| දසම | ,, ... ... ... | 510 – 112 |

භරණ්ඩුවග්ගො තතියො.

| | | |
|---|---|---|
| | **4. යොධාජීවවග්ගො** | **512 – 526** |
| පඨම | සුත්තං ... ... ... | 412 |
| දුතිය | ,, ... ... ... | 514 |
| තතිය | ,, ... ... ... | 514 |
| චතුත්ථ | ,, ... ... ... | 514 |
| පඤ්චම | ,, ... ... ... | 516 |
| ඡට්ඨම | ,, ... ... ... | 516 |
| සත්තම | ,, ... ... ... | 518 |
| අට්ඨම | ,, ... ... ... | 518 |
| නවම | ,, ... ... ... | 520 |
| දසම | ,, ... ... ... | 524 |
| එකාදසම | ,, ... ... ... | 524 |
| ද්වාදසම | ,, ... ... ... | 526 |
| තෙරසම | ,, ... ... ... | 526 |

යොධාජීවවග්ගො චතුත්ථො.

| විසයා: | | පිට්ඨඞ්කානි |
|---|---|---|
| | **5. මඞ්ගලවග්ගො** | **526 – 532** |
| පඨම | සුත්තං ... ... ... | 526 |
| දුතිය | ,, ... ... ... | 528 |
| තතිය | ,, ... ... ... | 528 |
| චතුත්ථ | ,, ... ... ... | 528 |
| පඤ්චම | ,, .... .... .... | 528 |
| ඡට්ඨම | ,, .... .... .... | 530 |
| සත්තම | ,, .... .... .... | 530 |
| අට්ඨම | ,, .... .... ... | 530 |
| නවම | ,, .... .... .... | 530 |
| දසම | ,, ... .... .... | 532 |

මඞ්ගලවග්ගො පඤ්චමො.

ඛුද්දකපණ්ණාසකො සමත්තො තතියො.

---

| | | |
|---|---|---|
| | **6. පටිපදාවග්ගො** | **532 – 538** |
| පඨම | සුත්තං .... .... ... | 532 |
| දුතිය | ,, .... .... .... | 536 |
| තතිය | ,, ... .... .... | 536 |
| චතුත්ථ | ,, .... .... .... | 536 |
| පඤ්චම | ,, .... .... .... | 536 |
| ඡට්ඨම | ,, .... .... .... | 538 |
| සත්තම | ,, .... .... ... | 538 |

පටිපදාවග්ගො ඡට්ඨො.

| | | |
|---|---|---|
| | **7. කම්මපථපෙය්‍යාලං** | **538 – 544** |
| පඨම | සුත්තං .... .... .... | 538 |
| දුතිය | ,, .... .... .... | 538 |
| තතිය | ,, .... .... .... | 540 |
| චතුත්ථ | ,, .... .... .... | 540 |
| පඤ්චම | ,, .... .... .... | 540 |
| ඡට්ඨම | ,, .... .... .... | 540 |
| සත්තම | ,, .... .... ... | 540 |
| අට්ඨම | ,, .... .... .... | 540 |
| නවම | ,, .... .... .... | 540 |
| දසම | ,, .... .... .... | 540 |

| විෂයා: | | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|---|
| එකාදසම | සුත්තං | .... | .... | .... | 542 |
| ද්වාදසම | ,, | .... | .... | .... | 542 |
| තෙරසම | ,, | .. | .... | .... | 542 |
| චුද්දසම | ,, | .... | .... | .... | 542 |
| පණ්ණරසම | ,, | .. | .... | .... | 542 |
| සොළසම | ,, | .... | .... | .... | 542 |
| සත්තරසම | ,, | .... | .... | .... | 542 |
| අට්ඨාරසම | ,, | .... | .... | .... | 542 |
| එකූනවීසතිම | ,, | .... | .... | .... | 544 |
| වීසතිම | ,, | .... | .... | .... | 544 |

කම්මපථපෙය්‍යාලං නිට්ඨිතං.

8. රාගපෙය්‍යාලං

1 — 170 සුත්තානි ... 544

රාගපෙය්‍යාලං නිට්ඨිතං.

තිකනිපාතො.

---

උද්දානගාථා 546 - 554

| | | | | |
|---|---|---|---|---|
| එකකනිපාතො | .... | .... | .... | 546–548 |
| දුකනිපාතො | ... | .... | .... | 550–552 |
| තිකනිපාතො | .... | .... | .... | 552-554 |

සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

පඨමො භාගො

## සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

### පඨමො භාගො

---

## 1. එකකනිපාතො

### 1. චිත්තපරියාදානවග්ගො

### නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

1. 1. 1.

එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

නාහං භික්ඛවෙ අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි, යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිරූපං. ඉත්ථිරූපං භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති.

1. 1. 2.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකසද්දම්පි සමනුපස්සාමි, යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිසද්දො. ඉත්ථිසද්දො භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති.

1. 1. 3.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකගන්ධම්පි සමනුපස්සාමි, යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිගන්ධො. ඉත්ථිගන්ධො භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති.

1. 1. 4.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකරසම්පි සමනුපස්සාමි, යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිරසො. ඉත්ථිරසො භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති.

# සූත්‍රාන්තපිටකයෙහි

# අඞ්ගුත්තරසඞ්ගීය

## ප්‍රථම භාගය

---

# 1. ඒකකනිපාතය

## 1. චිත්තපරියාදාන වර්ගය

### ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

**1. 1. 1.**

**මා** විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **අනේපිඬු** සිටුහු විසින් කරවන ලද **ජේතවනාරාම**-යෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'වහන්සැ' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක:

මහණෙනි, මේ ස්ත්‍රීරූපය යම්සේ වේ ද, එසේ යම් රූපයෙක් (රූප ගුරුක) පුරුෂයාගේ සිත් ගෙණ (කුසල් සිත පැහැර ගෙණ) සිටුනේ ද, එබඳු වූ අන් එක ද රූපයක් මම් (නුවණැසින්) නො දක්මි. මහණෙනි, ස්ත්‍රීරූපය පුරුෂයාගේ සිත් ගෙණ සිටුනේ ය.

**1. 1. 2.**

මහණෙනි, මේ ස්ත්‍රීශබ්දය යම්සේ වේ ද, එසේ යම් ශබ්දයෙක් (ශබ්ද ගුරුක) පුරුෂයාගේ සිත් ගෙණ සිටුනේ ද, එබඳු වූ අන් එක ද ශබ්දයක් මම් (නුවණැසින්) නො දක්මි. මහණෙනි, ස්ත්‍රීශබ්දය පුරුෂයාගේ සිත් ගෙණ සිටුනේ ය.

**1. 1. 3**

මහණෙනි, මේ ස්ත්‍රීගන්ධය (ස්ත්‍රීන් ඇසිරි කළ විලෙවුන් ඈ ගඳ) යම්සේ වේ ද, එසේ යම් ගන්ධයෙක් (ගන්ධගුරුක) පුරුෂයාගේ සිත් ගෙණ සිටුනේ ද, එබඳු වූ අන් එක ද ගන්ධයක් මම් (නුවණැසින්) නො දක්මි. මහණෙනි, ස්ත්‍රීගන්ධය පුරුෂයාගේ සිත් ගෙණ සිටුනේ ය.

**1. 1. 4.**

මහණෙනි, මේ ස්ත්‍රීරසය යම්සේ වේ ද, එසේ යම් රසයෙක් (රස ගුරුක) පුරුෂයාගේ සිත් ගෙණ සිටුනේ ද, එබඳු වූ අන් එක ද රසයක් මම් (නුවණැසින්) නො දක්මි. මහණෙනි, ස්ත්‍රීරසය පුරුෂයාගේ සිත් ගෙණ සිටුනේ ය.

**1. 1. 5.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකඵොට්ඨබ්බම්පි සමනුපස්සාමි, යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිඵොට්ඨබ්බො. ඉත්ථිඵොට්ඨබ්බො භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති.

**1. 1. 6.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි, යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ පුරිසරූපං. පුරිසරූපං භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨතීති.

**1. 1. 7.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකසද්දම්පි සමනුපස්සාමි, යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ පුරිසසද්දො. පුරිසසද්දො භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨතීති.

**1. 1. 8.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකගන්ධම්පි සමනුපස්සාමි, යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ පුරිසගන්ධො. පුරිසගන්ධො භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨතීති.

**1. 1. 9.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකරසම්පි සමනුපස්සාමි, යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ පුරිසරසො. පුරිසරසො භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨතීති.

**1. 1. 10.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකඵොට්ඨබ්බම්පි සමනුපස්සාමි, යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ පුරිසඵොට්ඨබ්බො. පුරිස-ඵොට්ඨබ්බො භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨතීති.

**වග්ගො පඨමො.***

---

* රූපාදිවග්ගො පඨමො-මජසං. PTS.

### 1. 1. 5.

මහණෙනි, මේ ස්ත්‍රීස්ප්‍රෂ්ටව්‍යය (ස්ත්‍රියගේ කයෙහිදු කයසැදි දූයෙහිදු පහස) යම්සේ වේ ද, එසේ යම් ස්ප්‍රෂ්ටව්‍යයෙක් (ස්ප්‍රෂ්ටව්‍යගුරුක) පුරුෂයාගේ සිත් ගෙණ සිටුනේ ද, එබඳු වූ අන් එක ද ස්ප්‍රෂ්ටව්‍යයක් මම් (නුවණැසින්) නො දක්මි. මහණෙනි, ස්ත්‍රීස්ප්‍රෂ්ටව්‍යය පුරුෂයාගේ සිත් ගෙණ සිටුනේ ය.

### 1. 1. 6.

මහණෙනි, මේ පුරුෂරූපය යම්සේ වේ ද, එසේ යම් රූපයෙක් (රූප-ගුරුක) ස්ත්‍රියගේ සිත් ගෙණ සිටුනේ ද, එබඳු වූ අන් එක ද රූපයක් මම් (නුවණැසින්) නො දක්මි. මහණෙනි, පුරුෂරූපය ස්ත්‍රියගේ සිත් ගෙණ සිටුනේ ය.

### 1. 1. 7.

මහණෙනි, මේ පුරුෂශබ්දය යම්සේ වේ ද, එසේ යම් ශබ්දයෙක් (ශබ්දගුරුක) ස්ත්‍රියගේ සිත් ගෙණ සිටුනේ ද, එබඳු වූ අන් එක ද ශබ්දයක් මම් (නුවණැසින්) නො දක්මි. මහණෙනි, පුරුෂශබ්දය ස්ත්‍රියගේ සිත් ගෙණ සිටුනේ ය.

### 1. 1. 8.

මහණෙනි, මේ පුරුෂගන්ධය යම්සේ වේ ද, එසේ යම් ගන්ධයෙක් (ගන්ධගුරුක) ස්ත්‍රියගේ සිත් ගෙණ සිටුනේ ද, එබඳු වූ අන් එක ද ගන්ධයක් මම් (නුවණැසින්) නො දක්මි. මහණෙනි, පුරුෂගන්ධය ස්ත්‍රියගේ සිත් ගෙණ සිටුනේ ය.

### 1. 1. 9.

මහණෙනි, මේ පුරුෂරසය යම්සේ වේ ද, එසේ යම් රසයෙක් (රස-ගුරුක) ස්ත්‍රියගේ සිත් ගෙණ සිටුනේ ද, එබඳු වූ අන් එක ද රසයක් මම් (නුවණැසින්) නො දක්මි. මහණෙනි, පුරුෂරසය ස්ත්‍රියගේ සිත් ගෙණ සිටුනේ ය.

### 1. 1. 10.

මහණෙනි, මේ පුරුෂස්ප්‍රෂ්ටව්‍යය යම්සේ වේ ද, එසේ යම් ස්ප්‍රෂ්ටව්‍ය-යෙක් (ස්ප්‍රෂ්ටව්‍යගුරුක) ස්ත්‍රියගේ සිත් ගෙණ සිටුනේ ද, එබඳු වූ අන් එක ද ස්ප්‍රෂ්ටව්‍යයක් මම් (නුවණැසින්) නො දක්මි. මහණෙනි, පුරුෂස්ප්‍රෂ්ටව්‍යය ස්ත්‍රියගේ සිත් ගෙණ සිටුනේ ය.

**පළමු වග යි.**

---

## 2. නීවරණප්පහාණවග්ගො

### 1. 2. 1.

[සාවත්ථිනිදානං:]

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා කාමච්ඡන්දො උප්පජ්ජති, උප්පන්නො වා කාමච්ඡන්දො භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති, යථයිදං භික්ඛවෙ සුභනිමිත්තං. සුභනිමිත්තං භික්ඛවෙ අයොනිසො මනසි කරොතො අනුප්පන්නො චෙව කාමච්ඡන්දො උප්පජ්ජති, උප්පන්නො ච කාමච්ඡන්දො භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

### 1. 2. 2.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා ව්‍යාපාදො[1] උප්පජ්ජති, උප්පන්නො වා ව්‍යාපාදො භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති, යථයිදං භික්ඛවෙ පටිඝනිමිත්තං. පටිඝනිමිත්තං භික්ඛවෙ අයොනිසො මනසි කරොතො අනුප්පන්නො චෙව ව්‍යාපාදො[1] උප්පජ්ජති, උප්පන්නො ච ව්‍යාපාදො භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

### 1. 2. 3.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නං වා ථීනමිද්ධං[2] උප්පජ්ජති, උප්පන්නං වා ථීනමිද්ධං භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අරති තන්දි විජම්භිකා[3] භත්තසම්මදො චෙතසො ච ලීනත්තං. ලීනචිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නං චෙව ථීනමිද්ධං උප්පජ්ජති, උප්පන්නඤ්ච ථීනමිද්ධං භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

### 1. 2. 4.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං උප්පජ්ජති, උප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති, යථයිදං භික්ඛවෙ චෙතසො අවූපසමො. අවූපසන්තචිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නං චෙව උද්ධච්චකුක්කුච්චං උප්පජ්ජති, උප්පන්නං ච උද්ධච්චකුක්කුච්චං භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

### 1. 2. 5.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා විචිකිච්ඡා උප්පජ්ජති, උප්පන්නා වා විචිකිච්ඡා භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරො. අයොනිසො භික්ඛවෙ මනසි කරොතො අනුප්පන්නා චෙව විචිකිච්ඡා උප්පජ්ජති, උප්පන්නා ච විචිකිච්ඡා භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

---

1. බ්‍යාපාදො-මජසං. ස්‍යා. 2. ථීනමිද්ධං-මජසං. 3. විජම්භිතා-මජ්ඣ

# 2. නීවරණප්‍රහාණ වර්ගය

## 1. 2. 1.

[සැවැත්නිදානයි:]

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද කාමච්ඡන්දය උපදනේ නම්, උපන්නා වූ ද කාමච්ඡන්දය භූයස්භාවය (නැවත නැවත වන බව) පිණිස විපුලබව පිණිස පවත්නේ නම්, මහණෙනි, මේ ශුභනිමිත්ත යම්සේ වේ ද, එබඳු වූ අන් එක ද ධර්මයක් මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, ශුභනිමිත්ත නුනුවණින් මෙනෙහි කරණුවහට නූපන්නා වූ ද කාමච්ඡන්දය උපදනේ ය, උපන්නා වූ ද කාමච්ඡන්දය භූයස්භාවය පිණිස විපුලත්වය පිණිස පවත්නේ ය.

## 1. 2. 2.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද ව්‍යාපාදය උපදනේ නම්, උපන්නා වූ ද ව්‍යාපාදය භූයොභාවය පිණිස විපුලභාවය පිණිස පවත්නේ නම්, මහණෙනි, මේ ප්‍රතිඝ (අනිෂ්ට) නිමිත්ත යම්සේ වේ ද, එබඳු වූ අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, ප්‍රතිඝනිමිත්ත නුනුවණින් මෙනෙහි කරණුවහට නූපන්නා වූ ද ව්‍යාපාදය උපදනේ ය. උපන්නා වූ ද ව්‍යාපාදය භූයොභාවය පිණිස විපුලභාවය පිණිස පවත්නේ ය.

## 1. 2. 3.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද ථීනමිද්ධය (චිත්තචෛතසිකයන් කර්මණ්‍ය නොවන බව) උපදනේ නම්, උපන්නා වූ ද ථීනමිද්ධය භූයොභාවය පිණිස විපුලභාවය පිණිස පවත්නේ නම්, මහණෙනි, මේ (දූරසෙනසුන්හි හෝ අධිකුශලධර්මයෙහි නොඇල්ම වූ) අරතිය ද, (අලසබව වූ) තන්‍ද්‍රිය ද, (ඇඟ මැලි කැඩීම වූ) විජම්භිකාව ද, (බත්මත නම් වූ) භත්තසම්මදය ද, චිත්තයාගේ හැකුළුනු බව වූ ලීනත්වය ද යම්සේ වේ ද, එබඳු වූ අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, හැකිළුනු සිත් ඇත්තහුට නූපන්නා වූ ද ථීනමිද්ධය උපදනේ ය. උපන්නා වූ ද ථීනමිද්ධය භූයොභාවය පිණිස විපුලභාවය පිණිස පවත්නේ ය.

## 1. 2. 4.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද (චිත්තයාගේ නො සන්හුන් බව හා විපිළිසරබව ය යි කියන ලද) උද්ධච්චකුක්කුච්චය උපදනේ නම්, උපන්නා වූ ද උද්ධච්චකුක්කුච්චය භූයොභාවය පිණිස විපුලභාවය පිණිස පවත්නේ නම්, මහණෙනි, චිත්තයාගේ මේ නොසන්හුන්බව යම්සේ වේ ද, එබඳු අන් එක ධර්මයකුදු මම නුවණැසින් නො දක්මි. මහණෙනි, නොසන්හුන් සිත් ඇත්තහුට නූපන්නා වූ ද උද්ධච්චකුක්කුච්චය උපදනේය. උපන්නා වූ ද උද්ධච්චකුක්කුච්චය භූයොභාවය පිණිස විපුලභාවය පිණිස පවත්නේ ය.

## 1. 2. 5.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද (බුද්ධාදි අට තන්හි සැකය යි කියන ලද) විචිකිච්ඡාව උපදනේ නම්, උපන්නා වූ ද විචිකිච්ඡාව භූයොභාවය පිණිස විපුලභාවය පිණිස පවත්නේ නම්, මහණෙනි, මේ නුනුවණින් මෙනෙහි කිරීම යම්සේ වේ ද, එබඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, නුනුවණින් මෙනෙහි කරණුවහට නූපන්නා වූ ද විචිකිච්ඡාව උපදනේ ය. උපන්නා වූ ද විචිකිච්ඡාව භූයොභාවය පිණිස විපුලභාවය පිණිස පවත්නේ ය.

**1. 2. 6.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා කාමච්ඡන්දො නුප්පජ්ජති, උප්පන්නො වා කාමච්ඡන්දො පහීයති, යථයිදං භික්ඛවෙ අසුභනිමිත්තං. අසුභනිමිත්තං භික්ඛවෙ යොනිසො මනසි කරොතො අනුප්පන්නො චෙව කාමච්ඡන්දො නුප්පජ්ජති, උප්පන්නො ච කාමච්ඡන්දො පහීයතීති.

**1. 2. 7.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා ව්‍යාපාදො නුප්පජ්ජති, උප්පන්නො වා ව්‍යාපාදො පහීයති, යථයිදං භික්ඛවෙ මෙත්තා චෙතොවිමුත්ති. මෙත්තං භික්ඛවෙ චෙතොවිමුත්තිං යොනිසො මනසි කරොතො අනුප්පන්නො චෙව ව්‍යාපාදො නුප්පජ්ජති, උප්පන්නො ච ව්‍යාපාදො පහීයතීති.

**1. 2. 8.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නං වා ථීනමිද්ධං නුප්පජ්ජති, උප්පන්නං වා ථීනමිද්ධං පහීයති, යථයිදං භික්ඛවෙ ආරම්භධාතු නික්කමධාතු පරක්කමධාතු. ආරද්ධවිරියස්ස භික්ඛවෙ අනුප්පන්නඤ්චෙව ථීනමිද්ධං නුප්පජ්ජති, උප්පන්නඤ්ච ථීනමිද්ධං පහීයතීති.

**1. 2. 9.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං නුප්පජ්ජති, උප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං පහීයති, යථයිදං භික්ඛවෙ චෙතසො වූපසමො. වූපසන්තචිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නඤ්චෙව උද්ධච්චකුක්කුච්චං නුප්පජ්ජති, උප්පන්නඤ්ච උද්ධච්චකුක්කුච්චං පහීයතීති.

**1. 2. 10.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා විචිකිච්ඡා නුප්පජ්ජති, උප්පන්නා වා විචිකිච්ඡා පහීයති, යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො. යොනිසො භික්ඛවෙ මනසි කරොතො අනුප්පන්නා චෙව විචිකිච්ඡා නුප්පජ්ජති, උප්පන්නා ච විචිකිච්ඡා පහීයතීති.

**වග්ගො දුතියො.***

---

* නීවරණප්පහාණවග්ගො දුතියො - මජ්සං

### 1. 2. 6.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද කාමච්ඡන්දය නූපදනේ නම්, උපන්නා වූ ද කාමච්ඡන්දය ප්‍රහීණ වේ නම්, මහණෙනි, මේ අශුභනිමිත්ත යම්සේ වේ ද, එබඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, අශුභනිමිත්ත නුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නා වූ ද කාමච්ඡන්දය නූපදනේ ය. උපන්නා වූ ද කාමච්ඡන්දය ප්‍රහීණ වේ.

### 1. 2. 7.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද ව්‍යාපාදය නූපදනේ නම්, උපන්නා වූ ද ව්‍යාපාදය ප්‍රහීණ වේ නම්, මහණෙනි, මේ මෛත්‍රීචිත්තවිමුක්තිය යම්සේ වේ ද, එබඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, මෛත්‍රීචිත්තවිමුක්තිය නුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නා වූ ද ව්‍යාපාදය නූපදනේ ය. උපන්නා වූ ද ව්‍යාපාදය ප්‍රහීණ වේ.

### 1. 2. 8.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද ථිනමිද්ධය නූපදනේ නම්, උපන්නා වූ ද ථිනමිද්ධය ප්‍රහීණ වේ නම්, මහණෙනි, මේ (ප්‍රථමාරම්භවීර්ය සඞ්ඛ්‍යාත) ආරම්භධාතු ද (කුසීතභාවයෙන් නික්මුනු බැවින් එයට වඩා බලවත්) නික්කමධාතු ද, (සම්බාධ මැඩ මතු මත්තට යන හෙයින් එයට ද වඩා බලවත්) පරක්කමධාතු ද යම්සේ වේ ද, එබඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, ආරබ්ධවීර්ය ඇතියහුට නූපන්නා වූ ද ථිනමිද්ධය නූපදනේ ය. උපන්නා වූ ද ථිනමිද්ධය ප්‍රහීණ වේ.

### 1. 2. 9.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද උද්ධච්චකුක්කුච්චය නූපදනේ නම්, උපන්නා වූ ද උද්ධච්චකුක්කුච්චය ප්‍රහීණ වේ නම්, මහණෙනි, මේ චිත්තයාගේ සන්හිඳීම යම්සේ වේ ද, එබඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, සන්හුන් සිත් ඇත්තහුට නූපන්නා වූ ද උද්ධච්චකුක්කුච්චය නූපදනේ ය. උපන්නා වූ ද උද්ධච්චකුක්කුච්චය ප්‍රහීණ වේ.

### 1. 2. 10.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද විචිකිච්ඡාව නූපදනේ නම්, උපන්නා වූ ද විචිකිච්ඡාව ප්‍රහීණ වේ නම්, මහණෙනි, මේ නුවණින් මෙනෙහි කිරීම යම්සේ වේ ද, එබඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නා වූ ද විචිකිච්ඡාව නූපදනේ ය. උපන්නා වූ ද විචිකිච්ඡාව ප්‍රහීණ වේ.

**දෙවන වග යි.**

---

## 3. අකම්මනියවග්ගො

### 1. 3. 1.

[සාවත්ථිනිදානං:]

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං අභාවිතං අකම්මනියං හොති, යථයිදං* චිත්තං. චිත්තං භික්ඛවෙ අභාවිතං අකම්මනියං හොතීති.

### 1. 3. 2.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං භාවිතං කම්මනියං හොති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං කම්මනියං හොතීති.

### 1. 3. 3

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං අභාවිතං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අභාවිතං මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 3. 4.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං භාවිතං මහතො අත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං මහතො අත්ථාය සංවත්තතීති.

### 1. 3. 5.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං අභාවිතං අපාතුභූතං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අභාවිතං අපාතුභූතං මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 3. 6.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං භාවිතං පාතුභූතං මහතො අත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං පාතුභූතං මහතො අත්ථාය සංවත්තතීති.

### 1. 3. 7.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං අභාවිතං අබහුලීකතං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අභාවිතං අබහුලීකතං මහතො අනත්ථාය සංවත්තතීති.

---

* යථයිදං භික්ඛවෙ චිත්තං - සයා. මජසං.

# 3. අකම්මඤ්ඤවග්ගය

## 1. 3. 1.

**[සැවැත් නිදානයි.]**

මහණෙනි, යමක් මෙසේ (භාවනා වශයෙන්) නොවඩන ලද්දේ අකම්මඤ්ඤ (=කර්මයට අහිත) වේ නම්, චිත්තය බඳු අන් එක ද ධර්මයක් මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, නොවඩන ලද සිත අකම්මඤ්ඤ වේ.

## 1. 3. 2.

මහණෙනි, යමක් මෙසේ (භාවනා වශයෙන්) වඩන ලද්දේ කම්මඤ්ඤ වේ ද, චිත්තය බඳු අන් එක ද ධර්මයක් මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, (භාවනා වශයෙන්) වඩන ලද සිත කම්මඤ්ඤ වේ.

## 1. 3. 3.

මහණෙනි, යමක් මෙසේ (භාවනා වශයෙන්) නොවඩනා ලද්දේ මහත් වූ අනර්ථය පිණිස පවත්නේ නම්, සිත බඳු අන් එක ද ධර්මයක් මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, නොවඩන ලද සිත මහත් අනර්ථය පිණිස පවත්නේ ය.

## 1. 3. 4.

මහණෙනි, යමක් මෙසේ (භාවනා වශයෙන්) වඩන ලද්දේ මහත් අර්ථය පිණිස පවත්නේ නම්, සිත බඳු අන් එක ද ධර්මයක් මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, වැඩූ සිත මහත් අර්ථය පිණිස පවත්නේ ය.

## 1. 3. 5.

මහණෙනි, යමක් මෙසේ නොවඩන ලද්දේ (විදර්ශනා මාර්ග ඵල නිර්වාණයන් අරමුණු කොට) පහළ නො වූයේ මහත් වූ අනර්ථය පිණිස පවත්නේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, නොවැඩූ (විදර්ශනාදිය අරමුණු කොට) පහළ නො වූ සිත මහත් වූ අනර්ථය පිණිස පවත්නේ ය.

## 1. 3. 6.

මහණෙනි, යමක් මෙසේ වඩන ලද්දේ පහළ වූයේ මහත් වූ අර්ථය පිණිස පවත්නේ නම්, සිත බඳු අන් එක ද ධර්මයක් මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, වැඩූ (විදර්ශනාදිය අරමුණු කොට) පහළ වූ සිත මහත් වූ අර්ථය පිණිස පවත්නේ ය.

## 1. 3. 7.

මහණෙනි, යමක් මෙසේ නොවඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු නොකරණ ලද්දේ මහත් වූ අනර්ථය පිණිස පවත්නේ නම්, සිත බඳු අන් එක ද ධර්මයක් මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, නො වැඩූ බහුල වශයෙන් පුරුදු නොකළ සිත මහත් වූ අනර්ථය පිණිස පවත්නේ ය.

**1. 3. 8.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං භාවිතං බහුලීකතං මහතො අත්ථාය සංවත්තති, යථයිදං* චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං බහුලීකතං මහතො අත්ථාය සංවත්තතීති.

**1. 3. 9**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං අභාවිතං අබහුලීකතං දුක්ඛාවහං[1] හොති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අභාවිතං අබහුලීකතං දුක්ඛාවහං[1] හොතීති.

**1. 3. 10.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං භාවිතං බහුලීකතං සුඛාවහං[2] හොති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං බහුලීකතං සුඛාවහං[2] හොතීති.

**වග්ගො තතියො.[3]**

---

## 4. අදන්තවග්ගො

**1. 4. 1.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අදන්තං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අදන්තං මහතො අනත්ථාය සංවත්තතීති.

**1. 4. 2.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං දන්තං මහතො අත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ දන්තං මහතො අත්ථාය සංවත්තතීති.

**1. 4. 3.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං අගුත්තං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අගුත්තං මහතො අනත්ථාය සංවත්තතීති.

**1. 4. 4.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං ගුත්තං මහතො අත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ ගුත්තං මහතො අත්ථාය සංවත්තතීති.

---

1. 'දුක්ඛාධිවාහං' ඉතිපි පාඨො, අට්ඨකථායං. 2. 'සුඛාධිවාහං' ඉති ච පාඨො, අට්ඨකථායං.
3. අකම්මනියවග්ගො තතියො - මජසං. * යථයිදං භික්ඛවෙ චිත්තං-සතා. මජසං

**1. 3. 8.**

මහණෙනි, යමක් මෙසේ වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ මහත් වූ අර්ථය පිණිස පවත්නේ නම්, සිත බඳු අන් එක ද ධර්මයක් මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, වැඩූ බහුල වශයෙන් කළ සිත මහත් වූ අර්ථය පිණිස පවත්නේ ය.

**1. 3. 9.**

මහණෙනි, යමක් මෙසේ නොවැඩුයේ බහුල වශයෙන් නොකෙළේ දුක් එළවන්නේ වේ නම්, සිත බඳු අන් එක ද ධර්මයක් මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, නොවැඩූ බහුල වශයෙන් නොකළ සිත දුක් එළවන්නේ වෙයි.

**1. 3. 10.**

මහණෙනි, යමක් මෙසේ වැඩුයේ බහුල වශයෙන් කෙළේ සුව එළවන්නේ වේ නම්, සිත බඳු අන් එක ද ධර්මයක් මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, භාවිත වූ බහුලීකෘත වූ සිත සුව එළවන්නේ වේ.

**තෙවන වග සි.**

---

## 4. අදන්ත වර්ගය

**1. 4. 1.**

මහණෙනි, යමක් මෙසේ නොදමුනේ මහත් වූ අනර්ථය පිණිස පවත්නේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, නොදමුනු සිත මහත් වූ අනර්ථය පිණිස පවත්නේ ය.

**1. 4. 2.**

මහණෙනි, යමක් මෙසේ දමුනේ මහත් වූ අර්ථය පිණිස පවත්නේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, දමුනු සිත මහත් අර්ථය පිණිස පවත්නේ ය.

**1. 4. 3.**

මහණෙනි, යමක් මෙසේ (සතිසංවරයෙන්) ගෝපනය නොකරණ ලද්දේ මහත් වූ අනර්ථය පිණිස පවත්නේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, අගෝපිත වූ සිත මහත් වූ අනර්ථය පිණිස පවත්නේ ය.

**1. 4. 4.**

මහණෙනි, යමක් මෙසේ ගෝපනය කරණ ලද්දේ මහත් වූ අර්ථය පිණිස පවත්නේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, ගෝපිත වූ සිත මහත් අර්ථය පිණිස පවත්නේ ය.

### 1. 4. 5.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං අරක්ඛිතං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අරක්ඛිතං මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 4. 6.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං රක්ඛිතං මහතො අත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ රක්ඛිතං මහතො අත්ථාය සංවත්තතීති.

### 1. 4. 7.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං අසංවුතං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අසංවුතං මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 4. 8.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං සංවුතං මහතො අත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ සංවුතං මහතො අත්ථාය සංවත්තතීති.

### 1. 4. 9.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං අදන්තං අගුත්තං අරක්ඛිතං අසංවුතං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අදන්තං අගුත්තං අරක්ඛිතං අසංවුතං මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 4. 10.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං දන්තං ගුත්තං රක්ඛිතං සංවුතං මහතො අත්ථාය සංවත්තති, යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ දන්තං ගුත්තං රක්ඛිතං සංවුතං මහතො අත්ථාය සංවත්තතීති.

**වග්ගො චතුත්ථො.**[1]

---

* යථයිදං භික්ඛවෙ චිත්තං - සෑං, මජසං. 1. අදන්තවග්ගො චතුත්ථො - මජසං.

**1. 4. 5.**

මහණෙනි, යමක් මෙසේ නොරක්නා ලද්දේ මහත් වූ අනර්ථය පිණිස පවත්තේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, නොරැකුනු සිත මහත් වූ අනර්ථය පිණිස පවත්තේ ය.

**1. 4. 6.**

මහණෙනි, යමක් මෙසේ රක්නා ලද්දේ මහත් වූ අර්ථය පිණිස පවත්තේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, රැකුනු සිත මහත් වූ අර්ථය පිණිස පවත්තේ ය.

**1. 4. 7.**

මහණෙනි, යමක් මෙසේ සංවර නොකරණ ලද්දේ මහත් වූ අනර්ථය පිණිස පවත්තේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, සංවර රහිත සිත මහත් වූ අනර්ථය පිණිස පවත්තේ ය.

**1. 4. 8.**

මහණෙනි, යමක් මෙසේ සංවර කරණ ලද්දේ මහත් අර්ථය පිණිස පවත්තේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, සංවර කළ සිත මහත් වූ අර්ථය පිණිස පවත්තේ ය.

**1. 4. 9.**

මහණෙනි, යමක් මෙසේ නොදැමුනේ ගෝපනග නොකරණ ලද්දේ සංවර නොකරණ ලද්දේ මහත් වූ අනර්ථය පිණිස පවත්තේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, නොදැමුනු ගෝපනය නොකළ නොරැකි සංවර රහිත සිත මහත් වූ අනර්ථය පිණිස පවත්තේ ය.

**1. 4. 10.**

මහණෙනි, යමක් මෙසේ දැමුනේ ගෝපනය කරණ ලද්දේ රක්නා ලද්දේ සංවර කරණ ලද්දේ මහත් වූ අර්ථය පිණිස පවත්තේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම (නුවණැසින්) නො දක්මි. මහණෙනි, දාන්ත වූ ගුප්ත වූ රක්ෂිත වූ සංවෘත වූ සිත මහත් වූ අර්ථය පිණිස පවත්තේ ය.

**සිවුවන වග යි.**

# 5. සූකවග්ගො.

## 1. 5. 1.

[ඝාවඤ්ඤිනිද්දනං:]

සෙය්‍යථාපි භික්ඛවෙ සාලිසූකං වා යවසූකං වා මිච්ඡාපණිහිතං හත්ථෙන වා පාදෙන වා අක්කන්තං හත්ථං වා පාදං වා භෙච්ඡති,* ලොහිතං වා උප්පා-දෙස්සතීති නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු: මිච්ඡාපණිහිතත්තා භික්ඛවෙ සූකස්ස. එවමෙව ඛො භික්ඛවෙ සො වත භික්ඛු මිච්ඡාපණිහිතෙන චිත්තෙන අවිජ්ජං භෙච්ඡති, විජ්ජං උප්පාදෙස්සති, නිබ්බාණං සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු: මිච්ඡාපණිහිතත්තා භික්ඛවෙ චිත්තස්සාති.

## 1. 5. 2.

සෙය්‍යථාපි භික්ඛවෙ සාලිසූකං වා යවසූකං වා සම්මාපණිහිතං හත්ථෙන වා පාදෙන වා අක්කන්තං හත්ථං වා පාදං වා භෙච්ඡති*, ලොහිතං වා උප්පා-දෙස්සතීති, ඨානමෙතං විජ්ජති. තං කිස්ස හෙතු: සම්මා පණිහිතත්තා භික්ඛවෙ සූකස්ස.[1] එවමෙව ඛො භික්ඛවෙ සො වත භික්ඛු සම්මා පණිහිතෙන චිත්තෙන අවිජ්ජං භෙච්ඡති, විජ්ජං උප්පාදෙස්සති, නිබ්බාණං සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති. තං කිස්ස හෙතු: සම්මාපණිහිතත්තා භික්ඛවෙ චිත්තස්සාති.

## 1. 5. 3.

ඉදහං[2] භික්ඛවෙ එකච්චං පුග්ගලං පදුට්ඨචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: ඉමම්හි චෙ අයං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය, යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. තං කිස්ස හෙතු: චිත්තං හිස්ස භික්ඛවෙ පදුට්ඨං. චෙතොපදොසහෙතුච[3] පන භික්ඛවෙ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්තීති.

## 1. 5. 4.

ඉදහං භික්ඛවෙ එකච්චං පුග්ගලං පසන්නචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: ඉමම්හි චෙ අයං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය, යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. තං කිස්ස හෙතු: චිත්තං හිස්ස භික්ඛවෙ පසන්නං. චෙතොපසාදහෙතුච[4] පන භික්ඛවෙ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

1. සාලිසූකස්ස—සයා 2. ඉධාහං—සයා, මජසං. 3. චෙතොපදොස හෙතු ච—සයා. චෙතොපදොස හෙතු පන—මජසං. 4. චෙතොපසාද හෙතු ච—සයා, චෙතොපසාද හෙතු —පනමජසං. * භෙජ්ජති—සිමු. මනොරථපූරණී.

# 5. ශූක වර්ගය

## 1. 5. 1.

**[සැවැත් නිදානයි:]**

මහණෙනි, (උඩු අත් කොට නො තබා) වරදවා තබන ලද හැල්වී තංඩු-යෙක් වේවයි යව වී තංඩුයෙක් වේව යි, අතින් වේවයි පයින් වේවයි, ඇක්-මූනේ, අත වේවයි පය වේවයි බිඳුනේ ය, ලේ හෝ උපදවන්නේ ය යන මෙ කරුණ විද්‍යමාන නො වේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, තංඩුව වරදවා තැබූ වන බැවිනි. මහණෙනි, එපරිදි ඒකාන්තයෙන් ඒ මහණ වරදවා තබන ලද සිතින්(දුඃඛාදි අට තන්හි නොදැනීම්) ය යි කියන ලද අවිද්‍යාව බිඳුනේ ය, (අර්හත්මාර්ගඥාන සඞ්ඛ්‍යාත) විද්‍යාව උපදවන්නේ ය, නිර්වාණය සාක්‍ෂාත් කරන්නේ ය යන මෙ කරුණ විද්‍යමාන නො වේ. ඒ කවර හෙයින යත්:- මහණෙනි, සිත වරදවා තැබූ වන බැවිනි.

## 1. 5. 2.

මහණෙනි, (බිඳිනට හැකි සේ උඩුඅත් කොට) මොනොවට තබනා ලද හැල්වීතංඩුයෙක් වේවයි යවවීතංඩුයෙක් වේවයි, අතින් වේවයි පයින් වේවයි, ඇක්මූනේ අත වේවයි, පය වේවයි බිඳුනේ ය, ලේ හෝ උපදවන්නේ ය යන මෙකරුණ විද්‍යමාන වේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, තංඩුව මොනොවට තැබූ වන බැවිනි. මහණෙනි, එපරිදි ඒකාන්තයෙන් ඒ මහණ මොනොවට තබන ලද සිතින් අවිද්‍යාව බිඳුනේ ය, විද්‍යාව උපදවන්නේ ය, නිර්වාණය සාක්‍ෂාත් කරන්නේ ය යන මෙකරුණ විද්‍යමාන වේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිත මොනොවට තැබූ වන බැවිනි.

## 1. 5. 3.

මහණෙනි, මම මෙලොවැ (ද්වේෂයෙන්) ප්‍රදුෂ්ට වූ සිත් ඇති කිසි පුඟුලකු "ඉදින් මේ පුද්ගල තෙමේ මෙ සමයෙහි කළුරිය කරන්නේ නම්, (ගිසින්) ගෙණවුත් තැබූයේ යම්සේ වේ ද, එසේ නිරයෙහි සිටුනේ"යි මෙසේ මා සිතින් උහු සිත පිරිසිඳ දනිමි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මොහුගේ සිත ප්‍රදුෂ්ට ය, එහෙයිනි. මහණෙනි, මෙසේ මෙලොව සත්ත්ව කෙනෙක් චිත්තප්‍රද්වේෂහේතුයෙන් කාබුන් මරණින් මතු (සුවෙන් තොර බැවින්) අපාය නම් වූ (නපුරු ගති ඇති බැවින්) දුර්ගති නම් වූ (විවශ ව පතිත වන බැවින්) විනිපාත නම් වූ නිරයට පැමිණෙන්නාහු ය.

## 1. 5. 4.

මහණෙනි, මම මෙලොවැ පහන් සිත් ඇති කිසි පුඟුලකු "ඉදින් මේ පුගුල් මෙ සමයෙහි කළුරිය කරන්නේ නම්, (ගිසින්) ගෙණවුත් තැබූයේ යම්සේ වේ ද, එසේ ස්වර්ගයෙහි සිටුනේ"යි මෙසේ මා සිතින් උහු සිත පිරිසිඳ දනිමි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මොහුගේ සිත පහන් වේ, එහෙයිනි. මහණෙනි, මෙලෙව්හි සත්ත්ව කෙනෙක් මෙසේ චිත්ත-ප්‍රසාදහේතුයෙනු දු කාබුන් මරණින් මතු (සුඛයට ගති වූ හෙයින්) සුගති නම් වූ (මොනොවට අග්‍ර හෙයින්) සගග නම් වූ ලෝකයට පැමිණෙන්නාහු ය.

### 1. 5. 5.

සෙය්‍යථාපි භික්ඛවෙ උදකරහදො ආවිලො ලුළිතො කලලීභූතො, තත්‍ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො න පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි* සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තං කිස්ස හෙතු: ආවිලත්තා භික්ඛවෙ උදකස්ස. එවමෙව ඛො භික්ඛවෙ සො වත භික්ඛු ආවිලෙන චිත්තෙන අත්තත්‍ථං වා ඤස්සති, පරත්‍ථං වා ඤස්සති, උභයත්‍ථං වා ඤස්සති, උත්තරිං වා මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරිස්සතීති, නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු: ආවිලත්තා භික්ඛවෙ චිත්තස්සාති.

### 1. 5. 6.

සෙය්‍යථාපි භික්ඛවෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො, තත්‍ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තං කිස්ස හෙතු: අනාවිලත්තා භික්ඛවෙ උදකස්ස. එවමෙව ඛො භික්ඛවෙ සො වත භික්ඛු අනාවිලෙන චිත්තෙන අත්තත්‍ථං වා ඤස්සති, පරත්‍ථං වා ඤස්සති, උභයත්‍ථං වා ඤස්සති, උත්තරිං වා මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරිස්සතීති, ඨානමෙතං විජ්ජති. තං කිස්ස හෙතු: අනාවිලත්තා භික්ඛවෙ චිත්තස්සාති.

### 1. 5. 7.

සෙය්‍යථාපි භික්ඛවෙ යානි කානිචි රුක්ඛජාතානං[1] ඵන්දනො[2] තෙසං අග්ගමක්ඛායති, යදිදං මුදුතාය චෙව කම්මඤ්ඤතාය ච. එවමෙව ඛො අහං භික්ඛවෙ න අඤ්ඤං[3] එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං භාවිතං බහුලීකතං මුදු ච[4] හොති කම්මඤ්ඤඤ්ච,[5] යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං බහුලීකතං මුදු ච හොති කම්මඤ්ඤඤ්චාති.

### 1. 5. 8.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං ලහුපරිවත්තං, යථයිදං චිත්තං. යාවඤ්චිදං භික්ඛවෙ උපමාපි න සුකරා යාව ලහුපරිවත්තං චිත්තන්ති.

### 1. 5. 9.

පභස්සරමිදං භික්ඛවෙ චිත්තං, තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨන්ති.

### 1. 5. 10.

පභස්සරමිදං භික්ඛවෙ චිත්තං, තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි විප්පමුත්තන්ති.

**වග්ගො පඤ්චමො.**[6]

1. රුක්ඛජාතානි - ස්‍යා. 2. ඵන්දනො - ස්‍යා. 3. නාඤ්ඤං - ස්‍යා. මජසං.
4. මුදුඤ්ච - සීමු 5. කම්මනියඤ්ච - ස්‍යා. කම්මඤ්ඤඤ්ච හොති - මජසං.
6. පණිහිත අච්ඡවග්ගො පඤ්චමො - මජසං. * සිප්පිකා සම්බුකම්පි - කාජ්ව

### 1. 5. 5.

මහණෙනි, යම් පරිදි නොපහන් වූ කැළඹුනු මඩබිහිලි දියවිලෙක් වේ නම්, එහි ඇස් ඇති පුරුෂයෙක් තෙර සිටියේ හැසිරෙන්නා වූ ද සිටුනා වූ ද සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලනුදු කැට කැබලිති හා මස්-කැල ද නොදක්නේ වේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, දිය නො පහන් වන බැවිනි. මහණෙනි, එපරිදි ම ඒ මහණ කැළඹුනු සිතින් යුක්ත ව ඒකාන්තයෙන් ආත්මාර්ථ ය හෝ දැන ගන්නේය, පරාර්ථය හෝ දැන ගන්නේය, උභයාර්ථය හෝ දැන ගන්නේය, (දශකුශලධර්ම සඞ්ඛ්‍යාත) මනුෂ්‍ය-ධර්මයෙන් මත්තෙහි වූ ආර්‍යභාවය කිරීමට සමත් වූ ඥානදර්ශනවිශේෂයක් හෝ පසක් කරන්නේය යන මෙකරුණ සිදු නො වේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිත නොපහන් වන බැවිනි.

### 1. 5. 6.

මහණෙනි, යම් පරිදි පිරිසිදු වූ වෙසෙසින් පහන් වූ නොකැළඹුනු දිය විලෙක් වේ නම්, එහි ඇස් ඇති පුරුෂයෙක් තෙර සිටියේ හැසිරෙන්නා වූ ද සිටුනා වූ ද සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලනු දු කැටකැබලිති හා මස්කැල ද දක්නේ වේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, දිය පහන් වන බැවිනි. මහණෙනි, එපරිදි ම ඒ මහණ ඒකාන්තයෙන් නො කැළඹුනු සිතින් ආත්මාර්ථය හෝ දැන ගන්නේය, පරාර්ථය හෝ දැන ගන්නේය, උභයාර්ථ ය හෝ දැන ගන්නේය, මනුෂ්‍යධර්මයෙන් මත්තෙහි වූ ආර්‍යභාවය ඇති කර ගැණීමට සමත් ඥානදර්ශනවිශේෂයක් හෝ පසක් කරන්නේය යන මෙ කරුණ විද්‍යමාන වේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිත පහන් වන බැවිනි.

### 1. 5. 7.

මහණෙනි, යම් පරිදි යම්කිසි වෘක්ෂ කෙනෙක් වෙත් නම්, ඔවුනතුරෙන් මෘදුභාවයෙන් හා කර්මණ්‍යතායෙනු දු බුදුරුදඹුනුගස අග්‍ර යයි කියනු ලැබේ ද, මහණෙනි, එපරිදි ම යමෙක් මෙසේ වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ මෘදුත් වේ නම්, කර්මණ්‍යත් වේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, සිත වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ මෘදුත් වෙයි, කර්මණ්‍යත් වෙයි.

### 1. 5. 8.

මහණෙනි, යමෙක් මෙසේ වහා ඉපද නස්නා සුලු වේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, සිත අත්‍යර්ථයෙන් වහා පෙරළෙන සුලු වේ නම්, (එයට) උපමාවකුදු අතිශයදුෂ්කර වේ.

### 1. 5. 9.

මහණෙනි, මේ (භවාඞ්ග) සිත ප්‍රභාස්වර ය, හෙ ද වනාහි ආගන්තුක ජවන්කෙණෙහි උපදනා රාගාදි) උපක්ලේශයන්ගෙන් කිලිටි වූයේ ය.

### 1. 5. 10.

මහණෙනි, මේ (භවාඞ්ග) සිත ප්‍රභාස්වර ය, හෙ ද වනාහි ආගන්තුක උපක්ලේශයන්ගෙන් මිදින.

**පස්වන වග යි.**

## 6. පභස්සරවග්ගො

### 1. 6. 1.

පභස්සරමිදං භික්ඛවෙ චිත්තං. තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං. තං අස්සුතවා පුථුජ්ජනො යථාභූතං නප්පජානාති. තස්මා අස්සුතවතො පුථුජ්ජනස්ස චිත්තභාවනා නත්ථීති වදාමීති.

### 1. 6. 2.

පභස්සරමිදං භික්ඛවෙ චිත්තං. තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි විප්පමුත්තං. තං සුතවා අරියසාවකො යථාභූතං පජානාති. තස්මා සුතවතො අරියසාවකස්ස චිත්තභාවනා අත්ථීති වදාමීති.

### 1. 6. 3.

අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු මෙත්තං[1] චිත්තං ආසෙවති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසනකරො ඔවාදපතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති. කො පන වාදො යෙ නං බහුලීකරොන්තීති.

### 1. 6. 4.

අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු මෙත්තං චිත්තං භාවෙති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසනකරො ඔවාදපතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති. කො පන වාදො යෙ නං බහුලීකරොන්තීති.

### 1. 6. 5.

අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු මෙත්තං චිත්තං මනසිකරොති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසනකරො ඔවාදපතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති. කො පන වාදො යෙ නං බහුලීකරොන්තීති.

### 1. 6. 6.

යෙ කෙචි භික්ඛවෙ ධම්මා අකුසලා අකුසලභාගියා අකුසලපක්ඛිකා, සබ්බෙ තෙ මනොපුබ්බඞ්ගමා. මනො තෙසං ධම්මානං පඨමං උප්පජ්ජති, අන්වදෙව අකුසලා ධම්මාති.

### 1. 6. 7.

යෙ කෙචි භික්ඛවෙ ධම්මා කුසලා කුසලභාගියා කුසලපක්ඛිකා, සබ්බෙ තෙ මනොපුබ්බඞ්ගමා. මනො තෙසං ධම්මානං පඨමං උප්පජ්ජති, අන්වදෙව කුසලා ධම්මාති.

---

1. මෙත්තචිත්තං – සයා. මෙත්තාචිත්තං – මජසං

# 6. ප්‍රභාස්වර වර්ගය

## 1. 6. 1.

මහණෙනි, මේ (භවාඞ්ග) සිත ප්‍රභාස්වර ය. එ ද වනාහි ආගන්තුක (ජවන්ක්ෂණෙහි උපදනා රාගාදි) උපක්ලේශයන්ගෙන් කිලිටි වූයේ ය. ශ්‍රැතරහිත පෘථග්ජන තෙමේ එය තත් වූ පරිද්දෙන් නො දනී. එහෙයින් ‘අශ්‍රැතවත් පෘථග්ජනයාහට චිත්තභාවනායෙක් නැතැ’යි කියමි.

## 1. 6. 2.

මහණෙනි, මේ (භවාඞ්ග) සිත ප්‍රභාස්වර ය. එ ද වනාහි ආගන්තුක උපක්ලේශයන්ගෙන් මිදීන. එය ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ තත් වූ පරිද්දෙන් දනී. එහෙයින් ‘ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට චිත්තභාවනාව ඇතැ’යි කියමි.

## 1. 6. 3.

මහණෙනි, ඉදින් මහණ අසුරුසනක් පමණකුදු මෛත්‍රී සිත සෙවුනේ නම්, මහණෙනි, මේ මහණ නොසිස් දුහැන් ඇත්තේ (ඊර්‍ය්‍යාපථවිහරණයෙන්) වෙසේය යි කියනු ලැබේ. ශාස්තෘන් වහන්සේගේ අනුශාසනය කරන්නේ අවවාදය පිළිපදනේ තොසිස් වූ රටඅපිණ්ඩය (රටින් ලත් පිණ්ඩපාතය) වළඳයි. යම් කෙනෙක් එය බහුල වශයෙන් කෙරෙත් නම් (එහි ලා) කවර කථා ද?

## 1. 6. 4.

මහණෙනි, ඉදින් මහණ අසුරුසනක් පමණකුදු මෛත්‍රී සිත වඩා නම්, මහණෙනි, මේ මහණ තොසිස් දුහැන් ඇත්තේ වෙසේය යි කියනු ලැබේ. ශාස්තෘශාසනය කරන්නේ අවවාදය පිළිපදනේ තොසිස් වූ රටඅපිණ්ඩය (රටින් ලත් පිණ්ඩපාතය ) වළඳයි. යම් කෙනෙක් එය බහුල වශයෙන් කෙරෙත් නම්, (එහි ලා) කවර කථා ද?

## 1. 6. 5.

මහණෙනි, ඉදින් මහණ අසුරුසනක් පමණකුදු මෛත්‍රී සිත මෙනෙහි කෙරේ නම්, මහණෙනි, මේ මහණ තොසිස් දුහැන් ඇත්තේ වෙසේය යි කියනු ලැබේ, ශාස්තෘශාසනය කරන්නේ අවවාදය පිළිපදනේ තොසිස් වූ රටඅපිණ්ඩය (රටින් ලත් පිණ්ඩපාතය) වළඳයි. යම් කෙනෙක් එය බහුල වශයෙන් කෙරෙත් නම්, (එහි ලා) කවර කථා ද?

## 1. 6. 6.

මහණෙනි, යම් ධර්ම කෙනෙක් අකුශල වෙත් ද, අකුශලභජනයෙහි, අකුශල පක්ෂයෙහි වැටෙත් ද, ඒහැම ධර්මයෝ සිත පෙරටු කොට ඇත. සිත ඒ ධර්මයනට පළමු උපදනේය. ඒ හා එක්වට ම අකුශලධර්මයෝ උපදිත්.

## 1. 6. 7.

මහණෙනි, යම් කිසි ධර්ම කෙනෙක් කුශල වෙත් ද, කුශලභජන යෙහි, කුශලපක්ෂයෙහි වැටෙත් ද, ඒ සියලු ධර්මයෝ සිත පෙරටු කොට ඇත. සිත ඒ ධර්මයනට පළමු ව උපදනේය. ඒ හා එක්වට ම කුශලධර්මයෝ උපදිත්.

### 1. 6. 8.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ පමාදො. පමත්තස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 6. 9.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ අප්පමාදො. අප්පමත්තස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 6. 10.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ කොසජ්ජං. කුසීතස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

**වග්ගො ඡට්ඨො***

---

## 7. විරියාරම්භවග්ගො

### 1. 7. 1.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ විරියාරම්භො.[1] ආරද්ධවිරියස්ස[2] භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 7. 2.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ මහිච්ඡතා. මහිච්ඡස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 7. 3.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ අප්පිච්ඡතා. අප්පිච්ඡස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

---

* අච්ඡරා සඞ්ඝාතවග්ගො ඡට්ඨො – මජ්සං. 1. විරියාරම්භො - මජ්සං.

2. ආරද්ධ විරියස්ස - මජ්සං.

### 1. 6. 8.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද අකුශලධර්‍මයෝ උපදිත් නම්, උපන්නා වූ ද කුශලධර්‍මයෝ පිරිහෙත් නම්, මහණෙනි, ප්‍රමාදය වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, පමා වූ පුඟුල්හට නූපන්නා වූ ද අකුශල ධර්‍මයෝ උපදිත්, උපන්නා වූද කුශල ධර්‍මයෝ පිරිහෙත්.

### 1. 6. 9.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද කුශලධර්‍මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුශලධර්‍මයෝ පිරිහෙත් නම්, මහණෙනි, අප්‍රමාදය වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, නොපමා පුඟුල්හට නූපන්නා වූ ද කුශලධර්‍මයෝ උපදිත්, උපන්නා වූ ද අකුශලධර්‍මයෝ පිරිහෙත්.

### 1. 6. 10.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද අකුශලධර්‍මයෝ උපදිත් නම්, උපන්නා වූ ද කුශලධර්‍මයෝ පිරිහෙත් නම්, මහණෙනි, කුසීත බව වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, කුසීතයාහට නූපන්නා වූ ද අකුශලධර්‍මයෝ උපදිත්, උපන්නා වූ ද කුශල ධර්‍මයෝ පිරිහෙත්.

සවන වග සි.

---

## 7. වීර්‍ය්‍යාරම්භ වර්‍ගය

### 1. 7. 1.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද කුශලධර්‍මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුශලධර්‍මයෝ පිරිහෙත් නම්, මහණෙනි, වීර්‍ය්‍යා-රම්භය වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, ඇරඹූ වැර ඇත්තාහට නූපන්නා වූ ද කුශලධර්‍මයෝ උපදිත්. උපන්නා වූ ද අකුශල-ධර්‍මයෝ පිරිහෙත්.

### 1. 7. 2.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද අකුශලධර්‍මයෝ උපදිත් නම්, උපන්නා වූ ද කුශල ධර්‍මයෝ පිරිහෙත් නම්, මහණෙනි, මහෙච්ඡතාව බඳු අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, මහෙච්ඡ-පුද්ගලයාහට නූපන්නා වූ ද අකුශල ධර්‍මයෝ උපදිත්, උපන්නා වූ ද කුශල-ධර්‍මයෝ පිරිහෙත්.

### 1. 7. 3.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද කුශලධර්‍මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුශලධර්‍මයෝ පිරිහෙත් නම්, මහණෙනි, අල්පෙච්ඡතාව බඳු අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, අල්පෙච්ඡ-යාහට නූපන්නා වූ ද කුශලධර්‍මයෝ උපදිත්, උපන්නා වූ ද අකුශල-ධර්‍මයෝ පිරිහෙත්.

### 1. 7. 4.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ අසන්තුට්ඨිතා. අසන්තුට්ඨස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 7. 5.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ, සන්තුට්ඨිතා. සන්තුට්ඨස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 7. 6.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරො. අයොනිසො භික්ඛවෙ මනසි-කරොතො අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 7. 7.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො. යොනිසො භික්ඛවෙ මනසි-කරොතො අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 7. 8.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ අසම්පජඤ්ඤං. අසම්පජානස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 7. 9.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ සම්පජඤ්ඤං. සම්පජානස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 7. 10.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ පාපමිත්තතා. පාපමිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

**වග්ගො සත්තමො.***

---

* විරියාරම්භාදිවග්ගො – මජසං

1. 7. 4

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, ලද දෑයින් නොසතුටු බව (ලෝභය) වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, ලද දෑයින් නොසතුටු වන්නාහට නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත්. උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත්.

1. 7. 5.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, ලද දෑයින් සතුටු බව (අලෝභය) බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, ලද දෑයින් සතුටු වන්නාහට නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත්, උපන්නා වූ ද අකුශලධර්මයෝ පිරිහෙත්.

1. 7 6.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, නුනුවණින් මෙනෙහි කිරීම වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, නුනුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත්, උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත්.

1. 7. 7.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, නුවණින් මෙනෙහි කිරීම වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත්, උපන්නා වූ ද අකුශලධර්මයෝ පිරිහෙත්.

1. 7. 8.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, (මෝහ සඞ්ඛ්‍යාත) අසම්පජඤ්ඤය වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, සම්මූඪ පුද්ගලයාහට නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත්, උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත්.

1. 7. 9.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, සම්‍යක්ප්‍රඥාව (තීරණප්‍රඥාව) වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, සම්‍යක්ප්‍රඥායෙන් දක්නාහට නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත්, උපන්නා වූ ද අකුශලධර්මයෝ පිරිහෙත්.

1. 7. 10

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, පාප මිත්‍රතාව වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, පාපමිත්‍රයන් ඇත්තහුට නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත්. උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත්.

සත්වන වග යි.

# 8. කල්‍යාණමිත්තවග්ගො

[සාවත්ථි නිදානං:]

### 1. 8. 1.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 8. 2.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ අනුයොගො අකුසලානං ධම්මානං, අනනුයොගො කුසලානං ධම්මානං. අනුයොගා භික්ඛවෙ අකුසලානං ධම්මානං අනනුයොගා කුසලානං ධම්මානං අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 8. 3.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ අනුයොගො කුසලානං ධම්මානං, අනනුයොගො අකුසලානං ධම්මානං. අනුයොගා භික්ඛවෙ කුසලානං ධම්මානං, අනනුයොගා අකුසලානං ධම්මානං අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

### 1. 8. 4.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා බොජ්ඣඞ්ගා නුප්පජ්ජන්ති, උප්පන්නා වා බොජ්ඣඞ්ගා න භාවනා පාරිපූරිං ගච්ඡන්ති, යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරො. අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව බොජ්ඣඞ්ගා නුප්පජ්ජන්ති, උප්පන්නා ච බොජ්ඣඞ්ගා න භාවනාපාරිපූරිං ගච්ඡන්තීති.

### 1. 8. 5.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා බොජ්ඣඞ්ගා උප්පජ්ජන්ති, උප්පන්නා වා බොජ්ඣඞ්ගා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො. යොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව බොජ්ඣඞ්ගා උප්පජ්ජන්ති, උප්පන්නා ච බොජ්ඣඞ්ගා භාවනාපාරිපූරිං ගච්ඡන්තීති.

### 1. 8. 6.

අප්පමත්තිකා එසා භික්ඛවෙ පරිහානි, යදිදං ඤාතිපරිහානි. එතං පතිකිට්ඨං භික්ඛවෙ පරිහානීනං යදිදං පඤ්ඤාපරිහානීති.

# 8. කල්‍යාණමිත්‍ර වර්ගය

[සැවැත් නිදානයි:]

1. 8. 1.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුශල ධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, කල්‍යාණ-මිත්‍රතාව වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, කලණ මිතුරන් ඇත්තාහට නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත්. උපන්නා වූ ද අකුශල ධර්මයෝ පිරිහෙත්.

1. 8. 2.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, අකුශල ධර්මයන්හි යෙදීම හා (චාතුර්භූමක) කුශලධර්මයන්හි නො යෙදීම ද වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, අකුශලධර්මයන්හි යෙදීමෙනුදු කුශලධර්මයන්හි නොයෙදීමෙනුදු නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත්, උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත්.

1. 8. 3.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, කුශලධර්මයන්හි යෙදීම හා අකුශලධර්මයන්හි නොයෙදීම ද වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, කුශලධර්මයන්හි යෙදීමෙන් හා අකුශල ධර්මයන්හි නො යෙදීමෙන් හා නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත්. උපන්නා වූ ද අකුශලධර්මයෝ පිරිහෙත්.

1. 8. 4.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද බෝධ්‍යඞ්ගධර්මයෝ නූපදිත් නම්, උපන්නා වූ ද බෝධ්‍යඞ්ගධර්මයෝ භාවනායෙන් පිරිපුන් බවට නො යෙත් නම්, මහණෙනි, අයොනිසො මනසිකාරය වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, නුනුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නා වූ ද බෝධ්‍යඞ්ග ධර්මයෝ නූපදිත්. උපන්නා වූ ද බෝධ්‍යඞ්ගධර්මයෝ භාවනායෙන් පිරිපුන් බවට නො යෙත්.

1. 8. 5.

මහණෙනි, යමක් හේතු කොට ගෙණ නූපන්නා වූ ද බෝධ්‍යඞ්ගධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද බෝධ්‍යඞ්ගධර්මයෝ භාවනායෙන් පිරිපුන් බවට යෙත් නම්, මහණෙනි, නුවණින් මෙනෙහි කිරීම වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නාහට නූපන්නා වූ ද බෝධ්‍යඞ්ගධර්මයෝ උපදිත්, උපන්නා වූ ද බෝධ්‍යඞ්ගධර්මයෝ භාවනායෙන් පිරිපුන් බවට යෙත්.

1. 8. 6

මහණෙනි, යම් ඥාති පරිහාණියෙක් වේ නම්, මෙය අල්පමාත්‍ර වූ පරිහාණි යෙකි. මහණෙනි, යම් ප්‍රඥාපරිහාණියෙක් වේ නම්, පිරිහීම් අතුරෙන් නෙල පිරිහීම නිකෘෂට ය.

1. 8. 7.

අප්පමත්තිකා එසා භික්ඛවෙ වුද්ධි, යදිදං ඤාතිවුද්ධි. එතදග්ගං භික්ඛවෙ වුද්ධීනං යදිදං පඤ්ඤාවුද්ධි. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: පඤ්ඤාවුද්ධියා වඩ්ඪිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

1. 8. 8.

අප්පමත්තිකා එසා භික්ඛවෙ පරිහානි, යදිදං භොගපරිහානි. එතං පතිකිට්ඨං භික්ඛවෙ පරිහානීනං යදිදං පඤ්ඤාපරිහානීති.

1. 8. 9.

අප්පමත්තිකා එසා භික්ඛවෙ වුද්ධි, යදිදං භොගවුද්ධි. එතදග්ගං භික්ඛවෙ වුද්ධීනං යදිදං පඤ්ඤාවුද්ධි. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: පඤ්ඤා-වුද්ධියා වඩ්ඪිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

1. 8. 10.

අප්පමත්තිකා එසා භික්ඛවෙ පරිහානි, යදිදං යසොපරිහානි. එතං පතිකිට්ඨං භික්ඛවෙ පරිහානීනං යදිදං පඤ්ඤාපරිහානීති.

1. 8. 11.

අප්පමත්තිකා එසා භික්ඛවෙ වුද්ධි, යදිදං යසොවුද්ධි. එතදග්ගං භික්ඛවෙ වුද්ධීනං යදිදං පඤ්ඤාවුද්ධි. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: පඤ්ඤාවුද්ධියා වඩ්ඪිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

වග්ගො අට්ඨමො*

---

## 9. පමාදවග්ගො

[සාවත්ථි නිදානං:]

1. 9. 1.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යො එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ පමාදො. පමාදො භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

1. 9. 2.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යො එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අප්පමාදො. අප්පමාදො භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

1. 9. 3.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ කොසජ්ජං. කොසජ්ජං භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

---

* කල්‍යාණමිත්තාදිවග්ගො අට්ඨමො - මජ්ඣං.

### 1. 8. 7.

මහණෙනි, යම් ඥාතිවෘද්ධියෙක් වේ නම්, මෙය අල්පමාත්‍ර වෘද්ධියෙක. මහණෙනි, යම් ප්‍රඥායෙන් වැඩීමෙක් වේ නම්, වෘද්ධීන් අතුරෙන් තෙල වෘද්ධිය අග්‍ර වෙයි. මහණෙනි, එහෙයින් මෙහි ලා 'ප්‍රඥාවෘද්ධියෙන් වැඩෙන්නම්හ'යි මෙසේ හික්මිය යුතුයි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි.

### 1. 8. 8.

මහණෙනි, යම් භෝගපරිහාණියෙක් වේ නම්, මේ පරිහාණිය අල්ප මාත්‍ර වූවක. මහණෙනි, යම් ප්‍රඥාපරිහාණියෙක් වේ නම්, පරිහාණීන් අතුරෙන් තෙල පරිහාණිය නිකෘෂ්ට වෙයි.

### 1. 8. 9.

මහණෙනි, යම් භෝගවෘද්ධියෙක් වේ නම්, මෙය අල්පමාත්‍ර වෘද්ධියෙක. මහණෙනි, යම් ප්‍රඥාවෘද්ධියෙක් වේ නම්, වෘද්ධීන් අතුරෙන් තෙල අග්‍ර වෙයි. මහණෙනි, එහෙයින් මෙහිලා 'ප්‍රඥාවෘද්ධියෙන් වැඩෙන්නම්හ'යි මෙසේ හික්මිය යුතුයි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

### 1. 8. 10.

මහණෙනි, යම් යශස් පරිහාණියෙක් වේ නම්, මෙය අල්පමාත්‍ර පරිහාණි යෙක. මහණෙනි, යම් ප්‍රඥාපරිහාණියෙක් වේ නම්, පරිහාණීන් අතුරෙන් තෙල නිකෘෂ්ට වෙයි.

### 1. 8. 11.

මහණෙනි, යම් යශෝවෘද්ධියෙක් වේ නම්, මෙය අල්පමාත්‍ර වෘද්ධියෙක. මහණෙනි, යම් ප්‍රඥාවෘද්ධියෙක් වේ නම්, එය වෘද්ධීන් අතුරෙන් අග්‍ර වෙයි. මහණෙනි, එහෙයින් මෙහි ලා 'ප්‍රඥාවෘද්ධියෙන් වැඩෙන්නම්හ' යි මෙසේ හික්මිය යුතු ය. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

අට වන වග යි.

---

## 9. ප්‍රමාද වර්ගය

[සැවැත් නිදානයි.]

### 1. 9. 1.

මහණෙනි, යමෙක් මෙසේ මහත් වූ අනර්ථය පිණිස පවත්නේ නම්, මහණෙනි, ප්‍රමාදය වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, ප්‍රමාදය මහත් අනර්ථය පිණිස පවත්නේ ය.

### 1. 9. 2.

මහණෙනි, යමෙක් මෙසේ මහත් අර්ථය පිණිස පවත්නේ නම්, මහණෙනි, අප්‍රමාදය වැනි අන් එක ධර්මයකුදු නො දක්මි. මහණෙනි, අප්‍රමාදය මහත් අර්ථය පිණිස පවත්නේය.

### 1. 9. 3.

මහණෙනි, යමෙක් මෙසේ මහත් අනර්ථය පිණිස පවත්නේ නම්, මහණෙනි, කුසීතබව වැනි අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, කුසීතබව මහත් අනර්ථය පිණිස පවත්නේ ය.

### 1. 9. 4.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යො එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ විරියාරම්භො. විරියාරම්භො භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

### 1. 9. 5.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යා එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ මහිච්ඡතා. මහිච්ඡතා භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 9. 6.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යා එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අප්පිච්ඡතා. අප්පිච්ඡතා භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

### 1. 9. 7.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යා එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අසන්තුට්ඨිතා. අසන්තුට්ඨිතා භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 9. 8.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යා එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ සන්තුට්ඨිතා. සන්තුට්ඨිතා භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

### 1. 9. 9

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යො එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරො. අයොනිසො මනසිකාරො භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 9. 10.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යො එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො. යොනිසො මනසිකාරො භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

### 1. 9. 11.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අසම්පජඤ්ඤං. අසම්පජඤ්ඤං භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 9. 12.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ සම්පජඤ්ඤං. සම්පජඤ්ඤං භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

1. 9. 4.

මහණෙනි, යම් ධර්‍මයෙක් මෙසේ මහත් අනර්‍ථය පිණිස පවත්තේ නම්, මහණෙනි, වීර්‍ය්‍යාරම්භය වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, වීර්‍ය්‍යාරම්භය මහත් අර්‍ථය පිණිස පවත්තේ ය.

1. 9. 5.

මහණෙනි, යමක් මහත් අනර්‍ථය පිණිස පවත්නී නම්, මහණෙනි, මහෙච්ඡතා වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, මහෙච්ඡතාව මහත් අනර්‍ථය පිණිස පවත්නී ය.

1. 9. 6.

මහණෙනි, යමක් මෙසේ මහත් අර්‍ථය පිණිස පවත්නී නම්, මහණෙනි, අල්පෙච්ඡතා වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, අල්පෙච්ඡතා මහත් අර්‍ථය පිණිස පවත්නී ය.

1. 9. 7.

මහණෙනි, යමක් මෙසේ මහත් අනර්‍ථය පිණිස පවත්නී නම්, මහණෙනි, අසන්තුෂ්ටිතා බඳු අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, අසන්තුෂ්ටිතා මහත් අනර්‍ථය පිණිස පවත්නී ය.

1. 9. 8.

මහණෙනි, යමක් මෙසේ මහත් අර්‍ථය පිණිස පවත්නී නම්, මහණෙනි, සන්තුෂ්ටිතා බඳු අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, සන්තුෂ්ටි-තා මහත් අර්‍ථය පිණිස පවත්නී ය.

1. 9. 9.

මහණෙනි, යමෙක් මෙසේ මහත් අනර්‍ථය පිණිස පවත්තේ නම්, මහණෙනි, නුනුවණින් මෙනෙහි කිරීම වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, නුනුවණින් මෙනෙහි කිරීම මහත් අනර්‍ථය පිණිස පවත්තේ ය.

1. 9. 10.

මහණෙනි, යමෙක් මෙසේ මහත් අර්‍ථය පිණිස පවත්තේ නම්, මහණෙනි, නුවණින් මෙනෙහි කිරීම වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, නුවණින් මෙනෙහි කිරීම මහත් අර්‍ථය පිණිස පවත්තේ ය.

1. 9. 11.

මහණෙනි, යම් ධර්‍මයෙක් මහත් අනර්‍ථය පිණිස පවත්තේ නම්, මහණෙනි, මෝහ සඞ්ඛ්‍යාත අසම්පජඤ්ඤය වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, අසම්පජඤ්ඤය මහත් අනර්‍ථය පිණිස පවත්තේ ය.

1. 9. 12.

මහණෙනි, යම් ධර්‍මයෙක් මෙසේ මහත් අර්‍ථය පිණිස පවත්තේ නම්, මහණෙනි සම්‍යක් ප්‍රඥාව වැනි අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, සම්‍යක් ප්‍රඥාව මහත් අර්‍ථය පිණිස පවත්නී ය.

### 1. 9. 13.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යා එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ පාපමිත්තතා. පාපමිත්තතා භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 9. 14.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යා එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තතා භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

### 1. 9. 15.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යො එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අනුයොගො අකුසලානං ධම්මානං, අනනුයොගො කුසලානං ධම්මානං. අනුයොගො භික්ඛවෙ අකුසලානං ධම්මානං, අනනුයොගො කුසලානං ධම්මානං මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 9. 16.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යො එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අනුයොගො කුසලානං ධම්මානං, අනනුයොගො අකුසලානං ධම්මානං. අනුයොගො භික්ඛවෙ කුසලානං ධම්මානං, අනනුයොගො අකුසලානං ධම්මානං මහතො අත්ථාය සංවත්තතීති.

**වග්ගො නවමො.***

---

## 10. අජ්ඣත්තිකවග්ගො

**[සංවණ්ණි නිදානං:]**

### 1. 10. 1.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න[1] අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යං එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ පමාදො. පමාදො භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 10. 2.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යං එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අප්පමාදො. අප්පමාදො භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

### 1. 10. 3

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යං එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ කොසජ්ජං. කොසජ්ජං භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

### 1. 10. 4.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යං එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ විරියාරම්භො. විරියාරම්භො භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

* පමාදවග්ගො නවමො - මජසං. 1. නාඤ්ඤං - මජසං.

### 1. 9. 13.

මහණෙනි, යමක් මෙසේ මහත් අනර්ථය පිණිස පවත්නී නම්, මහණෙනි, පාපමිත්‍රතාව බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, පාපමිත්‍රතාව මහත් අනර්ථය පිණිස පවත්නී ය.

### 1. 9. 14.

මහණෙනි, යමක් මෙසේ මහත් අර්ථය පිණිස පවත්නී නම්, මහණෙනි, කල්‍යාණමිත්‍රතාව බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, කල්‍යාණමිත්‍රතාව මහත් අර්ථය පිණිස පවත්නී ය.

### 1. 9. 15.

මහණෙනි, යම් ධර්මයෙක් මෙසේ මහත් අනර්ථය පිණිස පවත්තේ නම්, මහණෙනි, අකුශලධර්මයන්හි යෙදීම හා කුශලධර්මයන්හි නොයෙදීම බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, අකුශලධර්මයන්හි යෙදීම හා කුශලධර්මයන්හි නොයෙදීම ද මහත් අනර්ථය පිණිස පවත්තේ ය.

### 1. 9. 16.

මහණෙනි, යම් ධර්මයෙක් මෙසේ මහත් අර්ථය පිණිස පවත්තේ නම්, මහණෙනි, කුශලධර්මයන්හි යෙදීම හා අකුශලධර්මයන්හි නොයෙදීම බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, කුශලධර්මයන්හි යෙදීම හා අකුශල ධර්මයන්හි නොයෙදීම ද මහත් අර්ථය පිණිස පවත්තේ ය.

**නවවන වග්ග යි**

---

## 10. ආධ්‍යාත්මික වර්ගය.

### 1. 10. 1.

**[සැවැත්නිදානයි:]**

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි (තමා තුළ වැටෙන හෙතුය යි) මෙසේ කොට ගෙණ, (පරඞ්ගසඞ්ඛ්‍යාතබාහිර හේතු හැරපියා බණත් මැ) යමෙක් මෙසේ මහත් වූ අනර්ථය පිණිස පවත්තේ ද, මහණෙනි, ප්‍රමාදය බඳු අන් එක කාරණයකුදු නො දක්මි. මහණෙනි, ප්‍රමාදය මහත් අනර්ථය පිණිස පවත්තේ ය.

### 1. 10. 2.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ, යමෙක් මෙසේ මහත් වූ අර්ථය පිණිස පවත්තේ ද, මහණෙනි, අප්‍රමාදය බඳු අන් එක අඞ්ගයකුදු නො දක්මි. මහණෙනි, අප්‍රමාදය මහත් වූ අර්ථය පිණිස පවත්තේ ය.

### 1. 10. 3.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ, යමෙක් මෙසේ මහත් අනර්ථය පිණිස පවත්තේ ද, මහණෙනි, කුසීත බව බඳු අන් එක ධර්මයකුදු නො දක්මි. මහණෙනි, කුසීතබව මහත් වූ අනර්ථය පිණිස පවත්තේ ය.

### 1. 10. 4.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ, යමෙක් මෙසේ මහත් අර්ථය පිණිස පවත්තේ ද, මහණෙනි, වීර්‍ය්‍යාරම්භය බඳු අන් එක ධර්මයකුදු නො දක්මි. මහණෙනි, වීර්‍ය්‍යාරම්භය මහත් අර්ථය පිණිස පවත්තේය.

## 1. 10. 5.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යා[1] එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ මහිච්ඡතා. මහිච්ඡතා භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

## 1. 10. 6.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යා[1] එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අප්පිච්ඡතා. අප්පිච්ඡතා භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

## 1. 10. 7.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යා[1] එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අසන්තුට්ඨිතා. අසන්තුට්ඨිතා භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

## 1. 10. 8.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යා[1] එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ සන්තුට්ඨිතා. සන්තුට්ඨිතා භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

## 1. 10. 9.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යො[1] එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරො. අයොනිසො මනසිකාරො භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

## 1. 10. 10.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යො[1] එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො. යොනිසො මනසිකාරො භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

## 1. 10. 11.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යං එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අසම්පජඤ්ඤං. අසම්පජඤ්ඤං භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

## 1. 10. 12.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යං එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ සම්පජඤ්ඤං. සම්පජඤ්ඤං භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

---

1. යං - සබ්බත්ථ.

1. 10. 5.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ යමක් මෙසේ මහත් අනර්‍ථය පිණිස පවත්නී ද, මහණෙනි, මහෙච්ඡතාව බඳු අන් එක ධර්‍මයකුදු නො දක්මි. මහණෙනි, මහෙච්ඡතාව මහත් අනර්‍ථය පිණිස පවත්නී ය.

1. 10. 6.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ යමක් මෙසේ මහත් අර්‍ථය පිණිස පවත්නී ද, මහණෙනි, අල්පෙච්ඡතාව බඳු අන් එක ධර්‍මයකුදු නො දක්මි. මහණෙනි, අල්පෙච්ඡතාව මහත් අර්‍ථය පිණිස පවත්නී ය.

1. 10. 7.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ යමක් මෙසේ මහත් අනර්‍ථය පිණිස පවත්නී ද, මහණෙනි, අසන්තුට්ඨිතාව බඳු අන් එක ධර්‍මය කුදු නො දක්මි. මහණෙනි, අසන්තුට්ඨිතාව මහත් අනර්‍ථය පිණිස පවත්නී ය.

1. 10. 8.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ යමක් මෙසේ මහත් අර්‍ථය පිණිස පවත්නී ද, මහණෙනි, සන්තුට්ඨිතාව බඳු අන් එක ධර්‍මයකුදු නො දක්මි. මහණෙනි, සන්තුට්ඨිතාව මහත් අර්‍ථය පිණිස පවත්නී ය.

1. 10. 9.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ යමෙක් මෙසේ මහත් අනර්‍ථය පිණිස පවත්නේ ද, මහණෙනි, අයෝනිසො මනසිකාරය බඳු අන් එක ධර්‍මයකුදු නො දක්මි. මහණෙනි, අයෝනිසො මනසිකාරය මහත් අනර්‍ථය පිණිස පවත්නේ ය.

1. 10. 10.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ යමෙක් මෙසේ මහත් අර්‍ථය පිණිස පවත්නේ ද, මහණෙනි, යෝනිසො මනසිකාරය බඳු අන් එක ධර්‍මයකුදු නො දක්මි. මහණෙනි, යෝනිසො මනසිකාරය මහත් අර්‍ථය පිණිස පවත්නේ ය.

1. 10. 11.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ යමෙක් මෙසේ මහත් අනර්‍ථය පිණිස පවත්නේ ද, මහණෙනි, අසම්පජඤ්ඤය බඳු අන් එක ධර්‍මයකුදු නො දක්මි. මහණෙනි, අසම්පජඤ්ඤය මහත් අනර්‍ථය පිණිස පවත්නේ ය.

1. 10. 12.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ යමෙක් මෙසේ මහත් අර්‍ථය පිණිස පවත්නේ ද, මහණෙනි, සම්පජඤ්ඤය බඳු අන් එක ධර්‍මයකුදු නො දක්මි. මහණෙනි, සම්පජඤ්ඤය මහත් අර්‍ථය පිණිස පවත්නේ ය.

## 1. 10. 13.

බාහිරං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යා[1] එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ පාපමිත්තතා. පාපමිත්තතා භික්ඛවෙ මහතො අනත්ථාය සංවත්තතීති.

## 1. 10. 14.

බාහිරං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යා[1] එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තතා භික්ඛවෙ මහතො අත්ථාය සංවත්තතීති.

## 1. 10. 15.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යො එවං මහතො අනත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අනුයොගො අකුසලානං ධම්මානං, අනනුයොගො කුසලානං ධම්මානං. අනුයොගො භික්ඛවෙ අකුසලානං ධම්මානං, අනනුයොගො කුසලානං ධම්මානං මහතො අනත්ථාය සංවත්තතීති.

## 1. 10. 16.

අජ්ඣත්තිකං භික්ඛවෙ අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි, යො එවං මහතො අත්ථාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අනුයොගො කුසලානං ධම්මානං, අනනුයොගො අකුසලානං ධම්මානං. අනුයොගො භික්ඛවෙ කුසලානං ධම්මානං, අනනුයොගො අකුසලානං ධම්මානං මහතො අත්ථාය සංවත්තතීති.

## 1. 10. 17.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යො එවං සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති, යථයිදං භික්ඛවෙ පමාදො. පමාදො භික්ඛවෙ සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තතීති.

## 1. 10. 18.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යො එවං සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අප්පමාදො. අප්පමාදො භික්ඛවෙ සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තතීති.

## 1. 10. 19.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං[2] එවං සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති, යථයිදං භික්ඛවෙ කොසජ්ජං. කොසජ්ජං භික්ඛවෙ සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තතීති.

---

1. යං - සබ්බත්ථ   2. යො - සබ්බත්ථ.

## 1. 10. 13.

මහණෙනි, 'බාහිර අඞ්ගය' යි කොට ගෙණ යමක් මෙසේ මහත් අනර්ථය පිණිස පවත්නී ද, මහණෙනි, පාපමිත්‍රතාව බඳු අන් එක අඞ්ගයකුදු නො දක්මි. මහණෙනි, පාපමිත්‍රතාව මහත් අනර්ථය පිණිස පවත්නී ය.

## 1. 10. 14.

මහණෙනි, 'බාහිර අඞ්ගය' යි කොට ගෙණ යමක් මෙසේ මහත් අර්ථය පිණිස පවත්නී ද, මහණෙනි, කල්‍යාණමිත්‍රතාව බඳු අන් එක අඞ්ගයකුදු නො දක්මි. මහණෙනි, කල්‍යාණමිත්‍රතාව මහත් අර්ථය පිණිසපවත්නී ය.

## 1. 10. 15.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ යමෙක් මෙසේ මහත් අනර්ථය පිණිස පවත්තේ ද, මහණෙනි, අකුශලධර්මයන්හි යෙදීම හා කුශල-ධර්මයන්හි නොයෙදීම බඳු අන් එක අඞ්ගයකුදු නො දක්මි. මහණෙනි, අකුශලධර්මයන්හි යෙදීම හා කුශලධර්මයන්හි නො යෙදීම මහත් අනර්ථය පිණිස පවත්තේ ය.

## 1. 10. 16.

මහණෙනි, 'ආධ්‍යාත්මික අඞ්ගය' යි කොට ගෙණ යමෙක් මෙසේ මහත් අර්ථය පිණිස පවත්තේ ද, මහණෙනි, කුශලධර්මයන්හි යෙදීම හා අකුශල-ධර්මයන්හි නොයෙදීම බඳු අන් එක අඞ්ගයකුදු මම නොදක්මි. මහණෙනි, කුශලධර්මයන්හි යෙදීම හා අකුශලධර්මයන්හි නො යෙදීම මහත් අර්ථය පිණිස පවත්තේ ය.

## 1. 10. 17.

මහණෙනි, යමෙක් මෙසේ සද්ධර්මයාගේ විනාශය පිණිස අන්තර්ධානය පිණිස පවත්තේ ද, මහණෙනි, ප්‍රමාදය බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, ප්‍රමාදය සද්ධර්මයාගේ විනාශය පිණිස අන්තර්ධානය පිණිස පවත්තේ ය.

## 1. 10. 18.

මහණෙනි, යමෙක් මෙසේ සද්ධර්මයාගේ පැවැත්ම පිණිස අවිනාශය පිණිස අතුරුදන් නොවීම පිණිස පවත්තේ ද, මහණෙනි, අප්‍රමාදය බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, අප්‍රමාදය සද්ධර්මයාගේ පැවැත්ම පිණිස අවිනාශය පිණිස අතුරුදන් නො වීම පිණිස පවත්තේ ය.

## 1. 10. 19.

මහණෙනි, යමෙක් මෙසේ සද්ධර්මයාගේ ප්‍රමෝෂය පිණිස අන්තර්ධානය පිණිස පවත්තේ ද, මහණෙනි, කුසීත බව බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, කුසීත බව සද්ධර්මයාගේ ප්‍රමෝෂය පිණිස අන්තර්ධානය පිණිස පවත්තේ ය.

## 1. 10. 20.

නාහං භික්ඛවෙ අඤ්ඤං ඒකධම්මම්පි සමනුපස්සාමි, යො එවං සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති, යථයිදං භික්ඛවෙ විරියාරම්භො. විරියාරම්භො භික්ඛවෙ සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තතීති.

## 1. 10. 21—30.

නාහං භික්ඛවෙ අඤ්ඤං ඒකධම්මම්පි සමනුපස්සාමි, යා එවං සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති, යථයිදං භික්ඛවෙ මහිච්ඡතා -පෙ- අප්පිච්ඡතා -පෙ- අසන්තුට්ඨිතා -පෙ- සන්තුට්ඨිතා -පෙ- අයොනිසො මනසිකාරො -පෙ- යොනිසො මනසිකාරො -පෙ- අසම්පජඤ්ඤං -පෙ- සම්පජඤ්ඤං -පෙ- පාපමිත්තතා -පෙ- කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තතා භික්ඛවෙ සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තතීති.

## 1. 10. 31.

නාහං භික්ඛවෙ අඤ්ඤං ඒකධම්මම්පි සමනුපස්සාමි, යො එවං සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අනුයොගො අකුසලානං ධම්මානං, අනනුයොගො කුසලානං ධම්මානං. අනුයොගො භික්ඛවෙ අකුසලානං ධම්මානං, අනනුයොගො කුසලානං ධම්මානං සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තතීති.

## 1. 10. 32.

නාහං භික්ඛවෙ අඤ්ඤං ඒකධම්මම්පි සමනුපස්සාමි, යො එවං සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තති, යථයිදං භික්ඛවෙ අනුයොගො කුසලානං ධම්මානං, අනනුයොගො අකුසලානං ධම්මානං. අනුයොගො භික්ඛවෙ කුසලානං ධම්මානං, අනනුයොගො අකුසලානං ධම්මානං සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තතීති.

**චතුක්කොටිකං නිට්ඨිතං.**[1]

## 1. 10. 33.

යෙ[2] තෙ භික්ඛවෙ භික්ඛූ අධම්මං ධම්මොති දීපෙන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනාහිතාය[3] පටිපන්නා බහුජනාසුඛාය[4] බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ අපුඤ්ඤං පසවන්ති, තෙවිමං සද්ධම්මං අන්තරධාපෙන්තීති.

1. චතුක්කොටිකං නිට්ඨිතං - මජසං 2. යෙපි - සයා. 3. බහුජන අහිතාය - මජසං.
4. බහුජන අසුඛාය - මජසං

### 1. 10. 20.

මහණෙනි, යමෙක් මෙසේ සද්ධර්මයාගේ පැවැත්ම පිණිස අප්‍රමෝෂය පිණිස අතුරුදන් නො වීම පිණිස පවත්නේ ද, මහණෙනි, වීර්‍ය්‍යාරම්භය බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, වීර්‍ය්‍යාරම්භය සද්ධර්මයාගේ පැවැත්ම පිණිස අප්‍රමෝෂය පිණිස අතුරුදන් නොවීම පිණිස පවත්නේ ය.

### 1. 10. 21—30.

මහණෙනි, යමක් මෙසේ සද්ධර්මයාගේ ප්‍රමෝෂය පිණිස අතුරුදන් වීම පිණිස පවත්නී ද, මහණෙනි, මහේච්ඡතාව බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. ... අල්පේච්ඡතාව ... අසන්තුට්ඨිතාව ... සන්තුට්ඨිතාව ... අයෝනිසෝමනසිකාරය ... යෝනිසෝමනසිකාරය ... අසම්පජඤ්ඤය ... සම්පජඤ්ඤය ... පාපමිත්‍රයන් ඇති බව ... කල්‍යාණමිත්‍රයන් ඇති බව. මහණෙනි, කල්‍යාණමිත්‍රතාව සද්ධර්මයාගේ සචිතිය පිණිස අප්‍රමෝෂය පිණිස අතුරුදන් නොවීම් පිණිස පවත්නේ ය.

### 1. 10. 31.

මහණෙනි, යමෙක් මෙසේ සද්ධර්මයාගේ ප්‍රමෝෂය පිණිස අන්තර්ධානය පිණිස පවත්නේ ද, මහණෙනි, අකුශලධර්මයන්හි යෙදීම හා කුශලධර්මයන්හි නොයෙදීම බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, අකුශල-ධර්මයන්හි යෙදීම හා කුශල ධර්මයන්හි නො යෙදීම සද්ධර්මයාගේ ප්‍රමෝෂය පිණිස අතුරුදන්වීම පිණිස පවත්නේ ය.

### 1. 10. 32.

මහණෙනි, යමෙක් මෙසේ සද්ධර්මයාගේ ස්ථිතිය පිණිස අප්‍රමෝෂය පිණිස අතුරුදන් නොවීම පිණිස පවත්නේ ද මහණෙනි, කුශලධර්මයන්හි යෙදීම හා අකුශලධර්මයන්හි නොයෙදීම බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, කුශලධර්මයන්හි යෙදීම හා අකුශලධර්මයන්හි නො යෙදීම සද්ධර්ම යාගේ සචිතිය පිණිස අප්‍රමෝෂය පිණිස අතුරුදන් නොවීම පිණිස පවත්නේ ය.

**චතුකොටිකය නිමි.**

### 1. 10. 33.

මහණෙනි, යම් ම මහණ කෙනෙක් (ඒ ඒ ධර්මප්‍රදෙශ ඌනතාධිකවශයෙන් ගෙණ) අධර්මය ධර්මය යි ප්‍රකාශ කෙරෙත් ද, මහණෙනි, ඒ මහණහු බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නො සුව පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙවිමිනිසුනට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නාහු වෙති. මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ පව් ද උදු කෙරෙති. ඔහු ම මේ සද්ධර්මය අතුරුදන් කෙරෙත්.

### 1. 10. 34—42.

යෙ තෙ භික්ඛවෙ භික්ඛූ ධම්මං අධම්මොති දීපෙන්ති -පෙ- අවිනයං විනයොති දීපෙන්ති -පෙ- විනයං අවිනයොති දීපෙන්ති -පෙ- අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති -පෙ- භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති -පෙ- අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති -පෙ- ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති -පෙ- අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති -පෙ- පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනාහිතාය පටිපන්නා බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ අපුඤ්ඤං පසවන්ති. තෙචිමං[1] සද්ධම්මං අන්තරධාපෙන්තීති.

**වග්ගො දසමො.**

---

## 11. අධම්මවග්ගො

### 1. 11. 1.

[**සාවත්ථිනිදානං:**]

යෙ තෙ භික්ඛවෙ භික්ඛූ අධම්මං අධම්මොති දීපෙන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජන හිතාය පටිපන්නා බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ පුඤ්ඤං පසවන්ති. තෙචිමං[1] සද්ධම්මං ඨපෙන්තීති.

### 1. 11. 2—10.

යෙ තෙ භික්ඛවෙ භික්ඛූ ධම්මං ධම්මොති දීපෙන්ති -පෙ- අවිනයං අවිනයොති දීපෙන්ති -පෙ- විනයං විනයොති දීපෙන්ති -පෙ- අභාසිතං අලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති -පෙ- භාසිතං ලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති -පෙ- අනාචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති -පෙ- ආචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති -පෙ- අපඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති -පෙ- පඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනහිතාය පටිපන්නා බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ පුඤ්ඤං පසවන්ති. තෙචිමං[1] සද්ධම්මං ඨපෙන්තීති.

**වග්ගො එකාදසමො.**[2]

---

1. තෙපිමං-සීමු. තෙචිමං-ස්‍යා. මජසං. PTS. 2. අධම්මවග්ගො එකාදසමො - මජසං.

### 1. 10. 34—42.

මහණෙනි, යම් ම මහණ කෙනෙක් ධර්‍මය අධර්‍මය යි ප්‍රකාශ කෙරෙත් ද.... අවිනය විනය යි ප්‍රකාශ කෙරෙත් ද ... විනය අවිනය යි ප්‍රකාශ කෙරෙත් ද ... තථාගතයන් වහන්සේ විසින් නොදෙසන ලද්ද නොතෙපලන ලද්ද තථාගතයන් වහන්සේ විසින් දෙසන ලදැයි තෙපලන ලදැයි ප්‍රකාශ කෙරෙත් ද ... තථාගතයන් වහන්සේ විසින් දෙසන ලද්ද තෙපලන ලද්ද තථාගතයන් වහන්සේ විසින් නොදෙසන ලදැයි නොතෙපලන ලදැයි ප්‍රකාශ කෙරෙත් ද ... තථාගතයන් වහන්සේ විසින් නොපුරුදු කරණ ලද්ද තථාගතයන් වහන්සේ විසින් පුරුදු කරණ ලදැයි ප්‍රකාශ කෙරෙත් ද...තථාගත යන් වහන්සේ විසින් පුරුදු කරණ ලද්ද තථාගතයන් වහන්සේ විසින් පුරුදු නො කරණ ලදැයි ප්‍රකාශ කෙරෙත් ද ... තථාගතයන් වහන්සේ විසින් නො පණවන ලද්ද තථාගතයන් වහන්සේ විසින් පණවන ලදැයි ප්‍රකාශ කෙරෙත් ද ... තථාගතයන් වහන්සේ විසින් පණවන ලද්ද තථාගතයන් වහන්සේ විසින් නොපණවන ලදැයි ප්‍රකාශ කෙරෙත් ද ... මහණෙනි, ඒ මහණහු බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නො සුව පිණිස බොහෝ දෙනාට අනර්‍ථ පිණිස දෙවිමිනිසුනට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නාහු වෙති. මහණෙනි, ඒ මහණහු බොහෝ පව් ද උදා කෙරෙති. ඔහු ම මේ සද්ධර්‍මය අතුරුදන් කෙරෙත්.

**දසවන වග යි.**

---

## 11. අධම්ම වග්ගය.

**[සැවැත් නිදානයි:]**

### 1. 11. 1.

මහණෙනි, යම් ම මහණ කෙනෙක් අධර්‍මය අධර්‍මය යි දක්වත් ද, මහණෙනි, ඒ මහණහු බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට වැඩ පිණිස දෙවිමිනිස්නට හිත පිණිස සුව පිණිස පිළිපන්නාහු වෙති. මහණෙනි, ඒ මහණහු බොහෝ පින් ද උපදවත්. ඔහු ම මේ සද්ධර්‍මය තබත්.

### 1. 11. 2—10.

මහණෙනි, යම් ම මහණ කෙනෙක් ධර්‍මය ධර්‍මය යි (යථාවිධියෙන් ගෙණ) දක්වත් ද ..., අවිනය අවිනය යි දක්වත් ද ..., විනය විනය යි දක්වත් ද ..., තථාගතයන් වහන්සේ විසින් නොදෙසන ලද්ද නොතෙපලන ලද්ද තථාගතයන් වහන්සේ විසින් නොදෙසන ලදැයි නොතෙපලන ලදැයි දක්වත් ද ..., තථාගතයන් වහන්සේ විසින් දෙසන ලද්ද තෙපලන ලද්ද තථාගතයන් වහන්සේ විසින් දෙසන ලදැයි තෙපලන ලදැයි දක්වත් ද..., තථාගතයන් වහන්සේ විසින් පුරුදු නො කරණ ලද්ද තථාගතයන් වහන්සේ විසින් පුරුදු නො කරණ ලදැයි දක්වත් ද ..., තථාගතයන් වහන්සේ විසින් පුරුදු කරණ ලද්ද තථාගතයන් වහන්සේ විසින් පුරුදු කරණ ලදැයි දක්වත් ද ..., තථාගතයන් වහන්සේ විසින් නො පණවන ලද්ද තථාගතයන් වහන්සේ විසින් නො පණවන ලදැයි දක්වත් ද..., තථාගතයන් වහන්සේ විසින් පණවන ලද්ද තථාගතයන් වහන්සේ විසින් පණවන ලදැයි දක්වත් ද..., මහණෙනි, ඒ මහණහු බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට වැඩ පිණිස දෙවිමිනිස්නට හිත පිණිස සුව පිණිස පිළිපන්නාහු වෙති. මහණෙනි, ඒ මහණහු බොහෝ පින් ද උපදවත්. ඔහු ම මේ සද්ධර්‍මය තබත්.

**එකොළොස් වන වග යි.**

# 12. අනාපත්තිවග්ගො

## 1. 12. 1—10.

[සාවත්ථිනිදානං:]

යෙ තෙ භික්ඛවෙ භික්ඛූ අනාපත්තිං ආපත්තීති දීපෙන්ති -පෙ- ආපත්තිං අනාපත්තීති දීපෙන්ති -පෙ- ලහුකං ආපත්තිං ගරුකා ආපත්තීති දීපෙන්ති -පෙ- ගරුකං අපත්තිං ලහුකා ආපත්තීති දීපෙන්ති -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති -පෙ- අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති -පෙ- සාවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙන්ති -පෙ- අනවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙන්ති -පෙ- සප්පටිකම්මං ආපත්තිං අප්පටිකම්මා ආපත්තීති දීපෙන්ති -පෙ- අප්පටිකම්මං ආපත්තිං සප්පටිකම්මා ආපත්තීති දීපෙන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනාහිතාය පටිපන්නා බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ අපුඤ්ඤං පසවන්ති. තෙවිමං සද්ධම්මං අන්තරධාපෙන්තීති.

## 1. 12. 11—20.

යෙ තෙ භික්ඛවෙ භික්ඛූ අනාපත්තිං අනාපත්තීති දීපෙන්ති -පෙ- ආපත්තිං ආපත්තීති දීපෙන්ති -පෙ- ලහුකං ආපත්තිං ලහුකා ආපත්තීති දීපෙන්ති -පෙ- ගරුකං ආපත්තිං ගරුකා ආපත්තීති දීපෙන්ති -පෙ- [දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති] -පෙ- අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති -පෙ- සාවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙන්ති -පෙ- අනවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙන්ති -පෙ- සප්පටිකම්මං ආපත්තිං සප්පටිකම්මා ආපත්තීති දීපෙන්ති -පෙ- අප්පටිකම්මං ආපත්තිං අප්පටිකම්මා ආපත්තීති දීපෙන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනහිතාය පටිපන්නා බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ පුඤ්ඤං පසවන්ති. තෙවිමං සද්ධම්මං ඨපෙන්තීති.

**වග්ගො ද්වාදසමො**

---

# 13. එකපුග්ගලවග්ගො

## 1. 13. 1.

[සාවත්ථිනිදානං:]

එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය[1] අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමො එකපුග්ගලො: තථාගතො අරහං සම්මාසම්බුද්ධො. අයං ඛො භික්ඛවෙ එකපුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

---

1. ලොකානුකම්පකාය - අට්ඨකථා [-] අන්තරිතපාඨො - සීමු. පොත්ථකෙ න දිස්සතෙ.

## 12. අනාපත්ති වග්ගය

[සැවැත් නිදානයි:]

### 1. 12. 1—10.

මහණෙනි, යම් ම මහණ කෙනෙක් නොඇවැත ඇවැතැයි දක්වත් ද ..., ඇවැත නොඇවැතැයි දක්වත් ද ..., ලුහු ඇවැත ගුරු ඇවැතැයි දක්වත් ද ..., ගුරු ඇවැත ලුහු ඇවැතැයි දක්වත් ද ..., දුළුල් ඇවැත නොදුළුල් ඇවැතැයි දක්වත් ද ..., නොදුළුල් ඇවැත දුළුල් ඇවැතැයි දක්වත් ද ..., සාවශෙෂ ඇවැත අනවශෙෂ ඇවැතැයි දක්වත් ද ..., අනවශෙෂ ඇවැත සාවශෙෂ ඇවැතැයි දක්වත් ද ..., පිළියම් සහිත ඇවැත පිළියම් රහිත ඇවැතැයි දක්වත් ද ..., පිළියම් රහිත ඇවැත පිළියම් සහිත ඇවැතැයි දක්වත් ද..., මහණෙනි, ඒ මහණ හු බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නො සුව පිණිස බොහෝ දෙනාට නො වැඩ පිණිස දෙව්මිනිස්නට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නාහු වෙති. මහණෙනි, ඒ මහණහු බොහෝ පව් ද රැස් කෙරෙති. ඔහු ම මේ සද්ධර්මය අතුරුදන් කෙරෙත්.

### 1. 12. 11-20.

මහණෙනි, යම් ම මහණ කෙනෙක් නො ඇවැත නො ඇවැතැයි දක්වත් ද ..., ඇවැත ඇවැතැයි දක්වත් ද ..., ලුහු ඇවැත (පස්ඇවැත්කඳු) ලුහු ඇවැතැයි දක්වත් ද ..., ගුරු ඇවැත (දෙඇවැත්කඳු) ගුරු ඇවැතැයි දක්වත් ද ..., දුළුල් ඇවැත දුළුල් ඇවැතැයි දක්වත් ද ..., නො දුළුල් ඇවැත නො දුළුල් ඇවැතැයි දක්වත් ද ..., සාවශෙෂ ඇවැත සාවශෙෂ ඇවැතැයි දක්වත් ද ..., අනවශෙෂ ඇවැත (පරිජිඇවැත) අනවශෙෂ ඇවැතැයි දක්වත් ද .., පිළියම් සහිත ඇවැත පිළියම් සහිත ඇවැතැයි දක්වත් ද ..., පිළියම් රහිත ඇවැත (පරිජිඇවැත) පිළියම් රහිත ඇවැතැයි දක්වත් ද ..., මහණෙනි, ඒ මහණහු බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට වැඩ පිණිස දෙව්මිනිස්නට හිත සුව පිණිස පිළිපන්නාහු වෙති. මහණෙනි, ඒ මහණහු බොහෝ පින් ද උපදා කෙරෙත්. ඔහු ම මේ ශාසනය තබත්.

**දොළොස්වන වග යි.**

---

## 13. ඒකපුග්ගල වග්ගය

[සැවැත් නිදානයි:]

### 1. 13. 1.

මහණෙනි, එක් පුද්ගලයෙක් ලොවැ (සත්ත්වලොකයෙහි = මිනිස්ලොවැ) උපදනට සමත් වූයේ බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිස්නට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස (අභීතඵලසාක්ෂණයෙහි) උපන්නේ වෙයි. කවර එක් පුද්ගලයෙක යත්: තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ය. මහණෙනි, මේ එක් පුද්ගලයා වනාහි ලොවැ උපදනට සමත් වූයේ බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිස්නට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස උපන්නේ වෙයි.

## 1. 13. 2.

එකපුග්ගලස්ස භික්ඛවෙ පාතුභාවො දුල්ලභො ලොකස්මිං. කතමස්ස එකපුග්ගලස්ස: තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස. ඉමස්ස ඛො භික්ඛවෙ එකපුග්ගලස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මින්ති.

## 1. 13. 3.

එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති අච්ඡරියමනුස්සො. කතමො එකපුග්ගලො: තථාගතො අරහං සම්මාසම්බුද්ධො. අයං ඛො භික්ඛවෙ එකපුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති අච්ඡරියමනුස්සොති.

## 1 13. 4.

එකපුග්ගලස්ස භික්ඛවෙ කාලකිරියා බහුනො ජනස්ස අනුතප්පා[1] හොති. කතමස්ස එකපුග්ගලස්ස: තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස. ඉමස්ස ඛො භික්ඛවෙ එකපුග්ගලස්ස කාලකිරියා බහුනො ජනස්ස අනුතප්පා හොතීති.

## 1. 13. 5—13

එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති අදුතියො අසහායො, අප්පටිමො, අප්පටිසමො, අප්පටිභාගො, අප්පටිපුග්ගලො, අසමො අසමසමො, දිපදානං අග්ගො. කතමො එකපුග්ගලො: තථාගතො අරහං සම්මාසම්බුද්ධො. අයං ඛො භික්ඛවෙ එකපුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති අදුතියො, අසහායො, අප්පටිමො, අප්පටිසමො, අප්පටිභාගො, අප්පටි පුග්ගලො, අසමො, අසමසමො, දිපදානං අග්ගොති.

## 1. 13. 14—25.

එකපුග්ගලස්ස භික්ඛවෙ පාතුභාවා මහතො චක්ඛුස්ස පාතුභාවො හොති, මහතො ආලොකස්ස පාතුභාවො හොති, මහතො ඔභාසස්ස පාතුභාවො හොති, ඡන්නං අනුත්තරියානං පාතුභාවො හොති, චතුන්නං පටිසම්භිදානං සච්ඡිකිරියා හොති, අනෙකධාතුපටිවෙධො හොති, නානාධාතුපටිවෙධො හොති, විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියා හොති, සොතාපත්තිඵලසච්ඡිකිරියා හොති, සකදාගාමිඵලසච්ඡිකිරියා හොති, අනාගාමිඵලසච්ඡිකිරියා හොති, අරහත්තඵලසච්ඡිකිරියා හොති. කතමස්ස එකපුග්ගලස්ස: තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස. ඉමස්ස ඛො භික්ඛවෙ එකපුග්ගලස්ස පාතුභාවා මහතො චක්ඛුස්ස පාතුභාවො හොති, මහතො ආලොකස්ස පාතුභාවො හොති, මහතො ඔභාසස්ස පාතුභාවො හොති, ඡන්නං අනුත්තරියානං පාතුභාවො හොති, චතුන්නං පටිසම්භිදානං සච්ඡිකිරියා හොති, අනෙක ධාතුපටිවෙධො හොති, නානාධාතුපටිවෙධො හොති, විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියා හොති, සොතාපත්තිඵලසච්ඡිකිරියා හොති, සකදාගාමිඵලසච්ඡිකිරියා හොති, අනාගාමිඵලසච්ඡිකිරියා හොති, අරහත්තඵලසච්ඡිකිරියා හොතීති.

---

1. ආනුතප්පා - සෑඑවි.

## 1. 13. 2.

**මහණෙනි, එක් පුද්ගලයක්හුගේ** ඉපැද්ම ලොව දුර්ලභ ය. කවර එක් **පුද්ගලයක්හුගේ ය? යත්: තථාගත අර්හත් සම්‍යක්** සම්බුද්ධයන්වහන්සේගේ ය. මහ**ණෙනි, මේ එක් පුද්ගලයාගේ** ඉපැද්ම ලොව දුර්ලභ ය.

## 1. 13. 3.

**මහණෙනි, එක් පුද්ගලයෙක්** ලොව උපදනට සමත් වූයේ ආශ්චර්‍ය්‍ය **මනුෂ්‍ය ව උපන්නේ වෙයි.** කවර එක් පුද්ගලයෙක යත්: තථාගත අර්හත් **සම්‍යක් සම්බුද්ධයන්** වහන්සේ ය. මහණෙනි, මේ එක් පුද්ගලයා වනාහි ලොව **උපදනට සමත් වූයේ** අශ්චර්‍ය්‍ය මනුෂ්‍ය ව උපන්නේ වෙයි.

## 1. 13. 4.

**මහණෙනි,** එක් පුද්ගලයක්හුගේ කාලක්‍රියාව බොහෝ දෙනාට අනුතාප **කර** වෙයි. කවර එක් පුද්ගලයක්හුගේ ය? යත්: තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ (කාලක්‍රියා) ය. මහණෙනි, මේ එක් පුද්ගලයාගේ කාලක්‍රියාව බොහෝ දෙනාට අනුතාපකර (චෙතොදුඃඛාවහ) වෙයි.

## 1. 13. 5—13.

මහණෙනි, එක් පුද්ගලයෙක් ලොව උපදනට පොහොනේ අද්විතීය ව, අසහාය ව, අප්‍රතිම ව, අප්‍රතිසම ව, අප්‍රතිභාග ව, අප්‍රතිපුද්ගල ව, අසම ව, අසමසම ව, දෙපා ඇතියනට අග්‍ර ව උපන්නේවෙයි. කවර එක් පුද්ගලයෙක යත්: තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ය. මහණෙනි, මේ එක් පුද්ගල තෙමේ වනාහි ලොව උපදනට පොහොනේ අද්විතීය ව, අසහාය ව, අප්‍රතිම ව, අප්‍රතිසම ව, අප්‍රතිභාග ව, අප්‍රතිපුද්ගල ව, අසම ව, අසමසම ව, දෙපා ඇතියනට අග්‍ර ව උපන්නේ වෙයි.

## 1. 13. 14—25.

මහණෙනි, එක් පුද්ගලයක්හුගේ නිෂ්පත්තිය හේතු කොට ගෙණ මහත් වූ ප්‍රඥාචක්ෂුස්හුගේ පහළ වීම වෙයි, මහත් වූ ප්‍රඥාලෝකයක්හුගේ පහළ වීම වෙයි, මහත් වූ ප්‍රඥාවභාසයක්හුගේ පහළ වීම වෙයි, අනුත්තරියධර්මයන් සදෙනාගේ පහළ වීම වෙයි, සිව්පිළිසැඹියාවන්ගේ පසක් කිරීම වෙයි, (අටළොස් වැදෑරුම්) අනෙක ධාතූන්ගේ ප්‍රතිවෙධය වෙයි, (අටළොස් වැදෑරුම්) නානාධාතූන්ගේ ප්‍රතිවෙධය වෙයි, විද්‍යාවිමුක්තිඵලයන්ගේ සාක්ෂාත් කිරීම වෙයි, ස්‍රොතාපත්ති ඵලයාගේ සාක්ෂාත් කිරීම වෙයි, සකෘදාගාමි ඵලයාගේ සාක්ෂාත් කිරීම වෙයි, අනාගාමි ඵලයාගේ සාක්ෂාත් කිරීම වෙයි, අර්හත්ත්ව ඵලයාගේ සාක්ෂාත් කිරීම වෙයි, කවර එක් පුද්ගලයක්හුගේය? යත්: තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ය. මහණෙනි, මේ එක් පුද්ගලයාගේ නිෂ්පත්තියෙන් මහත් වූ ප්‍රඥාචක්ෂුස්හුගේ පහළ වීම වෙයි, මහත් වූ ප්‍රඥා-ලොකයාගේ පහළ වීම වෙයි, මහත් වූ ප්‍රඥාවභාසයාගේ පහළ වීම වෙයි, අනුත්තරිය ධර්මයන් සදෙනාගේ පහළ වීම වෙයි, සිව්පිළිසැඹියාවන්ගේ සාක්ෂාත් කිරීම වෙයි, අනෙකධාතු ප්‍රතිවෙධය වෙයි, නානාධාතුප්‍රතිවෙධය වෙයි, විද්‍යාවිමුක්තිඵලයාගේ සාක්ෂාත් කිරීම වෙයි, ස්‍රොතාපත්ති ඵලයාගේ සාක්ෂාත් කිරීම වෙයි.සකෘදාගාමි ඵලයාගේ සාක්ෂාත් කිරීම වෙයි, අනාගාමි ඵලයාගේ සාක්ෂාත් කිරීම වෙයි, අර්හත්ත්වඵලයාගේ සාක්ෂාත් කිරීම වෙයි.

**1. 13. 26.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකපුග්ගලම්පි සමනුපස්සාමි, යො එවං තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතං සම්මදෙව අනුප්පවත්තෙති, යථයිදං භික්ඛවෙ සාරිපුත්තො. සාරිපුත්තො භික්ඛවෙ තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතං සම්මදෙව අනුප්පවත්තෙතීති.

**වග්ගො තෙරසමො**

---

# 14. එතදග්ගපාළි.

**1. 14. 1. 1—10.**

[**සාවකපිනිදානං:**]

එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං රත්තඤ්ඤූනං යදිදං **අඤ්ඤාකොණ්ඩඤ්ඤො**,[1] -පෙ- මහාපඤ්ඤානං යදිදං **සාරිපුත්තො**,-පෙ-ඉද්ධිමන්තානං යදිදං **මහාමොග්ගල්ලානො**, -පෙ- ධුතවාදානං යදිදං **මහාකස්සපො**, -පෙ- දිබ්බචක්ඛුකානං යදිදං **අනුරුද්ධො**, -පෙ- උච්චාකුලිකානං යදිදං **භද්දියො** කාළිගොධාය පුත්තො, -පෙ- මඤ්ජුස්සරානං යදිදං **ලකුණ්ටකභද්දියො**, පෙ- සීහනාදිකානං යදිදං **පිණ්ඩොලභාරද්වාජො**, -පෙ- ධම්මකථිකානං යදිදං **පුණ්ණො මන්තාණිපුත්තො**, -පෙ- සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං විභජන්තානං යදිදං **මහාකච්චානොති.**

**වග්ගො පඨමො.**

---

**1. 14. 2. 1—11.**

එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං මනොමයං කායං අභිනිම්මිනන්තානං යදිදං **චුල්ලපන්ථකො**[2], -පෙ- චෙතොවිවට්ටකුසලානං යදිදං **චුල්ලපන්ථකො**, -පෙ- සඤ්ඤාවිවට්ටකුසලානං යදිදං **මහාපන්ථකො**, -පෙ- අරණවිහාරීනං යදිදං **සුභූති**, -පෙ- දක්ඛිණෙය්‍යානං යදිදං **සුභූති**, -පෙ- ආරඤ්ඤකානං යදිදං **රෙවතො** ඛදිරවනියො, -පෙ- ඣායීනං යදිදං **කඞ්ඛාරෙවතො** -පෙ- ආරද්ධවිරියානං යදිදං **සොණො කොළිවිසො** -පෙ- කල්‍යාණවාක්කරණානං යදිදං **සොණො කුටිකණ්ණො**, -පෙ- ලාභීනං යදිදං **සීවලි**, -පෙ- සද්ධාධිමුත්තානං යදිදං **වක්කලීති**.

**වග්ගො දුතියො.**

---

1. අඤ්ඤාසිකොණ්ඩඤ්ඤො - මජසං. අඤ්ඤාතකොණ්ඩඤ්ඤොති - සආවි.
2. චූළපන්ථකො - මජසං.

**1. 13. 26.**

මහණෙනි, යමෙක් මෙසේ තථාගතයන් වහන්සේ විසින් පවත්වන ලද අනුත්තර වූ ධම්මචක්‍රය මොනොවට ම (තථාගතයන්) අනුව පවත්වා ද, මහණෙනි, ශාරිපුත්‍රයන් බඳු අන් එක පුහුලකුදු මම නො දක්මි. මහණෙනි, සැරියුත් තෙමේ තථාගතයන් වහන්සේ විසින් පවත්වන ලද අනුත්තර වූ ධම්මචක්‍රය මනා කොට ම (තථාගතයන්) අනු ව පවත්වයි.

**තෙළෙස්වන වගයි.**

---

## 14. ඵතදග්ග පාළිය

[**සැවැත් නිදනයි:**]

**1. 14. 1—10.**

මහණෙනි, යම් **අඤ්ඤාකොණ්ඩඤ්ඤ** නම් මහණෙක් වේ ද, චිරරාත්‍රඥ වූ මාගේ ශ්‍රාවක භික්ෂූන් අතුරෙහි මෙ අග්‍ර වෙයි. ... යම් **ශාරිපුත්‍ර** නම් මහණෙක් වේ ද, මහාප්‍රාඥ වූ මාගේ ශ්‍රාවකයන් අතුරෙහි ... යම් මහා **මෞද්ගල්‍යායන** නම් මහණෙක් වේ ද, ඍද්ධිමතුන් අතුරෙහි ... යම් **මහාකාශ්‍යප** නම් මහණෙක් වේ ද, ධූතවාද ඇත්තවුන් අතුරෙහි ... යම් **අනුරුද්ධ** නම් මහණෙක් වේ ද, දිවැස් ඇතියන් අතුරෙහි ... **කාළිගොධා**-වගේ පුත් යම් භද්දිය නම් මහණෙක් වේ ද, උසස් කුලයෙහි උපනුවන් අතුරෙහි ... යම් **ලකුණ්ටක භද්දිය** නම් මහණෙක් වේ ද, මිහිරි කටහඬ ඇතියන් අතුරෙහි ... යම් **පිණ්ඩෝලභාරද්වාජ** නම් මහණෙක් වේ ද, සිංහනාද කරනුවන් අතුරෙහි ... යම් **මන්තාණි** බැමිණියගේ පුත් **පුණ්ණ** නම් මහණෙක් වේ ද, ධම්මකථිකයන් අතුරෙහි ... යම් **මහාකච්චාන** නම් මහණෙක් වේ ද, සැකෙවින් කියූ දෑයෙහි අරුත් විතරින් බෙදා දක්වන මාගේ ශ්‍රාවක භික්ෂූන් අතුරෙහි මෙ අග්‍ර වෙයි.

**පළමුවන වග යි.**

---

**1. 14. 2. 1—11.**

මහණෙනි, යම් **චූලපන්ථක** නම් මහණෙක් වේ ද, මනොමය කය මවන මාගේ ශ්‍රාවක භික්ෂූන් අතුරෙහි මෙ අග්‍ර වෙයි. ... යම් **චූලපන්ථක** නම් මහණෙක් වේ ද, චෙතොවිවට්ට (රූපධ්‍යාන) යෙහි දක්ෂ වූ භික්ෂූන් අතුරෙහි ... යම් **මහාපන්ථක** නම් මහණෙක් වේ ද, සඤ්ඤාවිවට්ට (අරූපධ්‍යාන) යෙහි දක්ෂ වූ භික්ෂූන් අතුරෙහි ... යම් **සුභූති** නම් මහණෙක් වේ ද, කෙලෙස් රහිත විහරණ ඇතියන් අතුරෙහි ... යම් **සුභූති** නම් මහණෙක් වේ ද, දක්ෂිණාර්හයන් අතුරෙහි ... කිහිරිවන වැසි යම් **රේවත** නම් මහණෙක් වේ ද, අරණ්‍යවාසී මාගේ ශ්‍රාවක භික්ෂූන් අතුරෙහි ... යම් **කඞ්ඛාරේවත** නම් මහණෙක් වේ ද, ධ්‍යානයෙහි ඇලුනවුන් අතුරෙහි ... **කොළිවීස** ගොත්‍රයෙහි උපන් යම් **සෝණ** නම් මහණෙක් වේ ද, පිරිපුන් වැර ඇති භික්ෂූන් අතුරෙහි ... යම් **කුටිකණ්ණසෝණ** නම් මහණෙක් වේ ද, කල්‍යාණ බස් තෙපලනුවන් අතුරෙහි ... යම් **සීවලී** නම් මහණෙක් වේ ද, සිව්පසය ලබනුවන් අතුරෙහි ... යම් **වක්කලී** නම් මහණෙක් වේ ද, බලවත් සැදැහැ ඇති මාගේ ශ්‍රාවක භික්ෂූන් අතුරෙන් මෙ අග්‍ර වෙයි.

**දෙවැනි වග යි.**

## 1. 14. 3. 1—10.

එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං සික්ඛාකාමානං යදිදං **රාහුලො**. -පෙ- සද්ධාපබ්බජිතානං යදිදං **රට්ඨපාලො**, -පෙ- පඨමං සලාකං ගණ්හන්තානං යදිදං **කුණ්ඩධානො**, -පෙ- පටිභානවන්තානං යදිදං **වඞ්ගීසො**, -පෙ- සමන්තපාසාදිකානං යදිදං **උපසෙනො** වඞ්ගන්තපුත්තො, -පෙ- සෙනාසනපඤ්ඤාපකානං යදිදං **දබ්බො** මල්ලපුත්තො, -පෙ- දෙවතානං පියමනාපානං යදිදං **පිලින්දිවච්ඡො**,[1] -පෙ- ඛිප්පාභිඤ්ඤානං යදිදං බාහියො **දාරුචීරියො** -පෙ- චිත්තකථිකානං යදිදං **කුමාරකස්සපො**, -පෙ- පටිසම්භිදප්පත්තානං යදිදං **මහාකොට්ඨිතොති**.

**වග්ගො තතියො**

## 1. 14. 4. 1—16.

එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං බහුස්සුතානං යදිදං **ආනන්දො**, -පෙ- සතිමන්තානං යදිදං **ආනන්දො**, -පෙ- ගතිමන්තානං යදිදං **ආනන්දො**, -පෙ- ධිතිමන්තානං යදිදං **ආනන්දො**, -පෙ- උපට්ඨාකානං යදිදං **ආනන්දො**, -පෙ- මහාපරිසානං යදිදං **උරුවෙලකස්සපො**, -පෙ- කුලප්පසාදකානං යදිදං **කාළුදායී**, -පෙ- අප්පාබාධානං යදිදං **බක්කුලො**,[2] -පෙ- පුබ්බෙ නිවාසං අනුස්සරන්තානං යදිදං **සොභිතො**, -පෙ- විනයධරානං යදිදං **උපාලි**, -පෙ- භික්ඛුනොවාදකානං යදිදං **නන්දකො**, -පෙ- ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරානං යදිදං **නන්දො**, -පෙ- භික්ඛුඔවාදකානං යදිදං **මහාකප්පිනො**, -පෙ- තෙජොධාතු-කුසලානං යදිදං **සාගතො**, -පෙ- පටිභානෙය්‍යකානං යදිදං **රාධො**, -පෙ- ලූඛචීවරධරානං යදිදං **මොඝරාජාති**.

**වග්ගො චතුත්ථො.**

1. පිලින්දවච්ඡො - මජ්ඣං. 2. බාකුලො - මජ්ඣං.

## 1. 14. 3. 1—10.

මහණෙනි, යම් **රාහුල** නම් මහණෙක් වේ ද, මාගේ ශ්‍රාවක වූ සික කැමැති භික්ෂූන් අතුරෙහි මෙ අග්‍ර වේ. ... යම් **රට්ඨපාල** නම් මහණෙක් වේ ද, සැදැහයෙන් පැවිදි වූ මාගේ ශ්‍රාවක භික්ෂූන් අතුරෙහි ... යම් **කුණ්ඩධාන** නම් මහණෙක් වේ ද, පෙරට ව ලහගන්නා මාගේ ශ්‍රාවක වූ මහණුන් අතුරෙහි .. යම් **වඞ්ගීස** නම් මහණෙක් වේ ද, පිරිපුන් වැටහීම් ඇති මාගේ ශ්‍රාවක වූ භික්ෂූන් අතුරෙහි ... වඞ්ගන්ත බ්‍රාහමණයාගේ පුත්‍ර වූ යම් **උපසෙන** නම් මහණෙක් වේ ද, පැහැදීම් එළවන මාගේ ශ්‍රාවක වූ මහණුන් අතුරෙහි ... මල්ලරාජපුත්‍ර වූ යම් **දබ්බ** නම් මහණෙක් වේ ද, සෙනසුන් පණවන මාගේ ශ්‍රාවක වූ භික්ෂූන් අතුරෙහි ... යම් **පිළින්දිවච්ඡ** නම් මහණෙක් වේ ද, දෙවියනට ප්‍රියමනාප වූ මාගේ ශ්‍රාවක වූ මහණුන් අතුරෙහි ... යම් **දරුචීරිය බාහිය** නම් මහණෙක් වේ ද, වහා ලත් අභිඥ ඇති මාගේ ශ්‍රාවක වූ මහණුන් අතුරෙහි ... යම් **කුමාරකාශ්‍යප** නම් මහණෙක් වේ ද, විසිතුරු ධර්මකථා ඇති මාගේ ශ්‍රාවක වූ මහණුන් අතුරෙහි... යම් **මහාකොට්ඨිත** නම් මහණෙක් වේ ද, පිළිසැඹියා ලත් මාගේ ශ්‍රාවක වූ මහණුන් අතුරෙහි මෙ අග්‍ර වේ.

තුන්වැනි වග යි.

## 1. 14. 4. 1—16.

මහණෙනි, යම් **ආනන්ද** නම් මහණෙක් වේ ද, බොහෝ ඇසූ පිරූ තැන් ඇති මාගේ සවු මහණුන් අතුරෙහි මෙ අග්‍ර වෙයි, ... යම් **ආනන්ද** නම් මහණෙක් වේ ද ... ධාරණසමෘති ඇති මහණුන් අතුරෙහි ... ප්‍රඥගති ඇති ... ධෘතිමත් වූ ... උපස්ථායක වූ මාගේ සවු මහණුන් අතුරෙහි මෙ අග්‍ර වෙයි. ... යම් **උරුවෙලකස්සප** නම් මහණෙක් වේ ද, මහපිරිස් ඇති මාගේ සවු මහණුන් අතුරෙහි... යම් **කාළුදායී** නම් මහණෙක් වේ ද, කුල පහදවන මාගේ සවු මහණුන් අතුරෙහි .. යම් **බක්කුල** නම් මහණෙක් වේ ද, නීරොග වූ මාගේ සවු මහණුන් අතුරෙහි ... යම් **සොභිත** නම් මහණෙක් වේ ද, පෙර විසූ කඳපිළිවෙළ සිහි කරණ මාගේ සවු මහණුන් අතුරෙහි ... යම් **උපාලි** නම් මහණෙක් වේ ද, විනයධර වූ මාගේ ශ්‍රාවක වූ භික්ෂූන් අතුරෙහි ... යම් **නන්දක** නම් මහණෙක් වේ ද, මෙහෙණනට ඔවා දෙන මාගේ සවු මහණුන් අතුරෙහි .. යම් **නන්ද** නම් මහණෙක් වේ ද, ඉඳුරන් කෙරෙහි වැසූ දෙර ඇති මාගේ සවු මහණුන් අතුරෙහි ... යම් **මහාකප්පින** නම් මහණෙක් වේ ද, භික්ෂූන්ට අවවාද කරණ මාගේ සවු මහණුන් අතුරෙහි ... යම් **සාගත** නම් මහණෙක් වේ ද, තෙජෝධාතු සමාපත්තියට සම්වැදීමෙහි දක්‍ෂ වූ මාගේ සවු මහණුන් අතුරෙහි ... යම් **රාධ** නම් මහණෙක් වේ ද, ධර්මදේශනා ප්‍රතිභානයට ප්‍රත්‍යය වන කථා ඇති මාගේ සවු මහණුන් අතුරෙහි ... යම් **මොඝරාජ** නම් මහණෙක් වේ ද, රූක්‍ෂචීවර දරණ මාගේ සවු මහණුන් අතුරෙහි මෙ අග්‍ර වේ.

සතරවන වග යි.

## 1. 14. 5. 1—13.

එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං භික්ඛුනීනං රත්තඤ්ඤූනං යදිදං **මහාපජාපතී ගොතමී**, -පෙ- මහාපඤ්ඤානං යදිදං **ඛෙමා**, -පෙ- ඉද්ධිමන්තීනං යදිදං **උප්පලවණ්ණා**, -පෙ- විනයධරානං යදිදං **පටාචාරා**, -පෙ- ධම්මකථිකානං යදිදං **ධම්මදින්නා**, -පෙ- ඣායීනං යදිදං **නන්දා**, -පෙ- ආරද්ධවිරියානං යදිදං **සොණා**, -පෙ- දිබ්බචක්ඛුකානං යදිදං **සකුලා**,[1] -පෙ- ඛිප්පාභිඤ්ඤානං යදිදං **භද්දා කුණ්ඩලකෙසා**, -පෙ- පුබ්බෙනිවාසං අනුස්සරන්තීනං යදිදං **භද්දා කාපිලානී**, -පෙ- මහාභිඤ්ඤප්පත්තානං යදිදං **භද්දකච්චානා**, -පෙ- ලූඛචීවරධරානං යදිදං **කිසාගොතමී**, -පෙ- සද්ධාධිමුත්තානං යදිදං **සිගාලමාතා**ති.[2]

**වග්ගො පඤ්චමො.**

## 1. 14. 6. 1—10.

එතදග්ගං භික්ඛවෙ මම සාවකානං උපාසකානං පඨමං සරණං ගච්ඡන්තානං යදිදං **තපුස්සභල්ලිකා**[3] වාණිජා, -පෙ- දායකානං යදිදං **සුදත්තො** ගහපති **අනාථපිණ්ඩිකො**, -පෙ- ධම්මකථිකානං යදිදං **චිත්තො** ගහපති මච්ඡිකාසණ්ඩිකො,-පෙ- චතූහි සඞ්ගහවත්ථූහි පරිසං සඞ්ගණ්හන්තානං යදිදං **හත්ථකො ආළවකො**, -පෙ- පණීතදායකානං යදිදං **මහානාමො** සක්කො, -පෙ- මනාපදායකානං යදිදං **උග්ගො** ගහපති වෙසාලිකො, -පෙ- සංඝුපට්ඨාකානං යදිදං **උග්ගතො**[4] ගහපති, -පෙ- අවෙච්චප්පසන්නානං යදිදං **සූරො අම්බට්ඨො**[5], -පෙ- පුග්ගලප්පසන්නානං යදිදං **ජීවකො කොමාරභච්චො**, -පෙ- විස්සාසකානං යදිදං **නකුලපිතා** ගහපතීති.

**වග්ගො ඡට්ඨො.**

1. බකුලා - මජසං. 2. සිගාලකමාතා - මජසං. 3. තපුස්සභල්ලිකා - ස්‍යා PTS
4. හත්ථිගාමිකො උග්ගො ගහපති - මජසං 5. සූරම්බට්ඨො - මජසං.

## 1. 14. 5. 1—13.

මහණෙනි, යම් **මහාප්‍රජාපතී ගෞතමී** නම් මෙහෙණක් ඇද්ද, චිරරාත්‍රඥ වූ මාගේ ශ්‍රාවිකා මෙහෙණින් අතුරෙහි තුලු අග්‍ර වේ. ... යම් **ඛෙමා** නම් මෙහෙණක් ඇද් ද, මාගේ ශ්‍රාවිකා වූ මහාප්‍රඥ ඇති මෙහෙණින් අතුරෙහි... යම් **උප්පලවණ්ණා** නම් මෙහෙණක් ඇද් ද, මාගේ ශ්‍රාවිකා වූ ඍද්ධි ඇති මෙහෙණින් අතුරෙහි ... යම් **පටාචාරා** නම් මෙහෙණක් ඇද් ද, මාගේ ශ්‍රාවිකා වූ විනයධර මෙහෙණින් අතුරෙහි ... යම් **ධම්මදින්නා** නම් මෙහෙණක් ඇද් ද, මාගේ ශ්‍රාවිකා වූ ධර්ම කථික මෙහෙණින් අතුරෙහි...යම් **නන්‍දා** නම් මෙහෙණක් ඇද් ද, ධ්‍යානයෙහි ඇලුනු මාගේ ශ්‍රාවිකා වූ මෙහෙණින් අතුරෙහි ... යම් **සොණා** නම් මෙහෙණක් ඇද් ද, මාගේ ශ්‍රාවිකා වූ සම්පූර්ණ කරණ ලද වීර්‍ය්‍ය ඇති මෙහෙණින් අතුරෙහි ... යම් **සකුලා** නම් මෙහෙණක් ඇද් ද, දිව්‍යස් ඇති මාගේ ශ්‍රාවිකාවූ මෙහෙණින් අතුරෙහි ... යම් **භද්‍දා කුණ්ඩලකෙසී** නම් මෙහෙණක් ඇද් ද, ක්‍ෂිප්‍රාභිඥ වූ මාගේ ශ්‍රාවිකා වූ මෙහෙණින් අතුරෙහි ... යම් **භද්‍දා කාපිලානී** නම් මෙහෙණක් ඇද් ද, පෙර විසූ කඳපිළිවෙළ සිහි කරණ මාගේ ශ්‍රාවිකා වූ මෙහෙණින් අතුරෙහි ... යම් **භද්‍දකච්චානා** නම් මෙහෙණක් ඇද් ද, මහා අභිඥා ලද මාගේ ශ්‍රාවිකා වූ මෙහෙණින් අතුරෙහි ... යම් **කිසාගෞතමී** නම් මෙහෙණක් ඇද් ද, රූක්‍ෂ චීවර දරණ මාගේ ශ්‍රාවිකා වූ මෙහෙණින් අතුරෙහි ... යම් **සිගාලමාතු** නම් මෙහෙණක් ඇද් ද, ශ්‍රද්ධාලක්‍ෂණයෙහි බැස ගත් මාගේ ශ්‍රාවිකා වූ මෙහෙණින් අතුරෙහි තුලු අග්‍ර වේ.

පස්වන වග යි.

## 1. 14. 6. 1—10.

මහණෙනි, යම් **තපුස්ස** ය **භල්ලික** ය යන වෙළෙඳහු දෙදෙනෙක් වෙත් ද, හැමට පළමු ව සරණ යන මාගේ ශ්‍රාවක වූ උපාසකයන් අතුරෙහි තෙලහු අග්‍ර වෙත්. .. යම් **අනාථපිණ්ඩික සුදත්ත** නම් වූ ගෘහපතියෙක් වේ ද, දායක වූ මාගේ ශ්‍රාවක උපාසකයන් අතුරෙහි ... යම් **මච්ඡිකාසණ්ඩ** පුරවාසී **චිත්ත** නම් ගෘහපතියෙක් වේ ද, ධර්මකථික වූ මාගේ ශ්‍රාවක උපාසකයන් අතුරෙහි ... යම් **හත්ථක ආලවක** නම් රජෙක් වේ ද, සිව්සඟරාවතින් පිරිස් සඟන්නා මාගේ ශ්‍රාවක උපාසකයන් අතුරෙහි ... යම් **මහානාම** නම් ශාක්‍යයෙක් වේ ද, ප්‍රණීත ප්‍රත්‍යය දෙන මාගේ ශ්‍රාවක උපාසකයන් අතුරෙහි ... යම් විසල්පුර වැසි **උග්ග** නම් ගැහැවියෙක් වේ ද, මනාප දෑ දෙන මාගේ ශ්‍රාවක උපාසකයන් අතුරෙහි ... යම් **උග්ගත** නම් ගැහැවියෙක් වේ ද, සඞ්ඝොපස්ථායක වූ මාගේ ශ්‍රාවක උපාසකයන් අතුරෙහි ..යම් **සූරම්බට්ඨ** නම් සිටුවරයෙක් වේ ද, අවෙප්‍රසාදයෙන් සමන්විත වූ මාගේ ශ්‍රාවක උපාසකයන් අතුරෙහි ... යම් **ජීවක කොමාරභච්ච** නම් උපාසකයෙක් වේ ද, පෞද්ගලික ප්‍රසාදයෙන් සමන්විත වූ මාගේ ශ්‍රාවක උපාසකයන් අතුරෙහි ... යම් **නකුලපිතු** නම් ගැහැවියෙක් වේ ද, විශ්වාස කථා ඇති මාගේ ශ්‍රාවක වූ උපාසකයන් අතුරෙන් තෙල අග්‍ර වේ.

සවැනි වගයි.

**1. 14. 7. 1—10.**

එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං උපාසිකානං පඨමං සරණං ගච්ඡන්තීනං යදිදං **සුජාතා** සෙනානීධීතා,[1] දායිකානං යදිදං **විසාඛා මිගාරමාතා**, බහුස්සුතානං යදිදං **ඛුජ්ජුත්තරා**, මෙත්තාවිහාරීනං යදිදං **සාමාවතී**, ඣායීනං යදිදං **උත්තරා** නන්දමාතා, පණීතදායිකානං යදිදං **සුප්පවාසා** කොලියධීතා, ගිලානුපට්ඨාකීනං යදිදං **සුප්පියා** උපාසිකා, අවෙච්චප්පසන්නානං යදිදං **කාතියානී**, විස්සාසිකානං යදිදං **නකුලමාතා** ගහපතානී, අනුස්සවප්පසන්නානං යදිදං **කාළී** උපාසිකා **කුරරඝරිකාති**[2]

**වග්ගො සත්තමො.**

---

1. සෙනියධීතා - මජ්ඣසං.
2 කුලඝරිකා - මජ්ඣසං.

## 1. 14. 7. 1—10.

මහණෙනි, යම් **සේනානීධීතු සුජාතා** නම් උපාසිකාවක් ඇද් ද, සියල්ලන්ට පළමු ව සරණයෙහි පිහිටි මාගේ ශ්‍රාවිකා උපාසිකාවන් අතුරෙහි තුලු අග්‍ර වේ. ... යම් **මිගාරමාතු විසාඛා** නම් උපාසිකාවක් ඇද්ද, දීමෙහි ඇලුනු මාගේ ශ්‍රාවිකා උපාසිකාවන් අතුරෙහි ... යම් **ඛුජ්ජුත්තරා** නම් උපාසිකාවක් ඇද් ද, බහුශ්‍රැත වූ මාගේ ශ්‍රාවිකා උපාසිකාවන් අතුරෙහි ... යම් **සාමාවතී** නම් උපාසිකාවක් ඇද් ද, මෛත්‍රීවිහරණ ඇති මාගේ ශ්‍රාවිකා උවැසියන් අතුරෙහි...යම් **උත්තරා නන්දමාතු** නම් උපාසිකාවක් ඇද් ද, ධ්‍යානයෙහි අභිරත වූ මාගේ ශ්‍රාවිකා උවැසියන් අතුරෙහි ... යම් **කොලියධීතු සුප්පවාසා** නම් උපාසිකාවක් ඇද් ද, ප්‍රණීත රසදායිකා වූ මාගේ ශ්‍රාවිකා උවැසියන් අතුරෙහි ... යම් **සුප්පියා** නම් උපාසිකාවක් ඇද් ද, ග්ලානොපස්ථායිකා වූ මාගේ ශ්‍රාවිකා උවැසියන් අතුරෙහි ... යම් **කාතියානී** නම් උපාසිකාවක් ඇද් ද, අවෙත්‍යප්‍රසාදයෙන් සමන්විත මාගේ ශ්‍රාවිකා වූ උවැසියන් අතුරෙහි ... යම් **නකුලමාතු ගහපතානී** නම් උපාසිකාවක් ඇද් ද, විශ්වාස කථා ඇති මාගේ ශ්‍රාවිකා වූ උවැසියන් අතුරෙහි ... යම් කුරරඝර වැසි **කාළී** නම් උපාසිකාවක් ඇද් ද, අනුශ්‍රවයෙන් උපන් ප්‍රසාද ඇති මාගේ ශ්‍රාවිකා වූ උපාසිකාවන් අතුරෙහි තුලු අග්‍ර වේ.

**සත්වැනි වග යි.**

# 15. අට්ඨානපාළි.

### 1. 15. 1.

[සාවත්ථිනිදානං:]

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි[1] සඞ්ඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුථුජ්ජනො කඤ්චි සඞ්ඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය, ඨානමෙතං විජ්ජති.[2]

### 1. 15. 2.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි සඞ්ඛාරං සුඛතො උපගච්ඡෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුථුජ්ජනො කඤ්චි සඞ්ඛාරං සුඛතො උපගච්ඡෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

### 1. 15. 3.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං දිට්ඨිසම්පන්නො පුග්ගලො *කඤ්චි ධම්මං අත්තතො උපගච්ඡෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුථුජ්ජනො කඤ්චි ධම්මං අත්තතො උපගච්ඡෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

### 1. 15. 4

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං දිට්ඨිසම්පන්නො පුග්ගලො මාතරං ජීවිතා වොරොපෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුථුජ්ජනො මාතරං ජීවිතා වොරොපෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

### 1. 15. 5.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං දිට්ඨිසම්පන්නො පුග්ගලො පිතරං ජීවිතා වොරොපෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුථුජ්ජනො පිතරං ජීවිතා වොරොපෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

### 1. 15. 6.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං දිට්ඨිසම්පන්නො පුග්ගලො අරහන්තං ජීවිතා වොරොපෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුථුජ්ජනො අරහන්තං ජීවිතා වොරොපෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

---

1 කිඤ්චි - කාළුචි. 2. විජ්ජතීති – මජසං, සයා.

# 15. අට්ඨානපාළිය.

[සැවැත් නිදානයි:]

### 1. 15. 1.

මහණෙනි, යම් හෙයෙකින් මාර්ගදෘෂ්ටියෙන් යුත් (=සොවත්) පුද්ගල තෙමේ කිසි සංස්කාරයක් නිත්‍යය යි ගන්නේය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල අවිද්‍යමාන තැනෙකි. ප්‍රත්‍යය රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් පෘථග්ජන තෙමේ කිසියම් සංසකාරයක් නිත්‍යය යි ගන්නේ ය යන යමෙක් වේද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

### 1. 15. 2.

මහණෙනි, යම් හෙයෙකින් දර්ශනසම්පන්න පුද්ගල තෙමේ කිසි සංසකාරයක් සුඛය යි ගන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් පෘථග්ජන තෙමේ කිසි සංසකාරයක් සුඛය යි ගන්නේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වෙයි. තෙල හේතු ඇත.

### 1. 15. 3.

මහණෙනි, යම් හෙයෙකින් දෘෂ්ටිසම්පන්න පුද්ගල තෙමේ කිසි ධර්මයක් ආත්මය යි ගන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් පෘථග්ජන තෙමේ කිසි ධර්මයක් ආත්මය යි ගන්නේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

### 1. 15. 4.

මහණෙනි, යම් හෙයෙකින් දෘෂ්ටිසම්පන්න පුද්ගල තෙමේ මව දිවියෙන් තොර කරන්නේය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් පෘථග්ජන තෙමේ මව දිවියෙන් තොර කරන්නේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වෙයි. තෙල හේතු ඇත.

### 1. 15. 5.

මහණෙනි, යම් හෙයෙකින් දෘෂ්ටිසම්පන්න පුද්ගල තෙමේ පියා දිවියෙන් තොර කරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් පෘථග්ජන තෙමේ පියා දිවියෙන් තොර කරන්නේ ය යන යමෙක් වේද, තෙල කරුණ විද්‍යමාන වෙයි. තෙල හේතු ඇත.

### 1. 15. 6.

මහණෙනි, යම් හෙයෙකින් දෘෂ්ටිසම්පන්න පුද්ගල තෙමේ රහතකු දිවියෙන් තොර කරන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් පෘථග්ජන තෙමේ රහතකු දිවියෙන් තොර කරන්නේය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වෙයි. තෙල හේතු ඇත.

## 1. 15. 7.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං දිට්ඨිසම්පන්නො පුග්ගලො තථාගතස්ස දුට්ඨෙන චිත්තෙන ලොහිතං උප්පාදෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුථුජ්ජනො තථාගතස්ස දුට්ඨෙන චිත්තෙන ලොහිතං උප්පාදෙය්‍ය, ඨානමෙතං විජ්ජති[1].

## 1. 15. 8.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං දිට්ඨිසම්පන්නො පුග්ගලො සඞ්ඝං භින්දෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුථුජ්ජනො සඞ්ඝං භින්දෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

## 1. 15 9.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං දිට්ඨිසම්පන්නො පුග්ගලො අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුථුජ්ජනො අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

## 1. 15. 10.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං එකිස්සා ලොකධාතුයා ද්වෙ අරහන්තො සම්මාසම්බුද්ධා අපුබ්බං අචරිමං උප්පජ්ජෙය්‍යුං, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං එකිස්සා ලොකධාතුයා එකො අරහං සම්මාසම්බුද්ධො උප්පජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

## 1. 15. 11.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං එකිස්සා ලොකධාතුයා ද්වෙ රාජානො චක්කවත්තී අපුබ්බං අචරිමං උප්පජ්ජෙය්‍යුං, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං එකිස්සා ලොකධාතුයා එකො රාජා චක්කවත්තී උප්පජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

## 1. 15. 12.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං ඉත්ථී අරහං අස්ස සම්මාසම්බුද්ධො, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුරිසො අරහං අස්ස සම්මාසම්බුද්ධො, ඨානමෙතං විජ්ජති.

---

1 විජ්ජතීති - මජසං, සතා.

### 1. 15. 7.

මහණෙනි, යම් හෙයෙකින් දෘෂ්ටිසම්පන්න පුද්ගල තෙමේ දුෂ්ට වූ සිතින් තථාගතයන් වහන්සේගේ (සිරුරෙහි) ලේ සොලවන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් පෘථග්ජන පුද්ගල තෙමේ දුෂ්ට වූ සිතින් තථාගතයන් වහන්සේගේ (සිරුරෙහි) ලේ සොලවන්නේ ය යන යමෙක් වේද, තෙල කරුණ විද්‍යමාන වෙයි. තෙල හේතු ඇත.

### 1. 15. 8.

මහණෙනි, යම් හෙයෙකින් දෘෂ්ටිසම්පන්න පුද්ගල තෙමේ සඞ්ඝයා බිඳුනේය යන තෙල කරුණ විද්‍යමාන නොවේ. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් පෘථග්ජන තෙමේ සඞ්ඝයා බිඳුනේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වෙයි. තෙල හේතු ඇත.

### 1. 15. 9.

මහණෙනි, යම් හෙයෙකින් දෘෂ්ටිසම්පන්න පුද්ගල තෙමේ අන්‍යශාස්තෘ කෙනකුන් උදෙසා සිටුනේ ය යන තෙල කාරණය විද්‍යමාන නො වෙයි, තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් පෘථග්ජන තෙමේ අන් ශාස්තෘ කෙනකුන් උදෙසා සිටුනේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වෙයි. තෙල හේතු ඇත.

### 1. 15. 10.

මහණෙනි, යම් හෙයෙකින් එක් ලොකධාතුවෙක්හි අර්හත් වූ දෙසම්බුදු කෙනකුන් වහන්සේ එකවට උපදනාහු ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් එක් ලොකධාතුවෙක එක ම අර්හත් සම්බුදුරජාතන් වහන්සේ කෙනෙක් උපදනාහ යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

### 1. 15. 11.

මහණෙනි, යම් හෙයෙක්න් එක් ලොකධාතුවෙක්හි සක්විති රජවරු දෙදෙනෙක් එකවට උපදනාහු ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් එක් ලොකධාතුවෙක්හි එක් සක්විතිරජෙක් උපදනේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

### 1. 15. 12.

මහණෙනි, යම් හෙයෙකින් ස්ත්‍රියක අර්හත් සම්‍යක්සම්බුද්ධ වෙති යි යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, යම් හෙයෙකින් පුරුෂයෙක් අර්හත් සම්‍යක්සම්බුද්ධ වන්නේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

### 1. 15. 13.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං ඉත්ථී රාජා අස්ස චක්කවත්තී, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුරිසො රාජා අස්ස චක්කවත්තී, ඨානමෙතං විජ්ජති.

### 1. 15. 14—16.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං ඉත්ථී සක්කත්තං කාරෙය්‍ය -පෙ-, මාරත්තං කාරෙය්‍ය -පෙ-, බ්‍රහ්මත්තං කාරෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං පුරිසො සක්කත්තං කාරෙය්‍ය, මාරත්තං කාරෙය්‍ය, බ්‍රහ්මත්තං කාරෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

### 1. 15. 17.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං කායදුච්චරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං කායදුච්චරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

### 1. 15. 18—19.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං වචීදුච්චරිතස්ස -පෙ-, යං මනොදුච්චරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං මනොදුච්චරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

### 1. 15 20.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං කායසුචරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං කායසුචරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

### 1 15. 21—22.

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං වචීසුචරිතස්ස -පෙ-, යං මනොසුචරිතස්ස අනිට්ඨො අකන්තො අමනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං මනොසුචරිතස්ස ඉට්ඨො කන්තො මනාපො විපාකො නිබ්බත්තෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

## 1. 15. 13.

මහණෙනි, යම් හෙයෙකින් ස්ත්‍රියක සක්විති රජ වෙති යි යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත යෙකි. අවකාශ රහිත යෙකි. මහණෙනි, පුරුෂයෙක් සක්විති රජ වන්නේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත

## 1. 15. 2. 14—16

මහණෙනි, යම් හෙයෙකින් ස්ත්‍රියක සක්දෙව් රජ බව කරති යි ... මාරබව කරති යි ... බ්‍රහම බව කරති යි යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත යෙක. අවකාශ රහිත යෙක. මහණෙනි, යම් හෙයෙකින් පුරුෂයෙක් සක්දෙව් බව කරන්නේ ය ..., මාර බව කරන්නේ ය ..., බ්‍රහ්ම බව කරන්නේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

## 1. 15. 17.

මහණෙනි, යම් හෙයෙකින් කායදුශ්චරිතයාගේ ඉෂ්ට කාන්ත මනාප විපාකයෙක් උපදනේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත ය. අවකාශ රහිත ය. මහණෙනි, යම් හෙයෙකින් කායදුශ්චරිතයාගේ අනිෂ්ට අකාන්ත අමනාප වූ විපාකයෙක් උපදනේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

## 1. 15. 18—19.

මහණෙනි, යම් හෙයෙකින් වාග්දුශ්චරිතයාගේ ..., යම් හෙයෙකින් මනො-දුශ්චරිතයාගේ ඉෂ්ට කාන්ත මනාප විපාකයෙක් උපදනේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. මහණෙනි, යම් හෙයෙකින් මනොදුශ්චරිතයාගේ අනිෂ්ට අකාන්ත අමනාප වූ විපාකයෙක් උපදනේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ තෙල හේතු ඇත.

## 1. 15. 20.

මහණෙනි, යම් හෙයෙකින් කායසුචරිතයාගේ අනිෂ්ට අකාන්ත අමනාප විපාකයෙක් උපදනේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත ය. අවකාශ රහිත ය. මහණෙනි, යම් හෙයෙකින් කායසුචරිතයාගේ ඉෂ්ට කාන්ත මනාප විපාකයෙක් උපදනේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

## 1. 15. 21—22

මහණෙනි, යම් හෙයෙකින් වාක්සුචරිතයාගේ ..., මනඃසුචරිතයාගේ අනිෂ්ට අකාන්ත අමනාප විපාකයෙක් උපදනේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත ය. අවකාශ රහිත ය. මහණෙනි, යම් හෙයෙකින් මනඃසුචරිතයාගේ ඉෂ්ට කාන්ත මනාප විපාකයෙක් උපදනේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

**1. 15. 23.**

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං කායදුච්චරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං කායදුච්චරිත-සමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජති

**1. 15. 24-25.**

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං වචීදුච්චරිතසමඞ්ගී -පෙ-, යං මනොදුච්චරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං මනොදුච්චරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

**1 15. 26.**

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං කායසුචරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං කායසුචරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජති.

**1. 15. 27 28.**

අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං වචීසුචරිතසමඞ්ගී -පෙ-, යං මනොසුචරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය, නෙතං ඨානං විජ්ජති. ඨානඤ්ච ඛො එතං භික්ඛවෙ විජ්ජති, යං මනොසුචරිතසමඞ්ගී තන්නිදානා තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය, ඨානමෙතං විජ්ජතීති.

[**අට්ඨානපාළි නිට්ඨිතා.**]

## 1. 15. 23.

මහණෙනි, යම් හෙයෙකින් කායදුශ්චරිතයෙන් සමන්විත පුද්ගල තෙමේ ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් කාබුන් මරණින් මතු (මනාගති ඇති හෙයින්) සුගති නම් වූ ස්වර්ගලොකයට (ප්‍රතිසන්ධිවශයෙන්) යන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත ය, අවකාශ රහිත ය. මහණෙනි, යම් හෙයෙකින් කායදුශ්චරිතයෙන් සමන්විත පුද්ගල තෙමේ ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් කාබුන් මරණින් මතු (සුවෙන් පහ වූ හෙයින්) අපාය නම් වූ (නපුරු ගති ඇති හෙයින්) දුගති නම් වූ (විවශව පතිත වන හෙයින්) විනිපාත නම් වූ නිරයට (ප්‍රතිසන්ධිවශයෙන්) යන්නේ ය යන යමෙක් වේ ද, තෙල විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

## 1. 15. 24—25.

මහණෙනි, යම් හෙයෙකින් වාග්දුශ්චරිතයෙන් සමන්විත පුද්ගල තෙමේ ... මනොදුශ්චරිතයෙන් සමන්විත පුද්ගල තෙමේ ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට යන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ, තෙල හෙතු රහිත ය, අවකාශ රහිත ය. මහණෙනි, යම් හෙයෙකින් මනොදුශ්චරිතයෙන් සමන්විත පුද්ගල තෙමේ ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගති නම් වූ විනිපාත නම් වූ නිරයට යන්නේ ය යන යමෙක්වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ, තෙල හේතු ඇත.

## 1. 15. 26.

මහණෙනි, යම් හෙයෙකින් කායසුචරිතයෙන් යුත් පුද්ගල තෙමේ ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගති නම් වූ විනිපාත නම් වූ නිරයට යන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත ය, අවකාශ රහිත ය. මහණෙනි, යම් හෙයෙකින් කායසුචරිතයෙන් යුත් පුද්ගල තෙමේ ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට (පිළිසඳ විසින්) යන්නේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

## 1. 15. 27—28.

මහණෙනි, යම් හෙයෙකින් වාක්සුචරිතයෙන් සමන්විත පුද්ගල තෙමේ .., යම් හෙයෙකින් මනඃසුචරිතයෙන් සමන්විත පුද්ගල තෙමේ ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගති නම් වූ විනිපාත නම් වූ නිරයට (පිළිසඳ විසින්) යන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. තෙල හෙතු රහිත ය, අවකාශ රහිත ය. මහණෙනි, යම් හෙයෙකින් මනඃසුචරිතයෙන් සමන්විත පුද්ගල තෙමේ ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට යන්නේ ය යන යමෙක් වේ ද, තෙල කරුණ විද්‍යමාන වේ. තෙල හේතු ඇත.

[අට්ඨානපාළිය නිමි.]

# 16. එකධම්මපාළි.

## 1. 16. 1. 1.

[සාවත්ථිනිදානං:]

එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති. කතමො එකධම්මො: බුද්ධානුස්සති. අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තතීති.[1]

## 1. 16. 1. 2—10.

එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති. කතමො එකධම්මො: ධම්මානුස්සති -පෙ- සඞ්ඝානුස්සති - සීලානුස්සති -පෙ- චාගානුස්සති -පෙ- දෙවතානුස්සති -පෙ- ආනාපානසති -පෙ- මරණසති -පෙ- කායගතාසති -පෙ- උපසමානුස්සති. අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තතීති.

වග්ගො පඨමො.

## 1. 16. 2. 1.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති.

## 1. 16. 2. 2.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති, යථයිදං භික්ඛවෙ සම්මාදිට්ඨි. සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති.

---

1. සංවත්තන්තීති - මජසං, සයා

# 16. එකධම්මපාළිය.

## 1. 16. 1. 1.

[සැවැත්නිදානයි:]

මහණෙනි, එක් ම ධර්මයෙක් (භාවනා වශයෙන්) වඩනා ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ ඒකාන්තයෙන් (සසර) කලකිරීම පිණිස, (සසර) නොඇලීම පිණිස (රාගාදීන්ගේ) නිරෝධය පිණිස (කෙලෙස්) සන්සිඳීම පිණිස (අනිත්‍යාදිවශයෙන්) වෙසෙසා දැනුම පිණිස සිවුසස් පිළිවිදීම පිණිස නිවන් පිණිස පවත්තේ ය. කවර එක් ධර්මයෙක? යත්: බුද්ධානුස්මෘතිය යි. මහණෙනි, මේ එක් ධර්මය වඩනා ලද්දේ බහුලවශයෙන් කරණ ලද්දේ ඒකාන්තනිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බෝධිය පිණිස නිර්වාණය පිණිස පවත්තේ ය.

## 1. 1. 16. 2—10.

මහණෙනි, එක් ම ධර්මයෙක් (භාවනා වශයෙන්) වඩනා ලද්දේ බහුලවශ-යෙන් කරණ ලද්දේ ඒකාන්ත නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බෝධය පිණිස නිර්වාණය පිණිස පවත්තේ ය. කවර එක් ධර්මයෙක? යත්: ධර්මානුස්මෘතිය යි. ... සඞ්ඝානුස්මෘති-ය යි. ... ශීලානුස්මෘතිය යි. ... ත්‍යාගානුස්මෘතිය යි. ... දෙවතානුස්මෘතිය යි. ... ආනාපානස්මෘතිය යි. ... මරණානුස්මෘතිය යි. ... කායගතස්මෘතිය යි. ... උපශමානුස්මෘතිය යි. මහණෙනි, මේ එක් ධර්මය වඩනා ලද්දේ බහුලවශයෙන් කරණ ලද්දේ ඒකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බෝධය පිණිස නිර්වාණය පිණිස පවත්තේ ය.

පළමු වග යි.

## 1. 16. 2. 1.

මහණෙනි, යම් ධර්මයක් හෙතු කොට ගෙණ නූපන්නා වූ ද අකුශල ධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද අකුශලධර්මයෝ භූයස්භාවය පිණිස විපුල බව පිණිස පවතිත් නම්, මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිකයාහට නූපන්නා වූ ද අකුශලධර්මයෝ උපදිත්. උපන්නා වූ ද අකුශලධර්මයෝ භූයස්භාවය පිණිස විපුල බව පිණිස පවතිත්.

## 1. 16. 2. 2.

මහණෙනි, යම් ධර්මයක් හෙතු කොට ගෙණ නූපන්නා වූ ද කුශල ධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ ද කුශලධර්මයෝ බොහෝ බව පිණිස විපුලබව පිණිස පවතිත් නම්, මහණෙනි, සම්‍යක්දෘෂ්ටිය බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, සම්‍යක්දෘෂ්ටිකයාහට නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත්. උපන්නා වූ ද කුශලධර්මයෝ භූයස්භාවය පිණිස විපුල බව පිණිස පවතිත්

**1. 16. 2. 3.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා නුප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා නුප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්ති.[1]

**1. 16. 2. 4.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා නුප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ සම්මාදිට්ඨි. සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා නුප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්ති.

**1. 16. 2. 5.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා මිච්ඡාදිට්ඨි උප්පජ්ජති, උප්පන්නා වා මිච්ඡාදිට්ඨි පවඩ්ඪති, යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරො. අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව මිච්ඡාදිට්ඨි උප්පජ්ජති, උප්පන්නා ච මිච්ඡාදිට්ඨි පවඩ්ඪති.[2]

**1. 16. 2. 6.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා සම්මාදිට්ඨි උප්පජ්ජති, උප්පන්නා වා සම්මාදිට්ඨි පවඩ්ඪති, යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො. යොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව සම්මාදිට්ඨි උප්පජ්ජති, උප්පන්නා ච සම්මාදිට්ඨි පවඩ්ඪති.

**1. 16. 2. 7.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙනෙව [3] සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨියා භික්ඛවෙ සමන්නාගතා සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.[4]

**1. 16. 2. 8.**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙනෙවං[3] සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, යථයිදං භික්ඛවෙ සම්මාදිට්ඨි. සම්මාදිට්ඨියා භික්ඛවෙ සමන්නාගතා සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

---

1. පරිහායන්තීති - මජසං, සහා. 2. පවඩ්ඪන්තීති - මජසං, සහා. 3. යෙන - මජසං.
4. උපපජ්ජන්තීති - මජසං.

1. 16. 2. 3.

මහණෙනි, යම් ධර්මයක් හෙතු කොට ගෙණ නූපන්නා වූ ද කුශලධර්මයෝ නූපදිත් නම්, උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, මිථ්‍යා-දෘෂ්ටිය බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිකයාහට නූපන්නා වූ ද කුශලධර්මයෝ නූපදිත්. උපන්නා වූ ද කුශලධර්මයෝ පිරිහෙත්.

1. 16. 2. 4.

මහණෙනි, යම් ධර්මයක් හෙතු කොට ගෙණ නූපන්නා වූ ද අකුශල-ධර්මයෝ නූපදිත් නම්, උපන්නා වූ ද අකුශලධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, සම්‍යග්දෘෂ්ටිය බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, සම්‍යග්-දෘෂ්ටිකයාහට නූපන්නා වූ ද අකුශලධර්මයෝ නූපදිත්. උපන්නා වූ ද අකුශලධර්මයෝ පිරිහෙත්.

1. 16. 2. 5.

මහණෙනි, යම් ධර්මයක් හෙතු කොට ගෙණ නූපන්නා වූ ද මිථ්‍යාදෘෂ්ටිය උපදනේ නම්, උපන්නා වූ ද මිථ්‍යාදෘෂ්ටිය වැඩේ නම්, මහණෙනි, මේ අයොනිසො මනසිකාරය යම්බඳු වේ නම් එබඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, අනුපාය මනසිකාරයෙන් මෙනෙහි කරනුවහුට නූපන්නා වූ ද මිථ්‍යාදෘෂ්ටිය උපදී. උපන්නා වූ ද මිථ්‍යාදෘෂ්ටිය වැඩේ.

1. 16. 2. 6.

මහණෙනි, යම් ධර්මයක් හෙතු කොට ගෙණ නූපන්නා වූ ද සම්‍යග්දෘෂ්ටිය උපදනේ නම්, උපන්නා වූ ද සම්‍යග්දෘෂ්ටිය වැඩේ නම්, මහණෙනි, මේ යොනිසො මනසිකාරය යම්බඳු වේ නම් එබඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, නුවණින් මෙනෙහි කරනුවහට නූපන්නා වූ ද සම්‍යග්දෘෂ්ටිය උපදී. උපන්නා වූ ද සම්‍යග්දෘෂ්ටිය වැඩේ.

1. 16. 2. 7.

මහණෙනි, යම් ධර්මයක් හෙතු කොට ගෙණ මෙසේ සත්ත්වයෝ කාබුත් මරණින් මතු අපාය නම් වූ දුගති නම් වූ විනිපාත නම් වූ නිරයට (ප්‍රතිසන්ධි වශයෙන්) පැමිණෙත් නම්, මහණෙනි, මේ මිථ්‍යාදෘෂ්ටිය යම්බඳු වේ නම් එබඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත සත්ත්වයෝ කාබුත් මරණින් මතු අපාය නම් වූ දුගති නම් වූ විනිපාත නම් වූ නිරයට පැමිණෙත්.

1. 16. 2. 8.

මහණෙනි, යම් ධර්මයක් හෙතු කොට ගෙණ මෙසේ සත්ත්වයෝ කාබුත් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට (පිළිසඳ විසින්) පැමිණෙත් නම්, මහණෙනි, මේ සම්‍යග්දෘෂ්ටිය යම්බඳු වේ නම් එබඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, සම්‍යග්දෘෂ්ටියෙන් යුක්ත වූ සත්ත්වයෝ කාබුත් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට පැමිණෙත්.

## 1. 16. 2. 9—15.

මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා-යා ච පත්ථනා-යො ච පණිධි-යෙ ච සඞ්ඛාරා-සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හි[1] භික්ඛවෙ පාපිකා. සෙය්‍යථාපි භික්ඛවෙ නිම්බබීජං වා කොසාතකීබීජං වා තිත්තකලාබුබීජං වා අල්ලාය පඨවියා නික්ඛිත්තං යඤ්චෙව පඨවිරසං උපාදියති, යඤ්ච ආපොරසං උපාදියති, සබ්බං තං තිත්තකත්තාය කටුකත්තාය අසාතත්තාය සංවත්තති. තං කිස්ස හෙතු: බීජං[2] හි භික්ඛවෙ පාපකං. එවමෙව ඛො භික්ඛවෙ මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා – යා ච පත්ථනා – යො ච පණිධි – යෙ ච සඞ්ඛාරා – සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හි භික්ඛවෙ පාපිකාති.

## 1. 16. 2. 16—22.

සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා – යා ච පත්ථනා – යො ච පණිධි – යෙ ච සඞ්ඛාරා – සබ්බෙ තෙ ධම්මා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හි භික්ඛවෙ භද්දිකා. සෙය්‍යථාපි භික්ඛවෙ උච්ඡුබීජං වා සාලිබීජං වා මුද්දිකාබීජං වා අල්ලාය පඨවියා[3] නික්ඛිත්තං යඤ්චෙව පඨවිරසං උපාදියති, යඤ්ච ආපොරසං උපාදියති, සබ්බං තං මධුරත්තාය සාතත්තාය අසෙචනකත්තාය[4] සංවත්තති. තං කිස්ස හෙතු: බීජං හි භික්ඛවෙ භද්දකං. එවමෙව ඛො භික්ඛවෙ සම්මාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා – යා ච පත්ථනා – යො ච පණිධි – යෙ ච සඞ්ඛාරා – සබ්බෙ තෙ ධම්මා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හි භික්ඛවෙ භද්දිකාති.

**වග්ගො දුතියො**

1. දිට්ඨිහිස්ස - මජසං. 2. බීජං - සීමු. බීජංහිස්ස - මජසං. 3. පඨවියා - මජසං.
4. අසෙචනකත්තාය - මජසං.

## 1. 16. 2. 9—15.

**මහණෙනි,** මිසදිටුගත් පුරුෂපුද්ගලයාගේ දෘෂ්ටියට අනුරූප වූ **සමාප්ත** වූ (නිඃශෙෂ වූ) සමාදින්න වූ (මුල මැද අග සම්කොට ගත්) යම් **කායකර්මයෙකුත් වේ ද,** ... යම් වාක්කර්මයෙකුත් වේ ද, දෘෂ්ටියට අනුරූප වූ **පිරිපුන් වූ මොනවට ගන්නා ලද යම් මනඃකර්මයෙකුත් වේ ද**...(දෘෂ්ටිසහජාත වූ) **යම් චෙතනායෙකුත් වේ ද**...යම් ප්‍රාර්ථනායෙකුත් වේ ද...**යම් චිත්තප්‍රණිධියෙකුත්** (චෙතනා ප්‍රාර්ථනාවන්ගේ වශයෙන් සිත පිහිටුවාලීමෙක්) වේ ද ... යම් සංස්කාර කෙනෙකුත් වෙද් ද, ඒ සියලු ධර්මයෝ අනිටු වූ අකාන්ත වූ මන නොවඩන්නා වූ අහිත වූ දුක් පිණිස පවත්නාහ. ඒ කවර හෙයින: මහණෙනි, දෘෂ්ටිය පවිටු ය, එහෙයිනි. මහණෙනි, යම්සේ කොසඹ බිජුවටෙක් වේවයි, වැටකොළු බිජුවටෙක් වේවයි, තිත්ත ලබු බිජුවටෙක් වේවයි, තෙත් බිම බහාලන ලද්දේ යම් ම පෘථිවීරසයකුත් ඇද ගණී ද, යම් ම ආපොරසයකුත් ඇද ගණී ද, ඒ සියල්ල තිත්තරස බව පිණිස, කටුකරස බව පිණිස, නොමිහිරි රස බව පිණිස පවත්නේ ය. ඒ කවරහෙයින: මහණෙනි, බිජුවට ලාමක ය, එහෙයිනි. මහණෙනි, එපරිද්දෙන් ම මිසදිටු ගත් පුරුෂ පුද්ගලයාගේ දෘෂ්ටියට අනුරූප වූ පිරිපුන් වූ සමාදන් වූ යම් කායකර්මයෙකුත් වේ ද ... යම් වාකකර්මයෙකුත් වේ ද ... යම් මනඃකර්මයෙකුත් වේ ද ... යම් චෙතනායෙකුත් වේ ද... යම් ප්‍රාර්ථනායෙකුත් වේ ද .... යම් ප්‍රණිධියෙකුත් වේ ද ... යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද, ඒ සියලු ධර්මයෝ අනිටු වූ නොකල් වූ අමනාප වූ අහිත වූ දුක් පිණිස පවත්නාහ. ඒ කවරහෙයින: මහණෙනි, දෘෂ්ටිය පවිටු ය, එහෙයිනි.

## 1. 16. 2. 16—22.

මහණෙනි, සම්‍යග්දෘෂ්ටිකා වූ පුරුෂපුද්ගලයාගේ දෘෂ්ටියට අනුරූප වූ පිරිපුන් වූ සමාදන් වූ යම් කායකර්මයෙකුත් වේ ද ... යම් වාක්කර්මයෙකුත් වේ ද ... දෘෂ්ටියට අනුරූප වූ පිරිපුන් වූ, සමාදන් වූ යම් මනඃකර්මයෙකුත් වේ ද ... යම් චෙතනායෙකුත් වේ ද ... යම් ප්‍රාර්ථනායෙකුත් වේ ද ... යම් චිත්තප්‍රණිධියෙකුත් වේ ද ... යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද, ඒ සියලු ධර්මයෝ ඉටු වූ කල් වූ මනාප වූ හිත වූ සුව පිණිස පවත්නාහ. ඒ කවර හෙයින: මහණෙනි, දෘෂ්ටිය කල්‍යාණය, එහෙයිනි. මහණෙනි, යම් බඳු උක් බිජුවටෙක් වේවයි, හැල් බිජුවටෙක් වේවයි, මිදි බිජුවටෙක් වේවයි, තෙත් බිමෙහි ඇද බහාලන ලද්දේ යම් ම පෘථිවී රසයකුත් ඇද ගණී ද, යම් ම ආපො රසයකුත් ඇද ගණී ද, ඒ සියල්ල මධුරභාවය පිණිස, ප්‍රියභාවය පිණිස අසෙචනකභාවය (අමුතු රස නො ඉසිය යුතු බව = අත්‍යන්තප්‍රියභාවය) පිණිස පවත්නේය. ඒ කවර හෙයින: මහණෙනි, බිජුවට සොඳුරුය, එහෙයිනි. මහණෙනි, එපරිද්දෙන් ම සම්‍යග්දෘෂ්ටික පුරුෂපුද්ගලයාගේ දෘෂ්ටියට අනුරූප වූ පිරිපුන් වූ සමාදන් ව ගත් යම් කායකර්මයෙකුත් වේ ද...යම් වාක්කර්මයෙකුත් වේ ද ... දෘෂ්ටියට අනුරූප වූ පිරිපුන් වූ සමාදන් ව ගත් යම් මනඃකර්මයෙකුත් වේ ද ... යම් චෙතනායෙකුත් වේ ද ... යම් ප්‍රාර්ථනායෙකුත් වේ ද ... යම් ප්‍රණිධියෙකුත් වේ ද ... යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද, ඒ සියලු ධර්මයෝ ඉටු වූ කල් වූ මනාප වූ හිත වූ සුව පිණිස පවත්නාහ. ඒ කවරහෙයින: මහණෙනි, දෘෂ්ටිය සොඳුරු ය, එහෙයිනි.

**දෙවන වගයි.**

## 1. 16. 3. 1.

එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනා-හිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙව-මනුස්සානං. කතමො එකපුග්ගලො: මිච්ඡාදිට්ඨිකො හොති විපරීතදස්සනො. සො බහුජනං සද්ධම්මා වුට්ඨාපෙත්වා අසද්ධම්මෙ පතිට්ඨාපෙති. අයං ඛො භික්ඛවෙ එකපුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං.

## 1. 16. 3. 2.

එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජන-හිතාය බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමො එකපුග්ගලො: සම්මාදිට්ඨිකො හොති අවිපරීතදස්සනො. සො බහුජනං අසද්ධම්මා වුට්ඨාපෙත්වා සද්ධම්මෙ පතිට්ඨාපෙති. අයං ඛො භික්ඛවෙ එක-පුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

## 1. 16. 3. 3

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං මහාසාවජ්ජං, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨිපරමානි භික්ඛවෙ වජ්ජානීති.[1]

## 1. 16. 3. 4

නාහං භික්ඛවෙ අඤ්ඤං එකපුග්ගලම්පි සමනුපස්සාමි, යො එවං බහු-ජනාහිතාය පටිපන්නො බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං, යථයිදං භික්ඛවෙ මක්ඛලී මොඝපුරිසො. සෙය්‍යථාපි භික්ඛවෙ නදීමුඛෙ ඛිපං[2] ඔඩ්ඩෙය්‍ය බහුන්නං මච්ඡානං අහිතාය දුක්ඛාය අනත්ථාය ව්‍යසනාය. එවමෙව ඛො භික්ඛවෙ මක්ඛලී මොඝපුරිසො මනුස්සඛිපං මඤ්ඤෙ ලොකෙ උප්පන්නො බහුන්නං සත්තානං අහිතාය දුක්ඛාය අනත්ථාය ව්‍යසනායාති.

## 1. 16. 3. 5.

දුරක්ඛාතෙ භික්ඛවෙ ධම්මවිනයෙ යො ච සමාදපෙති, යඤ්ච සමාදපෙති, යො ච සමාදපිතො තථත්තාය පටිපජ්ජති, සබ්බෙ තෙ බහුං අපුඤ්ඤං පසවන්ති. තං කිස්ස හෙතු: දුරක්ඛාතත්තා භික්ඛවෙ ධම්මස්ස.

1. මහාසාවජ්ජානීති - මජසං. 2. ඛිප්පං උඩ්ඩෙය්‍ය - මජසං.

## 1. 16. 3. 1.

මහණෙනි, ලෙව්හි උපදනට සමත් එක් පුද්ගලයෙක් බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නොසුව පිණිස බොහෝ දෙනාට නොවැඩ පිණිස දෙව්මිනිස්නට අහිත පිණිස දුක් පිණිස උපන්නේ වෙයි. කවර එක් පුද්ගලයෙක යත්: විපරීතදර්‍ශන ඇති මිථ්‍යාදෘෂ්ටික වෙයි. හෙතෙම බොහෝ දෙනා (දශකුශලකර්‍මපථසඞ්ඛ්‍යාත) සද්ධර්‍මයෙන් නගා (දශ අකුශල කර්‍මපථ සඞ්ඛ්‍යාත) අසද්ධර්‍මයෙහි පිහිටුවයි. මහණෙනි, ලෙව්හි උපදනට සමත් මේ එක් පුද්ගල තෙමේ බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නොසුව පිණිස බොහෝ දෙනාට නොවැඩ පිණිස දෙව්මිනිස්නට අහිත පිණිස දුක් පිණිස උපන්නේ වෙයි.

## 1. 16. 3. 2.

මහණෙනි, ලෙව්හි උපදනට සමත් එක් පුද්ගලයෙක් බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට වැඩ පිණිස දෙව්-මිනිස්නට හිත පිණිස සුව පිණිස උපන්නේ වෙයි. කවර එක් පුද්ගලයෙක යත්: මහණෙනි, අවිපරීත දර්‍ශන ඇති සම්‍යග් දෘෂ්ටික වෙයි. හෙ තෙමේ බොහෝ දෙනා අසද්ධර්‍මයෙන් නගා සද්ධර්‍මයෙහි පිහිටුවයි. මහණෙනි, ලෙව්හි උපදනට සමත් මේ එක් පුද්ගලයා බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට වැඩ පිණිස දෙව්මිනිස්නට හිත පිණිස සුව පිණිස උපන්නේ වෙයි.

## 1. 16. 3. 3.

මහණෙනි, යමෙක් මෙසේ මහාසාවද්‍ය වේ ද, මහණෙනි, මේ මිථ්‍යාදෘෂ්ටිය යම් බඳු වේ නම් එබඳු අන් එක ධර්‍මයකුදු මම නො දක්මි. මහණෙනි, දොෂයෝ මිථ්‍යාදෘෂ්ටිය පරම කොට ඇතියහ.

## 1. 16. 3. 4.

මහණෙනි, යමෙක් මෙසේ බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නොසුව පිණිස බොහෝ දෙනාට නොවැඩ පිණිස දෙව්මිනිස්නට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නේ ද, මහණෙනි, මක්ඛලී මොඝපුරුෂයා බඳු අන් එක පුගුලකු මම නො දක්මි. මහණෙනි, යම්සේ හෝමුවදොර බොහෝ මිස්නට අහිත පිණිස දුක් පිණිස නොවැඩ පිණිස වැසන පිණිස කෙමිනක් බනා ලන්නේ ද, මහණෙනි, එපරිද්දෙන් ම මක්ඛලී මොඝපුරුෂයා බොහෝ සත්නට අහිත පිණිස දුක් පිණිස නොවැඩ පිණිස වැසන පිණිස ලෙව්හි උපන් මිනිස් කෙමිනක් බඳු වේ.

## 1. 16. 3. 5.

මහණෙනි, වරදවා දෙසන ලද බාහිරක ශාසනයෙහි යමෙකුත් සමාදන් කරවා නම්, යමකුදු ලවා සමාදන් කරවා නම්, සමාදන් කරවන ලද යම් අනුවැසියෙකුත් ඒ පිණිස පිළිපදනේ නම්, එ හැම දෙන බොහෝ පව් රැස් කෙරෙත්. ඒ කවරහෙයින; මහණෙනි, ඒ ශාසනය වරදවා දෙසන ලද බැවිනි.

**1. 16. 3. 6.**

ස්වාක්ඛාතෙ භික්ඛවෙ ධම්මවිනයෙ යො ච සමාදපෙති, යඤ්ච සමාදපෙති, යො ච සමාදපිතො තථත්තාය පටිපජ්ජති, සබ්බෙ තෙ බහුං පුඤ්ඤං පසවන්ති. තං කිස්ස හෙතු: ස්වාක්ඛාතත්තා භික්ඛවෙ ධම්මස්සාති.

**1. 16. 3. 7.**

දුරක්ඛාතෙ භික්ඛවෙ ධම්මවිනයෙ දායකෙන මත්තා ජානිතබ්බා, නො පටිග්ගාහකෙන. තං කිස්ස හෙතු: දුරක්ඛාතත්තා භික්ඛවෙ ධම්මස්ස.

**1. 16. 3. 8.**

ස්වාක්ඛාතෙ භික්ඛවෙ ධම්මවිනයෙ පටිග්ගාහකෙන මත්තා ජානිතබ්බා, නො දායකෙන. තං කිස්ස හෙතු: ස්වාක්ඛාතත්තා භික්ඛවෙ ධම්මස්සාති.

**1. 16. 3. 9.**

දුරක්ඛාතෙ භික්ඛවෙ ධම්මවිනයෙ යො ආරද්ධවිරියො, සො දුක්ඛං විහරති. තං කිස්ස හෙතු: දුරක්ඛාතත්තා භික්ඛවෙ ධම්මස්ස.

**1. 16. 3. 10.**

ස්වාක්ඛාතෙ භික්ඛවෙ ධම්මවිනයෙ යො කුසීතො, සො දුක්ඛං විහරති. තං කිස්ස හෙතු: ස්වාක්ඛාතත්තා භික්ඛවෙ ධම්මස්සාති.

**1. 16. 3. 11.**

දුරක්ඛාතෙ භික්ඛවෙ ධම්මවිනයෙ යො කුසීතො, සො සුඛං විහරති. තං කිස්ස හෙතු: දුරක්ඛාතත්තා භික්ඛවෙ ධම්මස්ස.

**1. 16. 3. 12.**

ස්වාක්ඛාතෙ භික්ඛවෙ ධම්මවිනයෙ යො ආරද්ධවිරියො, සො සුඛං විහරති. තං කිස්ස හෙතු: ස්වාක්ඛාතත්තා භික්ඛවෙ ධම්මස්සාති.

**1. 16. 3. 13**

සෙය්‍යථාපි භික්ඛවෙ අප්පමත්තකොපි ගූථො දුග්ගන්ධො හොති, එවමෙව ඛො අහං භික්ඛවෙ අප්පමත්තකම්පි භවං න වණ්ණෙමි, අන්තමසො අච්ඡරාසඞ්ඝාතමත්තම්පීති

### 1. 16. 3. 6.

මහණෙනි, මොනොවට (ඒකාන්තනෛර්‍යාණිකභාවයෙන්) දෙසන ලද ශාසනයෙහි යමෙකුත් සමාදන් කරවා නම්, යමකුදු ලවා සමාදන් කරවා නම්, සමාදන් කරවන ලද යම් අතැවැසියෙකුත් ඒ පිණිස පිළිපදනේ නම්, එ හැම දෙන බොහෝ පින් රැස් කෙරෙත්. ඒ කවරහෙයින: මහණෙනි, ශාසනය මොනොවට දෙසන ලද බැවිනි.

### 1. 16. 3. 7.

මහණෙනි, වරදවා දෙසන ලද බාහිරකශාසනයෙහි දායකයා විසින් පමණ දත යුතු වෙයි. ප්‍රතිග්‍රාහකයා විසින් නොදත යුතු වේ. ඒ කවරහෙයින: මහණෙනි, ශාසනය වරදවා දෙසන ලද බැවිනි.

### 1. 16. 3. 8.

මහණෙනි, මොනොවට දෙසන ලද ශාසනයෙහි ප්‍රතිග්‍රාහකයා විසින් පමණ දත යුතු වෙයි. දායකයා විසින් නොදත යුතු වේ. ඒ කවරහෙයින: මහණෙනි, ශාසනය මොනොවට දෙසන ලද බැවිනි.

### 1. 16. 3. 9.

මහණෙනි, වරදවා දෙසන ලද බාහිරකශාසනයෙහි යමෙක් පටන්ගත් වැර ඇතියේ ද, හේ දුකසේ වෙසෙයි. ඒ කවරහෙයින: මහණෙනි, ධර්මය වරදවා දෙසන ලද බැවිනි.

### 1. 16. 3. 10.

මහණෙනි, මොනොවට දෙසන ලද ශාසනයෙහි යමෙක් කුසීත (කුසිත් විතක් ඇති) වේ ද, හේ දුකසේ වෙසෙයි. ඒ කවරහෙයින: මහණෙනි, ධර්මය මනාකොට දෙසන ලද බැවිනි.

### 1. 16. 3. 11.

මහණෙනි, වරදවා දෙසන ලද බාහිරක ශාසනයෙහි යමෙක් කුසීත වේ ද, හේ සුවසේ වෙසෙයි. ඒ කවරහෙයින: මහණෙනි, ධර්මය වරදවා දෙසන ලද බැවිනි.

### 1. 16. 3. 12.

මහණෙනි, මොනොවට දෙසන ලද ශාසනයෙහි යමෙක් පටන්ගත් වැර ඇතියේ ද, හේ සුවසේ වෙසෙයි. ඒ කවරහෙයින: මහණෙනි, ධර්මය මොනොවට දෙසන ලද බැවිනි.

### 1. 16. 3. 13.

මහණෙනි, යම්සේ අල්පමාත්‍ර වූත් ගූථය දුගඳ වේ ද, එසෙයින් ම මම අල්පමාත්‍ර කාලයකුදු යටතින් ඇඟිලිපොළනකල් පමණකුදු භවප්‍රතිසන්ධිය නො වණමි.

### 1. 16. 3. 14—17.

සෙය්‍යථාපි භික්ඛවෙ අප්පමත්තකම්පි මුත්තං දුග්ගන්ධං හොති -පෙ- අප්පමත්තකොපි ඛෙළො දුග්ගන්ධො හොති -පෙ- අප්පමත්තකොපි පුබ්බො දුග්ගන්ධො හොති -පෙ- අප්පමත්තකම්පි ලොහිතං දුග්ගන්ධං හොති, එවමෙව ඛො අහං භික්ඛවෙ අප්පමත්තකම්පි භවං න වණ්ණෙමි, අන්තමසො අච්ඡරාසඞ්ඝාතමත්තම්පීති.

**වග්ගො තතියො.**

---

## [ ජම්බුදීපපෙය්‍යාලො ]

### 1. 16. 4. 1.

සෙය්‍යථාපි භික්ඛවෙ අප්පමත්තකං ඉමස්මිං ජම්බුදීපෙ ආරාමරාම-ණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොක්ඛරණීරාමණෙය්‍යකං. අථ ඛො එතදෙව බහුතරං යදිදං උක්කූලවික්කූලං නදීවිදුග්ගං ඛාණුකණ්ටකා-ධානං[1] පබ්බතවිසමං. එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ ථලජා. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ ඔදකා.

### 1. 16. 4. 2.

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ අඤ්ඤත්‍ර මනුස්සෙහි පච්චාජායන්ති.

### 1. 16. 4. 3.

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ පච්චන්තිමෙසු ජනපදෙසු පච්චාජායන්ති අවිඤ්ඤාතාරෙසු මිලක්ඛෙසු.

### 1. 16. 4. 4.

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ පඤ්ඤවන්තො අජළා අනෙළමූගා පටිබලා සුභාසිතදුබ්භාසිතස්ස අත්ථමඤ්ඤාතුං. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ දුප්පඤ්ඤා ජළා එළමූගා න පටිබලා සුභාසිත-දුබ්භාසිතස්ස අත්ථමඤ්ඤාතුං.

### 1. 16. 4. 5.

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ අරියෙන පඤ්ඤාචක්ඛුනා සමන්නාගතා. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ අවිජ්ජාගතා සම්මූළ්හා.

### 1. 16. 4. 6.

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ ලභන්ති තථාගතං දස්සනාය. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ න ලභන්ති තථාගතං දස්සනාය.

1. ඛාණුකණ්ඩකට්ඨානං - මජසං. ඛාණුකණ්ටකධානං - අට්ඨකථා.

### 1. 16. 3. 14—17

මහණෙනි, යම්සේ අල්පමාත්‍ර වූ ද මූත්‍රය දුගඳ වේ ද ... අල්පමාත්‍ර වූ ද කෙළ දුගඳ වේ ද ... අල්පමාත්‍ර වූ ද පූයා දුගඳ වේ ද ... අල්පමාත්‍ර වූ ද ලෙහෙ දුගඳ වේ ද, මහණෙනි, එසෙයින් ම අල්පමාත්‍රකාලයකුදු යටත් පිරිසෙයින් ඇඟිලිවටත කලක් පමණකුදු භවය මම නො වණිමි.

**තෙවන වගයි.**

---

## [ ජම්බුදීපපෙය්‍යාලය ]

### 1. 16. 4. 1.

මහණෙනි, මෙ දඹදිව අරම් රමණීය, වන රමණීය, බිම් රමණීය, පොකුණු රමණීය යම්සේ අල්පමාත්‍ර වේ ද, වැලිදු ගොඩ හා හෝකඩ බුහු තැන් ද, නදී දුර්ග ද, කණු කටු පිහිටි තැන් ද, ගිරි විෂමස්ථාන ද යන මෙය ම ඉබොහෝ වේ, මහණෙනි, එපරිද්දෙන් ම යම් සත්ත්ව කෙනෙක් ගොඩ උපදනාහු ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් දියෙහි උපදනාහු ද තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

### 1. 16. 4. 2.

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් මිනිසුන් කෙරෙහි උපදිත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් මිනිසුන් හැරපියා (නිරුහි) උපදිත් ද, ඒ සත්ත්වයෝ ම බහුතර වෙති.

### 1. 16. 4. 3.

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් මධ්‍යම ජනපදයෙහි උපදිත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් අඥ වූ ම්ලෙච්ඡයන් ඇති පසල්දනවුහි උපදිත් ද, ඒ සත්ත්වයෝ ම බහුතර වෙති.

### 1. 16. 4. 4.

.... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් පැණවත් වෙත් ද, මූඪ නො වෙත් ද, වහතොලු නො වෙත් ද, සුභාෂිත දුර්භාෂිතයන්ගේ අර්ථ දත්නට සමත් වෙත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් දුෂ්ප්‍රාඥ ද, මූඪ ද, වහතොලු ද, සුභාෂිත දුර්භාෂිතයන් ගේ අර්ථ දත්නට අසමත් ද ඒ සත්ත්වයෝ ම බහුතර වෙති.

### 1. 16. 4. 5.

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් ආර්‍ය්‍ය වූ ප්‍රඥාචක්ෂුසින් සමන්විත වෙත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් අවිද්‍යා අඳුරෙන් යුක්ත වූවාහු මූළ්හ වූවාහු ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

### 1 16. 4. 6.

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් තථාගතයන් වහන්සේ දක්නට ලබත් ද, ඒ සත්ත්වයෝ ම අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් තථාගතයන් වහන්සේ දක්නට නො ලබත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

**1. 16. 4. 7.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ ලභන්ති තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවණාය. අථ ඛො එතෙව සත්තා බහුතරා, යෙ න ලභන්ති තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවණාය.

**1. 16. 4. 8.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ සුත්වා ධම්මං ධාරෙන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා, යෙ සුත්වා ධම්මං න ධාරෙන්ති.

**1. 16. 4. 9.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ ධතානං[1] ධම්මානං අත්ථං උපපරික්ඛන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ ධතානං ධම්මානං අත්ථං න උපපරික්ඛන්ති.

**1. 16. 4. 10.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං පටිපජ්ජන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ[2] අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං න පටිපජ්ජන්ති.

**1. 16. 4. 11.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ සංවෙජනීයෙසු[3] ඨානෙසු සංවිජ්ජන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ සංවෙජනීයෙසු ඨානෙසු න සංවිජ්ජන්ති.

**1. 16. 4. 12.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ සංවිග්ගා යොනිසො පදහන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ සංවිග්ගා යොනිසො න පදහන්ති.

**1. 16. 4. 13.**

එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ වවස්සග්ගාරම්මණං කරිත්වා ලභන්ති සමාධිං[4], ලභන්ති චිත්තස්ස[5] එකග්ගං. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ වවස්සග්ගාරම්මණං කරිත්වා න ලභන්ති සමාධිං, න ලභන්ති චිත්තස්ස එකග්ගං.

---

1. ධාතානං-මජසං. 2. යෙ න අත්ථමඤ්ඤාය න ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං න පටිපජ්ජන්ති. සීමු P.S.T. 3. සංවෙජනියෙසු - මජසං. 4. ලභන්ති චිත්තස්ස සමාධිං - සීමු.
5. ලභන්ති චිත්තස්සෙකග්ගතං - සයා. මජසං

**1. 16 4. 7.**

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් තථාගතයන් වහන්සේ විසින් සිවුසස් පවසා වදහළ ධම්විනය අසන්නට ලබත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් තථාගතයන් වහන්සේ විසින් (සිවුසස්) හෙළි කොට වදාළ ධම්විනය අසන්නට නො ලබත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

**1. 16. 4. 8.**

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් අසා පෙළ දරත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් අසා පෙළ නො දරත් ද තෙල සත්ත්වයෝ ම බහුතර වෙති

**1. 16. 4. 9.**

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් පුහුණු පෙළ අරුත් පිරික්සත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් දරූ පෙළ අරුත් නො පිරික්සත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

**1. 16. 4. 10**

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් අවුවා දැන පෙළ දැන ධම්ානුධම්ය (ලොව්තුරා දහම්ට අනුලොම් පිළිවෙත) පිළිපදිත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් අරුත් දැන පෙළ දැන ධම්ානුධම්ය නො පිළිපදිත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

**1. 16. 4. 11.**

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් සංවේග ජනන කරුණෙහි (ජාත්‍යාදියෙහි ලා) සංවෙග (සංපත්‍රපණෙන) කෙරෙත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් සංවෙග ජනන කරුණෙහි සංවෙග නො කෙරෙත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

**1. 16. 4. 12.**

.... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් සංවිග්න වූවාහු උපා නුවණින් ප්‍රධන් වැර වඩත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් සංවිග්න වූවාහු නුවණින් වැර නො වඩත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

**1. 16. 4. 13.**

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් නිවන් අරමුණු කොට මාර්ගඵලසමාධිය ලබත් ද, චිත්තෙකාග්‍රය ලබත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් නිවන් අරමුණු කොට සමාධිය නො ලබත් ද චිත්තෙකාග්‍රය නො ලබත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

**1. 16. 4. 14.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ අන්නග්ගරසග්ගානං ලාභිනො. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ අන්නග්ගරසග්ගානං න ලාභිනො උඤ්ඡෙන කපාලාභතෙන යාපෙන්ති.

**1. 16. 4. 15.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස ලාභිනො. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස න ලාභිනො. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස ලාභිනො භවිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

**1. 16. 4. 16—18.**

සෙය්‍යථාපි භික්ඛවෙ අප්පමත්තකං ඉමස්මිං ජම්බුදීපෙ ආරාමරාමණෙය්‍යකං වනරාමණෙය්‍යකං භූමිරාමණෙය්‍යකං පොක්ඛරණීරාමණෙය්‍යකං, අථ ඛො එතදෙව බහුතරං යදිදං උක්කූලවික්කූලං නදීවිදුග්ගං ඛාණුකණ්ටකාධානං[1] පබ්බතවිසමං. එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ මනුස්සා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා, යෙ මනුස්සා චුතා නිරයෙ පච්චාජායන්ති, -පෙ- තිරච්ඡානයොනියා පච්චාජායන්ති, -පෙ- පෙත්තිවිසයෙ පච්චාජායන්ති.

**1. 16. 4. 19—21.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ මනුස්සා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා, යෙ මනුස්සා චුතා නිරයෙ පච්චාජායන්ති. -පෙ- තිරච්ඡානයොනියා පච්චාජායන්ති. -පෙ- පෙත්තිවිසයෙ පච්චාජායන්ති.

**1. 16. 4. 22—24.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ දෙවා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා, යෙ දෙවා චුතා නිරයෙ පච්චාජායන්ති. -පෙ- අථ ඛො එතෙව සත්තා බහුතරා, යෙ තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- පෙත්තිවිසයෙ පච්චාජායන්ති.

**1. 16 4. 25—27.**

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ දෙවා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ දෙවා චුතා නිරයෙ පච්චාජායන්ති. -පෙ- තිරච්ඡානයොනියා පච්චාජායන්ති. -පෙ- පෙත්තිවිසයෙ පච්චාජායන්ති.

---

1. ඛානුකණ්ටකට්ඨානං - ම.ජ.සං.

1. 16. 4. 14.

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් අග්‍ර වූ පඤ්චභොජ-යන් හා අග්‍ර වූ රස ලබනසුලු වෙත් ද, තෙල සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් අග්‍ර ආහාර හා අග්‍ර රස නො ලබන සුලු වෙත් ද අසුලා ගත් වනමූලඵලයෙන් හෝ කබලින් අළ අහරින් හෝ යපෙත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

1. 16. 4. 15.

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් (චතුඃ ශ්‍රාමණ්‍යඵල සඞ්ඛ්‍යාත) අර්ථරසයත් (චතුර් මාර්ග සඞ්ඛ්‍යාත) ධර්මරසයත් (නිර්වාණ සඞ්ඛ්‍යාත) විමුක්තිරසයත් ලබනසුලු වෙත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් අර්ථරස ධර්මරස විමුක්තිරස නොලබන සුලු වෙත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති. මහණෙනි, එහෙයින් 'අර්ථරසය - ධර්මරසය - විමුක්තිරසය ලබන සුලු වම්හ'යි මෙසෙයින් හික්මිය යුතුය. මහණෙනි, තොප විසින් මෙසෙයින් හික්මිය යුතුයි.

1. 16. 4. 16—18.

මහණෙනි, යම්සේ මේ දඹදිව අරම් රමණීය, වන රමණීය, බිම් රමණීය, පොකුණු රමණීය අල්පමාත්‍ර වේ. වැලිදු යම් ගොඩවල තැන්, නදීදුර්ග, කණු කටු ගැවසීගත් තැන් හා පර්වත විෂමස්ථාන ඇත් ද, මෙය ම බහුතර වේ. මහණෙනි, එපරිද්දෙන් ම යම් සත්ත්ව කෙනෙක් මිනිසත් බැවින් ච්‍යුත වූවාහු මනුෂ්‍යයන් කෙරෙහි උපදිත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් මිනිසත් බැවින් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති. ... තිරිසන්යොන්හි උපදිත් ද, .... ප්‍රෙතවිෂයෙහි උපදිත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

1. 16. 4. 19—21.

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් මිනිසත් බැවින් ච්‍යුත වූවාහු දෙවියන් කෙරෙහි උපදිත් ද, තෙල සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් මිනිසත් බැවින් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් ද ... තිරිසන්යොන්හි උපදිත් ද ... ප්‍රෙතවිෂයෙහි උපදිත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

1. 16. 4. 22—24.

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් දෙවියන් කෙරෙන් ච්‍යුත වූවාහු දෙවියන් කෙරෙහි උපදිත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්ව කෙනෙක් දෙවියන් කෙරෙන් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් ද ... තිරිසන්යොන්හි උපදිත් ද ... ප්‍රෙතවිෂයෙහි උපදිත් ද තෙල සත්ත්වයෝ ම බහුතර වෙති.

1. 16. 4. 25—27

... මහණෙනි, එසෙයින් ම යම් සත්ත්ව කෙනෙක් දෙවියන් කෙරෙන් ච්‍යුත වූවාහු මනුෂ්‍යයන් කෙරෙහි උපදිත් ද, ඒ සත්ත්වයෝ අල්ප වෙති. යම් සත්ත්ව කෙනෙක් දෙවියන් කෙරෙන් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් ද .... තිරිසන්යොන්හි උපදිත් ද .... ප්‍රෙතවිෂයෙහි උපදිත් ද, තෙල සත්ත්වයෝ ම බහුතර වෙත්.

## 1. 16. 4. 28—30

පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ නිරයා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ නිරයා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- පෙත්තිවිසයෙ පච්චාජායන්ති.

## 1. 16. 4. 31—33.

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා, යෙ නිරයා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ නිරයා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- පෙත්තිවිසයෙ පච්චාජායන්ති.

## 1. 16. 4. 34—36.

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ තිරච්ඡානයොනියා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ පෙත්තිවිසයෙ පච්චාජායන්ති.

## 1. 16. 4. 37—39.

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ තිරච්ඡානයොනියා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ තිරච්ඡානයොනියා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- පෙත්තිවිසයෙ පච්චාජායන්ති.

## 1 16. 4. 40—42.

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ පෙත්තිවිසයා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ පෙත්තිවිසයා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- තිරච්ඡානයොනියා පච්චාජායන්ති -පෙ- පෙත්තිවිසයෙ පච්චාජායන්ති.

## 1. 16. 4. 43—45.

-පෙ- එවමෙව ඛො භික්ඛවෙ අප්පකා තෙ සත්තා යෙ පෙත්තිවිසයා චුතා දෙවෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව සත්තා බහුතරා යෙ පෙත්තිවිසයා චුතා නිරයෙ පච්චාජායන්ති -පෙ- තිරච්ඡානයොනියා පච්චාජායන්ති. -පෙ- පෙත්තිවිසයෙ පච්චාජායන්ති.

[ජම්බුදීප පෙය්‍යාලො නිට්ඨිතො]

වග්ගො චතුත්ථො.

### 1. 16. 4. 28—30.

මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් නිරයෙන් ච්‍යුත වූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් ද, ඒ සත්ත්‍වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්‍ව කෙනෙක් නිරයෙන් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් ද .... තිරිසන්යොන්හි උපදිත් ද ... ප්‍රෙතවිෂයෙහි උපදිත් ද, තෙල සත්ත්‍වයෝ ම බහුතර වෙත්.

### 1. 16. 4. 31—33.

මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් නිරයෙන් ච්‍යුත වූවාහු දෙවියන් කෙරෙහි උපදිත් ද, ඒ සත්ත්‍වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්‍ව කෙනෙක් නිරයෙන් ච්‍යුත වූවාහු නිරයෙහි ම උපදිත් ද ... තිරිසන්යොන්හි උපදිත් ද ... ප්‍රෙතවිෂයෙහි උපදිත් ද, තෙල සත්ත්‍වයෝ ම බහුතර වෙත්.

### 1. 16. 4. 34—36.

මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් තිරිසන්යොනින් ච්‍යුත වූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් ද, ඒ සත්ත්‍වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්‍ව කෙනෙක් තිරිසන්යොනින් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් ද ... තිරිසන් යොන්හි උපදිත් ද ... ප්‍රෙතවිෂයෙහි උපදිත් ද, තෙල සත්ත්‍වයෝ ම බහුතර වෙත්.

### 1. 16. 4. 37—39.

මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් තිරිසන්යොනින් ච්‍යුත වූවාහු දෙවියන් කෙරෙහි උපදිත් ද, ඒ සත්ත්‍වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්‍ව කෙනෙක් තිරිසන්යොනින් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් ද ... තිරිසන් යොන්හි උපදිත් ද ... ප්‍රෙතවිෂයෙහි උපදිත් ද, තෙල සත්ත්‍වයෝ ම බහුතර වෙති.

### 1. 16. 4. 40—42.

මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් ප්‍රෙතවිෂයෙන් ච්‍යුත වූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් ද, ඒ සත්ත්‍වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්‍ව කෙනෙක් ප්‍රෙතවිෂයෙන් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් ද ... තිරිසන් යොන්හි උපදිත් ද ... ප්‍රෙතවිෂයෙහි උපදිත් ද, තෙල සත්ත්‍වයෝ ම බහුතර වෙත්.

### 1. 16. 4. 43—45.

මහණෙනි, එසෙයින් ම යම් සත්ත්‍ව කෙනෙක් ප්‍රෙතවිෂයෙන් ච්‍යුත වූවාහු දෙවියන් කෙරෙහි උපදිත් ද, ඒ සත්ත්‍වයෝ අල්ප වෙති. වැලිදු යම් සත්ත්‍ව කෙනෙක් ප්‍රෙතවිෂයෙන් ච්‍යුත වූවාහු නිරයෙහි උපදිත් ද ... තිරිසන් යොන්හි උපදිත් ද ... ප්‍රෙතවිෂයෙහි උපදිත් ද, තෙල සත්ත්‍වයෝ ම බහුතර වෙත්.

[ජම්බුද්වීප පෙය්‍යාලය නිමි.]

**සතරවන වග සි.**

### 1. 16. 5. 1—16.

අද්ධමිදං භික්ඛවෙ ලාභානං යදිදං ආරඤ්ඤකත්තං[1] - පිණ්ඩපාතිකත්තං - පංසුකූලිකත්තං - තෙචීවරිකත්තං - ධම්මකථිකත්තං - විනයධරත්තං[2] - බාහුසච්චං - ථාවරෙය්‍යං - ආකප්පසම්පදා - පරිවාරසම්පදා - මහාපරිවාරතා - කොලපුත්ති - වණ්ණපොක්ඛරතා - කල්‍යාණවාක්කරණතා - අප්පිච්ඡතා - අප්පාබාධතාති.

**(සොළසපසාදකර ධම්මා නිට්ඨිතා.)**

**වග්ගො පඤ්චමො.**

## [ අච්ඡරාසඞ්ඝාතවග්ගො* ]

### 1. 16. 6. 1.

අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු පඨමං ඣානං[3] භාවෙති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසනකරො ඔවාදපතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති. කො පන වාදො යෙ තං බහුලීකරොන්ති

### 1. 16. 6. 2—8.

අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු දුතියං ඣානං[4] භාවෙති, -පෙ- තතියං ඣානං[5] භාවෙති, - චතුත්ථං ඣානං[6] භාවෙති - මෙත්තං චෙතො-විමුත්තිං භාවෙති, - කරුණං චෙතොවිමුත්තිං භාවෙති, - මුදිතං චෙතොවිමුත්තිං භාවෙති, - උපෙක්ඛං චෙතොවිමුත්තිං භාවෙති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසනකරො ඔවාදපතිකරො අමොඝං රට්ඨ-පිණ්ඩං භුඤ්ජති. කො පන වාදො, යෙ තං බහුලීකරොන්ති.

### 1. 16. 6. 9—12.

-පෙ- කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, -පෙ- වෙදනාසු වෙදනානුපස්සී විහරති, -පෙ- චිත්තෙ චිත්තානුපස්සී විහරති, -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං =

---

1. ආරඤ්ඤිකත්තං - මජසං. 2. විනයධරත්තං - සයා. PTS
3. පඨමජ්ඣානං - සීමු. 4. දුතියජ්ඣානං - සීමු.
5. තතියජ්ඣානං - සීමු. 6. චතුත්ථජ්ඣානං - සීමු. 7. විරියං - මජසං
* ඣානවග්ගො - PTS

**1. 16. 5. 1—16.**

මහණෙනි, යම් ආරණ්‍යක බවෙක් වේ ද, ... පිණ්ඩපාතික බවෙක් වේ ද, ... පංසුකූලික බවෙක් වේ ද, ... තෙචීවරික බවෙක් වේ ද, ... ධර්මකථික බවෙක් වේ ද, ... විනයධර බවෙක් වේ ද, ... බහුශ්‍රැත බවෙක් වේ ද, ... ස්ථාවරප්‍රාඥ බවෙක් වේ ද, ... ආකල්පසම්පත්තියෙක් වේ ද, ... පරිවාර-සම්පත්තියෙක් වේ ද, ... මහපිරිවර ඇති බවෙක් වේ ද, ... කුලපුත් බවෙක් වේ ද, ... රූපසම්පන්න බවෙක් වේ ද, ... බස්කම්හි මිහුරු හඬ ඇති බවෙක් වේ ද, .... අල්පේච්ඡ බවෙක් වේ ද, ... ආරෝග්‍යසම්පත්තියෙක් වේ ද, මේය ලාභයන් අතුරෙහි එකාන්ත ලාභය වේ.

[සොළොස්ප්‍රසාදකරධර්ම නිමි ]

**පස්වන වග යි.**

---

## [ අච්ඡරාසඞ්ඝාත වර්ගය ]

**1. 16. 6. 1.**

මහණෙනි, ඉදින් මහණ ඇඟිලි පොළන පමණ කලෙකුදු ප්‍රථමධ්‍යානය භවා නම්, මහණෙනි, මේ මහණ නො හළ දැහැන් ඇතිව වසතියි කියනු ලැබේ. ශාස්තෲශාසනය කරන්නේ (ශාස්තෲන් වහන්සේගේ) අවවාදය පිළිපදනේ රට වැසියාගේ (සවිපාක හෙයින්) නො සිස් වූ පිණ්ඩපාතය වළඳතියි කියනු ලැබේ. යම් කෙනෙක් එය බහුල වශයෙන් කෙරෙත් නම් කවර කථා ය.

**1. 16. 6. 2—8.**

මහණෙනි, ඉදින් මහණ අසුරු ගසන පමණ කලෙකුදු ද්විතීයධ්‍යානය භවා නම්, ... තෘතීයධ්‍යානය භවා නම්, ... චතුර්ථධ්‍යානය භවා නම්, ... (අර්පණාප්‍රාප්ත වූ) මෛත්‍රීචිත්තවිමුක්තිය භවා නම්, ... කරුණාචිත්තවිමුක්තිය භවා නම්, ... මුදිතාචිත්තවිමුක්තිය භවා නම්, ... උපෙක්ෂාචිත්තවිමුක්තිය භවා නම්, ... මහණෙනි මේ මහණ නොහළ දැහැන් ඇතිවැ වසතියි කියනු ලැබේ. ශාස්තෲශාසනය කරන්නේ අවවාදය පිළිපදනේ රට වැසියාගේ (සවිපාක හෙයින්) නොසිස් වූ පිණ්ඩපාතය වළඳතියි කියනු ලැබේ. යම් කෙනෙක් එය බහුල වශයෙන් කෙරෙත් නම් කවර කථා ය.

**1. 16. 6. 9—12.**

.... (අටළොස් වැදෑරුම්) කයෙහි කය අනුව දක්නේ කෙලෙස් තවන වීර ඇත්තේ, සම්‍යක්ප්‍රඥ ඇත්තේ, සමෘතිමත් වූයේ, (කායසඞ්ඛ්‍යාත) ලෙව්හි (පඤ්චකාමගුණිකතෘෂ්ණාව වූ) දළ ලෝභය ද (ප්‍රතිඝසම්ප්‍රයුක්ත) දෞර්මනස්‍ය ද දුරු කොට වෙසේ ද, ... (නවවිධ වේදනාවන්හි) වේදනාව අනුව දක්නේ වෙසේ ද, ... (ෂෝඩශ ප්‍රභේද) චිත්තයෙහි, ... (පඤ්චනීවරණාදි) ධර්මයන්හි ධර්මය අනුව දක්නේ, කෙලෙස් තවන වීර ඇත්තේ, සම්‍යක්ප්‍රඥ ඇත්තේ, සමෘතිමත් වූයේ, ලෙව්හි අභිධ්‍යාව හා දෞර්මනස්‍ය දුරලා වෙසේ ද ...

## 1. 16. 6. 13—16.

-පෙ- අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති, විරියං[1] ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති. -පෙ- උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති. -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති. -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති -පෙ-

## 1. 16. 6. 17--20.

-පෙ- ඡන්ද සමාධි පධානසඞ්ඛාර-සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, -පෙ- විරිය සමාධි, -පෙ- චිත්තසමාධි, -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. -පෙ-

## 1. 16. 6. 21-25.

-පෙ- සද්ධින්ද්‍රියං භාවෙති, -පෙ- විරියින්ද්‍රියං[2] භාවෙති, -පෙ- සතින්ද්‍රියං භාවෙති, -පෙ- සමාධින්ද්‍රියං භාවෙති, -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවෙති -පෙ-

## 1. 16. 6. 26—30

-පෙ- සද්ධාබලං භාවෙති -පෙ- විරියබලං[1] භාවෙති -පෙ- සතිබලං භාවෙති -පෙ- සමාධිබලං භාවෙති -පෙ- පඤ්ඤාබලං භාවෙති -පෙ-

## 1. 16. 6. 31—37.

-පෙ- සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති, -පෙ- ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති, -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති, -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති, -පෙ- පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති, -පෙ- සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති, -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ-

## 1. 16. 6. 38—45.

-පෙ- සම්මාදිට්ඨිං භාවෙති, -පෙ- සම්මාසඞ්කප්පං භාවෙති, -පෙ- සම්මාවාචං භාවෙති, -පෙ- සම්මාකම්මන්තං භාවෙති, -පෙ- සම්මාආජීවං භාවෙති, -පෙ- සම්මාවායාමං භාවෙති, -පෙ- සම්මාසතිං භාවෙති, -පෙ- සම්මාසමාධිං භාවෙති -පෙ-

---

1. විරියං - මජ්සං. 2. විරියින්ද්‍රියං - මජ්සං.

## 1. 16. 6. 13—16

නූපන් ලොභාදි ලාමක අකුශල ධර්මයන්ගේ අනුත්පාදය පිණිස (කර්තු-කම්‍යතා) කුශලච්ඡන්දය උපදවා ද, ... වයම්හි යෙදේ ද කායික චෛතසික වීර්‍යය අරඹා ද, සහජාතවීර්‍යයෙන් සිත තගා තබා ද, ප්‍රධන් වීර්‍ය කෙරේ ද, උපන් ලාමක අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලච්ඡන්දය උපදවා ද, ව්‍යායාම කෙරේ ද, වැර අරඹා ද, සිත තගා තබා ද, ප්‍රධන් වීර්‍ය කෙරේ ද, ... නූපන් කුශල ධර්මයන්ගේ උත්පාදය පිණිස ඡන්දය දනවා ද, ව්‍යායාම කෙරේ ද, වැර අරඹා ද, සිත තගා තබා ද, ප්‍රධන් වීර්‍ය කෙරේ ද ... උපන් කුශලධර්මයන්ගේ ස්ථිතිය පිණිස නො නස්නා පිණිස, භූයස්භාව පිණිස, විපුල බව පිණිස, වැඩීම පිණිස, පිරිපුන් බව පිණිස ඡන්දය දනවා ද, ව්‍යයම් කෙරේ ද, වැර අරඹා ද, සිත තගා තබා ද ප්‍රධන් වීර්‍ය කෙරේ ද- ...

## 1. 16. 6. 17—20

... කත්තුකම්‍යතාඡන්දය පැවති සමාධිය හා චතුකිච්චසාධක ප්‍රධාන සංස්කාරයන්ගෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩා ද, ... වීර්‍යය ඇසිරි කොට පැවති සමාධිය හා, ... චිත්තය ඇසිරි කොට පැවති සමාධිය හා, ... විමංසා ව ඇසිරි කොට පැවති සමාධිය හා ප්‍රධාන සංස්කාරයන්ගෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩා ද ...

## 1. 16. 6. 21 25

... ශ්‍රද්ධෙන්ද්‍රියය වඩා ද, ... වීර්‍යෙන්ද්‍රියය වඩා ද, ... සමෘතීන්ද්‍රියය වඩා ද, ... සමාධීන්ද්‍රියය වඩා ද, ... ප්‍රඥෙන්ද්‍රියය වඩා ද ...

## 1. 16. 6. 26—30

... ශ්‍රද්ධාබලය වඩා ද, ... වීර්‍යබලය වඩා ද, ... සමෘතිබලය වඩා ද, ... සමාධිබලය වඩා ද, ... ප්‍රඥාබලය වඩා ද ...

## 1. 16. 6. 31—37

... සමෘතිසම්බොධ්‍යඞ්ගය වඩා ද, ... ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය වඩා ද, ... වීර්‍යසම්බොධ්‍යඞ්ගය වඩා ද, ... ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය වඩා ද, ... ප්‍රශ්‍රබ්ධි-සම්බොධ්‍යඞ්ගය වඩා ද, ... සමාධිසම්බොධ්‍යඞ්ගය වඩා ද ... උපෙක්ෂා සම්බො-ධ්‍යඞ්ගය වඩා ද ...

## 1. 16. 6. 38—45

... සම්‍යග්දෘෂ්ටිය වඩා ද, ... සම්‍යක්සංකල්පය වඩා ද, ... සම්‍යග්-වචනය වඩා ද, .... සම්‍යක්කර්මාන්තය වඩා ද, ... සම්‍යක්ගාජීවය වඩා ද, ... සම්‍යග්ව්‍යායාමය වඩා ද, ... සම්‍යක්සමෘතිය වඩා ද, ... සම්‍යක්-සමාධිය වඩා ද ...

## 1. 16. 6. 46—53.

-පෙ- අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ-දුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. -පෙ- අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ-දුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. -පෙ- අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ-දුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. -පෙ- අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ-දුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. -පෙ- අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. -පෙ- අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති -පෙ- අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාත-නිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති -පෙ-

## 1. 16. 6., 54—61.

-පෙ- රූපී රූපානි පස්සති -පෙ- අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති. -පෙ- සුභන්තෙව අධිමුත්තො හොති. -පෙ- සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. -පෙ- සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. -පෙ- සබ්බසො විඤ්ඤාණඤ්චා-යතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. -පෙ- සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤා-යතනං උපසම්පජ්ජ විහරති. -පෙ- සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. -පෙ-

## 1. 16. 6. 62—72.

-පෙ- පඨවීකසිණං භාවෙති, -පෙ- ආපොකසිණං භාවෙති, -පෙ- තෙජො-කසිණං භාවෙති, -පෙ- වායොකසිණං භාවෙති, -පෙ- නීලකසිණං භාවෙති, -පෙ- පීතකසිණං භාවෙති, -පෙ- ලොහිතකසිණං භාවෙති, -පෙ- ඔදාත-කසිණං භාවෙති, -පෙ- ආකාසකසිණං භාවෙති, -පෙ- විඤ්ඤාණකසිණං භාවෙති, -පෙ- ආලොකකසිණං භාවෙති -පෙ-

## 1. 16. 6. 46—53

… එකෙක් අධ්‍යාත්මයෙහි රූප සංඥ ඇත්තේ නො වැඩූ සුවර්ණ දුර්වර්ණ වූ බාහිර රූපයන් දක්නේය; ඒ (නිමිත්තරූපයන්) මැඩ දන්මි, දක්මි යන මෙබඳු සංඥ ඇත්තේ වේ ද, … අධ්‍යාත්මයෙහි රූපසංඥ ඇත්තේ වඩනා ලද සුවර්ණ දුර්වර්ණ වූ බාහිර රූපයන් දක්නේය; ඒ රූපයන් මැඩ දන්මි, දක්මි යන මෙ බඳු සංඥ ඇත්තේ වේ ද, … එකෙක් අධ්‍යාත්මයෙහි අරූප සංඥ ඇත්තේ පරිත්ත වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහිර රූපයන් දක්නේ ය; ඒ රූපයන් මැඩ දන්මි, දක්මි යන මෙබඳු සංඥ ඇත්තේ වේ ද, … එකෙක් අධ්‍යාත්මයෙහි අරූප සංඥ ඇත්තේ වඩනා ලද හෙයින් අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහිර රූපයන් දක්නේය; ඒ රූපයන් මැඩ දන්මි, දක්මි යන මෙ බඳු සංඥ ඇත්තේ ද, … අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇත්තේ නිල් වූ, නිල්වන් වූ, අසම්භින්න නීලවර්ණ ඇති, නීලාවභාස ඇති බාහිර රූපයන් දක්නේය; ඒ රූපයන් මැඩ දන්මි, දක්මි යන මෙ බඳු සංඥ ඇත්තේ වේ ද, … එකෙක් අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇත්තේ පීත (කසා) වූ පීතවර්ණ වූ අසම්භින්න පීතවර්ණ ඇති පීතාවභාස ඇති බාහිර රූපයන් දක්නේය; ඒ රූපයන් මැඩ දන්මි, දක්මි යන මෙබඳු සංඥ ඇත්තේ වේ ද, … එකෙක් අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇත්තේ රතු වූ රතුපැහැ ඇති නොමුසු රතු පැහැ ඇති රත්පැහැයෙන් බබලන බැහැරි රූ දක්නේය; ඒ රූපයන් මැඩ දන්මි, දක්මි යන මෙබඳු සංඥ ඇත්තේ වේ ද, … එකෙක් අධ්‍යාත්මයෙහි රූපසංඥ ඇත්තේ සුදු වූ සුදු පැහැ ඇති, නොමුසු සුදු පැහැ ඇති, සුදුපැහැයෙන් බබලන බැහැරි රූ දක්නේය; ඒ රූපයන් මැඩ දන්මි, දක්මැ'යි මෙබඳු සංඥ ඇත්තේ වේ ද …

## 1. 16. 6. 54—61

… (නීලකසිණාදි වශයෙන් උපන්) රූපධ්‍යාන ඇත්තේ (ධ්‍යානචක්ෂුසින්) රූපයන් දක්නේ ද, … අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇත්තේ බැහැරි රූ දක්නේ ද, … ශුභයයි ම ගෙණ ඇලුනේ වේ ද, … සර්වප්‍රකාරයෙන් රූපාවචර-ධ්‍යාන සංඥවන් ඉක්මවීමෙන්, (දශවිධ) ප්‍රතිඝසංඥවන්ගේ අස්තගමයෙන්, (සිවුසාළිස් වැදෑරුම්) නානාත්වසංඥවන් මෙනෙහි නොකිරීමෙන්, 'ආකාශය අනන්තය'යි ආකාශානන්ත්‍යායතනයට පැමිණ වෙසේ ද, … සර්වප්‍රකාරයෙන් ආකාශානන්ත්‍යායතනය ඉක්මවා 'විඥනය අනන්තය'යි විඥනන්ත්‍යායත-නයට පැමිණ වෙසේ ද, … සර්වප්‍රකාරයෙන් විඥනන්ත්‍යායතනය ඉක්මවා 'කිසිත් නැතැ'යි ආකිඤ්චන්‍යායතනයට පැමිණ වෙසේ ද, … සර්වප්‍රකාරයෙන් ආකිඤ්චන්‍යායතනය ඉක්මවා නෛවසංඥනාසංඥයතනයට පැමිණ වෙසේ ද, … සර්වප්‍රකාරයෙන් නෛවසංඥනාසංඥයතනය ඉක්මවා සංඥවෙදයිත නිරොධයට පැමිණ වෙසේ ද …

## 1. 16. 6. 62—72

… පෘථිවිකසිණ ධ්‍යානය වඩා ද, … ආපොකසිණ ධ්‍යානය වඩා ද, … තෙජොකසිණ ධ්‍යානය වඩා ද, … වායොකසිණ ධ්‍යානය වඩා ද, … නීලකසිණ ධ්‍යානය වඩා ද, … පීත කසිණ ධ්‍යානය වඩා ද, … ලොහිතකසිණ ධ්‍යානය වඩා ද, … ඔදාතකසිණ ධ්‍යානය වඩා ද, … ආකාශ කසිණ ධ්‍යානය වඩා ද, … විඤ්ඤණ කසිණ ධ්‍යානය වඩා ද, … ආලොක කසිණ ධ්‍යානය වඩා ද, …

## 1. 16. 6. 73—82.

-පෙ- අසුභසඤ්ඤං භාවෙති, -පෙ- මරණසඤ්ඤං භාවෙති, -පෙ- ආහාරෙ පටික්කූලසඤ්ඤං භාවෙති, -පෙ- සබ්බලොකෙ අනභිරතසඤ්ඤං[1] භාවෙති, -පෙ- අනිච්චසඤ්ඤං භාවෙති, අනිච්චෙ දුක්ඛසඤ්ඤං භාවෙති, -පෙ- දුක්ඛෙ අනත්තසඤ්ඤං භාවෙති, -පෙ- පහාණසඤ්ඤං භාවෙති, -පෙ- විරාගසඤ්ඤං භාවෙති, -පෙ- නිරොධසඤ්ඤං භාවෙති -පෙ-

## 1. 16. 6. 83—92.

-පෙ- අනිච්චසඤ්ඤං භාවෙති, -පෙ- අනත්තසඤ්ඤං භාවෙති, -පෙ- මරණසඤ්ඤං භාවෙති, -පෙ- ආහාරෙ පටික්කූලසඤ්ඤං භාවෙති, -පෙ- සබ්බලොකෙ අනභිරතසඤ්ඤං භාවෙති, -පෙ- අට්ඨිකසඤ්ඤං භාවෙති, -පෙ- පුළුවකසඤ්ඤං භාවෙති, -පෙ- විනීලකසඤ්ඤං භාවෙති, -පෙ- විච්ඡිද්දකසඤ්ඤං භාවෙති, -පෙ- උද්ධුමාතකසඤ්ඤං භාවෙති -පෙ-

## 1. 16. 6. 93—102.

-පෙ- බුද්ධානුස්සතිං භාවෙති, -පෙ- ධම්මානුස්සතිං භාවෙති, -පෙ- සඞ්ඝානුස්සතිං භාවෙති, -පෙ- සීලානුස්සතිං භාවෙති, -පෙ- චාගානුස්සතිං භාවෙති, -පෙ- දෙවතානුස්සතිං භාවෙති, -පෙ- ආනාපානසතිං භාවෙති, -පෙ- මරණසතිං භාවෙති, -පෙ- කායගතාසතිං භාවෙති, -පෙ- උපසමානුස්සතිං භාවෙති -පෙ-

## 1. 16. 6. 103—142.

-පෙ- පඨමජ්ඣානසහගතං සද්ධින්ද්‍රියං භාවෙති, -පෙ- විරියින්ද්‍රියං[2] භාවෙති, -පෙ- සතින්ද්‍රියං භාවෙති, -පෙ- සමාධින්ද්‍රියං භාවෙති, -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවෙති, -පෙ- සද්ධාබලං භාවෙති, -පෙ- විරියබලං භාවෙති, -පෙ- සතිබලං භාවෙති, පෙ- සමාධිබලං භාවෙති, -පෙ- පඤ්ඤාබලං භාවෙති. දුතියජ්ඣානසහගතං -පෙ- තතියජ්ඣානසහගතං -පෙ- චතුත්ථජ්ඣානසහගතං පඤ්ඤාබලං භාවෙති -පෙ-

## 1. 16. 6. 143—182.

-පෙ- මෙත්තාසහගතං -පෙ- කරුණාසහගතං -පෙ- මුදිතාසහගතං -පෙ- උපෙක්ඛාසහගතං සද්ධින්ද්‍රියං භාවෙති, -පෙ- විරියින්ද්‍රියං භාවෙති, -පෙ- සතින්ද්‍රියං භාවෙති, -පෙ- සමාධින්ද්‍රියං භාවෙති, -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවෙති, -පෙ- සද්ධාබලං භාවෙති, -පෙ- විරියබලං භාවෙති, -පෙ- සතිබලං භාවෙති, -පෙ- සමාධිබලං භාවෙති, -පෙ- පඤ්ඤාබලං භාවෙති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසනකරො ඔවාදපතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති. කො පන වාදො යෙ නං බහුලීකරොන්තීති.

**වග්ගො ඡට්ඨො**

---

(අච්ඡරාසඞ්ඝාතවග්ගෙ පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨං හොති ද්වාසීත්‍යාධික සුත්තසතං?)

---

1. අනභිරතිසඤ්ඤං - ම. ඡ. සං. 2. විරියින්ද්‍රියං - මජසං

## 1. 16 6. 73–82

... අශුභ සංඥාව වඩා ද, ... මරණ සංඥාව වඩා ද, ...ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව වඩා ද, ... සියලුම (ත්‍රෛධාතුක) ලොකයෙහි අනභිරත සංඥාව වඩා ද, ... අනිත්‍යසංඥාව වඩා ද, ... අනිත්‍ය (වූ පඤ්චස්කන්ධ) යෙහි දුඃඛ සංඥාව වඩා ද, ... දුඃඛ (වූ පඤ්චස්කන්ධ) යෙහි අනාත්ම සංඥාව වඩා ද, ... (පඤ්චවිධ) ප්‍රහාණ සංඥාව වඩා ද, ... (පඤ්චවිධ) විරාග සංඥාව වඩා ද, ... (සංස්කාරයන්හි) නිරොධ සංඥාව වඩා ද ...

## 1. 16. 6. 83—92

... අනිත්‍ය සංඥාව වඩා ද, ... අනාත්ම සංඥාව වඩා ද,... මරණ සංඥාව වඩා ද, ... ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව වඩා ද, .. සර්වප්‍රකාරයෙන් ලොක-යෙහි අනභිරතසංඥාව වඩා ද, ... අස්ථිකසංඥාව වඩා ද, ... පුලවක සංඥාව වඩා ද, ... විනීලකසංඥාව වඩා ද, ... විච්ඡිද්‍රක සංඥාව වඩා ද, ... උද්ධුමාතක සංඥාව වඩා ද ...

## 1. 16. 6. 93—102.

... බුද්ධානුස්මෘතිය වඩා ද, ... ධර්මානුස්මෘතිය වඩා ද, ... සඞ්ඝානුස්මෘතිය වඩා ද, ... ශීලානුස්මෘතිය වඩා ද, ... ත්‍යාගානුස්මෘතිය වඩා ද, ... දෙවතානු-ස්මෘතිය වඩා ද, ... ආනාපානස්මෘතිය වඩා ද, ... මරණස්මෘතිය වඩා ද, .... කායගතාස්මෘතිය වඩා ද, ... උපශමානුස්මෘතිය වඩා ද, ...

## 1. 16. 6 103— 142

... ප්‍රථමධ්‍යාන සහගත වූ ශ්‍රද්ධෙන්ද්‍රිය ය වඩා ද, ... වීර්යෙන්ද්‍රිය ය වඩා ද,... ස්මෘතීන්ද්‍රිය ය වඩා ද, ... සමාධීන්ද්‍රිය ය වඩා ද, ... ප්‍රඥෙන්ද්‍රිය ය වඩා ද, ... ශ්‍රද්ධාබලය වඩා ද, ... වීර්යබලය වඩා ද, ... ස්මෘතිබලය වඩා ද, ... සමාධිබලය වඩා ද, ... ප්‍රඥාබලය වඩා ද, ... ද්විතීයධ්‍යානසහගත වූ, ... තෘතීයධ්‍යානසහ-ගත වූ, ... චතුර්ථධ්‍යානසහගත වූ, .... ප්‍රඥාබලය වඩා ද

## 1. 16. 6. 143—182.

... මෛත්‍රීසහගත වූ, ... කරුණාසහගත වූ, ... මෘදුතාසහගතවූ, ... උපෙක්ෂාසහගත වූ, ... ශ්‍රද්ධෙන්ද්‍රිය ය වඩා ද, .... වීර්යේන්ද්‍රියය වඩා ද, ... ස්මෘතීන්ද්‍රියය වඩා ද, ... සමාධීන්ද්‍රියය වඩා ද, ... ප්‍රඥෙන්ද්‍රියය වඩා ද, ... ශ්‍රද්ධා-බලය වඩා ද, වීර්යබලය වඩා ද, ... ස්මෘතිබලය වඩා ද, ... සමාධිබලය වඩා ද, ... ප්‍රඥාබලය වඩා ද, මහණෙනි, මේ මහණ නො හළ දැහැන් ඇත්තේ ය යි කියනු ලැබේ. ශාස්තෘශාසනකර වූයේ, ඔවා පිළිගෙණ කරන්නේ නො සිස් වූ රටපිණ්ඩය වළඳයි. යම් කෙනෙක් එය බහුල වශයෙන් කෙරෙත් නම් කවර කථාය.

**සවන වගයි.**

---

(අච්ඡරාසඞ්ඝාත වර්ගයෙහි පෙය්‍යාලමුඛයෙන් දක්වන ලද සූත්‍ර සංඛ්‍යාව එක්සිය දෙ අසූවකි ?)

## [ කායගතාසතිවග්ගො ]

### 1. 16. 7. 1.

යස්ස කස්සචි භික්ඛවෙ මහාසමුද්දො චෙතසා ඵුටො, අන්තොගධා තස්ස කුන්නදියො යා කාචි සමුද්දඞ්ගමා. එවමෙව ඛො[1] භික්ඛවෙ යස්ස කස්සචි කායගතාසති භාවිතා බහුලීකතා, අන්තොගධා තස්ස කුසලා ධම්මා, යෙ කෙචි විජ්ජාභාගියා.[2]

### 1. 16. 7. 2—8.

එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො මහතො සංවෙගාය සංවත්තති, -පෙ- මහතො අත්ථාය සංවත්තති, -පෙ- මහතො යොගක්ඛෙමාය සංවත්තති, -පෙ- සතිසම්පජඤ්ඤාය සංවත්තති, -පෙ- ඤාණදස්සනපටිලාභාය සංවත්තති, -පෙ- දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති, -පෙ- විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය, සංවත්තති. කතමො එකධම්මො: කායගතාසති. අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො මහතො සංවෙගාය සංවත්තති, මහතො අත්ථාය සංවත්තති, මහතො යොගක්ඛෙමාය සංවත්තති, සතිසම්පජඤ්ඤාය සංවත්තති, ඤාණදස්සනපටිලාභාය සංවත්තති, දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති, විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තතීති.

### 1. 16. 7. 9—12

එකධම්මෙ භික්ඛවෙ භාවිතෙ බහුලීකතෙ කායොපි පස්සම්භති, -පෙ- චිත්තම්පි පස්සම්භති, -පෙ- විතක්කවිචාරාපි වූපසම්මන්ති, -පෙ- කෙවලාපි විජ්ජාභාගියා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති. කතමස්මිං එකධම්මෙ: කායගතාසතියා. ඉමස්මිං ඛො භික්ඛවෙ එකධම්මෙ භාවිතෙ බහුලීකතෙ කායොපි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති, විතක්කවිචාරාපි වූපසම්මන්ති, කෙවලාපි විජ්ජාභාගියා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති.[3]

### 1. 16. 7. 13.

එකධම්මෙ භික්ඛවෙ භාවිතෙ බහුලීකතෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා නුප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පහීයන්ති. කතමස්මිං එකධම්මෙ: කායගතාසතියා. ඉමස්මිං ඛො භික්ඛවෙ එකධම්මෙ භාවිතෙ බහුලීකතෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා නුප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පහීයන්ති.

### 1. 16. 7. 14.

එකධම්මෙ භික්ඛවෙ භාවිතෙ බහුලීකතෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. කතමස්මිං එකධම්මෙ: කායගතාසතියා. ඉමස්මිං ඛො භික්ඛවෙ එකධම්මෙ භාවිතෙ බහුලීකතෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති.

---

1. එවමෙව - මජ්සං. 2. විජ්ජාභාගියාති - මජ්සං. 3. ගච්ඡන්තීති - මජ්සං.

# [ කායගතාසති වර්ගය ]

## 1. 16. 7. 1.

මහණෙනි, යම් කිසිවකු විසින් මහසමුදුර සිතින් පහස්නා ලද්දේ නම්, මහමුහුදට ගලා බස්නා යම් කිසි කුඩා නදීහු වෙත් ද, ඔහු එයට ඇතුළත් වෙති. මහණෙනි, එසෙයින් ම යම් කිසිවකු විසින් කාගියාසි (කායගතාසතිය) වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ වේ ද, අෂ්ටවිද්‍යා භජනය කරණ යම් කිසි කුශල ධර්මයෝ වෙත් නම්, ඔහු එයට (කායගතාසතියට) ඇතුළත් වෙති.

## 1. 16. 7. 2—8.

මහණෙනි, එක් ම ධර්මයෙක් වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ මහත් වූ සංවේගය පිණිස පවත්නේය...මහත් වූ අර්ථය (සතරමග) පිණිස පවත්නේය...මහත් වූ යොගක්ෂෙමය (සතර ශ්‍රාමණ්‍යඵල) පිණිස පවත්-නේය සමාධිය හා සම්‍යක්ප්‍රඥාව පිණිස පවත්නේය...ඥානදර්ශනප්‍රතිලාභය (දිව්‍යස් නුවණ) පිණිස පවත්නේය. ඉහාත්මභාවසුඛ විහරණය පිණිස පවත්නේය. විද්‍යා - විමුක්තිඵල (මාර්ගප්‍රඥා - සම්ප්‍රයුක්තධර්ම - අර්හත්ඵල) ප්‍රත්‍යවෙක්ෂා කිරීම පිණිස පවත්නේය කවර එක ම ධර්මයෙක යත්: කායගතා සතිය යි. මහණෙනි, මේ එක් ධර්මය වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ මහත් සංවේගය පිණිස පවත්නේය....මහත් අර්ථය පිණිස පවත්නේය... මහත් යොගක්ෂෙමය පිණිස පවත්නේය...සමාධිය හා සම්‍යක් ප්‍රඥාව පිණිස පවත්නේය...ඥානදර්ශනප්‍රතිලාභය පිණිස පවත්නේය...දෘෂ්ටධර්මසුඛ විහරණය පිණිස පවත්නේය...විද්‍යා - විමුක්ති - ඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නේය.

## 1. 16. 7. 9—12.

මහණෙනි, එක් ම ධර්මයක් වැඩූ කල්හි බහුල වශයෙන් (පුරුදු) කළ කල්හි කය ද (නාම - කරජ දෙකාය) සන්හිඳෙයි...සිත ද සන්හිඳෙයි...විතර්ක විචාරයෝ ද සන්හිඳෙත්...සියලු විද්‍යාභාගීය ධර්මයෝ ද භාවනායෙන් පිරිපුන් බවට යෙත්. කවර එක් ධර්මයක් වැඩූ කල්හි යත්: කායගතාසතිය යි මහණෙනි, මේ එක් ම ධර්මය වැඩූ කල්හි බහුල වශයෙන් (පුරුදු) කළ කල්හි කය ද සන්හිඳෙයි. සිත ද සන්හිඳෙයි. විතර්කවිචාරයෝ ද සන්හිඳෙත්. සියලු විද්‍යාභාගීය ධර්මයෝ ද භාවනායෙන් පිරිපුන් බවට යෙත්.

## 1. 16. 7. 13.

මහණෙනි, එක් ම ධර්මයක් වැඩූ කල්හි බහුල වශයෙන් පුරුදු කළ කල්හි නූපන් අකුශලධර්මයෝ ද නූපදිත්. උපන් අකුශලධර්මයෝ ද ප්‍රහීණ වෙත්. කවර එක් ධර්මයක් වැඩූ කල්හි යත්: කාගියාසිය යි. මහණෙනි, මේ එක් ම ධර්මය වැඩූ කල්හි බහුල වශයෙන් කළ කල්හි නූපන්නා වූ ද අකුශලධර්මයෝ නූපදිත්. උපන්නා වූ ද අකුශලධර්මයෝ ප්‍රහීණ වෙත්.

## 1. 16 7. 14.

මහණෙනි, එක් ම ධර්මයක් වැඩූ කල්හි බහුල වශයෙන් පුරුදු කළ කල්හි නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත්. උපන්නා වූ කුශලධර්මයෝ ද භූයස්භාවය පිණිස විපුල බව පිණිස පවත්නාහ. කවර එක් ධර්මයක් වැඩූ කල්හිය යත්: කාගියාසි (වැඩූ කල්හි) යි. මහණෙනි, මේ එක් ධර්මය වැඩූ කල්හි බහුල වශයෙන් කළකල්හි නූපන්නා වූ ද කුශලධර්මයෝ බොහෝ බව පිණිස විපුල බව පිණිස පවත්නාහ.

## 1. 16. 7. 15—19.

එකධම්මෙ භික්ඛවෙ භාවිතෙ බහුලීකතෙ අවිජ්ජා පහීයති, -පෙ- විජ්ජා උප්පජ්ජති. -පෙ- අස්මිමානො පහීයති, -පෙ- අනුසයා සමුග්ඝාතං ගච්ඡන්ති, -පෙ- සඤ්ඤොජනා පහීයන්ති. කතමස්මිං එකධම්මෙ: කායගතාය සතියා. ඉමස්මිං ඛො භික්ඛවෙ එකධම්මෙ භාවිතෙ බහුලීකතෙ අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. අස්මිමානො පහීයති, අනුසයා සමුග්ඝාතං ගච්ඡන්ති, සඤ්ඤොජනා පහීයන්ති.[1]

## 1. 16. 7. 20—21.

එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො පඤ්ඤාපභෙදාය සංවත්තති, -පෙ- අනුපාදා පරිනිබ්බාණාය සංවත්තති, කතමො එකධම්මො: කායගතා සති. අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො පඤ්ඤාපභෙදාය සංවත්තති, අනුපාදා පරිනිබ්බාණාය සංවත්තති.[2]

## 1. 16. 7. 22—24.

එකධම්මෙ භික්ඛවෙ භාවිතෙ බහුලීකතෙ අනෙකධාතුපටිවෙධො හොති, -පෙ- නානාධාතුපටිවෙධො හොති, -පෙ- අනෙකධාතුපටිසම්භිදා හොති. කතමස්මිං එකධම්මෙ: කායගතාය[3] සතියා. ඉමස්මිං ඛො භික්ඛවෙ එකධම්මෙ භාවිතෙ බහුලීකතෙ අනෙකධාතුපටිවෙධො හොති, නානාධාතුපටිවෙධො හොති, අනෙකධාතුපටිසම්භිදා හොති.[4]

## 1. 16. 7. 25—28.

එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො සොතාපත්තිඵලසච්ඡිකිරියාය සංවත්තති, -පෙ- සකදාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තති, -පෙ- අනාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තති -පෙ- අරහත්තඵලසච්ඡිකිරියාය සංවත්තති. කතමො එකධම්මො: කායගතා සති. අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො සොතාපත්තිඵලසච්ඡිකිරියාය සංවත්තති, සකදාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තති, අනාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තති, අරහත්තඵලසච්ඡිකිරියාය සංවත්තති.

---

1. පහීයන්තීති-මජසං 2. සංවත්තන්තීති-මජසං 3. කායගතා සතියා-සීමු.
4. හොන්තීති-මජසං.

### 1. 16. 7. 15—19.

මහණෙනි, මේ එක්ම ධර්මය වැඩූ කල්හි බහුල වශයෙන් (පුරුදු) කළ කල්හි (අවතන්හි බොල්අඳුරු කරණ) අවිද්‍යාව ප්‍රහීණ වේ.... (අභීත්තවමාගීඥන) විද්‍යාව උපදනීය... (නවවිධ) අසම්මානය ප්‍රහීණ වේ ... (සප්ත) අනුශයයෝ නැස්මට යෙත්... (දශ)සංයොජනයෝ ප්‍රහීණ වෙත්. කවර එක් ධර්මයක් වැඩූ කල්හිය යත්: කායගතාසති ය යි. මහණෙනි, මේ එක් ම ධර්මය වැඩූ කල්හි අවිද්‍යාව ප්‍රහීණ වේ. විද්‍යාව උපදනීය. අසම්මානය ප්‍රහීණ වේ. අනුශයයෝ නැස්මට යෙත්. සංයොජනයෝ ප්‍රහීණ වෙත්.

### 1. 16. 7. 20—21.

මහණෙනි, එක් ම ධර්මයෙක් වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ ප්‍රඥ ප්‍රභෙදය පිණිස පවත්නේ ය ... අනුපාද පරිනිර්වාණය පිණිස පවත්නේ ය. කවර එක් ධර්මයෙක යත්: කායගතාසති ය යි. මහණෙනි, මේ එක් ම ධර්මය වඩනා ලද්දේ බහුල වශයෙන් කරණ ලදදේ ප්‍රඥප්‍රභෙදය පිණිස පවත්නේ ය. අනුපාද පරිනිර්වාණය පිණිස පවත්නේ ය.

### 1. 16. 7 22—24.

මහණෙනි, එක් ම ධර්මයක් වැඩූ කල්හි බහුල වශයෙන් පුරුදු කළ කල්හි අනෙක (අටළොස්) ධාතුන්ගේ (ලක්‍ෂණ) ප්‍රතිවෙධය වෙයි. ... (අටළොස්) ධාතුන්ගේ නානාභාවයෙන් (ලක්‍ෂණ) ප්‍රතිවෙධය වේ ... අනෙක (අටළොස්) ධාතුන්ගේ ප්‍රතිසම්භිද ඥනය වේ. කවර එක් ධර්මයක් වැඩූකල්හි යත්: කායගතාසතිය යි. මහණෙනි, මේ එක් ම ධර්මය වැඩූ කල්හි බහුල වශයෙන් කළ කල්හි අනෙක ධාතුන්ගේ ප්‍රතිවෙධය වේ. නානාධාතුන්ගේ ප්‍රතිවෙධය වේ. අනෙක ධාතුන්ගේ ප්‍රතිසම්භිද ඥනය වේ.

### 1. 16. 7. 25—28.

මහණෙනි, එක් ම ධර්මයෙක් වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ සෝවාන්පල පසක් කිරීම පිණිස පවත්නේ ය ... සෙදගැමිපල පසක් කිරීම පිණිස පවත්නේය ... අනගැමිපල පසක් කිරීම පිණිස පවත්නේ ය ... රහත්පල පසක් කිරීම පිණිස පවත්නේ ය. කවර එක් ධර්මයක යත්: කායගතාසති ය යි. මහණෙනි, මේ එක් ම ධර්මය වඩන ලද්දේ බහුල වශයෙන් කරණ ලද්දේ සෝවාන්පල පසක් කිරීම පිණිස පවත්නේ ය. සෙදගැමිපල පසක් කිරීම පිණිස පවතී. අනගැමිපල පසක් කිරීම පිණිස පවත්නේ ය. රහත්පල පසක් කිරීම පිණිස පවත්නේ ය.

### 1. 16. 7. 29--44.

එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො පඤ්ඤාපටිලාභාය සංවත්තති, -පෙ- පඤ්ඤාවුද්ධියා සංවත්තති, -පෙ- පඤ්ඤාවෙපුල්ලාය සංවත්තති, මහාපඤ්ඤතාය සංවත්තති, -පෙ- පුථුපඤ්ඤතාය සංවත්තති, -පෙ- විපුලපඤ්ඤතාය සංවත්තති-පෙ- ගම්භීරපඤ්ඤතාය සංවත්තති, -පෙ- අසාමන්තපඤ්ඤතාය[1] සංවත්තති, -පෙ- භූරිපඤ්ඤතාය සංවත්තති, -පෙ- පඤ්ඤාබාහුල්ලාය සංවත්තති, -පෙ- සීඝපඤ්ඤතාය සංවත්තති, -පෙ- ලහුපඤ්ඤතාය සංවත්තති, -පෙ- හාසුපඤ්ඤතාය[2] සංවත්තති, -පෙ- ජවනපඤ්ඤතාය සංවත්තති, -පෙ- තික්ඛපඤ්ඤතාය සංවත්තති, -පෙ- නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තති. කතමො එකධම්මො: කායගතා සති. අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො පඤ්ඤාපටිලාභාය සංවත්තති, පඤ්ඤාවුද්ධියා සංවත්තති, පඤ්ඤාවෙපුල්ලාය සංවත්තති, මහාපඤ්ඤතාය සංවත්තති, පුථුපඤ්ඤතාය සංවත්තති, විපුලපඤ්ඤතාය සංවත්තති, ගම්භීරපඤ්ඤතාය සංවත්තති, අසාමන්තපඤ්ඤතාය සංවත්තති, භූරිපඤ්ඤතාය සංවත්තති, පඤ්ඤාබාහුල්ලාය සංවත්තති, සීඝපඤ්ඤතාය සංවත්තති, ලහුපඤ්ඤතාය සංවත්තති, හාසුපඤ්ඤතාය සංවත්තති, ජවනපඤ්ඤතාය සංවත්තති, තික්ඛපඤ්ඤතාය සංවත්තති, නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තති.[3]

[කායගතාසති] වග්ගො සත්තමො.

---

## [ අමතවග්ගො ]

### 1. 16. 8. 1—8.

අමතං තෙ භික්ඛවෙ න පරිභුඤ්ජන්ති, යෙ කායගතාසතිං න පරිභුඤ්ජන්ති.

අමතං තෙ භික්ඛවෙ පරිභුඤ්ජන්ති, යෙ කායගතාසතිං පරිභුඤ්ජන්ති.

අමතං තෙසං භික්ඛවෙ අපරිභුත්තං, යෙසං කායගතාසති අපරිභුත්තා.

අමතං තෙසං භික්ඛවෙ පරිභුත්තං, යෙසං කායගතාසති පරිභුත්තා.

අමතං තෙසං භික්ඛවෙ පරිහීනං, යෙසං කායගතාසති පරිහීනා.

අමතං තෙසං භික්ඛවෙ අපරිහීනං, යෙසං කායගතාසති අපරිහීනා.

අමතං තෙසං භික්ඛවෙ විරද්ධං, යෙසං කායගතාසති විරද්ධා.

අමතං තෙසං භික්ඛවෙ ආරද්ධං, යෙසං කායගතාසති ආරද්ධා.

---

1. අසම්හපඤ්ඤතාය-සයා [illegible] - අසමිතපඤ්ඤතාය, සාළුවි.
හාස පඤ්ඤතාය - මජසං. 3. සංවත්තතීති-මජසං.

**1. 16. 7. 29 - 44.**

මහණෙනි, එක් ම ධර්මයෙක් වඩන ලද්දේ, බහුල වශයෙන් කරණ ලද්දේ ප්‍රඥාප්‍රතිලාභය පිණිස පවත්නේය ... ප්‍රඥාවගේ වැඩීම පිණිස පවත්නේය ... ප්‍රඥාවගේ විපුල බව පිණිස පවත්නේය ... මහාප්‍රඥා බව පිණිස පවත්නේය ... (ස්කන්ධාදිනානාධර්මයන්හි) පෘථක්ප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. ... විපුල ප්‍රඥා ඇති බව පිණිස පවත්නේය ... ගැඹුරු ප්‍රඥා ඇති බව පිණිස පවත්නේය ... අසාමන්තප්‍රඥා ඇති බව පිණිස පවත්නේය ... (රාගාදිකෙලෙස් මඩනා) භූරි ප්‍රඥා ඇති බව පිණිස පවත්නේය ... ප්‍රඥාබාහුල්‍යය පිණිස පවත්නේය... ශීඝ්‍රප්‍රඥා ඇති බව පිණිස පවත්නේය...(යුහුව සිල්පුරණ) ක්ෂිප්‍රප්‍රඥා ඇති බව පිණිස පවත්නේය ... (තුෂ්ටිබහුලව ශීලාදිය පුරණ) හාසුප්‍රඥා ඇති බව පිණිස පවත්නේය ... (ස්කන්ධායතනාදියෙහි දුවන) ජවනප්‍රඥා ඇති බව පිණිස පවත්නේය ... (කෙලෙස් සිඳිමෙහි) තීක්ෂණප්‍රඥා ඇති බව පිණිස පවත්නේය ... (සංස්කාරයන්හි කලකිරුවන) නිර්වේදික ප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. කවර එක් ධර්මයෙක යත්: කායගතාසතිය යි. මහණෙනි, මේ එක් ම ධර්මය වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේ ප්‍රඥාවගේ ප්‍රතිලාභය පිණිස පවත්නේය. ප්‍රඥාවගේ වෘද්ධිය පිණිස පවත්නේය. ප්‍රඥාවගේ විපුලභාවය පිණිස පවත්නේය. මහාප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. පෘථක්ප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. විපුලප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. ගම්භීරප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. අසාමන්තප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. භූරිප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. ප්‍රඥාබාහුල්‍යය පිණිස පවත්නේය. ශීඝ්‍රප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. ක්ෂිප්‍ර ප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. හාසු ප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. ජවනප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. තීක්ෂණ ප්‍රඥා ඇති බව පිණිස පවත්නේය. නිර්වේදිකප්‍රඥා ඇති බව පිණිස පවත්නේය.

**සත්වන [කායගතාසති] වර්ගයි.**

---

## [ අමෘතවර්ගය ]

**1. 16. 8. 1—8.**

මහණෙනි, යම් කෙනෙක් අමෘතසදෘශ කායගතාසතිය පරිභොග ධ්‍යානසමාපජ්ජනයෙන් නො කෙරෙද් ද, ඔහු අමෘත සඞ්ඛ්‍යාත නිර්වාණය නො වළඳත්.

මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය පරිභොග කෙරෙත් ද, ඔහු අමෘතය වළඳත්.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය නො වළඳන ලදු ද, ඔවුන් විසින් අමෘතය නො වළඳනා ලදී.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය වළඳන ලදු ද, ඔවුන් විසින් අමෘතය වළඳනා ලදී.

මහණෙනි, යම් කෙනකුන්ගේ කායගතාසතිය පිරිහුනු ද, ඔවුන්ගේ අමෘතය පිරිහිත.

මහණෙනි, යම් කෙනකුන්ගේ කායගතාසතිය නො පිරිහුනු ද, ඔවුන්ගේ අමෘතය නො පිරිහිත,

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය අනධිගමයෙන් වරදනා ලදු ද, ඔවුන් විසින් අමෘතය වරදනා ලදී.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය සැපැයිනි ද, ඔවුන් විසින් අමෘතය නිෂ්පාදිත වෙයි.

### 1. 16. 8. 9.—24.

අමතං තෙ භික්ඛවෙ පමාදිංසු, යෙ කායගතාසතිං පමාදිංසු.

අමතං තෙ භික්ඛවෙ නප්පමාදිංසු, යෙ කායගතාසතිං නප්පමාදිංසු.

අමතං තෙසං භික්ඛවෙ පමුට්ඨං, යෙසං කායගතාසති පමුට්ඨා.

අමතං තෙසං භික්ඛවෙ අපමුට්ඨං, යෙසං කායගතාසති අපමුට්ඨා.

අමතං තෙසං භික්ඛවෙ අනාසෙවිතං, යෙසං කායගතාසති අනාසෙවිතා

අමතං තෙසං භික්ඛවෙ ආසෙවිතං, යෙසං කායගතාසති ආසෙවිතා.

අමතං තෙසං භික්ඛවෙ අභාවිතං, යෙසං කායගතාසති අභාවිතා.

අමතං තෙසං භික්ඛවෙ භාවිතං, යෙසං කායගතාසති භාවිතා.

අමතං තෙසං භික්ඛවෙ අබහුලීකතං, යෙසං කායගතාසති අබහුලීකතා.

අමතං තෙසං භික්ඛවෙ බහුලීකතං, යෙසං කායගතාසති බහුලීකතා.

අමතං තෙසං භික්ඛවෙ අනභිඤ්ඤාතං, යෙසං කායගතාසති අනභිඤ්ඤාතා.

අමතං තෙසං භික්ඛවෙ අභිඤ්ඤාතං, යෙසං කායගතාසති අභිඤ්ඤාතා.

අමතං තෙසං භික්ඛවෙ අපරිඤ්ඤාතං, යෙසං කායගතාසති අපරිඤ්ඤාතා.

අමතං තෙසං භික්ඛවෙ පරිඤ්ඤාතං, යෙසං කායගතාසති පරිඤ්ඤාතා.

අමතං තෙසං භික්ඛවෙ අසච්ඡිකතං, යෙසං කායගතාසති අසච්ඡිකතා.

අමතං තෙසං භික්ඛවෙ සච්ඡිකතං, යෙසං කායගතාසති සච්ඡිකතාති.

[අමත] වග්ගො අට්ඨමො.

**එකකනිපාතස්ස සුත්තසහස්සං* සමත්තං.**

---

* විමංසිතබ්බං.

**1. 16. 8. 9—24.**

මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය පමා කෙරෙත් ද, ඔහු අමෘතය පමා කෙරෙත්.

මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය පමා නො කෙරෙත් ද, ඔහු අමෘතය පමා නො කෙරෙත්.

මහණෙනි, යම් කෙනකුනට කායගතාසතිය විසමෘත ද, ඔවුනට අමෘතය විසමෘත වෙයි.

මහණෙනි, යම් කෙනකුනට කායගතාසතිය විසමෘත නො වේ ද, ඔවුනට අමෘතය විසමෘත නො වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය නො සෙවුනා ලද්ද ද, ඔවුන් විසින් අමෘතය සෙවුනා ලද නො වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය සෙවුනා ලද්ද ද, ඔවුන් විසින් අමෘතය සෙවුනා ලද වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය නො වඩනා ලද්ද ද, ඔවුන් විසින් අමෘතය වඩනා ලද නො වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය වඩන ලද්ද ද, ඔවුන් විසින් අමෘතය වඩන ලද වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය බහුල වශයෙන් පුරුදු නො කරණ ලද්ද ද, ඔවුන් විසින් අමෘතය පුරුදු කරණ ලද නො වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය බහුල වශයෙන් පුරුදු කරණ ලද්ද ද, ඔවුන් විසින් අමෘතය පුරුදු කරණ ලද වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය විශිෂ්ටඥානයෙන් නො දන්නා ලද්ද ද, ඔවුන් විසින් අමෘතය දන්නා ලද නො වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය දන්නා ලද්ද ද, ඔවුන් විසින් අමෘතය දන්නා ලද වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය (භූතපරිඥාවශයෙන්) පිරිසිඳ නොදන්නා ලද්ද ද, ඔවුන් විසින් අමෘතය පිරිසිඳ දන්නා ලද නො වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය පිරිසිඳ දන්නා ලද්ද ද, ඔවුන් විසින් අමෘතය පිරිසිඳ දන්නා ලද වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය පසක් නො කරණ ලද්ද ද, ඔවුන් විසින් අමෘතය පසක් කරණ ලද නො වෙයි.

මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය පසක් කරණ ලද්ද ද, ඔවුන් විසින් අමෘතය පසක් කරණ ලද වේ යි.

**අටවැනි [අමා] වගයි.**

**ඒකකනිපාතයෙහි සූත්‍රදහස* නිමි.**

* විමසුත්තේය.

# 2. දුකනිපාතො

### පඨමො පණ්ණාසකො

## 1. වජ්ජපනායිකාවග්ගො

### වජ්ජසුත්තං

2. 1. 1. 1.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ද්වෙමානි භික්ඛවෙ වජ්ජානි. කතමානි ද්වෙ: දිට්ඨධම්මිකඤ්ච වජ්ජං, සම්පරායිකඤ්ච වජ්ජං. කතමඤ්ච භික්ඛවෙ දිට්ඨධම්මිකං වජ්ජං: ඉධ භික්ඛවෙ එකච්චො පස්සති චොරං ආගුචාරිං රාජානො ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්තෙ, කසාහිපි තාළෙන්තෙ, වෙත්තෙහිපි තාළෙන්තෙ, අද්ධදණ්ඩකෙහිපි තාළෙන්තෙ, හත්ථම්පි ඡින්දන්තෙ, පාදම්පි ඡින්දන්තෙ, හත්ථපාදම්පි ඡින්දන්තෙ, කණ්ණම්පි ඡින්දන්තෙ, නාසම්පි ඡින්දන්තෙ, කණ්ණනාසම්පි ඡින්දන්තෙ, බිලඞ්ගථාලිකම්පි කාරෙන්තෙ, සඞ්ඛමුණ්ඩිකම්පි කාරෙන්තෙ, රාහුමුඛම්පි කාරෙන්තෙ, ජොතිමාලිකම්පි කාරෙන්තෙ, හත්ථපජ්ජොතිකම්පි කාරෙන්තෙ, එරකවත්තිකම්පි කාරෙන්තෙ, චීරකවාසිකම්පි කාරෙන්තෙ, එණෙය්‍යකම්පි කාරෙන්තෙ, බලිසමංසිකම්පි කාරෙන්තෙ, කහාපණකම්පි කාරෙන්තෙ, ඛාරාපතච්ඡිකම්පි කාරෙන්තෙ, පලිඝපරිවත්තිකම්පි කාරෙන්තෙ, පලාලපීඨකම්පි කාරෙන්තෙ, තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්තෙ, සුනඛෙහිපි ඛාදාපෙන්තෙ, ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්තෙ, අසිනාපි සීසං ඡින්දන්තෙ. තස්ස එවං හොති: යථාරූපානං ඛො පාපකානං කම්මානං හෙතු චොරං ආගුචාරිං රාජානො ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්ති, කසාහිපි තාළෙන්ති -පෙ- අසිනාපි සීසං ඡින්දන්ති. අහං චෙව ඛො පන එවරූපං පාපං කම්මං කරෙය්‍යං, මම්පි රාජානො ගහෙත්වා එවරූපා විවිධා කම්මකාරණා කාරෙය්‍යුං: කසාහිපි තාළෙය්‍යුං -පෙ- අසිනාපි සීසං ඡින්දෙය්‍යුන්ති. සො දිට්ඨධම්මිකස්ස වජ්ජස්ස භීතො න පරෙසං පාභතං පලුම්පන්තො චරති. ඉදං වුච්චති භික්ඛවෙ දිට්ඨධම්මිකං වජ්ජං.

කතමඤ්ච භික්ඛවෙ සම්පරායිකං වජ්ජං: ඉධ භික්ඛවෙ එකච්චො ඉති පටිසඤ්චික්ඛති: කායදුච්චරිතස්ස ඛො පාපකො විපාකො අභිසම්පරායං, වචීදුච්චරිතස්ස ඛො පාපකො විපාකො අභිසම්පරායං, මනොදුච්චරිතස්ස ඛො පාපකො විපාකො අභිසම්පරායං. අහං චෙව ඛො පන කායෙන දුච්චරිතං චරෙය්‍යං, වාචාය දුච්චරිතං චරෙය්‍යං, මනසා දුච්චරිතං චරෙය්‍යං කිඤ්ච තං, යාහං න කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍යන්ති. සො සම්පරායිකස්ස වජ්ජස්ස භීතො කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙති, වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙති, මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉදං වුච්චති භික්ඛවෙ සම්පරායිකං වජ්ජං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ වජ්ජානි. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: "දිට්ඨධම්මිකස්ස වජ්ජස්ස භායිස්සාම, සම්පරායිකස්ස වජ්ජස්ස භායිස්සාම. වජ්ජභීරුනො භවිස්සාම වජ්ජභයදස්සාවිනොති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං. වජ්ජභීරුනො භික්ඛවෙ වජ්ජභයදස්සාවිනො එතං පාටිකඞ්ඛං, යං පරිමුච්චිස්සති සබ්බවජ්ජෙහීති.

# 2. දුකනිපාතය

### පඨමපණ්ණාසකය

## 1. වජ්ජුපනායිකා වර්ගය

### 2. 1. 1. 1.

### වජ්ජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්ස, යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, මේ වද්‍ය (අපරාධ) දෙකෙකි. කවර දෙකෙක යත්: දෘෂ්ටධර්ම-විපාක ඇති අපරාධය හා පරලොව විපාක ඇති අපරාධය යි. මහණෙනි, ඉහාත්මයෙහි විපාක ඇති අපරාධය කවරේ ය යත්: මහණෙනි, මෙලොව රජවරු අපරාධ කරණ සොරු ගෙණ විවිධ කම්කටොලු කරත්: කසවැලිනුදු තළත්, වේවැලිනුදු තළත්, මුගුරිනුදු තළත්, අතුදු සිඳුති, පා ද සිඳුති, අත් පා ද සිඳුති, කණුදු සිඳුති, නැහැය ද සිඳුති, කන් නාසා ද සිඳුති, බිලඞ්ගථාලික නම් වධය ද කරත්, සඞ්ඛමුණ්ඩික නම් වධය ද කරත්, රාහුමුඛ නම් වධය ද කරත්, ජෝතිමාලික නම් වධය ද කරත්, හත්ථපජ්ජෝතික නම් වධය ද කරත්, එරකවත්තික නම් වධය ද කරත්, චීරකවාසික නම් වධය ද කරත්, එණෙය්‍යක නම් වධය ද කරත්, බලිසමංසික නම් වධය ද කරත්, කහාපණක නම් වධය ද කරත්, ඛාරාපතච්ඡික නම් වධය ද කරත්, පලිඝපරිවත්තික නම් වධය ද කරත්, පලාලපීඨක නම් වධය ද කරත්, කකියත තෙලිනුදු ඉසිත්, සීඝ්‍ර බල්ලන් ලා කවත්, දිවමිනුහු හුල හිඳුවත්, අසිපතිනුදු හිස සිඳුති. කිසිවෙක් තෙල සොරු දක්නේ ය. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: යම් බඳු පාපකර්මයන් හෙතු කොට ගෙණ අපරාධකාරී සොරු ගෙණ රජදරුවෝ විවිධ කම්කටොලු කරත් ද, කසවැලිනුදු තළත් ද, ... අසිපතිනුදු හිස් සිඳිත් ද, මම වැලි මෙ බඳු පව්කම් කරන්නෙම් නම්, රජදරුවෝ මසිදු ගෙණ මෙ බඳු විවිධ කම්කටොලු කරත්: කසවැලිනුදු තළත් ... අසිපතිනුදු හිස සිඳිත් ය කියා යි. හෙ තෙම ඉහාත්මයෙහි වූ වරදට බියපත් වූයේ මෙරමාගේ භාණ්ඩ වොලොගන්මින් නො හැසිරෙයි මහණෙනි, මෙය දෘෂ්ටධාර්මිකවද්‍යය යි කියනු ලැබේ.

මහණෙනි, සම්පරායිකවද්‍යය කවරේ ය යත්: මහණෙනි, මේ ලෝකයෙහි කිසිවෙක් මෙසේ නුවණින් සිතයි: 'කායදුශ්චරිතයාගේ වනාහි පරලොව ලාමක වූ දුඃඛවිපාකයෙක, වාග්දුශ්චරිතයාගේ පරලොව ලාමක වූ දුඃඛවිපාකයෙක. මනෝදුශ්චරිතයාගේ පරලොව ලාමක වූ දුඃඛවිපාකයෙක. මම වැලි කයින් දුසිරිත කරන්නෙම් නම්, වචනයෙන් දුසිරිත කරන්නෙම් නම්, සිතින් දුසිරිත කරන්නෙම් නම්, යම්බඳු ඒ දුසිරිතින් මම කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයෙහි නූපදින්නෙම් ද! කිම ඒ නො වේදැයි. හේ පරලොවිහි වරදින් බියපත් වූයේ කායදුශ්චරිතය දුරැර කායසුචරිතය වඩයි. වාග්දුශ්චරිතය දුරැර වාක්සුචරිතය වඩයි. මනොදුශ්චරිතය දුරැර මනස්සුචරිතය වඩයි. පිරිසිදු ආත්මයක් පරිහරණය කෙරෙයි. මහණෙනි, මේ සම්පරායිකවද්‍යය යි කියනු ලැබේ. මහණෙනි, මේ වද්‍ය දෙක ය. මහණෙනි, එහෙයින් මෙසේ හික්මිය යුතුය: ඉහාත්මවිපාක ඇති අපරාධයෙන් බිය පත් වන්නම්හ. පරලොව විපාක ඇති අපරාධයෙන් බිය පත් වන්නම්හ වරදෙහි බිය දක්නා සුල්ලමෝ වද්‍යභීරුක වූවමෝ වන්නම්හ යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි. මහණෙනි, සියලු වරදින් මිදෙන්නේය යන යමෙක් ඇද්ද, වරදට බිය වන සුලු වරදෙහි බිය දක්නා සුල්ලහු විසින් මෙය කැමති විය යුතුයි.

## 2. 1. 1. 2.

### පධානසුත්තං

2. ද්වෙමානි භික්ඛවෙ පධානානි දුරභිසම්භවානි ලොකස්මිං. කතමානි ද්වෙ: යඤ්ච ගිහීනං අගාරං අජ්ඣාවසතං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානුප්පදානත්ථං පධානං, යඤ්ච අගාරස්මා අනගාරියං පබ්බජිතානං සබ්බූපධිපටිනිස්සග්ගත්ථං[1] පධානං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ පධානානි දුරභිසම්භවානි ලොකස්මිං. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං පධානානං යදිදං සබ්බූපධිපටිනිස්සග්ගත්ථං පධානං. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: සබ්බූපධිපටිනිස්සග්ගත්ථං පධානං පදහිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

## 2. 1. 1. 3.

### තපනීයසුත්තං

3. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා තපනීයා. කතමෙ ද්වෙ: ඉධ භික්ඛවෙ එකච්චස්ස කායදුච්චරිතං කතං හොති, අකතං හොති කායසුචරිතං; වචීදුච්චරිතං කතං හොති, අකතං හොති වචීසුචරිතං; මනොදුච්චරිතං කතං හොති, අකතං හොති මනොසුචරිතං; සො කායදුච්චරිතං මෙ කතන්ති තප්පති, අකතං මෙ කායසුචරිතන්ති තප්පති; වචීදුච්චරිතං මෙ කතන්ති තප්පති, අකතං මෙ වචීසුචරිතන්ති තප්පති; මනොදුච්චරිතං මෙ කතන්ති තප්පති, අකතං මෙ මනොසුචරිතන්ති තප්පති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා තපනීයාති.

## 2. 1. 1. 4.

### අතපනීයසුත්තං

4. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා අතපනීයා. කතමෙ ද්වෙ: ඉධ භික්ඛවෙ එකච්චස්ස කායසුචරිතං කතං හොති, අකතං හොති කායදුච්චරිතං; වචීසුචරිතං කතං හොති, අකතං හොති වචීදුච්චරිතං; මනොසුචරිතං කතං හොති, අකතං හොති මනොදුච්චරිතං; සො කායසුචරිතං මෙ කතන්ති න තප්පති, අකතං මෙ කායදුච්චරිතන්ති න තප්පති; වචීසුචරිතං මෙ කතන්ති න තප්පති, අකතං මෙ වචීදුච්චරිතන්ති න තප්පති; මනො සුචරිතං මෙ කතන්ති න තප්පති, අකතං මෙ මනොදුච්චරිතන්ති න තප්පති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා අතපනීයාති.

---

1. සබ්බූපධිපටිනිස්සග්ගත්ථාය - අට්ඨකථා

## 2. 1. 1. 2.

### පධාන සූත්‍රය

2. මහණෙනි, ලොව්හි දුකසේ පිරිය යුතු මේ (ප්‍රධාන) වීර්‍ය්‍යයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ගිහිගෙයි වසන ගිහියන්ගේ චීවර-පිණ්ඩපාත - ශයනාසන - ග්ලානප්‍රත්‍යය - භෛෂජ්‍ය - පරිෂ්කාර දීම පිණිස යම් වීර්‍ය්‍යයෙක් වේ ද, ගිහිගෙන් නික්ම අනගාරිය සඞ්ඛ්‍යාත ශාසනයට පැමිණිය වුන්ගේ (ස්කන්ධ - ක්ලේශ - අභිසංස්කාර සඞ්ඛ්‍යාත) සියලු උපධීන් බැහැර ලීම වූ නිවණ පිණිස යම් වීර්‍ය්‍යයෙකුත් වේ ද (යන දෙකයි.) මහණෙනි, ලොව්හි දුෂ්කර වූ මේ වීර්‍ය්‍යයෝ දෙදෙන වෙති. මහණෙනි, මේ ද්විවිධ වීර්‍ය්‍යයන් අතුරෙන් සියලු උපධීන් දුරලීම පිණිස යම් වීර්‍ය්‍යයෙක් වේ නම්, තෙල අග්‍ර වේ. මහණෙනි, එහෙයින් මෙසේ හික්මිය යුතුයි: සියලු උපධීන් දුරලීම පිණිස වීර්‍ය්‍යය වඩන්නම්හ යි. මෙසේ ම තොප විසින් හික්මිය යුතුයි.

## 2. 1. 1. 3.

### තපනීය සූත්‍රය

3. මහණෙනි, මේ තපනීය (සිත් සතැවුලියෙන් තවන) ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: මහණෙනි, මෙලොව්හි කිසිවකු විසින් කායදුශ්චරිතය කරණ ලද වෙයි. කාය සුචරිතය නොකරණ ලද වෙයි. වාග්දුශ්චරිතය කරණ ලද වෙයි. වාක්සුචරිතය නොකරණ ලද වෙයි. මනොදුශ්චරිතය කරණ ලද වෙයි. මනස්සුචරිතය නොකරණ ලද වෙයි. හේ මා විසින් කායදුශ්චරිතය කරණ ලදූ යි තැවෙයි. මා විසින් කායසුචරිතය නොකරණ ලදූ යි තැවෙයි. මා විසින් වාග්දුශ්චරිතය කරණ ලදූයි තැවෙයි. මා විසින් වාක්සුචරිතය නොකරණ ලදූ යි තැවෙයි. මා විසින් මනෝදුශ්චරිතය කරණ ලදූ යි තැවෙයි. මා විසින් මනස්සුචරිතය නොකරණ ලදූ යි තැවෙයි. මහණෙනි, මේ වනාහි තවන ධර්මයෝ දෙදෙන වෙති.

## 2. 1. 1. 4.

### අතපනීය සූත්‍රය

4. මහණෙනි, මේ අතපනීය වූ (නොතවන) ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: මහණෙනි, මෙ ලොව්හි කිසිවකු විසින් කායසුචරිතය. කරණ ලද වෙයි. කායදුශ්චරිතය නොකරණ ලද වෙයි. වාක්සුචරිතය කරණ ලද වෙයි. වාග්දුශ්චරිතය නොකරණ ලද වෙයි. මනඃසුචරිතය කරණ ලද වෙයි. මනොදුශ්චරිතය නොකරණ ලද වෙයි. හේ මා විසින් කායසුචරිතය කරණ ලදූ යි නො තැවෙයි. මා විසින් කායදුශ්චරිතය නො කරණ ලදූ යි නො තැවෙයි. මා විසින් වාක්සුචරිතය කරණ ලදූ යි නො තැවෙයි. මා විසින් වාග්දුශ්චරිතය නො කරණ ලදූ යි නො තැවෙයි. මා විසින් මනස්සුචරිතය කරණ ලදූ යි නො තැවෙයි මා විසින් මනෝදුශ්චරිතය නො කරණ ලදූ යි නො තැවෙයි. මහණෙනි, මේ වනාහි අතපනීය (නොතවන) ධර්මයෝ දෙදෙනයි.

## 2. 1. 1. 5.

### උපඤ්ඤාතසුත්තං.

5. ද්වින්නාහං භික්ඛවෙ ධම්මානං උපඤ්ඤාසිං: යා ච අසන්තුට්ඨිතා කුසලෙසු ධම්මෙසු, යා ච අප්පටිවානිතා පධානස්මිං. අප්පටිවානි සුදහං භික්ඛවෙ පදහාමි: කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ, උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං[1] භවිස්සතීති. තස්ස මය්හං භික්ඛවෙ අප්පමාදාධිගතා බොධි, අප්පමාදාධිගතො අනුත්තරො යොගක්ඛෙමො.

තුම්හෙ චෙපි භික්ඛවෙ අප්පටිවානං පදහෙය්‍යාථ: කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ, උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති. තුම්හෙපි භික්ඛවෙ න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: අප්පටිවානං පදහිස්සාම, කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ, උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

## 2. 1. 1. 6.

### සඤ්ඤොජනීය සුත්තං.

6. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: යා ච සඤ්ඤොජනීයෙසු ධම්මෙසු අස්සාදානුපස්සිතා, යා ච සඤ්ඤොජනීයෙසු ධම්මෙසු නිබ්බිදානුපස්සිතා.

සඤ්ඤොජනීයෙසු භික්ඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සී විහරන්තො රාගං නප්පජහති[2], දොසං නප්පජහති, මොහං නප්පජහති. රාගං අප්පහාය දොසං අප්පහාය මොහං අප්පහාය න පරිමුච්චති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

සඤ්ඤොජනීයෙසු භික්ඛවෙ ධම්මෙසු නිබ්බිදානුපස්සී විහරන්තො රාගං පජහති, දොසං පජහති. මොහං පජහති. රාගං පහාය දොසං පහාය මොහං පහාය පරිමුච්චති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චති දුක්ඛස්මාති වදාමි. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

---

1. සණ්ඨානං – සසං. 2. න පජහති – මජසං.

## 2. 1. 1. 5.

### උපඤ්ඤාත සූත්‍රය

5. මහණෙනි, මම ධර්මයන් දෙදෙනකුගේ ගුණ එළඹ දැන ගතිමි: (ධ්‍යානාදි) කුශලධර්මයන්හි (මෙතෙක් පමණිසි) යම් නොතුස්නා බවෙක් වේ ද, ප්‍රධන් වීර්‍ය්‍යයෙහි යම් නොපසු බස්නා බවෙක් වේ ද (යන දෙකයි). මහණෙනි, මම නොපසු බස්නා සැහැවි ඇත්තෙමි 'ඒකාන්තයෙන් සිරුරෙහි සම් හා නහර හා ඇට ඉතිරි වේවා, මස් ලේ වියළේවා, යමෙක් පුරුෂ ශක්තියෙන් පුරුෂවීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් ලැබිය යුතු වේ නම්, එය නො ලැබ වීර්‍ය්‍යයාගේ නැබීමෙ (නැවැත්මෙ) ක් නම් නො වේ ය'යි වැර වැඩීමි. මහණෙනි, ඒ මා විසින් සම්බෝධිය අප්‍රමාදයෙන් ලබන ලදු, අනුත්තර වූ (අර්හත්ඵල, නිර්වාණ සඞ්ඛ්‍යාත) යොගක්ෂෙමය අප්‍රමාදයෙන් ලබන ලදී.

මහණෙනි, තෙපි ද නො පසු බස්නා වැර වඩව: 'ඒකාන්තයෙන් ශරීරයෙහි සම් හා නහර හා ඇට ඉතිරි වේවා, මස් ලේ වියළේවා, යමෙක් පුරුෂශක්තියෙන් පුරුෂවීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් ලැබිය යුතු වේ නම්, එය නො ලැබ වීර්‍ය්‍යයාගේ නැවැත්මෙක් නම් නො වේ ය' කියා යි. මහණෙනි, තෙපි ද මඳ කලෙකින් ම යමක් (යම් රහත්ඵලක්) උදෙසා කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම අනගාරිය සඞ්ඛ්‍යාත ශාසනයට මොනොවට යෙත් නම්, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයෙහි කෙළවර වූ ඒ අනුත්තර ආර්‍ය්‍යඵලය දිටුදැමියෙහි ම තුමූ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට සපයා වාසය කරව.

මහණෙනි, එහෙයින් මෙසේ හික්මිය යුතුයි: 'මාගේ සිරුරෙහි ඒකාන්ත-යෙන් සම් හා නහර හා ඇට ඉතිරි වේවා, මස් ලේ වියළේවා, නො පසුබස්නා වැර වඩන්නම්හ, යමෙක් පුරුෂශක්තියෙන් පුරුෂවීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රම-යෙන් පැමිණිය යුතු වේ නම්, එයට නො පැමිණ වීර්‍ය්‍යයාගේ නැබීමෙක් නම් නො වේ ය' කියා යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

## 2. 1. 1. 6.

### සංයෝජනීය සූත්‍රය

6. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: දශවිධ සංයොජනයනට ප්‍රත්‍යය වූ ත්‍රෛභූමක ධර්මයන් විෂයෙහි යම් ආස්වාද විසින් බලන සුලු බවෙකුදු වේ නම්, සංයොජනීයධර්මයන් විෂයෙහි යම් උකටලී විසින් බලන සුලු බවෙකුදු වේ නම්, යන මේ දෙකය.

මහණෙනි, සංයෝජනීය ධර්මයන් විෂයෙහි ආස්වාද විසින් දක්නාසුලු ව වෙසෙන්නේ රාගය නො හරනේ ය. ද්වේෂය නො හරනේ ය. මෝහය නො හරනේ ය. රාගය නො හැර ද්වේෂය නො හැර මෝහය නො හැර ජාතියෙන් ජරායෙන් මරණයෙන් ශෝකයෙන් වැලැප්මෙන් දුකින් දොම්-නසින් අධිමාත්‍ර ආයාසයෙන් නො මිදෙයි. වට දුකින් නො මිදේය යි කියමි.

මහණෙනි, සංයෝජනීයධර්මයන් විෂයෙහි නිර්වේද වශයෙන් බලන සුලු ව වෙසෙන්නේ රාගය හරනේය, ද්වේෂය හරනේය, මෝහය හරනේය. රාගය හැර ද්වේෂය හැර මෝහය හැර ජාතියෙන් ජරායෙන් මරණයෙන් ශෝකයෙන් වැලැප්මෙන් දුකින් දොම්නසින් අධිමාත්‍ර ආයාසයෙන් මිදෙයි. වට දුකින් මිදේය යි කියමි. මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙන යි.

## 2. 1. 1. 7

### කණ්හසුත්තං

7. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා කණ්හා. කතමෙ ද්වෙ: අහිරිකඤ්ච අනොත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා කණ්හාති.

## 2. 1. 1. 8

### සුක්කසුත්තං

8. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා සුක්කා. කතමෙ ද්වෙ: හිරි ච ඔත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා සුක්කාති.

## 2. 1. 1. 9

### චරියාසුත්තං

9. ද්වෙමෙ භික්ඛවෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති. කතමෙ ද්වෙ: හිරි ච ඔත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ සුක්කා ධම්මා ලොකං න පාලෙය්‍යුං, නයිධ පඤ්ඤායෙථ මාතාති වා මාතුච්ඡාති වා මාතුලානීති වා ආචරියභරියාති වා ගරූනං දාරාති වා, සම්භෙදං ලොකො අගමිස්ස, යථා අජෙළකා කුක්කුටසූකරා සොණසිඟාලා. යස්මා ච ඛො භික්ඛවෙ ඉමෙ ද්වෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති, තස්මා පඤ්ඤායති[1] මාතාති වා මාතුච්ඡාති වා මාතුලානීති වා ආචරියභරියාති වා ගරූනං දාරාති වාති.

## 2. 1. 1. 10

### වස්සූපනායිකාසුත්තං

10 ද්වෙමා භික්ඛවෙ වස්සූපනායිකා. කතමා ද්වෙ: පුරිමිකා ච පච්ඡිමිකා ච. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ වස්සූපනායිකාති

### වස්සූපනායිකාවග්ගො පඨමො

**තස්සුද්දානං** :

වජ්ජා පධානා ද්වෙ තපනීයා
උපඤ්ඤාතෙන පඤ්චමං
සඤ්ඤොජනඤ්ච කණ්හඤ්ච
සුක්කං චරියා වස්සූපනායිකෙන වග්ගො.*

1. පඤ්ඤායන්ති - සී මු.  * ස්‍යාම පොත්ථකෙ න දිස්සතෙ.

## 2. 1. 1. 7.

### කණ්හ සූත්‍රය

7. මහණෙනි, මේ කෘෂණ (පාප) ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: (පවට විළිනැති බව වූ) අහිරිකය ද (පවට බිරිනැති බව වූ) අනොත්තප්පය ද යන දෙක සි. මහණෙනි, මේ කෘෂණධර්මයෝ දෙදෙන ය.

## 2. 1. 1. 8.

### සුක්ක සූත්‍රය

8. මහණෙනි, මේ ශුක්ල (කුශල) ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: (පවට විළිඇති බව වූ) හිරිය ද (පවට බිරිඇති බව වූ) ඔත්තප්පය ද යන දෙක සි. මහණෙනි, මේ ශුක්ල ධර්මයෝ දෙදෙන ය.

## 2. 1. 1. 9.

### චරියා සූත්‍රය

9. මහණෙනි, මේ ශුක්ල ධර්මයෝ දෙදෙන ලොව පාලනය කරත්. කවර දෙදෙනෙක යත්: හිරිය හා ඔත්තප්පය වේ. මහණෙනි, මේ ශුක්ල ධර්මයෝ දෙදෙන ලොව නොපල්නාහු නම්, මෙලෙව්හි වැදූ මවැ සි හෝ සුළු මවැ සි හෝ නැඳියැ සි හෝ ඇදුරුබිරියැ සි හෝ ගුරුන්ගේ අත්බරහ සි හෝ (වෙනස) නො පැණෙසි. ලෝකයෝ එළු තිරෙළුවන් මෙන් ද කුකුළු හූරන් මෙන් ද බලු සිවලුන් මෙන් ද පණත් බිඳුමට යන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් මේ ශුක්ලධර්මයෝ දෙදෙන ලොව රකිත් ද, එහෙයින් වැදූ මවැ සි හෝ සුළු මවැ සි හෝ නැඳියැ සි හෝ ඇදුරුබිරියැ සි හෝ ගුරුන්ගේ අත්බරහ සි හෝ (වෙනස) පැණෙසි.

## 2. 1. 1. 10.

### වස්සූපනායිකා සූත්‍රය

10. මහණෙනි, මේ වස් එළැඹීම් දෙකෙකි. කවර දෙකෙක යත්: පෙරවස් එළැඹීම ය, පසුවස් එළැඹීම ය (යන දෙකයි). මහණෙනි, මේ වනාහි වස් එළැඹීම් දෙක සි

**පළමු වස්සූපනායිකා වගයි.**

**එහි උද්දානය:**

වජ්ජ සූත්‍රය, පධාන සූත්‍රය, තපනීය සූත්‍ර දෙකය, පඤ්චම උපක්ඛිත සූත්‍රය, සංයොජන සූත්‍රය, කණ්හ සූත්‍රය, සුක්ක සූත්‍රය, චරියා සූත්‍රය, වස්සූපනායිකා සූත්‍රය දැයි මෙයින් වර්ගය වේ.

# 2. අධිකරණවග්ගො

## 2. 1. 2. 1.

[සාවත්ථිනිදානං]

11. ද්වෙමානි භික්ඛවෙ බලානි. කතමානි ද්වෙ: පටිසඞ්ඛානබලඤ්ච, භාවනාබලඤ්ච. කතමඤ්ච භික්ඛවෙ පටිසඞ්ඛානබලං: ඉධ භික්ඛවෙ එකච්චො ඉති පටිසඤ්චික්ඛති: කායදුච්චරිතස්ස ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව[1] ධම්මෙ අභිසම්පරායඤ්ච, වචීදුච්චරිතස්ස පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්ච, මනොදුච්චරිතස්ස පාපකො විපාකො දිට්ඨෙ චෙව[1] ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙති. වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙති, මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙති. සුද්ධං අත්තානං පරිහරති. ඉදං වුච්චති භික්ඛවෙ පටිසඞ්ඛානබලං. කතමඤ්ච භික්ඛවෙ භාවනාබලං: තත්‍ර භික්ඛවෙ යමිදං[2] භාවනාබලං. සෙඛමෙතං[3] බලං. සෙඛං හි සො භික්ඛවෙ බලං ආගම්ම රාගං පජහති, දොසං පජහති, මොහං පජහති, රාගං පහාය දොසං පහාය මොහං පහාය යං අකුසලං, තං න කරොති.[4] යං පාපං, තං න සෙවති. ඉදං වුච්චති භික්ඛවෙ භාවනාබලං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ බලානීති.

## 2. 1. 2. 2.

12. ද්වෙමානි භික්ඛවෙ බලානි. කතමානි ද්වෙ: පටිසඞ්ඛානබලඤ්ච, භාවනාබලඤ්ච. කතමඤ්ච භික්ඛවෙ පටිසඞ්ඛානබලං: ඉධ භික්ඛවෙ එකච්චො ඉති පටිසඤ්චික්ඛති: කායදුච්චරිතස්ස ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්ච. වචීදුච්චරිතස්ස පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්ච. මනොදුච්චරිතස්ස පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති සො ඉති පටිසඞ්ඛාය කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙති, වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙති, මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉදං වුච්චති භික්ඛවෙ පටිසඞ්ඛානබලං. කතමඤ්ච භික්ඛවෙ භාවනාබලං: ඉධ භික්ඛවෙ භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිනාමිං. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිනාමිං. ඉදං වුච්චති භික්ඛවෙ භාවනාබලං ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ බලානීති.

---

1. දිට්ඨෙව ධම්මෙ - සීමු PTS. 2. යදිදං - සීමු. 3. සෙඛානං මෙතං බලං - මජසං. සෙඛසෙසතං'ච් බලං - සාජ්ඣි. 4. න තං කරොති - මජසං.

# 2. අධිකරණ වර්ගය

## 2. 1. 2. 1.

**[සැවැත් නිදනයි:]**

11. මහණෙනි, මේ බල දෙකෙකි. කවර දෙකෙක යත්: පටිසඞ්ඛාන-බලය හා භාවනාබලය (යන දෙක) යි. මහණෙනි, පටිසඞ්ඛානබලය කවරේ ය යත්: මහණෙනි, මෙලොවෙහි කිසිවෙක් මෙසේ නුවණින් පස්විකා බලයි: "කායදුශ්චරිතයාගේ ලාමක වූ විපාකය දිට්ඨධම්යෙහි ද පරලොවෙහි ද වෙයි. වාග්දුශ්චරිතයාගේ ලාමක වූ විපාකය දිට්ඨධම්යෙහි ද පරලොවෙහි ද වෙයි. මනෝදුශ්චරිතයාගේ ලාමක වූ විපාකය දිට්ඨධම්යෙහි ද පරලොවෙහි ද වේය" යි. හෙතෙම මෙසේ නුවණින් බලා කායදුශ්චරිතය හැරපියා කායසුචරිතය වඩයි. වාග්දුශ්චරිතය හැරපියා වාක්සුචරිතය වඩයි. මනෝදුශ්චරිතය හැරපියා මනස්සුචරිතය වඩයි. පිරිසිදු අත්බව පරිහරණය කෙරෙයි. මහණෙනි, මෙය පටිසඞ්ඛානබලැ යි කියනු ලැබේ. මහණෙනි, භාවනාබලය කවරේය යත්: මහණෙනි, එහි ලා යම් භාවනාබලයෙක් වේ නම්, මෙය ශෛක්ෂ-බලය වේ. මහණෙනි, හේ ශෛක්ෂබලයට පැමිණ රාගය හැරලයි. ද්වේෂය හැරලයි. මෝහය හැරලයි. රාගය හැර ලා, ද්වේෂය හැර ලා, මෝහය හැර ලා යමෙක් අකුශල වේ නම් එය නො කෙරෙයි. යමෙක් පව් වේ නම් එය නො සෙවිතේය. මහණෙනි, මෙය භාවනාබලැ යි කියනු ලැබේ. මහණෙනි, මේ වනාහි බල දෙකයි.

## 2. 1. 2. 2.

12. මහණෙනි, මේ බල දෙකෙකි. කවර දෙකෙක යත්: පටිසඞ්ඛාන-බලය හා භාවනාබලය (යන දෙක) යි. මහණෙනි, පටිසඞ්ඛානබලය කවරේය යත්: මහණෙනි, මෙ ලොවෙහි කිසිවෙක් මෙසේ නුවණින් පස්විකා බලයි: කායදුශ්චරිතයාගේ ලාමක විපාකය වනාහි දිට්ඨධම්යෙහි ද පරලොවෙහි ද වෙයි. වාග්දුශ්චරිතයාගේ ලාමක විපාකය දිට්ඨධම්යෙහි ද පරලොවෙහි ද වෙයි. මනෝදුශ්චරිතයාගේ ලාමක විපාකය දිට්ඨධම්යෙහි ද පරලොවෙහි ද වෙ යි. හේ මෙසේ නුවණින් බලා කායදුශ්චරිතය හැරපියා කායසුචරිතය වඩයි. වාග්දුශ්චරිතය හැරපියා වාක්සුචරිතය වඩයි. මනෝදුශ්චරිතය හැරපියා මනස්සුචරිතය වඩයි. පිරිසිදු අත්බව පරිහරණය කෙරෙයි. මහණෙනි, මේ පටිසඞ්ඛානබලැ යි කියනු ලැබේ මහණෙනි, භාවනාබලය කවරේය යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, කෙලශපරිත්‍යාගය හා නිර්වාණප්‍රසකාඤතය පිණිස පිරිනමන සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වඩයි. ... විරියසම්බොජ්ඣඞ්ගය වඩයි ... පීතිසම්බොජ්ඣඞ්ගය වඩයි පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගය වඩයි .. සමාධිසම්බොජ්ඣඞ්ගය වඩයි. විවේකය ඇසුරු කළ, විරාගය ඇසුරු කළ, නිරෝධය ඇසුරු කළ, කෙලශපරිත්‍යාගය හා නිර්වාණප්‍රසකාඤතය පිණිස පිරිනමන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මේ භාවනාබලැ යි කියනු ලැබේ. මහණෙනි, මේ බල දෙකයි.

## 2. 1. 2. 3.

13. ද්වෙමානි භික්ඛවෙ බලානි. කතමානි ද්වෙ: පටිසඞ්ඛානබලඤ්ච භාවනාබලඤ්ච. කතමඤ්ච භික්ඛවෙ පටිසඞ්ඛානබලං: ඉධ භික්ඛවෙ එකච්චො ඉති පටිසඤ්චික්ඛති කායදුච්චරිතස්ස ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්ච, වචීදුච්චරිතස්ස පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්ච, මනොදුච්චරිතස්ස පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙති, වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙති, මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉදං වුච්චති භික්ඛවෙ පටිසඞ්ඛානබලං. කතමඤ්ච භික්ඛවෙ භාවනාබලං: ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං වුච්චති භික්ඛවෙ භාවනාබලං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ බලානීති.

## 2. 1. 2. 4.

14. ද්වෙමා භික්ඛවෙ තථාගතස්ස ධම්මදෙසනා. කතමා ද්වෙ: සඞ්ඛිත්තෙන ච, විත්ථාරෙන ච. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ තථාගතස්ස ධම්මදෙසනාති.

## 2. 1. 2. 5

15. යස්මිං භික්ඛවෙ අධිකරණෙ ආපන්නො[2] ච භික්ඛු චොදකො ච භික්ඛු න සාධුකං අත්තනාව අත්තානං පච්චවෙක්ඛති[3], තස්සෙතං භික්ඛවෙ අධිකරණෙ පාටිකඞ්ඛං, දීඝත්තාය ඛරත්තාය වාළත්තාය සංවත්තිස්සති, භික්ඛූ ච න ඵාසුකං[4] විහරිස්සන්තීති.[5] යස්මිං ච ඛො භික්ඛවෙ අධිකරණෙ ආපන්නො ච භික්ඛු චොදකො ච භික්ඛු සාධුකං අත්තනාව අත්තානං පච්චවෙක්ඛති,[3] තස්සෙතං භික්ඛවෙ අධිකරණෙ පාටිකඞ්ඛං, න දීඝත්තාය ඛරත්තාය වාළත්තාය සංවත්තිස්සති, භික්ඛූ ච ඵාසුකං[4] විහරිස්සන්තීති:

1. පඨමජ්ඣානං - සී. මු. 2. ආපන්නාපන්නා - කත්ථචි. 3. පච්චවෙක්ඛන්ති - සීමු.
4. ඵාසු - කත්ථචි 5. විහරිස්සන්ති - සීමු

## 2. 1. 2. 3.

13. මහණෙනි, මේ බල දෙකෙකි. කවර දෙකක යත්: පටිසඞ්ඛානබලය හා භාවනාබලය (යන දෙක) යි. මහණෙනි, පටිසඞ්ඛානබලය කවරේ ය යත්: මහණෙනි, මෙලොව්හි කිසිවෙක් මෙසේ නුවණින් පස්විකා බලයි: කායදුශ්චරිතයාගේ ලාමක විපාකය වනාහි දිටුදම්යෙහි ද පරලොව්හි ද වෙයි. වාග්දුශ්චරිතයාගේ ලාමක විපාකය වනාහි මෙලොව්හි ද පරලොව්හි ද වෙයි. මනොදුශ්චරිතයාගේ ලාමක විපාකය වනාහි මෙලොව්හි ද පරලොව්හි ද වේ. හේ මෙසේ නුවණින් බලා කායදුශ්චරිතය හැරපියා කායසුචරිතය වඩයි. වාග්දුශ්චරිතය හැරපියා වාක්සුචරිතය වඩයි. මනෝදුශ්චරිතය හැරපියා මනස්සුචරිතය වඩයි. පිරිසිදු අත්බව පිරිවටයි. මහණෙනි, මේ පටිසඞ්ඛානබලැ යි කියනු ලැබේ. මහණෙනි, භාවනාබලය කවරේය යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ කාමයෙන් වෙන් ව ම අකුශලධර්මයෙන් වෙන් ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛ ඇති ප්‍රථමධ්‍යානය උපදා වෙසෙයි. විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම ඇති චිත්තයාගේ එකාග්‍රතාවය ඇති විතර්කරහිත වූ විචාරරහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛ ඇති ද්විතීයධ්‍යානයට ඇවි ඇවි සඳ සම්වැද වෙසෙයි. ප්‍රීතිහුගේ ද විරාගයෙන් උපෙක්ෂාව ඇත්තේ ද සමෘතිමත් වූයේ ද සම්‍යක්ප්‍රඥ ඇත්තේ වෙසෙයි. කයින් සුව පිළිවිඳියි ආර්‍ය්‍යයෝ "උපෙක්ෂා ඇත්තේ සමෘතිමත් වූයේ සුඛවිහරණ ඇත්තෙකැ"යි යම් ධ්‍යානලාභියකු (ගෙණ) කියද්ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. සුඛයාගේ ද ප්‍රහාණයෙන දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් කැලැ ම සොම්නස් දෙම්නසුන්ගේ අස්තඞ්ගමයෙන් නොදුක් නොසුව වූ උපේක්ෂාසමෘති පරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානයට එළඹ වෙසෙයි. මහණෙනි, මෙය භාවනාබලැ යි කියනු ලැබේ. මහණෙනි, මේ වනාහි බල දෙකයි.

## 2. 1. 2. 4.

14. මහණෙනි, තථාගතයන් වහන්සේගේ මේ ධර්මදේශනා දෙකෙකි. කවර දෙකෙක යත්: සැකෙවින් දෙසුම් හා විතර විසින් දෙසුම ය. මහණෙනි, මේ වනාහි තථාගතයන් වහන්සේගේ ධර්මදේශනා දෙක ය.

## 2. 1. 2 5.

15. මහණෙනි, යම් අධිකරණයෙක්හි ලා (ඇවැත්) අවන් මහණ ද (ඇවතින්) චොදනා කරණ මහණ ද මොනොවට තෙමේ ම තමා නුවණින් සලකා නො බලා නම්, මහණෙනි, ඒ අධිකරණයෙහි ලා හෙල කැමැති විය යුතුය: දිගුකාලක් පැවැත්ම පිණිස, රළුබස්කම් පිණිස, කැකුළුබව පිණිස (ඒ අධිකරණය) පවත්නේ ය. භික්ෂූහු ද සුවසේ නො වසන්නාහුය යි.

මහණෙනි, යම් අධිකරණයෙක්හි ලා (ඇවැත්) අවන් මහණ ද (ඇවතින්) චෝදනා කරණ මහණ ද තෙමේ ම මොනොවට තමා නුවණින් සලකා බලා නම්, මහණෙනි, ඒ අධිකරණයෙහි දී තෙල කැමැති විය යුතුය. දිගුකල් පැවැත්ම පිණිස, රළුබස්කම් පිණිස, කැකුළුබව පිණිස (ඒ අධිකරණය) නො පවත්නේ ය. භික්ෂූහු ද සුවසේ වසන්නාහුය යි.

කථඤ්ච භික්ඛවෙ ආපන්නො භික්ඛු සාධුකං අත්තනාව අත්තානං පච්චවෙක්ඛති: ඉධ භික්ඛවෙ ආපන්නො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති, අහං ඛො අකුසලං ආපන්නො කිඤ්චිදෙව දෙසං කායෙන. තං[1] මං සො භික්ඛු අද්දස අකුසලං ආපජ්ජමානං කිඤ්චිදෙව දෙසං කායෙන. නො චෙ අහං අකුසලං ආපජ්ජෙය්‍යං කිඤ්චිදෙව දෙසං කායෙන, න මං සො භික්ඛු පස්සෙය්‍ය අකුසලං ආපජ්ජමානං කිඤ්චිදෙව දෙසං කායෙන. යස්මා ච ඛො අහං අකුසලං ආපන්නො කිඤ්චිදෙව දෙසං කායෙන, තස්මා මං සො භික්ඛු අද්දස අකුසලං ආපජ්ජමානං කිඤ්චිදෙව දෙසං කායෙන. දිස්වා ච පන මං සො භික්ඛු අකුසලං ආපජ්ජමානං කිඤ්චිදෙව දෙසං කායෙන අනත්තමනො අහොසි. අනත්තමනො සමානො අනත්තමනවචනං මං සො භික්ඛු අවච. අනත්තමනවචනාහං තෙන භික්ඛුනා වුත්තො සමානො අනත්තමනො අහොසිං. අනත්තමනො සමානො පරෙසං ආරොචෙසිං. ඉති මමෙව තත්ථ අච්චයො අච්චගමා සුඞ්කදායකංව භණ්ඩස්මින්ති. එවං ඛො භික්ඛවෙ ආපන්නො භික්ඛු සාධුකං අත්තනා'ව අත්තානං පච්චවෙක්ඛති.

කථඤ්ච භික්ඛවෙ චොදකො භික්ඛු සාධුකං අත්තනාව අත්තානං පච්චවෙක්ඛති: ඉධ භික්ඛවෙ චොදකො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: අයංඛො භික්ඛු අකුසලං ආපන්නො කිඤ්චිදෙව දෙසං කායෙන. [2]තාහං ඉමං භික්ඛුං අද්දසං අකුසලං ආපජ්ජමානං කිඤ්චිදෙව දෙසං කායෙන. නො චෙ අයං භික්ඛු අකුසලං ආපජ්ජෙය්‍ය කිඤ්චිදෙව දෙසං කායෙන, නාහං ඉමං භික්ඛුං පස්සෙය්‍යං අකුසලං ආපජ්ජමානං කිඤ්චිදෙව දෙසං කායෙන. යස්මා ච ඛො අයං භික්ඛු අකුසලං ආපන්නො කිඤ්චිදෙව දෙසං කායෙන, තස්මා අහං ඉමං භික්ඛුං අද්දසං අකුසලං ආපජ්ජමානං කිඤ්චිදෙව දෙසං කායෙන. දිස්වා ච පනාහං ඉමං භික්ඛුං අකුසලං ආපජ්ජමානං කිඤ්චිදෙව දෙසං කායෙන, අනත්තමනො අහොසිං. අනත්තමනො සමානො අනත්තමනවචනාහං ඉමං භික්ඛුං අවචං. අනත්තමනවචනායං භික්ඛු මයා වුත්තො සමානො අනත්තමනො අහොසි. අනත්තමනො සමානො පරෙසං ආරොචෙසි. ඉති මමෙව තත්ථ අච්චයො අච්චගමා සුඞ්කදායකංව[3] භණ්ඩස්මින්ති. එවං ඛො භික්ඛවෙ චොදකො භික්ඛු සාධුකං අත්තනාව අත්තානං පච්චවෙක්ඛති.

යස්මිං භික්ඛවෙ අධිකරණෙ ආපන්නො ච භික්ඛු චොදකො ච භික්ඛු න සාධුකං අත්තනාව අත්තානං පච්චවෙක්ඛති, තස්සෙතං භික්ඛවෙ අධිකරණෙ පාටිකඞ්ඛං දීඝත්තාය ඛරත්තාය වාළත්තාය සංවත්තිස්සති. භික්ඛූ ච න ඵාසුකං විහරිස්සන්තීති. යස්මිං ච ඛො භික්ඛවෙ අධිකරණෙ ආපන්නො ච භික්ඛු චොදකො ච භික්ඛු සාධුකං අත්තනාව අත්තානං පච්චවෙක්ඛති, තස්සෙතං භික්ඛවෙ අධිකරණෙ පාටිකඞ්ඛං න දීඝත්තාය ඛරත්තාය වාළත්තාය සංවත්තිස්සති. භික්ඛූ ච ඵාසුකං විහරිස්සන්තීති.

---

1. මං සො භික්ඛු-මජසං. තස්මා මං සො භික්ඛු - ස්‍යා. සී 1.
2. අහං ඉමං භික්ඛුං - මජසං. ස්‍යා. 3. සුඞ්කදායිකංව - ස්‍යා.

මහණෙනි, කෙසේ නම් ඇවැත් අවන් මහණ මොනොවට තෙමේ ම තමා නුවණින් බලා ද? මහණෙනි, මේ සස්නෙහි (ඇවැත්) අවන් මහණ මෙසේ නුවණින් සලකා බලයි: 'මම වනාහි කරජ කයින් කිසිදෙසක් ම අකුසලට (අන්‍යතර ආපත්තියකට) අවන්මි. ඒ මහණ කයින් කිසියම් දේශමාත්‍ර වූ අකුශල (ආපත්ති) යකට අවදනා ඒ මා දිටී. මම වැලිත් කයින් යම් ම අකුශල (ආපත්ති) යකට නො අවන්නෙම් නම්, ඒ මහණ කයින් කිසියම් අකුශල (ආපත්ති)යකට අවදනා මා නො දක්නේ ය. යම් හෙයෙකින් මම කයින් කිසියම් අකුශල (ආපත්ති) යකට අවන්නෙම් වේ ද, එහෙයින් ඒ මහණ කයින් කිසියම් ප්‍රදේශමාත්‍ර වූ අකුශලයකට අවදනා මා දිටී. ඒ මහණ කයින් කිසියම් දේශමාත්‍ර වූ අකුශලයකට අවදනා මා දැක ද නො සතුටු සිත් ඇති විය. නොසතුටු සිත් ඇත්තේ ම ඒ මහණ මට නො සතුටු බස් කීය. මම ඒ මහණහු විසින් නො සතුටු බසින් කියනු ලැබුයෙම් ම නො සතුටු සිත් ඇත්තෙම් වීමි. නොසතුටු සිත් ඇත්තෙම් ම අනුනට සැළ කෙළෙමි. මෙසේ භාණ්ඩයෙහි සුංවත් දෙන්නකු සෙයින් ඒ අධිකරණයෙහි මාගේ ම (තුන්වැදූරුම්) අපරාධයෙක් මා ඔබාගෙන තැගිනැ' යි. මහණෙනි, මෙසේ වනාහි ඇවැත් අවන් මහණ තෙමේ ම තමා මොනොවට නුවණින් සලකා බලයි.

මහණෙනි, කෙසේ නම් චෝදනා කරණ මහණ තෙමේ ම තමා මොනොවට නුවණින් සලකා බලා ද? මහණෙනි, මේ සස්නෙහි චෝදක භික්‍ෂු තෙමේ මෙසේ නුවණින් සලකා බලයි: 'මේ මහණ තෙමේ වනාහි කයින් කිසියම් දේශමාත්‍ර වූ අකුශල (ආපත්ති) යකට අවන්නේය. මම කයින් කිසියම් එකදේශමාත්‍ර වූ අකුශලයකට අවදනා ඒ මහණහු දිටිමි. ඉදින් මේ මහණ කයින් කිසියම් අකුශලයකට නො අවදනේ නම්, මම කයින් යම් ම අකුශලයකට අවදනා මේ මහණහු නො දක්නෙමි. යම් හෙයෙකින් මේ මහණ තෙමේ කයින් කිසියම් දේශමාත්‍ර වූ අකුශලයකට අවන්නේ ද, එහෙයින් මම කයින් කිසියම් දෙසක් ම අකුශලයකට අවදනා මේ මහණහු දිටිමි. කයින් කිසියම් දේශමාත්‍ර වූ අකුශලයකට අවදනා මේ මහණහු දැක ද මම නො සතුටු සිත් ඇත්තෙම් වීමි. නොසතුටු සිත් ඇත්තෙම් ම මේ මහණහට නො සතුටු බස් කීමි. මා විසින් නො සතුටු බසින් කියනු ලැබුයේ ම මේ මහණ නො සතුටු සිත් ඇති විය. නො සතුටු සිත් ඇත්තේ ම එය අනුනට සැළ කෙළේය. මෙසේ ඒ අධිකරණයෙහි ලා භාණ්ඩයෙහි සුංවත් දෙන්නකු සේ මාගේ ම (දෙවැදූරුම්) අපරාධයෙක් මා ඔබාගෙන තැගිනැ' යි. මහණෙනි, මෙසේ චෝදක මහණ තෙමේ මොනොවට තෙමේ ම තමා නුවණින් සලකා බලයි.

මහණෙනි, යම් අධිකරණයෙක්හි ඇවැත් අවන් භික්‍ෂු තෙමේ ද චොදක භික්‍ෂු තෙමේ ද තෙමේ ම තමා මොනොවට නුවණින් සලකා නො බලා නම්, මහණෙනි, ඒ අධිකරණයෙහි ලා තෙල කැමැති විය යුතුයි: 'දිගුකල් පැවැත්ම පිණිස රළුබස්කම් පිණිස කැකුළුබැව් පිණිස (අධිකරණය) පවත්නේය. භික්‍ෂුහු ද සැපසේ නො වසන්නාහු' යි. මහණෙනි, යම් අධිකරණයෙක්හි ලා (ඇවැත්) අවන් මහණ තෙමේ ද ඇවැතින් චෝදනා කරණ මහණ තෙමේ ද තෙමේ ම තමා මොනොවට නුවණින් සලකා බලා නම්, මහණෙනි, ඒ අධිකරණයෙහි ලා තෙල කැමැති විය යුතුයි: 'දිගුකල් පැවැත්ම පිණිස රළුබස් කම් පිණිස කැකුළුබැව් පිණිස අධිකරණය නො පවත්නේ ය. භික්‍ෂුහු ද සැපසේ වසන්නාහුය' යි.

## 2. 1. 2. 6.

16. අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: කො නු ඛො භො ගොතම හෙතු, කො පච්චයො, යෙන මිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්තීති?

[භගවා:]

අධම්මචරියා[1] විසමචරියා හෙතු ඛො බ්‍රාහ්මණ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්තීති.

[බ්‍රාහ්මණො:]

කො පන භො ගොතම හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති?

[භගවා:]

ධම්මචරියා සමචරියා හෙතු ඛො බ්‍රාහ්මණ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

[බ්‍රාහ්මණො:]

අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය' අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති'[2]ති, එවමෙව භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛු-සඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 2. 1. 2. 7.

17 අථඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි -පෙ- එකමන්තං නිසින්නො ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. කො නු ඛො භො ගොතම, හෙතු, කො පච්චයො, යෙන මිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්තීති.

[භගවා ]

කතත්තා ච බ්‍රාහ්මණ අකතත්තා ච එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්තීති.

[බ්‍රාහ්මණො:]

කො පන භො ගොතම හෙතු, කො පච්චයො, යෙන මිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

---

1. අධම්මචරිය විසමචරියා හෙතු - සතා. 2. දක්ඛන්තීති - සතා. මජසං.

## 2. 1. 2. 6.

16. එකල්හි තොපාල බමුණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග තුස්තකථාවට නිසි සිහිකරනුවට නිසි කථාව නිමවා එකත් පසෙක හිඳ. එකත්පසෙක හුන් ඒ බමුණු භාග්‍යවතුන් වහන්සේට මේය සැල කළේ ය: 'භවත් ගෞතමයෙනි, යම් හෙයෙකින් මෙ ලොව්හි ඇතැම් සත්‍ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුවයෙන් පහවූ නපුරු ගති වූ විවස පතනයට තැන්වූ නිරයට (උපපාත වශයෙන්) පැමිණෙන් නම්, එයට හේතු කවරේය? එයට ප්‍රත්‍යය කවරේය?

[භගවත්හු:]

බමුණ, අධර්මචයර්‍යා සඞ්ඛ්‍යාත විෂම චය්‍යාව හේතු කොට ගෙණ මෙසේ මෙ ලොව්හි ඇතැම් සත්‍ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුවයෙන් පහ වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට එළඹෙත්.

[බමුණු:]

භවත් ගෞතමයෙනි, මෙලොව්හි ඇතැම් සත්‍ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති නම් වූ සවර්ගලොකයට එළඹෙත් නම්, එයට හේතු කවරේය? ප්‍රත්‍යය කවරේ ය?

[භගවත්හු:]

බමුණ, ධර්මචයර්‍යා සඞ්ඛ්‍යාත සමචයර්‍යාව හේතු කොට ගෙණ මෙසේ මෙ ලොව්හි ඇතැම් සත්‍ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති නම් වූ සවර්ගලොකයට එළඹෙත්.

[බමුණු:]

භවත් ගෞතමයන්වහන්ස, ඉතා මැනැවි. භවත් ගෞතමයන් වහන්ස ඉතා මැනැවි. භවත් ගෞතමයන් වහන්ස! යම්සේ යටිහුරු කොට තබන ලද්දක් හෝ උඩුහුරු කොට තබන්නේ, පිළිසන් වූවක් හෝ වැසුම් හරනේ මංමුළා වූවකුට හෝ මග කියන්නේ 'ඇස් ඇත්තෝ රූ දක්නාහුය' යි බොල් අඳුරෙහි තෙල් පහනක් හෝ දල්වන්නේ වේ ද, එසෙයින් ම භවත් ගෞතම-යන් වහන්සේ විසින් නන්නියරින් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. ඒ මම භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්‍ෂුසඞ්ඝයා ද සරණ යෙමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවිහිමියෙන් සරණ ගිය උවසුවකු සේ රැක්නා සේක්වා' යි.

## 2. 1. 2. 7.

17. එකල්හි ජාණුස්සොණි බ්‍රාහමණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ හා සමඟ සතුටු වීය ... එකත් පසෙක හුන් ජාණුස්සොණි බ්‍රාහමණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේය සැළකෙළේය: භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයෙකින් මේ ලෝකයෙහි ඇතැම් සත්‍ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුවයෙන් පහ වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට යෙත් නම්, (එයට) හේතු කවරේය? ප්‍රත්‍යය කවරේය?

[භගවත්හු:]

බමුණ, කළ බැවිනුදු නොකළ බැවිනුදු මෙසේ මෙ ලොව කිසි සත්‍ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුවයෙන් පහ වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට එළඹෙත්.

[බමුණු:]

භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයෙකින් මෙ ලොව කිසි සත්‍ත්ව කෙනෙක් සුගති සඞ්ඛ්‍යාත සවර්ගලොකයට එළඹෙත් නම්, (එයට) හේතු කවරේය? ප්‍රත්‍යය කවරේය?

[භගවා:]

කතත්තා ච බ්‍රාහ්මණ අකතත්තා ච එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

[බ්‍රාහ්මණො:]

න ඛො අහං ඉමස්ස භොතො ගොතමස්ස සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං[1] අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානාමි. සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු, යථා අහං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යන්ති.

තෙන හි බ්‍රාහ්මණ සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති. එවම්භොති ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි: භගවා එතදවොච:

ඉධ බ්‍රාහ්මණ එකච්චස්ස කායදුච්චරිතං කතං හොති, අකතං හොති කායසුචරිතං. වචීදුච්චරිතං කතං හොති, අකතං හොති වචීසුචරිතං. මනොදුච්චරිතං කතං හොති, අකතං හොති මනොසුචරිතං. එවං ඛො බ්‍රාහ්මණ කතත්තා ච අකතත්තා ච එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

ඉධ පන බ්‍රාහ්මණ එකච්චස්ස කායසුචරිතං කතං හොති, අකතං හොති කායදුච්චරිතං වචීසුචරිතං කතං හොති, අකතං හොති වචීදුච්චරිතං. මනොසුචරිතං කතං හොති, අකතං හොති මනොදුච්චරිතං. එවං ඛො බ්‍රාහ්මණ කතත්තා ච අකතත්තා ච එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

[බ්‍රාහ්මණො:]

අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 2. 1. 2. 8.

18. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

එකංසෙනාහං ආනන්ද අකරණීයං වදාමි කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතන්ති.

1. විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස - සහම්පොත්ථකෙ අයං පාඨො දිස්සති.

[භගවත්හු:]

බමුණ, කලබැව්නුදු නොකල බැව්නුදු මෙසේ මෙ ලොව කිසි සත්ත්‍ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගයට එළඹෙත්.

[බමුණු:]

භවත් ගෞතමයන් වහන්සේ විසින් සැකෙවින් වදාරණ ලද විතර විසින් අරුත් නො බෙදන ලද මේ භාෂිතයාගේ අර්‍ථය මම විතර විසින් නො දනිමි. යම්සේ මම භවත් ගෞතමයන් වහන්සේ විසින් සැකෙවින් දෙසූ විතර විසින් අරුත් නො බෙදූ මේ භාෂිතයාගේ අර්‍ථය විතර විසින් දැනගන්නෙම් ද එපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ දහම් දෙසන සේක් නම් මැනැවි.

බමුණ, එසේ වී නම් අසව, මනා කොට මෙනෙහි කරව, දෙසම් යි. එසේය වහන්සැ' යි ජාණුස්සොණි බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්විය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

බ්‍රාහ්මණය, මේ ලෝකයෙහි කිසිවකු විසින් කායදුශ්චරිතය කරණ ලද්දේ වෙයි, කායසුචරිතය නොකරණ ලද්දේ වෙයි. වාග්දුශ්චරිතය කරණ ලද්දේ වෙයි, වාක්සුචරිතය නො කරණ ලද්දේ වෙයි. මනොදුශ්චරිතය කරණ ලද්දේ වෙයි, මනඃසුචරිතය නො කරණ ලද්දේ වෙයි. බ්‍රාහ්මණය, මෙසේ වනාහි කල බැව්නුදු නො කල බැව්නුදු මේ ලොව්හි කිසි සත්ත්‍ව කෙනෙක් කාබුන් මරණින් මතු මෙසේ සුවයෙන් පහ වූ දුගති වූ විනිපාත වූ නිරයට එළඹෙත්.

බ්‍රාහ්මණය, මෙලොව කිසිවකු විසින් කායසුචරිතය කරණ ලද්දේ වෙයි, කායදුශ්චරිතය නොකරණ ලද්දේ වෙයි. වාක්සුචරිතය කරණ ලද්දේ වෙයි, වාග්දුශ්චරිතය නොකරණ ලද්දේ වෙයි. මනඃසුචරිතය කරණ ලද්දේ වෙයි, මනොදුශ්චරිතය නොකරණ ලද්දේ වෙයි. බ්‍රාහ්මණය, මෙසේ වනාහි කල බැව්නුදු නො කල බැව්නුදු මෙලොව්හි කිසි සත්ත්‍ව කෙනෙක් මෙ පරිද්දෙන් කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලෝකයට එළඹෙත්.

[බමුණු:]

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිම් කොට සරණ ගිය උවසුවකු සේ මා රැක්නා සේක්වායි.

## 2. 1. 2. 8.

18. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්දතෙරණුවනට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

ආනන්දය, මම කායදුශ්චරිතය වාග්දුශ්චරිතය මනොදුශ්චරිතය ඒකාන්තයෙන් නො කළ යුතුයි කියමි.

[ආනන්දො:]

යමිදං භන්තෙ භගවතා එකංසෙන අකරණීයං අක්ඛාතං කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. තස්මිං අකරණීයෙ කයිරමානෙ කො ආදීනවො පාටිකඞ්ඛොති.

[භගවා:]

යමිදං ආනන්ද මයා එකංසෙන අකරණීයං අක්ඛාතං කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. තස්මිං අකරණීයෙ කයිරමානෙ අයං ආදීනවො පාටිකඞ්ඛො:

අත්තාපි අත්තානං උපවදති, අනුවිච්ච විඤ්ඤූ ගරහන්ති, පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

යමිදං ආනන්ද මයා එකංසෙන අකරණීයං අක්ඛාතං කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. තස්මිං අකරණීයෙ කයිරමානෙ අයං ආදීනවො පාටිකඞ්ඛො.

එකංසෙනාහං ආනන්ද කරණීයං වදාමි කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතන්ති.

[ආනන්දො:]

යමිදං භන්තෙ භගවතා එකංසෙන කරණීයං අක්ඛාතං කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං තස්මිං කරණීයෙ කයිරමානෙ කො ආනිසංසො පාටිකඞ්ඛොති?

[භගවා:]

යමිදං ආනන්ද මයා එකංසෙන කරණීයං අක්ඛාතං කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං. තස්මිං කරණීයෙ කයිරමානෙ අයං ආනිසං-සො පාටිකඞ්ඛො:

අත්තාපි අත්තානං න උපවදති, අනුවිච්ච විඤ්ඤූ පසංසන්ති, කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, අසම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

යමිදං ආනන්ද මයා එකංසෙන කරණීයං අක්ඛාතං කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං. තස්මිං කරණීයෙ කයිරමානෙ අයං ආනිසංසො පාටිකඞ්ඛොති.

## 2. 1. 2. 9.

19. අකුසලං භික්ඛවෙ පජහථ. සක්කා භික්ඛවෙ අකුසලං පජහිතුං. නො චෙ තං[1] භික්ඛවෙ සක්කා අභවිස්ස අකුසලං පජහිතුං, නාහං එවං වදෙය්‍යං "අකුසලං භික්ඛවෙ පජහථා"ති. යස්මා ච ඛො භික්ඛවෙ සක්කා අකුසලං පජහිතුං, තස්මාහං එවං වදාමි "අකුසලං භික්ඛවෙ පජහථා"ති. අකුසලං ච හිදං භික්ඛවෙ පහීනං අහිතාය දුක්ඛාය සංවත්තෙය්‍ය. නාහං එවං වදෙය්‍යං "අකුසලං භික්ඛවෙ පජහථා"ති. යස්මා ච ඛො භික්ඛවෙ අකුසලං පහීනං හිතාය සුඛාය සංවත්තති, තස්මාහං එවං වදාමි "අකුසලං භික්ඛවෙ පජහථා"ති.

1. නොචෙදං - මජසං.

[අනඳ තෙරනු:]

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් කායදුශ්චරිතයෙක්, වාග්දුශ්චරිතයෙක් මනෝදුශ්චරිතයෙක් ඒකාන්තයෙන් නො කළ යුතුය යි වදාරණ ලද ද ඒ නොකට යුතු දෑ කරණු ලබන කල්හි කවර ආදීනවයෙක් කැමැති විය යුතු ද?

[භගවත්හු:]

ආනන්දය, මා විසින් යම් කායදුශ්චරිතයෙක්-වාග්දුශ්චරිතයෙක්-මනෝදුශ්චරිතයෙක් ඒකාන්තයෙන් නො කට යුතුය යි වදාරණ ලද නම්, ඒ නො කට යුතු දෑ කරණු ලබන කල්හි මේ ආදීනවය කැමැති විය යුතුය:

“තෙමේත් තමහට උපවාද කෙරෙයි. නුවණැතියෝ විමසා දූත ගරහත්. අපකීර්තිය උස්ව නගියි. සම්මූඪ ව කළුරිය කෙරෙයි. කාබුත් මරණින් මතු සුවයෙන් පහ වූ දුගති වූ විනිපාත වූ නිරයට එළඹෙත්”ය යි.

ආනන්දය, මා විසින් යම් කායදුශ්චරිතයෙක් - වාග්දුශ්චරිතයෙක් - මනෝදුශ්චරිතයෙක් ඒකාන්තයෙන් නො කළ යුතුය යි පවසන ලද නම්, ඒ නොකට යුතු දෑ කරණු ලබන කල්හි මේ ආදීනවය කැමැති විය යුත්තේ ය.

ආනන්දය, මම් කායසුචරිතය - වාක්සුචරිතය – මනසුචරිතය එකාන්ත යෙන් කළ යුතු යයි කියමි.

[අනඳ තෙරනු:]

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් කායසුචරිතයෙක් - වාක්සුචරිතයෙක් – මනසුචරිතයෙක් ඒකාන්තයෙන් කළ යුතු ය යි පවසන ලද නම්, ඒ කට යුතු දෑ කරණු ලබන කල්හි කවර අනුසසෙක් කැමැති විය යුත්තේ ද?

[භගවත්හු:]

ආනන්දය, යම් මේ කායසුචරිතයෙක් - වාක්සුචරිතයෙක් - මනසුචරිත යෙක් එකාන්තයෙන් කටයුතුය යි මා විසින් කියන ලද නම්, ඒ කටයුතු දෑ කරණු ලබන කල්හි මේ අනුසස කැමැති විය යුත්තේ ය:

“තෙමේත් තමාට උපවාද නො කෙරෙයි. නුවණැත්තෝ විමසා දූත පසසත්. යසශී උස්ව නැගෙයි. අසම්මූඪ ව කළුරිය කෙරෙයි. කාබුත් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලෝකයට එළඹෙත්.”

ආනන්දය, යම් කායසුචරිතයෙක් – වාක්සුචරිතයෙක්-මනසුචරිතයෙක් ඒකාන්තයෙන් කට යුතුයයි ම විසින් පවසන ලද නම් ඒ කටයුතු දෑ කරණු ලබන කල්හි මේ අනුසස කැමැති විය යුත්තේ යයි.

## 2. 1. 2. 9.

19. මහණෙනි, අකුශලය දුරලව. මහණෙනි, අකුශලය දුරලන්නට හැකිය. මහණෙනි, ඉදින් ඒ අකුශලය දුරලීමට නො හැකි නම් “මහණෙනි, අකුශලය දුරලවයි” මෙසේ මම නොකියමි. මහණෙනි, යම් හෙයෙකින් අකුශලය දුරලන්නට හැකි ද, එහෙයින් ම “මහණෙනි, අකුශලය දුරලව”යි මෙසේ මම කියමි. තවද මහණෙනි, මේ අකුශලය ප්‍රහීණ වූයේ අහිත පිණිස දුක් පිණිස පවත්තේ නම් “මහණෙනි, අකුශලය දුරලව”යි මම මෙසේ නොකියමි. මහණෙනි, යම් හෙයෙකින් අකුශලය ප්‍රහීණ වූයේ හිත පිණිස සුව පිණිස පවත්නේ ද එහෙයින් ම “මහණෙනි, අකුශලය දුරලව”යි මම් මෙසේ කියමි.

කුසලං භික්ඛවෙ භාවෙථ. සක්කා භික්ඛවෙ කුසලං භාවෙතුං. නො චෙ තං[1] භික්ඛවෙ සක්කා අභවිස්ස කුසලං භාවෙතුං, නාහං එවං වදෙය්‍යං "කුසලං භික්ඛවෙ භාවෙථා"ති. යස්මා ච ඛො භික්ඛවෙ සක්කා කුසලං භාවෙතුං, තස්මාහං එවං වදාමි "කුසලං භික්ඛවෙ භාවෙථා"ති. කුසලං ච හිදං භික්ඛවෙ භාවිතං අහිතාය දුක්ඛාය සංවත්තෙය්‍ය, නාහං එවං වදෙය්‍යං "කුසලං භික්ඛවෙ භාවෙථා"ති. යස්මා ච ඛො භික්ඛවෙ කුසලං භාවිතං හිතාය සුඛාය සංවත්තති තස්මාහං එවං වදාමි "කුසලං භික්ඛවෙ භාවෙථා"ති.

## 2. 1. 2. 10.

20. ද්වෙ මෙ භික්ඛවෙ ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති. කතමෙ ද්වෙ? දුන්නික්ඛිත්තඤ්ච පදබ්‍යඤ්ජනං, අත්ථො ච දුන්නීතො. දුන්නික්ඛිත්තස්ස භික්ඛවෙ පදබ්‍යඤ්ජනස්ස අත්ථොපි දුන්නයො හොති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්තීති.

ද්වෙ මෙ භික්ඛවෙ ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තන්ති. කතමෙ ද්වෙ? සුනික්ඛිත්තඤ්ච පදබ්‍යඤ්ජනං, අත්ථො ච සුනීතො. සුනික්ඛිත්තස්ස භික්ඛවෙ පදබ්‍යඤ්ජනස්ස අත්ථොපි සුනයො හොති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තන්තීති.

**අධිකරණවග්ගො දුතියො.**

---

# 3. බාලවග්ගො

## 2. 1. 3. 1.

**[සාවජ්ජනිද්දනං:]**

21. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ? යො ච අච්චයං අච්චයතො න පස්සති, යො ච අච්චයං දෙසෙන්තස්ස යථාධම්මං න පතිගණ්හාති.[1] ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති.

ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා. කතමෙ ද්වෙ? යො ච අච්චයං අච්චයතො පස්සති, යො ච අච්චයං දෙසෙන්තස්ස යථාධම්මං පතිගණ්හාති.[2] ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති.

## 2. 1. 3. 2.

22. ද්වෙමෙ භික්ඛවෙ තථාගතං අබ්භාචික්ඛන්ති. කතමෙ ද්වෙ? දුට්ඨො වා දොසන්තරො, සද්ධො වා දුග්ගහිතෙන. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ තථාගතං අබ්භාචික්ඛන්තීති.

1. නප්පටිග්ගණ්හාති - මජසං.
2. පටිග්ගණ්හාති - මජසං. පටිගණ්හාති - සී 1

මහණෙනි, කුශලය වඩව. මහණෙනි, කුශලය වඩන්නට හැකිය. මහණෙනි, ඉදින් කුශලය නොවැඩිය හැකි නම් "මහණෙනි, කුශලය වඩව"යි මෙසේ මම නොකියමි. මහණෙනි, යම් හෙයෙකින් කුශලය වඩන්නට හැකි ද එහෙයින් "මහණෙනි, කුශලය වඩව"යි මම මෙසේ කියමි. මහණෙනි, කුශලය වඩන ලද්දේ ඉදින් අහිත පිණිස දුක් පිණිස පවත්නේ නම් "මහණෙනි, කුසල් වඩව"යි මෙසේ මම නො කියමි.

තවද මහණෙනි, යම් හෙයෙකින් කුශලය වඩන ලද්දේ හිත පිණිස සුව පිණිස පවත්නේ ද එහෙයින් ම "මහණෙනි, කුශලය වඩව"යි මම මෙසේ කියමි.

**2. 1. 2. 10.**

20. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් සද්ධර්මයාගේ විනාශය පිණිස අතුරුදන් වීම පිණිස පවත්නාහ. කවර දෙදෙනෙක යත්: උපිළිවෙළින් වරදවා ගත් පෙළ ද වරදවා පෙරළා ගත් අටුවා ද යන දෙකය. මහණෙනි, වරදවා ගත් පාළියෙහි අටුවා ද දුර්නය (අන්නැය) වෙයි. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙන සද්ධර්මයාගේ විනාශය පිණිස අනතර්ධානය පිණිස පවත්නාහ.

මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් සද්ධර්මයාගේ පැවැත්ම පිණිස අවිනාශය පිණිස අතුරුදන් නොවීම පිණිස පවත්නාහ. කවර දෙදෙනක යත්: මොනොවට ගත් පෙළදහම ද මොනොවට ගත් අටුවා ද යන දෙකයි. මහණෙනි, මොනොවට ගත් පෙළදහමෙහි අටුවා ද සුනය වෙයි.

මහණෙනි, මේ ධර්මයෝ දෙදෙන සද්ධර්මයාගේ පැවැත්ම පිණිස අවිනාශය පිණිස අතුරුදන් නොවීම පිණිස පවත්නාහ යි.

**අධිකරණවග්ග දෙවැනි යි**

---

## 3. බාලවර්ගය

**2. 1. 3. 1.**

**[සැවැත්නිදානයි:]**

21. මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙක් වෙති. කවර දෙදෙනෙක යත්: යමෙක් වරද වරද විසින් නො දක්නේ ද, යමෙකුත් (පිළිගෙණ) වරද දෙසන්නහුගේ යථාධර්මය නො පිළිගන්නේ ද, මහණෙනි, මොහු බාලයෝ දෙදෙන වෙති.

මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙක් වෙති. කවර දෙදෙනෙක යත්: යමෙක් වරද වරද විසින් දක්නේ ද, යමෙකුත් පිළිගෙණ වරද දෙසන්නහුගේ යථාධර්මය පිළිගන්නේ ද, මහණෙනි, මොහු දෙදෙන පණ්ඩිත වෙති.

**2. 1. 3. 2.**

22. මහණෙනි, මොහු දෙදෙන තථාගතයන්ට අභ්‍යාඛ්‍යාන කෙරෙත්. (අභූතයෙන් දෙස් තබත්.) කවර දෙදෙනෙක යත්: දුෂ්ට වූයේ ඇතුළත සිටුනා ද්වේෂය ඇත්තේ හෝ වේ ද, වැරදි ලෙස ගැණීමෙන් වූ සැදැහැ ඇත්තේ හෝ වේ ද (යන දෙදෙන වෙති.) මහණෙනි, මොහු දෙදෙන තථාගතයන්ට අභ්‍යාඛ්‍යාන කෙරෙත්.

2. 1. 3. 3.

23. ද්වෙමෙ භික්ඛවෙ තථාගතං අබ්භාචික්ඛන්ති. කතමෙ ද්වෙ? යො ච අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙති, යො ච භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ තථාගතං අබ්භාචික්ඛන්තීති.

ද්වෙමෙ භික්ඛවෙ තථාගතං නාබ්භාචික්ඛන්ති. කතමෙ ද්වෙ? යො ච අභාසිතං අලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙති, යො ච භාසිතං ලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ තථාගතං නාබ්භාචික්ඛන්තීති.

2. 1. 3. 4.

24. ද්වෙමෙ භික්ඛවෙ තථාගතං අබ්භාචික්ඛන්ති. කතමෙ ද්වෙ? යො ච නෙය්‍යත්ථං සුත්තන්තං නීතත්ථො සුත්තන්තොති දීපෙති, යො ච නීතත්ථං සුත්තන්තං නෙය්‍යත්ථො සුත්තන්තොති දීපෙති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ තථාගතං අබ්භාචික්ඛන්තීති.

2. 1. 3. 5.

25. ද්වෙමෙ භික්ඛවෙ තථාගතං නාබ්භාචික්ඛන්ති. කතමෙ ද්වෙ? යො ච නෙය්‍යත්ථං සුත්තන්තං නෙය්‍යත්ථො සුත්තන්තොති දීපෙති, යො ච නීතත්ථං සුත්තන්තං නීතත්ථො සුත්තන්තොති දීපෙති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ තථාගතං නාබ්භාචික්ඛන්තීති.

2. 1. 3. 6.

26. පටිච්ඡන්නකම්මන්තස්ස භික්ඛවෙ ද්වින්නං ගතීනං අඤ්ඤතරා ගති පාටිකඞ්ඛා: නිරයො වා තිරච්ඡානයොනි වාති.

අප්පටිච්ඡන්නකම්මන්තස්ස භික්ඛවෙ ද්වින්නං ගතීනං අඤ්ඤතරා ගති පාටිකඞ්ඛා: දෙවා වා මනුස්සා වාති.

2. 1. 3. 7.

27. මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ ද්වින්නං ගතීනං අඤ්ඤතරා ගති පාටිකඞ්ඛා: නිරයො වා තිරච්ඡානයොනි වාති.

**2. 1. 3. 3.**

23. මහණෙනි, මොහු දෙදෙන තථාගතයන්ට අභ්‍යාඛ්‍යාන කෙරෙත්. කවර දෙදෙන යත්: යමෙක් තථාගතයන් වහන්සේ විසින් නො දෙසන ලද්ද නො තෙපලන ලද්ද තථාගතයන් වහන්සේ විසින් දෙසනලදැ යි තෙපලන ලදැයි දක්වා ද, යමෙකුත් තථාගතයන් වහන්සේ විසින් දෙසන ලද්ද තෙපලන ලද්ද තථාගතයන් වහන්සේ විසින් නො දෙසන ලදැයි නො තෙපලන ලදැයි දක්වා ද (යන දෙදෙන වෙති.) මහණෙනි, මොහු දෙදෙන තථාගතයන්ට අභ්‍යාඛ්‍යාන කෙරෙත්.

මහණෙනි, මොහු දෙදෙන තථාගතයන්ට අභ්‍යාඛ්‍යාන නො කෙරෙත්. කවර දෙදෙන යත්: යමෙක් තථාගතයන් වහන්සේ විසින් නො දෙසන ලද්ද නො තෙපලන ලද්ද තථාගතයන් වහන්සේ විසින් නො දෙසන ලදැයි නො තෙපලන ලදැයි දක්වා ද, යමෙකුත් තථාගතයන් වහන්සේ විසින් දෙසන ලද්ද තෙපලන ලද්ද තථාගතයන් වහන්සේ විසින් දෙසන ලදැයි තෙපලන ලදැයි දක්වා ද, (යන දෙදෙන වෙති.) මහණෙනි, මොහු දෙදෙන තථාගතයන්ට අභ්‍යාඛ්‍යාන නො කෙරෙත්.

**2. 1. 3—4.**

24 මහණෙනි, මොහු දෙදෙන තථාගතයන්ට අභ්‍යාඛ්‍යාන කෙරෙත්. කවර දෙදෙන යත්: යමෙක් එළවා කිය යුතු අර්‍ථ ඇති සූත්‍රාන්තය හෙළි කළ අරුත් ඇති සූත්‍රාන්තය යි දක්වා ද, යමෙකුත් හෙළි කළ අරුත් ඇති සූත්‍රාන්තය එළවා කිය යුතු අරුත් ඇති සූත්‍රාන්තය යි දක්වා ද (යන මේ දෙදෙන වෙති.) මහණෙනි, මොහු දෙදෙන තථාගතයන්ට අභ්‍යාඛ්‍යාන කෙරෙත්.

**2. 1. 3. 5.**

25. මහණෙනි, මොහු දෙදෙන තථාගතයන්ට අභ්‍යාඛ්‍යාන නො කෙරෙත්. කවර දෙදෙන යත්: යමෙක් එළවා කිය යුතු අරුත් ඇති සූත්‍රාන්තය එළවා කිය යුතු අරුත් ඇති සූත්‍රාන්තය යි දක්වා ද, යමෙකුත් හෙළි කළ අරුත් ඇති සූත්‍රාන්තය හෙළි කළ අරුත් ඇති සූත්‍රාන්තය යි දක්වා ද (යන මේ දෙදෙන වෙති.) මහණෙනි, මොහු දෙදෙන තථාගතයන්ට අභ්‍යාඛ්‍යාන නො කෙරෙත්.

**2. 1. 3. 6.**

26. මහණෙනි, පිළිසත්කම්ත්හට (පව්කම් ඇත්තහුට) නිරය හෝ තිරිසන් යෝනිය හෝ යයි දෙගතීන් අතුරෙන් එක්තරා ගතියෙක් කැමති විය යුතුයි.

**2. 1. 3. 7.**

27. මහණෙනි, නො පිළිසත් කමත්හට දේවගතිය හෝ මනුෂ්‍යගතිය හෝ යයි දෙගතීන් අතුරෙන් එක්තරා ගතියෙක් කැමති විය යුතුයි.

**2. 1. 3. 8.**

28. සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ ද්වින්නං ගතීනං අඤ්ඤතරා ගති පාටිකඞ්ඛා: දෙවා වා මනුස්සා වාති.

**2. 1. 3. 9.**

29. දුස්සීලස්ස භික්ඛවෙ ද්වෙ පටිග්ගාහා: නිරයො වා තිරච්ඡානයොනි වාති.[1] සීලවතො භික්ඛවෙ ද්වෙ පටිග්ගාහා: දෙවා වා මනුස්සා වාති.

**2. 1. 3. 10.**

30. ද්වාහං භික්ඛවෙ අත්ථවසෙ සම්පස්සමානො අරඤ්ඤෙ වනපත්ථානි[1] පන්තානි සෙනාසනානි පටිසෙවාමි. කතමෙ ද්වෙ? අත්තනො ච දිට්ඨධම්මසුඛවිහාරං සම්පස්සමානො, පච්ඡිමඤ්ච ජනතං අනුකම්පමානො. ඉමෙ ඛො අහං භික්ඛවෙ ද්වෙ අත්ථවසෙ සම්පස්සමානො අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවාමීති.

**2. 1. 3. 11.**

31. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා විජ්ජාභාගියා. කතමෙ ද්වෙ? සමථො ච විපස්සනා ච. සමථො භික්ඛවෙ භාවිතො කමත්ථමනුභොති? චිත්තං භාවියති. චිත්තං භාවිතං කමත්ථමනුභොති[2]? යො රාගො, සො පහීයති. විපස්සනා භික්ඛවෙ භාවිතා කමත්ථමනුභොති? පඤ්ඤා භාවියති. පඤ්ඤා භාවිතා කමත්ථමනුභොති? යා අවිජ්ජා, සා පහීයති. රාගූපක්කිලිට්ඨං වා භික්ඛවෙ චිත්තං න විමුච්චති. අවිජ්ජූපක්කිලිට්ඨා වා පඤ්ඤා න භාවියති. ඉති ඛො භික්ඛවෙ රාගවිරාගා චෙතොවිමුත්ති, අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්තීති.

**බාලවග්ගො තතියො.**

---

## 4. සමචිත්තවග්ගො

**2. 1. 4. 1.**

**[සාවත්ථිනිදානං:]**

32. අසප්පුරිසභූමිඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි[3] සප්පුරිසභූමිඤ්ච. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමා ච භික්ඛවෙ අසප්පුරිසභූමි? අසප්පුරිසො භික්ඛවෙ අකතඤ්ඤූ හොති අකතවෙදී. අසබ්භිහෙතං භික්ඛවෙ උපඤ්ඤාතං යදිදං අකතඤ්ඤුතා අකතවෙදිතා. කෙවලා එසා භික්ඛවෙ අසප්පුරිසභූමි යදිදං අකතඤ්ඤුතා අකතවෙදිතා.

---

1. අරඤ්ඤවනපත්ථානි - මජසං.
2. කිමත්ථමනුභොති - සයා. කතමත්ථමනුභොති - කණ්ඩි
3. දෙසෙස්සාමි - මජසං. සයා. සී. 1.

**2. 1. 3. 8.**

28. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිකයාට නිරය හෝ තිරිසන් යෝනිය හෝ යයි දෙගතියෙන් අතුරෙන් එක්තරා ගතියෙක් කැමැති විය යුතුයි.

මහණෙනි, සම්‍යග්දෘෂ්ටිකයාට දෙවගතිය හෝ මනුෂ්‍යගතිය හෝ යයි දෙගතියෙන් අතුරෙන් එක්තරා ගතියෙක් කැමති විය යුතුයි.

**2. 1. 3. 9.**

29. මහණෙනි, දුශ්ශීලයාගේ පිළිගාවෝ (ප්‍රතිග්‍රාහකයෝ) දෙදෙනෙකි. නිරය හෝ තිරිසන් යෝනිය හෝ යි. මහණෙනි, සිල්වත්හුගේ පිළිගාවෝ දෙදෙනෙකි. දෙවියෝ හෝ මනුෂ්‍යයෝ හෝ යි.

**2. 1. 3. 10.**

30. මහණෙනි, මම කරුණු දෙකක් දක්නෙම් අරන් ද, වනපෙත් ද, ගැඹුරු වල් ද යන සෙනසුන් සෙවනය කරමි. කවර දෙකෙක යත්: තමන්හට ඉහාත්මසුඛවිහරණය දක්නෙම් හෝ පශ්චිමජනතාවට අනුකම්පා කරන්නෙම් හෝ යි මහණෙනි, මම මේ කරණු දෙක දක්නෙම් අරන් ද, වනපෙත් ද, ගැඹුරු වල් ද යන සෙනසුන් සෙවනය කරමි.

**2. 1. 3. 11.**

31. මහණෙනි, මේ විද්‍යාභාගීය ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ශමථය හා විදර්ශනාව හා යන දෙදෙනායි. මහණෙනි, ශමථය වඩන ලද්දේ කිනම් අර්ථයක් සපයා ද.? මාර්ගචිත්තය වැඩෙයි. වැඩුනු සිත කිනම් අර්ථයක් සපයා ද? යම් රාගයෙක් වේ නම්, එය පැහෙයි (ප්‍රහීණ වේ.) මහණෙනි, විදර්ශනාව වඩන ලද්දී කිනම් අර්ථයක් සපයා ද?, මාර්ගප්‍රඥව වැඩෙයි. වැඩුනු ප්‍රඥව කිනම් අර්ථයක් සපයා ද? යම් අවිද්‍යායෙක් වේ නම් එය පැහෙයි. මහණෙනි, රාගයෙන් කිලිටි වූ සිත නො මිදෙයි. අවිද්‍යායෙන් කිලිටි වූ ප්‍රඥව නො වැඩෙයි. මහණෙනි, මෙසේ වනාහි රාගයාගේ ක්‍ෂයවිරාගයෙන් (ඵලසමාධිසඞ්ඛ්‍යාත) චිත්තවිමුක්තිය වේ. අවිද්‍යාවගේ ක්‍ෂයවිරාගයෙන් (ඵලප්‍රඥසඞ්ඛ්‍යාත) ප්‍රඥවිමුක්තිය වේ.

**බාල වග්ග තෙවැනි යි.**

---

## 4. සමචිත්ත වර්ගය

**2. 1. 4. 1**

**[සැවැත්නිදානයි:]**

32. මහණෙනි, තොපට අසත්පුරුෂ භූමිය හා සත්පුරුෂ භූමිය දෙසමි. එය අසව, මනාකොට මෙනෙහි කරව. කියනු මැනව (වදාළහ.) වහන්ස, එසේ ය යි ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇසවූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, අසත්පුරුෂ භූමිය කවර? මහණෙනි, අසත්පුරුෂ තෙමේ අකෘතඥ වෙයි, කෙළෙහිගුණ පාළකොට නො දන්නේ ද වෙයි. මහණෙනි, යම් මේ අකෘතඥ බවෙක් වේ ද, අකෘතවේදී බවෙක් වේ ද, මෙය අසත්පුරුෂයන් විසින් ම පසස්නා ලදී. මහණෙනි, යම් අකෘතඥ බවෙක් අකෘතවේදී බවෙක් වේ ද, මේ සම්පූර්ණ අසත්පුරුෂ භූමිය වෙයි.

කතමා ච භික්ඛවෙ සප්පුරිසභූමි? සප්පුරිසො ච ඛො භික්ඛවෙ කතඤ්ඤූ හොති කතවෙදී. සබ්භිහෙතං භික්ඛවෙ උපඤ්ඤාතං යදිදං කතඤ්ඤුතා කතවෙදිතා. කෙවලා එසා භික්ඛවෙ සප්පුරිසභූමි යදිදං කතඤ්ඤුතා කතවෙදිතාති.

## 2. 1. 4. 2.

33. ද්වින්නාහං භික්ඛවෙ න සුප්පතිකාරං වදාමි,* මාතුච්ච පිතුච්ච[1]. එකෙන භික්ඛවෙ අංසෙන මාතරං පරිහරෙය්‍ය. එකෙන අංසෙන පිතරං පරිහරෙය්‍ය වස්සසතායුකො වස්සසතජීවී. සො ච නෙසං උච්ඡාදනපරිමද්දන න්හාපනසම්බාහනෙන, තෙපි තත්ථෙව මුත්තකරීසං චජෙය්‍යුං, නත්වෙව භික්ඛවෙ මාතාපිතූනං කතං වා හොති, පතිකතං[2] වා.

ඉමිස්සා ච භික්ඛවෙ මහාපථවියා පහූතසත්තරතනාය[3] මාතාපිතරො ඉස්සරාධිපච්චෙ රජ්ජෙ පතිට්ඨාපෙය්‍ය, නත්වෙව භික්ඛවෙ මාතාපිතූනං කතං වා හොති, පතිකතං[2] වා. තං කිස්ස හෙතු: බහුකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං ආපාදකා පොසකා, ඉමස්ස ලොකස්ස දස්සෙතාරො.

යො ච ඛො භික්ඛවෙ මාතාපිතරො අස්සද්ධෙ සද්ධාසම්පදාය සමාදපෙති, නිවෙසෙති, පතිට්ඨාපෙති, දුස්සීලෙ සීලසම්පදාය සමාදපෙති, නිවෙසෙති, පතිට්ඨාපෙති, මච්ඡරී චාගසම්පදාය සමාදපෙති, නිවෙසෙති, පතිට්ඨාපෙති, දුප්පඤ්ඤෙ පඤ්ඤාසම්පදාය සමාදපෙති, නිවෙසෙති, පතිට්ඨාපෙති, එත්තාවතා ඛො භික්ඛවෙ මාතාපිතූනං කතඤ්ච හොති පතිකතඤ්ච අතිකතඤ්චාති †

## 2. 1. 4. 3.

34. අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: කිංවාදී භවං ගොතමො කිමක්ඛායීති?

[භගවා:]

කිරියවාදී චාහං බ්‍රාහ්මණ අකිරියවාදී චාති

[බ්‍රාහ්මණො:]

යථාකථං පන භවං ගොතමො කිරියවාදී ච අකිරියවාදී චාති?

[භගවා:]

අකිරියං ඛො අහං බ්‍රාහ්මණ වදාමි කායදුච්චරිතස්ස වචීදුච්චරිතස්ස මනොදුච්චරිතස්ස, අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං අකිරියං වදාමි. කිරියඤ්ච ඛො අහං බ්‍රාහ්මණ වදාමි කායසුචරිතස්ස වචීසුචරිතස්ස මනොසුචරිතස්ස, අනෙකවිහිතානං කුසලානං ධම්මානං කිරියං වදාමි. එවං ඛො අහං බ්‍රාහ්මණ කිරියවාදී ච අකිරියවාදී චාති.

* කතමෙසං ද්වින්නං - මජසං PTS. ස්‍යා. 1 මාතු ච, පිතු ච - මජසං. ස්‍යා.
2. පටිකතං වා - මජසං. ස්‍යා. 3. පහූතරත්තරතනාය - මජසං.
†. අයං පාඨො ස්‍යාම මරම්ම පොත්ථකෙසු න දිස්සතෙ

මහණෙනි, සත්පුරුෂ භූමිය කවර? මහණෙනි, සත්පුරුෂ තෙමේ කෘතඥ වූයේ කෘතවේදී වූයේ වේ. මහණෙනි, තෙල කෘතඥ බවෙක් කෘතවේදී බවෙක් වේ ද, මෙය සත්පුරුෂයන් විසින් ම පසස්නා ලදී. මහණෙනි, තෙල කෘතඥ බවෙක් කෘතවේදී බවෙක් වේ ද, මේ සමපූර්ණ සත්පුරුෂ භූමිය මැයි

**2. 1. 4. 2.**

33. මහණෙනි, මම මවට ද පියාට දැයි දෙදෙනාට ප්‍රත්‍යුපකාරය සුකරය යි නො කියමි. මහණෙනි, ශතවර්ෂායුෂ්ක වූ යමෙක් සියවස් ජීවත් වන්නේ එක් අංසයෙකින් මව පිළිදගින්නේ එක් අංසයෙකින් පියා පිළිදගින්නේ වේ ද, හේ ම ඔවුන්ගේ සිරුරු සුවඳ සුණු ඉලීමෙන් හා අත්පා පිරිමැදීමෙන් හා සිහිල්පැන් හුණුපැන් නැවීමෙන් හා අඞ්ගසම්බාහනයෙන් හා උපස්ථාන කෙරේ ද, ඔහුත් ඒ අංසයෙහි ම හිඳ මල මූත්‍ර පහකරන්නාහු නම්, මහණෙනි, හේ එසේ ද වුව, මවුපියන්ට උපකාරයෙක් හෝ ප්‍රත්‍යුපකාරයෙක් හෝ නොවේ මැයි.

මහණෙනි, බොහෝ සත්රුවන් ඇති මේ මහා පෘථිවියෙහි මවු පියන් සක්විති රජයෙහි පිහිටුවන්නේ නමුදු, මහණෙනි, මවුපියන්ට උපකාර කරණ ලද්දේ හෝ ප්‍රත්‍යුපකාර කරණ ලද්දේ හෝ නො ම වෙයි. එයට හේතු කවරේය? මහණෙනි, මවුපියෝ දූ පුතුනට බොහෝ උපකාර ඇතියහ. පුතුන් වඩන්නාහු පෝෂණය කරන්නාහු මේ ලෝකය දක්වනසුලු වෙති.

මහණෙනි, යමෙක් ශ්‍රද්ධා නැති මවුපියන් ශ්‍රද්ධාසම්පත්තියෙහි සමාදන් කරවා ද, වසවා ද, පිහිටුවා ද මසුරුවූවන් ත්‍යාගසම්පත්තියෙහි සමාදන් කරවා ද, වසවා ද, පිහිටුවා ද. දුෂ්ප්‍රාඥවූවන් ප්‍රඥසම්පත්තියෙහි සමාදන් කරවා ද, වසවා ද, පිහිටුවා ද. මහණෙනි, මෙතෙකින් මවුපියනට උපකාර කරණ ලද්දේත් ප්‍රත්‍යුපකාර කරණ ලද්දේත් අධික උපකාර කරණ ලද්දේත් වේ යයි.

**2. 1. 4. 3.**

34. එකල්හි එක්තරා බ්‍රාහමණයෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වී ය ... එකත් පසෙක හුන් ඒ බ්‍රාහමණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්සේ කෙබඳු වාද ඇතිසේක් ද? කුමක් වදාරණ දූ ද?

[භගවත්හු:]

බ්‍රාහමණය, මම ක්‍රියාවාදීත් වෙමි, අක්‍රියාවාදීත් වෙමි.

[බමුණු:]

කිසෙසින් භවත් ගෞතමයන් වහන්සේ ක්‍රියාවාදීත් අක්‍රියාවාදීත් වන සේක් ද?

[භගවත්හු:]

බ්‍රාහමණය, මම කායදුශ්චරිතයාගේත් වාග්දුශ්චරිතයාගේත් මනෝදුශ්චරිතයාගේත් අක්‍රියාව (නො කිරීම) කියමි. නන්වැදෑරුම් ලාමක අකුශලධර්මයන්ගේ නොකිරීම කියමි. බ්‍රාහමණය, මම කායසුචරිතයාගේත් වාක්සුචරිතයාගේත් මනස්සුචරිතයාගේත් කිරීම කියමි. නන්වැදෑරුම් කුශලධර්මයන්ගේ කිරීම කියමි. බ්‍රාහමණය, මම මෙසේ වනාහි ක්‍රියාවාදීත් අක්‍රියාවාදීත් වෙමි.

[බ්‍රාහ්මණො:]

අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 2. 1. 4. 4

35. අථ ඛො **අනාථපිණ්ඩිකො** ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අනාථපිණ්ඩිකො ගහපති භගවන්තං එතදවොච: කති නු ඛො භන්තෙ ලොකෙ දක්ඛිණෙය්‍යා? කත්ථ ච දානං දාතබ්බන්ති?

ද්වෙ ඛො ගහපති ලොකෙ දක්ඛිණෙය්‍යා සෙඛො ච අසෙඛො ච. ඉමෙ ඛො ගහපති ද්වෙ ලොකෙ දක්ඛිණෙය්‍යා. එත්ථ ච දානං දාතබ්බන්ති, ඉදමවොච භගවා. ඉදං වත්වා[1] සුගතො අථාපරං එතදවොච සත්ථා:

සෙඛො අසෙඛො ච ඉමස්මිං ලොකෙ
ආහුනෙය්‍යා යජමානානං හොන්ති,
තෙ උජ්ජුභූතා කායෙන වාචාය උද චෙතසා
ඛෙත්තං තං යජමානානං එත්ථ දින්නං මහප්ඵලන්ති.

## 2. 1. 4. 5

36. එවං මෙ සුතං; එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **සාරිපුත්තො** සාවත්ථියං විහරති **පුබ්බාරාමෙ** මිගාරමාතුපාසාදෙ. තත්‍ර ඛො ආයස්මා **සාරිපුත්තො** භික්ඛූ ආමන්තෙසි, ආවුසො භික්ඛවොති.[2] ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච.

අජ්ඣත්තසඤ්ඤොජනඤ්ච ආවුසො පුග්ගලං දෙසිස්සාමි බහිද්ධාසඤ්ඤොජනඤ්ච. තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

කතමො චාවුසො අජ්ඣත්තසඤ්ඤොජනො පුග්ගලො? ඉධාවුසො භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. සො කායස්ස භෙදා පරම්මරණා අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. සො තතො චුතො ආගාමී හොති ආගන්තා ඉත්ථත්තං. අයං වුච්චතාවුසො අජ්ඣත්තසඤ්ඤොජනො පුග්ගලො ආගාමී ආගන්තා ඉත්ථත්තං.

1. ඉදං වත්වාන - මජසං 2. භික්ඛවෙති - මජසං

[බමුණු:]

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවියෙන් ශරණ ගත් උපාසකයකු කොට මා රුස්නා සේක් වා යි.

## 2. 1. 4. 4.

35. ඉක්බිති **අනාථපිණ්ඩික** ගෘහපති තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන් අනාථපිණ්ඩික ගෘහපති තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: වහන්ස, ලොකයෙහි **දක්ෂිණාර්හයෝ** කෙතෙක් ද? කො තැන්හි දන් දිය යුතු ද?

ගෘහපතිය, ලොකයෙහි දක්ෂිණාවට සුදුස්සෝ දෙදෙනෙක් වෙති. **ශෛක්‍ෂ** තෙමේ ය, **අශෛක්‍ෂ** තෙමේ ය යන දෙදෙනා යි. ගෘහපතිය, ලොකයෙහි මේ දක්ෂිණාවට සුදුස්සෝ දෙදෙන වෙත්. මොවුන් කෙරෙහි දන් දිය යුතු වේ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. මෙය වදාරා ඉක්බිති සුගත වූ ශාස්තෘන්වහන්සේ තෙල ගය ද වදාළසේක.

මේ ලොකයෙහි ශෛක්‍ෂ තෙමේ ද අශෛක්‍ෂ තෙමේ ද යාග කරනුවනට ආහුණෙය්‍ය (ඇරැදෙන්නටඅර්හ) වෙති. ඔහු කයින් ද වචනයෙන් ද යලි සිතින් ද ඍජු වෙති. යාග කරන්නන්හට එය කෙත වෙයි මෙහි දෙන ලද්දේ මහත්ඵල වෙයි.

## 2. 1. 4. 5.

36. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජෙතවන** නම්වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එසමයෙහි ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවෝ සැවැත්නුවර සමීපයෙහි **පූර්වාරාම** නම් මුවරමාපායෙහි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ ඇවැත් මහණෙනි යි භික්‍ෂූන් ඇමතූහ. ඒ භික්‍ෂූහු ඇවැත්නි, යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ තෙල සූත්‍රය දෙසූහ:

ඇවැත්නි, අධ්‍යාත්මසංයෝජන ඇති පුද්ගලයා හා බාහිර සංයෝජන ඇති පුද්ගලයා හා දෙසමි. එය අසව මොනොවට මෙනෙහි කරව. දෙසමි යි. ඇවැත්නි, එසේ යි ඒ භික්‍ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තෙල වදාළහ:

ඇවැත්නි, අධ්‍යාත්මසංයොජන ඇති පුද්ගල තෙමේ කවරේ ය? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙමේ සිල්වත් වෙයි. ප්‍රාතිමොක්‍ෂසංවරශීලයෙන් සමන්‍වාගතවූයේ ආචාරගෝචර සම්පන්න වූයේ වෙසෙයි. අල්පමාත්‍ර වූ ද වරදෙහි බිය දක්නා සුලු වූයේ ශික්‍ෂාපදයන් මොනොවට ගෙන හික්මෙයි. හෙ තෙමේ කාබුන් මරණින් මතු එක්තරා දේවනිකායකට එළඹෙයි හේ එයින් ච්‍යුතවූයේ ආගාමී වූයේ මේ මිනිස් බවට එන්නේ වෙයි. ඇවැත්නි, මෙ තෙමේ ආගාමී වූ මිනිස්බවට එන අධ්‍යාත්මසංයොජන ඇති පුද්ගලයා යි කියනු ලැබේ.

කතමො චාවුසො බහිද්ධාසඤ්ඤොජනො පුග්ගලො? ඉධාවුසො භික්ඛු සීලවා හොති. පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. සො අඤ්ඤතරං සන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරති. සො කායස්ස භෙදා පරම්මරණා අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. සො තතො චුතො අනාගාමී හොති අනාගන්තා ඉත්ථත්තං. අයං වුච්චතාවුසො බහිද්ධාසඤ්ඤොජනො පුග්ගලො අනාගාමී[1] අනාගන්තා ඉත්ථත්තං.

පුනවපරං ආවුසො භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. සො කාමානං යෙව නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. සො භවානං යෙව නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. සො තණ්හක්ඛයාය[2] පටිපන්නො හොති. සො ලොභක්ඛයාය පටිපන්නො හොති. සො කායස්ස භෙදා පරම්මරණා අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. සො තතො චුතො අනාගාමී හොති අනාගන්තා ඉත්ථත්තං. අයං වුච්චතාවුසො බහිද්ධාසඤ්ඤොජනො පුග්ගලො අනාගාමී අනාගන්තා ඉත්ථත්තන්ති.

අථ ඛො සම්බහුලා සමචිත්තා දෙවතා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තා දෙවතා භගවන්තං එතදවොචුං:

එසො භන්තෙ ආයස්මා සාරිපුත්තො පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ භික්ඛූනං අජ්ඣත්තසඤ්ඤොජනඤ්ච පුග්ගලං දෙසෙති, බහිද්ධාසඤ්ඤොජනඤ්ච. හට්ඨා භන්තෙ පරිසා සාධු භන්තෙ භගවා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමතු, අනුකම්පං උපාදායාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො භගවා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං[3] වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙව ජෙතවනෙ අන්තරහිතො පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ ආයස්මතො සාරිපුත්තස්ස පමුඛෙ පාතුරහොසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. ආයස්මාපි ඛො සාරිපුත්තො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සාරිපුත්තං භගවා එතදවොච:

---

1. අනාගාමී හොති - මජ්සං. 2. තණ්හක්ඛයාය මජ්සං 3. සම්මිඤ්ජිතං - මජ්සං

ඇවැත්නි, බාහිරසංයෝජන ඇති පුද්ගල තෙමේ කවරේ ද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙමේ සිල්වත් වෙයි ප්‍රාතිමෝක්‍ෂසංවරයෙන් සමන්‍වාගත වූයේ ආචාර ගෝචර සම්පන්න වූයේ වෙසෙයි. අල්පමාත්‍ර වූ ද වරදෙහි බිය දක්නා සුලු වූයේ ශික්‍ෂාපදයන් සමාදන්ව හික්මෙයි. හෙ තෙමේ එක්තරා ශාන්ත චිත්ත විමුක්තියකට පැමිණ වාසය කරයි. හෙ තෙමේ කාබුන් මරණින් මතු එක්තරා දේවනිකායකට එළඹෙයි. හේ එයින් ච්‍යුත වූයේ මේ මිනිසත් බවට නො එන්නේ අනාගාමී වෙයි. ඇවැත්නි, මේ තෙමේ මේ මිනිසත්බවට නො එන්නේ බාහිරසංයොජන ඇති අනාගාමී පුද්ගල යා යි කියනු ලැබේ.

ඇවැත්නි, යළිදු අනෙකක් කියමි: මහණ තෙමේ සිල්වත් වෙයි ... ශික්‍ෂාපදයන් සමාදන්ව හික්මෙයි හෙ තෙම කාමයන්ගේ ම නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. හෙ තෙමේ ත්‍රිවිධ භවයන්ගේ ම නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස පිළිපන්නේ වෙයි. හෙතෙම (පඤ්චකාමගුණික වූ) තෘෂ්ණාව ක්‍ෂය කිරීම පිණිස පිළිපන්නේ වෙයි. හෙ තෙමේ භවලොභය ක්‍ෂය කිරීම පිණිස පිළිපන්නේ වෙයි. හෙ තෙමේ කාබුන් මරණින් මත්තෙහි එක්තරා දෙවනිකායෙක උපදී. හේ එයින් ච්‍යුත වූයේ මේ මිනිසත් බවට නො එන්නේ අනාගාමී වෙයි. ඇවැත්නි, මේ මිනිසත්බවට නො පැමිණෙන, අනාගාමී වූ බාහිර සංයොජන ඇති පුද්ගලයා යි කියනු ලැබේ.

ඉක්බිති, බොහෝ වූ සමසිත් ඇති දෙවිවරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාහු ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව සිටියාහු ය. එකත්පසෙක සිටි ඒ දෙවිවරු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළාහු ය:

වහන්ස, මේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පූර්‍වාරාම නම් වූ මුවරමාපහයෙහිදී භික්‍ෂූන්ට අධ්‍යාත්මසංයොජන ඇති පුද්ගලයා ද බාහිර සංයොජන ඇති පුද්ගලයා ද දෙශනා කෙරෙති. වහන්ස, පිරිස සතුටු වූ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා කොට ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වෙත එළඹෙන සේක් නම් මැනැවි. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ බලවත් පුරුෂයෙක් මක් කළ අතක් දික් නො කරණ තුරු දිගු කළ අතක් මක් නො කරන තුරු ජේතවනයෙහි අතුරු දහන් වූ සේක් පූර්‍වාරාම නම් මුවරමාපහයෙහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ පෙරට පැණී ගිය සේක. භාග්‍යවතුන් වහන්සේ පැන වූ අස්නෙහි වැඩ හුන් සේක. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

ඉධ සාරිපුත්ත සම්බහුලා සමචිත්තා දෙවතා යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො සාරිපුත්ත තා දෙවතා මං එතදවොචුං:

එසො භන්තෙ ආයස්මා සාරිපුත්තො පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ, භික්ඛූනං අජ්ඣත්තසඤ්ඤොජනඤ්ච පුග්ගලං දෙසෙති බහිද්ධාසඤ්ඤොජනඤ්ච. "හට්ඨා භන්තෙ පරිසා සාධු භන්තෙ භගවා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදාය"ති. තා ඛො පන සාරිපුත්ත දෙවතා දසපි හුත්වා වීසම්පි[1] හුත්වා තිංසම්පි හුත්වා චත්තාරීසම්පි හුත්වා පඤ්ඤාසම්පි හුත්වා සට්ඨිම්පි හුත්වා ආරග්ගකොටිනිතුදනමත්තෙපි[2] තිට්ඨන්ති න ච අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්තීති.

සියා ඛො[3] පන තෙ සාරිපුත්ත එවමස්ස. තත්ථ නූන තාසං දෙවතානං තථා චිත්තං භාවිතං යෙන තා දෙවතා දසපි හුත්වා වීසම්පි[1] හුත්වා තිංසම්පි හුත්වා චත්තාරීසම්පි හුත්වා පඤ්ඤාසම්පි හුත්වා සට්ඨිම්පි හුත්වා ආරග්ගකොටිනිතුදනමත්තෙපි[2] තිට්ඨන්ති න ච අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති.

න ඛො පනෙතං සාරිපුත්ත එවං දට්ඨබ්බං, ඉධෙව සාරිපුත්ත තාසං දෙවතානං තථා චිත්තං භාවිතං යෙන තා දෙවතා දසපි හුත්වා වීසම්පි[1] හුත්වා තිංසම්පි හුත්වා චත්තාරීසම්පි හුත්වා පඤ්ඤාසම්පි හුත්වා සට්ඨිම්පි හුත්වා ආරග්ගකොටිනිතුදන[2] මත්තෙපි තිට්ඨන්ති න ච අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්තීති.

තස්මාතිහ සාරිපුත්ත එවං සික්ඛිතබ්බං: සන්තින්ද්‍රියා භවිස්සාම සන්තමානසාති. එවං හි වො සාරිපුත්ත සික්ඛිතබ්බං. සන්තින්ද්‍රියානං හි වො සාරිපුත්ත සන්තමානසානං සන්තං යෙව කායකම්මං භවිස්සති සන්තං වචීකම්මං සන්තං මනොකම්මං, සන්තංයෙව උපහාරං උපහරිස්සාම සබ්‍රහ්මචාරීසූති. එවං හි වො සාරිපුත්ත සික්ඛිතබ්බං.

අනස්සුං ඛො සාරිපුත්ත අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා යෙ ඉමං ධම්මපරියායං න අස්සොසුන්ති.

## 2. 1. 4. 6.

37. * එකං සමයං ආයස්මා මහාකච්චානො වරණායං විහරති කද්දමදහතීරෙ. අථ ඛො ආරාමදණ්ඩො බ්‍රාහ්මණො යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා මහාකච්චානෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණියං[4] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආරාමදණ්ඩො බ්‍රාහ්මණො ආයස්මන්තං මහාකච්චානං එතදවොච:

කො නු ඛො භො කච්චාන, හෙතු, කො පච්චයො යෙන ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති, බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති, ගහපතිකාපි ගහපතිකෙහි විවදන්තීති?

1. වීසතිම්පි-කත්ථචි. 2. ආරග්ගකොටිනිතුදනමත්තෙපි - මජ්සං.
3. සියා ඛො පන සාරිපුත්ත - මජ්සං. * එවං මෙ සුතං - මජ්සං.
4. සාරණීයං - මජ්සං.

ශාරිපුත්‍රය, මෙහි බොහෝ වූ සමසිත් ඇති දෙව්වරු මා වෙත එළඹියාහු ය. එළඹ මා වැඳ එකත්පසෙක සිටියාහු ය. ශාරිපුත්‍රය, එකත් පසෙක සිටියා වූ ඒ දෙවියෝ මට තෙල සැළ කළාහු ය. වහන්ස, මේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ පූර්වාරාම නම්වූ මිගාරමාතෘප්‍රාසාදයෙහි දී භික්ෂූන්ට අධ්‍යාත්මසංයෝජන ඇති පුද්ගලයා ද බාහිරසංයෝජන ඇති පුද්ගලයා ද දෙශනා කෙරෙති, වහන්ස, පිරිස තුටු වූය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වෙත අනුකම්පා කොට එළඹෙන සේක් නම් මැනවැයි. ශාරිපුත්‍රය, ඒ දෙවියෝ දසදෙනක් ව ද, විසිදෙනක් ව ද, තිස්දෙනක් ව ද, සතළිස්දෙනක් ව ද, පණස්දෙනක් ව ද, සැටදෙනක් ව ද, හිදි අග් වැද සිටුනා පමණ තන්හිදු සිටිත්. ඔවුනොවුන් නො ද පෙළති සි.

ශාරිපුත්‍රය, තොපට මෙබඳු සිතෙක් විය හෙයි. එනම්: යම් හෙයෙකින් ඒ දෙව්වරු දසදෙනක් ව ද, විසිදෙනක් ව ද, තිස්දෙනක් ව ද, සතළිස් දෙනක් ව ද. පණස්දෙනක් ව ද, සැටදෙනක් ව ද, හිදි අග් වැද සිටුනා පමණ තන්හිදු සිටිත් ද, උනුන් නො ද පෙළත් ද, ඒ දෙවියන් විසින් එකාන්තයෙන් ඒ රූපභවයෙහි දී එසේ සිත වඩනා ලද්දේ ය (කියා යි.)

ශාරිපුත්‍රය, මෙය මෙසේ නොදත යුතුය. ශාරිපුත්‍රය, යම් හෙයෙකින් ඒ දෙවියෝ දසදෙනක් ව ද විසිදෙනක් ව ද, තිස්දෙනක් ව ද, සතළිස්දෙනක් ව ද, පණස්දෙනක් ව ද, සැටදෙනක් ව ද, හිදි අග් වැද සිටුනා පමණ තන්හි සිටිත් ද, ඔවුනොවුන් නො පෙළත් ද, මෙසස්නෙහි දී ම ඒ දෙවියන් විසින් එසේ සිත වඩන ලද.

ශාරිපුත්‍රය, එහෙයින් මෙසේ හික්මිය යුතු ය: සන්හුන් ඉඳුරන් ඇත්තමෝ සන්හුන් සිත් ඇත්තමෝ වන්නම්හ (කියායි.) ශාරිපුත්‍රය, තොප විසින් මෙසේ ම හික්මිය යුතු ය. ශාරිපුත්‍ර ය, සන්හුන් ඉඳුරන් ඇත්තා වූ ම සන්හුන් සිත් ඇත්තා වූ ම තොපගේ කායකර්මය ශාන්ත වන්නේ ය. වාක්කර්මය ශාන්ත වන්නේ ය.. මනඃකර්මය ශාන්ත වන්නේ ය. සබ්‍රම්සරුන් කෙරෙහි ශාන්ත වූ ම උපහාරයක් කරන්නම්හ යි (කියායි). ශාරිපුත්‍රය, මෙසේ ම හික්මිය යුතු ය.

ශාරිපුත්‍රය, යම් කෙනෙක් මේ ධර්මපර්යාය නො ඇසුහු ද, ඒ අන්‍යතීර්ථක යෝ නටුවාහු ම වෙති යි.

## 2. 1. 4. 6

37. එක් සමයෙක්හි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ වරණායෙහි කද්දමදහතීරයෙහි වසන සේක. එකල්හි ආරාමදණ්ඩ බ්‍රාහමණ තෙමේ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වී ය. සමෙමාදනකථාවට තිසි සිහිකරනුවට තිසි කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන් ආරාමදණ්ඩ බ්‍රාහමණ ආයුෂ්මත් මහා-කාත්‍යායන ස්ථවිරයන් වහන්සේට මෙය කී ය.

භවත් කාත්‍යායනයෙනි, යම් හෙයෙකින් ක්‍ෂත්‍රියයෝ ද ක්‍ෂත්‍රියයන් හා සමග විවාද කෙරෙත් නම්, බ්‍රාහමණයෝ ද බ්‍රාහමණයන් හා සමග විවාද කෙරෙත් නම්, ගැහැවියෝ ද ගැහැවියන් හා සමග විවාද කෙරෙත් නම්, එයට හේතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය?

[මහාකච්චානො:]

කාමරාගවිනිවෙසවිනිබන්ධ[1]පලිගෙධපරියුට්ඨානජ්ඣොසානහෙතු ඛො බ්‍රාහ්මණ, ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති, බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති, ගහපතිකාපි ගහපතිකෙහි විවදන්තීති.

[ආරාමදණ්ඩො:]

කො පන භො කච්චාන, හෙතු කො පච්චයො යෙන සමණාපි සමණෙහි විවදන්තීති?

[මහාකච්චානො:]

දිට්ඨිරාගවිනිවෙසවිනිබන්ධ[2]පලිගෙධපරියුට්ඨානජ්ඣොසානහෙතු ඛො බ්‍රාහ්මණ, සමණාපි සමණෙහි විවදන්තීති.

[ආරාමදණ්ඩො:]

අත්ථි පන භො කච්චාන, කොචි ලොකස්මිං යො ඉමං චෙව කාමරාගවිනිවෙසවිනිබන්ධපලිගෙධපරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තො, ඉමං ච දිට්ඨිරාගවිනිවෙස[2]විනිබන්ධපලිගෙධපරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තොති?

[මහාකච්චානො:]

අත්ථි බ්‍රාහ්මණ ලොකස්මිං යො ඉමඤ්චෙව කාමරාගවිනිවෙසවිනිබන්ධපලිගෙධපරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තො, ඉමඤ්චදිට්ඨිරාගවිනිවෙස[2]-විනිබන්ධපලිගෙධ පරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තොති.

[ආරාමදණ්ඩො:]

කො පන සො භො කච්චාන, ලොකස්මිං යො ඉමඤ්චෙව කාමරාගවිනිවෙසවිනිබන්ධපලිගෙධපරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තො, ඉමඤ්ච දිට්ඨිරාගවිනිවෙසවිනිබන්ධපලිගෙධපරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තොති?

[මහාකච්චානො:]

අත්ථි බ්‍රාහ්මණ, පුරත්ථිමෙසු ජනපදෙසු **සාවත්ථි** නාම නගරං. තත්ථ සො භගවා එතරහි විහරති අරහං සම්මාසම්බුද්ධො. සො හි බ්‍රාහ්මණ, භගවා ඉමඤ්චෙව කාමරාගවිනිවෙසවිනිබන්ධපලිගෙධපරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තො, ඉමඤ්ච දිට්ඨිරාගවිනිවෙසවිනිබන්ධපලිගෙධපරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තොති.

එවං වුත්තෙ ආරාමදණ්ඩො බ්‍රාහ්මණො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණං ජාණුමණ්ඩලං පුථුවියං[3] නිහන්ත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං උදානං උදානෙසි: නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස - නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස -පෙ- යො හි සො භගවා ඉමඤ්චෙව කාමරාග[2] විනිවෙස විනිබන්ධපලිගෙධ පරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තො, ඉමඤ්ච දිට්ඨිරාග[2]විනිවෙසවිනිබන්ධ පලිගෙධ පරියුට්ඨානජ්ඣොසානං සමතික්කන්තොති.

1. කාමරාගාභිනිවෙස විනිබද්ධ - මජ්ඣං. 2. දිට්ඨිරාගාභිනිවෙස විනිබද්ධ - මජ්ඣං.
3. පඨවියං - කත්ථචි.

[කසසිත්තෙරහු:]

බ්‍රාහමණය, කාමරාගයෙහි වැද ගැණුම ය, වෙසෙසින් බැඳීම ය, එරුණු ය, මැඩැගැණුම ය, ගිල ගැණුමය යන මේ හේතු කොට ගෙණ ම ක්‍ෂත්‍රියයෝ ද ක්‍ෂත්‍රියයන් හා සමග විවාද කෙරෙති බ්‍රාහමණයෝ ද බ්‍රාහමණයන් හා සමග විවාද කෙරෙති. ගැහැවියෝ ද ගැහැවියන් හා සමග විවාද කෙරෙති.

[රූප්දබුබමුණු:]

භවත් කාත්‍යායනයෙනි, යම් හෙයෙකින් ශ්‍රමණයෝ ද ශ්‍රමණයන් හා සමග විවාද කෙරෙත් නම්, එයට හෙතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය?

[කසසිත්තෙරහු:]

බ්‍රාහමණය, දෘෂ්ටිරාගයෙහි වැද ගැණුම ය, වෙසෙසින් බැඳීම ය, එරුණු ය, මැඩැගැණුම ය, ගිල ගැණුම ය යන මේ හෙතු කොට ගෙණ ශ්‍රමණයෝ ද ශ්‍රමණයන් හා සමග විවාද කෙරෙත්.

[රූප්දබුබමුණු:]

භවත් කාත්‍යායනයෙනි, යමෙක් මේ කාමරාග විනිවෙස විනිබන්ධ පලිගෙධ පරියුට්ඨාන අජෙඣාසානය ඉක්ම වී ද, මේ දිට්ඨිරාගවිනිවෙස විනිබන්ධ පලිගෙධ පරියුට්ඨාන අජෙඣාසානය ඉක්ම වී ද එබඳු කිසිවෙක් ලොකයෙහි ඇත් ද?

[කසසිත්තෙරහු:]

බ්‍රාහමණය, ලොකයෙහි යමෙක් මේ කාමරාග විනිවෙස විනිබන්ධ පලිගෙධ පරියුට්ඨාන අජෙඣාසානය ඉක්ම වූයේ ද, මේ දිට්ඨිරාග විනිවෙස විනිබන්ධ පලිගෙධ පරියුට්ඨාන අජෙඣාසානයන් ඉක්ම වී ද එබඳු කෙනෙක් ඇත.

[රූප්දබුබමුණු·]

භවත් කාත්‍යායනයෙනි, යම් කෙනෙක් ලෝකයෙහි මේ කාමරාග විනිවෙස විනිබන්ධ පලිගෙධ පරියුට්ඨාන අජෙඣාසානය ඉක්ම වූ හු නම්, යම් කෙනෙක් මේ දිට්ඨිරාග විනිවෙස විනිබන්ධ පලිගෙධ පරියුට්ඨාන අජෙඣාසානයන් ඉක්ම වූහු නම්, ඔහු කවරහ ?

[කසසිත්තෙරහු:]

බ්‍රාහමණය, පෙරදිග දනව්වෙහි සැවැත් නම් නුවරෙක් ඇත. එහි ඒ අභිත් සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ දැන් වැඩවසන සේක. බ්‍රාහමණය, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි මේ කාමරාග විනිවෙශ විනි-බන්ධ පරිගෙධ පයර්‍යුත්ථාන අධ්‍යවසාය ඉක්ම වූ සේක. මේ දෘෂ්ටිරාග විනිවෙශ විනිබන්ධ පරිගෙධ පයර්‍යුත්ථාන අධ්‍යවසාය ද ඉක්ම වූ සේකැ යි.

මෙසේ කී කල්හි ආරාමදණ්ඩ බ්‍රාහමණ හුනස්නෙන් නැගී සිට උතුරුසළුව එකස් කොට ලා දකුණු දණමඩල පොළොවෙහි හැන භාග්‍යවතුන් වහන්සේ වසන දසට ඇඳිලි බැඳ යම් ඒ භාග්‍යවතුන් වහන්සේ කෙනෙක් මේ කාමරාග විනිවෙශ විනිබන්ධ පරිගෙධ පයර්‍යුත්ථාන අධ්‍යවසාය ඉක්ම වූහු ද, මේ දෘෂ්ටිරාග විනිවෙශ විනිබන්ධ පරිගෙධ පයර්‍යුත්ථාන අධ්‍යවසායයන් ඉක්ම වූහු ද ඒ භාග්‍යවත් අභිත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමසකාර වේ වා යි තෙවරක් උදන් ඇනී.

අභික්කන්තං භො කච්චාන -පෙ- සෙය්‍යථාපි භො කච්චාන නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති,[1] එවමෙවං භොතා කච්චානෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භො කච්චාන තං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං කච්චානො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 2. 1. 4. 7.

38. එකං සමයං ආයස්මා **මහාකච්චානො මධුරායං** විහරති ගුන්දාවනෙ. අථඛො **කණ්ඩරායණො**[2] බ්‍රාහ්මණො යෙනායස්මා මහාකච්චානො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා මහාකච්චානෙන සද්ධිං -පෙ- එකමන්තං නිසින්නො ඛො කණ්ඩරායණො[2] බ්‍රාහ්මණො ආයස්මන්තං මහාකච්චානං එතදවොච:

සුතං මෙතං භො කච්චාන, න සමණො කච්චානො බ්‍රාහ්මණෙ ජිණ්ණෙ වුද්ධෙ මහල්ලකෙ අද්ධගතෙ වයො අනුප්පත්තෙ අභිවාදෙති වා පච්චුට්ඨෙති වා ආසනෙන වා නිමන්තෙතීති, තයිදං භො කච්චාන, තථෙව, නහි භවං කච්චානො බ්‍රාහ්මණෙ ජිණ්ණෙ වුද්ධෙ මහල්ලකෙ අද්ධගතෙ වයො අනුප්පත්තෙ අභිවාදෙති වා පච්චුට්ඨෙති වා ආසනෙන වා නිමන්තෙති. තයිදං භො කච්චාන න සම්පන්නමෙවාති.

අත්ථි බ්‍රාහ්මණ, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන වුද්ධභූමි ච අක්ඛාතා, දහරභූමි ච. වුද්ධො චෙපි බ්‍රාහ්මණ හොති ආසීතිකො වා නාවුතිකො වා වස්සසතිකො වා ජාතියා, සො ච කාමෙ පරිභුඤ්ජති, කාමමජ්ඣාවසති, කාමපරිළාහෙන පරිඩය්හති, කාමවිතක්කෙහි ඛජ්ජති, කාමපරියෙසනාය උස්සුක්කො. අථ ඛො සො බාලො* න්වෙව සඞ්ඛං ගච්ඡති. දහරො චෙපි බ්‍රාහ්මණ, හොති යුවා සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා. සො ච න කාමෙ පරිභුඤ්ජති, න කාමමජ්ඣාවසති, න කාමපරිළාහෙන පරිඩය්හති, න කාමවිතක්කෙහි ඛජ්ජති, න කාමපරියෙසනාය උස්සුක්කො. අථ ඛො සො පණ්ඩිතො ථෙරොත්වෙව සඞ්ඛං ගච්ඡතීති. එවං වුත්තෙ කණ්ඩරායණො බ්‍රාහ්මණො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දහරානං සුදං භික්ඛූනං පාදෙ සිරසා වන්දති: වුද්ධා භවන්තො වුද්ධභූමියං ඨිතා, දහරා මයං දහරභූමියං ඨිතාති.

අභික්කන්තං භො කච්චාන -පෙ- උපාසකං මං භවං කච්චානො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

---

1. දක්ඛන්තීති - මජසං. 2. කන්දරායනො - මජසං. * න ථෙරොත්වෙව - මජසං.

භවත් කාත්‍යායනයෙනි, ඉතා මැනැවි ... භවත් කාත්‍යායනයෙනි, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ පිළිසන් වූවක් විවර කරන්නේ හෝ මංමුළා වූවකුහට මග කියන්නේ හෝ 'ඇස් ඇත්තාහු රූප දක්නාහුය' යි අඳුරෙහි තෙල්වැටුප් හෝ දරන්නේ වේ ද, එසේ ම භවත් කාත්‍යායනයන් විසින් නොයෙක් නියරින් ධර්මය දෙශනා කරණ ලද. භවත් කාත්‍යායනයෙනි, තෙල මම ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද ශරණ කොට යෙමි. භවත් කාත්‍යායනයෝ අද පටන් කොට දිවියෙන් ගත් සරණ ගිය උපාසකයකු කොට මා රැක්නා සේක්වා යි.

## 2. 1. 4 7.

38. එකල්හි ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ මධුරායෙහි වූ ගුන්දවනයෙහි වැඩ වසන සේක. එකල්හි කණ්ඩරායණ බමුණු ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ හා සමග ... එකත් පසෙක හුන් කණ්ඩරායණ බමුණු ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේට තෙල සැළ කෙළේය:

භවත් කාත්‍යායනයෙනි, ශ්‍රමණ කාත්‍යායන තෙමේ ජරාජීර්ණ වූ වියඅතට ගිය දුම්හලු වූ කල් ගිය පශ්චිම වයසට පැමිණි බ්‍රාහමණයන් නොවඳනේය යි ද, දැක හුනස්නෙන් නොනැඟසිටුනේ යයි ද, අස්නෙන් නො අමතනේ යයි ද, යන මේය මා විසින් අසන ලදී. භවත් කාත්‍යායනයෙනි, ඒ කාරණය එසේ ම ය. "භවත් කාත්‍යායන තෙමේ ජරාජීර්ණ වූ වයොවෘද්ධ වූ මහලු වූ කල් ඉක්ම වූ පශ්චිම වයසට පැමිණි බමුණන් නො වඳනේය. දැක හුනස්නෙන් ද නැග නොසිටුනේය. අස්නෙනුදු නො අමතනේ ය. භවත් කාත්‍යායනයෙනි, එ කරුණ නොනිසිමැය"යි.

බ්‍රාහමණය, භාග්‍යවත් වූ (සියලු දතයුතු දේ) දන්නා වූ (සියලු දැකිය යුතු දේ හස්තාමලකයක් සේ) දක්නා වූ අර්හත් වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදාරණ ලද වෘද්ධභූමියෙක් හා දහරභූමියෙක් හා ඇත. බ්‍රාහමණය, ඉදින් උත්පත්තියෙන් අසූවයස් ඇති හෝ අනූවයස් ඇති හෝ සියක්වස් ඇති හෝ වෘද්ධයෙක් වේ නම් හෙ ද වස්තුකාම ක්ලෙශකාමයන් වළඳ කෙරේ ද, වස්තුකාම ක්ලෙශකාමයෙහි ලා ඉවස්නේ ද, කාමපරිලාහයෙන් දැවේ ද, කාමවිතර්කයන් විසින් කනු ලැබේ ද, කම්සුව පිරියෙස්ලියට උත්සාහවත් වූයේ ද, එකල්හි හෙ බාලයෙක යන සඞ්ඛ්‍යාවට ම යෙයි. බ්‍රාහමණය, ඉදින් තරුණ වූයේ මනා බොල් කළු කෙස් ඇත්තේ බහදුරු යොවුනින් සමන්නාවූයේ ප්‍රථම වයසින් යුක්ත දහරයෙක් හෝ වේ ද, හෙ ද වස්තුකාම ක්ලෙශකාමයන් පරිභෝග නො කරනේ ද, වස්තුකාම ක්ලෙශකාම යෙහි ලා නො ඉවස්නේ ද, කාමපරිදාහයෙන් නො දැවේ ද, කාමවිතර්කයන් විසින් නො කනු ලැබේ ද, කම්සුව පිරියෙස්නට උත්සාහඇත් නො වේ ද, 'එකල්හි හෙ තෙමේ පණ්ඩිත වූ ස්ථවිර නම්' යන සඞ්ඛ්‍යාවට ම යේ යි.

මෙසේ කී කල්හි කණ්ඩරායණ බ්‍රාහමණ හුනස්නෙන් නැඟී උතුරුසළුව එකස් කොට ලා "වෘද්ධ වූ භවත්හු තුමූ වෘද්ධභූමියෙහි සිටියහ. දහර වූ අපි දහරභූමියෙහි සිටියමෝය" යි. තරුණ භික්ෂූන්ගේ පා (මෙසේ) සිරසින් වඳියි: භවත් කාත්‍යායනයෙනි, ඉතා මැනවි ... භවත් කාත්‍යායන තෙමේ අද පටන් කොට දිවියෙන් ගත් සරණ ගිය උපාසකයකු කොට මා රැක්නාසේක් වා යි.

## 2. 1. 4. 8.

[සාවත්ථිනිදානං:]

39. යස්මිං භික්ඛවෙ සමයෙ චොරා බලවන්තො හොන්ති, රාජානො තස්මිං සමයෙ දුබ්බලා හොන්ති. තස්මිං භික්ඛවෙ සමයෙ රඤ්ඤො න ඵාසු හොති අතියාතුං වා නීයාතුං වා පච්චන්තිමෙ වා ජනපදෙ අනුසඤ්ඤාතුං. බ්‍රාහ්මණගහපතිකානම්පි තස්මිං සමයෙ න ඵාසු හොති අතියාතුං වා නීයාතුං වා බාහිරානි වා කම්මන්තානි පටිවෙක්ඛිතුං. එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ පාපභික්ඛූ බලවන්තො හොන්ති, පෙසලා භික්ඛූ තස්මිං සමයෙ දුබ්බලා හොන්ති. තස්මිං භික්ඛවෙ සමයෙ පෙසලා භික්ඛූ තුණ්හීභූතා තුණ්හීභූතා සඞ්ඝමජ්ඣෙ සංකසායන්ති[1] පච්චන්තිමෙ වා ජනපදෙ භජන්ති. තයිදං භික්ඛවෙ හොති බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං.

යස්මිං භික්ඛවෙ සමයෙ රාජානො බලවන්තො හොන්ති, චොරා තස්මිං සමයෙ දුබ්බලා හොන්ති. තස්මිං භික්ඛවෙ සමයෙ රඤ්ඤො ඵාසු හොති අතියාතුං වා නීයාතුං වා, පච්චන්තිමෙ වා ජනපදෙ අනුසඤ්ඤාතුං. බ්‍රාහ්මණගහපතිකානම්පි තස්මිං සමයෙ ඵාසු හොති අතියාතුං වා නීයාතුං වා, බාහිරානි වා කම්මන්තානි පටිවෙක්ඛිතුං. එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ පෙසලා භික්ඛූ බලවන්තො හොන්ති, පාපභික්ඛූ තස්මිං සමයෙ දුබ්බලා හොන්ති. තස්මිං භික්ඛවෙ සමයෙ පාපභික්ඛූ තුණ්හීභූතා තුණ්හීභූතා සඞ්ඝමජ්ඣෙ සංකසායන්ති, යෙන වා පන තෙන පපතන්ති.[2] තයිදං භික්ඛවෙ හොති බහුජනහිතාය බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

## 2. 1. 4. 9.

40. ද්වින්නාහං භික්ඛවෙ මිච්ඡාපටිපත්තිං න වණ්ණෙමි, ගිහිස්ස වා පබ්බජිතස්ස වා. ගිහී වා භික්ඛවෙ පබ්බජිතො වා මිච්ඡාපටිපන්නො මිච්ඡාපටිපත්තාධිකරණහෙතු නාරාධකො හොති ඤායං ධම්මං කුසලං.

ද්වින්නාහං භික්ඛවෙ සම්මාපටිපත්තිං වණ්ණෙමි, ගිහිස්ස වා පබ්බජිතස්ස වා. ගිහී වා භික්ඛවෙ පබ්බජිතො වා සම්මාපටිපන්නො සම්මාපටිපත්තාධිකරණහෙතු ආරාධකො හොති ඤායං ධම්මං කුසලන්ති.

## 2 1. 4. 10.

41. යෙ තෙ භික්ඛවෙ භික්ඛූ දුග්ගහිතෙහි සුත්තන්තෙහි බ්‍යඤ්ජනපතිරූපකෙහි අත්ථඤ්ච ධම්මඤ්ච පටිබාහන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනාහිතාය පටිපන්නා බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ අපුඤ්ඤං පසවන්ති. තෙ චිමං සද්ධම්මං අන්තරධාපෙන්ති.

---

1. සඞ්ඛායන්ති, අට්ඨකථා - සංකායන්ති - කත්ථචි. 2. පක්කමන්ති - මජසං.

2. 1. 4. 8.

[සැමැත්නිදානයි:]

39 මහණෙනි, යම් කලෙක්හි සොරු බලවත් වෙත් ද, රජවරු එසමයෙහි දුර්වල වෙත්. මහණෙනි, එසමයෙහි රජුට (ඇතුළුනුවරට) පිවිසෙන්නට හෝ (ඇතුළුනුවරින්) නික්මෙන්නට හෝ පසල්දනව්වෙහි (කටයුතු) සංවිධාන කරන්නට හෝ පහසු නො වෙයි. එසමයෙහි බමුණු ගැහැවියන්ට ද (ඇතුළුනුවරට) පිවිසෙන්නට හෝ (ඇතුළුනුවරින්) නික්මෙන්නට හෝ බැහැර කටයුතු සංවිධාන කරන්නට හෝ පහසු නො වේ. මහණෙනි, එසේ ම යම් සමයෙක්හි පවිටු භික්ෂූහු බලවත් වෙත් ද, එසමයෙහි පේශල භික්ෂූහු දුර්වල වෙත්. මහණෙනි, එසමයෙහි පේශල භික්ෂූහු පුන පුනා නිශ්ශබ්ද වූවාහු සඟ මැද කර බහා හිඳිනාහ. පසල් දනව්වු හෝ ඇසුරු කරන්නාහ. මහණෙනි, මේ කරුණ බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නො සුව පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙව්මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වේ.

මහණෙනි, යම් කලෙක්හි රජවරු බලවත් වෙත් ද, එසමයෙහි සොරු දුර්වල වෙත්. මහණෙනි, එසමයෙහි රජුට (ඇතුළු නුවරට) පිවිසෙන්නට හෝ (ඇතුළු නුවරින්) නික්ම යන්නට හෝ පසල් දනව්වෙහි (කටයුතු) සංවිධාන කරන්නට හෝ පහසු වෙයි. එසමයෙහි බමුණු ගැහැවියනට ද (ඇතුළු නුවරට) පිවිසෙන්නට හෝ (ඇතුළු නුවරින්) නික්ම යන්නට හෝ බැහැර කටයුතු සංවිධාන කරන්නට හෝ පහසු වේ. මහණෙනි, එසේ ම යම් සමයෙක්හි පෙශල භික්ෂූහු බලවත් වෙත් ද, එසමයෙහි පවිටු භික්ෂූහු දුර්වල වෙත්. මහණෙනි, එසමයෙහි පවිටු භික්ෂූහු පුන පුනා නිශ්ශබ්ද වූවාහු සඟ මැද කරබහා හිඳිනාහ. යම් මැ තැනෙක හෝ යෙත්. මහණෙනි, ඒ මේ කරුණ බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට වැඩ පිණිස දෙව්මිනිසුනට හිත පිණිස සුව පිණිස වේ.

2. 1. 4. 9.

40. මහණෙනි, මම ගිහියාගේ වේව යි පැවිද්දාගේ වේව යි දෙදෙනාගේ වරදවා පිළිපැදුම වර්ණනා නො කරමි. මහණෙනි, වරදවා පිළිපන් ගිහියා වේව යි පැවිද්ද වේව යි වරදවා පිළිපැදුම් හෙතුයෙන් විදගීනා සහිත මාර්ගය පුරන්නට නො හැකි වෙයි.

මහණෙනි, මම ගිහියාගේ වේව යි පැවිද්දාගේ වේව යි දෙදෙනාගේ නිවැරදි පිළිපැදුම වර්ණනා කරමි. මහණෙනි, නිවැරදි ව පිළිපන් ගිහියා වේව යි පැවිද්ද වේව යි නිවැරදි පිළිපැදුම් හේතුයෙන් විදගීනා සහිත මාර්ගය පුරන්නට හැකි වෙයි.

2. 1 4. 10.

41. මහණෙනි, යම් මහණ කෙනෙක් වරදවා ගන්නා ලද පදප්‍රතිරූපක වූ (ශබ්දවින්‍යාසයෙන් වරදවා ගන්නට නිසි) සූත්‍රාන්තයෙන් අටුවා ද පෙළ ද පිළිබහන්නාහු ද, මහණෙනි, ඒ මහණහු බොහෝ දෙනාට අහිත පිණිස ද බොහෝ දෙනාට නොසුව පිණිස ද බොහෝ දෙනාට අනර්ථ පිණිස ද දෙව්මිනිසුනට අහිත පිණිස ද දුක් පිණිස ද පිළිපන්නාහු ය. මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ අකුසල් ද රැස් කෙරෙත්. ඔහු ම මේ සස්න ද අතුරුදන් කෙරෙත්.

යෙ තෙ භික්ඛවෙ භික්ඛූ සුගහිතෙහි සුත්තන්තෙහි න බ්‍යඤ්ජනපතිරූපකෙහි අත්ථඤ්ච ධම්මඤ්ච අනුලොමෙන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනහිතාය පටිපන්නා බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ පුඤ්ඤං පසවන්ති. තෙ චිමං සද්ධම්මං ඨපෙන්තීති.

**සමචිත්තවග්ගො චතුත්ථො**

---

## [ 5. පරිසවග්ගො ]

### 2. 1. 5. 1.

**[සාවත්ථිනිදානං:]**

42. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ: උත්තානා ච පරිසා ගම්භීරා ච පරිසා.

කතමා ච භික්ඛවෙ උත්තානා පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ උද්ධතා හොන්ති උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා මුට්ඨස්සතී අසම්පජානා අසමාහිතා විබ්භන්තචිත්තා පාකතින්ද්‍රියා. අයං වුච්චති භික්ඛවෙ උත්තානා පරිසා.

කතමා ච භික්ඛවෙ ගම්භීරා පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ අනුද්ධතා හොන්ති අනුන්නළා අචපලා අමුඛරා අවිකිණ්ණවාචා උපට්ඨිතස්සතී සම්පජානා සමාහිතා එකග්ගචිත්තා සංවුතින්ද්‍රියා. අයං වුච්චති භික්ඛවෙ ගම්භීරා පරිසා. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං ගම්භීරා පරිසාති.

### 2. 1. 5. 2.

43. ද්වෙමා භික්ඛවෙ පරිසා: කතමා ද්වෙ: වග්ගා ච පරිසා, සමග්ගා ච පරිසා.

කතමා ච භික්ඛවෙ වග්ගා පරිසා. ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති. අයං වුච්චති භික්ඛවෙ වග්ගා පරිසා.

කතමා ච භික්ඛවෙ සමග්ගා පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති. අයං වුච්චති භික්ඛවෙ සමග්ගා පරිසා. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං සමග්ගා පරිසාති.

මහණෙනි, යම් මහණ කෙනෙක් මැනැවින් ගන්නා ලද ව්‍යඤ්ජන ප්‍රතිරූපක නොවූ (අක්ෂරවින්‍යාසයෙන් වැරදි ලෙස අදහස ගන්නට නොහිසි) සූත්‍රාන්තයෙන් අර්ථය ද ධර්මය ද අනුව පවත්නාහු ද, මහණෙනි, ඒ මහණහු බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස බොහෝ දෙනාට වැඩ පිණිස දෙව්මිනිසුනට හිත පිණිස සුව පිණිස පිළිපන්නාහු ය. මහණෙනි, ඒ මහණහු බොහෝ කුසල් ද රැස් කෙරෙත්. ඔහු ම මේ ශාසනය තබත් සී.

**සිවුවැනි සමසිත්වගයි.**

---

## [ 5. පරිස වග්ගය ]

### 2. 1. 5. 1.

**[සැවැත්නිදානයි·]**

42. මහණෙනි, මේ පිරිස් දෙකෙකි. කවර දෙකෙක යත්: නොගැඹුරු (ප්‍රකට) පිරිස හා ගැඹුරු (මුවහ) පිරිස හා යන දෙකය.

මහණෙනි, නොගැඹුරු පිරිස කවර: මහණෙනි, මෙසස්නෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු වික්ෂිප්ත සිත් ඇති වෙත් ද, උස් ව නැගුනු මාන නළ ඇති වෙත් ද, චපල වෙත් ද, රළුවදන් ඇති වෙත් ද, පලප් ඇති වෙත් ද, මුෂිතසම්‍ෘති වෙත් ද, සම්‍යක්ප්‍රඥ නැති වෙත් ද, සමාධිගත සිත් නැති වෙත් ද, එකඟ නො වූ සිත් ඇති වෙත් ද, භ්‍රාන්ත සිත් ඇති වෙත් ද, (සංවර නොකෙළෙන්) පියවි ඉඳුරන් ඇති වෙත් ද, මහණෙනි, මේ උත්තාන (නොමුවහ) පිරිස යි කියනු ලැබේ.

මහණෙනි, ගැඹුරු පිරිස කවර: මහණෙනි, මේ සස්නෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු වික්ෂිප්ත සිත් නැති වෙත් ද, උස් ව නැගුනු මාන නළ නැති වෙත් ද, චපල නො වෙත් ද, රළුවදන් නැති වෙත් ද, අසංවෘත වචන නැති වෙත් ද, එළඹසිටි සිහි ඇති වෙත් ද, සම්‍යක් ප්‍රඥ ඇති වෙත් ද, සමාධිගත සිත් ඇති වෙත් ද, එකඟ වූ සිත් ඇති වෙත් ද, සංවර කළ ඉඳුරන් ඇති වෙත් ද, මහණෙනි, මේ ගම්භීර පිරිසැ යි කියනු ලැබේ. මහණෙනි, මේ පිරිස් දෙකය. මහණෙනි, මේ දෙපිරිස් අතුරෙන් යම් ගැඹුරු පිරිසෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

### 2. 1. 5. 2.

43. මහණෙනි, මේ පිරිස් දෙකෙකි. කවර දෙකෙක යත්: ව්‍යග්‍ර පිරිස හා සමග්‍ර පිරිස හා යන දෙකයි.

මහණෙනි, ව්‍යග්‍ර පිරිස් කවර: මහණෙනි, මෙසස්නෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු හටගත් පූර්වභාග සවන් ඇත්තාහු, හටගත් කලහ ඇත්තාහු, විරුඬවාදයට පැමිණියාහු, උනුන් මුවසැතින් විදුනාහු වෙසෙත් ද, මහණෙනි, මේ වර්ගී පිරිසැ යි කියනු ලැබේ.

මහණෙනි, සමග්‍ර පිරිස කවර: මහණෙනි, මෙ සස්නෙහි යම් පිරිසෙක්හි භික්ෂූහු සමග වූවාහු, සතුටුවන්නාහු විවාද නොකරන්නාහු, කිරි හා දිය මෙන් සැසැඳුනාහු, උනුන් පියනෙතින් බලන්නාහු වෙසෙත් ද, මහණෙනි, මේ සමග්‍ර පිරිසැ යි කියනු ලැබේ. මහණෙනි, මේ වනාහි දෙපිරිස ය. මහණෙනි, මේ දෙපිරිස් අතුරෙන් යම් සමග්‍ර පිරිසක් වේ නම්, තෙල අග්‍ර වේ.

## 2. 1. 5. 3.

44. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ: අනග්ගවතී ච පරිසා, අග්ගවතී ච පරිසා.

කතමා ච භික්ඛවෙ අනග්ගවතී පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං ථෙරා භික්ඛූ බාහුලිකා[1] හොන්ති සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා, න විරියං ආරභන්ති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, තෙසං පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති. සාපි හොති බාහුලිකා[1] සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා, න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. අයං වුච්චති භික්ඛවෙ අනග්ගවතී පරිසා.

කතමා ච භික්ඛවෙ අග්ගවතී පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං ථෙරා භික්ඛූ න බාහුලිකා හොන්ති න සාථලිකා, ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා, විරියං ආරභන්ති, අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. තෙසං පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති. සාපි හොති න බාහුලිකා න සාථලිකා, ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා, විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. අයං වුච්චති භික්ඛවෙ අග්ගවතී පරිසා. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං අග්ගවතී පරිසාති.

## 2. 1. 5. 4.

45. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ: අනරියා ච පරිසා, අරියා ච පරිසා.

කතමා ච භික්ඛවෙ අනරියා පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛසමුදයොති යථා-භූතං නප්පජානන්ති, අයං දුක්ඛනිරොධොති. යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානන්ති, අයං වුච්චති භික්ඛවෙ අනරියා පරිසා.

1. බාහුලිකා - ස්‍යා. කං.

## 2. 1. 5. 3.

44. මහණෙනි, මේ පිරිස් දෙකෙකි. කවර දෙකෙක යත්: (උතුම් පුහුලන් ඇති හෙයින්) අගගවතී නම් පිරිස හා (උතුම් පුහුලන් නැති හෙයින්) අනගගවතී නම් පිරිස හා දෙකයි.

මහණෙනි, අනගගවතී පිරිස් කවර: මහණෙනි, මේ සස්නෙහි යම් පිරිසෙක සථවිර භික්ෂූහු (සිවුරු ඇ පිරිකරින්) බාහුලික වෙත් ද, සස්න ලිහිල් කොට ගන්නාහු වෙත් ද, අවක්‍රමණ සඞ්ඛ්‍යාත පඤ්චනීවරණධර්මයන් පිරිමෙහි පෙරටු වෙත් ද, ප්‍රවිවෙක සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි බහා තැබූ වියසීධුර ඇති වෙත් ද, නොලත් (ධ්‍යාන - විදර්ශනා - මාර්ග - ඵල විශෙෂයාගේ) ප්‍රාප්තිය පිණිස අනධිගත ධර්මයාගේ අධිගමය පිණිස, පසක් නො කළ ධර්මයාගේ පසක් කිරීම් පිණිස වැර නො වඩත් ද, ඔවුන්ගේ (සද්ධිවිහාරිකාදී) පශ්චිමජනතාව (ඔවුන්ගේ ආචාරය අනුව යැමය යි කියන ලද) දෘෂටානුගතියට පැමිණේ. ඒ ජනතාව ද බාහුලික වෙයි. සාථලික වෙයි. අවක්‍රමණයෙහි පූර්වඞ්ගම වෙයි. ප්‍රවිවෙකයෙහි හළ ධූර ඇති වෙයි. නො පත් ධර්මයට පැමිණීම පිණිස නො ලත් ධර්මය ලැබීම පිණිස පසක් නොකළ ධර්මය පසක් කිරීම පිණිස වැර නො වඩයි. මහණෙනි, මේ අනගගවතී පිරිසැ යි කියනු ලැබේ.

මහණෙනි, අගගවතී නම් පිරිස කවර: මහණෙනි, මෙසස්නෙහි යම් පිරිසෙක සථවිර භික්ෂූහු බාහුලික නො වෙත් ද, සාථලික නො වෙත් ද, පඤ්චනීවරණ සඞ්ඛ්‍යාත අවක්‍රමණයෙහි හළ වියසීධූර ඇති වෙත් ද, ප්‍රකර්ෂ විවෙකයෙහි පෙරටු ව යන්නාහු වෙත් ද, නො පත් ධර්මයාගේ පැමිණීම පිණිස, නො ලත් ධර්මයාගේ ලැබීම පිණිස, පසක් නො කළ ධර්මයාගේ පසක් කිරීම පිණිස වැර වඩත් ද, ඔවුන්ගේ පශ්චිමජනතාව දෘෂටානුගතියට පැමිණෙයි. ඒ ජනතාවද, බාහුලික නො වේ සාථලික නො වේ අවක්‍රමණයෙහි හළ ධූර ඇති වේ ප්‍රවිවෙකයෙහි පෙරටු ව යන්නේ වේ. නො පත් ධර්මයාගේ පැමිණීම පිණිස, නො ලත් ධර්මයාගේ ලාභය පිණිස, පසක් නො කළ ධර්මයාගේ පසක් කිරීම් පිණිස, වැර වඩයි. මහණෙනි, මේ අගගවතී පිරිසැ යි කියනු ලැබේ. මහණෙනි, මේ පිරිස් දෙකය. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් අගගවතී පිරිසෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

## 2. 1. 5. 4

45. මහණෙනි, මේ පිරිස් දෙකෙකි. කවර දෙකෙක යත්: අනාර්‍ය්‍ය (ශ්‍රාවක) පිරිස හා ආර්‍ය්‍ය (ශ්‍රාවක) පිරිස හා දෙකයි.

මහණෙනි, අනාර්‍ය්‍ය පිරිස කවර: මහණෙනි, මෙ සස්නෙහි යම් පිරිසෙක භික්ෂූහු මේ (තෘෂණාව තබා පඤ්චස්කන්ධය) දුකැයි තත් වූ පරිදි නො දනිත් ද, මේ (තෘෂණාව) දුඃඛසමුදයයි තත් වූ පරිදි නො දනිත් ද, මේ (තෘෂණාවගේ නැවැත්ම) දුඃඛනිරොධ යයි තත් වූ පරිදි නො දනිත් ද, මේ (අර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය) දුඃඛනිරොධගාමී ප්‍රතිපත්ති යයි තත් වූ පරිදි නො දනිත් ද, මහණෙනි, මේ අනාර්‍ය්‍ය පිරිසැ යි කියනු ලැබේ.

කතමා ච භික්ඛවෙ අරියා පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානන්ති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානන්ති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානන්ති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානන්ති. අයං වුච්චති භික්ඛවෙ අරියා පරිසා. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං අරියා පරිසාති.

## 2. 1. 5. 5.

46. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ: පරිසකසටො[1] ච පරිසමණ්ඩො ච.

කතමො ච භික්ඛවෙ පරිසකසටො: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ ඡන්දාගතිං ගච්ඡන්ති, දොසාගතිං ගච්ඡන්ති, මොහාගතිං ගච්ඡන්ති, භයාගතිං ගච්ඡන්ති, අයං වුච්චති භික්ඛවෙ පරිසකසටො.

කතමො ච භික්ඛවෙ පරිසමණ්ඩො: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ න ඡන්දාගතිං ගච්ඡන්ති, න දොසාගතිං ගච්ඡන්ති, න මොහාගතිං ගච්ඡන්ති, න භයාගතිං ගච්ඡන්ති, අයං වුච්චති භික්ඛවෙ පරිසමණ්ඩො. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා, එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං පරිසමණ්ඩොති.

## 2. 1. 5. 6.

47. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ: ඔක්කාචිතවිනීතා[2] පරිසා නො පටිපුච්ඡාවිනීතා, පටිපුච්ඡාවිනීතා පරිසා නො ඔක්කාචිතවිනීතා.

කතමා ච භික්ඛවෙ ඔක්කාචිතවිනීතා පරිසා නො පටිපුච්ඡාවිනීතා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ යෙ තෙ සුත්තන්තා තථාගතභාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතා[3] පටිසඤ්ඤුත්තා. තෙසු භඤ්ඤමානෙසු න සුස්සූසන්ති න සොතං ඔදහන්ති, න අඤ්ඤාචිත්තං උපට්ඨපෙන්ති, න ච තෙ ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤන්ති. යෙ පන තෙ සුත්තන්තා කවිකතා[4] කාවෙය්‍යා චිත්තක්ඛරා චිත්තබ්‍යඤ්ජනා බාහිරකා සාවකභාසිතා. තෙසු භඤ්ඤමානෙසු සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤාචිත්තං උපට්ඨපෙන්ති, තෙ ච ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤන්ති. තෙ තං ධම්මං පරියාපුණිත්වා න චෙව අඤ්ඤමඤ්ඤං පටිපුච්ඡන්ති, පටිවිචරන්ති*. ඉදං කථං, ඉමස්ස ක්වත්ථොති?. තෙ අවිවටඤ්චෙව න විවරන්ති, අනුත්තානීකතඤ්ච නො උත්තානී කරොන්ති. අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං න පටිවිනොදෙන්ති.[5] අයං වුච්චති භික්ඛවෙ ඔක්කාචිතවිනීතා පරිසා, නො පටිපුච්ඡාවිනීතා.

---

1. පරිසාකසටො ච, පරිසාමණ්ඩො ච - මජසං. 2. උක්කාචිතවිනීතා - සීමු. සී 1, PTS, ස්‍යා
3. සුඤ්ඤතපටිසංයුත්තා - ස්‍යා. 4. කවිතා - මජසං. 5. න පටිවිනොදෙන්ති - මජසං, ස්‍යා. * පටිවිචරන්ති - කළුවි

මහණෙනි, ආයෂ්ඨි පිරිස කවර: මහණෙනි, මෙසස්නෙහි යම් පිරිසෙක භික්ෂූහු මේ දුකැයි තත් වූ පරිදි දනිත් ද, මේ දුඃඛසමුදයයි තත් වූ පරිදි දනිත් ද, මේ දුඃඛනිරොධයයි තත් වූ පරිදි දනිත් ද, මේ දුඃඛනිරොධගාමි ප්‍රතිපත්ති යයි තත් වූ පරිදි දනිත් ද, මහණෙනි, මේ ආයෂ්ඨි පිරිස යි කියනු ලැබේ· මහණෙනි, මේ පිරිස් දෙකයි. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් ආයෂ්ඨි පිරිසෙක් වේ නම්, තෙල අගී.

## 2. 1. 5. 5.

46. මහණෙනි, මේ පිරිස් දෙකෙකි. කවර දෙකක යත්: කසළ පිරිස හා නිකසළ පිරිස හා දෙකයි.

මහණෙනි, කසළ පිරිස කවර: මහණෙනි, මෙසස්නෙහි යම් පිරිසෙක භික්ෂූහු ඡන්දයෙන් අගතියට යෙත් ද, ද්වෙෂයෙන් අගතියට යෙත් ද, මොහ-යෙන් අගතියට යෙත් ද, භයින් අගතියට යෙත් ද, මහණෙනි, මේ කසළ පිරිසැ යි කියනු ලැබේ.

මහණෙනි, නිකසළ පිරිස කවර: මහණෙනි, මෙසස්නෙහි යම් පිරිසෙක භික්ෂූහු ඡන්දයෙන් අගතියට නො යෙත් ද, ද්වෙෂයෙන් අගතියට නො යෙත් ද, මොහයෙන් අගතියට නො යෙත් ද, භයින් අගතියට නො යෙත් ද, මහණෙනි, මේ නිකසළ පිරිසැ යී කියනු ලැබේ. මහණෙනි, මේ පිරිස් දෙකය. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් නිකසළ පිරිසෙක් වේ නම් තෙල අගී.

## 2. 1. 5. 6.

47. මහණෙනි, මේ පිරිස් දෙකෙකි. කවර දෙකෙක යත්: අවිනීත වූ පිළිවිස නොහික්මුනු පිරිසය, දුර්විනීත නො වූ පිළිවිස හික්මුනු පිරිසය යන දෙකය.

මහණෙනි, අවිනීත වූ පිළිවිස නො හික්මුනු පිරිස කවර:මහණෙනි, මෙ සස්නෙහි යම් පිරිසෙක භික්ෂූහු තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද (පාළි වසයෙන්) ගැඹුරු වූ, ගැඹුරු අරුත් ඇති, ලොකොත්තර අර්ථය ප්‍රකාශ කරණ (සත්ත්ව පුද්ගල) ශුන්‍යතායෙන් යුත් යම් සූත්‍රාන්ත කෙනෙක් වෙත් ද, ඒ සූත්‍රාන්ත දෙසනු ලබන කල්හි ඇසීමට නො කැමැති වෙත්, ඇසීමට කන් රැකොට නොගණිත්, දැන ගැණීමට සිත් නො එළවත්, ඒ ධර්මයන් උගත යුතු කොට පුහුණු කළ යුතු කොට නො හඟිත්, කවීන් විසිත් කරණ ලද, කවීත්ට හිත වූ, විසිතුරු අකුරු ඇති, විසිතුරු ව්‍යඤ්ජන ඇති, සස්නෙන් බැහිරි වූ, සව්වන් විසින් කියන ලද යම් ඒ සූත්‍රාන්ත කෙනෙක් වෙත් නම්, එය කියත් කියත් ඇසීමට කැමැති වෙත්, කන් රැකොට ගණිත්, ඇසීමට සිත් එළවත්, ඒ ධර්මයන් උගත යුතු කොට පුහුණු කළ යුතු කොට හඟිත්. ඔහු ඒ ධර්මය පුහුණු කොට ඔවුනොවුන් නො ද පිළිවිසිත්. මෙය කෙසේ ය? මෙහි අරුත් කිමැ යි පිළිවිසුමට නො ම සැරිසරත්. ඔහු පිළිසන් අරුත විවර නො කෙරෙත්. අප්‍රකට අර්ථය ප්‍රකට නො කෙරෙත්. නන් වැදෑරුම් සැකයට කරුණු වූ ධර්මයන් විෂයෙහි සැක දුරු නො කෙරෙත්. මහණෙනි, මේ අවිනීත නො පිළිවිස හික්මුනු පිරිස වෙයි.

කතමා ච භික්ඛවෙ පටිපුච්ඡාවිනීතා පරිසා නො ඔක්කාචිතවිනීතා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ යෙ තෙ සුත්තන්තා, කවිකතා කාවෙය්‍යා චිත්තක්ඛරා චිත්තබ්‍යඤ්ජනා බාහිරකා සාවකභාසිතා, තෙසු භඤ්ඤමානෙසු න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, න ච තෙ ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤන්ති. යෙ පන තෙ සුත්තන්තා තථාගතභාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතාපටි-සංයුත්තා, තෙසු භඤ්ඤමානෙසු සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, තෙ ච ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤන්ති. තෙ තං ධම්මං පරියාපුණිත්වා අඤ්ඤමඤ්ඤං පටිපුච්ඡන්ති, පටිවිචරන්ති, ඉදං කථං? ඉමස්ස ක්වත්ථොති,[1] තෙ අවිවටඤ්චෙව විවරන්ති? අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති, අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති. අයං වුච්චති භික්ඛවෙ පටිපුච්ඡාවිනීතා පරිසා නො ඔක්කාචිතවිනීතා, ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං පටිපුච්ඡාවිනීතා පරිසා නො ඔක්කාචිතවිනීතාති.

## 2. 1. 5. 7.

48. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ: ආමිසගරු පරිසා නො සද්ධම්මගරු, සද්ධම්මගරු පරිසා නො ආමිසගරු.

කතමා ච භික්ඛවෙ ආමිසගරු පරිසා නො සද්ධම්මගරු: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ ගිහීනං ඔදාතවසනානං සම්මුඛා අඤ්ඤමඤ්ඤස්ස වණ්ණං භාසන්ති, අසුකො භික්ඛු උභතොභාගවිමුත්තො, අසුකො පඤ්ඤා-විමුත්තො, අසුකො කායසක්ඛි, අසුකො දිට්ඨිප්පත්තො, අසුකො සද්ධා-විමුත්තො, අසුකො ධම්මානුසාරී, අසුකො සද්ධානුසාරී, අසුකො සීලවා කල්‍යාණ-ධම්මො, අසුකො දුස්සීලො පාපධම්මොති. තෙ තෙන ලාභං ලභන්ති. තෙ තං ලාභං ලභිත්වා ගධිතා මුච්ඡිතා අජ්ඣොපන්නා අනාදීනවදස්සාවිනො අනිස්ස-රණපඤ්ඤා පරිභුඤ්ජන්ති. අයං වුච්චති භික්ඛවෙ ආමිසගරු පරිසා නො සද්ධම්මගරු.

1. කො අත්ථොති - මජසං.

මහණෙනි, පිළිවිස හික්මුනු අවිනීත නො වූ පිරිස කවර: මහණෙනි, මේ සස්නෙහි යම් පිරිසෙක භික්ෂූහු කවීන් විසින් කරණ ලද, කවීත්ව ගිත වූ, විසිතුරු අකුරු ඇති, විසිතුරු ව්‍යඤ්ජන ඇති, සස්නෙන් බැහැරි වූ ශ්‍රාවකයන් විසින් කියන ලද, යම් ම සූත්‍රාන්ත කෙනෙක් වෙත් නම් ඒ සූත්‍රාන්තයන් කියත් ම එය ඇසීමට කන් නතු නො කෙරෙත්. දැනගැණීමට සිත් නො එළවත්. ඒ ධර්මයන් උගත යුතු කොට පුහුණු කළ යුතු කොට නො ද හඟිත්. තථාගතයන් වහන්සේ විසින් දෙසන ලද (පාළිවිසින්) ගැඹුරු වූ, ගැඹුරු අරුත් ඇති, ලොකොත්තර වූ, ශුන්‍යතාප්‍රතිසංයුක්ත වූ යම් ම සූත්‍රාන්ත කෙනෙක් වෙත් නම්, ඒ සූත්‍රාන්ත දෙසනු ලබන කල්හි ඇසීමට කැමැති වෙත්. කන් නතු කෙරෙත්. දැනගැණීමට සිත් එළවත්. ඒ ධර්මයන් ද උගත යුතු කොට පුහුණු කළ යුතු කොට හඟිත්. ඔහු ඒ ධර්මය පුහුණු කොට උනුන් පිළිවිසිත්. මෙය කෙසේ ද? මෙහි අර්ථය කිමැ? යි පිළිවිසීමට සැරිසරත්. ඒ භික්ෂූහු නොපිළිසන් වූ අර්ථය විවර කෙරෙත්. අප්‍රකට වූ අර්ථය ද ප්‍රකට කෙරෙත්. නන්වැදෑරුම් සැකයට කරුණු වූ ධර්ම විෂයෙහි සැක දුරු කෙරෙත්. මහණෙනි, මේ විනීත වූ පිළිවිස හික්මුනු පිරිසැ යි කියනු ලැබේ. මහණෙනි, මේ වනාහි පිරිස් දෙකය. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් පිළිවිස හික්මුනු විනීත වූ පිරිසෙක් වේ ද, තෙල අග්‍රී.

**2 1. 5. 7**

මහණෙනි, මේ පිරිස් දෙකෙකි. කවර දෙකෙක යත්: ආමිස (සිවුපස) ගරු කරණ සදහම් ගරු නොකරණ පිරිසය, සදහම් ගරු කරණ ආමිස ගරු නො කරණ පිරිසය යන දෙකය.

මහණෙනි, ආමිස ගරු කරණ සදහම් ගරු නො කරණ පිරිස කවර: මහණෙනි, මේ සස්නෙහි යම් පිරිසෙක භික්ෂූහු සුදුවත් හඳනා ගිහියන් පෙරට අසෝ මහණ (සමථවිපස්සනා දෙකින් කෙලෙසුන් කෙරෙන් මිදුනු) උභතොභාගවිමුක්තයෙක, අසෝ මහණ (ශුෂ්කවිදර්ශක ක්ෂීණාස්‍රව) ප්‍රඥාවිමුක්ත යෙක, අසෝ මහණ (නාමකයින් ධ්‍යානස්පර්ශ කොට නිවන් පසක් කළ) කායසාක්ෂියෙක. අසෝ මහණ දෘෂ්ටප්‍රාප්තයෙක. අසෝ මහණ (ශ්‍රද්ධාධුරයෙන් වැද කෙලෙසුන් නැසූ බැවින්) ශ්‍රද්ධාවිමුක්තයෙක, අසෝ මහණ (ප්‍රඥාධුරයෙන් වැද සෝවන්මඟ ගත්තා බැවින්) ධර්මානුසාරියෙක, අසෝ මහණ (සැදැහැයෙන් වැද සමවත් නොසපයා සොවන් මඟට පිළිපන්) ශ්‍රද්ධානුසාරියෙක, අසෝ මහණ කල්‍යාණ දහම් ඇති සිල්වතෙක, අසෝ මහණ පවිටුදහම් ඇති දුශ්ශීලයෙකැ යි උනුන් ගුණ බෙණෙත් ද, ඔහු එයින් ලාභ ලබත්. ඔහු මැසූතාහු මූසපත්වූවාහු (එහි) ගැලුනාහු ආදීනව නො දක්නාහු නිස්සරණප්‍රඥා නැත්තාහු ඒ ලාභය පරිභොග කෙරෙත්. මහණෙනි, මේ ආමිසය ගරු කරණ සද්ධර්මය ගරු නොකරණ පිරිස වෙයි.

කතමා ච භික්ඛවෙ සද්ධම්මගරු පරිසා නො ආමිසගරු: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ ගිහීනං ඔදාතවසනානං සම්මුඛා *න අඤ්ඤමඤ්ඤස්ස වණ්ණං භාසන්ති: අසුකො භික්ඛු උභතොභාගවිමුත්තො, අසුකො පඤ්ඤාවිමුත්තො, අසුකො කායසක්ඛී, අසුකො දිට්ඨිප්පත්තො, අසුකො සද්ධාවිමුත්තො, අසුකො ධම්මානුසාරී, අසුකො සද්ධානුසාරී, අසුකො සීලවා කල්‍යාණධම්මො, අසුකො දුස්සීලො පාපධම්මොති. තෙ තෙන ලාභං ලභන්ති. තං ලාභම්පි ලභිත්වා අගථිතා අමුච්ඡිතා අනජ්ඣාපන්නා ආදීනවදස්සාවිනො නිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති. අයං වුච්චති භික්ඛවෙ සද්ධම්මගරු පරිසා නො ආමිසගරු. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං සද්ධම්මගරු පරිසා නො ආමිසගරූති.

## 2. 1. 5. 8.

49. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ: විසමා ච පරිසා, සමා ච පරිසා.

කතමා ච භික්ඛවෙ විසමා පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං අධම්මකම්මානි පවත්තන්ති, ධම්මකම්මානි නප්පවත්තන්ති. අවිනයකම්මානි පවත්තන්ති, විනයකම්මානි නප්පවත්තන්ති. අධම්මකම්මානි දිප්පන්ති, ධම්මකම්මානි න දිප්පන්ති. අවිනයකම්මානි දිප්පන්ති, විනයකම්මානි න දිප්පන්ති. අයං වුච්චති භික්ඛවෙ විසමා පරිසා. †විසමත්තා භික්ඛවෙ පරිසාය අධම්මකම්මානි පවත්තන්ති, ධම්මකම්මානි නප්පවත්තන්ති. අවිනයකම්මානි පවත්තන්ති, විනයකම්මානි නප්පවත්තන්ති. අධම්මකම්මානි දිප්පන්ති, ධම්මකම්මානි න දිප්පන්ති. අවිනයකම්මානි දිප්පන්ති, විනයකම්මානි න දිප්පන්ති.

කතමා ච භික්ඛවෙ සමා පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං ධම්මකම්මානි පවත්තන්ති, අධම්මකම්මානි නප්පවත්තන්ති. විනයකම්මානි පවත්තන්ති, අවිනයකම්මානි නප්පවත්තන්ති. ධම්මකම්මානි දිප්පන්ති, අධම්මකම්මානි න දිප්පන්ති. විනයකම්මානි දිප්පන්ති, අවිනයකම්මානි න දිප්පන්ති. අයං වුච්චති භික්ඛවෙ සමා පරිසා. †සමත්තා භික්ඛවෙ පරිසාය ධම්මකම්මානි පවත්තන්ති, අධම්මකම්මානි නප්පවත්තන්ති. විනයකම්මානි පවත්තන්ති, අවිනයකම්මානි නප්පවත්තන්ති. ධම්මකම්මානි දිප්පන්ති, අධම්මකම්මානි නදිප්පන්ති. විනයකම්මානි දිප්පන්ති, අවිනයකම්මානි න දිප්පන්ති. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං සමා පරිසාති.

## 2. 1. 5. 9.

50. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ, අධම්මිකා ච පරිසා, ධම්මිකා ච පරිසා. -පෙ- ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං ධම්මිකා පරිසාති.

---

* අඤ්ඤමඤ්ඤස්ස වණ්ණං න භාසන්ති - මජසං, න ගිහීනං ඔදාතවසනානං සම්මුඛා අඤ්ඤමඤ්ඤස්ස වණ්ණං භාසන්ති - ස්‍යා. මජසං.

† මරම්මපොත්ථකෙ අයං පාඨො න දිස්සතෙ.

මහණෙනි, සද්ධර්මය ගරු කරණ (ආමිෂය) ගරු නොකරණ පිරිස කවරඃ මහණෙනි, මෙසස්නෙහි යම් පිරිසෙක භික්ෂූහු සුදුවත් හඳනා ගිහියන් පෙරට 'අසෝ මහණ උභතොභාග විමුක්තයෙක, අසෝ මහණ ප්‍රඥාවිමුක්තයෙක, අසෝ මහණ කායසාක්ෂියෙක, අසෝ මහණ දෘෂ්ටප්‍රාප්තයෙක, අසෝ මහණ ශ්‍රද්ධාවිමුක්තයෙක, අසෝ මහණ ධර්මානුසාරියෙක, අසෝ මහණ ශ්‍රද්ධානුසාරියෙක, අසෝ මහණ කල්‍යාණදහම් ඇති සිල්වතෙක, අසෝ මහණ පවිටුදහම් ඇති දුශ්ශීලයෙකැ යි උනුන් ගුණ නො බෙණෙත්. ඔහු ලාභ ද ලබා නො මැඩුනාහු මුසපත් නො වූවාහු (එහි) නො ගැලුනාහු ආදීනව දක්නාහු නිඃසරණප්‍රඥ ඇත්තාහු පරිභොග කෙරෙත්. මහණෙනි, මේ සද්ධර්මය ගරු කරණ ආමිෂය ගරු නො කරණ පිරිසැ යි කියනු ලැබේ. මහණෙනි, මේ පිරිස් දෙකය. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් සද්ධර්මය ගරු කරණ ආමිෂය ගරු නො කරණ පිරිසෙක් වේ නම් තෙල අග්‍රී.

## 2. 1. 5. 8.

49. මහණෙනි, මේ පිරිස් දෙකෙකි. කවර දෙකෙක යත්: විෂම පිරිස හා සමපිරිස හා දෙකය.

මහණෙනි, විෂම පිරිස කවරඃ මහණෙනි, මේ සස්නෙහි යම් පිරිසෙක අධර්මකර්මයෝ පවතිත් ද, ධර්මකර්මයෝ නො පවතිත් ද, අවිනය කර්මයෝ පවතිත් ද, විනයකර්මයෝ නො පවතිත් ද, අධර්මකර්මයෝ දීප්‍යා වෙත් ද, ධර්මකර්මයෝ දීප්‍යා නො වෙත් ද, අවිනයකර්මයෝ දීප්‍යා වෙත් ද, විනයකර්මයෝ දීප්‍යා නො වෙත් ද, මහණෙනි, මේ විෂම පිරිසැ යි කියනු ලැබේ. මහණෙනි, පිරිස විෂම බැවින් අධර්මකර්මයෝ පවතිත්. ධර්මකර්මයෝ නො පවතිත්. අවිනයකර්මයෝ පවතිත්. විනයකර්මයෝ නො පවතිත්. අධර්මකර්මයෝ දීප්‍යා වෙත්. ධර්මකර්මයෝ දීප්‍යා නො වෙත්. අවිනයකර්මයෝ දීප්‍යා වෙත්. විනය කර්මයෝ දීප්‍යා නො වෙත්.

මහණෙනි, සමපිරිස කවරඃ මහණෙනි, මේ සස්නෙහි යම් පිරිසෙක ධර්මකර්මයෝ පවතිත් ද, අධර්මකර්මයෝ නො පවතිත් ද, විනයකර්මයෝ පවතිත් ද, අවිනයකර්මයෝ නො පවතිත් ද, ධර්මකර්මයෝ දීප්‍යා වෙත් ද, අධර්මකර්මයෝ දීප්‍යා නො වෙත් ද, විනයකර්මයෝ දීප්‍යා වෙත් ද, අවිනයකර්මයෝ දීප්‍යා නො වෙත් ද, මහණෙනි, මේ සමපිරිසැ යි කියනු ලැබේ. මහණෙනි, පිරිස සම බැවින් ධර්මකර්මයෝ පවතිත්. අධර්මකර්මයෝ නො පවතිත්. විනයකර්මයෝ පවතිත්. අවිනයකර්මයෝ නො පවතිත්. ධර්මකර්මයෝ දීප්‍යා වෙත්. අධර්මකර්මයෝ දීප්‍යා නො වෙත්. විනයකර්මයෝ දීප්‍යා වෙත්. අවිනයකර්මයෝ දීප්‍යා නො වෙත්. මහණෙනි, මේ වනාහි පිරිස් දෙකය. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් සම පිරිසෙක් වේ ද, තෙල අග්‍ර වේ.

## 2 1. 5. 9.

50. මහණෙනි, මේ පිරිස් දෙකෙකි. කවර දෙකෙක යත්:

අධාර්මික පිරිස හා ධාර්මික පිරිස හා දෙකය. ... මහණෙනි, මේ වනාහි පිරිස් දෙකය. මහණෙනි, මේ පිරිස්දෙක අතුරෙන් යම් මේ ධාර්මික පිරිසෙක් වේ ද, තෙල අග්‍ර වේ.

## 2. 1. 5. 10.

51. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ: අධම්මවාදිනී ච පරිසා, ධම්මවාදිනී ච පරිසා.

කතමා ච භික්ඛවෙ අධම්මවාදිනී පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ අධිකරණං ආදියන්ති ධම්මිකං වා අධම්මිකං වා. තෙ තං අධිකරණං ආදියිත්වා න චෙව අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපෙන්ති, න ච සඤ්ඤත්තිං උපගච්ඡන්ති, න ච නිජ්ඣාපෙන්ති, න ච නිජ්ඣත්තිං උපගච්ඡන්ති. තෙ අසඤ්ඤත්තිබලා අනිජ්ඣත්තිබලා අප්පටිනිස්සග්ගමන්තිනො තමෙව අධිකරණං ථාමසා පරාමස්ස[1] අභිනිවිස්ස වොහරන්ති, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. අයං වුච්චති භික්ඛවෙ අධම්මවාදිනී පරිසා.

කතමා ච භික්ඛවෙ ධම්මවාදිනී පරිසා: ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ අධිකරණං ආදියන්ති, ධම්මිකං වා අධම්මිකං වා. තෙ තං අධිකරණං ආදියිත්වා අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපෙන්ති චෙව සඤ්ඤත්තිඤ්ච උපගච්ඡන්ති. නිජ්ඣාපෙන්ති චෙව නිජ්ඣත්තිඤ්ච උපගච්ඡන්ති. තෙ සඤ්ඤත්තිබලා නිජ්ඣත්තිබලා පටිනිස්සග්ගමන්තිනො න තමෙව අධිකරණං ථාමසා පරාමස්ස[2] අභිනිවිස්ස වොහරන්ති, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. අයං වුච්චති භික්ඛවෙ ධම්මවාදිනී පරිසා. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං ධම්මවාදිනී පරිසාති.

**පරිසවග්ගො පඤ්චමො.**

**තත්‍රුද්දානං:**

උත්තානා වග්ගා අග්ගවතී අරියා කසටො ච පඤ්චමො,
ඔක්කාචිතාමිසඤ්චෙව විසමා අධම්මා ධම්මියෙන චාති.

**පඨමො පණ්ණාසකො සමත්තො.**

---

**දුතියො පණ්ණාසකො**

# [ 6. පුග්ගලවග්ගො ]

## 2. 2. 6. 1.

[**සාවත්ථිනිදානං:**]

1 ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති බහුජනහිතාය බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

කතමෙ ද්වෙ: තථාගතො ච අරහං සම්මාසම්බුද්ධො, රාජා ච චක්කවත්ති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති බහුජනහිතාය බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

---

1. පරාමාසා - මජසං.

## 2. 1. 5. 10

51. මහණෙනි, මේ පිරිස් දෙකෙකි. කවර දෙකෙක යත්: අධර්මවාදී පිරිස හා ධර්මවාදී පිරිස හා දෙකය.

මහණෙනි, අධර්මවාදී පිරිස කවර: මහණෙනි, මේ සස්නෙහි යම් පිරිසෙක භික්ෂූහු දැහැමි වූ හෝ නො දැහැමි වූ අධිකරණයක් ගණිත් ද, ඔහු ඒ අධිකරණය ගෙණ උනුන් නො ද හඟවත්. හැඟවීමට නො ද එළඹෙත්. නො ද දක්වත්. දැක්වීමට නො ද එළඹෙත්. නො ඇඟවීම බලය කොට ඇති, නො දැක්වීම බලය කොට ඇති ඔහු (අයුක්ති) දුරලීමට මන්ත්‍රණ නොකරන්නාහු එම අධිකරණ (දෘෂ්ටි) ශක්තියෙන් පරාමර්ශ කොට එයට වැදගෙන 'මෙය ම සත්‍යය, සෙස්ස තුච්ඡ' යි ව්‍යවහාර කෙරෙත් ද, මහණෙනි, මේ අධර්මවාදී පිරිස යි කියනු ලැබේ.

මහණෙනි, ධර්මවාදී පිරිස කවර: මහණෙනි, මෙසස්නෙහි යම් පිරිසෙක භික්ෂූහු දැහැමි හෝ නො දැහැමි අධිකරණයක් ගණිත් ද, ඔහු ඒ අධිකරණය ගෙණ උනුන් ද හඟවත්. හැඟවීමට ද එළඹෙත්. උනුන් දක්වත්. දැක්වීමට ද එළඹෙත්. හැඟවීම බලය කොට ඇති, දැක්වීම බලය කොට ඇති (අධර්මය) දුරලීමට ම මන්ත්‍රණය කරණ සුලු ඔහු එම අධිකරණය 'මෙය ම සත්‍යය, සෙස්ස තුච්ඡ' යි (දෘෂ්ටි) ශක්තියෙන් පරාමර්ශ කොට එයට පිවිස ව්‍යවහාර නො කෙරෙත් ද, මහණෙනි, මේ වනාහි ධර්මවාදී පිරිසැ යි කියනු ලැබේ. මහණෙනි, මේ පිරිස් දෙකය. මහණෙනි, මේ පිරිස් දෙක අතුරෙන් යම් ධර්මවාදී පිරිසෙක් වේ නම් තෙල අග්‍ර වේ.

**පස්වන පිරිස් වග යි.**

**එහි උද්දානය**:

උපඤ්ඤාත, වග්ග, අග්ගවතී, අරියසූත්‍රය හා පස්වැනි කසට සූත්‍රය ද, උක්කාචිත, ආමිස, විසම, අධම්ම, ධම්මිය සූත්‍රය ද යන මොහු (දශසූත්‍රයෝ) යි.

**ප්‍රථම පණ්ණාසකය සමාප්ත යි.**

---

**දෙවන පණ්ණාසකය**

# [ 6. පුද්ගලවර්ගය ]

## 2. 2. 6. 1.

**[සැවැත්නිදනයි:]**

1. මහණෙනි, මේ පුද්ගලයෝ දෙදෙනෙක් උපදනට සමත්වූවාහු ලොකයෙහි බොහෝ දෙනාට හිත පිණිස ද බොහෝ දෙනාට සුව පිණිස ද බොහෝ දෙනාට වැඩ පිණිස ද දෙව්මිනිසුනට හිත පිණිස ද සුව පිණිස ද උපදනාහ.

කවර දෙදෙනෙක යත්: තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ හා චක්‍රවර්ත්ති රජහු හා දෙදෙන ය. මහණෙනි, මේ පුද්ගලයෝ දෙදෙන ලොකයෙහි උපදනට සමත්වූවාහු බොහෝ දෙනාට හිත පිණිස ද බොහෝ දෙනාට සුව පිණිස ද බොහෝ දෙනාට වැඩ පිණිස ද දෙව් මිනිසුනට හිත පිණිස ද සුව පිණිස ද උපදනාහ යි.

**2. 2. 6. 2.**

2. ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති අච්ඡරියමනුස්සා. කතමෙ ද්වෙ: තථාගතො ච අරහං සම්මාසම්බුද්ධො රාජා ච චක්කවත්ති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති අච්ඡරියමනුස්සාති.

**2. 2. 6. 3.**

3. ද්වින්නං භික්ඛවෙ පුග්ගලානං කාලකිරියා බහුනො ජනස්ස ආනුතප්පා[1] හොති. කතමෙසං ද්වින්නං: තථාගතස්ස[2] අරහතො සම්මාසම්බුද්ධස්ස, රඤ්ඤො චක්කවත්තිස්ස. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං පුග්ගලානං කාලකිරියා බහුනො ජනස්ස ආනුතප්පා හොති.[3]

**2. 2. 6. 4.**

4. ද්වෙමෙ භික්ඛවෙ ථූපාරහා. කතමෙ ද්වෙ: තථාගතො ච අරහං සම්මාසම්බුද්ධො, රාජා ච චක්කවත්ති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ථූපාරහාති.

**2. 2. 6. 5.**

5. ද්වෙමෙ භික්ඛවෙ බුද්ධා. කතමෙ ද්වෙ: තථාගතො ච අරහං සම්මාසම්බුද්ධො; පච්චෙකබුද්ධො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බුද්ධාති.

**2. 2. 6. 6.**

6. ද්වෙමෙ භික්ඛවෙ අසනියා ඵලන්තියා න සන්තසන්ති. කතමෙ ද්වෙ: භික්ඛු ච ඛීණාසවො, හත්ථාජානියො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අසනියා ඵලන්තියා න සන්තසන්තීති.

**2. 2. 6. 7.**

7. ද්වෙමෙ භික්ඛවෙ අසනියා ඵලන්තියා න සන්තසන්ති. කතමෙ ද්වෙ: භික්ඛු ච ඛීණාසවො, අස්සාජානීයො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අසනියා ඵලන්තියා න සන්තසන්තීති.

**2. 2. 6. 8.**

8. ද්වෙමෙ භික්ඛවෙ අසනියා ඵලන්තියා න සන්තසන්ති. කතමෙ ද්වෙ: භික්ඛු ච ඛීණාසවො, සීහො ච මිගරාජා. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අසනියා ඵලන්තියා න සන්තසන්තීති.

---

1. අනුතප්පා හොති - මජ්ඣං., ස්‍යා. PTS. 2. තථාගතස්ස ච – මජ්ඣං., ස්‍යා. PTS
3. හොතීති - මජ්ඣං. ස්‍යා. PTS.

2. 2. 6. 2.

2. මහණෙනි, මේ පුද්ගලයෝ දෙදෙනෙක් ලෝකයෙහි උපදනට සමත් වූවාහු ආශ්චර්‍ය්‍ය මනුෂ්‍ය ව උපදිත්. කවර දෙදෙනෙක යත්: තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ හා චක්‍රවර්ත්ති රජ හා දෙදෙනයි. මහණෙනි, ලොකයෙහි උපදනට සමත් මේ පුද්ගලයෝ දෙදෙන ආශ්චර්‍ය්‍ය මනුෂ්‍ය ව උපදනාහ.

2. 2. 6. 3.

3. මහණෙනි, පුද්ගලයන් දෙදෙනක්හුගේ කාලක්‍රියාව බොහෝ දෙනාට අනුතාපකර වෙයි. කවර දෙදෙනක්හුගේ ය යත්: තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ය, චක්‍රවර්ත්ති රජහුගේ ය. මහණෙනි, මේ පුද්ගලයන් දෙදෙනාගේ කාලක්‍රියාව බොහෝ දෙනාව අනුතාප කර වේ.

2. 2. 6. 4.

4. මහණෙනි, මේ ස්තූපාර්හයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ හා චක්‍රවර්ත්ති රජ හා දෙදෙනයි. මහණෙනි, මොහු වනාහි ස්තූපාර්හයෝ දෙදෙන වෙත්.

2. 2. 6. 5.

5. මහණෙනි, මේ බුදුවරු දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ හා ප්‍රත්‍යෙක බුදුන්වහන්සේ හා දෙදෙනයි. මහණෙනි, මොහු බුදුවරු දෙදෙන වෙත්.

2. 2. 6. 6.

6. මහණෙනි, මොහු දෙදෙනෙක් සෙන ගිගිරි කරණ කල්හි නොබිත්. කවර දෙදෙනෙක යත්: ක්ෂීණාස්‍රව තෙමේ ද ආජානෙය හස්ති තෙමේ ද යන දෙදෙන යි. මහණෙනි, මේ දෙදෙන සෙන ගුගුරත් නො බිති.

2. 2. 6. 7.

7. මහණෙනි, මොහු දෙදෙන සෙන ගිගිරි කරත් ම නො බානහ. කවර දෙදෙනෙක යත්: ක්ෂීණාස්‍රව තෙමේ ද ආජානෙය අශ්වයා ද යන දෙදෙන යි. මහණෙනි, මේ දෙදෙන සෙන ගුගුරණ කල්හි තැති නො ගණිත්.

2. 2. 6. 8.

8. මහණෙනි, මොහු දෙදෙන සෙන ගොහන කල්හි තැති නො ගණිත්: කවර දෙදෙනෙක යත්: ක්ෂීණාස්‍රව මහණ හා මෘගරාජන් වූ සිංහයා හා දෙදෙනයි. මහණෙනි, මොහු දෙදෙන සෙන ගොහන කල්හි තැති නො ගණිත්.

## 2. 2. 6. 9.

9. ද්වෙමෙ භික්ඛවෙ අත්ථවසෙ සම්පස්සමානා කිම්පුරිසා මානුසිං වාචං න භාසන්ති. කතමෙ ද්වෙ: මා ච මුසා භණිම්හා[1], මා ච පරං අභූතෙන අබ්භාචික්ඛිම්හාති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අත්ථවසෙ සම්පස්සමානා කිම්පුරිසා මානුසිං වාචං න භාසන්තීති.

## 2. 2. 6. 10.

10. ද්වින්නං භික්ඛවෙ[2] ධම්මානං අතිත්තො අප්පටිවානො මාතුගාමො කාලං කරොති. කතමෙසං ද්වින්නං: මෙථුනධම්මසමාපත්තියා[3] ච, විජායනස්ස ච. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ධම්මානං අතිත්තො අප්පටිවානො මාතුගාමො කාලං කරොතීති.

## 2. 2. 6. 11.

11. අසන්තසන්නිවාසං ච වො භික්ඛවෙ දෙසිස්සාමි[4] සන්තසන්නිවාසඤ්ච. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති: එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

කථඤ්ච භික්ඛවෙ අසන්තසන්නිවාසො හොති: කථඤ්ච අසන්තො සන්නිවසන්ති:

ඉධ භික්ඛවෙ ථෙරස්ස භික්ඛුනො එවං හොති: ථෙරොපි මං න වදෙය්‍ය, මජ්ඣිමොපි මං න වදෙය්‍ය, නවොපි මං න වදෙය්‍ය, ථෙරම්පහං[5] න වදෙය්‍යං, මජ්ඣිමම්පහං න වදෙය්‍යං, නවම්පහං[6] න වදෙය්‍යං, ථෙරො චෙපි මං වදෙය්‍ය, අහිතානුකම්පි මං වදෙය්‍ය, නො හිතානුකම්පී, නොති නං වදෙය්‍යං, විහෙසෙය්‍යම්පි[7] නං, පස්සම්පිස්ස න පටිකරෙය්‍යං. මජ්ඣිමො චෙපි මං වදෙය්‍ය, නවො චෙපි මං වදෙය්‍ය, අහිතානුකම්පි මං වදෙය්‍ය; නො හිතානුකම්පි. නොති නං වදෙය්‍යං, විහෙසෙය්‍යම්පි[7] නං, පස්සම්පිස්ස න පටිකරෙය්‍යං. මජ්ඣිමස්සපි භික්ඛුනො එවං හොති -පෙ- නවස්සපි භික්ඛුනො එවං හොති: ථෙරොපි මං න වදෙය්‍ය, මජ්ඣිමොපි මං න වදෙය්‍ය, නවොපි මං න වදෙය්‍ය, ථෙරම්පහං න වදෙය්‍යං, මජ්ඣිමම්පහං න වදෙය්‍යං, නවම්පහං නං වදෙය්‍යං, ථෙරො චෙපි මං වදෙය්‍ය, අහිතානුකම්පි මං වදෙය්‍ය, නො හිතානුකම්පි, නොති නං වදෙය්‍යං, විහෙසෙය්‍යම්පි[7] නං, පස්සම්පිස්ස න පටිකරෙය්‍යං. මජ්ඣිමො චෙපි මං වදෙය්‍ය, නවො චෙපි මං වදෙය්‍ය; අහිතානුකම්පී මං වදෙය්‍ය, නො හිතානුකම්පී, නොති නං වදෙය්‍යං, විහෙසෙය්‍යම්පි[7] නං; පස්සම්පිස්ස න පටිකරෙය්‍යං. එවං ඛො භික්ඛවෙ අසන්තසන්නිවාසො හොති. එවං ච අසන්තො සන්නිවසන්ති.

1. භණිම්හ - මජසං. සයා, සී 1. PTS. 2. ද්වින්නං ධම්මානං භික්ඛවෙ - මජසං.
3. මෙථුනසමාපත්තියා ච - මජසං. 4. දෙසෙස්සාමි - මජසං, සයා, PTS.
5. ථෙරම්පාහං - මජසං, සයා. 6. නවම්පාහං - සයා. මජසං. 7. විහෙඨෙය්‍යං - මජසං.

**2. 2. 6. 9.**

9. මහණෙනි, මේ කරුණු දෙකක් දක්නා කිංපුරුෂයෝ මිනිස්බස් නො බෙණෙත්. කවර දෙකෙක යත්: තහමක් මුසවා බණමෝව යි, මෙරමා අභූතයෙන් තහමක් අභ්‍යාඛ්‍යාන කරමෝව යි යන දෙකයි. මහණෙනි, මේ කරුණු දෙක දක්නා කිංපුරුෂයෝ මිනිස්බස් නොබණන්නාහ.

**2. 2. 6. 10.**

10. මහණෙනි, මේ ධර්ම දෙකක් පිළිබඳව මාගම අතෘප්ත ව නොපසුබට ව සිට කළුරිය කරයි. කවර දෙකක් පිළිබඳවය යත්: මෛථුන්දම් සෙවීම හා ප්‍රසූතිය හා යන දෙක පිළිබඳව යි. මහණෙනි, මේ ධර්ම දෙක පිළිබඳ මාගම අතෘප්ත ව නොපසුබට ව සිට කළුරිය කෙරේ ය යි.

**2. 2. 6. 11.**

11. මහණෙනි, තොපට අසත්පුරුෂ සන්නිවාසය හා සත්පුරුෂසන්නිවාසය හා දෙසමි. එය අසව….

මහණෙනි, කෙසේ නම් අසත්පුරුෂ සන්නිවාසය වේද යත්: කෙසේ නම් අසත්පුරුෂයෝ එක්ව වෙසෙත්ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි සථවිර භික්ෂුහට මෙබඳු සිතෙක් වෙයි: වැඩිහිටි තෙරද මට තහමක් කියාවා, මධ්‍යම තෙර ද මට තහමක් කියාවා, නවක තෙමේ ද මට තහමක් කියාවා, මම ද මහලු තෙරුන්ට තහමක් කියම්වා, මම මැදුම් තෙරුන් ට ද තහමක් කියම්වා, නවක භික්ෂුහට ද තහමක් කියම්වා, මහලු තෙර ද මට කියන්නේ නම්, හිතානුකම්පා නැත්තේ ම මට කියයි. හිතානුකම්පා ඇති ව නො කියයි ඔහුට නැතැයි ද කියනෙමි. ඔහුට වෙහෙස ද කරමි, එය දක්නෙම් නමුදු පිළියම් නො කරමි. ඉදින් මැදුම් තෙර ද මට කියා නම් … ඉදින් නවක භික්ෂු ද මට කියා නම්, අහිතානුකම්පා ඇති ව මට කියන්නේය. හිතානුකම්පා ඇති ව නො වේ. ඔහුට මම නැතැ'යි කියමි. ඔහුට වෙහෙස ද කරමි. දක්නෙම් නමුදු එයට පිළියම් නො කරමි. මැදුම් මහණහට ද මෙබඳු සිතෙක් වෙයි … නවක භික්ෂුහට ද මෙබඳු සිතෙක් වෙයි: මහලු තෙර ද මට තහමක් කියාවා, මැදුම් තෙර ද මට තහමක් කියාවා, නවක භික්ෂු තෙමේ ද මට තහමක් කියාවා, මම ද මහලු තෙරුන්ට තහමක් කියමි. මැදුම් තෙරුන්ට ද මම තහමක් කියමි. නවක භික්ෂුහට ද මම තහමක් කියමි. ඉදින් මහලු තෙර ද මට කියා නම්, (මට) අහිතානුකම්පී ව කියන්නේය. හිතානුකම්පී ව නො වේ. නැතැයි ඔහුට කියමි, ඔහුට වෙහෙස ද කරමි. දක්නෙම් නමුදු එයට පිළියම් නො කරමි. ඉදින් මැදුම් තෙර ද මට කියා නම් … ඉදින් නවක භික්ෂු තෙමේ ද මට කියා නම්, අහිතානුකම්පී ව මට කියන්නේය, හිතානුකම්පී ව නො වේ. නැතැයි ඔහුට කියමි, ඔහුට වෙහෙස ද කරමි. දක්නෙම් නමුදු එයට පිළියම් නො කරමි. මහණෙනි, මෙසේ වනාහි අසත්පුරුෂ සන්නිවාසය වේ. මෙසේ ද අසත්පුරුෂයෝ එක්ව වෙසෙත්.

කථඤ්ච භික්ඛවෙ සන්තාසන්නිවාසො හොති: කථඤ්ච සන්තො සන්නි-වසන්ති:

ඉධ භික්ඛවෙ ථෙරස්ස භික්ඛුනො එවං හොති: ථෙරොපි මං වදෙය්‍ය, මජ්ඣිමොපි මං වදෙය්‍ය. නවොපි මං වදෙය්‍ය, ථෙරම්පහං වදෙය්‍යං, මජ්ඣිමම්පහං වදෙය්‍යං, නවම්පහං වදෙය්‍යං. ථෙරො චෙපි මං වදෙය්‍ය, හිතානුකම්පී මං වදෙය්‍ය, නො අහිතානුකම්පී, සාධූති නං වදෙය්‍යං, න නං විහෙසෙය්‍යං පස්සම්පිස්ස පටිකරෙය්‍යං. මජ්ඣිමො චෙපි මං වදෙය්‍ය, නවො චෙපි මං වදෙය්‍ය හිතානුකම්පී මං වදෙය්‍ය, නො අහිතානුකම්පී, සාධූති නං වදෙය්‍යං, න නං විහෙසෙය්‍යං, පස්සම්පිස්ස පටිකරෙය්‍යං. මජ්ඣිමස්සපි භික්ඛුනො එවං හොති -පෙ- නවස්සපි භික්ඛුනො එවං හොති: ථෙරොපි මං වදෙය්‍ය, මජ්ඣිමොපි මං වදෙය්‍ය, නවොපි මං වදෙය්‍ය. ථෙරම්පහං වදෙය්‍යං, මජ්ඣිමම්පහං වදෙය්‍යං, නවම්පහං වදෙය්‍යං. ථෙරො චෙපි මං වදෙය්‍ය, හිතානුකම්පී මං වදෙය්‍ය, නො අහිතානුකම්පී. සාධූති නං වදෙය්‍යං, න නං විහෙසෙය්‍යං, පස්සම්පිස්ස පටිකරෙය්‍යං. මජ්ඣිමො චෙපි මං වදෙය්‍ය, නවො චෙපි මං වදෙය්‍ය, හිතානුකම්පී මං වදෙය්‍ය නො අහිතානුකම්පී. සාධූති නං වදෙය්‍යං, න නං විහෙසෙය්‍යං, පස්සම්පිස්ස පටිකරෙය්‍යං. එවං ඛො භික්ඛවෙ සන්තාසන්නිවාසො හොති. එවං ච[1] සන්තො සන්නිවසන්තීති.

### 2. 2. 6 12.

12. යස්මිං භික්ඛවෙ අධිකරණෙ උභතො වචීසංසාරො දිට්ඨිපලාසො චෙතසො ආඝාතො අප්පච්චයො අනභිරද්ධි අජ්ඣත්තං න අවූපසන්තං[2] හොති. තස්සෙතං භික්ඛවෙ අධිකරණෙ පාටිකඞ්ඛං: දීඝත්තාය ඛරත්තාය වාළත්තාය සංවත්තිස්සති, භික්ඛූ ච න ඵාසුං විහරිස්සන්ති.

### 2. 2. 6. 13

13. යස්මිඤ්ච ඛො භික්ඛවෙ අධිකරණෙ උභතො වචීසංසාරො දිට්ඨි-පලාසො චෙතසො ආඝාතො අප්පච්චයො අනභිරද්ධි අජ්ඣත්තං අවූපසන්තං හොති. තස්සෙතං භික්ඛවෙ අධිකරණෙ පාටිකඞ්ඛං: න දීඝත්තාය ඛරත්තාය වාළත්තාය සංවත්තිස්සති. භික්ඛූ ච ඵාසුං විහරිස්සන්තීති.

**පුග්ගල වග්ගො ඡට්ඨො.**

1. එවං - මජසං. එවං ඛො - සයා. 2. න වූපසන්තං - සී 1. සීමු.

මහණෙනි, සත්පුරුෂසහනිවාසය කෙසේය යත්: සත්පුරුෂයෝ කෙසේ නම් එක්ව වෙසෙති යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහලු තෙරුන්ට මේබඳු සිතෙක් වෙයි: මහලු තෙර ද මට කියාවා, මැදුම් තෙරද මට කියාවා, නවකභික්ෂු තෙමේ ද මට කියාවා, මම ද මහලු තෙරුන්ට ද කියමි. මැදුම් තෙරුන්ට ද මම කියමි. නවක භික්ෂුහට ද මම කියමි. ඉදින් මහලු තෙර ද මට කියා නම්, හිතානුකම්පී ව මට කියයි. අහිතානුකම්පී ව නො වේ, මැනවැයි ඔහුට කියමි. මම ඒ තෙරුන් නො වෙහෙසන්නෙමි. මම දක්නෙම් එයට පිළියම් කරමි. ඉදින් මධ්‍යම තෙර ද මට කියා ... නවක භික්ෂු තෙමේ ද මට කියා නම්, හිතානුකම්පී ව මට කියන්නේය, අහිතානුකම්පී ව නො කියන්නේය. (මම) මැනවැ යි ඒ තෙරුන්ට කියමි, ඒ තෙරුන් නො වෙහෙසමි, දක්නෙම් එයට පිළියම් කරමි. මධ්‍යම භික්ෂුහට ද මේබඳු සිතෙක් වෙයි ... නවක භික්ෂුහට ද මේබඳු සිතෙක් වෙයි: මහලු තෙර ද මට කියාවා. මැදුම් මහණ තෙමේ ද මට කියාවා. නවක මහණ තෙමේ ද මට කියාවා. මම ද මහලු තෙරුන්ට කියන්නෙමි... මම ද මැදුම් තෙරුන්ට කියන්නෙමි ... මම ද නවක මහණහට කියන්නෙමි. ඉදින් මහලු තෙර ද මට කියා නම්, මට හිතානුකම්පී ව කියන්නේය. අහිතානුකම්පී ව නො කියන්නේය. ඔහුට "මැනවැ"යි කියමි. ඔහුට වෙහෙස ද නො කරමි. දක්නෙම් නමුදු එයට පිළියම් කරමි ඉදින් මැදුම් තෙර ද මට කියන්නේ නම් ... ඉදින් නවක මහණ තෙමේ ද මට කියන්නේ නම්, හිතානුකම්පී ව මට කියන්නේය, අහිතානුකම්පී ව නො කියන්නේය. ඔහුට "මැනවැ" යි කියමි. ඔහුට වෙහෙස ද නො කරමි. දක්නෙම් පිළියම් ද කරමි. මහණෙනි, මෙසේ වනාහි සත්පුරුෂ සහනිවාසය වෙයි. මෙසේ ම සත්පුරුෂයෝ එක්ව වෙසෙත් යයි.

2. 2. 6. 12.

12. මහණෙනි, යම් අධිකරණයෙක (උනුන් ආක්‍රොශවශයෙන් සමවලා ගැණීම වූ) වාක්සංසරණය ද, (දෘෂ්ටිය නිසා උපදනා ප්‍රුගග්‍රාහ සඞ්ඛ්‍යාත) පළාසය ද, චිත්තයෙහි වූ කොපය ද, නො සතුට ද, නො ඇල්ම ද, අධ්‍යාත්ම යෙහි මැනැවින් නොසන්හිඳුනේ වේ ද, මහණෙනි, ඒ අධිකරණයෙහි මෙය බොහෝ කල් පැවැත්මට රළුබවට සැඩබවට වැටෙන්නේය. භික්ෂූහු ද සුවසේ නො වෙසෙන්නාහ'යි කැමැති විය යුත්තේ යි.

2. 2. 6. 13.

13. මහණෙනි, යම් අධිකරණයෙක දෙපස වාක් සංසරණය, දිට්ඨි-පළාසය, චිත්තයාගේ ආඝාතය අසන්තුෂ්ටිය, අනභිරද්ධිය අධ්‍යාත්මයෙහි මැනැවින් සන්හිඳුනේ වේ ද, මහණෙනි, මෙය ඒ අධිකරණයෙහි බොහෝ කල් පැවැත්මට රළුබවට සැඩබවට නො වැටෙන්නේය. භික්ෂූහු ද සුවසේ වෙසෙන්නාහ යි කැමැති විය යුත්තේ යි.

සවන පුඟුල්වගයි.

# [ 7. සුඛවග්ගො ]

### 2. 2. 7. 1.

**[සාවත්ථිනිදානං:]**

14. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: ගිහිසුඛඤ්ච, පබ්බජ්ජාසුඛඤ්ච.[1] ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං පබ්බජ්ජාසුඛන්ති.

### 2. 2. 7. 2.

15. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: කාමසුඛඤ්ච, නෙක්ඛම්මසුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නෙක්ඛම්ම සුඛන්ති.

### 2. 2. 7. 3.

16. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: උපධිසුඛඤ්ච,[2] නිරුපධිසුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නිරුපධිසුඛන්ති.

### 2. 2. 7. 4.

17. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: සාසවඤ්ච සුඛං, අනාසවඤ්ච සුඛං[2]. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං අනාසවං සුඛන්ති.

### 2. 2. 7. 5.

18. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: සාමිසඤ්ච සුඛං, නිරාමිසඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නිරාමිසං සුඛන්ති.

### 2. 2. 7. 6.

19. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: අරියසුඛඤ්ච, අනරියසුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං අරියසුඛන්ති.

---

1, පබ්බජිතසුඛඤ්ච - මජසං. 2. සාසවසුඛඤ්ච, අනාසව සුඛඤ්ච - මජසං.

# [ සුඛ වර්ගය ]

## 2. 2. 7. 1.

**[සැවැත්නිදානයි:]**

14. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: ගිහි සුඛ හා පැවිදි සුඛ හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සුඛ දෙක ය. මහණෙනි මේ සුව දෙක අතුරෙන් යම් පැවිදි සුවයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

## 2. 2. 7. 2.

15. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: කාමසුඛය හා නෙක්ඛම්මසුඛය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සුඛ දෙකය. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් නෙක්ඛම්මසුඛයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

## 2. 2. 7. 3.

16. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: (ත්‍රෛභූමකසුඛ සඞ්ඛ්‍යාත) උපධි සුඛය හා (ලෝකෝත්තරසුඛ සඞ්ඛ්‍යාත) නිරුපධිසුඛය හා යන දෙකයි. මහණෙනි, මේ සුව දෙකය. මහණෙනි, මේ සුඛ දෙක අතුරෙන් යම් නිරුපධිසුඛයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

## 2. 2. 7. 4.

17. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: (වට්ටසුඛ සඞ්ඛ්‍යාත) සාසවසුඛය හා (විවට්ටසුඛ සඞ්ඛ්‍යාත) අනාසවසුඛය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සුඛ දෙකය. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් අනාසවසුඛයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

## 2. 2. 7. 5.

18. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: (වට්ටගාමිසුඛ සඞ්ඛ්‍යාත) සාමිස සුඛය හා (විවට්ටගාමී සුඛ සඞ්ඛ්‍යාත) නිරාමිස සුඛය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සුඛ දෙකයි. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් නිරාමිසසුඛයෙක් වේ ද, තෙල අග්‍ර වේ.

## 2. 2. 7. 6.

19. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: ආර්‍ය්‍යසුඛය හා අනාර්‍ය්‍ය සුඛය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සුඛ දෙකය. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් ආර්‍ය්‍යසුඛයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

2. 2. 7. 7.

20. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: කායිකඤ්ච සුඛං චෙතසිකඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං චෙතසිකං සුඛන්ති.

2. 2. 7. 8.

21. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: සප්පීතිකඤ්ච සුඛං, නිප්පීතිකඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නිප්පීතිකං සුඛන්ති.

2. 2. 7. 9.

22. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: සාතසුඛඤ්ච උපෙක්ඛා-සුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං උපෙක්ඛාසුඛන්ති.

2. 2. 7. 10.

23. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: සමාධිසුඛඤ්ච අසමාධි-සුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං සමාධිසුඛන්ති.

2. 2. 7. 11.

24. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: සප්පීතිකාරම්මණඤ්ච සුඛං, නිප්පීතිකාරම්මණඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නිප්පීතිකාරම්මණං සුඛන්ති.

2. 2. 7. 12.

25. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: සාතාරම්මණඤ්ච සුඛං, උපෙක්ඛාරම්මණඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං උපෙක්ඛාරම්මණං සුඛන්ති.

2. 2. 7. 13.

26. ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ: රූපාරම්මණඤ්ච සුඛං, අරූපාරම්මණඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං අරූපාරම්මණං සුඛන්ති.

**වග්ගො සත්තමො**

**2. 2. 7. 7.**

20. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: කායිකසුඛය හා චෛතසික සුඛය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සුව දෙකය. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් චෛතසිකසුඛයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

**2. 2. 7. 8.**

21. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: (ප්‍රථම ද්විතීය-ධ්‍යාන සඞ්ඛ්‍යාත) සප්‍රීතිඝ සුඛය හා (තෘතීය චතුර්ථ ධ්‍යාන සඞ්ඛ්‍යාත) නිෂ්ප්‍රීතික සුඛය හා යන දෙකයි මහණෙනි, මේ වනාහි සුව දෙක ය. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් නිෂ්ප්‍රීතික සුවයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

**2. 2. 7. 9.**

22. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: (ප්‍රථම-ද්විතීය-තෘතීයධ්‍යාන සඞ්ඛ්‍යාත) සාතසුඛය හා (චතුර්ථධ්‍යාන සඞ්ඛ්‍යාත) උපේක්‍ෂා-සුඛය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සුව දෙකය. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් උපේක්‍ෂාසුඛයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

**2. 2. 7. 10.**

23. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: (අර්පණාවට හෝ උපචාරයට පැමිණි) සමාධිසුඛය හා (එසේ නො පැමිණි) අසමාධිසුඛය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සුව දෙකය. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් සමාධිසුඛයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

**2. 2. 7. 11.**

24. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: (ප්‍රථම-ද්විතීය-ධ්‍යාන දෙක ප්‍රත්‍යවේක්‍ෂාකරන්නහුට උපන් සප්‍රීතිකාලම්බන සුඛය හා (තෘතීය චතුර්ථධ්‍යාන ප්‍රත්‍යවේක්‍ෂාකරන්නහුට උපන්) නිෂ්ප්‍රීතිකාලම්බන සුඛය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සුව දෙකය. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් නිෂ්ප්‍රීතිකාලම්බන සුඛයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

**2. 2. 7. 12.**

25. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: (ප්‍රථම-ද්විතීය-තෘතීය ධ්‍යාන සඞ්ඛ්‍යාත) සාතාලම්බන සුඛය හා (චතුර්ථධ්‍යාන සඞ්ඛ්‍යාත) උපේක්‍ෂාලම්බන සුඛය හා යන දෙක යි. මහණෙනි, මේ වනාහි සුව දෙකය. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් උපේක්‍ෂාලම්බනසුඛයෙක් වේ නම්, තෙල අග්‍ර වේ.

**2. 2. 7. 13.**

26. මහණෙනි, මේ සුඛ දෙකෙකි. කවර දෙකෙක යත්: (රූපාවචර-චතුර්ථධ්‍යානය අරමුණුකොට ඇති) රූපාලම්බන සුඛය හා අරූපාවචරධ්‍යාන අරමුණු කොට ඇති අරූපාලම්බන සුඛය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සුව දෙකය. මහණෙනි, මේ සුව දෙක අතුරෙන් යම් අරූපාලම්බන සුඛයෙක් වේ නම්, තෙල අග්‍ර වේය යි.

**සත්වැනි සුඛවග යි.**

## [8. සනිමිත්තවග්ගො]

2. 2. 8. 1.

[සාවත්ථිනිදානං:]

27. සනිමිත්තා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අනිමිත්තා. තස්සෙව නිමිත්තස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.[1]

2. 2. 8. 2.

28. සනිදානා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අනිදානා. තස්සෙව නිදානස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 3.

29. සහෙතුකා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අහෙතුකා තස්සෙව හෙතුස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 4.

30. සප්පච්චයා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අප්පච්චයා. තස්සෙව පච්චයස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 5.

31. සරූපා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අරූපා. තස්සෙව රූපස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 6.

32. සවෙදනා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අවෙදනා. තස්සායෙව වෙදනාය පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 7.

33. සසඤ්ඤා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අසඤ්ඤා. තස්සායෙව සඤ්ඤාය පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති

2. 2. 8. 8.

34. සසඞ්ඛාරා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අසඞ්ඛාරා. තෙසං යෙව සඞ්ඛාරානං පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

---

1. න හොන්තීති - මජසං, සතා, PTS.

## [ 8. සනිමිත්ත වර්ගය ]

### 2. 2. 8. 1

[සැවැත්නිදානයි:]

27. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ සනිමිත්ත ව උපදිත්. අනිමිත්ත ව නූපදිත්. ඒ නිමිත්තයාගේ ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශලධර්මයෝ නො වෙත් ය යි.

### 2. 2. 8. 2.

28. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ සනිදාන ව උපදිත්. අනිදාන ව නූපදිත්. ඒ නිදානයාගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශලධර්මයෝ නො වෙත් ය යි.

### 2. 2. 8. 3.

29. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ සහේතුක ව උපදිත්. අහේතුක ව නූපදිත් ඒ හේතුහුගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශලධර්මයෝ නො වෙත් ය යි.

### 2. 2. 8. 4.

30. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ සංස්කාර සහිත ව උපදිත්. සංස්කාර රහිත ව නූපදිත්. ඒ සංස්කාරයන්ගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශලධර්මයෝ නො වෙත් ය යි.

### 2. 2. 8. 5.

31. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ ප්‍රත්‍යය සහිත ව උපදිත්. ප්‍රත්‍යය රහිත ව නූපදිත් ඒ ප්‍රත්‍යයාගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශල-ධර්මයෝ නො වෙත් ය යි

### 2. 2. 8. 6.

32. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ රූපසහිත ව උපදනාහ. රූප රහිත ව නූපදනාහ. ඒ රූපයාගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශල-ධර්මයෝ නො වත් හ යියි.

### 2. 2. 8. 7.

33. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ වේදනා සහිත ව උපදනා හ. වේදනා රහිත ව නූපදනා හ. ඒ වේදනාහුගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශලධර්මයෝ නො වන්නාහ යි.

### 2. 2. 8. 8.

34. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ සංඥා සහිත ව උපදනාහ. සංඥා රහිත ව නූපදනාහ. ඒ සංඥාහුගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශලධර්මයෝ නොවන්නා හයි.

2. 2. 8. 9.

35. සවිඤ්ඤාණා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අවිඤ්ඤාණා. තස්සෙව විඤ්ඤාණස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 10.

36 සඞ්ඛතාරම්මණා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අසඞ්ඛතාරම්මණා. තස්සෙව සඞ්ඛතස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති.

වග්ගො අට්ඨමො

---

## [9. ධම්මවග්ගො]

2. 2. 9. 1.

[සාවත්ථිනිදානං:]

37. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: චෙතොවිමුත්ති ච පඤ්ඤා-විමුත්ති ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 2.

38. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: පග්ගහො ච අවික්ඛෙපො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 3.

39. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: නාමඤ්ච, රූපඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 4.

40. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: විජ්ජා ච විමුත්ති ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 5.

41. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: භවදිට්ඨි ච විභවදිට්ඨි ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති

**2. 2. 8. 9.**

35. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ විඥාන සහිත ව උපදනාහ. විඥාන රහිත ව නූපදනාහ. ඒ විඥානයාගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශලධර්මයෝ නො වන්නාහ යි.

**2. 2. 8. 10.**

36. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ (හේතුප්‍රත්‍යයෙන් උපන්) සංස්කෘතය අරමුණු කොට උපදනාහ. (හේතුප්‍රත්‍යයෙන් නූපන්) අසංස්කෘතය අරමුණු කොට නූපදනාහ. ඒ සඞ්ඛතයාගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශලධර්මයෝ නො වන්නාහ යි.

**අටවන වර්ග යි.**

---

## [ 9. ධර්මවර්ගය ]

**[සැවැත්නිදානයි:]**

**2. 2. 9. 1.**

37. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (ඵලසමාධි සඞ්ඛ්‍යාත) චේතොවිමුක්තිය හා (ඵලප්‍රඥා සඞ්ඛ්‍යාත) ප්‍රඥාවිමුක්තිය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක යි.

**2. 2. 9. 2.**

38. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (වීර්‍ය්‍යසඞ්ඛ්‍යාත) ප්‍රග්‍රාහය හා (චිත්තෙකාග්‍රතා සඞ්ඛ්‍යාත) අවික්ෂේපය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක යි.

**2. 2. 9. 3.**

39. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (සතර අරූපස්කන්ධ සඞ්ඛ්‍යාත) නාමය හා රූප (ස්කන්ධ) ය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක යි.

**2. 2. 9. 4.**

40. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (ඵලඥාන සඞ්ඛ්‍යාත) විද්‍යාව හා (ඵලඥාන සම්ප්‍රයුක්ත සෙසු ධර්ම සඞ්ඛ්‍යාත) විමුක්තිය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක ය.

**2. 2. 9. 5.**

41. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (ශාශ්වත සඞ්ඛ්‍යාත) භවදෘෂ්ටිය හා (උච්ඡේද සඞ්ඛ්‍යාත) විභවදෘෂ්ටිය හා යන දෙක යි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක ය.

2. 2. 9. 6.

42. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: අහිරිකඤ්ච අනොත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 7.

43. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: හිරි ච ඔත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 8.

44. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: දොවචස්සතා ච පාපමිත්තතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 9.

45. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: සොවචස්සතා ච කල්‍යාණ-මිත්තතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 10.

46. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: ධාතුකුසලතා ච මනසිකාර-කුසලතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 11.

47. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: ආපත්තිකුසලතා ච ආපත්ති-වුට්ඨානකුසලතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

වග්ගො නවමො

---

## [ 10. බාලවග්ගො ]

[සාවත්ථිනිදානං:]

2. 2. 10. 1.

48. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ: යො ච අනාගතං භාරං වහති, යො ච ආගතං භාරං න වහති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති.

2. 2. 10. 2.

49. ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා. කතමෙ ද්වෙ: යො ච ආගතං භාරං වහති, යො ච අනාගතං භාරං න වහති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති.

2. 2. 9. 6.

42. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (පවට ලජ්ජා නැති බව වූ) අහ්රිකය හා (පවට නො බිතා බව වූ) අනපත්‍රපාව හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙකය.

2. 2. 9. 7.

43. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (පවට ලජ්ජා ඇති බව වූ) හ්‍රිය හා (පවට බිතා බව වූ) අපත්‍රපාව හා යන දෙක ය. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක ය.

2. 2. 9. 8.

44. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (ඔවා නොපිළිගන්නා බව වූ) දෞර්වචස්සතාව හා (පවිටු මිතුරන් සෙවුනා බව වූ) පාපමිත්‍රතාව හා යන දෙකය. මහණෙනි, මේ වනාහි ධර්ම දෙකය.

2. 2. 9. 9.

45. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (ඔවා පිළිගන්නා බව වූ) සෞවචස්සතාව හා (කල්‍යාණමිතුරන් සෙවුනා බව වූ) කල්‍යාණමිත්‍රතාව හා යන දෙකය. මහණෙනි, මේ වනාහි ධර්ම දෙකය.

2. 2. 9. 10.

46. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (අෂ්ටාදශ) ධාතූන් දැනීමෙහි දක්ෂ බව හා (ඒ) ධාතූන් අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කිරීමෙහි දක්ෂ බව හා යන දෙකය. මහණෙනි, මේ වනාහි ධර්ම දෙකය.

2. 2. 9. 11.

47. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: සත්‍යාපත්ති-ස්කන්ධයන් දැනීමෙහි දක්ෂ බව හා ඇවැතින් නැගිසිටීමෙහි දක්ෂ බව හා යන දෙක ය. මහණෙනි, මේ වනාහි ධර්ම දෙකය.

නවවන වග යි.

---

## [ 10. බාලවර්ගය ]

[සැවැත්නිදානයි:]

2. 2. 10. 1.

48. මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: යමෙක් නො පැමිණි බර උසුලනුයේ ද, යමෙකුත් පැමිණි බර නො උසුලනුයේ නම් හේය යන මේ දෙදෙන ය. මහණෙනි, මොහු වනාහි බාලයෝ දෙදෙන ය.

2. 2. 10. 2.

49. මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: යමෙකුත් පැමිණි බර උසුලනුයේ ද, යමෙකුත් නො පැමිණි බර නො උසුලනුයේ ද යන දෙදෙන ය. මහණෙනි, මොහු වනාහි පණ්ඩිතයෝ දෙදෙන ය.

### 2. 2. 10. 3.

50. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ: යො ච අකප්පියෙ කප්පිය-සඤ්ඤී, යො ච කප්පියෙ අකප්පියසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති.

### 2. 2. 10. 4.

51. ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා. කතමෙ ද්වෙ: යො ච අකප්පියෙ අකප්පියසඤ්ඤී, යො ච කප්පියෙ කප්පියසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති.

### 2. 2. 10. 5.

52. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ: යො ච අනාපත්තියා ආපත්ති-සඤ්ඤී, යො ච ආපත්තියා අනාපත්තිසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති.

### 2. 2. 10. 6.

53. ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා. කතමෙ ද්වෙ: යො ච අනාපත්තියා අනාපත්තිසඤ්ඤී, යො ච ආපත්තියා ආපත්තිසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති.

### 2. 2. 10. 7.

54. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ: යො ච අධම්මෙ ධම්මසඤ්ඤී, යො ච ධම්මෙ අධම්මසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති.

### 2. 2. 10. 8.

55. ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා. කතමෙ ද්වෙ: යො ච අධම්මෙ අධම්ම-සඤ්ඤී, යො ච ධම්මෙ ධම්මසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති.

### 2. 2. 10. 9.

56. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ: යො ච අවිනයෙ විනයසඤ්ඤී, යො ච විනයෙ අවිනයසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති.

### 2. 2. 10. 10.

57. ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා. කතමෙ ද්වෙ: යො ච අවිනයෙ අවිනය-සඤ්ඤී, යො ච විනයෙ විනයසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති.

## 2. 2. 10. 3.

50. මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: යමෙකුත් නො කැප දෑයෙහි කැපය යන සංඥ ඇත්තේ වේ ද, යමෙකුත් කැප දෑයෙහි අකැපය යන සංඥ ඇත්තේ වේ ද, යන දෙදෙන ය. මහණෙනි, මොහු වනාහි බාලයෝ දෙදෙන ය.

## 2. 2. 10. 4.

51. මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: යමෙකුත් අකැප දෑයෙහි අකැපය යන සංඥ ඇත්තේ වේ ද, යමෙකුත් කැප දෑයෙහි කැපය යන සංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනය. මහණෙනි, මොහු වනාහි පණ්ඩිතයෝ දෙදෙන ය.

## 2. 2. 10. 5.

52. මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: යමෙකුත් අනාපත්තියෙහි ආපත්ති සංඥ ඇත්තේ වේ ද, යමෙකුත් ආපත්තියෙහි අනාපත්තිසංඥ ඇත්තේ වේ ද, යන දෙදෙන ය. මහණෙනි, මොහු වනාහි බාලයෝ දෙදෙන ය.

## 2. 2. 10. 6.

53. මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: යමෙකුත් අනාපත්තියෙහි අනාපත්ති සංඥ ඇත්තේ වේ ද, යමෙකුත් ආපත්තියෙහි ආපත්තිසංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනය. මහණෙනි, මොහු වනාහි පණ්ඩිතයෝ දෙදෙන ය.

## 2. 2. 10. 7.

54. මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: යමෙකුත් අධර්මයෙහි ධර්මසංඥ ඇත්තේ වේ ද, යමෙකුත් ධර්මයෙහි අධර්මසංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනය. මහණෙනි, මොහු වනාහි බාලයෝ දෙදෙන ය.

## 2. 2. 10. 8.

55. මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: යමෙකුත් අධර්මයෙහි අධර්මසංඥ ඇත්තේ වේ ද, යමෙකුත් ධර්මයෙහි ධර්මසංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනය. මහණෙනි, මොහු වනාහි පණ්ඩිතයෝ දෙදෙන ය.

## 2. 2. 10. 9.

56. මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: යමෙකුත් අවිනයෙහි විනයසංඥ ඇත්තේ වේ ද, යමෙකුත් විනයෙහි අවිනය සංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනය. මහණෙනි, මොහු වනාහි බාලයෝ දෙදෙන ය

## 2. 2. 10 10.

57. මහණෙනි, මේ පණ්ඩිතයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: අවිනයෙහි අවිනයසංඥ ඇති යමෙකුත් වේ ද, විනයෙහි විනයසංඥ ඇති යමෙකුත් වේ ද, යන දෙදෙනය. මහණෙනි, මොහු වනාහි පණ්ඩිතයෝ දෙදෙන ය.

**2. 2. 10. 11.**

58. ද්වින්නං භික්ඛවෙ ආසවා වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං: යො ච න කුක්කුච්චායිතබ්බං කුක්කුච්චායති, යො ච කුක්කුච්චායිතබ්බං න කුක්කුච්චායති. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා වඩ්ඪන්තීති.

**2. 2. 10. 12.**

59. ද්වින්නං භික්ඛවෙ ආසවා න වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං: යො ච න කුක්කුච්චායිතබ්බං න කුක්කුච්චායති, යො ච කුක්කුච්චායිතබ්බං කුක්කුච්චායති. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා න වඩ්ඪන්තීති.

**2. 2 10. 13.**

60. ද්වින්නං භික්ඛවෙ ආසවා වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං: යො ච අකප්පියෙ කප්පියසඤ්ඤී, යො ච කප්පියෙ අකප්පියසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා වඩ්ඪන්තීති.

**2. 2. 10. 14.**

61. ද්වින්නං භික්ඛවෙ ආසවා න වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං: යො ච අකප්පියෙ අකප්පියසඤ්ඤී, යො ච කප්පියෙ කප්පියසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා න වඩ්ඪන්තීති.

**2. 2. 10. 15.**

62. ද්වින්නං භික්ඛවෙ ආසවා වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං: යො ච අනාපත්තියා ආපත්තිසඤ්ඤී, යො ච ආපත්තියා අනාපත්තිසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා වඩ්ඪන්තීති.

**2. 2. 10. 16.**

63. ද්වින්නං භික්ඛවෙ ආසවා න වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං: යො ච අනාපත්තියා අනාපත්තිසඤ්ඤී, යො ච ආපත්තියා ආපත්තිසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා න වඩ්ඪන්තීති.

**2. 2. 10. 17.**

64. ද්වින්නං භික්ඛවෙ ආසවා වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං: යො ච අධම්මෙ ධම්මසඤ්ඤී, යො ච ධම්මෙ අධම්මසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා වඩ්ඪන්තීති.

**2. 2. 10. 18.**

65. ද්වින්නං භික්ඛවෙ ආසවා න වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං: යො ච අධම්මෙ අධම්මසඤ්ඤී, යො ච ධම්මෙ ධම්මසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා න වඩ්ඪන්තීති.

### 2. 2. 10. 11.

58. මහණෙනි, දෙදෙනකුන්ට ආශ්‍රවයෝ වැඩෙත්නාහ. කවර දෙදෙනකුන්ටය යත්: යමෙකුත් කුකුස් නො කළ යුත්තෙහි කුකුස් කරණුයේ ද, යමෙකුත් කුකුස් කළ යුත්තෙහි කුකුස් නො කරණුයේ ද යන දෙදෙනය. මහණෙනි, මේ දෙදෙනහට ආශ්‍රවයෝ වැඩෙත්නාහ යි.

### 2. 2. 10. 12.

59. මහණෙනි, දෙදෙනකුන්ගේ ආශ්‍රවයෝ නො වැඩෙත්නාහ. කවර දෙදෙනකුන්ගේය යත්: යමෙකුත් කුකුස් නො කළ යුත්තෙහි කුකුස් නො කරණුයේ ද, යමෙකුත් කුකුස් කළ යුත්තෙහි කුකුස් කරණුයේ ද, යන දෙදෙන ය. මහණෙනි, මේ දෙදෙනාගේ ආශ්‍රවයෝ නො වැඩෙත්නාහ යි.

### 2. 2. 10. 13.

60. මහණෙනි, දෙදෙනකුන්ගේ ආශ්‍රවයෝ වැඩෙත්නාහ. කවර දෙදෙනකුන්ගේය යත්: යමෙකුත් අකැප දෑයෙහි කැපය යන සංඥ ඇත්තේ වේ ද, යමෙකුත් කැප දෑයෙහි නො කැපය යන සංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනාගේ ය. මහණෙනි, මේ දෙදෙනාගේ ආශ්‍රවයෝ වැඩෙත්නාහ යි.

### 2. 2. 10. 14.

61. මහණෙනි, දෙදෙනකුන්ගේ ආශ්‍රවයෝ නො වැඩෙත්නාහ. කවර දෙදෙනකුන්ගේය යත්: යමෙකුත් අකැප දෑයෙහි අකැපය යන සංඥ ඇත්තේ වේ ද, යමෙකුත් කැප දෑයෙහි කැපය යන සංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනාගේ ය. මහණෙනි, මේ දෙදෙනාගේ ආශ්‍රවයෝ නො වැඩෙත්නාහ යි.

### 2. 2. 10. 15.

62. මහණෙනි, දෙදෙනකුන්ගේ ආශ්‍රවයෝ වැඩෙත්නාහ. කවර දෙදෙනකුන්ගේය යත්: යමෙකුත් අනාපත්තියෙහි ආපත්තිසංඥ ඇත්තේ වේ ද, යමෙකුත් ආපත්තියෙහි අනාපත්තිසංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනාගේ ය. මහණෙනි, මේ දෙදෙනාගේ ආශ්‍රවයෝ වැඩෙත්නාහ යි.

### 2. 2. 10. 16.

63. මහණෙනි, දෙදෙනකුන්ගේ ආශ්‍රවයෝ නො වැඩෙත්නාහ. කවර දෙදෙනකුන්ගේය යත්: යමෙකුත් ආපත්තියෙහි ආපත්තිසංඥ ඇත්තේ වේ ද, යමෙකුත් අනාපත්තියෙහි අනාපත්තිසංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනාගේ ය. මහණෙනි, මේ දෙදෙනාගේ ආශ්‍රවයෝ නො වැඩෙත්නාහ යි.

### 2. 2. 10. 17.

64. මහණෙනි, දෙදෙනකුන්ගේ ආශ්‍රවයෝ වැඩෙත්. කවර දෙදෙනකුන්ගේය යත්: යමෙකුත් අධර්මයෙහි ධර්මසංඥ ඇත්තේ වේ ද, යමෙකුත් ධර්මයෙහි අධර්මසංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනාගේ ය. මහණෙනි, මේ දෙදෙනාගේ ආශ්‍රවයෝ වැඩෙත්නාහ යි.

### 2. 2 10. 18.

65. මහණෙනි, දෙදෙනකුන්ගේ ආශ්‍රවයෝ නො වැඩෙත්නාහ. කවර දෙදෙනකුන්ගේය යත්: යමෙකුත් අධර්මයෙහි අධර්මසංඥ ඇත්තේ වේ ද, යමෙකුත් ධර්මයෙහි ධර්මසංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනාගේ ය. මහණෙනි, මේ දෙදෙනාගේ ආශ්‍රවයෝ නො වැඩෙත්නාහ යි.

2. 2. 10. 19.

66. ද්වින්නං භික්ඛවෙ ආසවා වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං: යො ච අවිනයෙ විනයසඤ්ඤී, යො ච විනයෙ අවිනයසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා වඩ්ඪන්තීති.[1]

2. 2. 10. 20.

67. ද්වින්නං භික්ඛවෙ ආසවා න වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං: යො ච අවිනයෙ අවිනයසඤ්ඤී, යො ච විනයෙ විනයසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා න වඩ්ඪන්තීති.

**වග්ගො දසමො.**

**දුතියො පණ්ණාසකො සමත්තො.**

---

**තතියො පණ්ණාසකො**

## [ 11. ආසාවග්ගො ]

**[සාවත්ථිනිදානං:]**

2. 3. 11. 1.

1. ද්වෙමා භික්ඛවෙ ආසා දුප්පජහා. කතමා ද්වෙ: ලාභාසා ච, ජීවිතාසා ච. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ ආසා දුප්පජහාති.

2. 3. 11. 2.

2. ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා දුල්ලභා ලොකස්මිං. කතමෙ ද්වෙ: යො ච පුබ්බකාරී, යො ච කතඤ්ඤූ කතවෙදී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා දුල්ලභා ලොකස්මින්ති.[2]

2. 3. 11. 3.

3. ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා දුල්ලභා ලොකස්මිං. කතමෙ ද්වෙ: තිත්තො ච, තප්පෙතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා දුල්ලභා ලොකස්මින්ති.[2]

2. 3. 11. 4.

4. ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා දුත්තප්පයා. කතමෙ ද්වෙ: යො ච ලද්ධං ලද්ධං නික්ඛිපති, යො ච ලද්ධං ලද්ධං විස්සජ්ජෙති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා දුත්තප්පයාති.

2. 3. 11. 5

5. ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා සුතප්පයා. කතමෙ ද්වෙ: යො ච ලද්ධං ලද්ධං න නික්ඛිපති, යො ච ලද්ධං ලද්ධං න විස්සජ්ජෙති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා සුතප්පයාති.

---

1. වඩ්ඪන්තීති - මජසං, සයා. 2. ලොකස්මින්ති - මජසං

**2. 2. 10. 19.**

66. මහණෙනි, දෙදෙනකුන්ගේ ආශ්‍රවයෝ වැඩෙන්නාහ. කවර දෙදෙනකුන්ගේය යත්: යමෙකුත් අවිනයෙහි විනයසංඥ ඇත්තේ වේ ද, යමෙකුත් විනයෙහි අවිනයසංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනාගේ ය. මහණෙනි, මේ දෙදෙනාගේ ආශ්‍රවයෝ වැඩෙන්නාහ යි.

**2 2. 10. 20.**

67. මහණෙනි, දෙදෙනකුන්ගේ ආශ්‍රවයෝ නො වැඩෙන්නාහ. කවර දෙදෙනකුන්ගේය යත්: යමෙකුත් අවිනයෙහි අවිනයසංඥ ඇත්තේ වේ ද, යමෙකුත් විනයෙහි විනයසංඥ ඇත්තේ වේ ද, යන දෙදෙනාගේ ය. මහණෙනි, මේ දෙදෙනාගේ ආශ්‍රවයෝ නො වැඩෙන්නාහ යි.

**දසවන වගයි.**

**දෙවන පණ්ණාසකය සමාප්තයි.**

---

**තෙවන පණ්ණාසකය**

## [ 11. ආසාවග්ගය ]

**[සැවැත්නිදානයි.]**

**2. 3. 11. 1.**

1. මහණෙනි, මේ ආශාවෝ දෙදෙනෙක් හැරලීමට දුෂ්කර වෙත්. කවර දෙදෙනෙක යත්: ලාභාශාව හා ජීවිතාශාව හා යන දෙකය. මහණෙනි, මේ ආශාවෝ දෙදෙන හැරලීමට දුෂ්කර වෙත් ය යි

**2. 3. 11. 2.**

2. මහණෙනි, ලොව්හි මේ පුහුලෝ දෙදෙනෙක් දුලබ වෙති. කවර දෙදෙනෙක යත්: යමෙකුත් පළමු ම උපකාර කරන්නේ වේ ද, යමෙකුත් කෘතඥ වූයේ කෘතවෙදී වේ ද, යන දෙදෙන ය. මහණෙනි, මේ පුහුලෝ දෙදෙන වනාහි ලොව්හි දුලබ වෙත් ය යි.

**2. 3. 11. 3.**

3. මහණෙනි, ලොව්හි මේ පුහුලෝ දෙදෙනෙක් දුලබ වෙත්. කවර දෙදෙනෙක යත්: තෘප්ත වූයේ ද, තෘප්තියට පමුණුවන්නේ ද යන දෙදෙන වෙති. මහණෙනි, මේ පුහුලෝ දෙදෙන ලොව්හි දුලබ වෙත් ය යි.

**2. 3. 11. 4.**

4. මහණෙනි, ලොව්හි මේ පුහුලෝ දෙදෙනෙක් (දායකයා විසින්) තෘප්තිමත් කළ නො හැක්කාහු වෙති. කවර දෙදෙනෙක යත්: යමෙකුත් ලද ලද දෑ තැන්පත් කෙරේ නම්, යමෙකුත් ලද ලද දෑ වියදම් කෙරේ නම්, යන මොහු දෙදෙන ය. මහණෙනි, මේ පුහුලෝ දෙදෙන ලොව්හි තෘප්තිමත් කළ නො හැක්කාහු වෙත් ය යි.

**2. 3. 11. 5.**

5. මහණෙනි, ලොව්හි මේ පුහුලෝ දෙදෙනෙක් (දායකයා විසින්) පහසුවෙන් තර්පණය කළ හැක්කාහු වෙති. කවර දෙදෙනෙක යත්: යමෙකුත් ලද ලද දෑ තැන්පත් නො කෙරේ ද, යමෙකුත් ලද ලද දෑ වියදම් නො කෙරේ ද යන දෙදෙන ය. මහණෙනි, මේ පුහුලෝ දෙදෙන ලොව්හි පහසුවෙන් තර්පණය කළ හැක්කාහු වෙත් ය යි.

**2. 3. 11. 6.**

6. ද්වෙමෙ භික්ඛවෙ පච්චයා රාගස්ස උප්පාදාය. කතමෙ ද්වෙ: සුභනිමිත්තඤ්ච, අයොනිසො ච මනසිකාරො. ඉමෙ බො භික්ඛවෙ ද්වෙ පච්චයා රාගස්ස උප්පාදායාති.

**2. 3. 11. 7.**

7. ද්වෙමෙ භික්ඛවෙ පච්චයා දොසස්ස උප්පාදාය. කතමෙ ද්වෙ: පටිඝනිමිත්තඤ්ච, අයොනිසො ච මනසිකාරො. ඉමෙ බො භික්ඛවෙ ද්වෙ පච්චයා දොසස්ස උප්පාදාය.

**2. 3. 11. 8.**

8. ද්වෙමෙ භික්ඛවෙ පච්චයා මිච්ඡාදිට්ඨියා උප්පාදාය. කතමෙ ද්වෙ: පරතො ච ඝොසො, අයොනිසො ච මනසිකාරො. ඉමෙ බො භික්ඛවෙ ද්වෙ පච්චයා මිච්ඡාදිට්ඨියා උප්පාදාය.

**2. 3. 11. 9.**

9. ද්වෙමෙ භික්ඛවෙ පච්චයා සම්මාදිට්ඨියා උප්පාදාය. කතමෙ ද්වෙ: පරතො ච ඝොසො, යොනිසො ච මනසිකාරො. ඉමෙ බො භික්ඛවෙ ද්වෙ පච්චයා සම්මාදිට්ඨියා උප්පාදාය.[1]

**2. 3. 11. 10.**

10. ද්වෙමා භික්ඛවෙ ආපත්තියො. කතමා ද්වෙ: ලහුකා ච ආපත්ති, ගරුකා ච ආපත්ති. ඉමා බො භික්ඛවෙ ද්වෙ ආපත්තියො.[2]

**2. 3. 11. 11.**

11. ද්වෙමා භික්ඛවෙ ආපත්තියො. කතමා ද්වෙ: දුට්ඨුල්ලා ච ආපත්ති, අදුට්ඨුල්ලා ච ආපත්ති. ඉමා බො භික්ඛවෙ ද්වෙ ආපත්තියො.[2]

**2. 3. 11. 12.**

12. ද්වෙමා භික්ඛවෙ ආපත්තියො. කතමා ද්වෙ: සාවසෙසා ච ආපත්ති, අනවසෙසා ච ආපත්ති. ඉමා බො භික්ඛවෙ ද්වෙ ආපත්තියොති.

**වග්ගො එකාදසමො[3].**

---

## [ 12. ආයාචනවග්ගො ]

**[සාවත්ථිනිදානං:]**

**2. 3. 12. 1.**

13. සද්ධො භික්ඛවෙ භික්ඛු එවං සම්මා ආයාචමානො ආයාචෙය්‍ය: තාදිසො හොමි, යාදිසා **සාරිපුත්තමොග්ගල්ලානාති**. එසා භික්ඛවෙ තුලා, එතං පමාණං මම සාවකානං භික්ඛූනං යදිදං සාරිපුත්තමොග්ගල්ලානාති.

---

1. උප්පාදායාති - මජ්ඣං. 2. ආපත්තියොති - මජ්ඣං. 3. ආසාදුප්පජහවග්ගො - පඨමො - මජ්ඣං.

**2. 3. 11. 6.**

6. මහණෙනි, රාගයාගේ ඉපදීමට මේ ප්‍රත්‍යයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: සුභනිමිත්ත හා අයෝනිසෝමනසිකාරය හා යන දෙකයි. මහණෙනි, මොහු වනාහි රාගයාගේ ඉපදීමට ප්‍රත්‍යයෝ දෙදෙන ය.

**2. 3. 11. 7.**

7. මහණෙනි, ද්වේෂයාගේ ඉපදීමට මේ ප්‍රත්‍යයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ප්‍රතිඝනිමිත්ත හා අයොනිසොමනසිකාරය හා යන දෙදෙන ය. මහණෙනි, මොහු වනාහි ද්වෙෂයාගේ ඉපදීමට ප්‍රත්‍යයෝ දෙදෙන ය.

**2. 3. 11. 8.**

8. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිහුගේ ඉපදීමට මේ ප්‍රත්‍යයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: මෙරමාගෙන් (අසද්ධර්මය) ඇසීම හා නුනුවණින් මෙනෙහි කිරීම හා යන දෙදෙන ය. මහණෙනි, මොහු වනාහි මිථ්‍යාදෘෂ්ටිහුගේ ඉපදීමට ප්‍රත්‍යයෝ දෙදෙන ය.

**2. 3. 11. 9.**

9. මහණෙනි, සම්‍යග්දෘෂ්ටිහුගේ ඉපදීමට මේ ප්‍රත්‍යයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: මෙරමාගෙන් සද්ධර්මය ඇසීම හා නුවණින් මෙනෙහි කිරීම හා යන දෙදෙන යි. මහණෙනි, මොහු වනාහි සම්‍යග්දෘෂ්ටිහුගේ ඉපදීමට ප්‍රත්‍යයෝ දෙදෙන ය.

**2. 3. 11. 10.**

10. මහණෙනි, මේ ඇවැත් දෙකෙකි. කවර දෙකෙක යත්: ලුහු ඇවැත හා ගුරු ඇවැත හා යන දෙකය. මහණෙනි, මේ වනාහි ඇවැත් දෙක ය.

**2. 3. 11. 11.**

11. මහණෙනි, මේ ඇවැත් දෙකෙකි. කවර දෙකෙක යත්: දුළුල් ඇවැත හා නො දුළුල් ඇවැත හා යන දෙකය. මහණෙනි, මේ වනාහි ඇවැත් දෙක ය.

**2. 3 11. 12.**

12. මහණෙනි, මේ ඇවැත් දෙකෙකි. කවර දෙකක යත්: සාවසෙසාපත්තිය හා අනවසෙසාපත්තිය හා යන දෙකය. මහණෙනි, මේ වනාහි ඇවැත් දෙක ය.

**එකොළොස්වන වගයි.**

---

## [ 12. ආයාචනවග්ගය ]

**[සැවැත්නිදානයි:]**

**2. 3. 12. 1.**

13. මහණෙනි, ඇදහැති මහණ මෙසේ මොනොවට යදනේ **සැරියුත් මුගලන්** දෙදෙන යම්බඳු වෙත් නම්, එබඳු වෙම්ව යි යදනේය. (කවර හෙයින යත්:) මහණෙනි, යම් සැරියුත් මුගලන් දෙදෙනෙක් වෙත් නම්, මාගේ ශ්‍රාවක භික්ෂූන්ට තෙල තුලාව ය. තෙල ප්‍රමාණ ය යි.

**2. 3. 12. 2.**

14. සද්ධා භික්ඛවෙ භික්ඛුනී එවං සම්මා ආයාචමානා ආයාචෙය්‍ය: තාදිසා[1] හොමි, යාදිසා[2] **ඛෙමා** ච භික්ඛුනී **උප්පලවණ්ණා** චාති. එසා භික්ඛවෙ තුලා, එතං පමාණං මම සාවිකානං භික්ඛුනීනං යදිදං ඛෙමා ච භික්ඛුනී, උප්පලවණ්ණා චාති.

**2. 3. 12. 3.**

15. සද්ධො භික්ඛවෙ උපාසකො එවං සම්මා ආයාචමානො ආයාචෙය්‍ය: තාදිසො හොමි, යාදිසො **චිත්තො** ච ගහපති, **හත්ථකො** ච ආළවකොති. එසා භික්ඛවෙ තුලා, එතං පමාණං මම සාවකානං උපාසකානං යදිදං චිත්තො ච ගහපති, හත්ථකො ච ආළවකොති.

**2. 3. 12 4.**

16. සද්ධා භික්ඛවෙ උපාසිකා එවං සම්මා ආයාචමානා ආයාචෙය්‍ය: තාදිසා[1] හොමි, යාදිසා[2] **ඛුජ්ජුත්තරා** ච උපාසිකා, **වෙළුකණ්ටකියා** ච **නන්දමාතාති**. එසා භික්ඛවෙ තුලා, එතං පමාණං මම සාවිකානං උපාසිකානං යදිදං ඛුජ්ජුත්තරා ච උපාසිකා, වෙළුකණ්ටකියා ච නන්දමාතාති.

**2. 3. 12. 5.**

17. ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො[3] විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති. කතමෙහි ද්වීහි: අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති. අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසති. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති.[4]

**2. 3. 12. 6.**

18. ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච පුඤ්ඤං පසවති. කතමෙහි ද්වීහි: අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති, අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසති. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති, අනනුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච පුඤ්ඤං පසවතීති.

1. තාදිසී හොමි - මජසං 2. යාදිසී - මජසං. 3. සානුවජ්ජො ච - මජසං.
4 පසවතීති - මජසං

**2. 3. 12. 2.**

14. මහණෙනි, සැදැහැති මෙහෙණ මෙසේ මොනොවට යදනී ඛෙමා උප්පලවණ්ණා දෙනම යම්බඳු වෙත් නම්, එබඳු වෙම්වා යි යදනීය. (කවර-හෙයින යත්:) මහණෙනි, මේ ඛෙමා හා උප්පලවණ්ණා හා යන දෙදෙන යම්සේ වෙත් නම් මාගේ ශ්‍රාවිකා භික්ෂුණීන්ට තෙල තුලාව ය. තෙල ප්‍රමාණය යි.

**2. 3. 12. 3.**

15. මහණෙනි, සැදැහැති උපාසක මෙසේ මොනොවට යදතේ චිත්ත ගෘහපති හා හත්ථක ආලවක හා යම්බඳු වෙත් නම්, එබඳු වෙම්වා යි යදතේය. (කවරහෙයින යත්:) මහණෙනි, මේ චිත්ත ගෘහපති හා හත්ථක ආලවක තෙමේත් යම්සේ වෙත් නම් මාගේ ශ්‍රාවක උපාසකයන්ට තෙල තුලාව වේ, තෙල ප්‍රමාණය යි.

**2. 3. 12. 4.**

16. මහණෙනි, සැදැහැති උපාසිකාව මෙසේ මොනොවට යදනී ඛුජ්ජුත්තරා උපාසිකාව හා වෙළුකණ්ටකීයා නන්දමාතාව හා යම්බඳු වෙත් ද, එබඳු වෙම්වා යි යදනීය. (කවරහෙයින යත්:) මහණෙනි, මේ ඛුජ්ජුත්තරා උපාසිකාව ද වෙළුකණ්ටකීය නන්දමාතාව ද යන දෙදෙනෙක් වෙත් නම් මාගේ ශ්‍රාවිකා උපාසිකාවනට තෙල තුලාව වේ. තෙල ප්‍රමාණය යි.

**2. 3. 12. 5.**

17. මහණෙනි, දහම් දෙකෙකින් සමන්‍වාගත වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාල තෙමේ සාරා දමන ලද ගුණ ඇති, නට ගුණ ඇති ආත්මය පරිහරණය කරයි. සදෙස් වූයේ ද නුවණැත්තන් ගේ උපවාදයට යොග්‍ය වූයේ ද වේ. බොහෝ පව් ද රැස් කරයි. කවර දෙකෙකින යත්: නොදැන නොපිරිස නුගුණ කීමට සුදුස්සාගේ ගුණ කියා නම්, නොදැන නොපිරිස ගුණ කීමට සුදුස්සාගේ අගුණ කියා නම්, මහණෙනි, මේ දහම් දෙකින් යුක්ත වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාල තෙමේ සාරා දමන ලද ගුණ ඇති, නට ගුණ ඇති ආත්මය පරිහරණය කෙරෙයි. සදෙස් වූයේ ද නුවණැත්තන්ගේ උපවාදයට යොග්‍ය වූයේ ද වේ. බොහෝ පව් ද රැස් කරණේ ය යි.

**2. 3. 12. 6.**

18. මහණෙනි, දහම් දෙකෙකින් සමන්‍වාගත වූ ව්‍යක්ත වූ සත්පුරුෂ වූ පණ්ඩිත තෙමේ සාරා නො දැමූ ගුණ ඇති, නොනට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. නිදෙස් වූයේ ද නුවණැත්තන්ගේ උපවාදයට යොග්‍ය නුවූයේ ද වේ. බොහෝ පින් ද රැස් කරණේය. කවර දෙකෙකින යත්: දැන පිරිස නුගුණ කිය යුත්තාගේ නුගුණ කියා නම්, දැන පිරිස ගුණ කීමට සුදුස්සාගේ ගුණ කියා නම්, මහණෙනි, මේ දහම් දෙකින් යුක්ත වූ ව්‍යක්ත වූ සත්පුරුෂ වූ පණ්ඩිත තෙම සාරා නො දමන ලද ගුණ ඇති, නොනට ගුණ ඇති ආත්මය පරිහරණය කෙරෙයි. නිදෙස් වූයේ ද නුවණැත්තන්ගේ උපවාදයට යොග්‍ය නුවූයේ ද වේ. බොහෝ පින් ද රැස් කරණේ ය යි.

## 2. 3. 12. 6.

19. ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච අපුඤ්ඤං පසවති. කතමෙහි ද්වීහි: අනනුවිච්ච අපරියොගාහෙත්වා අප්පසාදනියෙ ඨානෙ පසාදං උපදංසෙති. අනනුවිච්ච අපරියොගාහෙත්වා පසාදනියෙ ඨානෙ අප්පසාදං උපදංසෙති. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති, සානුවජ්ජො[1] විඤ්ඤූනං. බහුඤ්ච අපුඤ්ඤං පසවති.[2]

## 2. 3. 12. 7.

20. ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච පුඤ්ඤං පසවති. කතමෙහි ද්වීහි: අනුවිච්ච පරියොගාහෙත්වා අප්පසාදනියෙ ඨානෙ අප්පසාදං උපදංසෙති, අනුවිච්ච පරියොගාහෙත්වා පසාදනියෙ ඨානෙ පසාදං උපදංසෙති. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති. අනවජ්ජො ච හොති, අනනුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච පුඤ්ඤං පසවතීති.

## 2. 3. 12. 8.

21. ද්වීසු භික්ඛවෙ මිච්ඡා පටිපජ්ජමානො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති. කතමෙසු ද්වීසු: මාතරි ච පිතරි ච. ඉමෙසු ඛො භික්ඛවෙ ද්වීසු මිච්ඡා පටිපජ්ජමානො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති.[2]

## 2. 3. 12. 9.

22. ද්වීසු භික්ඛවෙ සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච පුඤ්ඤං පසවති. කතමෙසු ද්වීසු: මාතරි ච පිතරි ච. ඉමෙසු ඛො භික්ඛවෙ ද්වීසු සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච පුඤ්ඤං පසවතීති.

1. සානුවජ්ජො ච – මජසං. 2. පසවතීති - මජසං

## 2. 3. 12. 6

19. මහණෙනි, දහම් දෙකෙකින් සමන්‍වාගත වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාල තෙමේ කනත ලද ගුණ ඇති, නට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. සදෙස් වූයේ ද නුවණැත්තන්ගේ උපවාදයට යෝග්‍ය වූයේ ද වේ. බොහෝ පව් ද රැස් කරණේය. කවර දෙකෙකින යත්: නොදැන නොපිවිස නොපැහැදිය යුතු තන්හි ප්‍රසාදය දක්වන්නේ ද, නො දැන නොපිවිස පැහැදිය යුතු තන්හි අප්‍රසාදය දක්වන්නේ ද යන දෙකිනි. මහණෙනි, මේ දහම් දෙකින් සමන්‍වාගත වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාල තෙමේ කනත ලද ගුණ ඇති, නට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. සදෙස් වූයේ ද නුවණැත්තන්ගේ උපවාදයට යෝග්‍ය වූයේ ද වේ. බොහෝ පව් ද රැස් කරණේ ය යි.

## 2. 3. 12 7.

20. මහණෙනි, දහම් දෙකෙකින් සමන්‍වාගත වූ ව්‍යක්ත වූ සත්පුරුෂ වූ පණ්ඩිත තෙමේ නො කනත ලද ගුණ ඇති නොනට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. නිදෙස් වූයේ ද නුවණැත්තවුන් විසින් උපවාද නොකට යුත්තේ ද වේ. බොහෝ පින් ද රැස් කරයි. කවර දෙකෙකින යත්: දැන පිවිස නො පැහැදිය යුතු තන්හි අප්‍රසාදය දක්වන්නේ ද, දැන පිවිස පැහැදිය යුතු තන්හි ප්‍රසාදය දක්වන්නේ ද යන දෙකිනි. මහණෙනි, මේ දහම් දෙකින් සමන්‍වාගත වූ ව්‍යක්ත වූ සත්පුරුෂ වූ පණ්ඩිත තෙම නො කනත ලද ගුණ ඇති නොනට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. නිදෙස් වූයේ ද නුවණැත්තන් විසින් උපවාද නොකට යුත්තේ ද වේ. බොහෝ කුසල් ද රැස් කරණේය යි.

## 2 3. 12. 8.

21. මහණෙනි, දෙතැනෙක්හි වරදවා පිළිපදනා වූ අව්‍යක්ත වූ අසත්-පුරුෂ වූ බාල තෙම කනත ලද ගුණ ඇති නට ගුණ ඇති ආත්මය පරිහරණය කෙරෙයි, සදෙස් වූයේ ද නුවණැත්තන් විසින් ගැරැහිය යුතු වූයේ ද වෙයි. බොහෝ පව් ද රැස් කරණේය. කවර දෙතැනෙකය යත්: මවු කෙරෙහි ද පියා කෙරෙහි ද යන දෙතැන්හිය. මහණෙනි, මේ දෙතැන්හි වරදවා පිළිපදනා වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාල තෙම කනත ලද ගුණ ඇති නට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. සදෙස් වූයේ ද නුවණැත්තන් විසින් උපවාද කටයුත්තේ ද වේ. බොහෝ පව් ද රැස් කරණේය.

## 2. 3. 12. 9.

22. මහණෙනි, දෙතැනෙක මොනොවට පිළිපදනා වූ ව්‍යක්ත වූ සත්-පුරුෂ වූ පණ්ඩිත තෙම නොකනත ලද ගුණ ඇති නොනට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. නිදෙස් වූ යේ ද නුවණැත්තන් විසින් උපවාද නො කට යුත්තේ ද වෙයි. බොහෝ කුසල් ද රැස් කරණේය. කවර දෙතැනෙක යත්: මවු කෙරෙහි ද පියා කෙරෙහි ද යන දෙතැන්හිය. මහණෙනි, මේ දෙතැන්හි මොනොවට පිළිපදනා වූ ව්‍යක්ත වූ සත්පුරුෂ වූ පණ්ඩිත තෙම නො කනත ලද ගුණ ඇති නොනට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. නිදෙස් වූයේ ද නුවණැත්තන් විසින් උපවාද නො කටයුත්තේ ද වෙයි. බොහෝ පින් ද රැස් කරණේ ය යි.

**2. 3. 12. 10.**

23. ද්වීසු භික්ඛවෙ මිච්ඡා පටිපජ්ජමානො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච අපුඤ්ඤං පසවති. කතමෙසු ද්වීසු: තථාගතෙ ච තථාගතසාවකෙ ච. ඉමෙසු ඛො භික්ඛවෙ ද්වීසු මිච්ඡා පටිපජ්ජමානො බාලො අබ්‍යත්තො අසප්පු-රිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති.

**2. 3. 12. 11.**

24. ද්වීසු භික්ඛවෙ සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජො ච හොති, අනනුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච පුඤ්ඤං පසවති. කතමෙසු ද්වීසු: තථාගතෙ ච තථාගතසාවකෙ ච; ඉමෙසු ඛො භික්ඛවෙ ද්වීසු සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජො ච හොති අනනුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච පුඤ්ඤං පසවතීති.

**2. 3. 12. 12.**

25. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: සචිත්තවොදානඤ්ච, න ච කිඤ්චි ලොකෙ උපාදියති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

**2. 3. 12. 13.**

26. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: කොධො ච උපනාහො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

**2. 3. 12. 14.**

27. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: කොධවිනයො ච උපනාහ-විනයො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

**වග්ගො ද්වාදසමො.**

## 2. 3. 12. 10.

23. මහණෙනි, දෙතැනෙක වරදවා පිළිපදනා වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාල තෙම කනන ලද ගුණ ඇති නටගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. සදෙස් වූ යේ ද නුවණැත්තන් විසින් උපවාද කළ යුත්තේ ද වෙයි. බොහෝ පව් ද රැස් කරණේය. කවර දෙතැනෙකය යත්: තථාගතයන් වහන්සේ කෙරෙහි ද තථාගතශ්‍රාවකයා කෙරෙහි ද යන දෙතන්හිය. මහණෙනි, මේ දෙතන්හි වරදවා පිළිපදනා වූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාල තෙම කනන ලද ගුණ ඇති නට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. සදෙස් වූයේ ද නුවණැත්තවුන් විසින් උපවාද කටයුත්තේ ද වෙයි. බොහෝ පව් ද රැස් කරණේ ය යි.

## 2. 3. 12. 11.

24. මහණෙනි, දෙතැනෙක මනාව පිළිපදනා වූ ව්‍යක්ත වූ සත්පුරුෂ වූ පණ්ඩිත තෙම නොකනන ලද ගුණ ඇති නොනට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. නිදෙස් වූයේ ද නුවණැත්තවුන් විසින් උපවාද නො කටයුත්තේ ද වෙයි. බොහෝ පින් ද රැස් කරණේය. කවර දෙතැනෙකය යත්: තථාගතයන් වහන්සේ කෙරෙහි ද තථාගතශ්‍රාවකයා කෙරෙහි ද යන දෙතන්හිය. මහණෙනි, මේ දෙතන්හි මනාව පිළිපදනා වූ ව්‍යක්ත වූ සත්පුරුෂ වූ පණ්ඩිත තෙම නො කනන ලද ගුණ ඇති නොනට ගුණ ඇති ආත්මය පරිහරණය කරණේය. නිදෙස් වූයේ ද නුවණැත්තන් විසින් උපවාද නො කටයුත්තේ ද වෙයි. බොහෝ පින් ද රැස් කරණේ ය යි.

## 2. 3. 12. 12.

25. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (අෂ්ටසමාපත්ති සඞ්ඛ්‍යාත) සවිඥානවාවේදනය ද ලොව්‍ කිසි එක ද ධර්මයක් (තෘෂ්ණා දෘෂ්ටි මානපරාමර්ශයෙන්) නොගන්නේ ද යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙකයි.

## 2. 3. 12. 13.

26. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: ක්‍රෝධය හා උපනාහය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙකයි.

## 2. 3. 12. 14.

27. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: ක්‍රෝධවිනය හා උපනාහවිනය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙකයි.

**දෙළොස්වන වග යි.**

## [ 13. දානවග්ගො ]

[සාවත්ථිනිදානං:]

2. 3. 13. 1.

28. ද්වෙමානි භික්ඛවෙ දානානි. කතමානි ද්වෙ: ආමිසදානඤ්ච ධම්මදානඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ දානානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං දානානං යදිදං ධම්මදානන්ති.

2. 3. 13. 2.

29. ද්වෙමෙ භික්ඛවෙ යාගා. කතමෙ ද්වෙ: ආමිසයාගො ච ධම්මයාගො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ යාගා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං යාගානං යදිදං ධම්මයාගොති.

2. 3. 13. 3.

30. ද්වෙමෙ භික්ඛවෙ චාගා. කතමෙ ද්වෙ: ආමිසචාගො ච ධම්මචාගො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ චාගා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං චාගානං යදිදං ධම්මචාගොති.

2. 3. 13. 4.

31. ද්වෙමෙ භික්ඛවෙ පරිච්චාගා. කතමෙ ද්වෙ: ආමිසපරිච්චාගො ච ධම්මපරිච්චාගො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පරිච්චාගා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං පරිච්චාගානං යදිදං ධම්මපරිච්චාගොති.

2. 3. 13. 5.

32. ද්වෙමෙ භික්ඛවෙ භොගා. කතමෙ ද්වෙ: ආමිසභොගො ච ධම්මභොගො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ භොගා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං භොගානං යදිදං ධම්මභොගොති.

2. 3. 13. 6.

33. ද්වෙමෙ භික්ඛවෙ සම්භොගා. කතමෙ ද්වෙ: ආමිසසම්භොගො ච ධම්මසම්භොගො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ සම්භොගා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සම්භොගානං යදිදං ධම්මසම්භොගොති.

2. 3. 13. 7.

34. ද්වෙමෙ භික්ඛවෙ සංවිභාගා. කතමෙ ද්වෙ: ආමිසසංවිභාගො ච ධම්මසංවිභාගො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ සංවිභාගා එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සංවිභාගානං යදිදං ධම්මසංවිභාගොති.

2. 3. 13. 8.

35. ද්වෙමෙ භික්ඛවෙ සඞ්ගහා. කතමෙ ද්වෙ: ආමිසසඞ්ගහො ච ධම්මසඞ්ගහො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ සඞ්ගහා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සඞ්ගහානං යදිදං ධම්මසඞ්ගහොති.

---

1. අනානුවජ්ජො ච - මජසං.

## [ 13. දානවග්ගය ]

**[සැවැත්නිදානයි:]**

**2. 3. 13. 1.**

28. මහණෙනි, මේ දාන දෙකෙකි. කවර දෙකෙක යත්: ආමිෂදානය හා ධම්මදානය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි දාන දෙකය. මහණෙනි, මේ දාන දෙක අතුරෙන් යම් ධම්මදානයෙක් වේ නම්, තෙල අග්‍ර වේ ය යි.

**2. 3. 13. 2.**

29. මහණෙනි, මේ යාගයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂයාගය හා ධම්මයාගය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි යාග දෙකය. මහණෙනි, මේ යාගයන් දෙදෙනා අතුරෙන් යම් ධම්මයාගයෙක් වේ නම්, තෙල අග්‍ර වේ ය යි.

**2. 3. 13. 3.**

30. මහණෙනි, මේ ත්‍යාග දෙකෙකි. කවර දෙකෙක යත්: ආමිෂත්‍යාගය හා ධම්මත්‍යාගය හා යන දෙකයි මහණෙනි, මේ වනාහි ත්‍යාග දෙකය. මහණෙනි, මේ ත්‍යාගයන් දෙදෙනා අතුරෙන් යම් ධම්ම ත්‍යාගයෙක් වේ නම්, තෙල අග්‍ර වේ ය යි.

**2. 3. 13. 4.**

31. මහණෙනි, මේ පරිත්‍යාගයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂපරිත්‍යාගය හා ධම්මපරිත්‍යාගය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි පරිත්‍යාගයෝ දෙදෙනායි. මහණෙනි, මේ පරිත්‍යාගයන් දෙදෙනා අතුරෙන් යම් ධම්මපරිත්‍යාගයෙක් වේ නම්, තෙල අග්‍ර වේ ය යි.

**2. 3. 13. 5.**

32. මහණෙනි, මේ භෝගයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂභෝගය හා ධම්මභෝගය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි භෝග දෙක ය. මහණෙනි, මේ භෝගයන් දෙදෙනා අතුරෙන් යම් ධම්මභෝගයෙක් වේ නම්, තෙල අග්‍ර වේ ය යි.

**2. 3. 13. 6.**

33. මහණෙනි, මේ සම්භෝගයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂසම්භෝගය හා ධම්මසම්භෝගය හා යන දෙදෙනායි මහණෙනි, මේ වනාහි සම්භෝගයෝ දෙදෙනායි. මහණෙනි, මේ සම්භෝගයන් දෙදෙනා අතුරෙන් යම් ධම්මසම්භෝගයෙක් වේ නම්, තෙල අග්‍ර වේ ය යි.

**2. 3. 13. 7.**

34. මහණෙනි, මේ සංවිභාගයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂසංවිභාගය හා ධම්මසංවිභාගය හා යන දෙදෙනායි. මහණෙනි, මේ වනාහි සංවිභාගයෝ දෙදෙනා වෙත්. මහණෙනි, මේ සංවිභාගයන් දෙදෙනා අතුරෙන් යම් ධම්මසංවිභාගයෙක් වේ නම්, තෙල අග්‍ර වේ ය යි.

**2. 3. 13. 8.**

35. මහණෙනි, මේ සංග්‍රහයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂසංග්‍රහය හා ධම්මසංග්‍රහය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි සංග්‍රහයෝ දෙදෙනා වෙත්. මහණෙනි, මේ සංග්‍රහයන් දෙදෙනා අතුරෙන් යම් ධම්මසංග්‍රහයෙක් වේ නම්, තෙල අග්‍ර වේ ය යි.

**2. 3. 13. 9.**

36. ද්වෙමෙ භික්ඛවෙ අනුග්ගහා. කතමෙ ද්වෙ: ආමිසානුග්ගහො ච ධම්මානුග්ගහො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අනුග්ගහා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං අනුග්ගහානං යදිදං ධම්මානුග්ගහොති.

**2. 3. 13. 10.**

37. ද්වෙමා භික්ඛවෙ අනුකම්පා. කතමා ද්වෙ: ආමිසානුකම්පා ච ධම්මානුකම්පා ච. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ අනුකම්පා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං අනුකම්පානං යදිදං ධම්මානුකම්පාති.

**වග්ගො තෙරසමො.**

---

## [ 14. සන්ථාරවග්ගො ]

**[සාවත්ථිනිදානං:]**

**2. 3. 14. 1.**

38. ද්වෙමෙ භික්ඛවෙ සන්ථාරා. කතමෙ ද්වෙ: ආමිසසන්ථාරො ච ධම්ම-සන්ථාරො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ සන්ථාරා. එතදග්ගා භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සන්ථාරානං යදිදං ධම්මසන්ථාරොති.

**2. 3. 14. 2.**

39. ද්වෙමෙ භික්ඛවෙ පටිසන්ථාරා. කතමෙ ද්වෙ: ආමිසපටිසන්ථාරො ච ධම්මපටිසන්ථාරො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පටිසන්ථාරා එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං පටිසන්ථාරානං යදිදං ධම්මපටිසන්ථාරොති.

**2. 3. 14. 3.**

40. ද්වෙමා භික්ඛවෙ එසනා කතමා ද්වෙ: ආමිසෙසනා ච ධම්මෙසනා ච ඉමා ඛො භික්ඛවෙ ද්වෙ එසනා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං එසනානං යදිදං ධම්මෙසනාති.

**2. 3. 14. 4.**

41. ද්වෙමා භික්ඛවෙ පරියෙසනා. කතමා ද්වෙ: ආමිසපරියෙසනා ච ධම්මපරියෙසනා ච. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරියෙසනා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරියෙසනානං යදිදං ධම්මපරියෙසනාති.

**2. 3. 14. 5.**

42. ද්වෙමා භික්ඛවෙ පරියෙට්ඨියො. කතමා ද්වෙ: ආමිසපරියෙට්ඨි ච ධම්මපරියෙට්ඨි ච. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරියෙට්ඨියො. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරියෙට්ඨීනං යදිදං ධම්මපරියෙට්ඨීති.

2. 3. 13. 9.

36. මහණෙනි, මේ අනුග්‍රහයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂඅනුග්‍රහය හා ධර්මඅනුග්‍රහය හා යන දෙදෙනා යි. මහණෙනි, මේ වනාහි අනුග්‍රහයෝ දෙදෙනා ය. මහණෙනි, මේ අනුග්‍රහයන් දෙදෙනා අතුරෙන් යම් ධර්මඅනුග්‍රහයෙක් වේ නම්, තෙල අග්‍ර වේ යයි.

2. 3. 13. 10.

37. මහණෙනි, මේ අනුකම්පාවෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂඅනුකම්පාව හා ධර්මානුකම්පාව හා යන දෙදෙනා යි. මහණෙනි, මේ වනාහි අනුකම්පාවෝ දෙදෙනා ය. මහණෙනි, මේ අනුකම්පාවන් දෙදෙනා අතුරෙන් යම් ධර්මානුකම්පාවෙක් වේ නම්, තෙල අග්‍ර වේ යයි.

තෙළෙස්වන වගයි.

---

## [ 14. සන්ථාරවර්ගය ]

[සැවැත්නිදනයි:]

2. 3. 14. 1.

38. මහණෙනි, මේ සන්ථාරයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂසන්ථාරය හා ධර්මසන්ථාරය හා යන දෙදෙනායි. මහණෙනි, මේ වනාහි සන්ථාරයෝ දෙදෙනාය. මහණෙනි, මේ සන්ථාරයන් දෙදෙනා අතුරෙන් යම් ධර්මසන්ථාරයෙක් වේ නම්, තෙල අග්‍ර වේ යයි.

2. 3. 14. 2.

39. මහණෙනි, මේ පටිසන්ථාරයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂපටිසන්ථාරය හා ධර්මපටිසන්ථාරය හා යන දෙදෙනායි. මහණෙනි, මේ වනාහි පටිසන්ථාරයෝ දෙදෙනාය. මහණෙනි, මේ පටිසන්ථාරයන් දෙදෙනා අතුරෙන් යම් ධර්මපටිසන්ථාරයෙක් වේ නම්, තෙල අග්‍ර වේ යයි.

2. 3. 14. 3.

40. මහණෙනි, මේ ඒසනාවෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිසඒසනාව හා ධම්මඒසනාව හා යන දෙදෙනායි. මහණෙනි, මේ වනාහි ඒසනාවෝ දෙදෙනාය. මහණෙනි, මේ එසනාවන් දෙදෙනා අතුරෙන් යම් ධම්මඒසනාවෙක් වේ නම්, තෙල අග්‍ර වේ යයි.

2. 3. 14. 4.

41. මහණෙනි, මේ පරියේසනාවෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිසපරියේසනාව හා ධම්මපරියේසනාව හා යන දෙදෙනායි. මහණෙනි, මේ වනාහි පරියෙසනා දෙකය. මහණෙනි, මේ පරියේසනාවන් දෙදෙනා අතුරෙන් යම් ධම්මපරියේසනාවෙක් වේ නම්, තෙල අග්‍ර වේ යයි.

2. 3. 14. 5.

42. මහණෙනි, මේ (මුදුන්පත්සෙවීම්) පරියෙට්ඨීහු දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිසපරියෙට්ඨිය හා ධම්මපරියෙට්ඨිය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි පරියෙට්ඨීහු දෙදෙනාය. මහණෙනි, මේ පරියෙට්ඨීන් දෙදෙනා අතුරෙන් යම් ධම්මපරියෙට්ඨියෙක් වේ ද, මෙය අග්‍ර වේ යයි.

### 2. 3. 14. 6

43. ද්වෙමා භික්ඛවෙ පූජා. කතමා ද්වෙ: ආමිසපූජා ච ධම්මපූජා ච. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පූජා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පූජානං යදිදං ධම්මපූජාති.

### 2. 3. 14. 7.

44. ද්වෙමානි භික්ඛවෙ ආතිථෙය්‍යානි. කතමානි ද්වෙ: ආමිසාතිථෙය්‍යඤ්ච ධම්මාතිථෙය්‍යඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ ආතිථෙය්‍යානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං ආතිථෙය්‍යානං යදිදං ධම්මාතිථෙය්‍යන්ති.

### 2. 3. 14. 8.

45. ද්වෙමා භික්ඛවෙ ඉද්ධියො. කතමා ද්වෙ: ආමිසිද්ධි ච ධම්මිද්ධි ච. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ ඉද්ධියො. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං ඉද්ධීනං යදිදං ධම්මිද්ධීති.

### 2. 3. 14. 9.

46. ද්වෙමා භික්ඛවෙ වුද්ධියො. කතමා ද්වෙ: ආමිසවුද්ධි ච ධම්මවුද්ධි ච. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ වුද්ධියො. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං වුද්ධීනං යදිදං ධම්මවුද්ධීති

### 2. 3. 14. 10.

47. ද්වෙමානි භික්ඛවෙ රතනානි. කතමානි ද්වෙ: ආමිසරතනඤ්ච ධම්මරතනඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ රතනානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං රතනානං යදිදං ධම්මරතනන්ති.

### 2. 3. 14. 11.

48. ද්වෙමෙ භික්ඛවෙ සන්නිචයා. කතමෙ ද්වෙ: ආමිසසන්නිචයො ච ධම්මසන්නිචයො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ සන්නිචයා. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සන්නිචයානං යදිදං ධම්මසන්නිචයොති.

### 2. 3 14. 12

49. ද්වෙමානි භික්ඛවෙ වෙපුල්ලානි. කතමානි ද්වෙ: ආමිසවෙපුල්ලඤ්ච ධම්මවෙපුල්ලඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ වෙපුල්ලානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං වෙපුල්ලානං යදිදං ධම්මවෙපුල්ලන්ති.

**වග්ගො චුද්දසමො.**

**2. 3. 14. 6.**

43. මහණෙනි, මේ පූජාවෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිසපූජාව හා ධම්මපූජාව හා යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි පූජාවෝ දෙදෙනාය. මහණෙනි, මේ පූජාවන් දෙදෙනා අතුරෙන් යම් ධම්පූජාවෙක් වේ ද මෙය අග්‍රවේ යයි.

**2. 3. 14. 7.**

44. මහණෙනි, මේ ආගන්තුකදානයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිසයෙන් කරණ ආගන්තුකදානය හා ධම්මයෙන් කරණ ආගන්තුකදානය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ආගන්තුකදාන දෙකය. මහණෙනි, මේ ආගන්තුකදානයන් දෙදෙනා අතුරෙන් යම් ධම්යෙන් කරණ ආගන්තුකදානයෙක් වේ ද මෙය අග්‍රවේ යයි.

**2. 3. 14. 8.**

45. මහණෙනි, මේ සෘද්ධීහු දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂ සෘද්ධිය හා ධම් සෘද්ධිය හා යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි සෘද්ධීහු දෙදෙනාය. මහණෙනි, මේ සෘද්ධීන් දෙදෙනා අතුරෙන් යම් ධම් සෘද්ධියෙක් වේ නම් මෙය අග්‍රවේ යයි.

**2. 3. 14. 9.**

46. මහණෙනි, මේ වෘද්ධීහු දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂවෘද්ධිය හා ධම්වෘද්ධිය හා යන දෙදෙනා ය. මහණෙනි, මේ වෘද්ධීන් දෙදෙනා අතුරෙන් යම් ධම්වෘද්ධියෙක් වේ ද මෙය අග්‍රවේ යයි.

**2. 3. 14. 10.**

47. මහණෙනි, මේ රත්නයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂරත්නය හා ධම්රත්නය හා යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි රත්නයෝ දෙදෙනාය. මහණෙනි, මේ රත්නයන් දෙදෙනා අතුරෙන් යම් ධම්රත්නයෙක් වේ ද මෙය අග්‍රවේ යයි.

**2. 3. 14. 11.**

48. මහණෙනි, මේ සන්නිචයයෝ (රැස්කිරීම්) දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂසන්නිචය හා ධම්මසන්නිචය හා යන දෙදෙනාය. මහණෙනි, මේ සන්නිචයයන් දෙදෙනා අතුරෙන් යම් ධම්මසන්නිචයයෙක් වේ ද මෙය අග්‍රවේ යයි.

**2. 3. 14. 12.**

49. මහණෙනි, මේ වෛපුල්‍යයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ආමිෂවෛපුල්‍යය හා ධම්මවෛපුල්‍යය හා යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි වෛපුල්‍යයෝ දෙදෙනාය. මහණෙනි, මේ වෛපුල්‍යයන් දෙදෙනා අතුරෙන් යම් ධම්වෛපුල්‍යයෙක් වේ ද මෙය අග්‍රවේ යයි.

**තුදුස්වන වග යි.**

# [ 15. සමාපත්තිවග්ගො ]

[සාවත්ථිනිදානං]

### 2. 3. 15. 1.

50. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: සමාපත්තිකුසලතා ච සමාපත්තිවුට්ඨානකුසලතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.[1]

### 2. 3. 15. 2.

51. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: අජ්ජවඤ්ච. මද්දවඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

### 2. 3. 15. 3.

52. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: ඛන්ති ච සොරච්චඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

### 2. 3. 15. 4.

53. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: සාඛල්‍යඤ්ච පටිසන්ථාරො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

### 2. 3. 15. 5.

54. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: අවිහිංසා[2] ච සොචෙය්‍යඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

### 2. 3. 15. 6

55. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා ච භොජනෙ අමත්තඤ්ඤුතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

### 2. 3. 15. 7.

56. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා ච භොජනෙ මත්තඤ්ඤුතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

### 2. 3. 1 . 8.

57. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: පටිසඞ්ඛානබලඤ්ච භාවනා-බලඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

### 2. 3. 15. 9.

58. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: සතිබලඤ්ච සමාධිබලඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

---

1. අහිංසා ච - මජසං. 2. මුට්ඨස්සච්චඤ්ච - මජසං.

# [ 15. සමාපත්තිවර්ගය ]

[සැවැත්නිදනයි:]

**2. 3. 15. 1.**

50. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් වෙති. කවර දෙදෙනෙක යත්: සමාපත්තියෙහි දක්‍ෂ බව හා සමාපත්තියෙන් නැගී සිටීමෙහි දක්‍ෂ බව හා යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙනා යි.

**2. 3. 15. 2.**

51. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ඍජුභවය හා මෘදුභවය හා යන දෙදෙනාය මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙනා යි.

**2. 3. 15. 3.**

52. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ක්‍ෂාන්තිය (ඉවසීම) හා සුරතබව හා යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙනා යි.

**2. 3. 15. 4.**

53. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: සඛිල (මොලොක් තෙපුල් ඇති) බව හා පටිසන්ථාරය (පිළිසඳර) හා යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙනා යි.

**2. 3. 15. 5.**

54. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් වෙති. කවර දෙදෙනෙක යත්: (කරුණා පූර්වභාගය වූ අවිහිංසාව හා (ශීලවශයෙන් පිරිසිදු බව) සුචිභාවය හා යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙනා යි.

**2. 3. 15. 6.**

55. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ඉඳුරන්හි නො පියූදොර ඇති බව හා භොජනයෙහි පමණ නොදන්නා බව හා යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙනා යි.

**2. 3. 15. 7.**

56. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ඉඳුරන්හි පියූ දොර ඇති බව ද, භොජනයෙහි පමණ දන්නා බව ද යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙනා යි.

**2. 3. 15. 8.**

57. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් වෙති. කවර දෙදෙනෙක යත්: ප්‍රත්‍යවෙක්‍ෂාබලය හා භාවනාබලය හා යන දෙදෙනාය. මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙනා යි.

**2. 3. 15. 9.**

58. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: සමෘතිබලය හා සමාධිබලය හා යන දෙදෙනාය, මහණෙනි, මේ වනාහි ධර්මයෝ දෙදෙනා යි.

**2. 3. 15. 10.**

59. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: සමථො ච විපස්සනා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

**2. 3. 15. 11.**

60. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: සීලවිපත්ති ච දිට්ඨිවිපත්ති ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

**2. 3. 15. 12.**

61. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: සීලසම්පදා ච දිට්ඨිසම්පදා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

**2. 3. 15. 13.**

62. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ, සීලවිසුද්ධි ච දිට්ඨිවිසුද්ධි ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

**2. 3. 15. 14.**

63. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: දිට්ඨිවිසුද්ධි ච යථාදිට්ඨිස්ස ච පධානං. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

**2. 3. 15 15.**

64. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු අප්පටිවානිතා ච පධානස්මිං. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

**2. 3. 15. 16.**

65. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: මුට්ඨස්සච්චඤ්ච අසම්පජඤ්ඤඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

**2. 3. 15. 17.**

66. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: සති ච සම්පජඤ්ඤඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

**වග්ගො පණ්ණරසමො.**

**තතියො පණ්ණාසකො සමත්තො.**

2. 3. 15. 10.

59. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ශමථය හා විදර්ශනාව හා යන දෙදෙනාය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනා යි.

2. 3. 15. 11.

60. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ශීලවිපත්තිය හා දෘෂ්ටිවිපත්තිය හා යන දෙදෙනාය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනා යි.

2. 3. 15. 12.

61. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ශීලසම්පදාව හා දෘෂ්ටිසම්පදාව හා යන දෙදෙනාය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනා යි.

2. 3. 15. 13.

62. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ශීලවිශුද්ධිය හා දෘෂ්ටිවිශුද්ධිය හා යන දෙදෙනාය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනා යි.

2. 3. 15. 14.

63. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: දෘෂ්ටිවිශුද්ධිය හා දෘෂ්ටිය වූ පරිදි ප්‍රධන්වීර්‍ය්‍ය කිරීම හා යන දෙදෙනාය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනා යි.

2. 3. 15. 15.

64. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: කුශලධර්මයෙහි අසන්තුෂ්ටභාවය හා ප්‍රධන්වීර්‍ය්‍යයෙහි නො පසුබස්නා බව හා යන දෙදෙනාය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනා යි.

2. 3. 15. 16.

65. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: මුළාසිහිය හා නුනුවණ බව හා යන දෙදෙනාය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනා යි.

2. 3. 15. 17.

66. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙකි. කවර දෙදෙනෙක යත්: ස්මෘතිය හා සම්ප්‍රජන්‍යය හා යන දෙදෙනාය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනා යි.

**පසළොස්වන වර්‍ගයි.**

**තුන්වන පණ්ණාසකය නිමි.**

## [ 16. කොධවග්ගො ]

**[සාවත්ථිනිදානං:]**

### 2. 16 1—5.

ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: කොධො ච උපනාහො ච -පෙ- මක්ඛො ච පළාසො ච - ඉස්සා ච මච්ඡරියඤ්ච - මායා ච සාඨෙය්‍යඤ්ච-අහිරිකඤ්ච අනොත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

### 2. 16. 6—10.

ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: අක්කොධො ච අනුපනාහො ච -පෙ- අමක්ඛො ච අපළාසො ච - අනිස්සා ච අමච්ඡරියඤ්ච - අමායා ච අසාඨෙය්‍යඤ්ච - හිරි ච ඔත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා.

### 2. 16. 11—15.

ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො දුක්ඛං විහරති. කතමෙහි ද්වීහි: කොධෙන ච උපනාහෙන ච -පෙ- මක්ඛෙන ච පළාසෙන ච - ඉස්සාය ච මච්ඡරියෙන ච - මායාය ච සාඨෙය්‍යෙන ච - අහිරිකෙන ච - අනොත්තප්පෙන ච - ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො දුක්ඛං විහරති.

### 2. 16. 16—20.

ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සුඛං විහරති. කතමෙහි ද්වීහි: අක්කොධෙන ච අනුපනාහෙන ච -පෙ- අමක්ඛෙන ච අපළාසෙන ච - අනිස්සාය ච අමච්ඡරියෙන ච - අමායාය ච අසාඨෙය්‍යෙන ච - හිරියා ච ඔත්තප්පෙන ච - ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො සුඛං විහරති.

### 2. 16. 21—25

ද්වෙමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති. කතමෙ ද්වෙ: කොධො ච උපනාහො ච -පෙ- මක්ඛො ච පළාසො ච - ඉස්සා ච මච්ඡරියඤ්ච - මායා ච සාඨෙය්‍යඤ්ච - අහිරිකඤ්ච අනොත්තප්පඤ්ච - ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති.

### 2. 16. 26—30.

ද්වෙමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ ද්වෙ: අක්කොධො ච අනුපනාහො ච -පෙ- අමක්ඛො ච අපළාසො ච - අනිස්සා ච අමච්ඡරියඤ්ච - අමායා ච අසාඨෙය්‍යඤ්ච - හිරි ච ඔත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති.

# [ 16. ක්‍රොධ වර්ගය ]

[සැවැත්නිදානයි:]

## 2. 16. 1—5.

මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් වෙති. කවර දෙදෙනෙක යත්: ක්‍රොධය හා උපනාහය හා යන දෙක ය ... මක්ඛය හා පලාසය හා දෙකය. .... ඊර්ෂ්‍යාව හා මාත්සර්‍ය්‍යය හා දෙකය. ... මායාව හා සාඨෙය්‍ය හා දෙක ය. ... අහිරිකය හා අනොත්තප්පය හා දෙක ය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනා යි.

## 2. 16. 6—10.

මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනෙක් වෙති. කවර දෙදෙනෙක යත්: අක්‍රොධය හා අනුපනාහය හා දෙක ය. ... අමක්ඛය හා අපලාසය හා දෙක ය. ... අනිස්සාව හා අමච්ඡරිය හා දෙක ය. ... අමායාව හා අසාඨෙය්‍ය හා දෙක ය. ... හිරිය හා ඔත්තප්පය හා දෙක ය. මහණෙනි, මේ ධර්මයෝ දෙදෙනා යි.

## 2. 16. 11. 15.

මහණෙනි, ධර්ම දෙකෙකින් සමන්‍වාගත වූයේ දුක සේ වෙසෙයි. කවර දෙකෙකින යත්: ක්‍රොධයෙන් හා උපනාහයෙන් හා දෙකෙනි. ... මක්ඛයෙන් හා පලාසයෙන් හා දෙකෙනි. ... ඊර්ෂ්‍යායෙන් හා මාත්සර්‍ය්‍යයෙන් හා දෙකෙනි ... මායාවෙන් හා සාඨෙය්‍යයෙන් හා දෙකෙනි. ... අහිරිකයෙන් හා අනොත්තප්පයෙන් හා දෙකෙනි. මහණෙනි, මේ දහම් දෙකින් සමන්‍වාගත වූයේ දුක සේ වෙසේ යි.

## 2. 16. 16—20.

මහණෙනි, දහම් දෙකෙකින් සමන්‍වාගත වූයේ සුවසේ වෙසෙයි. කවර දෙකෙකින යත්: අක්‍රොධයෙන් හා අනුපනාහයෙන් හා දෙකෙනි. ... අමක්ඛයෙන් හා අපලාසයෙන් හා දෙකෙනි. ...අනීර්ෂ්‍යායෙන් හා අමාත්සර්‍ය්‍ය-යෙන් හා දෙකෙනි. ... අමායාවෙන් හා අසාඨෙය්‍යයෙන් හා දෙකෙනි. ... හිරියෙන් හා ඔත්තප්පයෙන් හා දෙකෙනි. මහණෙනි, මේ දහම් දෙකින් සමන්‍වාගත වූයේ සුවසේ වෙසේ යි.

## 2. 16. 21—25.

මහණෙනි, ශෛක්‍ෂ භික්‍ෂුහුගේ පිරිහීම පිණිස මේ ධර්මයෝ දෙදෙනෙක් පවතිත්. කවර දෙදෙනෙක යත්: ක්‍රොධය හා උපනාහය හා දෙක ය. .... මක්ඛය හා පලාසය හා දෙක ය ඊර්ෂ්‍යාව හා මාත්සර්‍ය්‍යය හා දෙක ය. ... මායාව හා සාඨෙය්‍ය හා දෙක ය. ... අහිරිකය හා අනොත්තප්පය හා දෙක ය. මහණෙනි, ශෛක්‍ෂ භික්‍ෂුහුගේ පිරිහීම පිණිස මේ ධර්මයෝ දෙදෙන පවතිත්.

## 2. 16. 26—30.

මහණෙනි, ශෛක්‍ෂ භික්‍ෂුහුගේ නො පිරිහීම පිණිස මේ ධර්මයෝ දෙදෙ-නෙක් පවතිත්. කවර දෙදෙනෙක යත්: අක්‍රොධය හා අනුපනාහය හා දෙක ය. ... අමක්ඛය හා අපලාසය හා දෙක ය. ... අනීර්ෂ්‍යාව හා අමාත්සර්‍ය්‍යය හා දෙක ය. ... අමායාව හා අසාඨෙය්‍ය හා දෙක ය. ... හිරිය හා ඔත්තප්පය හා දෙක ය. මහණෙනි, ශෛක්‍ෂ භික්‍ෂුහුගේ නො පිරිහීම පිණිස මේ ධර්මයෝ දෙදෙන පවතිත්.

## 2. 16. 31—35.

ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි ද්වීහි: කොධෙන ච උපනාහෙන ච - මක්ඛෙන ච පලාසෙන ච - ඉස්සාය ච මච්ඡරියෙන ච - මායාය ච සාඨෙය්‍යෙන ච - අහිරිකෙන ච අනොත්තප්පෙන ච. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

## 2. 16. 36—40.

ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි ද්වීහි: අක්කොධෙන ච අනුපනාහෙන ච - අමක්ඛෙන ච අපලාසෙන ච - අනිස්සාය ච අමච්ඡරියෙන ච - අමායාය ච අසාඨෙය්‍යෙන ච - හිරියා ච ඔත්තප්පෙන ච. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 2. 16. 41—45.

ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ඉධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි ද්වීහි: කොධෙන ච උපනාහෙන ච - මක්ඛෙන ච පලාසෙන ච - ඉස්සාය ච මච්ඡරියෙන ච - මායාය ච සාඨෙය්‍යෙන ච - අහිරිකෙන ච අනොත්තප්පෙන ච. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො ඉධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

## 2. 16. 46—50

ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ඉධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි ද්වීහි: අක්කොධෙන ච අනුපනාහෙන ච -පෙ- අමක්ඛෙන ච අපලාසෙන ච -පෙ- අනිස්සාය ච අමච්ඡරියෙන ච -පෙ- අමායාය ච අසාඨෙය්‍යෙන ච -පෙ- හිරියා ච ඔත්තප්පෙන ච. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො ඉධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

**වග්ගො සොළසමො.**

1 සග්ගෙ - මජසං.

## 2. 16. 31—35.

මහණෙනි, ධර්ම දෙකෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ වේ ද, එසෙයින් නිරයෙහි වේ. කවර දෙකෙකින යත්: ක්‍රොධයෙන් හා උපනාහයෙන් හා දෙකෙනි. ... මක්‍ඛයෙන් හා පලාසයෙන් හා දෙකෙනි. ... ඊර්ෂ්‍යායෙන් හා මාත්සර්‍ය්‍යයෙන් හා දෙකෙනි. ... මායාවෙන් හා සාඨෙය්‍ය-යෙන් හා දෙකෙනි. ... අහිරිකයෙන් හා අනොත්තප්පයෙන් හා දෙකෙනි. මහණෙනි, මේ දහම් දෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ වේ ද, එසෙයින් නිරයෙහි වේ.

## 2. 16. 36—40.

මහණෙනි, දහම් දෙකෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ වේ ද, එසෙයින් ස්වර්ගයෙහි ය. කවර දෙකෙකින යත්: අක්‍රොධයෙන් හා අනුපනාහයෙන් හා දෙකෙනි. ... අමක්‍ඛයෙන් හා අපලාසයෙන් හා දෙකෙනි. ... අනීර්ෂ්‍යායෙන් හා අමාත්සර්‍ය්‍යයෙන් හා දෙකෙනි. ... අමායාවෙන් හා අසාඨෙය්‍යයෙන් හා දෙකෙනි. ... හිරියෙන් හා ඔත්තප්පයෙන් හා දෙකෙනි. මහණෙනි, මේ දහම් දෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් බහා තැබූයේ යම්සේ වේ ද එසෙයින් ස්වර්ගයෙහි වේ.

## 2. 16. 41—45.

මහණෙනි, මෙලොවෙහි ඇතැමෙක් දහම් දෙකෙකින් සමන්‍වාගත වූයේ කාබුන් මරණින් මතු අපාය නම් වූ, දුගති නම් වූ, විනිපාත නම් වූ නිරයට (පටිසන්‍ධි විසින්) පැමිණේ. කවර දෙකෙකින යත්: ක්‍රොධයෙන් හා උපනාහ යෙන් හා දෙකෙනි. ... මක්‍ඛයෙන් හා පලාසයෙන් හා දෙකෙනි. ... ඊර්ෂ්‍යායෙන් හා මාත්සර්‍ය්‍යයෙන් හා දෙකෙනි. ... මායාවෙන් හා සාඨෙය්‍යයෙන් හා දෙකෙනි. ... අහිරිකයෙන් හා අනොත්තප්පයෙන් හා දෙකෙනි. මහණෙනි, මෙලොවෙහි ඇතැමෙක් මේ දහම් දෙකින් සමන්‍වාගත වූයේ කාබුන් මරණින් මතු අපාය නම් වූ, දුගති නම් වූ නිරයට (පටිසන්‍ධි විසින්) පැමිණේ.

## 2. 16. 46—50.

මහණෙනි, මෙලොවෙහි ඇතැමෙක් දහම් දෙකෙකින් සමන්‍වාගත වූයේ කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට (පටිසන්‍ධි විසින්) පැමිණේ. කවර දෙකෙකින යත්: අක්‍රොධයෙන් හා අනුපනාහයෙන් හා දෙකෙනි. ... අමක්‍ඛයෙන් හා අපලාසයෙන් හා දෙකෙනි. ... අනීර්ෂ්‍යායෙන් හා අමාත්සර්‍ය්‍ය-යෙන් හා දෙකෙනි. ... අමායාවෙන් හා අසාඨෙය්‍යයෙන් හා දෙකෙනි. ... හිරියෙන් හා ඔත්තප්පයෙන් හා දෙකෙනි. මහණෙනි, මෙලොවෙහි ඇතැමෙක් මේ දහම් දෙකින් සමන්‍වාගත වූයේ කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට (පටිසන්‍ධි විසින්) පැමිණේ.

**සොළොස්වන වර්‍ගයි.**

# [ 17. සත්තරසමො වග්ගො ]

## 1. අකුසලපෙය්‍යාලං

### 1—50.

ද්වෙමෙ භික්ඛවෙ ධම්මා අකුසලා -පෙ- ද්වෙමෙ භික්ඛවෙ ධම්මා කුසලා -පෙ- ද්වෙමෙ භික්ඛවෙ ධම්මා සාවජ්ජා -පෙ- ද්වෙමෙ භික්ඛවෙ ධම්මා අනවජ්ජා -පෙ- ද්වෙමෙ භික්ඛවෙ ධම්මා දුක්ඛුද්‍රයා -පෙ- ද්වෙමෙ භික්ඛවෙ ධම්මා සුඛුද්‍රයා -පෙ- ද්වෙමෙ භික්ඛවෙ ධම්මා දුක්ඛවිපාකා -පෙ- ද්වෙමෙ භික්ඛවෙ ධම්මා සුඛවිපාකා -පෙ- ද්වෙමෙ භික්ඛවෙ ධම්මා සබ්‍යාපජ්ඣා -පෙ- ද්වෙමෙ භික්ඛවෙ ධම්මා අබ්‍යාපජ්ඣා. කතමෙ ද්වෙ: අක්කොධො ච අනුපනාහො ච -පෙ- අමක්ඛො ච අපළාසො ච -පෙ- අනිස්සා ච අමච්ඡරියඤ්ච -පෙ- අමායා ච අසාඨෙය්‍යඤ්ච -පෙ- හිරි ච ඔත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා අබ්‍යාපජ්ඣාති.

---

## 2. විනයපෙය්‍යාලං

### 1—10

ද්වෙමෙ භික්ඛවෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං. කතමෙ ද්වෙ: සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය -පෙ- දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය -පෙ- දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය -පෙ- දිට්ඨධම්මිකානං වෙරානං සංවරාය, සම්පරායිකානං වෙරානං පටිඝාතාය -පෙ- දිට්ඨධම්මිකානං වජ්ජානං සංවරාය, සම්පරායිකානං වජ්ජානං පටිඝාතාය -පෙ- දිට්ඨධම්මිකානං භයානං සංවරාය, සම්පරායිකානං භයානං පටිඝාතාය -පෙ- දිට්ඨධම්මිකානං අකුසලානං ධම්මානං සංවරාය, සම්පරායිකානං අකුසලානං ධම්මානං පටිඝාතාය -පෙ- ගිහීනං අනුකම්පාය, පාපිච්ඡානං[1] පක්ඛුපච්ඡෙදාය -පෙ- අප්පසන්නානං පසාදාය, පසන්නානං භිය්‍යොභාවාය -පෙ- සද්ධම්මට්ඨිතියා විනයානුග්ගහාය. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තන්ති.

### 11—300

ද්වෙමෙ භික්ඛවෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං පාතිමොක්ඛං පඤ්ඤත්තං -පෙ- පාතිමොක්ඛුද්දෙසා පඤ්ඤත්තා -පෙ- පාතිමොක්ඛට්ඨපනං පඤ්ඤත්තං -පෙ- පවාරණා පඤ්ඤත්තා -පෙ- පවාරණට්ඨපනං පඤ්ඤත්තං -පෙ- තජ්ජනීයකම්මං පඤ්ඤත්තං -පෙ- නියස්සකම්මං පඤ්ඤත්තං -පෙ- පබ්බාජනීයකම්මං පඤ්ඤත්තං -පෙ- පටිසාරණීයකම්මං පඤ්ඤත්තං -පෙ- උක්ඛෙපනීයකම්මං පඤ්ඤත්තං -පෙ- පරිවාසදානං පඤ්ඤත්තං -පෙ- මූලායපටිකස්සනං පඤ්ඤත්තං -පෙ- මානත්තදානං පඤ්ඤත්තං -පෙ- අබ්භානං පඤ්ඤත්තං -පෙ- ඔසාරණීයං පඤ්ඤත්තං -පෙ- නිස්සාරණීයං පඤ්ඤත්තං -පෙ- උපසම්පදා පඤ්ඤත්තා -පෙ- ඤත්තිකම්මං පඤ්ඤත්තං -පෙ- ඤත්තිදුතියකම්මං පඤ්ඤත්තං -පෙ- ඤත්තිචතුත්ථකම්මං පඤ්ඤත්තං -පෙ- අපඤ්ඤත්තෙ පඤ්ඤත්තං -පෙ- පඤ්ඤත්තෙ අනුපඤ්ඤත්තං -පෙ- සම්මුඛාවිනයො පඤ්ඤත්තො -පෙ- සතිවිනයො පඤ්ඤත්තො -පෙ- අමූළ්හවිනයො පඤ්ඤත්තො -පෙ- පටිඤ්ඤාතකරණං පඤ්ඤත්තං -පෙ- යෙභුය්‍යසිකා පඤ්ඤත්තා -පෙ- තස්සපාපිය්‍යසිකා පඤ්ඤත්තා -පෙ- තිණවත්ථාරකො පඤ්ඤත්තො.

---

1. පාපිච්ඡානං භික්ඛූනං -මජසං. 2 අනුපඤ්ඤත්තං -මජසං.

# [ 17. සතලොඃස්වතාවග ]

## 1. අකුශල පෙය්‍යාලය

### 1.- 50.

මහණෙනි, මේ අකුසල් දහම්හු දෙදෙනෙක් වෙති ... මහණෙනි, මේ කුසල් දහම්හු දෙදෙනෙක් වෙති ... මහණෙනි, මේ සාවද්‍යධර්මයෝ දෙදෙනෙක් වෙති ... මහණෙනි, මේ අනවද්‍යධර්මයෝ දෙදෙනෙක් වෙති. ... මහණෙනි, මේ දුක් වඩන දහම්හු දෙදෙනෙක් වෙති. ... මහණෙනි, මේ සුව වඩන දහම්හු දෙදෙනෙක් වෙති. ... මහණෙනි, මේ දුඃඛවිපාක ඇති දහම්හු දෙදෙනෙක් වෙති. ... මහණෙනි, මේ සුඛ විපාක ඇති දහම්හු දෙදෙනෙක් වෙති. ... මහණෙනි, මේ දුක් සහිත දහම්හු දෙදෙනෙක් වෙති. ... මහණෙනි, මේ නිදුක් දහම්හු දෙදෙනෙක් වෙති. ... කවර දෙදෙනෙක යත්: අක්‍රොධය හා අනුපනාහය හා ... අම්‍රක්ෂය හා අපලාසය හා ... අනීර්ෂ්‍යාව හා අමාත්සර්‍ය්‍ය හා ... අමායාව හා අසාඨෙය්‍යය හා ... හිරිය හා ඔත්තප්පය හා දෙදෙන වෙති. මහණෙනි, මේ දහම්හු දෙදෙන නිදුක් දහම්හු වෙති.

අකුශල පෙය්‍යාලය නිමි.

---

## 2. විනය පෙය්‍යාලය

### 1—10.

මහණෙනි, කරුණු දෙකක් පිණිස තථාගතයන් වහන්සේ විසින් සව්වනට සිකපද පණවන ලදී.

කවර දෙකෙක යත්: සඞ්ඝයාගේ සුෂ්ඨුභාවය පිණිස හා සඞ්ඝයාගේ ඵාසුභාවය පිණිස හා යි ... දුසිල් පුතුලනට නිගා පිණිස හා පෙශල මහණුනට ඵාසුවිහාරය පිණිස හා යි ... ඉහාත්මයෙහි වන ආස්‍රවයන් ගේ සංවරය පිණිස හා පරලොව්හි වන ආස්‍රවයන් වැළහීම පිණිස හා යි ... ඉහාත්මයෙහි වන වෛරයන් ගේ සංවරය පිණිස හා පරලොව්හි වන වෛරයන්ගේ වැළහීම පිණිස හා යි ... ඉහාත්මයෙහි වන දෙෂයන්ගේ සංවරය පිණිස හා පරලොව්හි වන දෙෂයන්ගේ වැළහීම පිණිස හා යි. ... ඉහාත්මයෙහි වන බිය වැළහීම පිණිස හා පරලොව්හි වන බිය වැළහීම පිණිස හා යි ... ඉහාත්මයෙහි වන අකුශල ධර්මයන්ගේ වැළහීම පිණිස හා පරලොව්හි වන අකුශලධර්මයන්ගේ වැළහීම පිණිස හා යි. ... ගිහියනට අනුකම්පා පිණිස හා පාපෙච්ඡයන්ගේ පක්ෂොපච්ඡෙදය පිණිස හා යි. ... අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හා ප්‍රසන්නයන්ගේ භූයොභාවය පිණිස හා යි. ... සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස හා විනයානුග්‍රහය පිණිස හා යි. ... මහණෙනි, මේ කරුණු දෙක පිණිස තථාගතයන් වහන්සේ විසින් සව්වනට සිකපද පණවන ලදී.

### 11—300

මහණෙනි, මේ කරුණු දෙකක් පිණිස තථාගතයන් වහන්සේ විසින් සව්වනට පාමොක් පණවන ලදී. ... පාමොක් උදෙසුම් පණවන ලදී. ... පාමොක් තැබීම් පණවන ලදී. ... පවාරණා පණවන ලදු ... පවාරණ තැබුම් පණවන ලදී. .. තජ්ජනීය කර්මය පණවන ලදී.... නියස්සකර්මය පණවන ලදී.... පබ්බාජනීයකර්මය පණවන ලදී. ... පටිසාරණීයකර්මය පණවන ලදී. ... උක්ඛෙපනීයකර්මය පණවන ලදී. ... පරිවාසදානය පණවන ලදී. ... මූලායපටිකස්සනය පණවන ලදී. ... මානත්තදානය පණවන ලදී. ... අබ්භානය පණවන ලදී. ... ඔසාරණීයය පණවන ලදී. ... නිස්සාරණීයය පණවන ලදී. ... උපසපුව පණවන ලදී. ... ඤත්තිකර්මය පණවන ලදී. ... ඤත්තිදුතියකර්මය පණවන ලදී. ... ඤත්තිචතුත්ථකර්මය පණවන ලදී. ... නො පණවන ලද්දෙහි (සිකපද) පණවන ලදී. ... පණවන ලද්දෙහි අනුපපඤ්ඤත්ති පණවන ලදු. ... සම්මුඛාවිනය පණවන ලදී. ... සතිවිනය පණවන ලදී.... අමූළ්හවිනය පණවන ලදී. ... පටිඤ්ඤාතකරණය පණවන ලදී. යෙභුය්‍යසිකාව පණවන ලදී. ... තස්සපාපිය්‍යසිකාව පණවන ලදී. තිණවත්ථාරකය පණවන ලදී. ...

කතමෙ ද්වෙ: සඞ්ඝසුට්ඨුතාය -පෙ- සඞ්ඝඵාසුතාය -පෙ- දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය -පෙ- පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය -පෙ- දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය -පෙ- සම්පරායිකානං ආසවානං පටිඝාතාය -පෙ- දිට්ඨධම්මිකානං වෙරානං -පෙ- වජ්ජානං -පෙ- භයානං -පෙ- අකුසලානං ධම්මානං සංවරාය -පෙ- සම්පරායිකානං අකුසලානං ධම්මානං පටිඝාතාය -පෙ- ගිහීනං අනුකම්පාය -පෙ- පාපිච්ඡානං පක්ඛුපච්ඡේදාය -පෙ- අප්පසන්නානං පසාදාය -පෙ- පසන්නානං භීය්‍යොභාවාය -පෙ- සද්ධම්මට්ඨිතියා -පෙ- විනයානුග්ගහාය. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තොති.

**විනයපෙය්‍යාලං නිට්ඨිතං.**

---

**රාගපෙය්‍යාලං**

**1—10**

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ද්වෙ ධම්මා භාවෙතබ්බා. කතමෙ ද්වෙ: සමථො ච විපස්සනා ච. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ ද්වෙ ධම්මා භාවෙතබ්බා.

රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය. ඉමෙ ද්වෙ ධම්මා භාවෙතබ්බා.

**11—70**

දොසස්ස -පෙ- මොහස්ස -පෙ- කොධස්ස -පෙ- උපනාහස්ස -පෙ- මක්ඛස්ස -පෙ- පළාසස්ස -පෙ- ඉස්සාය -පෙ- මච්ඡරියස්ස -පෙ- මායාය -පෙ- සාඨෙය්‍යස්ස -පෙ- ථම්භස්ස -පෙ- සාරම්භස්ස -පෙ- මානස්ස -පෙ- අතිමානස්ස -පෙ- මදස්ස -පෙ- පමාදස්ස, අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය =පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය. ඉමෙ ද්වෙ ධම්මා භාවෙතබ්බාති.

**රාගපෙය්‍යාලං නිට්ඨිතං.**

**වග්ගො සත්තරසමො නිට්ඨිතො.**

## දුකනිපාතො සමත්තො.

කවර දෙකෙක යත්: සඞ්ඝයාගේ සුෂ්ඨුභාවය පිණිස හා ... සඞ්ඝයාගේ පහසුව පිණිස හා ... දුසිල් පුද්ගලයනට නිගා පිණිස හා ... පෙශල භික්ෂූනට එහි සුවවිහාරය පිණිස හා ... ඉහාත්මයෙහි වන ආශ්‍රවයන්ගේ සංවරය පිණිස හා...සාම්පරායික ආශ්‍රවයන්ගේ වැළකීම පිණිස හා ...දෘෂ්ටධාර්මික වෛරයන්ගේ...වද්‍යයන්ගේ... භීතීන්ගේ ... අකුශලධර්මයන්ගේ සංවරය පිණිස හා ... සම්පරායික අකුශල ධර්මයන්ගේ ප්‍රතිඝාතය පිණිස හා ... ගිහියනට අනුකම්පා පිණිස හා ... පාපෙච්ඡයන්ගේ පක්ෂොපච්ඡේදය පිණිස හා ... අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හා .... ප්‍රසන්නයන්ගේ භූයොභාවය පිණිස හා ... සද්ධර්මස්ථිතිය පිණිස හා ... විනයානුග්‍රහය පිණිස හා යි. මහණෙනි, මේ කරුණු දෙක පිණිස තථාගතයන් වහන්සේ විසින් සව්වනට තිණවත්ථාරකය පණවන ලදී.

**විනයපෙය්‍යාලය නිමි.**

---

**රාගපෙය්‍යාලය**

**1—10**

මහණෙනි, රාගය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ධර්මයෝ දෙදෙනෙක් වැඩිය යුත්තාහ.

කවර දෙදෙනෙක යත්: සමථය හා විදර්ශනාව හා දෙදෙන ය. මහණෙනි, රාගය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස මේ ධර්මයෝ දෙදෙන වැඩිය යුත්තාහ. මහණෙනි, රාගයාගේ පරිජානනය පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරෝධය පිණිස ... ත්‍යාගය පිණිස .. නිසර්ජනය පිණිස .... මේ ධර්මයෝ දෙදෙන වැඩිය යුත්තාහ.

**11—70**

මහණෙනි, ද්වෙෂයාගේ ... මෝහයාගේ...ක්‍රොධයාගේ...උපනාහයාගේ... මක්ඛයාගේ ... පලාසයාගේ .... ඊර්ෂ්‍යාවගේ ... මාත්සර්‍ය්‍යයාගේ ... මායාවගේ... .... ශඨභාවයාගේ ... ස්තම්භයාගේ සාරම්භයාගේ ... මානයාගේ ... අති-මානයාගේ .... මදයාගේ .. ප්‍රමාදයාගේ ... ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස .. පරිජා-නනය පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස .... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරෝධය පිණිස ... ත්‍යාගය පිණිස ... නිසර්ජනය පිණිස ... මේ ධර්මයෝ දෙදෙන වැඩිය යුත්තාහ.

**රාගපෙය්‍යාලය නිමි.**

**සතළොස්වන වර්ගය නිමි**

**දුකනිපාතය සමාප්තයි.**

# 3. තිකනිපාතො

## පඨමො පණ්ණාසකො

## [ 1. බාලවග්ගො ]

### 3. 1. 1. 1.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි, භික්ඛවො ති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

යානි කානිචි භික්ඛවෙ භයානි උප්පජ්ජන්ති. සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො. යෙ කෙචි උපද්දවා උප්පජ්ජන්ති, සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො. යෙ කෙචි උපසග්ගා[1] උප්පජ්ජන්ති, සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො.

සෙය්‍යථාපි භික්ඛවෙ නළාගාරෙ වා තිණාගාරෙ[2] වා අග්ගිමුක්කො[3] කූටාගාරානිපි ඩහති උල්ලිත්තාවලිත්තානි නිවාතානි ඵුස්සිතග්ගලානි[4] පිහිතවාතපානානි.[5] එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි භයානි උප්පජ්ජන්ති, සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො. යෙ කෙචි උපද්දවා උප්පජ්ජන්ති, සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො. යෙ කෙචි උපසග්ගා උප්පජ්ජන්ති, සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති නො පණ්ඩිතතො.

ඉති ඛො භික්ඛවෙ සප්පටිභයො බාලො, අප්පටිභයො පණ්ඩිතො. සඋපද්දවො බාලො, අනුපද්දවො පණ්ඩිතො. සඋපසග්ගො බාලො, අනුපසග්ගො පණ්ඩිතො. නත්ථි භික්ඛවෙ පණ්ඩිතතො භයං, නත්ථි පණ්ඩිතතො උපද්දවො, නත්ථි පණ්ඩිතතො උපසග්ගො.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: යෙහි තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො, තෙ තයො ධම්මෙ අභිනිවජ්ජෙත්වා යෙහි තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො, තෙ තයො ධම්මෙ සමාදාය වත්තිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

---

1. උපස්සග්ගා - සාළුවි. 2. නළාගාරා වා තිණාගාරා වා - මජසං. සයා. PTS.
3. අග්ගිමුත්තො - මජසං. 4. ඵස්සිතග්ගලානි - සාළුවි. ඵුසිතග්ගලානි - මජසං. සයා.
5 වාතාපානානි– PTS.

# 3. තිකනිපාතය.

### පඨමපණ්ණාසකය

## [ 1. බාලවර්ගය ]

### 3. 1. 1. 1.

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. පින්වතුන් වහන්ස යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය සූත්‍රය වදාළ සේක.

මහණෙනි, යම් කිසි බිය කෙනෙක් උපදිත් නම් එහැම භීතීහු බාලයා කෙරෙන් උපදනාහ. පණ්ඩිතයා කෙරෙන් නූපදනාහ. යම් කිසි උපද්‍රව කෙනෙක් උපදිත් නම් එහැම උපද්‍රවයෝ බාලයා කෙරෙන් උපදනාහ. පණ්ඩිතයා කෙරෙන් නූපදනාහ. යම් කිසි උපසර්ග කෙනෙක් උපදිත් නම් එහැම උපසර්ගයෝ බාලයා කෙරෙන් උපදනාහ. පණ්ඩිතයා කෙරෙන් නූප-දනාහ.

මහණෙනි, රතහුණින් සුසන් ගෙයක් හෝ තණ කරලින් සුසන් ගෙයක් හෝ ගිනි ඇවිළ ගත්තේ, ඇතුළත පිටත හුණුවමින් ගල්වන ලද, වැළැහු සුලං ඇති, පැහැසු කවුළු ඇති, යෙදූ දූල් කවුළුදෙර ඇති කැණිි දුත් ගෙය ද යම්සේ දවා ද, මහණෙනි, එසෙයින් ම යම් කිසි බිය කෙනෙක් උපදිත් නම් එහැම භීතීහු බාලයා කෙරෙන් උපදනාහ. පණ්ඩිතයා කෙරෙන් නූපදනාහ. යම් කිසි උපද්‍රව කෙනෙක් උපදිත් නම් එහැම උපද්‍රවයෝ බාලයා කෙරෙන් උපදනාහ. පණ්ඩිතයා කෙරෙන් නූපදනාහ. යම් කිසි උපසර්ග කෙනෙක් උපදිත් නම් එහැම උපසර්ගයෝ බාලයා කෙරෙන් උපදනාහ. පණ්ඩිතයා කෙරෙන් නූපදනාහ.

මහණෙනි, මෙසේ වනාහි බාල තෙමේ ප්‍රතිභය සහිත වේ. පණ්ඩිත තෙමේ ප්‍රතිභය රහිත වේ. බාල තෙමේ උපද්‍රව සහිත වේ. පණ්ඩිත තෙමේ උපද්‍රව රහිත වේ. බාල තෙමේ උපසර්ග සහිත වේ. පණ්ඩිත තෙමේ උපසර්ග රහිත වේ. මහණෙනි, පණ්ඩිතයා කෙරෙන් බියෙක් නැත. පණ්ඩිතයා කෙරෙන් උපද්‍රවයෙක් නැත. පණ්ඩිතයා කෙරෙන් උපසර්ගයෙක් නැත.

මහණෙනි, එහෙයින් යම් ධර්ම තුණෙකින් සමන්වාගත බාල තෙම දත යුතු නම්, ඒ ධර්ම තුණ තෙරැ යම්බඳු ධර්ම තුණෙකින් සමන්වාගත පණ්ඩිත තෙම දතයුතු නම්, ඒ ධර්ම තුණ සමාදන් කොට ගෙණ පවත්නම්හ යි මෙසේ හික්මිය යුතුය. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

### 3. 1. 1. 2.

2. කම්මලක්ඛණො භික්ඛවෙ බාලො, කම්මලක්ඛණො පණ්ඩිතො, අපදානසොභිනී[1] පඤ්ඤාති.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො. කතමෙහි තීහි: කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො; කතමෙහි තීහි: කායසුචරිතෙන, වචීසුචරිතෙන, මනොසුචරිතෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං; යෙහි තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො, තෙ තයො ධම්මෙ අභිනිවජ්ජෙත්වා යෙහි තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො, තෙ තයො ධම්මෙ සමාදාය වත්තිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

### 3. 1. 1. 3

3. තීණිමානි භික්ඛවෙ බාලස්ස බාලලක්ඛණානි බාලනිමිත්තානි බාලාපදානානි.[2] කතමානි තීණි: ඉධ භික්ඛවෙ බාලො දුච්චින්තිතචින්තී ච හොති, දුබ්භාසිතභාසී, දුක්කටකම්මකාරී. නො චෙදං[3] භික්ඛවෙ බාලො දුච්චින්තිතචින්තී ච අභවිස්ස, දුබ්භාසිතභාසී, දුක්කටකම්මකාරී. කෙන නං පණ්ඩිතා ජානෙය්‍යුං බාලො අයං භවං අසප්පුරිසොති. යස්මා ච ඛො භික්ඛවෙ බාලො දුච්චින්තිතචින්තී ච හොති, දුබ්භාසිතභාසී, දුක්කටකම්මකාරී. තස්මා නං පණ්ඩිතා ජානන්ති, බාලො අයං භවං අසප්පුරිසොති. ඉමානි ඛො භික්ඛවෙ තීණි බාලස්ස බාලලක්ඛණානි බාලනිමිත්තානි බාලාපදානානි.

තීණිමානි භික්ඛවෙ පණ්ඩිතස්ස පණ්ඩිතලක්ඛණානි පණ්ඩිතනිමිත්තානි පණ්ඩිතාපදානානි[4]. කතමානි තීණි: ඉධ භික්ඛවෙ පණ්ඩිතො සුචින්තිතචින්තී ච හොති, සුභාසිතභාසී, සුකතකම්මකාරී. නො චෙදං[3] භික්ඛවෙ පණ්ඩිතො සුචින්තිතචින්තී ච අභවිස්ස, සුභාසිතභාසී, සුකතකම්මකාරී. කෙන නං පණ්ඩිතා ජානෙය්‍යුං, පණ්ඩිතො අයං භවං සප්පුරිසොති. යස්මා ච ඛො භික්ඛවෙ පණ්ඩිතො සුචින්තිතචින්තී ච හොති, සුභාසිතභාසී, සුකතකම්මකාරී. තස්මා නං පණ්ඩිතා ජානන්ති, පණ්ඩිතො අයං භවං සප්පුරිසොති. ඉමානි ඛො භික්ඛවෙ තීණි පණ්ඩිතස්ස පණ්ඩිතලක්ඛණානි පණ්ඩිතනිමිත්තානි පණ්ඩිතාපදානානි. තස්මාතිහ -පෙ- එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

---

1 අපදානසොභනි පඤ්ඤා-PTS. සයා. අපදානසොභනී-මජ්ඣසං 2 බාලපදානානි - PTS
3 නොචෙතං - සයා. සාං 4 පණ්ඩිතපදානානි - PTS.

### 3. 1. 1. 2.

2. මහණෙනි, බාල තෙමේ කර්මය ලකුණු කොට ඇතියේ ය. පණ්ඩිත තෙමේ කර්මය ලකුණු කොට ඇතියේ ය. ප්‍රඥාව චරිතාපදානයෙන් හොබනී ය.

මහණෙනි, ධර්ම තුණෙකින් සමන්‍වාගත වූ බාලයා දතයුතු ය. කවර තුණෙකින යත්: කායදුශ්චරිතයෙන් හා වාග්දුශ්චරිතයෙන් හා මනොදුශ්චරිතයෙන් හා යන තුණෙනි මහණෙනි, මේ ධර්ම තුණෙන් සමන්‍වාගත වූ බාල තෙමේ දතයුතු ය.

මහණෙනි, ධර්ම තුණෙකින් සමන්‍වාගත වූ පණ්ඩිත තෙමේ දතයුතුය: කවර තුණෙකින යත්: කායසුචරිතයෙන් හා වාක්සුචරිතයෙන් හා මනසුචරිතයෙන් හා යන තුණෙනි. මහණෙනි, මේ ධර්ම තුණෙන් සමන්‍වාගත වූ පණ්ඩිත තෙමේ දතයුතු ය.

මහණෙනි, එහෙයින් යම් ධර්ම තුණෙකින් සමන්‍වාගත බාල තෙමේ දතයුත්තේ නම්, ඒ තුන් ධර්මයන් තෙරැ යම් ධර්ම තුණෙකින් සමන්‍වාගත පණ්ඩිත තෙමේ දතයුත්තේ නම්, ඒ ධර්ම තුණ සමාදන් කොට ගෙණ පවත්නම්හයි මෙසේ හික්මිය යුතුය. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

### 3. 1. 1. 3.

3. මහණෙනි, බාලයාගේ බාලාභිඥානයෝ, බාලනිමිත්තයෝ, බාලචරිතයෝ මොහු තුන්දෙනෙක් වෙත්. කවර තුන්දෙනෙක යත්: මහණෙනි, මෙ ලොව්හි බාල තෙමේ (අභිධ්‍යාදි විසින්) නපුරු සිතිවිලි සිතනුයේ ද වෙයි. නපුරු බස් බණනුයේ ද වෙයි. නපුරු කර්ම කරණුයේ ද වෙයි. මහණෙනි, ඉදින් බාල තෙමේ නපුරු සිතිවිලි සිතන සුලුත්, නපුරු බස් බණන සුලුත්, නපුරු කර්ම කරණ සුලුත් නොවී නම්, පණ්ඩිතයෝ මේ භවත් බාල ය, අසත්පුරුෂ යයි කවර සැටියෙකින් ඔහු හඳුනාගත හෙත් ද, මහණෙනි, යම් හෙයෙකින් බාල තෙමේ නපුරු සිතිවිලි සිතන සුලුත් වේ ද, නපුරු බස් බණන සුලුත් වේ ද, නපුරු කර්ම කරණ සුලුත් වේ ද, පණ්ඩිතයෝ මේ භවත් බාල ය, අසත්පුරුෂ යයි එයින් ඔහු හඳුනත්නාහ. මහණෙනි, මොහු තුන්දෙන බාලයාගේ බාලලක්‍ෂණ වෙති. බාලනිමිත්ත වෙති. බාලාපදාන වෙත්.

මහණෙනි, පණ්ඩිතයාගේ පණ්ඩිතලක්‍ෂණයෝ පණ්ඩිතනිමිත්තයෝ පණ්ඩිතචරිතයෝ මොහු තුන්දෙනෙක් වෙති. කවර තුන්දෙනෙක යත්: මහණෙනි, මෙලොව්හි පණ්ඩිත තෙම මනාසිතිවිලි සිතන සුල්ලේත්, මනාතෙපුල් තෙපලන සුල්ලේත්, මනා කර්ම කරණ සුල්ලේත් වෙයි. මහණෙනි, පණ්ඩිත තෙමේ ඉදින් මනා සිතිවිලි සිතන සුල්ලේත්, මනා තෙපුල් තෙපලන සුල්ලේත්, මනා කර්ම කරණ සුල්ලේත් නොවී නම්, කවර සැටියෙකින් පණ්ඩිතයෝ මේ භවත් සත්පුරුෂයෙක පණ්ඩිතයෙකැ යි ඔහු හඳුනා ගත හෙත් ද, මහණෙනි, යම් හෙයෙකින් පණ්ඩිත තෙමේ මනා සිතිවිලි සිතන සුල්ලේත් වේ ද, මනා තෙපුල් තෙපලන සුල්ලේත් වේ ද, මනා කර්ම කරණ සුල්ලේත් වේ ද. එහෙයින් පණ්ඩිතයෝ මේ භවත් සත්පුරුෂයෙක, පණ්ඩිතයෙකැ යි ඔහු හඳුනා ගන්නාහ. මහණෙනි, පණ්ඩිතයාගේ පණ්ඩිත ලක්‍ෂණයෝ පණ්ඩිත නිමිත්තයෝ පණ්ඩිතාපදානයෝ මොහු තුන්දෙන වෙත් යයි. එහෙයින් ... මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

## 3. 1. 1. 4.

4. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො, කතමෙහි තීහි: අච්චයං අච්චයතො න පස්සති, අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං න පටිකරොති, පරස්ස ඛො පන අච්චයං දෙසෙන්තස්ස යථාධම්මං න පතිගණ්හාති.[1] ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො, කතමෙහි තීහි: අච්චයං අච්චයතො පස්සති, අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති, පරස්ස ඛො පන අච්චයං දෙසෙන්තස්ස යථාධම්මං පතිගණ්හාති.[3] ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො. තස්මාතිහ -පෙ- එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

## 3. 1. 1. 5.

5. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො, කතමෙහි තීහි: අයොනිසො පඤ්හං කත්තා හොති, අයොනිසො පඤ්හං විස්සජ්ජෙතා හොති, පරස්ස ඛො පන යොනිසො පඤ්හං විස්සජ්ජිතං පරිමණ්ඩලෙහි පදබ්‍යඤ්ජනෙහි සිලිට්ඨෙහි උපගතෙහි නාබ්භනුමොදිතා හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො, කතමෙහි තීහි: යොනිසො පඤ්හං කත්තා හොති, යොනිසො පඤ්හං විස්සජ්ජෙතා හොති, පරස්ස ඛො පන යොනිසො පඤ්හං විස්සජ්ජිතං පරිමණ්ඩලෙහි පදබ්‍යඤ්ජනෙහි සිලිට්ඨෙහි උපගතෙහි අබ්භනුමොදිතා හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො. තස්මාතිහ -පෙ- එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

## 3. 1. 1. 6.

6. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො, කතමෙහි තීහි: අකුසලෙන කායකම්මෙන අකුසලෙන වචීකම්මෙන අකුසලෙන මනොකම්මෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො, කතමෙහි තීහි: කුසලෙන කායකම්මෙන, කුසලෙන වචීකම්මෙන, කුසලෙන මනොකම්මෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො. තස්මාතිහ -පෙ- එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

## 3. 1. 1. 7.

7. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො, කතමෙහි තීහි: සාවජ්ජෙන කායකම්මෙන, සාවජ්ජෙන වචීකම්මෙන, සාවජ්ජෙන මනොකම්මෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො, කතමෙහි තීහි: අනවජ්ජෙන කායකම්මෙන, අනවජ්ජෙන වචීකම්මෙන, අනවජ්ජෙන මනොකම්මෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො. තස්මාතිහ -පෙ- එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

1 නප්පටිග්ගණ්හාති - මජසං. න පටිග්ගණ්හාති - සයා. නප්පතිගණ්හාති - PTS.

## 3. 1. 1. 4.

4. **මහණෙනි,** ධම් තුණෙකින් සමන්‍ඛාගත බාල තෙමේ දතයුතු **වේ. කවර තුණෙකින** යත්: වරද වරද විසින් නො දක්නේ ද, වරද වරද **විසින් දැක** ඇවැතට තිසි (යථාපරාධ දණ්ඩයෙන්) පිළියම් නොකෙරේ ද, **අපරාධය දෙසන** මෙරමාගේ යථාධර්මය නො පිළිගණී ද (යන තුණෙනි.) **මහණෙනි, මේ ධම් තුණෙන්** සමන්‍ඛාගත බාල තෙමේ දතයුත්තේ ය.

**මහණෙනි,** ධම් **තුණෙකින්** සමන්‍ඛාගත පණ්ඩිත තෙමේ දතයුතු ය. **කවර තුණෙකින යත්:** වරද වරද විසින් දක්නේ ද, වරද වරද විසින් දැක **දහම් වූ පරිදි පිළියම් කෙරේ ද,** අපරාධය දෙසන අන්‍යයාගේ අපරාධය **පිළිගණී ද,** (යන තුණෙනි). **මහණෙනි,** මේ ධම් **තුණෙන්** සමන්‍ඛාගත පණ්ඩිත තෙමේ දතයුත්තේය. එහෙයින් .. **මහණෙනි,** තොප විසින් මෙසේ ම **හික්මිය** යුතුයි.

## 3. 1. 1. 5.

5. මහණෙනි, ධම් තුණෙකින් සමන්‍ඛාගත බාල තෙමේ දතයුතු ය. කවර **තුණෙකින** යත්: නුනුවණින් ප්‍රශ්න කරණ්නු වෙයි. නුනුවණින් ප්‍රශ්න **විසඳනු** වෙයි. පිරිමඬුලු සිලුටු අර්ථානුගතපදයෙන් මෙරමා විසින් නුවණින් **විසඳන** ලද ප්‍රශ්නය සතුටින් නො පිළිගණ්නු වෙයි. (යන තුණෙනි.) මහණෙනි, **මේ ධම් තුණෙන් යුක්ත** වූ බාල තෙමේ දතයුතු වේ.

මහණෙනි, ධම් **තුණෙකින්** සමන්‍ඛාගත වූ පණ්ඩිත තෙමේ දතයුතු වේ. **කවර** තුණෙකින යත්: නුවණින් ප්‍රශ්න කරණ්නු වෙයි. නුවණින් ප්‍රශ්න විසඳනු වෙයි. පිරිමඬුලු සිලුටු අර්ථානුගත පදව්‍යඤ්ජනයෙන් මෙරමා විසින් නුවණින් විසඳන ලද ප්‍රශ්නය සතුටින් පිළිගණ්නු වෙයි. (යන තුණෙනි.) මහණෙනි, මේ ධම් තුණෙන් සමන්‍ඛාගත වූ පණ්ඩිත තෙමේ දතයුතු වේ. එහෙයින් ... මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු ය.

## 3. 1. 1. 6

6. මහණෙනි, ධම් තුණෙකින් සමන්‍ඛාගත වූ බාල තෙමේ දතයුතු වේ. කවර තුණෙකින යත්: අකුශල වූ කායකර්මයෙන, අකුශල වූ වාක්කර්මයෙන, අකුශල වූ මනඃකර්මයෙන. (යන තුණෙනි.) මහණෙනි, මේ ධම් තුණෙන් සමන්‍ඛාගත වූ බාල තෙමේ දතයුතු වේ.

මහණෙනි, ධම් තුණෙකින් සමන්‍ඛාගත වූ **පණ්ඩිත** තෙමේ දතයුතු වෙයි. **කවර** තුණෙකින යත්: කුශල වූ කායකර්මයෙන, කුශල වූ වාක්කර්මයෙන, **කුශල** වූ මනඃකර්මයෙන (යන තුණෙනි.) මහණෙනි, මේ ධම් තුණෙන් **සමන්‍ඛාගත** වූ **පණ්ඩිත** තෙමේ දතයුතු වේ. එහෙයින් ... මහණෙනි, තොප **විසින්** මෙසේ ම හික්මිය යුතු ය.

## 3. 1. 1. 7.

7. මහණෙනි, ධම් තුණෙකින් සමන්‍ඛාගත වූ බාල තෙමේ දතයුතු වේ. **කවර ධම් තුණෙකින** යත්: වරද සහිත වූ කායකර්මයෙන, වරද සහිත වූ **වාක්කර්මයෙන,** වරද සහිත වූ මනඃකර්මයෙන (යන තුණෙනි.) මහණෙනි, මේ **ධම් තුණෙන්** සමන්‍ඛාගත වූ බාල තෙමේ දතයුතු වෙයි.

**මහණෙනි,** ධම් තුණෙකින් සමන්‍ඛාගත වූ **පණ්ඩිත** තෙමේ දතයුතු වෙයි. **කවර තුණෙකින** යත්: නිරවද්‍ය වූ කායකර්මයෙන, නිරවද්‍ය වූ වාක්කර්මයෙන, **නිරවද්‍ය** වූ **මනඃකර්මයෙන** (යන තුණෙනි.) මහණෙනි, මේ ධම් තුණෙන් **සමන්‍ඛාගත වූ පණ්ඩිත තෙමේ** දතයුතු වේ. එහෙයින් ... **මහණෙනි,** තොප **විසින් මෙසේ ම හික්මිය යුතු ය.**

### 3. 1. 1 8.

8. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො, කතමෙහි තීහි: සබ්‍යාපජ්ඣෙන කායකම්මෙන, සබ්‍යාපජ්ඣෙන වචීකම්මෙන, සබ්‍යාපජ්ඣෙන මනොකම්මෙන. -පෙ- අබ්‍යාපජ්ඣෙන කායකම්මෙන, අබ්‍යාපජ්ඣෙන වචීකම්මෙන, අබ්‍යාපජ්ඣෙන මනොකම්මෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: යෙහි තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො, තෙ තයො ධම්මෙ අභිනිවජ්ජෙත්වා යෙහි තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො, තෙ තයො ධම්මෙ සමාදාය වත්තිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

### 3. 1. 1. 9.

9. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති. කතමෙහි තීහි: කායදුච්චරිතෙන, වචීදුච්චරිතෙන, මනොදුච්චරිතෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති, සානුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො ව්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජො ච හොති, අනනුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච පුඤ්ඤං පසවති. කතමෙහි තීහි: කායසුචරිතෙන, වචීසුචරිතෙන, මනොසුචරිතෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො ව්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජො ච හොති, අනනුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච පුඤ්ඤං පසවතීති.

### 3. 1. 1. 10.

10. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො තයො මලෙ අප්පහාය යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි තීහි: දුස්සීලො ච හොති, දුස්සීල්‍යමලඤ්චස්ස අප්පහීනං හොති. ඉස්සුකී ච හොති, ඉස්සාමලඤ්චස්ස අප්පහීනං හොති. මච්ඡරී ච හොති, මච්ඡෙරමලඤ්චස්ස අප්පහීනං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො ඉමෙ තයො මලෙ අප්පහාය යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො තයො මලෙ පහාය යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි තීහි: සීලවා ච හොති, දුස්සීල්‍යමලඤ්චස්ස පහීනං හොති. අනිස්සුකී ච හොති, ඉස්සාමලඤ්චස්ස පහීනං හොති. අමච්ඡරී ච හොති, මච්ඡෙරමලඤ්චස්ස පහීනං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො ඉමෙ තයො මලෙ පහාය යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

**බාලවග්ගො පඨමො.**

---

1. තස්සුද්දානං:– භයං ලක්ඛණචින්තාච අච්චයඤ්ච අයොනිසො,
අකුසලඤ්ච සාවජ්ජං - සබ්‍යජ්ඣකතං බලංති - මජ්ඣං. ස්‍යා.

### 3. 1. 1. 8.

8. මහණෙනි, ධර්ම තුණෙකින් සමන්‍වාගත වූ බාල තෙමේ දතයුතු වෙයි. කවර තුණෙකින යත්: සදොස් වූ කායකර්මයෙන, සදොස් වූ වාක්කර්මයෙන, සදොස් වූ මනඃකර්මයෙන (යන තුණෙනි.) නිදොස් වූ කායකර්මයෙන, නිදොස් වූ වාක්කර්මයෙන, නිදොස් වූ මනඃකර්මයෙන (යන තුණෙනි.) මහණෙනි, මේ ධර්ම තුණෙන් සමන්‍වාගත වූ පණ්ඩිත තෙමේ දතයුතු වේ. මහණෙනි, එහෙයින් යම් ධර්ම තුණෙකින් සමන්‍වාගත වූ බාල තෙමේ දත යුත්තේ නම්, ඒ ධර්ම තුණ හැර යම් ධර්ම තුණෙකින් සමන්‍වාගත වූ පණ්ඩිත තෙමේ දතයුත්තේ නම්, ඒ ධර්ම තුණ සමාදන් කොට ගෙණ පවත්නම්හ යි මෙසේ හික්මිය යුතුය. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

### 3. 1. 1. 9.

9. මහණෙනි, ධර්ම තුණෙකින් සමන්‍වාගත අව්‍යක්ත අසත්පුරුෂ බාල තෙම කැණු ගුණ ඇති නට ගුණ ඇති ආත්මය පිරිවටයි. වරද සහිත ද වෙයි. නුවණැත්තන් විසින් උපවාද කටයුතු ද වෙයි. බොහෝ පව් ද රැස් කරයි. කවර තුණෙකින යත්: කායදුශ්චරිතයෙන, වාග්දුශ්චරිතයෙන, මනොදුශ්චරිත යෙන (යන තුණෙනි) මහණෙනි, මේ ධර්ම තුණෙන් සමන්‍වාගත වූ අව්‍යක්ත අසත්පුරුෂ තෙමේ කැණු ගුණ ඇති නටගුණ ඇති ආත්මය පස්වටයි. සදොස් වූයේ ද නුවණැත්තන් විසින් උපවාද කටයුතු ද වෙයි. බොහෝ පව් ද රැස් කරයි.

මහණෙනි, ධර්ම තුණෙකින් සමන්‍වාගත ව්‍යක්ත සත්පුරුෂ වූ පණ්ඩිත තෙම නොකිණි ගුණ ඇති, නොනට ගුණ ඇති ආත්මය පිරිවටයි. නිදොස්වූයේ ද නුවණැත්තන් විසින් උපවාද නොකට යුත්තේ ද වෙයි. බොහෝ (ලෞකික ලොවුතුරු) කුසල් ද රැස් කරයි කවර තුණෙකින යත්: කායසුචරිතයෙන, වාක්සුචරිතයෙන, මනස්සුචරිතයෙන (යන තුණෙනි.) මහණෙනි, මේ ධර්ම තුණෙන් සමන්‍වාගත ව්‍යක්ත සත්පුරුෂ වූ පණ්ඩිත තෙමේ නොකිණි ගුණ ඇති, නොනට ගුණ ඇති ආත්මය පරිහරණය කෙරෙයි. නිදොස් වූයේ නුවණැත්තන් විසින් නො ම උපවාද කටයුතු ද වෙයි. බොහෝ කුසල් ද රැස් කෙරේ.

### 3. 1. 1. 10.

10. මහණෙනි, ධර්ම තුණෙකින් සමන්‍වාගත වූයේ ත්‍රිවිධ මල නො දහැ (හිසින්) ගෙණවුත් බහා තැබූයේ යම්සේ ද, එසේ නිරයෙහි (පිහිටියේ) වේ. කවර තුණෙකින යත්: දුශ්ශීල ද වේ. මොහුගේ දෞශ්ශීල්‍ය මලය ප්‍රහීණ නුවූයේත් වේ. ඊර්ෂ්‍යා ඇත්තේත් වේ මොහුගේ ඊර්ෂ්‍යාමලය ප්‍රහීණ නුවූයේත් වේ. මසුරුවූයේ ද වේ ඔහුගේ මසුරු මල නො ම ප්‍රහීණ වූයේ ද වේ. (යන තුණෙනි,) මහණෙනි, මේ ධර්ම තුණෙන් සමන්‍වාගත වූයේ මේ මල තුණ ප්‍රහීණ නො කොට හිසින් ගෙණවුත් බහා තැබූයේ යම්සේ ද එසේ නිරයෙහි (පිහිටියේ) වේ.

මහණෙනි, ධර්ම තුණෙකින් සමන්‍වාගත වූයේ ත්‍රිවිධ මල පහා හිසින් ගෙණ වුත් බහා තැබූයේ යම්සේ ද, එසේ ස්වර්ගයෙහි (පිහිටියේ) වේ. කවර තුණෙකින යත්: සිල්වත් ද වෙයි ඔහුගේ දෞශ්ශීල්‍ය මලය ප්‍රහීණ වූයේත් වෙයි. ඊර්ෂ්‍යා නැත්තේ ද වෙයි. ඔහුගේ ඊර්ෂ්‍යා මලය ප්‍රහීණ වූයේත් වෙයි. නො මසුරු වූයේ ද වෙයි. ඔහුගේ මසුරුමල ප්‍රහීණ වූයේත් වේ. මහණෙනි, මේ ධර්ම තුණෙන් සමන්‍වාගත වූයේ මේ ත්‍රිවිධමලය ප්‍රහීණ කොට හිසින් ගෙණවුත් බහා තැබූයේ යම්සේ ද එසේ (ස්වර්ගයෙහි) වේ.

**පළමුවන බාල වග යි.**

## [2. රථකාරවග්ගො]

### 3. 1. 2. 1.

**[සාවත්ථිනිදානං:]**

11. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ඤාතකො භික්ඛු බහුජනා-හිතාය පටිපන්නො හොති, බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. කතමෙහි තීහි: අනනුලොමිකෙ කායකම්මෙ සමාදපෙති, අනනුලොමිකෙ වචීකම්මෙ සමාදපෙති, අනනුලොමිකෙසු ධම්මෙසු සමාදපෙති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො ඤාතකො භික්ඛු බහුජනාහිතාය පටිපන්නො හොති, බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ඤාතකො භික්ඛු බහුජනහිතාය පටිපන්නො හොති, බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමෙහි තීහි: අනුලොමිකෙ කායකම්මෙ සමාදපෙති, අනුලොමිකෙ වචීකම්මෙ සමාදපෙති, අනුලොමිකෙසු ධම්මෙසු සමාදපෙති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො ඤාතකො භික්ඛු බහුජන-හිතාය පටිපන්නො හොති, බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

### 3. 1. 2. 2.

12. තීණිමානි භික්ඛවෙ රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස යාවජීවං සාරණීයානි[1] භවන්ති. කතමානි තීණි: යස්මිං භික්ඛවෙ පදෙසෙ රාජා ඛත්තියො මුද්ධාවසිත්තො ජාතො හොති ඉදං භික්ඛවෙ පඨමං රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස යාවජීවං සාරණීයං හොති

පුනචපරං භික්ඛවෙ යස්මිං පදෙසෙ රාජා ඛත්තියො මුද්ධාවසිත්තො[2] හොති. ඉදං භික්ඛවෙ දුතියං රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස[2] යාවජීවං සාරණීයං හොති.

පුනචපරං භික්ඛවෙ යස්මිං පදෙසෙ රාජා ඛත්තියො මුද්ධාවසිත්තො සඞ්ගාමං අභිවිජිනිත්වා විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අජ්ඣාවසති. ඉදං භික්ඛවෙ තතියං රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස[2] යාවජීවං සාරණීයං[1] හොති. ඉමානි ඛො භික්ඛවෙ තීණි රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස යාවජීවං සාරණීයානි භවන්ති.

එවමෙව ඛො භික්ඛවෙ තීණිමානි භික්ඛුස්ස යාවජීවං සාරණීයානි භවන්ති. කතමානි තීණි: යස්මිං භික්ඛවෙ පදෙසෙ භික්ඛු කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති. ඉදං භික්ඛවෙ පඨමං භික්ඛුස්ස යාවජීවං සාරණීයං[1] හොති.

---

1 සරණීයානි - සතා. සං. PTS. සාරණීයානි - මජසං. 2. මුද්ධාභිසිත්තො - සතා.

## [ 2. රථකාරවර්ගය ]

**[සැවැත් නිදානයි:]**

### 3. 1. 2. 1.

11. මහණෙනි, කරුණු තුණෙකින් සමන්නාගත ප්‍රකට මහණ බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නොසුව පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස, දෙවිමිනිස්නට අහිත පිණිස, දුක් පිණිස පිළිපන්නේ වෙයි. කවර තුණෙකින යත්: (ශාසනයට) අනුලොම් නුවූ කායකර්මයෙහි සමාදන් කරවයි. අනුලොම් නුවූ වාක්කර්මයෙහි සමාදන් කරවයි. අනුලොම් නුවූ ධර්මයෙහි සමාදන් කරවයි. මහණෙනි, මේ ධර්ම තුණෙන් සමන්නාගත ප්‍රකට මහණ තෙම බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නොසුව පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙවිමිනිස්නට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නේ ය.

මහණෙනි, ධර්ම තුණෙකින් සමන්නාගත ප්‍රසිද්ධ මහණ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, බොහෝ දෙනාට වැඩ පිණිස, දෙවිමිනිස්නට හිත පිණිස, සුව පිණිස පිළිපන්නේ ය. කවර තුණෙකින යත්: (සස්නට) අනුලොම් වූ කායකර්මයෙහි සමාදන් කරවයි. අනුලොම් වූ වාක්කර්මයෙහි සමාදන් කරවයි, අනුලොම් වූ ධර්මයෙහි සමාදන් කරවයි, මහණෙනි, මේ ධර්ම තුණෙන් සම්නවාගත ප්‍රකට මහණ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, බොහෝ දෙනාට වැඩ පිණිස, දෙවිමිනිස්නට හිත පිණිස, සුව පිණිස පිළිපන්නේ ය.

### 3. 1. 2. 2.

12 මහණෙනි, මේ කරුණු තුණෙක් මූර්ධාභිෂික්ත ක්ෂත්‍රිය... 

මහණෙනි, මේ කරුණු තුණෙක් මුදුනෙහි බිසෙස් කළ ද කැත්රජහු විසින් දිවිහිම් කොට සිහි කරණුවට නිසි වේ. කවර තුණෙක යත්: මහණෙනි, යම් පෙදෙසෙක්හි මුදුනෙහි බිසෙස් කළ කැත් රජ උපන්නේ වේ ද, මහණෙනි, මෙය මුදුනෙහි බිසෙස් කළ කැත් රජහු විසින් දිවිහිම් කොට සිහි කටයුතු පළමු වන කරුණ වේ.

තවද මහණෙනි, යම් පෙදෙසෙක දී මුදුනෙහි බිසෙස් කළ කැත් රජ බිසෙස් කෙළේ වේ ද, මහණෙනි, මෙය මුදුනෙහි බිසෙස් කළ කැත් රජහු විසින් දිවිහිම් කොට සිහි කටයුතු දෙවෙනි කරුණ වේ.

තවද මහණෙනි, යම් පෙදෙසෙක්හි දී මුදුනෙහි බිසෙස් කළ කැත් රජ සඞ්ග්‍රාමය දිනා, දිනූ සඞ්ග්‍රාම ඇත්තේ, එම සඞ්ග්‍රාම ස්ථානය (කඳවුරු) අභිභවා වෙසේ ද, මහණෙනි, මේ මුදුනෙහි බිසෙස් කළ කැත් රජහු විසින් දිවි හිම්යෙන් සිහි කටයුතු තෙවෙනි කරුණ වේ. මහණෙනි, මේ මුදුනෙහි බිසෙස් කළ කැත් රජහු විසින් දිවිහිම්යෙන් සිහි කරණුවට නිසි කරුණු තුණ ය.

මහණෙනි, එසෙයින් ම මහණහු විසින් (දිවිහිම්) කොට සිහි කරණුවට නිසි මේ කරුණු තුණෙක් වේ. කවර කරුණු තුණෙක යත්: මහණෙනි, යම් පෙදෙසක දී මහණ තෙම කෙහෙරවුලු බා කසාවත් හැඳ පෙරෙව ගිහිගෙන් නික්ම සසුන් වන්නේ වේ ද, මහණෙනි, මෙය දිවිහිම්යෙන් මහණහු විසින් සිහිකටයුතු පළමු වන කරුණය.

පුනචපරං භික්ඛවෙ යස්මිං පදෙසෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. ඉදං භික්ඛවෙ දුතියං භික්ඛුස්ස යාවජීවං සාරාණීයං හොති.

පුනචපරං භික්ඛවෙ යස්මිං පදෙසෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉදං භික්ඛවෙ තතියං භික්ඛුස්ස යාවජීවං සාරාණීයං හොති. ඉමානි ඛො භික්ඛවෙ තීණි භික්ඛුස්ස යාවජීවං සාරාණීයානි භවන්තීති.

### 3. 1. 2. 3.

13. තයොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: නිරාසො ආසංසො විගතාසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො නිරාසො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති, චණ්ඩාලකුලෙ වා නෙසාදකුලෙ වා වෙණකුලෙ වා රථකාරකුලෙ වා පුක්කුසකුලෙ වා, දලිද්දෙ අප්පන්නපානභොජනෙ කසිරවුත්තිකෙ යත්ථ කසිරෙන ඝාසච්ඡාදො ලබ්භති. සො ච හොති, දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො[1] කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා, න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො සුණාති, ඉත්ථන්නාමො කිර ඛත්තියො ඛත්තියෙහි ඛත්තියාභිසෙකෙන අභිසිත්තොති. තස්ස න එවං හොති: කුදස්සු නාම මම්පි[2] ඛත්තියා ඛත්තියාභිසෙකෙන අභිසිඤ්චිස්සන්තීති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො නිරාසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො ආසංසො. ඉධ භික්ඛවෙ රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස ජෙට්ඨො පුත්තො හොති, ආභිසෙකො අනභිසිත්තො මචලප්පත්තො. සො සුණාති, ඉත්ථන්නාමො කිර ඛත්තියො ඛත්තියෙහි ඛත්තියාභිසෙකෙන අභිසිත්තොති. තස්ස එවං හොති: කුදස්සු නාම[3] මම්පි ඛත්තියා ඛත්තියාභිසෙකෙන අභිසිඤ්චිස්සන්තීති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො ආසංසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො විගතාසො: ඉධ භික්ඛවෙ රාජා හොති, ඛත්තියො මුද්ධාවසිත්තො. සො සුණාති: ඉත්ථන්නාමො කිර ඛත්තියො ඛත්තියෙහි ඛත්තියාභිසෙකෙන අභිසිත්තොති. තස්ස න එවං හොති: කුදස්සු[3] නාම මම්පි[2] ඛත්තියා ඛත්තියාභිසෙකෙන අභිසිඤ්චිස්සන්තීති. තං කිස්ස හෙතු: යා හිස්ස භික්ඛවෙ පුබ්බෙ අනභිසිත්තස්ස ආභිසෙකාසා සාස්ස පටිප්පස්සද්ධා. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො විගතාසො. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

1. බහ්වාබාධො - ස්‍යා. සං. PTS. 2. මමපි - මජසං. 3. කුදස්සු නාම - මජසං.

තවද මහණෙනි, යම් පෙදෙසෙක්හි දී මහණ 'මේය දුකැ'යි තත් වූ පරිද්දෙන් දැනැගණී ද, 'මේය දුක ඉපදීමට හෙතු යැ'යි තත් වූ පරිද්දෙන් දැනගණී ද, 'මෙය දුඃඛනිරොධයැ'යි තත් වූ පරිද්දෙන් දැනගණී ද, 'මෙය දුඃඛ-නිරොධයට යන මාර්‍ගයැ'යි තත් වූ පරිද්දෙන් දැනගණී ද, මහණෙනි, මෙය මහණහු විසින් දිවිහිමියෙන් සිහි කටයුතු දෙවෙනි කරුණ වේ.

තවද මහණෙනි, මහණ යම් පෙදෙසෙක්හි දී ආස්‍රවක්‍ෂයෙන් ආස්‍රව රහිත වූ චිත්තසමාධිය ද ප්‍රඥාවිමුක්තිය ද දිටුදැමියෙහි තෙමේ ම විශිෂ්ටඥාන-යෙන් දැන පසක් කොට එය ලැබගෙණ වාසය කරයි ද මහණෙනි, මෙය මහණහු විසින් දිවිහිමියෙන් මෙතෙහි කටයුතු තෙවෙනි කරුණ ය. මහණෙනි, මේ මහණහු විසින් දිවිහිමියෙන් මෙතෙහි කටයුතු කරුණු තුණයි.

## 3. 1. 2. 3.

13. මහණෙනි, මේ පුද්ගලයෝ තුන්දෙනෙක් ලොව්හි විද්‍යමාන වෙත්. කවර තුන්දෙනෙක යත්: නිරාශය, ආශංසය, විගතාශ යි.

මහණෙනි, නිරාශ පුද්ගල තෙමේ කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් දිළිඳු වූ සවල්ප ආහාරපාන භෝජන ඇති දුක්දිවෙල් ඇති, දුකසේ ආහාර වස්ත්‍ර ලබන, සැඩල් කුලයෙහි වේව යි වැදි කුලයෙක වේව යි, කුලුපොතු කුලයෙහි වේව යි, සොම්මර කුලයෙහි වේව යි, පුප්සඹු කුලයෙහි වේව යි, නීචකුලයෙක උපන්නේ වෙයි. හෙතෙමේ ද දුර්‍වර්‍ණ වූ අප්‍රියදර්‍ශන ඇති ලකුණවක වූ බොහෝ ආබාධ ඇති කණෙක් හෝ අත් කොරෙක් හෝ පා කොරෙක් හෝ පිළෙක් හෝ වෙයි. ආහාර පාන වස්ත්‍ර යාන මාලා ගඳ විලෙපන ශයනාවාස ප්‍රදීපොපකරණ නො ලබන්නෙක් වෙයි. හෙ තෙමේ අසෝ ක්‍ෂත්‍රිය තෙමේ ක්‍ෂත්‍රියයන් විසින් ක්‍ෂත්‍රියාභිෂෙක යෙන් බිසෙස් කරණ ලදැයි අසා. ඔහුට "කවර නම් දිනෙක ක්‍ෂත්‍රියයෝ මා ක්‍ෂත්‍රියාභිෂේකයෙන් අභිසෙස් කරන්නාහු ද්‍ෙ!"යි මෙසේ සිතෙක් නො වෙයි. මහණෙනි, මේ පුද්ගල තෙමේ නිරාශ යැ යි කියනු ලැබේ.

මහණෙනි, ආශංස පුද්ගල තෙමේ කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි මූර්‍ධාභිෂික්ත වූ ක්‍ෂත්‍රිය රජක්හුගේ අභිෂේකයට යෝග්‍ය වූ අචලප්‍රාප්ත වූ අනභිෂික්ත වූ දෙටු පුතෙක් වේ හෙ තෙමේ අසෝ කැත් ක්‍ෂත්‍රියයන් විසින් ක්‍ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂික්තයැයි අසා, "ක්‍ෂත්‍රියයෝ කවර නම් දිනෙක මාත් ක්‍ෂත්‍රියාභිෂේකයෙන් බිසෙස් කරන්නාහු ද්‍ෙ!"යි ඔහුට මෙසේ සිතෙක් වෙයි. මහණෙනි, මේ පුද්ගල තෙමේ ආශංසය යි කියනු ලැබේ.

මහණෙනි, විගතාශ පුද්ගල තෙමේ කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි මූර්‍ධාභිෂික්ත වූ ක්‍ෂත්‍රිය රජෙක් වේ. හේ මෙනම් "ක්‍ෂත්‍රිය තෙම ක්‍ෂත්‍රියයන් විසින් ක්‍ෂත්‍රියාභිෂේකයෙන් අභිෂික්තය"යි අසා, ඔහුට "කවර නම් දිනෙක ක්‍ෂත්‍රියයෝ මාත් ක්‍ෂත්‍රියාභිෂෙකයෙන් බිසෙස් කරන්නාහු ද්‍ෙ!"යි මෙසේ සිතෙක් නො වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, අනභිෂික්ත වූ ඔහුට පෙර යම් අභිෂෙකාශායෙක් වී ද, ඔහුගේ ඒ ආශාව සංසිඳින. මහණෙනි, මේ පුද්ගල තෙමේ විගතාශයි කියනු ලැබේ. මහණෙනි, මේ පුද්ගලයෝ තිදෙන ලොව්හි විද්‍යමාන වෙති.

එවමෙව ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛූසු. කතමෙ තයො: නිරාසො ආසංසො විගතාසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො නිරාසො. ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො දුස්සීලො හොති, පාපධම්මො අසුචි සංකස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරිපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො. සො සුණාති: ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. තස්ස න එවං හොති: කුදස්සු[2] නාම අහම්පි ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමීති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො නිරාසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො ආසංසො: ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති, කල්‍යාණධම්මො. සො සුණාති: ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. තස්ස එවං හොති: කුදස්සු[2] නාම අහම්පි ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමීති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො ආසංසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො විගතාසො: ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො. සො සුණාති: ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. තස්ස න එවං හොති: කුදස්සු[2] නාම අහම්පි ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමීති. තං කිස්ස හෙතු: යා හිස්ස භික්ඛවෙ පුබ්බෙ අවිමුත්තස්ස විමුත්තාසා, සාස්ස[4] පටිප්පස්සද්ධා. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො විගතාසො. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛූසූති.

### 3. 1. 2. 4.

14. යොපි සො භික්ඛවෙ රාජා චක්කවත්තී ධම්මිකො ධම්මරාජා. සොපි[5] න අරාජකං චක්කං වත්තෙතීති. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: කො පන භන්තෙ රඤ්ඤො චක්කවත්තිස්ස ධම්මිකස්ස ධම්මරඤ්ඤො රාජාති? ධම්මො, භික්ඛූති, භගවා අවොච. ඉධ භික්ඛු රාජා චක්කවත්තී ධම්මිකො ධම්මරාජා ධම්මංයෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති අන්තොජනස්මිං.

1 අවලුප්පන්නො - මජසං 2 කුදාස්සු නාම - මජසං. 3. ඔමපි - මජසං
4. සා - මජසං 5 සොපි නාම - සයා P.T.S

මහණෙනි, එපරිද්දෙන් ම මේ පුද්ගලයෝ තුන්දෙනෙක් භික්ෂූන් අතර විද්‍යමාන වෙති. කවර තුන්දෙනෙක යත්: නිරාශය, ආශංසය, විගතාශ යි. මහණෙනි, නිරාශපුද්ගල තෙමේ කවරේය යත්: මහණෙනි, මෙසස්නෙහි ඇතැම් පුද්ගලයෙක් ලාමක ස්වභාව ඇත්තේ අපිරිසිදු වූ කායකර්මාදිය ඇත්තේ, සැකයෙන් සිහිකටයුතු හැසිරීම් ඇත්තේ, පිළිසන් කර්ම ඇත්තේ ශ්‍රමණ ප්‍රතිරූපක වැ "ශ්‍රමණයෙමි"යි ප්‍රතිඥ කරන්නේ බ්‍රහ්මචාරී ප්‍රතිරූපක වැ "බඹසැරිමි"යි පිළිින කරන්නේ ඇතුළත දුගඳ ඇතියේ රාගාදියෙන් තෙත් වූයේ හටගත් කෙලෙස් කසළ ඇත්තේ දුශ්ශීල වෙයි. හෙ තෙමේ "මෙනම් භික්ෂු තෙම ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් ආස්‍රවරහිත වූ ඵලසමාධිය හා ඵලප්‍රඥ හා දිට්ඨධම්හි තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ලැබගෙණ වෙසේ ලැ යි අසා ද, ඔහුට මෙබඳු සිතෙක් නො වෙයි. "කවර නම් දිනෙක මමත් ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් ආස්‍රවරහිත වූ ඵලසමාධිය හා ඵලප්‍රඥව හා ඉහාත්ම-යෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ලැබැ වසන්නෙම් ද්‍යෝ!"යි මෙබඳු සිතෙක් නො වේ. මහණෙනි, මෙ නෙම නිරාශ පුද්ගල යැ යි කියනු ලැබේ.

මහණෙනි, ආශංස පුද්ගල තෙමේ කවරේය යත්: මහණෙනි, මේ ශාසන-යෙහි මහණෙක් සිල් ඇත්තේ, කලණදහම් ඇත්තේ වේ. "මෙ නම් භික්ෂු තෙම ආස්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආස්‍රවරහිත වූ ඵලසමාධිය හා ඵලප්‍රඥව හා ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට සපයාගෙණ වෙසේ ලැ යි හෙතෙම අසා ද, ඔහුට "කවර නම් දිනෙක මමත් ආස්‍රවක්ෂය-යෙන් අනාශ්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥවත් මෙ අත්බව්හි ම තෙමේ විශිෂ්ට-ඥානයෙන් දැන පසක් කොට ලැබ වසන්නෙම් ද්‍යෝ!"යි මෙබඳු සිතෙක් වේ. මහණෙනි, මෙතෙම ආශංස පුද්ගල ය යි කියනු ලැබේ.

මහණෙනි, විගතාශ පුද්ගල තෙමේ කවරේය යත්: මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් අතීත් වූයේ ක්ෂය කළ ආශ්‍රව ඇත්තේ වේ ද, "මෙනම් භික්ෂු තෙම ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් ආස්‍රවරහිත වූ ඵලසමාධිය හා ඵලප්‍රඥව හා ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන පසක් කොට සපයා වෙසේ ලැයි අසා ද, ඔහුට "කවර නම් දිනෙක මමත් ආශ්‍රවයන්ගේ ක්ෂයයෙන් ... පසක් කොට ඊට පැමිණ වෙසෙම්ද්‍යෝ!"යි (මෙබඳු) සිතෙක් නො වෙයි. ඒ කවරහෙයින යත්: මහණෙනි, පෙර ම කෙලෙසුන්ගෙන් නොමිදුනා වූ ඔහුගේ යම් විමුක්තියෙහි ආශාවෙක් වී ද ඒ ආශා තොමෝ ඔහුට සංහුන. මහණෙනි, මේ විගතාශපුද්ගලයැ යි කියනු ලැබේ. මහණෙනි, මේ පුද්ගලයෝ තිදෙන භික්ෂූන් අතරෙහි විද්‍යමාන වෙත්.

## 3. 1. 2. 4.

14. මහණෙනි, යම් ඒ දැහැමි වූ ධර්මරාජන් වූ සක්විතිරජෙක් වේ ද, හෙ ද රජකුනෙන් තොර වූ අණසක නො පවත්වයි. මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් "භාග්‍යවතුන් වහන්සේට වහන්ස, දැහැමි වූ ධර්ම-රාජන් වූ සක්විති රජකුහට කවර නම් රජෙක් වේ දැ"යි මෙය කීය. මහණ, ධර්මය වේයැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මහණ, මෙලොව්හි දැහැමි වූ ධර්මරාජන් වූ සක්විතිරජ තෙමේ ධර්මය ම ආශ්‍රය කොට ධර්මයට සත්කාර කරමින් ධර්මයට ගරු කරමින් ධර්මය පුදමින් ධර්මය ධ්වජ කොට ඇත්තේ ධර්මය කෙතු කොට ඇත්තේ ධර්මාධිපත්‍යය ඇත්තේ ධාර්මික වූ රකවල් ඇතුළත් ජනයා කෙරෙහි යොදයි.

පුන ච පරං භික්ඛු රාජා චක්කවත්තී ධම්මිකො ධම්මරාජා ධම්මංයෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති ඛත්තියෙසු අනුයුත්තෙසු[1] බලකායස්මිං බ්‍රාහ්මණගහපතිකෙසු, නෙගමජානපදෙසු, සමණබ්‍රාහ්මණෙසු, මිගපක්ඛීසු. ස ඛො සො භික්ඛු රාජා චක්කවත්තී ධම්මිකො ධම්මරාජා ධම්මඤ්ඤෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා අන්තොජනස්මිං, ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා ඛත්තියෙසු අනුයුත්තෙසු බලකායස්මිං බ්‍රාහ්මණගහපතිකෙසු නෙගමජානපදෙසු සමණබ්‍රාහ්මණෙසු මිගපක්ඛීසු ධම්මෙනෙව චක්කං වත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පාණිනා.

එවමෙව ඛො භික්ඛු තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මිකො ධම්මරාජා ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති කායකම්මස්මිං, එවරූපං කායකම්මං සෙවිතබ්බං, එවරූපං කායකම්මං න සෙවිතබ්බන්ති.

පුනචපරං භික්ඛු තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මිකො ධම්මරාජා ධම්මංයෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති වචීකම්මස්මිං, එවරූපං වචීකම්මං සෙවිතබ්බං, එවරූපං වචීකම්මං න සෙවිතබ්බන්ති. -පෙ- මනොකම්මස්මිං, එවරූපං මනොකම්මං සෙවිතබ්බං, එවරූපං මනොකම්මං න සෙවිතබ්බන්ති.

ස ඛො සො භික්ඛු තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මිකො ධම්මරාජා ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා කායකම්මස්මිං, ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා වචීකම්මස්මිං, ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා මනොකම්මස්මිං, ධම්මෙනෙව අනුත්තරං ධම්මචක්කං පවත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

1 අනුයන්තෙසු - මජසං

තවද මහණෙ, දැහැමි වූ ධර්මරාජන් වූ සක්විතිරජ තෙමේ ධර්මය ම ආශ්‍රය කොට ධර්මයට ම සත්කාර කරන්නේ ධර්මය ම ගරු කරන්නේ ධර්මය ම පුදන්නේ ධර්මය ම ධ්වජ කොට ඇත්තේ ධර්මය ම කේතු කොට ඇත්තේ ධර්මාධිපත්‍යය ඇත්තේ අනුයුක්ත වූ ක්‍ෂත්‍රියයන් කෙරෙහි ද, බලසෙනඟ කෙරෙහි ද, බමුණුගැහැවියන් කෙරෙහි ද, නියම්ගම් දනවු වැස්සන් කෙරෙහි ද, මහණබමුණන් කෙරෙහි ද, මෘගපක්‍ෂීන් කෙරෙහි ද, ධාර්මික වූ රක්‍ෂාවරණ ගුප්තිය පණවයි. මහණෙ, ඒ දැහැමි වූ ධර්මරජන් වූ සක්විතිරජ ධර්මය ම ආශ්‍රය කොට, ධර්මයට ම සත්කාර කරන්නේ, ධර්මය ම ගරු කරන්නේ, ධර්මය ම පුදන්නේ, ධර්මය ධ්වජ කොට ඇත්තේ, ධර්මය කේතු කොට ඇත්තේ, ධර්මාධිපත්‍යය ඇත්තේ අභ්‍යන්තර ජනයා කෙරෙහි ධාර්මික වූ රක්‍ෂාවරණ ගුප්තිය යොදා අනුයුක්ත වූ ක්‍ෂත්‍රියයන් කෙරෙහි ද, බලසෙනඟ කෙරෙහි ද, බමුණු ගැහැවියන් කෙරෙහි ද, නියම්ගම් දනවු වැස්සන් කෙරෙහි ද, මහණ බමුණන් කෙරෙහි ද, මෘගපක්‍ෂීන් කෙරෙහි ද, ධාර්මික වූ රක්‍ෂාවරණ ගුප්තිය යොදා දැහැමින් ම අණසක පණවයි ද, ඒ අණසක මනුෂ්‍ය වූ පසමිතුරු වූ කිසියම් ප්‍රාණියකු විසින් නොවැළැක්විය හැකි වෙයි.

මහණෙ, එපරිද්දෙන් ම දැහැමි වූ අර්හත් වූ ධර්මරජන් වූ සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ධර්මය ම ආශ්‍රය කොට ධර්මයට ම සත්කාර කරණ සේක් ධර්මය ම ගරු කරණ සේක් ධර්මය ම පුදන සේක් ධර්මය ම ධ්වජ කොට ඇති සේක් ධර්මය ම කේතු කොට ඇති සේක් ධර්මාධිපත්‍යය ඇති සේක් මෙබඳු වූ කායකර්මය සෙවිය යුතුය යි ද, මෙබඳු වූ කායකර්මය නො සෙවිය යුතුයැ යි ද, කායකර්ම විෂයෙහි ලා ධාර්මික වූ රක්‍ෂාවරණගුප්තිය වදාරණ සේක.

මහණෙ, තවද දැහැමි වූ ධර්මරජන් වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ධර්මය ම ආශ්‍රය කොට ධර්මයට සත්කාර කරණ සේක් ධර්මය ගරු කරණ සේක් ධර්මය පුදන සේක් ධර්මය ධ්වජ කොට ඇති සේක් ධර්මය කේතු කොට ඇති සේක් ධර්මාධිපත්‍යය ඇති සේක් මෙබඳු වූ වාක්කර්මය සෙවිය යුතුයැ යි ද, මෙබඳු වූ වාක්කර්මය නො සෙවිය යුතුයැ යි ද, වාක්කර්ම විෂයෙහි දැහැමි වූ රක්‍ෂාවරණ ගුප්තිය පණවන සේක. ... මෙබඳු වූ මනඃකර්මය සෙවිය යුතුය, මෙබඳු වූ මනඃකර්මය නො සෙවිය යුතුයැ යි ද මනඃකර්මවිෂයෙහි දැහැමි වූ රක්‍ෂාවරණ ගුප්තිය පණවන සේක.

මහණෙ, දැහැමි වූ ධර්මරාජන් වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ තථාගතයන් වහන්සේ ධර්මයට සත්කාර කරණ සේක් ධර්මය ගරු කරණ සේක් ධර්මය පුදන සේක් ධර්මය ධ්වජ කොට ඇති සේක් ධර්මය කේතු කොට ඇති සේක් ධර්මාධිපත්‍යය ඇති සේක් කායකර්ම විෂයයෙහි ධාර්මික වූ රක්‍ෂාවරණ ගුප්තිය පණවා, වාක්කර්ම විෂයයෙහි ධාර්මික වූ රක්‍ෂාවරණ ගුප්තිය පණවා, මනඃකර්ම විෂයයෙහි ධාර්මික වූ රක්‍ෂාවරණ ගුප්තිය පණවා, දැහැමින් ම නිරුත්තර වූ ධර්මචක්‍රය පවත්වන සේක් ද, ඒ ධර්මචක්‍රය වනාහි ලොව්හි ශ්‍රමණ වූ හෝ බ්‍රාහ්මණ වූ හෝ දෙව වූ හෝ බ්‍රහ්ම වූ හෝ ලොව්හි කිසිවකු විසිනුත් නො වැළැක්විය හැක්කේ වේ.

**3. 1. 2. 5.**

15. එකං සමයං භගවා **බාරාණසියං** විහරති **ඉසිපතනෙ** මිගදායෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

භූතපුබ්බං භික්ඛවෙ රාජා අහොසි **පචෙතනො** නාම. අථ ඛො භික්ඛවෙ රාජා පචෙතනො[1] රථකාරං ආමන්තෙසි: ඉතො මෙ සම්ම රථකාර, ඡන්නං මාසානං අච්චයෙන සඞ්ගාමො භවිස්සති, සක්කසි[2] මෙ සම්ම රථකාර, නවං චක්කයුගං කාතුන්ති? සක්කොමි දෙවාති ඛො භික්ඛවෙ රථකාරො රඤ්ඤො පචෙතනස්ස පච්චස්සොසි. අථ ඛො භික්ඛවෙ රථකාරො ඡහි මාසෙහි ඡාරත්තූනෙහි එකං චක්කං නිට්ඨාපෙසි. අථ ඛො භික්ඛවෙ රාජා පචෙතනො රථකාරං ආමන්තෙසි: ඉතො මෙ සම්ම රථකාර, ඡන්නං දිවසානං අච්චයෙන සඞ්ගාමො භවිස්සති නිට්ඨිතං තෙ[3] නවං චක්කයුගන්ති. ඉමෙහි ඛො දෙව ඡහි මාසෙහි ඡාරත්තූනෙහි එකං චක්කං නිට්ඨිතන්ති. සක්කසි පන මෙ සම්ම රථකාර, ඉමෙහි ඡහි දිවසෙහි දුතියං චක්කං නිට්ඨාපෙතුන්ති? සක්කොමි දෙවාති ඛො භික්ඛවෙ රථකාරො රඤ්ඤො පචෙතනස්ස පච්චස්සොසි. අථ ඛො භික්ඛවෙ රථකාරො ඡහි දිවසෙහි දුතියං චක්කං නිට්ඨාපෙත්වා නවං චක්කයුගං ආදාය යෙන රාජා පචෙතනො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජානං පචෙතනං එතදවොච: ඉදන්තෙ දෙව නවං චක්කයුගං නිට්ඨිතන්ති. යඤ්ච තෙ ඉදං සම්ම රථකාර, චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි, යඤ්ච තෙ ඉදං චක්කං ඡහි දිවසෙහි නිට්ඨිතං. ඉමෙසං කිං නානාකරණං නෙසාහං[4] කිඤ්චි නානාකරණං පස්සාමීති. අත්ථෙසං දෙව නානාකරණං, පස්සතු දෙවො නානාකරණන්ති.

අථ ඛො භික්ඛවෙ රථකාරො යං තං චක්කං ඡහි දිවසෙහි නිට්ඨිතං, තං පවත්තෙසි. තං පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති, තාවතිකං ගන්ත්වා චිඞ්ගුලායිත්වා භූමියං පපති. යං පන තං චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි තං පවත්තෙසි. තං පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති, තාවතිකං ගන්ත්වා අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසි.

කො නු ඛො සම්ම රථකාර, හෙතු, කො පච්චයො. යමිදං චක්කං ඡහි දිවසෙහි නිට්ඨිතං, තං පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති, තාවතිකං ගන්ත්වා චිඞ්ගුලායිත්වා භූමියං පපති? කො පන සම්ම රථකාර, හෙතු, කො පච්චයො? යමිදං චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි, තං පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති, තාවතිකං ගන්ත්වා අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසීති? යමිදං දෙව, චක්කං ඡහි දිවසෙහි නිට්ඨිතං. තස්ස නෙමිපි සවඞ්කා සදොසා සකසාවා. අරාපි සවඞ්කා සදොසා සකසාවා. නාභිපි සවඞ්කා සදොසා සකසාවා. තං නෙමියාපි සවඞ්කත්තා සදොසත්තා සකසාවත්තා, අරානම්පි සවඞ්කත්තා සදොසත්තා සකසාවත්තා, නාභියාපි සවඞ්කත්තා සදොසත්තා සකසාවත්තා පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති, තාවතිකං ගන්ත්වා චිඞ්ගුලායිත්වා භූමියං පපති. යං පන තං දෙව චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි. තස්ස නෙමිපි අවඞ්කා අදොසා අකසාවා. අරාපි අවඞ්කා අදොසා අකසාවා. නාභිපි අවඞ්කා අදොසා අකසාවා. තං නෙමියාපි අවඞ්කත්තා අදොසත්තා අකසාවත්තා, අරානම්පි අවඞ්කත්තා අදොසත්තා අකසාවත්තා, නාභියාපි අවඞ්කත්තා අදොසත්තා අකසාවත්තා පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති. තාවතිකං ගන්ත්වා අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසීති.

---

1. සචෙතනො නාම - මජසං. 2. සක්කසි කච්චි – සක්ඛිස්සසි – මජසං.
3. නිට්ඨිතං - මජසං. සයා. PTS. 4. නාහං - සීමු. නෙසං නාහං - PTS.

## 3. 1. 2. 5.

15. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **බරණැස්නුවර ඉසිපතන නම් වූ මිගදායෙහි** වැඩවසන සේක එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, යි' භික්ෂූන් ඇමතූ සේක 'වහන්ස' යී ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

මහණෙනි, වූ විරියෙකි. **පචෙතන** නම් රජෙක් විය. මහණෙනි, ඉක්බිති පචෙතන රජ තෙම, "යහළු රථකාරය, මෙයින් සමසක් ඇවෑමෙන් මට යුද්ධයෙක් වන්නේ ය. යහළු රථකාරය, මට නව රියසක් යුවළක් කරන්නට හැක්කෙහි දැ"යි රියකරුවා ඇමතීය. මහණෙනි, "හැක්කෙමි දේවයෙනි"යි රියකරු පචෙතන රජහට පිළිවදන් ඇස්වීය. මහණෙනි, ඉක්බිත්තෙන් රථකාර තෙමේ සරයක් අඩු සමසෙකින් එක් රියසකක් නිමැවීය. මහණෙනි, ඉක්බිත්තෙන් පචෙතන රජ තෙමේ, "යහළු රථකාරය, මෙයින් සදවසක් ඇවෑමෙන් මාගේ සඞ්ග්‍රාමය වන්නේය. තා විසින් නවසක්සඟළ නිමවන ලද දැයි රථකාරයා ඇමතීය. "දේවයිනි, සරයක් හළ මේ සමයින් එක් රියසකෙක් නිමවන ලද්දැ"යි රියකරු කී ය. "යහළු රථකාරය, මේ සදවසින් මාගේ දෙවන රියසක නිමවන්නට හැක්කෙහි ද?" "දේවයිනි, හැක්කෙමැ"යි රථකාර තෙම පචෙතන රජුට පිළිවදන් ඇස්වීය. මහණෙනි, ඉක්බිති රථකාර තෙමේ සදවසෙකින් දෙවන රියසක නිමවා නවසක්යුවළ රැගෙණ පචෙතන රජු වෙත එළඹියේය. එළඹ පචෙතන රජහට "දේවයෙනි, මුඹගේ මේ නවසක් යුවළ නිමවන ලද්දැ"යි මෙය පැවසීය. "යහළු රථකාරය, තා විසින් යම් මේ රියසකෙක් සරයක් අඩු සමසෙකින් නිමවන ලද ද, තා විසින් යම් මේ රියසකෙක් සදවසෙකින් නිමවන ලද ද, මේ දෙකෙහි වෙනස කවරේ ය? මම කිසිදු වෙනසක් නො දකිමි"යි රජ කීය. "දේවයෙනි, මේ දෙ ක්හි වෙනස ඇත් ම ය. දේව තෙමේ වෙනස දකීවා" යිරියකරු කීය.

මහණෙනි, ඉක්බිත්හෙන් රථකාර තෙමේ යම් ඒ රියසකෙක් සදවසින් නිමවන ලද ද, එය පෙරළා හැරියේය. එය පෙරළා හරිණ ලද්දේ ම ප්‍රයොග යාගේ ගතිය යම්හාක් ද ඒතාක් ගොස් බමා බිම වැටුනේය. යම් ඒ රියසකෙක් සරයක් අඩු සමසෙකින් නිමවන ලද ද එය පෙරළා හැරියේය. එය පෙරළා හරිණ ලද්දේ ම ප්‍රයොග ගතිය වහන තාක් ගොස් අකුරෙහි වැද තුබුවා සෙයින් සිටියේය.

"යහළු රථකාරය, යම් මේ රියසකෙක් සදවසින් නිමවන ලද ද, එය පෙරළා හරිණ ලද්දේ ම ප්‍රයොගයාගේ ගතිය වහන තාක් බමා බිම වැටුනේ ද, එයට හෙතු කිම? එයට කාරුණු කිම? යහළු රථකාරය, යම් මේ සකෙක් සරයෙකින් අඩු සමසෙකින් නිමවන ලද ද, එය පෙරළා හරිණ ලද්දේ ම ප්‍රයොගයාගේ ගතිය වහන තාක් ගොස් අකුරෙහි වැද තුබුවා සෙයින් සිටියේ ද, එයට හෙතු කවරේ ය: එයට කාරුණ කවරේය? දෙවයෙනි, යම් මේ රියසකෙක් සදවසෙකින් නිමවන ලද ද, එහි නිම්වළල්ල වක්වෙයි. සදොස් වෙයි. එලයෙන් යුක්ත වෙයි දැව් ද වක් වෙයි. සදොස් වෙයි. එලයෙන් යුක්ත වෙයි. නැබ ද වක් වෙයි. සදොස් වෙයි. එලයෙන් යුක්ත වෙයි නිම්වළල්ලෙහි වක්බැවින් ද සදොස් බැවින් ද එලයෙන් යුත් බැවින් ද දැව්යෙහි වක් බැවින් ද සදොස් බැවින් ද එලයෙන් යුත් බැවින් ද නැබෙහි වක් බැවින් ද සදොස් බැවින් ද එලයෙන් යුත් බැවින් ද පෙරළා හරිණ ලද්දා වූ ම එය ප්‍රයොගයාගේ ගතිය යම්තාක් ද ඒ තාක් ගොස් බමා බිම වැටුනේ ය. දේවයෙනි, යම් ඒ රියසකෙක් සරයක් අඩු සමසෙකින් නිමවන ලද ද, එහි නිම් වළල්ල ද නො වක් වෙයි. නිදොස් වෙයි. එලයෙන් තොර වෙයි. (එහි) දැව්හු ද නො වක්හ නිදොස්හ. එල යෙන් තොරහ. නැබ ද නො වක්ය, නිදොස්ය, එලයෙන් තොරය, නිම් වළල්ලේ නොවක් බැවින් නිදොස් බැවින් එලයෙන් තොර බැවින් ද, දැව්යෙහි නො වක් බැවින් නිදොස් බැවින් එලයෙන් තොර බැවින් ද, නැබෙහි නො වක් බැවින් ද නිදොස් බැවින් ද එලයෙන් තොර බැවින් ද පෙරළා හරිණ ලද්දා වූ ම එය ප්‍රයොගයාගේ ගතිය යම්තාක් ද ඒ තාක් ගොස් අකුරෙහි වැද තුබුවා සෙයින් සිටියේය.

සියා ඛො පන භික්ඛවෙ තුම්හාකං එවමස්ස: අඤ්ඤො නූන තෙන සමයෙන සො රථකාරො අහොසීති. න ඛො පනෙතං භික්ඛවෙ එවං දට්ඨබ්බං. අහං තෙන සමයෙන සො රථකාරො අහොසිං. තදා පනාහං භික්ඛවෙ කුසලො දාරුවඞ්කානං දාරුදොසානං දාරුකසාවානං. එතරහි ඛො පනාහං භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො කුසලො කායවඞ්කානං කායදොසානං කායකසාවානං. කුසලො වචීවඞ්කානං වචීදොසානං වචීකසාවානං. කුසලො මනොවඞ්කානං මනොදොසානං මනොකසාවානං.

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා කායවඞ්කො අප්පහීනො කායදොසො කායකසාවො. වචීවඞ්කො අප්පහීනො වචීදොසො වචීකසාවො. මනොවඞ්කො අප්පහීනො මනොදොසො මනොකසාවො. එවං පපතිතා තෙ භික්ඛවෙ ඉමස්මා ධම්මවිනයා. සෙය්‍යථාපි තං චක්කං ඡහි දිවසෙහි නිට්ඨිතං.

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා කායවඞ්කො පහීනො කායදොසො කායකසාවො. වචීවඞ්කො පහීනො වචීදොසො වචීකසාවො. මනොවඞ්කො පහීනො මනොදොසො මනොකසාවො. එවං පතිට්ඨිතා තෙ භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ. සෙය්‍යථාපි තං චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: කායවඞ්කං පජහිස්සාම, කායදොසං කායකසාවං. වචීවඞ්කං පජහිස්සාම, වචීදොසං වචීකසාවං. මනොවඞ්කං පජහිස්සාම, මනොදොසං මනොකසාවන්ති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

### 3. 1. 2. 6.

[සාවත්ථිනිදානං:]

16. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකතං[1] පටිපදං පටිපන්නො හොති, යොනි චස්ස ආරද්ධා හොති. ආසවානං ඛයාය. කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති, භොජනෙ මත්තඤ්ඤූ හොති, ජාගරියං අනුයුත්තො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණ[2]මෙතං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අනවාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා - ඝාණෙන ගන්ධං ඝායිත්වා - ජිව්හාය රසං සායිත්වා - කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙතං[2] මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

---

1. අපණ්ණකපටිපදං - ස්‍යා. මජසං 2, යත්වාධිකරණමෙනං - මජසං. ස්‍යා,

මහණෙනි, එසමයෙහි ඒ රියකරු ඒකාන්තයෙන් අනෙකෙක් විය හැක්කැ යි තොපට මෙබඳු සිතෙක් විය හෙයි. මහණෙනි, මේය මෙසේ නො දක්ක යුතු ම ය. එ සමයෙහි මම ඒ රියකරු වීමි. මහණෙනි, මම වනාහි එකල දැව පිළිබඳ ඇදෙහි දැව පිළිබඳ දොස්හි දැව පිළිබඳ එලයෙහි නිපුණයෙකිම් වීමි. මහණෙනි, දැන් වනාහි මම අර්හත් සම්‍යක් සම්බුද්ධවූයෙම් කායවඞ්කයන්ගේ ද කායදොෂයන්ගේ ද කායකෂායයන්ගේ ද නිපුණයෙකිම් වෙමි. වාග්වඞ්කයන්ගේ ද වාග්දොෂයන්ගේ ද වාක්කෂායයන්ගේ ද නිපුණයෙකිම් වෙමි. මනොවඞ්කයන්ගේ ද මනොදොෂයන්ගේද මනඃකෂායයන්ගේ ද නිපුණයෙකිම් වෙමි.

මහණෙනි, යම්කිසි මහණකුගේ හෝ මෙහෙණකගේ හෝ කායවඞ්කය කායදොෂය කායකෂායය ප්‍රහීණ නුවූයේ වේ ද, වාග්වඞ්කය වාග්දොෂය වාක්කෂායය ප්‍රහීණ නුවූයේ වේ ද, මනොවඞ්කය මනොදොෂය මනඃකෂායය ප්‍රහීණ නුවූයේ වේ ද, මහණෙනි, මෙසේ ඔහු මේ (ධර්මවිනයයෙන්) ශාසනයෙන් ගුණ හීනවීමෙන් වැටුනාහු වෙති. සදවසෙකින් නිමවන ලද ඒ රියසක යම්සේ වේ ද, එසේය.

මහණෙනි, යම් කිසි මහණකුගේ හෝ මෙහෙණකගේ හෝ කායවඞ්කය කායදොෂය කායකෂායය ප්‍රහීණ වූයේ ද, වාග්වඞ්කය වාග්දොෂය වාක්කෂායය ප්‍රහීණ ද, මනොවඞ්කය මනොදොෂය මනඃකෂායය ප්‍රහීණ ද, මහණෙනි, මෙසේ වනාහි ඔහු මෙසස්නෙහි පිහිටියාහු වෙති. සරයක් හළ සමසෙකින් නිමි ඒ රියසක යම්සේ වේ ද එසේය.

මහණෙනි, එහෙයින් කායවඞ්කය කායදොෂය කායකෂායය දුරලන්නම්හ. වාග්වඞ්කය වාග්දොෂය වාක්කෂායය දුරලන්නම්හ. මනොවඞ්කය මනොදොෂය මනඃකෂායය දුරලන්නම්හ යි මෙසේ හික්මිය යුතුයි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

## 3. 1. 2. 6.

[සැවැත් නිදානයි:]

16. මහණෙනි, ධර්ම තුනෙකින් සමන්වාගත භික්ෂු තෙම අවිරුද්ධ ප්‍රතිපත්තියට පිළිපන්නේ වෙයි. ඔහු විසින් ආස්‍රවයන්ගේ ක්ෂයය පිණිස කරුණ ද පටන්ගන්නා ලද්දේ වේ. කවර තුනෙකින යුත්· මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ඉන්ද්‍රියයන් විෂයයෙහි රක්නා ලද දොර ඇත්තේ වේ. භොජනයෙහි මාත්‍රඥ වේ. නිදිවැරීමෙහි යෙදුනේ වේ.

මහණෙනි, භික්ෂු තෙම කෙසේ ඉන්ද්‍රිය විෂයෙහි රක්නා ලද දොර ඇති වේ ද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් නො ගන්නේ වේ. අනුව්‍යඤ්ජන වශයෙන් නො ගන්නේ වේ. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රියය අසංවර කොට වාසය කරණ මේ පුද්ගලයා අභිධ්‍යා දොර්මනස්‍ය නම් වූ ලාමක අකුශල ධර්මයෝ ලුහු බඳනාහු ද, ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදනේ ය. චක්ෂුරින්ද්‍රියය රක්නේ ය. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙන්නේ ය. කණින් ශබ්දයක් අසා ... නාසිකායෙන් ගඳක් ආඝ්‍රාණය කොට ... දිවෙන් රසයක් විඳ .... කයින් ස්ප්‍රෂ්ටව්‍යයක් ස්පර්ශ කොට...සිතින් දහමක් දැන නිමිති වශයෙන් නොගන්නේ වේ ද, අනුව්‍යඤ්ජන වශයෙන් නො ගන්නේ වේ ද, අභිධ්‍යා දොර්මනස්‍ය නම් වූ ලාමක අකුශලධර්මයෝ තුමූ ම ඉන්ද්‍රියය සංවර කොට නොගෙණ වසන මේ පුගුලා යම් හෙයෙකින් ලුහු බඳනාහු ද, ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. මහණෙනි, මහණ තෙමේ මෙසේ ඉන්ද්‍රිය විෂයයෙහි වැසූ ද්වාර ඇති වේ.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු භොජනෙ මත්තඤ්ඤු හොති: ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති, නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය. යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති, අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. එවං බො භික්ඛවෙ භික්ඛු භොජනෙ මත්තඤ්ඤු හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ජාගරියං අනුයුත්තො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති, පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා. රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. එවං බො භික්ඛවෙ භික්ඛු ජාගරියං අනුයුත්තො හොති. ඉමෙහි බො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකතං පටිපදං පටිපන්නො හොති. යොනි චස්ස ආරද්ධා හොති ආසවානං ඛයායාති.

## 3. 1. 2. 7.

17. තයොමෙ භික්ඛවෙ ධම්මා අත්තව්‍යාබාධායපි සංවත්තන්ති, පරව්‍යාබාධායපි සංවත්තන්ති, උභයව්‍යාබාධායපි සංවත්තන්ති. කතමෙ තයො: කායදුච්චරිතං, වචීදුච්චරිතං, මනොදුච්චරිතං. ඉමෙ බො භික්ඛවෙ තයො ධම්මා අත්තව්‍යාබාධායපි සංවත්තන්ති, පරව්‍යාබාධායපි සංවත්තන්ති, උභයව්‍යාබාධායපි සංවත්තන්ති.

තයොමෙ භික්ඛවෙ ධම්මා නෙවත්තව්‍යාබාධායපි සංවත්තන්ති. න පරව්‍යාබාධායපි සංවත්තන්ති. න උභයව්‍යාබාධායපි සංවත්තන්ති. කතමෙ තයො: කායසුචරිතං, වචීසුචරිතං, මනොසුචරිතං. ඉමෙ බො භික්ඛවෙ තයො ධම්මා නෙවත්තව්‍යාබාධායපි සංවත්තන්ති. න පරව්‍යාබාධායපි සංවත්තන්ති. න උභයව්‍යාබාධායපි සංවත්තන්තීති.

## 3. 1. 2. 8.

18. සචෙ වො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: දෙවලොකූපපත්තියා ආවුසො සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතීති?[1] නනු තුම්හෙ භික්ඛවෙ එවංපුට්ඨා අට්ටීයෙය්‍යාථ, හරායෙය්‍යාථ, ජිගුච්ඡෙය්‍යාථාති? එවම්භන්තෙ. ඉති කිර තුම්හෙ භික්ඛවෙ දිබ්බෙන ආයුනා අට්ටීයථ, හරායථ, ජිගුච්ඡථ. දිබ්බෙන වණ්ණෙන - දිබ්බෙන සුඛෙන-දිබ්බෙන යසෙන - දිබ්බෙන ආධිපතෙය්‍යෙන, අට්ටීයථ, හරායථ, ජිගුච්ඡථ. පගෙව බො පන භික්ඛවෙ තුම්හෙහි කායදුච්චරිතෙන අට්ටීයිතබ්බං, හරායිතබ්බං, ජිගුච්ඡිතබ්බං. වචී- -පෙ- මනොදුච්චරිතෙන අට්ටීයිතබ්බං, හරායිතබ්බං, ජිගුච්ඡිතබ්බං.

---

1 වුස්සථාති - සීමු, මජසං.

මහණෙනි, මහණ තෙම කෙසේ භෝජනයෙහි මාත්‍රාඥ වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙම නුවණින් සලකා අහර ගණියි. කෙළි පිණිස නො වේ, මද පිණිස නො වේ, අඩුතැන් පිරවීම පිණිස නො වේ, සැරසීම පිණිස නො වේ, මේ සිරුර පැවැත් ම පිණිස ම වේ, යැපීම පිණිස ම වේ, සාගිනි වේදනාව වැළැක් ම පිණිස ම වේ, ශාසනමාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයාට අනුග්‍රහ පිණිස ම වේ, මෙසේ පැරණි කුසගිනි වේදනාව නසන්නෙමි. අභිනව වේදනා නූපදවන්නෙමි. මාගේ ජීවිත යාත්‍රාව ද වන්නේ ය. නිදෙස්බව ද නිවැරදිබව ද පහසු විහරණය ද වන්නේ ය යනුයි. මහණෙනි, මෙසේ වනාහි මහණ තෙමේ භොජනයෙහි පමණ දන්නේ වේ.

මහණෙනි, මහණ තෙම කෙසේ වනාහි නිදිවැරීමෙහි යෙදුනේ වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ දවල් සක්මනින් ද හිඳීමෙන් ද නීවරණධර්ම-යන් කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. රෑ පළමු යම සක්මනින් ද හිඳීමෙන් ද නීවරණධර්මයන්ගෙන් සිත පිරිසිදු කෙරෙයි, රෑ මැදියම දකුණු පයෙහි වම්පය මදක් හයා තබා නැඟීසිටුනා සංඥව මෙනෙහි කොට සිහි ඇත්තේ නුවණ ඇත්තේ සිංහ ශය්‍යාව කරයි. රෑ පැසුළුයම නැඟිට සක්මනින් ද හිඳීමෙන් ද නීවරණධර්මයන් කෙරෙන් සිත පිරිසිදු කරයි. මහණෙනි, මෙසේ වනාහි මහණ තෙමේ නිදිවැරීමෙහි යෙදුනේ වෙයි. මහණෙනි, මේ ධර්ම තුනෙන් සමන්වාගත මහණ අවිරුද්ධ ප්‍රතිපත්තියට පිළිපන්නේ වෙයි. ආස්‍රවයන්ගේ ක්‍ෂයය පිණිස කරුණු ද පටන්ගන්නා ලද්දේ වෙයි.

## 3. 1. 2. 7.

17. මහණෙනි, මේ ධර්මයෝ තුන්දෙනෙක් තමාට පීඩාව පිණිස ද පවත්නාහ. මෙරමාහට පීඩා පිණිස ද පවත්නාහ. දෙදෙනාහට ම පීඩා පිණිස පවත්නාහ. කවර තුන්දෙනෙක යත්: කායදුශ්චරිත ය වාග්දුශ්චරිත ය මනෝදුශ්චරිත යි. මහණෙනි, මේ ධර්මයෝ තුන්දෙන තමාට හිංසාව පිණිස ද පවත්නාහ. මෙරමාහට හිංසාව පිණිස ද, දෙදෙනාහට හිංසාව පිණිස ද පවත්නාහ.

මහණෙනි, මේ ධර්මයෝ තුන්දෙනෙක් තමාට පීඩා පිණිස ද නො පවත්නාහ. මෙරමාහට පීඩා පිණිස ද නො පවත්නාහ. දෙදෙනාහට ම පීඩා පිණිස නො පවත්නාහ. කවර තුන්දෙනෙක යත්: කායසුචරිතය වාක්-සුචරිතය මනඃසුචරිතයි. මහණෙනි, මේ ධර්මයෝ තුන්දෙන තමාට පීඩා පිණිස ද නො පවත්නාහ. මෙරමාහට පීඩා පිණිස ද නො ම පවත්නාහ. දෙදෙනාහට ම පීඩා පිණිස ද නො ම පවත්නාහ.

## 3. 1. 2. 8.

18. මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, දෙව්ලොව උපදනා සඳහා මහණගොයුම්හු කෙරෙහි බඹසරවස් වැසෙන්නේ වේ ද"යි මෙසේ පුළුවුස්නාහු නම්, මහණෙනි, තෙපි මෙසේ පුළුවුස්නා ලද්දහු පීඩිතවන්නහු නොවවු ද, ලජ්ජිතවන්නහු නොවවු ද, ජුගුප්සා ඇත්තහු නොවවු ද යි. වහන්ස, එසේය. මහණෙනි, මෙසේ තෙපි දිව්‍ය ආයුෂින් පීඩිත වව, ලජ්ජිත වව, හටගත් ජුගුප්සා ඇති වව, දිව්‍ය වූ වර්‍ණයෙන් - දිව්‍ය වූ සුඛයෙන් - දිව්‍ය වූ යශසින් - දිව්‍ය වූ ආධිපත්‍යයෙන් පීඩිත වව, ලජ්ජිත වව, ජුගුප්සා ඇති වව, මහණෙනි, තොප විසින් කැල ම කායදුශ්චරිතයෙන් පීඩිත වූව මැනව, ලජ්ජිත වූව මැනව, ජුගුප්සා ඇති වූව මැනව. වාග්දුශ්චරිතයෙන් ... මනො-දුශ්චරිතයෙන් පීඩිත වූව මැනව, ලජ්ජිත වූව මැනව, ජුගුප්සා ඇති වූම මැනව

## 3. 1. 2. 9.

19. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො අභබ්බො අනධිගතං වා භොගං අධිගන්තුං, අධිගතං වා භොගං ඵාතිකත්තුං.[1] කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ පාපණිකො පුබ්බණ්හසමයං න සක්කච්චං කම්මන්තං අධිට්ඨාති, මජ්ඣන්තිකං[2] සමයං න සක්කච්චං කම්මන්තං අධිට්ඨාති, සායන්හසමයං න සක්කච්චං කම්මන්තං අධිට්ඨාති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො අභබ්බො අනධිගතං වා භොගං අධිගන්තුං, අධිගතං වා භොගං ඵාතිකත්තුං.[1]

එවමෙව ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං, අධිගතං වා කුසලං ධම්මං ඵාතිකත්තුං[1]. කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ භික්ඛු පුබ්බණ්හසමයං න සක්කච්චං සමාධිනිමිත්තං අධිට්ඨාති. මජ්ඣන්තිකං සමයං න සක්කච්චං සමාධිනිමිත්තං අධිට්ඨාති. සායන්හසමයං න සක්කච්චං සමාධිනිමිත්තං අධිට්ඨාති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං, අධිගතං වා කුසලං ධම්මං ඵාතිකත්තුං[1].

තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො භබ්බො අනධිගතං වා භොගං අධිගන්තුං, අධිගතං වා භොගං ඵාතිකත්තුං[2]. කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ පාපණිකො පුබ්බණ්හසමයං සක්කච්චං කම්මන්තං අධිට්ඨාති, මජ්ඣන්තිකං සමයං -පෙ- සායන්හසමයං සක්කච්චං කම්මන්තං අධිට්ඨාති ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො භබ්බො අනධිගතං වා භොගං අධිගන්තුං, අධිගතං වා භොගං ඵාතිකත්තුං.

එවමෙව ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං, අධිගතං වා කුසලං ධම්මං ඵාතිකත්තුං. කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ භික්ඛු පුබ්බණ්හසමයං සක්කච්චං සමාධිනිමිත්තං අධිට්ඨාති. මජ්ඣන්තිකං සමයං -පෙ- සායන්හසමයං සක්කච්චං සමාධිනිමිත්තං අධිට්ඨාති, ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං, අධිගතං වා කුසලං ධම්මං ඵාතිකත්තුන්ති.

## 3. 1. 2. 10

20. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො න චිරස්සෙව මහන්තත්තං[2] වෙපුල්ලත්තං පාපුණාති භොගෙසු. කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ පාපණිකො චක්ඛුමා ච හොති, විධුරො ච, නිස්සයසම්පන්නො ච.

1. ඵාතිකාතුං - PTS. සහා. ඵාතිං කාතුං - මජසං.
2. මජ්ඣන්තිකසමයං - මජසං. සහා.

**3. 1. 2. 9**

19. මහණෙනි, අඞ්ග තුනෙකින් සමන්‍වාගත වෙළෙඳ නොලැබූ භෝග ලබන්නට වේවයි ලැබූ භෝග දියුණු කරන්නට වේවයි අභව්‍යයෙයි. කවර අඞ්ග තුනෙකින යත්: මහණෙනි, මෙලොව්හි වෙළෙඳ පෙරවරු කාලයෙහි සකසා කර්මාන්තයෙහි නො සිටුනේ ද, මධ්‍යාහ්න කාලයෙහි කර්මාන්තයෙහි සකසා නො සිටුනේ ද, සවස් කාලයෙහි කර්මාන්තයෙහි සකසා නොසිටුනේ ද, මහණෙනි, මේ අඞ්ග තුනෙන් සමන්‍වාගත වූ වෙළෙඳ නොලත් භොග ලබා ගන්නට වේවයි ලැබූ භොග දියුණු කරනනට වේවයි අභව්‍ය වේ.

මහණෙනි, එපරිද්දෙන් ම ධර්ම තුනෙකින් සමන්‍වාගත වූ මහණ නොලත් කුසල්දහම් ලබන්නට වේවයි ලැබූ කුසල්දහම් වඩාගන්නට වේවයි අභව්‍ය වෙයි කවර තුනෙකින යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ පෙරවරු කාලයෙහි සකසා සමාධිනිමිත්තෙහි නොසිටුනේ ද, මධ්‍යාහ්නකාලයෙහි සකසා සමාධිනිමිත්තෙහි නොසිටුනේ ද, සවස්කාලයෙහි සකසා සමාධිනිමිත්තෙහි නොසිටුනේ ද, මහණෙනි, මේ ධර්ම තුනෙන් සමන්‍වාගත වූ මහණ නො ලැබූ සමාධිනිමිත්ත ලබා ගන්නට වේවයි ලැබූ සමාධිනිමිත්ත වඩාගන්-නට වේවයි අභව්‍ය වේ.

මහණෙනි, අඞ්ග තුනෙකින් සමන්‍වාගත වෙළෙඳ නොලැබූ භොග ලබාගන්නට වේවයි. ලැබූ භොග වඩාගන්නට වේවයි භව්‍ය වෙයි. කවර තුනෙකින යත්: මහණෙනි, මෙලොව්හි වෙළෙඳ පෙරවරුකාලයෙහි සකසා කර්මාන්තයෙහි සිටුනේ ද, මධ්‍යාහ්නකාලයෙහි සකසා කර්මාන්තයෙහි සිටුනේ ද, සවස් කාලයෙහි සකසා කර්මාන්තයෙහි සිටුනේ ද. මහණෙනි, මේ අඞ්ගතුනෙන් සමන්‍වාගත වෙළෙඳ නොලැබූ භොග ලබන්නට වේවයි ලැබූ භොග වඩා-ගන්නට වේවයි භව්‍ය වේ.

මහණෙනි, එපරිද්දෙන් ම ධර්ම තුනෙකින් සමන්‍වාගත මහණ නො ලැබූ කුසල්දහම් ලබන්නට වේවයි ලැබූ කුසල්දහම් වඩන්නට වේවයි භව්‍ය වෙයි කවර තුනෙකින යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ පෙරවරු කාල යෙහි සමාධිනිමිත්තෙහි සකසා සිටුනේය. මධ්‍යාහ්නකාලයෙහි සමාධිනිමිත්-තෙහි සකසා සිටුනේය. සවස්කාලයෙහි සමාධිනිමිත්තෙහි සකසා සිටුනේය. මහණෙනි, මේ ධර්මතුනෙන් සමන්‍වාගත වූ මහණ නොලැබූ කුසල්දහම් ලබන්නට වේවයි, ලැබූ කුසල්දහම් වඩන්නට වේවයි භව්‍ය වේ.

**3. 1. 2. 10.**

20. මහණෙනි, අඞ්ග තුනෙකින් සමන්‍වාගත වෙළෙඳ නොබෝ කලෙකින් ම භොගවිෂයෙහි මහත්බවට විපුලබවට පැමිණෙයි. කවර තුනෙකින යත්: මහණෙනි, මෙලොව්හි වෙළෙඳ නුවණැස් ඇත්තේ වෙයි, ඥනසම්ප්‍ර-යුක්ත වියඅී ඇත්තේ ද වෙයි, නිඃශ්‍රයසම්පන්න ද වේ.

කථඤ්ච භික්ඛවෙ පාපණිකො චක්ඛුමා හොති: ඉධ භික්ඛවෙ පාපණිකො පණියං ජානාති. ඉදං පණියං එවං කීතං එවං වික්කයමානං එත්තකං මූලං භවිස්සති එත්තකො උදයොති[1] එවං ඛො භික්ඛවෙ පාපණිකො චක්ඛුමා හොති. කථඤ්ච භික්ඛවෙ පාපණිකො විධුරො හොති: ඉධ භික්ඛවෙ පාපණිකො කුසලො හොති පණියං කෙතුඤ්ච වික්කෙතුඤ්ච. එවං ඛො භික්ඛවෙ පාපණිකො විධුරො හොති.

කථඤ්ච භික්ඛවෙ පාපණිකො නිස්සයසම්පන්නො හොති: ඉධ භික්ඛවෙ පාපණිකං යෙ තෙ ගහපති වා ගහපතිපුත්තා වා අඩ්ඪා මහද්ධනා මහාභොගා තෙ නං එවං ජානන්ති: අයං ඛො භවං පාපණිකො චක්ඛුමා ච විධුරො ච පටිබලො පුත්තදාරඤ්ච පොසෙතුං. අම්හාකඤ්ච කාලෙන කාලං අනුප්පදාතුන්ති. තෙ නං භොගෙහි නිපතන්ති: ඉතො සම්ම පාපණික, භොගෙ හරිත්වා[2] පුත්තදාරඤ්ච පොසෙහි අම්හාකඤ්ච කාලෙන කාලං අනුප්පදෙහීති. එවං ඛො භික්ඛවෙ පාපණිකො නිස්සයසම්පන්නො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො න චිරස්සෙව මහන්තත්තං[3] වෙපුල්ලත්තං පාපුණාති භොගෙසු.

එවමෙව ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව මහන්තත්තං[3] වෙපුල්ලත්තං පාපුණාති කුසලෙසු ධම්මෙසු, කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුමා ච හොති විධුරො ච නිස්සයසම්පන්නො ච. කථඤ්ච භික්ඛවෙ භික්ඛු චක්ඛුමා හොති: ඉධ භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු චක්ඛුමා හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු විධුරො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු විධුරො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු නිස්සයසම්පන්නො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛූ බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා. තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡති, පරිපඤ්හති ඉදං භන්තෙ කථං? ඉමස්ස කො අත්ථොති? තස්ස තෙ ආයස්මන්තො අවිවටඤ්චෙව විවරන්ති අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති, අනෙකවිහිතෙසු[4] කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති. එවං ඛො භික්ඛවෙ භික්ඛු නිස්සයසම්පන්නො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව මහන්තත්තං[3] වෙපුල්ලත්තං පාපුණාති කුසලෙසු ධම්මෙසූති.

පඨමභාණවාරො නිට්ඨිතො.

වග්ගො දුතියො

1. උද්දයොති - සාළුවි. 2. සරිත්වා - මජසං. 3. මහත්තං - මජසං.
4. අනෙකවිහිතෙසු ච - මජසං.

තස්සුද්දානං:- ක්‍යෙහාසරණීයෙසා භික්ඛු - වසාවත්ති සංවතනො, අපණ්ණකතා දෙවො ච-
දුවෙ පාපණිකෙ සහාවාති - මජසං.

මහණෙනි, වෙළෙන්ද කෙසේ නුවණැස් ඇති වේ ද යත්: මහණෙනි, මේ ලොව්හි වෙළෙන්ද “මේ වෙළෙඳ බඩු මෙසේ මිල දී ගන්නා ලද්දේ මෙසේ විකුණනු ලබන්නේ මෙතෙක් මිල වෙයි. මෙතෙක් ලාභ වේ යයි” බඩුමිල දනී ද, මහණෙනි, මෙසේ වනාහි වෙළෙඳ තෙම නුවණැස් ඇති වෙයි. මහණෙනි, කෙසේ නම්, වෙළෙඳ තෙම ඥනසම්ප්‍රයුක්ත වීර්‍ය්‍ය ඇති වේ ද යත්: මහණෙනි, මෙලොව්හි වෙළෙඳ තෙම වෙළෙඳ බඩු මිලට ගන්නට හා විකුණන්නට හා දක්‍ෂ වේ ද, මහණෙනි, මෙසේ වනාහි වෙළෙඳ තෙම ඥනසම්ප්‍රයුක්ත වීර්‍ය්‍ය ඇති වෙයි.

මහණෙනි, වෙළෙඳ තෙම කෙසේ නම් නිඃශ්‍රයසම්පන්න වේ ද? යත් මහණෙනි, මෙලොව්හි වෙළෙඳෙක් වේද, ‘‘ආඪ්‍ය වූ මහත් වූ ධන ඇති, මහා භොග ඇති, යම් ඒ ගෘහපති කෙනෙක් හෝ ඇත් ද, ගෘහපතිපුත්‍ර කෙනෙක් හෝ ඇත් ද, ඔවුහු “මේ භවත් වෙළෙඳ තෙම නුවණැස් ඇත්තේ ද, විධුර ද වෙයි. අඹුදරුවන් පුස්නට හා අපට කලින් කල අනුප්‍රදනය කරන්නට ද ප්‍රතිබල වේ ය”යි මෙසේ ඔහු දන ගණිත් ද, ඔවුහු “සගය, වාණිජයෙනි, මෙයින් භොගයන් ගෙණ ගොස් අඹුදරුවන් පුස්ව, කලින් කල අපට ද දෙව”යි ඔහු භොගයෙන් පවරත්. මහණෙනි, මෙසේ වනාහි වෙළෙඳ තෙම නිඃශ්‍රයසම්පන්න වේ. මහණෙනි, මේ අඞ්ග තුණෙන් යුත් වෙළෙඳ තෙම භොගවිෂයෙහි මහත්බවට විපුලබවට පැමිණෙයි.

මහණෙනි, එපරිද්දෙන් ම ධර්‍ම තුණෙකින් සමන්‍වාගත මහණ තොබෝ කලෙකින් ම ධර්‍මවිෂයෙහි මහත් බවට විපුල බවට පැමිණෙයි. කවර තුණෙකින යත්: මහණෙනි, මේ ශාසනයෙහි මහණ නුවණැස් ඇත්තේ ප්‍රඥ ඇත්තේ නිඃශ්‍රය ඇත්තේ වෙයි. මහණෙනි, මහණ කෙසේ නුවණැස් ඇති වේ ද යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ තෙම “මෙය දුක”යි තත් වූ පරිද්දෙන් දනී ද – මෙය දුක් නැති කිරීමට යන ප්‍රතිපදා යයි තත් වූ පරිද්දෙන් දනී ද, මහණෙනි, මෙසේ වනාහි මහණ නුවණැස් ඇති වෙයි.

මහණෙනි, මහණ කෙසේ නම් විධුර වූයේ වේ ද? මහණෙනි, මේ සස්නෙහි මහණ අකුශලධර්‍මයන් ප්‍රහීණ කිරීම පිණිස පටන්ගත් වැර ඇත්තේ වෙසෙයි ද, කුසල්දහම් වැඩීම පිණිස ශක්ති ඇත්තේ දෘඪපරාක්‍රම ඇත්තේ වේ ද, කුශලධර්‍මයන් කෙරෙහි නොහළ වීර්‍ය්‍ය ඇති වේ ද, මහණෙනි, මෙසේ වනාහි මහණ වීර්‍ය්‍ය ඇති වෙයි.

මහණෙනි, මහණ කෙසේ නම් නිඃශ්‍රය ඇති වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ, බහුශ්‍රැත වූ පැමිණි ශාස්ත්‍රශාසන ඇති ධර්‍මධර වූ විනයධර වූ (උභය) මාතෘකාධර වූ යම් මහණ කෙනෙක් වෙත් ද, කලින් කල ඔවුන් වෙත පැමිණ කරුණු නොකරුණු විචාරා ද, වහන්ස, මෙය කෙසේ ය? මෙහි අර්‍ථය කිමෙකැයි? ප්‍රශ්නකරයි ද, ඒ ආයුෂ්මත්හු ඔහුට අප්‍රකට වූ ධර්‍මය ද විවර කෙරෙති. විස්තෘත නුවූ ධර්‍මය විස්තර කෙරෙති. නන්වැදෑරුම් සැකයට කරුණු වූ ධර්‍මයන් කෙරෙහි සැක දුරලති. මහණෙනි, මෙසේ වනාහි මහණ නිඃශ්‍රය ඇති වේ. මහණෙනි, මේ ධර්‍ම තුණෙන් සමන්‍වාගත වූ මහණ නොබෝ කලෙකින් ම ධර්‍මවිෂයෙහි මහත්බවට විපුල බවට පැමිණෙයි.

**පළමු වන බණවර නිමි.**

**දෙවන වග යි.**

**3. 1. 3. 1**

21. ඒවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා ච **සවිට්ඨො**[1] ආයස්මා ච **මහාකොට්ඨිතො** යෙනායස්මා **සාරිපුත්තො** තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සවිට්ඨං ආයස්මා සාරිපුත්තො එතදවොච:

තයොමෙ ආවුසො සවිට්ඨ[1], පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: කායසක්ඛි, දිට්ඨිප්පත්තො,[2] සද්ධාවිමුත්තො. ඉමෙ ඛො ආවුසො තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. ඉමෙසං[3] ඛො ආවුසො තිණ්ණං පුග්ගලානං කතමො තෙ පුග්ගලො ඛමති අභික්කන්තතරො ච පණීතතරො චාති.

තයොමෙ ආවුසො සාරිපුත්ත, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො? කායසක්ඛි දිට්ඨිප්පත්තො සද්ධාවිමුත්තො. ඉමෙ ඛො ආවුසො තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. ඉමෙසං ආවුසො තිණ්ණං පුග්ගලානං ය්වායං පුග්ගලො සද්ධාවිමුත්තො, අයං මෙ පුග්ගලො ඛමති, ඉමෙසං තිණ්ණං පුග්ගලානං අභික්කන්තතරො ච, පණීතතරො ච. තං කිස්ස හෙතු, ඉමස්සාවුසො පුග්ගලස්ස සද්ධින්ද්‍රියං අධිමත්තන්ති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොච: තයො මෙ ආවුසො කොට්ඨිත, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: කායසක්ඛි දිට්ඨිප්පත්තො සද්ධාවිමුත්තො. ඉමෙ ඛො ආවුසො තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. ඉමෙසං ආවුසො තිණ්ණං පුග්ගලානං කතමො තෙ පුග්ගලො ඛමති, අභික්කන්තතරො ච පණීතතරො චාති.

තයොමෙ ආවුසො සාරිපුත්ත, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: කායසක්ඛි, දිට්ඨිප්පත්තො, සද්ධාවිමුත්තො. ඉමෙ ඛො ආවුසො තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. ඉමෙසං ආවුසො තිණ්ණං පුග්ගලානං ය්වායං පුග්ගලො කායසක්ඛි, අයං මෙ පුග්ගලො ඛමති, ඉමෙසං තිණ්ණං පුග්ගලානං අභික්කන්තතරො ච පණීතතරො ච. තං කිස්ස හෙතු? ඉමස්සාවුසො පුග්ගලස්ස සමාධින්ද්‍රියං අධිමත්තන්ති.

අථ ඛො ආයස්මා මහාකොට්ඨිතො[4] ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: තයොමෙ ආවුසො සාරිපුත්ත, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: කායසක්ඛි දිට්ඨිප්පත්තො සද්ධාවිමුත්තො. ඉමෙ ඛො ආවුසො තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. ඉමෙසං ආවුසො තිණ්ණං පුග්ගලානං කතමො තෙ පුග්ගලො ඛමති, අභික්කන්තතරො ච පණීතතරො චාති.

---

1 සවිට්ඨො - මජසං. 2 දිට්ඨිප්පත්තො - සාළුවි 3 ඉමෙසං ආවුසො - මජසං
4 මහාකොට්ඨිකො - මජසං

## 3. 1. 3. 1.

21. **මා** විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ අනේපිඩු මහසිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් සවිට්ඨ තෙරණුවන් හා ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හා සමඟ සතුටු වූහ. සමෝමෝදනයට හේතු වන සිහි කරන්නට නිසි කථාව කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් සවිට්ඨ තෙරණුවන්ට ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තෙල කීහ:

ඇවැත්නි, සවිට්ඨයෙනි, ලොවිහි මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ඇත. කවර තුන් දෙනෙක යත්: කායසක්ඛී ය, දිට්ඨිප්පත්ත ය, සද්ධාවිමුත්තයි. ඇවැත්නි, මේ පුද්ගලයෝ තුන්දෙන ලොව්හි විද්‍යමාන වෙත්. ඇවැත්නි, මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් කවර පුද්ගලයෙක් තොපට ඉතා මැනැවැයි ප්‍රණීතතරය යි රුස්නේ ය?

ඇවැත් ශාරිපුත්‍රයෙනි, ලොව්හි මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ඇත. කවර තුන් දෙනෙක යත්: කායසක්ඛී ය, දිට්ඨිප්පත්ත ය, සද්ධාවිමුත්තයි. ඇවැත්නි: ලොව්හි මේ පුද්ගලයෝ තුන් දෙන විද්‍යමාන වෙති. ඇවැත්නි, මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් සද්ධාවිමුත්ත නම් යම් පුද්ගලයෙක් වේ ද, මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් මේ පුද්ගල තෙමේ වඩා මැනැවැයි ද වඩා ප්‍රණීත යයි ද මට රුස්නේ වේ. එට හේතු කවරේය යත්: ඇවැත්නි, මේ පුද්ගලයාගේ ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වේ ද එහෙයිනි.

ඉක්බිති, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන්ට තෙල කීහ: ඇවැත, කොට්ඨිතයෙනි, ලොව්හි මේ පුද්ගලයෝ තුන් දෙනෙක් විද්‍යමාන වෙති. කවර තුන් දෙනෙක යත්: කායසක්ඛී ය, දිට්ඨිප්පත්ත ය, සද්ධාවිමුත්තයි. ඇවැත්නි, මේ පුද්ගලයෝ තුන්දෙන ලොව්හි විද්‍යමාන වෙති. ඇවැත්නි, මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් කවර පුද්ගලයෙක් වඩා මැනැවැයි ද, වඩා ප්‍රණීතය යී ද තොපට රුස්නේ වේ ද?

ඇවැත් ශාරිපුත්‍රයෙනි, ලොව්හි මේ පුද්ගලයෝ තුන් දෙනෙක් වෙති. කවර තුන් දෙනෙක යත්: කායසක්ඛී ය, දිට්ඨිප්පත්ත ය, සද්ධාවිමුත්තයි. ඇවැත්නි, මේ පුද්ගලයෝ තුන්දෙන ලොව්හි විද්‍යමාන වෙති. ඇවැත්නි, මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙහි යම් පුද්ගලයෙක් කායසක්ඛී වේ ද, මේ පුද්ගල තෙමේ මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් වඩා මැනැවැයි ද, වඩා ප්‍රණීතය යි ද මට රුස්නේ වෙයි. ඒ කවර හෙයින යත්: ඇවැත්නි, මේ පුද්ගලයාගේ සමාධීන්ද්‍රිය ය ඉතා බලවත් වේ ද, එහෙයිනි.

ඉක්බිති ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට තෙල කීහ: ඇවැත් ශාරිපුත්‍රයෙනි, මේ පුද්ගලයෝ තුන්දෙනෙක් ලොව්හි විද්‍යමාන වෙත්. කවර තුන් දෙනෙක යත්: කායසක්ඛී ය, දිට්ඨිප්පත්ත ය, සද්ධාවිමුත්ත යි. ඇවැත්නි, මේ පුද්ගලයෝ තුන් දෙන ලොව්හි විද්‍යමාන වෙත්. ඇවැත්නි, මේ පුද්ගලයන් තුන්දෙනා අතුරෙන් කවර පුද්ගලයෙක් වඩා මැනවැයි ද, වඩා ප්‍රණීතය යි ද තොපට රුස්නේ වේ ද?

තයො මෙ ආවුසො කොට්ඨිත, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: කායසක්ඛි, දිට්ඨිප්පත්තො, සද්ධාවිමුත්තො. ඉමෙ ඛො ආවුසො තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. ඉමෙසං ආවුසො තිණ්ණං පුග්ගලානං ය්වායං පුග්ගලො දිට්ඨිප්පත්තො, අයං මෙ පුග්ගලො ඛමති, ඉමෙසං තිණ්ණං පුග්ගලානං අභික්කන්තතරො ච, පණීතතරො ච, තං කිස්ස හෙතු: ඉමස්සාවුසො පුග්ගලස්ස පඤ්ඤින්ද්‍රියං අධිමත්තන්ති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තඤ්ච සවිට්ඨං ආයස්මන්තඤ්ච මහාකොට්ඨිතං එතදවොච: ව්‍යාකතං ඛො ආවුසො අම්හෙහි සබ්බෙහෙව යථාසකං පටිභානං. ආයාමාවුසො යෙන භගවා තෙනුපසඞ්කමිස්සාම, උපසඞ්කමිත්වා භගවතො එතමත්ථං ආරොචෙස්සාම. යථා නො භගවා ව්‍යාකරිස්සති, තථා නං ධාරෙස්සාමාති.

එවමාවුසොති. ඛො ආයස්මා ච සවිට්ඨො ආයස්මා ච මහාකොට්ඨිතො ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. අථ ඛො ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච සවිට්ඨො ආයස්මා ච මහාකොට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො යාවතකො අහොසි ආයස්මතා ච සවිට්ඨෙන ආයස්මතා ච මහාකොට්ඨිතෙන සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි.

න ඛොත්ථ[1] සාරිපුත්ත සුකරං එකංසෙන ව්‍යාකාතුං, අයං ඉමෙසං තිණ්ණං පුග්ගලානං අභික්කන්තතරො ච පණීතතරො චාති. ඨානං හෙතං සාරිපුත්ත, විජ්ජති, ය්වායං පුග්ගලො සද්ධාවිමුත්තො ස්වාස්ස අරහත්තාය පටිපන්නො. ය්වායං පුග්ගලො කායසක්ඛි, ස්වාස්ස සකදාගාමී වා, අනාගාමී වා. යො වායං පුග්ගලො දිට්ඨිප්පත්තො, සොපස්ස සකදාගාමී වා, අනාගාමී වා. න ඛොත්ථ සාරිපුත්ත සුකරං, එකංසෙන ව්‍යාකාතුං, අයං ඉමෙසං තිණ්ණං පුග්ගලානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

ඨානං හෙතං සාරිපුත්ත විජ්ජති, ය්වායං පුග්ගලො කායසක්ඛි ස්වාස්ස අරහත්තාය පටිපන්නො. ය්වායං පුග්ගලො සද්ධාවිමුත්තො, ස්වාස්ස සකදාගාමී වා, අනාගාමී වා. යො වායං පුග්ගලො දිට්ඨිප්පත්තො, සො පස්ස සකදාගාමී වා අනාගාමී වා. න ඛොත්ථ සාරිපුත්ත සුකරං එකංසෙන ව්‍යාකාතුං, අයං ඉමෙසං තිණ්ණං පුග්ගලානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

ඨානං හෙතං සාරිපුත්ත, විජ්ජති, ය්වායං පුග්ගලො දිට්ඨිප්පත්තො ස්වාස්ස අරහා, වා අරහත්තාය පටිපන්නො, ය්වායං පුග්ගලො සද්ධාවිමුත්තො, ස්වාස්ස සකදාගාමී වා, අනාගාමී වා. යො වායං පුග්ගලො කායසක්ඛි, සොපස්ස. සකදාගාමී වා අනාගාමී වා. න ඛොත්ථ සාරිපුත්ත, සුකරං එකංසෙන ව්‍යාකාතුං, අයං ඉමෙසං තිණ්ණං පුග්ගලානං අභික්කන්තතරො ච පණීතතරො චාති.

1. නාඛත්ථ - මජසං.

ඇවැත් කොට්ඨිතයෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ලොව්හි විද්‍යමාන වෙත්. කවර තුන් දෙනෙක යත්: කායසක්ඛිය, දිට්ඨිප්පත්තය, සද්ධාවිමුත්තයයි. ඇවැත්නි, මේ පුද්ගලයෝ තුන් දෙන ලොව්හි විද්‍යමාන වෙත්. ඇවැත්නි, මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් යම් පුද්ගලයෙක් දිට්ඨිප්පත්ත වේ ද, ඇවැත්නි, මේ පුද්ගල තෙමේ මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් ඉතා මැනැවැයි ද, ඉතා ප්‍රණීතය යි ද, මට රුස්නේ වෙයි. ඒ කවර හෙයින යත්: ඇවැත්නි, මේ පුද්ගලයාගේ ප්‍රඥෙන්ද්‍රියය ඉතා බලවත් වේ ද, ඒහෙයිනි.

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් සවිට්ඨ තෙරණුවන් හා ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන්ට තෙල කීහ: ඇවැත්නි, අප හැම දෙනා විසින් සිය සිය වැටහීම් ප්‍රකාශ කරණ ලදී. ඇවැත්නි, යම්හ, භාග්‍යවතුන් මහන්සේ කරා එළඹෙන්නම්හ. එළැඹ භාග්‍යවතුන් වහන්සේට මෙ පවත සැළ කරම්හ. භාග්‍යවතුන් වහන්සේ අපට යම් පරිද්දෙකින් වදාරණ සේක් නම්, එපරිද්දෙන් එය දරන්නම්හ යි.

ආයුෂ්මත් සවිට්ඨ තෙරණුවන් හා ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ඇවැත්නි, එසේ ය යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් සවිට්ඨ තෙරණුවන් හා ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන් හා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාහුය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් සවිට්ඨ තෙරුන් හා ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන් හා සමඟ යම් බඳු කථාසල්ලාපයෙක් වී ද, ඒ හැම භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ.

ශාරිපුත්‍රය, මෙහි ලා මේ පුද්ගලයන් තුන්දෙනා අතුරෙන් මෙ තෙමේ වඩා මැනැවැයි ද, වඩා ප්‍රණීතය යි ද, ඒකාන්තයෙන් ප්‍රකාශ කිරීම් සුකර නො වේ. ශාරිපුත්‍රය, මෙබඳු කරුණෙක් ඇත: "යම් මේ පුද්ගලයෙක් සද්ධාවිමුත්ත වේ ද, හේ අර්හත් හෝ අර්හත් මාර්ගයට පිළිපන්නේ හෝ වෙයි. යම් පුද්ගලයෙක් කායසක්ඛි වේ ද, හේ සකෘදගාමී හෝ අනාගාමී හෝ වෙයි. යම් මේ පුද්ගලයෙක් දිට්ඨිප්පත්ත වේ ද, හෙ ද සකෘදගාමී හෝ අනාගාමී හෝ වෙයි" ශාරිපුත්‍රය, මෙහි ලා මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් මේ වඩා මැනැවැ යි ද, වඩා ප්‍රණීතය යි ද ඒකාන්තයෙන් ප්‍රකාශ කිරීම සුකර නො වේ.

ශාරිපුත්‍රය, මෙබඳු කරුණෙක් ඇත: 'යම් මේ පුද්ගලයෙක් කායසක්ඛි වේ ද, හෙ අර්හත් හෝ අර්හත් මාර්ගයට පිළිපන්නේ හෝ වෙයි. යම් මේ පුද්ගලයෙක් සද්ධාවිමුත්ත වේ ද, හේ සකෘදගාමී හෝ අනාගාමී හෝ වෙයි. යම් මේ පුද්ගලයෙක් දිට්ඨිප්පත්ත වේ ද, හෙ ද සකෘදගාමී හෝ අනාගාමී හෝ වෙයි.' ශාරිපුත්‍ර ය, මෙහි ලා මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් මේ වඩා මැනැවැ යි ද, වඩා ප්‍රණීතය යි ද, ඒකාන්තයෙන් ප්‍රකාශ කිරීම සුකර නො වේ.

ශාරිපුත්‍රය, මෙබඳු කරුණෙක් ඇත: "යම් මේ පුද්ගලයෙක් දිට්ඨිප්පත්ත වේ ද, හේ අර්හත් හෝ අර්හත් මාර්ගයට පිළිපන්නේ හෝ වෙයි. යම් මේ පුද්ගලයෙක් සද්ධාවිමුත්ත වේ ද, හේ සකෘදගාමී හෝ අනාගාමී හෝ වෙයි. යම් මේ පුද්ගලයෙක් කායසක්ඛි වේ ද, හෙ ද සකෘදගාමී හෝ අනාගාමී හෝ වෙයි." ශාරිපුත්‍රය, මෙහි ලා මේ පුද්ගලයන් තුන් දෙනා අතුරෙන් මෙ තෙමේ වඩා මැනැවැ යි ද, වඩා ප්‍රණීතය යි ද ඒකාන්තයෙන් ප්‍රකාශ කිරීමට සුකර නො වේ යයි.

[සාවත්ථිනිදානං:]

**3. 1. 3. 2.**

22. තයො'මෙ භික්ඛවෙ ගිලානා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: ඉධ භික්ඛවෙ එකච්චො ගිලානො ලභන්තො වා සප්පායානි භොජනානි, අලභන්තො වා සප්පායානි භොජනානි, ලභන්තො වා සප්පායානි භෙසජ්ජානි, අලභන්තො වා සප්පායානි භෙසජ්ජානි, ලභන්තො වා පතිරූපං උපට්ඨාකං, අලභන්තො වා පතිරූපං උපට්ඨාකං, නෙව වුට්ඨාති තම්හා ආබාධා.

ඉධ භික්ඛවෙ එකච්චො ගිලානො ලභන්තො වා සප්පායානි භොජනානි, අලභන්තො වා සප්පායානි භොජනානි, ලභන්තො වා සප්පායානි භෙසජ්ජානි, අලභන්තො වා සප්පායානි භෙසජ්ජානි, ලභන්තො වා පතිරූපං උපට්ඨාකං, අලභන්තො වා පතිරූපං උපට්ඨාකං, වුට්ඨාති තම්හා ආබාධා.

ඉධ පන භික්ඛවෙ එකච්චො ගිලානො ලභන්තො'ව සප්පායානි භොජනානි නො අලභන්තො, ලභන්තො'ව සප්පායානි භෙසජ්ජානි නො අලභන්තො, ලභන්තො'ව පතිරූපං උපට්ඨාකං නො අලභන්තො, වුට්ඨාති තම්හා අබාධා.

තත්‍ර භික්ඛවෙ ය්වායං ගිලානො ලභන්තො'ව සප්පායානි භොජනානි නො අලභන්තො, ලභන්තො'ව සප්පයානි භෙසජ්ජානි නො අලභන්තො, ලභන්තො'ව පතිරූපං උපට්ඨාකං නො අලභන්තො, වුට්ඨාති තම්හා ආබාධා, ඉමං ඛො භික්ඛවෙ ගිලානං පටිච්ච ගිලානභත්තං අනුඤ්ඤාතං, ගිලානභෙසජ්ජං අනුඤ්ඤාතං, ගිලානුපට්ඨාකො අනුඤ්ඤාතො; ඉමඤ්ච පන භික්ඛවෙ ගිලානං පටිච්ච අඤ්ඤෙපි ගිලානා උපට්ඨාතබ්බා. ඉමෙ ඛො භික්ඛවෙ තයො ගිලානා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

එවමෙව ඛො භික්ඛවෙ තයො මෙ ගිලානූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං කතමෙ. තයො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ලභන්තො වා තථාගතං දස්සනාය, අලභන්තො වා තථාගතං දස්සනාය, ලභන්තො වා තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවණාය, අලභන්තො වා තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවණාය, නෙවොක්කමති[1] නියාමං කුසලෙසු ධම්මෙසු සම්මත්තං.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ලභන්තො වා තථාගතං දස්සනාය, අලභන්තො වා තථාගතං දස්සනාය, ලභන්තො වා තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවණාය, අලභන්තො වා තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවණාය, වොක්කමති[2] නියාමං කුසලෙසු ධම්මෙසු සම්මත්තං.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො ලභන්තො'ව[3] තථාගතං දස්සනාය, නො අලභන්තො, ලභන්තො'ව තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවණාය, නො අලභන්තො, වොක්කමති[2] නියාමං කුසලෙසු ධම්මෙසු සම්මත්තං.

තත්‍ර භික්ඛවෙ ය්වායං පුග්ගලො ලභන්තො'ව තථාගතං දස්සනාය, නො අලභන්තො, ලභන්තො'ව තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවණාය, නො අලභන්තො, වොක්කමති[3] නියාමං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. ඉමං ඛො භික්ඛවෙ පුග්ගලං පටිච්ච ධම්මදෙසනා අනුඤ්ඤාතා. ඉමඤ්ච පන භික්ඛවෙ පුග්ගලං පටිච්ච අඤ්ඤෙසම්පි ධම්මො දෙසෙතබ්බො. ඉමෙ ඛො භික්ඛවෙ තයො ගිලානූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

---

1. නෙව ඔක්කමති - මජසං. PTS. සයා. 2. ඔක්කමති - මජසං. සයා. PTS.
3. ලභන්තො - සයා. PTS

[ගිලාන සූත්‍රය]

**3. 1. 3. 2.**

22. මහණෙනි, ලොව්හි මේ ගිලන්නු තුන් දෙනෙක් ඇත. කවර තුන් දෙනෙක යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි ගිලනෙක් පථ්‍ය භෝජන ලබන්නේ හෝ පථ්‍ය භෝජන නො ලබන්නේ හෝ, පථ්‍ය බෙහෙත් ලබන්නේ හෝ පථ්‍ය බෙහෙත් නො ලබන්නේ හෝ, නිසි උපස්ථායකයකු ලබන්නේ හෝ නිසි උපස්ථායකයකු නො ලබන්නේ හෝ ඒ ආබාධයෙන් නොමැ නැඟී සිටුනේ ය.

මහණෙනි, මෙ ලොව්හි කිසි ගිලනෙක් පථ්‍ය භෝජන ලබන්නේ හෝ පථ්‍ය භෝජන නො ලබන්නේ හෝ, පථ්‍ය බෙහෙත් ලබන්නේ හෝ පථ්‍ය බෙහෙත් නො ලබන්නේ හෝ, නිසි උපස්ථායකයකු ලබන්නේ හෝ නිසි උපස්ථායකයකු නො ලබන්නේ හෝ, ඒ ආබාධයෙන් නැඟී සිටුනේ ය.

මහණෙනි, මෙ ලොව්හි කිසි ගිලනෙක් පථ්‍ය භොජන නො ලබනු නොව ලබනුයේ ම, පථ්‍ය බෙහෙත් නො ලබනු නොව ලබනුයේ ම, නිසි උපස්ථායක-යකු නො ලබනු නොව ලබනුයේ ම, ඒ ආබාධයෙන් නැඟී සිටුනේ ය.

මහණෙනි, එහි ලා යම් ගිලනෙක් පථ්‍ය භෝජන නො ලබනු නො ව ලබනුයේ ම, පථ්‍ය බෙහෙත් නො ලබනු නො ව ලබනුයේ ම, නිසි උපස්ථායකයකු නො ලබනු නොව ලබනුයේ ම, ඒ ආබාධයෙන් නැඟේ ද, මහණෙනි, මේ ගිලනා පිණිස ගිලන් බත අනුදන්නා ලදී. ගිලන් බෙහෙත් අනුදන්නා ලදී. ගිලන් උවටෙක් අනුදන්නා ලද්දේ ය. මහණෙනි, මේ ගිලනා නිසා අන් ගිලන්නු ද උවැටන් කළයුත්තාහු වෙති. මහණෙනි, මේ වනාහි ලොව්හි විද්‍යමාන වූ ගිලන්නු තුන් දෙන වෙත්.

මහණෙනි, එපරිද්දෙන් ම ලොව්හි මේ ගිලනුන් බඳු පුද්ගලයෝ තුන්-දෙනෙක් විද්‍යමාන වෙත්. කවර තුන් දෙනෙක යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැම් පුද්ගලයෙක් තථාගතයන් වහන්සේ දක්නට ලබන්නේ හෝ තථාගත-යන් දක්නට නොලබන්නේ හෝ තථාගතයන් දෙසූ ධර්මවිනය අසන්නට ලබන්නේ හෝ තථාගතයන් දෙසූ ධර්මවිනය අසන්නට නොලබන්නේ හෝ කුශලධර්මිෂයෙහි මාර්ගනියාම සඞ්ඛ්‍යාත සම්‍යක්ත්වයට නො පැමිණෙයි.

මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් තථාගතයන් දක්නට ලබන්නේ හෝ තථාගතයන් දක්නට නො ලබන්නේ හෝ තථාගතයන් දෙසූ ධර්මවිනය අසන්නට ලබන්නේ හෝ තථාගතයන් දෙසූ ධර්මවිනය අසන්නට නොල-බන්නේ හෝ කුශලධර්මයන් විෂයෙහි මාර්ගනියාම සඞ්ඛ්‍යාත සම්‍යක්ත්වයට පැමිණෙයි.

මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් තථාගතයන් දක්නට නොලබනු නොව ලබන්නේ ම, තථාගතයන් දෙසූ ධර්මවිනය අසන්නට නොලබනු නොව ලබන්නේ ම කුසලධර්මයන් විෂයෙහි මාර්ගනියාම සඞ්ඛ්‍යාත සම්‍යක්ත්වයට පැමිණෙයි.

මහණෙනි, එහි ලා යම් පුද්ගලයෙක් තථාගතයන් දක්නට නොලබනු නොව ලබන්නේ ම, තථාගතයන් දෙසූ ධර්මවිනය අසන්නට නොලබනු නොව ලබන්නේ ම, කුශල ධර්මයන් විෂයෙහි මාර්ගනියාම සඞ්ඛ්‍යාත සම්‍යක්ත්වයට පැමිණේ ද, මේ පුඟුලා පිණිස ධර්මදේශනාව අනුදන්නා ලදු. මහණෙනි, මේ පුඟුලා පිණිස අනුන්ට ධර්මය දෙසිය යුතුයි. මහණෙනි, ලොව්හි ගිලනුන් උපමා කොට ඇති මේ පුද්ගලයෝ තුන් දෙන විද්‍යමාන වෙත්.

### 3. 1. 3. 3

23. තයො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො සබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣං ලොකං උපපජ්ජති. තමෙනං සබ්‍යාපජ්ඣං ලොකං උපපන්නං සමානං සබ්‍යාපජ්ඣා ඵස්සා ඵුසන්ති. සො සබ්‍යාපජ්ඣෙහි ඵස්සෙහි ඵුට්ඨො සමානො සබ්‍යාපජ්ඣං වෙදනං වෙදියති එකන්තදුක්ඛං, සෙය්‍යථාපි සත්තා නෙරයිකා.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, අබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, අබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො අබ්‍යාපජ්ඣං කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා අබ්‍යාපජ්ඣං ලොකං උපපජ්ජති. තමෙනං අබ්‍යාපජ්ඣං ලොකං උපපන්නං සමානං අබ්‍යාපජ්ඣා ඵස්සා ඵුසන්ති. සො අබ්‍යාපජ්ඣෙහි ඵස්සෙහි ඵුට්ඨො සමානො අබ්‍යාපජ්ඣං වෙදනං වෙදියති එකන්තසුඛං, සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා.

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වචීසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වචීසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ලොකං උපපජ්ජති. තමෙනං සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ලොකං උපපන්නං සමානං සබ්‍යාපජ්ඣාපි අබ්‍යාපජ්ඣාපි ඵස්සා ඵුසන්ති. සො සබ්‍යාපජ්ඣෙහිපි අබ්‍යාපජ්ඣෙහිපි ඵස්සෙහි ඵුට්ඨො සමානො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වෙදනං වෙදියති වොකිණ්ණසුඛදුක්ඛං, සෙය්‍යථාපි මනුස්සා, එකච්චෙ ච දෙවා, එකච්චෙ ච විනිපාතිකා. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති

### 3. 1. 3. 4

24. තයො'මෙ භික්ඛවෙ පුග්ගලා පුග්ගලස්ස බහුකාරා. කතමෙ තයො: යං භික්ඛවෙ පුග්ගලං ආගම්ම පුග්ගලො බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සඞ්ඝං සරණං ගතො හොති. අයං භික්ඛවෙ පුග්ගලො ඉමස්ස පුග්ගලස්ස බහුකාරො.

පුන චපරං භික්ඛවෙ යං පුග්ගලං ආගම්ම පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. අයං භික්ඛවෙ පුග්ගලො ඉමස්ස පුග්ගලස්ස බහුකාරො.

## 3. 1. 3. 3

23. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ලොව්හි විද්‍යමාන වෙත්. කවර තුන් දෙනෙක යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලෙක් දුඃඛ සහිත (කායද්වාරයෙහි උපදනා චෙතනා රාශිය යි කියන ලද) කායසංස්කාරය රැස් කෙරෙයි. දුඃඛ සහිත (වාග්ද්වාරයෙහි උපදනා චෙතනා රාශිය යි කියන ලද) වාක්සංස්කාරය මුළු කෙරෙයි. දුඃඛ සහිත (මනොද්වාරයෙහි උපදනා චෙතනා රාශිය යි කියන ලද) මනඃසංස්කාරය පිඩු කෙරෙයි හේ දුඃඛ සහිත කාය-සංස්කාරය රැස් කොට, දුඃඛ සහිත වාක්සංස්කාරය මුළු කොට, දුඃඛ සහිත මනඃසංස්කාරය පිඩු කොට දුඃඛ සහිත ලෝකයට පැමිණෙයි. දුඃඛ සහිත ලෝකයට පැමිණියා වූ ම ඔහු දුඃඛ සහිත ස්පර්ශයෝ පහස්නාහ. හේ දුඃඛ සහිත ස්පර්ශයන් විසින් පහස්නා ලද්දුයේ ම නිරිසතුන් සෙයින් ඒකාන්ත-යෙන් දුක් වූ සාබාධවිපාක වෙදනාව විඳුනේ ය.

මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් නිදුක් කායසංස්කාරය රැස් කෙරෙයි. නිදුක් වාක්සංස්කාරය රැස් කෙරෙයි. නිදුක් මනඃසංස්කාරය රැස් කෙරෙයි. හේ නිදුක් කායසංස්කාරය රැස් කොට, නිදුක් වාක්-සංස්කාරය රැස් කොට නිදුක් මනඃසංස්කාරය රැස් කොට නිදුක් ලෝකයට පැමිණෙයි. නිදුක් ලොවට පැමිණියා වූ ම ඔහු නිදුක් ස්පර්ශයෝ පහස්නාහ. හේ නිදුක් ස්පර්ශයන් විසින් පහස්නා ලද්දුයේ ම සුභකිණ්ණ දෙවියන් සෙයින් නිදුක් ඒකාන්ත සුව ඇති විපාක වෙදනාව විඳුනේ ය.

මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් දුඃඛ සහිත වූ ද, දුඃඛ රහිත වූ ද කායසංස්කාරය රැස් කෙරෙයි. දුඃඛ සහිත වූ ද දුඃඛ රහිත වූ ද වාක්සංස්කාරය රැස් කෙරෙයි. දුඃඛ සහිත වූ ද දුඃඛ රහිත වූ ද මනඃසංස්කාරය රැස් කෙරෙයි. දුඃඛ සහිත වූ ද දුඃඛ රහිත වූ ද කායසංස්කාරය රැස් කොට දුඃඛ සහිත වූ ද දුඃඛ රහිත වූ ද වාක්සංස්කාරය රැස් කොට, දුඃඛ සහිත වූ ද දුඃඛ රහිත වූ ද මනඃසංස්කාරය රැස් කොට දුඃඛ සහිත වූ ද දුඃඛ රහිත වූ ද ලෝකයට පැමිණෙයි. දුඃඛ සහිත වූ ද දුඃඛ රහිත වූ ද ලෝකයට පැමිණියා වූ ම ඔහු දුඃඛ සහිත වූ ද දුඃඛ රහිත වූ ද ස්පර්ශයෝ පහස්නාහ. දුඃඛ සහිත වූ ද දුඃඛ රහිත වූ ද ස්පර්ශයන් විසින් පහස්නා ලද්දුයේ ම හේ ඇතැම් මිනිසුන් හා ඇතැම් විනිපාතික දෙවියන් සෙයින් දුඃඛ සහිත වූ ද දුඃඛ රහිත වූ ද සුවදුක් මුසු වූ වේදනාව විඳුනේ ය. මහණෙනි, මේ පුද්ගලයෝ තිදෙන ලොව්හි විද්‍යමාන වෙති.

## 3. 1. 3. 4

24. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් පුද්ගලයක්හට බොහෝ වහල් වෙති කවර තුන් දෙනෙක යත්: මහණෙනි, යම් පුගුලකු වෙත පැමිණ පුද්ගල තෙමේ බුදුන් සරණ ගියා වේ ද, දහම් සරණ ගියා වේ ද, සඟුන් සරණ ගියා වේ ද, මහණෙනි, මේ ඇදුරු පුද්ගල තෙමේ මේ අතැවැසි පුද්ගලයාහට බොහෝ වහල් වෙයි.

තවද මහණෙනි, යම් පුද්ගලයකු වෙත පැමිණ පුද්ගල තෙමේ 'මේ දුකැ'යි තත් වූ පරිද්දෙන් දන්නේ වේ ද, 'මේ දුක් ඉපැදීමෙහි හේතුය'යි තත් වූ පරිද්දෙන් දන්නේ වේ ද, 'මේ දුක් නැති කිරීමැ'යි තත් වූ පරිද්දෙන් දන්නේ වේ ද, 'මෙ දුක් නැති කරණු පිණිස යන ප්‍රතිපදාය'යි තත් වූ පරිද්දෙන් දන්නේ වේ ද, මහණෙනි, මේ ඇදුරු පුද්ගල තෙමේ මේ අතැවැසි පුද්ගලයාහට බොහෝ වහල් වෙයි.

පුන චපරං භික්ඛවෙ යං පුග්ගලං ආගම්ම පුග්ගලො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති; අයං භික්ඛවෙ පුග්ගලො ඉමස්ස පුග්ගලස්ස බහුකාරො. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා පුග්ගලස්ස බහුකාරා.

ඉමෙහි ච පන භික්ඛවෙ තීහි පුග්ගලෙහි ඉමස්ස පුග්ගලස්ස නත්ථඤ්ඤො පුග්ගලො බහුකාරතරොති වදාමි. ඉමෙසඤ්ච භික්ඛවෙ තිණ්ණං පුග්ගලානං ඉමිනා පුග්ගලෙන න සුප්පතිකාරං වදාමි, යදිදං අභිවාදන පච්චුට්ඨාන අඤ්ජලිකම්ම සාමීචිකම්ම චීවරපිණ්ඩපාතසෙනාසන ගිලානපච්චය භෙසජ්ජ-පරික්ඛාරානුප්පදානෙනාති.

### 3. 1. 3. 5.

25. තයො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: අරුකූපමචිත්තො පුග්ගලො, විජ්ජූපමචිත්තො[1] පුග්ගලො, වජිරූපමචිත්තො[2] පුග්ගලො.

කතමො ච භික්ඛවෙ අරුකූපමචිත්තො පුග්ගලො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො කොධනො හොති උපායාසබහුලො, අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති, කුප්පති, බ්‍යාපජ්ජති, පතිත්ථීයති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සෙය්‍යථාපි[3] භික්ඛවෙ දුට්ඨාරුකා[4] කට්ඨෙන වා කඨලෙන[5] වා ඝට්ටිතා[6] භිය්‍යොසොමත්තාය අස්සන්දති;[7] එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො කොධනො හොති උපායාසබහුලො, අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති, කුප්පති, බ්‍යාපජ්ජති, පතිත්ථීයති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, අයං වුච්චති භික්ඛවෙ අරුකූපමචිත්තො පුග්ගලො.

කතමො ච භික්ඛවෙ විජ්ජූපමචිත්තො පුග්ගලො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධ-ගාමිනී පටිපදාති යථාභූතං පජානාති. සෙය්‍යථාපි භික්ඛවෙ චක්ඛුමා පුරිසො රත්තන්ධකාරතිමිසායං විජ්ජන්තරිකාය රූපානි පස්සෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති, යථාභූතං පජානාති. අයං වුච්චති භික්ඛවෙ විජ්ජූපමචිත්තො පුග්ගලො.

කතමො ච භික්ඛවෙ වජිරූපමචිත්තො පුග්ගලො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. සෙය්‍යථාපි භික්ඛවෙ වජිරස්ස නත්ථි කිඤ්චි අභෙජ්ජං, මණි වා පාසාණො වා. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ වජිරූපමචිත්තො පුග්ගලො. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

---

1. විජ්ජුපමචිත්තො - PTS. 2. වජිරූපමචිත්තො - PTS. 3. සෙය්‍යථාපි නාම - PTS
4 දුට්ඨාරුකො - සයා. මජසං. PTS. 5. කඨලාය වා - සී 1. මජසං. සයා. PTS.
6. ඝට්ටිතො - මජසං. සයා. PTS. 7. අස්සවන්තානි - සීමු. ආසවං දෙති - PTS. මජස, සයා

තවද මහණෙනි, යම් පුද්ගලයකු වෙත පැමිණ පුද්ගල තෙමේ ආස්‍රවයන්ගේ ක්ෂයහේතුයෙන් අනාස්‍රව වූ ඵලසමාධිය ද ඵලප්‍රඥව ද ඉහාත්මයෙහි ම තමා විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට උපයා ගෙණ වාසය කරන්නේ වේ ද, මහණෙනි, මේ ඇදුරු පුද්ගල තෙමේ මේ අතැවැසි පුද්ගලයාහට බොහෝ උපකාරවත් වේ. මහණෙනි, මේ ඇදුරු පුද්ගලයෝ තුන් දෙන මේ අතැවැසි පුද්ගලයාහට බොහෝ උපකාරවත් වෙති.

මහණෙනි, මේ පුද්ගලයන් තුන් දෙනාට වඩා මේ අතැවැසි පුද්ගලයාට උපකාර ඇති අනෙක් පුද්ගලයෙක් නැතියි කියමි. මහණෙනි මේ පුද්ගලයන් තුන් දෙනාහට මේ (අතැවැසි) පුගුලා විසින් මනා සේ ප්‍රත්‍යුපකාර කිරීම සුකර නො වෙති යි කියමි. හේ කිමෙකින: වැඳීම ය, දැක හුනස්නෙන් නැඟී සිටීම ය, ඇඳිලි කිරීම ය, උවසර කිරීම ය, චීවර පිණ්ඩපාත සේනාසන ගිලානපච්චය හා බෙහෙත් පිරිකර දීමය යන මෙයිනි.

### 3. 1. 3. 5.

25. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ලොව්හි විද්‍යමාන වෙත්. කවර තුන් දෙනෙක යත්: පැරැණි වණයක් බඳු සිත් ඇති පුද්ගලය, විදුලිය බඳු සිත් ඇති පුද්ගලය, විදුරක් බඳු සිත් ඇති පුද්ගල යි.

මහණෙනි, පැරැණි වණයක් බඳු සිත් ඇති පුද්ගල කවරේය යත්: මහණෙනි, මෙලොව්හි කිසි පුගුලෙක් කිපෙන සුලු වෙයි, දැඩි ආයාස බහුල කොට ඇත්තේ වෙයි, මඳකුදු කියනු ලැබුයේ ම ලැගෙයි, කිපෙයි, ප්‍රකෘතිය පියයි, තද ව සිටී, කෝපයත් ද්වේෂයත් නොසතුටත් පහළ කෙරෙයි. මහණෙනි, යම් පරිදි දඬුකඩෙකින් හෝ කැබිලිත්තෙකින් හෝ ගටනා ලද පැරැණි වණයක් වෙසෙසින් (ලේ සැරව) වගුරුවා ද, මහණෙනි, එපරිද්දෙන් ම මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් කිපෙන සුලු වෙයි. දැඩි ආයාස බහුල කොට ඇත්තේ වෙයි. මඳකුදු කියනු ලැබූයේ ම ලැගෙයි, කිපෙයි, ප්‍රකෘතිය අත් හරියි, තදව සිටී, කෝපයත් ද්වේෂයත් නොසතුටත් පහළ කෙරෙයි. මහණෙනි, මෙ පැරැණි වණයක් බඳු සිත් ඇති පුද්ගලයා යි කියනු ලැබේ.

මහණෙනි, විදුලිය බඳු සිත් ඇති පුද්ගල කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් "මේ දුකැ" යි තත් වූ පරිද්දෙන් දනී. "මේ දුක් උපදනා හේතු ය" යි තත් වූ පරිද්දෙන් දනී. "මේ දුක් නැති කිරීම ය" යි තත් වූ පරිද්දෙන් දනි. "මේ දුක් නැති කරණු පිණිස යන පිළිවෙත ය" යි තත් වූ පරිද්දෙන් දනී. මහණෙනි, යම් පරිදි ඇස් ඇති පුරුෂයෙක් ගණඳුරු රැයෙහි විදුලිය පවත්නා අතුරෙහි රූ දක්නේ වේ ද, මහණෙනි, එපරිදි මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් 'මේ දුකැ"යි තත් වූ පරිද්දෙන් දනී ... 'මේ දුක් නැති කරණ පිළිවෙතැ' යි තත් වූ පරිද්දෙන් දනී. මහණෙනි, මෙ විදුලිය බඳු සිත් ඇති පුද්ගලයා යි කියනු ලැබේ.

මහණෙනි, විදුර බඳු සිත් ඇති පුද්ගල කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් අනාස්‍රව වූ ඵලසමාධිය ද ඵලප්‍රඥව ද ඉහාත්මයෙහි ම තමා විසින් විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඇටි ඇටි සඳ සමවැද වෙසෙයි. මහණෙනි, යම් පරිදි මිණෙක් වේවයි, පහණෙක් වේවයි, විදුර විසින් නොබිඳලියහෙන දෑයෙක් නැද්ද, මහණෙනි, එපරිද්දෙන් ම මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් ආස්‍රවක්ෂයත් ... ප්‍රත්‍යක්ෂ කොට උපයා වෙසෙයි. මහණෙනි, මෙ විදුර බඳු සිත් ඇති පුද්ගලයා යි කියනු ලැබේ. මහණෙනි, මේ වනාහි ලෝකයෙහි විද්‍යමාන වන පුද්ගලයෝ තුන් දෙන වෙත්.

**3. 1. 3. 6**

26. තයො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: අත්ථි භික්ඛවෙ පුග්ගලො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො. අත්ථි භික්ඛවෙ පුග්ගලො සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො. අත්ථි භික්ඛවෙ පුග්ගලො සක්කත්වා ගරුකත්වා සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො හීනො හොති සීලෙන සමාධිනා පඤ්ඤාය. එවරූපො භික්ඛවෙ පුග්ගලො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො අඤ්ඤත්‍ර අනුද්දයාය[1] අඤ්ඤත්‍ර අනුකම්පාය.

කතමො ච භික්ඛවෙ පුග්ගලො සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සදිසො හොති සීලෙන සමාධිනා පඤ්ඤාය. එවරූපො භික්ඛවෙ පුග්ගලො සෙවිතබ්බො, භජිතබ්බො, පයිරුපාසිතබ්බො. තං කිස්ස හෙතු: සීලසාමඤ්ඤගතානං සතං සීලකථා ච නො භවිස්සති, සා ච නො පවත්තනී[2] භවිස්සති, සා ච නො ඵාසු භවිස්සති. සමාධිසාමඤ්ඤගතානං සතං සමාධිකථා ච නො භවිස්සති, සා ච නො පවත්තනී[2] භවිස්සති, සා ච නො ඵාසු භවිස්සති. පඤ්ඤාසාමඤ්ඤගතානං සතං පඤ්ඤාකථා ච නො භවිස්සති, සා ච නො පවත්තනී[2] භවිස්සති, සා ච නො ඵාසු භවිස්සතීති තස්මා එවරූපො පුග්ගලො සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො සක්කත්වා ගරුකත්වා සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අධිකො හොති සීලෙන සමාධිනා පඤ්ඤාය, එවරූපො භික්ඛවෙ පුග්ගලො සක්කත්වා ගරුකත්වා සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො. තං කිස්ස හෙතු: ඉති අපරිපූරං වා සීලක්ඛන්ධං පරිපූරෙස්සාමි, පරිපූරං වා සීලක්ඛන්ධං තත්‍ථ තත්‍ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමි. අපරිපූරං වා සමාධික්ඛන්ධං පරිපූරෙස්සාමි, පරිපූරං වා සමාධික්ඛන්ධං තත්‍ථ තත්‍ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමි. අපරිපූරං වා පඤ්ඤාක්ඛන්ධං පරිපූරෙස්සාමි, පරිපූරං වා පඤ්ඤාක්ඛන්ධං තත්‍ථ තත්‍ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමීති. තස්මා එවරූපො පුග්ගලො සක්කත්වා ගරුකත්වා සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

1. නිහීයති පුරිසො නිහීනසෙවී
   න ච හායෙථ කදාචි තුල්‍යසෙවී,
   සෙට්ඨමුපනමං උදෙති ඛිප්පං
   තස්මා අත්තනො උත්තරිං භජෙථාති.

---

1. අනුද්දයා. අනුකම්පා - සෳා. මජසං. සී 1. PTS. 2. පවත්තිනී - මජසං.

## 3. 1. 3. 6

26. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ලොව්හි විද්‍යමාන වෙත්. කවර තුන් දෙනෙක යත්: මහණෙනි, නො එළඹියයුතු නො ඇලියයුතු පුන-පුනා නො එළඹියයුතු පුද්ගලයෙක් ඇත. මහණෙනි, සේවනය කටයුතු භජනය කටයුතු පයඬුපාසනය කටයුතු පුද්ගලයෙක් ඇත. මහණෙනි, සත්කාර කොට ගුරුකාර කොට සේවනය කටයුතු භජනය කටයුතු පයඬුපාසනය කටයුතු පුද්ගලයෙක් ඇත.

මහණෙනි, සේවනය නො කටයුතු භජනය නො කටයුතු පයඬුපාසනය නො කටයුතු පුද්ගලයා කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් ශීලයෙන් සමාධියෙන් ප්‍රඥයෙන් (තමහට) හීන වේ ද, මහණෙනි, මෙබඳු පුද්ගල සේවනය නො කටයුතුය. භජනය නො කටයුතුය. පයඬුපාසනය නො කටයුතුය. දයාව හැරයි, අනුකම්පාව හැරයි.

මහණෙනි, සේවනය කටයුතු, භජනය කටයුතු, පයඬුපාසනය කටයුතු පුද්ගල කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් ශීලයෙන් සමාධියෙන් ප්‍රඥයෙන් (තමහට) සමාන වේ ද, මහණෙනි, මෙබඳු පුද්ගල සේවනය කටයුතුය. භජනය කටයුතුය. පයඬුපාසනය කටයුතු ය. ඒ කවර හෙයින යත්: ශීලයෙන් සමාන බවට ගියා වූ ම අපගේ ශීල කථාව ද වෙයි, අපගේ ඒ කථාව ද පවත්නී වෙයි, ඒ කථාව අපට පහසු ද වෙයි. සමාධියෙන් සමාන බවට ගියා වූ ම අපගේ සමාධිකථාව ද වෙයි, එය අපගේ පවත්නා කථාව ද වෙයි, ඒ කථාව අපට පහසු ද වෙයි. ප්‍රඥයෙන් සමාන බවට ගියා වූ ම අපගේ ප්‍රඥකථාව ද වෙයි, එය අපගේ පවත්නා කථාව ද වෙයි, ඒ කථාව අපට පහසු ද වේ. එහෙයින් මෙබඳු වූ පුද්ගල සේවනය කටයුත්තේ ය. භජනය කටයුත්තේ ය. පයඬුපාසනය කට යුත්තේ ය.

මහණෙනි, කවර පුද්ගලයෙක් සත්කාර කොට ගුරුකාර කොට සේවනය කටයුත්තේ වේ ද, භජනය කටයුත්තේ වේ ද, පයඬුපාසනය කටයුත්තේ වේ ද: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් ශීලයෙන් සමාධියෙන් ප්‍රඥයෙන් (තමහට) වැඩි තරම් වේ ද, මහණෙනි, මෙබඳු වූ පුද්ගල සත්කාර කොට ගුරුකාර කොට සේවනය කටයුත්තේය. භජනය කටයුත්තේ ය. පයඬුපාසනය කටයුත්තේය. ඒ කවර හෙයින යත්: මෙසේ නො පිරිපුන් හෝ සිල්කඳ පුරමි. පිරිපුන් හෝ සිල්කඳ ඒ ඒ තන්හි ප්‍රඥයෙන් අනුගන්මි. නො පිරිපුන් හෝ සමාධිස්කන්ධය පුරමි. පිරිපුන් හෝ සමාධිස්කන්ධය ඒ ඒ තන්හි ප්‍රඥයෙන් අනුගන්මි. නො පිරිපුන් හෝ ප්‍රඥස්කන්ධය පුරමි. පිරිපුන් වූ හෝ ප්‍රඥස්කන්ධය ඒ ඒ තන්හි ප්‍රඥයෙන් අනුගන්මි. එහෙයින් මෙබඳු වූ පුද්ගල සත්කාර කොට ගුරුකාර කොට සේවනය කටයුත්තේය. භජනය කටයුත්තේය. පයඬුපාසනය කටයුත්තේය. මහණෙනි, මේ පුද්ගලයෝ තිදෙන ලෝකයෙහි විද්‍යමාන වෙති.

1. තමනට වඩා (ගුණයෙන්) හීනයන් සෙවුනා පුරුෂ පිරිහෙයි. තමන් හා (ගුණයෙන්) සමාන පුහුලන් සෙවුනා පුරුෂ කිසි කලෙකත් නො පිරිහෙයි. තමනට වඩා (ගුණයෙන්) වැඩුනවුන් වෙත නැමෙන්නේ වහා වැඩෙයි. එහෙයින් තමනට වඩා (ගුණයෙන්) වැඩිතැනැත්තකු භජනය කරන්නේ ය.

## 3. 1 3. 7

27. තයො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: අත්ථි භික්ඛවෙ පුග්ගලො ජිගුච්ඡිතබ්බො, න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො. අත්ථි භික්ඛවෙ පුග්ගලො අජ්ඣුපෙක්ඛිතබ්බො, න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො. අත්ථි භික්ඛවෙ පුග්ගලො සෙවිතබ්බො, භජිතබ්බො, පයිරුපාසිතබ්බො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො ජිගුච්ඡිතබ්බො, න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො අසුචි සංකස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරීපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො. එවරූපො භික්ඛවෙ පුග්ගලො ජිගුච්ඡිතබ්බො, න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො. තං කිස්ස හෙතු: කිඤ්චාපි භික්ඛවෙ එවරූපස්ස පුග්ගලස්ස න දිට්ඨානුගතිං ආපජ්ජති, අථ ඛො නං පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති පාපමිත්තො පුරිසපුග්ගලො පාපසහායො පාපසම්පවඞ්කොති. සෙය්‍යථාපි භික්ඛවෙ අහි ගුථගතො, කිඤ්චාපි න දංසති, අථ නං මක්ඛෙති. එවමෙව ඛො භික්ඛවෙ කිඤ්චාපි එවරූපස්ස පුග්ගලස්ස න දිට්ඨානුගතිං ආපජ්ජති, අථ ඛො නං පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති පාපමිත්තො පුරිසපුග්ගලො පාපසහායො පාපසම්පවඞ්කොති. තස්මා එවරූපො පුග්ගලො ජිගුච්ඡිතබ්බො, න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො අජ්ඣුපෙක්ඛිතබ්බො, න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො කොධනො හොති -පෙ- සෙය්‍යථාපි භික්ඛවෙ දුට්ඨාරුකා[2] කට්ඨෙන වා කඨලෙන වා ඝට්ටිතා[3] භිය්‍යොසොමත්තාය අස්සන්දති.[4] එවමෙව ඛො භික්ඛවෙ -පෙ- සෙය්‍යථාපි භික්ඛවෙ තින්දුකාලාතං කට්ඨෙන වා කඨලෙන[5] වා ඝට්ටිතං භිය්‍යොසොමත්තාය චිච්චිටායති, චිටිචිටායති. එවමෙව ඛො භික්ඛවෙ -පෙ- ගුථකූපො කට්ඨෙන වා කඨලෙන[5] වා ඝට්ටිතො භිය්‍යොසොමත්තාය දුග්ගන්ධො හොති. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො කොධනො හොති, උපායාසබහුලො, අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති, කුප්පති, ව්‍යාපජ්ජති, පතිත්ථියති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, එවරූපො භික්ඛවෙ පුග්ගලො අජ්ඣුපෙක්ඛිතබ්බො, න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො. තං කිස්ස හෙතු: අක්කොසෙය්‍යාපි මං, පරිභාසෙය්‍යාපි මං, අනත්ථම්පි මං කරෙය්‍යාති, තස්මා එවරූපො පුග්ගලො අජ්ඣුපෙක්ඛිතබ්බො, න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො.

---

2. දුට්ඨාරුකො - මජසං. ස්‍යා. PTS.
3. ඝට්ටිතො - මජසං. ස්‍යා. PTS. 4. ආසවං දෙති - මජසං
5. කඨලාය වා - සීමු. මජසං. ස්‍යා. PTS.

**3. 1. 3. 7.**

27. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ලෝකයෙහි ඇත. කවර තුන් දෙනෙක යත්: මහණෙනි, පිළිකුල් කටයුතු වූ නොසෙවිය යුතු වූ භජනය නොකටයුතු වූ පයිරුපාසනය නොකටයුතු වූ පුහුලෙක් ඇත. මහණෙනි, මැදහත්ව දක්කයුතු, නො සෙවියයුතු භජනය නොකටයුතු පයිරුපාසනය නොකටයුතු පුහුලෙක් ඇත. මහණෙනි, සේවනය කටයුතු භජනය කටයුතු පයිරුපාසනය කටයුතු පුහුලෙක් ඇත.

මහණෙනි, ගැරහිය යුතු නො සෙවියයුතු නො ඇලියයුතු පුනපුනා නො එළඹිය යුතු පුද්ගල කවරේය යත්: මහණෙනි, මේ ලෝකයෙහි කිසි පුද්ගලයෙක් දුශ්ශීල වූ පාපකස්වභාව ඇති අපවිත්‍ර වූ සැකෙන් සිහි කළයුතු හැසිරීම් ඇති පිළිසත්කමත් ඇති ශ්‍රමණප්‍රතිරූපක වූ, ශ්‍රමණයෙමි, පිළින කරණ, බ්‍රහ්මචාරී ප්‍රතිරූපක වූ, බ්‍රහ්මචාරිමි පිළිත කරණ, ඇතුළත දුගඳ වූ කෙලෙසුන් විසින් තෙත් වූ හටගත් කෙලෙස් කසළ ඇතියේ වේ ද, මහණෙනි, මෙබඳු පුද්ගල තෙමේ පිළිකුල් කටයුතු නො සෙවියයුතු භජනය නො කටයුතු පයිරුපාසනය නො කටයුතු වේ. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙබඳු පුද්ගලයාගේ දෘෂ්ටානුගතියට නොයතුදු වැලිත් "පවිටු මිතුරන් ඇති පවිටුන් සහාය කොට ඇති පවිටුන් කෙරෙහි නැමෙන පුරුෂ පුද්ගලයෙකැ"යි ඔහුගේ ලාමක වූ කීර්ති ශබ්දය (අපකීර්තිය) උස්ව නගියි. මහණෙනි, අසූචියෙන් වැකුනු සර්පයා නොඩහතත් වැලි ඔහු (අසූචියෙන්) යම්සේ තවරා ද, මහණෙනි, එමෙන් ම මෙබඳු පුහුලාගේ දෘෂ්ටානුගතියට නොපැමිණිය ද වැලි "මේ පුරුෂපුද්ගල පාපමිත්‍රයන් ඇතියෙක, පාප යහළුවන් ඇතියෙක, පාපයන් කෙරෙහි නැමුනෙකැ" යි ඔහුගේ අපකීර්ති ශබ්දය උස්ව නැඟෙයි. එහෙයින් මෙ බඳු වූ පුද්ගල පිළිකුල් කටයුතු වෙයි. සේවනය නොකටයුතු වෙයි. භජනය නොකටයුතු වෙයි. පයිරුපාසනය නොකටයුතු වේ.

මහණෙනි, මැදහත් සේ දක්කයුතු සෙවනය නොකටයුතු භජනය නොකටයුතු පයිරුපාසනය නොකටයුතු පුද්ගල කවරේය යත්: මහණෙනි, මේ ලෝකයෙහි කිසි පුහුලෙක් කිපෙනසුලු වූයේ වේ ද ... මහණෙනි, යම් පරිදි දඬුකඩෙකින් හෝ කැබිලිත්තෙකින් හෝ ගටනු ලැබූ පැරැණි වණෙක් යම් සේ වෙසෙසින් ලේ සැරව වගුරුවා ද, මහණෙනි, එසේ ම ... මහණෙනි, යම් පරිදි දඬුකඩෙකින් හෝ කැබිලිත්තෙකින් හෝ ගටනු ලැබූ තිඹිරිගිනිපෙණෙහෙල්ල වැඩිපමණින් "චිටි චිටි" යන අනුකරණ පවත්වා ද, මහණෙනි, එපරිද්දෙන් ම දඬුකඩෙකින් හෝ කැබිලිත්තෙකින් හෝ ගටනු ලැබූ අශූචිවළ යම්සේ වෙසෙසින් දුගඳ වහනය කෙරේ ද, මහණෙනි, එපරිද්දෙන් ම මේ ලෝකයෙහි කිසි පුද්ගලයෙක් දැඩි ආයාසබහුල කොට ඇත්තේ මඳකුත් කියන ලද්දේ එහි ගැටේ ද, කිපේ ද, තදව සිටුනේ වේ ද, කෝපයත් ද්වේෂයත් නොසතුටත් පහළ කෙරේ ද, මහණෙනි, මෙබඳු පුද්ගල මැදහත් සේ දක්ක යුත්තේ ය. සේවනය නොකට යුත්තේ ය. භජනය නොකට යුත්තේ ය. පයිරුපාසනය නොකට යුත්තේ ය. කවර හෙයින යත්: වැලි මා හැවිගහෙන්නේය, වැලි මට අසභ්‍ය බණනේය, මට අනර්ථ ද කරන්නේය කියායි. එබැවින් මෙබඳු පුද්ගල මැදහත් සේ දක්ක යුත්තේ ය. සේවනය නොකට යුත්තේ ය. භජනය නොකට යුත්තේ ය. පයිරුපාසනය නොකට යුත්තේ ය.

කතමො ච භික්ඛවෙ පුග්ගලො සෙවිතබ්බො, භජිතබ්බො, පයිරුපාසිතබ්බො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සීලවා හොති කල්‍යාණධම්මො. එවරූපො භික්ඛවෙ පුග්ගලො සෙවිතබ්බො, භජිතබ්බො, පයිරුපාසිතබ්බො. තං කිස්ස හෙතු: කිඤ්චාපි භික්ඛවෙ එවරූපස්ස පුග්ගලස්ස න දිට්ඨානුගතිං ආපජ්ජති. අථ ඛො නං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති: "කල්‍යාණමිත්තො පුරිසපුග්ගලො, කල්‍යාණසහායො, කල්‍යාණසම්පවඞ්කො"ති. තස්මා එවරූපො පුග්ගලො සෙවිතබ්බො, භජිතබ්බො, පයිරුපාසිතබ්බො. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

2. නිහීයති පුරිසො නිහීනසෙවී
න ච හායෙථ කදාචි තුල්‍යසෙවී,
සෙට්ඨමුපනමං උදෙති ඛිප්පං
තස්මා අත්තනො උත්තරිං භජෙථාති.

### 3. 1. 3. 8

28. තයො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: ගූථභාණී පුප්ඵභාණී මධුභාණී.

කතමො ච භික්ඛවෙ පුග්ගලො ගූථභාණී: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සභග්ගතො[1] වා පරිසග්ගතො[2] වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො "එහම්භො[3] පුරිස යං ජානාසි, තං වදෙහී" ති. සො අජානං වා ආහ, "ජානාමී" ති. ජානං වා ආහ, "න ජානාමී"ති. අපස්සං වා ආහ, "පස්සාමී"ති පස්සං වා ආහ, "න පස්සාමී"ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසිතා හොති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො ගූථභාණී.

කතමො ච භික්ඛවෙ පුග්ගලො පුප්ඵභාණී: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සභග්ගතො වා පරිසග්ගතො[2] වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො "එහම්භො[3] පුරිස, යං ජානාසි තං වදෙහී"ති. සො අජානං වා ආහ, "න ජානාමී"ති, ජානං වා ආහ, "ජානාමී" ති, අපස්සං වා ආහ, "න පස්සාමී" ති, පස්සං වා ආහ, "පස්සාමී"ති: ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා න සම්පජානමුසා භාසිතා හොති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො පුප්ඵභාණී.

කතමො ච භික්ඛවෙ පුග්ගලො මධුභාණී: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ඵරුසං වාචං පහාය ඵරුසාය[4] වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා; තථාරූපිං[5], වාචං භාසිතා හොති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො මධුභාණී. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

---

1. සභාගතො වා. - සතා. සං. 2. පරිසගතො වා - සීමු. සී 1 සතා.
3. එවමෙහාපුරිස - PTS 4. ඵරුසා වාචා - සීමු. 5. තථාරූපං - සීමු.

මහණෙනි, කවර පුද්ගලයෙක් සේවනය කටයුතු වේ ද, භජනය කටයුතු වේ ද, පයඞුපාසනය කටයුතු වේ ද: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් කලණ දහම් ඇත්තේ සිල්වත් වෙයි. මහණෙනි, මෙබඳු පුද්ගල සේවනය කටයුත්තේ ය, භජනය කටයුත්තේ ය, පයඞුපාසනය කටයුත්තේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙබඳු පුද්ගලයාගේ දෘෂ්ටානුගතියට නොයතත් වැලි "මේ පුරුෂ පුද්ගල කලණ මිතුරන් ඇතියෙක, කලණ යහළුවන් ඇතියෙක, කලණ මිතුරන් කෙරෙහි නැමුනෙකැ"යි මෙසේ ඔහු ලකුණු කොට කලණ යස ගී උස්ව නැහෙයි. එහෙයින් මෙබඳු පුද්ගල සේවනය කටයුත්තේ ය, භජනය කටයුත්තේ ය, පයඞුපාසනය කටයුත්තේ ය. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙන ලෝකයෙහි විද්‍යමාන වෙත්.

2. තමහට විඩා ගුණයෙන්) හීනයන් සෙවුනා පුරුෂ පිරිහෙයි. තමන් හා (ගුණයෙන්) සමාන පුගුලන් සෙවුනා පුරුෂ කිසිකලෙකත් නො පිරිහෙන්නේ ය. තමනට වඩා (ගුණයෙන්) වැඩුනවුන් වෙත නැමෙන්නේ වහා වැඩෙයි. එහෙයින් තමනට විඩා (ගුණයෙන්) වැඞි නැනැත්තකු භජනය කරන්නේ යි.

**3. 1. 3 8**

28. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ලොව්හි විද්‍යමාන වෙති. කවර තුන් දෙනෙක යත්: ගූථභාණිය, පුෂ්පභාණිය, මධුභාණිය යන මොහුයි.

මහණෙනි, ගූථභාණී පුද්ගල තෙමේ කවරේ ය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් සභාවට ගියේ හෝ ගම්පිරිසට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ සේණි මැදට ගියේ හෝ රජකුලත් මැදට ගියේ හෝ "එම්බා, පුරුෂය, එව, යමක් දනිහි නම් එය කියව"යි පිළිවිසීමට හමියට කැඳවන ලද්දේ සාක්‍ෂි කොට පුළුවුස්නා ලද්දේ නොදන්නේ හෝ 'දන්මි'යි කියයි. දන්නේ හෝ 'නො දන්මි'යි කියයි. නො දක්නේ හෝ 'දක්මි'යි කියයි. දක්නේ හෝ 'නො දක්මි'යි කියයි. මෙසේ තමා හේතු කොට හෙණ හෝ මෙරමා හේතු කොට හෙණ හෝ මඳ ආමිෂයක් හේතු කොට ගෙණ හෝ දැන දැන මුසවා බෙණේ ද, මහණෙනි, මේ ගූථභාණී පුද්ගලයා යී කියනු ලැබේ.

මහණෙනි, පුෂ්පභාණී පුද්ගල කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුතුලෙක් සභාවට ගියේ හෝ පිරිසට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ සේණි මැදට ගියේ හෝ රජකුලන් මැදට ගියේ හෝ 'එම්බා පුරුෂය, "එව', යමක් දනිහි නම් එය කියව"යි පෙරමුණට කැඳවන ලද්දේ සාක්‍ෂි කොට පුළුවුස්නා ලද්දේ වේ ද, හෙ නො දන්නේ හෝ "නොදන්මි" යි කියයි. දන්නේ හෝ "දන්මි"යි කියයි. නො දක්නේ හෝ "නො දක්මි"යි කියයි. දක්නේ හෝ "දක්මි"යි කියයි. මෙසේ තමා හේතු කොට හෝ මෙරමා හේතු කොට හෝ මඳ ආමිෂයක් හේතු කොට හෝ දැන දැන මුසවා නො බෙණේ ද, මහණෙනි, මේ පුෂ්පභාණී පුද්ගලයා යී කියනු ලැබේ.

මහණෙනි, මධුභාණී පුද්ගල කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් පරුෂ්විසිකම් දුරු කොට කොරොස් බසින් වැළකුනේ වෙයි. යම් බසක් නිදෙස් ද, කණට සුව එළවා ද, පෙම් දනවා ද, ල ගණී ද, නත්වැසි (සභ්‍ය) ද, බොහෝ දෙනාට කැමති ද, බොහෝ දෙනාට මනාප ද, එබඳු බස් කියන්නේ වේ ද, මහණෙනි, මේ මධුභාණී පුද්ගලයා යී කියනු ලැබේ. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙන ලොව්හි විද්‍යමාන වෙත් යයි.

### 3. 1. 3. 9

29. තයො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: අන්ධො එකචක්ඛු ද්විචක්ඛු. කතමො ච භික්ඛවෙ පුග්ගලො අන්ධො: ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස තථාරූපං චක්ඛු න හොති, යථාරූපෙන චක්ඛුනා අනධිගතං වා භොගං අධිගච්ඡෙය්‍ය, අධිගතං වා භොගං ඵාතිකරෙය්‍ය.[1] තථාරූපම්පිස්ස චක්ඛු න හොති, යථාරූපෙන චක්ඛුනා කුසලාකුසලෙ ධම්මෙ ජානෙය්‍ය, සාවජ්ජානවජ්ජෙ ධම්මෙ ජානෙය්‍ය, හීනප්පණීතෙ ධම්මෙ ජානෙය්‍ය, කණ්හසුක්කසප්පටිභාගෙ ධම්මෙ ජානෙය්‍ය. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො අන්ධො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො එකචක්ඛු: ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස තථාරූපං චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා අනධිගතං වා භොගං අධිගච්ඡෙය්‍ය, අධිගතං වා භොගං ඵාතිකරෙය්‍ය. තථාරූපම්පිස්ස* චක්ඛු න හොති, යථාරූපෙන චක්ඛුනා කුසලාකුසලෙ ධම්මෙ ජානෙය්‍ය, සාවජ්ජානවජ්ජෙ ධම්මෙ ජානෙය්‍ය, හීනප්පණීතෙ ධම්මෙ ජානෙය්‍ය, කණ්හසුක්කසප්පටිභාගෙ ධම්මෙ ජානෙය්‍ය. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො එකචක්ඛු.

කතමො ච භික්ඛවෙ පුග්ගලො ද්විචක්ඛු: ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස තථාරූපං චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා අනධිගතං වා භොගං අධිගච්ඡෙය්‍ය, අධිගතං වා භොගං ඵාතිකරෙය්‍ය[1] තථාරූපම්පිස්ස චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා කුසලාකුසලෙ ධම්මෙ ජානෙය්‍ය, සාවජ්ජානවජ්ජෙ ධම්මෙ ජානෙය්‍ය, හීනප්පණීතෙ ධම්මෙ ජානෙය්‍ය, කණ්හසුක්කසප්පටිභාගෙ ධම්මෙ ජානෙය්‍ය. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො ද්විචක්ඛු. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

3. න චෙව භොගා තථාරූපා න ච පුඤ්ඤානි කුබ්බති,
උභයත්ථ කලිග්ගාහො අන්ධස්ස හතචක්ඛුනො.

4 අථාපරායං අක්ඛාතො එකචක්ඛු ච පුග්ගලො,
ධම්මාධම්මෙන සසඨො[2] භොගානි පරියෙසති.

5. ථෙය්‍යෙන කූටකම්මෙන මුසාවාදෙන චූභයං,
කුසලො හොති සංඝාතුං[3] කාමභොගී ච මානවො,
ඉතො සො නිරයං ගන්ත්වා එකචක්ඛු විහඤ්ඤති.

6. ද්විචක්ඛු පන අක්ඛාතො සෙට්ඨො පුරිසපුග්ගලො,
ධම්මලද්ධෙහි භොගෙහි උට්ඨානාධිගතං ධනං.

7. දදාති සෙට්ඨසඞ්කප්පො අව්‍යග්ගමනසො[4] නරො,
උපෙති භද්දකං ඨානං යත්ථ ගන්ත්වා න සොචති.

8. අන්ධඤ්ච එකචක්ඛුඤ්ච ආරකා පරිවජ්ජයෙ,
ද්විචක්ඛුං[5] පන සෙවෙථ සෙට්ඨං පුරිසපුග්ගලන්ති.

1. ඵාතිං කරෙය්‍ය - මජසං. ස්‍යා. 2. සාඨාසො, - මජසං. සංසට්ඨො - කම්බො.
3. සංහාතුං - ස්‍යා. 4. අබ්‍යග්ගමානසො නරො - මජසං. 5. ද්විචක්ඛුඤ්ච - PTS.

## 3. 1. 3. 9.

29. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ලොව්හි විද්‍යමාන වෙත්. කවර තුන් දෙනෙක යත්: අන්ධ ය, එකැස් ඇත්තේ ය, දෑස් ඇත්තේ ය යි. මහණෙනි, අන්ධ පුද්ගල කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයකුට යම්බඳු පැණසෙකින් නොලත් භෝග හෝ ලබන්නේ නම්, ලැබූ භෝග හෝ වඩා ගන්නේ නම්, එබඳු වූ නුවණසෙක් නොවෙයි. යම් බඳු නුවණසෙකින් කුසල් අකුසල් දහම් දැනගන්නේ නම්, සදොස් නිදොස් දහම් දැනගන්නේ නම්, හීනප්‍රණීත දහම් දැනගන්නේ නම්, අන්‍යෝන්‍ය ප්‍රතිවිරුද්ධ වූ කෘෂ්ණ ශුක්ල ධර්මයන් දැනගන්නේ නම්, එබඳු වූ නුවණසෙක් ඔහට නැත. මහණෙනි, මේ පුද්ගල අන්ධයා යි කියනු ලැබේ.

මහණෙනි, එකැස් ඇති පුද්ගල කවරේය යත්: මහණෙනි, මේ ලෝකයෙහි කිසි පුද්ගලයකුට යම් බඳු ඇසෙකින් ලබා නොගත් භෝග ලබා ගන්නේ නම්, ලබාගත් භෝග හෝ වඩා ගන්නේ නම්, එබඳු නුවණසෙක් ද වෙයි. යම් බඳු නුවණසෙකින් කුසල් අකුසල් දහම් දැනගන්නේ නම්, සදොස් නිදොස් දහම් දැනගන්නේ නම්, හීනප්‍රණීත ධර්මයන් දැනගන්නේ නම්, අන්‍යෝන්‍ය ප්‍රතිවිරුද්ධ කෘෂ්ණ ශුක්ල ධර්මයන් දැනගන්නේ නම්, එබඳු වූ නුවණස ද ඔහට නො වේ. මහණෙනි, මේ පුද්ගල එකැස් පුඟුලාය යි කියනු ලැබේ.

මහණෙනි, දෑස් ඇති පුද්ගල කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයකුහට යම් බඳු වූ නුවණසෙකින් නොලැබූ හෝ භෝගයන් ලබාගන්නේ නම් ලබාගත් හෝ භෝගයන් වඩා ගන්නේ නම් එබඳු නුවණසෙක් වෙයි. යම් බඳු වූ නුවණසෙකින් කුසල් අකුසල් දහම් දැනගන්නේ නම්, සදොස් නිදොස් දහම් දැනගන්නේ නම්, හීනප්‍රණීත ධර්මයන් දැනගන්නේ නම්, අන්‍යෝන්‍ය ප්‍රතිවිරුද්ධ වූ කෘෂ්ණ ශුක්ල ධර්මයන් දැනගන්නේ නම්, එබඳු වූ නුවණස ද ඔහට වේ. මහණෙනි, මේ දෑස් ඇති පුද්ගලයා යි කියනු ලැබේ. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙන ලොව්හි විද්‍යමාන වෙත්.

3. තට නුවණැස් ඇති අන්ධයාහට එබඳු භොගයෝ නො වෙත්. පින් ද නොකරයි, දෙලොව්හි පරාජයග්‍රහණ වෙයි.

4. වැලිදු ශඨවූ සිටුනා හේ පින්පව් දෙකින් භෝගයන් සොයා ද, එබඳු වූ මේ අනෙක් එකැස් ඇති පුඟුලෙක් ද වදුරණ ලද්දේය.

5. කාමභෝගී වූ ඒ මිනිස් සොර රුවටිලි හා මුසාවාද යන දෙකිනුදු භෝග රැස් කරන්නට දක්‍ෂයෙක් වේ. එකැස් ඇති හෙ මෙයින් නිරයට ගොස් වැනසෙයි.

6-7 දෑස් ඇත්තා වූ ශ්‍රෙෂ්ඨ පුරුෂ පුද්ගලයෙක් ද වදුරණ ලද්දේය. ශ්‍රේෂ්ඨ සංකල්පනා ඇති විචිකිච්ඡාරහිත සිත් ඇති ඒ මනුෂ්‍යයා දැහැමින් ලත් භොගයෙන් යුක්ත වූයේ උත්ථානවීර්‍ය්‍යයෙන් ලත් ධනය (මෙරමාහට) දෙයි. යම් තැනෙකට ගොස් නොසොස්නේ නම්, එබඳු සොඳුරු තැනට පැමිණෙයි.

8 අන්ධයා ද එකැස් ඇති පුද්ගලයා ද දුරින් දුරු කරන්නේය. ශ්‍රෙෂ්ඨ වූ දෑස් ඇති පුරුෂ පුද්ගලයා සේවනය කරන්නේය යි.

## 3. 1. 3. 10

30. තයො'මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: අවකුජ්ජපඤ්ඤො පුග්ගලො, උච්ඡඞ්ගපඤ්ඤො පුග්ගලො, පුථුපඤ්ඤො පුග්ගලො.

කතමො ච භික්ඛවෙ අවකුජ්ජපඤ්ඤො පුග්ගලො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවණාය. තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං, සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති. සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය නෙවාදිං මනසි කරොති, න මජ්ඣං මනසි කරොති, න පරියොසානං මනසි කරොති. වුට්ඨිතොපි තම්හා ආසනා තස්සා කථාය නෙවාදිං මනසි කරොති, න මජ්ඣං මනසි කරොති, න පරියොසානං මනසි කරොති. සෙය්‍යථාපි භික්ඛවෙ කුම්භො නික්කුජ්ජො, තත්‍ර උදකං ආසිත්තං විවට්ටති, නො සණ්ඨාති. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවණාය. තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති, ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං, සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති. සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය නෙවාදිං මනසි කරොති, න මජ්ඣං මනසි කරොති, න පරියොසානං මනසි කරොති. වුට්ඨිතොපි තම්හා ආසනා තස්සා කථාය නෙවාදිං මනසි කරොති, න මජ්ඣං මනසි කරොති, න පරියොසානං මනසි කරොති. අයං වුච්චති භික්ඛවෙ අවකුජ්ජපඤ්ඤො පුග්ගලො.

කතමො ච භික්ඛවෙ උච්ඡඞ්ගපඤ්ඤො පුග්ගලො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවණාය. තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං, සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති. සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය ආදිම්පි මනසි කරොති, මජ්ඣම්පි මනසි කරොති, පරියොසානම්පි මනසි කරොති. වුට්ඨිතොපි තම්හා ආසනා තස්සා කථාය නෙවාදිං මනසි කරොති, න මජ්ඣං මනසි කරොති, න පරියොසානං මනසි කරොති. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසස්ස උච්ඡඞ්ගෙ නානාඛජ්ජකානි ආකිණ්ණානි තිලා තණ්ඩුලා මොදකා බදරා, සො තම්හා ආසනා වුට්ඨහන්තො සතිසම්මොසා පකිරෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවණාය. තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං, සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති. සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය ආදිම්පි මනසි කරොති, මජ්ඣම්පි මනසි කරොති, පරියොසානම්පි මනසි කරොති. වුට්ඨිතොපි තම්හා ආසනා තස්සා කථාය නෙවාදිං මනසි කරොති, න මජ්ඣං මනසි කරොති, න පරියොසානං මනසි කරොති. අයං වුච්චති භික්ඛවෙ උච්ඡඞ්ගපඤ්ඤො පුග්ගලො.

## 3. 1. 3. 10.

30. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ලොව්හි විද්‍යමාන වෙත්. කවර තුන් දෙනෙක යත්: අවකුජ්ජපඤ්ඤ පුද්ගලය, උච්ඡඞ්ගපඤ්ඤ පුද්ගලය, පුථුපඤ්ඤ පුද්ගලයි.

මහණෙනි, අවකුජ්ජපඤ්ඤ පුද්ගල කවරේය යත්: මහණෙනි, මේ ලෝකයෙහි කිසි පුද්ගලයෙක් භික්ෂූන් වෙත නිතර බණ ඇසීම පිණිස ආරාමයට යන්නේ වේ ද, භික්ෂූහු ඔහට මුල කලණ කොට මැද කලණ කොට අග කලණ කොට අර්‍ථසහිත කොට ව්‍යඤ්ජන සහිත කොට කේවල සම්පූර්‍ණ කොට දහම් දෙසත්. පිරිසිදු කොට බඹසර ප්‍රකාශ කරත්, හෙතෙම ඒ අස්නෙහි හුන්නේ ඒ කථාව පිළිබඳ මුල මෙනෙහි නො කරයි. මැද මෙනෙහි නො කරයි, අග මෙනෙහි නො කරයි. ඒ අස්නෙන් නැඟී සිටියේත් ඒ කථාව පිළිබඳ මුල මෙනෙහි නො කෙරේ, මැද මෙනෙහි නො කෙරේ, අග මෙනෙහි නො කෙරේ. මහණෙනි, යම් පරිදි යටිකුරු කළ කළයෙක් වේ ද, වත් කරණ ලද ජලය පෙරළේ ද, නො නවත්නේ ද, මහණෙනි, එපරිද්දෙන් ම මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් භික්ෂූන් වෙත බණ ඇසීම පිණිස නිතර ආරාමයට යන්නේ වේ ද, භික්ෂූහු ඔහට මුල කලණ කොට මැද කලණ කොට අග කලණ කොට දම් දෙසත් ද, අර්‍ථ සහිත කොට ඛ්‍යඤ්ජන සහිත කොට සියල්ලෙන් සම්පූර්‍ණ කොට දහම් දෙසත්. පිරිසිදු කොට බඹසර ප්‍රකාශ කරත්. හෙතෙම ඒ අස්නෙහි හුන්නේ ඒ කථාව පිළිබඳ මුල මෙනෙහි නො කරයි ද, මැද මෙනෙහි නො කරයි ද, අග මෙනෙහි නො කරයි ද, ඒ අස්නෙන් නැඟී සිටියේ ම ඒ කථාව පිළිබඳ මුල මෙනෙහි නො කරයි ද, මැද මෙනෙහි නො කරයි ද, අග මෙනෙහි නො කරයි ද; මහණෙනි, මේ අවකුජ්ජපඤ්ඤ පුද්ගලයා යි කියනු ලැබේ.

මහණෙනි, උච්ඡඞ්ගපඤ්ඤ පුද්ගල කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් භික්ෂූන් වෙත දහම් ඇසීම පිණිස නිතර ආරාමයට යන්නේ වේ, භික්ෂූහු ඔහට මුල කලණ කොට මැද කලණ කොට අග කලණ කොට අර්‍ථ සහිත කොට ඛ්‍යඤ්ජන සහිත කොට සියල්ලෙන් සම්පූර්‍ණ කොට ධර්‍මය දෙසත් ද, පිරිසිදු කොට බඹසර ප්‍රකාශ කරත් ද, හෙතෙම ඒ අස්නෙහි හුන්නේ ඒ කථාව පිළිබඳ මුලත් මෙනෙහි කෙරේ ද, මැදත් මෙනෙහි කෙරේ ද, අගත් මෙනෙහි කෙරේ ද, ඒ අස්නෙන් නැඟී සිටියේත් ඒ කථාව පිළිබඳ මුල මෙනෙහි නො කෙරේ ද, මැද මෙනෙහි නො කෙරේ ද, අග මෙනෙහි නො කෙරේ ද, මහණෙනි, යම් පරිදි පුරුෂයකුගේ හිඟු තල සහල් අත්වට බෙබර යන නොයෙක් කෑයුතු දෑ ගැවසුනේ වේ ද, හෙතෙම ඒ අස්නෙන් නැඟී සිටුනේ ම සිහිමුළාවෙන් වම්හයි ද, මහණෙනි, එපරිදි ම මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් භික්ෂූන් වෙත බණ ඇසීම පිණිස නිතර ආරාමයට යන්නේ වේ ද, භික්ෂූහු ඔහට මුල කලණ කොට මැද කලණ කොට අග කලණ කොට දහම් දෙසත් ද, අර්‍ථ සහිත කොට ඛ්‍යඤ්ජන සහිත කොට සියල්ලෙන් සම්පූර්‍ණ කොට පිරිසිදු කොට බඹසර ප්‍රකාශ කරත් ද, හෙතෙම ඒ අස්නෙහි හුන්නේ ඒ කථාව පිළිබඳ මුලත් මෙනෙහි කෙරේ ද, මැදත් මෙනෙහි කෙරේ ද, අගත් මෙනෙහි කෙරේ ද, ඒ අස්නෙන් නැඟී සිටියේ ඒ කථාව පිළිබඳ මුල නො මෙනෙහි කෙරේ ද, මැද නොම මෙනෙහි කෙරේ ද, අග නොම මෙනෙහි කෙරේ ද, මහණෙනි, මේ උච්ඡඞ්ගපඤ්ඤ පුද්ගල යි කියනු ලැබේ.

කතමො ච භික්ඛවෙ පුථුපඤ්ඤො පුග්ගලො: ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවණාය. තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං, සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති. සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය ආදිම්පි මනසිකරොති, මජ්ඣම්පි මනසි කරොති, පරියොසානම්පි මනසි කරොති. වුට්ඨිතොපි තම්හා ආසනා තස්සා කථාය ආදිම්පි මනසි කරොති, මජ්ඣම්පි මනසි කරොති, පරියොසානම්පි මනසි කරොති. සෙය්‍යථාපි භික්ඛවෙ කුම්භො උක්කුජ්ජො, තත්‍ර උදකං ආසිත්තං සණ්ඨාති, නො විවට්ටති. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවණාය. තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං, සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති. සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය ආදිම්පි මනසි කරොති, මජ්ඣම්පි මනසි කරොති, පරියොසානම්පි මනසි කරොති. වුට්ඨිතොපි තම්හා ආසනා තස්සා කථාය ආදිම්පි මනසි කරොති, මජ්ඣම්පි මනසි කරොති, පරියොසානම්පි මනසි කරොති. අයං වුච්චති භික්ඛවෙ පුථුපඤ්ඤො පුග්ගලො. ඉමෙ ඛො භික්ඛවේ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

9. අවකුජ්ජපඤ්ඤො පුරිසො දුම්මෙධො අවිචක්ඛණො,
අභික්ඛණම්පි චෙ හොති ගන්තා භික්ඛූන සන්තිකෙ.

10. ආදිං කථාය මජ්ඣඤ්ච පරියොසානඤ්ච තාදිසො,
උග්ගහෙතුං න සක්කොති පඤ්ඤා හිස්ස න විජ්ජති.

11. උච්ඡඞ්ගපඤ්ඤො පුරිසො සෙය්‍යො එතෙන වුච්චති,
අභික්ඛණම්පි චෙ හොති ගන්තා භික්ඛූන සන්තිකෙ.

12. ආදිං කථාය මජ්ඣඤ්ච පරියොසානඤ්ච තාදිසො,
නිසින්නො ආසනෙ තස්මිං උග්ගහෙත්වාන බ්‍යඤ්ජනං,
වුට්ඨිතො[1] නප්පජානාති ගහිතම්පිස්ස[2] මුස්සති.

13. පුථුපඤ්ඤො ච පුරිසො සෙය්‍යො එතෙහි වුච්චති,
අභික්ඛණම්පි චෙ හොති ගන්තා භික්ඛූන සන්තිකෙ.

14. ආදිං කථාය මජ්ඣඤ්ච පරියොසානඤ්ච තාදිසො,
නිසින්නො ආසනෙ තස්මිං උග්ගහෙත්වාන බ්‍යඤ්ජනං.

15. ධාරෙති සෙට්ඨසඞ්කප්පො අබ්‍යග්ගමානසො නරො,
ධම්මානුධම්මපටිපන්නො දුක්ඛස්සන්තකරො[3] සියාති.

පුග්ගලවග්ගො තතියො.

1. වුට්ඨිතො ච ඛො - මජ්සං. 2. ගහිතං හිස්ස - ස්‍යා - කං.
3 දුක්ඛස්සන්තකරො සියා - සීමු.

තස්සුද්දානං:- සමිද්ධ ගිලානසඞ්ඛාර බහුකාරා වජිරෙන ච
සෙවි ජිගුච්ඡ ගූථභාණී අන්ධො ච අවකුජ්ජතාති.

මහණෙනි, පුථුපඤ්ඤ පුද්ගල කවරේය යත්: මහණෙනි, මෙ ලොව්හි කිසි පුද්ගලයෙක් භික්ෂූන් වෙත බණ ඇසීම පිණිස ආරාමයට නිතර යන්නේ වේ. භික්ෂූහු ඔහුට මුල කලණ කොට මැද කලණ කොට අග කලණ කොට අර්ථ සහිත කොට ව්‍යඤ්ජන සහිත කොට සියල්ලෙන් සම්පූර්ණ කොට ධර්මය දෙසත්. පිරිසිදු බඹසර ප්‍රකාශ කෙරෙත්. හෙතෙම ඒ අස්නෙහි හුන්නේ ඒ කථාව පිළිබඳ මුලත් මෙනෙහි කෙරේ, මැදත් මෙනෙහි කෙරේ, අගත් මෙනෙහි කෙරේ. ඒ අස්නෙන් නැගීසිටියේත් ඒ කථායෙහි මුලත් මෙනෙහි කෙරේ, මැදත් මෙනෙහි කෙරේ, අගත් මෙනෙහි කෙරේ. මහණෙනි, යම් පරිදි උඩුකුරු කළ කළයෙක් වේ ද, එහි වත් කරණ ලද දිය පිහිටා ද, පිටත නො ගැලේ ද, මහණෙනි, එපරිද්දෙන් ම මෙ ලොව්හි කිසි පුහුලෙක් භික්ෂූන් වෙත බණ ඇසීම පිණිස නිතර ආරාමයට යන්නේ වේ ද, භික්ෂූහු ඔහුට මුල කලණ කොට මැද කලණ කොට අග කලණ කොට අර්ථ සහිත කොට ව්‍යඤ්ජන සහිත කොට සියල්ලෙන් සම්පූර්ණ කොට ධර්මය දෙසත් ද, පිරිසිදු වූ බඹසර ප්‍රකාශ කරත් ද, හෙ ඒ අස්නේ හුන්නේ ඒ කථායෙහි මුලත් මෙනෙහි කරයි ද, මැදත් මෙනෙහි කරයි ද, අගත් මෙනෙහි කරයි ද, ඒ අස්නෙන් නැගී සිටියේත් ඒ කථායෙහි මුලත් මෙනෙහි කරයි ද, මැදත් මෙනෙහි කරයි ද, අගත් මෙනෙහි කරයි ද, මහණෙනි, මේ පුථුපඤ්ඤ පුද්ගලයා යි කියනු ලැබේ. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙන ලොව්හි විද්‍යමාන වෙත්.

9. විචක්ෂණ නුවූ ප්‍රඥ නැති, අවකුජ්ජපඤ්ඤ පුරුෂ තෙමේ ඉදින් භික්ෂූන් වෙත නිතර යන සුලු වේ ද-

10. එබඳු පුරුෂ කථායෙහි මුල ද මැද ද අග ද උගන්නට නොහැක්කේ ය. ඔහුට ප්‍රඥව නැත් ද, එහෙයිනි.

11. 'උච්ඡඞ්ගපඤ්ඤ' පුරුෂ තෙමේ මෝහුට වඩා ශ්‍රේෂ්ඨය යි කියනු ලැබේ. හෙතෙම ඉදින් නිතර භික්ෂූන් වෙත යන සුලු වේ ද-

12. එබඳු පුද්ගල ඒ ආසනයෙහි හුන්නේ ඒ කථායෙහි මුල ද මැද ද අග ද ඉගෙණ ව්‍යඤ්ජන ධරා නැගී සිටියේ ම නො දනී ද, ඔහු විසින් ගන්නා ලද්ද නැසෙයි.

13. 'පුථුපඤ්ඤ' පුරුෂ මොවුනට වඩා ශ්‍රේෂ්ඨය යි කියනු ලැබේ. ඉදින් හේ නිතර භික්ෂූන් වෙත යන සුලු වේ ද-

14. එබඳු පුද්ගල ඒ අස්නෙහි හුන්නේ ඒ කථායෙහි මුල ද මැද ද අග ද ඉගෙණ ව්‍යඤ්ජනය දරයි.

15. ශ්‍රේෂ්ඨසංකල්පනා ඇති විචිකිච්ඡා රහිත සිත් ඇති ධර්මානුධර්මයෙහි පිළිපන් මිනිස් ඒ දුක් කෙළවර කරන්නෙක් වන්නේය යි.

තෙවන පුඟුල් වග යි.

## [ 4. දෙවදූතවග්ගො. ]

### 3. 1. 4. 1

**[සාවත්ථිනිදානං:]**

31. සබ්‍රහ්මකානි භික්ඛවෙ තානි කුලානි, යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි, යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සාහුනෙය්‍යකානි[1] භික්ඛවෙ තානි කුලානි, යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං. පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං. ආහුනෙය්‍යාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං. තං කිස්ස හෙතු: බහුකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං. ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති.

16. බ්‍රහ්මාති මාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ,
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා.

17. තස්මා හි නෙ නමස්සෙය්‍ය සක්කාරෙය්‍යාථ පණ්ඩිතො,
අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච,
උච්ඡාදනෙන න්හාපනෙන පාදානං ධොවනෙන ච.

18. තාය නං පරිචරියාය මාතාපිතූසු පණ්ඩිතා,
ඉධෙව[2] නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදතීති.

### 3. 1. 4. 2

32. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: සියා නු ඛො භන්තෙ භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා[3] නාස්සු, බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා නාස්සු, යඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරතො අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා[3] න හොන්ති, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරෙය්‍යාති.

සියා ආනන්ද භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා[3] නාස්සු, බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා[3] නාස්සු, යඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරතො අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා[3] න හොන්ති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරෙය්‍යාති.

යථා කථං පන භන්තෙ සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා[3] න හොන්ති, බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා[3] න හොන්ති, යං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරතො අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා න හොන්ති, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරෙය්‍යාති.

---

1. සාහුණෙය්‍යාති - මජසං. 2. ඉධෙව නං - මජසං.
3. අහඞ්කාරමමඞ්කාරමානානුසයා - ස්‍යා. මජසං.

# [ 4. දේවදූත වර්‍ගය ]

## 3. 1. 4. 1

[සැවැත්නිදානයි:]

31. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මාපියෝ සියගෙහි පුදන ලද්දාහු වෙත් ද, ඒ කුලයෝ බ්‍රහම සහිතයහ. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මාපියෝ සියගෙහි පුදන ලද්දාහු වෙත් ද, ඒ කුලයෝ පූර්‍වාචාර්‍ය සහිතයහ. මහණෙනි, යම් පුත්‍ර කෙනකුන් විසින් මාපියෝ සියගෙහි පුදන ලද්දාහු වෙත් ද, ඒ කුලයෝ ආහුණෙය්‍ය සහිතයහ. මහණෙනි, 'බ්‍රහම' යනු මාපියනට තෙල නමෙකි. මහණෙනි, 'පුබ්බාචරිය' යනු මාපියනට තෙල නමෙකි. මහණෙනි, 'ආහුනෙය්‍ය' යනු මාපියනට තෙල නමෙකි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මාපියෝ පුත්‍රයන් පල්නාහු පුස්නාහු මේ ලෝකය දක්වන්නාහු වෙත් ද, එහෙයින් දරුවනට බොහෝ උපකාර ඇතියහ.

16. මාපියෝ පුත්‍රයනට බ්‍රහමයහ යි ද පූර්‍වාචාර්‍යයහ යි ද ආහුනෙය්‍යයහ යි ද දරුවනට අනුකම්පා කරන්නාහු යයි ද කියනු ලැබෙත්.

17. එහෙයින් නුවණැත්තේ ඔවුන් නමදනේ ය. ආහාරයෙනුදු යලි පානයෙනුදු වස්ත්‍රයෙනුදු යහනිනුදු ඇඟ ඉලීමෙනුදු නැවීමෙනුදු පා දෙවීමෙනුදු ඔවුන් සගන්නේ ය.

18. මවුපියන් කෙරෙහි ඒ පිරිසැරියෙන් පණ්ඩිතයෝ මෙලොව්හි ද ඔහු පසසත්. හේ පරලොව ගොස් ස්වර්‍ගයෙහි ද (විපාකමෝදනායෙන්) තුටු වේ යයි.

## 3. 1. 4. 2.

32. එකල්හි ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂමත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ: වහන්ස, යම් පරිද්දෙකින් සවිඥානක වූ මේ ශරීරයෙහිත් අහඞ්කාරදෘෂ්ටි හා මමඞ්කාරතෘෂ්ණා හා මානානුසය හා යන මොහු නො වෙත් නම්, බාහිර වූ ද සියලු නිමිත්තයෙහි අහඞ්කාර, මමඞ්කාර, මානානුසය යන මොහු නො වෙත් නම්, යම් ඵල සමාධියකටත් ඵලප්‍රඥාවකටත් සමවැද වසන්නහුට අහඞ්කාර, මමඞ්කාර, මානානුසයයෝ නො වෙත් නම්, එබඳු ඵලසමාධියකට ද ඵලප්‍රඥාවකට ද පැමිණ වසන්නේ නම්, ඒ භික්‍ෂුහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් ඇත් ද?.

ආනන්‍දයෙනි, යම් පරිද්දෙකින් මේ සවිඥානක ශරීරයෙහි ද, අහඞ්කාර, මමඞ්කාර, මානානුසයයෝ නො වෙත් නම්, බාහිර වූ ද සියලු රූපාදි-නිමිත්තයෙහි අහඞ්කාර, මමඞ්කාර, මානානුසයයෝ නො වෙත් නම්, යම් බඳු වූ ඵල සමාධියකට ඵලප්‍රඥාවකට පැමිණ වසන්නහුට අහඞ්කාර, මමඞ්කාර, මානානුසයයෝ නොවෙත් නම්, එබඳු වූ ද ඵලසමාධියකට ඵලප්‍රඥාවකට පැමිණ වෙසෙන්නේ නම්, ඒ භික්‍ෂුහට එවැනි සමාධිප්‍රතිලාභයෙක් ඇත.

වහන්ස, යම් හෙයෙකින් මේ සවිඥානක ශරීරයෙහි ද අහඞ්කාර, මමඞ්කාර, මානානුසයයෝ නො වෙත් ද, බාහිර වූ ද සියලු නිමිත්තයෙහි අහඞ්කාර, මමඞ්කාර, මානානුසයෝ නො වෙත් ද, යම් බඳු වූ ඵලසමාධියකට ඵලප්‍රඥා-වකට පැමිණ වසන්නහුට අහඞ්කාර, මමඞ්කාර, මානානුසයයෝ නොවෙත් නම්, එබඳු වූ ඵලසමාධියට ඵලප්‍රඥාවට පැමිණ වසන්නේ නම්, ඒ භික්‍ෂුහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් කෙසේ නම් වන්නේ ද?

ඉධානන්ද භික්ඛුනො එවං හොති: එතං සන්තං, එතං පණීතං, යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති. එවං ඛො ආනන්ද සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා ඉමස්මිං ච සවිඤ්ඤාණකෙ කායෙ අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා[1] නාස්සු, බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා නාස්සු, යං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරතො අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා න හොන්ති, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරෙය්‍ය.[2] ඉදං ච පන මෙතං ආනන්ද සන්ධාය භාසිතං පාරායණෙ පුණ්ණකපඤ්හෙ:

19. සඞ්ඛාය ලොකස්මිං පරොවරානි[3]
යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ,
සන්තො විධූමො අනීඝො නිරාසො
අතාරි සො ජාතිජරන්ති බ්‍රෑමී'ති.

**3. 1. 4. 3.**

33. අථ ඛො ආයස්මා **සාරිපුත්තො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සාරිපුත්තං භගවා එතදවොච: සඞ්ඛිත්තෙනපි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං, විත්ථාරෙනපි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං, සඞ්ඛිත්තවිත්ථාරෙනපි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං, අඤ්ඤාතාරො[4] ච දුල්ලභාති. එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා සඞ්ඛිත්තෙනපි ධම්මං දෙසෙය්‍ය, විත්ථාරෙනපි ධම්මං දෙසෙය්‍ය, සඞ්ඛිත්තවිත්ථාරෙනපි ධම්මං දෙසෙය්‍ය, භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරොති.

තස්මාතිහ සාරිපුත්ත එවං සික්ඛිතබ්බං: ඉමස්මිං ච සවිඤ්ඤාණකෙ කායෙ අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා න භවිස්සන්ති, බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා න භවිස්සන්ති, යං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරතො අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා න හොන්ති, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරිස්සාමාති. එවං හි ඛො සාරිපුත්ත සික්ඛිතබ්බං.

යතො ච ඛො සාරිපුත්ත භික්ඛුනො ඉමස්මිං ච සවිඤ්ඤාණකෙ කායෙ අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා න හොන්ති, බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා න හොන්ති, යං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරතො අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා න හොන්ති, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති සාරිපුත්ත භික්ඛු අවෙච්ඡි,[5] තණ්හං, වාවත්තයි[6] සංයොජනං, සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්ස. ඉදං ච පන මෙතං සාරිපුත්ත සන්ධාය භාසිතං පාරායණෙ උදයපඤ්හෙ.

20. පහානං කාමසඤ්ඤානං දොමනස්සාන චූභයං,
ථිනස්ස ච පනූදනං කුක්කුච්චානං නිවාරණං.

21. උපෙක්ඛාසතිසංසුද්ධං ධම්මතක්කපුරෙජවං,
අඤ්ඤාවිමොක්ඛං පබ්‍රෑමි අවිජ්ජායප්පභෙදනං'ති.

---

1. අහඞ්කාරමමඞ්කාරමානානුසයා - මජ්ඣං. PTS, 2. විහරෙය්‍යාති - මජ්ඣං. PTS.
3. පරොපරානි - මජ්ඣං ස්‍යා. 4. ධම්මස්ස අඤ්ඤාතාරො - ස්‍යා.
5. අවෙජ්ජී - ස්‍යා. කං 6. විවත්තයි - මජ්ඣං.

ආනන්දයෙනි, මේ ශාසනයෙහි භික්ෂුහට මෙබඳු සිතෙක් වෙයි: යම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාක්ෂයයෙක් නො ඇලීමෙක් නිරෝධයෙක් නිර්වාණයෙක් වේ ද, තෙල ශාන්තය. තෙල ප්‍රණීතයි. ආනන්දයෙනි, යම්සේ මේ සවිඤ්ඤාණක ශරීරයෙහි අහඞ්කාර මමඞ්කාර මානානුශයයෝ නො වෙත් ද, යම් ඵලසමාධියකට ද යම් ඵලප්‍රඥාවකට ද පැමිණ වාසය කරන්නාහට අහඞ්කාර මමඞ්කාර මානානුශයයෝ නො වෙත් ද, ඒ ඵලසමාධියට ද ඒ ඵලප්‍රඥාවට ද පැමිණ වාසය කරන්නේ ද, මෙසේ ඒ භික්ෂුහට එබඳු වූ සමාධිප්‍රතිලාභයෙක් වන්නේ ය. ආනන්දයෙනි, මේ කරුණ සඳහා පාරායණයෙහි පූර්ණක ප්‍රශ්නයෙහිදී මා විසින් තෙල දෙසන ලදී:

19. ලෝකයෙහි ස්වාත්මභාව පරාත්මභාව සඞ්ඛ්‍යාත පරාවරයන් නුවණින් දැන ලොව්හි කිසි අරමුණෙක්හිදු යමකුගේ කම්පායෙක් නැත් ද, විරුද්ධ වූ ක්ලේශයන් සංසිඳ වූ හෙයින් ශාන්ත වූ කායදුශ්චරිතාදි වූ දුම් නැති රාගාදි ඊඝ හා ආශා නැති හෙතෙම ජාති ජරා ව්‍යාධි මරණ සමූහය තරණය කෙළේය යි කියමි.

## 3. 1. 4. 3.

33. එකල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවනට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක: 'ශාරීපුත්‍රයෙනි, මම සැකෙවිනුදු දහම් දෙසමි. ශාරීපුත්‍රයෙනි, මම විතර විසිනුදු දහම් දෙසමි. සංක්ෂෙපවිස්තාර දෙකිනුදු දහම් දෙසමි. එතෙකුදුවත් ප්‍රතිවෙධ කරණුවෝ දුර්ලභයහ යි. භාග්‍යවතුන්වහන්සේ යම් හෙයෙකින් සැකෙවිනුදු දහම් දෙසන සේක් ද, විතර විසිනුදු දහම් දෙසන සේක් ද, සංක්ෂෙපවිස්තාර දෙකිනුත් දහම් දෙසන සේක් ද, භාග්‍යවතුන් වහන්ස, මේ එයට කලි. සුගතයන් වහන්ස, මේ එයට කලි. ධර්මය ප්‍රතිවේධ කරණුවෝ වෙති යි.

ශාරීපුත්‍රයෙනි, එසේ හෙයින් මේ සවිඤ්ඤාණක ශරීරයෙහි අහඞ්කාර මමඞ්කාර මානානුශයයෝ නොවන්නාහු ද, බාහ්‍ය වූ හැම නිමිත්හිදු අහඞ්කාර මමඞ්කාර මානානුශයයෝ නො වන්නාහු ද, යම් ඵලසමාධියකටත් ඵලප්‍රඥාවකටත් පැමිණ වාසය කරන්නහුට අහඞ්කාර මමඞ්කාර මානානුශයයෝ නො වෙත් නම් ඒ ඵලසමාධියට ද ඒ ඵලප්‍රඥාවට ද පැමිණ වසන්නම් හ යි මෙසේ හික්මිය යුතුයි. ශාරීපුත්‍රයෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

ශාරීපුත්‍රයෙනි, යම් කලෙක පටන්ගෙණ භික්ෂුහට සවිඤ්ඤාණක වූ මේ ශරීරයෙහි අහඞ්කාර මමඞ්කාර මානානුශයයෝ නො වෙත් නම්, බාහිර වූ සියලු නිමිත්තයෙහි දු අහඞ්කාර මමඞ්කාර මානානුශයයෝ නොවෙත් නම්, යම් ඵලසමාධියකට ද යම් ඵලප්‍රඥාවකට ද පැමිණ වාසය කරන්නහුට අහඞ්කාර මමඞ්කාර මානානුශයයෝ නො වෙත් නම්, ඒ ඵලසමාධියට ද ඵලප්‍රඥාවට ද පැමිණ වෙසේ නම්, ශාරීපුත්‍රයෙනි, මේ භික්ෂු තෘෂ්ණාව සිඳලී ය යි ද, සංයෝජන උපුටා හළේ ය යි ද, මනා පිළිවෙතින් මානය සංසිඳවීමෙන් සසරදුක අවසන් කෙළේය යි ද, කියනු ලැබේ. ශාරීපුත්‍රයෙනි, මෙය සඳහා ම **පාරායණ** වර්ගයෙහි **උදය ප්‍රශ්න**යෙහි මා විසින් තෙල දෙසන ලදී:

20-21. කාමසංඥාවන්ගේ ද දෞර්මනස්‍යන්ගේ දැයි මේ ධර්මයන් දෙදෙනාගේ ප්‍රහාණය ද ථිනමිද්ධයාගේ දුරලීම ද කුකුකුච්චයන්ගේ වැළැකීම ද චතුර්ථධ්‍යානයට අයත් ඵලයෙහි උපන් උපේක්ෂායෙන් හා ස්මෘතියෙන් පිරිසිදු වූ සම්‍යක්සංකල්පය පෙරට කොට සිටි අඤ්ඤින්ද්‍රියයාගේ කෙළවර උපදනා අර්හත්ඵලය අවිද්‍යාව බිඳීමය යි කියමි.

## 3. 1. 4. 4.

34. තීණි'මානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය. කතමානි තීණි: ලොභො නිදානං කම්මානං සමුදයාය, දොසො නිදානං කම්මානං සමුදයාය, මොහො නිදානං කම්මානං සමුදයාය.

යං භික්ඛවෙ ලොභපකතං කම්මං ලොභජං ලොභනිදානං ලොභසමුදයං, යත්ථස්ස අත්තභාවො නිබ්බත්තති, තත්ථ තං කම්මං විපච්චති. යත්ථ තං කම්මං විපච්චති, තත්ථ තස්ස කම්මස්ස විපාකං පටිසංවෙදෙති දිට්ඨෙ වා ධම්මෙ, උපපජ්ජෙ වා,[1] අපරෙ වා පරියායෙ.

යං භික්ඛවෙ දොසපකතං කම්මං දොසජං දොසනිදානං දොසසමුදයං, යත්ථස්ස අත්තභාවො නිබ්බත්තති, තත්ථ තං කම්මං විපච්චති. යත්ථ තං කම්මං විපච්චති, තත්ථ තස්ස කම්මස්ස විපාකං පටිසංවෙදෙති දිට්ඨෙ වා ධම්මෙ, උපපජ්ජෙ[1] වා, අපරෙ වා පරියායෙ.

යං භික්ඛවෙ මොහපකතං කම්මං මොහජං මොහනිදානං මොහසමුදයං, යත්ථස්ස අත්තභාවො නිබ්බත්තති, තත්ථ තං කම්මං විපච්චති. යත්ථ තං කම්මං විපච්චති, තත්ථ තස්ස කම්මස්ස විපාකං පටිසංවෙදෙති දිට්ඨෙ වා ධම්මෙ, උපපජ්ජෙ වා, අපරෙ වා පරියායෙ.

සෙය්‍යථාපි භික්ඛවෙ බීජානි අඛණ්ඩානි අපූතීනි අවාතාතපහතානි සාරාදානි සුඛසයිතානි සුඛෙත්තෙ සුපරිකම්මකතාය භූමියා නික්ඛිත්තානි, දෙවො ච සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, එවස්සු තානි භික්ඛවෙ බීජානි වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යුං. එවමෙව ඛො භික්ඛවෙ යං ලොභපකතං කම්මං ලොභජං ලොභනිදානං ලොභසමුදයං, යත්ථස්ස අත්තභාවො නිබ්බත්තති, තත්ථ තං කම්මං විපච්චති. යත්ථ තං කම්මං විපච්චති, තත්ථ තස්ස කම්මස්ස විපාකං පටිසංවෙදෙති දිට්ඨෙ වා ධම්මෙ, උපපජ්ජෙ වා, අපරෙ වා පරියායෙ.

යං දොසපකතං කම්මං -පෙ- යං මොහපකතං කම්මං මොහජං මොහනිදානං මොහසමුදයං, යත්ථස්ස අත්තභාවො නිබ්බත්තති, තත්ථ තං කම්මං විපච්චති. යත්ථ තං කම්මං විපච්චති, තත්ථ තස්ස කම්මස්ස විපාකං පටිසංවෙදෙති දිට්ඨෙ වා ධම්මෙ, උපපජ්ජෙ වා, අපරෙ වා පරියායෙ. ඉමානි ඛො භික්ඛවෙ තීණි නිදානානි කම්මානං සමුදයායාති.

---

1. උපපජ්ජ වා - මජසං.

**3. 1. 4. 4**

34. මහණෙනි, (වෘත්තගාමී) කර්මයන්ගේ රැස් කිරීමට මේ කරුණු තුනෙකි. කවර තුනෙක යත්: කර්මයන්ගේ රැස් කිරීමට ලෝභය කරුණෙකි, කර්මයන්ගේ රැස් කිරීමට ද්වේෂය කරුණෙකි, කර්මයන්ගේ රැස් කිරීමට මෝහය කරුණෙකි.

මහණෙනි, ලෝභයෙන් කරණ ලද ලෝභයෙන් උපන් ලෝභය නිදාන කොට ඇති ලෝභය ප්‍රත්‍යය කොට ඇති යම් කර්මයෙක් වේ ද, යම් තැනෙක කර්මවත් ඔහුගේ පස්කඳ පහළ වේ ද, ඒ අත්බැව්හි ඔහුගේ ඒ කර්මය විපාක දෙයි. යම් තැනෙක ඒ කර්ම විපාක දෙන්නේ වේ ද, ඒ කර්මයාගේ විපාකය ඉහාත්මයෙහි හෝ දෙවන අත්බැව්හි හෝ අවකාශ ලත් යම් ම අත්බැවෙක හෝ විඳුනේය.

මහණෙනි, ද්වේෂයෙන් කරණ ලද ද්වේෂයෙන් උපන් ද්වේෂය නිදාන කොට ඇති ද්වේෂය ප්‍රත්‍යය කොට ඇති යම් කර්මයෙක් වේ ද, යම් තැනෙක ඔහුගේ පස්කඳ පහළ වේ නම්, ඒ අත්බැව්හි ඒ කර්මය විවස්නේ වෙයි. යම් තැනෙක ඒ කර්මය විවස්නේ ද, මේ භවයෙහි වේවයි, දෙවන අත්බැව්හි වේවයි, තදන්‍යභවයෙක වේවයි, එහි ඒ කර්මවිපාකය විඳුනේ ය.

මහණෙනි, මෝහයෙන් කරණ ලද මෝහයෙන් උපන් මෝහය නිදාන කොට ඇති මෝහය ප්‍රත්‍යය කොට ඇති යම් කර්මයෙක් වේ ද, යම් තැනෙක ඔහුගේ ආත්මභාවය පහළ වේ නම්, ඒ අත්බැව්හි ඒ කර්මය විවස්නේ ය. යම් තැනෙක ඒ කර්මය විවස්නේ වේ ද, ඉහාත්මභාවයෙහි වේවයි, දෙවන භවයෙහි වේවයි, තදන්‍යභවයෙක වේවයි එහි ඒ කර්මවිපාකය විඳුනේ ය.

මහණෙනි, යම්සේ නොබුන් කුණු නුවූ අව්සුළඟින් නොපහළ ඇදගත් සාරය ඇති සුවයෙන් හොත් මනා කෙතෙක්හි මොනොවට සඟට බිම්හි වපුළ බීජකෙනෙක් වෙත් ද, මේඝය ද සම්‍යක් ධාරාව වර්ෂණ කෙරේ ද, මහණෙනි, එසේ ඇතිකල්හි ඒ බීජයෝ (අකුර නැඟීමෙන්) වෘද්ධියට (මූල්බැස ගැණීමෙන්) විරූඪියට (පැතිරීමෙන්) වෛපුල්‍යයට යන්නාහ. මහණෙනි, එපරිද්දෙන් ම ලෝභයෙන් කරණ ලද ලෝභයෙන් උපන් ලෝභය නිදාන කොට ඇති ලෝභය ප්‍රත්‍යය කොට ඇති යම් කර්මයෙක් වේ ද, යම් තැනෙක ඔහුගේ ආත්මභාවය (පස්කඳ) පහළ වේ ද, ඒ අත්බැව්හි ඒ කර්මය විවස්නේය. යම් තැනෙක ඒ කර්මය විවස්නේ වේ ද, ඉහාත්මභාවයෙහි වේවයි, දෙවන අත්බැව්හි වේවයි, තදන්‍යභවයෙක වේවයි, එහි ඒ කර්ම විපාකය විඳුනේය.

ද්වේෂයෙන් කරණ ලද යම් කර්මයෙක් වේ ද ... මෝහයෙන් කරණ ලද මෝහයෙන් උපන් මෝහය නිදාන කොට ඇති මෝහය ප්‍රත්‍යය කොට ඇති යම් කර්මයෙක් වේ ද, යම් තැනෙක ඔහුගේ ආත්මභාවය පහළ වේ ද, එහි ඔහුගේ ඒ කර්මය විවස්නේය. යම් තැනෙක ඒ කර්මය විවස්නේ වේ ද, ඉහාත්මභාවයෙහි වේවයි, දෙවන අත්බැව්හි වේවයි, එයින් අන් අත්-බැවෙක්හි වේවයි එහි ඒ කර්මවිපාකය විඳුනේය. මහණෙනි, (වෘත්තගාමී) කර්මයන්ගේ සමුදය පිණිස මේ නිදානයෝ තුන් දෙන වෙති.

තීණි'මානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය. කතමානි තීණි: අලොභො නිදානං කම්මානං සමුදයාය, අදොසො නිදානං කම්මානං සමුදයාය, අමොහො නිදානං කම්මානං සමුදයාය.

යං භික්ඛවෙ අලොභපකතං කම්මං අලොභජං අලොභනිදානං අලොභ-සමුදයං, ලොභෙ විගතෙ එවං තං කම්මං පහීනං හොති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං[1] ආයතිං අනුප්පාදධම්මං.

යං භික්ඛවෙ අදොසපකතං කම්මං අදොසජං අදොසනිදානං අදොස-සමුදයං, දොසෙ විගතෙ එවං තං කම්මං පහීනං හොති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං[1] ආයතිං අනුප්පාදධම්මං.

යං භික්ඛවෙ අමොහපකතං කම්මං අමොහජං අමොහනිදානං අමොහ-සමුදයං, මොහෙ විගතෙ එවං තං කම්මං පහීනං හොති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං.

සෙය්‍යථාපි භික්ඛවෙ බීජානි අඛණ්ඩානි අපූතීනි අවාතාතපහතානි සාරදානි සුඛසයිතානි. තානි පුරිසො අග්ගිනා දහෙය්‍ය, අග්ගිනා දහිත්වා මසිං කරෙය්‍ය, මසිං කරිත්වා මහාවාතෙ වා ඔපුනෙය්‍ය[2], නදියා වා සීඝසොතාය පවාහෙය්‍ය, එවස්සු තානි භික්ඛවෙ බීජානි උච්ඡින්නමූලානි තාලාවත්ථුකතානි අනභාවකතානි ආයතිං අනුප්පාදධම්මානි. එවමෙව ඛො භික්ඛවෙ යං අලොභපකතං කම්මං අලොභජං අලොභනිදානං අලොභසමුදයං, ලොභෙ විගතෙ එවං තං කම්මං පහීනං හොති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාව-කතං ආයතිං අනුප්පාදධම්මං.

යං අදොසපකතං කම්මං -පෙ- යං අමොහපකතං කම්මං අමොහජං අමොහනිදානං අමොහසමුදයං, මොහෙ විගතෙ එවං තං කම්මං පහීනං හොති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං. ඉමානි ඛො භික්ඛවෙ තීණි නිදානානි කම්මානං සමුදයායාති.

22 ලොභජං දොසජං චෙව මොහජං චාපවිද්දසු,
යං තෙන පකතං කම්මං අප්පං වා යදි වා බහුං,
ඉධෙව තං වෙදනීයං වත්ථු අඤ්ඤං න විජ්ජති.

23 තස්මා ලොභං ච දොසං ච මොහජං චාපි විද්දසු,
විජ්ජං උප්පාදයං භික්ඛු සබ්බා දුග්ගතියො ජහෙ'ති.

1. අනභාවං කතං - මජසං. සයා
2. ඔපුණෙය්‍ය - මජසං

මහණෙනි, වෘත්තගාමී කර්මයන්ගේ සමුදය පිණිස මේ නිදානයෝ තුන් දෙනෙකි: කවර තුන් දෙනෙක යත්: වෘත්තගාමී කර්මයන්ගේ සමුදය පිණිස අලෝභය නිදාන වේ. වෘත්තගාමී කර්මයන්ගේ සමුදය පිණිස අද්වේෂය නිදානය වේ. වෘත්තගාමී කර්මයන්ගේ සමුදය පිණිස අමෝහය නිදානය වේ.

මහණෙනි, අලෝභයෙන් කරණ ලද අලෝභයෙන් උපන් අලෝභය නිදාන කොට ඇති අලෝභය සමුදය කොට ඇති යම් කර්මයෙක් වේ ද, ලෝභය පහ වූ කල්හි මෙසේ ඒ කර්මය ප්‍රහත වේ. උපුටා හළ මුල් ඇති වේ. මුදුන සිඳලූ (තාලවස්තුවක් මෙන්) කරණ ලද්දේ වේ. නැවත නොවැඩීම කරණ ලද්දේ වේ. නැවත නූපදනා සැහැවි ඇති වේ.

මහණෙනි, අද්වේෂයෙන් කරණ ලද අද්වේෂයෙන් උපන් අද්වේෂය නිදාන කොට ඇති අද්වේෂය සමුදය කොට ඇති යම් කර්මයෙක් වේ ද, ද්වේෂය පහවූ කල්හි මෙසේ ඒ කර්මය ප්‍රහත වේ. උපුටා හළ මුල් ඇති වේ. (මුදුන සිඳුනා ලද) තාලවස්තුවක් මෙන් කරණ ලද්දේ වේ. මතු නොවැඩීම කරණ ලද්දේ වේ. මතු නූපදනා සැහැවි ඇති වේ.

මහණෙනි, අමෝහයෙන් කරණ ලද අමෝහයෙන් උපන් අමෝහ නිදාන කොට ඇති අමෝහ සමුදය කොට ඇති යම් කර්මයෙක් වේ ද, මෝහය පහ වූ කල්හි මෙසේ ඒ කර්මය ප්‍රහත වේ. උපුටා හළ මුල් ඇති වේ. (මුදුන සිඳුනා ලද) තාලවස්තුවක් මෙන් කරණ ලද්දේ වේ. නැවත නොවැඩීම කරණ ලද්දේ වේ. නැවත නූපදනා සැහැවි ඇති වේ.

මහණෙනි, යම් පරිදි නො බුන් කුණු නුවූ අව්සුළඟින් නොපහළ ඇඳගත් සාරය ඇති, මොනොවට හොත් බිජුවට ඇත් ද, ඒ බිජුවට පුරුෂයෙක් ගින්නෙන් දවන්නේ ද, ගින්නෙන් දවා හළු කරන්නේ ද, හළු කොට මහසුළඟෙහි හෝ පොළාහරණේ ද, සැඩ දියපහර ඇති නදියෙක්හි හෝ උල්පවා හරණේ ද, මහණෙනි, එසේ ඇති කල්හි ඒ බිජුවට සිඳලූ මුල් ඇති වේ. (මුදුන සිඳුනා ලද) තාලවස්තුවක් මෙන් කරණ ලද්දේ වේ. මතු නොවැඩීම කරණ ලද්දේ වේ. මත්තෙහි නූපදනා සැහැවි ඇති වේ. මහණෙනි, එපරිද්දෙන් ම අලෝභයෙන් කරණ ලද අලෝභයෙන් උපන් අලෝභය නිදාන කොට ඇති අලෝභය සමුදය කොට ඇති යම් කර්මයෙක් වේ ද, ලෝභය පහවූ කල්හි මෙසේ ඒ කර්මය ප්‍රහත වේ. සිඳලූ මුල් ඇති වේ. (මුදුන සිඳුනා ලද) තාලවස්තුවක් මෙන් කරණ ලද්දේ වේ. නැවත නොවැඩීම කරණ ලද්දේ වේ. නැවත නූපදනා සැහැවි ඇති වේ.

අද්වේෂයෙන් කරණ ලද යම් කර්මයෙක් වේ ද ... අමෝහයෙන් කරණ ලද අමෝහයෙන් උපන් අමෝහය නිදාන කොට ඇති අමෝහය සමුදය කොට ඇති යම් කර්මයෙක් වේ ද, මෝහය පහවූ කල්හි ඒ කර්මය ප්‍රහත වේ. සිඳලූ මුල් ඇති වේ. (මුදුන සිඳලූ) තාලවස්තුවක් මෙන් කරණ ලද්දේ වේ. නැවත නොවැඩීම කරණ ලද්දේ වේ. නැවත නූපදනා සැහැවි ඇති වේ. මහණෙනි, මොහු වෘත්තගාමී කර්මයන්ගේ සමුදය පිණිස වූ තුන් නිදානයෝයි.

22. අඥ බාල තෙම ලෝභයෙන් උපන් හෝ ද්වේෂයෙන් උපන් හෝ ස්වල්ප වූ හෝ බොහෝ වූ යම් කර්මයක් කරයි ද, ඔහු විසින් කරණ ලද ඒ කර්මය මේ අත්බැව්හි ම වින්ද යුතු වේ. (එහි විපාක දීමට) අන් තැනෙක් නැත.

23. එහෙයින් පණ්ඩිත භික්ෂු තෙම අභිඥාවමාගීඥනවිද්‍යාව උපදවන්නේ ලෝභයෙන් උපන් හෝ ද්වේෂයෙන් උපන් හෝ මෝහයෙන් උපන් කර්ම ද සියලු දුගතීන් ද දුර ලන්නේ යයි.

## 3. 1. 4. 5.

35. එකං සමයං භගවා **ආළවියං** විහරති ගොමග්ගෙ සිංසපාවනෙ පණ්ණසන්ථරෙ. අථ ඛො **හත්ථකො** ආළවකො ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො අද්දස භගවන්තං ගොමග්ගෙ සිංසපාවනෙ පණ්ණසන්ථරෙ නිසින්නං. දිස්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො හත්ථකො ආළවකො භගවන්තං එතදවොච: කච්චි භන්තෙ භගවා සුඛමසයිත්ථාති? එවං කුමාර සුඛමසයිත්ථං, යෙ ච පන ලොකෙ සුඛං සෙන්ති, අහං තෙසං අඤ්ඤතරොති.

සීතා භන්තෙ හෙමන්තිකා රත්ති, අන්තරට්ඨකො හිමපාතසමයො, ඛරා ගොකණ්ටකහතා භූමි, තනුකො පණ්ණසන්ථරො, විරළානි රුක්ඛස්ස පත්තානි, සීතානි කාසායානි වත්ථානි, සීතො ච වෙරම්භවාතො[1] වාති. අථ ච පන භගවා එවමාහ: එවං කුමාර සුඛමසයිත්ථං; යෙ ච පන ලොකෙ සුඛං සෙන්ති, අහං තෙසං අඤ්ඤතරොති.

තෙන හි කුමාර තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි; යථා තෙ ඛමෙය්‍ය, තථා නං ව්‍යාකරෙය්‍යාසි. තං කිම්මඤ්ඤසි කුමාර? ඉධස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා කූටාගාරං උල්ලිත්තාවලිත්තං නිවාතං ඵුසිතග්ගළං පිහිතවාතපානං; තත්‍රස්ස පල්ලඞ්කො ගොණකත්ථතො පටිකත්ථතො පටලිකත්ථතො කාදලිමිගපවර පච්චත්ථරණො[2] සඋත්තරච්ඡදො උභතොලොහිතකූපධානො; තෙලප්පදීපො චෙත්ථ ඣායෙය්‍ය; චතස්සො ච පජාපතියො මනාපමනාපෙන පච්චුපට්ඨිතාස්සු; තං කිම්මඤ්ඤසි කුමාර සුඛං වා සො සයෙය්‍ය, නො වා, කථං වා තෙ එත්ථ හොතීති?

සුඛං සො භන්තෙ සයෙය්‍ය; යෙ ච පන ලොකෙ සුඛං සෙන්ති, සො තෙසං අඤ්ඤතරොති.

තං කිම්මඤ්ඤසි කුමාර? අපි නු තස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා උප්පජ්ජෙය්‍යුං රාගජා පරිළාහා කායිකා වා චෙතසිකා වා, යෙහි සො රාගජෙහි පරිළාහෙහි පරිඩය්හමානො දුක්ඛං සයෙය්‍යාති? එවං භන්තෙ. යෙහි ඛො සො කුමාර, ගහපති වා ගහපතිපුත්තො වා රාගජෙහි පරිළාහෙහි පරිඩය්හමානො දුක්ඛං සයෙය්‍ය, සො රාගො තථාගතස්ස පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. තස්මාහං සුඛමසයිත්ථං. තං කිම්මඤ්ඤසි කුමාර? අපි නු තස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා උප්පජ්ජෙය්‍යුං දොසජා පරිළාහා -පෙ- උප්පජ්ජෙය්‍යුං මොහජා පරිළාහා කායිකා වා චෙතසිකා වා යෙහි සො මොහජෙහි පරිළාහෙහි පරිඩය්හමානො දුක්ඛං සයෙය්‍යාති? එවං භන්තෙ. යෙහි ඛො සො කුමාර, ගහපති වා ගහපතිපුත්තො වා මොහජෙහි පරිළාහෙහි පරිඩය්හමානො දුක්ඛං සයෙය්‍ය, සො මොහො තථාගතස්ස පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. තස්මාහං සුඛමසයිත්ථන්ති.

---

1. වෙරම්භා වාතො වායති - මජසං

2 කාදලිමිගපවර පච්චත්ථරණො - මජසං, සා PTS.

## 3. 1. 4. 5

35. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අලව්රට ගොන්මග ඇව්ටර වෙනෙහි කොළ ඇතිරියෙහි වැඩවසන සේක. එකල්හි හත්ථක ආලවක නම් රජපුත් ජඞ්ඝාවිහාරය කොට සක්මන් කරනුයේ ඇවිදිනුයේ ගොන්මග ඇව්ටර වෙනෙහි කොළ ඇතිරියෙහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස් ව හින. එකත්පස්ව හුන් හත්ථක ආලවක භාග්‍යවතුන් වහන්සේට මෙය කීය: කිමෙක් ද, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සුවසේ හොත්සේක් ද?. කුමාරය, එසේය. සුවසේ හොත්මි. ලොව්හි යම් කෙනෙක් සුවසේ හොවිත් නම්, මම ඔවුන් අතුරෙන් අන්‍යතරයෙක්මි.

වහන්ස, හේමන්තයට අයත් රැය ශීතය, (=තවම් මැදින් දෙමස අගමුල අට දවස) හිම වැටෙන කාලය වේ. බිම රළුය, ගොකුරකටුයෙන් බිඳින. පත් ඇතිරිය තුනීය. ගසේ කොළ ද විරල ය. කසාවත් සිහිලැ. සිහිල් වෙරම්බ වාතය ද හමයි. එහෙකුදු වුව භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාරණ සේක: ‘කුමාරය, එසේය. සුවසේ හොත්මි. ලොව්හි යම් කෙනෙක් සුවසේ හොවිත් නම්, මම ඔවුනතුරෙන් අන්‍යතරයෙක්මි යි.’

කුමාරය, එසේ නම් මෙහිලා තා ම පුළුවුස්මි. යම්සේ තට රුස්නේ නම්, එසේ ප්‍රකාශ කරව. කුමාරය, එය කිමැයි හඟනෙහි ද? මෙ ලොව්හි ගැහැවියකුහට හෝ ගැහැවි පුතකුට හෝ ඇතුලත පිටත අලෙව් දුන් වාතයෙන් තොර වූ වැද්දූ අගුල් ඇති යෙදූ වා කවුළු ඇති කූළගෙයෙක් වන්නේ නම්, එහි කළුකොඳු පලස් අතුළ, සුදු එළුලොම්මුවා ඇතිරි අතුළ, සතපුප් එළුලොම් ඇතිරි අතුළ, කෙහෙල්මුවසමින් කළ උතුම් පසතුරුණු ඇති, උඩුවියැන් සහිත හිස්දෙර හා පාමුල දෙපස රත් කන්වකින් ඇති පලඟෙක් ඇත් නම්, තෙල් පහනෙක් ද එහි දැල්වේ නම්, පාදපරිචාරිකාවෝ සිවුදෙනකුත් මනාප මනාප උපස්ථානයෙන් එළඹ සිටියාහු නම්, කුමාරය, එය කිමැයි සිතයි ද? හෙතෙම සුවසේ හෝනේ හෝ වේ ද? නොහොත් නො වේ ද? මෙහිලා තට කෙබඳු සිතෙක් හෝ වේ දැ” යි?

‘වහන්ස, හෙතෙම සැපසේ හෝනේය. ලොව්හි යම් කෙනෙකුන් සුවසේ හොවිත් නම්, හෙතෙම ඔවුනතුරෙන් අන්‍යතරයෙකැ’ යි කීය. කුමාරය, එසේ නම් මෙහිලා තා ම පුළුවුස්මි. යම්සේ තට රුස්නේ නම්, එසේ ප්‍රකාශ කරව.

‘කුමාරය, ‘එය කිමැ’ යි සිතයි ද? රාගයෙන් උපන් යම්බඳු පරිදාහයෙන් දැවෙන හෙතෙම දුකසේ හෝනේ නම්, එබඳු කය පිළිබඳ වූ හෝ සිත පිළිබඳ වූ හෝ රාගයෙන් උපන් පරිදාහයෝ ඒ ගෘහපතියාට හෝ ගෘහපතිපුත්‍රයාට හෝ උපදනාහු ද? ‘වහන්ස, එසේය’. ‘කුමාරය, ඒ ගෘහපති තෙමේ හෝ ගෘහපති පුත්‍රයා හෝ රාගයෙන් උපන් යම් දැවිල්ලෙකින් හාත්පසින් දැවෙන්නේ දුකසේ හෝනේ නම්, ඒ රාගය තථාගතයන් වහන්සේට ප්‍රහතය, උපුටා හළ මුල් ඇත්තේය, (මුදුන සිඳුනා ලද) තාලවස්තුවක් මෙන් කරණ ලද්දේය. නැවත නොවැඩීම කරණ ලද්දේය. නැවත නූපදනා සැහැවි ඇත්තේය එහෙයින් මම සුවසේ හොත්මි.’ ‘කුමාරය, එය කිමැයි සිතයි ද? ඒ ගෘහපතියාහට හෝ ගෘහපතිපුත්‍රයාහට හෝ ද්වේෂයෙන් උපන් දැවිලිහි ඉදින් උපදනාහු ද? -පෙ- හෙතෙම යම්බඳු මෝහයෙන් උපන් දැවිල්ලෙන් දැවෙන්නේ දුකසේ හොවී නම්, එබඳු වූ කායික හෝ චෛතසික හෝ මොහයෙන් උපන් දැවිලිහි උපදින්නාහු ද? ‘වහන්ස, එසේය.’ ‘කුමාරය, ඒ ගෘහපතියා හෝ ගෘහපතිපුත්‍රයා හෝ මෝහයෙන් උපන් යම්බඳු දැවිල්ලෙ-කින් දැවෙන්නේ දුකසේ හෝනේ නම්, ඒ මෝහය තථාගතයනට ප්‍රහතය. උපුටා හළ මුල් ඇත්තේය. (මුදුන සිඳලූ) තාලවස්තුවක් මෙන් කරණ ලද්දේය නැවත නොවැඩීම කරණ ලද්දේය. මතු නූපදනා සැහැවි ඇත්තේය. එහෙයින් මම සුවසේ හොත්මි’ යි.

24 සබ්බදා වෙ සුඛං සෙති බ්‍රාහ්මණො පරිනිබ්බුතො,
යො න ලිම්පති[1] කාමෙසු සීතිභූතො නිරූපධි.

25 සබ්බා ආසත්තියො ඡෙත්වා විනෙය්‍ය හදයෙ දරං,
උපසන්තො සුඛං සෙති සන්තිං පප්පුය්‍ය චෙතසො'ති.

## 3. 1. 4. 6.

**[සාවත්ථිනිදානං:]**

**36. තීණි'මානි භික්ඛවෙ දෙවදූතානි.** කතමානි තීණි: ඉධ භික්ඛවෙ **එකච්චො** කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. තමෙනං භික්ඛවෙ නිරයපාලා නානාබාහාසු ගහෙත්වා යමස්ස රඤ්ඤො දස්සෙන්ති: 'අයං දෙව පුරිසො අමත්තෙය්‍යො අපෙත්තෙය්‍යො අසාමඤ්ඤො අබ්‍රහ්මඤ්ඤො, න කුලෙජෙට්ඨාපචායී, ඉමස්ස දෙවො දණ්ඩං පණෙතූ'ති.

තමෙනං භික්ඛවෙ යමො රාජා පඨමං දෙවදූතං සමනුයුඤ්ජති, සමනුගාහති, සමනුභාසති: 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු පඨමං දෙවදූතං පාතුභූත'න්ති. සො එවමාහ: 'නාද්දසං භන්තෙ'ති.

තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු ඉත්ථිං වා පුරිසං වා ආසීතිකං වා නාවුතිකං වා වස්සසතිකං වා ජාතියා, ජිණ්ණං ගොපානසිවඞ්කං භොග්ගං දණ්ඩපරායණං පවෙධමානං ගච්ඡන්තං ආතුරං ගතයොබ්බනං ඛණ්ඩදන්තං පලිතකෙසං විලූනං ඛලිතංසිරං[2] වලිතං තිලකාහතගත්ත'න්ති. සො එවමාහ: 'අද්දසං භන්තෙ'ති.

තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි: 'අහම්පි ඛොමහි ජරාධම්මො ජරං අනතීතො, හන්දාහං කල්‍යාණං කරෙමි කායෙන වාචාය මනසා'ති?. 'සො එවමාහ: 'නාසක්ඛිස්සං භන්තෙ, පමාදස්සං භන්තෙ'ති.

තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, පමාදවතාය න කල්‍යාණමකාසි කායෙන වාචාය මනසා. තග්ඝ ත්වං අම්භො පුරිස, තථා කරිස්සන්ති යථා තං පමත්තං. තං ඛො පනෙතං පාපං කම්මං නෙව මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න දෙවතාහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං. අථ ඛො තයා වෙතං පාපං කම්මං කතං, ත්වඤ්ඤෙවෙතස්ස විපාකං පටිසංවෙදිස්සසී'ති.

---

1. ලිප්පති - PTS 2. ඛලිත සිරං - මජසං.

24. (කෙලෙස් පිරිනිවීමෙන්) පිරිනිවීගිය (කෙලෙස්තැවීම් නැති බැවින්) සිහිල් වූ කෙලෙශෝපධීන්ගේ අභාවයෙන් උපධි රහිත වූ යමෙක් වස්තුකාම කෙලෙශකාමයන්හි නො ඇලේ ද, ඒ ක්ෂීණාස්‍රව බ්‍රාහමණ තෙම හැමකල්හි සැපසේ නොවිසි.

25. සියලු තෘෂ්ණාවන් සිඳ සිත්හි කෙලෙශදරථ සංහිඳුවා චිත්තශාන්තියට පැමිණ සංහුන් වූයේ සුවසේ හෝනේය යි.

## 3. 1. 4. 6

[දෑවැත්නිදානයි:]

36. මහණෙනි, මේ දෙවදූතයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක යත්: මහණෙනි, මෙ ලොව්හි එකෙක් කයින් දුසිරිත් කරනේය. වචනයෙන් දුසිරිත් කරනේය. සිතින් දුසිරිත් කරනේය. හෙතෙම කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට සිතින් දුසිරිත් කොට කාබුන් මරණින් මත්තෙහි අපාය නම් වූ දුගති නම් වූ විනිපාත නම් වූ නරකයට පැමිණෙයි. මහණෙනි, යමපල්හු ඔහු වෙන වෙන අත්හි ලා ගෙණ යමරජුට දක්වත්. 'දේවයන් වහන්ස, මේ පුරුෂ මවට අහිතයෙක, පියාට අහිතයෙක, මහණුනට අහිත-යෙක, බමුණනට අහිතයෙක, කුලදෙටුවන් නොපුදන්නෙක. දේවයන් වහන්සේ මුහුට දඬුවම් එලවත්වා'යි.

මහණෙනි, යමරජ ඔහුගෙන් පලමු දේවදූතයා අනුයොග වනට නගා විචාරයි. ලබයියෙහි පිහිටුවයි, කරුණු විචාරයි: 'එම්බා පුරුෂය, මිනිසුන් අතුරෙහි පහළ වූ පලමු දෙවදූතයා තෝ නොදිටිහි ද?' හේ මෙසේ කියයි. 'වහන්ස, නො දිටිමි.'

මහණෙනි, යමරජ ඔහුට මෙසේ කියයි: 'එම්බා පුරුෂය, තෝ මිනිසුන් අතුරෙහි උපතින් අසූවස් ගියා වූ හෝ අනූවස් ගියා වූ හෝ සියවස් ගියා වූ හෝ දිරූ ගොනැස්සක් මෙන් නැමුනා වූ වක් වූ සැරයටිය පිහිට කොට ඇති ව වෙවුලමින් යන්නා වූ ජරායෙන් ආතුර වූ ගිය යොවුන් විය ඇති, කඩදත් ඇති, පැසුනු කෙස් ඇති, මුඩු හිස් ඇති, මච්චත්තල ඇති, හටගත් රැලි ඇති තලකැලලින් යුත් සිරුරු ඇති, ස්ත්‍රියක හෝ පුරුෂයකු, නොදිටිහි ද?' හේ මෙසේ කියයි: 'වහන්ස, දිටිමි.'

මහණෙනි, යමරජ ඔහුට මෙසේ කියයි: 'එම්බා පුරුෂය, මහලු වූ නුවණැත්තා වූ ම ඒ නාහට මෙබඳු සිතෙක් නො වී ද? 'මම ද ජරාව නො ඉක්ම වූයෙමි ජරාව සවභාව කොට ඇත්තෙමි වෙමි. ඉදින් මම කයින් වචසින් මනසින් කලණ දහම් පුරුදු කෙරෙමි නම් මැනවැ' යි. හෙතෙම මෙසේ කියයි: 'වහන්ස, නො හැකි වීමි. වහන්ස, පමා වීමි'යි.

ඔහට යමරජ මෙසේ කියයි: 'එම්බා පුරුෂය, පමාවත් බැවින් කයින් වචසින් මනසින් කුසල් නො කෙළෙහි, එම්බා පුරුෂය, එහෙයින් ඒ පමාවූවහුට යම්සේ ද එසේ තට කරන්නාහ. ඒ මේ පාපකර්මය වනාහි මව විසින් නො ම කරණ ලද්දේ ය. පියා විසින් නො ම කරණ ලද්දේ ය. බෑයා විසින් නො ම කරණ ලද්දේ ය. බිහිනිය විසින් නො ම කරණ ලද්දේ ය. සගයහළුවන් විසිනුදු නො ම කරණ ලද්දේ ය. නෑ සහලේ නෑයන් විසිනුදු නො ම කරණ ලද්දේ ය. දෙවියන් විසින් නො ම කරණ ලද්දේ ය. මහණ බමුණන් විසින් නො ම කරණ ලද්දේ ය. වැලිදු තා විසින් ම මේ පාපකර්මය කරණ ලදී. තෝ ම මේ කර්මයාගේ විපාක විඳුව'යි.

තමෙනං භික්ඛවෙ යමො රාජා පඨමං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා දුතියං දෙවදූතං සමනුයුඤ්ජති, සමනුගාහති, සමනුභාසති: 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු දුතියං දෙවදූතං පාතුභූතන්ති?' සො එවමාහ: 'නාද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු ඉත්ථිං වා පුරිසං වා ආබාධිකං දුක්ඛිතං බාළ්හගිලානං සකෙ මුත්තකරීසෙ පළිපන්නං සෙමානං අඤ්ඤෙහි වුට්ඨාපියමානං අඤ්ඤෙහි සංවෙසියමානන්ති?' සො එවමාහ: 'අද්දසං භන්තෙ'ති.

තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: අම්භො පුරිස, තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි: අහම්පි බොම්හි ව්‍යාධිධම්මො ව්‍යාධිං අනතීතො, හන්දාහං කල්‍යාණං කරොමි කායෙන වාචාය මනසාති. සො එවමාහ: නාසක්ඛිස්සං භන්තෙ, පමාදස්සං භන්තෙති.

තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, පමාදවතාය න කල්‍යාණමකාසි කායෙන වාචාය මනසා. තග්ඝ ත්වං අම්භො පුරිස, තථා කරිස්සන්ති යථා තං පමත්තං; තං ඛො පනෙතං පාපං[2] කම්මං නෙව මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං,න දෙවතාහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං. අථ ඛො තයා වෙතං පාපං[2] කම්මං කතං, ත්වඤ්ඤෙව තස්ස විපාකං පටිසංවෙදිස්සසී'ති.

තමෙනං භික්ඛවෙ යමො රාජා දුතියං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා තතියං දෙවදූතං සමනුයුඤ්ජති, සමනුගාහති, සමනුභාසති: 'අම්භො පුරිස, න ත්වං අද්දස මනුස්සෙසු තතියං දෙවදූතං පාතුභූතන්ති?' සො එවමාහ: 'නාද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: 'අම්භො පුරිස' න ත්වං අද්දස මනුස්සෙසු ඉත්ථිං වා පුරිසං වා එකාහමතං වා ද්වීහමතං වා තීහමතං වා උද්ධුමාතකං විනීලකං විපුබ්බකජාතන්ති?. සො එවමාහ: 'අද්දසං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, තස්ස තෙ විඤ්ඤුස්ස සතො මහල්ලකස්ස න එතදහොසි: 'අහම්පි බොම්හි මරණධම්මො, මරණං අනතීතො, හන්දාහං කල්‍යාණං කරොමි කායෙන වාචාය මනසා'ති. සො එවමාහ: 'නාසක්ඛිස්සං භන්තෙ, පමාදස්සං භන්තෙ'ති. තමෙනං භික්ඛවෙ යමො රාජා එවමාහ: 'අම්භො පුරිස, පමාදවතාය න කල්‍යාණමකාසි කායෙන වාචාය මනසා. තග්ඝ ත්වං අම්භො පුරිස, තථා කරිස්සන්ති යථා තං පමත්තං. තං ඛො පනෙතං පාපං[2] කම්මං නෙව මාතරා කතං න පිතරා කතං න භාතරා කතං න භගිනියා කතං න මිත්තාමච්චෙහි කතං න ඤාතිසාලොහිතෙහි කතං න දෙවතාහි කතං න සමණබ්‍රාහ්මණෙහි කතං. අථ ඛො තයා වෙතං පාපං[2]කම්මං කතං, ත්වඤ්ඤෙව තස්ස විපාකං පටිසංවෙදිස්සසී'ති.

---

1 නාහං සක්ඛිස්සං - PTS. 2. පාපකම්මං - PTS. මජ්සං.

මහණෙනි, යමරජ ප්‍රථම දෙවදූතයා අනුයෝගවතට නංවා ලබ්ධියෙහි පිහිටුවා කරුණු ගත්වා, කරුණු විචාරා, දෙවන දෙවදූතයා අනුයොගවතට නංවා විචාරයි, කරුණු ගත්වයි, කරුණු විචාරයි: 'එම්බා පුරුෂය, තෝ මිනිසුන් අතුරෙහි පහළ වූ දෙවන දේවදූතයා නො දිටිහි ද?' හේ මෙසේ කියයි: 'වහන්ස, නො දිටිමි'යි. මහණෙනි, යමරජ තුලුන්ට මෙසේ කී යයි: 'එම්බා පුරුෂය, තෝ මිනිසුන් අතුරෙහි රෝගාතුර වූ දුකට පත් වූ දැඩි ගිලන් වූ සිය මලමූයෙහි ගැලී හෝනා මෙරමා විසින් නගාසිටුවනු ලබන්නා වූ මෙරමා විසින් හොවනු ලබන්නා වූ ස්ත්‍රියක හෝ පුරුෂයකු නො දිටිහි ද?' හේ මෙසේ කියයි: 'වහන්ස, දිටිමි'යි. මහණෙනි, යමරජ තුලුන්ට මෙසේ කියයි: 'එම්බා පුරුෂය, මහලු වූ නුවණැත්තා වූ ම ඒ තට මේ සිත නො වී ද?' 'මම ද ව්‍යාධිය සවභාව කොට ඇත්තෙමි, ව්‍යාධිය නො ඉක්මවූයෙමි වෙමි. එබැවින් මම කයින් වචසින් මනසින් කුසල් දහම් කෙරෙමි'යි. හේ මෙසේ කියයි: 'වහන්ස, නො හැකිවීමි, වහන්ස, පමාවීමි'යි.

මහණෙනි, යමරජ තුලුන්ට මෙසේ කියයි: 'එම්බා පුරුෂය, පමාවත්වත බැවින් කයින් වචසින් මනසින් කුසල් දහම් නො කෙළෙහි ය. එම්බා පුරුෂය, ඒ පමාවූවකුට කරන්නාක් සෙයින් තට ද කරන්නාහ මේ පව්කම වනාහි මව විසිනුදු නො ම කරණ ලද. පියා විසිනුදු නො ම කරණ ලද. බෑයා විසිනුදු නො ම කරණ ලද. බූන් විසිනුදු නො ම කරණ ලද. යහළුවන් විසිනුදු නො ම කරණ ලද. නෑ සහලේනෑයන් විසිනුදු නො ම කරණ ලද. දෙවියන් විසිනුදු නො ම කරණ ලද. මහණ බමුණන් විසිනුදු නො ම කරණ ලද. වැලිදු තා විසින් ම මේ පාපකර්මය කරණ ලදී. මේ පාපකර්මයාගේ විපාක තෝ ම විඳුනෙහිය'යි

මහණෙනි, යමරජ දෙවන දේවදූතයා අනුයෝගවතට නංවා කරුණු ගත්වා කරුණු විචාරා තෙවන දේවදූතයා අනුයෝගවතට නංවා විචාරයි, කරුණු ගත්වයි, කරුණු කියයි: 'එම්බා පුරුෂය, තෝ මිනිසුන් අතරෙහි පහළ වූ තෙවන දේවදූතයා නොදිටිහිද' යි. හේ මෙසේ කියයි: 'වහන්ස, නොදිටිමි'යි. මහණෙනි, යමරජ තුලුන්ට මෙසේ කියයි: 'එම්බා පුරුෂය, තෝ මිනිසුන් අතරෙහි මළගිය එක් දවසක් ඇත්තා වූ හෝ මළගිය දෙදවසක් ඇත්තා වූ හෝ මළගිය තෙදිනක් ඇත්තා වූ හෝ ඉදිමුනු වෙසෙසින් නිල්වන් වූ පුයා වැහෙන ස්ත්‍රියක හෝ පුරුෂයකු නොදිටිහිද'යි. හේ මෙසේ කියයි. 'වහන්ස, දිටිමි'යි. මහණෙනි, යමරජ තුලුන්ට මෙසේ කියයි. 'එම්බා පුරුෂය, මහලු වූ නුවණැත්තා වූ ම තට මේ සිත නො වී ද?' 'මම ද මරණය නො ඉක්මවූයෙමි, මරණය සවභාව කොට ඇත්තෙම් වෙමි. එබැවින් මම කයින් වචසින් මනසින් කුසල් දහම් කෙරෙමි'යි. හෙතෙම මෙසේ කියයි: 'වහන්ස, නොහැකිවීමි. වහන්ස, පමාවීමි. මහණෙනි, යමරජ තුලුන්ට මෙසේ කියයි: 'එම්බා පුරුෂය, පමාවත්වත බැවින් කයින් වචසින් මනසින් කුසල් දහම් නො කෙළෙහි ය. එම්බා පුරුෂය, ඒ පමාවූව-හුට කරන්නාක් සෙයින් තට ද කරන්නාහ. ඒ මේ පාපකර්මය වනාහි මව විසිනුදු නොකරණ ලදී. පියා විසිනුදු නො කරණ ලදී. බෑයා විසිනුදු නො කරණ ලදී. බූන් විසිනුදු නො කරණ ලදී. සගයහළුවන් විසිනුදු නො කරණ ලදී. නෑ සහලේනෑයන් විසිනුදු නො කරණ ලදී. දෙවියන් විසිනුදු නො කරණ ලදී. මහණ බමුණන් විසිනුදු නො කරණ ලදී. වැලිදු තා විසින් ම මේ පාපකර්මය කරණ ලදී. තෝ ම මේ කර්මයාගේ විපාකය විඳුනෙහි'යි.

තමෙනං භික්ඛවෙ යමො රාජා තතියං දෙවදූතං සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා තුණ්හී හොති. තමෙනං භික්ඛවෙ නිරයපාලා පඤ්චවිධබන්ධනං නාම කාරණං කාරෙන්ති, තත්තං අයොඛිලං හත්ථෙ ගමෙන්ති, තත්තං අයොඛිලං දුතියස්මිං හත්ථෙ ගමෙන්ති, තත්තං අයොඛිලං පාදෙ ගමෙන්ති, තත්තං අයොඛිලං දුතියස්මිං පාදෙ ගමෙන්ති, තත්තං අයොඛිලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති. සො තත්ථ දුක්ඛා තිබ්බා[1] කටුකා වෙදනා වෙදියති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං[2] බ්‍යන්තී හොති.

තමෙනං භික්ඛවෙ නිරයපාලා සංවෙසෙත්වා[3] කුඨාරීහි තච්ඡන්ති. සො තත්ථ දුක්ඛා තිබ්බා[1] කටුකා වෙදනා වෙදියති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තී හොති. තමෙනං භික්ඛවෙ නිරයපාලා [4]උද්ධපාදං අධොසිරං ඨපෙත්වා[5] වාසීහි තච්ඡන්ති -පෙ- තමෙනං භික්ඛවෙ නිරයපාලා රථෙ යොජෙත්වා ආදිත්තාය භූමියා සම්පජ්ජලිතාය සජොතිභූතාය [6]සාරෙන්තිපි, පච්චාසාරෙන්තිපි -පෙ- තමෙනං භික්ඛවෙ නිරයපාලා මහන්තං අඞ්ගාරපබ්බතං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි. තමෙනං භික්ඛවෙ නිරයපාලා උද්ධපාදං[5] අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චති.[7] සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡති, සකිම්පි අධො ගච්ඡති, සකිම්පි තිරියං ගච්ඡති. සො තත්ථ දුක්ඛා තිබ්බා කටුකා වෙදනා වෙදියති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තී හොති. තමෙනං භික්ඛවෙ නිරයපාලා මහානිරයෙ පක්ඛිපන්ති. සො ඛො පන භික්ඛවෙ මහානිරයො-:

26 චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසො මිතො,
අයොපාකාරපරියන්තො අයසා පටිකුජ්ජිතො.

27 තස්ස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා'ති.

භූතපුබ්බං භික්ඛවෙ යමස්ස රඤ්ඤො එතදහොසි: 'යෙ කිර භො ලොකෙ පාපකානි කම්මානි කරොන්ති, තෙ එවරූපා විවිධා කම්මකාරණා කරීයන්ති. අහො වතාහං මනුස්සත්තං ලභෙය්‍යං, තථාගතො ච ලොකෙ උප්පජ්ජෙය්‍ය අරහං සම්මාසම්බුද්ධො, තං චාහං භගවන්තං පයිරුපාසෙය්‍යං, සො ච මෙ භගවා ධම්මං දෙසෙය්‍ය, තස්ස චාහං භගවතො ධම්මං ආජානෙය්‍යන්ති'. තං ඛො පනාහං භික්ඛවෙ න අඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සුත්වා එවං වදාමි. අපි ච ඛො භික්ඛවෙ යදෙව මෙ සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං, තදෙවාහං වදාමීති.

1. තිප්පා - සීමු. ස්‍යා. තිප්පා - ස්‍යා, තිබ්බාඛරා - මජ්සං. 2. පාපකම්මං - මජ්සං, PTS.
3. සංකඩ්ඪිත්වා කුඨාරීහි තච්ඡන්ති - මජ්සං. 4 උද්ධංපාදං - PTS. මජ්සං, ස්‍යා.
5. ගහෙත්වා - මජ්සං. 6. සඤ්ජොතිභූතාය - ස්‍යා, කං. 7 මජ්සං. පොත්ථකෙ අයං පාඨො න දිස්සතෙ.

මහණෙනි, යමරජ තෙල තෙවන දේවදූතයා අනුයෝගවතට තංවා විචාරු කරුණු ගත්වා කරුණු කියා තුෂ්ණිම්භූත වෙයි. මහණෙනි, යමපල්ලෝ ඔහුට පඤ්චවිධබන්ධන නම් කම්කටොලු කරත්: රත්කළ යගුලක් දකුණතෙහි ගසත්. රත්කළ යහුලක් දෙවෙනි (වම්) අතෙහි ගසත්. රත්කළ යහුලක් දකුණු පයෙහි ගසත්. රත්කළ යහුලක් දෙවෙනි (වම්) පාහි ගසත්. රත්කළ යහුලක් ළමැද ගසත්. හේ එහි දුක් වූ තිව්‍ර වූ කටුක වූ වේදනා විඳුනේයි. ඒ පාපකර්මය නොගෙවෙනා තාක් හේ කලුරිය නො කරයි.

මහණෙනි, යමපල්හු තුලුත් හොවාපියා කෙටේරියෙන් සසිත්. හේ එහි දුක් වූ තිව්‍ර වූ කටුක වූ වේදනා විඳුනේයි. ඒ පාපකර්මය නොගෙවෙන තාක් හේ කලුරිය නො කරයි. යමපල්හු තුලුත් පා උඩුකුරු කොට හිස යටිකුරු කොට තබා වෑයෙන් සසිත් ... මහණෙනි, යමපල්හු තුලුත් රියෙහි යොදා ගිනි ගෙණ දිලියෙන ගිනිදැල් සහිත බිම්හි ඔබ මොබ ඇවිදුවත් ... මහණෙනි, යම්පල්හු තුලුත් ගිනි ගෙණ දිලියෙන ගිනිදැල් සහිත මහඅඟුරුපව්වකට නංවත්, බස්වත් ... මහණෙනි යමපල්හු තුලුත් පා උඩුකුරු කොට හිස යටිකුරු කොට ගෙණ රත් වූ ඇවිලගත් ගිනිදැල් සහිත ලෝකුඹුයෙහි බහත්. හේ එහි පෙණ නංවමින් පැසෙයි. හේ එහි පෙණ නංවමින් පැසෙනුයේ වරක් උඩට මතු වෙයි. වරක් යටට බසියි. වරක් සරසට ද යෙයි. හේ එහි දුක් වූ තිව්‍ර වූ කටුක වූ වෙදනා විඳියි. ඒ පව්කම් නො ගෙවෙන තාක් කලුරිය නො කරයි. මහණෙනි, යමපල්හු තුලුත් ගෙණ මහානිරයෙහි බහත්. මහණෙනි, ඒ මහානිරය වනාහි:

26. සිවුකොත් ඇත්තේ ය, සිවුදෙරටු ඇත්තේ ය, කොටස් කොට මැන බෙදන ලද්දේ ය, යපවුරින් පිරිසිඳුනා ලද්දේ ය, යපවින් වසන ලද්දේ ය.

27. එහි බිම යමුවා ය, දිලිත, ගිනිදැලින් මුසු වෙයි. හාත්පස යොදුන් සියක් පුරා හැමකල්හි පැතිර සිටුනේය.

මහණෙනි, වූ විරියෙකි: යමරජුට මෙබඳු සිතෙක් විය: 'භවත්නි, ලොව්හි යම් කෙනෙක් පව්කම් කෙරෙත් ද, ඔවුහු මෙබඳු වූ නන් කම්කටොලු කරවනු ලබත්. අහෝ! ඉදින් මම මිනිසත්බවක් ලබම් නම්, අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ ලොව උපදින සේක් නම්, මම ද ඒ භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරන්නෙම් නම්, ඒ භාග්‍යවතුන් වහන්සේ ද මට දහම් දෙසන සේක් නම්, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය මම දැනගන්නෙම් නම්, ඉතා මැනවැ'යි. මහණෙනි, ඒ වනාහි මම අන් මහණකුගෙන් හෝ බමුණකුගෙන් හෝ අසා මෙසේ නො කියමි. මහණෙනි, වැලිදු යමක් මා විසින් තමා විසින් ම දැනගන්නා ලද ද, තමා ම දක්නා ලද ද, තමා විසින් ම ප්‍රකට කොට දැනගන්නා ලද ද, එය මම ම කියමි.

28 චොදිතා දෙවදූතෙහි යෙ පමජ්ජන්ති මානවා,
තෙ දීඝරත්තං සොචන්ති හීනකායූපගා නරා.

29 යෙ ච ඛො දෙවදූතෙහි සන්තො සප්පුරිසා ඉධ,
චොදිතා නප්පමජ්ජන්ති අරියධම්මෙ කුදාචනං.

30. උපාදානෙ භයං දිස්වා ජාතිමරණසම්භවෙ,
අනුපාදා විමුච්චන්ති ජාතිමරණසඞ්ඛයෙ.

31. තෙ ඛොප්පමත්තා[1] සුඛිතා[2] දිට්ඨධම්මාභිනිබ්බුතා,
සබ්බවෙරභයාතීතා සබ්බදුක්ඛං උපච්චගුන්ති.

## 3. 1. 4. 7

37. අට්ඨමියං භික්ඛවෙ පක්ඛස්ස චතුන්නං මහාරාජානං අමච්චා පාරිසජ්ජා ඉමං ලොකං අනුවිචරන්ති: 'කච්චි බහූ මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති, පටිජාගරන්ති[3], පුඤ්ඤානි කරොන්තීති.

චාතුද්දසියං* භික්ඛවෙ පක්ඛස්ස චතුන්නං මහාරාජානං පුත්තා ඉමං ලොකං අනුවිචරන්ති, කච්චි බහූ මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති, පටිජාගරන්ති,[3] පුඤ්ඤානි කරොන්තී'ති. තදහු භික්ඛවෙ උපොසථෙ පණ්ණරසෙ චත්තාරො මහාරාජා[4] සාමඤ්ඤෙව ඉමං ලොකං අනුවිචරන්ති: 'කච්චි බහූ මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති, පටිජාගරන්ති, පුඤ්ඤානි කරොන්තී'ති.

සචෙ භික්ඛවෙ අප්පකා හොන්ති මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති, පටිජාගරන්ති, පුඤ්ඤානි කරොන්ති, තමෙනං භික්ඛවෙ චත්තාරො මහාරාජා[4] දෙවානං තාවතිංසානං සුධම්මායං සභායං† සන්නිසින්නානං සන්නිපතිතානං ආරොචෙන්ති: අප්පකා ඛො මාරිසා මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති, පටිජාගරන්ති, පුඤ්ඤානි කරොන්තී'ති. තෙන[5] භික්ඛවෙ දෙවා තාවතිංසා අනත්තමනා හොන්ති: දිබ්බා වත භො කායා පරිහායිස්සන්ති පරිපූරිස්සන්ති අසුර[6] කායාති.

සචෙ පන භික්ඛවෙ බහූ හොන්ති මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති, පටිජාගරන්ති, පුඤ්ඤානි කරොන්ති. තමෙනං භික්ඛවෙ චත්තාරො මහාරාජා දෙවානං තාවතිංසානං සුධම්මායං සභායං සන්නිසින්නානං සන්නිපතිතානං ආරොචෙන්ති: 'බහූ ඛො මාරිසා මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති, පටිජාගරන්ති, පුඤ්ඤානි කරොන්තී'ති. තෙන භික්ඛවෙ දෙවා තාවතිංසා අත්තමනා හොන්ති: 'දිබ්බා වත භො කායා පරිපූරිස්සන්ති, පරිහායිස්සන්ති අසුර කායාති.[6]

---

1. තෙ අප්පමත්තා - මජසං., තෙ ඛෙමප්පත්තා - PTS. ස්‍යා.
2 සුඛිනො - මජසං. 3. පටිජාගරොන්ති - මජසං. ස්‍යා 4. මහාරාජානො - මජසං.
5. තෙන ඛො - මජසං. 6. අසුරකායා - මජසං. PTS.

* චාතුද්දසිං - මජසං. † සුධම්මාය සභාය - මජසං.

28. දේවදූතයන් විසින් මෙහෙයන ලද යම් මිනිස් කෙනෙක් පමා වෙත් ද, හීන වූ අත්බැව් ලැබූ ඒ මිනිස්හු බොහෝ කලක් සොවිත්.

29. මෙ ලොව්හි දේවදූතයන් විසින් මෙහෙයන ලද යම් ශාන්ත සත්පුරුෂ කෙනෙක් වෙත් ද, (ඔහු) ආර්‍ය්‍යධර්මයෙහි කිසි කලෙකත් පමා නො වෙත්.

30. ජාති මරණ දෙකට කරුණු වූ (පඤ්ච) උපාදානයෙහි බිය දැක (ආත්ම ආත්මීය වශයෙන්) සතර උපාදානයන් නො ගෙණ ජාතිමරණ-යන්ගේ ක්‍ෂය සඞ්ඛ්‍යාත නිර්‍වාණය නිමිති කොට මිදෙත්.

31. මෙ අත්බව්හි ම කෙලෙස් පිරිනිවීමෙන් නිවුනු නොපමා වූ (එහෙයින් ම) සුවපත් වූ ඔහු සියලු වෛරභය ඉක්මවූවාහු සියලු දුක් ඉක්ම ගියාහුය සි.

## 8. 1. 4. 7

37. මහණෙනි, අඩමසැ අටවක්හි සිවුමහරජුන්ගේ පිරිසට අයත් ඇමතියෝ 'කිමෙක් ද? මිනිස් ලොව්හි බොහෝ මිනිස්හු මවුන් පුදනුවාහු ද, පියන් පුදනුවාහු ද, මහණුන් පුදනුවාහු ද, බමුණන් පුදනුවාහු ද, කුලදෙටුවන් පුදනුවාහු ද, පෙහෙවස් වෙසෙත් ද, පටිජාගර උපොසථය කෙරෙත් ද, පින් කෙරෙත්දැ'යි. මෙලොව සිසාරා ඇවිදිත්.

මහණෙනි, අඩමසැ තුදුස්වක්හි සිවුමහරජුන්ගේ පුත්‍රයෝ මේ ලෝකය වටාගෙණ ඇවිදිත්:, කිම, මිනිසුන් අතුරෙහි බොහෝ දෙනා මවුන් පුදනුවාහු ද, පියන් පුදනුවාහු ද, මහණුන් පුදන්නාහු ද, බමුණන් පුදන්නාහු ද, කුලදෙටුවන් පුදන්නාහු ද, පෙහෙවස් වෙසෙත් ද, පටිජාගර උපොසථය කෙරෙත් ද, පින් කෙරෙත් දැ'යි. මහණෙනි, ඒ පුරපසළොස්වක් පොහෝ දින සිවුමහරජවරු තුමූ ම මේ ලොව වටාගෙණ ඇවිදිත්. 'කිම, මිනිසුන් අතුරෙහි බොහෝ දෙනා මවුන් පුදන්නාහු ද, පියන් පුදන්නාහු ද, මහණුන් පුදන්නාහු ද, බමුණන් පුදන්නාහු ද, කුලදෙටුවන් පුදන්නාහු ද, පෙහෙවස් වෙසෙත් ද, පටිජාගර උපෝසථය කෙරෙත් ද, පින් කෙරෙත්දැ'යි.

මහණෙනි, ඉදින් මිනිසුන් අතුරෙහි මවුන් පුදන පියන් පුදන මහණුන් පුදන බමුණන් පුදන කුලදෙටුවන් පුදන මිනිස්සු ස්වල්ප වෙත් ද, (එසේ ම) ස්වල්ප මනුෂ්‍ය කෙනෙක් පෙහෙවස් වෙසෙත් ද, පටිජාගර උපොසථය කෙරෙත් ද, පින් කෙරෙත් ද, මහණෙනි, සතරවරම් මහරජවරු සුධර්මා-සභායෙහි රැස්ව හුන් තව්තිසාවැසි දෙවියන්ට මේකරුණ සැළ කරත්: 'නිදුකානෙනි, මිනිස්ලොව්හි ස්වල්ප මනුෂ්‍ය කෙනෙක් මවුන්ට හිතවත්හ. පියනට හිතවත්හ. මහණුනට හිතවත්හ. බමුණනට හිතවත්හ. කුලදෙටු-වන් පුදන්නාහ. පෙහවස් කරන්නාහ. පටිජාගර උපෝසථය කරන්නාහ. පින් කරන්නාහ' යි. මහණෙනි, එයින් තව්තිසා වැසි දෙවියෝ 'අහෝ' භවත්නි, දෙව්පිරිස්හු පිරිහෙන්නාහ, අසුර පිරිස්හු පිරෙන්නාහ' යි නො සතුටු සිත් ඇත්තාහු වෙති.

මහණෙනි, ඉදින් මිනිස්ලොව බොහෝ මනුෂ්‍යයෝ මවුනට හිතවත් නම්, පියනට හිතවත් නම්, මහණුනට හිතවත් නම්, බමුණනට හිතවත් නම්, කුල-දෙටුවන් පුදත් නම්, පෙහෙවස් වෙසෙත් නම්, පටිජාගර උපෝසථය කෙරෙත් නම්, පින් කෙරෙත් නම්, මහණෙනි, සිවුවරම් මහරජවරු සුධර්මාසභායෙහි රැස්ව හුන් තව්තිසාවැසි දෙවියනට මෙසේ සැළ කරත්: 'නිදුකානනි, මිනිසුන් අතුරෙහි බොහෝ මිනිස්හු මවුනට හිතවත්හ. පියනට හිතවත්හ. මහණුනට හිතවත්හ. බමුණනට හිතවත්හ. කුලදෙටුවන් පුදන්නාහ. පෙහෙවස් වසන්නාහ. පටිජාගර උපෝසථය වසන්නාහ. පින් කරන්නාහ'යි. මහණෙනි, එයින් තව්තිසාවැසි දෙවියෝ 'භවත්නි, ප්‍රීතියෙක! දෙව්පිරිස්හු පිරෙන්නාහ. අසුරපිරිස්හු පිරිහෙන්නාහ' යි තුටුසිත් ඇත්තාහු වෙත්.

## 3. 1. 4. 8

38. භූතපුබ්බං භික්ඛවෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ අනුනයමානො[1] තායං වෙලායං ඉමං ගාථං අභාසි:

32. චාතුද්දසිං පඤ්චදසිං[2] යාව පක්ඛස්ස අට්ඨමී[3]
පාටිහාරියපක්ඛං ච අට්ඨඞ්ගසුසමාගතං,
උපොසථං උපවසෙය්‍ය යො පස්ස[4] මාදිසො නරො'ති.

සා ඛො පනෙසා භික්ඛවෙ සක්කෙන දෙවානමින්දෙන ගාථා දුග්ගීතා, න සුගීතා, දුබ්භාසිතා, න සුභාසිතා. තං කිස්ස හෙතු: සක්කො හි භික්ඛවෙ දෙවානමින්දො අවීතරාගො අවීතදොසො අවීතමොහො. යො ච ඛො සො භික්ඛවෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා* කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො කල්ලං වචනාය:

33. චාතුද්දසිං[2] පඤ්චදසිං යා ච පක්ඛස්ස[3] අට්ඨමී,
පාටිහාරියපක්ඛං ච අට්ඨඞ්ගසුසමාගතං
උපොසථං උපවසෙය්‍ය යොපස්ස[4] මාදිසො නරො'ති.

තං කිස්ස හෙතු? සො හි භික්ඛවෙ භික්ඛු වීතරාගො වීතදොසො වීතමොහොති.

භූතපුබ්බං භික්ඛවෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ අනුනයමානො තායං වෙලායං ඉමං ගාථං අභාසි:-

34. චාතුද්දසිං[2] පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,[3]
පාටිහාරියපක්ඛං ච අට්ඨඞ්ගසුසමාගතං,
උපොසථං උපවසෙය්‍ය යොපස්ස[4] මාදිසො නරො'ති.

සා ඛො පනෙසා භික්ඛවෙ සක්කෙන දෙවානමින්දෙන ගාථා දුග්ගීතා, න සුගීතා, දුබ්භාසිතා, න සුභාසිතා. තං කිස්ස හෙතු: සක්කො හි භික්ඛවෙ දෙවානමින්දො අපරිමුත්තො ජාතියා ජරාමරණෙන[5] සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, අපරිමුත්තො දුක්ඛස්මාති වදාමි.

යො ච ඛො සො භික්ඛවෙ භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, තස්ස ඛො එතං භික්ඛවෙ භික්ඛුනො කල්ලං වචනාය:-

35. චාතුද්දසිං පඤ්චදසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛං ච අට්ඨඞ්ගසුසමාගතං;
උපොසථං උපවසෙය්‍ය යොපස්ස මාදිසො නරො'ති.

තං කිස්ස හෙතු: සො හි භික්ඛවෙ භික්ඛු පරිමුත්තො ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි පරිමුත්තො දුක්ඛස්මාති වදාමීති.

---

1 අනුසඤ්ඤායමානො - අට්ඨකථා. * බ්‍රහ්මචරියො - මජ්සං.
2. චාතුද්දසී පඤ්චදසී - PTS. 3. යාව පක්ඛස්ස අට්ඨමිං - සීමු.
4. යෙ,පිස්ස - මජ්සං. 5. ජරාය මරණෙන - PTS. මජ්සං

## 3. 1. 4. 8

38. මහණෙනි, වූ විරියෙකි: සක්දෙවිඳු තව්තිසාවැසි දෙවියන් ඇලුම් කරවමින් ඒ වේලායෙහි මේ ගය කීය:

32. 'ඉදින් යම් මිනිසෙක් මා' බඳු වන්නේ නම්, ඒ මිනිස් පක්‍ෂයෙහි තුදුස්වක්හි ද, පසළොස්වක්හි ද, අටවක්හි ද, ප්‍රාතිහාර්‍ය්‍ය පක්‍ෂයෙහි ද, අටඟින් යුත් පෙහෙවස් වසනේ ය.

මහණෙනි, සක්දෙවිඳුහු විසින් ඒ ගාථා වරදවා ගයන ලදී. මැනැවින් නො ගයන ලදී. වරදවා කියන ලදී. මැනැවින් නො කියන ලදී. ඒ කවර-හෙයින යත්: මහණෙනි, සක්දෙවිඳු වනාහි පහ නො කළ රාග ඇත්තෙක. පහ නො කළ ද්වේෂ ඇත්තෙක. පහ නො කළ මෝහ ඇත්තෙක. මහණෙනි, ක්‍ෂය කළ ආස්‍රව ඇති, වැස නිම වූ මඟබඹසර ඇති, කරණ ලද සිවුමඟ කටයුතු ඇති, බහා තබන ලද කෙලෙස්බර ඇති, පැමිණි සවාර්‍ථ ඇති, ක්‍ෂය කළ සසරබැඳුම් ඇති, මනාසේ දැන කෙලෙසුන් කෙරෙන් මිදුන යම් රහත් මහණෙක් වේ ද, ඒ මහණහු විසින් මෙය කියන්නට නිසි ය.

33. 'ඉදින් යම් මිනිසෙක් මා බඳු වන්නේ ද, ඒ මිනිස් පක්‍ෂ පිළිබඳ තුදුස්වක්හි ද, පසළොස්වක්හි ද, අටවක්හි ද, ප්‍රාතිහාර්‍ය්‍යපක්‍ෂයෙහි ද, අටඟින් යුත් පෙහෙවස් වසනේ ය.

කවර හෙයින යත්: මහණෙනි, යම් හෙයෙකින් ඒ මහණ පහ වූ රාග ඇත්තේ වේ ද, පහ වූ ද්වේෂ ඇත්තේ වේ ද, පහ වූ මෝහ ඇත්තේ වේ ද, එහෙයිනි.

මහණෙනි, වූ විරියෙකි: සක්දෙවිඳු තව්තිසාවැසි දෙවියන් ඇලුම් කරවමින් ඒ වේලායෙහි මේ ගය කීය:

34. ඉදින් යම් මිනිසෙක් මා බඳු වන්නේ නම්, ඒ මිනිස් පක්‍ෂ පිළිබඳ තුදුස්වක්හි ද පසළොස්වක්හි ද, අටවක්හි ද, ප්‍රාතිහාර්‍ය්‍යපක්‍ෂයෙහි ද, අටඟින් යුත් පෙහෙවස් වසනේය'යි.

මහණෙනි, සක්දෙවිඳු විසින් මේ ගාථාව වරදවා ගයන ලදී. මැනැවින් නො ගයන ලදී, වරදවා කියන ලදී, මැනැවින් නො කියන ලදී, ඒ කවර හෙයින යත්: මහණෙනි, යම් හෙයෙකින් සක්දෙවිඳු ජාතියෙන් ද, ජරායෙන් හා මරණයෙන් ද, ශෝකයෙන් ද, වැලපීමෙන් ද, දුක්දොම්නසින් ද, දැඩි ආයාස-යෙන් ද, හාත්පසින් නො මිදුනේ ද, එහෙයිනි. (හෙ තෙමේ) දුකින් නොමිදුනේ ය යි කියමි.

මහණෙනි, ක්‍ෂය කළ ආස්‍රව ඇති වැස නිම වූ මඟබඹසර ඇති කරණ ලද සිවුමඟ කටයුතු ඇති බහා තැබූ කෙලෙස්බර ඇති පැමිණි සවාර්‍ථ ඇති ක්‍ෂය කළ සසරබැඳුම් ඇති මනා සේ දැන කෙලෙසුන්ගෙන් මිදුනු යම් රහත් මහණෙක් වේ ද, ඒ මහණහු විසින් මෙය කියන්නට නිසි ය.

35. 'ඉදින් යම් මිනිසෙක් මා බඳු වන්නේ ද, ඒ මිනිස් පක්‍ෂය පිළිබඳ තුදුස්වක්හි ද, පසළොස්වක්හි ද, අටවක්හි ද, ප්‍රාතිහාර්‍ය්‍යපක්‍ෂයෙහි ද, අටඟින් යුත් පෙහෙවස් වසනේ ය.

ඒ කවර හෙයින යත්: මහණෙනි, යම් හෙයෙකින් ඒ මහණ ජාතියෙන් ද, ජරාමරණයෙන් ද, ශෝකයෙන් ද, වැලපීමෙන් ද, කායිකදුකින් ද, දොම්නසින් ද, දැඩි ආයාසයෙන් ද, මිදුනේ ද, එහෙයිනි. (හෙ තෙමේ) දුකින් මිදුනේය යි කියමි.

## 3. 1. 4. 9

39. සුඛුමාලො අහං භික්ඛවෙ පරමසුඛුමාලො. අච්චන්තසුඛුමාලො. මම සුදං භික්ඛවෙ පිතු නිවෙසනෙ පොක්ඛරණියො කාරිතා හොන්ති. එකත්ථ සුදං* උප්පලං පුප්ඵති,[1] එකත්ථ පදුමං, එකත්ථ පුණ්ඩරීකං, යාවදෙව මමත්ථාය. න ඛො පනස්සාහං භික්ඛවෙ අකාසිකං† චන්දනං ධාරෙමි. කාසිකං සු මෙ තං භික්ඛවෙ වෙඨනං හොති. කාසිකා කඤ්චුකා, කාසිකං නිවාසනං, කාසිකො උත්තරාසඞ්ගො. රත්තින්දිවං ඛො පනස්සු[2] මේතං භික්ඛවෙ සෙතච්ඡත්තං ධාරියති, මා නං ඵුසි සීතං වා උණ්හං වා රජො වා තිණං වා උස්සාවො වාති.

තස්ස මය්හං භික්ඛවෙ තයො පාසාදා අහෙසුං, එකො හෙමන්තිකො, එකො ගිම්හිකො, එකො වස්සිකො. සො ඛො අහං භික්ඛවෙ වස්සිකෙ පාසාදෙ වස්සිකෙ චත්තාරො මාසෙ නිප්පුරිසෙහි තුරියෙහි පරිචාරියමානො[3] න හෙට්ඨාපාසාදං ඔරොහාමි. යථා ඛො පන භික්ඛවෙ අඤ්ඤෙසං නිවෙසනෙසු[4] දාසකම්මකරපොරිසස්ස කණාජකං භොජනං දීයති බිලඞ්ගදුතියං. එවමෙවස්සු මෙ භික්ඛවෙ පිතුනිවෙසනෙ දාසකම්මකරපොරිසස්ස සාලිමංසොදනො දීයති.

තස්ස මය්හං භික්ඛවෙ එවරූපාය ඉද්ධියා සමන්නාගතස්ස එවරූපෙන ච සුඛුමාලෙන එතදහොසි: 'අස්සුතවා ඛො පුථුජ්ජනො අත්තනා ජරාධම්මො සමානො ජරං අනතීතො පරං ජිණ්ණං දිස්වා අට්ටීයති, හරායති, ජිගුච්ඡති, අත්තානංයෙව අතිසිත්වා.[5] අහම්පි ඛොම්හි ජරාධම්මො ජරං අනතීතො, අහං චෙව ඛො පන ජරාධම්මො සමානො ජරං අනතීතො, පරං ජිණ්ණං දිස්වා අට්ටීයෙය්‍යං, හරායෙය්‍යං, ජිගුච්ඡෙය්‍යං, න මෙ තං අස්ස පතිරූපන්ති'. තස්ස මය්හං භික්ඛවෙ ඉති පටිසඤ්චික්ඛතො යො යොබ්බනෙ යොබ්බනමදො, සො සබ්බසො පහීයි.

අස්සුතවා ඛො පුථුජ්ජනො අත්තනා ව්‍යාධිධම්මො සමානො ව්‍යාධිං අනතීතො, පරං ව්‍යාධිතං දිස්වා අට්ටීයති, හරායති, ජිගුච්ඡති, අත්තානංයෙව අතිසිත්වා[5], අහම්පි ඛොම්හි ව්‍යාධිධම්මො, ව්‍යාධිං අනතීතො, අහං චෙව ඛො පන ව්‍යාධිධම්මො සමානො ව්‍යාධිං අනතීතො, පරං ව්‍යාධිතං දිස්වා අට්ටීයෙය්‍යං හරායෙය්‍යං ජිගුච්ඡෙය්‍යං, න මෙ තං අස්ස පතිරූපන්ති'. තස්ස මය්හං භික්ඛවෙ ඉති පටිසඤ්චික්ඛතො යො ආරොග්‍යෙ ආරොග්‍යමදො, සො සබ්බසො පහීයි.

---

* සුදං භික්ඛවෙ - මජ්සං. † කාසිකං - සහං. කං.

1. වපුප්ඵති - සහං. මජ්සං. 2. ඛො පන මම සු තං - මජ්සං. PTS.
3. පරිචාරයමානො - අට්ඨකථා - මජ්සං.
4. නිවෙසනෙ - මජ්සං. 5. අතිසිත්වා - සීමු. මජ්සං PTS සහං, සී 1

## 3. 1. 4. 9

39. මහණෙනි, මම නිදුක්මි. අතිශයින් නිදුක්මි. සතතයෙන් නිදුක්මි. මහණෙනි, මාගේ පියනිවෙස්නෙහි පොකුණු කරවන ලද. එකෙක වනාහි නිලුපුල් පිපෙයි. එකෙක හෙලපියුම් පිපෙයි. එකෙක රත්පියුම් පිපෙයි. ඒ වනාහි හුදෙක් මා පිණිස ම ය. මහණෙනි, මම වනාහි නො සියුම් සඳුනක් නම් නො දරමි. මහණෙනි, මා හිස්වෙළුම ද සියුම් ම වෙයි. මා ගේ පොරෝනා කස්ස ද සියුම් ම ය. හඳනා ද සියුම් වෙයි. උතුරුසළුව ද සියුම් වේ. මහණෙනි, රෑදෙවෙහි ශීතය හෝ උෂ්ණය හෝ රජස හෝ තෘණ හෝ පිනී හෝ මුහු නහමක් පෙළාවා යි මට සේසතෙක් දරණු ලැබේ.

මහණෙනි, ඒ මට තුන් පහයෙක් විය. එකෙක් හෙමන්තයට හිත ය, එකෙක් ගිම්හානයට හිත ය, එකෙක් වර්ෂාසෘතුවට හිත ය. මහණෙනි, ඒ මම වැසිකලට නිසි පහයෙහි පිරිමින් නැති (ස්ත්‍රීන් කරණ) පසඟතුරුයෙන් පිනවනු ලබන්නෙම් යට පහයට නො බස්මි. මහණෙනි, යම්සේ අන්‍යයන්ගේ නිවෙස්හි දස්කම්කරු අතුවැසි පුරුෂයනට කාඩි දෙවන කොට ඇති නිවුඩුසාලේ බත දෙනු ලැබේ ද, මහණෙනි, එලෙසින් මාගේ පිය නිවෙස්නෙහි දස්කම්කරු යටත් පුරුෂයනට මස් සහිත ඇල්සහලේ බත් දෙනු ලැබේ.

මහණෙනි, මෙබඳු ඉද්ධියෙන් ද මෙබඳු සියුමැලියෙන් ද යුත් ඒ මට මේ සිත විය: අශ්‍රැතවත් පෘථග්ජන ජරාව සවභාව කොට ඇත්තේ ම ජරාව නො ඉක්ම වූයේ ම ජරාවට පත් අනෙකකු දැක තමා තබා පීඩිත වෙයි. ලජ්ජිතවෙයි, පිළිකුල් උපදවයි. වැලි මම ද ජරාව සවභාව කොට ඇත්තෙමි. ජරාව නො ඉක්ම වූ යෙම් වෙමි. මම ද ජරාව සවභාව කොට ඇත්තෙම් ජරාව නො ඉක්ම වූයෙම් ම ජරාවට පත් අනෙකකු දැක පීඩිත වන්නෙම් නම්, ලජ්ජිත වන්නෙම් නම්, පිළිකුල් උපදවන්නෙම් නම්, එය මට නිසි නො වන්නේ ම ය.' මහණෙනි, මෙසේ නුවණින් සලකා බලන්නා වූ ඒ මාගේ යොවුන් විය නිමිති කොට යම් යෞවනමදයෙක් වී ද, එය සර්වප්‍රකාරයෙන් ප්‍රහත විය.

අශ්‍රැතවත් පෘථග්ජනයා තෙමේ ව්‍යාධිය සවභාව කොට ඇත්තේ ම ව්‍යාධිය නො ඉක්ම වූයේ ම ව්‍යාධියට පත් අනෙකකු දැක තමා තබා පීඩිත වෙයි, ලජ්ජිත වෙයි, පිළිකුල් උපදවයි. මම වැලිත් ව්‍යාධිය සවභාව කොට ඇත්තෙමි, ව්‍යාධිය නො ඉක්ම වූයෙම් වෙමි. මම ද ව්‍යාධිය සවභාව කොට ඇත්තෙම්, ව්‍යාධිය නො ඉක්ම වූයෙම් ම ව්‍යාධියට පත් අනෙකකු දැක පීඩිත වන්නෙම් නම්, ලජ්ජිත වන්නෙම් නම්, පිළිකුල් උපදවන්නෙම් නම්, ඒ මට තරම් නො වන්නේ ම ය.' මහණෙනි, මෙසේ නුවණින් සලකා බලන්නා වූ ඒ මාගේ ආරොග්‍යය නිමිති කොට යම් ආරොග්‍යමදයෙක් වී නම්, එය සර්වප්‍රකාරයෙන් ප්‍රහත විය.

අස්සුතවා ඛො පුථුජ්ජනො අත්තනා මරණධම්මො සමානො මරණං අනතීතො පරං මතං දිස්වා අට්ටීයති හරායති ජිගුච්ඡති, අත්තානංයෙව අතිසිත්වා[1]. අහම්පි ඛොම්හි මරණධම්මො මරණං අනතීතො, අහං චෙව ඛො පන මරණධම්මො සමානො මරණං අනතීතො පරං මතං දිස්වා අට්ටීයෙය්‍යං හරායෙය්‍යං ජිගුච්ඡෙය්‍යං, න මෙ තං අස්ස පතිරූපන්ති'. තස්ස මය්හං භික්ඛවෙ ඉති පටිසඤ්චික්ඛතො යො ජීවිතෙ ජීවිතමදො, සො සබ්බසො පහීයි.

තයො'මෙ භික්ඛවෙ මදා. කතමෙ තයො: යොබ්බනමදො, ආරොග්‍යමදො, ජීවිතමදො. යොබ්බනමදමත්තො වා භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. ආරෙග්‍යමදමත්තො වා භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො -පෙ- ජීවිතමදමත්තො වා භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

යොබ්බනමදමත්තො වා භික්ඛවෙ භික්ඛු සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. ආරොග්‍යමදමත්තො වා භික්ඛවෙ භික්ඛු සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති, ජීවිතමදමත්තො වා භික්ඛවෙ භික්ඛු සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තතීති.

36 ව්‍යාධිධම්මා ජරාධම්මා අථො මරණධම්මිනො,
යථා ධම්මා තථා සන්තා ජිගුච්ඡන්ති පුථුජ්ජනා.

37 අහං චෙතං ජිගුච්ඡෙය්‍යං එවං ධම්මෙසු පාණිසු,
න මෙ තං පතිරූපස්ස මම එවං විහාරිනො.

38 සොහං එවං විහරන්තො ඤත්වා ධම්මං නිරූපධිං,
ආරොග්‍යෙ යොබ්බනස්මිං ච ජීවිතස්මිං ච යෙ මදා.

39 සබ්බෙ මදෙ අභිභොස්මි නෙක්ඛම්මෙ[2] දට්ඨු ඛෙමතං,
තස්ස මෙ අහු උස්සාහො නිබ්බානං අභිපස්සතො.

40 නාහං භබ්බො එතරහි කාමානි පතිසෙවිතුං,
අනිවත්ති භවිස්සාමි බ්‍රහ්මචරියපරායනොති.

1. අතිසිත්වා - මජසං. 2 නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො - සයා. සී. 1 සීමු. PTS.

අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ මරණය ස්වභාව කොට ඇත්තේ ම මරණය නො ඉක්ම වූයේ ම මරණයට පත් අනෙකකු දැක තමා ගැබා පීඩිත වෙයි, ලජ්ජිත වෙයි, පිළිකුල් උපදවයි. 'මම වැලිත් මරණය ස්වභාව කොට ඇත්තෙම් මරණය නො ඉක්ම වූයෙම් වෙමි. මම ද මරණය ස්වභාව කොට ඇත්තෙම් ම මරණය නො ඉක්ම වූයෙම් ම මළා වූ අනෙකකු දැක පීඩිත වන්නෙම් නම්, ලජ්ජිත වන්නෙම් නම්, පිළිකුල් උපදවන්නෙම් නම්, ඒ මට තරම් නො වන්නේ ය. මහණෙනි, මෙසේ නුවණින් සලකන්නා වූ ඒ මාගේ ජීවිතය නිමිති කොට යම් ජීවිතමදයෙක් වී නම්, එය සර්වප්‍රකාරයෙන් ප්‍රහීන විය.

මහණෙනි, මේ මද තුනෙකි. කවර තුනෙක යත්: යෞවනමදය, ආරෝග්‍යමදය, ජීවිතමදයි. මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජන යෞවන මදයෙන් මත්වූයේ කයින් දුසිරිත් කරයි, වචසින් දුසිරිත් කරයි, සිතින් දුසිරිත් කරයි, හේ කයින් දුසිරිත් කොට වචසින් දුසිරිත් කොට සිතින් දුසිරිත් කොට කාබුන් මරණින් මතු සුවයෙන් පහ වූ දුකට ගති වූ විවසව පතිත වන නිරයට පැමිණෙයි. මහණෙනි, ආරෝග්‍යමදයෙන් මත් වූත් අශ්‍රැතවත් පෘථග්ජන ... ජීවිතමදයෙන් මත් වූත් අශ්‍රැතවත් පෘථග්ජන කයෙන් දුසිරිත් කරයි, වචසින් දුසිරිත් කරයි, මනසින් දුසිරිත් කරයි. කයින් දුසිරිත් කොට වචසින් දුසිරිත් කොට මනසින් දුසිරිත් කොට කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ (පව්කළහු) විවසව පතිත වන නිරයට පැමිණෙයි.

මහණෙනි, යොවුන්මදින් මත් වූ ද මහණ ශික්ෂාව හැරපියා ගිහිබවට පෙරළෙයි. මහණෙනි, ආරෝග්‍යමදයෙන් මත් වූ ද මහණ ශික්ෂාව හැරපියා ගිහිබවට පෙරළෙයි. ජීවිතමදයෙන් මත් වූ ද මහණ ශික්ෂාව හැරපියා ගිහිබවට පෙරළෙයි.

36. ව්‍යාධිය ස්වභාව කොට ඇත්තා වූ ද ජරාව ස්වභාව කොට ඇත්තා වූ ද යළි මරණය ස්වභාව කොට ඇත්තා වූ ද පෘථග්ජනයෝ (ව්‍යාධිආදී) ස්වභාවයන් නො ඉක් මැ සිටියාහු ම (මෙරමා) පිළිකුල් කරත්.

37. මම ද මෙබඳු ස්වභාව ඇති ප්‍රාණීන් කෙරෙහි පිළිකුල් කරන්නෙම් නම්, මෙබඳු ජුගුප්සාවිහරණ ඇති මට එය තරම් නො වන්නේ ය.

38. මම මෙසේ වසන්නෙම් නිර්වාණධර්මය දැන, ආරෝග්‍යයෙහි ද යෞවනයෙහි ද, ජීවිතයෙහි ද යම් මද කෙනෙක් වෙත් නම්,

39. නිර්වාණයෙහි ක්ෂේමභාවය දැක සියලු මදයන් මැඩලූයෙම් වෙමි. නිවන දක්නා ඒ මට උත්සාහය විය.

40. දැන් මම කාමයන් සෙවුනට භව්‍ය නො වෙමි. නො නවත්නෙම් මහබඹසර පිහිට කොට ඇත්තෙම් වෙමි.

## 3. 1. 4. 10.

තීණි'මානි භික්ඛවෙ ආධිපතෙය්‍යානි. කතමානි තීණි: අත්තාධිපතෙය්‍යං, ලොකාධිපතෙය්‍යං, ධම්මාධිපතෙය්‍යං.

කතමං ච භික්ඛවෙ අත්තාධිපතෙය්‍යං: ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: 'න බො පනාහං චීවරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො, න පිණ්ඩපාතහෙතු -පෙ- න සෙනාසනහෙතු -පෙ- න ඉතිභවාභවහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො. අපි ච බොම්හි ඔතිණ්ණො ජාතියා ජරාමරණෙන[1] සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො, අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති. අහඤ්චෙව බො පන යාදිසකෙ[2] වා කාමෙ ඔහාය අගාරස්මා අනගාරියං පබ්බජිතො, තාදිසකෙ වා කාමෙ පරියෙසෙය්‍යං, තතො වා පාපිට්ඨතරෙ, න මෙ තං[3] අස්ස පතිරූපන්ති. සො ඉති පටිසඤ්චික්ඛති: ආරද්ධං බො පන මෙ විරියං භවිස්සති අසල්ලීනං, උපට්ඨිතා සති අසම්මුට්ඨා,[4] පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගන්ති'. සො අත්තානඤ්ඤෙව අධිපතිං කරිත්වා අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉදං වුච්චති භික්ඛවෙ අත්තාධිපතෙය්‍යං.

කතමඤ්ච භික්ඛවෙ ලොකාධිපතෙය්‍යං: ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: 'න බො පනාහං චීවරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො, න පිණ්ඩපාතහෙතු -පෙ- න සෙනාසනහෙතු -පෙ- න ඉතිභවාභවහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො. අපි ච බොම්හි ඔතිණ්ණො ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො. අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති. අහං චෙව බො පන එවං පබ්බජිතො සමානො කාමවිතක්කං වා විතක්කෙය්‍යං, ව්‍යාපාදවිතක්කං වා විතක්කෙය්‍යං, විහිංසාවිතක්කං වා විතක්කෙය්‍යං, මහා බො පනායං ලොකසන්නිවාසො, මහන්තස්මිං බො පන ලොකසන්නිවාසෙ සන්ති සමණබ්‍රාහ්මණා ඉද්ධිමන්තො දිබ්බචක්ඛුකා පරචිත්තවිදුනො. තෙ දූරතොපි පස්සන්ති, ආසන්නාපි න දිස්සන්ති, චෙතසාපි චිත්තං පජානන්ති[5]. තෙපි මං එවං ජානෙය්‍යුං: 'පස්සථ භො ඉමං කුලපුත්තං සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො වොකිණ්ණො විහරති පාපකෙහි අකුසලෙහි ධම්මෙහී'ති. දෙවතාපි බො සන්ති ඉද්ධිමන්තිනියො දිබ්බචක්ඛුකා පරචිත්තවිදුනියො. තා දූරතොපි පස්සන්ති, ආසන්නාපි න දිස්සන්ති, චෙතසාපි චිත්තං පජානන්ති,[5] තාපි මං එවං ජානෙය්‍යුං: 'පස්සථ භො ඉමං කුලපුත්තං, සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො වොකිණ්ණො විහරති පාපකෙහි අකුසලෙහි ධම්මෙහී'ති. සො ඉති පටිසංචික්ඛති: 'ආරද්ධං බො පන මෙ විරියං භවිස්සති අසල්ලීනං, උපට්ඨිතා සති අසම්මුට්ඨා,[4] 'පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගන්ති'. සො ලොකඤ්ඤෙව අධිපතිං කරිත්වා අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉදං වුච්චති භික්ඛවෙ ලොකාධිපතෙය්‍යං.

---

1. ජරාය මරණෙන මජ්සං, 2 යාදිසකෙ-මජ්සං. 3. න මෙතං පතිරූපන්ති - මජ්සං
4. අපම්මුට්ඨා - සීමු. 5. ජානන්ති - මජ්සං.

## 3. 1. 4. 10

40. මහණෙනි, මේ ආධිපත්‍යයෝ තුන් දෙනෙකි. කවර තුන්දෙනෙක යත්: ආත්මාධිපත්‍යය, ලෝකාධිපත්‍යය, ධර්මාධිපත්‍යයයි.

මහණෙනි, ආත්මාධිපත්‍යය කවරේද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ අරණ්‍යයට ගියේ හෝ වෘක්ෂමූලයට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරයි: 'මම චීවරහේතුයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නො වෙමි. පිණ්ඩපාත හේතුයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නො වෙමි. සෙනසුන් හේතුයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නො වෙමි. මෙසේත් භවය, මෙසේත් භවයයි ඒ ඒ සම්පත්තිභව හේතුයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නො වෙමි. වැලිදු ජාතියෙන් හා ජරාමරණයෙන් හා ශොකයෙන් හා වැලපීමෙන් හා දුක්දෙම්නසින් හා දැඩි ආයාසයෙන් හා වැදගත්තා ලදුයෙම් වෙමි. දුකට බටුයෙම්, දුකින් පීඩිත වූයෙම් වෙමි. මෙහැම දුක්රැසෙහි අවසන් කිරීමෙක් පැණෙන්නේ නම් මනාමැනු යි. තවද මම යම්බඳු වූ කාමයන් හැර ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් ද, එබඳු වූ කාමයන් හෝ එයට වඩා ඉතා ලාමක වූ කාමයන් හෝ සොයන්නෙම් නම්, එය මට තරම් නො වන්නේය යි. හෙතෙම මෙසේ නුවණින් සලකයි: 'මවිසින් වීර්‍ය්‍යය සම්පූර්ණ කරණ ලද වෙයි. එහෙයින් ම නො හැකුළුනේ වෙයි. සිහිය එළඹ සිටියේ වෙයි. එහෙයින් ම නො මුළා වෙයි. කය සැහැල්ලු වෙයි. එහෙයින් ම සන්හුන් දරථ ඇත්තේ ය. සිත අරමුණෙහි පිහිටුවන ලද, එහෙයින් ම එකඟ වූයේ'යි. හෙතෙම තමා ම අධිපති කොට අකුශලය දුරු කෙරෙයි, කුශලය වඩයි, සාවද්‍යය දුරලයි, අනවද්‍යය වඩයි, පිරිසිදු කොට ආත්මය පිරිවටයි. මෙය අත්තාධිපතෙය්‍ය යි කියනු ලැබේ.

මහණෙනි, ලෝකාධිපත්‍යය කවරේද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ වනසෙනස්නට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ මෙසේ සිතයි: 'මම වනාහි චීවර හේතුයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නො වෙමි, පිණ්ඩපාතය හේතු කොට ගෙණ...සෙනසුන් හේතු කොටගෙණ හෝ ... මෙසේ මෙසේත් භවය, මෙසේත් භව යයි ඒ ඒ සම්පත්තිභවය හේතුයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නො වෙමි. වැලිදු ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් වැලපීමෙන් දුක්දෙම්නසින් දැඩි ආයාසයෙන් වැදගත්තා ලද්දෙම් දුකින් මඩන ලදුයෙම් දුකින් පීඩිත වූයෙම් වෙමි. මෙ හැම දුක්රැස අවසන් කිරීමෙක් පැණේ නම් මැනැවැ යි. මම ද වැලිත් මෙසේ පැවිදි වූයෙම් ම කාමවිතර්කයක් හෝ කරන්නෙම් නම්, ව්‍යාපාදවිතර්කයක් හෝ කරන්නෙම් නම්, විහිංසාවිතර්කයක් හෝ කරන්නෙම් නම්, මේ ලොකසන්නිවාසය වනාහි මහත් වූවෙකි. මහත් වූ ලොකසන්නිවාසයෙහි ඍද්ධිමත් වූ දිවැස් ඇති පරසිත් දන්නා මහණ බමුණෝ ඇත. ඔවුහු දුරිනුදු දක්නාහ. සමීපසථවූවාහු නමුදු නො පැණෙන්නාහ. ඔවුන්ගේ සිතිනුදු මාගේ සිත දැන ගණිත්. තවද ඔවුහු මා මෙසේ දැනගන්නාහුය: 'භවත්නි, මේ කුලපුත්හු බලව, සැදැහැයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට වන්නේ ලාමක අකුශලධර්මයන්ගෙන් ගැවසී ගත්තේ වෙසෙයි. ඍද්ධිමත් වූ දිවැස් ඇත්තා වූ පරසිත් දන්නා වූ දෙවියෝ ද ඇත. ඔවුහු ද දුරින් (මා) දකිත්. සමීපසථවූවාහු ද (ඔවුහු) නො පැණෙත්. ඔවුහු තමන් සිතිනුදු මා සිත දැනගන්නාහ. ඔවුහු ද මා මෙසේ හඳුනා ගන්නාහ: 'භවත්නි, මේ කුලපුත්හු බලව, සැදැහැයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට වන්නේ ම ලාමක අකුශලධර්මයන්ගෙන් ව්‍යාකීර්ණව වෙසේය' යි. හේ මෙසේ නුවණින් සලකයි: 'මා විසින් වීර්‍ය්‍යය අරඹන ලද. එය නො හැකුළුනේ වෙයි. සිහිය එළඹ සිටියේ ය. එහෙයින් මුළා නුවූයේ ය. නාමකාය සන්හිඳුනේ ය. එහෙයින් ම දරථ රහිත වෙයි. සිත සමාධිගත වූයේ ය. එහෙයින් ම එකඟ වේ ය'යි. හේ ලෝකයා ම අධිපති කොට අකුශලය හැරලයි, කුශලය වඩයි, සාවද්‍යය දුරලයි, අනවද්‍යය වඩයි, පිරිසිදු කොට ආත්මය පිරිවටයි මහණෙනි, මෙය ලෝකාධිපත්‍ය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ ධම්මාධිපතෙය්‍යං: ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසංචික්ඛති: 'න ඛො පනාහං චීවරහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො, න පිණ්ඩපාතහෙතු -පෙ- න සෙනාසනහෙතු -පෙ- න ඉතිභවාභවහෙතු අගාරස්මා අනගාරියං පබ්බජිතො. අපි ච ඛො'ම්හි ඔතිණ්ණො ජාතියා ජරාමරණෙන[1] සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො. අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති. ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[2] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. සන්ති ඛො පන මෙ සබ්‍රහ්මචාරී ජානං පස්සං විහරන්ති. අහං චෙව ඛො පන එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතො සමානො කුසීතො විහරෙය්‍යං පමත්තො, න මෙ තං අස්ස පතිරූපන්ති'. සො ඉති පටිසංචික්ඛති: 'ආරද්ධං ඛො පන මෙ විරියං භවිස්සති අසල්ලීනං, උපට්ඨිතා සති අසම්මුට්ඨා, පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගන්ති'. සො ධම්මංයෙව අධිපතිං කරිත්වා අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධං අත්තානං පරිහරති. ඉදං වුච්චති භික්ඛවෙ ධම්මාධිපතෙය්‍යං. ඉමානි ඛො භික්ඛවෙ තීණි ආධිපතෙය්‍යානීති.

41. නත්ථි ලොකෙ රහො නාම පාපකම්මං පකුබ්බතො,
අත්තා තෙ පුරිස ජානාති සච්චං වා යදි වා මුසා.

42. කල්‍යාණං වත භො සක්ඛි අත්තානං අතිමඤ්ඤසි,
යො සන්තං අත්තනි පාපං අත්තානං පරිගූහසි.

43. පස්සන්ති දෙවා ච තථාගතා ච ලොකස්මිං බාලං විසමං චරන්තං,
තස්මා හි අත්තාධිපකො[3] සතො චරෙ ලොකාධිපො ච
නිපකො ච ඣායී,
ධම්මාධිපො ච අනුධම්මචාරී න හීයති සච්චපරක්කමො මුනි.

44. පසය්හ මාරං අභිභුය්‍ය අන්තකං යො ච ඵුසී ජාතික්ඛයං පධානවා,
ස[4] තාදිසො ලොකවිදූ සුමෙධො සබ්බෙසු ධම්මෙසු අතම්මයො මුනීති.

**දෙවදූත වග්ගො චතුත්ථො.**

*

1. ජරාය මරණෙන
2. ඔපනෙය්‍යිකො - මජසං.
3 අත්තාධිපතෙය්‍යකොච - මජසං.
4 සො.

* තස්සුද්දානං:
බ්‍රහ්ම ආනන්ද සාරිපුත්තො - නිදානං හත්ථකෙන ච
දූතා දුවෙ ච රාජානො - සුඛුමාලාධිපතෙය්‍යතාවාති - මජසං.

මහණෙනි, ධර්මාධිපත්‍යය කවරේද යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ වනසෙනසක්හට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසේ සිතයි: 'මම වනාහි චීවරහේතුයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නො වෙමි. පිණ්ඩපාත හේතුයෙන් ගිහිගෙන් නික්ම ... සෙනසුන් හෙතුයෙන් ... ඉතිභවාභව හේතුයෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නො වෙමි. වැලිදු ජාතියෙන් ජරාමරණයෙන් ශොකයෙන් වැලපීමෙන් දුක්දොම්නසින් දැඩි ආයාසයෙන් අවතීර්ණ වෙමි. දුකට බටුයෙම් දුකින් මඩනා ලදුයෙම් වෙමි. මේ හැම දුක් රැස අවසන් කිරීමෙක් පැණේ නම්, ඉතා මැනව. භාග්‍යවතුන් වහන්සේ විසින් සාන්දෘෂ්ටික වූ අකාලික වූ 'එව බලව' යන විධානයට නිසි වූ උපනයනයට නිසි වූ නුවණැත්තන් විසින් තමන් කෙරෙහි ලා දතයුතු වූ නවලොකොත්තර ධර්මය මොනොවට ප්‍රකාශ කරණ ලදී. මට සමාන බඹසර ඇත්තාහු වෙත් ම ය. ඔහු මා දන්නාහු දක්නාහු වෙසෙත්. මම ද වනාහි මෙසේ ස්වාඛ්‍යාත වූ ශාසනයෙහි පැවිදි වූයෙම් ම කුසීත ව ප්‍රමත්ත ව වෙසෙම් නම්, එය මට නිසි නොවන්නේය''යි. හෙතෙම මෙසේ නුවණින් සලකයි: 'මා විසින් වීර්‍ය්‍යය පුරන ලද වෙයි. එහෙයින් ම නො හැකුළුනේ වෙයි. සිහිය එළඹ සිටියේ ය. එහෙයින් ම නුමුළා වූයේ ය. නාමකය සන්හිත. එහෙයින් ම දරථ රහිත වෙයි. සිත සමාධිගත වූයේය. එහෙයින් ම එකඟ වේය' යි. හෙතෙම ධර්මය ම අධිපති කොට අකුශලය හැරලයි, කුශලය වඩයි, සාවද්‍යය හැරලයි, අනවද්‍යය වඩයි, පිරිසුදු වූ ආත්මය පරිහරණය කරයි. මහණෙනි, මෙය ධර්මාධිපත්‍ය යි කියනු ලැබේ. මහණෙනි, මේ වනාහි ආධිපත්‍යයෝ තුන් දෙන යහ.

41. පව්කම් කරණුවහට ලොව්හි රහසෙක් නම් නැත. පුරුෂය, තාගේ ආත්මය (හිත) එය සැබවෙක් ද, නැතහොත් මුසායෙක් දැයි දන්නේ යි.

42. යම් බඳු වූ තෝ තමා කෙරෙහි ඇත්තාවූ ම පව තමාට සඟවන්-නෙහි ද? පින්වත, තමා ඉක්මවා හහනෙහි ද? මැනවෙක් වනාහි එකාන්ත-යෙන් ප්‍රත්‍යක්ෂය.

43. යම් හෙයෙකින් ලොව්හි විෂම ලෙස හැසිරෙන්නා වූ බාලයා දෙවියෝ ද තථාගතවරු ද දකිත් ද. එහෙයින් ම සිහි ඇත්තාවූ ද තත්වැසි නුවණැත්තා වූ ද ධ්‍යාන කරණ සුළුවූ ද ධර්මය අනුව හැසිරෙන්නා වූ ද සත්‍යපරාක්‍රම ඇත්තාවූ ද යම් මහණෙක්

44. ප්‍රධන්වීර්‍ය්‍ය ඇත්තේ මාරයා මැඩ අන්තකයා අභිභවනය කොට රහත් බව ප්‍රත්‍යක්ෂ කෙළේ ද, අත්තාධිපති වූ ද ලෝකාධිපති වූ ද ධර්මාධිපති වූ ද ලෝකය දැනගත්තා වූ මනා නුවණැත්තා වූ එබඳු මුනි තෙම සියලු ත්‍රෛභූමික ධර්මයන්හි තමමය නම් වූ තෘෂ්ණායෙන් තොර වූයේ ලෝකය දැනගන්නේ නො පිරිහේ ය යි.

**සතරවන දෙවදූත වර්ගයයි.**

# [5. චූළවග්ගො]

[සාවත්ථිනිදානං:]

### 3. 1. 5. 1.

41. තිණ්ණං භික්ඛවෙ සම්මුඛිභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. කතමෙසං තිණ්ණං: සද්ධාය භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධො කුල-පුත්තො බහුං පුඤ්ඤං පසවති. දෙය්‍යධම්මස්ස භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දක්ඛිණෙය්‍යානං භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවතීති.

### 3. 1. 5. 2.

42. තීහි භික්ඛවෙ ඨානෙහි සද්ධො පසන්නො වෙදිතබ්බො. කතමෙහි තීහි: සීලවන්තානං දස්සනකාමො හොති, සද්ධම්මං සොතුකාමො හොති, විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ඨානෙහි සද්ධො පසන්නො වෙදිතබ්බොති.

45. දස්සනකාමො සීලවතං සද්ධම්මං සොතුමිච්ඡති,
විනෙය්‍ය[1] මච්ඡෙරමලං ස වෙ සද්ධොති වුච්චතීති.

### 3. 1. 5. 3.

43. තයො'මෙ[2] භික්ඛවෙ අත්ථවසෙ සම්පස්සමානෙන අලමෙව පරෙසං ධම්මං දෙසෙතුං. කතමෙ තයො: යො ධම්මං දෙසෙති, සො අත්ථපටිසංවෙදී ච හොති 'ධම්මපටිසංවෙදී ච. යො ධම්මං සුණාති, සො අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී[3] ච. යො චෙව ධම්මං දෙසෙති, යො ච ධම්මං සුණාති, උභො අත්ථපටිසංවෙදිනො ච හොන්ති ධම්මපටිසංවෙදිනො ච. ඉමෙ ඛො භික්ඛවෙ තයො අත්ථවසෙ සම්පස්සමානෙන අලමෙව පරෙසං ධම්මං දෙසෙතුන්ති.

---

1. විනයෙ - මජසං. 2. තණයා - මජසං 3. ධම්මපටිසංවෙදී - මජසං

## [ 5. චූලවග්ගය ]

[සැවැත්නිදානයි:]

### 3. 1. 5. 1.

41. මහණෙනි, තුන් දෙනකුන්ගේ හමුබැවින් සැදැහැවත් කුලපුත් බොහෝ පින් රැස් කරණේය. කවර තිදෙනකුගේය යත්: මහණෙනි, සැදැහැ හමුබැවින් සැදැහැවත් කුලපුත් බොහෝ පින් රැස් කරණේ ය. මහණෙනි, දෙයධම් හමුබැවින් සැදැහැති කුලපුත් බොහෝ පින් රැස් කරණේය. මහණෙනි, දක්ෂිණාර්හයන්ගේ හමුබැවින් සැදැහැවත් කුලපුත් බොහෝ පින් රැස් කරණේ ය. මහණෙනි, මෙ කරුණු තුණ හමුබැවින් සැදැහැති කුලපුත් බොහෝ පින් රැස් කරණේ ය.

### 3. 1. 5. 2.

42. මහණෙනි, කරුණු තුණෙකින් පහන් වූ සැදැහැතියේ දතයුතු වේ. කවර තුණෙකින යත්: සිල්වතුන් දක්නා කැමැතියේ වෙයි, සදහම් අසනු කැමැතියේ වෙයි, මුහුටු ත්‍යාග ඇත්තේ දීමෙහි දෙව් අත් ඇතියේ හැරපිමෙහි ඇලුනේ යදනට නිසිවූයේ දන් හා සංවිභාගයෙහි ඇලුනේ පහ වූ මසුරු මලින් යුත් සිතින් ගිහිගෙයි වෙසෙයි. මහණෙනි, මේ තෙකරුණින් යුක්ත වූයේ පහන් වූ සැදැහැතියේ යි දත යුතුයි.

45. සිල්වතුන් දක්නට කැමැතියේ වේ ද, සදහම් අසන්නට කැමැති වේ ද, මසුරුමල දුරලා වෙසේ ද, හේ එකාන්තයෙන් සැදැහැත්තේ ය යි කියනු ලැබේ.

### 3. 1. 5. 3.

43. මහණෙනි, මේ කරුණු තුණක් දක්නහු විසින් පරහට දහම් දෙසුමට නිසි ම වේ. කවර තුණෙක යත්: යමෙක් දහම් දෙසා නම්, හේ අටුවා දන්නේත් වෙයි. පෙළදහම් දන්නේත් වෙයි. යමෙක් ධර්මය අසා නම්, හෙ අටුවා දන්නේත් පෙළදහම් දන්නේත් වෙයි. යමෙකුත් දහම් දෙසා නම්, යමෙකුත් දහම් අසා නම්, එ දෙදෙන අටුවා දන්නාහු ද පෙළදහම් දන්නාහු ද වෙත්. මහණෙනි, මේ කරුණු තුණ දක්නහු විසින් පරහට දහම් දෙසනු නිසි මැ යි.

### 3. 1. 5. 4.

44. තීහි භික්ඛවෙ ඨානෙහි කථා පවත්තනී[1] හොති. කතමෙහි තීහි: යො ධම්මං දෙසෙති, සො අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. යො ධම්මං සුණාති, සො අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච. යො චෙව ධම්මං දෙසෙති, යො ච ධම්මං සුණාති, උභො අත්ථපටිසංවෙදිනො ච හොන්ති ධම්මපටිසංවෙදිනො ච. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ඨානෙහි කථා පවත්තනී[1] හොතීති.

### 3. 1. 5. 5.

45. තීණි'මානි භික්ඛවෙ පණ්ඩිතපඤ්ඤත්තානි සප්පුරිසපඤ්ඤත්තානි. කතමානි තීණි: දානං භික්ඛවෙ පණ්ඩිතපඤ්ඤත්තං සප්පුරිසපඤ්ඤත්තං. පබ්බජ්ජා භික්ඛවෙ පණ්ඩිතපඤ්ඤත්තා සප්පුරිසපඤ්ඤත්තා. මාතාපිතූනං[2] භික්ඛවෙ උපට්ඨානං පණ්ඩිතපඤ්ඤත්තං සප්පුරිසපඤ්ඤත්තං. ඉමානි ඛො භික්ඛවෙ තීණි පණ්ඩිතපඤ්ඤත්තානි සප්පුරිසපඤ්ඤත්තානීති.

46. සබ්භි දානං උපඤ්ඤත්තං අහිංසා සඤ්ඤමො දමො,
මාතාපිතුඋපට්ඨානං සන්තානං බ්‍රහ්මචාරිනං.

47. සතං එතානි ඨානානි යානි සෙවෙථ පණ්ඩිතො,
අරියො දස්සනසම්පන්නො ස ලොකං භජතෙ සිවන්ති.

### 3. 1. 5. 6.

46. යං භික්ඛවෙ සීලවන්තො පබ්බජිතා ගාමං වා නිගමං වා උපනිස්සාය විහරන්ති, තත්ථ මනුස්සා තීහි ඨානෙහි බහුං පුඤ්ඤං පසවන්ති. කතමෙහි තීහි: කායෙන වාචාය මනසා. යං භික්ඛවෙ සීලවන්තො පබ්බජිතා ගාමං වා නිගමං වා උපනිස්සාය විහරන්ති, තත්ථ මනුස්සා ඉමෙහි තීහි ඨානෙහි බහුං පුඤ්ඤං පසවන්තීති.

### 3. 1. 5. 7.

47. තීණි'මානි භික්ඛවෙ සඞ්ඛතස්ස සඞ්ඛතලක්ඛණානි. කතමානි තීණි: උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. ඉමානි ඛො භික්ඛවෙ තීණි සඞ්ඛතස්ස සඞ්ඛතලක්ඛණානීති.

### 3. 1. 5. 8.

48. තීණි'මානි භික්ඛවෙ අසඞ්ඛතස්ස අසඞ්ඛතලක්ඛණානි. කතමානි තීණි: න උප්පාදො පඤ්ඤායති, න වයො පඤ්ඤායති, න ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. ඉමානි ඛො භික්ඛවෙ තීණි අසඞ්ඛතස්ස අසඞ්ඛතලක්ඛණානීති.

---

1. පවත්තිනී - මජසං. 2. මාතාපිතුන්නං - මජසං.

**3. 1. 5. 4.**

44. මහණෙනි, කරුණු තුණෙකින් කථාව පවත්නී වෙයි. කවර තුණෙකින යත්: යමෙක් දහම් දෙසා නම්, හේ අටුවා දන්නේත් පෙළදහම් දන්නේත් වේ. යමෙක් දහම් අසා නම්, හේ අටුවා දන්නේත් පෙළදහම් දන්නේත් වේ. යමෙක් එ දහම් දෙසා නම්, යමෙක් දහම් අසා නම්, යන දෙදෙන ම අටුවා දන්නෝත් පෙළදහම් දන්නෝත් වෙති. මහණෙනි, මේ කරුණු තුණෙන් කථාව පවත්නී වේ යයි.

**3. 1. 5. 5.**

45. මහණෙනි, පණ්ඩිතයන් විසින් පණවන ලද සත්පුරුෂයන් විසින් පණවන ලද මේ කරුණු තුණෙකි. කවර තුණෙක යත්: මහණෙනි, දානය පණ්ඩිතයන් විසින් පණවන ලද සත්පුරුෂයන් විසින් පණවනලද. මහණෙනි, පැවිද්ද පණ්ඩිතයන් විසින් පණවන ලද සත්පුරුෂයන් විසින් පණවන ලද මහණෙනි, මවුපියඋවටන පණ්ඩිතයන් විසින් පණවන ලද. සත්පුරුෂයන් විසින් පණවනලද. මහණෙනි, මොහු තිදෙන පණ්ඩිතයන් විසින් පණවන ලද්දාහු සත්පුරුෂයන් විසින් පණවන ලද්දාහු වෙති සි.

46. ශ්‍රෙෂ්ඨවයසී ඇති සත්පුරුෂයන්ගේ දානය ද අහිංසාව ද ශීල-සංයමය ද ඉන්ද්‍රියසංවරය ද මවුපිය උවටන ද යන මේ සත්පුරුෂයන් විසින් පණවන ලද වෙයි.

47. පණ්ඩිත තෙමේ සත්පුරුෂයන් පිළිබඳ වූ යම්බඳු මේ තුන් කරුණු සෙවුනේ නම්, දර්ශන සම්පන්න වූ ඒ ආර්‍ය්‍ය තෙම දෙව්ලොව සෙවුනේ සි.

**3. 1. 5. 6.**

46. මහණෙනි, සිල්වත් පැවිද්දෙ යම් ගමක් හෝ නියම්ගමක් ඇසුරු කොට වෙසෙත් ද, එහි මිනිස්සු කරුණු තුණෙකින් බොහෝ පින් ලබත්. කවර තුණෙකින යත්: කයින් ද, වචනයෙන් ද, සිතින් දැයි. මහණෙනි, සිල්වත් වූ පැවිද්දෙ යම් ගමක් හෝ නියම්ගමක් හෝ ඇසුරු කොට වසත් නම්, එහි මිනිස්සු මේ කරුණු තුණෙන් බොහෝ පින් ලබත්.

**3. 1. 5. 7.**

47. මහණෙනි, ප්‍රත්‍යය සමවායයෙන් සකස් කරණ ලද්දහුගේ මේ සඞ්ඛත ලක්ෂණ තුණෙකි. කවර තුණෙක යත්: ඉපැදීම පැණෙයි, නැස්ම (බිඳීම) පැණෙයි, සිටියහුගේ වෙනස්වීම (නම් වූ ජරාව) පැණෙයි. මහණෙනි, ප්‍රත්‍යය සමවායයෙන් සකස් කරණ ලද්දහුගේ මේ සඞ්ඛත ලක්ෂණ තුණයි.

**3. 1. 5. 8.**

48. මහණෙනි, ප්‍රත්‍යයයන් විසින් නො සකස්කළහු (නිර්වාණය) ගේ මේ අසඞ්ඛත ලක්ෂණ තුණෙකි. කවර තුනෙක යත්: උපත් නොපැණෙයි, ව්‍යය නො පැණෙයි, සිටියහුගේ අන්‍යථාත්වය (ජරාව) නො පැණෙයි. මහණෙනි, අසංස්කාර (ධර්මයා)ගේ මේ අසංස්කෘත ලක්ෂණ තුණයි.

### 3. 1. 5. 9.

49. හිමවන්තං භික්ඛවෙ පබ්බතරාජං නිස්සාය මහාසාලා තීහි වඩ්ඪීහි වඩ්ඪන්ති. කතමාහි තීහි:[1] සාඛාපත්තපලාසෙන වඩ්ඪන්ති, තචපපටිකාය වඩ්ඪන්ති, ඵෙග්ගුසාරෙන වඩ්ඪන්ති. හිමවන්තං භික්ඛවෙ පබ්බතරාජං නිස්සාය මහාසාලා ඉමාහි තීහි වඩ්ඪීහි වඩ්ඪන්ති.

එවමෙව ඛො භික්ඛවෙ සද්ධං කුලපතිං නිස්සාය අන්තොජනො තීහි වඩ්ඪීහි වඩ්ඪති, කතමාහි තීහි: සද්ධාය වඩ්ඪති, සීලෙන වඩ්ඪති, පඤ්ඤාය වඩ්ඪති. සද්ධං භික්ඛවෙ කුලපතිං නිස්සාය අන්තොජනො ඉමාහි තීහි වඩ්ඪීහි වඩ්ඪතීති.

48. යථාපි පබ්බතො සෙලො අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ,
තං රුක්ඛා උපනිස්සාය වඩ්ඪන්තෙ තෙ වනස්පතී.[2]

49. තථෙව සීලසම්පන්නං සද්ධං කුලපතිං ඉධ,
උපනිස්සාය වඩ්ඪන්ති පුත්තදාරා ච බන්ධවා,
අමච්චා ඤාතිසඞ්ඝා ච යෙ චස්ස අනුජීවිනො.

50. ත්‍යාස්ස සීලවතො සීලං චාගං සුචරිතානි ච,
පස්සමානානුකුබ්බන්ති[3] යෙ භවන්ති විචක්ඛණා.

51. ඉධ ධම්මං චරිත්වාන මග්ගං සුගතිගාමිනං,
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනොති.

### 3. 1. 5. 10.

50. තීහි භික්ඛවෙ ඨානෙහි ආතප්පං කරණීයං. කතමෙහි තීහි: අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ආතප්පං කරණීයං. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ආතප්පං කරණීයං. උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිබ්බානං[4] ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසනාය ආතප්පං කරණීයං. ඉමෙහි තීහි භික්ඛවෙ ඨානෙහි ආතප්පං කරණීයං.

යතො ඛො භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ආතප්පං කරොති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ආතප්පං කරොති, උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිබ්බානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසනාය ආතප්පං කරොති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ආතාපී නිපකො සතො සම්මා දුක්ඛස්ස අන්තකිරියායාති.

### 3. 1. 5. 11.

51. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො මහාචොරො සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති. කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ මහාචොරො විසමනිස්සිතො ච හොති, ගහනනිස්සිතො ච හොති, බලවනිස්සිතො ච හොති. කථඤ්ච භික්ඛවෙ මහාචොරො විසමනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ මහාචොරො නදීවිදුග්ගං වා නිස්සිතො හොති, පබ්බතවිසමං වා. එවං ඛො භික්ඛවෙ මහාචොරො විසමනිස්සිතො හොති.

1. කතමෙහි තීහි - PTS. 2. වනප්පතී - මජසං. 3. අනුමොදං - මජසං
4. තිප්පානං - සීමු, අට්ඨකථා

### 3. 1. 5. 9.

49. මහණෙනි, හිමවත් පර්වතරාජයා නිසා මහා වෘක්‍ෂයෝ තුන් වැඩුමෙකින් වැඩෙත්. කවර තුණෙකින යත්: ශාඛායෙන් හා පත්‍ර සඞ්ඛ්‍යාත කොළපතරින් වැඩෙත්, පොතුපතරින් වැඩෙත්, ඵලයෙන් හා හරින් හා වැඩෙත්, මහණෙනි, හිමවත් පර්වතරාජයා නිසා මහාවෘක්‍ෂයෝ මේ තුන් වැඩුමෙන් වැඩෙත්.

මහණෙනි, එපරිද්දෙන් ම සැදැහැති කුලදෙටුහු නිසා ඇතුළු දෙනෝ තුන් වැඩුමෙකින් වැඩෙයි. කවර තුණෙකින යත්: සැදැහැයෙන් වැඩෙයි, ශීලයෙන් වැඩෙයි, ප්‍රඥායෙන් වැඩෙයි. මහණෙනි, සැදැහැති කුලපතිහු නිසා ඇතුළු දෙනෝ මේ තුන් වැඩුමින් වැඩෙයි.

48 තොාගම් මහවෙනෙහි ගල්පව්වෙක් යම්බදු වේ නම්, එය ඇසුරු කොට ගෙණ ඒ වනදෙටු වෘක්‍ෂයෝ වැඩෙත්.

49. එපරිදි ම මෙහි සැදැහැති සිල්වත් කුලදෙටුහු ඇසුරු කොට ගෙණ අඹුදරුවෝ ද, බන්‍ධුහු ද, සගයෝ ද, නෑ සමූහයෝ ද යම් අනුජීවීහු වෙත් නම්, ඔහු ද වැඩෙත්.

50. යම් විචක්‍ෂණ කෙනෙක් වෙත් නම්, ඔහු ඒ සිල්වත්හුගේ ශීලය හා ත්‍යාගය හා සුචරිත හා දක්නාහු ඔහු අනුව ක්‍රියා කෙරෙත්.

51. මෙලොව සුගතිගාමී මාර්ගය වන කුසල් දහම් පුරා (කර්මනන්දනායෙන්) සතුටු වූවාහු පස්කම් සැප කැමැත්තාහු දෙව්ලොව දී (විපාක මොදනායෙන්) සතුටු වෙත්.

### 3. 1. 5. 10.

50. මහණෙනි, කරුණු තුණෙකින් වීර්‍යය කට යුතුයි. කවර තුණෙකින යත්: නූපන් ලාමක අකුශල ධර්මයන්ගේ නූපදීම පිණිස වීර්‍යය කට යුතු. නූපන් කුශලධර්මයන්ගේ ඉපැත්ම පිණිස වීර්‍යය කට යුතු. උපන් දුක් වූ තීව්‍ර වූ කර්කශ වූ කටුක වූ අමිහිරි වූ අමනාප වූ දිවිහරණා වූ ශාරීරික වෙදනාවන් ඉවසීම පිණිස වීර්‍යය කටයුතුය.

මහණෙනි, යම් කලෙක පටන් කොට මහණ නූපන් ලාමක අකුශලධර්ම-යන් නූපදනා පිණිස වීර්‍යය කෙරේ ද, නූපන් කුශලධර්මයන් ඉපැත්ම පිණිස වීර්‍යය කෙරේ ද, උපන් දුක් වූ තීව්‍ර වූ කර්කශ වූ කටුක වූ අමිහිරි වූ අමනාප වූ දිවිහරණා වූ ශාරීරික වෙදනාවන් ඉවසීම පිණිස වැර කෙරේ ද, මහණෙනි, මේ මහණ කෙලෙස් තවන වීර්‍යය ඇත්තේ පාරිහාරික නුවණින් නුවණැත්තේ සමෘති සමපන්න වූයේ මොනොවට දුක් නසනු පිණිස පිළිපන්නේ යි කියනු ලැබේ.

### 3. 1. 5. 11.

51. මහණෙනි, අඞ්ග තුණෙකින් සමන්‍වාගත වූ මහසොර ගෘහසන්ධි ද සිඳුනේයි. වොලොගැණුම් ද කරණේයි. එක් ගෙයක් පැහැර ගැණුම් ද කරණේයි. කඩපලා සොරකමෙහි ද යෙදෙයි. කවර තුණෙකින යත්: මහණෙනි, මෙ ලොව්හි මහසොර විෂමසථාන ඇසුරු කෙලේ ද වෙයි. වනලැහැබ් ඇසුරු කෙලේ ද වෙයි. බලවතුන් ඇසුරු කෙලේ ද වෙයි.

කථඤ්ච භික්ඛවෙ මහාචොරො ගහනනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ මහාචොරො තිණගහනං වා නිස්සිතො හොති රුක්ඛගහනං වා ගෙධං[1] වා පන වනසණ්ඩං. එවං ඛො භික්ඛවෙ මහාචොරො ගහනනිස්සිතො හොති.

කථඤ්ච භික්ඛවෙ මහාචොරො බලවනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ මහාචොරො රාජානං වා රාජමහාමත්තානං වා නිස්සිතො හොති. තස්ස එවං හොති: සචෙ මං කොචි කිඤ්චි වක්ඛති, ඉමෙ මෙ රාජානො වා රාජමහාමත්තා වා පරියොධාය අත්ථං භණිස්සන්තීති. සචෙ නං කොචි කිඤ්චි ආහ, ත්‍යාස්ස රාජානො වා රාජමහාමත්තා වා පරියොධාය අත්ථං භණන්ති. එවං ඛො භික්ඛවෙ මහාචොරො බලවනිස්සිතො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො මහාචොරො සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති.

එවමෙව ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි† සමන්නාගතො පාපභික්ඛු ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො[2] විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති. කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ පාපභික්ඛු විසමනිස්සිතො ච හොති, ගහනනිස්සිතො ච, බලවනිස්සිතො ච.

කථඤ්ච භික්ඛවෙ පාපභික්ඛු විසමනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ පාපභික්ඛු විසමෙන කායකම්මෙන සමන්නාගතො හොති, විසමෙන වචීකම්මෙන සමන්නාගතො හොති, විසමෙන මනොකම්මෙන සමන්නාගතො හොති. එවං ඛො භික්ඛවෙ පාපභික්ඛු විසමනිස්සිතො හොති.

කථඤ්ච භික්ඛවෙ පාපභික්ඛු ගහනනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ පාපභික්ඛු මිච්ඡාදිට්ඨිකො හොති, අන්තග්ගාහිකාය දිට්ඨියා සමන්නාගතො.[3] එවං ඛො භික්ඛවෙ පාපභික්ඛු ගහනනිස්සිතො හොති.

කථඤ්ච භික්ඛවෙ පාපභික්ඛු බලවනිස්සිතො හොති: ඉධ භික්ඛවෙ පාපභික්ඛු රාජානං වා රාජමහාමත්තානං වා නිස්සිතො හොති. තස්ස එවං හොති: සචෙ මං කොචි කිඤ්චි වක්ඛති, ඉමෙ මෙ රාජානො වා රාජමහාමත්තා වා පරියොධාය අත්ථං භණිස්සන්තීති. සචෙ නං කොචි කිඤ්චි ආහ, ත්‍යාස්ස රාජානො වා රාජමහාමත්තා වා පරියොධාය අත්ථං භණන්ති. එවං ඛො භික්ඛවෙ පාපභික්ඛු බලවනිස්සිතො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො පාපභික්ඛු ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති, සානුවජ්ජො ච විඤ්ඤූනං. බහුං ච අපුඤ්ඤං පසවතීති.

චූළවග්ගො පඤ්චමො.

*

පඨමො පණ්ණාසකො සමත්තො.

---

1. රොධං වා - මජසං. ස්‍යා. 2. සානුවජ්ජො ච - මජසං.
3 සමන්නාගතො හොති - මජසං.
† අඞ්ගෙහි-මජසං.
* තස්සුද්දානං :- සම්මුඛීඨානාපඤ්චස්ස - පවත්ති පණ්ඩිත සීලවං
සඞ්ඛතං පබ්බතා තපපං මහාචොරෙනෙකාදසාති.

මහණෙනි, මහසොර කෙසේ නම් විසමතැන් ඇසුරු කෙළේ වේ ද: මහණෙනි, මෙලොව්හි මහසොර නදී විදුගීයක් හෝ පර්වත විෂම ස්ථානයක් හෝ ඇසුරු කෙළේ වෙයි. මහණෙනි, මෙසේ මහසොර විෂමස්ථානයන් ඇසුරු කෙළේ වේ.

මහණෙනි, කෙසේ නම් මහසොර ගහන ස්ථානයන් ඇසුරු කෙළේ වේ ද: මහණෙනි, මෙ ලොව්හි මහසොර තණ ලැහැබ් හෝ රුක් ලැහැබ් හෝ මහවන ලැහැබ් හෝ ඇසුරු කෙළේ වෙයි. මහණෙනි, මෙසේ මහසොර ගහන ස්ථානයන් ඇසුරු කෙළේ වේ.

මහණෙනි, මහසොර කෙසේ නම් බලවතුන් ඇසුරු කෙළේ වේ ද: මහණෙනි, මෙ ලොව්හි මහසොර රජකු හෝ රජමහඇමතියන් හෝ ඇසුරු කෙළේ වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි 'ඉදින් කිසිවෙක් මට කිසිවක් කියන්නේ නම්, මේ රජවරු ද රජමහඇමැතියෝ ද මාගේ දෙස් සඟවා කරුණු කියන්නාහ'යි. ඉදින් කිසිවෙක් ඔහට කිසිවක් කියා නම්, ඒ රජවරු හෝ රජමහඇමතියෝ හෝ දෙස් සඟවා (ඔහුගේ නිදෙස්බවට) යුක්ති බෙණෙත්. මහණෙනි, මෙසේ මහසොර බලවතුන් ඇසුරු කෙළේ වේ. මහණෙනි, මේ අඞ්ග තුණෙන් යුත් මහසොර ගෘහසන්ධි ද සිඳුනේයි, වොලොංගැන්ම ද කරණේයි, එක්ගෙයක් පැහැරගැණුම ද කරණේයි. සඬපලා සොරකම්හි ද යෙදෙන්නේයි.

මහණෙනි, එපරිද්දෙන් ම දහම් තුණෙකින් යුත් ලාමක භික්‍ෂු ගුණවිසින් සාළු ගුණවිසින් තට ආත්මය පිරිවටයි. වරද සහිතයෙක් ද නුවණැත්තන් විසින් දෙස් කියයුත්තෙක් ද වෙ යි. බොහෝ පව් ද ප්‍රසව කෙරෙයි. කවර තුණෙකින යත්: මහණෙනි, මෙහි පවිටු මහණ විෂමස්ථාන ඇසුරු කෙළේත්, ගහනස්ථාන ඇසුරු කෙළේත් බලවතුන් ඇසුරු කෙළේත් වෙයි. මහණෙනි, පවිටු මහණ කෙසේ විෂමස්ථාන ඇසුරු කෙළේ වේ ද: මහණෙනි, මෙ සස්නෙහි පවිටු මහණ විෂම වූ කායකර්මයෙන් යුක්ත වෙයි, විෂම වූ වාක්කර්මයෙන් යුක්ත වෙයි, විෂම වූ මනඃකර්මයෙන් යුක්ත වෙයි. මහණෙනි, මෙසේ පවිටු මහණ විෂමස්ථාන ඇසුරු කෙළේ වේ.

මහණෙනි, කෙසේ නම් පවිටු මහණ ගහන නිඃශ්‍රිත වේ ද: මහණෙනි, මෙහි පවිටු මහණ අන්තග්‍රාහිකදෘෂ්ටියෙන් යුක්ත වූයේ මිසදිටු වේ නම්, මහණෙනි, මෙසේ පවිටු මහණ ගහන නිඃශ්‍රිත වේ.

මහණෙනි, පවිටු මහණ කෙසේ නම් බලවතුන් ඇසුරු කෙළේ වේ ද: මහණෙනි, මෙහි පවිටු මහණ රජුන් හෝ රජමහඇමතියන් ඇසුරු කෙළේ වේ. ඔහට මෙබඳු සිතෙක් වෙයි: 'ඉදින් මට කිසිවෙක් කිසිවක් කියන්නේ නම්, මේ රජවරු හෝ රජමහඇමතියෝ හෝ මාගේ දෙස් සඟවා යුක්ති බෙණෙත්. ඉදින් කිසිවෙක් ඔහට කිසිවක් කියා නම්, ඒ රජවරු හෝ රජමහඇමතියෝ හෝ ඔහුගේ දෙස් සඟවා යුක්ති බෙණෙති. මහණෙනි, මෙසේ පවිටු මහණ බලවතුන් ඇසුරු කෙළේ වේ. මහණෙනි, මේ ධර්ම තුණෙන් යුත් පවිටු මහණ ගුණවිසින් සාළු ගුණ විසින් තට ආත්මය පිරිවටයි. වරද සහිතයෙක් ද නුවණැත්තවුන් විසින් ගැරැහිය යුත්තෙක් ද වේ. බොහෝ පව් ද ප්‍රසව කෙරේ යි.

**පස්වන චූලවර්ගයයි**

**පළමු පණ්ණස නිමි.**

## 2. දුතියො පණ්ණාසකො.

## [ 1. බ්‍රාහ්මණවග්ගො ]

### 3. 2. 1. 1.

[සාවත්ථිනිදානං:]

1. අථ ඛො ද්වෙ බ්‍රාහ්මණා ජිණ්ණා වුද්ධා මහල්ලකා අද්ධගතා වයො අනුප්පත්තා වීසං[1] වස්සසතිකා ජාතියා, යෙන භගවා තෙනුපසංකමිංසු උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං[2] වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ බ්‍රාහ්මණා භගවන්තං එතදවොචුං: 'මයමස්සු භො ගොතම බ්‍රාහ්මණා ජිණ්ණා වුද්ධා මහල්ලකා අද්ධගතා වයො අනුප්පත්තා වීසං[1] වස්සසතිකා ජාතියා. තෙ චම්හා අකතකල්‍යාණා අකතකුසලා අකතභීරුත්තාණා. ඔවදතු නො භවං ගොතමො, අනුසාසතු නො භවං ගොතමො, යං අම්හාකං අස්ස දීඝරත්තං හිතාය සුඛායා'ති.

තග්ඝ තුම්හෙ බ්‍රාහ්මණා ජිණ්ණා වුද්ධා මහල්ලකා අද්ධගතා වයො අනුප්පත්තා වීසං[1] වස්සසතිකා ජාතියා. තෙ චත්ථ අකතකල්‍යාණා අකතකුසලා අකතභීරුත්තාණා. උපනීයති ඛො අයං බ්‍රාහ්මණා ලොකො ජරාය ව්‍යාධිනා මරණෙන. එවං උපනීයමානෙ ඛො බ්‍රාහ්මණා ලොකෙ ජරාය ව්‍යාධිනා මරණෙන, යො ඉධ කායෙන සංයමො, වාචාය සංයමො, මනසා සංයමො, තං තස්ස පෙතස්ස තාණඤ්ච ලෙණඤ්ච දීපඤ්ච සරණඤ්ච පරායණඤ්චාති.

1. උපනීයති ජීවිතමප්පමායු ජරූපනීතස්ස න සන්ති තාණා,
   එතං භයං මරණෙ පෙක්ඛමානො පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි.

2. යොධ කායෙන සඤ්ඤමො වාචාය උද චෙතසා,
   තං තස්ස පෙතස්ස සුඛාය හොති යං ජීවමානො පකරොති පුඤ්ඤන්ති.

### 3. 2. 1. 2.

2. අථ ඛො ද්වෙ බ්‍රාහ්මණා ජිණ්ණා වුද්ධා මහල්ලකා අද්ධගතා වයො අනුප්පත්තා වීසංවස්සසතිකා ජාතියා, යෙන භගවා තෙනුපසඞ්කමිංසු -පෙ- එකමන්තං නිසින්නා ඛො තෙ බ්‍රාහ්මණා භගවන්තං එතදවොචුං: මයමස්සු භො ගොතම බ්‍රාහ්මණා ජිණ්ණා වුද්ධා මහල්ලකා අද්ධගතා වයො අනුප්පත්තා වීසං වස්සසතිකා ජාතියා. තෙ චම්හා අකතකල්‍යාණා අකතකුසලා අකත-භීරුත්තාණා. ඔවදතු නො භවං ගොතමො, අනුසාසතු නො භවං ගොතමො, යං අම්හාකං අස්ස දීඝරත්තං හිතාය සුඛායාති.

---

1. වීසවස්ස සතිකා - මජසං. ස්‍යා 2. සාරණීයං - මජසං

## 2. දෙවන පණ්ණාසකය.

### [ 1. බ්‍රාහමණවග්ගය ]

#### 3. 2. 1. 1

**[සැවැත්නිදනයි:]**

1. එසමයෙහි ජරා ජීර්ණ වයෝ වෘද්ධ දෑමහලු තුන් විය ඉක්මවා සිටි පැසිම් වියට පැමිණි උපතින් එක්සිය විසි හැවිරිදි දෙබමුණු කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ඒ බමුණෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළහ: 'භවත් ගෞතමයන් වහන්ස අපි වනාහි ජරාජීර්ණ වයෝවෘද්ධ දෑ මහලු තුන් විය ඉක්මවා සිටි පැසිම් වියට පැමිණි උපතින් එක්සියවිසි හැවිරිදි බමුණු වම්හ. ඒ අපිදු නොකරණ ලද කලණ දහම් ඇත්තම්හ. නොකළ කුසල් ඇත්තම්හ. නොකළ භයපරිත්‍රාණ ඇත්තම්හ. යමක් අපට බොහෝකල් හිතසුව පිණිස වේ නම්, භවත් ගෞතමයෝ අපට එබඳු අවවාද කෙරෙත්වා. භවත් ගෞතමයෝ අපට අනුශාසනා කෙරෙත්වා' යි.

බ්‍රාහමණයෙනි, සැබව, තෙපි ජරාජීර්ණ වූවහු ම ය. වයසින් වැඩී සිටියහුම ය. දෑමහලු වූවහු ම ය. තුන්වයස් ඉක්ම සිටියහු ම ය. පැසිම් වියට පැමිණියහු ම ය. උපතින් එක්සියවිසි හැවිරිදි වූවහු ම ය. ඒ තෙපි නොකළ කලණදම් ඇත්තහු ය. නොකළ කුසල් ඇත්තහු ය. නොකළ භයපරිත්‍රාණ ඇත්තහුය. බ්‍රාහමණයෙනි, මේ ලෝවැසි ජරාව විසිතුදු ව්‍යාධිය විසිතුදු මරණය විසිතුදු (ඒ ඒ අවස්ථාවට) එළවනු ලැබේ. බ්‍රාහමණයෙනි, ලොකයා මෙසේ ජරාව විසිතුදු ව්‍යාධිය විසිතුදු මරණය විසිතුදු එළවනු ලබත්ම, මෙලොවදී කයින් යම් සංයමයෙක් වේ ද, වචනයෙන් යම් සංයමයෙක් වේ ද, සිතින් යම් සංයමයෙක් වේ ද, ඒ පිණ පරලොව ගිය ඔහට රක්ෂාස්ථාන ද නිලීයනස්ථාන (නැසෙන තැන) ද ප්‍රතිෂ්ඨාස්ථාන (දිවයින) ද ශරණ ද පරායණ (පිහිටීම) ද වේ.

1. ජීවිතය මරණය කරා පමුණුවනු ලබයි. ආයුෂය අල්ප වෙයි. ජරායෙන් ගෙණයන ලද්දහුට රක්ෂාස්ථානයෝ නැත. මරණයෙහි ලා මේ බිය දක්නේ සුව එළවන පින් කරන්නේ ය.

2. කයින් වේවයි වචනයෙන් වේවයි නොහොත් සිතින් වේවයි යම් සංයමයෙක් වේ ද, ජීවත්වනුයේ යම් පිණක් කෙරේ ද, ඒ පිණ පරලොව ගිය ඔහට සුව පිණිස වේ.

#### 3. 2. 1. 2

2. එකල්හි ජරාජීර්ණ වයෝ වෘද්ධ දෑමහලු තුන්වයස් පැනගිය පැසිම්-වයසට පැමිණි උපතින් එක්සියවිසිහැවිරිදි දෙබමුණු කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. ...එකත්පස්ව හුන් ඒ බ්‍රාහමණයෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ: භවත් ගෞතමයන් වහන්ස, අපි ජරාජීර්ණ වයෝවෘද්ධ මහලු තුන් වයස් පැනගිය පැසිම් වියට පැමිණි උපතින් එක්සිය-විසිහැවිරිදි බමුණම්හ. ඒ අපිදු නොකළ කලණදහම් ඇතියම්හ. නොකළ කුසල් ඇතියම්හ. නොකළ භයපරිත්‍රාණ ඇත්තම්හ. යමක් අපට බොහෝ කලක් හිත පිණිස සුව පිණිස වේ නම්, භවත් ගෞතමයන් වහන්සේ අපට එසේ අවවාද කරණ සේක්වා. භවත් ගෞතමයන් වහන්සේ අපට එසේ අනුශාසනා කරණ සේක්වා.

තග්ඝ තුම්හෙ බ්‍රාහ්මණා ජිණ්ණා වුඩ්ඪා මහල්ලකා අද්ධගතා වයො අනුප්පත්තා වීසං වස්සසතිකා ජාතියා. තෙ චත්ථ අකතකල්‍යාණා අකතකුසලා අකතභීරුත්තාණා. ආදිත්තො ඛො අයං බ්‍රාහ්මණා ලොකො ජරාය ව්‍යාධිනා මරණෙන. එවං ආදිත්තෙ ඛො බ්‍රාහ්මණා ලොකෙ ජරාය ව්‍යාධිනා මරණෙන යො ඉධ කායෙන සඤ්ඤමො, වාචාය සඤ්ඤමො, මනසා සඤ්ඤමො. තං තස්ස පෙතස්ස තාණං ච ලෙනඤ්ච දීපඤ්ච සරණඤ්ච පරායණඤ්චාති.

3. ආදිත්තස්මිං අගාරස්මිං යං නීහරති භාජනං,
තං තස්ස හොති අත්ථාය නො ච යං තත්ථ ඩය්හති.

4. එවං ආදිපිතො[1] ලොකො ජරාය මරණෙන ච,
නීහරෙථෙව දානෙන දින්නං හොති සුනීහටං.[2]

5. යො'ධ කායෙන සඤ්ඤමො වාචාය උද චෙතසා,
තං තස්ස පෙතස්ස සුඛාය හොති යං ජීවමානො පකරොති පුඤ්ඤානි.

## 3. 2. 1. 3.

3. අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: සන්දිට්ඨිකො ධම්මො 'සන්දිට්ඨිකො ධම්මො'ති භො ගොතම වුච්චති, කිත්තාවතා නු ඛො භො ගොතම සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[3] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

රත්තො ඛො බ්‍රාහ්මණ, රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තව්‍යාබාධායපි චෙතෙති, පරව්‍යාබාධායපි චෙතෙති, උභයව්‍යාබාධායපි චෙතෙති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. රාගෙ පහීනෙ නෙවත්තව්‍යාබාධායපි චෙතෙති, න පරව්‍යාබාධායපි චෙතෙති, න උභයව්‍යාබාධායපි චෙතෙති, න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති, එවම්පි ඛො බ්‍රාහ්මණ සන්දිට්ඨිකො ධම්මො හොති -පෙ- දුට්ඨො ඛො බ්‍රාහ්මණ දොසෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තව්‍යාබාධායපි චෙතෙති, පරව්‍යාබාධායපි -පෙ- උභයව්‍යාබාධායපි චෙතෙති. චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. දොසෙ පහීනෙ නෙවත්තව්‍යාබාධායපි චෙතෙති. න පරව්‍යාබාධායපි -පෙ- න උභයව්‍යාබාධායපි චෙතෙති. න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවම්පි ඛො බ්‍රාහ්මණ සන්දිට්ඨිකො ධම්මො හොති -පෙ- මූළ්හො ඛො බ්‍රාහ්මණ මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තව්‍යාබාධායපි චෙතෙති. පරව්‍යාබාධායපි -පෙ- උභයව්‍යාබාධායපි චෙතෙති. චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. මොහෙ පහීනෙ නෙවත්තව්‍යාබාධායපි චෙතෙති, න පරව්‍යාබාධායපි චෙතෙති. න උභයව්‍යාබාධායපි චෙතෙති. න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවං ඛො බ්‍රාහ්මණ සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති

1. ආදිත්තා ඛො-මජ්ඣං - එවං ආදිත්තෙ ඛො - සයා. 2. සුනීහතං - මජ්ඣං - සයා. PTS
3. ඔපනෙය්‍යිකො - මජ්ඣං

සැබව, බ්‍රාහ්මණයෙනි, තෙපි ජරාජීර්ණවූහු, වයොවෘද්ධවූහු, මහලුවූහු, ගතවයස් ඇතියහු, පැසිම්වියට ද පැමිණියහු, උපතින් එක්සියවිසිහැවිරිදි වූහු ම ය. ඒ තෙපිදු නොකළ කලණදහම් ඇත්තහු ය, නොකළ කුසල් ඇත්තහු ය, නොකළ භයපරිත්‍රාණ ඇත්තහු ය. බ්‍රාහ්මණයෙනි, මේ ලෝකය ජරාව විසිනුදු ව්‍යාධිය විසිනුදු මරණය විසිනුදු ඇවිළ ගන්නා ලද්දේ ය. බ්‍රාහ්මණයෙනි, මෙසේ ජරාව විසිනුදු ව්‍යාධිය විසිනුදු මරණය විසිනුදු ලෝකය ඇවිළ ගණුත් ම මෙහි කයින් යම් සංයමයෙක් වේ ද, වචනයෙන් යම් සංයමයෙක් වේ ද, වැලිත් මනසින් යම් සංයමයෙක් වේ ද, එය පරලොව ගිය ඔහට ආරක්‍ෂාස්ථාන ද නිලීයනස්ථාන ද ප්‍රතිෂ්ඨාස්ථාන ද ශරණස්ථාන ද පරායණස්ථාන ද වේ යි.

3. ගෙය ඇවිළගත් කල්හි යම් බඳුනක් බැහැර කෙරේ ද, එය ගෙහිමි ඔහුට වැඩ පිණිස වෙයි. යම් බඳුනෙක් එහි දැවේ නම්, එය වැඩ පිණිස නො වෙයි.

4. මෙසේ ජරාව විසිනුදු මරණය විසිනුදු ලෝවැසි හාත්පසින් ඇවිළ ගන්නා ලද්දේ ය. දීමෙන් ම බැහැර කරගත්තේ ය. දෙන ලද්ද මොනොවට නෙරණ ලද්දේ වේ.

5. මෙහි කයින් යම් සංයමයෙක් වේ ද, වැලිත් වචනයෙන් යම් සංයමයෙක් වේ ද, සිතින් යම් සංයමයෙක් වේ ද, ජීවත් වනුයේ යම් පිනක් කරයි ද එය පරලොව ගිය ඔහට සුව පිණිස වේ යි.

## 3. 2. 1. 3

3. එකල්හි එක්තරා බමුණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය ... එකත්පස්ව හුන් ඒ බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, 'ධර්මය සාංදෘෂ්ටිකය, ධර්මය සාංදෘෂ්ටිකය' යි කියනු ලැබේ. භවත් ගෞතම-යන් වහන්ස, කොපමණෙකින් ධර්මය සාංදෘෂ්ටික වේ ද? අකාලික වේ ද? 'එව, බලව' යන විධියට සුදුසු වේ ද? උපනයනාශී වේ ද? නුවණැත්තන් විසින් තමා සතන්හි ලා දතයුතු වේ ද? යි.

බ්‍රාහ්මණය, රාගයෙන් ඇලුනේ රාගයෙන් මැඩුනේ රාගයෙන් ගත් සිත් ඇත්තේ, තමාට පීඩා පිණිස ද සිතයි, මෙරමාහට පීඩා පිණිස ද සිතයි. දෙපසට ම පීඩා පිණිස ද සිතයි. චෛතසික වූ දුක්දෙම්නස් විඳියි. රාගය ප්‍රහත වූ කල්හි ආත්ම පීඩාව පිණිස නොම සිතයි. මෙරමාහට පීඩා පිණිස නොම සිතයි. දෙපසට ම පීඩා පිණිස නොම සිතයි. චෛතසික දුක්දෙම්නස් නොවිඳියි. බ්‍රාහ්මණය, මෙසේත් ධර්මය සාංදෘෂ්ටික වේ. ... බ්‍රාහ්මණය, ද්වෙෂයෙන් දුෂ්ට වූයේ මඩනා ලද්දේ ගත් සිත් ඇත්තේ ආත්මපීඩා පිණිස ද සිතයි. ... දෙපසට ම පීඩා පිණිස ද සිතයි, මානසික දුක්දෙම්නස් විඳියි. ද්වෙෂය ප්‍රහත වත් ම ආත්මපීඩාව පිණිස නො සිතයි. මෙරමාහට ... දෙපසට ම පීඩා පිණිස නො සිතයි. මානසික දුක් දෙම්නස් නො විඳියි ... බ්‍රාහ්මණය, මෙසේත් ධර්මය සාංදෘෂ්ටික වෙයි. බ්‍රාහ්මණය, මොහයෙන් මුළා වූයේ මඩනා ලද්දේ ගත් සිත් ඇත්තේ ආත්මපීඩාව පිණිස ද සිතයි. මෙරමා-හට ... දෙපසට ම පීඩා පිණිස ද සිතයි. මානසික දුක්දෙම්නස් ද විඳියි. මෝහය ප්‍රහතවත් ම ආත්මපීඩාව පිණිස ද නො සිතයි. මෙරමාහට .. පීඩා පිණිස ද ... දෙපසට ම පීඩා පිණිස ද නො සිතයි. මානසික වූ දුක්දෙම්නස් නො විඳියි. බමුණ, මෙසේ වනාහි ධර්මය සාංදෘෂ්ටික වෙයි. කල් නොයවා විපාක දෙන්නේ වේ. 'එව බලව' යන විධියට සුදුසු වේ. උපනයනාශී වේ. නුවණැත්තන් විසින් තමා සතන්හි එළවා දත යුතු වේ යයි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනව ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් කොට දිවියෙන් සරණ ගිය උපාසකයකු කොට මා දරණසේක්වා යි.

**3. 2. 1. 4.**

4. අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණපරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණපරිබ්බාජකො භගවන්තං එතදවොච: සන්දිට්ඨිකො ධම්මො සන්දිට්ඨිකො ධම්මොති භො ගොතම වුච්චති, කිත්තාවතා නු ඛො භො ගොතම සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

රත්තො ඛො බ්‍රාහ්මණ රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තබ්‍යාබාධායපි චෙතෙති, පරබ්‍යාබාධායපි චෙතෙති, උභයබ්‍යාබාධායපි චෙතෙති. චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. රාගෙ පහීණෙ නෙවත්තබ්‍යාබාධායපි චෙතෙති, න පරබ්‍යාබාධායපි චෙතෙති, න උභයබ්‍යාබාධායපි චෙතෙති. න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති.

රත්තො ඛො බ්‍රාහ්මණ රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති, රාගෙ පහීණෙ නෙව කායෙන දුච්චරිතං චරති, න වාචාය දුච්චරිතං චරති, න මනසා දුච්චරිතං චරති. රත්තො ඛො බ්‍රාහ්මණ රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තත්ථම්පි යථාභූතං නප්පජානාති, පරත්ථම්පි යථාභූතං නප්පජානාති, උභයත්ථම්පි යථාභූතං නප්පජානාති. රාගෙ පහීණෙ අත්තත්ථම්පි යථාභූතං පජානාති, පරත්ථම්පි යථාභූතං පජානාති, උභයත්ථම්පි යථාභූතං පජානාති. එවම්පි ඛො බ්‍රාහ්මණ සන්දිට්ඨිකො ධම්මො හොති -පෙ-

දුට්ඨො ඛො බ්‍රාහ්මණ දොසෙන -පෙ- මූළ්හො ඛො බ්‍රාහ්මණ මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තබ්‍යාබාධායපි චෙතෙති, පරබ්‍යාබාධායපි -පෙ- උභයබ්‍යාබාධායපි චෙතෙති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. මොහෙ පහීණෙ නෙවත්තබ්‍යාබාධායපි චෙතෙති, න පරබ්‍යාබාධායපි චෙතෙති, න උභයබ්‍යාබාධායපි චෙතෙති. න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති.

මූළ්හො ඛො බ්‍රාහ්මණ මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. මොහෙ පහීණෙ නෙව කායෙන දුච්චරිතං චරති, න වාචාය දුච්චරිතං චරති, න මනසා දුච්චරිතං චරති. මූළ්හො ඛො බ්‍රාහ්මණ මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තත්ථම්පි යථාභූතං නප්පජානාති. පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි යථාභූතං නප්පජානාති. මොහෙ පහීණෙ අත්තත්ථම්පි යථාභූතං පජානාති, පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි යථාභූතං පජානාති. එවං ඛො බ්‍රාහ්මණ සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

**3. 2. 1. 4.**

4. එකල්හි එක්තරා බමුණු පිරිවැජියෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. ... එකත්පස්ව හුන් ඒ බමුණු පිරිවැජි භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය: 'භවත් ගෞතමයන් වහන්ස, 'ධර්මය සාංදෘෂ්ටිකය, ධර්මය සාංදෘෂ්ටිකය'යි කියනු ලැබේ. භවත් ගෞතමයන් වහන්ස, කොපමණෙකින් ධර්මය සාංදෘෂ්ටික වේ ද, අකාලික වේ ද, එහිපස්සික වේ ද, ඕපනයික වේ ද, නුවණැත්තන් විසින් සියසතන්හි ලා දත යුතු වේ දැ?'යි.

බ්‍රාහ්මණය, රාගයෙන් අනුරක්ත වූයේ මඩනා ලද්දේ ගත් සිත් ඇත්තේ තමහට පීඩා පිණිස ද සිතයි. මෙරමාහට ... දෙපසට ම පීඩා පිණිස ද සිතයි. මානසික දුක් දොම්නස් විඳියි. රාගය ප්‍රහීණ වත් ම තමහට පීඩා පිණිස ද නො ම සිතයි. මෙරමාහට ... දෙපසට ම පීඩා පිණිස ද නො ම සිතයි. මානසික දුක් දොම්නස් නො ම විඳියි.

බ්‍රාහ්මණය, රාගයෙන් අනුරක්ත වූයේ මඩනා ලද්දේ ගත් සිත් ඇත්තේ කයින් දුසිරිත් කරයි. වචනයෙන් ... සිතින් දුසිරිත් කරයි. රාගය ප්‍රහීණවත් ම කයින් දුසිරිත් නො ම කරයි. වචනයෙන් ... සිතින් දුසිරිත් නො ම කරයි.

බමුණ, රාගයෙන් අනුරක්ත වූයේ මඩනා ලද්දේ ගත් සිත් ඇත්තේ ආත්මාර්ථය ද තත්වූ පරිද්දෙන් නො දනියි. පරාර්ථය ද ... උභයාර්ථය ද තත් වූ පරිද්දෙන් නො දනියි. රාගය ප්‍රහීණ වත්ම ආත්මාර්ථය ද තත් වූ පරිද්දෙන් දැනගණියි. පරාර්ථය ද ... උභයාර්ථය ද තත්වූ පරිද්දෙන් දැනගණියි. බ්‍රාහ්මණය, මෙසේ ද ධර්මය සාංදෘෂ්ටික වෙයි. ...

බ්‍රාහ්මණය, ද්වේෂයෙන් දුෂ්ට වූයේ ... බ්‍රාහ්මණය, මෝහයෙන් මූඪ වූයේ මඩනා ලද්දේ ගත් සිත් ඇත්තේ තමහට පීඩා පිණිස ද සිතයි. මෙරමාහට ... දෙපසට ම පීඩා පිණිස ද සිතයි. මානසික දුක් දොම්නස් විඳියි. මෝහය ප්‍රහීණවත් ම තමහට පීඩා පිණිස ද නො සිතයි. මෙරමාහට පීඩා පිණිස ද නො සිතයි. දෙපසට ම පීඩා පිණිස ද නො සිතයි. මානසික දුක් දොම්නස් නොම විඳියි.

බ්‍රාහ්මණය, මෝහයෙන් මූඪ වූයේ මඩනා ලද්දේ ගත් සිත් ඇත්තේ කයින් දුසිරිත් කරයි. වචනයෙන් දුසිරිත් කරයි. සිතින් දුසිරිත් කරයි. මෝහය ප්‍රහීණ වත් ම කයින් දුසිරිත් නො ම කරයි. වචනයෙන් ... මනසින් දුසිරිත් නො ම කරයි.

බමුණ, මෝහයෙන් මූඪ වූයේ මඩනා ලද්දේ ගත් සිත් ඇත්තේ ආත්මාර්ථය ද තත්වූ පරිද්දෙන් නො දනියි. පරාර්ථය ද ... උභයාර්ථය ද තත්වූ පරිද්දෙන් නො දනියි. මෝහය ප්‍රහීණ වත්ම ආත්මාර්ථය ද තත්වූ පරිද්දෙන් දැනගණියි. පරාර්ථය ද ... උභයාර්ථය ද තත්වූ පරිද්දෙන් දැනගණියි. බ්‍රාහ්මණය, මෙසේ වනාහි ධර්මය සාංදෘෂ්ටික ද අකාලික ද එහිපස්සික ද ඕපනයික ද නුවණැත්තන් විසින් තමන් සතන්හි ලා දතයුත්තේ ද වේ.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනව ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවියෙන් සරණ ගිය උවසුවකු කොට දරණ සේක්වා යි.

### 3. 2. 1. 5.

5. අථ ඛො **ජානුස්සොණි** බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ජානුස්සොණි බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: 'සන්දිට්ඨිකං නිබ්බානං සන්දිට්ඨිකං නිබ්බානන්ති' භො ගොතම වුච්චති. කිත්තාවතා නු ඛො භො ගොතම සන්දිට්ඨිකං නිබ්බානං හොති අකාලිකං එහිපස්සිකං ඔපනයිකං පච්චත්තං වෙදිතබ්බං විඤ්ඤූහීති?

රත්තො ඛො බ්‍රාහ්මණ රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තබ්‍යාබාධායපි චෙතෙති, පරබ්‍යාබාධායපි චෙතෙති, උභයබ්‍යාබාධායපි චෙතෙති. චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. රාගෙ පහීණෙ නෙවත්තබ්‍යාබාධාය පි චෙතෙති, න පරබ්‍යාබාධාය පි චෙතෙති, න උභයබ්‍යාබාධාය පි චෙතෙති, න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවං ඛො* බ්‍රාහ්මණ සන්දිට්ඨිකං නිබ්බානං හොති.

දුට්ඨො ඛො බ්‍රාහ්මණ දොසෙන -පෙ- මූළ්හො ඛො බ්‍රාහ්මණ මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තබ්‍යාබාධායපි චෙතෙති, පරබ්‍යාබාධායපි චෙතෙති, උභයබ්‍යාබාධායපි චෙතෙති. චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. මොහෙ පහීණෙ නෙවත්තබ්‍යාබාධාය පි චෙතෙති, න පරබ්‍යාබාධාය පි චෙතෙති, න උභයබ්‍යාබාධායපි චෙතෙති. න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවං ඛො* බ්‍රාහ්මණ සන්දිට්ඨිකං නිබ්බානං හොති.

යතො ච ඛො අයං බ්‍රාහ්මණ අනවසෙසං රාගක්ඛයං පටිසංවෙදෙති, අනවසෙසං දොසක්ඛයං පටිසංවෙදෙති, අනවසෙසං මොහක්ඛයං පටිසංවෙදෙති. එවං ඛො බ්‍රාහ්මණ සන්දිට්ඨිකං නිබ්බානං හොති අකාලිකං එහිපස්සිකං ඔපනයිකං පච්චත්තං වෙදිතබ්බං විඤ්ඤූහීති.

අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

### 3. 2. 1. 6.

6. අථ ඛො **අඤ්ඤතරො** බ්‍රාහ්මණමහාසාලො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණමහාසාලො භගවන්තං එතදවොච: 'සුතං මෙතං භො ගොතම පුබ්බකානං බ්‍රාහ්මණානං වුඩ්ඪානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං: '[1]පුබ්බස්සුදං අයං ලොකො අවීචිමඤ්ඤෙ ඵුටො† හොති මනුස්සෙහි, කුක්කුටසම්පාතිකා ගාමනිගමරාජධානියො'ති. කො නු ඛො භො ගොතම හෙතු, කො පච්චයො යෙනෙතරහි මනුස්සානං ඛයො හොති, තනුත්තං පඤ්ඤායති, ගාමාපි අගාමා හොන්ති, නිගමාපි අනිගමා හොන්ති, නගරාපි අනගරා හොන්ති, ජනපදාපි අජනපදා හොන්තී'ති.

---

1. පුබ්බස්සුදං - මජ්සං.

* එවම්පි ඛො - මජ්සං.   † ඵුටො අහොසි - මජ්සං.

### 3. 2. 1. 5.

5. එකල්හි ජානුස්සොණි බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පස්ව හුන් ජානුස්සොණි බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, ‘නිර්වාණය සාංදෘෂ්ටිකය: නිර්වාණය සාංදෘෂ්ටිකය’ යි කියනු ලැබේ. භවත් ගෞතමයන් වහන්ස, කොපමණෙකින් නිර්වාණය සාංදෘෂ්ටික වේ ද, අකාලික වේ ද, එහිපස්සික වේ ද, ඔපනයික වේ ද, නුවණැත්තන් විසින් තමන් සතන්හි ලා දතයුතු වේදැ?’යි.

බමුණ, රාගයෙන් ඇලුනේ රාගයෙන් මැඩුනේ, රාගයෙන් ගත් සිත්-ඇත්තේ තමාට පීඩා පිණිස ද සිතයි ... දෙපසට ම පීඩා පිණිස ද සිතයි. චෛතසික දුක් දොම්නස් ද විඳියි. රාගය ප්‍රහීණ වත් ම තමාට පීඩා පිණිස ද නො සිතයි, මෙරමාහට පීඩා පිණිස ද නො සිතයි, දෙපසට පීඩා පිණිස ද නො සිතයි. චෛතසික දුක් දොම්නස් ද නො විඳියි. බ්‍රාහමණය, මෙසේත් නිර්වාණය සාංදෘෂ්ටික වේ.

බමුණ, ද්වේෂයෙන් දුෂ්ට වූයේ ... බ්‍රාහමණය, මෝහයෙන් මූඪ වූයේ මෝහයෙන් මැඩුනේ මෝහයෙන් ගත් සිත් ඇත්තේ තමාට පීඩා පිණිස ද සිතයි. මෙරමාහට පීඩා පිණිස ද සිතයි. දෙපසට ම පීඩා පිණිස ද සිතයි. චෛතසික දුක් දොම්නස් ද විඳියි. බමුණ, ද්වේෂය ප්‍රහීණ වත් ම .. මෝහය ප්‍රහීණ වත් ම තමාට පීඩා පිණිස නො සිතයි. මෙරමාහට පීඩා පිණිස නො සිතයි. දෙපසට ම පීඩා පිණිස නො සිතයි. චෛතසික වූ දුක් දොම්නස් නො විඳියි. බමුණ, මෙසේත් නිර්වාණය සාංදෘෂ්ටික වේ.

බමුණ, යම් තැනෙක පටන් කොට මෙ තෙමේ නිරවශේෂයෙන් රාගක්‍ෂය (සඞ්ඛ්‍යාත නිර්වාණය) ප්‍රත්‍යක්‍ෂ කෙරේ ද, නිරවශේෂයෙන් ද්වෙෂක්‍ෂය ප්‍රත්‍යක්‍ෂ කෙරේ ද, නිරවශේෂයෙන් මෝහක්‍ෂය ප්‍රත්‍යක්‍ෂ කෙරේ ද, බ්‍රාහමණය, මෙසේ වනාහි නිර්වාණය සාංදෘෂ්ටික වෙයි, අකාලික වෙයි, එහිපස්සික වෙයි, ඔපනයික වෙයි, නුවණැත්තන් විසින් තමන් සතන්හි ලා දතයුතු වේ යි.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් කොට දිවියෙන් සරණ ගිය උවසුවකු කොට මා දරණ සේක්වා යි.

### 3. 2. 1. 6

6. එකල්හි එක්තරා මහසල්කුල බමුණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... එකත්පසෙක හුන් බමුණු මහසල් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: ‘භවත් ගෞතමයන් වහන්ස, ‘පෙර වනාහි මේ ලෝකය මිනිසුන් විසින් අවීචිය සේ නිරතුරු පිරුණේ වෙයි. ගම් නියම්ගම් රජදහන්හු (කුකුළකු විසින් පියාසරින් යා හැකි පමණ තුදුරෙහි වූ පියසි ඇති බැවින්) කුක්කුට සම්පාතික වූහ’ යි. පෙර විසූ වෘද්ධවූ මහලු වූ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍ය වූ බණන බමුණන් අතින් මවිසින් අසනලදී’ යි.

භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයෙකින් දැන් මිනිසුන්ගේ අඩුවෙක් වේ නම්, තුනී බවෙක් පැණේ නම්, ගම්දු නොගම් වේ නම්, නියම්ගම්දු නො නියම්ගම් වේ නම්, නුවර නො නුවර වේ නම්, දනවූ නොදනවූ වේ නම්, එයට හේතු කවර? එයට ප්‍රත්‍යය කවර’යි විචාළේ ය.

එතරහි බ්‍රාහ්මණ මනුස්සා අධම්මරාගරත්තා විසමලොභාභිභූතා මිච්ඡාධම්මපරෙතා තෙ අධම්මරාගරත්තා විසමලොභාභිභූතා මිච්ඡාධම්මපරෙතා තිණ්හානි සත්ථානි ගහෙත්වා අඤ්ඤමඤ්ඤං[1] ජීවිතා වොරොපෙන්ති. තෙන බහූ මනුස්සා කාලං කරොන්ති. අයම්පි ඛො බ්‍රාහ්මණ හෙතු, අයං පච්චයො යෙනෙතරහි මනුස්සානං ඛයො හොති, තනුත්තං පඤ්ඤායති, ගාමාපි අගාමා හොන්ති, නිගමාපි අනිගමා හොන්ති, නගරාපි අනගරා හොන්ති, ජනපදාපි අජනපදා හොන්ති.

පුන ච පරං බ්‍රාහ්මණ එතරහි මනුස්සා අධම්මරාගරත්තා විසමලොභාභිභූතා මිච්ඡාධම්මපරෙතා. තෙසං අධම්මරාගරත්තානං විසමලොභාභිභූතානං මිච්ඡාධම්මපරෙතානං දෙවො න සම්මා ධාරං අනුප්පවෙච්ඡති. තෙන දුබ්භික්ඛං හොති දුස්සස්සං සෙතට්ඨිකං සලාකාවුත්තං. තෙන බහූ මනුස්සා කාලං කරොන්ති. අයම්පි ඛො බ්‍රාහ්මණ හෙතු, අයං පච්චයො යෙනෙතරහි මනුස්සානං ඛයො හොති, තනුත්තං පඤ්ඤායති, ගාමාපි අගාමා හොන්ති, නිගමාපි -පෙ- ජනපදාපි අජනපදා හොන්ති.

පුන ච පරං බ්‍රාහ්මණ එතරහි මනුස්සා අධම්මරාගරත්තා විසමලොභාභිභූතා මිච්ඡාධම්මපරෙතා. තෙසං අධම්මරාගරත්තානං විසමලොභාභිභූතානං මිච්ඡාධම්මපරෙතානං යක්ඛා වාළෙ මනුස්සෙ ඔස්සජන්ති.[2] තෙන බහූ මනුස්සා කාලං කරොන්ති. අයම්පි ඛො බ්‍රාහ්මණ හෙතු, අයං පච්චයො යෙනෙතරහි මනුස්සානං ඛයො හොති, තනුත්තං පඤ්ඤායති, ගාමාපි අගාමා හොන්ති, නිගමාපි අනිගමා හොන්ති, නගරාපි අනගරා හොන්ති, ජනපදාපි අජනපදා හොන්තීති.

අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 3. 2. 1. 7.

7. අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: 'සුතං මෙ තං භො ගොතම' සමණො ගොතමො එවමාහ: මය්හමෙව දානං දාතබ්බං, නාඤ්ඤෙසං දානං දාතබ්බං, මය්හමෙව සාවකානං දානං දාතබ්බං, නාඤ්ඤෙසං සාවකානං දානං දාතබ්බං, මය්හමෙව දින්නං මහප්ඵලං, නාඤ්ඤෙසං දින්නං මහප්ඵලං, මය්හමෙව සාවකානං දින්නං මහප්ඵලං, නාඤ්ඤෙසං සාවකානං දින්නං මහප්ඵලන්ති.'

1. අඤ්ඤමඤ්ඤස්ස - සබ්බත්ථ    2. අමනුස්සෙ ඔස්සජ්ජන්ති - මජ්සං.

බමුණ, මෙකල වනාහි මනුෂ්‍යයෝ අධර්මරාගයෙන් රත් වූවාහු විෂම-ලෝභයෙන් මැඩුනාහු, මිථ්‍යාධර්මයෙන් යුක්ත වෙති. අධර්මරාගයෙන් රත් වූ විෂමලෝභයෙන් මැඩුනු, මිථ්‍යාධර්මයෙන් යුක්ත වූ ඔහු තියුණු සැත් ගෙණ උනුන් දිවි තොර කෙරෙත්. එයින් බොහෝ මිනිස්සු කලුරිය කෙරෙත්. යම් හෙයෙකින් මෙකල මිනිසුන්ගේ අඩුවෙක් වේ නම්, තුනු බවෙක් පැණේ නම්, ගමුදු නො ගම් වේ නම්, නියම්ගමුදු නො නියම්ගම් වේ නම්, නුවර දු නො නුවර වේ නම්, දනවුදු නො දනවු වේ නම්, මේ එයට හේතු වෙයි. මේ එයට ප්‍රත්‍යය වේ.

වැලිදු බමුණ, මෙකල මිනිස්සු අධර්මරාගයෙන් රත් වූවාහු, විෂමලෝභ-යෙන් මැඩුනාහු, මිථ්‍යාධර්මයෙන් යුක්ත වෙති. අධර්මරාගයෙන් රත් වූ විෂම-ලෝභයෙන් මැඩුනු, මිථ්‍යාධර්මයෙන් යුක්ත වූ ඔවුනට මේඝය මැනවින් වැසි දහර නො පවත්වයි. එයින් දුර්භික්ෂ වෙයි. ශස්‍යයෝ විෂමපාකී වෙති. සෙතට්ඨිකා නම් ශස්‍යරෝගය වෙයි. වපුල ධාන්‍යය ඉරටු ම වෙයි. එයින් බොහෝ මිනිස්සු කලුරිය කෙරෙති. බමුණ, යම් හෙයෙකින් මෙකල මිනිසුන්-ගේ අඩුවෙක් වේ නම්, තුනුබවෙක් පැණේ නම්, ගමුදු නොගම් වේ නම්, නියම් ගමුදු ... දනවුදු නොදනවු වේ නම්, මෙ ද එයට හේතු වෙයි. එයට ප්‍රත්‍යය වේ.

වැලිදු බමුණ, මෙකල මිනිස්සු අධර්මරාගයෙන් රත්වූවාහු, විෂම්ලෝභයෙන් මැඩුනාහු මිථ්‍යාධර්මයෙන් යුක්ත වෙති. අධර්මරාගයෙන් රත් වූ විෂම-ලෝභයෙන් මැඩුනු මිථ්‍යාධර්මයෙන් යුක්ත වූ ඔවුනට යක්ෂයෝ සැඩයකුන් මුදා හරිති. එයින් බොහෝ මිනිස්සු කලුරිය කෙරෙති. බමුණ, යම් හෙයෙකින් මෙකල මිනිසුන්ගේ අඩුවෙක් වේ නම්, තුනුබවෙක් පැණේ නම්, ගමුදු නොගම් වේ නම්, නියම්ගමුදු නොනියම්ගම් වේ නම්, නුවරදු නොනුවර වේ නම්, දනවු දු නොදනවු වේ නම්, මෙ ද එයට හේතු වේ. මෙ ද එයට ප්‍රත්‍යය වේ.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැව...භවත් ගෞතමයන් වහන්සේ අද පටන් කොට දිවියෙන් ගත් සරණ ගිය උවසුවකු කොට මා දරණ සේක්වා' යි.

### 3. 2. 1. 7.

7. එකල්හි **වච්ඡගොත්ත** පිරිවැජ් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... එකත්පසෙක හුන් වච්ඡගොත්ත පිරිවැජ් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කෙළේ ය:

භවත් ගෞතමයන් වහන්ස, මා විසින් මෙය අසන ලදි: 'ශ්‍රමණ ගෞතමයෝ මෙසේ කියති'යි. "මට ම දන් දිය යුතු ය. අන්හට දන් නො දිය යුතුය. මාගේ ම සව්වනට දන් දිය යුතුය. අනුන්ගේ සව්වනට දන් නො දිය යුතු ය. මට ම දුන් දය මහත්ඵලය. අන්හට දුන් දය මහත්ඵල නො වෙයි. මාගේ ම සව්වනට දුන් දය මහත්ඵල ය. අන් සව්වනට දුන් දය මහත්ඵල නො වේ" යි.

යෙ තෙ භො ගොතම එවමාහංසු: සමණො ගොතමො එවමාහ: 'මය්හමෙව දානං දාතබ්බං, නාඤ්ඤෙසං දානං දාතබ්බං -පෙ- මය්හමෙව සාවකානං දින්නං මහප්ඵලං, නාඤ්ඤෙසං සාවකානං දින්නං මහප්ඵලන්ති, කච්චි තෙ භොතො ගොතමස්ස වුත්තවාදිනො? න ච භවන්තං ගොතමං අභූතෙන අබ්භාචික්ඛන්ති? ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොන්ති? න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡති? අනබ්භක්ඛාතුකාමා හි මයං භවන්තං ගොතම'න්ති.

යෙ තෙ වච්ඡ එවමාහංසු: 'සමණො ගොතමො එවමාහ: මය්හමෙව දානං දාතබ්බා -පෙ- නාඤ්ඤෙසං සාවකානං දින්නං මහප්ඵල'න්ති, න මෙ තෙ වුත්තවාදිනො, අබ්භාචික්ඛන්ති ච පන මං[1] තෙ අසතා අභූතෙන. යො ඛො වච්ඡ පරං දානං දදන්තං වාරෙති, සො තිණ්ණං අන්තරායකරො හොති, තිණ්ණං පාරිපන්ථිකො. කතමෙසං තිණ්ණං: දායකස්ස පුඤ්ඤන්තරායකරො හොති, පටිග්ගාහකානං ලාභන්තරායකරො හොති. පුබ්බෙව ඛො පනස්ස අත්තා ඛතො ච හොති උපහතො ච. යො ඛො වච්ඡ පරං දානං දදන්තං වාරෙති, සො ඉමෙසං තිණ්ණං අන්තරායකරො හොති, තිණ්ණං පාරිපන්ථිකො.

අහං ඛො පන වච්ඡ එවං වදාමි: 'යෙපි තෙ චන්දනිකාය වා ඔළිගල්ලෙ වා පාණා, තත්‍රපි යො ථාලිධොවනං වා සරාවධොවනං වා ඡඩ්ඩෙති, යෙ තත්‍ථ පාණා, තෙ තෙන යාපෙන්තූ'ති. තතො නිදානම්පහං වච්ඡ පුඤ්ඤස්ස ආගමං වදාමි. කො පන වාදො මනුස්සභූතෙ. අපි චාහං වච්ඡ සීලවතො දින්නං මහප්ඵලං වදාමි, නො තථා දුස්සීලෙ.[2] සො ච හොති, පඤ්චඞ්ගවිප්පහීණො පඤ්චඞ්ගසමන්නාගතො. කතමානි පඤ්චඞ්ගානි පහීණානි හොන්ති: කාමච්ඡන්දො පහීණො හොති, ව්‍යාපාදො පහීණො හොති, ථීනමිද්ධං පහීණං හොති. උද්ධච්චකුක්කුච්චං පහීණං හොති, විචිකිච්ඡා පහීණා හොති. ඉමානි පඤ්චඞ්ගානි පහීණානි හොන්ති.

කතමෙහි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො හොති: අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති. අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති. ඉමෙහි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො හොති. ඉති පඤ්චඞ්ගවිප්පහීණෙ පඤ්චඞ්ගසමන්නාගතෙ දින්නං මහප්ඵලං වදාමීති.

6. ඉති කණ්හාසු සෙතාසු රොහිණීසු හරීසු වා,
කම්මාසාසු සරූපාසු ගොසු පාරෙවතාසු වා.

7. යාසු කාසු චි[3] එතාසු දන්තො ජායති පුඞ්ගවො,
ධොරය්හො බලසම්පන්නො කල්‍යාණජවනික්කමො.[4]

8. තමෙව භාරෙ යුඤ්ජන්ති නාස්ස වණ්ණං පරික්ඛරෙ,
එවමෙව මනුස්සෙසු යස්මිං කස්මිඤ්චි ජාතියෙ.

9. ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ සුද්දෙ චණ්ඩාලපුක්කුසෙ,
යාසු කාසු චි එතාසු දන්තො ජායති සුබ්බතො.

---

1. ච පන මං අසතා - මජසං. 2. දුස්සීලස්ස - මජසං.
3. යාසු කාසු වා - මජසං. 4. කල්‍යාණජවනියඛනමො - සීමු.

භවත් ගෞතමයන් වහන්ස, යම් කෙනෙක් මෙසේ කියත් නම්, 'ශ්‍රමණ ගෞතමයෝ මෙසේ කියති. 'මට ම දන් දිය යුතු ය. අන්හට දන් නො දිය යුතු ය. ... මාගේ ම සව්වනට දුන් දය මහත්ඵල වෙයි. අන් සව්වනට දුන් දය මහත්ඵල නො වෙති' යි. "කිමෙක්? ඔහු භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ වදාරණ ලද්දක් කියන්නාහු වෙත් ද, භවත් ගෞතමයන් වහන්සේට අභූතයෙන් අභ්‍යාඛ්‍යාන නො කෙරෙත් ද? කියුවාට පිළිකියු කියද් ද? කිසියම් සහේතුක වූ වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නො ඒ ද? අපි වනාහි භවත් ගෞතමයන් වහන්සේ අභ්‍යාඛ්‍යාන නො කරනු කැමැත්තම්හ"යි.

වත්සය, යම් කෙනෙක් මෙසේ කියත් නම්, "ශ්‍රමණ ගෞතමයෝ මෙසේ කියති: මට ම දන් දිය යුතුය. ... අන් සව්වනට දුන් දය මහත්ඵල නො වෙති"යි, ඔහු මා පිළිබඳ කියන ලද්දක් කියන්නාහු නො වෙති. ඔහු අසත් වූ අභූතයෙන් මට අභ්‍යාඛ්‍යාන කෙරෙත්. වත්සය, යමෙක් දන් දෙන පරහු වළහා නම්, හේ තිදෙනකුට අන්තරායකර වෙයි, තිදෙනකුට කඩපලා (මංපහරණ) සොර වෙයි. කවර තුන් දෙනකුටය යත්: දායකයාගේ පිණට අනතුරු කරන්නේ වෙයි, ප්‍රතිග්‍රාහකයන්ගේ ලාභයට අනතුරු කරන්නේ වෙයි. කැල ම ඔහුගේ ආත්මය සාළු ගුණ ඇත්තෙක් කසා ලූ ගුණ ඇත්තෙක් වෙයි. වත්සය, යමෙක් දන් දෙන මෙරමා වළහා නම් හේ මේ තුන්දෙනාහට අන්තරායකර වෙයි. මේ තුන්දෙනාහට කඩපලා සොර වෙයි.

වත්සය, මම වැලිත් මෙසේ කියමි: ගවරවළෙක හෝ මොළෙක හෝ යම් ප්‍රාණී කෙනෙක් වෙත් නම්, එහිදු යමෙක් සැළිදෙවුත් දිය හෝ වළං දෙවුත් දිය හෝ "එහි යම් ප්‍රාණී කෙනෙක් වෙත් නම් ඔහු එයින් යපෙත්ව" යි දමා නම්, ඒ හේතු කොට ගෙණ ද වත්සය පුණ්‍යයාගේ ආගමනය මම කියමි. මිනුෂ්‍ය වූවකු කෙරෙහි කියනු කිම! වත්සය, එතෙකුදු වූව, සිල්වත්නට දෙන ලද්ද මහත්ඵලය යි මම කියමි. දුශ්ශීලයාහට දෙන ලද්ද එසේ නො වේ. ඒ සිල්වත් තෙමේ ද ප්‍රහන පඤ්චාඞ්ග ඇතියේ සම්න්‍වාගත පඤ්චාඞ්ග ඇතියේ වෙයි. කවර පසෙක් ප්‍රහන වේ ද යත්: කාමච්ඡන්දය ප්‍රහන වෙයි, ව්‍යාපාදය ප්‍රහන වෙයි. ථිනමිද්ධය ප්‍රහන වෙයි. උද්ධච්චකුක්කුච්චය ප්‍රහන වෙයි. විචිකිච්ඡාව ප්‍රහන වෙයි. මේ පඤ්චාඞ්ගයෝ ප්‍රහන වෙත්.

කවර පසෙකින් සම්න්‍වාගත වේ ද! "අශෛක්ෂ ශීලස්කන්ධයෙන් යුක්ත වෙයි. අශෛක්ෂ සමාධිස්කන්ධයෙන් යුක්ත වෙයි. අශෛක්ෂ ප්‍රඥාස්කන්ධයෙන් යුක්ත වෙයි. අශෛක්ෂ විමුක්තිස්කන්ධයෙන් යුක්ත වෙයි. අශෛක්ෂ විමුක්තිඥානදර්ශනස්කන්ධයෙන් යුක්ත වෙයි. මේ පසගින් යුක්ත වෙයි. මෙසේ ප්‍රහන වූ අඞ්ගපසක් ඇති අඞ්ග පසෙකින් යුක්ත වූවහු කෙරෙහි දෙන ලද දය මහත්ඵල ය යි කියමි.

6. මෙසේ කළු වූත් සුදු වූත් රතු වූත් පලාවන් වූත් චිත්‍රවර්ණ වූත් තම වස්සන් හා සමාන රූ ඇත්තා වූත් කොබෝවන් පැහැති වූත් දෙනුන් කෙරෙහි දැයි.

7. තෙල යම් කිසි දෙන කෙනකුන් අතුරෙහි දැමුනු ධූරවහනයට යෝග්‍ය වූ බලසම්පන්න වූ කල්‍යාණ ජවයෙන් යන වෘෂභයෙක් උපදනේ වේ ද.

8-9. ඔහු ම භාරෙද්වහනයෙහි ලා යොදත්. ඔහුගේ වර්ණය එළවා නො බලත්. එසෙයින් ම මිනිසුන් කෙරෙහි යම් කිසි කුලජාතයෙක =ක්ෂත්‍රිය වේව යි, බ්‍රාහමණ වේව යි, වෛශ්‍ය වේව යි, ශූද්‍ර වේව යි, සැඩල් පුප්සඩු වේව යි තෙල යම් කිසි කුලයෙක දැමුනු මනා ව්‍රත ඇති.

10. ධම්මට්ඨො සීලසම්පන්නො සච්චවාදී හිරීමනො,
පහීණජාතිමරණො බ්‍රහ්මචරියස්ස කෙවලී.

11. පන්නභාරො විසංයුත්තො කතකිච්චො අනාසවො,
පාරගූ සබ්බධම්මානං අනුපාදාය නිබ්බුතො.

12. තස්මිඤ්ඤෙව විරජෙ ඛෙත්තෙ විපුලා හොති දක්ඛිණා,
බාලා ච අවිජානන්තා දුම්මෙධා අස්සුතාවිනො.

13. බහිද්ධා දදන්ති[1] දානානි න හි සන්තෙ උපාසරෙ,
යෙ ච සන්තෙ උපාසන්ති සප්පඤ්ඤෙ ධීරසම්මතෙ.

14. සද්ධා ච නෙසං සුගතෙ මූලජාතා පතිට්ඨිතා,
දෙවලොකඤ්ච තෙ යන්ති කුලෙ වා ඉධ ජායරෙ.
අනුපුබ්බෙන නිබ්බාණං අධිගච්ඡන්ති පණ්ඩිතාති.

## 3. 2. 1. 8.

8. අථ ඛො තිකණ්ණො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං -පෙ- එකමන්තං නිසින්නො ඛො තිකණ්ණො බ්‍රාහ්මණො භගවතො සම්මුඛා තෙවිජ්ජානං සුදං බ්‍රාහ්මණානං වණ්ණං භාසති "එවම්පි තෙවිජ්ජා බ්‍රාහ්මණා ඉතිපි තෙවිජ්ජා බ්‍රාහ්මණා"ති.

යථා කථං පන බ්‍රාහ්මණ බ්‍රාහ්මණා බ්‍රාහ්මණං තෙවිජ්ජං පඤ්ඤපෙන්තීති? ඉධ භො ගොතම බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං. පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයොති. එවං ඛො භො ගොතම බ්‍රාහ්මණා බ්‍රාහ්මණං තෙවිජ්ජං පඤ්ඤපෙන්තීති.

අඤ්ඤථා ඛො බ්‍රාහ්මණ බ්‍රාහ්මණා බ්‍රාහ්මණං තෙවිජ්ජං පඤ්ඤපෙන්ති. අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ තෙවිජ්ජො හොතීති. යථා කථම්පන භො ගොතම අරියස්ස විනයෙ තෙවිජ්ජො හොති? සාධු මෙ භවංගොතමො තථා ධම්මං දෙසෙතු යථා අරියස්ස විනයෙ තෙවිජ්ජො හොතීති. තෙන හි බ්‍රාහ්මණ සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති. එවං භොති ඛො තිකණ්ණො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

---

1. වදන්ති - මජසං.

10. දහම්හි සිටි සිල් සපන් සැබව බණන පාපයෙහි ලා සලජ්ජසිත් ඇති පැහූ දූ මරණ ඇති බඹසර පිරිපුන් කළ.

11. බහා තැබූ කෙලෙස් බර ඇති එහෙයින් ම (කායාදි විවෙකයෙන්) විසංයුක්ත වූ කළ මගකිස ඇති ආස්‍රව නැති (පඤ්චස්කන්ධාදි) දහමුත්ගේ පර තෙර පත් කෙලෙස් විසින් නො ගෙණ පිරිනිවි රහතෙක් උපදනේ ද.

12. එම අගීත් සඞ්ඛ්‍යාත ක්ෂෙත්‍රයෙහි දක්ෂිණාව විපුල වේ. කෙත නො දන්නා දුෂ්ප්‍රාඥ වූ කෙත් විනිස නො ඇසූ බාලයෝ

13. බැහැර තව්සන් කෙරෙහි දන් දෙති. බුද්ධාදි සත්පුරුෂයන් උපාසනා නො කෙරෙත්. යම් කෙනෙක් සත්ප්‍රාඥ වූ ධීර සම්මත වූ බුද්ධාදී සත්පුරුෂයන් උපාසනා කෙරෙත් ද.

14. උන්ගේ ශ්‍රද්ධාව සුගතයන් වහන්සේ කෙරෙහි හටගත් මූල් ඇති ව පිහිටියා වෙයි. ඒ පණ්ඩිතයෝ දෙව්ලොව ද යෙත්. මෙලොව උසස් කුලෙහි හෝ උපදිත්. ක්‍රමයෙන් නිර්වාණය පසක් කෙරෙත්.

## 3. 2. 1. 8.

8. එකල්හි තිකණ්ණ බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග ... එකත් පසෙක හුන් තිකණ්ණ බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි ත්‍රිවිද්‍යා ඇති බ්‍රාහමණයන්ගේ ම ගුණ වණයි. "මෙසේත් බමුණෝ ත්‍රිවිද්‍යා ඇත්තාහ. මෙසේත් බමුණෝ ත්‍රිවිද්‍යා ඇත්තාහ" කියායි.

"බමුණ, කෙසේ හෙයින් බ්‍රාහමණයෝ බ්‍රාහමණයකු ත්‍රිවිද්‍යා ඇත්තකු කොට පණවත්ද" යි. "භවත් ගෞතමයන් වහන්ස, මෙලොව්හි බමුණු මවු පසිනුදු පියපසිනුදු දෙපසින් මොනොවට උපන්නේ වේ. පිරිසිදු මවුකුස ඇත්තේ සත්වන මහමුතු යුග තෙක් ජාතිවාදයෙන් බැහැර නො කරණ ලද්දේ නිඳු නොකරණ ලද්දේ වේ ද, වෙද හදරන්නේ වේ ද, මන්ත්‍ර දරන්නේ වේ ද, නිඝණ්ඩු කෙටුභශාස්ත්‍ර සහිත වූ ශික්ෂානිරුක්ති සහිත වූ ඉතිහාසය පස්වනු කොට ඇති, ත්‍රිවෙදයේ පරතෙරට ගියේ වේ ද, පදපාඨ හදරන්නේ ව්‍යාකරණ දන්නේත් වේ ද, විතණ්ඩවාද ශාස්ත්‍රයෙහි දු මහාපුරුෂලක්ෂණ-යෙහි දු සම්පූර්ණකාරී වේ ද, භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහමණයෝ මෙසේ බ්‍රාහමණයකු ත්‍රිවිද්‍යා ඇත්තකු කොට පණවත්ය" යි.

බ්‍රාහමණය, බමුණෝ අන්පරිද්දෙකින් ත්‍රිවිද්‍යා ඇති බමුණා පණවත්. ආර්‍යවිනයෙහි අන්පරිද්දෙකින් ම ත්‍රිවිද්‍යා ඇත්තේ වේ. භවත් ගෞතමයන් වහන්ස, කිපරිදි ආර්‍යවිනයෙහි ත්‍රිවිද්‍යා ඇත්තේ වේ ද? භවත් ගෞතමයන් වහන්සේ යම් පරිද්දෙකින් ආර්‍යවිනයෙහි ත්‍රිවිද්‍යා ඇත්තෙක් වේ ද, එපරිදි මට ධර්මදෙශනා කරණසේක් නම් මැනවි. බමුණ, එසේ නම් අසව, මනා කොට මෙනෙහි කරව, කියමි යි. පින්වතුන් වහන්ස, එසේය යි, තිකණ්ණ බමුණු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී ය. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

ඉධ බ්‍රාහ්මණ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ. අමුත්‍රාසිං එවංනාමො, එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං,[1] තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. අයමස්ස පඨමා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා, වචී -පෙ- මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචී -පෙ- මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. අයමස්ස දුතියා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

---

1. උදපාදිං - මජ්ස.

බමුණ, මේ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව ම, අකුශලධර්මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි, විතර්කවිචාරයන් සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම ඇති චිත්තයාගේ එකඟබව වූ විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසේ, ප්‍රීතිහුගේ ද විරාගයෙන් උපේක්ෂා ද ඇත්තේ සිහි ද ඇත්තේ සම්‍යක් ප්‍රඥ ද ඇත්තේ වෙසේ. කයින් සුඛයත් විඳුනේය. ආර්යයෝ 'උපේක්ෂා ඇත්තේ සමෘතිමත් වූයේ සුඛවිහරණ ඇත්තේය'යි යම් ඒ පුගුලකු කියත් නම්, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසේ. සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් කැලම සොම්නස් දොම්නස් දෙදෙනාගේ අස්තඞ්ගමයෙන් දුක් නැති සුව නැති උපේක්ෂාසමෘති පරිශුද්ධි ඇති සතරවන ධ්‍යානයට පැමිණ වෙසේ.

හේ මෙසේ සමාධිගත වූ සිත පිරිසිදු වූ කල්හි පවිත්‍ර වූ කල්හි කෙලෙස් අඞ්ගණ රහිත වූ කල්හි පහ වූ උපකෙල්ශ ඇති කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වූ කල්හි සිටි කල්හි නො සැලෙන බවට පත් වූ කල්හි පෙර විසූ කඳපිළිවෙළ දන්නා නුවණ පිණිස සිත එළවයි. හේ නන්වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි. කෙසේය යත්: එක් ජාතියකුදු ජාති දෙකකුදු ජාති තුණකුදු ජාති සතරකුදු ජාති පසකුදු ජාති දසයකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු ජාති සතළිසකුදු ජාති පණසකුදු ජාති සියකුදු ජාති දහසකුදු ජාති සියක්දහසකුදු නොයෙක් සංවර්තකල්පයකුදු නොයෙක් විවර්තකල්පයකුදු නොයෙක් සංවර්තවිවර්තකල්පයකුදු සිහි කෙරෙයි: අසෝ තැන මෙනම් ඇත්තෙයිම් වීමි. මෙසේ ගොත් ඇත්තෙයිම් වීමි. මෙසේ පැහැසටහන් ඇත්තෙයිම් වීමි. මෙ බඳු අහර ඇත්තෙයිම් වීමි. මෙ බඳු සුවදුක් විඳිනසුල්ලෙයිම් වීමි. මෙ බඳු ආයු කෙළවර ඇත්තෙයිම් වීමි. ඒ මම එයින් සැව අසෝ තැන උපන්මි. එහිදු මෙ බඳු නම් ඇත්තෙයිම් මෙ බඳු ගොත් ඇත්තෙයිම් මෙ බඳු පැහැසටහන් ඇත්තෙයිම් මෙ බඳු ආහාර ඇත්තෙයිම් මෙ බඳු සුවදුක් විඳුනෙයිම් මෙ බඳු ආයු පර්යන්ත ඇත්තෙයිම් වීමි. ඒ මම එයින් සැව මෙහි උපන්මි'යි මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ නන් වැදෑරුම් පෙරවිසූ කඳපිළිවෙළ සිහි කෙරේ. මෙසේ ඔහු විසින් ප්‍රථම විද්‍යාව ලදු. අවිද්‍යාව නසන ලදු. විද්‍යාව උපන. මෝහාන්ධකාරය නසන ලද. ආලෝකය උපන. අප්‍රමත්ත වූ කෙලෙස් තවන වීර්ය්‍ය ඇත්තා වූ නිවන් කෙරෙහි මෙහෙයූ සිතැතිව වසන්නක්හට වන්නාක් සෙයිනි.

හෙතෙම මෙසේ සමාධිගත වූ සිත පිරිසිදු වූ කල්හි පර්යවදාත වූ කල්හි අඞ්ගණ රහිත වූ කල්හි උපක්ලෙශ දුරු වූ කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වූ කල්හි සිටි කල්හි නො සැලීමට පත් වූ කල්හි සත්ත්වයන්ගේ ච්‍යුති-උපපත්තිඥානය පිණිස සිත එළවයි. හෙ තෙමේ පිරිසිදු වූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් ච්‍යුත වන්නා වූත් උපදනා වූත් හීන වූත් ප්‍රණීත වූත් සුවර්ණ වූත් දුර්වර්ණ වූත් මනා ගති ඇති දුගති නැති සත්ත්වයන් දන්නේය, එකැතියෙන් මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්විත වූවාහු වාග්දුශ්චරිතයෙන් සමන්විත වූවාහු මනෝදුශ්චරිතයෙන් සමන්විත වූවාහු ආර්යයනට උපවාද කරන්නාහු මිසදිටු ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු සුවෙන් පහ වූ දුකට ගති වූ විවසව පතිත වන නිරයෙහි උපන්නාහු වෙති. මේ භවත් සත්ත්වයෝ වනාහි කායසුචරිතයෙන් සමන්විත වූවාහු වාක්සුචරිතයෙන් සමන්විත වූවාහු මනඃසුචරිතයෙන් සමන්විත වූවාහු ආර්යයනට උපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහු වෙති. ඒ සත්ත්වයන් කාබුන් මරණින් මතු සොඳුරු ගති ඇති ස්වර්ගලෝකයට පිළිසඳ විසින් පැමිණෙති දන්නේ ය. මෙසේ පිරිසිදු වූ මිනිසැස ඉක්මැ සිටි දිවැසින් ච්‍යුත වන්නා වූත් උපදනා වූත් හීන වූත් ප්‍රණීත වූත් සුවර්ණ වූත් දුර්වර්ණ වූත් මනා ගති ඇති, දුගති ඇති, කම් වූ පරිදි පරලොව යන සත්ත්වයන් දන්නේය. ඔහු විසින් මේ දෙවෙනි විද්‍යාව ලදු. අවිද්‍යාව නසන ලදු. විද්‍යාව උපන. මොහඳුර නසනලද. ආලෝකය උපන. නො පමා වූ කෙලෙස් තවන වැර ඇති නිවන් කෙරේ මෙහෙයූ සිත් ඇති ව වසන්නක්හට වන්නාක් සෙයිනි.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධොති -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති, භවාසවාපි චිත්තං විමුච්චති, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. අයමස්ස තතියා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො. යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතොති.

15. අනුච්චාවචසීලස්ස නිපකස්ස ච ඣායිනො,
චිත්තං යස්ස වසීභූතං එකග්ගං සුසමාහිතං.

16. තං වෙ තමොනුදං ධීරං තෙවිජ්ජං මච්චුහායිනං,
හිතං දෙවමනුස්සානං ආහු සබ්බප්පහායිනං.

17. තීහි විජ්ජාහි සම්පන්නං අසම්මූළ්හවිහාරිනං,
බුද්ධං අන්තිමසාරීරං තං නමස්සන්ති ගොතමං.

18. පුබ්බෙනිවාසං යො වෙදි[1] සග්ගාපායං ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤා වොසිතො මුනි.

19. එතාහි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො,
තමහං වදාමි තෙවිජ්ජං නාඤ්ඤං ලපිතලාපනන්ති.

එවං ඛො බ්‍රාහ්මණ අරියස්ස විනයෙ තෙවිජ්ජො හොතීති.

අඤ්ඤථා භො ගොතම බ්‍රාහ්මණානං තෙවිජ්ජො, අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ තෙවිජ්ජො හොති. ඉමස්ස ච පන භො ගොතම අරියස්ස විනයෙ තෙවිජ්ජස්ස බ්‍රාහ්මණානං තෙවිජ්ජො කලං නාග්ඝති සොළසිං.

අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණංගතන්ති.

1. 'වෙදී' ඉතිපි පාඨො

ගේ මෙසේ සමාධිගත වූ සිත පිරිසිදු වූ කල්හි පර්‍යවදාත වූ කල්හි අඞ්ගණ රහිත වූ කල්හි උපක්ලේශ දුරු වූ කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වූ කල්හි සිටිකල්හි නො සැලීමට පත් කල්හි ආස්‍රවක්ෂයඥානය පිණිස සිත එළවයි. හෙ 'මේ දුකැ'යි තත් වූ පරිදි දන්නේය. 'මේ දුඃඛසමුදය'යි තත් වූ පරිදි දන්නේය, 'මේ දුඃඛනිරොධය' යි තත් වූ පරිදි දන්නේය 'මේ දුඃඛනිරොධගාමි ප්‍රතිපත්'යි තත් වූ පරිදි දන්නේය. 'මොහු ආස්‍රවයෝ' යි තත් වූ පරිදි දන්නේය. 'මේ ආස්‍රවසමුදය' යි තත් වූ පරිදි දන්නේය 'මේ ආසවනිරොධය' යි තත් වූ පරිදි දන්නේය. 'මේ ආසවනිරොධගාමිනී පටිපදා' යි තත් වූ පරිදි දන්නේය. මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ ඔහුගේ සිත කාමාස්‍රවයෙනුදු මිදෙයි. භවාස්‍රවයෙනුදු සිත මිදෙයි. අවිද්‍යාස්‍රව-යෙනුදු සිත මිදෙයි. මිදුනු කල්හි 'සිත මිදුනේ' යි (ප්‍රත්‍යවෙක්ෂා) ඥානය වේ. ජාතිය ක්ෂීණ විය. මගබඹසර වැස නිමවන ලදී. සිවුමගින් සොළොස් වැදෑරුම් කරණී කරණ ලදි. 'මේ ෂොඩශකරණීයභාවය පිණිස අන්මාර්ගී භාවනායෙක් නැතැ'යි දන්නේය. ඔහු විසින් මේ තෙවන විද්‍යාව ලදී. .... අවිද්‍යාව නසන ලදී මොහඳුර නසන ලද. ආලෝකය උපන. නො පමා වූ කෙලෙස් තවන වැර ඇති නිවන් කෙරේ මෙහෙයූ සිත් ඇතිව වසන්නකුහට වන්නාක් සෙයිනි.

15. (විසිතුරු බවට නොපත්, එකතින්) වැඩුනු සිල් ඇති ප්‍රඥාවත් වූ ධ්‍යාන කරණ සුලු යමකුගේ සිත වසී වූයේ ද, එකඟ වූයේ ද, මොනොවට අරමුණෙහි පිහිටියේ ද,

16. ඒකාන්තයෙන් මොහඳුර දුරු කළ කෙලෙස් තවන වැර ඇති මරණය දුර ලූ දෙව්මිනිසුනට හිත වූ සියලු කෙලෙස් ප්‍රහාණ කළ ඔහු ත්‍රිවිද්‍යා ඇත්තෙකැ යි (බුද්ධාදි ආර්‍ය්‍යයෝ) කියත්.

17. ත්‍රිවිද්‍යායෙන් සමපූර්ණ වූ නො මුළා වූ විහරණ ඇති අන්තිම සිරුර දරණ ඒ ගෞතම බුදුරදුන් (දෙව්මිනිස්සු) නමදිති.

18. යමෙක් පෙර විසූ කඳපරපුර දන්නේ වේ ද, ස්වර්ගය හා අපාය දක්නේ වේ ද, වැලිත් විශිෂ්ටඥානයෙන් දැන වැස නිමවූයේ සිවුමගනුවණින් මුනි වූයේ ජාතික්ෂයට පැමිණියේ ද,

19. ඒ බමුණු තෙල ත්‍රිවිද්‍යායෙන් ත්‍රෛවිද්‍ය වේ. මම ඔහු ත්‍රිවිද්‍යා ඇත්තෙකැ යි කියමි. අනුන් කියූ බස් මතු වන අනෙකකු ත්‍රෛවිද්‍ය යී නො කියමි.

බ්‍රාහ්මණය, මෙසේ වනාහි ආර්‍ය්‍යවිනයෙහි ත්‍රිවිද්‍යා ඇත්තේ වෙයි. භවත් ගෞතමයන් වහන්ස, අන්‍යාකාරයෙකින් බ්‍රාහ්මණයන්ගේ ත්‍රෛවිද්‍යයා වෙයි. ආර්‍ය්‍යවිනයෙහි වනාහි අන්පරිද්දෙකින් ත්‍රෛවිද්‍යයා වෙයි. භවත් ගෞතම-යන් වහන්ස, ආර්‍ය්‍යවිනයෙහි මේ ත්‍රෛවිද්‍ය බ්‍රාහ්මණයා හට බ්‍රාහ්මණයන්ගේ ත්‍රෛවිද්‍ය තෙමේ සොළොස්වන කලාවට ද නො අගනේ වෙයි.

භවත් ගෞතමයන් වහන්ස, ඉකලි. භවත් ගෞතමයන් වහන්ස, ඉකලි. . .. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් කොට මා දිවියෙන් ගත් සරණගිය උවසුවකු කොට දරණ සේක්වා යි.

## 3. 2. 1. 9

9. අථ ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං -පෙ- එකමන්තං නිසින්නො ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: යස්සස්සු භො ගොතම යඤ්ඤො වා සද්ධං වා ථාලිපාකො වා දෙය්‍යධම්මං වා තෙවිජ්ජෙසු බ්‍රාහ්මණෙසු දානං දදෙය්‍යාති.

යථාකථං පන බ්‍රාහ්මණ බ්‍රාහ්මණා බ්‍රාහ්මණං තෙවිජ්ජං පඤ්ඤපෙන්තීති? ඉධ පන භො ගොතම[1] බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයොති. එවං ඛො භො ගොතම බ්‍රාහ්මණා බ්‍රාහ්මණං තෙවිජ්ජං පඤ්ඤපෙන්තීති.

අඤ්ඤථා ඛො බ්‍රාහ්මණ බ්‍රාහ්මණා බ්‍රාහ්මණං තෙවිජ්ජං පඤ්ඤපෙන්ති, අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ තෙවිජ්ජො හොතීති. යථාකථං පන භො ගොතම අරියස්ස විනයෙ තෙවිජ්ජො හොති? සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු යථා අරියස්ස විනයෙ තෙවිජ්ජො හොතීති. තෙන හි බ්‍රාහ්මණ සුණාහි -පෙ- භගවා එතදවොච:

ඉධ බ්‍රාහ්මණ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[2] පුබ්බනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති: සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. අයමස්ස පඨමා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති. අයමස්ස දුතියා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

1. බො පන ගොතම - මජසං. 2. ආනෙජ්ජප්පත්තෙ - සීමු.

**3. 2. 1. 9.**

9. එකල්හි ජාණුස්සොණි බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ ... එකත් පසෙක හුන් ජාණුස්සොණි බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේය. භවත් ගෞතමයන් වහන්ස, යමකුගේ වනාහි යඥයෙක් හෝ මතකබතෙක් හෝ මුළු බතෙක් හෝ (සෙසු) දෙයධම්යෙක් හෝ වේ නම් ත්‍රෛවිද්‍ය බ්‍රාහමණයන් කෙරෙහි දන් දෙන්නේ ය. (කියායි)

බමුණ, කි හෙයින් බ්‍රාහමණයෝ ත්‍රෛවිද්‍ය බ්‍රාහමණයා පණවත් ද්‍යයි? භවත් ගෞතමයන් වහන්ස, මේ ලොව්හි බ්‍රාහමණ මවුපිය දෙපසින් සුජාතයෙක් වේ ද, සත්වන මහමුතුයුග තෙක් පිරිසිදු මවුගැබ් ඇත්තේ ජාතිවාදයෙන් බැහැර නොකරණ ලද්දේ වේ ද, උපක්‍රොසා නොකරණ ලද්දේ වේ ද, වේද හදාරන්නේ වේදමන්ත්‍ර දරන්නේ නිඝණ්ටු කෙටුභ (ඡන්දොලඞ්කාර) ශාස්ත්‍ර සහිත වූ අක්‍ෂර ප්‍රභෙද සහිත වූ ඉතිහාසය පස්වනු කොට ඇති ත්‍රිවේදයෙහි පරතෙර ගියේ වේ ද, පද හදාරන්නේ ව්‍යාකරණ දන්නේ වේ ද, ලෝකායත (විතණ්ඩ) ශාස්ත්‍රයෙහිදු මහා පුරුෂලක්‍ෂණයෙහි (අනූනව) පිරිපුන් දැනුම් ඇත්තේ වේ ද, භවත් ගෞතමයන් වහන්ස, මෙසේ වනාහි බමුණෝ ත්‍රෛවිද්‍ය බ්‍රාහමණයා පණවත්.

බ්‍රාහමණය, බමුණෝ ත්‍රෛවිද්‍ය බ්‍රාහමණයා අන් පරිද්දෙකින් පණවති. ආයඹීවිනයෙහි වනාහි ත්‍රෛවිද්‍යයා අන් පරිද්දෙකින් වෙයි. භවත් ගෞතමයන් වහන්ස, ආයඹීවිනයෙහි ත්‍රෛවිද්‍යයා කෙසේ නම් වේ ද? යම් පරිද්දෙකින් ආයඹීවිනයෙහි ත්‍රෛවිද්‍යයා වේ නම්, එසේ භවත් ගෞතම-යන් වහන්සේ මට දහම් දෙසනසේක් නම් මැනැවැ යි. එසේ වී නම් බමුණ, අසව, ... භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක.

බ්‍රාහමණය, මේ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව ම ... සිවුවන ද්‍යානය උපයා වෙසෙයි.

හේ මෙසේ සමාහිතහ සිත පිරිසිදු වූ කල්හි ප්‍රයඹීවදාත වූ කල්හි අඞ්ගණ රහිත වූ කල්හි උපක්ලෙශයන් පහව ගිය කල්හි මෘදු වූ කල්හි කම්යොග්‍ය වූ කල්හි ස්ථිත කල්හි නොසැලෙන බවට පත් වූ කල්හි පෙර විසූ කඳපරපුර දන්නා නුවණ පිණිස සිත වෙසෙසින් නමයි. හේ නන් වැදෑරුම් වූ පෙර විසූ කඳපරපුර සිහි කෙරෙයි. කෙසේය යත්: එක් ජාතියකුදු, ජාති දෙකකුදු ... මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ නන්වැදෑරුම් වූ පෙර විසූ කඳපරපුර සිහි කෙරෙයි. ඔහු විසින් මේ ප්‍රථම විද්‍යාව ලබන ලදු. අවිද්‍යාව නසන ලදු. විද්‍යාව උපන. මොහඳුර නසන ලදි. ආලොකය උපන. නො පමා වූ කෙලෙස් තවන වැර ඇති නිවන් කෙරෙහි මෙහෙයූ සිත් ඇති ව වසන්නක්හට වන්නාක් සෙයිනි.

හේ මෙසේ සමාහිගත සිත පිරිසිදු වූ කල්හි පයඹීවදාත වූ කල්හි අඞ්ගණ රහිත වූ කල්හි පහ වූ උපක්ලේශ ඇති කල්හි මෘදු වූ කල්හි කම්හිත වූ කල්හි ස්ථිත කල්හි නො සැලෙන බවට පත් වූ කල්හි සත්‍වයන්ගේ ච්‍යුති උපපත්ති ඥානය පිණිස සිත වෙසෙසින් නමයි. හේ පිරිසිදු වූ මිනිසැස ඉක්මැ සිටි දිවැසින් ... කම් වූ පරිදි යන සත්‍වයන් දන්නේය. ඔහු විසින් මේ දෙවන විද්‍යාව ලබන ලදු, අවිද්‍යාව නසන ලදු, විද්‍යාව උපන. මොහඳුර නැසුනේය. ආලෝකය උපන්නේ ය. නො පමා වූ කෙලෙස් තවන වැර ඇති නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතිව වසන්නහුට වන්නාක් සෙයිනි.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති. -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති, භවාසවාපි චිත්තං විමුච්චති, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. අයමස්ස තතියා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතොති.

20. යො සීලබ්බතසම්පන්නො පහිතත්තො සමාහිතො,
චිත්තං යස්ස වසීභූතං එකග්ගං සුසමාහිතං.

21. පුබ්බෙනිවාසං යො වෙති[1] සග්ගාපායඤ්ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤා වොසිතො මුනි.

22. එතාහි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො,
තමහං වදාමි තෙවිජ්ජං නාඤ්ඤං ලපිතලාපනන්ති

එවං ඛො බ්‍රාහ්මණ අරියස්ස විනයෙ තෙවිජ්ජො හොතීති.

අඤ්ඤථා භො ගොතම බ්‍රාහ්මණානං තෙවිජ්ජො. අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ තෙවිජ්ජො හොති. ඉමස්ස ච භො ගොතම අරියස්ස විනයෙ තෙවිජ්ජස්ස බ්‍රාහ්මණානං තෙවිජ්ජො කලං නාග්ඝති සොළසිං.

අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 3. 2. 1. 10

10. අථ ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි-පෙ- එකමන්තං නිසින්නො ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: මයමස්සු භො ගොතම බ්‍රාහ්මණා නාම, යඤ්ඤං යජාමපි, යජාපෙමපි, තත්‍ර භො ගොතම යො චෙව යජති, යො ච යජාපෙති, සබ්බෙ තෙ අනෙකසාරීරිකං පුඤ්ඤපටිපදං[2] පටිපන්නා හොන්ති යදිදං යඤ්ඤාධිකරණං, යො පනායං භො ගොතම යස්ස වා තස්ස වා කුලා අගාරස්මා අනගාරියං පබ්බජිතො එකමත්තානං දමෙති, එකමත්තානං සමෙති, එකමත්තානං පරිනිබ්බාපෙති, එවමස්සායං එකසාරීරිකං පුඤ්ඤපටිපදං පටිපන්නො හොති යදිදං පබ්බජ්ජාධිකරණන්ති.

1. වෙදී - සීමු - මජසං - සී 1. PTS
2. පුඤ්ඤප්පටිපදං - මජසං,

හේ මෙසේ සමාධිගත සිත පිරිසිදු වූ කල්හි පයඞීවදාත වූ කල්හි අඞ්ගණ රහිත වූ කල්හි පහ වූ උපක්ලේශ ඇති කල්හි මෘදු වූ කල්හි කර්මක්ෂම වූ කල්හි සිටි කල්හි නො සැලෙන බවට පැමිණි කල්හි ආශ්‍රවක්ෂයඥානය පිණිස වෙසෙසින් සිත එළවයි. හේ 'මේ දුකැ'යි තත් වූ පරිදි දන්නේය. ... "මේ දුඃඛනිරෝධගාමී ප්‍රතිපත්" යි තත් වූ පරිදි දන්නේය. 'මේ ආශ්‍රවයෝ' යි තත් වූ පරිදි දන්නේය ... "මේ ආශ්‍රවනිරෝධගාමී ප්‍රතිපත්" යි තත් වූ පරිදි දන්නේ ය. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාශ්‍රවයෙනුදු මිදෙයි. භවාශ්‍රවයෙනුදු සිත මිදෙයි. අවිද්‍යාශ්‍රවයෙනුදු සිත මිදෙයි. (සිත) මිදුනු කල්හි මිදුනේය යන ඥානය වේ. ජාතිය ක්ෂීණ විය. බඹසර වැස නිමවන ලදි. කරණී කරණ ලදි, "මේ කෘත්‍යසඞ්ඛ්‍යාතයෙන් අනෙක් කෘත්‍යසඞ්ඛ්‍යාත නැතැ"යි දන්නේය. මේ තෙවන විද්‍යාව ඔහු විසින් ලබන ලදු. විද්‍යාව උපන මෝහඳුර නැසුනේය, ආලෝකය උපන්නේය, නො පමා වූ කෙලෙස් තවන වැර ඇත්තා වූ නිවනට මෙහෙයූ සිත් ඇතිව වසන්නහුට වන්නාක් සෙයිනි.

20. යමෙක් ශීලව්‍රතයෙන් සමන්විත වූයේ ද, නිවන් පිණිස මෙහෙයූ සිත් ඇත්තේ වේ ද, සමාධිගත සිත් ඇත්තේ වේ ද, යමකුගේ සිත විසිය වැවේ ද, එකඟවූයේ ද, මොනොවට අරමුණෙහි පිහිටියේ වේ ද-

21. යමෙක් පූර්වේනිවාසය දන්නේ වේ ද, ස්වර්ගයත් අපායත් දක්නේ වේ ද, වැලිත් ජාතික්ෂයට පැමිණියේ විශිෂ්ටඥානයෙන් දූත වැස නිමවූයේ ක්ෂීණාශ්‍රව මුනි වේ ද-

22. තෙල ත්‍රිවිද්‍යායෙන් ඒ ක්ෂීණාශ්‍රව බ්‍රාහමණ ත්‍රෛවිද්‍ය වෙයි. මම ඔහු ත්‍රෛවිද්‍යයා යි කියමි. අනුන් කියූ බස් මතු වන අනෙකකු (ත්‍රෛවිද්‍යයා යි) නො කියමි යි.

බමුණ, මෙසේ වනාහි ආර්‍යවිනයෙහි ත්‍රෛවිද්‍යයා වෙ යි. භවත් ගෞතම-යන් වහන්ස, බමුණන්ගේ ත්‍රෛවිද්‍යයා අන් පරිද්දෙකින් වේ· ආර්‍යවිනයෙහි වනාහි ත්‍රෛවිද්‍යයා අන් පරිද්දෙකින් වේ. භවත් ගෞතමයන් වහන්ස, මේ ආර්‍යවිනයෙහි ත්‍රෛවිද්‍යයාහට බ්‍රාහමණයන්ගේ ත්‍රෛවිද්‍යයා සොළොස් වන කලාවටත් නො අගනේ ය.

භවත් ගෞතමයන් වහන්ස, ඉකල්ය. භවත් ගෞතමයන් වහන්ස, ඉකල්ය ... අද පටන් කොට දිවියෙන් ගත් සරණ ගිය උවසුවකු කොට මා දරණ සේක්වා යි.

## 3. 2. 1. 10.

10. එකල්හි සඞ්ගාරව බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. එකත්පසෙක හුන් සඞ්ගාරව බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහමණ වූ අපි වනාහි යාග කරන්නමෝ ද යාග කරවන්නමෝ ද වම්හ. භවත් ගෞතමයන් වහන්ස, ඒ අප අතුරෙන් යමෙක් යාග කෙරේ ද, යමෙකුත් යාග කරවා ද, එහැම යම් මේ යාගය කාරණ කොට ගෙණ නොයෙක් සිරුරු වහලින් උපන් පුණ්‍යප්‍රතිපත්තියකට පිළිපන්නාහු වෙති. භවත් ගෞතමයන් වහන්ස, යම් මේ පුරුෂයෙක් යම් ම කුලගෙයෙකින් ගිහිගෙන් නික්ම පැවිද්දට ගියේ වේ ද හේ (තමාගේ ඉන්ද්‍රියදමන වශයෙන්) ඒකාත්මයක් ම දමනය කරන්නේ ය. ඒකාත්මයක් ම ශමනය කරන්නේය. ඒකාත්මයක් ම පිරි-නිවන්නේය. මෙසේ මෙ තෙමේ මේ පැවිද්ද හේතු කොට ගෙණ එකශාරීරික වූ පුණ්‍යප්‍රතිපත්තියට පිළිපන්නේ වෙයි.

තෙන හි බ්‍රාහ්මණ, තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය, තථා නං ව්‍යාකරෙය්‍යාසි. තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා, සො එවමාහ: එථායං මග්ගො, අයං පටිපදා, යථා පටිපන්නො අහං අනුත්තරං බ්‍රහ්මචරියොහධං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙමි, එථ තුම්හෙපි තථා පටිපජ්ජථ, යථා පටිපන්නා තුම්හෙපි අනුත්තරං බ්‍රහ්මචරියොගධං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථාති. ඉති අයං චෙව සත්ථා ධම්මං දෙසෙති, පරෙ ච තථත්තාය පටිපජ්ජන්ති. තානි ඛො පන හොන්ති අනෙකානිපි සතානි අනෙකානිපි සහස්සානි අනෙකානිපි සතසහස්සානි.

තං කිං මඤ්ඤසි බ්‍රාහ්මණ, ඉච්චායං එවං සන්තෙ එකසාරීරිකා වා පුඤ්ඤපටිපදා හොති අනෙකසාරීරිකා වා, යදිදං පබ්බජ්ජාධිකරණන්ති? ඉච්චායම්පි[1] භො ගොතම, එවං සන්තෙ අනෙකසාරීරිකා පුඤ්ඤපටිපදා හොති, යදිදං පබ්බජ්ජාධිකරණන්ති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො සඞ්ගාරවං බ්‍රාහ්මණං එතදවොච: ඉමාසං තෙ බ්‍රාහ්මණ ද්වින්නං පටිපදානං කතමා පටිපදා ඛමති, අප්පට්ඨතරා ච අප්පසමාරම්භතරා ච මහප්ඵලතරා ච මහානිසංසතරා චාති? එවං වුත්තෙ සඞ්ගාරවො බ්‍රාහ්මණො ආයස්මන්තං ආනන්දං එතදවොච: සෙය්‍යථාපි භවං ගොතමො භවං චානන්දො එතෙ මෙ පුජ්ජා, එතෙ මෙ පාසංසාති.

දුතියම්පි ඛො ආයස්මා ආනන්දො සඞ්ගාරවං බ්‍රාහ්මණං එතදවොච: න ඛො ත්‍යාහං බ්‍රාහ්මණ එවං පුච්ඡාමි: කෙ වා තෙ පුජ්ජා කෙ වා තෙ පාසංසාති. එවඤ්ච[2] ඛො ත්‍යාහං බ්‍රාහ්මණ පුච්ඡාමි: ඉමාසං තෙ බ්‍රාහ්මණ ද්වින්නං පටිපදානං කතමා පටිපදා ඛමති, අප්පට්ඨතරා[3] ච අප්පසමාරම්භතරා ච මහප්ඵලතරා ච මහානිසංසතරා චාති. දුතියම්පි ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො ආයස්මන්තං ආනන්දං එතදවොච: සෙය්‍යථාපි භවං ගොතමො භවං චානන්දො එතෙ මෙ පුජ්ජා එතෙ මෙ පාසංසාති.

තතියම්පි ඛො ආයස්මා ආනන්දො සඞ්ගාරවං බ්‍රාහ්මණං එතදවොච: න ඛො ත්‍යාහං බ්‍රාහ්මණ එවං පුච්ඡාමි: කෙ වා තෙ පුජ්ජා කෙ වා තෙ පාසංසාති. එවඤ්ච[2] ඛො ත්‍යාහං බ්‍රාහ්මණ පුච්ඡාමි: ඉමාසං තෙ බ්‍රාහ්මණ ද්වින්නං පටිපදානං කතමා පටිපදා ඛමති. අප්පට්ඨතරා[3] ච අප්පසමාරම්භතරා ච මහප්ඵලතරා ච මහානිසංසතරා චාති.

1. ඉච්චායපි - මජසං. 2. එවං ඛො - මජසං. 3. අප්පත්ථතරාච - මජසං

බ්‍රාහමණය, එසේ වී නම් මෙහි ලා තා ම පුළුවුස්නෙමි. යම්සේ තට රුස්නේ නම් එසේ එය ප්‍රකාශ කරව. බමුණ, මෙලොව්හි අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයෙන් යුක්ත වූ සුගත වූ තුන්ලෝ දන්නා වූ අනුත්තර පුරුෂදම්‍යසාරථි වූ දෙවිමිනිසුනට ශාස්තෘ වූ සිවුසස් පිළිවිදි භාග්‍යවත් වූ තථාගතයන් වහන්සේ ලොව උපදනා සේක. උන්-වහන්සේ මෙසේ වදරත්: "එව, මේ මගය, මේ පිළිවෙතය, යම්සේ මම අනුත්තර බ්‍රහමචය්‍ර්‍යයට ඇතුළත් වූ නිර්වාණය තෙමේ ම විශිෂ්ටඥානයෙන් දැන සාක්‍ෂාත් කොට පවසම් ද, එව, තෙපිදු එසේ පිළිපදුව, යථාප්‍රතිපන්න තෙපි අනුත්තර වූ අර්හත්මාර්ග සඞ්ඛ්‍යාත බ්‍රහමචය්‍ර්‍යයට ඇතුළත් නිර්වාණය තුමූ ම විශිෂ්ට ඥානයෙන් දැන සාක්‍ෂාත් කොට උපයාගෙන වසත්නහුය. මෙසේ මේ ශාස්තෘ තෙමේ ද දහම් දෙසයි. අන්හු ද ඒ පිණිස පිළිපදිත්. ඔහු ද අනෙකශතයෝත් අනෙක සහස්‍රයෝත් අනෙකශතසහස්‍රයෝත් වෙත්.

බමුණ, ඒ කිමැයි හඟනෙහි ද? මෙසේ ඇති කල්හි මේ පැවිද්ද හේතු කොට ගෙණ තෙල පුණ්‍යප්‍රතිපත්ති තොමෝ ඒකශාරීරික හෝ වේ ද, අනේක ශාරීරික හෝ වේ ද? භවත් ගෞතමයන් වහන්ස, මෙසේ ඇති කල්හි මේ පැවිද්ද හේතු කොට ගෙණ ඇති වූ තෙල පුණ්‍යප්‍රතිපත්තිය ද අනේක-ශාරීරික ම වේ.

මෙසේ කී කල්හි ආයුෂමත් ආනන්ද ස්ථවිර තෙමේ සඞ්ගාරව බ්‍රාහමණයාට තෙල කිය: බ්‍රාහමණය, මේ ප්‍රතිපද් දෙක අතුරෙන් කවර ප්‍රතිපත්තියෙක් (බොහෝ මෙහෙ කරන්නවුන් විසින් හෝ උපකරණයෙන් ප්‍රයොජන නැති බැවින්) අල්පාර්ථතර යි ද, (අධික පීඩා නැතිවන බැවින්) අල්පසමාරම්භතර යි ද, මහත්ඵලතර යි ද, මහානෘශංසතර යි ද තට රුස්නේ ද? මෙසේ කී කල්හි සඞ්ගාරව බ්‍රාහමණ ආයුෂමත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට තෙල කිය: යම්බඳු වූ භවත් ගෞතමයන් වහන්සේ හා භවත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ හා ඇත් ද, මොහු (දෙදෙන) මා විසින් පිදිය යුතු වෙති. මොහු මා විසින් පැසසිය යුතු වෙති.

දෙවනවටත් ආයුෂමත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සඞ්ගාරව බ්‍රාහමණයාහට තෙල කීහ: බ්‍රාහමණය, තා විසින් කවරහු පිදිය යුත්තාහු ද තා විසින් කවරහු පැසසිය යුත්තාහුදැ යි මෙසේ මම තා නො විචාරමි. බ්‍රාහමණය, මෙසේ වනාහි මම තා පුළුවුස්මි. බ්‍රාහමණය, මේ ප්‍රතිපත් දෙක අතුරෙන් කවර ප්‍රතිපත්තියෙක් අල්පාර්ථතර යි ද, අල්පසමාරම්භතර යි ද මහත්ඵලතර යි ද මහානෘශංසතර යි දැයි තට රුස්නේ වේ දැයි. දෙවනවටත් සඞ්ගාරව බ්‍රාහමණ ආයුෂමත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට තෙල කිය: යම්බඳු වූ භවත් ගෞතමයන් වහන්සේ හා භවත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ හා ඇත් ද, මොහු මා විසින් පිදිය යුතු වෙති. මොහු මා විසින් පැසසිය යුතු වෙති.

තෙවනවටත් ආයුෂමත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සඞ්ගාරව බ්‍රාහමණ හට තෙල කීහ: බ්‍රාහමණය, කවරහු තා විසින් පිදිය යුතු වෙත් ද? කවරහු තා විසින් පැසසිය යුතු වෙද්දැ යි මෙසේ මම තා නො විචාරමි. බ්‍රාහමණය, මෙසේ වනාහි මම තා විචාරමි: බ්‍රාහමණය, මේ ප්‍රතිපත් දෙක අතුරෙන් කවර නම් ප්‍රතිපත්තියෙක් අල්පාර්ථතර යි ද, අල්පසමාරම්භතර යි ද, මහත්-ඵලතර යි ද, මහානෘශංසතර යි දැයි තට රුස්නේ දැයි?

තතියම්පි ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො ආයස්මන්තං ආනන්දං එතදවොච: සෙය්‍යථාපි භවං ගොතමො භවං චානන්දො එතෙ මෙ පුජ්ජා එතෙ මෙ පාසංසාති.

අථ ඛො භගවතො එතදහොසි: යාවතතියම්පි ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො ආනන්දෙන සහධම්මිකං පඤ්හං පුට්ඨො සංසාදෙති, නො විස්සජ්ජෙති, යන්නූනාහං පරිමොචෙය්‍යන්ති. අථ ඛො භගවා සඞ්ගාරවං බ්‍රාහ්මණං එතදවොච: කානුජ්ජ[1] බ්‍රාහ්මණ, රාජන්තෙපුරෙ රාජපරිසායං[2] සන්නිසින්නානං සන්නිපතිතානං අන්තරා කථා උදපාදීති? අයං ඛ්වජ්ජ භො ගොතම, රාජන්තෙපුරෙ රාජපරිසායං සන්නිසින්නානං සන්නිපතිතානං අන්තරා කථා උදපාදි: පුබ්බෙ සුදං අප්පතරා චෙව භික්ඛූ අහෙසුං, බහුතරා ච උත්තරි මනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං දස්සෙසුං. එතරහි ඛො බහුතරා චෙව භික්ඛූ අප්පතරා ච උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං දස්සෙන්තීති. අයං ඛ්වජ්ජ භො ගොතම, රාජන්තෙපුරෙ රාජපරිසායං සන්නිසින්නානං සන්නිපතිතානං අන්තරා කථා උදපාදීති.

තීණි ඛො ඉමානි බ්‍රාහ්මණ පාටිහාරියානි. කතමානි තීණි: ඉද්ධිපාටිහාරියං, ආදෙසනාපාටිහාරියං, අනුසාසනීපාටිහාරියං. කතමඤ්ච බ්‍රාහ්මණ ඉද්ධිපාටිහාරියං: ඉධ බ්‍රාහ්මණ එකච්චො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො[3] ගච්ඡති, සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි[4] උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභිජ්ජමානෙ[5] ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසති, පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. ඉදං වුච්චති බ්‍රාහ්මණ ඉද්ධිපාටිහාරියං.

කතමඤ්ච බ්‍රාහ්මණ, ආදෙසනාපාටිහාරියං: ඉධ බ්‍රාහ්මණ එකච්චො නිමිත්තෙන ආදිසති: එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො. ඉතිපි තෙ චිත්තන්ති. සො බහුඤ්චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා.

ඉධ පන බ්‍රාහ්මණ, එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, අපි ච ඛො මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති: එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො. ඉතිපි තෙ චිත්තන්ති. සො බහුඤ්චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා.

ඉධ පන බ්‍රාහ්මණ, එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, නපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, අපි ච ඛො විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාරසද්දං සුත්වා ආදිසති: එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්තන්ති. සො බහුඤ්චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා.

---

1 කාඛ්වජ්ජ - මජසං 2. රාජපුරිසානං - මජසං. 3. අසජ්ජමානො - මජසං
4. පථවියාපි - මජසං. 5. අභෙජ්ජමානෙ - සීමු.

තෙවනවටත් සඞ්ගාරව බ්‍රාහමණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීය: යම්බඳු වූ භවත් ගෞතමයන් වහන්සේ හා භවත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ හා ඇත් ද, මොහු මා විසින් පිදිය යුතු වෙති. මොහු මා විසින් පැසසිය යුතු වෙත්ය යි.

එසඳ භාග්‍යවතුන් වහන්සේට මේ බඳු සිතක් වී: "සඞ්ගාරව බ්‍රාහමණ තෙවෙනිවරටත් ආනන්දයන් විසින් සකාරණ කොට පැණ පුළුවුස්නා ලද්දේ කථාව හිඳුවයි, නොවිසඳයි. මම මොවුන් දෙදෙන (වෙහෙසින්) මුදන්නෙම් නම් මැනවැ නු! යි. එසඳ භාග්‍යවතුන් වහන්සේ සඞ්ගාරව බ්‍රාහමණයාහට මෙසේ වදාළ සේක: බ්‍රාහමණය, අද රාජාන්තඃපුරයෙහි රජපිරිස්හි රැස්ව හුන්නවුන් අතර කවර නම් අතුරු කථායෙක් පහළවීද? යි. භවත් ගෞතමයන් වහන්ස, අද රාජාන්තඃපුරයෙහි රජපිරිස්හි රැස්ව හුන්නවුන් අතර මේ අතුරු කථාව උපන: පෙර භික්ෂූහු අල්පතර වූහ. බහුතර භික්ෂූහු උතුරු මිනිස්දම්න් ඉද්ධිපෙළහර දැක්වූහ. මෙකල වනාහි භික්ෂූහු ද බහුතර වෙති. අල්පතර භික්ෂු කෙනෙක් උතුරු මිනිස්දම්න් ඉද්ධිපෙළහර දක්වතියි, භවත් ගෞතමයන් වහන්ස, අද රාජාන්තඃපුරයෙහි රජපිරිස්හි රැස්ව හුන්නවුන් අතර මේ අතුරු කථාව උපන.

බමුණ, මේ පෙළහර තුණෙකි. කවර තුණෙක යත්: ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යය, ආදේශනාප්‍රාතිහාර්‍ය්‍යය, අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි. බමුණ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යය කවරැ: බ්‍රාහමණය, මෙලොව්හි කිසිවෙක් නන්වැදෑරුම් ඍද්ධිප්‍රභෙද වළඳ කෙරෙයි (තෙමේ) එකලාවූයේ ම බහු ප්‍රකාර වෙයි. බහුප්‍රකාර ද වී එකෙක් වෙයි. විටෙක පැනෙන බවට ද විටෙක නො පැනෙන බවට ද පැමිණෙයි. භිත්තියෙන් ඈතට ද, පවුරෙන් ඈතට ද, පව්වෙන් ඈතට ද අහසෙහි මෙන් නො ගැටී යෙයි පොළොවෙහි ද දියෙහි මෙන් කිමිදීම් ඉල්පීම් කෙරෙයි. අභිද්‍යමාන උදකයෙහි දු පොළොවෙහි මෙන් යෙයි. අහස්හිදු පියාහඹන ලිහිණියකු සෙයින් පලඟින් ඉරියව් කෙරෙයි. මේ සා මහත් ඍද්ධ්‍යනුභාව ඇති මේ සඳහිරු දෙදෙනා ද අත්ලෙන් පරාමර්‍ශ කෙරෙයි, පිරිමදියි. බඹලොව තෙක්දු කයින් විසිය පවත්වයි. බමුණ, මේ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යය යි කියනු ලැබේ.

බමුණ, ආදේශනා ප්‍රාතිහාර්‍ය්‍යය කවරැ: බමුණ, මෙලොව්හි කිසිවෙක් තාගේ සිත මෙසේත් වෙයි. තාගේ සිත මෙබඳුත් වෙයි. තාගේ සිත මේ අයුරුදු වෙයි. නිමිත්තෙන් දක්වයි. හෙ තෙමේ බොහෝ කොට ද දක්වයි. එය එසේ ම වෙයි. අන්පරිදි නො වෙයි.

බමුණ, මෙලොව්හි කිසිවෙක් නිමිත්තෙන් නො කියන්නේ ම වෙයි. වැලිදු වනාහි මනුෂ්‍යයන්ගේ වේවයි අමනුෂ්‍යයන්ගේ වේවයි දේවතාවන්ගේ වේවයි ශබ්දය අසා තාගේ සිත මෙසේත් වෙයි. තාගේ සිත මෙබඳුත් වෙයි. තාගේ සිත මේ අයුරුදු වේයයි කියයි. හේ බොහෝ කොටත් කියන්නේ නම් එය එසේ ම වෙයි. අන්පරිදි නො වේ.

බමුණ, මෙලොව්හි කිසිවෙක් නිමිත්තෙනුදු නොමැ කියා මැ යි. මනුෂ්‍යයන්ගේ වේවයි අමනුෂ්‍යයන්ගේ වේවයි දේවතාවන්ගේ වේවයි ශබ්දය අසා ද නො මැ කිය යි. වැලිදු විතර්‍කනය කරන්නහුගේ විචාරය කරන්නහුගේ විතර්‍කවිස්ඵාරශබ්දය අසා තාගේ සිත මෙසේත් වෙයි. තාගේ සිත මෙබඳුත් වෙයි. තාගේ සිත මේ අයුරැත් වේය යි කියයි. හෙතෙම බොහෝ කොටත් කියන්නේ නම්, එය එසේ ම වෙයි. අන් පරිදි නො වේ.

ඉධ පන බ්‍රාහ්මණ, එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, නපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, නපි විතක්කයතො නපි විචාරයතො න විතක්කවිප්ඵාරසද්දං සුත්වා ආදිසති: අපි ච ඛො අවිතක්කං අවිචාරං සමාධිං සමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාති. යථා ඉමස්ස භොතො මනොසඞ්ඛාරා පණිහිතා, ඉමස්ස චිත්තස්ස අනන්තරා අමුන්නාම විතක්කං විතක්කිස්සතීති, සො බහුඤ්චෙපි ආදිසති. තථෙව තං හොති, නො අඤ්ඤථා. ඉදං වුච්චති බ්‍රාහ්මණ ආදෙසනා-පාටිහාරියං.

කතමඤ්ච බ්‍රාහ්මණ, අනුසාසනීපාටිහාරියං: ඉධ බ්‍රාහ්මණ, එකච්චො එවමනුසාසති: එවං විතක්කෙථ, මා එවං විතක්කයිත්ථ, එවං මනසි කරොථ, මා එවං මනසාකත්ථ, ඉදං පජහථ, ඉදං උපසම්පජ්ජ විහරථාති ඉදං වුච්චති බ්‍රාහ්මණ අනුසාසනීපාටිහාරියං. ඉමානි ඛො බ්‍රාහ්මණ තීණි පාටිහාරියානි. ඉමෙසං තෙ බ්‍රාහ්මණ, තිණ්ණං පාටිහාරියානං කතමං පාටිහාරියං ඛමති අභික්කන්තතරඤ්ච පණීතතරඤ්චාති.

තත්‍ර භො ගොතම යදිදං[1] පාටිහාරියං, ඉධෙකච්චො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. ඉදං භො ගොතම පාටිහාරියං යොච[2] නං කරොති, සොච[2] තං පටිසංවෙදෙති. යොච තං කරොති, තස්සෙව තං හොති. ඉදං මෙ භො ගොතම පාටිහාරියං මායාසහධම්මරූපං විය ඛායති.

යම්පිදං භො ගොතම පාටිහාරියං ඉධෙකච්චො නිමිත්තෙන ආදිසති: එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්තන්ති. සො බහුඤ්චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා. ඉධ පන භො ගොතම, එකච්චො නහෙව ඛො නිමිත්තෙන ආදිසති, අපි ච ඛො මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති: -පෙ- අපි ච ඛො විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාරසද්දං සුත්වා ආදිසති -පෙ- නපි විතක්කයතො නපි විචාරයතො විතක්කවිප්ඵාරසද්දං සුත්වා ආදිසති, අපි ච ඛො අවිතක්කං අවිචාරං සමාධිං සමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාති: යථා ඉමස්ස භොතො මනොසඞ්ඛාරා පණිහිතා ඉමස්ස චිත්තස්ස අනන්තරා අමුන්නාම විතක්කං විතක්කිස්සතීති. සො බහුඤ්චෙපි ආදිසති, තථෙව තං හොති. නො අඤ්ඤථා. ඉදම්පි භො ගොතම පාටිහාරියං යොච තං කරොති සොච තං පටිසංවෙදෙති. යොච තං කරොති, තස්සෙව[3] තං හොති. ඉදම්පි භො ගොතම පාටිහාරියං මායාසහධම්මරූපං විය ඛායති.

යඤ්ච ඛො ඉදං භො ගොතම පාටිහාරියං ඉධෙකච්චො එවමනුසාසති: එවං විතක්කෙථ, මා එවං විතක්කයිත්ථ, එවං මනසි කරොථ, මා එවං මනසාකත්ථ, ඉදං පජහථ, ඉදං උපසම්පජ්ජ විහරථාති. ඉදමෙව භො ගොතම පාටිහාරියං ඛමති ඉමෙසං තිණ්ණං පාටිහාරියානං අභික්කන්ත-තරඤ්ච පණීතතරඤ්ච.

1 යම්දං - ස්‍යා. කං. 2. යොච, - ස්‍යා. කං. TPS. සොච - ස්‍යා. 2. කං. PTS
3. තස්සෙමෙව - සිමු.

බ්‍රාහමණය, මෙලොව්හි කිසිවෙක් නිමිත්තෙනුදු නො කියා මැයි. මනුෂ්‍ය-යන්ගේ වේවයි අමනුෂ්‍යයන්ගේ වේවයි දේවතාවන්ගේ වේවයි ශබ්දය අසා ද නො කියා මැ යි. විතර්ක කරන්නහුගේ හෝ විචාරය කරන්නහුගේ හෝ විතර්ක විෂ්ඵාරශබ්දය අසා ද නො කියා මැ යි. වැලිදු අවිතර්ක වූ අවිචාර වූ සමාධියට සමවන් තමාගේ සිතින් ඔහු සිත පිරිසිඳ දන්නේය. යම්සේ මේ භවත්හුගේ මනසංස්කාරයෝ පිහිටුවන ලද්දාහු ද, මේ සිතට අනතුරුව අසෝ විතර්කය විතර්කණය කරන්නේය කියායි. හේ බොහෝ කොට ද කියා නම්, එය එසේ ම වෙයි. අන්පරිද්දකින් නො වෙයි. බමුණ, මේ ආදේශනා ප්‍රාතිහාර්‍ය්‍ය යි කියනු ලැබේ.

බමුණ, අනුසාසනීපාටිහාරිය කවරු: බමුණ, මෙලොව්හි කිසිවෙක් මෙසේ අනුශාසනා කෙරේ: මෙසේ සිතව, නහමක් මෙසේ සිතව, මෙසේ මෙනෙහි කරව, නහමක් මෙසේ මෙනෙහි කරව, මෙය දුරලව, මෙයට පැමිණ වසව කියායි. බමුණ, මේ අනුසාසනීපාටිහාරිය යි කියනු ලැබේ. බමුණ, මේ වනාහි පෙළහර තුණයි. බමුණ, මේ තුන්පෙළහර අතුරෙන් කවර පෙළහරෙක් ඉතා කල්යෑ යි ද, ඉතා ප්‍රණීතය යි ද තට රුස්නේ වේ ද?

භවත් ගෞතමයන් වහන්ස, මෙලොව්හි කිසිවෙක් නන් වැදෑරුම් ඍද්ධිවිධ පවත්වයි. ... බඹලොව තෙක් ද කයින් වසය පවත්වයි, යන යම් පෙළහරෙක් වේ ද, භවත් ගෞතමයන් වහන්ස, මේ ප්‍රාතිහාර්‍ය්‍ය යමෙක් කෙරේ නම්, එය හේ ම විඳුනේය. යමෙක් එය කෙරේ නම්, ඔහුට ම එය වෙයි. භවත් ගෞතමයන් වහන්ස, මේ ප්‍රාතිහාර්‍ය්‍ය මායාස්වභාව ඇතිසේ මට වැටහේ.

භවත් ගෞතමයන් වහන්ස, යම් ප්‍රාතිහාර්‍ය්‍යයෙක් වේ ද? එනම්: මෙ ලොව්හි කිසිවෙක් තාගේ සිත මෙසේත් වෙයි. තාගේ සිත මෙබඳුත් වෙයි. තාගේ සිත මෙ අයුරුදු වේය යි නිමිත්තෙන් කියයි. හේ බොහෝ කොට ද කියා නම්, එය එසේ ම වේ. අන් පරිදි නො වේ. භවත් ගෞතමයන් වහන්ස, මෙලොව්හි කිසිවෙක් නිමිත්තෙන් නො ම කියයි. වැලිත් මනුෂ්‍යයන්ගේ වේවයි අමනුෂ්‍යයන්ගේ වේවයි දේවතාවන්ගේ වේවයි ශබ්දය අසා කියයි... වැලිදු විතර්ක කරන්නහුගේ විචාර කරන්නහුගේ විතර්කවිෂ්ඵාර ශබ්දය අසා කියයි. ... විතර්ක කරන්නහුගේ විචාර කරන්නහුගේ විතර්කවිෂ්ඵාර ශබ්දය අසා ද නො කියයි. වැලිදු අවිතර්ක වූ අවිචාර වූ සමාධියට සමවන් තමාගේ සිතින් (මෙරමා) සිත පිරිසිඳ දන්නේය. යම්සේ මේ භවත්හුගේ මනඃ-සංස්කාරයෝ පිහිටුවන ලද්දාහු ද මේ සිතට අනතුරුව අසෝ විතර්කය කරන්නේය කියායි. හේ බොහෝ කොට ද කියා නම්, එය එසේ ම වේ. අන් පරිදි නො වේ. භවත් ගෞතමයන් වහන්ස, මේ පෙළහර ද යමෙක් ම කෙරේ නම් එය හෙ ම විඳුනේය. යමෙක් එය කෙරේ නම් එය ඔහුට ම වේ. භවත් ගෞතමයන් වහන්ස, මේ පෙළහර ද මායාස්වභාව ඇතිසේ මට වැටහේ.

භවත් ගෞතමයන් වහන්ස, යම් ප්‍රාතිහාර්‍ය්‍යයෙක් වේ ද, එනම්: මෙලොව්හි කිසිවෙක් මෙසේ අනුශාසනා කෙරෙයි: මෙසේ සිතව. නහමක් මෙසේ සිතව. මෙසේ මෙනෙහි කරව. නහමක් මෙසේ මෙනෙහි කරව. මෙය දුරලව. මෙයට පැමිණ වසව කියායි. භවත් ගෞතමයන් වහන්ස, මේ ප්‍රාතිහාර්‍ය්‍ය මේ **තුන්** ප්‍රාතිහාර්‍ය්‍යයන් අතුරෙන් අතිශය මනාපා යි ද අතිශය ප්‍රණීතය යි ද (මට) වැටහේ.

අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යාව සුභාසිතමිදං භොතා ගොතමෙන. ඉමෙහි ච මයං තීහි පාටිහාරියෙහි සමන්නාගතං භවන්තං ගොතමං ධාරෙම. භවං හි ගොතමො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. භවං හි ගොතමො අවිතක්කං අවිචාරං සමාධිං සමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාති යථා ඉමස්ස භොතො මනොසඞ්ඛාරා පණිහිතා ඉමස්ස චිත්තස්ස අනන්තරා අමුන්නාම විතක්කං විතක්කිස්සතීති. භවං හි ගොතමො එවමනුසාසති: එවං විතක්කෙථ, මා එවං විතක්කයිත්ථ, එවං මනසි කරොථ, මා එවං මනසාකත්ථ. ඉදං පජහථ, ඉදං උපසම්පජ්ජ විහරථාති.

අද්ධා ඛො ත්‍යායං බ්‍රාහ්මණ ආසජ්ජ උපනීයවාචා භාසිතා, අපි ච ත්‍යාහං ව්‍යාකරිස්සාමි. අහං හි බ්‍රාහ්මණ අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොමි -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙමි. අහං හි බ්‍රාහ්මණ අවිතක්කං අවිචාරං සමාධිං සමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාමි, යථා ඉමස්ස භොතො මනොසඞ්ඛාරා පණිහිතා ඉමස්ස චිත්තස්ස අනන්තරා අමුන්නාම විතක්කං විතක්කිස්සතීති.[1] අහං හි බ්‍රාහ්මණ එවමනුසාසාමි: එවං විතක්කෙථ, මා එවං විතක්කයිත්ථ. එවං මනසි කරොථ, මා එවං මනසාකත්ථ, ඉදං පජහථ, ඉදං උපසම්පජ්ජ විහරථාති.

අත්ථි පන භො ගොතම අඤ්ඤො එකභික්ඛුපි යො ඉමෙහි තීහි පාටිහාරියෙහි සමන්නාගතො? අඤ්ඤත්‍ර භොතා ගොතමෙනාති. න ඛො බ්‍රාහ්මණ එකංයෙව සතං, න ද්වෙ සතානි, න තීණි සතානි, න චත්තාරි සතානි, න පඤ්චසතානි. අථ ඛො භිය්‍යොව යෙ භික්ඛූ ඉමෙහි තීහි පාටිහාරියෙහි සමන්නාගතාති. කහං පන භො ගොතම එතරහි තෙ භික්ඛූ විහරන්තීති? ඉමස්මිං යෙව ඛො බ්‍රාහ්මණ භික්ඛුසඞ්ඝෙති.

අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණංගතන්ති.

බ්‍රාහ්මණවග්ගො පඨමො.

---

* තස්සුද්දානං:-
ද්වෙ බ්‍රාහ්මණා චඤ්ඤතරො - පරිබ්බාජකෙන නිබ්බුතං
පලොකවජ්ජෙඛා තිකණ්ණො - සොණිසඞ්ගාරවෙන චාති - මජ්ඣං.

1. විතක්කෙස්සති - මජ්ඣං.

භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්‍ය්‍යය. අද්භූතය. භවත් ගෞතමයන් වහන්සේ විසින් මෙ යාවත්සුභාෂිතය. අපි භවත් ගෞතමයන් වහන්සේ මේ තුන් පෙළහරින් සමන්විත කොට දරම්හ භවත් ගෞතමයන් වහන්සේ වනාහි නන්වැදෑරුම් ඍද්ධිවිධ වළඳ කෙරෙති. ... බඹලොව තෙක් ද කයින් වසය පවත්වති. භවත් ගෞතමයන් වහන්සේ ම අවිතර්‍ක වූ අවිචාර වූ සමාධියට සමවත් තමාගේ සිතින් මෙරමා සිත පිරිසිඳ දන්නාහ. 'මේ පින්වත්-හුගේ මනස්සංස්කාරයෝ යම්සේ පිහිටුවන ලද්දාහු නම්, මේ සිතට අනතුරුව අසෝ නම් විතර්‍කය විතර්‍කණය කරන්නේය' කියායි. භවත් ගෞතමයන් වහන්සේ ම මෙසේ අනුශාසනා කරණ සේක: 'මෙසේ සිතව. නහමක් මෙසේ සිතව. මෙසේ මෙනෙහි කරව. නහමක් මෙසේ මෙනෙහි කරව. මෙය දුර ලව මෙය උපයාගෙණ වසව' යි කියායි.

බමුණ, ඒකාන්තයෙන් තා විසින් (මා ගුණෙහි) ගටා මවෙන එළවා (නතු කොට) බසෙක් කියන ලදි. වැලිදු මම තට ප්‍රකාශ කරමි. බමුණ, මම ම නන් වැදෑරුම් ඍද්ධිවිධ වළඳ කරමි. ... බඹලොව තෙක්දු කයින් වසය පවත්වමි. බමුණ, මම ම අවිතර්‍ක වූ අවිචාර වූ සමාධියට සමවත් මාගේ සිතින් (ඔහු) සිත පිරිසිඳ දනිමි' මේ භවත්හුගේ මනස්සංස්කාරයෝ යම් පරිද්දෙකින් පිහිටුවන ලද්දාහු ද (එහෙයින්) මේ සිතට අනතුරුව අසෝ නම් විතර්‍කය විතර්‍කණය කරන්නේය' යි. බමුණ, මම ම මෙසේ අනුශාසනා කරමි: 'මෙසේ සිතව. නහමක් මෙසේ සිතව. මෙසේ මෙනෙහි කරව. නහමක් මෙසේ මෙනෙහි කරව. මෙය දුර ලව. මෙයට පැමිණ වසව' යි.

භවත් ගෞතමයන් වහන්ස, භවත් ගෞතමයන් වහන්සේ තබා මේ ප්‍රාතිහාර්‍ය්‍ය තුණෙන් යුක්ත වූ යම් කිසි අන් එක ද භික්ෂුවෙක් ඇත් ද? බමුණ, එක් සියෙක් ම නො වේ. දෙසියෙක් ම නො වේ. තුන්සියෙක් ම නො වේ. සාර සියෙක් ම නො වේ. පන්සියෙක් ම නො වේ. වැලිදු යම් කිසිවෙක් මේ ප්‍රාතිහාර්‍ය්‍ය තුණෙන් සමන්විත නම්, ඔහු බෙහෙව. භවත් ගෞතමයන් වහන්ස, ඒ භික්ෂූහු මෙකල කොහි වෙසෙත් ද? බමුණ මේ භික්ෂුසඞ්ඝයා කෙරෙහි මැ වෙති.

භවත් ගෞතමයන් වහන්ස, ඉකැලි. භවත් ගෞතමයන් වහන්ස, ඉකැලි. ... භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් කොට දිවියෙන් ගත් සරණ ගිය උවසුවකු කොට දරණ සේක්වා යී.

**පළමුවන බ්‍රාහමණ වර්‍ගයයි.**

# [ 2. මහාවග්ගො ]

## 3. 2. 2. 1.

### [සාවත්ථිනිදානං:]

11. තීණිමානි භික්ඛවෙ තිත්ථායතනානි, යානි පණ්ඩිතෙහි සමනුයුඤ්ජිය-මානානි සමනුගාහියමානානි සමනුභාසියමානානි[1] පරම්පි ගන්ත්වා අකිරියාය සණ්ඨහන්ති. කතමානි තීණි: සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා එවං-වාදිනො එවංදිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙකතහෙතූති. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා, අදුක්ඛමසුඛං වා, සබ්බං තං ඉස්සරනිම්මාණ-හෙතූති. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං අහෙතුඅප්පච්චයාති.

තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙ කතහෙතූති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවංවාදිනො එවංදිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙකත-හෙතූති?. තෙ[2] චෙ මෙ එවං පුට්ඨා ආමාති පටිජානන්ති, ත්‍යාහං එවං වදාමි: තෙනහායස්මන්තො පාණාතිපාතිනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, අදින්නා-දායිනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, අබ්‍රහ්මචාරිනො භවිස්සන්ති පුබ්බෙ-කතහෙතු, මුසාවාදිනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, පිසුනවාචා භවිස්සන්ති පුබ්බෙකතහෙතු. ඵරුසවාචා භවිස්සන්ති පුබ්බෙකතහෙතු, සම්ඵප්පලාපිනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, අභිජ්ඣාලුනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, බ්‍යාපන්නචිත්තා භවිස්සන්ති පුබ්බෙකතහෙතු, මිච්ඡාදිට්ඨිකා භවිස්සන්ති පුබ්බෙකතහෙතු.

පුබ්බෙකතං ඛො පන භික්ඛවෙ සාරතො පච්චාගච්ඡතං න හොති ඡන්දො වා වායාමො වා, ඉදං වා කරණීයං ඉදං වා අකරණීයන්ති. ඉති කරණීයා-කරණීයෙ ඛො පන සච්චතො ථෙතතො අනුපලබ්භියමානෙ මුට්ඨස්සතීනං අනාරක්ඛානං විහරතං න හොති පච්චත්තං සහධම්මිකො සමණවාදො. අයං ඛො මෙ භික්ඛවෙ තෙසු සමණබ්‍රාහ්මණෙසු එවංවාදිසු එවංදිට්ඨිසු පඨමො සහධම්මිකො නිග්ගහො හොති.

---

1. සමනුගාහියමානානි - මජසං. සෑා. 2. තෙ ච මෙ - මජසං.

# [ 2. මහාවග්ගය ]

## 3. 2. 2. 1

[සෑවැත්නිදානයි:]

11. මහණෙනි, යම් තීර්‍ථායතන කෙනෙක් (මේ කිනම් දෘෂ්ටියෙක්දැයි මෙසේ) නුවණැතියන් විසින් පුළුවුස්නා ලබන්නාහු (කවර හෙයින් මේ දෘෂ්ටි උපනැයි මෙසේ) පුන පුනා කරුණු ගන්වනු ලබන්නාහු (මේ ලමුදිටු හරුවයි මෙසේ) මොනොවට අනුශාසනා කරණු ලබන්නාහු (ආචාර්‍ය්‍ය - ලබ්ධි - ආත්මභාව) පරම්පරාවක් ගොසිනුදු අක්‍රියවාදයෙහි සිටිද්ද, එබඳු වූ මේ තීර්‍ථායතනයෝ තුන්දෙනෙක් වෙති. කවර තුන්දෙනෙක යත්: මහණෙනි, "මේ පුරුෂ පුද්ගල යම් කිසි සුඛවේදනාවෙක් වේවයි දුඃඛවේදනාවෙක් වේවයි උපේක්‍ෂාවේදනාවෙක් වේවයි විඳුනේ වේ ද, එ හැම පෙර කළ කම් හෙයිනැ"යි මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති මහණ බමුණු කෙනෙක් ඇත. මහණෙනි, "මේ පුරුෂ පුද්ගල යම් කිසි සුඛවේදනාවෙක් වේවයි දුඃඛවේදනාවෙක් වේවයි උපේක්‍ෂා වේදනාවෙක් වේවයි විඳුනේ වේ ද, එ හැම ඊශ්වරනිර්මාණ හේතුයෙනැ"යි මෙ බඳු වාද ඇති මෙ බඳු දෘෂ්ටි ඇති මහණ බමුණු කෙනෙක් ඇත. මහණෙනි, "මේ පුරුෂ පුද්ගල යම් කිසි සුඛවේදනාවෙක් වේවයි දුඃඛවේදනාවෙක් වේවයි උපේක්‍ෂා වේදනාවෙක් වේවයි විඳුනේ වේ ද, එ හැම අහේතු අප්‍රත්‍යයෙනැ"යි මෙ බඳු වාද ඇති මෙ බඳු දෘෂ්ටි ඇති මහණ බමුණු කෙනෙක් ඇත.

මහණෙනි, එහි ලා "මේ පුරුෂ පුද්ගල යම් කිසි සුඛවේදනාවෙක් වේවයි දුඃඛවේදනාවෙක් වේවයි උපේක්‍ෂාවේදනාවෙක් වේවයි විඳුනේ වේ ද, එ හැම පෙර කළ කම් හෙයිනැ"යි මෙ බඳු වාද ඇති මෙ බඳු දෘෂ්ටි ඇති යම් මහණ බමුණෝ ඇද්ද, මම ඔවුන් වෙත එළඹ මෙසේ කියමි: ආයුෂ්මත්නි, "මේ පුරුෂ පුද්ගල යම් කිසි සුඛවේදනාවෙක් වේවයි දුඃඛවේදනාවෙක් වේවයි උපෙක්‍ෂා වේදනාවෙක් වේවයි විඳුනේ වේ ද, එ හැම පෙර කළ කම් හෙයිනැ"යි තෙපි මෙ බඳු වාද ඇත්තහු ල, මෙ බඳු දෘෂ්ටි ඇත්තහු ල, ඒ සැබෙවෙක් වේ ද? ඉදින් ඔහු මා විසින් මෙසේ පුළුවුස්නා ලද්දාහු සැබෑවැයි පිළිණ කෙරෙත් ද, මම ඔවුනට මෙසේ කියමි: 'ආයුෂ්මත්නි, එසේ වී නම් ආයුෂ්මත්හු පෙර කළ කම් හෙයින් පණිවා කරන්නාහු වෙති, පෙර කළ කම් හෙයින් අයිනාදන් ගන්නාහු වෙති, පෙර කළ කම් හෙයින් අබ්‍රහ්මචාරීහු වෙති, පෙර කළ කම් හෙයින් මුසවා බණන්නාහු වෙති, පෙර කළ කම් හෙයින් පිසුනුබස් ඇත්තාහු වෙති, පෙර කළ කම් හෙයින් පරෙස් බස් ඇත්තාහු වෙති, පෙර කළ කම් හෙයින් හිස් බස් තෙපලන්නාහු වෙති, පෙර කළ කම් හෙයින් දැඩලොභ ඇත්තාහු වෙති, පෙර කළ කම් හෙයින් ව්‍යාපාදයට පත් සිත් ඇත්තාහු වෙති, පෙර කළ කම් හෙයින් මිසදිටු ඇත්තාහු වෙති' යි.

මහණෙනි, පෙර කළ කම් සාර වශයෙන් පිළිගන්නවුනට 'මෙය කටයුතු ය හෝ මෙය නො කටයුතු ය හෝ' යි කර්‍තුකාමතා සඞ්ඛ්‍යාත ඡන්දයෙක් වේවයි ව්‍යායාමයෙක් වේවයි නො වේ. මෙසේ කරණී නො කරණී සත්‍ය වශයෙන් ස්ථිරවශයෙන් නො ලැබෙන් ම, නට සිහි ඇති ඉන්ද්‍රියසංවරයෙන් තොරව වසන්නවුනට තමා කෙරෙහි හේතු සහිත වූ ශ්‍රමණවාදයෙක් නො වේ. මහණෙනි, මෙ බඳු වාද ඇති මෙ බඳු දෘෂ්ටි ඇති ඒ මහණ බමුණන් කෙරෙහි මාගේ මේ ප්‍රථම වූ සකාරණ නිග්‍රහය වේ.

තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං ඉස්සරනිම්මාණහෙතූති, ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි. සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවංවාදිනො එවංදිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං ඉස්සරනිම්මාණහෙතූති. තෙ වෙ[1] මෙ එවං පුට්ඨා ආමාති[2] පටිජානන්ති, ත්‍යාහං එවං වදාමි: තෙන හායස්මන්තො පාණාතිපාතිනො භවිස්සන්ති ඉස්සරනිම්මාණහෙතු -පෙ- මිච්ඡාදිට්ඨිකා භවිස්සන්ති ඉස්සරනිම්මාණහෙතු.

ඉස්සරනිම්මාණං ඛො පන භික්ඛවෙ සාරතො පච්චාගච්ඡතං න හොති ඡන්දො වා වායාමො වා, ඉදං වා කරණීයං ඉදං වා අකරණීයන්ති. ඉති කරණීයාකරණීයෙ ඛො පන සච්චතො ථෙතතො අනුපලබ්භියමානෙ මුට්ඨස්සතීනං අනාරක්ඛානං විහරතං න හොති පච්චත්තං සහධම්මිකො සමණවාදො. අයං ඛො මෙ භික්ඛවෙ තෙසු සමණබ්‍රාහ්මණෙසු එවංවාදිසු එවංදිට්ඨිසු දුතියො සහධම්මිකො නිග්ගහො හොති.

තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං අහෙතුඅප්පච්චයාති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවංවාදිනො එවංදිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං අහෙතුඅප්පච්චයාති? තෙ වෙ මෙ එවං පුට්ඨා ආමාති[2] පටිජානන්ති: ත්‍යාහං එවං වදාමි: තෙන හායස්මන්තො පාණාතිපාතිනො භවිස්සන්ති අහෙතුඅප්පච්චයා -පෙ- මිච්ඡාදිට්ඨිකා භවිස්සන්ති අහෙතුඅප්පච්චයා.

අහෙතුං අප්පච්චයං* ඛො පන භික්ඛවෙ සාරතො පච්චාගච්ඡතං න හොති ඡන්දො වා වායාමො වා, ඉදං වා කරණීයං, ඉදං වා අකරණීයන්ති. ඉති කරණීයාකරණීයෙ ඛො පන සච්චතො ථෙතතො අනුපලබ්භියමානෙ මුට්ඨස්සතීනං අනාරක්ඛානං විහරතං න හොති පච්චත්තං සහධම්මිකො සමණවාදො. අයං ඛො මෙ භික්ඛවෙ තෙසු සමණබ්‍රාහ්මණෙසු එවංවාදිසු එවංදිට්ඨිසු. තතියො සහධම්මිකො නිග්ගහො හොති.

---

1. තෙ ච මෙ - මජසං. 2. ආමොති - මජසං, ස්‍යා, PTS.

* අහෙතුං - සීමු. අහෙතු - ස්‍යා. කං, අහෙතු අප්පච්චයා - PTS. මජසං

මහණෙනි, එහි ලා "මේ පුරුෂ පුද්ගල යම් කිසි සුඛවේදනායෙක් වේවයි දුඃඛවේදනායෙක් වේවයි උපෙක්‍ෂාවේදනායෙක් වේවයි විඳුනේ වේ ද එ හැම ඊශ්වරනිර්මාණ හේතුයෙනැ"යි මෙ බඳු වාද ඇති මෙ බඳු දෘෂ්ටි ඇති යම් මහණ බමුණු කෙනෙක් වෙත් ද, මම ඔවුන් වෙත එළඹ මෙසේ කියමි: ආයුෂ්මත්නි, "මේ පුරුෂ පුද්ගල යම් කිසි සුඛවේදනායෙක් වේවයි දුඃඛවේදනායෙක් වේවයි උපේක්‍ෂාවේදනායෙක් වේවයි විඳුනේ වේ ද, එ හැම ඊශ්වරනිර්මාණ හේතුයෙනැ"යි තෙපි මේ බඳු වාද ඇත්තහු ල, මෙ බඳු දෘෂ්ටි ඇත්තහු ල, ඒ සැබෙවෙක් ද? ඉදින් ඔහු මා විසින් මෙසේ පුළුවුස්නා ලද්දහු සැබැවැයි පිළිණ කෙරෙත් ද, මම ඔවුනට මෙසේ කියමි: එසේ වී නම් ආයුෂ්මත්හු ඊශ්වරනිර්මාණහේතුයෙන් පණිවා කරන්නාහු වෙති. ... ඊශ්වර-නිර්මාණහේතුයෙන් මිසදිටු ඇත්තාහු වෙති.

මහණෙනි, ඊශ්වරනිර්මාණය වනාහි සාරභාවයෙන් පිළිගත්තවුනට මේ කළයුතුය කියා වේවයි මේ නො කළයුතුය කියා වේවයි ඡන්දයෙක් හෝ ව්‍යායාමයෙක් හෝ නො වෙයි. මෙසේ කර්තව්‍යාකර්තව්‍ය දෙක සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් නො ලැබෙත් ම, නට සිහි ඇති ව ඉන්ද්‍රියසංවරයෙන් තොරව වසන්තවුනට තමා කෙරෙහි හේතු සහිත වූ ශ්‍රමණවාදයෙක් නො වේ. මහණෙනි, මෙ බඳු වාද ඇති මෙ බඳු දෘෂ්ටි ඇති ඒ මහණබමුණන් කෙරෙහි මාගේ මේ දෙවනු වූ සහේතුක නිග්‍රහය වේ.

මහණෙනි, එහි ලා "මේ පුරුෂ පුද්ගල යම් කිසි සුඛවේදනායෙක් වේවයි දුඃඛවේදනායෙක් වේවයි උපේක්‍ෂාවේදනායෙක් වේවයි විඳුනේ වේ ද, එ හැම අහේතු අප්‍රත්‍යයෙනැ"යි මෙ බඳු වාද ඇති මෙ බඳු දෘෂ්ටි ඇති යම් මහණ බමුණු කෙනෙක් වෙත් ද, මම ඔවුන් වෙත එළඹ මෙසේ කියමි: "ආයුෂ්මත්නි, තෙපි මේ පුරුෂ පුද්ගල යම් කිසි සුඛවේදනායෙක් වේවයි දුඃඛවේදනායෙක් වේවයි උපේක්‍ෂාවේදනායෙක් වේවයි විඳුනේ වේ ද, එ හැම අහේතු අප්‍රත්‍යයෙනැ"යි මෙ බඳු වාද ඇත්තහු ල, මෙ බඳු දෘෂ්ටි ඇත්තහු ල, ඒ සැබෙවෙක් ද? ඉදින් ඔහු මා විසින් මෙසේ පුළුවුස්නාලද්දහු 'සැබැවැ'යි පිළිණ කෙරෙත් ද, මම ඔවුනට මෙසේ කියමි: එසේ වී නම් ආයුෂ්මත්හු අහේතු අප්‍රත්‍යයෙන් පණිවා කරන්නාහු වෙති ... අහේතු අප්‍රත්‍යයෙන් මිසදිටු ඇත්තාහු වෙති.

මහණෙනි, අහේතු අප්‍රත්‍යය වනාහි සාරභාවයෙන් පිළිගත්තවුනට 'මේ කරණී වේවයි මේ නො කරණී වේවයි ඡන්දයෙක් හෝ ව්‍යායාමයෙක් හෝ නො වෙයි. මෙසේ කර්තව්‍යාකර්තව්‍ය දෙක සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් නො ලැබෙත් ම, නට සිහි ඇතිව ඉන්ද්‍රියසංවරයෙන් තොරව වසන්තවුනට තමා කෙරෙහි හේතු සහිත වූ ශ්‍රමණවාදයෙක් නො වේ. මහණෙනි, මෙ බඳු වාද ඇති මෙ බඳු දෘෂ්ටි ඇති ඒ මහණ බමුණන් කෙරෙහි මාගේ මේ තෙවනු වූ සකාරණ නිග්‍රහය වේ.

ඉමානි ඛො භික්ඛවෙ තීණි තිත්ථායතනානි: යානි පණ්ඩිතෙහි සමනුයුඤ්ජියමානානි සමනුගාහියමානානි සමනුභාසියමානානි පරම්පි ගන්ත්වා අකිරියාය සණ්ඨහන්ති.

අයං ඛො පන භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. කතමො ච භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. ඉමා ඡ ධාතුයොති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො - පෙ - අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. ඉමානි ඡ ඵස්සායතනානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො - පෙ - අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. ඉමෙ අට්ඨාරස මනොපවිචාරාති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො -පෙ- අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. ඉමානි චත්තාරි අරියසච්චානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො -පෙ- සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

ඉමා ඡ ධාතුයොති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති: ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඡයිමා භික්ඛවෙ ධාතුයො: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු ආකාසධාතු විඤ්ඤාණධාතු. ඉමා ඡ ධාතුයොති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති. ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

මහණෙනි, යම් තීර්ථායතන කෙනෙක් (මේ කිනම් දෘෂ්ටියෙක්දැයි මෙසේ) නුවණැතියන් විසින් පුළුවුස්නා ලබන්නාහු (කවර හෙයින් මේ දෘෂ්ටි උපනැයි මෙසේ) පුන පුනා කරුණු ගන්වනු ලබන්නාහු ( මේ ලමුදිවූ හරුවයි මෙසේ ) මොනොවට අනුශාසනා කරණු ලබන්නාහු (ආචාර්ය-ලබ්ධි-අත්මභාව පරම්පරාවක් ගොසිනුදු) අක්‍රියවාදයෙහි සිටිත් ද, එබඳු වූ මේ තීර්ථායතනයෝ තුන් දෙන වෙති.

මහණෙනි, මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි, කෙලෙසන්නට නොහැකි, උපවාද කරන්නට නොහැකි, බැහැර කරන්නට නොහැකි, මේ ධර්මයෙක් මා විසින් දෙසන ලද්දේ ය. මහණෙනි, මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි, කෙලෙසන්නට නොහැකි, උපවාද කරන්නට නොහැකි බැහැර කරන්නට නොහැකි මා විසින් දෙසන ලද ඒ ධර්මය කවරේ ය? යත්: මහණෙනි, 'මේ ධාතු සයෙක' යනු මා විසින් දෙසන ලද. මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි කෙලෙසන්නට නොහැකි උපවාද කරන්නට නොහැකි බැහැර කරන්නට නොහැකි ධර්මය සි මහණෙනි, 'මේ ස්පර්ශායතන සයෙක' යනු මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි ... බැහැර කරන්නට නොහැකි මා විසින් දෙසන ලද ධර්මය සි. මහණෙනි, 'මේ අටළොස් තැනෙක්හි පවත්නා මනෝපවිචාරයෝ ය' යනු මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි ... බැහැර කරන්නට නොහැකි මා විසින් දෙසන ලද ධර්මය සි. මහණෙනි, 'මේ සතර ආර්ය සත්‍යයෝ ය' යනු මා විසින් දෙසන ලද....මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් ... බැහැර කරන්නට නොහැකි ධර්මය සි.

මහණෙනි, මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි ... බැහැර කරන්නට නොහැකි 'මේ ධාතු සයෙකැ' යි දහමෙක් මා විසින් දෙසන ලදැයි මෙසේ තෙල කියන ලද්දේ මය. තෙල කුමක් සඳහා කියන ලද ද යත්: මහණෙනි, මේ ධාතුහු සදෙනෙකි: පඨවි-ධාතු යැ, ආපෝධාතු යැ, තේජෝධාතු යැ, වායෝධාතු යැ, ආකාසධාතු යැ, විඤ්ඤාණධාතු යි. මහණෙනි, මේ ෂඩ්ධාතුහු යැ යි, මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි ... බැහැර කරන්නට නොහැකි වූ ධර්මයෙක් මා විසින් දෙසන ලදැයි මෙසේ යමක් කියන ලද ද මෙය තෙල කරුණු නිසා කියන ලද.

ඉමානි ඡ ඵස්සායතනානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසංකිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති, ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඡයිමානි භික්ඛවෙ ඵස්සායතනානි: චක්ඛුං[1] ඵස්සායතනං සොතං ඵස්සායතනං ඝානං ඵස්සායතනං ජිව්හා ඵස්සායතනං කායො ඵස්සායතනං මනො ඵස්සායතනං. ඉමානි ඡ ඵස්සායතනානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති. ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමෙ අට්ඨාරස මනොපවිචාරාති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති. ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: චක්ඛුනා රූපං දිස්වා සොමනස්සට්ඨානීයං රූපං උපවිචරති, දොමනස්සට්ඨානීයං රූපං උපවිචරති, උපෙක්ඛාට්ඨානීයං රූපං උපවිචරති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය සොමනස්සට්ඨානීයං ධම්මං උපවිචරති. දොමනස්සට්ඨානීයං ධම්මං උපවිචරති, උපෙක්ඛාට්ඨානීයං ධම්මං උපවිචරති. ඉමෙ අට්ඨාරස මනොපවිචාරාති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති. ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමානි චත්තාරි අරියසච්චානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති. ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඡන්නං භික්ඛවෙ ධාතූනං උපාදාය ගබ්භස්සාවක්කන්ති හොති, ඔක්කන්තියා සති නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා. වෙදියමානස්ස ඛො පනාහං භික්ඛවෙ ඉදං දුක්ඛන්ති පඤ්ඤපෙමි. අයං දුක්ඛසමුදයොති පඤ්ඤපෙමි. අයං දුක්ඛනිරොධොති පඤ්ඤපෙමි[2], අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති පඤ්ඤපෙමි.

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛං අරියසච්චං: ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛො[3] මරණම්පි දුක්ඛං, සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා,* යම්පිච්ඡං න ලභති, තම්පි දුක්ඛං. සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා. ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛං අරියසච්චං.

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛසමුදයො[3] අරියසච්චං: අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛසමුදයො අරියසච්චං.

---

1. චක්ඛුඵස්සායතනං - මජසං. 2. පඤ්ඤපෙති - මජසං. 3. මජසං - නත්ථි
* අප්පියෙහි සම්පයොගො දුක්ඛො. පියෙහි විප්පයොගො දුක්ඛො - සතා. සං.
3. දුක්ඛසමුදයං - සීමු.

මහණෙනි, මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි ... බැහැර කරන්නට නොහැකි වූ මේ ෂට්ස්පර්ශායතනයහ යි දහමෙක් මා විසින් දෙසන ලද්‍ද යි මෙසේ මේය කියන ලද්දේ මය. තෙල කුමක් සඳහා කියන ලද ද: මහණෙනි, මේ ඵස්සායතන සයෙකි: චක්ඛු නම් වූ ඵස්සායතනයෙක, සොත නම් වූ ඵස්සායතනයෙක, ඝාණ නම් වූ ඵස්සායතනයෙක, ජිව්හා නම් වූ ඵස්සායතනයෙක, කාය නම් වූ ඵස්සායතනයෙක, මනස නම් වූ ඵස්සායතනයෙකැ යි. මහණෙනි, මේ ඵස්සායතනයෝ සදෙන යැ යි මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි බැහැර කරන්නට නොහැකි ධර්මයෙක් මා විසින් දෙසන ලද්‍ද යි මෙසේ යමක් කියන ලද ද, මෙය තෙල කරුණ නිසා කියන ලදී.

මහණෙනි, මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි වූ ... බැහැර කරන්නට නොහැකි වූ මේ අටළොස් මනෝපවිචාරයෝ යි දහමෙක් මා විසින් දෙසන ලද්‍ද යි මෙසේ මෙය කියන ලද්දේ ම ය. තෙල කුමක් සඳහා කියන ලද ය යත්: ඇසින් රූපයක් දැක සොම්නසට කරුණු වූ රූපය ගෙණ සිත එළවයි. දොම්නසට කරුණු වූ රූපය-ගෙණ සිත එළවයි. උපේක්‍ෂාවට කරුණු වූ රූපය ගෙණ සිත එළවයි. කණින් හඬක් අසා ... නැහැයෙන් ගඳක් ආඝ්‍රාණය කොට ... දිවින් රසක් විඳ ... කයින් සප්‍රෂ්ටව්‍යයක් ස්පර්ශ කොට ... මනසින් දහම් අරමුණක් දැක සොම්නසට කරුණු වූ දහම ගෙණ සිත එළවයි. දොම්නසට කරුණු වූ දහම-ගෙණ සිත එළවයි. උපේක්‍ෂාවට කරුණු වූ දහම ගෙණ සිත එළවයි. මහණෙනි, මහණුන් විසින් බමුණන් විසින්නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි වූ ... බැහැර කරන්නට නොහැකි වූ මේ අටළොස් මනොපවිචාරයෝ යි ධර්මයෙක් මා විසින් දෙසන ලද්‍ද යි මෙසේ යමක් කියන ලද ද, මෙය තෙල කරුණ නිසා කියන ලදී.

මහණෙනි, මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි වූ ... බැහැර කරන්නට නොහැකි වූ මේ සතර සත්‍යයෝ යි දහමෙක් මා විසින් දෙසන ලද්‍ද යි මෙසේ මෙය කියන ලද්දේ ම ය. තෙල කුමක් සඳහා කියන ලද ය යත්: මහණෙනි, ෂඩ්ධාතූන් නිසා ගර්භාවක්‍රාන්තිය වෙයි. අවක්‍රාන්තිය ඇති කල්හි නාමරූපය වෙයි නාමරූප-ප්‍රත්‍යයයෙන් ෂඩායතනය වෙයි. ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශප්‍රත්‍යයයෙන් වේදනාව වෙයි. මහණෙනි, විඳුනාහට (-විඳිම් දන්නාහට) මෙතෙක් මැ දුකැ යි පණවමි. මෙතෙක් දුකට කාරණයැ යි පණවමි. මෙතෙක් (-දුඃඛ සමුදය දෙදෙනාගේ නැසීම) දුඃඛනිරොධය යි පණවමි. මෙතෙක් (-ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය) දුඃඛනිරොධගාමී ප්‍රතිපත්තිය යි පණවමි.

මහණෙනි, දුඃඛාර්‍ය්‍යසත්‍යය කවරු: ජාතිය ද දුකැ, ජරාව ද දුකැ, ව්‍යාධිය ද දුකැ, මරණය ද දුකැ, ශෝක - පරිදේව - දුක් - දොම්නස් - උපායාසයෝත් දුක්හ. යමක් කැමැති වනුයේ නොලබන්නේ නම්, එ ද දුකැ. සැකෙවින් පඤ්චොපාදනස්කන්ධයෝ දුක්හ. මහණෙනි, මේ දුඃඛාර්‍ය්‍ය සත්‍යය යි කියනු ලැබේ.

මහණෙනි, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය කවරේය යත්: අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වෙයි, විඥානප්‍රත්‍යයයෙන් නාමරූප වෙයි, නාමරූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වෙයි, ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ වෙයි, ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වෙදනාව වෙයි, වෙදනාප්‍රත්‍යය-යෙන් තෘෂ්ණාව වෙයි, තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදනය වෙයි, උපාදන ප්‍රත්‍යයයෙන් භවය වෙයි, භවප්‍රත්‍යයයෙන් ජාතිය වෙයි, ජාතිප්‍රත්‍යයයෙන් ජරා - මරණ - සෝක - පරිදේව - දුක් - දොම්නස් - උපායාසයෝ වෙත්. මෙසේ මේ සියලු (-අමිශ්‍ර වූ) දුඃඛ රාශීහුගේ හටගැන්ම වේ. මහණෙනි, මේ දුඃඛ සමුදයාර්‍ය්‍යසත්‍යය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛනිරොධො[1] අරියසච්චං: අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛනිරොධො අරියසච්චං.

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. ඉමානි චත්තාරි අරියසච්චානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසංකිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති. ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

## 3. 2. 2. 2.

12. තීණිමානි භික්ඛවෙ අමාතාපුත්තිකානි භයානීති අස්සුතවා පුථුජ්ජනො භාසති. කතමානි තීණි: හොති[2] සො භික්ඛවෙ සමයො, යං මහාඅග්ගිඩාහො උට්ඨාති. මහාඅග්ගිඩාහෙ ඛො පන භික්ඛවෙ උට්ඨිතෙ තෙන ගාමාපි ඩය්හන්ති නිගමාපි ඩය්හන්ති, නගරාපි ඩය්හන්ති. ගාමෙසුපි ඩය්හමානෙසු නිගමෙසුපි ඩය්හමානෙසු නගරෙසුපි ඩය්හමානෙසු තත්ථ මාතාපි පුත්තං නප්පටිලභති, පුත්තොපි මාතරං නප්පටිලභති. ඉදං භික්ඛවෙ පඨමං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති.

පුනචපරං භික්ඛවෙ හොති සො සමයො යං මහාමෙඝො උට්ඨාති, මහාමෙඝෙ ඛො පන භික්ඛවෙ උට්ඨිතෙ මහාඋදකවාහකො සඤ්ජායති, මහාඋදකවාහකෙ ඛො පන භික්ඛවෙ සඤ්ජාතෙ තෙන ගාමාපි වුය්හන්ති, නිගමාපි වුය්හන්ති, නගරාපි වුය්හන්ති. ගාමෙසුපි වුය්හමානෙසු නිගමෙසුපි වුය්හමානෙසු නගරෙසුපි වුය්හමානෙසු තත්ථ මාතාපි පුත්තං නප්පටිලභති, පුත්තොපි මාතරං නප්පටිලභති, ඉදං භික්ඛවෙ දුතියං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති.

පුනචපරං භික්ඛවෙ හොති සො සමයො, යං භයං හොති අටවිසංකොපො චක්කසමාරූළ්හා ජානපදා පරියායන්ති. භයෙ ඛො පන භික්ඛවෙ සති අටවිසංකොපෙ චක්කසමාරූළ්හෙසු ජානපදෙසු පරියායන්තෙසු තත්ථ මාතාපි පුත්තං නප්පටිලභති, පුත්තොපි මාතරං නප්පටිලභති, ඉදං භික්ඛවෙ තතියං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති. ඉමානි ඛො භික්ඛවෙ තීණි අමාතාපුත්තිකානි භයානීති අස්සුතවා පුථුජ්ජනො භාසති,

1. දුක්ඛනිරොධං - සීමු   2. හොති ඛො - මජ්ඣං.

මහණෙනි, දුඃඛ නිරොධාර්‍ය්‍යසත්‍යය කවරේය යත්: අවිද්‍යාවගේ ම අනවශේෂ නිරෝධයෙන් සංස්කාර නිරොධය වෙයි. සංස්කාර නිරොධයෙන් විඥාන නිරොධය වෙයි, විඥාන නිරොධයෙන් නාමරූප නිරොධය වෙයි, නාමරූප නිරොධයෙන් ෂඩායතන නිරොධය වෙයි, ෂඩායතන නිරොධයෙන් ස්පර්ශ නිරොධය වෙයි, ස්පර්ශනිරොධයෙන් වේදනා නිරොධය වෙයි, වේදනා නිරොධයෙන් තෘෂ්ණානිරොධය වෙයි, තෘෂ්ණානිරොධයෙන් උපාදාන නිරොධය වෙයි, උපාදානනිරොධයෙන් භවනිරොධය වෙයි, භවනිරොධයෙන් ජාතිනිරොධය වෙයි, ජාති නිරොධයෙන් ජරා – මරණ – ශෝක – පරිදේව – දුක් – දොම්නස් – උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුඃඛස්කන්ධයාගේ නිරොධය වේ. මහණෙනි, මේ දුඃඛනිරොධාර්‍ය්‍ය සත්‍යය යි කියනු ලැබේ.

මහණෙනි, දුඃඛනිරොධගාමී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය කවරෙය යත්: මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ම ය, ඒ මෙසේ ය: සම්‍යග් දෘෂ්ටිය, සම්‍යක් සඞ්කල්පය, සම්‍යග් වචනය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග් ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධිය යන මොහුය. මහණෙනි, මෙය දුඃඛනිරොධගාමී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය යි කියනු ලැබේ. මහණෙනි, මේ සතර ආර්‍ය්‍යසත්‍ය කෙනෙකා යි මහණුන් විසින් බමුණන් විසින් නුවණැත්තන් විසින් නිගන්නට නොහැකි වූ කෙලෙසන්නට නොහැකි වූ උපවාද නො කළ හැකි වූ බැහැර කරන්නට නොහැකි වූ දහමෙක් දෙසන ලදු යි මෙසේ යමක් කියන ලද නම්, තෙලෙ මේ නිසා කියන ලදැයි.

3. 2. 2. 2.

12. මහණෙනි, (මවු පුතුන් උතුන් රැකගත නොහෙන බියයි කියන ලද) මේ අමාතාපුත්‍රක බිය තුණෙකැ යි අශ්‍රුතවත් පෘථග්ජන කියයි. කවර තුණෙක යත්: මහණෙනි, යම් කලෙක මහත් අග්නිදාහයෙක් නඟී ද එබඳු කාලයෙක් වේ ම ය. මහණෙනි, මහත් අග්නිදාහයක් නැඟී සිටි කල්හි එයින් ගම්නුදු දැවෙති. නියම්ගම්නුදු දැවෙති. නගරයෝ ද දැවෙත්. ගමුදු දැවෙන කල්හි නියම්ගමුදු දැවෙන කල්හි නුවර ද දැවෙන කල්හි එහිලා මවු ද පුතා නොලැබෙයි. පුතාද මව නොලැබෙයි. මහණෙනි, මේ පළමුවන අමාතාපුත්‍රක භයය යි අශ්‍රුතවත් පෘථග්ජන තෙම කියයි.

තවද මහණෙනි, යම් කලෙක්හි මහත් මේඝයෙක් නැගේ ද එබඳු වූ කාලයෙක් වේ. මහණෙනි, මහත් මේඝය නැගි කල්හි මහ ගංවතුරෙක් නැහෙයි. මහණෙනි, මහගංවතුරැ නැගිකල්හි එයින් ගම්නුදු හයනු ලැබෙත්. නියම්ගම්නුදු හයනු ලැබෙත්. නගරයෝ ද හයනු ලැබෙත්. ගමුදු හයනු ලබන කල්හි නියම්ගමුදු හයනු ලබන කල්හි නුවරුදු හයනු ලබන කල්හි එහිලා මවු ද පුතා නොලැබෙයි. පුතා ද මව නොලැබෙයි. මහණෙනි, මෙය දෙවන අමාතාපුත්‍රක භයයි අශ්‍රුතවත් පෘථග්ජන තෙම කියයි.

තවද මහණෙනි, යම් කලෙක්හි කඩපලා සොර බියෙක් වේ නම්, චක්‍රාරූඪ වූ දනව් වැස්සෝ හිස් ලූ ලූ අත ඔබමොබ යෙත් නම් පලායෙත් නම් එබඳු කාලයෙක් ද වේ මය. මහණෙනි, කඩපලා සොරබිය ඇති කල්හි චක්‍රාරූඪ වූ දනව් වැස්සන් හිස් ලූ ලූ අත ඔබමොබ පලා යන කල්හි එහි මවු ද පුතු නොලැබෙයි. පුතු ද මව නොලැබෙයි. මහණෙනි, මෙය තෙවන අමාතාපුත්‍රක භයයි අශ්‍රුතවත් පෘථග්ජන තෙම කියයි. මහණෙනි, මේ තුණ වනාහි අමාතාපුත්‍රක භයයි අශ්‍රුතවත් පෘථග්ජන තෙම කියයි.

තානි බො පනිමානි භික්ඛවෙ තීණි සමාතාපුත්තිකානියෙව භයානි අමාතාපුත්තිකානි භයානීති අස්සුතවා පුථුජ්ජනො භාසති. කතමානි තීණි: හොති සො භික්ඛවෙ සමයො, යං මහාඅග්ගිඩාහො උට්ඨාති, මහාඅග්ගිඩාහෙ බො පන භික්ඛවෙ උට්ඨිතෙ තෙන ගාමාපි -පෙ- නගරාපි ඩය්හන්ති. ගාමෙසුපි ඩය්හමානෙසු නිගමෙසුපි ඩය්හමානෙසු නගරෙසුපි ඩය්හමානෙසු හොති සො සමයො, යං කදාචි කරහචි මාතාපි පුත්තං පටිලභති, පුත්තොපි මාතරං පටිලභති. ඉදං භික්ඛවෙ පඨමං සමාතාපුත්තිකං යෙව භයං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති.

පුනචපරං භික්ඛවෙ හොති සො සමයො, යං මහාමෙඝො උට්ඨාති. මහාමෙඝෙ බො පන භික්ඛවෙ උට්ඨිතෙ මහාඋදකවාහකො සඤ්ජායති, මහාඋදකවාහකෙ බො පන භික්ඛවෙ සඤ්ජාතෙ තෙන ගාමාපි වුය්හන්ති, නිගමාපි වුය්හන්ති, නගරාපි වුය්හන්ති. ගාමෙසුපි වුය්හමානෙසු නිගමෙසුපි වුය්හමානෙසු නගරෙසුපි වුය්හමානෙසු හොති සො සමයො, යං කදාචි කරහචි මාතාපි පුත්තං පටිලභති, පුත්තොපි මාතරං පටිලභති, ඉදං භික්ඛවෙ දුතියං සමාතාපුත්තිකං යෙව භයං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති.

පුනචපරං භික්ඛවෙ හොති සො සමයො, යං භයං හොති අටවිසඞ්කොපො, චක්කසමාරූළ්හා ජානපදා පරියායන්ති. භයෙ බො පන භික්ඛවෙ සති අටවිසඞ්කොපෙ චක්කසමාරූළ්හෙසු ජානපදෙසු පරියායන්තෙසු හොති සො සමයො, යං කදාචි කරහචි මාතාපි පුත්තං පටිලභති. පුත්තොපි මාතරං පටිලභති. ඉදං භික්ඛවෙ තතියං සමාතාපුත්තිකං යෙව භයං අමාතා-පුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති. ඉමානි බො භික්ඛවෙ තීණි සමාතාපුත්තිකානි යෙව භයානි අමාතාපුත්තිකානි භයානීති අස්සුතවා පුථුජ්ජනො භාසති.

තීණිමානි භික්ඛවෙ අමාතාපුත්තිකානි භයානි. කතමානි තීණි: ජරාභයං ව්‍යාධිභයං මරණභයං. න භික්ඛවෙ මාතා පුත්තං ජීරමානං එවං ලභති: අහං ජීරාමි, මා මෙ පුත්තො ජීරීති. පුත්තො වා පන මාතරං ජීරමානං න එවං ලභති, අහං ජීරාමි, මා මෙ මාතා ජීරීති.

න භික්ඛවෙ මාතා පුත්තං ව්‍යාධියමානං එවං ලභති: අහං ව්‍යාධියාමි, මා මෙ පුත්තො ව්‍යාධියීති, පුත්තො වා පන මාතරං ව්‍යාධියමානං න එවං ලභති: අහං ව්‍යාධියාමි, මා මෙ මාතා ව්‍යාධියීති.

න භික්ඛවෙ මාතා පුත්තං මීයමානං එවං ලභති: අහං මීයාමි, මා මෙ පුත්තො මීයීති, පුත්තො වා පන මාතරං මීයමානං න එවං ලභති: අහං මීයාමි, මා මෙ මාතා මීයීති. ඉමානි බො භික්ඛවෙ තීණි අමාතාපුත්තිකානි භයානීති.

අත්ථි භික්ඛවෙ මග්ගො, අත්ථි පටිපදා, ඉමෙසඤ්ච තිණ්ණං සමාතාපුත්ති-කානං භයානං, ඉමෙසඤ්ච තිණ්ණං අමාතාපුත්තිකානං භයානං පහාණාය සමතික්කමාය සංවත්තති: කතමො ච භික්ඛවෙ මග්ගො: කතමා ච පටිපදා: ඉමෙසඤ්ච තිණ්ණං සමාතාපුත්තිකානං භයානං, ඉමෙසඤ්ච තිණ්ණං අමාතා-පුත්තිකානං භයානං පහාණාය සමතික්කමාය සංවත්තති: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං බො භික්ඛවෙ මග්ගො, අයං පටිපදා, ඉමෙසඤ්ච තිණ්ණං සමාතාපුත්තිකානං භයානං, ඉමෙසඤ්ච තිණ්ණං අමාතාපුත්තිකානං භයානං පහාණාය සමතික්කමාය සංවත්තතීති.

මහණෙනි, සමාතෘපුත්‍රක වූ ම ඒ තුන් බියක් අමාතෘපුත්‍රක භය යි අශ්‍රැතවත් පෘථග්ජන කියයි. කවර තුනෙක යත්: මහණෙනි, යම් කලෙක්හි මහත් වූ අග්නිදාහයෙක් නැගේ නම් එබඳු කාලයෙක් වේ ම ය. මහණෙනි, මහත් වූ ගින්නෙන් දැවීම ඇති කල්හි එයින් ගම්දු ... නගරයෝ ද දැවෙත්. ගම්දු දැවෙන කල්හි නියම්ගම්දු දැවෙන කල්හි නගර දු දැවෙන කල්හි යම් හෙයෙකින් කිසියම් කලෙක මව පුතා ලැබේ ද, පුතා ද මව ලැබේ ද, එබඳු කාලයෙක් වේ ම ය. මහණෙනි, මේ පළමුවන සමාතෘපුත්‍රක වූ ම බිය අමාතෘපුත්‍රක භය යි අශ්‍රැතවත් පෘථග්ජන කියයි.

තවද මහණෙනි, යම් කලෙක මහාමෙඝය නැගේ නම් එබඳු කාලයෙක් ද වෙයි. මහණෙනි, මහාමෙඝය නැඟිකල්හි ම මහ ගංවතුරැ නැඟෙයි. මහ-ගංවතුරැ නැඟි කල්හි ගම්හුදු හයනු ලැබෙත්. නියම්ගම්හුදු හයනු ලැබෙත්. නගරයෝ ද හයනු ලැබෙත්. ගම්දු හයනු ලබන කල්හි, නියම්ගම්දු හයනු ලබන කල්හි, නගර දු හයනු ලබන කල්හි යම් හෙයෙකින් කිසි විටෙක මවත් පුතා ලැබේ ද, පුතාත් මවු ලැබේ ද, එබඳු කාලයෙක් වේ ම ය. මහණෙනි, මේ වනාහි සමාතෘපුත්‍රක වූ ම දෙවන බිය අමාතෘපුත්‍රක බියැයි අශ්‍රැතවත් පෘථග්ජන කියයි.

තවද මහණෙනි, යම් හෙයෙකින් කඩපලා සොරබියෙක් වේ ද, චක්‍රසමා-රූඪ වූ දනවුවැස්සෝ හිස් ලූ ලූ අත ඔබමොබ පලා යෙද් ද, එබඳු කාලයෙක් වේ ම ය. මහණෙනි, කඩපලා සොරබිය ඇති කල්හි චක්‍රසමාරූඪ වූ දනවු-වැස්සන් හිස් ලූ ලූ අත පලායන කල්හි යම් හෙයෙකින් කිසිකලෙක මවුදු පුතා ලැබේ නම්, පුතුදු මව ලැබේ නම්, එබඳු කාලයෙක් වේ ම ය. මහණෙනි, මේ තෙවන සමාතෘපුත්‍රක වූ ම බිය අමාතෘපුත්‍රක වූ භය යි අශ්‍රැතවත් පෘථග්ජන කියයි. මහණෙනි, මේ සමාතෘපුත්‍රක වූ ම තුන් බිය අමාතෘපුත්‍රක භය යි අශ්‍රැතවත් පෘථග්ජන කියයි.

මහණෙනි, මේ අමාතෘපුත්‍රක වූ භය තුනෙනි. කවර තුනෙක යත්: ජරාභය, ව්‍යාධිභය, මරණභය යන තුණ යි. මහණෙනි, මවු ජරායෙන් දිරන පුතු (දරුකු) "මම දිරම්වා, මා පුතු නහමක් දිරාව"යි යන මෙබන්දක් නො ලැබෙයි. පුතා හෝ ජරායෙන් දිරන මව (දරුක) "මම දිරම්වා, මා මවු නහමක් දිරාව"යි යන මෙබන්දක් නොලැබෙයි.

මහණෙනි, මවු රෙවින් පෙළෙනු වූ පුතු (දරුක) "මම පෙළෙම්වා, මාගේ පුතු නහමක් පෙළේ"ව යි යන මෙබන්දක් නොලැබෙයි. පුතා ද රෙවින් පෙළෙන මවු දරුක "මම පෙළෙම්වා, මාගේ මවු නහමක් පෙළේව"යි යන මෙබන්දක් නොලැබෙයි

මහණෙනි, මවු ද මැරෙනු වූ පුතු (දරුක) "මම මියෙම්වා, මාගේ පුතු නහමක් මියේව"යි යන මෙබන්දක් නොලැබෙ යි. පුතා හෝ මැරෙනු වූ මව (දරුක) "මම මියෙම්වා, මාගේ මවු නහමක් මියේව" යි යන මෙබන්දක් නොලැබෙයි. මහණෙනි, මේ වනාහි අමාතෘපුත්‍රක වූ බිය තුණ ය.

මහණෙනි, මේ සමාතෘපුත්‍රක වූ තුන් බිය ද අමාතෘපුත්‍රක වූ තුන් බිය ද ප්‍රහාණය කරණු පිණිස, මොනොවට ඉක්මෙනු පිණිස යමෙක් පවත්නේ නම්, ඒ මාර්ගය ඇත. ඒ ප්‍රතිපත්තිය ඇත. මහණෙනි, මේ සමාතෘපුත්‍රක වූ තුන් බිය ද මේ අමාතෘපුත්‍රක වූ තුන් බිය ද ප්‍රහාණය කරණු පිණිස, මොනොවට ඉක්-මෙනු පිණිස (යමෙක්) පවත්නේ නම්, ඒ මාර්ගය කවරෙයැ: ඒ ප්‍රතිපත්තිය කවර යැ: ඒ මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය මැ යි. ඒ කෙසේ යැ: සම්‍යග්දෘෂ්ටිය... සම්‍යක්සමාධිය (යන මේ අටයි.) මහණෙනි, මේ සමාතෘපුත්‍රක වූ තුන් බිය ද, මේ අමාතෘපුත්‍රක වූ තුන් බිය ද ප්‍රහාණය කරණු පිණිස මොනොවට ඉක්මෙනු පිණිස (යමක්) පවත්නේ නම්, මේ ඒ මාර්ග යි. මේ ඒ ප්‍රතිපත්ති යි.

**3. 2. 2. 3.**

13. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන වෙනාගපුරං නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි. අස්සොසුං ඛො වෙනාගපුරිකා බ්‍රාහ්මණගහපතිකා: සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො වෙනාගපුරං අනුප්පත්තො "තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොති"ති.

අථ ඛො වෙනාගපුරිකා බ්‍රාහ්මණගහපතිකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො වෙනාගපුරිකො වච්ඡගොත්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

"අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යාවඤ්චිදං භොතො ගොතමස්ස විප්පසන්නානි ඉන්ද්‍රියානි, පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො.

සෙය්‍යථාපි භො ගොතම සාරදං බදරපණ්ඩු[2] පරිසුද්ධං හොති පරියොදාතං. එවමෙව භොතො ගොතමස්ස විප්පසන්නානි ඉන්ද්‍රියානි, පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. සෙය්‍යථාපි භො ගොතම තාලපක්කං සම්පති බන්ධනා පවුත්තං[3] පරිසුද්ධං හොති පරියොදාතං. එවමෙව භොතො ගොතමස්ස විප්පසන්නානි ඉන්ද්‍රියානි, පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො".

---

1. සාරණීයං - මජ්සං සරණීයං - PTS. 2. බදරපණ්ඩුං - මජ්සං සයා. කං.
3. බන්ධනා පමුත්තං - මජ්සං. මුත්තං, සීමු.

**3. 2. 2. 3.**

13. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂුසඞ්ඝයා සමග **කොසොල්**දනව්හි සැරිසරණ සේක් කොසොල්දනව්වයෙහි **වේනාගපුර** නමැති බමුණුගමට වැඩි සේක. වෙනාගපුර වැසි බමුණුගැහැවියෝ "භවත්නි, ශාක්‍යපුත්‍ර වූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූ ශ්‍රමණ ගෞතමයෝ වනාහි වෙනාගපුරයට වැඩියහ. ඒ භවත් ගෞතමයන් වහන්සේ පිළිබඳව "මෙසේ මෙසේත් ඒ භගවත්හු අර්හත්හ. සම්‍යක්සම්බුද්ධයහ. විද්‍යාචරණ සම්පන්නයහ. සුගතයහ. ලොකවිදූහ. අනුත්තරයහ. පුරුෂදම්‍යසාරථියහ. දෙවිමිනිසුන්ට ශාස්තෘයහ. බුද්ධයහ. භාග්‍යවත්හ. ඔබ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලෝකය ද මහණ බමුණන් සියො දෙවිමිනිසුන් සියො සත්ත්ව ප්‍රජාව ද තුමූ ම අධිකඥනයෙන් දැන සාක්ෂාත් කොට ප්‍රකාශ කෙරෙති. ඔබ ආදි කල්‍යාණ කොට මධ්‍ය කල්‍යාණ කොට පර්‍ය්‍යවසාන කල්‍යාණ කොට අර්ථ සහිත කොට ව්‍යඤ්ජන සහිත කොට සර්වප්‍රකාරයෙන් පරිපූර්ණ කොට පිරිසුදු කොට දහම් දෙසති. බඹසර පවසති. මෙබඳු උතුම් වූ කීර්තිශබ්දයෙක් ඉතා උස්ව නැංගේය. එබඳු වූ රහතුන්ගේ දර්ශනය මනා මැ නු!" යි ඇසුවාහු ම ය.

ඉක්බිති වේනාගපුර වැසි බමුණු ගැහැවියෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළැඹ ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. තුන්නට නිසි සිහි කරණුවට නිසි කථාව කොට නිමවා එකත් පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දසට ඇඳිලි බැඳ එකත් පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් නම් ගොත් අස්වා එකත් පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් තූෂ්ණීම්භූත ව එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් වේනාගපුර වැසි **වච්ඡගොත්ත** බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේ ය:

"භවත් ගෞතමයෙනි, ආශ්චර්‍ය්‍යයෙක. භවත් ගෞතමයෙනි, අද්භූතයෙක. භවත් ගෞතමයන් වහන්සේගේ ඉන්ද්‍රියයෝ ඉමහත් සේ පහන් වූවාහු වෙති. ඡවිවර්ණය මහත් සේ පිරිසිදුය. ඉතා ප්‍රභාස්වරය.

භවත් ගෞතමයන් වහන්ස, යම්සේ සරත් කල්හි හටගත් විලිකුන් නොවූ ඩෙබරපක් පිරිසිදු වේ ද, ප්‍රභාස්වර වේ ද, එසෙයින් ම භවත් ගෞතමයන් වහන්සේගේ ඉන්ද්‍රියයෝ වෙසෙසින් පහන් වෙති. ඡවිවර්ණය පිරිසිදුය. ප්‍රභාස්වර ය. භවත් ගෞතමයෙනි, යම්සේ එකොණේහි තවුයෙන් ගිළිහුන විලිකුන් තල්පක් පිරිසිදු වේ ද, ප්‍රභාස්වර වේ ද, එලෙසින් ම භවත් ගෞතමයන් වහන්සේගේ ඉන්ද්‍රියයෝ වෙසෙසින් පහන්හ. ඡවිවර්ණය පිරිසිදු ය. ප්‍රභාස්වර ය".

"සෙය්‍යථාපි භො ගොතම නෙක්ඛං ජම්බොනදං දක්ඛකම්මාරපුත්ත-සුපරිකම්මකතං උක්කාමුඛෙ සුකුසලසම්පහට්ඨං පණ්ඩුකම්බලෙ නික්ඛිත්තං භාසතෙ ච තපතෙ ච විරොචති ච. එවමෙව භොතො ගොතමස්ස විප්පසන්නානි ඉන්ද්‍රියානි, පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො.

යානි තූන[1] තානි භො ගොතම උච්චාසයනමහාසයනානි. සෙය්‍යථීදං: ආසන්දි පල්ලඞ්කො ගොණකො චිත්තකා[2] පටිකා පටලිකා තූලිකා විකතිකා උද්දලොමි එකන්තලොමි කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණි කාදලිමිගපවරපච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතො ලොහිතකූපධානං. එවරූපානං නූන භවං ගොතමො උච්චාසයනමහාසයනානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී"ති.

[භගවා:]

යානි බො පන තානි බ්‍රාහ්මණ උච්චාසයනමහාසයනානි. සෙය්‍යථීදං: ආසන්දි පල්ලඞ්කො ගොණකො චිත්තකා පටිකා පටලිකා තූලිකා විකතිකා උද්දලොමි එකන්තලොමි කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණි කාදලිමිගපවරපච්චත්ථරණං[3] සඋත්තරච්ඡදං උභතො ලොහිතකූපධානං. දුල්ලභානි තානි පබ්බජිතානං, ලද්ධා ච න කප්පන්ති.

තීණි බො ඉමානි බ්‍රාහ්මණ උච්චාසයනමහාසයනානි, යෙසාහං එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී. කතමානි තීණි: දිබ්බං උච්චාසයනමහාසයනං බ්‍රහ්මං උච්චාසයනමහාසයනං අරියං උච්චාසයනමහාසයනං. ඉමානි බො බ්‍රාහ්මණ තීණි උච්චාසයනමහාසයනානි, යෙසාහං එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභීති.

---

1. යානි තානි - මජ්ඣං 2. චිත්තිකා - ස්‍යා. සී 1. චිත්තකො - මජ්ඣං
3. කාදලිමිගපවරපච්චත්ථරණං - මජ්ඣං

"භවත් ගෞතමයෙනි, නිපුණ වූ කඹුරුදරුවක්හු විසින් මොනොවට පිරියම් කළ, කෝවෙහි පිස දක්ෂ රන්කරුවකු විසින් මොනොවට කොළ ලද දඹරන් නිකෙක් රත්පලසෙක්හි තබන ලද්දේ යම්සේ බබලා ද, දිලිසේ ද, රස් විහිදුවා ද, එලෙසින් ම භවත් ගෞතමයන් වහන්සේගේ ඉන්ද්‍රියයෝ වෙසෙසින් පහන්හ. ඡවිවර්ණය පිරිසිදු ය. ප්‍රභාස්වර ය.

භවත් ගෞතමයෙනි, දික් පා ඇති හැඳිය, පලඟය, සතරඟුලෙන් දික් ලොම් ඇති මහකොඳු පලසය, වීමෙන් විසිතුරු එළලොම් ඇතිරිය, එළලොම්-මුවා සුදුපුප් ඇතිරිය, එළලොම්මුවා ඝනපුප් ඇතිරිය, පුලුන් ඔත් තිලිය, සිහරු විගරු නගා වියන ලද එළලොම්මුවා ඇතිරිය, (දෙපස දවළ ඇති) දෙදා ඇතිරිය, (එක්පස දවළ ඇති) එක්දා ඇතිරිය, රත්කොසුකම් කළ තිඹිරිමුවා පසතුරුණ, රන් හා මුතු කොට කැපි තිඹිරිහුයින් වියූ පසතුරුණ, සොළොස් නළුවනට නැටිය හැකි අවන් මහඇතිරිය, ඇත් පිට අතුරණ ඇතිරිය, අස් පිට අතුරණ ඇතිරිය, රියෙහි අතුරණ ඇතිරිය, අඳුන්දිවිසමින් කළ ඇතිරිය, කෙසෙල්මුවසමින් කළ පසතරණ, ඉස්දෙර පාමුල රත්-කන්වසින් (කොට්ට) ඇති උඩ රත්වියන් බැඳි අස්න, යන යම් මැ උසසුන් මහසුන් කෙනෙක් වෙත් නම්, භවත් ගෞතමයෝ මෙබඳු උසසුන් මහ-අසුන් රිසිසේ ලබන සුල්ලභ. නිදුකින් ලබන සුල්ලභ. මහත්සේ ලබන සුල්ලභ".

[භගවත්හු:]

බමුණ, දික් පා ඇති හැඳිය, පශු වලරු ගැන්වූ පලඟය, දික්ලොම් ඇති කොඳු පලසය, වීමෙන් විසිතුරු එළලොම් ඇතිරිය, එළලොම්මුවා සුදුපුප් ඇතිරිය, ඝනපුප් එළලොම් ඇතිරිය, පුලුන් ඔත් තිලිය, සිහරු විගරු නඟා වියන ලද එළලොම්මුවා ඇතිරිය, (දෙපස දා ඇති) දෙදා ඇතිරිය (එක්-පස දා ඇති) එක් දා ඇතිරිය, රත්කොසුකම් කළ තිඹිරිමුවා පසතරණය, රන් හා මුතුකොට කැපි තිඹිරිහුයින් වියූ පසතරණය, සොළොස් නළුවනට නැටිය හැකි අවන්මහ ඇතිරිය, ඇත් පිට අතුරණ ඇතිරිය, අස්පිට අතුරණ ඇතිරිය, රියෙහි අතුරණ ඇතිරිය, අඳුන්දිවිසමින් කළ ඇතිරිය, කෙසෙල්මුව-සමින් කළ ඇතිරිය, ඉස්දෙර පාමුල රත්කන්වසින් ඇති උඩ රත්වියන් බැඳි අස්න, යන යම් ම උසසුන් මහසුන් කෙනෙක් වෙත් නම්, පැවිද්දනට ඒ අසුන්හු දුර්ලභයහ. ලැබ ද නො කැප වෙති.

බමුණ, මම දැන් යම් උසසුන් මහසුන් කෙනකුන් රිසිසේ ලබන සුල්ලෙම් ද, නිදුකින් ලබන සුල්ලෙම් ද, මහත්සේ ලබන සුල්ලෙම් ද, මේ උසසුන් මහඅසුන් තුන් දෙනෙක් වෙති. කවර තුන් දෙනෙක යත්: දිව්‍ය උසසුන් මහසුනැ, බ්‍රාහ්ම උසසුන් මහසුනැ, ආර්‍ය්‍ය උසසුන් මහසුනැ. බමුණ, දැන් යම් බඳු වූ උසසුන් මහසුන් කෙනකුන් මම රිසිසේ ලබන සුල්ලෙම් නම්, නිදුකින් ලබන සුල්ලෙම් නම්, මහත්සේ ලබන සුල්ලෙම් නම්, මේ ඒ උසසුන් මහසුන් තුන් දෙන වෙත්.

[බ්‍රාහ්මණො:]

කතමං පන භො ගොතම දිබ්බං උච්චාසයනමහාසයනං, යස්ස භවං ගොතමො එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී?ති.

[භගවා:]

ඉධාහං බ්‍රාහ්මණ යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරාමි, සො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය තමෙව ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසාමි. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො වනන්තඤ්ඤෙව පවාරයාමි, සො යදෙව තත්ථ හොන්ති තිණානි වා පණ්ණානි වා තානි එකජ්ඣං සංහරිත්වා[1] නිසීදාමි, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරාමි. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරාමි. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරාමි සතො ච සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙමි, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තං තතියං ඣානං උපසම්පජ්ජ විහරාමි. සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරාමි.

සො චෙ අහං බ්‍රාහ්මණ එවම්භූතො චඞ්කමාමි, දිබ්බො මෙ එසො තස්මිං සමයෙ චඞ්කමො හොති. සො චෙ අහං බ්‍රාහ්මණ, එවං භූතො තිට්ඨාමි, දිබ්බං මෙ එතං තස්මිං සමයෙ ඨානං හොති. සො චෙ අහං බ්‍රාහ්මණ, එවම්භූතො නිසීදාමි, දිබ්බං මෙ එතං තස්මිං සමයෙ ආසනං හොති. සො චෙ අහං බ්‍රාහ්මණ, එවම්භූතො සෙය්‍යං කප්පෙමි, දිබ්බං මෙ එතං තස්මිං සමයෙ උච්චාසයනමහාසයනං හොති. ඉදං බො තං බ්‍රාහ්මණ දිබ්බං උච්චාසයනමහාසයනං, යස්සාහං එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභීති.

[බ්‍රාහ්මණො:]

අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, කො චඤ්ඤො එවරූපස්ස දිබ්බස්ස උච්චාසයනමහාසයනස්ස නිකාමලාභී භවිස්සති අකිච්ඡලාභී අකසිරලාභී අඤ්ඤත්‍ර භොතා ගොතමෙන.-

1. සඞ්ඝරිත්වා - මජසං.

[බමුණු:]

භවත් ගෞතම්යෙනි, මෙකල භවත් ගෞතමයන් වහන්සේ යම්ක් රිසිසේ ලබන සුලු වෙත් නම්, නිදුකින් ලබන සුලු වෙත් නම්, මහත්සේ ලබන සුලු වෙත් නම්, ඒ දිව්‍ය උසසුන් මහස්න කවරේ ය?

[භගවත්හු:]

බමුණ, මෙහි මම යම් ගමක් හෝ නියම්ගමක් හෝ ඇසුරු කොට වෙසෙම් ද, ඒ මම පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙණ එම ගමට හෝ නියම්ගමට හෝ පිඬු පිණිස පිවිසෙමි. ඒ මම පස් බත්හි පිඬුයෙන් වැලකුනෙම් වනයට ම පිවිසෙමි. ඒ මම එහි යම් ම තණ හෝ පරණලා හෝ වේ නම්, ඒ එකතු කොට පලක් බැඳ කය ඍජු කොට තබා හවුන්විටියට හමු කොට සිහි එළවා තබා හිඳිමි.

ඒ මම කාම්‍යන්ගෙන් වෙන් ව ම අකුශලධර්‍මයන්ගෙන් වෙන් ව ම විතර්‍ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙමි. විතර්‍ක විචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම වූ චිත්තයාගේ එකඟබව වූ විතර්‍ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙමි. ප්‍රීතිහුගේ ද විරාග-යෙන් උපේක්‍ෂා ද ඇත්තෙම් සිහි ඇත්තෙම් සම්‍යක් ප්‍රඥ ඇත්තෙම් වෙසෙමි. සුඛය ද කයින් විඳිමි. යම්කු ඇරැබ උපේක්‍ෂා ඇත්තේ ය. සිහි ඇත්තේ ය. සුඛ විහරණ ඇත්තේ ය යි, ආර්‍යයෝ කියත් නම්, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙමි. සුඛයාගේ ද ප්‍රහාණයෙන් හා දුඃඛයාගේ ප්‍රහාණයෙන් හා කැල ම සොම්නස් දොම්නසුන් හතයට යැමෙන් දුක් නැති සුව නැති උපේක්‍ෂාසමෘති දෙකින් වූ පිරිසිදු බව ඇති චතුර්‍ථධ්‍යානයට පැමිණ වෙසෙමි.

බමුණ, ඒ මම ඉදින් මෙබඳු වූයෙම්, සක්මන් කෙරෙම් නම්, එසමයෙහි තෙල මාගේ දිව්‍ය සක්මණ වෙයි. බමුණ, ඉදින් ඒ මම මෙබඳු වූයෙම් සිටිම් නම්, එසමයෙහි තෙල මාගේ දිව්‍ය වූ සිටීම වෙයි. බමුණ, ඒ මම ඉදින් මෙබඳු වූයෙම් හිඳිම් නම්, එසමයෙහි තෙල මාගේ දිව්‍ය වූ හිඳුම වේ. බමුණ, ඉදින් ඒ මම මෙබඳු වූයෙම්, ශයනය කෙරෙම් නම්, එසමයෙහි තෙල මාගේ දිව්‍ය උසසුන් මහසුන් වෙයි. බමුණ, මෙකල යම්ක් මම රිසිසේ ලබම් ද, නිදුකින් ලබම් ද, මහත්සේ ලබම් ද, මේ ඒ දිව්‍ය උසසුන් මහස්න වේ.

[බමුණු:]

භවත් ගෞතම්යෙනි, ආශ්චර්‍යයෙකි. භවත් ගෞතමයෙනි, අද්භූතයෙකි. භවත් ගෞතමයන් වහන්සේ තබා අන් කවරෙක් නම් මෙබඳු දිව්‍ය උසසුන් මහස්නක් රිසිසේ ලබන්නේ වේ ද නිදුකින් ලබන්නේ වේ ද! මහත්සේ ලබන්නේ වේ ද-

කතමං පන තං භො ගොතම බ්‍රහ්මං උච්චාසයනමහාසයනං, යස්ස භවං ගොතමො එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභීති.?

[භගවා:]

ඉධාහං බ්‍රාහ්මණ යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරාමි, සො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය තමෙව ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසාමි, සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො වනන්තඤ්ඤෙව පචාරයාමි.

සො යදෙව තත්ථ හොන්ති තිණානි වා, පණ්ණානි වා තානි එකජ්ඣං සංහරිත්වා[1] නිසීදාමි, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරාමි. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරාමි. කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරාමි. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං[2]. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරාමි.

සො චෙ අහං බ්‍රාහ්මණ එවං භූතො චඞ්කමාමි, බ්‍රහ්මො මෙ එසො තස්මිං සමයෙ චඞ්කමො හොති. සො චෙ අහං බ්‍රාහ්මණ එවම්භූතො තිට්ඨාමි - නිසීදාමි - සෙය්‍යං කප්පෙමි, බ්‍රහ්මං මෙ එතං තස්මිං සමයෙ උච්චාසයනමහාසයනං හොති. ඉදං ඛො තං බ්‍රාහ්මණ බ්‍රහ්මං උච්චාසයනමහාසයනං, යස්සාහං එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභීති.

[බ්‍රාහ්මණො:]

අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, කො චඤ්ඤො එවරූපස්ස බ්‍රහ්මස්ස උච්චාසයනමහාසයනස්ස නිකාමලාභී භවිස්සති අකිච්ඡලාභී අකසිරලාභී අඤ්ඤත්‍ර භොතා ගොතමෙන.

කතමං පන තං භො ගොතම අරියං උච්චාසයනමහාසයනං, යස්ස භවං ගොතමො එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභීති. ?

[භගවා:]

ඉධාහං බ්‍රාහ්මණ යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරාමි. සො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය තමෙව ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසාමි. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො වනන්තඤ්ඤෙව පචාරයාමි. සො යදෙව තත්ථ හොන්ති තිණානි වා පණ්ණානි වා, තානි එකජ්ඣං සංහරිත්වා[1] නිසීදාමි පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා

1. සංහරිත්වා - මජසං. 2. චතුත්ථං

භවත් ගෞතමයන් දැන් යම් රිසිසේ ලබන සුල්ලෝ ද, නිදුකින් ලබන සුල්ලෝ ද, මහත්සේ ලබන සුල්ලෝ ද, ඒ බ්‍රාහ්ම වූ උසසුන් මහස්න කවරේ ය?

[භගවත්හු:]

බමුණ, මම යම් ගමක් හෝ නියම් ගමක් ඇසුරු කොට වෙසෙම් ද, ඒ මම පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ ඒ ගමට හෝ නියම් ගමට හෝ පිඩු පිණිස පිවිසෙමි. ඒ මම පස්බත්හි පිඩුයෙන් වැළකුනෙම් වනයට ම පිවිසෙමි.

ඒ මම එහි යම් ම තණ හෝ පරණලා හෝ වේ නම් ඒ එකතු කොට පලක් බැඳ කය ඍජු කොට තබා සිහිය කමටහන් අරමුණට අභිමුඛ කොට තබා හිඳිමි. ඒ මම මෙත් සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙමි. එසේ ම දෙවන දිග ද, එසේ ම තෙවන දිග ද, එසේ ම සිවුවන දිග ද, මෙසේ උඩ – යට සරස ද, හැම තන්හි සර්‍වාත්මතායෙන් මුළු මහත් ලොව විපුල වූ මහද්ගත වූ අපමණ වූ වෙර නැති ව්‍යාපාද රහිත මෙත් සහගිය සිතින් පතුරුවා වෙසෙමි. කරුණා සහගත සිතින් ... මුදිතා සහගත සිතින් ... උපේක්‍ෂා සහගත සිතින් එක් දිගක් පතුරුවා වෙසෙමි. එසේ ම දෙවන දිග ද, එසේ ම තෙවන දිග ද, එසේ ම සිවුවන දිග ද, මෙසේ උඩ – යට සරස ද, සියලු තන්හි සර්‍වාත්මතායෙන් මුළු මහත් ලොව විපුල වූ මහද්ගත වූ අපමණ වූ වෙර නැති ව්‍යාපාද නැති උපෙක්‍ෂා සහගත සිතින් පතුරුවා වෙසෙමි.

බමුණ, ඉදින් ඒ මම මෙබඳු වූයෙම් සක්මන් කෙරෙම් නම්, එසමයෙහි තෙල මාගේ බ්‍රාහ්ම වූ සක්මණ වෙයි. බමුණ, ඒ මම මෙසේ වූයෙම් ඉදින් සිටිම් නම්, ... හිඳිම් නම් ... ශයනය කෙරෙම් නම්, එසමයෙහි තෙල ඒ මාගේ බ්‍රාහ්ම වූ උසසුන් මහස්න වේ. බමුණ, මම මෙකල යමක් රිසිසේ ලබන සුලුයෙම් නම්, නිදුකින් ලබන සුලුයෙම් නම්, මහත්සේ ලබන සුලුයෙම් නම්, මේ වනාහි ඒ බ්‍රාහ්ම වූ උසසුන් මහස්න වේ.

[බමුණු:]

භවත් ගෞතමයෙනි, ආශ්චර්‍ය්‍යයෙකි. භවත් ගෞතමයෙනි, අද්භූතයෙකි. භවත් ගෞතමයන් තබා අන් කවරෙක් මෙබඳු වූ බ්‍රාහ්ම වූ උසසුන් මහස්නක් රිසිසේ ලබනසුලු වන්නේ ද, නිදුකින් ලබනසුලු වන්නේ ද, මහත්සේ ලබන සුලු වන්නේ ද!

භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෝ දැන් යමක් රිසිසේ ලබන සුල්ලෝ නම්, නිදුකින් ලබන සුල්ලෝ නම්, මහත්සේ ලබන සුල්ලෝ නම්, ඒ ආර්‍ය්‍ය උසසුන් මහසුන් කවරේ ය?

[භගවත්හු:]

බමුණ, මම යම් ගමක් හෝ නියම්ගමක් හෝ ඇසුරු කොට වෙසෙම් නම්, ඒ මම පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ එම ගමට හෝ නියම්ගමට හෝ පිඩු පිණිස පිවිසෙමි. ඒ මම පැසුළු බත්හි පිඩුයෙන් වැළකුනෙම් වනයට ම පිවිසෙමි. ඒ මම එහි යම් ම තණ හෝ පරණලා ඇත් නම් ඒ එකතු කොට පලක් බැඳ කය ඍජු කොට පිහිටුවා සිහිය කමටහන් අරමුණට තතු කොට එළවා හිඳිමි.

සො එවං පජානාමි.[1] රාගො මෙ පහීනො; උච්ඡින්නමූලො තාලාවත්ථු-කතො අනභාවකතො[2] ආයතිං අනුප්පාදධම්මො. දොසො මෙ පහීනො -පෙ- මොහො මෙ පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො[2] ආයතිං අනුප්පාදධම්මො.

සො චෙ අහං බ්‍රාහ්මණ එවම්භූතො චඞ්කමාමි, අරියො මෙ එසො තස්මිං සමයෙ චඞ්කමො හොති. සො චෙ අහං බ්‍රාහ්මණ එවම්භූතො තිට්ඨාමි -පෙ- නිසීදාමි- සෙය්‍යං කප්පෙමි. අරියං මෙ එතං තස්මිං සමයෙ උච්චාසයන-මහාසයනං හොති. ඉදං ඛො තං[3] බ්‍රාහ්මණ අරියං උච්චාසයනමහාසයනං. යස්සාහං එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභීති.

[බ්‍රාහ්මණො:]

අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යාව චඤ්ඤත්‍ර එවරූපස්ස අරියස්ස උච්චාසයනමහාසයනස්ස නිකාමලාභී භවිස්සති අකිච්ඡලාභී අකසිර-ලාභී අඤ්ඤත්‍ර භොතො ගොතමෙන.

අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං[4] භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භවන්තං ගොතමං සරණං ගච්ඡාම, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණංගතෙති.

## 3. 2. 2. 4

14. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන සරභො නාම පරිබ්බාජකො අචිරපක්කන්තො හොති ඉමස්මා ධම්මවිනයා. සො රාජගහෙ පරිසතිං[5] එවං වාචං භාසති: අඤ්ඤාතො මයා සමණානං සක්‍යපුත්තියානං ධම්මො, අඤ්ඤාය ච පනාහං සමණානං සක්‍යපුත්තියානං ධම්මං එවාහං තස්මා ධම්මවිනයා අපක්කන්තොති.

අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පවිසිංසු. අස්සොසුං ඛො තෙ භික්ඛූ සරභස්ස පරිබ්බාජකස්ස රාජගහෙ පරිසතිං[5] එවං වාචං භාසමානස්ස: අඤ්ඤාතො මයා සමණානං සක්‍යපුත්තියානං ධම්මො, අඤ්ඤාය ච පනාහං සමණානං සක්‍යපුත්තියානං ධම්මං එවාහං තස්මා ධම්මවිනයා අපක්කන්තොති.

අථ ඛො තෙ භික්ඛූ රාජගහෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාත-පටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

---

1. ජානාමි - මජ්සං. 2. අනභාවංකතො - මජ්සං 3. මජ්සං - නත්ථි
4. එවමෙවං ඛො - මජ්සං. 5 පරිසති - මජ්සං.

ඒ මම මාගේ රාගය ප්‍රහීන ය. සිඳ ලූ මුල් ඇත්තේ ය. මුදුන සිඳින ලද තල්ගසක් මෙන් කරණ ලද්දේ ය. නැවත නො හටගන්නක් කරණ ලද්දේ ය. මතුයෙහි නූපදනා ස්වභාව ඇත්තක් කරණ ලද්දේ ය. මාගේ ද්වේෂය ප්‍රහීනය .. මාගේ මෝහය ප්‍රහීනය. සිඳලූ මුල් ඇත්තේ ය. මුදුන් සුන් තල්ගසක් මෙන් කරණ ලද්දේ ය. නැවත නොහටගන්නක් කරණ ලද්දේ ය. මතුයෙහි නූපදනා සැහැවි ඇත්තක් කරණ ලද්දේය යි මෙසේ දනිමි.

බ්‍රාහමණය, ඒ මම මෙබඳු වූයෙම් ඉදින් සක්මන් කෙරෙම් නම්, එසමයෙහි තෙල මාගේ ආයභී වූ සක්මණ වෙයි. බමුණ, ඒ මම මෙබඳු වූයෙම් ඉදින් සිටිම් නම් ... හිඳිම් නම් ... ශයනය කෙරෙම් නම් එසමයෙහි තෙල මාගේ ආයභී වූ උසසුන් මහසුන් වේ. බමුණ, දූත් මම යමක් රිසියේ ලබන සුලුයෙම් නම්, නිදුකින් ලබන සුලුයෙම් නම්, මහත්සේ ලබන සුලුයෙම් නම්, මේ වනාහි ඒ ආයභී වූ උසසුන් මහස්න වේ.

[බමුණු:]

භවත් ගෞතමයෙනි, ආශචයභීය. භවත් ගෞතමයෙනි, අද්භූතය. භවත් ගෞතමයන් තබා අන් කවරෙක් මෙබඳු ආයභී වූ උසසුන් මහසුන් රිසියේ ලබන සුලු වන්නේ ද! නිදුකින් ලබන සුලු වන්නේ ද! මහත්සේ ලබන සුලු වන්නේ ද!

භවත් ගෞතමයෙනි, ඉතා මැනවි. භවත් ගෞතමයෙනි, ඉතා මැනවි. භවත් ගෞතමයෙනි, යටිකුරු කොට තබන ලද්දක් යම්සේ උඩුකුරු කරන්නේ ද, පිළිසන් වූවක් හෝ යම්සේ විවර කරන්නේ ද, මංමුළාවූවකුට යම්සේ මඟ කියන්නේ හෝ වේ ද, ඇස් ඇත්තෝ රූ දක්නාහයි අඳුරෙහි තෙල් පහනක් හෝ යම්සේ දරන්නේ ද, එපරිද්දෙන් ම භවත් ගෞතමයන් විසින් නන්නියරින් ධර්මය දේශනා කරණ ලද්දේය. වහන්ස, තෙල අපි භවත් ගෞතමයන් වහන්සේ ද, ධර්මය ද, භික්ෂුසඞ්ඝයා ද සරණ යම්හ. භවත් ගෞතමයන් වහන්සේ අප අද පටන් කොට දිවිහිම් සරණගිය උවසුවන් කොට දරණ සේක්වා යි.

## 3. 2. 2. 4

14 එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජුකුළු පව්වෙහි වැඩ වසන සේක. එසමයෙහි සරභ නම් පිරිවැජ මේසස්-නෙන් බැහැරගිය නොබොහෝකලැ. රජගහනුවර පිරිසෙහි "මා විසින් ශාක්‍යපුත්‍රීයශ්‍රමණයන්ගේ ධර්මය දැනගන්නා ලද්දේය. මම ශාක්‍යපුත්‍රීය-ශ්‍රමණයන්ගේ ධර්මය දැනගෙණ ම මෙසේ ඒ සස්නෙන් බැහැර නික්ම සිටියෙමි" යි. මෙසේ තෙපුල් බෙණෙයි.

එකල්හි බොහෝ භික්ෂූහු පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ රජගහනුවරට පිඬු පිණිස පිවිසියහ. ඒ භික්ෂූහු රජගහනුවර පිරිස්මැද "මා විසින් ශාක්‍යපුත්‍රීයශ්‍රමණයන්ගේ ධර්මය දැන ගන්නා ලද්දේ ය. ශාක්‍යපුත්‍රීය-ශ්‍රමණයන්ගේ ධර්මය දැනගෙණ ම මේසේ මම ඒ සස්නෙන් නික්ම සිටියෙමි" මෙසේ තෙපුල් පෙපළන සරභ පිරිවැජියාගේ වචනය ඇසූහ.

ඉක්බිති ඒ භික්ෂූහු රජගහනුවර පිඬු පිණිස හැසිර පැසුළු බත්හි පිණ්ඩ-පාතයෙන් වැළැකුනාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස්ව හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ:

සරභො නාම හොති පරිබ්බාජකො අචිරපක්කන්තො ඉමස්මා ධම්මවිනයා. සො රාජගහෙ පරිසතිං එවං වාචං භාසති. අඤ්ඤාතො මයා සමණානං සක්‍යපුත්තියානං ධම්මො. අඤ්ඤාය ච පනාහං සමණානං සක්‍යපුත්තියානං ධම්මං එවාහං තස්මා ධම්මවිනයා අපක්කන්තොති. සාධු භන්තෙ භගවා යෙන **සප්පිනිකාතීරං** යෙන පරිබ්බාජකාරාමො, යෙන සරභො පරිබ්බාජකො, තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන සප්පිනිකාතීරං යෙන පරිබ්බාජකාරාමො යෙන සරභො පරිබ්බාජකො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා සරභං පරිබ්බාජකං එතදවොච: සච්චං කිර ත්වං සරභ එවං වදෙසි: අඤ්ඤාතො මයා සමණානං සක්‍යපුත්තියානං[1] ධම්මො, අඤ්ඤාය ච පනාහං සමණානං සක්‍යපුත්තියානං[1] ධම්මං එවාහං තස්මා ධම්මවිනයා අපක්කන්තොති? එවං වුත්තෙ සරභො පරිබ්බාජකො තුණ්හී අහොසි.

දුතියම්පි ඛො භගවා සරභං පරිබ්බාජකං එතදවොච: වදෙහි සරභ, කින්ති තෙ අඤ්ඤාතො සමණානං සක්‍යපුත්තියානං[1] ධම්මො; සචෙ තෙ අපරිපූරං භවිස්සති, අහං පරිපූරෙස්සාමි, සචෙ පන තෙ පරිපූරං භවිස්සති. අහං අනුමොදිස්සාමීති. දුතියම්පි ඛො සරභො පරිබ්බාජකො තුණ්හී අහොසි.

තතියම්පි ඛො භගවා සරභං පරිබ්බාජකං එතදවොච: වදෙහි සරභ, කින්ති තෙ අඤ්ඤාතො සමණානං සක්‍යපුත්තියානං ධම්මො, සචෙ තෙ අපරිපූරං භවිස්සති, අහං පරිපූරෙස්සාමි, සචෙ පන තෙ පරිපූරං භවිස්සති, අහං අනුමොදිස්සාමීති. තතියම්පි ඛො සරභො පරිබ්බාජකො තුණ්හී අහොසි.

අථ ඛො තෙ පරිබ්බාජකා සරභං පරිබ්බාජකං එතදවොචුං: "යදෙව ඛො ත්වං ආවුසො සරභ, සමණං ගොතමං යාචෙය්‍යාසි. තදෙව තෙ සමණො ගොතමො පවාරෙති. වදෙහාවුසො සරභ, කින්ති තෙ අඤ්ඤාතො සමණානං සක්‍යපුත්තියානං[1] ධම්මො, සචෙ තෙ අපරිපූරං භවිස්සති. සමණො ගොතමො පරිපූරෙස්සති. සචෙ පන තෙ පරිපූරං භවිස්සති. සමණො ගොතමො අනුමොදිස්සතී"ති. එවං වුත්තෙ සරභො පරිබ්බාජකො තුණ්හීභූතො මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො නිසීදි.

අථ ඛො භගවා සරභං පරිබ්බාජකං තුණ්හීභූතං මඞ්කුභූතං පත්තක්ඛන්ධං අධොමුඛං පජ්ඣායන්තං අප්පටිභානං විදිත්වා තෙ පරිබ්බාජකෙ එතදවොච:

යො ඛො මං පරිබ්බාජකා[2] එවං වදෙය්‍ය. සම්මාසම්බුද්ධස්ස තෙ පටිජානතො ඉමෙ ධම්මා අනභිසම්බුද්ධාති, තමහං තත්ථ සාධුකං සමනුයුඤ්ජෙය්‍යං, සමනුගාහෙය්‍යං, සමනුභාසෙය්‍යං. සො වත මයා සාධුකං සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො අට්ඨානමෙතං අනවකාසො, යං සො තිණ්ණං ඨානානං නාඤ්ඤතරං ඨානං නිගච්ඡෙය්‍ය අඤ්ඤෙන වා අඤ්ඤං පටිචරිස්සති, බහිද්ධා කථං අපනාමෙස්සති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරිස්සති. තුණ්හීභූතො වා මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො නිසීදිස්සති. සෙය්‍යථාපි සරභො පරිබ්බාජකො.

1. සක්‍යපුත්තිකානං - මජසං. 2. පරිබ්බාජකො - PTS.

වහන්ස, සරභ පිරිවැජි මේ ශාසනයෙන් බැහැර ගිය නොබෝ කල් ඇති වෙයි. හේ රජගහනුවර පිරිස්මැද "ම විසින් ශාක්‍යපුත්‍රීයශ්‍රමණයන්ගේ ධර්මය දැනගන්නා ලද. ශාක්‍යපුත්‍රීයශ්‍රමණයන්ගේ ධර්මය දැනගෙණ ම මෙසේ ඒ සස්නෙන් පහව සිටියෙමි" මෙසේ තෙපුල් තෙපලයි. "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සප්පිනිකාතීරයෙහි පරිව්‍රාජකාරාමයෙහි සරභ පිරිවැජියා කරා අනුකම්පා සඳහා වඩනාසේක් නම් මනා මැ නු" යි කීහ. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස්කල්හි පිළිසලනින් නැගීසිටි සේක් සප්පිනිකා හෝතෙර පිරිවැජි අරම කරා සරභ පිරිවැජියා වෙත එළඹි සේක. එළැඹ, පැන්වූ අස්නෙහි වැඩහුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ම "සැබව, සරභය? තෝ මා විසින් ශාක්‍යපුත්‍රීයශ්‍රමණයන්ගේ ධර්මය දැනගන්නා ලද්දේය. ශාක්‍යපුත්‍රීයශ්‍රමණයන්ගේ ධර්මය දැනගෙණ ම මෙසේ මම ඒ සස්නෙන් පහව සිටිමි" මෙසේ කියයි දැයි වදාළ සේක. එසේ වදාළ කල්හි සරභ පිරිවැජි තුෂ්ණීම්භූත විය.

දෙවනවටත් භාග්‍යවතුන් වහන්සේ සරභ පිරිවැජියාට "කිය සරභය, ශාක්‍යපුත්‍රීයශ්‍රමණයන්ගේ ධර්මය තා විසින් කිසේ දැනගන්නා ලද දැ? "ඉදින් තාගේ දැනුම අපරිපූර්ණ වේ නම් මම එය පරිපූර්ණ කරමි. ඉදින් තාගේ දැනුම පරිපූර්ණ වේ නම්, මම අනුමෙව්නෙමි" සී තෙල වදාළ සේක. දෙවනවටත් සරභ පරිව්‍රාජක තුෂ්ණීම්භූත විය.

තෙවනවටත් භාග්‍යවතුන් වහන්සේ සරභ පිරිවැජියාට "කිය සරභය, ශාක්‍යපුත්‍රීයශ්‍රමණයන්ගේ ධර්මය තා විසින් කිසේ දැනගන්නා ලද දැ? ඉදින් තාගේ දැනුම අපරිපූර්ණ වේ නම් මම එය පරිපූර්ණ කරමි. ඉදින් තාගේ දැනුම පරිපූර්ණ වේ නම් මම එය අනුමෙව්නෙමි" සී තෙල වදාළ සේක. තෙවනවටත් සරභ පරිව්‍රාජක තුෂ්ණීම්භූත විය.

ඉක්බිති ඒ පිරිවැජියෝ සරභ පිරිවැජියාහට "ඇවැත සරභය, තෝ යමක් ම මහණගොයුම්හු (අතින්) යදනෙහි නම් එය ම මහණගොයුම්හු තට පවරති. කිය ඇවැත සරභය, ශාක්‍යපුත්‍රීයශ්‍රමණයන්ගේ ධර්මය තා විසින් කිසේ දන්නා ලද දැ? ඉදින් තාගේ දැනුම අපරිපූර්ණ වේ නම්, මහණ ගොයුම්හු එය පරිපූර්ණ කරන්නාහ. ඉදින් තාගේ දැනුම පරිපූර්ණ වේ නම්, එය මහණ ගොයුම්හු අනුමෝ වන්නාහ" යි තෙල කීහ. මෙසේ කී කල්හි සරභ පිරිවැජි තුෂ්ණීම්භූත වූයේ නිතෙද වූයේ කරබාගත්තේ යට බලාලූ මුව ඇතියේ සිතිවිලි සිතන්නේ වැටහෙන නුවණ නැත්තේ හුන්නේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සරභ පිරිවැජියා තුෂ්ණීම්භූත වූවහු තෙද නැතියහු කරබාගත්තහු යටට හෙළූ මුව ඇත්තහු සිතුවිලි සිතන්නහු වැටහෙන නුවණ නැත්තහු දැන ඒ පිරිවැජියනට තෙල වදාළ සේක:

පිරිවැජියෙනි, "සම්‍යක් සම්බුද්ධයෙමියි පිළිණ කරණ තොප විසින් මේ ධර්මයෝ අනභිසම්බුද්ධයහ"සී යමෙක් මට මෙසේ කියන්නේ නම්, එහි ලා මම ඔහු අතින් ප්‍රශ්න විචාරන්නෙමි. කරුණු ගන්වන්නෙමි. කරුණු කියන්නෙමි. හෙ මා විසින් මොනොවට විචාරනු ලබන්නේ කරුණු ගන්වනු ලබන්නේ, මොනොවට කියනු ලබන්නේ යම් හෙයෙකින් හෙ සරභ පිරිවැජියා මෙන් අනෙකෙකින් අනෙකක් වසාලන්නේ හෝ වෙයි. බැහැරි කථාවක් ලා ප්‍රස්තුත කථාව බැහැර කරන්නේ හෝ වෙයි. කෝපය ද ද්වේෂය ද නොසතුට ද පහළ කරන්නේ හෝ වෙයි. තුෂ්ණීම්භූත වූයේ හෝ තෙද රහිත වූයේ කරබාගත්තේ යටිකුරු කළ මුව ඇත්තේ සිතිවිලි සිතන්නේ (වැටහෙන) නුවණ නැත්තේ හිඳුනේ හෝ වෙයි යන මේ තුන් කරුණෙන් එක්තරා කරුණකට නොපැමිණෙන්නේය යන තෙල නොකරුණෙකි. නොවිය හැක්කෙකැ යි වදාළ සේක.

යො ඛො මං පරිබ්බාජකා එවං වදෙය්‍ය: ඛීණාසවස්ස තෙ පටිජානතො ඉමෙ ආසවා අපරික්ඛීණාති, තමහං තත්‍ථ සාධුකං සමනුයුඤ්ජෙය්‍යං සමනුගාහෙය්‍යං සමනුභාසෙය්‍යං. සො වත මයා සාධුකං සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො අට්ඨානමෙතං අනවකාසො යං සො තිණ්ණං ඨානානං නාඤ්ඤතරං ඨානං නිගච්ඡෙය්‍ය, අඤ්ඤෙන වා අඤ්ඤං පටිචරිස්සති, බහිද්ධා කථං අපනාමෙස්සති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරිස්සති. තුණ්හීභූතො වා මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො නිසීදිස්සති, සෙය්‍යථාපි සරභො පරිබ්බාජකො.

යො ඛො මං පරිබ්බාජකා එවං වදෙය්‍ය: යස්ස ඛො පන තෙ අත්‍ථාය ධම්මො දෙසිතො, සො න නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති. තමහං තත්‍ථ සාධුකං සමනුයුඤ්ජෙය්‍යං, සමනුගාහෙය්‍යං, සමනුභාසෙය්‍යං. සො වත මයා සාධුකං සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො අට්ඨානමෙතං අනවකාසො යං සො තිණ්ණං ඨානානං නාඤ්ඤතරං ඨානං නිගච්ඡෙය්‍ය අඤ්ඤෙන වා අඤ්ඤං පටිචරිස්සති, බහිද්ධා කථං අපනාමෙස්සති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරිස්සති. තුණ්හීභූතො වා මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො නිසීදිස්සති, සෙය්‍යථාපි සරභො පරිබ්බාජකොති.

අථ ඛො භගවා සප්පිනිකාතීරෙ පරිබ්බාජකාරාමෙ තික්ඛත්තුං සීහනාදං නදිත්වා වෙහාසං පක්කාමි.

අථ ඛො තෙ පරිබ්බාජකා අචිරපක්කන්තස්ස භගවතො සරභං පරිබ්බාජකං සමන්තතො වාචාසන්නිතොදකෙන සඤ්ජම්භරිං අකංසු: සෙය්‍යථාපි ආවුසො සරභ බ්‍රහාරඤ්ඤෙ ජරසිගාලො සීහනාදං නදිස්සාමීති සෙගාලකඤ්ඤෙව[2] නදති, භෙරණ්ඩකඤ්ඤෙව නදති. එවමෙව ඛො ත්වං ආවුසො සරභ අඤ්ඤත්‍රෙව සමණෙන ගොතමෙන සීහනාදං නදිස්සාමීති සෙගාලකඤ්ඤෙව නදසි, භෙරණ්ඩකඤ්ඤෙව නදසි. සෙය්‍යථාපි ආවුසො සරභ අම්බකමද්දරී[3] පුස්සකරවිතං[4] රවිස්සාමීති අම්බකමද්දරිරවිතඤ්ඤෙව රවති. එවමෙව ඛො ත්වං ආවුසො සරභ අඤ්ඤත්‍රෙව සමණෙන ගොතමෙන පුස්සකරවිතං රවිස්සාමීති අම්බකමද්දරිරවිතඤ්ඤෙව රවසි. සෙය්‍යථාපි ආවුසො සරභ උසභො සුඤ්ඤාය ගොසාලාය ගම්භීරං නදිතබ්බං මඤ්ඤති. එවමෙව ඛො ත්වං ආවුසො සරභ අඤ්ඤත්‍රෙව සමණෙන ගොතමෙන ගම්භීරං නදිතබ්බං මඤ්ඤසීති. අථ ඛො තෙ පරිබ්බාජකා සරභං පරිබ්බාජකං සමන්තතො වාචාසන්නිතොදකෙන **සඤ්ජම්භරිං** අකංසූති.

1 මජසං - සයා - පාළි  2 සිඞ්ගාලකඤ්ඤෙව - මජසං
3. අම්බුකාසඤ්චරි - මජසං  4. පුරිසකරවිතං - මජසං, පුස්සකාරවිතං - සයා.

පිරිවැජියෙනි, "ක්ෂීණාශ්‍රවයෙමි'යි පිළිණ කරණ තොපගේ මේ ආශ්‍රවයෝ අපරික්ෂීණයහ" යි යමෙක් මට මෙසේ කියන්නේ නම්, එහි ලා මම ඔහු අතින් එය මොනොවට විචාරන්නෙමි. කරුණු ගන්වන්නෙමි, කරුණු කියන්නෙමි. මා විසින් යෙ ඒකාන්තයෙන් විචාරනු ලබන්නේ කරුණු ගන්වනු ලබන්නේ, කරුණු කියනු ලබන්නේ සරභ පිරිවැජියා මෙන් අනෙකෙකින් අනෙකක් වසාලන්නේ හෝ වෙයි. බැහැරි කථායෙකින් ප්‍රස්තුත කථාව බැහැරලන්නේ හෝ වෙයි. කෝපයත් ද්වේෂයත් නොසතුටත් පහළ කරන්නේ හෝ වෙයි. තූෂ්ණීම්භූතව හෝ තෙදරහිතව කරබාගෙණ යටට හෙළු මුව ඇතිව සිතිවිලි සිතන්නේ වැටහෙන නුවණ නැත්තේ හිඳුනේ හෝ වෙයි යන තුන් කරුණෙන් යම් එක්තරු කරුණකට නොයන්නේ ය යන තෙල නොකරුණෙක, නොවිය හැක්කෙක.

පිරිවැජියෙනි, "යම් මාගීඵලයක් පිණිස තොප විසින් ධර්මය දෙසන ලද නම්, එය ඒ ධර්මය පිළිපදනහුට මොනොවට වටදුක් නසනු පිණිස නොසාහා" යි යමෙක් මෙසේ මට කියන්නේ නම්, මා විසින් හේ මොනොවට විචාරනු ලබන්නේ මොනොවට කරුණු ගන්වනු ලබන්නේ මොනොවට කියනු ලබන්නේ සරභ පිරිවැජියා මෙන් අනෙකෙකින් අනෙකක් වසා ලන්නේ හෝ වෙයි. බැහැරි කථායෙකින් ප්‍රස්තුත කථාව බැහැර කරන්නේ හෝ වෙයි. කෝපයත් ද්වේෂයත් නොසතුටත් පහළ කරන්නේ හෝ වෙයි. තූෂ්ණීම්භූත වූයේ හෝ තෙද නැතියේ කර බහා ගත්තේ යටට හෙළු මුව ඇත්තේ සිතිවිලි සිතන්නේ වැටහෙන නුවණ නැත්තේ හෝ හිඳුනේය යන තුන් කරුණු අතුරෙන් යම් එක්තරු කරුණකට නොපැමිණෙන්නේය යන තෙල නොකරුණෙක, නො වියහැක්කෙකැ යි වදාළ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සප්පිනිකා නදීතීරයෙහි පිරිවැජිඅරමෙහි තෙවරක් සිංහනාද කොට අහසට නැගි සේක. ඉක්බිති ඒ පිරිවැජියෝ භාග්‍යවතුන් වහන්සේ නික්ම වැඩි නොබෝ කල්හි "ඇවැත සරභය, මහවෙනෙහි ජරසිවලෙක් සිඟනද කරන්නෙමි, සිවල්හඬ ම නඟා ද, බුන් හඬ ම නඟා ද, ඇවැත සරභය, එසේ ම තෝ ශ්‍රමණ ගෞතමයන් නබා සිංහනාද කරන්නෙමි සිවල්හඬ ම නඟව, බුන් හඬම නඟව. ඇවැත, සරභය, යම්සේ කුඩා කිකිළියක් මහකුකුළු හඬ නඟන්නෙමි කුඩා කිකිළි-යකගේ හඬ ම කෙරේ ද, ඇවැත සරභය, තෝ එපරිද්දෙන් ම මහණ ගොයුම්හණන් හැරපියා ම මහකුකුළුහඬ නඟන්නෙමි කියා කුඩා කිකිළියක හඬ ම නඟව, ඇවැත සරභය, යම්සේ ගොනෙක් හිස්වූ ගාලෙක දෙවූ ගොනකුසේ ගැඹුරුහඬ නැඟිය යුතු කොට සිතන්නේ ද, ඇවැත සරභය, තෝ එසේ ම මහණ ගොයුම්හණන් පියා ම ගැඹුරුසේ හඬ නැඟිය යුතු කොට සිතව් ය යි වචන නමැති අඞ්යටියෙන් නරතුරු ව වැදගත්තා ලද්දකු කළහ.

## 3. 2. 2. 5

15. එකං සමයං භගවා **කොසලෙසු** චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන **කෙසපුත්තං** නාම **කාලාමානං** නිගමො තදවසරි. අස්සොසුං ඛො කෙසපුත්තියා කාලාමා සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කෙසපුත්තං අනුප්පත්තො, තං ඛො පන භවන්තං[1] ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො -පෙ- සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

අථ ඛො කෙසපුත්තියා කාලාමා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො කෙසපුත්තියා කාලාමා භගවන්තං එතදවොචුං: සන්ති භන්තෙ එකෙ සමණබ්‍රාහ්මණා කෙසපුත්තං ආගච්ඡන්ති, තෙ සකංයෙව වාදං දීපෙන්ති, ජොතෙන්ති, පරවාදං පන[2] ඛුංසෙන්ති, වම්භෙන්ති, ඔපපක්ඛිං[3] කරොන්ති, පරිභවන්ති. අපරෙපි භන්තෙ එකෙ සමණබ්‍රාහ්මණා කෙසපුත්තං ආගච්ඡන්ති, තෙපි සකංයෙව වාදං දීපෙන්ති, ජොතෙන්ති, පරවාදං පන ඛුංසෙන්ති, වම්භෙන්ති, ඔපපක්ඛිං කරොන්ති, පරිභවන්ති. තෙසං නො භන්තෙ අම්හාකං හොතෙව කඞ්ඛා, හොති විචිකිච්ඡා: කො සු නාම ඉමෙසං භවන්තානං සමණබ්‍රාහ්මණානං සච්චං ආහ, කො මුසාති.

අලං හි වො කාලාමා කඞ්ඛිතුං අලං විචිකිච්ඡිතුං, කඞ්ඛනීයෙ ච පන වො ඨානෙ විචිකිච්ඡා උප්පන්නා, එථ තුම්හෙ කාලාමා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති. යදා තුම්හෙ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ: ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුගරහිතා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති: අථ තුම්හෙ කාලාමා පජහෙය්‍යාථ.

තං කිම්මඤ්ඤථ කාලාමා ලොභො පුරිසස්ස අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති හිතාය වා අහිතාය වාති? අහිතාය භන්තෙ.

---

1, භගවන්තං - සීමු. 2. පරප්පවාදං - මජසං 3. ඔමසකිං - මජසං.

**3. 2. 2. 5.**

15. **එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්සඞ්ඝ හා කොසොල් රට සැරිසරා වඩනා සේක් කාලාම ක්‍ෂත්‍රියයන්ගේ කේසපුත්ත නම්** නියම්ගමට වැඩි සේක. කේසපුත්ත නියම්ගම් වැසි කාලාමක්‍ෂත්‍රියයෝ "පින්වත්නි, ශාක්‍යපුත්‍ර වූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූ ශ්‍රමණ ගෞතමයෝ වනාහි කේසපුත්ත නියම්ගමට වැඩියහ. ඒ භවත් ගෞතමයන් වහන්සේ ලකුණු කොට මෙසේ මෙසේත් ඒ භගවත්හු අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ ... මෙසේ උතුම් වූ කීර්තිශබ්දය ඉතා උස්ව නැංගේය. එබඳු වූ රහතුන්ගේ දර්‍ශනය මනා මැ නු"යි ඇසුවාහුය.

ඉක්බිති කේසපුත්ත නියම්ගම්වැසි කාලාමක්‍ෂත්‍රියයෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. තුස්නට නිසි සිහි කරනුවට නිසි තෙපුල් කොට නිමවා එකත්පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දසට ඇඳිලි බැඳ එකත්-පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් නම්ගොත් අස්වා එකත්පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් තුෂ්ණීම්භූතව එකත්පසෙක හුන්හ. එකත්පස්ව හුන් කෙසපුත්ත නියම්ගම්වැසි කාලාම ක්‍ෂත්‍රියයෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ. "වහන්ස, කෙසපුත්තයට එන ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත.!ඔහු සවකීය ලබ්ධිය ම කියති, පවසති. මෙරමාගේ ලබ්ධිය සටා බෙණෙති, හෙළා දකිති, බැහැර කෙරෙත්. වහන්ස, අන්‍ය වූ ද ඇතැම් මහණ බමුණු කෙනෙක් කේසපුත්තයට එති. ඔහු ද සවකීය ලබ්ධිය ම කියති, පවසති, මෙරමාගේ ලබ්ධිය සටා බෙණෙති, හෙළා දකිති, බැහැර කෙරෙත්. වහන්ස, ඒ අපට "මේ භවත් මහණ බමුණන් අතුරෙන් කවරෙක් නම්, සත්‍යය කියා ද ! කවරෙක් මුසවා බෙණේද යි සැක ඇති වේ ම ය, විචිකිත්සා ඇතිවේ ම ය" යි.

කාලාමයෙනි, තොප විසින් සැක කරන්නට නිසි මැය, විචිකිත්සා කරන්නට නිසි මැය. සැක කටයුතු තැන ම තොපට විචිකිත්සාව උපන. කාලාමයෙනි, තෙපි එව, අනුශ්‍රව කථායෙනුදු නො ගණුව, පරම්පරාකථා-යෙනුදු නොගණුව, තෙල මෙසේ වී ලැ යි ද නොගණුව, අපගේ පෙළ හා යෙදෙනී ද නොගණුව, තර්කග්‍රාහයෙනුදු නොගණුව, නයග්‍රාහයෙනුදු නොගණුව, ආකාරපරිවිතර්කයෙනුදු නොගණුව, අප සිතා ඉවසාගත් දෘෂ්ටිය හා සැසැඳෙනැ යි ද නොගණුව, (මෙතෙම පූජ්‍යයෙකැයි) භව්‍යරූපතායෙනුදු නොගණුව, මේ මහණ අපට ගුරුහයි ද නොගණුව, කාලාමයෙනි, මේ දහම් කුසල්ය, මේ දහම් අකුසල්ය, මේ දහම් වරද සහිතය, මේ දහම් නුවණැත්තන් විසින් ගර්හිතය, මේ දහම්හු සපුරන ලද්දාහු සමාදන් කොට ගත්නා ලද්දාහු අවැඩ පිණිස දුක් පිණිස පවත්නාහ'යි තෙපි යම් කලෙක තුමූ ම දැනගන්නහු නම්, කාලාමයෙනි, එකල්හි තෙපි එය දුරු කරව.

කාලාමයෙනි, ඒ කිමැයි සිතවු ද? ලෝභය පුරුෂයාගේ සිතතුළ උපද-නුයේ ඔහුට වැඩ පිණිස හෝ අවැඩ පිණිස උපදනේ දැයි ඇසූ සේක. වහන්ස, අහිත පිණිස වේ යැයි කීහ.

ලුද්ධො පනායං කාලාමා පුරිසපුග්ගලො ලොභෙන අභිභූතො පරියාදින්නචිත්තො පාණම්පි හනති[1] අදින්නම්පි ආදියති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, පරම්පි තථත්තාය සමාදපෙති, යං ස හොති දීඝරත්තං අහිතාය දුක්ඛායාති. එවං භන්තෙ.

තං කිම්මඤ්ඤථ කාලාමා දොසො පුරිසස්ස අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති හිතාය වා අහිතාය වාති. අහිතාය භන්තෙ.

දුට්ඨො පනායං කාලාමා පුරිසපුග්ගලො දොසෙන අභිභූතො පරියාදින්නචිත්තො පාණම්පි හනති -පෙ- පරම්පි තථත්තාය සමාදපෙති, යං ස හොති දීඝරත්තං අහිතාය දුක්ඛායාති. එවං භන්තෙ.

තං කිම්මඤ්ඤථ කාලාමා මොහො පුරිසස්ස අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති හිතාය වා අහිතාය වාති. අහිතාය භන්තෙ

මූළ්හො පනායං කාලාමා පුරිසපුග්ගලො මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො පාණම්පි හනති, අදින්නම්පි ආදියති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, පරම්පි තථත්තාය සමාදපෙති, යං ස හොති දීඝරත්තං අහිතාය දුක්ඛායාති. එවං භන්තෙ.

තං කිම්මඤ්ඤථ කාලාමා ඉමෙ ධම්මා කුසලා වා අකුසලා වාති. අකුසලා භන්තෙ.

සාවජ්ජා වා අනවජ්ජා වාති. සාවජ්ජා භන්තෙ.

විඤ්ඤුගරහිතා වා විඤ්ඤුප්පසත්ථා වාති. විඤ්ඤුගරහිතා භන්තෙ.

සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්ති නො වා කථං වා හෙත්ථ හොතීති. සමත්තා භන්තෙ සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්ති. එවං නො හෙත්ථ හොතීති.

ඉති ඛො කාලාමා යං තං අවොචුම්හ. එථ තුම්හෙ කාලාමා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති. යදා තුම්හෙ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ: ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුගරහිතා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති. අථ තුම්හෙ කාලාමා පජහෙය්‍යාථාති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

1 හනාති - මජසං. සභා

කාලාමයෙනි, ලෝභී වූ මේ පුරුෂපුද්ගල ලෝභයෙන් මඩනා ලද්දුයේ ගන්නා ලද සිත් ඇතියේ යමක් ඔහුට බොහෝ කලක් අවැඩ පිණිස දුක් පිණිස වේ නම්, එබඳු පණිවා ද කෙරේ, අසිතාදත් ද ගණී, පරඹුවන් කරා ද යේ. මුසවා ද බෙණේ. මෙරමාත් එබව පිණිස සමාදන් කරවයි. එසේය, වහන්ස.

කාලාමයෙනි, ඒ කිමැයි සිතවු ද? ද්වේෂය පුරුෂයාගේ සිතෙහි උපදනුයේ වැඩ පිණිස හෝ අවැඩ පිණිස උපදනේ වේ ද? වහන්ස, අහිත පිණිස උපදනේය.

කාලාමයෙනි, මේ දුෂ්ට වූ පුරුෂපුද්ගල ද්වේෂයෙන් මඩනා ලද්දුයේ ගන්නා ලද සිත් ඇතියේ යමක් ඔහුට බොහෝ කලක් අවැඩ පිණිස දුක් පිණිස වේ නම් එබඳු වූ පණිවාත් කෙරේ ... මෙරමා ද එසෙයට සමාදන් කරවයි. එසේය, වහන්ස.

කාලාමයෙනි, ඒ කිමැයි හගිවු ද? මොහය පුරුෂයාගේ සිතෙහි උපදනේ වැඩ පිණිස හෝ ඇවැඩ පිණිස උපදනේ වේ ද? වහන්ස, අහිත පිණිස උපදනේය.

කාලාමයෙනි, මුළු වූ මේ පුරුෂපුද්ගල මෝහයෙන් මඩනා ලද්දුයේ ගන්නා ලද සිත් ඇතියේ යමක් ඔහුට බොහෝ කලක් අවැඩ පිණිස දුක් පිණිස වේ නම්, එබඳු වූ පණිවාත් කෙරේ. අසිතාදනුත් ගණී. පරඹුවන් කරාත් යේ. මුසවාත් බෙණේ. මෙරමාත් එසෙයට සමාදන් කරවයි. එසේය, වහන්ස.

කාලාමයෙනි, ඒ කිමැයි හගිවු ද? මේ දහම්හු කුසල් හෝ වෙත් ද? අකුසල් හෝ වෙත් ද? වහන්ස, අකුසල්හ.

සාවද්‍ය හෝ වෙත් ද? අනවද්‍ය හෝ වෙත් ද? වහන්ස, සාවද්‍යයහ.

නුවණැත්තන් විසින් ගරහන ලද්දාහු ද? නොහොත් නොගරහන ලද්දාහු ද? වහන්ස, නුවණැත්තන් විසින් ගරහන ලද්දාහ.

පිරිපුන් කොට ගන්නා ලද්දාහු සමාදන් කොට ගන්නා ලද්දාහු අවැඩ පිණිස දුක් පිණිස පවතිත් ද? නොහොත් නො පවතිත් ද? මෙහිලා තොපට කෙසේ අදහස් වේ ද? වහන්ස, 'පිරිපුන් කොට ගන්නා ලද්දාහු සමාදන් කොට ගන්නා ලද්දාහු අවැඩ පිණිස දුක් පිණිස පවත්නාහ'යි මෙහිලා අපට මෙසේ අදහස් වේ.

කාලාමයෙනි, මෙසේ යම් ඒ බසක් කීමෝ ද: 'තෙපි එව, අනුශ්‍රව කථායෙනුදු නොගණුව, පරම්පරා කථායෙනුදු නොගණුව, 'තෙල මෙසේ වී ලැ'යි ද නොගණුව, අපගේ පෙළ හා යෙදෙතී ද නොගණුව, තර්කග්‍රාහයෙනුදු නොගණුව, නයග්‍රාහයෙනුදු නොගණුව, ආකාරපරිවිතර්කයෙනුදු නොගණුව, 'අප සිතා ඉවසාගත් දෘෂ්ටිය හා සැසැඳෙතැ'යි ද නොගණුව, (මෙතෙම පූජ්‍යයෙකැ'යි) භව්‍යරූපතායෙනුදු නොගණුව, 'මේ මහණ අපට ගුරුහ'යි ද නොගණුව' යි. කාලාමයෙනි, මේ දහම් අකුසල්ය, මේ දහම් වරද සහිතය, මේ දහම් නුවණැත්තන් විසින් ගර්හිතය, මේ දහම්හු සපුරන ලද්දාහු සමාදන් කොට ගන්නා ලද්දාහු අවැඩ පිණිස දුක් පිණිස පවත්නාහ'යි යම් කලෙක තෙපි තුමූ ම දැනගන්නහු නම්, කාලාමයෙනි, එකල්හි තෙපි එය දුරු කරව'යි මෙසේ යමක් කියන ලද නම්, තෙල මේ සඳහා කියන ලදී.

එථ තුම්හෙ කාලාමා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති. යදා තුම්හෙ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ, ඉමෙ ධම්මා කුසලා, ඉමෙ ධම්මා අනවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුප්පසත්ථා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්තීති. අථ තුම්හෙ කාලාමා උපසම්පජ්ජ විහරෙය්‍යාථ.

තං කිම්මඤ්ඤථ කාලාමා අලොභො පුරිසස්ස අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති හිතාය වා අහිතාය වාති. හිතාය භන්තෙ,

අලුද්ධො පනායං කාලාමා පුරිසපුග්ගලො ලොභෙන අනභිභූතො අපරියාදින්නචිත්තො නෙව පාණං හනති, න අදින්නං ආදියති, න පරදාරං ගච්ඡති, න මුසා භණති. පරම්පි තථත්තාය සමාදපෙති, යං ස හොති දීඝරත්තං හිතාය සුඛායාති. එවං භන්තෙ.

තං කිම්මඤ්ඤථ කාලාමා අදොසො පුරිසස්ස අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති හිතාය වා අහිතාය වාති; හිතාය භන්තෙ.

අදුට්ඨො පනායං කාලාමා පුරිසපුග්ගලො දොසෙන අනභිභූතො අපරියා-දින්නචිත්තො නෙව පාණං හනති -පෙ- න මුසා භණති, පරම්පි තථත්තාය සමාදපෙති. යං ස හොති දීඝරත්තං හිතාය සුඛායාති. එවං භන්තෙ.

තං කිම්මඤ්ඤථ කාලාමා අමොහො පුරිසස්ස අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති හිතාය වා අහිතාය වාති? හිතාය භන්තෙ.

අමූළ්හො පනායං කාලාමා පුරිසපුග්ගලො මොහෙන අනභිභූතො අපරියාදින්නචිත්තො නෙව පාණං හනති, න අදින්නං ආදියති, න පරදාරං ගච්ඡති, න මුසා භණති, පරම්පි තථත්තාය සමාදපෙති, යං ස හොති දීඝරත්තං හිතාය සුඛායාති. එවං භන්තෙ.

තං කිම්මඤ්ඤථ කාලාමා ඉමෙ ධම්මා කුසලා වා අකුසලා වාති? කුසලා භන්තෙ.

සාවජ්ජා වා අනවජ්ජා වා ති? අනවජ්ජා භන්තෙ.

විඤ්ඤුගරහිතා වා විඤ්ඤුප්පසත්ථා වාති? විඤ්ඤුප්පසත්ථා භන්තෙ.

කාලාමයෙනි, තෙපි එව, අනුශ්‍රවකථායෙනුදු නොගණුව, පරම්පරා කථායෙනුදු නොගණුව, තෙල මෙසේ වීලැයි ද නොගණුව, අපගේ පෙළ හා යෙදේනී ද නොගණුව, තර්කග්‍රාහයෙනුදු නොගණුව, න්‍යායග්‍රාහයෙනුදු නොගණුව, ආකාරපරිවිතර්කයෙනුදු නොගණුව, අප සිතා ඉවසාගත් දෘෂ්ටිය හා සැසැදෙ-තැයිද නොගණුව, (මෙතෙම පූජ්‍යයෙකැයි) භව්‍යරූපතායෙනුදු නොගණුව, 'මේ මහණ අපට ගුරුහයි' ද නොගණුව, කාලාමයෙනි, යම් කලෙක තෙපි මේ දහම්හු කුසල්හ, මේ දහම්හු අනවද්‍යයහ, මේ දහම්හු විඥප්‍රශස්තයහ, මේ දහම්හු සම්පූර්ණ කොට ගන්නා ලද්දාහු සමාදන් කොට ගන්නා ලද්දාහු වැඩ පිණිස සුව පිණිස පවත්නාහ'යි තුමූ ම දන්නහු නම්, එකල කාලාම-යෙනි, තෙපි එය උපයාගෙණ වසව

කාලාමයෙනි, ඒ කිමැයි සිතවු ද? පුරුෂයාගේ සිත තුළ අලොභය උපදනේ හිත පිණිස හෝ අහිත පිණිස හෝ උපදනේ ද? වහන්ස, හිත පිණිස උපදනේය.

කාලාමයෙනි, අලුබ්ධ වූ මේ පුරුෂ පුද්ගල ලෝභයෙන් නොමඩනා ලදුයේ නොගත්තා ලද සිත් ඇතියේ යම් කරුණෙක් ඔහුට දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුව පිණිස වේ නම්, එබඳු වූ පණිවා නොමැ කෙරේ. අසිතාදන් නො ගණී. පරදාරයන් කරා නො යේ. මුසවා නො බෙණේ. මෙරමාත් එසෙයට සමාදන් කරවයි. වහන්ස, එසේය.

කාලාමයෙනි, ඒ කිමැයි හඟිවු ද; පුරුෂයාගේ සිත තුළ අද්වේෂය උපදනේ වැඩ පිණිස හෝ අවැඩ පිණිස හෝ උපදනේ ද? වහන්ස, වැඩ පිණිස උපදනේ ය.

කාලාමයෙනි, අද්විෂ්ට වූ මේ පුරුෂ පුද්ගල ද්වේෂයෙන් නො මඩනා ලදුයේ නොගත්තාලද සිත් ඇතියේ යම් කරුණෙක් ඔහුට දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුව පිණිස වේ නම් එබඳු වූ පණිවා නො ම කෙරේ ... මුසවා නො බෙණේ. මෙරමාත් එසෙයට සමාදන් කරවයි. වහන්ස, එසේය.

කාලාමයෙනි, ඒ කිමැයි හඟිවු ද? අමෝහය පුරුෂයා තුළ උපදනේ වැඩ පිණිස හෝ අවැඩ පිණිස හෝ උපදනේ ද? වහන්ස, වැඩ පිණිස උපදනේ ය.

කාලාමයෙනි, අමූඪ වූ මේ පුරුෂ පුද්ගල මොහයෙන් නොමඩනා ලදුයේ-නොගත්තා ලද සිත් ඇතියේ, යම් කරුණෙක් ඔහුට දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුව පිණිස වේ නම්, එබඳු වූ පණිවා නො ම කෙරේ, අසිතාදන් නො ගණී. පරදාරයට නොයේ, මුසවා නො බෙණේ, මෙරමාත් එසෙයට සමාදන් කරව යි. වහන්ස, එසේය.

කාලාමයෙනි, ඒ කිමැයි හඟිවු ද? මේ ධර්මයෝ කුසල් හෝ අකුසල් හෝ වෙත් ද? වහන්ස, කුසල්හු වෙති.

සාවද්‍ය හෝ අනවද්‍ය හෝ වෙත් ද? වහන්ස, අනවද්‍ය වෙති.

විඥයන් විසින් ගර්හිත හෝ ප්‍රශස්ත හෝ වෙත් ද? වහන්ස, විඥයන් විසින් ප්‍රශස්තයහ.

සම්මත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්ති නො වා කථං වා හෙත්ථ හොතීති? සමත්තා භන්තෙ සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්ති එවං නො හෙත්ථ හොතීති.

ඉති ඛො කාලාමා යන්තං අවොචුම්හ: එථ තුම්හෙ කාලාමා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති. යදා තුම්හෙ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ: ඉමෙ ධම්මා කුසලා, ඉමෙ ධම්මා අනවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුප්පසත්ථා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්තීති. අථ තුම්හෙ කාලාමා උපසම්පජ්ජ විහරෙය්‍යාථාති ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

ස ඛො සො කාලාමා අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතබ්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො මෙත්තාසහගතෙන චෙතසා -පෙ- කරුණාසහගතෙන චෙතසා - මුදිතාසහගතෙන චෙතසා-උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං - තථා තතියං - තථා චතුත්ථිං - ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති.

ස ඛො සො කාලාමා අරියසාවකො එවං අවෙරචිත්තො එවං අබ්‍යාපජ්ඣචිත්තො එවං අසඞ්කිලිට්ඨචිත්තො එවං විසුද්ධචිත්තො තස්ස දිට්ඨෙව ධම්මෙ චත්තාරො අස්සාසා අධිගතා හොන්ති:

සචෙ ඛො පන අත්ථි පරො ලොකො, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, ඨානමහං කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමීති, අයමස්ස පඨමො අස්සාසො අධිගතො හොති.

සචෙ ඛො පන නත්ථි පරො ලොකො, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, ඉධාහං දිට්ඨෙව ධම්මෙ අවෙරං අබ්‍යාපජ්ඣං අනීඝං සුඛිං අත්තානං පරිහරාමීති, අයමස්ස දුතියො අස්සාසො අධිගතො හොති.

සචෙ ඛො පන කරොතො කරීයති පාපං, න ඛො පනාහං කස්සචි පාපං චෙතෙමි, අකරොන්තං ඛො පන මං පාපං කම්මං කුතො දුක්ඛං ඵුසිස්සතීති අයමස්ස තතියො අස්සාසො අධිගතො හොති.

සචෙ ඛො පන කරොතො න කරීයති පාපං, ඉධාහං[1] උභයෙනෙව විසුද්ධං අත්තානං සමනුපස්සාමීති අයමස්ස චතුත්ථො අස්සාසො අධිගතො හොති.

1 අථාහං - මජසං

පරිපූර්ණ වූවාහු මොනොවට ගන්නා ලද්දාහු හිතයට සුඛයට වැටෙත් ද? නොහොත් නො වැටෙත් ද? මෙහිලා කෙසේ හෝ අදහස් වන්නේ ද? වහන්ස, පරිපූර්ණ වූවාහු මොනොවට ගන්නා ලද්දාහු හිතයට සුඛයට වැටෙත්. මෙහි ලා අපට මෙබඳු අදහස් වෙයි.

"කාලාමයෙනි, තෙපි එව, අනුශ්‍රව කථායෙනුදු නො ගණුව, පරම්පරා-කථායෙනුදු නො ගණුව, (තෙල මෙසේ වීල යන) ඉතිකිරාකථායෙනුදු නො ගණුව. (පෙළ හා සැසඳෙයි යන) පිටක සම්පදානයෙනුදු නො ගණුව, තර්කහේතුයෙනුදු නො ගණුව, නයහෙතුයෙනුදු නො ගණුව, ආකාරපරි-විතර්කයෙනුදු නො ගණුව, දෘෂ්ටිනිර්ධ්‍යානක්ෂාන්තියෙනුදු නො ගණුව, භව්‍ය-රූපභාවයෙනුදු නො ගණුව. මේ මහණහු අපට ගුරුහ යන හෙතුයෙනුදු නො ගණුව. කාලාමයෙනි, තෙපි යම් කලෙක මේ ධර්මයෝ කුශලයහ, මේ ධර්මයෝ අනවද්‍යයහ, මේ ධර්මයෝ විඥප්‍රශස්තයහ. මේ ධර්මයෝ සමාත්ත වූවාහු, සමාදත්ත වූවාහු හිතයට සුඛයට වැටෙති'යි තුමූ ම දනිවූ නම් කාලාමයෙනි, එකල තෙපි එය ලැබගෙණ වසව"යි මෙසේ යම් ඒ බසක් කියනලදනම්, මෙය තෙල කරුණ පිණිස කියන ලදී.

කාලාමයෙනි, ඒ ආර්‍යශ්‍රාවක වනාහි මෙසේ පහව ගිය අභිධ්‍යා ඇත්තේ, පහව ගිය ව්‍යාපාද ඇත්තේ අසම්මූඪ වූයේ නුවණින් දන්නේ එළඹසිටි සිහි ඇත්තේ මෛත්‍රී සහගත සිතින් ... කරුණා සහගත සිතින් ... මාදීව සහගත සිතින් ... උපෙක්ෂා සහගත සිතින් එක් දිගක් පැතිර ගෙණ වෙසේ. එසැටි ම දෙවන දිග, එසැටි ම තුන්වන දිග, එසැටි ම සතරවන දිග දූයි මෙසේ උඩ යට සරස හැම තැන සර්‍වාත්මභාවයෙන් සකල ලොකය විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ එයින් ම නිදුක් වූ උපෙක්ෂා-සහගත සිතින් පැතිර ගෙණ වෙසෙයි.

කාලාමයෙනි, ඒ ආර්‍යශ්‍රාවක වනාහි මෙසේ අවෛර සිත් ඇතියේ මෙසේ නිදුක් සිත් ඇතියේ මෙසේ නොකිලිටි සිත් ඇතියේ මෙසේ පිරිසිදු සිත් ඇතියේ වේ ද, ඔහු විසින් ඉහාත්මයෙහි ම සතර ආශ්වාස කෙනෙක් අධිගත වෙත්.

ඉදින් පරලොව් වේ නම් සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාකයෙක් වේ නම් මම ඒකාන්තයෙන් කාබුන් මරණින් මතුයෙහි ශෝභනගති ඇති ස්වර්ගලෝකයට එළඹෙමි සි මේ පළමුවන ආශ්වාසය අධිගත වෙයි.

ඉදින් පරලොව නො වේ නම් සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක යෙක් නො වේ නම් මම මෙලොව ම අවෛර වූත් ව්‍යාබාධරහිත වූත් සුඛ වූත් ආත්මයක් පරිහරණය කෙරෙමි සි මේ දෙවන ආශ්වාසය අධිගත වෙයි.

ඉදින් කරණුවහට පව් කෑරේ ද, මම වැලින් කිසිවක්හට පවක් නො සිතමි. පව්කම් නො කරණ මා කොයින් දුක් වදනේ ද සි ඔහු විසින් මේ තුන්වන ආශ්වාසය අධිගත වෙයි.

ඉදින් කරණුවහට පව් නො කෑරේ ද, මම වැලින් දෙපසින් ම විශුද්ධ වූ ආත්මයක් දක්මි සි ඔහු විසින් මේ සතරවන ආශ්වාසය අධිගත වෙයි.

ස ඛො සො කාලාමා අරියසාවකො එවං අවෙරචිත්තො එවං අබ්‍යාපජ්ඣ-චිත්තො එවං අසඞ්කිලිට්ඨචිත්තො, එවං විසුද්ධචිත්තො තස්ස දිට්ඨෙව ධම්මෙ ඉමෙ චත්තාරො අස්සාසා අධිගතා හොන්තීති?

එවමෙතං භගවා, එවමෙතං සුගත, ස ඛො සො භන්තෙ අරියසාවකො එවං අවෙරචිත්තො එවං අබ්‍යාපජ්ඣචිත්තො එවං අසඞ්කිලිට්ඨචිත්තො එවං විසුද්ධචිත්තො තස්ස දිට්ඨෙව ධම්මෙ චත්තාරො අස්සාසා අධිගතා හොන්ති.

සචෙ ඛො පන අත්ථි පරො ලොකො, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, ඨානමහං කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමීති, අයමස්ස පඨමො අස්සාසො අධිගතො හොති.

සචෙ ඛො පන නත්ථි පරො ලොකො, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො. ඉධාහං දිට්ඨෙව ධම්මෙ අවෙරං අබ්‍යාපජ්ඣං අනීඝං සුඛං අත්තානං පරිහරාමීති අයමස්ස දුතියො අස්සාසො අධිගතො හොති.

සචෙ ඛො පන කරොතො කරීයති පාපං, න ඛො පනාහං කස්සචි පාපං චෙතෙමි, අකරොන්තං ඛො පන මං පාපං කම්මං කුතො දුක්ඛං ඵුසිස්සතීති අයමස්ස තතියො අස්සාසො අධිගතො හොති.

සචෙ ඛො පන කරොතො න කරීයති පාපං, ඉධාහං උභයෙනෙව විසුද්ධං අත්තානං සමනුපස්සාමීති අයමස්ස චතුත්ථො අස්සාසො අධිගතො හොති.

ස ඛො සො භන්තෙ අරියසාවකො එවං අවෙරචිත්තො එවං අබ්‍යාපජ්ඣ-චිත්තො එවං අසඞ්කිලිට්ඨචිත්තො එවං විසුද්ධචිත්තො තස්ස දිට්ඨෙව ධම්මෙ ඉමෙ චත්තාරො අස්සාසා අධිගතා හොන්තීති.

අභික්කන්තං භන්තෙ -පෙ- එතෙ මයං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භන්තෙ භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණංගතෙති.

## 3. 2. 2 6.

16. එවං මෙ සුතං: එකං සමයං ආයස්මා නන්දකො සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ. අථ ඛො සාළ්හො ච මිගාරනත්තා රොහණො ච පෙඛුනියනත්තා යෙනායස්මා නන්දකො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා ආයස්මන්තං නන්දකං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නං ඛො සාළ්හං මිගාරනත්තාරං ආයස්මා නන්දකො එතදවොච:

කාලාමියෙනි, ඒ ආර්‍ය්‍යශ්‍රාවක වනාහි මෙසේ අවෛර සිත් ඇත්තේ, මෙසේ අව්‍යාබාධ සිත් ඇත්තේ, මෙසේ නො කිලිටි සිත් ඇත්තේ, මෙසේ විශුද්ධ සිත් ඇත්තේ වේ ද, ඔහු විසින් ඉහාත්මයෙහි ම මේ සතර ආශ්වාසයෝ අධිගත වෙත් දැයි වදාළහ.

භාග්‍යවතුන් වහන්ස, මෙල මෙසේ මැයැ. සුගතයන් වහන්ස, මෙල මෙසේ මැයැ. වහන්ස, ඒ අරිසවූ මෙසේ අවෛර සිත් ඇතියේ, මෙසේ ව්‍යාබාධ රහිත සිත් ඇතියේ - මෙසේ නො කිලිටි සිත් ඇතියේ - මෙසේ පිරිසිදු සිත් ඇතියේ වේ ද, ඔහු විසින් ඉහාත්මයෙහි ම සතර ආශ්වාසයෝ අධිගත වෙත්. (කෙසේ ද?)

ඉදින් පරලොව වේ ද, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාකයෙක් වේ ද, එකාන්තයෙන් මම කාබුන් මරණින් මතුයෙහි ශුභගති ඇති සවර්ගලො-කයට එළඹෙමි යි ඔහු විසින් මේ පළමුවන ආශ්වාසය අධිගත වෙයි.

ඉදින් පරලොව නො වේ ද, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵල විපාක-යෙක් නො වේ ද, මම මෑලිත් ඉහාත්මයෙහි ම අවෛර වූ ව්‍යාබාධ රහිත වූ ව්‍යසන රහිත වූ සුඛ වූ ආත්මයක් පරිහරණය කරමි යි ඔහු විසින් මේ දෙවන ආශ්වාසය අධිගත වෙයි.

ඉදින් කරණුවහට පව් කැරේ ද, මම මෑලිත් කිසිවක්හට පවක් නො සිතමි. පව්කම් නො කරණ මා කොයින් දුක් වදනේ ද යි ඔහු විසින් මේ තුන්වන ආශ්වාසය අධිගත වෙයි.

ඉදින් කරණුවහට පව් නො කැරේ ද, මම එයින් දෙපසින් ම විශුද්ධ වූ ආත්මයක් දක්මි යි ඔහු විසින් මේ සතරවන ආශ්වාසය අධිගත වෙයි.

වහන්ස, ඒ අරිසවූ මෙසේ අවෛර සිත් ඇත්තේ, මෙසේ නිර්ව්‍යාබාධ සිත් ඇත්තේ, මෙසේ නො කිලිටි සිත් ඇත්තේ, මෙසේ පිරිසිදු සිත් ඇතියේ වේ ද, ඔහු විසින් ඉහාත්මයෙහි ම මේ සතර ආශ්වාසයෝ අධිගත වෙත්.

වහන්ස, ඉතා මැනව, ... වහන්ස, මෙල අපි භාග්‍යවතුන් වහන්සේ සරණ යම්හ. දහම ද භික්සඟුන් ද සරණ යම්හ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අප අද පටන් කොට දිවියෙන් ගත් සරණ ගිය උපාසකයන් කොට ධරණ සේක් වා.

## 3. 2. 2. 6.

16. එක් සමයෙක්හි ආයුෂමත් **නන්‍දක** මහතෙරහු **සැවැත්** නුවර මිගාරමාපහය නම් ලද **පූර්වාරාමයෙහි** වැඩ වෙසෙති. එකල්හි මිගාර මහසිටුහු මුනුපුරු **සාළහ** සිටු හා පෙඛුනිය සිටුහු මුනුපුරු **රොහණ** සිටු හා නන්‍දක මහතෙරුන් කරා එළඹියහ. එළඹ ආයුෂමත් නන්‍දක මහතෙරුන් සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් මිගාර මහසිටු මුනුපුරු සාළහයනට ආයුෂමත් නන්‍දක මහතෙරහු මෙල පැවසූහ.

එථ තුම්හෙ සාළ්හා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති. යදා තුම්හෙ සාළ්හා අත්තනාව ජානෙය්‍යාථ: ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුගරහිතා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති. අථ තුම්හෙ සාළ්හා පජහෙය්‍යාථ.

තං කිං මඤ්ඤථ සාළ්හා අත්ථි ලොභොති? එවං භන්තෙ, අභිජ්ඣාති ඛො අහං සාළ්හා එතමත්ථං වදාමි.

ලුද්ධො ඛො අයං සාළ්හා අභිජ්ඣාලු පාණම්පි හනති, අදින්නම්පි ආදියති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, පරම්පි තථත්තාය සමාදපෙති යං ස හොති දීඝරත්තං අහිතාය දුක්ඛායාති? එවං භන්තෙ.

තං කිම්මඤ්ඤථ සාළ්හා අත්ථි දොසොති? එවං භන්තෙ. බ්‍යාපාදොති ඛො අහං සාළ්හා එතමත්ථං වදාමි.

දුට්ඨො ඛො අයං සාළ්හා බ්‍යාපන්නචිත්තො පාණම්පි හනති -පෙ- මුසාපි භණති, පරම්පි තථත්තාය සමාදපෙති, යං ස හොති දීඝරත්තං අහිතාය දුක්ඛායාති, එවම්භන්තෙ.

තං කිම්මඤ්ඤථ සාළ්හා අත්ථි මොහොති? එවම්භන්තෙ. අවිජ්ජාති ඛො අහං සාළ්හා එතමත්ථං වදාමි.

මූළ්හො ඛො අයං සාළ්හා අවිජ්ජාගතො පාණම්පි හනති, අදින්නම්පි ආදියති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, පරම්පි තථත්තාය සමාදපෙති, යං ස හොති දීඝරත්තං අහිතාය දුක්ඛායාති. එවම්භන්තෙ.

තං කිං මඤ්ඤථ සාළ්හා, ඉමෙ ධම්මා කුසලා වා අකුසලා වාති? අකුසලා භන්තෙ. සාවජ්ජා වා අනවජ්ජා වාති? සාවජ්ජා භන්තෙ. විඤ්ඤුගරහිතා වා විඤ්ඤුප්පසත්ථා වාති? විඤ්ඤුගරහිතා භන්තෙ. සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්ති නො වා කථං වා එත්ථ හොතීති? සමත්තා භන්තෙ සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්ති; එවං නො එත්ථ හොතීති.

සාළ්හයෙනි, තෙපි එව, අනුශ්‍රවකථායෙනුදු නො ගණුව, පරම්පරා-කථායෙනුදු නො ගණුව, (තෙල මෙසේ වේ ල යන මේ) ඉතිකිරා කථායෙනුදු නො ගණුව, (අපගේ පෙළ හා සැසඳෙතී යන) පිටක සම්පදානයෙනුදු නො ගණුව, තර්කග්‍රාහයෙනුදු නො ගණුව, නයග්‍රාහයෙනුදු නො ගණුව, ආකාරපරිවිතර්කයෙනුදු නො ගණුව, (අප ඉවසූ දෘෂ්ටිය හා සැසඳෙති යන) දෘෂ්ටිනිර්ධ්‍යානක්ෂාන්තියෙනුදු නො ගණුව, භව්‍යරූපතාවයෙනුදු නො ගණුව, මේ මහණහු අප ගුරුහ යන හේතුයෙනුදු නො ගණුව සාළ්හයෙනි, යම් කලෙක තෙපි "මේ දහම්හු අකුසල්හ, මේ දහම්හු සාවද්‍යයහ, මේ දහම්හු විඥගර්හිතයහ. මේ දහම්හු පරිපූර්ණ වූවාහු පරාමර්ෂ වශයෙන් ගන්නා ලද්දාහු අහිතයට දුඃඛයට වැටෙති" යි තුමූ ම දනිව් ද, සාළ්හයෙනි, එකල තෙපි හැරපියව.

සාළ්හයෙනි, ඒ කිමැයි හඟිව් ද, ලෝභය ඇද් ද? වහන්ස, එසේය, සාළ්හයෙනි, මම තෙල අර්ථය 'අභිධ්‍යා'යි කියමි.

සාළ්හයෙනි, ලුබ්ධ වූ අභිධ්‍යා බහුල වූ මේ පුරුෂ යම් කර්මයෙක් ඔහුට දීර්ඝරාත්‍රයෙහි අහිතයට දුඃඛයට වැටේ ද, එබඳු කර්ම වූ ප්‍රාණයන් නස්නේ ය, අයිතාදනුත් ගන්නේ ය, පරදාරයන් කරත් යන්නේ ය, මුසවාත් බණන්නේ ය, මෙරමාත් එසෙයට සමාදන් කරවන්නේ ය. වහන්ස, එසේය.

සාළ්හයෙනි, එය කිමැයි හඟිව් ද, ද්වේෂය ඇද්ද? වහන්ස, එසේය. සාළ්හයෙනි, මම 'ව්‍යාපාද'යි තෙල අර්ථය කියමි.

සාළ්හයෙනි, දුෂ්ට වූ ව්‍යාපාදයට පත් සිතැති මේ පුද්ගල, යම් කර්මයෙක් ඔහුට දීර්ඝරාත්‍රයෙහි අහිතයට දුඃඛයට වැටේ ද, එබඳු කර්ම වූ ප්‍රාණයන් නස්නේ ය ... මුසවාත් බණන්නේ ය, මෙරමාත් එසෙයට සමාදන් කර-වන්නේ ය. වහන්ස, එසේය.

සාළ්හයෙනි, ඒ කිමැ යි හඟිව් ද, මෝහය ඇද්ද? වහන්ස, එසේය. සාළ්හයෙනි, මම 'අවිද්‍යා'යි තෙල අර්ථය කියමි.

සාළ්හයෙනි, මූඪ වූ අවිද්‍යායෙන් යුක්ත මේ පුරුෂ, යම් කර්මයෙක් ඔහුට දීර්ඝරාත්‍රයෙහි අහිතයට දුඃඛයට වැටේ ද, එබඳු කර්ම වූ ප්‍රාණයන් නස්නේ ය, අයිතාදනුත් ගන්නේ ය, පරදාරයන් කරත් යන්නේ ය, මුසවාත් බණන්නේ ය, මෙරමාත් එසෙයට සමාදන් කරවන්නේ ය. වහන්ස, එසේය.

සාළ්හයෙනි, ඒ කිමැයි හඟිව් ද? මේ දහම්හු කුසල් හෝ අකුසල් හෝ වෙද් ද? වහන්ස, අකුසල්හ. සාවද්‍ය හෝ අනවද්‍ය හෝ වෙත් ද? වහන්ස, සාවද්‍යයහ. විඥගර්හිත හෝ විඥප්‍රශස්ත හෝ වෙද්ද? වහන්ස, විඥගර්හිතයහ. සමාපන්න වූවාහු සමාදත්ත වූවාහු අහිතයට දුඃඛයට වැටෙත් ද? නොහොත් නො වැටෙද් ද? මෙහිලා කෙසේ හෝ අදහස් වේ ද? වහන්ස, පරිපූර්ණ වූවාහු මොනොවට ගන්නා ලද්දාහු අහිතයට දුඃඛයට වැටෙති. මෙහිලා අපට මෙසේ අදහස් වෙයි.

ඉති ඛො සාළ්හා යන්තං අවොචුම්හ: එථ තුම්හෙ සාළ්හා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති. යදා තුම්හෙ සාළ්හා අත්තනාව ජානෙය්‍යාථ, ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුගරහිතා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති. අථ තුම්හෙ සාළ්හා පජහෙය්‍යාථාති ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

එථ තුම්හෙ සාළ්හා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති. යදා තුම්හෙ සාළ්හා අත්තනාව ජානෙය්‍යාථ ඉමෙ ධම්මා කුසලා, ඉමෙ ධම්මා අනවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුප්පසත්ථා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්තීති. අථ තුම්හෙ සාළ්හා උපසම්පජ්ජ විහරෙය්‍යාථ.

තං කිං මඤ්ඤථ සාළ්හා අත්ථි අලොභොති? එවම්භන්තෙ. අනභිජ්ඣාති ඛො අහං සාළ්හා එතමත්ථං වදාමි.

අලුද්ධො ඛො අයං සාළ්හා අනභිජ්ඣාලු නෙව පාණං හන්ති, න අදින්නං ආදියති, න පරදාරං ගච්ඡති, න මුසා භණති, පරම්පි තථත්තාය සමාදපෙති යං ස හොති දීඝරත්තං හිතාය සුඛායාති? එවම්භන්තෙ.

තං කිං මඤ්ඤථ සාළ්හා අත්ථි අදොසොති? එවම්භන්තෙ. අබ්‍යාපාදොති ඛො අයං සාළ්හා එතමත්ථං වදාමි.

අදුට්ඨො ඛො අයං සාළ්හා අබ්‍යාපන්නචිත්තො නෙව පාණං හන්ති, -පෙ- න මුසා භණති, පරම්පි තථත්තාය සමාදපෙති, යං ස හොති දීඝරත්තං හිතාය සුඛායාති? එවම්භන්තෙ.

තං කිම්මඤ්ඤථ සාළ්හා අත්ථි අමොහොති? එවම්භන්තෙ. විජ්ජාති ඛො අයං සාළ්හා එතමත්ථං වදාමි.

අමූළ්හො ඛො අයං සාළ්හා විජ්ජාගතො නෙව පාණං හන්ති, -පෙ- න මුසා භණති, පරම්පි තථත්තාය සමාදපෙති, යං ස හොති දීඝරත්තං හිතාය සුඛායාති? එවම්භන්තෙ.

"සාළ්හයෙනි, තෙපි එව, අනුශ්‍රවකථායෙනුදු නො ගණුව, ඉතිකිරා කථායෙනුදු නො ගණුව, පිටකසම්පදානයෙනුදු නො ගණුව, තර්කහේතුයෙනුදු නො ගණුව, නයහේතුයෙනුදු නො ගණුව, ආකාරපරිවිතර්කයෙනුදු නො ගණුව, දෘෂ්ටිනිර්ධ්‍යානක්ෂාන්තියෙනුදු නො ගණුව, භව්‍යරූපතායෙනුදු නො-ගණුව, අපගේ ගුරු ශ්‍රමණයහ යන හේතුයෙනුදු නො ගණුව"යි මෙසේ යම් ඒ බසක් කීමෝ ද, සාළ්හයෙනි, යම් කලෙක තෙපි "මේ දහම්හු අකුසල්හ. මේ දහම්හු සාවද්‍යයහ. මේ දහම්හු විඥයන් විසින් ගර්හිතයහ. මේ දහම්හු පරිපූර්ණ වූවාහු සමාදාන විසින් ගන්නා ලද්දාහු අහිතයට දුඃඛයට වැටෙති යි තුමූ ම දනිව් ද? සාළ්හයෙනි, එකල තෙපි හැරපියව"යි මෙසේ යම් ඒ බසක් කියන ලද ද, මෙය තෙල කරුණ පිණිස කියන ලදි.

සාළ්හයෙනි, තෙපි එව, අනුශ්‍රවකථායෙනුදු නො ගණුව, පරම්පරාකථා-යෙනුදු නො ගණුව, ඉතිකිරා කථායෙනුදු නො ගණුව, පිටකසම්පදානයෙනුදු නො ගණුව, තර්කහෙතුයෙනුදු නො ගණුව, නයහෙතුයෙනුදු නො ගණුව, ආකාරපරිවිතර්කයෙනුදු නො ගණුව, දෘෂ්ටිනිර්ධ්‍යානක්ෂාන්තියෙනුදු නො ගණුව, භව්‍යරූපතායෙනුදු නො ගණුව, අපගේ ගුරු ශ්‍රමණයහ යන හෙතුයෙනුදු නො ගණුව. සාළ්හයෙනි, යම් කලෙක තෙපි "මේ දහම්හු කුසල්හ, මේ දහම්හු අනවද්‍යයහ, මේ දහම්හු විඥප්‍රශස්තයහ, මේ දහම්හු සමාප්ත වූවාහු සමාදත්ත වූවාහු හිතයට සුඛයට වැටෙත්" යි තුමූ ම දනිව් ද, සාළ්හයෙනි, එකල තෙපි එයට එළඹ වසව.

සාළ්හයෙනි, ඒ කිමැ යි හඟිව් ද, අලෝභය ඇද් ද? වහන්ස, එසේය. සාළ්හයෙනි, මම 'අනභිධ්‍යා'ය යි තෙල අර්ථය කියමි.

සාළ්හයෙනි, අලුබ්ධ වූ අභිධ්‍යා බහුල නො වූ මේ පුරුෂ, යම් කර්මයෙක් ඔහුට දීර්ඝරාත්‍රයෙහි හිතයට සුඛයට වැටේ ද, එබඳු කර්ම වූ ප්‍රාණයන් නො ම නසයි, අයිතාදන් නො ගණී, පරදාරයට නො යෙයි, මුසවා නො කියයි, මෙරමා එසෙයට සමාදන් කරවයි. වහන්ස, එසේය.

සාළ්හයෙනි, ඒ කිමැ යි හඟිව් ද, අද්වේෂය ඇද් ද? වහන්ස, එසේය. සාළ්හයෙනි, මම 'අව්‍යාපාද'ය යි තෙල අර්ථය කියමි.

සාළ්හයෙනි, අද්විෂ්ට වූ ව්‍යාපාදයට නොපත් සිතැති, මේ පුද්ගල යම් කර්මයෙක් ඔහුට හිතයට සුඛයට වැටේ ද, එබඳු කර්ම වූ ප්‍රාණය නො ම නස්නේ ය, ... මුසවා නො බෙණේ, මෙරමාත් එසෙයට සමාදන් කරවයි. වහන්ස, එසේය.

සාළ්හයෙනි, ඒ කිමැ යි හඟිව් ද, අමොහය ඇද්ද? වහන්ස එසේය. සාළ්හයෙනි, මම 'විද්‍යා'ය යි තෙල අර්ථය කියමි.

සාළ්හයෙනි, අමූඪ වූ විද්‍යාව ලත් මේ පුරුෂ යම් කර්මයෙක් ඔහුට දීර්ඝරාත්‍රයෙහි හිතයට සුඛයට වැටේ ද, එබඳු කර්ම වූ ප්‍රාණය නො ම නස්නේය, ... මුසවා නො බණන්නේ ය, මෙරමාත් එසෙයට සමාදන් කරවන්නේ ය. වහන්ස, එසේය.

තං කිම්මඤ්ඤථ සාළ්හා ඉමෙ ධම්මා කුසලා වා අකුසලා වාති? කුසලා භන්තෙ. සාවජ්ජා වා අනවජ්ජා වාති? අනවජ්ජා භන්තෙ. විඤ්ඤුගරහිතා වා විඤ්ඤුප්පසත්ථා වාති? විඤ්ඤුප්පසත්ථා භන්තෙ.

සමත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්ති, නො වා කථං වා හෙත්ථ හොතීති? සමත්තා භන්තෙ සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්ති, එවං නො හෙත්ථ හොතීති.

ඉති ඛො සාළ්හා යං තං අවොචුම්හ: එථ තුම්හෙ සාළ්හා, මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති. යදා තුම්හෙ සාළ්හා අත්තනාව ජානෙය්‍යාථ, ඉමෙ ධම්මා කුසලා, ඉමෙ ධම්මා අනවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුප්පසත්ථා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්තීති, අථ තුම්හෙ සාළ්හා උපසම්පජ්ජ විහරෙය්‍යාථාති, ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

ස ඛො සො සාළ්හා අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතබ්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො මෙත්තාසහගතෙන චෙතසා -පෙ- කරුණා - මුදිතා - උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං - තථා තතියං - තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති.

සො එවං පජානාති, අත්ථි ඉදං, අත්ථි හීනං, අත්ථි පණීතං, අත්ථි ඉමස්ස සඤ්ඤාගතස්ස උත්තරිං නිස්සරණන්ති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති, භවාසවාපි චිත්තං විමුච්චති, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

සො එවං පජානාති. අහු පුබ්බෙ ලොභො, තදහු අකුසලං සො එතරහි නත්ථි, ඉච්චෙතං කුසලං. අහු පුබ්බෙ දොසො -පෙ- අහු පුබ්බෙ මොහො, තදහු අකුසලං. සො එතරහි නත්ථි, ඉච්චෙතං කුසලන්ති.

ඉති සො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති.

සාළ්හයෙනි, ඒ කිමැ යි හඟිව් ද? මේ දහම්හු කුසල් හෝ අකුසල් හෝ වෙද්ද? වහන්ස, කුසල්හ. සාවද්‍ය හෝ අනවද්‍ය හෝ වෙද්ද! වහන්ස, අනවද්‍යයහ. විඥගර්හිත හෝ විඥප්‍රශස්ත හෝ වෙද්ද? වහන්ස, විඥප්‍රශස්තයහ.

සමාත්ත වූවාහු සමාදත්ත වූවාහු හිතයට සුඛයට වැටෙද්ද? නොහොත් නොවැටෙද්ද? මෙහි ලා කෙසේ අදහස් වේ ද! වහන්ස, සමාත්ත වූවාහු සමාදත්ත වූවාහු හිතයට සුඛයට වැටෙති. මෙහිලා අපට මෙසේ අදහස් වෙයි.

"සාළ්හයෙනි, තෙපි එව, අනුශ්‍රවකථායෙනුදු නො ගණුව. පරම්පර කථායෙනුදු නො ගණුව, ඉතිකිරා කථායෙනුදු නො ගණුව, පිටකසම්පදන-යෙනුදු නොගණුව, තර්කහේතුයෙනුදු නොගණුව, නයහේතුයෙනුදු නොගණුව, ආකාරපරිවිතර්කයෙනුදු නොගණුව, දෘෂ්ටිනිර්ධ්‍යානක්ෂාන්තියෙනුදු නොගණුව, අපගේ ගුරුශ්‍රමණයහ යන හේතුයෙනුදු නොගණුව යි මෙසේ යම් ඒ බසක් කිමෝ ද, "සාළ්හයෙනි, යම් කලෙක තෙපි මේ දහම්හු කුසල්හ. මේ දහම්හු අනවද්‍යයහ. මේ දහම්හු විඥප්‍රශස්තයහ. මේ දහම්හු පුරණ ලද්දාහු සමාදාන වශයෙන් ගන්නා ලද්දාහු හිතයට සුඛයට වැටෙති යි තුමූම දනිව් ද, සාළ්හයෙනි, එකල තෙපි එයට පැමිණ වසව"යි මෙසේ යම් ඒ බසක් කියන ලද ද, මෙය තෙල අර්ථය පිණිස කියන ලදි.

සාළ්හයෙනි, ඒ ආර්‍යශ්‍රාවක මෙසේ පහව ගිය අභිධ්‍යා ඇත්තේ පහව ගිය ව්‍යාපාද ඇත්තේ පහව ගිය මූළා ඇත්තේ නුවණින් දන්නේ එළඹි සිහි ඇත්තේ මෙත් සහගිය සිතින් ... කුලුණු සහගිය සිතින් ... මුදිතා සහගිය සිතින් ... උපෙක්ෂා සහගිය සිතින් එක් දිගක් පැතිර ගෙණ වෙසෙයි. එසැටි ම දෙවන දිග ද, එසැටි ම තෙවන දිග ද, එසැටි ම සතරවන දිගදු යි මෙසේ උඩ - යට - සරස හැමතැන සර්‍වාත්මභාවයෙන් හැමලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාබාධ වූ උපෙක්ෂාසහගත සිතින් පැතිර ගෙණ වෙසෙයි.

"මේ ඇත. හීනයෙක් ඇත. ප්‍රණීතයෙක් ඇත, මේ සංඥගතයාගේ මතු නිශ්‍යරණයෙක් ඇතැ"යි හේ මෙසේ දනී.

මෙසේ දන්නා මෙසේ දක්නා ඔහට කාමාස්‍රවයෙනුදු සිත මිදෙයි. භවාස්‍රවයෙනුදු සිත මිදෙයි. අවිද්‍යාස්‍රවයෙනුදු සිත මිදෙයි. මිදෙන් ම, විමුක්තය යි නුවණෙක් වෙයි. ජාතිය ක්ෂීණ විය. මගබඹසර වැස නිම විය. සතර මග කිස කරණලදි. මේ අර්හත්වය පිණිස කළයුතු අන් දෑයෙක් නැති යි දන්නේය.

"පෙර ලොභයෙක් විය. එය අකුසල් විය. ඒ දැන් නැත. මෙසේ මේ මැනව. පෙර ද්වෙෂයෙක් විය ... පෙර මොහයෙක් විය. එය අකුසල් විය. ඒ දැන් නැත. මෙසේ මේ මැනවැ"යි හේ මෙසේ දැනගණී.

මෙසේ හෙයින් මෙලොව්හි ම නිස්තෘෂ්ණ වූයේ නිර්වෘත වූයේ සීතීභූත වූයේ ශ්‍රෙෂ්ඨ වූ ආත්මයෙන් වෙසෙයි.

### 3. 2. 2. 7.

17. තීණිමානි භික්ඛවෙ කථාවත්ථූනි. කතමානි තීණි: අතීතං වා භික්ඛවෙ අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය එවං අහොසි අතීතමද්ධානන්ති, අනාගතං වා භික්ඛවෙ අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය එවං භවිස්සති අනාගතමද්ධානන්ති, එතරහි වා භික්ඛවෙ පච්චුප්පන්නං ආරබ්භ කථං කථෙය්‍ය එවං එතරහි පච්චුප්පන්නන්ති.

කථාසම්පයොගෙන භික්ඛවෙ පුග්ගලො වෙදිතබ්බො, යදි වා කච්ඡො, යදි වා අකච්ඡොති. සචායං භික්ඛවෙ පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො එකංසව්‍යාකරණීයං පඤ්හං න එකංසෙන ව්‍යාකරොති, විභජ්ජ ව්‍යාකරණීයං පඤ්හං න විභජ්ජ ව්‍යාකරෙති, පටිපුච්ඡා ව්‍යාකරණීයං පඤ්හං න පටිපුච්ඡා ව්‍යාකරෙති, ඨපනීයං පඤ්හං න ඨපෙති, එවං සන්තායං භික්ඛවෙ පුග්ගලො අකච්ඡො හොති.

සචෙ පනායං භික්ඛවෙ පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො එකංසව්‍යාකරණීයං පඤ්හං එකංසෙන ව්‍යාකරොති, විභජ්ජ ව්‍යාකරණීයං පඤ්හං විභජ්ජ ව්‍යාකරොති, පටිපුච්ඡා ව්‍යාකරණීයං පඤ්හං පටිපුච්ඡා ව්‍යාකරොති, ඨපනීයං පඤ්හං ඨපෙති, එවං සන්තායං භික්ඛවෙ පුග්ගලො කච්ඡො හොති.

කථාසම්පයොගෙන භික්ඛවෙ පුග්ගලො වෙදිතබ්බො යදි වා කච්ඡො, යදි වා අකච්ඡොති. සචායං භික්ඛවෙ පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො ඨානාඨානෙ න සණ්ඨාති, පරිකප්පෙ න සණ්ඨාති, අඤ්ඤවාදෙ න සණ්ඨාති, පටිපදාය න සණ්ඨාති, එවං සන්තායං භික්ඛවෙ පුග්ගලො අකච්ඡො හොති.

සචෙ පනායං භික්ඛවෙ පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො ඨානාඨානෙ සණ්ඨාති, පරිකප්පෙ සණ්ඨාති, අඤ්ඤවාදෙ සණ්ඨාති, පටිපදාය සණ්ඨාති එවං සන්තායං භික්ඛවෙ පුග්ගලො කච්ඡො හොති.

කථාසම්පයොගෙන භික්ඛවෙ පුග්ගලො වෙදිතබ්බො යදි වා කච්ඡො යදි වා අකච්ඡොති. සචායං භික්ඛවෙ පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති, බහිද්ධා කථං අපනාමෙති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, එවං සන්තායං භික්ඛවෙ පුග්ගලො අකච්ඡො හොති.

සචෙ පනායං භික්ඛවෙ පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො නාඤ්ඤෙනඤ්ඤං පටිචරති. න බහිද්ධා කථං අපනාමෙති, න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, එවං සන්තායං භික්ඛවෙ පුග්ගලො කච්ඡො හොති.

3. 2. 2. 7.

17. මහණෙනි, මේ කථාවස්තූහු තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්:

මහණෙනි, 'අතීතකාලය මෙසේ වීය'සි අතීත අද්ධානය අරභයා කථා කියන්නේය. මහණෙනි, 'අනාගත කාලය මෙසේ වේය'සි අනාගත අද්ධානය අරභයා කථා කියන්නේය. මහණෙනි, 'දැන් ප්‍රත්‍යුත්පන්නාය මෙසේය' සි දැන් ප්‍රත්‍යුත්පන්නාය හෝ අරභයා කථා කියන්නේ ය.

මහණෙනි, පුග්ගලයා "කථායෙහි යෝග්‍ය වේ ද, නොහොත් කථායෙහි අයෝග්‍ය වේ දැ" යි කථාසම්ප්‍රයෝගයෙන් දතයුතුය. මහණෙනි, ඉදින් ප්‍රශ්න කරණ ලද මේ පුද්ගලයා ඒකාන්තයෙන් විසඳිය යුතු ප්‍රශ්නය ඒකාන්තයෙන් නො විසඳූ ද, විභාග කොට විසඳිය යුතු ප්‍රශ්නය විභාග කොට නො විසඳූ ද, පිළිවිසීමෙන් විසඳිය යුතු ප්‍රශ්නය පිළිවිසීමෙන් නො විසඳූ ද, තුබුවමනා ප්‍රශ්නය නො තබා ද, එසේවත් ම, මහණෙනි, මේ පුද්ගලයා කථා යොග්‍ය නොවේ.

මහණෙනි, ඉදින් මේ පුද්ගලයෙක් ප්‍රශ්න කරණ ලදුයේ ඒකාන්තයෙන් විසඳිය යුතු ප්‍රශ්නය ඒකාන්තයෙන් විසඳූ ද, විභාග කොට විසඳිය යුතු ප්‍රශ්නය විභාග කොට විසඳූ ද, පිළිවිසීමෙන් විසඳිය යුතු ප්‍රශ්නය පිළිවිසීමෙන් විසඳූ ද, තුබුවමනා ප්‍රශ්නය තබා ද, එසේවත් ම, මහණෙනි, මේ පුද්ගලයා කථායොග්‍ය වෙයි.

මහණෙනි, පුද්ගලයා "කථා යෝග්‍ය වේ ද, නොහොත් කථා යෝග්‍ය නො වේ දැ" යි කථා සම්ප්‍රයෝගයෙන් දත යුතුයි. මහණෙනි, ඉදින් මේ පුද්ගලයෙක් ප්‍රශ්න කරණ ලදුයේ කාරණාකාරණයෙහි නො සිටුනේ ද, පරිකල්පනා කොට ගත් කරුණෙහි නො සිටුනේ ද, දැන සිටි වාදයෙහි නො සිටුනේ ද, ප්‍රතිපත්තියෙහි නො සිටුනේ ද, මෙසේ වත් ම, මහණෙනි, මේ පුද්ගලයා කථා යොග්‍ය නො වෙයි,

මහණෙනි, ඉදින් මේ පුද්ගලයෙක් ප්‍රශ්න කරණ ලදුයේ කාරණාකාරණයෙහි සිටුනේ ද, පරිකල්පනා කොට ගත් කරුණෙහි සිටුනේ ද, දැන සිටි වාදයෙහි සිටුනේ ද, ප්‍රතිපත්තියෙහි සිටුනේ ද, එසේ වත් ම, මහණෙනි, මේ පුද්ගලයා කථා යෝග්‍ය වේ.

මහණෙනි, පුද්ගලයා "කථා යෝග්‍ය වේ ද, කථා යෝග්‍ය නො වේ දැ"යි කථා සම්ප්‍රයෝගයෙන් දත යුතු ය.

මහණෙනි, ඉදින් මේ පුද්ගලයෙක් ප්‍රශ්න කරණ ලදුයේ අන්‍යකථාවකින් අන්‍යකථාව වසාලයි ද, එයින් ම බැහැරට කථාව නෙරලයි ද, කොපය හා ද්වේෂය හා නො සතුට හා පහළ කෙරේ ද, එසේවත් ම, මහණෙනි, මේ පුද්ගලයා කථා යෝග්‍ය නො වෙයි.

මහණෙනි, ඉදින් මේ පුද්ගලයෙක් ප්‍රශ්න කරණ ලදුයේ අන්‍යකථාවකින් අන්‍යකථාව නො වසාලයි ද, එයින් ම බැහැරට කථාව නො නෙරයි ද, කෝපය හා ද්වේෂය හා නොසතුට හා පහළ නොකෙරේ ද, එසේවත් ම, මහණෙනි, මේ පුද්ගලයා කථා යෝග්‍ය වෙයි.

කථාසම්පයොගෙන භික්ඛවෙ පුග්ගලො වෙදිතබ්බො යදි වා කච්ඡො, යදි වා අකච්ඡොති.

සචායං භික්ඛවෙ පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො අභිහරති, අභිමද්දති, අනුපජග්ඝති, ඛලිතං ගණ්හාති. එවං සන්තායං භික්ඛවෙ පුග්ගලො අකච්ඡො හොති.

සචෙ පනායං භික්ඛවෙ පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො න අභිහරති, න අභිමද්දති, න අනුපජග්ඝති, න ඛලිතං ගණ්හාති. එවං සන්තායං භික්ඛවෙ පුග්ගලො කච්ඡො හොති.

කථාසම්පයොගෙන භික්ඛවෙ පුග්ගලො වෙදිතබ්බො යදි වා සඋපනිසො යදි වා අනුපනිසොති.

අනොහිතසොතො භික්ඛවෙ අනුපනිසො හොති. ඔහිතසොතො සඋපනිසො හොති. සො සඋපනිසො සමානො අභිජානාති එකං ධම්මං, පරිජානාති එකං ධම්මං, පජහති එකං ධම්මං, සච්ඡිකරොති එකං ධම්මං. සො අභිජානන්තො එකං ධම්මං, පරිජානන්තො එකං ධම්මං, පජහන්තො එකං ධම්මං, සච්ඡිකරොන්තො එකං ධම්මං, සම්මාවිමුත්තිං ඵුසති.

එතදත්ථා භික්ඛවෙ කථා, එතදත්ථා මන්තනා, එතදත්ථා උපනිසා, එතදත්ථං සොතාවධානං යදිදං අනුපාදා චිත්තස්ස විමොක්ඛොති.

23. යෙ විරුද්ධා සල්ලපන්ති විනිවිට්ඨා සමුස්සිතා,
අනරියගුණමාසජ්ජ අඤ්ඤමඤ්ඤ[1] විවරෙසිනො.

24. දුබ්භාසිතං වික්ඛලිතං සම්පමොහං පරාජයං,
අඤ්ඤමඤ්ඤස්සාභිනන්දන්ති[2] තදරියො කථනාචරෙ.

25. සචෙ චස්ස කථාකාමො කාලමඤ්ඤාය පණ්ඩිතො,
ධම්මට්ඨපටිසංයුත්තා යා අරියාචරිතා[3] කථා.

26. තං කථං කථයෙ ධීරො අවිරුද්ධො අනුස්සිතො,
අනුපාදින්නෙන[4] මනසා අපලාසො අසාහසො.

27. අනුසූයායමානො[5] සො සම්මදඤ්ඤාය භාසති,
සුභාසිතං අනුමොදෙය්‍ය දුබ්භට්ඨෙනාවසාදයෙ.

28. උපාරම්භං න සික්ඛෙය්‍ය ඛලිතඤ්ච න ගාහයෙ,
නාභිහරෙ නාභිමද්දෙ න වාචං පයුතං භණෙ.

---

1. අඤ්ඤමඤ්ඤවිවරෙසිනො - මජසං. 2. අඤ්ඤමඤ්ඤස්සාභිනන්දන්ති - මජසං.
3. යා අරියඤ්චරිතා කථා - සීමු. යා අරියචරිතා කථා - මජසං. PTS
4. අනුන්නතෙන - මජසං. 5. අනුසුයායමානො - මජසං. අනුසුය්‍යමානො - PTS.

මහණෙනි, පුද්ගලයා "කථායෝග්‍ය වේ ද, කථායෝග්‍ය නො වේ ද"යි කථාසම්ප්‍රයෝගයෙන් දතයුතු ය.

මහණෙනි, ඉදින් මේ පුද්ගලයෙක් ප්‍රශ්න කරණ ලද්දුයේ ඔබිනොබින් කරුණු එළවා බාධා කෙරේ ද, කරුණු එළවා කථාව මැඩ පියා ද, අත් පැහැර මහා හාස්‍ය කෙරේ ද, සංඛලිතය ඇද ගණී ද, එසේ වත් ම, මහණෙනි, මේ පුද්ගලයා කථායෝග්‍ය නො වේ.

මහණෙනි, ඉදින් මේ පුද්ගලයෙක් ප්‍රශ්න කරණ ලද්දුයේ ඔබිනොබින් කරුණු එළවා බාධා නො කෙරේ ද, කරුණු එළවා කථා ව නො මැඩපියා ද, අත් පැහැර මහා හාස්‍ය නො කෙරේ ද, සංඛලිතය නො ගණී ද, එසේ වත් ම මහණෙනි, මේ පුද්ගලයා කථායොග්‍ය වේ.

මහණෙනි, පුද්ගල තෙමේ "උපනිඃශ්‍රය සහිත වේ ද, උපනිඃශ්‍රය රහිත වේ ද"යි කථාසම්ප්‍රයොගයෙන් දතයුතුය.

මහණෙනි, යොමු නො කළ කන් ඇතියෙ උපනිඃශ්‍රය නැතියෙ නම් වෙයි. යොමු කළ කන් ඇතියේ උපනිඃශ්‍රය ඇතියේ නම් වෙයි. හේ උපනිඃශ්‍රය ඇතියේ එක් කුසල් දහමක් වූ අරිමග දනී. එක් දහමක් වූ දුඃඛසත්‍යය තීරණය කොට දනී. එක් දහමක් වූ සර්‍වාකුශලය දුරු කෙරෙයි. එක් දහමක් වූ අර්හත්ඵලය ප්‍රත්‍යක්‍ෂ කෙරෙ යි. හේ එක් දහමක් වූ අරිමග දන්නේ, එක් දහමක් වූ දුඃඛසත්‍යය තීරණය කොට දන්නේ, එක් දහමක් වූ සර්‍වාකුශලය හරනේ, එක් දහමක් වූ අර්හත්ඵලය ප්‍රත්‍යක්‍ෂ කරණුයේ සම්‍යක් විමුක්ති සඞ්ඛ්‍යාත අර්හත්ඵල විමෝක්‍ෂය ඥානස්පර්ශයෙන් ස්පර්ශ කෙරෙයි.

මහණෙනි, යම් මේ චිත්තයාගේ අනුපාදවිමෝක්‍ෂයෙක් වේ ද, කථාව මෙ අර්ථ කොට ඇත. මන්ත්‍රණාව මේ අර්ථ කොට ඇත. උපනිසාව මේ අර්ථ කොට ඇත, කන් නතු කිරීම මෙ අර්ථ කොට ඇත.

23. යම් කෙනෙක් කොපයෙන් විරුද්ධ වූවාහු එහි බැසගත්තාහු මානයෙන් නගන ලද්දාහු උනුත් සිදුරු සොයන්නාහු ගුණ සවා අනාර්‍ය්‍ය-කථාව අල්ලාප සල්ලාප විසින් කෙරෙත් ද,

24. ඔහු උනුන්ගේ දුර්භාෂිතය මුඛදෝෂ ආදි අල්පස්ඛලිතය මුළාව පරාජය ගෙණ සතුටු වෙත්. ආර්‍ය්‍ය තෙමේ එබඳු කථාව නො කරන්නේ ය.

25-26. ඉදින් කථාවට කැමති වන්නේ වී නම් නිසි කල් දැන ධීර වූ අවිරුද්ධ වූ මානයෙන් නො හුවන ලද ඒ පණ්ඩිත තෙමේ අනුද්ධත සිතින් යුගග්‍රාහ රහිත ව ලාභෙළාකම් නැතිව ධර්මස්ථ වූත් ධර්මප්‍රතිසංයුක්ත වූත් යම් ආර්‍ය්‍යකථායෙක් ඇද්ද, ඒ කථාව කියන්නේ ය.

27. ඒ පණ්ඩිත තෙමේ ඊර්ෂ්‍යා රහිත සිතැත්තේ මොනොවට දැන බෙණේ. සුභාෂිතය අනුමෙවන්නේය. දුර්භාෂිතයෙහි ලා නො බස්නේ ය.

28. කරණොත්තරකරණ ලක්‍ෂණ උපාරම්භය ශික්‍ෂණ විසින් නො ගන්නේය. පමාදෙස නො ගන්නේ ය. (මෙරමා කථාව වළහා) කරුණු නො එළවන්නේ ය. (මෙරමා කථාව) නො මඩනේ ය. සත්‍යානෘත්‍යප්‍රති-සංයුක්ත තෙපුල නො බණන්නේය.

29. අඤ්ඤතත්ථං පසාදත්ථං සතං වෙ හොති මන්තනා,
එවං ඛො අරියා මන්තෙන්ති එසා අරියාන මන්තනා,
එතදඤ්ඤාය මෙධාවී න සමුස්සෙය්‍ය මන්තයෙති.

### 3. 2. 2. 8.

18. සචෙ භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: තයො, මෙ ආවුසො ධම්මා: කතමෙ තයො: රාගො දොසො මොහො. ඉමෙ ඛො ආවුසො තයො ධම්මා. ඉමෙසං ආවුසො තිණ්ණං ධම්මානං කො විසෙසො, කො අධිප්පායො, කිං නානාකරණන්ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං කින්ති බ්‍යාකරෙය්‍යාථාති?

භගවම්මූලකා නො භන්තෙ ධම්මා භගවන්නෙත්තිකා භගවම්පටිසරණා සාධු වත භන්තෙ භගවන්තඤ්ඤෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො: භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙන හි භික්ඛවෙ සුණාථ -පෙ- භගවා එතදවොච:

සචෙ භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං තයො, මෙ ආවුසො ධම්මා: කතමෙ තයො: රාගෝ දොසො මොහො. ඉමෙ ඛො ආවුසො තයො ධම්මා. ඉමෙසං ආවුසො තිණ්ණං ධම්මානං කො විසෙසො, කො අධිප්පායො, කින්නානාකරණන්ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං බ්‍යාකරෙය්‍යාථ: රාගො ඛො ආවුසො අප්පසාවජ්ජො දන්ධවිරාගී, දොසො මහාසාවජ්ජො ඛිප්පවිරාගී, මොහො මහා-සාවජ්ජො දන්ධවිරාගීති.

කො පනාවුසො හෙතු කො පච්චයො, යෙන අනුප්පන්නො වා රාගො උප්පජ්ජති, උප්පන්නො වා රාගො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති? සුභනිමිත්තන්තිස්ස වචනීයං.

තස්ස සුභනිමිත්තං අයොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව රාගො උප්පජ්ජති. උප්පන්නො ච රාගො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අයං ඛො ආවුසො හෙතු, අයං පච්චයො, යෙන අනුප්පන්නො වා රාගො උප්පජ්ජති, උප්පන්නො වා රාගො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

කො පනාවුසො හෙතු කො පච්චයො, යෙන අනුප්පන්නො වා දොසො උප්පජ්ජති, උප්පන්නො වා දොසො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති? පටිඝනිමිත්තන්තිස්ස වචනීයං.

තස්ස පටිඝනිමිත්තං අයොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව දොසො උප්පජ්ජති, උප්පන්නො ච දොසො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අයං ඛො ආවුසො හෙතු, අයං පච්චයො, යෙන අනුප්පන්නො වා දොසො උප්පජ්ජති, උප්පන්නො වා දොසො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

29. පණ්ඩිතයන්ගේ මන්ත්‍රණාව දැනුම් පිණිස ද ප්‍රසාදය පිණිස ද එකැතිත් වෙයි. ආයතීයෝ මෙසේ මන්ත්‍රණය කෙරෙති, මේ ආයතීයන්ගේ මන්ත්‍රණාව යි. ප්‍රශස්තබුද්ධි ඇති පණ්ඩිත තෙම මෙපවත් දූත මානයෙන් හුවා නො ගන්නේ ය. මානනිඃශ්‍රිත නො වී මන්ත්‍රණය කරන්නේ ය.

3. 2. 2. 8.

18. මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, මේ ධර්මයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: රාගය, ද්වෙෂය, මොහ යි ඇවැත්නි, මේ ධර්මයෝ තුන් දෙනයහ. ඇවැත්නි, මේ තුන් දහමුන්ගේ විශේෂය කවරේ ය, අභිප්‍රාය කවරේ ය, නානාස කවරේ යැ? යි මෙසේ විචාරන්නාහු නම් මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට කිමැ යි ප්‍රකාශ කරන්නාහු ද?

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නෙතෘ කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. වහන්ස, තෙල භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේ නම් මනා මැනු. භාග්‍යවතුන් වහන්සේගේ තෙපුල් අසා භික්ෂූහු ධරන්නාහ.

මහණෙනි, එසේ වී නම් අසව ... භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, මේ ධර්මයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: රාගය ද්වෙෂය මොහ යි. ඇවැත්නි, මේ ධර්මයෝ තුන් දෙනයහ. ඇවැත්නි, මේ ධර්මයන් තුන් දෙනාගේ විශෙෂය කවරේ යැ, අභිප්‍රාය කවරේ යැ, නානාස කවරේ යැ?"යි මෙසේ විචාරන්නාහු නම්, මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ ප්‍රකාශ කරව: ඇවැත්නි, රාගය අල්පසාවද්‍ය ය, ලැසිව පහවන සුලු ය. ද්වෙෂය මහාසාවද්‍ය ය, වහා පහවන සුලු ය. මොහය මහා-සාවද්‍ය ය, ලැසිව පහවන සුලුය යි.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ රාගය උපදනේ ද, උපන් හෝ රාගය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ වේ ද, එයට හේතු කවරේ යැ, ප්‍රත්‍යය කවරේ යැ? එයට හේතු සුභනිමිත්තය යි කිය යුතු ය.

සුභනිමිත්ත නුනුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද රාගය උපදනේ ය. උපන්නා වූ ද රාගය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ රාගය උපදනේ ද, උපන් හෝ රාගය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ද, මේ එයට හෙතු වේ. මේ එයට ප්‍රත්‍යය වෙයි.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ ද්වෙෂය උපදනේ ද, උපන් හෝ ද්වෙෂය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ද, එයට හේතු කවරේ යැ, එයට ප්‍රත්‍යය කවරේ යැ? එයට හේතු ප්‍රතිඝනිමිත්තය යි කිය යුතු ය.

ප්‍රතිඝනිමිත්ත නුනුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද ද්වේෂය උපදනේ ය. උපන්නා වූ ද ද්වේෂය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ ද්වෙෂය උපදනේ ද, උපන් හෝ ද්වේෂය භූයෝභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ද මේ එයට හේතු වෙයි. මේ එයට ප්‍රත්‍යය වෙයි

කො පනාවුසො හෙතු, කො පච්චයො, යෙන අනුප්පන්නො වා මොහො උප්පජ්ජති, උප්පන්නො වා මොහො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති? අයොනිසො මනසිකාරොතිස්ස වචනීයං.

තස්ස අයොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව මොහො උප්පජ්ජති, උප්පන්නො ච මොහො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අයං ඛො ආවුසො හෙතු අයං පච්චයො, යෙන අනුප්පන්නො වා මොහො උප්පජ්ජති, උප්පන්නො වා මොහො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

කො පනාවුසො හෙතු, කො පච්චයො, යෙන අනුප්පන්නො වා රාගො නුප්පජ්ජති, උප්පන්නො වා රාගො පහීය්‍යතීති? අසුභනිමිත්තන්තිස්ස වචනීයං.

තස්ස අසුභනිමිත්තං යොනිසො මනසිකරොතො අනුපන්නො චෙව රාගො නුප්පජ්ජති, උප්පන්නො ච රාගො පහීය්‍යති. අයං ඛො ආවුසො හෙතු අයං පච්චයො. යෙන අනුප්පන්නො වා[1] රාගො නුප්පජ්ජති, උප්පන්නො වා රාගො පහීය්‍යතීති.

කො පනාවුසො හෙතු, කො පච්චයො, යෙන අනුප්පන්නො වා දොසො නුප්පජ්ජති, උප්පන්නො වා දොසො පහීය්‍යතීති? මෙත්තා චෙතොවිමුත්තීතිස්ස වචනීයං.

තස්ස මෙත්තං චෙතොවිමුත්තිං යොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව දොසො නුප්පජ්ජති, උප්පන්නො ච[2] දොසො පහීය්‍යති. අයං ඛො ආවුසො හෙතු අයං පච්චයො. යෙන අනුප්පන්නො වා[1] දොසො නුප්පජ්ජති. උප්පන්නො වා[2] දොසො පහීය්‍යතීති.

කො පනාවුසො හෙතු, කො පච්චයො, යෙන අනුප්පන්නො වා මොහො නුප්පජ්ජති, උප්පන්නො වා[2] මොහො පහීය්‍යතීති. යොනිසො මනසිකාරො-තිස්ස වචනීයං.

තස්ස යොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව මොහො නුප්පජ්ජති, උප්පන්නො ච මොහො පහීය්‍යති. අයං ඛො ආවුසො හෙතු, අයං පච්චයො. යෙන අනුප්පන්නො වා මොහො නුප්පජ්ජති, උප්පන්නො වා මොහො පහීය්‍යතීති.

### 3. 2. 2. 9.

19. තීණිමානි භික්ඛවෙ අකුසලමූලානි. කතමානි තීණි: ලොභො අකුසලමූලං දොසො අකුසලමූලං මොහො අකුසලමූලං.

යදපි භික්ඛවෙ ලොභො, තදපි අකුසලං[3]. යදපි ලුද්ධො අභිසඞ්ඛරොති. කායෙන වාචා[4] මනසා. තදපි අකුසලං. යදපි ලුද්ධො ලොභෙන අභිභූතො පරියාදින්නචිත්තො පරස්ස අසතා දුක්ඛං උපදහති[5], වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා. "බලවම්හි බලත්ථො ඉතිපි"[6] තදපි අකුසලං. ඉතිස්සමෙ ලොභජා ලොභනිදානා ලොභසමුදයා ලොභපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති.

1. අනුප්පන්නො චෙව - මජසං. 2 උප්පන්නො ච - මජසං. 3. අකුසලමූලං - මජසං. 4 වාචාය - මජසං. සී 1. 5. උප්පාදයති - මජසං. 6. බලත්ථො ඉති - සී 1. සීමු.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ මෝහය උපදනේ ද, උපන් හෝ මෝහය භූයෝභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ද, එයට හේතු කවරේ යෑ, එයට ප්‍රත්‍යය කවරේ යෑ? එයට හේතු නුනුවණින් මෙනෙහි කිරීමය යි කිය යුතු ය.

නුනුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද මොහය උපදනේ ය. උපන්නා වූ ද මෝහය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ මොහය උපදනේ ද, උපන් හෝ මොහය භූයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස පවත්නේ වේ ද, මේ එයට හෙතු වෙයි. මේ එයට ප්‍රත්‍යය වෙයි.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ රාගය නූපදනේ ද, උපන් හෝ රාගය පහව යන්නේ ද, එයට හෙතු කවරේ යෑ, එයට ප්‍රත්‍යය කවරේ යෑ? එයට හෙතු අශුභනිමිත්තය යි කිය යුතු වෙයි.

අශුභනිමිත්ත නුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද රාගය නූපදනේ ය. උපන්නා වූ ද රාගය පහව යන්නේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ රාගය නූපදනේ ද, උපන් හෝ රාගය පහව යන්නේ වේ ද, මේ එයට හෙතු වේ. මේ එයට ප්‍රත්‍යය වේ.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් ද්වෙෂය නූපදනේ ද, උපන් හෝ ද්වෙෂය පහව යන්නේ වේ ද, එයට හෙතු කවරේ යෑ, එයට ප්‍රත්‍යය කවරේ යෑ? එයට හෙතු මෛත්‍රාචෙතොවිමුක්තිය යි කිය යුතු වෙයි.

මෛත්‍රීචෙතොවිමුක්තිය නුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද ද්වේෂය නූපදනේ ය. උපන්නා වූ ද ද්වේෂය පහව යන්නේ ය. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන්නා වූ ද ද්වේෂය නූපදනේ වේ ද, උපන්නා වූ හෝ ද්වේෂය පහව යන්නේ වේ ද, මේ එයට හෙතු වේ. මේ එයට ප්‍රත්‍යය වේ.

ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ මෝහය නූපදනේ ද, උපන් හෝ මෝහය පහව යන්නේ වේ ද, එයට හේතු කවරේ යෑ? එයට ප්‍රත්‍යය කවරේ යෑ? එයට හෙතු නුවණින් මෙනෙහි කිරීමය යි කිය යුතු වෙයි.

නුවණින් මෙනෙහි කරණ ඔහට නූපන්නා වූ ද මොහය නූපදනේ වෙයි. උපන්නා වූ ද මෝහය පහව යන්නේ වෙයි. ඇවැත්නි, යම් හෙයෙකින් නූපන් හෝ මෝහය නූපදනේ ද, උපන් හෝ මෝහය පහව යන්නේ වේ ද, මේ එයට හේතු වෙයි. මේ එයට ප්‍රත්‍යය වෙයි.

### 3. 2. 2. 9

19. මහණෙනි, මේ අකුශලමූලයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: ලෝභය අකුශලමූලයෙකි. ද්වේෂය අකුශලමූලයෙකි. මෝහය අකුශල-මූලයෙකි.

මහණෙනි, යම් ලෝභයෙක් වේ ද, හෙ ද අකුශලය. ලුබ්ධ වූයේ කයින් වේවයි වචසින් වේවයි මනසින් වේවයි යමක් පිළියෙළ කරන්නේ නම් එ ද අකුශලය. ලුබ්ධ වූයේ ලෝභයෙන් මඩනා ලද්දේ ලෝභයෙන් ගත් සිතැත්තේ "බලවත් වෙමි. බලයෙන් අර්ථ ඇතියෙමි" යි හෝ මෙරමාහට වධයෙන් වේවයි බන්ධනයෙන් වේවයි, සර්වස්වහරණයෙන් වේවයි, ගර්හායෙන් වේවයි, ගමින් හෝ රටින් නෑගීමෙන් වේවයි, අවිද්‍යමානදොෂයෙකින් දුක් උපදවා ද, එ ද අකුශලය. මෙසේ ලෝභයෙන් හටගත් ලෝභය නිදාන කොට ඇති ලෝභය සමුදය කොට ඇති ලෝභය ප්‍රත්‍යය කොට ඇති අනේකපාපක අකුශලධර්මයෝ ඔහට පහළ වෙත්.

යදපි භික්ඛවෙ දොසො, තදපි අකුසලං[1]. යදපි දුට්ඨො අභිසඞ්ඛරොති කායෙන වාචා[2] මනසා. තදපි අකුසලං. යදපි දුට්ඨො දොසෙන අභිභූතො පරියාදින්නචිත්තො පරස්ස අසතා දුක්ඛං උපදහති[3], වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා. "බලවම්හි බලත්ථො ඉතිපි". තදපි අකුසලං. ඉතිස්ස, මෙ දොසජා දොසනිදානා දොසසමුදයා දොසපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති.

යදපි භික්ඛවෙ මොහො, තදපි අකුසලං. යදපි මූළ්හො අභිසඞ්ඛරොති කායෙන වාචා මනසා. තදපි අකුසලං. යදපි මූළ්හො මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො පරස්ස අසතා දුක්ඛං උපදහති, වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා "බලවම්හි බලත්ථො ඉතිපි". තදපි අකුසලං. ඉතිස්සමෙ මොහජා මොහනිදානා මොහසමුදයා මොහපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. එවරූපො චායං භික්ඛවෙ පුග්ගලො වුච්චති: අකාලවාදීතිපි අභූතවාදීතිපි අනත්ථවාදීතිපි අධම්මවාදීතිපි අවිනයවාදීතිපීති.

කස්මා චායං භික්ඛවෙ එවරූපො පුග්ගලො වුච්චති: අකාලවාදීතිපි අභූත-වාදීතිපි අනත්ථවාදීතිපි අධම්මවාදීතිපි අවිනයවාදීතිපීති? තථා හයං භික්ඛවෙ පුග්ගලො පරස්ස අසතා දුක්ඛං උපදහති[3], වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා "බලවම්හි බලත්ථො ඉතිපි" භූතෙන ඛො පන වුච්චමානො අවජානාති නො පටිජානාති, අභූතෙන වුච්චමානො න ආතප්පං කරොති, තස්ස නිබ්බෙඨනාය: ඉතිපෙතං අතච්ඡං ඉතිපෙතං අභූතන්ති. තස්මා එවරූපො පුග්ගලො වුච්චති අකාලවාදීතිපි අභූතවාදීතිපි අනත්ථවාදීතිපි අධම්මවාදීතිපි අවිනයවාදීතිපි.

එවරූපො භික්ඛවෙ පුග්ගලො ලොභජෙහි පාපකෙහි අකුසලෙහි ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දිට්ඨෙ චෙව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සවුපායාසං සපරිළාහං, කායස්ස ච භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා.

දොසජෙහි -පෙ- මොහජෙහි පාපකෙහි අකුසලෙහි ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දිට්ඨෙ චෙව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සවුපායාසං සපරිළාහං. කායස්ස ච භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා.

---

1. අකුසලමූලං - ජසං  2. වාචාය - සී 1.  3. උපපාදයති - මජසං.

මහණෙනි, යම් ද්වේෂයෙක් වේ ද, එ ද අකුශලයෙකි. “ද්වේෂට වූයේ කායින් හෝ වචනයෙන් හෝ මනසින් හෝ යමක් සකස් කරන්නේ වේ ද, එ ද අකුශලය. ද්වේෂට වූයේ ද්වේෂයෙන් මඩනා ලද්දේ ද්වේෂයෙන් ගත් සිත් ඇත්තේ “බලවත් වෙමි, බලයෙන් අර්ථ ඇතියෙමි” යි හෝ මෙරමාහට වධයෙන් හෝ, බන්ධනයෙන් හෝ, ධනහානියෙන් හෝ, ගැරහීමෙන් හෝ ගමින් හෝ රටින් නෙරපීමෙන් හෝ, යම් දුකක් උපදවා ද, එ ද අකුශලය. මෙසේ ද්වේෂයෙන් හැටි ද්වේෂය නිදාන කොට ඇති ද්වේෂය සමුදය කොට ඇති ද්වේෂය ප්‍රත්‍යය කොට ඇති මේ අනේකපාපකඅකුශල ධර්මයෝ ඔහට පහළ වෙත්.

මහණෙනි, යම් මෝහයෙක් වේ ද, එ ද අකුශලය. මූඪ වූයේ කායින් හෝ, වචනයෙන් හෝ, මනසින් හෝ, යමක් රැස් කරන්නේ වේ ද, එ ද අකුශල ය. මූඪ වූයේ මෝහයෙන් මඩනා ලද්දේ එයින් ම ඇදගත් සිතැත්තේ “බලවත් වෙමි. බලයෙහි සිටියෙමි” යි මෙරමාහට වධයෙන් හෝ, බන්ධනයෙන් හෝ, ධනය පැහැර ගැනීමෙන් හෝ, ගැරහීමෙන් හෝ, ගමින් හෝ රටින් නෑහීමෙන් හෝ අවිද්‍යමාන දෝෂයෙකින් යම් දුකක් උපදවා ද, එ ද අකුශලය. මෙසේ මෝහයෙන් හැටි මෝහය නිදාන කොට ඇති මෝහය සමුදය කොට ඇති මෝහය ප්‍රත්‍යය කොට ඇති මේ අනේකපාපකඅකුශලධර්මයෝ ඔහට පහළ වෙත්. මහණෙනි, මෙ වැනි වූ මේ පුද්ගල ද අකාලවාදීය යි ද, අභූතවාදීය යි ද, අනර්ථවාදීය යි ද, අධර්මවාදීය යි ද, අවිනයවාදීය යි ද කියනු ලැබේ.

මහණෙනි, කවර හෙයෙකින් මෙබඳු වූ මේ පුද්ගල අකාලවාදීය යි ද, අභූතවාදීය යි ද, අනර්ථවාදීය යි ද, අධර්මවාදීය යි ද, අවිනයවාදීය යි ද කියනු ලබන්නේ වේ ද? මහණෙනි, යම්සේ මේ පුද්ගල “බලවත් වෙමි; බලයෙන් අර්ථ ඇත්තෙමි”යි හෝ මෙරමාහට වධයෙන් හෝ, බන්ධනයෙන් හෝ, ධනහානියෙන් හෝ, ගර්හායෙන් හෝ, ගමින් හෝ රටින් නෑහීමෙන් හෝ අවිද්‍යමාන දෝෂයෙකින් දුක් උපදවා ද එහෙයිනි. සත්‍යවූ දෑයින් කියනු ලබන්නේ අවඥා කෙරෙයි. ප්‍රතිඥා නො කෙරෙයි. අභූතයෙන් අභ්‍යාඛ්‍යාන කරණු ලබන්නේ මෙසේත් මෙය තථ්‍ය නො වෙයි, මෙසේත් මෙය භූත නො වෙයි කියා ඒ අභූතය අවුල් හරණු පිණිස උත්සාහ නො කරයි. එහෙයින් මෙබඳු පුද්ගල අකාලවාදීය යි ද, අභූතවාදීය යි ද, අනර්ථවාදීය යි ද, අධර්මවාදීය යි ද, අවිනයවාදීයයි ද කියනු ලැබේ.

මහණෙනි, මෙබඳු පුද්ගල ලෝභයෙන් හටගත් පාපකඅකුශලධර්මයෙන් මඩනා ලදුයේ එයින් ම වැළඳගත් සිතැත්තේ ඉහාත්මයෙහි ම වෙහෙස සහිත උපායාස සහිත පරිදාහ සහිත දුකින් වෙසෙයි. කාබුන් මරණින් මතුයෙහි දුගතිය කැමැති විය යුතු ය.

ද්වේෂයෙන් හැටි ... මෝහයෙන් හැටි පාපකඅකුශලධර්මයෙන් මඩනා ලදුයේ එයින් පැහැර ගත් සිතැත්තේ ඉහාත්මයෙහි ම වෙහෙස ඇති උපායාස ඇති පරිදාහ ඇති දුකින් වෙසෙයි. කාබුන් මරණින් මතුයෙහි දුගතිය කැමැති විය යුතු ය.

සෙය්‍යථාපි භික්ඛවෙ සාලො වා ධවො වා ඵන්දනො වා තීහි මාලුවාලතාහි උද්ධස්තා පරියොනද්ධො අනයං ආපජ්ජති, ව්‍යසනං ආපජ්ජති, අනයව්‍යසනං ආපජ්ජති; එවමෙව ඛො භික්ඛවෙ එවරූපො පුග්ගලො ලොභජෙහි පාපකෙහි අකුසලෙහි ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දිට්ඨෙ චෙව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සවුපායාසං සපරිළාහං. කායස්ස ච භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා. දොසජෙහි -පෙ- මොහජෙහි පාපකෙහි අකුසලෙහි ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දිට්ඨෙ චෙව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සවුපායාසං සපරිළාහං. කායස්ස ච භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා ඉමානි ඛො භික්ඛවෙ තීණි අකුසලමූලානීති.

තීණිමානි භික්ඛවෙ කුසලමූලානි. කතමානි තීණි: අලොභො කුසලමූලං. අදොසො කුසලමූලං. අමොහො කුසලමූලං.

යදපි භික්ඛවෙ අලොභො, තදපි කුසලං. යදපි අලුද්ධො අභිසංඛරොති කායෙන වාචා[2] මනසා, තදපි කුසලං. යදපි අලුද්ධො ලොභෙන අනභිභූතො අපරියාදින්නචිත්තො න පරස්ස අසතා දුක්ඛං උපදහති[3], වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා "බලවම්හි බලත්ථො" ඉතිපි, තදපි කුසලං. ඉතිස්සමෙ අලොභජා අලොභනිදානා අලොභසමුදයා අලොභපච්චයා අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති.

යදපි භික්ඛවෙ අදොසො, තදපි කුසලං. යදපි අදුට්ඨො අභිසංඛරොති කායෙන වාචා[2] මනසා, තදපි කුසලං. යදපි අදුට්ඨො දොසෙන අනභිභූතො අපරියාදින්නචිත්තො න පරස්ස අසතා දුක්ඛං උපදහති[3], වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා බලවම්හි බලත්ථො ඉතිපි. තදපි කුසලං. ඉතිස්සමෙ අදොසජා අදොසනිදානා අදොසසමුදයා අදොසපච්චයා අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති.

යදපි භික්ඛවෙ අමොහො, තදපි කුසලං. යදපි අමූළ්හො අභිසංඛරොති කායෙන වාචා[2] මනසා, තදපි කුසලං. යදපි අමූළ්හො මොහෙන අනභිභූතො අපරියාදින්නචිත්තො න පරස්ස අසතා දුක්ඛං උපදහති[3] වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා "බලවම්හි බලත්ථො" ඉතිපි තදපි කුසලං. ඉතිස්සමෙ අමොහජා අමොහනිදානා අමොහසමුදයා අමොහපච්චයා අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති. එවරූපො චායං භික්ඛවෙ පුග්ගලො වුච්චති, කාලවාදීතිපි භූතවාදීතිපි අත්ථවාදීතිපි ධම්මවාදීතිපි විනයවාදීතිපි.

---

1. කුසලමූලං - මජ්ඣං. 2. වාචාය - සී 1. - මජ්ඣං 3. උපපාදයති - මජ්ඣං
4. අනභාවංකතා - මජ්ඣං.

මහණෙනි, යම් පරිදි සල්ගසෙක් වේවයි දවගසෙක් වේවයි බුදුරු ගසෙක් වේවයි තුන් මාලුවා ලියන් විසින් මතුයෙහි වසාගන්නා ලද්දේ හාත්පස වෙලදනා ලද්දේ නො වැඩීමට පැමිණේ ද, විනාසට පැමිණේ ද, අනයව්‍යසනයට පැමිණේ ද, මහණෙනි, එපරිදි ම මෙබඳු පුද්ගල ලොභයෙන් හැටි පාපකඅකුශලධර්මයෙන් මඩනා ලද්දේ එයින් ම ඇදගත් සිතැත්තේ ඉහාත්මයෙහි ම වෙහෙස ඇති උපායාස ඇති පරිදාහ ඇති දුකින් වසනේ ය. කාබුන් මරණින් මතුයෙහි දුගතිය කැමැති විය යුතු ය. ද්වෙෂයෙන් හටගත්... මොහයෙන් හටගත් පාපකඅකුශලධර්මයෙන් මඩනා ලද්දේ ඇදගත් සිතැත්තේ ඉහාත්මයෙහි ම විඝාත සහිත උපායාස සහිත පරිලාහ සහිත දුකින් වෙසෙයි. කාබුන් මරණින් මතුයෙහි දුගතිය කැමැති විය යුතු. මහණෙනි, මේ අකුශලමූලයෝ තුන් දෙනයහ.

මහණෙනි, මේ කුශලමූලයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: අලොභය කුශලමූලය, අද්වෙෂය කුශලමූලය, අමොහය කුශලමූලයි.

මහණෙනි, යමෙක් අලොභ වේ ද, එ ද කුශල යි. අලුබ්ධ වූයේ කයින් වේවයි වචනයෙන් වේවයි මනසින් වේවයි යමක් ම කෙරේ ද, එ ද කුශල යි. අලුබ්ධ වූයේ ලොභයෙන් නො මඩනා ලද්දේ එයින් ඇද නොගත් සිතැත්තේ "බලවත්මි, බලයෙහි සිටියෙමි" යි මෙරමාහට වධයෙන් වේවයි බන්ධනයෙන් වේවයි ධනහානියෙන් වේවයි ගර්හායෙන් වේවයි රටින් නෙරීමෙන් වේවයි අවිද්‍යමාන දෙෂයෙකින් පරහට දුක් නො දනවා ද එ ද කුශල යි. මෙසේ අලෝභයෙන් හැටි අලෝභය නිදාන කොට ඇති අලෝභය සමුදය කොට ඇති අලෝභය ප්‍රත්‍යය කොට ඇති මේ අනෙක කුශල ධර්මයෝ පහළ වෙත්.

මහණෙනි, යමෙක් ම අද්වෙෂ වේ ද, එ ද කුශලයි අදුෂ්ට වූයේ කයින් වේවයි, වචනයෙන් වේවයි, සිතින් වේවයි යමක් ම කෙරේ ද, එ ද කුශලයි. අදුෂ්ට වූයේ ද්වෙෂයෙන් නොමඩනා ලද්දේ එයින් පැහැර නොගත් සිතැත්තේ "බලවත්මි. බලයෙන් අර්ථ ඇතියෙමි" යි වධයෙන් වේවයි, බන්ධනයෙන් වේවයි, සර්වස්වහරණයෙන් වේවයි, ගැරහීමෙන් වේවයි, රටින් නෙරීමෙන් වේවයි අවිද්‍යමාන දෙෂයෙකින් යම් දුකක් පරහට නොදනවා ද

එ ද කුශලයි. මෙසේ අද්වෙෂයෙන් හටගත් අද්වෙෂය නිදාන කොට ඇති, අද්වෙෂය සමුදය කොට ඇති, අද්වෙෂය ප්‍රත්‍යය කොට ඇති මේ අනෙක කුශල ධර්මයෝ ඔහට පහළ වෙත්.

මහණෙනි, යමෙක් ම අමොහ වේ ද, එ ද කුශල යි. අමූඪ වූයේ කයින් වේවයි, වචනයෙන් වේවයි, මනසින් වේවයි, යමක් කෙරේ ද එ ද කුශල ය. අමූඪ වූයේ මොහයෙන් නොමඩනා ලද්දේ එයින් හාත්පස ඇද නොගත් සිතැත්තේ "බලවත්මි. බලයෙන් අර්ථ ඇතියෙමි" යි වධයෙන් වේවයි, බන්ධනයෙන් වේවයි, වස්තුව පැහැර ගැණීමෙන් වේවයි, ගර්හායෙන් වේවයි, රටින් නෙරණායෙන් වේවයි අවිද්‍යමාන දෙෂයෙකින් මෙරමාහට යම් දුකක් නො දනවා ද එ ද කුශලය. මෙසේ අමොහයෙන් හටගත් අමොහය නිදාන කොට ඇති, අමොහය සමුදය කොට ඇති, අමොහය ප්‍රත්‍යය කොට ඇති මේ අනෙක කුශලධර්මයෝ ඔහට පහළ වෙත්. මහණෙනි, මෙබඳු වූ ද මේ පුද්ගල කාලවාදීය යි ද, භූතවාදීය යි ද, අර්ථවාදීය යි ද, ධර්මවාදීය යි ද, විනයවාදීය යි ද කියනු ලැබේ.

තස්මා චායං භික්ඛවෙ එවරූපො පුග්ගලො වුච්චති, කාලවාදීතිපි -පෙ- විනයවාදීතිපි. තථාහයං භික්ඛවෙ පුග්ගලො න පරස්ස අසතා දුක්ඛං උපදහති[1], වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා “බලවම්හි බලත්ථො” ඉතිපි. භූතෙන ඛො පන වුච්චමානො පටිජානාති නො අවජානාති. අභූතෙන වුච්චමානො ආතප්පං කරොති තස්ස නිබ්බෙඨනාය: ඉතිපෙතං අතච්ඡං ඉතිපෙතං අභූතන්ති. තස්මා එවරූපො පුග්ගලො වුච්චති කාලවාදීතිපි -පෙ- විනයවාදීතිපීති.

එවරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස ලොභජා පාපකා අකුසලා ධම්මා පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[2] ආයතිං අනුප්පාදධම්මා. දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති, අවිඝාතං අනුපායාසං අපරිළාහං. දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායති.

දොසජා -පෙ- මොහජා පාපකා අකුසලා ධම්මා පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති. අවිඝාතං අනුපායාසං අපරිළාහං දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායති.

සෙය්‍යථාපි භික්ඛවෙ සාලො වා ධවො වා ඵන්දනො වා, තීහි මාලුවාලතාහි උද්ධස්තො පරියොනද්ධො. අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං[3] ආදාය. සො තං මාලුවාලතං මූලෙ ඡින්දෙය්‍ය. මූලෙ ඡෙත්වා පලිඛණෙය්‍ය. පලිඛණිත්වා මූලානි උද්ධරෙය්‍ය අන්තමසො උසීරනාලමත්තානිපි.[4] සො තං මාලුවාලතං ඛණ්ඩාඛණ්ඩිකං ඡින්දෙය්‍ය, ඛණ්ඩාඛණ්ඩිකං ඡෙත්වා ඵාලෙය්‍ය, ඵාලෙත්වා සකලිකං සකලිකං කරෙය්‍ය, සකලිකං සකලිකං කරිත්වා වාතාතපෙ විසොසෙය්‍ය, වාතාතපෙ විසොසෙත්වා අග්ගිනා දහෙය්‍ය,[5] අග්ගිනා දහිත්වා මසිං කරෙය්‍ය, මසිං කරිත්වා මහාවාතෙ වා ඔපුනෙය්‍ය,[6] නදියා වා සීඝසොතාය පවාහෙය්‍ය. එවමස්සු තා[7] භික්ඛවෙ මාලුවාලතා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා.

එවමෙව ඛො භික්ඛවෙ එවරූපස්ස පුග්ගලස්ස ලොභජා අකුසලා ධම්මා පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං, දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායති. දොසජා -පෙ- මොහජා පාපකා අකුසලා ධම්මා පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං, දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායති. ඉමානි ඛො භික්ඛවෙ තීණි කුසලමූලානීති.

1 උපපාදයති - මජසං. 2 අනභාවංකතා - මජසං 3. කුදලපිටකං - මජසං.
4 උසීරනාලිමත්තානිපි - මජසං. 5. ඩහෙය්‍ය - මජසං. 6. ඔපුණෙය්‍ය - මජසං,
7. එවමංසං - මජසං.

මහණෙනි, මෙබඳු මේ පුද්ගල ද කාලවාදීය යි ද, ... විනයවාදීය යි ද කවර හෙයෙකින් කියනු ලැබේ ද? මහණෙනි, මේ පුද්ගල යම්සේ "බලවත්මි. බලයෙන් අර්ථි ඇතියෙමි"යි වධයෙන් වේවයි බන්ධනයෙන් වේවයි ධනහානියෙන් වේවයි රටින් නෑගීමෙන් වේවයි අවිද්‍යමාන දෝෂයෙකින් පරහට දුක් නොදනවා ද, එහෙයිනි විද්‍යමාන වූ ගුණයෙන් කියනු ලබන්නේ පිළිණ කරන්නේ ය. ආඥ නො කරන්නේ ය. අවිද්‍යමාන දෝෂයෙන් කියනු ලබන්නේ "මෙසේ මෙය අතථ්‍යය, මෙසේත් මෙය අභූතය" යි ඒ දෝෂය නිරාකූල කරණු පිණිස වීයම් කරන්නේ ය. මහණෙනි, එහෙයින් මෙබඳු පුද්ගල කාලවාදීය යි ද ... විනයවාදීය යි ද කියනු ලැබේ.

මහණෙනි, මෙබඳු පුද්ගලයාහට ලෝභයෙන් හටගත් පාපක අකුශල ධර්මයෝ ප්‍රහත වෙත්. මුලුසුන් වෙත්. මුදුන් සුන් තලක් සෙයින් අවස්තුක බව කරණ ලද්දාහු වෙත්. අනභාවය කරණ ලද්දාහු වෙත්. මතුයෙහි අනුත්පාද ස්වභාව ඇත්තාහු වෙත්. ඉහාත්මයෙහි ම විඝාත රහිත උපායාස රහිත පරිදාහ රහිත සුඛයෙන් වසන්නේ ය. ඉහාත්මයෙහි ම පිරිනිවන් පාන්නේ ය.

ද්වේෂයෙන් හටගත් ... මෝහයෙන් හටගත් පාපකඅකුශලධර්මයෝ ප්‍රහත වෙත්. මුලුසුන් වෙත්. මුදුන් සුන් තලක් සෙයින් අවස්තුක බව කරණ ලද්දාහු වෙත්. අනභාවය කරණ ලද්දාහු වෙත්. මතුයෙහි අනුත්පාදස්වභාව ඇත්තාහු වෙත්. ඉහාත්මයෙහි ම විඝාත නැති, උපායාස නැති, පරිදාහ නැති සුවයෙන් වෙසෙයි ඉහාත්මයෙහි ම පිරිනිවන් පාන්නේ ය.

මහණෙනි, යම් පරිදි සල්ගසෙක් වේවයි, දෑවගසෙක් වේවයි, කොළොම්-ගසෙක් වේවයි මාලුවාවැල් තුනෙකින් මතුයෙහි වසා ගන්නා ලද්දේ වෙළදනා ලද්දේ වේ ද, ඉක්බිති පුරුෂයෙක් හුදැල්ලක් හා පැසක් හා ගෙණ එන්නේ වේ ද, හේ ඒ මාලුවාවැල මුලෙහි සිඳුනේ වේ ද මුලෙහි සිඳ සාරන්නේ වේ ද සාරා මුල් උදුරන්නේ වේ ද, යටත්පිරිසෙයින් සුවඳහොව තල සා මුලුදු උදුරන්නේ වේ ද, හේ ඒ මාලුවා වැල කඩ කඩ කොට සිඳුනේ වේ ද, කඩ කඩ කොට සිඳ පළන්නේ වේ ද, පළා කැබැලි-කැබැලි කරන්නේ වේ ද, කැබැලි-කැබැලි කොට අව්සුලෙහි වියළන්නේ වේ ද, අව්සුලෙහි වියළා ගින්නෙන් දවන්නේ වේ ද, ගින්නෙන් දවා දළු කරන්නේ වේ ද, දළු කොට මහා වාතයෙහි හෝ පොළන්නේ වේ ද, ශීඝ්‍රස්‍රෝතස් ඇති නදියෙහි හෝ උල්පවා හරණේ වේ ද, මහණෙනි, මෙසේ ඒ මාලුවා වැල්හු මුලුසුන් වූවාහු වෙත්. තාලාවස්තුකතාවට ගියාහු වෙත්. අනභාව කරණ ලද්දාහු වෙත්. මතුයෙහි අනුත්පාදස්වභාව ඇත්තාහු වෙත්.

මහණෙනි, එපරිදි ම මෙබඳු පුද්ගලයාහට ලෝභයෙන් හටගත් පාපක අකුශලධර්මයෝ ප්‍රහත වෙත්. මුලුසුන් වෙත්. තාලාවස්තුකභාවයට ගියාහු වෙත්. අභාවය කරණ ලද්දාහු වෙත්. මතුයෙහි අනුත්පාදස්වභාව ඇත්තාහු වෙත්. ඉහාත්මයෙහි ම විඝාත නැති උපායාස නැති පරිදාහ නැති සුඛයෙන් වසන්නේ ය. ඉහාත්මයෙහි ම පිරිනිවන් පාන්නේ ය. ද්වේෂයෙන් හටගත් ... මෝහයෙන් හටගත් පාපක අකුශලධර්මයෝ ප්‍රහත වෙත්. මුලුසුන් වෙත්. තාලාවස්තුක බවට ගියාහු වෙත්. අභාවය කරණ ලද්දාහු වෙත්. මතුයෙහි අනුත්පාදස්වභාව ඇත්තාහු වෙත්. ඉහාත්මයෙහි ම විඝාත නැති උපායාස නැති පරිදාහ නැති සුඛයෙන් වෙසේ. ඉහාත්මයෙහි ම පිරිනිවන් පාන්නේය. මහණෙනි, මේ තුන් කුශලමූලයෝ යි.

## 3. 2. 2 10.

20. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති, **පුබ්බාරාමෙ** මිගාරමාතුපාසාදෙ. අථ ඛො **විසාඛා** මිගාරමාතා තදහුපොසථෙ යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො විසාඛං මිගාරමාතරං භගවා එතදවොච:

හන්ද කුතො නු ත්වං විසාඛෙ ආගච්ඡසි දිවා දිවස්සාති?

උපොසථාහං භන්තෙ අජ්ජ උපවසාමීති.

තයො ඛො මෙ විසාඛෙ උපොසථා, කතමෙ තයො? ගොපාලකූපොසථො නිගණ්ඨුපොසථො අරියූපොසථො.

කථඤ්ච විසාඛෙ ගොපාලකූපොසථො හොති: සෙය්‍යථාපි විසාඛෙ ගොපාලකො සායන්හසමයං[1] සාමිකානං ගාවො නිය්‍යාතෙත්වා ඉති පටිසං- චික්ඛති: අජ්ජ ඛො ගාවො අමුකස්මිඤ්ච අමුකස්මිඤ්ච පදෙසෙ චරිංසු, අමුකස්මිඤ්ච අමුකස්මිඤ්ච පදෙසෙ පානීයානි අපංසු, ස්වෙදානි ගාවො අමුකස්මිඤ්ච අමුකස්මිඤ්ච පදෙසෙ චරිස්සන්ති, අමුකස්මිඤ්ච අමුකස්මිඤ්ච පදෙසෙ පානීයානි පිවිස්සන්තීති. එවමෙව ඛො විසාඛෙ ඉධෙකච්චො උපොසථිකො ඉති පටිසංචික්ඛති: අහං ඛ්වජ්ජ ඉදඤ්චිදඤ්ච ඛාදනීයං ඛාදිං. ඉදඤ්චිදඤ්ච භොජනීයං භුඤ්ජිං. ස්වෙදානාහං ඉදඤ්චිදඤ්ච ඛාදනීයං ඛාදිස්සාමි, ඉදඤ්චිදඤ්ච භොජනීයං භුඤ්ජිස්සාමීති. සො තෙන ලොභෙන අභිජ්ඣාසහගතෙන චෙතසා දිවසං අතිනාමෙති. එවං ඛො විසාඛෙ ගොපාලකූපොසථො හොති. එවං උපවුත්ථො ඛො විසාඛෙ ගොපාලකූපොසථො න මහප්ඵලො හොති න මහානිසංසො න මහාජුතිකො න මහාවිප්ඵාරො.

කථඤ්ච විසාඛෙ **නිගණ්ඨුපොසථො** හොති: අත්ථි විසාඛෙ නිගණ්ඨා නාම සමණජාතිකා. තෙ සාවකං එවං සමාදපෙන්ති: එහි ත්වං අම්භො පුරිස, යෙ පුරත්ථිමාය දිසාය පාණා පරං යොජනසතං, තෙසු දණ්ඩං නික්ඛිපාහි, යෙ පච්ඡිමාය දිසාය පාණා පරං යොජනසතං, තෙසු දණ්ඩං නික්ඛිපාහි: යෙ උත්තරාය දිසාය පාණා පරං යොජනසතං, තෙසු දණ්ඩං නික්ඛිපාහි, යෙ දක්ඛිණාය දිසාය පාණා පරං යොජනසතං, තෙසු දණ්ඩං නික්ඛිපාහීති. ඉති එකච්චානං පාණානං අනුද්දයාය අනුකම්පාය සමාදපෙන්ති, එකච්චානං පාණානං නානුද්දයාය නානුකම්පාය සමාදපෙන්ති. තෙ තදහුපොසථෙ සාවකං එවං සමාදපෙන්ති: එහි ත්වං අම්භො පුරිස සබ්බචෙලානි නික්ඛිපිත්වා එවං වදෙහි: නාහං ක්වචන[2] කස්සචි කිඤ්චනතස්මිං[3]. න ච මම ක්වචන කත්ථචි කිඤ්චන[4] නත්ථීති.

---

1. සායණ්හසමයෙ - මජසං
2. ක්වචානි - මජසං - කාවචිනී - අට්ඨකථා.
3. කිඤ්චනං තස්මිං – සීමු. සී 1 PTS.
4. කිඤ්චනතා නත්ථීති - සීමු. සී. 1 කිඤ්චනං නත්ථීති - PTS.

### 3. 2. 2. 10

20. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පූර්වාරාම නම් වූ මිගාරමාතු ප්‍රාසාදයෙහි වැඩ වසන සේක. එකල මිගාරමාතෘ වූ විශාඛා තොමෝ පොහෝ ලත් එදින භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹුනු. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුනු. එකත්පසෙක හුන් මිගාරමාතු විශාඛාවනට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක.

විශාඛාවෙනි, මේ දෙවෙන්දවහල්හි තෙපි කොහි සිට එවූ දැ?

වහන්ස, මම අද පෙහෙවස් ඇතියෙම් උපවාස කරමි යි.

විශාඛාවෙනි, මේ පෙහෙවස්හු තුන් දෙනෙක. කවර තුන් දෙනෙක යත්:

ගොපාලකූපොසථය, නිගණ්ඨූපොසථය, අරියූපොසථ යි.

විශාඛාවෙනි, ගොපාලකූපොසථය කෙසේ වේ ද?

විශාඛාවෙනි, යම් පරිදි ගොපලු සවස්කල හිමියනට ගවයන් දක්වා දී මෙසේ සලකා බලන්නේ වේ ද: "අද ගවයෝ අසෝ අසෝ පියෙස්හි (තණ) කෑහ. අසෝ අසෝ පියෙස්හි පැන් පීහ. සෙට දවස්හි ගවයෝ අසෝ අසෝ පියෙස්හි තණ කති. අසෝ අසෝ පෙදෙස්හි පැන් බොති" යී.

විශාඛාවෙනි, එපරිදි ම මෙලොව කිසිවෙක් පෙහෙවස් ඇතියේ මෙසේ සලකයි: "මම අද මේ මේ ඛාද්‍ය කෑයෙමි. මම අද මේ මේ භොජ්‍ය වැළඳීමි. සෙට දවස මම මේ මේ ඛාද්‍ය කමි. මේ මේ භොජ්‍ය බුදිමි" යී. හේ ඒ ලෝභයෙන් අභිධ්‍යාසහගත සිතින් දවස ගලවයි. විශාඛාවෙනි, මෙසේ ගොපාලකූපොසථය (ගොපලු පෙහෙවස) වෙයි. විශාඛාවෙනි, මෙ පරිදි වූසු ගොපාලකූපොසථය මහත්ඵල නො වෙයි. මහානිශංස නො වෙයි. මහාද්‍යුතික නො වෙයි. මහාවිස්ඵාර ද නො වෙයි.

විශාඛාවෙනි, නිගණ්ඨූපොසථය කෙසේ වේ ද:

විශාඛාවෙනි, නිගණ්ඨ නම් වූ මහණ පිරිසෙක් ඇත. ඔහු සව්වා මෙසේ සමාදන් කරවත්: "එම්බා පුරුෂය, එව, තෝ පැදුම් දිග යොදුන් සියෙකින් ඔබ යම් ප්‍රාණීහු වෙත් ද ඔවුන් කෙරෙහි දඬු බහා තබව. පැළදිග යොදුන් සියෙකින් ඔබ යම් ප්‍රාණීහු වෙත් ද ඔවුන් කෙරෙහි දඬු බහා තබව. උතුරුදිග්හි සියක් යොද්නෙන් ඔබ යම් ප්‍රාණීහු වෙත් ද ඔවුන් කෙරෙහි දඬු බහා තබව. දකුණු දිග්හි සියක් යොද්නෙන් ඔබ යම් ප්‍රාණීහු වෙත් ද ඔවුන් කෙරෙහි දඬු බහා තබව"යි. මෙසේ ඇතැම් ප්‍රාණීන්හට දයා පිණිස අනුකම්පා පිණිස සමාදන් කරවත්. ඇතැම් ප්‍රාණීන්හට නිර්දයා පිණිස නිරනුකම්පා පිණිස සමාදන් කරවත්. ඔහු පොහෝ ලත් එදින සව්වා මෙසේ සමාදන් කරවත්: "එම්බා පුරුෂය, එව, තෝ හැම පිළී බහා තබා මෙසේ කියව: "මම කිසිතැනෙක්හිදු කිසිවකුගේ පළිබෝධයෙකිම් නොවෙමි. මාගේ ඇතුළත හෝ පිටත කිසිදු තැනෙක පිරිකරෙක පළිබෝධයෙක් ද නැතැ" යී.

ජානන්ති ඛො පනස්ස මාතාපිතරො: අයං අම්හාකං පුත්තොති සොපි ජානාති, ඉමෙ මය්හං මාතාපිතරොති. ජානාති ඛො පනස්ස පුත්තදාරො අයං අම්හාකං භත්තාති. සොපි ජානාති අයං මය්හං පුත්තදාරොති. ජානන්ති ඛො පනස්ස දාසකම්මකරපොරිසා අයං අම්හාකං අය්‍යොති. සොපි ජානාති ඉමෙ මය්හං දාසකම්මකරපොරිසාති. ඉති යස්මිං සමයෙ සච්චෙ සමාදපෙතබ්බා මුසාවාදෙ තස්මිං සමයෙ සමාදපෙන්ති ඉදමස්ස මුසාවාදස්මිං වදාමි. සො තස්සා රත්තියා අච්චයෙන තෙ භොගෙ අදින්නඤ්ඤෙව පරිභුඤ්ජති. ඉදමස්ස අදින්නාදානස්මිං වදාමි එවං ඛො විසාඛෙ නිගණ්ඨුපොසථො හොති. එවං උපවුත්ථො ඛො විසාඛෙ නිගණ්ඨුපොසථො න මහප්ඵලො හොති න මහානිසංසො න මහාජුතිකො න මහාවිප්ඵාරො.

කථඤ්ච විසාඛෙ අරියූපොසථො හොති: උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. ඉධ විසාඛෙ අරියසාවකො තථාගතං අනුස්සරති: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.

තස්ස තථාගතං අනුස්සරතො චිත්තං පසීදති. පාමුජ්ජං උප්පජ්ජති. යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස සීසස්ස උපක්කමෙන පරියොදපනා හොති.

කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස සීසස්ස උපක්කමෙන පරියොදපනා හොති. කක්කඤ්ච පටිච්ච මත්තිකඤ්ච පටිච්ච උදකඤ්ච පටිච්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස සීසස්ස උපක්කමෙන පරියොදපනා හොති. එවමෙව ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති: ඉධ විසාඛෙ අරියසාවකො තථාගතං අනුස්සරති. ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.

තස්ස තථාගතං අනුස්සරතො චිත්තං පසීදති. පාමුජ්ජං උප්පජ්ජති. යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. අයං වුච්චති විසාඛෙ අරියසාවකො බ්‍රහ්මූපොසථං උපවසති. බ්‍රහ්මුනා සද්ධිං සංවසති. බ්‍රහ්මං චස්ස ආරබ්භ චිත්තං පසීදති. පාමුජ්ජං උප්පජ්ජති. යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

"මේ අපගේ පුතු ය"යි ඔහුගේ මාපියෝ හඳුනත්. හෙ ද "මොහු මාගේ මාපියහ"යි ද .... "මේ අපගේ භතීෘ ය"යි ඔහුගේ අඹුදරුවෝ ද දනිති. හෙ ද "මේ මාගේ අඹුදරුහ"යි දනියි ඔහුගේ දස් කම්කරු පිරිස්හු ද "මේ අපගේ හිමියාපුත්හ" යි දනිති හෙ ද "මොහු මාගේ දස්කම්කරු පිරිස්හු"යි දනියි මෙසේ යම් කලෙක සත්‍යයෙහි සමාදන් කරවිය යුත්තාහු ද එසමයෙහි මුසවායෙහි සමාදන් කරවයි. මෙය ඔහුගේ මුසවා යී කියමි. හේ ඒ රය ඉක්ම යාමෙන් පසු අයිතාදන් වූ ම ඒ භෝග වළඳ කෙරෙයි. මෙ ද ඔහුගේ අයිතාදනැ යි කියමි. විශාඛාවෙනි, මෙසේ නිගණ්ඨුපොසථය (නුවට පෙහෙවස) වේ. විශාඛාවෙනි, මෙසේ වුසු නිගණ්ඨුපොසථය මහත් ඵල නො වෙයි. මහත් අනුසස් ඇතියේ නො වෙයි. මහත් දිලුම් ඇතියේ නො වෙයි. මහත් පැතිරීම් ඇතියේ ද නො වෙයි.

විශාඛාවෙනි, අරියුපොසථය කෙසේ වේ ද: විශාඛාවෙනි, සකිලිට් චිත්තයාගේ පිරිසිදු කිරීම උපක්‍රමයෙන් වෙයි. විශාඛාවෙනි, කෙසේ නම් සකිලිට් චිත්තයාගේ උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වේ ද: විශාඛාවෙනි, මෙසස්නෙහි අරිසවු තථාගතයන් අනුසමරණය කෙරෙයි: "මෙ කරුණිනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් වන සේක. සම්‍යක්සම්බුද්ධයහ. විජ්ජාචරණ-සම්පන්නයහ. සුගතයහ. ලොකවිදූහ. අනුත්තරපුරිසදම්මසාරථියහ. දෙව්-මිනිස්නට ශාස්තෘයහ බුද්ධයහ. භාග්‍යවත්හ"යි.

තථාගතයන් අනුසමරණය කරණ ඔහුගේ සිත පහදී. ප්‍රමොදය උපදී චිත්තයාගේ යම්බඳු උපක්ලේශයෝ වෙත් ද ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, යම්සේ කිලිට් හිසෙහි පිරිසිදුබව උපක්‍රමයෙන් වේ ද එසෙයිනි.

විශාඛාවෙනි, කිලිට් හිසෙහි පිරිසිදු බව කෙසේ උපක්‍රමයෙන් වේ ද. ඇඹුලුකල්කය ද නිසා මැටි ද නිසා දිය ද නිසා පුරුෂයාගේ එයට නිසි ව්‍යායාමය ද නිසා වෙයි. විශාඛාවෙනි, මෙසේ කිලිට් හිසෙහි පිරිසිදුබව උපක්‍රමයෙන් වෙයි. විශාඛාවෙනි, එපරිදි ම කිලිට්සිත්හි පිරිසිදු බව උපක්‍රම-යෙන් වෙයි.

විශාඛාවෙනි, කිලිට්සිත්හි පිරිසිදුබව උපක්‍රමයෙන් කෙසේ වේ ද: විශාඛාවෙනි, මෙසස්නෙහි ආර්‍යශ්‍රාවක තථාගතයන් අනුස්මරණය කෙරෙයි. "මේ කරුණිනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ ... දෙව්මිනිස්නට ශාස්තෘයහ. බුද්ධයහ. භාග්‍යවත්හ"යි.

තථාගතයන් අනුසමරණය කරණ ඔහුගේ සිත පහදී. ප්‍රමොදය උපදී. චිත්තයාගේ යම්බඳු උපක්ලෙශයෝ වෙත් ද, ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, මේ ආර්‍යශ්‍රාවක බ්‍රහ්මපොසථය (සමාදන්ව) වෙසේ ය යි ද (සම්‍යක්සම්බුද්ධ සඞ්ඛ්‍යාත) බ්‍රහ්මයා සමග වෙසේ යී ද කියනු ලැබේ. සම්‍යක් (සම්බුද්ධසඞ්ඛ්‍යාත) බ්‍රහ්මයා ඇරබ ඔහුගේ සිත පහදී, ප්‍රමොදය උපදී. චිත්තයාගේ යම්බඳු උපක්ලෙශයෝ වෙත් ද, ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, මෙසේ කිලිට් චිත්තයාගේ පර්‍යවදානය උපක්‍රමයෙන් වේ.

උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. ඉධ විසාඛෙ අරියසාවකො ධම්මං අනුස්සරති: ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[1] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

තස්ස ධම්මං අනුස්සරතො චිත්තං පසීදති, පාමුජ්ජං උප්පජ්ජති, යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස කායස්ස උපක්කමෙන පරියොදපනා හොති.

කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස කායස්ස උක්කමෙන පරියොදපනා හොති: සොත්තිඤ්ච පටිච්ච චුණ්ණඤ්ච පටිච්ච උදකඤ්ච පටිච්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස කායස්ස උපක්කමෙන පරියොදපනා හොති.

එවමෙව ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති: ඉධ විසාඛෙ අරියසාවකො ධම්මං අනුස්සරති: ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. තස්ස ධම්මං අනුස්සරතො චිත්තං පසීදති, පාමුජ්ජං උප්පජ්ජති, යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. අයං වුච්චති විසාඛෙ අරියසාවකො ධම්මූපොසථං උපවසති. ධම්මෙන සද්ධිං සංවසති ධම්මං චස්ස ආරබ්භ චිත්තං පසීදති. පාමුජ්ජං උප්පජ්ජති. යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති: ඉධ විසාඛෙ අරියසාවකො සඞ්ඝං අනුස්සරති: සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

තස්ස සඞ්ඝං අනුස්සරතො චිත්තං පසීදති. පාමුජ්ජං උප්පජ්ජති. යෙ චිත්තස්ස උපක්කිලෙසා. තෙ පහීයන්ති. සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස වත්ථස්ස උපක්කමෙන පරියොදපනා හොති.

---

1. ඔපනෙය්‍යිකො - මජසං.

විශාඛාවෙනි, කිලිටි වූ චිත්තයාගේ පයඹීවදනය උපක්‍රමයෙන් වේ. විශාඛාවෙනි, කෙසේ කිලිටි වූ චිත්තයාගේ පයඹීවදනය උපක්‍රමයෙන් වේ ද: විශාඛාවෙනි, මෙසස්නෙහි අරිසවූ ධර්මය අනුසමරණය කෙරෙයි. "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය (අනතාධ්‍යයට නොගොස් මැනවින් දෙසන ලද බැවින්) ස්වාඛ්‍යානය තමා තුළ සාක්‍ෂාත්කරණ විසින් දතයුතු බැවින් සාන්දෘෂ්ටිකය (කල් නොයවා පල දෙන හෙයින්) අකාලිකය. ("එව, බලව," යන විධියට නිසි බැවින්) එහිපස්සිකය (තමා තුළ එලවා පිළිවිදීමට නිසි බැවින්) ඔපනයිකය නුවණැත්තන් විසින් තමන් තමන් සිත්හි වෙන වෙන ම එලවා පිළිවිදිය යුතු වේ"යි.

මෙසේ දහම් සිහි කරණ ඔහුගේ සිත පහන් වෙයි. ප්‍රමෝදය උපදියි. චිත්තයාගේ යම්බඳු උපක්ලේශයෝ වෙත් ද, ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, යම් සේ කිලිටි ශරීරයාගේ පයඹීවදනය උපක්‍රමයෙන් වේ ද එසෙයිනි.

විශාඛාවෙනි, කිලිටි වූ ශරීරයාගේ පයඹීවදනය කෙසේ උපක්‍රමයෙන් වේ ද: කුරුඳුවල ද නිසා නහනු ද නිසා දිය ද නිසා පුරුෂයාගේ එයට නිසි වූ ව්‍යායාමය ද නිසා වෙයි. විශාඛාවෙනි, කිලිටි ශරීරයාගේ මෙසේ උපක්‍රමයෙන් පයඹීවදනය වේ.

විශාඛාවෙනි, එපරිදි ම කිලිටි චිත්තයාගේ පයඹීවදනය උපක්‍රමයෙන් වේ. විශාඛාවෙනි, කෙසේ කිලිටි චිත්තයාගේ පයඹීවදනය උපක්‍රමයෙන් වේ ද: විශාඛාවෙනි, මෙ සස්නෙහි අරිසවූ ධර්මය අනුසමරණය කෙරෙයි. "ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වාඛ්‍යාතය ... නුවණැතියන් විසින් තමන් තමන් සිත්හි වෙන වෙන ම එලවා පිළිවිදිය යුතු වේ"යි. ධර්මය අනුසමරණය කරණ ඔහුගේ සිත පහන් වේ. ප්‍රමොදය උපදී. චිත්තයාගේ යම්බඳු උපකෙලශයෝ වෙත් නම් ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, මේ අරිසවූ ධම්මූපොසථය වෙසේ ය යි ද ධර්මය හා සමග වෙසේය යි ද කියනු ලැබේ. ධර්මය ඇරබ ඔහු සිත පහන් වේ. ප්‍රමෝදය උපදී. චිත්තයාගේ යම්බඳු උපකෙලශයෝ වෙත් ද ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, මෙසේ වනාහි කිලිටි වූ චිත්තයාගේ පයඹීවදනය උපක්‍රමයෙන් වේ.

විශාඛාවෙනි, කිලිටි වූ චිත්තයාගේ පයඹීවදනය උපක්‍රමයෙන් වේ. විශාඛාවෙනි, කිලිටි වූ චිත්තයාගේ පයඹීවදනය කෙසේ උපක්‍රමයෙන් වේ ද: විශාඛාවෙනි, මෙසස්නෙහි අරිසවූ සඞ්ඝයා අනුසමරණය කෙරෙයි. "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ සුපිළිපන් වේ. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ ඉදිපිළිවෙතට පිළිපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ ආයඹීමාගී සඞ්ඛ්‍යාත න්‍යායයට පිළිපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ මනා පිළිවෙතට පිළිපන්නෝ වෙයි. එනම්: මේ පුරුෂයුග සතරය; පුරුෂපුද්ගලයෝ අට දෙනය. භාග්‍යවතුන් වහන්සේගේ තෙල ශ්‍රාවකසඞ්ඝ තෙමේ (දුරින් ගෙණවුත් දෙන පූජා සඞ්ඛ්‍යාත) ආහුනයට නිසි වෙයි. (ආගන්තුග දානසඞ්ඛ්‍යාත) පාහුණයට නිසි වෙයි. පරලොව සඳහා දෙන දන සඞ්ඛ්‍යාත දක්ෂිණා පිළිගැණීමට නිසි වෙයි. අඤ්ජලිකර්මයට නිසි වෙයි. ලෝකයාහට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍රය වේ" යි.

සඞ්ඝයා සිහි කරණ ඔහුගේ සිත පහදී. ප්‍රමෝදය උපදියි. චිත්තයාගේ යම්බඳු උපකෙලශයෝ වෙත් ද, ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, යම්සේ කිලිටි වස්ත්‍රයක්හුගේ පයඹීවදනය උපක්‍රමයෙන් වේ ද, එසෙයිනි.

කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස වත්ථස්ස උපක්කමෙන පරියොදපනා හොති: උසුමඤ්ච පටිච්ච ඛාරඤ්ච පටිච්ච ගොමයඤ්ච පටිච්ච උදකඤ්ච පටිච්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස වත්ථස්ස උපක්කමෙන පරියොදපනා හොති. එවමෙව ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති: ඉධ විසාඛෙ අරියසාවකො සඞ්ඝං අනුස්සරති: සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති. තස්ස සඞ්ඝං අනුස්සරතො චිත්තං පසීදති, පාමුජ්ජං උප්පජ්ජති. යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. අයං වුච්චති විසාඛෙ අරියසාවකො සඞ්ඝුපොසථං උපවසති, සඞ්ඝෙන සද්ධිං සංවසති. සඞ්ඝං චස්ස ආරබ්භ චිත්තං පසීදති. පාමුජ්ජං උප්පජ්ජති. යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති: ඉධ විසාඛෙ අරියසාවකො අත්තනො සීලානි අනුස්සරති අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි. තස්ස සීලං අනුස්සරතො චිත්තං පසීදති, පාමුජ්ජං උප්පජ්ජති, යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස ආදාසස්ස උපක්කමෙන පරියොදපනා හොති.

කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස ආදාසස්ස උපක්කමෙන පරියොදපනා හොති: තෙලඤ්ච පටිච්ච ඡාරිකඤ්ච පටිච්ච වාලණ්ඩුකඤ්ච පටිච්ච[1] පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස ආදාසස්ස උපක්කමෙන පරියොදපනා හොති. එවමෙව ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. ඉධ විසාඛෙ අරියසාවකො අත්තනො සීලානි අනුස්සරති අඛණ්ඩානි -පෙ- සමාධිසංවත්තනිකානි. තස්ස සීලං අනුස්සරතො චිත්තං පසීදති, පාමුජ්ජං උප්පජ්ජති, යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. අයං වුච්චති විසාඛෙ අරියසාවකො සීලූපොසථං උපවසති, සීලෙන සද්ධිං සංවසති, සීලං චස්ස ආරබ්භ චිත්තං පසීදති, පාමුජ්ජං උප්පජ්ජති, යෙ චිත්තස්ස උපක්කිලෙසා, තෙ පහීයන්ති. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

විශාඛාවෙනි, කෙසේ කිලිටි වස්ත්‍රයාගේ පයණීවදනය උපක්‍රමයෙන් වේ ද: උණුසුම නිසා ද ගළ නිසා ද ගොමූත්‍ර (හෝ එළුපක්) නිසා ද දිය නිසා ද පුරුෂයාගේ එයට නිසි ව්‍යායාමය නිසා ද වේ. විශාඛාවෙනි, මෙසේ කිලිටි වස්ත්‍රයාගේ පයණීවදනය උපක්‍රමයෙන් වේ. විශාඛාවෙනි, එපරිදි ම කිලිටි චිත්තයාගේ පයණීවදනය උපක්‍රමයෙන් වේ.

විශාඛාවෙනි, කෙසේ කිලිටි චිත්තයාගේ උපක්‍රමයෙන් පිරිසිදුබව වේ ද: විශාඛාවෙනි, මෙ සස්නෙහි අරිසවු සඞ්ඝයා අනුසමරණය කෙරෙයි: "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ සුපිළිපන් වෙයි ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍රය වේ"යි සඞ්ඝයා සිහි කරණ ඔහුගේ සිත පහදී, ප්‍රමෝදය උපදී, චිත්තයාගේ යම්බඳු උපක්ලේශයෝ වෙත් ද ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, මේ අරිසවු තෙම සඞ්ඝුපොසථය වසනේය යි ද සඞ්ඝයා සමග වසනේය යි ද කියනු ලැබේ. සඞ්ඝයා ඇරබ ඔහුගේ සිත පහදී. ප්‍රමෝදය උපදී. චිත්තයාගේ යම්බඳු උපක්ලේශයෝ වෙත් ද ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, මෙසේ කිලිටි චිත්තයාගේ පිරිසිදු බව උපක්‍රමයෙන් වේ.

විශාඛාවෙනි, උපක්‍රමයෙන් කිලිටි චිත්තයාගේ පයණීවදනය වේ. විශාඛාවෙනි, කෙසේ උපක්‍රමයෙන් කිලිටි චිත්තයාගේ පයණීවදනය වේ ද: විශාඛාවෙනි, මෙ සස්නෙහි අරිසවු අනන්‍යයෙහි වීකුම්වැරි මැද සිදුරු නොවූ ශබල නොවූ කල්මාෂ නොවූ තෘෂ්ණාදාසත්‍වයෙන් මිදුන නුවණැත්තවුන් විසින් පසස්නා ලද තෘෂ්ණාදෘෂ්ටීන් විසින් පරාමර්ශ නොපත් සමාධිය පිණිස පවත්නා වූ තමාගේ සිල් අනුසමරණය කෙරෙයි. ශීලය සිහි කරණ ඔහුගේ සිත පහදී. ප්‍රමෝදය උපදියි. චිත්තයාගේ යම්බඳු උපක්ලේශයෝ වෙත් ද ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, යම්සේ කිලිටි වූ කැටපත්හි පිරිසිදු බව උපක්‍රමයෙන් වේ ද එසෙයිනි.

විශාඛාවෙනි, කෙසේ කිලිටි වූ කැටපත්හි පිරිසිදු බව උපක්‍රමයෙන් වේ ද: තෙල් නිසා ද හළු නිසා ද වල් කොසුව නිසා ද පුරුෂයාගේ එයට නිසි ව්‍යායාමය නිසා ද වේ. විශාඛාවෙනි, මෙසේ කිලිටි කැටපත්හි පිරිසිදුබව උපක්‍රමයෙන් වේ. විශාඛාවෙනි, එපරිදි ම කිලිටි වූ චිත්තයාගේ පිරිසිදු බව උපක්‍රමයෙන් වේ.

විශාඛාවෙනි, කෙසේ කිලිටි වූ චිත්තයාගේ පිරිසිදු බව උපක්‍රමයෙන් වේ ද: විශාඛාවෙනි, මෙ සස්නෙහි අරිසවු අඛණ්ඩ වූ ... සමාධිය පිණිස පවත්නා තමාගේ සිල් සිහි කෙරේ. සිල් සිහි කරණ ඔහුගේ සිත පහදී. ප්‍රමෝදය උපදී, චිත්තයාගේ යම්බඳු උපක්ලේශයෝ වෙත් ද ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, මේ අරිසවු සීලූපෝසථය වසන්නේ යි ද සීලය හා සමග වසන්නේ යි ද කියනු ලැබේ. සිල් ඇරබ ඔහුගේ සිත පහන් වේ. චිත්තයාගේ යම්බඳු උපක්ලේශයෝ වෙත් ද ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, මෙසේ කිලිටි සිත්හි පයණීවදනය උපක්‍රමයෙන් වේ.

උපක්කිලිට්ඨස්ස විසාඛෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. ඉධ විසාඛෙ අරියසාවකො දෙවතා අනුස්සරති, සන්ති දෙවතා චාතුම්මහාරාජිකා සන්ති දෙවා තාවතිංසා සන්ති දෙවා යාමා -පෙ- තුසිතා - නිම්මාණරතිනො - පරනිම්මිතවසවත්තිනො, සන්ති දෙවා බ්‍රහ්මකායිකා, සන්ති දෙවා තතුත්තරිං, යථාරූපාය සද්ධාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා. මය්හම්පි තථාරූපා සද්ධා සංවිජ්ජති යථාරූපෙන සීලෙන සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපං සීලං සංවිජ්ජති. යථාරූපෙන සුතෙන සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපං සුතං සංවිජ්ජති. යථාරූපෙන චාගෙන සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපො චාගො සංවිජ්ජති. යථාරූපාය පඤ්ඤාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපා පඤ්ඤා සංවිජ්ජතීති. තස්ස අත්තනො ච තාසං ච දෙවතානං සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරතො චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති. යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති.

සෙය්‍යථාපි විසාඛෙ උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස උපක්කමෙන පරියොදපනා හොති. කථං ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස උපක්කමෙන පරියොදපනා හොති. උක්කඤ්ච පටිච්ච ලොණඤ්ච පටිච්ච ගෙරුකඤ්ච පටිච්ච නාලිසණ්ඩාසඤ්ච පටිච්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස ජාතරූපස්ස උපක්කමෙන පරියොදපනා හොති. එවමෙව ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

කථඤ්ච විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති: ඉධ විසාඛෙ අරියසාවකො දෙවතා අනුස්සරති: සන්ති දෙවා චාතුම්මහාරාජිකා -පෙ- සන්ති දෙවා තතුත්තරිං, යථාරූපාය සද්ධාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපා සද්ධා සංවිජ්ජති, යථාරූපෙන සීලෙන -පෙ- සුතෙන-චාගෙන-පඤ්ඤාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා මය්හම්පි තථාරූපා පඤ්ඤා සංවිජ්ජතීති. තස්ස අත්තනො ච තාසඤ්ච දෙවතානං සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරතො චිත්තං පසීදති. පාමුජ්ජං උප්පජ්ජති. යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. අයං වුච්චති විසාඛෙ අරියසාවකො දෙවතූපොසථං උපවසති. දෙවතාහි සද්ධිං සංවසති, දෙවතා චස්ස ආරබ්භ චිත්තං පසීදති, පාමුජ්ජං උප්පජ්ජති, යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති. එවං ඛො විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති.

---

1 පිංසු - මජසං. - අමුසම්ඤ්ච - PTS.

විශාඛාවෙනි, කිලිටි සිත්හි පිරිසිදු බව උපක්‍රමයෙන් වේ. විශාඛාවෙනි, කෙසේ කිලිටි සිත්හි පිරිසිදු බව උපක්‍රමයෙන් වේ ද: විශාඛාවෙනි, මෙ සස්නෙහි අරිසවු දෙවියන් අනුස්මරණය කෙරෙයි: සිවුමහරජයෙහි වැයි දෙවියෝ ඇත. තව්තිසා වැසි දෙවියෝ ඇත. යාමයෙහි වැසි දෙවියෝ ඇත. ... තුසිපුරවැයි දෙවියෝ ... නිම්මාණරති දෙව්ලෝ වැසි ... පරනිර්මිත-වශවර්තියෙහි වැසි දෙවියෝ ඇත. බඹලොව වැසි දෙවියෝ ඇත. ඉන් ඔබ උපන් දෙවියෝ ඇත. යම්බඳු වූ ශ්‍රද්ධායෙකින් සමන්වාගත වූ ඒ දෙවියෝ මෙයින් සැව එහි උපන්නාහු නම් මට ද එබඳු ශ්‍රද්ධායෙක් විද්‍යමාන වෙයි. යම්බඳු වූ ශීලයෙකින් සමන්‍වාගත වූ ඒ දෙවියෝ මෙයින් ච්‍යුත වූවාහු එහි උපන්නාහු නම් මට ද එබඳු ශීලය විද්‍යමාන වේ. යම්බඳු වූ ශ්‍රැතයෙකින් සමන්‍වාගත වූ ඒ දෙවියෝ මෙයින් ච්‍යුත වූවාහු එහි උපන්නාහු නම් මට ද එබඳු ශ්‍රැතයෙක් විද්‍යමාන වෙයි. යම්බඳු වූ ත්‍යාගයෙන් සමන්‍වාගත වූ ඒ දෙවියෝ මෙයින් සැව එහි උපන්නාහු නම් මට ද එබඳු වූ ත්‍යාගයෙක් විද්‍යමාන වේ. යම්බඳු වූ ප්‍රඥයෙකින් සමන්‍වාගත වූ ඒ දෙවියෝ මෙයින් සැව එහි උපන්නාහු නම් මට ද එබඳු වූ ප්‍රඥයෙක් විද්‍යමාන වෙයි. තමාගේ හා දෙවියන්ගේ හා ශ්‍රද්ධාව හා ශීලය හා ශ්‍රැතය හා ත්‍යාගය හා ප්‍රඥව හා අනුස්මරණය කරණ ඔහුගේ සිත පහන් වෙයි. ප්‍රමෝදය උපද-නේය. චිත්තයාගේ යම්බඳු උපක්ලේශයෝ වෙත් නම් ඔහු ප්‍රහත වෙත්.

විශාඛාවෙනි, යම්පරිදි කිලිටි වූ රනක්හුගේ පිරිසිදුබව උපක්‍රමයෙන් වේ ද එසෙයිනි. විශාඛාවෙනි, කෙසේ චනාහි කිලිටි රනක්හුගේ පිරිසිදුබව උපක්‍රමයෙන් වේ ද: උදුන ද නිසා ලුණු ද නිසා ගෛරික ද නිසා පුඹුනා නලය හා අඬුව ද නිසා පුරුෂයාගේ එයට නිසි ව්‍යායාමය ද නිසා වෙයි. විශාඛාවෙනි, මෙසේ චනාහි කිලිටි වූ ජාතරූපයාගේ පිරිසිදුබව උපක්‍රමයෙන් වේ. විශාඛාවෙනි, එපරිදි ම කිලිටි වූ චිත්තයාගේ පිරිසිදුබව උපක්‍රමයෙන් වේ.

විශාඛාවෙනි, කෙසේ නම් කිලිටි වූ චිත්තයාගේ පිරිසිදුබව උපක්‍රමයෙන් වේ ද: විශාඛාවෙනි, මෙසස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවක දෙවියන් සිහි කරයි. "සිවුමහ-රජය වැසි දෙවියෝ ඇත. ... ඉන් ඔබ උපන් දෙවියෝ ඇත. යම්බඳු ශ්‍රද්ධායෙකින් සමන්‍වාගත වූ ඒ දෙවියෝ මෙයින් සැව එහි උපන්නාහු නම් මට ද එබඳු ශ්‍රද්ධායෙක් විද්‍යමාන වෙයි. යම්බඳු ශීලයෙකින් ... යම්බඳු ශ්‍රැතයෙකින් ... ත්‍යාගයෙකින් ... ප්‍රඥයෙකින් සමන්‍වාගත වූ ඒ දෙවියෝ මෙයින් ච්‍යුත වූවාහු එහි උපන්නාහු නම් මට ද එබඳු ප්‍රඥයෙක් විද්‍යමාන වේ"යි. තමාගේ හා ඒ දෙවියන්ගේ හා ශ්‍රද්ධාව හා ශීලය හා ශ්‍රැතය හා ත්‍යාගය හා ප්‍රඥව හා අනුස්මරණය කරණ ඔහුගේ සිත පහන් වේ. ප්‍රමෝදය උපදී. චිත්තයාගේ යම්බඳු උපක්ලේශයෝ වෙත් නම් ඔහු ප්‍රහත වෙති. විශාඛාවෙනි, මේ අරිසවු දෙවතුපොසථය වසන්නේ යයි ද දෙවියන් හා සමග වසන්නේ යයි ද කියනු ලැබේ. දෙවියන් ඇරබ ඔහු සිත පහදී. ප්‍රමෝදය උපදී. චිත්තයාගේ යම්බඳු උපක්ලේශයෝ වෙත් නම් ඔහු ප්‍රහත වෙත්. විශාඛාවෙනි, කිලිටි චිත්තයාගේ පර්‍ය්‍යවදාතය මෙසේ උපක්‍රමයෙන් වේ.

ස ඛො සො විසාඛෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යාවජීවං අරහන්තො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතා නිහිතදණ්ඩා නිහිතසත්ථා ලජ්ජී දයාපන්නා සබ්බපාණභූතහිතානුකම්පී විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරාමි. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති.

යාවජීවං අරහන්තො අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතා දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරාමි. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති.

යාවජීවං අරහන්තො අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී ආරාචාරී[2] විරතා මෙථුනා ගාමධම්මා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී විරතො මෙථුනා ගාමධම්මා. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති.

යාවජීවං අරහන්තො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතා සච්චවාදී සච්චසන්ධා ථෙතා පච්චයිකා අවිසංවාදකා ලොකස්ස. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො සච්චවාදී සච්ච-සන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති.

යාවජීවං අරහන්තො සුරාමෙරයමජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරය-මජ්ජපමාදට්ඨානා පටිවිරතා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං සුරාමෙරයමජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති.

යාවජීවං අරහන්තො එකභත්තිකා රත්තූපරතා විරතා විකාලභොජනා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං එකභත්තිකො රත්තූපරතො විරතො විකාලභොජනා. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති.

යාවජීවං අරහන්තො නච්චගීතවාදිතවිසූකදස්සනමාලාගන්ධවිලෙපන-ධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං නච්චගීතවාදිතවිසූකදස්සනමාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූස-නට්ඨානා පටිවිරතො. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපො-සථො ච මෙ උපවුත්ථො භවිස්සති.

---

1. ඉමිනාපි - මජසං. 2. අනාචාරී - මජසං.

විශාඛාවෙනි, එම අරිසවු මෙසේ නුවණින් සලකයි: "රහත්හු දිවිහිමියෙන් පණිවා හැර පණිවායෙන් වැළකුනාහු බහා තුබූ දඬු ඇත්තාහු බහා තැබූ අවි ඇත්තාහු ලජ්ජා ඇත්තාහු දයාවට පැමිණියාහු සව්ප්‍රාණභූතයන් කෙරෙහි හිතානුකම්පි ව වෙසෙත්. මම ද අද මේ රෑ හා මේ දවස හා පණිවා හැර පණිවායෙන් වැළකියෙම් බහා තැබූ දඬු ඇතියෙම් බහා තැබූ අවි ඇතියෙම් ලජ්ජා ඇතියෙම් දයාවට පැමිණියෙම් සව්ප්‍රාණභූතයන් කෙරෙහි හිතානුකම්පි වූයෙම් වෙසෙමි. මම මේ ගුණාඞ්ගයෙනුදු රහතුන් අනුකරණය කරමි. මා විසින් පෙහෙවස ද විසූයේ වෙයි.

රහත්හු දිවිහිමියෙන් අයිනාදනින් වැළකුනාහු දුන් දෑ ගන්නාසුලු වූවාහු දුන් දෑ කැමතිවනසුලු වූවාහු නොසොර වූ පිරිසිදු අත්බැවින් වෙසෙත්. මම ද අද මේ රෑ හා මේ දවස හා අයිනාදන් හැර දමා අයිනාදනින් වැළකියෙම් දුන් දෑ ගන්නා සුල්ලෙම් දුන් දෑ කැමැති වන සුල්ලෙම් නොසොර වූ පිවිතුරු අත්බැවින් වෙසෙමි. මම මේ ගුණාඞ්ගයෙනුදු රහතුන් අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් වුසුයේ ද වෙයි.

රහත්හු දිවිහිමි අබ්‍රම්සර හැරදමා බඹසර ඇත්තාහු අබ්‍රම්සරින් දුරුව වසන්නාහු ගැමිදහම් වූ මෙවුන්දමින් වැළකුනාහු වෙති, මම ද අද මේ රෑ හා මේ දවල හා අබ්‍රම්සර හැරදමා බඹසැරියෙම් ගැමිදම් වූ මෛථුනයෙන් වැළකියෙම් වෙමි. මම මේ ගුණාඞ්ගයෙනුදු රහතුන් අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් ද වුසුයේ වෙයි.

රහත්හු දිවිහිමි මුසවා හැරදමා මුසවායෙන් වැළකුනාහු සත්‍යවාදී වූවාහු සත්‍යයෙන් සත්‍යය සටනාහු සපිර කථා ඇත්තාහු හැදහිය යුතු කථා ඇත්තාහු ලෝකයා නළ නො කෙරෙති. මම ද අද මේ රෑ හා මේ දවල හා මුසවා හැර දමා මුසවායෙන් වැළකියෙමි. සත්‍යවාදී වූයෙමි. සත්‍යයෙන් සත්‍යය සටනෙම් සපිර කථා ඇතියෙම් හැදෑහිය හැකි කථා ඇතියෙම් ලොකයා නොවස්නෙම් වෙමි. මම මේ ගුණාඞ්ගයෙනුදු රහතුන් අනුකරණය කරමි. මා විසින් පෙහෙවස ද විසූයේ වෙයි.

රහත්හු දිවිහිමි කොට පාන වෙතනා නැමැති ප්‍රමාදයට කරුණු වූ රහමෙරමද හැරදමා පමා කරුණු වූ රහමෙරමදින් වැළකුනාහු වෙති. මම ද අද මේ රෑ හා මේ දවල පමා කරුණු වූ රහමෙර මද හැර දමා පමා කරුණු වූ රහමෙරමදින් වැළකියෙම් වෙමි. මේ ගුණාඞ්ගයෙනුදු මම රහතුන් අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් ද විසුයේ වෙයි.

රහත්හු දිවිහිමි එකහත්තික වූවාහු රාත්‍රිභොජනයෙන් වැළකුනාහු විකල්බොජුනෙන් වැළකුනාහු වෙති. මම ද අද මේ රෑ හා මේ දවල හා එකහත්තික වූයෙම් රාත්‍රිභෝජනයෙන් වැළකුනෙම් විකල් බොජුනෙන් දුරුවූයෙම් වෙමි මම මේ ගුණාඞ්ගයෙනුදු රහතුන් අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් ද වුසුයේ වෙයි.

රහත්හු දිවිහිමියෙන් නැටුම් ගැයුම් වැයුම් විසුළුදැකුම් මල්ගඳවිලෙවුන් දරණ සජන සරසන යන කරුණින් වැළකුනාහු වෙති. මම ද අද මේ රෑ හා මේ දවාල හා නැටුම් ගැයුම් වැයුම් විසුළු දැකුම් මල්ගඳ විලෙවුන් දැරුම් සැඳුම් සැරැයුම් යන කරුණින් වැළකුනෙම් වෙමි. මම මේ ගුණාඞ්ගයෙනුදු රහතුන් අනුකරණය කරමි. මා විසින් පෙහෙවස් වුසුයේ ද වෙයි.

යාවජීවං අරහන්තො උච්චාසයනමහාසයනං පහාය උච්චාසයනමහා-සයනා පටිවිරතා නීචසෙය්‍යං කප්පෙන්ති. මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං උච්චාසයනමහාසයනං පහාය උච්චාසයනමහාසයනා පටිවිරතො නීචසෙය්‍යං කප්පෙමි. මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති. එවං ඛො විසාඛෙ අරියූපොසථො හොති.

එවං උපවුත්ථො ඛො විසාඛෙ අරියූපොසථො මහප්ඵලො හොති. මහානි-සංසො මහාජුතිකො මහාවිප්ඵාරො. කීව මහප්ඵලො හොති. කීව මහානිසංසො කීව මහාජුතිකො කීව මහාවිප්ඵාරො.

සෙය්‍යථාපි විසාඛෙ යො ඉමෙසං සොළසන්නං මහාජනපදානං පහූත-සත්තරතනානං[1] ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙය්‍ය, සෙය්‍යථීදං: අඞ්ගානං මගධානං කාසීනං කොසලානං වජ්ජීනං මල්ලානං චෙතීනං වඞ්ගානං කුරූනං පඤ්චාලානං මච්ඡානං සූරසෙනානං අස්සකානං අවන්තීනං ගන්ධාරානං කම්බොජානං, අට්ඨඞ්ගසමන්නාගතස්ස උපොසථස්ස එතස්ස කලං නාග්ඝති[2] සොළසිං. තං කිස්ස හෙතු: කපණං විසාඛෙ මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යානි විසාඛෙ මානුසකානි පඤ්ඤාස වස්සානි, චාතුම්මහාරාජිකානං දෙවානං එසො එකො රත්තින්දිවො[3], තාය රත්තියා තිංසරත්තියො මාසො. තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන පඤ්චවස්ස-සතානි* චාතුම්මහාරාජිකානං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යං විසාඛෙ මානුසකං වස්සසතං, තාවතිංසානං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදස-මාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බං වස්සසහස්සං තාවතිංසානං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා තාවතිංසානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යානි විසාඛෙ මානුසකානි ද්වෙ වස්සසතානි, යාමානං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන දිබ්බානි ද්වෙ වස්සසහස්සානි යාමානං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා යාමානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

1. පහූතරත්තරතනානං - මජසං. 2. නාග්ඝති - මජසං. 3. රත්තිදිවො - මජසං.
* දිබ්බානි පඤ්චවස්සසතානි - මජසං.

රහත්හු දිවිහිමියෙන් උසසුන් මහඅසුන් හැර දමා උසසුන් මහසුනෙන් වැළැක්කාහු හැදෙක හෝ තණඇතිරියෙක හෝ බට ශයනය කෙරෙත්. මම ද අද මේ රෑ හා මේ දවල හා උසසුන් මහසුන් හැරදමා උසසුන් මහස්නෙන් වැළකියෙම් හැඳෙක හෝ තණඇතිරියෙක බටහෙවුම් කෙරෙමි. මේ ගුණාඞ්ගයෙනුදු මම රහතුන් අනුකරණය කරමි. මා විසින් පෙහෙවස ද වුසුයේ වෙයි. විශාඛාවෙනි, මෙසේ අරියුපොසථය (අරීපෙහෙවස) වෙයි.

විශාඛාවෙනි, මෙසේ විසූ අරියුපොසථය මහත්ඵල වෙයි. මහානිසංස ද වෙයි. මහාජුතික ද වෙයි. මහාවිප්ඵාර ද වෙයි. කිපමණ මහත්ඵල වේ ද: කිපමණ මහානිසංස වේ ද: කිපමණ මහාජුතික වේ ද: කිපමණ මහාවිප්ඵාර වේ ද?

විශාඛාවෙනි, යම්පරිදි අඞ්ග – මගධ – කාසී – කොසල – වජ්ජී – මල්ල – චෙති – වඞ්ග – කුරු – පඤ්චාල – මච්ඡ – සූරසේන – අස්සක – අවන්තී – ගන්ධාර – කාම්බොජ බඳු නොමඳ සත්රුවනින් පිරි සොළොස් මහා ජනපදයන්ගේ ඓශ්වර්‍ය්‍යාධිපත්‍යය ඇති රාජ්‍යය යමෙක් කරන්නේ නම් තෙල අෂ්ටාඞ්ගසමන්විත උපොසථයාගේ සොළොස් වන කොටසට ද (එය) නො අගී. ඒ කවර හෙයින: විශාඛාවෙනි, දිව්‍යසුඛය පිණිස මිනිස්රජය ඇලුප් වෙයි.

විශාඛාවෙනි, මිනිසුන් සතු යම් පණස් වසෙක් වේ ද, තෙල චාතුම්මහාරාජික දෙවියනට එක් රෑ දවලෙකි. මසෙක් එරැයින් තිස් රැයෙක් වේ. හවුරුද්දෙක් එමසින් දොළොස් මැසි වෙයි. එ හවුරුදුයෙන් පන්සිය වසෙක් චාතුම්මහාරාජික දෙවියන්ගේ ආයුෂප්‍රමාණය වේ. විශාඛාවෙනි. යම් හෙයෙකින් මෙලොව කිසි ස්ත්‍රියක් වේවයි, පුරුෂයෙක් වේවයි අෂ්ටාඞ්ගසමන්විත වූ පෙහෙවස් වැස කාබුන් මරණින් මතු සිවුමහරජවැසි දෙවියන්ගේ සහවාසයට පැමිණේ යන තෙල කරුණ විද්‍යමාන වේ. විශාඛාවෙනි, මේ කරුණ සඳහා දිව්‍යසුඛය පිණිස මිනිස්රජය ඇලුප් වෙයි. යන තෙල කියන ලදී.

විශාඛාවෙනි, මිනිසුන් සතු යම් වර්ෂ ශතයෙක් වේ ද, තව්තිසාවැසි දෙවියනට තෙල එක් රෑදවලෙකි. එරැයින් තිස්රැයෙක් මසෙකි. එමසින් දොළොස්මැසි වූයේ හවුරුද්දෙකි. එහවුරුදුයෙන් දිව්‍යවර්ෂසහස්‍රයෙක් තව්තිසා වැසි දෙවියන්ගේ ආයුෂප්‍රමාණ වෙයි. විශාඛාවෙනි, යම් හෙයෙකින් මෙලොව කිසි ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු තාවතිංස වැසි දෙවියන්ගේ සහවාසයට පැමිණේය යන මෙකරුණ විද්‍යමාන වේ. විශාඛාවෙනි, දිව්‍යසුඛය පිණිස මිනිස්රජය ඇලුප් වෙයි. යන මේ සඳහා තෙල කරුණ කියන ලදී.

විශාඛාවෙනි, මනුෂ්‍යයන් පිළිබඳ යම් දෙසිය හවුරුදුයෙක්, වේ ද, යාම දෙවියනට තෙල එක් රෑදවලෙකි. එරැයින් තිස්රැයෙක් මසෙකි. එමසින් දොළොස්මැසි වූයේ හවුරුද්දෙකි. එහවුරුදුයෙන් දිව්‍ය වූ දෙව්සහස්‍ර වර්ෂයෙක් යාමදෙවියන්ගේ ආයුෂප්‍රමාණ වෙයි. විශාඛාවෙනි, යම් හෙයෙකින් මෙලොවෙහි ඇතැම් ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු යාමදෙවියන්ගේ සහවාසයට එළඹේය යන තෙල කරුණ විද්‍යමාන වේ විශාඛාවෙනි, මේ සඳහා දිව්‍යසුඛය පිණිස මිනිස්රජය ඇලුප් වෙයි. යන තෙල කරුණ කියන ලදී.

යානි විසාඛෙ මානුසකානි චත්තාරි වස්සසතානි, තුසිතානං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො. තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බානි චත්තාරි වස්සසහස්සානි තුසිතානං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා තුසිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යානි විසාඛෙ මානුසකානි අට්ඨවස්සසතානි නිම්මාණරතීනං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බානි අට්ඨ වස්සසහස්සානි නිම්මාණරතීනං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති, යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා නිම්මාණරතීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යානි විසාඛෙ මානුසකානි සොළස වස්සසතානි පරනිම්මිතවසවත්තීනං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බානි සොළස වස්සසහස්සානි පරනිම්මිතවසවත්තීනං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති, යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධායාති.

30. පාණං න ඝාතෙ[1] න චදින්නමාදියෙ
මුසා න භාසෙ න ච මජ්ජපො සියා,
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං.

31. මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ
මඤ්චෙව ඡමායං ච සයෙථ සන්ථතෙ,
එතං හි අට්ඨඞ්ගිකමාහු පොසථං
බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං.

32. චන්දො ච සුරියො ච උභො සුදස්සනා
ඔභාසයං අනුපරියන්ති යාවතා,
තමොනුදා තෙ පන අන්තලික්ඛගා
නභෙ පභාසෙන්ති දිසා විරොචනා.

33. එතස්මිං යං විජ්ජති අන්තරෙ ධනං
මුත්තා මණී වෙළුරියඤ්ච භද්දකං,
සිඞ්ගීසුවණ්ණං අථවාපි කඤ්චනං
යං ජාතරූපං හටකන්ති වුච්චති.

34 අට්ඨඞ්ගුපෙතස්ස උපොසථස්ස
කලම්පි තෙ නානුභවන්ති සොළසිං,
චන්දප්පභා තාරගණා ච සබ්බෙ.

35. තස්මා හි නාරී ච නරො ච සීලවා
අට්ඨඞ්ගුපෙතං උපවස්සුපොසථං,
පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

*

**මහාවග්ගො දුතියො**

1. න හඤ්ඤෙ - මජසං.

* තස්සුද්දානං:- තිත්ථභායඤ්ච වෙනාගො - සරභො කෙසපුත්තියා
සාළ්හො චාපි කථාවත්ථු තිත්ථයමූලුපොසථොති.

විශාඛාවෙනි, මිනිසුන්ගේ යම් සාරසිය වසෙක් වේ ද තෙල තුෂිත දෙවියන්ගේ එක් රැදුවලෙකි. එරැයින් තිස්රැයෙක් මාසයෙකි. එමසින් දෙළොස් මැසි වූයේ හවුරුදුයෙකි. එහවුරුදුයෙන් දිව්‍ය වූ සාරදහස් වසෙක් තුෂිත දෙවියන්ගේ ආයුෂප්‍රමාණය වේ. විශාඛාවෙනි, යම් හෙයෙකින් මෙලොව කිසි ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු තුෂිත දෙවියන්ගේ සහවාසයට එළඹෙන්නේය යන තෙල කරුණ විද්‍යමාන වේ. විශාඛාවෙනි, මේ සඳහා මානුෂිකරාජ්‍යය දිව්‍යසුඛය පිණිස අල්ප වෙයි යන තෙල කරුණ කියනලදී.

විශාඛාවෙනි, මානුෂික වූ යම් අටසිය වසෙක් වේ ද තෙල නිර්මාණරති දෙවියනට එක් රැදුවලෙකි. එරැයින් තිස්රැයෙක් මාසයෙකි. එමසින් දෙළොස්මස් ඇතියේ හවුරුද්දෙකි. එහවුරුදුයෙන් දිව්‍ය වූ අෂ්ටවර්ෂසහස්‍රයෙක් නිර්මාණරති දෙවියන්ගේ ආයුෂප්‍රමාණ වේ. විශාඛාවෙනි, යම් හෙයෙකින් මෙලොව ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු නිර්මාණරති දෙවියන්ගේ සහවාසයට එළඹෙන්නේය යන තෙල කරුණ විද්‍යමාන වේ. විශාඛාවෙනි, මේ සඳහා දිව්‍යසුඛය පිණිස මානුෂිකරාජ්‍යය කෘපණ වේ යන තෙල කරුණ කියන ලදී.

විශාඛාවෙනි, මිනිසුන් පිළිබඳ යම් සොළොස් සියවසෙක් වේ ද, පරනිර්මිත වශවර්ති දෙවියනට තෙල එක් රැදුවලෙකි. එරැයින් තිස්රැයෙක් මාසයෙකි. එමසින් දෙළොස්මැසි වූයේ හවුරුද්දෙකි. එහවුරුද්දෙන් දිව්‍ය වූ ෂොඩෂ වර්ෂ සහස්‍රයෙක් පරනිර්මිතවශවර්ති දෙවියන්ගේ ආයුප්‍රමාණය වේ. විශාඛාවෙනි, මෙලොව යම් හෙයෙකින් කිසි ස්ත්‍රියක් වේවයි, පුරුෂයෙක් වේවයි අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු පරනිර්මිත වශවර්ති දෙවියන්ගේ සහභාවයට එළඹෙන්නේය යන තෙල කරුණ විද්‍යමාන වේ. විශාඛාවෙනි, දිව්‍යසුඛය පිණිස මානුෂික රාජ්‍යය පුරුතු වෙයි යන තෙල කරුණ කියන ලදී.

30. පරපණ නො නස්නේය. අයිනාදන් නො ද ගන්නේය. මුසවා නො බණන්නේය. මත්පැන් පානය කරන්නෙක් නො ද වන්නේය. අබ්‍රහමචර්‍ය්‍යා සඞ්ඛ්‍යාත මෛථුනයෙන් වළක්නේය. රාත්‍රිභෝජනය හා විකාලභෝජනය නො බුදින්නේය.

31. මල්දම් නො දරන්නේය. සුවඳ නො තවරගන්නේය. හැඳෙහි ද (පිරියම් කළ) බිමෙහි ද ඇතිරියෙහි ද හෝනේය. දුකත් ගිය බුදුරජුන් විසින් වදහළ තෙල ම අටඟපෙහෙවසැ යි කීහු.

32. සුදශීන වූ චන්ද්‍රයා ද සූර්‍ය්‍යා ද යන දෙදෙන යම්තාක් තැන් හොබවමින් සිසාරා යෙත් ද, අඳුරු බිඳලන අහසෙහි යන ඔහු සව් දිගුන් හොබවන්නාහු අහස්හි රැස් නඟත් ද,

33. මේ දෙයතුරෙහි සිත්කලු මුතු හා දෑමිණි හා වෙරළුමිණි හා සිඟු රන් හා වැලිත් පැවි කසුන් හා බුදුබඳ පාහැති රන් හා කුහුඹුවන් විසින් ගෙණෙන ලද හෙයින් "හාටකයැ"යි කියනු ලබන රන් හා යම් බඳු ධනයක් වේ ද,

34. ඔහු ද අටඟින් යුත් පෙහෙවස්හුගේ සොළොස් වන කොටස ද නොයෙත්.

35. හැම උළුකැන්හු සඳරැස්හුගේ සොළොස්වන කොටසට නොවැ-ටෙද්ද එසෙයිනි. එහෙයින් ම සිල්වත් නරනාරීහු අටඟින් යුත් පෙහෙවස් වැස සුව එළවන පින් කොට අනින්දිත වූවාහු ස්වර්ගස්ථානයට එළඹෙත්.

දෙවන මහවගයි.

**3. 2. 3. 1**

**[සාවත්ථි නිදානං]**

21. අථ ඛො **ඡන්නො** පරිබ්බාජකො යෙනායස්මා **ආනන්දො,** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ඡන්නො පරිබ්බාජකො ආයස්මන්තං ආනන්දං එතදවොච:

තුම්හෙපි ආවුසො ආනන්ද රාගස්ස පහාණං පඤ්ඤපෙථ. දොසස්ස -පෙ- මොහස්ස පහාණං පඤ්ඤපෙථාති. මයං ඛො ආවුසො රාගස්ස පහාණං පඤ්ඤපෙම, දොසස්ස -පෙ- මොහස්ස පහාණං පඤ්ඤපෙමාති. කිම්පන තුම්හෙ ආවුසො රාගෙ ආදීනවං දිස්වා රාගස්ස පහාණං පඤ්ඤපෙථ. කිං දොසෙ -පෙ- කිං මොහෙ ආදීනවං දිස්වා මොහස්ස පහාණං පඤ්ඤපෙථාති.

රත්තො ඛො ආවුසො රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තව්‍යාබාධායපි චෙතෙති, පර -පෙ- උභයව්‍යාබාධායපි චෙතෙති. චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. රාගෙ පහීණෙ නෙවත්තව්‍යාබාධාය චෙතෙති, න පර -පෙ- න උභය -පෙ- න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. රත්තො ඛො ආවුසො රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො කායෙන දුච්චරිතං චරති, වාචාය -පෙ- මනසා දුච්චරිතං චරති. රාගෙ පහීණෙ නෙව කායෙන දුච්චරිතං චරති, න වාචාය -පෙ- න මනසා දුච්චරිතං චරති. රත්තො ඛො ආවුසො රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තත්ථම්පි යථාභූතං නප්පජානාති, පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි යථාභූතං නප්පජානාති. රාගෙ පහීණෙ අත්තත්ථම්පි යථාභූතං පජානාති. පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි යථාභූතං පජානාති. රාගො ඛො ආවුසො අන්ධකරණො අචක්ඛුකරණො අඤ්ඤාණකරණො පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බාණසංවත්තනිකො.

දුට්ඨො ඛො ආවුසො දොසෙන -පෙ- මූළ්හො ඛො ආවුසො මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තව්‍යාබාධායපි චෙතෙති -පෙ- උභයව්‍යාබාධායපි චෙතෙති. චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. මොහෙ පහීණෙ නෙවත්තව්‍යාබාධාය චෙතෙති, න පර -පෙ- න උභය -පෙ- න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති.

**3. 2. 3. 1.**

**[සැවැත් නිදානයි:]**

21. එකල්හි සන් පිරිවැජි ආයුෂ්මත් අනඳ තෙරණුවන් කරා එළඹියේය. එළඹ ආයුෂ්මත් අනඳ තෙරණුවන් හා සමග සතුටු විය. සමෙමාදනයට නිසි සිහි කරණුවට නිසි කථාව කොට නිමවා එකත්පස් ව හිඳ. එකත්පස්ව හුන් සන් පිරිවැජි ආයුෂ්මත් අනඳ තෙරණුවන්ට තෙල සැල කෙළේ ය:

කියග ආනන්දයෙනි, තෙපිත් රාගප්‍රහාණය පනවාලවු ද, ද්වෙෂ-ප්‍රහාණය ... මොහප්‍රහාණය පනවාලවු ද' යි. ඇවැත්නි, අපි ම රාගප්‍රහාණය පණවම්හ. ද්වෙෂප්‍රහාණය ... මෝහ ප්‍රහාණය පණවම්හ යි. කිමෙක ඇවැත්නි, තෙපි රාගයෙහි ආදීනව දක රාගප්‍රහාණය පණවා ලවු ද?, කිම ද්වේෂයෙහි ... කිම්? මෝහයෙහි ආදීනව දක මෝහප්‍රහාණය පණවා ලවු ද යි.

ඇවැත්නි, රාගයෙන් රත්වූයේ, මඩනා ලදුයේ, ගත් සිතැතියේ ආත්මව්‍යාබාධය පිණිස ද සිතයි, පරව්‍යාබාධය පිණිස ද ... උභයව්‍යාබාධය පිණිස ද සිතයි.චෛතසික වූත් දුක් දොම්නස් විඳුනේය, රාගය ප්‍රහනවත් ම ආත්මව්‍යාබාධය පිණිස නො සිතයි. පරව්‍යාබාධය පිණිස ... උභයව්‍යාබාධය පිණිස ... චෛතසික වූ දුක් දොම්නස් නො විඳුනේය. ඇවැත්නි, රාගයෙන් රත්වූයේ, මඩනා ලදුයේ, ගත් සිතැතියේ කයින් දුසිරිත් කරයි. වචනයෙන් ... සිතින් දුසිරිත් කරයි. රාගය ප්‍රහනවත් ම කයින් දුසිරිත් නො ම කරයි. වචනයෙන් ... සිතින් දුසිරිත් නො ම කරයි. ඇවැත්නි, රාගයෙන් රත්වූයේ, මඩනා ලදුයේ, ගත් සිතැතියේ ආත්මාර්ථය ද තත් වූ පරිදි නො දන්නේය. පරාර්ථය ද ... උභයාර්ථය ද තත් වූ පරිදි නො දන්නේය. රාගය ප්‍රහනවත් ම ආත්මාර්ථය ද තත් වූ පරිදි දන්නේය. පරාර්ථය ද ... උභයාර්ථය ද තත් වූ පරිදි දන්නේය. ඇවැත්නි, රාගය චනාහි අඳ කරන්නේ වෙයි. පැණැස් නො කරන්නේ වෙයි. නුවණ නොකරන්නේ වෙයි. ප්‍රඥව නිරුද්ධ කරන්නේ වෙයි. දුඃඛපක්ෂයෙහි වැටෙන්නේ වෙයි. කෙලෙස් නිවනු පිණිස නො පවත්නේ වෙයි.

ඇවැත්නි, ද්වේෂයෙන් දුෂ්ට වූයේ ... ඇවැත්නි, මෝහයෙන් මූඪ වූයේ, මඩනා ලදුයේ, ඇදගත් සිතැතියේ ආත්මව්‍යාබාධය පිණිස ද සිතයි. පරව්‍යාබාධය පිණිස ... උභයව්‍යාබාධය පිණිස ද සිතයි. චෛතසික වූත් දුක් දොම්නස් විඳුනේය. මෝහය ප්‍රහනවත් ම ආත්මව්‍යාබාධය පිණිස නො ම සිතයි. පරව්‍යාබාධය පිණිස ... උභයව්‍යාබාධය පිණිස නො ම සිතයි. චෛතසික වූ දුක් දොම්නස් නො විඳුනේය.

මූළ්හො ඛො ආවුසො මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො කායෙන දුච්චරිතං චරති. වාචාය දුච්චරිතං චරති. මනසා දුච්චරිතං චරති. මොහෙ පහීණෙ නෙව කායෙන දුච්චරිතං චරති. න වාචාය දුච්චරිතං චරති. න මනසා දුච්චරිතං චරති. මූළ්හො ඛො ආවුසො මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තත්ථම්පි යථාභූතං නප්පජානාති. පරත්ථම්පි යථාභූතං නප්පජානාති. උභයත්ථම්පි යථාභූතං නප්පජානාති. මොහෙ පහීණෙ අත්තත්ථම්පි යථාභූතං පජානාති. පරත්ථම්පි යථාභූතං පජානාති. උභයත්ථම්පි යථාභූතං පජානාති. මොහො ඛො ආවුසො අන්ධකරණො අචක්ඛුකරණො අඤ්ඤාණකරණො පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකො.

ඉදං ඛො මයං ආවුසො රාගෙ ආදීනවං දිස්වා රාගස්ස පහාණං පඤ්ඤපෙම, ඉදං දොසෙ ආදීනවං දිස්වා දොසස්ස පහාණං පඤ්ඤපෙම, ඉදං මොහෙ ආදීනවං දිස්වා මොහස්ස පහාණං පඤ්ඤපෙමාති.

අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහාණායාති? අත්ථාවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහාණායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහාණායාති? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහාණායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහාණායාති, අලඤ්ච පනාවුසො ආනන්ද අප්පමාදායාති.

## 3. 2. 3. 2.

22. එකං සමයං ආයස්මා **ආනන්දො කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ**. අථ ඛො අඤ්ඤතරො ආජීවකසාවකො ගහපති යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො ආජීවකසාවකො ගහපති ආයස්මන්තං ආනන්දං එතදවොච: කෙසං නො භන්තෙ ආනන්ද ධම්මො ස්වාක්ඛාතො, කෙ ලොකෙ සුපටිපන්නා[1], කෙ ලොකෙ සුගතාති?[2]

තෙන හි ගහපති තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය, තථා නං ව්‍යාකරෙය්‍යාසි. තං කිං මඤ්ඤසි ගහපති යෙ රාගස්ස පහාණාය ධම්මං දෙසෙන්ති, දොසස්ස පහාණාය ධම්මං දෙසෙන්ති, මොහස්ස පහාණාය ධම්මං දෙසෙන්ති. තෙසං ධම්මො ස්වාක්ඛාතො නො වා, කථං වා තෙ එත්ථ හොතීති? යෙ භන්තෙ රාගස්ස පහාණාය ධම්මං දෙසෙන්ති. දොසස්ස -පෙ- මොහස්ස පහාණාය ධම්මං දෙසෙන්ති. තෙසං ධම්මො ස්වාක්ඛාතො, එවං මෙ එත්ථ හොතීති.

තං කිං මඤ්ඤසි ගහපති, යෙ රාගස්ස පහාණාය පටිපන්නා, දොසස්ස -පෙ- මොහස්ස පහාණාය පටිපන්නා, තෙ ලොකෙ සුපටිපන්නා, නො වා කථං වා තෙ එත්ථ හොතීති? යෙ භන්තෙ රාගස්ස පහාණාය පටිපන්නා, දොසස්ස -පෙ- මොහස්ස පහාණාය පටිපන්නා, තෙ ලොකෙ සුපටිපන්නා, එවං මෙ එත්ථ හොතීති.

1 සුප්පටිපන්නා - මජ්සං. 2. සුකතාති - මජ්ඣං.

ඇවැත්නි, මෝහයෙන් මූඪ වූයේ මඩනා ලදුයේ, ඇදගත් සිතැතියේ කයින් දුසිරිත් කරයි. වචනයෙන් ... සිතින් දුසිරිත් කරයි. මෝහය ප්‍රහීන වත් ම කයින් දුසිරිත් නො ම කරයි. වචනයෙන් ... සිතින් දුසිරිත් නො ම කරයි. ඇවැත්නි, මෝහයෙන් මූඪ වූයේ මඩනා ලදුයේ, ඇදගත් සිතැතියේ ආත්මාර්ථය ද තත් වූ පරිදි නො දන්නේය. පරාර්ථය ද ... උභයාර්ථය ද තත් වූ පරිදි නො දන්නේය. මෝහය ප්‍රහීන වත් ම ආත්මාර්ථය ද තත් වූ පරිදි දන්නේය. පරාර්ථය ද ... උභයාර්ථය ද තත් වූ පරිදි දන්නේය. ඇවැත්නි, මෝහය චක්ෂු අඳ කරන්නේ වෙයි. පැණැස් නො කරන්නේ වෙයි. නුවණ නො කරන්නේ වෙයි. ප්‍රඥව නිරුද්ධ කරන්නේ වෙයි. දුඃඛපක්ෂයෙහි වැටෙන්නේ වෙයි. කෙලෙස් නිවනු පිණිස නො පවත්නේ වෙයි.

ඇවැත්නි, අපි රාගයෙහි මේ ආදීනවය දැක රාගප්‍රහාණය පණවම්හ. ද්වේෂයෙහි මේ ආදීනවය දැක ද්වේෂප්‍රහාණය පණවම්හ. මෝහයෙහි මේ ආදීනවය දැක මෝහප්‍රහාණය පණවම්හ යි.

ඇවැත්නි, තෙල රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ ප්‍රහාණය පිණිස, මාර්ගයෙක් ඇත් ද? ප්‍රතිපදායෙක් ඇත් දැ යි? ඇවැත්නි, තෙල රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ ප්‍රහාණය පිණිස මාර්ගයෙක් ඇත. ප්‍රතිපදායෙක් ඇත, ඇවැත්නි, තෙල රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ ප්‍රහාණය පිණිස වැටෙන මාර්ග කවරේය? ප්‍රතිපදාව කවර? ඇවැත්නි, මේ අරි අටඟි මඟ මැ යි. හේ කෙසේය: සම්‍යග් දෘෂ්ටිය, ... සම්‍යක් සමාධි යි. ඇවැත්නි, තෙල රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ ප්‍රහාණය පිණිස මේ මගයි. මේ ප්‍රතිපදායි. ඇවැත්නි, තෙල රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ ප්‍රහාණය පිණිස වැටෙන මාර්ගය භද්‍රය. ප්‍රතිපදාව භද්‍රය. ඇවැත, ආනන්දයෙනි, අප්‍රමාදය පිණිස නිසිත් වෙයි.

3. 2. 3. 2.

[කොසඹෑ නිදානයි:]

22. එක් කලෙක ආයුෂ්මත් අනඳ තෙරණුවෝ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වෙසෙති. එකල එක්තරා ආජීවක ශ්‍රාවක වූ ගැහැවි-යෙක් ආයුෂ්මත් අනඳ තෙරණුවන් කරා එළඹියේය. එළඹ ආයුෂ්මත් අනඳ තෙරණුවන් ඇදුරු කොට වැඳ, එකත්පස්හි හිඳ. එකත්පස්හි හුන් ඒ ආජීවක ශ්‍රාවක වූ ගැහැවි ආයුෂ්මත් අනඳ තෙරණුවන්ට තෙල සැළ කෙළේය. වහන්ස, ආනන්දයෙනි, කවර කෙනකුන්ගේ දහම මොනොවට දෙසන ලද්දේ වේ ද? ලෝකයෙහි කවර කෙනෙක් සුපිළිපන් වෙත් ද? ලෝකයෙහි කවර කෙනෙක් මනා ගති ඇති වෙත් දැ යි?

ගැහැවියෙනි, එයින් තා ම මෙහි ලා පුළුවුස්නෙමි. යම් පරිදි තට රිසියේ නම් එපරිදි එය ප්‍රකාශ කරව. ගැහැවියෙනි, ඒ කිමැයි සිතවු ද? යම් කෙනෙක් රාගප්‍රහාණය සඳහා දහම් දෙසත් ද, ද්වේෂප්‍රහාණය සඳහා දහම් දෙසත් ද, මෝහප්‍රහාණය සඳහා දහම් දෙසත් ද, ඔවුන් විසින් ඒ දහම මොනොවට දෙසන ලද්දේ වේ ද, නොහොත් නො වේ ද? තට මෙහි ලා කෙසේ හෝ අදහස් වේ දැයි? වහන්ස, යම් කෙනෙක් රාගප්‍රහාණය සඳහා දහම් දෙසත් ද? ද්වේෂප්‍රහාණය ... මෝහප්‍රහාණය සඳහා දහම් දෙසත් ද, ඔවුන් විසින් ඒ දහම මොනොවට දෙසන ලද්දේ වෙයි. මෙහි ලා මට මෙසේ සිත් වෙයි.

ගැහැවියෙනි, ඒ කිමැයි සිතවු ද? යම් කෙනෙක් රාගප්‍රහාණය සඳහා පිළිපන්නාහු වෙත් ද, ද්වේෂප්‍රහාණය ... මෝහප්‍රහාණය සඳහා පිළිපන්නාහු වෙත් ද? ඔහු ලෝකයෙහි සුපිළිපන්හු වෙත් ද, නොහොත් නො වෙත් ද, තට මෙහි ලා කෙසේ හෝ අදහස් වේදැයි? වහන්ස, යම් කෙනෙක් රාගප්‍රහාණය සඳහා පිළිපන්නාහු වෙ ත් ද? ද්වේෂප්‍රහාණය ... මෝහප්‍රහාණය පිණිස පිළිපන්නාහු වෙත් ද, ඔහු ලෝකයෙහි සුපිළිපන් වෙති. මෙහි ලා මට මෙසේ අදහස් වෙයි.

තං කිංමඤ්ඤසි ගහපති යෙසං රාගො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො[1] ආයතිං අනුප්පාදධම්මො, යෙසං දොසො පහීනො -පෙ- යෙසං මොහො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො, තෙ ලොකෙ සුගතා, නො වා කථං වා තෙ එත්ථ හොතීති? යෙසං භන්තෙ රාගො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො, යෙසං දොසො පහීනො -පෙ- මොහො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො, තෙ ලොකෙ සුගතා. එවං මෙ එත්ථ හොතීති.

ඉති ඛො ගහපති තයා චෙතං ව්‍යාකතං. යෙ භන්තෙ රාගස්ස පහානාය ධම්මං දෙසෙන්ති, දොසස්ස -පෙ- මොහස්ස පහානාය ධම්මං දෙසෙන්ති තෙසං ධම්මො ස්වාක්ඛාතොති, තයා චෙතං[2] ව්‍යාකතං. යෙ භන්තෙ රාගස්ස පහානාය පටිපන්නා, දොසස්ස -පෙ- මොහස්ස පහානාය පටිපන්නා, තෙ ලොකෙ සුපටිපන්නාති, තයා චෙතං ව්‍යාකතං. යෙසං භන්තෙ රාගො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො, යෙසං දොසො පහීනො -පෙ- මොහො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො, තෙ ලොකෙ සුගතාති.[3]

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, න චෙව නාම සධම්මුක්කංසනා භවිස්සති, න ච පරධම්මාපසාදනා, ආයතනෙව ධම්මදෙසනා. අත්ථො ච වුත්තො. අත්තා ච අනුපනීතො.

තුම්හෙ භන්තෙ ආනන්ද රාගස්ස පහානාය ධම්මං දෙසෙථ, දොසස්ස පහානාය ධම්මං දෙසෙථ, මොහස්ස පහානාය ධම්මං දෙසෙථ. තුම්හාකං භන්තෙ ආනන්ද ධම්මො ස්වාක්ඛාතො. තුම්හෙ භන්තෙ ආනන්ද රාගස්ස පහානාය පටිපන්නා දොසස්ස -පෙ- මොහස්ස පහානාය පටිපන්නා. තුම්හෙ[4] ලොකෙ සුපටිපන්නා[5]. තුම්හාකං භන්තෙ ආනන්ද රාගො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. තුම්හාකං දොසො -පෙ- තුම්හාකං මොහො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො[1] ආයතිං අනුප්පාදධම්මො. තුම්හෙ ලොකෙ සුගතා.

1. අනභාවංකතො - මජසං. 2. තයාවෙතං - මජසං.
3. සුකතාති - මජසං. 4. තුම්හෙ භන්තෙ ලොකෙ - මජසං.
5. සුප්පටිපන්නා - මජසං.

ගැහැවියෙනි, ඒ කිසෙසින් සිතව් ද? යම් කෙනකුන්ගේ රාගය ප්‍රහත වේ ද, මුලුසුන් වේ ද, මුදුන් සුන් තලක් සේ අවස්තුකභාවය කරණ ලද්දේ වේ ද, අනභාව කරණ ලද්දේ වේ ද, මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ වේ ද, යම් කෙනකුන්ගේ ද්වේෂය ප්‍රහත වේ ද, ... යම් කෙනකුන්ගේ මෝහය ප්‍රහත වේ ද, මුලුසුන් වේ ද, මුදුන් සුන් තලක් සේ අවස්තුකභාවය කරණ ලද්දේ වේ ද, අනභාව කරණ ලද්දේ වේ ද, මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ වේ ද, ඔහු ලෝකයෙහි මනා ගති ඇති වෙත් ද? නොහේ වෙත් ද? මෙහි ලා තට කෙසේ හෝ අදහස් වේ දැයි? වහන්ස, යම් කෙනකුන්ගේ රාගය ප්‍රහත වේ නම්, මුලුසුන් වේ නම්, මුදුන් සුන් තලක් සේ අවස්තුකභාවය කරණ ලද්දේ වේ නම්, අනභාවය කරණ ලද්දේ වේ නම්, මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ වේ නම්, යම් කෙනකුන්ගේ ද්වේෂය ප්‍රහත වේ නම් ... මෝහය ප්‍රහත වේ නම්, මුලුසුන් වේ නම්, මුදුන් සුන් තලක් සේ අවස්තුකභාවය කරණ ලද්දේ වේ නම්, අනභාවය කරණ ලද්දේ වේ නම්, මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ වේ නම්, ඔහු ලෝකයෙහි මනාගති ඇති වෙති. මෙහි ලා මට මෙසේ අදහස් වෙයි.

ගැහැවියෙනි, "වහන්ස, යම් කෙනෙක් රාගප්‍රහාණය සඳහා දහම් දෙසත් ද, ද්වේෂප්‍රහාණය සඳහා ... මෝහප්‍රහාණය සඳහා දහම් දෙසත් ද, ඔවුන් විසින් ඒ දහම මොනොවට දෙසන ලද්දේ ය" යි මෙසේ තා විසින් ම තෙල ප්‍රශ්නය විසඳ කියන ලදී. 'වහන්ස, යම් කෙනෙක් රාගප්‍රහාණය පිණිස පිළිපන්නාහු වෙත් ද, ද්වේෂප්‍රහාණය පිණිස ... මෝහප්‍රහාණය පිණිස පිළිපන්නාහු වෙත් ද, ඔහු ලෝකයෙහි සුපිළිපන්හ' යි තා විසින් ම තෙල ප්‍රශ්නය විසඳ කියන ලදී. 'වහන්ස, යම් කෙනකුන්ගේ රාගය ප්‍රහත වේ නම්, මුලුසුන් වේ නම්, මුදුන් සුන් තලක් සේ අවස්තුකභාවය කරණ ලද්දේ වේ නම්, අනභාව කරණ ලද්දේ වේ නම්, මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ වේ නම්, යම් කෙනකුන්ගේ ද්වේෂය ප්‍රහත වේ නම් ... මෝහය ප්‍රහත වේ නම්, මුලුසුන් වේ නම්, මුදුන් සුන් තලක් සේ අවස්තුක-භාවය කරණ ලද්දේ වේ නම්, අනභාව කරණ ලද්දේ වේ නම්, මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ වේ නම්, ඔහු ලෝකයෙහි මනාගති ඇති වෙති' යි තා විසින් ම තෙල ප්‍රශ්නය විසඳ කියන ලදී.

වහන්ස, ඇඟිලි පොළන්නට නිසිය. වහන්ස, නොවූවිරියෙක, තමා ලද හුවා නො දක්වනු වෙයි. මෙරමා ලද හෙළනුදු නොවෙයි. නිසි කරුණෙහි ම දහම් දෙසුම වෙයි. පුළුවුත් පැනට අර්ථය ම පැවසිත. තෙමේත් (අපි මෙබන්දම්හ යි) එළවා නො දක්විත.

වහන්ස, ආනන්දයෙනි, තෙපි රාගප්‍රහාණය සඳහා දහම් දෙසව. ද්වේෂ-ප්‍රහාණය සඳහා දහම් දෙසව. මෝහප්‍රහාණය සඳහා දහම් දෙසව. වහන්ස, ආනන්දයෙනි, තොපගේ දහම මොනොවට පවසන ලදී. වහන්ස, ආනන්දයෙනි, තෙපි රාගප්‍රහාණය සඳහා පිළිපන්නාව. ද්වේෂප්‍රහාණය ... මෝහප්‍රහාණය සඳහා පිළිපන්නාව. තෙපි ලෝකයෙහි සුපිළිපන්නාව. වහන්ස, ආනන්දයෙනි, තොපගේ රාගය ප්‍රහත වෙයි. මුලුසුන් වෙයි මුදුන් සුන් තලක් සෙයින් අවස්තුකභාවය කරණ ලද්දේ වෙයි. අනභාව කරණ ලද්දේ වෙයි. මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ වෙයි. තොපගේ ද්වේෂය ... තොපගේ මෝහය ප්‍රහත වෙයි. මුලුසුන් වෙයි. මුදුන් සුන් තලක් සෙයින් අවස්තුක-භාවය කරණ ලද්දේ වෙයි. අනභාව කරණ ලද්දේ වෙයි. මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ වෙයි. තෙපි ලෝකයෙහි මනාගති ඇත්තාව.

අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති.[1] එවමෙවං අය්‍යෙන ආනන්දෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො.

එසාහං භන්තෙ ආනන්ද තං භගවන්තං සරණං ගච්ඡාමි, ධම්මං ච භික්ඛුසඞ්ඝං ච. උපාසකං මං අය්‍යො ආනන්දො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

**3. 2. 3. 3.**

[**කපිලවත්ථුනිදානං:**]

23. එකං සමයං භගවා **සක්කෙසු** විහරති **කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ**. තෙන ඛො පන සමයෙන භගවා ගිලානා[2] වුට්ඨිතො හොති අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා. අථ ඛො **මහානාමො** සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: දීඝරත්තාහං භන්තෙ භගවතා එවං ධම්මං දෙසිතං ආජානාමි: සමාහිතස්ස ඤාණං, නො අසමාහිතස්සාති. සමාධි නු ඛො භන්තෙ පුබ්බෙ, පච්ඡා ඤාණං. උදාහු ඤාණං පුබ්බෙ, පච්ඡා සමාධීති?

අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි. භගවා ඛො ගිලානා වුට්ඨිතො අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා; අයඤ්ච මහානාමො සක්කො භගවන්තං අතිගම්භීරං පඤ්හං පුච්ඡති. යන්නූනාහං මහානාමං සක්කං එකමන්තං අපනෙත්වා ධම්මං දෙසෙය්‍යන්ති.

අථ ඛො ආයස්මා **ආනන්දො** මහානාමං සක්කං බාහාය[3] ගහෙත්වා එකමන්තං අපනෙත්වා මහානාමං සක්කං එතදවොච: සෙඛම්පි ඛො මහානාම සීලං වුත්තං භගවතා, අසෙඛම්පි සීලං වුත්තං භගවතා, සෙඛොපි සමාධි වුත්තො භගවතා, අසෙඛොපි සමාධි වුත්තො භගවතා, සෙඛාපි පඤ්ඤා වුත්තා භගවතා, අසෙඛාපි පඤ්ඤා වුත්තා භගවතා.

කතමඤ්ච මහානාම සෙඛං සීලං: ඉධ මහානාම භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු ඉදං වුච්චති මහානාම සෙඛං සීලං. කතමො ච මහානාම සෙඛො සමාධි: ඉධ මහානාම භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති මහානාම සෙඛො සමාධි. කතමා ච මහානාම සෙඛා පඤ්ඤා: ඉධ මහානාම භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. අයං වුච්චති මහානාම සෙඛා පඤ්ඤා.

1 දක්ඛන්තීති - මජසං 2. ගිලානවුට්ඨිතො - මජසං. 3. බාහායං - මජසං

වහන්ස, ඉතා මැනව, වහන්ස, ඉතා මැනව. වහන්ස, යටිහුරු කරණ ලද්දක් හෝ යම්සේ උඩුහුරු කරන්නේ වේ ද, පිළිසන් දැයක් හෝ යම්සේ විවට කරන්නේ වේ ද, මං මුළාවූවක්හට හෝ යම්සේ මග කියන්නේ වේ ද, 'ඇස් ඇතියෝ රූපායතනයන් දක්නාහ' යි අඳුරෙහි හෝ යම්සේ තෙල් පහනක් දල්වන්නේ වේ ද, එපරිදි ම ආයු. ආනන්ද තෙරණුවන් විසින් අනෙකපර්‍යායයෙන් (නුන් අයුරින්) දහම් දෙසන ලදී.

වහන්ස, ආනන්දයෙනි, තෙල මම ඒ භගවත්හු ද දහම ද බික්සඟුන් ද සරණ යෙමි. ආයු. ආනන්ද තෙරණුවෝ අද පටන් කොට මා දිවියෙන් සරණ ගිය උපාසකයකු කොට ධරත්වා.

3. 2. 3. 3.

**[කිඹුල්වත්නිදානයි:]**

23. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **ශාක්‍යජනපදයෙහි කිඹුල්වත නිග්‍රොධාරාමයෙහි** වැඩ වසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ ගිලන් ව නැගී සිටි සේක් ගිලන් සෙයින් නැගිසිටි නොබෝකල් ඇති සේක. එක්බිති **මහානාම** සැහැරජ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේය. එළඹ භාග්‍ය-වතුන් වහන්සේ ඇදුරු කොට වැඳ එකත්පස්ව හිඳ. එකත්පස් ව හුන් මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේය. වහන්ස, 'එකඟ සිතැතියාහට ඥානය ඇත. එකඟ සිත් නැතියාහට ඥානය නැතැ'යි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ දෙසූ දහම මම දීර්ඝ-රාත්‍රයෙහි දැන සිටිමි. වහන්ස, කැල ම සමාධිය වේ ද? පසු ව ඥානය වේ ද? නොහොත් කැල ම ඥානය වේ ද? පසු ව ලා සමාධිය වේ දැ යි?

එසඳ ආයුෂමත් අනඳ තෙරණුවන්ට මෙබඳු සිතෙක් වී. භාග්‍යවතුන් වහන්සේ ගිලන්ව නැගිසිටි සේක් ගිලන් බැවින් නැගිසිටි නොබෝකල් ඇති සේක. වැලිදු මේ මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේ අතින් ඉගැඹුරු පැනක් පුළුවුස්නේය. මම මහානාම සැහැරජ එකත්පසෙකට ගෙණ ගොස් දහම් දෙසම් නම් මනා මැ නුයි.

එක්බිති ආයුෂමත් අනඳ තෙරණුවෝ මහානාම සැහැරජු අත්හි ගෙණ එකත්පසෙකට තෙරැ මහානාම සැහැරජුට තෙල කීහ: මහානාමයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ශෛක්‍ෂශීලයෙකු දු වදාරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් අශෛක්‍ෂශීලයෙකු දු වදාරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් ශෛක්‍ෂසමාධියෙකුදු වදාරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් අශෛක්‍ෂසමාධියෙකු දු වදාරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් ශෛක්‍ෂ-ප්‍රඥයෙකුදු වදාරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් අශෛක්‍ෂප්‍රඥයෙකුදු වදාරණ ලදී.

මහානාමයෙනි, ශෛක්‍ෂශීලය නම් කවරේ ය? මහානාමයෙනි, මෙසස්-නෙහි මහණ සිල්වත් වෙයි. ප්‍රාතිමොක්‍ෂ සංවරසංවෘතව ... මොනොවට ගෙණ ශික්‍ෂාපද විෂයෙහි හික්මෙයි. මහානාමයෙනි, මේ ශෛක්‍ෂශීලය යි කියනු ලැබේ. මහානාමයෙනි, ශෛක්‍ෂසමාධිය කවරේ ය? මහානාමයෙනි, මෙසස් නෙහි මහණ කාමයන් කෙරෙන් වෙන්ව ම...චතුර්ථධ්‍යානයට එළඹ වෙසෙයි. මහානාමයෙනි, මේ ශෛක්‍ෂසමාධිය යි කියනු ලැබේ. මහානාමයෙනි, ශෛක්‍ෂප්‍රඥව කවර? මහානාමයෙනි, මෙසස්නෙහි මහණ මේ දුකැයි යථාභූ-තය ප්‍රකාරයෙන් දන්නේය. ... මේ දුඃඛනිරොධගාමිනී වූ ප්‍රතිපත්තිය යි යථා-භූතය ප්‍රකාරයෙන් දන්නේය මහානාමයෙනි, මේ ශෛක්‍ෂප්‍රඥ යි කියනු ලැබේ.

ස ඛො සො මහානාම අරියසාවකො එවං සීලසම්පන්නො එවං සමාධිසම්පන්නො එවං පඤ්ඤාසම්පන්නො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

එවං ඛො මහානාම සෙඛම්පි සීලං වුත්තං භගවතා, අසෙඛම්පි සීලං වුත්තං භගවතා, සෙඛොපි සමාධි වුත්තො භගවතා, අසෙඛොපි සමාධි වුත්තො භගවතා, සෙඛාපි පඤ්ඤා වුත්තා භගවතා, අසෙඛාපි පඤ්ඤා වුත්තා භගවතාති.

### 3. 2. 3. 4

[වෙසාලිනිදානං:]

24. එකං සමයං ආයස්මා ආනන්දො වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො අභයො ච ලිච්ඡවි පණ්ඩිතකුමාරකො ච ලිච්ඡවි යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො අභයො ලිච්ඡවි ආයස්මන්තං ආනන්දං එතදවොච:

නිගණ්ඨො භන්තෙ නාතපුත්තො[1] සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති: චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිතන්ති. සො පුරාණානං කම්මානං තපසා ව්‍යන්තීභාවං පඤ්ඤපෙති, නවානං කම්මානං අකරණා සෙතුඝාතං. ඉති කම්මක්ඛයා දුක්ඛක්ඛයො, දුක්ඛක්ඛයා වෙදනාක්ඛයො, වෙදනාක්ඛයා සබ්බං දුක්ඛං නිජ්ජිණ්ණං භවිස්සති. එවමෙතිස්සා සන්දිට්ඨිකාය නිජ්ජරවිසුද්ධියා සමතික්කමො හොති.

ඉධ භන්තෙ භගවා කිමාහාති.

තිස්සො ඛො ඉමා අභය, නිජ්ජරවිසුද්ධියො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං[2] සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය.

කතමා තිස්සො: ඉධ අභය, භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. සො නවඤ්ච කම්මං න කරොති. පුරාණඤ්ච කම්මං ඵුස්ස ඵුස්ස ව්‍යන්තී කරොති. සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා[3] පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහීති.

1. නාථපුත්තො - සබ්බත්ථ. 2. සොකපරිදෙවානං - මජ්ඣං 3. ඕපනෙය්‍යිකා - මජ්ඣං

මහානාමයෙනි, ඒ අරිසවූ මෙබඳු සිල් ඇතියේ, මෙබඳු සමාධි ඇතියේ මේ බඳු පැණ ඇතියේ ආස්‍රවක්‍ෂයයෙන් අනාස්‍රව වූ රහත්ඵල සපියුතු සමාධි හා ප්‍රඥවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට උපයාගෙණ වෙසෙයි.

මහානාමයෙනි, මෙ පරිදි භාග්‍යවතුන් වහන්සේ විසින් ශෛක්‍ෂශීලය ද වදාරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් අශෛක්‍ෂ ශීලය ද වදාරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් ශෛක්‍ෂසමාධිය ද වදාරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් අශෛක්‍ෂ සමාධිය ද වදාරණ ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් ශෛක්‍ෂප්‍රඥව ද වදාරණ ලදූ. භාග්‍යවතුන් වහන්සේ විසින් අශෛක්‍ෂ-ප්‍රඥව ද වදාරණ ලදූ.

## 3. 2. 3. 4.

### [වෙශාලිනිදනයි]

24. එක් කලෙක ආයුෂ්මත් **අනද** තෙරණුවෝ **විශාලා** මහනුවර **මහාවනයෙහි කූටාගාරශාලායෙහි** (කැණි දී තැනූ කුළාරපහයෙහි) වැඩ වෙසෙති. එක්බිති **අභය** ලිච්ඡවි හා **පණ්ඩිතකුමාර** ලිච්ඡවි හා දෙදෙන ආයුෂ්මත් අනද තෙරණුවන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් අනද තෙරණුවන් සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස්ව හුන් අභය ලිච්ඡවි ආයුෂ්මත් අනද තෙරණුවන්ට මෙල කිය.

වහන්ස, නිගණ්ඨනාතපුත්‍ර 'ඇවිදුනා වූත් සිටුනා වූත් නිදන්නා වූත් නිදිවරන්නා වූත් මට නිරතුරු ඥනදශීනය එළඹ සිටිති'යි සර්වඥ යැයි සර්වදර්ශී යැ යි නිඃශේෂඥනයක් පිළිත කෙරෙයි. හේ පුරාණකර්මයන්ගේ තපසින් විගතාන්තභාවය පණවයි. නවකර්මයන්ගේ නොකිරීමෙන් සේතු-ඝාතය පණවයි. මෙසේ කර්මක්‍ෂය හේතුයෙන් දුඃඛක්‍ෂය වෙයි. දුඃඛක්‍ෂය-හේතුයෙන් වේදනාක්‍ෂය වෙයි. වේදනාක්‍ෂය හේතුයෙන් සර්වදුඃඛය නිර්ජීර්ණ වෙයි. මෙසේ මෙල සාන්දෘෂ්ටිකනිර්ජරාවිශුද්ධියෙන් භවසමතික්‍රමණය වේය යි කියා යි.

වහන්ස, මෙහි ලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදාරණ සේක් ද?

අභයයෙනි, සත්ත්වයන්ගේ විශුද්ධිය සඳහා ශෝකපරිදේවයන්ගේ සමති-ක්‍රමණය සඳහා දුඃඛදෞර්මනස්‍යයන්ගේ අස්තඞ්ගමය සඳහා මාර්ගයාගේ අධිගමය සඳහා නිර්වාණයාගේ ප්‍රත්‍යක්‍ෂ කරණය සඳහා අනාවරණඥනයෙන් සියල්ල දන්නා වූ සමන්තචක්‍ෂුයින් සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ තුන් වැදෑරුම් නිර්ජරා විශුද්ධිහු මොනොවට වදාරණ ලදහ.

කවර තුන් දෙනෙක යත්: අභයයෙනි, මෙසස්නෙහි මහණ සිල්වත් වෙයි. ... මොනොවට ගෙණ ශික්‍ෂාපදයෙහි හික්මෙයි. හේ නූතන වූත් කර්ම නො කෙරෙයි. පුරාණ වූත් කර්ම පුනපුනා විපාක ස්පර්ශ කොට විගතාන්ත කෙරෙයි. (මෙල) අකාලික වූ 'එව, බලව' යන විධියට යෝග්‍ය වූ උපනයනාර්හ වූ නුවණැතියන් විසින් තමා කෙරෙහි එළවා වෙදිතව්‍ය වූ සාන්දෘෂ්ටික නිර්ජරා විශුද්ධිය යි.

ස ඛො සො අභය, භික්ඛු එවං සීලසම්පන්නො විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො නවඤ්ච කම්මං න කරොති. පුරාණඤ්ච කම්මං ඵුස්ස ඵුස්ස ව්‍යන්තී කරොති. සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා[1] පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහීති.

සො අභය භික්ඛු එවං සීලසම්පන්නො එවං සමාධිසම්පන්නො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. සො නවඤ්ච කම්මං න කරොති. පුරාණඤ්ච කම්මං ඵුස්ස ඵුස්ස ව්‍යන්තී කරොති. සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා[1] පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහීති.

ඉමෙ ඛො අභය, තිස්සො නිජ්ජරා විසුද්ධියො තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා සත්තානං විසුද්ධියා සොක-පරිද්දවානං[2] සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියායාති.

එවං වුත්තෙ පණ්ඩිතකුමාරකො ලිච්ඡවි අභයං ලිච්ඡවිං එතදවොච:

කිං පන ත්වං සම්ම අභය, ආයස්මතො ආනන්දස්ස සුභාසිතං සුභාසිතතො නාබ්භනුමොදසීති.

කථාහං සම්ම[3] ආයස්මතො ආනන්දස්ස සුභාසිතං සුභාසිතතො නාබ්භනු-මොදිස්සාමි, මුද්ධාපි තස්ස විපතෙය්‍ය, යො ආයස්මතො ආනන්දස්ස සුභාසිතං සුභාසිතතො නාබ්භනුමොදෙය්‍යාති.

### 3. 2. 3. 5

**[සාවජ්ජනිද්දනං:]**

25. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

යෙ[4] ආනන්ද අනුකම්පෙය්‍යාථ යෙ ච සොතබ්බං මඤ්ඤෙය්‍යුං මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා, තෙ වො ආනන්ද තීසු ඨානෙසු සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා.

කතමෙසු තීසු: බුද්ධෙ අවෙච්චප්පසාදෙ සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති.

1. ඔපනෙය්‍යිකා - මජසං. 2. සොකපරිදෙවානං - මජසං.
3. සම්ම පණ්ඩිතකුමාරක - මජසං. 4. යං - සාළුවි.

අභයයෙනි, ඒ මහණ මෙ පරිදි සිල් ඇතියේ කාමයන් කෙරෙන් වෙන් ව ම ... චතුර්ථධ්‍යානයට සම්වැද වෙසෙයි. හේ නූතන වූත් කම් නොකෙරෙයි. පුරාණ වූත් කම් විපාක විසින් පුනපුනා ස්පර්ශ කොට විගතාන්ත කෙරෙයි. (හෙල) අකාලික වූ 'එව, බලව' යන විධියට යෝග්‍ය වූ උපනයනාර්ථ වූ නුවණැතියන් විසින් තමා කෙරෙහි එළවා වෙදිතව්‍ය වූ සාන්දෘෂ්ටික නිර්ජරා විශුද්ධිය යි.

අභයයෙනි, ඒ මහණ මෙපරිදි සිල් ඇතියේ මෙපරිදි සමාධි ඇතියේ ආශ්‍රවක්ෂයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ගෙණ උපයා වෙසෙයි. හේ නූතන වූත් කම් නොකෙරෙයි. පුරාණ වූත් කම් ස්පර්ශ කොට කොට විගතාන්ත කෙරෙයි. (හෙල) අකාලික වූ 'එව, බලව' යන විධියට යෝග්‍ය වූ උපනයනාර්ථ වූ නුවණැතියන් විසින් තමා කෙරෙහි එළවා වෙදිතව්‍ය වූ සාන්දෘෂ්ටික නිර්ජරා විශුද්ධිය යි.

අභයයෙනි, සත්ත්වයන්ගේ විශුද්ධිය සඳහා ශෝකපරිදේවයන්ගේ සමතික්‍රමණය සඳහා දුඃඛදෞර්මනස්‍යයන් නතයට යනු සඳහා අර්හත්ත්වමාර්ගයාගේ අධිගමය සඳහා නිර්වාණයාගේ ප්‍රත්‍යක්ෂකරණය සඳහා සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ තුන් වැදෑරුම් නිර්ජරාවිශුද්ධීහු මොනොවට වදාරණ ලදහ.

මෙසේ වදාළ කල්හි පණ්ඩිතකුමාර ලිච්ඡවි අභය ලිච්ඡවිහට මෙල කිය:

යහළු අභයයෙනි, කිම, තො ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ගේ සුභාෂිතය සුභාෂිත විසින් නො අනුමෙවූතෙහි ද?

යහළුව, කිමෙක, මම ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ගේ සුභාෂිතය සුභාෂිත විසින් නො අනුමෙවූතෙම් වෙම් ද, යමෙක් ආයුෂ්මත් අනඳ තෙරණුවන්ගේ සුභාෂිතය සුභාෂිත විසින් නොඅනුමෙවූයේ වේ නම් ඔහුගේ හිසත් ඇදහෙන්නේ ය.

3. 2. 3 5

[සැවැත්නිදානයි:]

25. එක්කලෙක ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ මෙල වදාළහ:

ආනන්දය, යම් කෙනකුන්ට අනුකම්පා කරව් ද මිත්‍රයෝ වෙත්ව යි, සුහෘදයෝ වෙත්ව යි, නැදිමිසිල් දෙපස නෑයෝ වෙත්වයි, භ්‍රාතෘභගිත්‍යාදි සාලේ නෑයෝ වෙත්ව යි ඒ යම් කෙනෙක් (තොපගේ බස) ඇසියයුතු කොට හඟිත් ද, ආනන්දය,තොප විසින් ඔහු තුන් තැනෙක්හි ලා සමාදන් කරවිය යුතුවහ. ඇතුළත් කරවිය යුතුවහ. පිහිටුවාලිය යුතුවහ.

කවර තුන් තැනෙක යත්: බුදුන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙහි සමාදන් කරවිය යුතුවහ. ඇතුළත් කරවිය යුතුවහ. පිහිටුවා ලිය යුතුවහ. "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණිනුදු අර්හත්හ. සම්‍යක්සම්බුද්ධයහ ... දෙව්මිනිස්නට ශාස්තෘහ. චතුස්සත්‍යය අවබොධ කළහ. භාග්‍යවත්හ නියා සි.

ධම්මෙ අවෙච්චප්පසාදෙ සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා: 'ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී''ති.

සඞ්ඝෙ අවෙච්චප්පසාදෙ සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා: ''සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා''ති.

සියා ආනන්ද, චතුන්නං මහාභූතානං අඤ්ඤථත්තං පඨවිධාතුයා ආපොධාතුයා තෙජොධාතුයා වායොධාතුයා. නත්වෙව බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතස්ස අරියසාවකස්ස සියා අඤ්ඤථත්තං. තත්‍රිදං අඤ්ඤථත්තං: සො වතානන්ද බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො අරියසාවකො නිරයං වා තිරච්ඡානයොනිං වා පෙත්තිවිසයං වා උපපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සියා ආනන්ද, චතුන්නං මහාභූතානං අඤ්ඤථත්තං පඨවිධාතුයා ආපොධාතුයා තෙජොධාතුයා වායොධාතුයා. නත්වෙව ධම්මෙ -පෙ- නත්වෙව සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතස්ස අරියසාවකස්ස සියා අඤ්ඤථත්තං. තත්‍රිදං අඤ්ඤථත්තං: සො වතානන්ද, සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො අරියසාවකො නිරයං වා තිරච්ඡානයොනිං වා පෙත්තිවිසයං වා උපපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

යෙ ආනන්ද, අනුකම්පෙය්‍යාථ යෙ ච සොතබ්බං මඤ්ඤෙය්‍යුං මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා, තෙ වො ආනන්ද, ඉමෙසු තීසු ඨානෙසු සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බාති.

## 3. 2. 3. 6

26 අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා -පෙ- භගවන්තං එතදවොච: 'භවො, භවො'ති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ භවො හොතීති?

කාමධාතුවෙපක්කඤ්ච ආනන්ද, කම්මං නාභවිස්ස අපි නු ඛො කාමභවො පඤ්ඤායෙථාති?

නො හෙතං භන්තෙ.

ඉති ඛො ආනන්ද, කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො.[1] අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං හීනාය ධාතුයා විඤ්ඤාණං පතිට්ඨිතං. එවං ආයති[2] පුනබ්භවාභිනිබ්බත්ති හොති.

1 තණ්හාසෙනහො - මජසං. 2. ආයතිං - මජසං.

ධර්මයෙහි අවෙත්‍යප්‍රසාදයෙහි සමාදන් කරවිය යුතුවහ. ඇතුළත් කරවිය යුතුවහ. පිහිටුවාලිය යුතුවහ. 'භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මොනොවට වදාරණ ලද්දේය. සාන්දෘෂ්ටිකය. ... නුවණැතියන් විසින් සියසතන්හි ලා දතයුතුය' කියා යි.

සඟුන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙහි සමාදන් කරවිය යුතුවහ. ඇතුළත් කරවිය යුතුවහ. පිහිටුවාලිය යුතුවහ. 'භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා සුපිළිපන ... ලෝකයට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍රය'කියා යි.

ආනන්දය, පෘථිවිධාතු, අබ්ධාතු, තේජෝධාතු, වායෝධාතු යන සතර මහාභූතයන්ගේ අන්‍යථාත්වය වෙයි. බුදුන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්‍වාගත ආර්‍යශ්‍රාවකයාගේ අන්‍යථාත්වයෙක් නො ම වෙයි. එහි මේ වෙනසයි: ආනන්දය, බුදුන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්‍වාගත ආර්‍යශ්‍රාවක නිරයට හෝ තිරිසන් ගතියට හෝ ප්‍රෙතවිෂයට හෝ එළඹෙන්නේය යන මෙල කරුණ සිදු නොවේ.

ආනන්දය, පෘථිවිධාතු, අබ්ධාතු, තේජෝ ධාතු, වායෝධාතු යන සතර මහාභූතයන්ගේ අන්‍යථාත්වය වෙයි. ධර්මයෙහි ... සඞ්ඝයා කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්‍වාගත ආර්‍යශ්‍රාවකයාගේ අන්‍යථාත්වයෙක් නො ම වෙයි. එහි මේ වෙනසයි: ආනන්දය, සඟුන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්‍වාගත ඒ ආර්‍යශ්‍රාවක එකාන්තයෙන් නිරයට හෝ තිරිසන් යොනියට හෝ ප්‍රෙතවිෂයට හෝ එළඹෙන්නේය යන මෙ කරුණ සිදු නොවෙයි.

ආනන්දය, යම් කෙනකුන්ට අනුකම්පා කරව් ද, මිත්‍රයෝ හෝ සුහෘදයෝ හෝ නෑයෝ හෝ සාලේ නෑයෝ හෝ යම් කෙනෙක් (තොපගේ බස) ඇසිය යුතු කොට සිතත් ද, ආනන්දය, තොප විසින් ඔහු මේ තුන් තන්හි සමාදන් කරවිය යුතුවහ. ඇතුළත් කරවිය යුතුවහ. පිහිටුවිය යුතුවහ.

### 3. 2. 3. 6.

26. එකල්හි ආයුෂමත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ ... භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කළහ: වහන්ස, 'භවය, භවය'යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් භවය වේ ද?

ආනන්දය, කාමධාතුයෙහි විපාක්වස්තා කර්මයෙක් නො වී නම් කාමභවයෙක් කිම, පැණේ ද?

වහන්ස, මෙල එසේ නො පැණෙයි.

ආනන්දය, මෙසේ කර්මය ක්‍ෂේත්‍රය වෙයි. අභිසංස්කාර විඥානය බීජය වෙයි. තෘෂ්ණාව උදකය වෙයි. අවිද්‍යායෙන් ඇවුරුණු, තෘෂ්ණාබන්ධනයෙන් බැඳුනු සත්ත්වයන්ගේ කාමධාතුයෙහි විඥානය පිහිටියේ ය. මෙසේ මතුයෙහි පුනර්භව සඞ්ඛ්‍යාත අභිනිර්වෘතිය වේ.

රූපධාතුවෙපක්කඤ්ච ආනන්ද, කම්මං නාභවිස්ස, අපි නු බො රූපභවො පඤ්ඤායෙථා?ති.

නො හෙතං භන්තෙ.

ඉති බො ආනන්ද, කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො. අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං මජ්ඣිමාය ධාතුයා විඤ්ඤාණං පතිට්ඨිතං. එවං ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොති.

අරූපධාතුවෙපක්කඤ්ච ආනන්ද කම්මං නා භවිස්ස, අපි නු බො අරූපභවො පඤ්ඤායෙථා?ති.

නො හෙතං භන්තෙ.

ඉති බො ආනන්ද, කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො. අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං පණීතාය ධාතුයා විඤ්ඤාණං පතිට්ඨිතං. එවං ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොති. එවං බො ආනන්ද, භවො හොතී'ති.

3. 2. 3. 7

27. අථ බො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො බො ආයස්මා ආනන්දො -පෙ- භගවන්තං එතදවොච:

'භවො, භවො'ති භන්තෙ වුච්චති, කිත්තාවතා නු බො භන්තෙ භවො හොතීති?.

කාමධාතුවෙපක්කඤ්ච ආනන්ද, කම්මං නාභවිස්ස, අපි නු බො කාමභවො පඤ්ඤායෙථාති?.

නො හෙතං භන්තෙ.

ඉති බො ආනන්ද, කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො.[1] අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං හීනාය ධාතුයා චෙතනා පතිට්ඨිතා, පත්ථනා පතිට්ඨිතා. එවං ආයතිං[2]. පුනබ්භවාභිනිබ්බත්ති හොති.

රූපධාතුවෙපක්කඤ්ච ආනන්ද, කම්මං නාභවිස්ස, අපි නු බො රූපභවො පඤ්ඤායෙථාති?

නො හෙතං භන්තෙ.

ඉති බො ආනන්ද, කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො. අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං මජ්ඣිමාය ධාතුයා චෙතනා පතිට්ඨිතා, පත්ථනා පතිට්ඨිතා. එවං ආයතිං[2] පුනබ්භවාභිනිබ්බත්ති හොති.

1 සෙනෙහො - මජසං. 2 ආයතිං - මජසං.

ආනන්දය, රූපධාතුයෙහි විපක්නා කර්මය නො වී නම් රූපභවය කිම, පැණේ ද?

වහන්ස, තෙල එසේ නොවේ මැයි.

ආනන්දය, මෙසේ කර්මය ක්ෂේත්‍රය වෙයි අභිසංස්කාරවිඥානය බීජය වෙයි. තෘෂ්ණාව උදකය වේ. අවිද්‍යායෙන් ඇවුරුණු තෘෂ්ණා බන්ධනයෙන් බැඳුනු සත්ත්වයන්ගේ රූපධාතුයෙහි විඥානය පිහිටියේ වෙයි. මෙසේ මතුයෙහි පුනර්භව සඞ්ඛ්‍යාත අභිනිර්වෘතිය වෙයි

ආනන්දය, අරූපධාතුයෙහි විපක්නා කර්මය නො වී නම් අරූපභවයෙක් කිම, පැණේ ද?

වහන්ස, තෙල එසේ නොවේ මැයි.

ආනන්දය, මෙසේ කර්මය ක්ෂේත්‍රය වෙයි. අභිසංස්කාරවිඥානය බීජය වෙයි. තෘෂ්ණාව උදකය වෙයි. අවිද්‍යායෙන් ඇවුරුණු තෘෂ්ණාබන්ධනයෙන් බැඳුනු සත්ත්වයන්ගේ අරූපධාතුයෙහි විඥානය පිහිටියේ වෙයි. මෙසේ මතුයෙහි පුනර්භව සඞ්ඛ්‍යාත අභිනිර්වෘතිය වෙයි. ආනන්දය, මෙසේ භවය වෙයි.

### 3. 2. 3. 7.

27. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එකත්පස්ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ... භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ:

වහන්ස, 'භවය, භවය'යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් භවය වේ ද යි?

ආනන්දය, කාමධාතුයෙහි විපක්නා කර්මයෙක් නො වී නම්, කාමභවය කිම, පැණේ ද?

වහන්ස, තෙල නොවේ මැයි.

ආනන්දය, මෙසේ කර්මය ක්ෂේත්‍ර වෙයි. (සහජාත) අභිසංස්කාරවිඥානය බීජ වෙයි. තෘෂ්ණාව උදක වෙයි. අවිද්‍යායෙන් ඇවුරුණු තෘෂ්ණාබන්ධනයෙන් බැඳුනු සත්ත්වයන්ගේ කාමධාතුයෙහි කර්මචේතනාව පිහිටියාය, කර්ම ප්‍රාර්ථනාව පිහිටියාය. මෙසේ මතුයෙහි පුනර්භව සඞ්ඛ්‍යාත අභිනිර්වෘතිය වේ.

ආනන්දය, රූපධාතුයෙහි විපක්නා කර්මයෙක් නො වී නම්, රූපධාතුව කිම, පැණේ ද ?

වහන්ස, තෙල නොවේ මැයි.

ආනන්දය, මෙසේ කර්මය ක්ෂේත්‍ර වෙයි. අභිසංස්කාරවිඥානය බීජ වෙයි. තෘෂ්ණාව උදක වෙයි. අවිද්‍යායෙන් ඇවුරුණු තෘෂ්ණාබන්ධනයෙන් බැඳුනු සත්ත්වයන්ගේ කර්මචේතනාව රූප ධාතුයෙහි පිහිටියාය. කර්මප්‍රාර්ථනාව පිහිටියාය. මෙසේ මතුයෙහි පුනර්භව සඞ්ඛ්‍යාත අභිනිර්වෘතිය වෙයි.

අරූපධාතුවෙපක්කඤ්ච ආනන්ද කම්මං නාභවිස්ස, අපි නු ඛො අරූපභවො පඤ්ඤායෙථාති?

නො හෙතං භන්තෙ.

ඉති ඛො ආනන්ද කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො. අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං පණීතාය ධාතුයා චෙතනා පතිට්ඨිතා. පත්ථනා පතිට්ඨිතා. එවං ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොති. එවං ඛො ආනන්ද භවො හොතීති.

3. 2. 3. 8.

28. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

සබ්බං නු ඛො ආනන්ද සීලබ්බතං ජීවිතං බ්‍රහ්මචරියං උපට්ඨානසාරං සඵලන්ති.

න ඛ්වෙත්ථ භන්තෙ එකංසෙනාති.

තෙන හානන්ද විභජස්සූති.

යං හිස්ස භන්තෙ සීලබ්බතං ජීවිතං බ්‍රහ්මචරියං උපට්ඨානසාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපං සීලබ්බතං ජීවිතං බ්‍රහ්මචරියං උපට්ඨානසාරං අඵලං.

යඤ්ච ඛ්වාස්ස භන්තෙ සීලබ්බතං ජීවිතං බ්‍රහ්මචරියං උපට්ඨානසාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපං සීලබ්බතං ජීවිතං බ්‍රහ්මචරියං උපට්ඨානසාරං සඵලන්ති.

ඉදමවොච ආයස්මා ආනන්දො. සමනුඤ්ඤො සත්ථා අහොසි. අථ ඛො ආයස්මා ආනන්දො "සමනුඤ්ඤො මෙ සත්ථා"ති උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො භගවා අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ආනන්දෙ භික්ඛූ ආමන්තෙසි:

සෙඛො භික්ඛවෙ ආනන්දො, න ච පනස්ස සුලභරූපො සමසමො පඤ්ඤායාති.

3. 2. 3. 9.

29. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

තීණිමානි භන්තෙ ගන්ධජාතානි යෙසං අනුවාතඤ්ඤෙව ගන්ධො ගච්ඡති, නො පටිවාතං.

ආනන්දය, අරූපධාතුයෙහි විපක්වන කර්මයෙක් නො වී නම්, අරූපභවයෙක් කිම, පැණේ ද?

වහන්ස, තෙල නො වේ මැයි.

ආනන්දය, මෙසේ කර්මය ක්ෂේත්‍ර වෙයි. අභිසංස්කාරවිඥානය බීජ වෙයි. තෘෂ්ණාව උදක වේ. අවිද්‍යායෙන් ඇවුරුණු තෘෂ්ණාබන්ධනයෙන් බැඳුනු සත්ත්වයන්ගේ කර්මචේතනාව අරූපධාතුයෙහි පිහිටියාය. කර්මප්‍රාර්ථනාව පිහිටියාය. මෙසේ මතුයෙහි පුනර්භව සඞ්ඛ්‍යාත අභිනිර්වෘත්තිය වෙයි. ආනන්දය, මෙසේ භවය වෙයි.

## 3. 2. 3. 8.

28. එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පස්ව හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

ආනන්දය, හැම ශීලව්‍රතයෙක් දුෂ්කරකාරිකානුයොග සඞ්ඛ්‍යාත ජීවිත වූයේ බඹසර වූයේ වටනහර වූයේ සඵල වේ දූ සි?

වහන්ස, මේහිලා ඒකාන්තවශයෙන් එසේමය යි නොකියැ හෙයි.

ආනන්දය, එසේ වී නම් බෙදලවයි.

වහන්ස, යම් ශීලව්‍රතයෙක් දුෂ්කරකාරිකානුයොග සඞ්ඛ්‍යාත ජීවිත වේ ද, බඹසර වේ ද, මේ සාරයයි වැටහුනේ වේ ද, එය සෙවුනහුගේ අකුසල් දහම්හු වැඩෙත් නම්, කුසල් දහම්හු පිරිහෙත් නම්, මෙබඳු වූ ශීලව්‍රතය ජීවිත වූයේ බ්‍රහ්මචර්‍ය්‍ය වූයේ උපස්ථාන සාර වූයේ අඵල වෙයි.

වහන්ස, යම් ශීලව්‍රතයෙක් ජීවිත වේ ද, බ්‍රහ්මචර්‍ය්‍ය වේ ද, උපස්ථානසාර වේ ද, එය සෙවුනහුගේ අකුසල් දහම්හු පිරිහෙත් නම්, කුසල්දහම්හු වැඩෙත් නම්, මෙබඳු ශීලව්‍රතය ජීවිත වූයේ, බ්‍රහ්මචර්‍ය්‍ය වූයේ උපස්ථානසාර වූයේ සඵල වෙයි.

ආයුෂ්මත් අනඳ තෙරණුවෝ තෙල සැල කළහ. ශාස්තෘන් වහන්සේ අනුදත් සේක. එක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ මබස අනුදත් සේකැ යි හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියහ.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරණුවන් වඩනා හා ම භික්ෂූන් ඇමතූ සේක:

මහණෙනි, අනඳ තෙරණුවෝ ශෛක්ෂයහ. ඔහුට ප්‍රඥායෙන් සම්සමයෙක් දුලභ නො ද වේ.

## 3. 2. 3. 9.

29. එකල ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ ... එකත්පස්ව හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ:

වහන්ස, යම් ගන්ධජාතයන්ගේ ගඳෙක් අනුවාතයට ම හමා ද, පටිවාතයට නො හමා ද, එබඳු මේ ගන්ධජාතයෝ තුන් දෙනෙකි.

කතමානි තීණි: මූලගන්ධො සාරගන්ධො පුප්ඵගන්ධො. ඉමානි ඛො භන්තෙ තීණි ගන්ධජාතානි යෙසං අනුවාතඤ්ඤෙව ගන්ධො ගච්ඡති, නො පටිවාතං.

අත්ථි නු ඛො භන්තෙ කිඤ්චි ගන්ධජාතං යස්ස අනුවාතම්පි ගන්ධො ගච්ඡති, පටිවාතම්පි ගන්ධො ගච්ඡති, අනුවාතපටිවාතම්පි ගන්ධො ගච්ඡතීති?

අත්ථානන්ද[1] ගන්ධජාතං යස්ස අනුවාතම්පි ගන්ධො ගච්ඡති, පටිවාතම්පි ගන්ධො ගච්ඡති, අනුවාතපටිවාතම්පි ගන්ධො ගච්ඡතීති.

කතමඤ්ච පන තං භන්තෙ ගන්ධජාතං, යස්ස අනුවාතම්පි ගන්ධො ගච්ඡති, පටිවාතම්පි ගන්ධො ගච්ඡති, අනුවාතපටිවාතම්පි ගන්ධො ගච්ඡතීති?

ඉධානන්ද යස්මිං ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා පුරිසො වා බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සඞ්ඝං සරණං ගතො හොති. පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, සීලවා හොති, කල්‍යාණධම්මො, විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො. තස්ස දිසාසු සමණබ්‍රාහ්මණා වණ්ණං භාසන්ති: අසුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා පුරිසො වා බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සඞ්ඝං සරණං ගතො හොති, පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, සීලවා හොති, කල්‍යාණධම්මො. විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතොති.

දෙවතාපිස්ස අමනුස්සා වණ්ණං භාසන්ති: අසුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා පුරිසො වා බුද්ධං සරණං -පෙ- ධම්මං සරණං -පෙ- සඞ්ඝං සරණං ගතො හොති, පාණාතිපාතා පටිවිරතො -පෙ- දානසංවිභාගරතොති.

ඉදං ඛො තං ආනන්ද ගන්ධජාතං යස්ස අනුවාතම්පි ගන්ධො ගච්ඡති, පටිවාතම්පි ගන්ධො ගච්ඡති, අනුවාතපටිවාතම්පි ගන්ධො ගච්ඡතීති.

36. න පුප්ඵගන්ධො පටිවාතමෙති
න චන්දනං [2]තගරමල්ලිකා වා,
සතඤ්ච ගන්ධො පටිවාතමෙති
සබ්බා දිසා සප්පුරිසො පවාතීති.

1. අත්ථානන්ද කිඤ්චි - මජසං. 2 තගරමල්ලිකා වා. P.T.S.

කවර තුන් දෙනෙකු යත්: මූලගන්ධය, සාරගන්ධය, පුෂ්පගන්ධයි. වහන්ස, යම් ගන්ධජාතයන්ගේ ගඳෙක් අනුවාතයට ම හමා ද, පටිවාතයට නො හමා ද, මේ ඒ ගන්ධජාතයෝ තුන් දෙනාය.

වහන්ස, යම් ගන්ධජාතයක්හුගේ ගන්ධය අනුවාතයටත් හමා ද, පටිවාතයටත් හමා ද, අනුවාත පටිවාතයටත් හමා ද, එබඳු කිසි ගන්ධජාතයෙක් ඇත් ද?

ආනන්දය, යම් ගන්ධජාතයක්හුගේ ගන්ධය අනුවාතයටත් හමා ද, පටිවාතයටත් හමා ද, අනුවාතපටිවාතයටත් හමා ද. එබඳු ගන්ධජාතයෙක් ඇත.

වහන්ස, යම් ගන්ධජාතයක්හුගේ ගන්ධය අනුවාතයටත් හමා ද, පටිවාතයටත් හමා ද, අනුවාතපටිවාතයටත් හමා ද, එබඳු ගන්ධජාතය කවරේ ය?

ආනන්දය, මෙලොව යම් ගමෙක වේවයි, නියම් ගමෙක වේවයි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ බුදුන් සරණ ගියේ වේ ද, දහම් සරණ ගියේ වේ ද, සඟුන් සරණ ගියේ වේ ද, පණිවායෙන් දුරුවූයේ වේ ද, අයිනාදනින් දුරුවූයේ වේ ද, කාමයෙහි මිස හසරින් දුරුවූයේ වේ ද, මුසවායෙන් දුරුවූයේ වේ ද, පමාවරදට කරුණු වූ රහමෙරමදින් දුරුවූයේ වේ ද, සිල්වත් වේ ද, කලණදහම් ඇතියේ වේ ද, පැහැ මලමසුරු ඇති සිතින් ගිහිගෙහි වෙසේ ද, මුදුදෙත ත්‍යාග ඇතියේ ද, දෙනුවට දෙවි අත් ඇතියේ වේ ද, දීමෙහි ඇලුනේ වේ ද, යදනට නිසිවූයේ වේ ද, දන් හා සංවිභාගයෙහි ඇලුනේ වේ ද, ඔහුගේ ගුණ ඒ ඒ දික්හි මහණබමුණෝ බෙණෙත්. "අසෝ ගම හෝ නියම්ගම හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් බුදුන් සරණ ගියේ වෙයි. දහම් සරණ ගියේ වෙයි. සඟුන් සරණ ගියේ වෙයි. පණිවායෙන් දුරුවූයේ වෙයි. අයිනාදනින් දුරුවූයේ වෙයි කාමයෙහි මිස හසරින් දුරුවූයේ වෙයි. මුසවායෙන් දුරුවූයේ වෙයි. පමාවරදට කරුණු වූ රහමෙරමදින් දුරුවූයේ වෙයි සිල්වත් වෙයි. කලණදහම් ඇතියේ වෙයි. පැහැ මලමසුරු ඇති සිතින් ගිහිගෙහි වෙසෙයි. මුදුදෙත ත්‍යාග ඇතියේ වෙයි. දෙනුවට දෙවි අත් ඇතියේ වෙයි. දීමෙහි ඇලුනේ වෙයි. යැදිවත් දීමෙන් යාවයොග වෙයි. දීමෙහි හා සංවිභාගයෙහි ඇලුනේ වෙයි" කියති.

මනුෂ්‍ය නොවන දෙවියෝත් පවා ඔහුගේ ගුණ කියත්: "අසුවල් ගම හෝ නියම්ගම හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ බුදුන් සරණ … දහම් සරණ … සඟුන් සරණ ගියේ වෙයි, පණිවායෙන් දුරුවූයේ වෙයි, … දීමෙහි හා සංවිභාගයෙහි ඇලුනේත් වෙයි" කියති.

ආනන්දය, යම් ගන්ධජාතයක්හුගේ ගන්ධය අනුවාතයටත් හමා ද පටිවාතයටත් හමා ද අනුවාතපටිවාතයටත් හමා ද, මේ ඒ ගන්ධජාතයයි.

36 පුෂ්පගන්ධය උඩුසුළඟට නොහමයි. සඳුන් තුවරලා, සමන්සුවඳ හෝ උඩුසුළඟට නොහමයි. සත්පුරුෂයන්ගේ ගුණගන්ධය උඩුසුළඟට හමා. සත්පුරුෂ තෙමේ හැම දික්හි ම වැතිරෙසි. (ගුණ සුවඳින් හැමේ.)

## 3. 2. 3. 10.

30. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: "භගවතො ආනන්ද සිඛිස්ස අභිභූ නාම සාවකො බ්‍රහ්මලොකෙ ඨිතො සහස්සීලොකධාතුං සරෙන විඤ්ඤාපෙසී"ති. භගවා පන භන්තෙ අරහං සම්මාසම්බුද්ධො කීවතකං පහොති සරෙන විඤ්ඤාපෙතුන්ති.

සාවකො සො ආනන්ද, අප්පමෙය්‍යා තථාගතාති.

දුතියම්පි ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: සම්මුඛා මෙතං භන්තෙ -පෙ- සාවකො සො ආනන්ද, අප්පමෙය්‍යා තථාගතාති.

තතියම්පි ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: සම්මුඛා මෙතං භන්තෙ භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං: "භගවතො ආනන්ද, සිඛිස්ස අභිභූ නාම සාවකො බ්‍රහ්මලොකෙ ඨිතො සහස්සීලොකධාතුං සරෙන විඤ්ඤාපෙසී"ති. භගවා පන භන්තෙ අරහං සම්මාසම්බුද්ධො කිවතකං පහොති සරෙන විඤ්ඤාපෙතුන්ති.

සුතා තෙ ආනන්ද සහස්සී චූළනිකා ලොකධාතූති:

එතස්ස භගවා කාලො එතස්ස සුගත කාලො යං භගවා භාසෙය්‍ය, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙන හානන්ද සුණාහි -පෙ- යාවතා ආනන්ද චන්දිමසූරියා පරිහරන්ති, දිසා භන්ති විරොචනා, තාව සහස්සධා ලොකො. තස්මිං සහස්සධා ලොකෙ සහස්සං චන්දානං, සහස්සං සූරියානං, සහස්සං සිනෙරුපබ්බතරාජානං, සහස්සං ජම්බුදීපානං, සහස්සං අපරගොයානානං, සහස්සං උත්තරකුරූනං, සහස්සං පුබ්බවිදෙහානං, චත්තාරි මහාසමුද්දසහස්සානි, චත්තාරි මහාරාජසහස්සානි, සහස්සං චාතුම්මහාරාජිකානං, සහස්සං තාවතිංසානං, සහස්සං යාමානං, සහස්සං තුසිතානං, සහස්සං නිම්මාණරතීනං, සහස්සං පරනිම්මිතවසවත්තීනං, සහස්සං බ්‍රහ්මලොකානං. අයං වුච්චතානන්ද සහස්සී චූළනිකා ලොකධාතු.

**3. 2. 3. 10.**

30. **එකල ආයුෂ්මත් අනඳ** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ: වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි තෙල අසන ලදී: හමුයෙහි පිළිගන්නා ලදී: "ආනන්‍දය, **සිඛී** සම්මා සම්බුදුන්ගේ **අභිභූ** නම් ශ්‍රාවක බඹලොව සිටියේ සහස්‍රී ලෝකධාතුව ස්වරයෙන් විඥාපනය කෙළේය"යි. වහන්ස, අතීත් සම්‍යක්සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ එතාගි කෙතෙක් තැන් ස්වරයෙන් විඥාපනය කරන්නට සමර්ථ වෙති හෝ යි?

ආනන්‍දය, හේ ශ්‍රාවකයෙක; තථාගතයෝ එතාගි අපරිමේය වෙති.

දෙවනවටත් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ: වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි තෙල ... ආනන්‍දය, හේ ශ්‍රාවකයෙක; තථාගතයෝ එතාගි අපරිමේය වෙති.

තෙවනවටත් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ: වහන්ස, මා විසින් භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි තෙල අසන ලද: හමුයෙහි පිළිගන්නා ලද: "ආනන්‍දය, සිඛී සම්මා සම්බුදුන්ගේ අභිභූ නම් ශ්‍රාවක බඹලොව සිටියේ සහස්‍රී ලොකධාතුව ස්වරයෙන් විඥාපනය කෙළේයයි" වහන්ස, අතීත් සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ කෙතෙක් තැන් ස්වරයෙන් විඥාපනය කරන්නට සමර්ථ වෙති හෝ යි?

ආනන්‍දය, තා විසින් දහසක් සක්වළ ඇති චූලනීය ලෝකධාතුව අසන ලද නු යි?

යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ වදාරණ සේක් ද, භාග්‍යවතුන් වහන්සේගේ බස් අසා භික්ෂූහු ධරත් ද, භාග්‍යවතුන් වහන්ස, තෙල සිංහනාදයට මේ කාලය යි. සුගතයන් වහන්ස, තෙල සිංහනාදයට මේ කාලය යි.

ආනන්‍දය, එසේ වී නම් අසව...... ආනන්‍දය, සඳහිරුහු බබලමින් යම්තාක් තැන් ඇවිදුනාහු ද, දිශා බබුලුවත් ද, ඒ තාක් තැන් සහස්‍රීලොකධාතුයි. ඒ සහස්‍රධාලෝකයෙහි සඳ දහසෙක් ඇත. හිරු දහසෙක් ඇත. සුනෙරු පව්රද දහසෙක් ඇත. දඹදිව් දහසෙක් ඇත. අපරගොයාන දහසෙක් ඇත. උතුරුකුරුදිව් දහසෙක් ඇත. පූර්වවිදෙහ දහසෙක් ඇත. මහා-සමුද්‍ර සහස්‍රයෝ සතර දෙනෙක් ඇත. මහාරාජසහස්‍රයෝ සතර දෙනෙක් ඇත. චාතුර්මහාරාජික සහස්‍රයෙක් ඇත. ත්‍රයත්‍රිංශත් දෙවලෝක සහස්‍රයෙක් ඇත. යාම දෙවලෝක සහස්‍රයෙක් ඇත. තුෂිත දෙවලෝක සහස්‍රයෙක් ඇත. නිර්මාණරතී දේවලෝක සහස්‍රයෙක් ඇත. පරනිර්මිත වශවර්තී දෙවලොක සහස්‍රයෙක් ඇත. බ්‍රහ්මලෝක සහස්‍රයෙක් ඇත. ආනන්‍දය, මේ සහස්‍රීචූලනීය ලෝකධාතුය යි කියනු ලැබේ.

යාවතා ආනන්ද සහස්සී චූළනිකා ලොකධාතු, තාව සහස්සධා ලොකො. අයං වුච්චතානන්ද ද්විසහස්සී මජ්ඣිමිකා ලොකධාතු.

යාවතා ආනන්ද ද්විසහස්සී මජ්ඣිමිකා ලොකධාතු, තාව සහස්සධා ලොකො. අයං වුච්චතානන්ද තිසහස්සී මහාසහස්සී ලොකධාතු.

ආකඞ්ඛමානො ආනන්ද තථාගතො තිසහස්සිමහාසහස්සිලොකධාතුං සරෙන විඤ්ඤාපෙය්‍ය, යාවතා පන ආකඞ්ඛෙය්‍යාති.

යථා කථම්පන භන්තෙ භගවා තිසහස්සිමහාසහස්සිලොකධාතුං සරෙන විඤ්ඤාපෙය්‍ය, යාවතා පන ආකඞ්ඛෙය්‍යාති?

ඉධානන්ද තථාගතො තිසහස්සිමහාසහස්සිලොකධාතුං ඔභාසෙන ඵරෙය්‍ය. යදා තෙ සත්තා තං ආලොකං සඤ්ජානෙය්‍යුං, අථ තථාගතො ඝොසං කරෙය්‍ය, සද්දමනුස්සාවෙය්‍ය. එවං ඛො ආනන්ද තථාගතො තිසහස්සිමහා-සහස්සිලොකධාතුං සරෙන විඤ්ඤාපෙය්‍ය, යාවතා පන ආකඞ්ඛෙය්‍යාති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ලාභා වත මෙ, සුලද්ධං වත මෙ යස්ස මෙ සත්ථා එවං මහිද්ධිකො එවං මහානුභාවොති.

එවං වුත්තෙ ආයස්මා උදායී ආයස්මන්තං ආනන්දං එතදවොච: කිං තුය්හෙත්ථ ආවුසො ආනන්ද යදි තෙ සත්ථා එවං මහිද්ධිකො එවං මහානු-භාවොති?

එවං වුත්තෙ භගවා ආයස්මන්තං උදායිං එතදවොච: මා හෙවං උදායි, මා හෙවං උදායි. සචෙ උදායි ආනන්දො අවීතරාගො කාලං කරෙය්‍ය, තෙන චිත්තප්පසාදෙන සත්තක්ඛත්තුං දෙවෙසු දෙවරජ්ජං කරෙය්‍ය, සත්තක්ඛත්තුං ඉමස්මිංයෙව ජම්බුදීපෙ මහාරජ්ජං කරෙය්‍ය. අපි උදායි ආනන්දො දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායිස්සතීති.

ආනන්දවග්ගො තතියො.

ආනන්දය, යම්තාක් තැන් සහස්‍රීචූලනීය ලෝකධාතුයෙක් වේ ද, ඒ තාක් සහස්‍රභාගයෙන් ගණනා ලද ලෝකයෙක් වේ ද, ආනන්දය, මේ ද්විසහස්‍රී මාධ්‍යමික ලෝකධාතුය යි කියනු ලැබේ.

ආනන්දය, යම්තාක් තැන් ද්විසහස්‍රීමාධ්‍යමික ලෝකධාතුයෙක් වේ ද, ඒ තාක් සහස්‍රභාගයෙන් ගණනා ලද ලෝකයෙක් වේ ද, ආනන්දය, මේ ත්‍රිසහස්‍රී මහාසහස්‍රී ලෝකධාතුය යි කියනු ලැබේ.

ආනන්දය, තථාගතයන් වහන්සේ කැමැතිවන සේක් ත්‍රිසහස්‍රී මහාසහස්‍රී ලෝකධාතුව ස්වරයෙන් විඥපනය කරණ සේක. ඉන් පිටත් යම්තාක් කැමැති වන සේක් නම්, එ ද ස්වරයෙන් විඥපනය කරණ සේක.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වනාහි කෙසේ නම් ත්‍රිසහස්‍රී මහාසහස්‍රී ලෝකධාතුව ස්වරයෙන් විඥපනය කරණ සේක් ද? ඉන් පිටත් යම් තාක් කැමැති වන සේක් නම් එ ද ස්වරයෙන් විඥපනය කරණ සේක් ද?

ආනන්දය, මෙහි තථාගතයන් වහන්සේ ත්‍රිසහස්‍රී මහාසහස්‍රී ලෝක-ධාතුව ශරීරාවභාසයෙන් පතුරුවන සේක.යම් වරෙක ඒසත්හු ඒ ආලෝකය හඳුනත් ද, එවර තථාගතයන් වහන්සේ බඹගොස් කරණ සේක. හඬ අස්වන සේක. ආනන්දය, මෙසේ තථාගතයන් වහන්සේ ත්‍රිසහස්‍රී මහාසහස්‍රී ලෝකධාතුව ස්වරයෙන් විඥපනය කරණ සේක. ඉන් පිටත් යම්තාක් කැමැති වන සේක් නම් ඒ තාක් ස්වරයෙන් විඥපනය කරණ සේක.

මෙසේ වදාළ කල්හි ආයුෂමත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට "යම් බඳු මාගේ ශාස්තෲන් වහන්සේ මෙබඳු මහත් ඍද්ධි ඇති සේක් ද, මෙබඳු මහත් අනුභාව ඇති සේක් ද, ඒකාන්තයෙන් මට ලාභයෙක. ඒකාන්ත යෙන් මට මනා ලැබීමෙකැ" යි මෙල ප්‍රසාදය සැළ කළහ.

මෙසේ කී කල්හි ආයුෂමත් උදායී තෙරණුවෝ ආයුෂමත් අනඳ තෙරණු-වන්ට මෙල කීහ. "කියග ආනන්දය, ඉදින් තාගේ ශාස්තෲන් වහන්සේ මෙබඳු මහත් ඍද්ධි ඇතිසේක් ද, මෙබඳු මහත් අනුභාව ඇතිසේක් ද, මෙහිලා තොපි කිමෙකැ" යි.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂමත් උදායී තෙරණුවනට මෙල බස් වදාළහ: උදායිය, තහමක් මෙසේ කියව. උදායිය, තහමක් මෙසේ කියව. උදායිය, ඉදින් අනඳ තෙර අවීතරාග ව කලුරිය කෙරේ නම්, ඒ චිත්ත-ප්‍රසාදයෙන් සත් වටක් දෙවියන් කෙරෙහි දෙව්රජය කෙරෙයි. සත්වටක් මේ දඹදිව ම මහරජය කෙරෙයි. වැළිත් උදායිය, අනඳ ඉහාත්මයෙහි ම පිරිනිවන් පාන්නේය.

**ආනන්දවර්ගය තෙවෙනියි.**

## [4. සමණවග්ගො]

### 3. 2. 4. 1.

[සාවත්ථි නිදානං]

31. තීණිමානි භික්ඛවෙ සමණස්ස සමණකරණීයානි.[1] කතමානි තීණි: අධිසීලසික්ඛාසමාදානං, අධිචිත්තසික්ඛාසමාදානං, අධිපඤ්ඤාසික්ඛාසමාදානං. ඉමානි ඛො භික්ඛවෙ තීණි සමණස්ස සමණකරණීයානි. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: තිබ්බො නො ඡන්දො භවිස්සති අධිසීලසික්ඛාසමාදානෙ, තිබ්බො නො ඡන්දො භවිස්සති අධිචිත්තසික්ඛාසමාදානෙ, තිබ්බො නො ඡන්දො භවිස්සති අධිපඤ්ඤාසික්ඛාසමාදානෙති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

### 3. 2. 4. 2.

32. සෙය්‍යථාපි භික්ඛවෙ ගද්‍රභො ගොගණං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධො හොති, "අහම්පමහා අහම්පමහාති".[2] තස්ස න තාදිසො වණ්ණො හොති සෙය්‍යථාපි ගුන්නං. න තාදිසො සරො හොති සෙය්‍යථාපි ගුන්නං. න තාදිසං පදං හොති සෙය්‍යථාපි ගුන්නං. සො ගොගණස්සෙව පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධො හොති, "අහම්පමහා අහම්පමහාති.[2]"

එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො භික්ඛු භික්ඛුසඞ්ඝං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධො හොති, "අහම්පි භික්ඛු, අහම්පි භික්ඛූති", තස්ස න තාදිසො ඡන්දො හොති අධිසීලසික්ඛාසමාදානෙ, සෙය්‍යථාපි අඤ්ඤෙසං භික්ඛූනං. න තාදිසො ඡන්දො හොති අධිචිත්තසික්ඛාසමාදානෙ. සෙය්‍යථාපි අඤ්ඤෙසං භික්ඛූනං. න තාදිසො ඡන්දො හොති අධිපඤ්ඤාසික්ඛාසමාදානෙ, සෙය්‍යථාපි අඤ්ඤෙසං භික්ඛූනං. සො භික්ඛුසඞ්ඝස්සෙව පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධො හොති, "අහම්පි භික්ඛු අහම්පි භික්ඛූති."

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: තිබ්බො නො ඡන්දො භවිස්සති අධිසීලසික්ඛාසමාදානෙ. තිබ්බො නො ඡන්දො[3] භවිස්සති අධිචිත්තසික්ඛාසමාදානෙ, තිබ්බො නො ඡන්දො භවිස්සති අධිපඤ්ඤාසික්ඛාසමාදානෙති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

### 3. 2. 4. 3

33. තීණිමානි භික්ඛවෙ කස්සකස්ස ගහපතිස්ස පුබ්බෙ කරණීයානි. කතමානි තීණි: ඉධ භික්ඛවෙ කස්සකො ගහපති පටිගච්චෙව[4] ඛෙත්තං සුකට්ඨං කරොති සුමතිකතං. පටිගච්චෙව ඛෙත්තං සුකට්ඨං කරිත්වා සුමතිකතං කාලෙන බීජානි පතිට්ඨාපෙති. කාලෙන බීජානි පතිට්ඨාපෙත්වා සමයෙන උදකං අභිනෙතිපි අපනෙතිපි. ඉමානි ඛො භික්ඛවෙ තීණි කස්සකස්ස ගහපතිස්ස පුබ්බෙ කරණීයානි.

---

1, සමණීයානි - මජසං. 2. අහම්පි ගො - කාළුව්. අහම්පි දම්මො, අහම්පි දම්මො - මජසං. තිබ්බො ඡන්දො - සිමු. 4. පටිකච්චෙව - මජසං.

## [4. ශ්‍රමණවර්ගය]

### 1. 2. 4. 1.

**[සැවැත් නිදානයි:]**

31. මහණෙනි, ශ්‍රමණසන්තකවූ මේ ශ්‍රමණකරණීයයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: අධිශීලශික්‍ෂාසමාදානය, අධිචිත්තශික්‍ෂාසමාදානය, අධිප්‍රඥ ශික්‍ෂාසමාදාන යි. මහණෙනි, ශ්‍රමණ සන්තක වූ මේ තුන් ශ්‍රමණ කරණීයයෝ යි. මහණෙනි, එහෙයින් මෙසේ හික්මිය යුතුය: "අධිශීලශික්‍ෂා සමාදානයෙහි ලා අපගේ තීව්‍ර වූ ඡන්දයෙක් වෙයි. අධිචිත්තශික්‍ෂා සමාදාන-යෙහි ලා අපගේ තීව්‍ර වූ ඡන්දයෙක් වෙයි. අධිප්‍රඥශික්‍ෂාසමාදානයෙහි ලා අපගේ තීව්‍ර වූ ඡන්දයෙක් වෙයි" කියා යි. මහණෙනි, මෙසේ ම තොප විසින් හික්මිය යුතු යි.

### 3. 2. 4. 2.

32. මහණෙනි, යම් පරිදි ගද්‍රභයෙක් "අහම්පමහා අහම්පමහා (මම ද ගවයෙමි, මම ද ගවයෙමි යි" යන අනුකරණයෙන් හඬමින්) ගොගණයා පස් පස් ලුහු බඳනේ වේ ද, ගවයන්ට වන පරිද්දෙන් ඔහුට එබඳු පැහැසටහනෙක් නොවෙයි. ගවයන්ට වන පරිද්දෙන් එබඳු හඬෙකුදු නොවෙයි. ගවයන්ට වන පරිදි එබඳු පිය සටහනෙක් ද නොවෙයි. හේ "අහම්පමහා, අහම්පමහා"යි ගවමුළු ම පස් පස් ලුහු බැඳ යන්නේ වෙයි.

මහණෙනි, එපරිදි ම මෙසස්නෙහි කිසි මහණෙක් "මම ද මහණයෙමි, මම ද මහණයෙමි"යි (බෙණෙමින්) භික් සඟුන් පස් පස් ලුහු බැඳ යන්නේ වේ ද, සෙසු මහණුන්ට වන පරිදි අධිශීලශික්‍ෂාසමාදානයෙහි ලා ඔහුට එබඳු ඡන්දයෙක් නො වෙයි. සෙසු මහණුන්ට වන පරිදි අධිචිත්ත ශික්‍ෂාසමාදාන යෙහි ලා එබඳු ඡන්දයෙක් නො වෙයි. සෙසු මහණුන්ට වන පරිදි අධිප්‍රඥ ශික්‍ෂා සමාදානයෙහි ලා එබඳු ඡන්දයෙක් නො වෙයි. හේ "මම ද මහණයෙමි, මම ද මහණයෙමි"යි බික් සඟුන් ම පස් පස් ලුහු බඳනේ වෙයි.

මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතුය: අධිශීලශික්‍ෂාසමාදාන-යෙහි ලා අපගේ තීව්‍ර ඡන්දයෙක් වෙයි. අධිචිත්තශික්‍ෂාසමාදානයෙහි ලා අපගේ තීව්‍ර ඡන්දයෙක් වෙයි. අධිප්‍රඥශික්‍ෂාසමාදානයෙහි ලා අපගේ තීව්‍ර ඡන්දයෙක් වෙයි, කියා යි. මහණෙනි, මෙසේ ම තොප විසින් හික්මිය යුතුයි.

### 3. 2. 4. 3.

33. මහණෙනි, සීසානා ගෙහෙවියා විසින් කැල ම මේ කළ යුතු දෑ තුණෙක. කවර තුණෙක යත්: මහණෙනි, මෙලොව සීසානා ගෙහෙවි කැල ම ක්‍ෂේත්‍රය මොනොවට සානා ලද්දක් පුවරුවෙන් සම කරණ ලද්දක් කෙරේ ද. ක්‍ෂේත්‍රය මොනොවට සාට තැනක් පුවරු ගා සම කරණ ලද්දක් කොට නිසි කල බිජු පිහිටුවයි. නිසි කල්හි බිජු පිහිටුවා නිසි සමාහි දිය වද්දනුයේත් නෙරනුයේත් වෙයි. මහණෙනි, සානා ගෙහෙවියා විසින් කැල ම මේ කළයුතු දෑ තුණයි.

එවමෙව බො භික්ඛවෙ තීණිමානි භික්ඛුස්ස පුබ්බෙ කරණීයානි. කතමානි තීණි: අධිසීලසික්ඛාසමාදානං, අධිචිත්තසික්ඛාසමාදානං, අධිපඤ්ඤාසික්ඛාසමා-දානං. ඉමානි බො භික්ඛවෙ තීණි භික්ඛුස්ස පුබ්බෙ කරණීයානි.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: තිබ්බො නො ඡන්දො භවිස්සති අධිසීලසික්ඛාසමාදානෙ. තිබ්බො නො ඡන්දො භවිස්සති අධිචිත්තසික්ඛාසමා-දානෙ. තිබ්බො නො ඡන්දො භවිස්සති අධිපඤ්ඤාසික්ඛාසමාදානෙති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

### 3. 2. 4. 4

**[වෙසාලි නිදානං:]**

34. එවං මෙ සුතං: එකං සමයං භගවා **වෙසාලියං** විහරති මහාවනෙ **කූටාගාරසාලායං.** අථ බො අඤ්ඤතරො වජ්ජිපුත්තකො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා -පෙ- එකමන්තං නිසින්නො බො සො වජ්ජිපුත්තකො භික්ඛු භගවන්තං එතදවොච:

සාධිකමිදං භන්තෙ දියඩ්ඪසික්ඛාපදසතං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති. නාහං භන්තෙ එත්ථ සක්කොමි සික්ඛිතුන්ති.

සක්කසි පන ත්වං භික්ඛු තීසු සික්ඛාසු සික්ඛිතුං අධිසීලසික්ඛාය අධිචිත්ත-සික්ඛාය අධිපඤ්ඤාසික්ඛායාති?

සක්කොමහං භන්තෙ තීසු සික්ඛාසු සික්ඛිතුං අධිසීලසික්ඛාය අධිචිත්ත-සික්ඛාය අධිපඤ්ඤා ක්ඛායාති.

තස්මාතිහ ත්වං භික්ඛු තීසු සික්ඛාසු සික්ඛස්සු අධිසීලසික්ඛාය අධිචිත්ත-සික්ඛාය අධිපඤ්ඤාසික්ඛාය. යතො බො ත්වං භික්ඛු අධිසීලම්පි සික්ඛිස්සසි, අධිචිත්තම්පි සික්ඛිස්සසි, අධිපඤ්ඤම්පි සික්ඛිස්සසි, තස්ස තුය්හං භික්ඛු අධිසීලම්පි සික්ඛතො අධිචිත්තම්පි සික්ඛතො අධිපඤ්ඤම්පි සික්ඛතො රාගො පහීයිස්සති. දොසො පහීයිස්සති. මොහො පහීයිස්සති. සො ත්වං රාගස්ස පහානා දොසස්ස පහානා මොහස්ස පහානා යං අකුසලං තං න කරිස්සසි. යං පාපං තං න සෙවිස්සසීති.

අථ බො සො භික්ඛු අපරෙන සමයෙන අධිසීලම්පි සික්ඛි, අධිචිත්තම්පි සික්ඛි, අධිපඤ්ඤම්පි සික්ඛි. තස්ස අධිසීලම්පි සික්ඛතො අධිචිත්තම්පි සික්ඛතො අධිපඤ්ඤම්පි සික්ඛතො රාගො පහීයි. දොසො පහීයි. මොහො පහීයි. සො රාගස්ස පහානා දොසස්ස පහානා මොහස්ස පහානා යං අකුසලං තං නාකාසි. යං පාපං තං න සෙවීති.

### 3. 2. 4. 5

**[සාවත්ථි නිදානං]**

35. අථ බො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො බො සො භික්ඛු භගවන්තං එතදවොච: සෙඛො සෙඛොති භන්තෙ වුච්චති. කිත්තාවතා නු බො භන්තෙ සෙඛො හොතීති?

මහණෙනි, එපරිදි ම මහණහු විසින් කැල ම මේ කළ යුතු දෑ තුණෙකි. කවර තුණෙක යත්: අධිශීලශික්‍ෂාසමාදානය, අධිචිත්තශික්‍ෂාසමාදානය, අධිප්‍රඥාශික්‍ෂාසමාදාන යි. මහණෙනි, මහණහු විසින් කැල ම මේ කළ යුතු දෑ තුණය

මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතුය: අධිශීලශික්‍ෂා සමාදාන-යෙහි ලා අපගේ තීව්‍ර වූ ඡන්දය වෙයි. අධිචිත්තශික්‍ෂා සමාදානයෙහි ලා අපගේ තීව්‍ර ඡන්දය වෙයි. අධිප්‍රඥාශික්‍ෂා සමාදානයෙහි ලා අපගේ තීව්‍ර ඡන්දය වේයයි. මහණෙනි, තොප විසින් මෙසේ මැ හික්මිය යුතුය.

### 3. 2. 4. 4.

**[වෙසාලි නිදානයි:]**

34. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර මහවනයෙහි කූටාගාරශාලායෙහි වැඩ වසන සේක. එකල එක්තරා වැදෑ රජකුලපුත් මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹිත. එළඹ .. එකත්පස්ව හුන් ඒ වැදෑපුත් මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේය:

වහන්ස, "සාධික දෙළ සියක් මේ සිකපද අඩමසක් පාසා උදෙසීමට එයි. වහන්ස, මම මෙහි හික්මෙන්නට නො පොහොසත්මි" යි.

මහණ, අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා යන තුන් සිකයෙහි හික්මෙන්නට තෝ පොහොසත්හි?

වහන්ස, මම අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා යන තුන් සිකයෙහි හික්මෙන්නට පොහොසත්මි.

මහණ, එහෙයින් තෝ අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා යන තුන් සිකෙහි හික්මෙව. මහණ, යම් හෙයෙකින් තෝ අධිශීලයෙහි හික්මෙහි ද, අධිචිත්ත-යෙහි හික්මෙහි ද, අධිප්‍රඥායෙහිත් හික්මෙහි ද, මහණ, අධිශීලයෙහි හික්මෙන අධිචිත්තයෙහිත් හික්මෙන, අධිප්‍රඥායෙහිත් හික්මෙන ඒ තට රාගය ප්‍රහන වෙයි. ද්වේෂය ප්‍රහන වෙයි. මෝහය ප්‍රහන වෙයි. ඒ තෝ, රාගප්‍රහාණ-යෙන් ද්වේෂප්‍රහාණයෙන් මෝහප්‍රහාණයෙන් - යම් අකුශලයෙක් වේ නම් එය නො කෙරෙහි, යම් පාපයෙක් වේ නම්, ඒ නො සෙවුනෙහිය.

එක්බිති ඒ මහණ, පසු කලෙක අධිශීලයෙහිත් හික්මිත. අධිචිත්ත-යෙහිත් හික්මිත. අධිප්‍රඥායෙහිත් හික්මිත. අධිශීලයෙහිත් අධිචිත්තයෙහිත් අධිප්‍රඥායෙහිත් හික්මෙන ඔහුට රාගය ප්‍රහන විය. ද්වේෂය ප්‍රහන විය. මෝහය ප්‍රහන විය. රාගයාගේ ප්‍රහාණයෙන් ද්වේෂයාගේ ප්‍රහාණයෙන් මෝහයාගේ ප්‍රහාණයෙන් පසු යම් අකුශලයෙක් ඇත් ද ඒ නො කෙළේය. යම් පාපයෙක් ඇත් ද එය නො සෙවුනේ විය.

### 3. 2, 4. 5.

**[සැවැත් නිදානයි:]**

35. එකල අන්‍යතර මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹි-යේය. ... එකත්පස්ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේය: වහන්ස, 'ශෛක්‍ෂය, ශෛක්‍ෂය' යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් ශෛක්‍ෂ වේ හො යි?

සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙඛොති වුච්චති. කිඤ්ච සික්ඛති: අධිසීලම්පි සික්ඛති, අධිචිත්තම්පි සික්ඛති, අධිපඤ්ඤම්පි සික්ඛති. සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙඛොති වුච්චතීති.

37 සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො,
ඛයස්මිං පඨමං ඤාණං තතො අඤ්ඤා අනන්තරා.

38 තතො අඤ්ඤාවිමුත්තස්ස ඤාණං වෙ හොති තාදිනො,
අකුප්පා මෙ විමුත්තීති භවසඤ්ඤොජනක්ඛයෙති.

### 3. 2. 4. 6

36. සාධිකමිදං භික්ඛවෙ දියඩ්ඪසික්ඛාපදසතං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති, යත්ථ අත්ථකාමා[1] කුලපුත්තා සික්ඛන්ති. තිස්සො ඉමා භික්ඛවෙ සික්ඛා, යත්ථෙතං සබ්බං සමොධානං ගච්ඡති. කතමා තිස්සො: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො සික්ඛා, යත්ථෙතං සබ්බං සමොධානං ගච්ඡති.

ඉධ භික්ඛවෙ භික්ඛු සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං මත්තසොකාරී. පඤ්ඤාය මත්තසොකාරී. සො යානි තානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි තානි ආපජ්ජතිපි වුට්ඨාතිපි. තං කිස්ස හෙතු? න හි මෙත්ථ භික්ඛවෙ අභබ්බතා වුත්තා. යානි ච ඛො තානි සික්ඛාපදානි ආදිබ්‍රහ්මචරියිකානි බ්‍රහ්මචරියසාරුප්පානි තත්ථ ධුවසීලී ච හොති ඨිතසීලී ච. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො.

ඉධ පන භික්ඛවෙ භික්ඛු සීලෙසු පරිපූරකාරී හොති සමාධිස්මිං මත්තසොකාරී, පඤ්ඤාය මත්තසොකාරී. සො යානි තානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි තානි ආපජ්ජතිපි වුට්ඨාතිපි. තං කිස්ස හෙතු? න හි මෙත්ථ භික්ඛවෙ අභබ්බතා වුත්තා. යානි ච ඛො තානි සික්ඛාපදානි ආදිබ්‍රහ්මචරියිකානි බ්‍රහ්මචරියසාරුප්පානි, තත්ථ ධුවසීලී ච හොති ඨිතසීලී ච. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති.

1 අත්තකාමා - මජ්ඣං.

මහණ, හික්මේ නු යි එහෙයින් ශෛක්‍ෂය යි කියනු ලැබේ. කුමක් හික්මේ ද? අධිශීලයත් හික්මෙයි. අධිචිත්තයත් හික්මෙයි. අධිප්‍රඥවත් හික්මෙයි. මහණ හික්මේ නු යි එහෙයින් ශෛක්‍ෂය යි කියනු ලැබේ.

37 අරිමග පිළිපදනා සුලු හික්මෙන ශෛක්‍ෂයාහට පළමුව ලා (කෙලශක්‍ෂය කරණ හෙයින්) ක්‍ෂය නම් ලද මාර්ගයෙහි ඥානය උපදනේ ය, ඒ චතුර්ථමාර්ගඥානයෙන් අනතුරුව අර්හත්ඵලය උපදනේ ය.

38 එක්බිති අර්හත්ඵලවිමුක්තියෙන් විමුක්ත වූ ඒ තාදීහට එකාන්ත-යෙන් ප්‍රත්‍යවෙක්‍ෂණඥානය පහළ වෙයි. "භවසංයොජනක්‍ෂයයෙහි දී මාගේ විමුක්තිය අකොප්‍ය විය" කියා යි,

### 3. 2. 4. 6.

36. මහණෙනි, නමනට වැඩ කැමැති කුලපුත්‍රයෝ යමෙක්හි හික්මෙත් නම් එබඳු මේ සාධික යෙළසියක් සික‍පද අඩමසක් පාසා උදෙසීමට එයි. මහණෙනි, යමෙක මේ හැම සිකපද සංග්‍රහයට යේ නම් මේ එබඳු ශික්‍ෂාවෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: අධිශීලශික්‍ෂාය, අධිචිත්තශික්‍ෂාය, අධිප්‍රඥශික්‍ෂා යි. මහණෙනි, යමෙක මෙ හැම සිකපද සංග්‍රහයට යේ නම් මේ එබඳු ශික්‍ෂාවෝ තුන් දෙනහ.

මහණෙනි, මෙ සස්නෙහි මහණ, ශීලයෙහි පරිපූරකාරී වෙයි, සමාධියෙහි පමණින් කරණ සුලු වෙයි. ප්‍රඥයෙහි පමණින් කරණ සුලු වෙයි, හේ යම් ඒ කුදන්කුදු සිකපද ඇත් ද, ඒ සිකපද අවදනේත් ඇවැතින් නැග සිටුනේත් වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙහි ලා මා විසින් අභව්‍යභාවයෙක් නොකියන ලදී. බ්‍රහමචර්යයට නිසි වූ යම් ඒ ආදිබ්‍රහමචර්යක ශික්‍ෂාපදයෝ වෙත් ද, එහි ලා නිබද සිල් ඇතියේත් පිහිටි සිල් ඇතියේත් වෙයි. මොනොවට සමාදන්ව සිකපෙදෙහි හික්මෙයි. හේ තුන් වැදූරුම් සංයෝජනයන්ගේ ක්‍ෂයහේතුයෙන් අපායට නොහෙන සැහැවි ඇතියේ මාර්ගනියාමයෙන් නියත වූයේ උපරිමාර්ගත්‍රය සඞ්ඛ්‍යාත සම්බොධිය පරායණ කොට ඇතියේ සෝවන් වෙයි.

මහණෙනි, මෙසස්නෙහි මහණ ශීලයෙහි පරිපූරකාරී වෙයි. සමාධියෙහි පමණින් කරණ සුලු වෙයි. ප්‍රඥයෙහි පමණින් කරණ සුලු වෙයි. හේ යම් ඒ කුදන්කුදු සිකපද ඇත් ද, ඒ අවදනේත් ඇවැතින් නැගී සිටුනේත් වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙහි ලා මා විසින් අභව්‍යභාවයෙක් නොකියන ලදී. බ්‍රහමචයර්යට නිසි වූ යම් ඒ ආදි බ්‍රහමචර්යක ශික්‍ෂාපදයෝ ඇත් ද, එහි නිබඳ සිල් ඇතියේත් පිහිටි සිල් ඇතියේත් වෙයි. මොනොවට සමාදන්ව සිකපෙදෙහි හික්මෙයි. හේ තුන් වැදූරුම් සංයෝජනයන්ගේ පරික්‍ෂය හේතුයෙන් රාගද්වෙෂ මෝහයන්ගේ තනුවයෙන් සකෘදාගාමි වෙයි. එක් වරක් ම මෙ ලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි

ඉධ පන භික්ඛවෙ භික්ඛු සීලෙසු පරිපූරකාරී හොති සමාධිස්මිං පරිපූරකාරී පඤ්ඤාය මත්තසොකාරී. සො යානි තානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි තානි ආපජ්ජතිපි වුට්ඨාතිපි. තං කිස්ස හෙතු: න හි මෙත්ථ භික්ඛවෙ අභබ්බතා වුත්තා. යානි ච ඛො තානි සික්ඛාපදානි ආදිබ්‍රහ්මචරියිකානි බ්‍රහ්මචරියසාරුප්පානි තත්ථ ධුවසීලී ච[1] හොති ඨිතසීලී ච[2] සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා.

ඉධ පන භික්ඛවෙ භික්ඛු සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං පරිපූරකාරී. පඤ්ඤාය පරිපූරකාරී. සො යානි තානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි, තානි ආපජ්ජතිපි වුට්ඨාතිපි. තං කිස්ස හෙතු? න හි මෙත්ථ භික්ඛවෙ අභබ්බතා වුත්තා. යානි ච ඛො තානි සික්ඛාපදානි ආදිබ්‍රහ්මචරියිකානි බ්‍රහ්මචරියසාරුප්පානි, තත්ථ ධුවසීලී ච[1] හොති ඨිතසීලී ච[2] සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉති ඛො භික්ඛවෙ පදෙසං පදෙසකාරී ආරාධෙති. පරිපූරං පරිපූරකාරී. අවඤ්ඣානි[3] ත්වෙවාහං භික්ඛවෙ සික්ඛාපදානි වදාමීති.

## 3. 2. 4. 7.

37. සාධිකමිදං භික්ඛවෙ දියඩ්ඪසික්ඛාපදසතං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති, යත්ථ අත්තකාමා කුලපුත්තා සික්ඛන්ති. තිස්සො ඉමා භික්ඛවෙ සික්ඛා, යත්ථෙතං සබ්බං සමොධානං ගච්ඡති. කතමා තිස්සො? අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො සික්ඛා, යත්ථෙතං සබ්බං සමොධානං ගච්ඡති.

ඉධ භික්ඛවෙ භික්ඛු සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං මත්තසොකාරී, පඤ්ඤාය මත්තසොකාරී. සො යානි තානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි, තානි ආපජ්ජතිපි වුට්ඨාතිපි. තං කිස්ස හෙතු? න හි මෙත්ථ භික්ඛවෙ අභබ්බතා වුත්තා. යානි ච ඛො තානි සික්ඛාපදානි ආදිබ්‍රහ්මචරියිකානි බ්‍රහ්මචරිය-සාරුප්පානි, තත්ථ ධුවසීලී ච[1] හොති ඨිතසීලී ච, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සත්තක්ඛත්තුපරමො හොති: සත්තක්ඛත්තුපරමං දෙවෙ ච මනුස්සෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරොති.

---

1. ධුවසීලො ච - PTS. මජ්සං. 2. ඨිතසීලො ච - PTS මජ්සං.
3. අවජ්ඣානි - PTS.

මහණෙනි, මෙසස්නෙහි මහණ ශීලයෙහි පරිපූරකාරී වෙයි. සමාධියෙහි පරිපූරකාරී වෙයි. ප්‍රඥයෙහි පමණින් කරණ සුලු වෙයි. හේ යම් ඒ කුදත්කුදු සිකපද ඇත් ද, ඒ අවදනේත් ඇවැතින් නැග සිටුනේත් වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙහි ලා මා විසින් අභව්‍යභාවයෙක් නොකියන ලදී. බ්‍රහමචර්යයට නිසි වූ යම් ඒ ආදිබ්‍රහමචර්යක ශික්‍ෂාපදයෝ ඇත් ද, එහි නිබද සිල් ඇතියේත්. පිහිටි සිල් ඇතියේත් වෙයි. මොනොවට සමාදන්ව සිකපදයෙහි හික්මෙයි. හේ පසළොස් ඔරම්භාගීය සංයොජනයන්ගේ පරික්‍ෂය හේතුයෙන් ඔපපාතික වෙයි. ඒ බඹලොවින් වටාලා නොඑන සැහැවි ඇත්තේ එහි ම පිරිනිවන් පානේය.

මහණෙනි, මෙසස්නෙහි මහණ ශීලයෙහි පරිපූරකාරී වෙයි. සමාධියෙහි පරිපූරකාරී වෙයි. ප්‍රඥයෙහි පරිපූරකාරී වෙයි. හේ යම් ඒ කුදත්කුදු සිකපද ඇත් ද, ඒ අවදනේත් ඇවැතින් නැඟී සිටුනේත් වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙහි ලා මා විසින් අභව්‍යභාවයෙක් නොකියන ලදී. බ්‍රහමචර්යයට නිසි වූ යම් ඒ ආදිබ්‍රහමචර්යක ශික්‍ෂාපදයෝ ඇත් ද, එහි ලා නිබද සිල් ඇතියේත් පිහිටි සිල් ඇතියේත් වෙයි. මොනොවට සමාදන්ව සිකපෙදෙහි හික්මෙයි. හේ ආස්‍රවයන්ගේ ක්‍ෂයහේතුයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට එයට එළඹ වෙසෙයි.

මහණෙනි, මෙසේ ප්‍රදේශකාරී ආර්‍ය පුද්ගල (=සොවත් සෙදගැමි, අනගැමි පුහුල් ) ප්‍රදේශයක් සපයයි. පරිපූරකාරී පුද්ගල (=රහත් තෙමේ) පරිපූර්ණත්වය (=රහත්ඵලය) සපයයි. මහණෙනි, මම සිකපදනු නොවඳහ යි කියමියි.

## 3. 2. 4. 7.

37. මහණෙනි, තමතට වැඩ කැමැති කුලපුත්‍රයෝ යමෙක්හි හික්මෙත් නම් මේ එබඳු සාධිකයෙලසියක් සිකපද අඩමසක් පාසා උදෙසීමට එයි. මහණෙනි, මේ හැම සිකපද යමෙක සංග්‍රහයට යේ නම් එබඳු මේ ශික්‍ෂාවෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: අධිශීලශික්‍ෂාය, අධිචිත්ත-ශික්‍ෂාය, අධිප්‍රඥශික්‍ෂා යි. මහණෙනි, යමෙක මෙ හැම සිකපද සංග්‍රහයට යේ නම් මේ එබඳු ශික්‍ෂාවෝ තුන් දෙනහ

මහණෙනි, මෙ සස්නෙහි මහණ ශීලයෙහි පරිපූරකාරී වෙයි. සමාධියෙහි පමණින් කරණ සුලු වෙයි. ප්‍රඥයෙහි පමණින් කරණ සුලු වෙයි. හේ යම් ඒ කුදත්කුදු සිකපද ඇත් ද, ඒ සිකපද අවදනේත් ඇවැතින් නැඟ සිටුනේත් වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙහි ලා මා විසින් අභව්‍යභාවයෙක් නොකියන ලදී. බ්‍රහමචර්යයට නිසි වූ යම් ඒ ආදිබ්‍රහමචර්යක ශික්‍ෂාපදයෝ ඇත් ද, එහි ලා නිබද සිල් ඇතියේත් වෙයි. පිහිටි සිල් ඇතියේත් වෙයි. මොනොවට සමාදන්ව සිකපෙදෙහි හික්මෙයි

හේ තුන් වැදෑරුම් සංයෝජනයන්ගේ ක්‍ෂයහේතුයෙන් සත්තක්ඛත්තු-පරම වෙයි. සත් වරක් පරම කොට දෙවියන් කෙරෙහි ද මිනිසුන් කෙරෙහි ද දිවැ සැරිසරා දුක් කෙළවර කෙරෙයි.

සො තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා කොලඞ්කොලො හොති: ද්වෙ වා තීණි වා කුලානි සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරොති.

සො තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා එකබීජී හොති: එකඤ්ඤෙව මානුසකං භවං නිබ්බත්තෙත්වා දුක්ඛස්සන්තං කරොති.

සො තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති: සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති.

ඉධ පන භික්ඛවෙ භික්ඛු සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං පරිපූරකාරී, පඤ්ඤාය මත්තසොකාරී. සො යානි තානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි, තානි ආපජ්ජතිපි වුට්ඨාතිපි. තං කිස්ස හෙතු? න හි මෙත්ථ භික්ඛවෙ අභබ්බතා වුත්තා. යානි ච ඛො තානි සික්ඛාපදානි ආදිබ්‍රහ්මචරියකානි බ්‍රහ්මචරියසාරුප්පානි, තත්ථ ධුවසීලී ච[1] හොති ඨිතසීලී ච, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා උද්ධංසොතො හොති අකනිට්ඨගාමී.

සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා සසඞ්ඛාරපරිනිබ්බායී හොති.

සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අසඞ්ඛාරපරිනිබ්බායී හොති.

සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා උපහච්චපරිනිබ්බායී හොති.

සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති.

ඉධ පන භික්ඛවෙ භික්ඛු සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං පරිපූරකාරී, පඤ්ඤාය පරිපූරකාරී. සො යානි තානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි තානි ආපජ්ජතිපි වුට්ඨාතිපි. තං කිස්ස හෙතු? න හි මෙත්ථ භික්ඛවෙ අභබ්බතා වුත්තා. යානි ච ඛො තානි සික්ඛාපදානි ආදිබ්‍රහ්මචරියකානි බ්‍රහ්මචරියසාරුප්පානි, තත්ථ ධුවසීලී ච හොති ඨිතසීලී ච[1] සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉති ඛො භික්ඛවෙ පදෙසං පදෙසකාරී ආරාධෙති. පරිපූරං පරිපූරකාරී. අවඤ්ඣානි ත්වෙවාහං භික්ඛවෙ සික්ඛාපදානි වදාමීති.

1. ධුවසීලා ච හොති ඨිතසීලා ච - මජසං - PTS.

හේ තුන් වැදැරුම් සංයෝජනයන්ගේ පරික්ෂය හේතුයෙන් කොලංකොල (=භවයෙන් භවයට යනුවෙක්) වෙයි. භවයන් දෙකක් හෝ තුණක් හෝ දිවැ සැරැ දුක් කෙළවර කෙරෙයි.

හේ තුන් වැදැරුම් වූ සංයෝජනයන්ගේ පරික්ෂය හේතුයෙන් එකබීජී (=එක් භවයකට ම බීජ ඇතියේ) වෙයි. එක් ම මිනුෂ්‍යභවයක් නිපයා දුක් කෙළවර කෙරෙයි.

හේ තුන් වැදැරුම් සංයෝජනයන්ගේ පරික්ෂය හෙතුයෙන් රාග ද්වෙෂ මෝහයන්ගේ තානුවයෙන් (තුනී බැවින්) සෙදගාමි වෙයි. වරක් ම මේ ලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි.

මහණෙනි, මෙ සත්හෙහි මහණ ශීලයෙහි පරිපූරකාරී වෙයි. සමාධියෙහි පරිපූරකාරී වෙයි. ප්‍රඥයෙහි පමණින් කරණ පුළු වෙයි. හේ යම් ඒ කුදත්කුදු සිකපද ඇත් ද, ඒ අවදනේත් ඇවැතින් නැඟී සිටුනේත් වෙයි. ඒ කවර හෙයින යත්? මහණෙනි, මෙහි ලා මා විසින් අභව්‍යභාවයෙක් නොකියන ලදී. බ්‍රහමචර්‍යයට නිසි වූ යම් ඒ ආදිබ්‍රහමචර්‍යක ශික්ෂාපදයෝ ඇත් ද, එහි නිබඳ සිල් ඇතියේත් පිහිටි සිල් ඇතියේත් වෙයි මොනොවට සමාදන්ව සිකපෙදෙහි හික්මෙයි.

හේ පස් වැදැරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂය හේතුයෙන් උද්ධංසොත අකනිට්ඨගාමී වෙයි.

හේ පස්වැදැරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂය හේතුයෙන් සංසඞ්ඛාර පරිනිබ්බායී වෙයි.

හේ පස්වැදැරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂය හේතුයෙන් අසඞ්ඛාර පරිනිබ්බායී වෙයි.

හේ පස් වැදැරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂය හෙතුයෙන් උපහච්චපරිනිබ්බායී වෙයි.

හේ පස් වැදැරුම් ඔරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂය හේතුයෙන් අන්තරාපරිනිබ්බායී වෙයි.

මහණෙනි, මෙ සත්හෙහි මහණ ශීලයෙහි පරිපූරකාරී වෙයි. සමාධියෙහි පරිපූරකාරී වෙයි. ප්‍රඥයෙහි පරිපූරකාරී වෙයි. හේ යම් ඒ කුදත්කුදු සිකපද ඇත් ද, ඒ අවදනේත් ඇවැතින් නැඟී සිටුනේත් වේ. ඒ කවර හෙයින යත්? මහණෙනි, මෙහි ලා මා විසින් අභව්‍යභාවයෙක් නොකියන ලදී. බ්‍රහමචර්‍යයට නිසි වූ යම් ඒ ආදිබ්‍රහමචර්‍යක ශික්ෂාපදයෝ ඇත් ද, එහි නිබඳ සිල් ඇතියේත් පිහිටි සිල් ඇතියේත් වෙයි. මොනොවට සමාදන්ව සිකපදයෙහි හික්මෙයි. හේ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥ විමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට එළඹ වෙසෙයි

මහණෙනි, මෙසේ ප්‍රදේශකාරී පුද්ගල ප්‍රදේශය සපයයි. පරිපූරකාරී පුද්ගල පරිපූර්ණත්වය සපයයි. මහණෙනි, මම "සිකපදහු නොවඳහ"යි වදාරම් සී.

**3. 2. 4. 8.**

38. සාධිකමිදං භික්ඛවෙ දියඩ්ඪසික්ඛාපදසතං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති, යත්ථ අත්ථකාමා[1] කුලපුත්තා සික්ඛන්ති. තිස්සො ඉමා භික්ඛවෙ සික්ඛා, යත්ථෙතං සබ්බං සමොධානං ගච්ඡති. කතමා තිස්සො: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො සික්ඛා, යත්ථෙතං සබ්බං සමොධානං ගච්ඡති.

ඉධ භික්ඛවෙ භික්ඛු සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං පරිපූරකාරී, පඤ්ඤාය පරිපූරකාරී. සො යානි තානි ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි, තානි ආපජ්ජතිපි වුට්ඨාතිපි. තං කිස්ස හෙතු? න හි මෙත්ථ භික්ඛවෙ අභබ්බතා වුත්තා. යානි ච ඛො තානි සික්ඛාපදානි ආදිබ්‍රහ්මචරියිකානි බ්‍රහ්මචරියසාරුප්පානි, තත්ථ ධුවසීලී ච හොති ඨිතසීලී ච, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

තං වා පන අනභිසම්භවං අප්පටිවිජ්ඣං පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති.

තං වා පන අනභිසම්භවං අප්පටිවිජ්ඣං පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා උපහච්චපරිනිබ්බායී හොති -පෙ-

අසංඛාරපරිනිබ්බායී හොති. -පෙ- සසංඛාරපරිනිබ්බායී හොති -පෙ- උද්ධංසොතො හොති, අකනිට්ඨගාමී.

තං වා පන අනභිසම්භවං අප්පටිවිජ්ඣං තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති

තං වා පන අනභිසම්භවං අප්පටිවිජ්ඣං තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා එකබීජී හොති, එකඤ්ඤෙව මානුසකං භවං නිබ්බත්තෙත්වා දුක්ඛස්සන්තං කරොති.

තං වා පන අනභිසම්භවං අප්පටිවිජ්ඣං තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා කොලඞ්කොලො හොති, ද්වෙ වා තීණි වා කුලානි සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරොති.

තං වා පන අනභිසම්භවං අප්පටිවිජ්ඣං තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා සත්තක්ඛත්තුපරමො හොති. සත්තක්ඛත්තුපරමං දෙවෙ ච මනුස්සෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්ත කරොති.

ඉති ඛො භික්ඛවෙ පරිපූරං පරිපූරකාරී ආරාධෙති. පදෙසං පදෙසකාරී.

අවඤ්ඣානිත්වෙවාහං භික්ඛවෙ සික්ඛාපදානි වදාමීති.

1. අත්තකාමා - මජසං

## 3. 2. 4. 8.

38. මහණෙනි තමනට වැඩ කැමැති කුලපුත්‍රයෝ යමෙකෙ හික්මෙත් නම් මේ එබඳු සාධික යෙළසියක් සිකපද අඩමසක් පාසා උදෙසීමට එයි. මහණෙනි, යමෙක මෙ හැම සිකපද සංග්‍රහයට යේනම් මේ එබඳු ශික්‍ෂාවෝ තුන්දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: අධිශීලශික්‍ෂාය, අධිචිත්තශික්‍ෂාය, අධිප්‍රඥශික්‍ෂා යි. මහණෙනි, යමෙක මෙ හැම සිකපද සඞ්ග්‍රහයට යේ නම් මෙ එබඳු ත්‍රිවිධ ශික්‍ෂාවෝ යි.

මහණෙනි, මෙසස්නෙහි මහණ ශීලයෙහි පරිපූරකාරී වෙයි, සමාධියෙහි පරිපූරකාරී වෙයි, ප්‍රඥයෙහි පරිපූරකාරී වෙයි. හේ යම් ඒ කුදන්කුදු සිකපද ඇත් ද, ඒ අවදනේත් ඇවැතින් නැගී සිටුනේත් වෙයි.ඒ කවර හෙයින යත්: මහණෙනි, මෙහිලා මා විසින් අභව්‍යභාවයෙක් නොකියන ලදී. බ්‍රහමචර්‍යයට නිසි වූ යම් ඒ ආදිබ්‍රහමචර්‍යක ශික්‍ෂාපදයෝ ඇත් ද, එහි නිබඳ සිල් ඇතියේත් පිහිටි සිල් ඇතියේක් වෙයි. මොනොවට සමාදන්ව සික පදයෙහි හික්මෙයි. හේ ආස්‍රවයන් ක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ චෙතො-විමුක්තිය ප්‍රඥවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥනයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට ඊට එළඹ වෙසෙයි.

ඒ අර්හත්ත්වය හෝ නො විදුනේ නො පිළිවිදුනේ පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන් ක්‍ෂය කිරීමෙන් 'අන්තරාපරිනිබ්බායී' වෙයි.

ඒ අන්තරාපරිනිබ්බායී භාවය හෝ නො විදුනේ නො පිළිවිදුනේ පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන් ක්‍ෂය කිරීමෙන් "උපහච්චපරිනිබ්බායී" වෙයි. ....

අසඞ්ඛාරපරිනිබ්බායී වෙයි. ... සසඞ්ඛාරපරිනිබ්බායී වෙයි. ... අකනිට්ඨ-ගාමීඋද්ධංසොත වෙයි. ...

ඒ උද්ධංසොත අකනිට්ඨභාවය හෝ නො විදුනේ නො පිළිවිදුනේ ත්‍රිවිධ සංයොජනයන් ක්‍ෂය කිරීමෙන් රාගද්වෙෂමොහයන් තුනු කිරීමෙන් සෙදගැමි වෙයි. වරක් ම මෙ ලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි.

ඒ සෙද ගැමි බව හෝ නො විදුනේ නො පිළිවිදුනේ ත්‍රිවිධ සංයොජනයන් ක්‍ෂය කිරීමෙන් එකබීජී වෙයි, එක් ම මිනිස්බවක් නිපයා දුක් කෙළවර කෙරෙයි.

ඒ මිනිස්බව හෝ නොවිදුනේ නො පිළිවිදුනේ ත්‍රිවිධ සංයෝජනයන් ක්‍ෂය කිරීමෙන් කොලංකොල වෙයි. භව දෙකක් හෝ තුණක් දිවැ ඇවිද දුක් කෙළවර කෙරෙයි

ඒ කොලංකොල බව හෝ නො විදුනේ නො පිළිවිදුනේ ත්‍රිවිධ සංයෝජන-යන් ක්‍ෂය කිරීමෙන් සත්තක්ඛත්තුපරම වෙයි. සත්වරක් පරම කොට දෙව්ලොව ද මිනිස්ලොව ද දිවැ ඇවිද දුක් කෙළවර කෙරෙයි.

මහණෙනි, මෙසේ පරිපූරකාරී පුද්ගල පරිපූර්ණාර්ථය සපයයි. ප්‍රදේශකාරී පුද්ගල ප්‍රදේශාර්ථය සපයයි. මහණෙනි, මම "සිකපදනු නො වඳ හ"යි වදාරම් යි.

### 3. 2. 4. 9.

39. තිස්සො ඉමා භික්ඛවෙ සික්ඛා. කතමා තිස්සො? අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා.

කතමා ච භික්ඛවෙ අධිසීලසික්ඛා: ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති-පෙ-සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. අයං වුච්චති භික්ඛවෙ අධිසීලසික්ඛා.

කතමා ච භික්ඛවෙ අධිචිත්තසික්ඛා. ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ අධිචිත්තසික්ඛා.

කතමා ච භික්ඛවෙ අධිපඤ්ඤාසික්ඛා: ඉධ භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. අයං වුච්චති භික්ඛවෙ අධිපඤ්ඤාසික්ඛා.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො සික්ඛාති.

### 3. 2 4. 10.

40. තිස්සො ඉමා භික්ඛවෙ සික්ඛා. කතමා තිස්සො: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා.

කතමා ච භික්ඛවෙ අධිසීලසික්ඛා: ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති -පෙ-සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. අයං වුච්චති භික්ඛවෙ අධිසීලසික්ඛා.

කතමා ච භික්ඛවෙ අධිචිත්තසික්ඛා: ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ අධිචිත්තසික්ඛා.

කතමා ච භික්ඛවෙ අධිපඤ්ඤාසික්ඛා: ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ අධිපඤ්ඤාසික්ඛා.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො සික්ඛාති.

39 අධිසීලං අධිචිත්තං ච අධිපඤ්ඤඤ්ච විරියවා,
ථාමවා ධිතිමා ඣායී සතො ගුත්තින්ද්‍රියො චරෙ.

40 යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො.

41 යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා,
අභිභුය්‍ය දිසා සබ්බා අප්පමාණසමාධිනා.

## 3. 2. 4. 9.

39. මහණෙනි, මේ ශික්‍ෂාවෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: අධිශීලශික්‍ෂාය, අධිචිත්තශික්‍ෂාය, අධිප්‍රඥ ශික්‍ෂා යි.

මහණෙනි, අධිශීලශික්‍ෂා නම් කවර: මහණෙනි, මෙසස්නෙහි මහණ සිල්වත් වෙයි ... සමාදන කොට සිකපෙදෙහි හික්මෙයි. මහණෙනි, මේ අධිශීලශික්‍ෂා යි කියනු ලැබේ.

මහණෙනි, අධිචිත්තශික්‍ෂා නම් කවර: මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයෙන් වෙන්ව ම ... චතුර්ථධ්‍යානයට එළඹ වෙසෙයි. මහණෙනි, මේ අධි-චිත්ත ශික්‍ෂා යි කියනු ලැබේ.

මහණෙනි, අධිප්‍රඥශික්‍ෂා නම් කවර: මහණෙනි, මෙසස්නෙහි මහණ "මේ දුක"යි යථාභූතය දනී ... "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපත්ය"යි යථාභූතය දනී. මහණෙනි, මේ අධිප්‍රඥ ශික්‍ෂා යි කියනු ලැබේ.

මහණෙනි, මේ ත්‍රිවිධ ශික්‍ෂාවෝ යි.

## 3. 2. 4. 10.

40. මහණෙනි, මේ ශික්‍ෂාවෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: අධිශීලශික්‍ෂාය, අධිචිත්තශික්‍ෂාය, අධිප්‍රඥශික්‍ෂා යි.

මහණෙනි, අධිශීලශික්‍ෂා නම් කවර: මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි ... සමාදන කොට ශික්‍ෂා පදයෙහි හික්මෙයි. මහණෙනි, මේ අධිශීලශික්‍ෂා යි කියනු ලැබේ.

මහණෙනි, අධිචිත්තශික්‍ෂා නම් කවර: මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන්ව ම ... චතුර්ථධ්‍යානයට එළඹ වෙසෙයි. මහණෙනි, මේ අධිචිත්තශික්‍ෂා යි කියනු ලැබේ.

මහණෙනි, අධිප්‍රඥශික්‍ෂා නම් කවර: මහණෙනි, මෙ සස්නෙහි මහණ ආස්‍රවක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්ති හා ප්‍රඥවිමුක්ති ඉහාත්ම-යෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට ඊට එළඹ වෙසෙයි. මහණෙනි, මේ අධිප්‍රඥශික්‍ෂා යි (අඞ්ගීභාවමාගී යි) කියනු ලැබේ.

මහණෙනි, මේ ත්‍රිවිධ ශික්‍ෂාවෝ යි.

39. (චෛතසිකවීර්යයෙන්) වීර්යවත් වූ (කායිකවීර්යයෙන්) ස්ථාමවත් වූ ධෛර්යවත් වූ ධ්‍යාන කරණ සුලු සමෘතිමත් වූ සංයත ඉඳුරන් ඇති මහණ අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥ යන ත්‍රිවිධ ශික්‍ෂාවන් පුරන්නේ ය.

40. යම් පරිදි පළමු දවස් ත්‍රිවිධ ශික්‍ෂාවන් පිරී ද පසු දවසුදු එසේ ම පුරන්නේය. පසු දවස් යම්සේ පුරන්නේ ද පළමු දවස්හිදු එසේ ම වෙයි. යම් පරිදි යට කය අශුභවශයෙන් දක්නේ ද එපරිදි උඩුකය ද දක්නේ ය. යම් පරිදි උඩුකය දක්නේ ද එපරිදි යටිකය ද දක්නේ ය.

41. යම් පරිදි දවල ත්‍රිවිධ ශික්‍ෂාවන් පුරන්නේ ද, රැය ද එසේ ම පුරන්නේය. යම් පරිදි රැයෙහි පුරන්නේ ද දවල ද එසේ ම පුරන්නේ ය. අඞ්ගීභාවමාගීසමාධියෙන් හැම දික් (=අරමුණු) මැඩ ගෙණ සිටුනේ ය.

42 තමාහු සෙක්ඛං පටිපදං අථො [1]සංසුද්ධචාරණං,
තමාහු ලොකෙ සම්බුද්ධං වීරං[2] පටිපදන්තගුං.

43 විඤ්ඤාණස්ස නිරොධෙන තණ්හාක්ඛයවිමුත්තිනො,
පජ්ජොතස්සෙව නිබ්බාණං විමොක්ඛො හොති චෙතසොති.

### 3. 2. 4. 11.

[කොසලනිදානං:]

41. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන පඞ්කධා[3] නාම කොසලානං නිගමො තදවසරි. තත්‍ර සුදං භගවා පඞ්කධායං විහරති. පඞ්කධා නාම කොසලානං නිගමො[4].

තෙන ඛො පන සමයෙන කස්සපගොත්තො නාම භික්ඛු පඞ්කධායං ආවාසිකො හොති. තත්‍ර සුදං භගවා සික්ඛාපදපටිසංයුත්තාය ධම්මියා කථාය භික්ඛූ සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති.

අථ ඛො කස්සපගොත්තස්ස භික්ඛුනො භගවති සික්ඛාපදපටිසංයුත්තාය ධම්මියා කථාය භික්ඛූ සන්දස්සෙන්තෙ සමාදපෙන්තෙ සමුත්තෙජෙන්තෙ සම්පහංසෙන්තෙ අහුදෙව අක්ඛන්ති, අහු අප්පච්චයො, 'අධිසල්ලිඛතෙවායං[5] සමණො'ති.

අථ ඛො භගවා පඞ්කධායං යථාභිරන්තං විහරිත්වා යෙන රාජගහං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන රාජගහං තදවසරි. තත්‍ර සුදං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ.[6] අථ ඛො කස්සපගොත්තස්ස භික්ඛුනො අචිරපක්කන්තස්ස භගවතො අහුදෙව කුක්කුච්චං. අහු විප්පටිසාරො "අලාභා වත මෙ, න වත මෙ ලාභා. දුල්ලද්ධං වත මෙ, න වත මෙ සුලද්ධං, යස්ස මෙ භගවති සික්ඛාපදපටිසංයුත්තාය ධම්මියා-කථාය භික්ඛූ සන්දස්සෙන්තෙ සමාදපෙන්තෙ සමුත්තෙජෙන්තෙ සම්පහංසෙන්තෙ අහුදෙව අක්ඛන්ති, අහු අප්පච්චයො, අධිසල්ලිඛතෙවායං සමණො"ති.

යන්නූනාහං යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යං, උපසඞ්කමිත්වා භගවතො සන්තිකෙ අච්චයං අච්චයතො දෙසෙය්‍යන්ති.

අථ ඛො කස්සපගොත්තො භික්ඛු සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන රාජගහං තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන රාජගහං යෙන ගිජ්ඣකූටො පබ්බතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො කස්සපගොත්තො භික්ඛු භගවන්තං එතදවොච:

---

1. සංසුද්ධචාරියං - මජසං 2. ධීරං - සීමු.
3. පඞ්කධා නාම - මජසං. 4. නිගමෙ - සබ්බත්ථ 5. අධිසල්ලෙඛතෙවායං - සතා.
6. ගිජ්ඣකූටෙ පබ්බතෙ - න දිස්සතෙ මජසං.

42. සකරණීය වූ ඔහු පිළිපන්නකු කොට කියත්. වැලිත් පිරිසිදු සිල් ඇති ඔහු ලෝකයෙහි චතුස්සත්‍යාවබෝධය කළ පිළිවෙත්හි කෙළවරට ගිය වීර වූ ධිතිසම්පන්නයකු කොට කියත්.

43 තෘෂ්ණාක්ෂය විමුක්ති සඞ්ඛ්‍යාත අර්හත්ඵලවිමුක්තියෙන් සමන්වාගත ඒ ආර්‍ය්‍යපුද්ගලයාගේ චරමවිඥානයාගේ නිරොධයෙන් ප්‍රදීපනිර්වාණයක් මෙන් චිත්තයාගේ විමුක්තිය වේ.

### 3. 2. 4. 11.

[කොසොල් නිදානයි:]

41. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි මහත් භික්සඟුන් සමග සැරි සරණ සේක් කෝශලයන්ගේ පඞ්කධා නම් නියම්ගමට වැඩි සේක. එහි කෝශලයන්ගේ 'පඞ්කධා' නම් නියම් ගමෙක් වේ ද ඒ 'පඞ්කධා' යෙහි වැඩ වෙසෙති.

එසමයෙහි කසුබුගොතු නම් මහණ පඞ්කධායෙහි ආවාසික වෙයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ශික්ෂාපද ප්‍රතිසංයුක්ත දැහැමි කථායෙන්. සතුන් දක්වත්. කරුණු බැණ සමාදන් කරවත්. උත්සාහ දනවත්. පහදවත්.

ඉක්බිති කසුබුගොතු මහණහට භාග්‍යවතුන් වහන්සේ ශික්ෂාපද ප්‍රති-සංයුක්ත දැහැමි කථායෙන් මහණුන් දක්වත් ම සමාදන් කරවත් ම උත්සාහ දනවත් ම පහදවත් ම අක්ෂාන්තිය වී මැ ය. නො සතුටෙක් වී ම ය. 'මේ මහණ අත්‍යර්ථයෙන් සියුම් සියුම් කොට බෙණේය' යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පඞ්කධායෙහි කැමැති තාක් වැස රජගහනුවර කරා චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙළින් සැරිසරණ සේක් රජගහනුවරට වැඩි සේක. එකල භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජුකුළු පව්යෙහි වැඩ වසන සේක. ඉක්බිති, භාග්‍යවතුන් වහන්සේ නික්ම වඩුත් ම කසුබුගොතු මහණහට කුකුස් වී ම ය. විපිළිසර වී ම ය. "යම් බඳු මට භාග්‍යවතුන් වහන්සේ ශික්ෂාපද ප්‍රතිසංයුක්ත දැහැමි කථායෙන් මහණුන් දක්වත් ම සමාදන් කරවත් ම, උත්සාහ කරවත් ම පහදවත් ම මේ මහණ අත්‍යර්ථයෙන් කරුණු බැණ කියති යි අක්ෂාන්තියෙක් වී ද, නො සතුටෙක් වී ද, ඒ මට ඒකාන්තයෙන් අලාභයෙකි. ඒ මට ඒකාන්තයෙන් ලාභයෙක් නොවේ. ඒ මට ඒකාන්තයෙන් අභාග්‍යයෙකි. ඒ මට ඒකාන්ත-යෙන් මනා භාග්‍යයෙක් නො වේ ය" යි.

"මම භාග්‍යවතුන් වහන්සේ කරා එළඹෙම් නම් එළඹ භාග්‍යවතුන් වහන්සේ වෙත වරද වරද වියින් දෙසන්නෙම් නම් මනා මැ නු" යි.

ඉක්බිති කසුබුගොතු මහණ සෙනසුන් සඟවා තබා පාසිවුරු ගෙණ රජගහනුවර කරා එළඹියේ ය. පිළිවෙළින් රජගහනුවර ගිජුකුළු පව්යෙහි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹිත. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හිත. එකත්පස්ව හුන් කසුබු ගොතු මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේය:

එකමිදං[1]. භන්තෙ සමයං භගවා පඞ්කධායං විහරති, පඞ්කධා නාම කොසලානං නිගමො[2]. තත්‍ර සුදං භගවා සික්ඛාපදපටිසංයුත්තාය ධම්මියා කථාය භික්ඛූ සන්දස්සෙසි. සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. තස්ස මය්හං භන්තෙ භගවති සික්ඛාපදපටිසඤ්ඤුත්තාය ධම්මියා කථාය භික්ඛූ සන්දස්සෙන්තෙ සමාදපෙන්තෙ සමුත්තෙජෙන්තෙ සම්පහංසෙන්තෙ අහුදෙව අක්ඛන්ති, අහු අප්පච්චයො, "අධිසල්ලිඛතෙවායං සමණො"ති. අථ ඛො භන්තෙ භගවා පඞ්කධායං යථාභිරන්තං විහරිත්වා යෙන රාජගහං තෙන චාරිකං පක්කාමි. තස්ස මය්හං භන්තෙ අචිරපක්කන්තස්ස භගවතො අහුදෙව කුක්කුච්චං, අහු විප්පටිසාරො, "අලාභා වත මෙ, න වත මෙ ලාභා. දුල්ලද්ධං වත මෙ, න වත මෙ සුලද්ධං, යස්ස මෙ භගවති සික්ඛාපදපටිසංයුත්තාය ධම්මියා කථාය භික්ඛූ සන්දස්සෙන්තෙ සමාදපෙන්තෙ සමුත්තෙජෙන්තෙ සම්පහංසෙන්තෙ අහුදෙව අක්ඛන්ති, අහු අප්පච්චයො, අධිසල්ලිඛතෙවායං සමණොති. යන්නූනාහං යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යං, උපසඞ්කමිත්වා භගවතො සන්තිකෙ අච්චයං අච්චයතො දෙසෙය්‍ය"න්ති.

අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං යස්ස මෙ භගවති සික්ඛාපදපටිසඤ්ඤුත්තාය ධම්මියා කථාය භික්ඛූ සන්දස්සෙන්තෙ සමාදපෙන්තෙ සමුත්තෙජෙන්තෙ සම්පහංසෙන්තෙ අහුදෙව අක්ඛන්ති, අහු අප්පච්චයො, අධිසල්ලිඛතෙවායං සමණොති. තස්ස මෙ භන්තෙ භගවා අච්චයං අච්චයතො පතිගණ්හාතු ආයතිං සංවරායාති.

තග්ඝ ත්වං කස්සප අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං; යස්ස තෙ මයි සික්ඛාපදපටිසංයුත්තාය ධම්මියා කථාය භික්ඛූ සන්දස්සෙන්තෙ සමාදපෙන්තෙ සමුත්තෙජෙන්තෙ සම්පහංසෙන්තෙ අහුදෙව අක්ඛන්ති, අහු අප්පච්චයො, අධිසල්ලිඛතෙවායං සමණො'ති

යතො ච ඛො ත්වං කස්සප අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොසි, තං තෙ මයං පතිගණ්හාම, වුද්ධි හෙසා කස්සප අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති. ආයතිං සංවරං ආපජ්ජති.

ථෙරො චෙපි කස්සප භික්ඛු හොති න සික්ඛාකාමො සික්ඛාසමාදානස්ස න වණ්ණවාදී. යෙ චඤ්ඤෙ භික්ඛූ න සික්ඛාකාමා තෙ ච න සික්ඛාය න සමාදපෙති, යෙ චඤ්ඤෙ භික්ඛූ සික්ඛාකාමා තෙසඤ්ච න වණ්ණං භණති, භූතං තච්ඡං කාලෙන. එවරූපස්සාහං කස්සප ථෙරස්ස භික්ඛුනො න වණ්ණං භණාමි.

---

1. එකමිදං - සීමු. 2. නිගමෙ - සබ්බත්ථ

වහන්ස, එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොශලයන්ගේ පඞ්කධා නම් නියම්ගමෙක් වේ ද, එ ගම වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ ශික්‍ෂාපද ප්‍රතිසංයුක්ත දහැම් කථායෙන් මහණුන් මොනොවට දක්වූ සේක, සමාදන් කරවූ සේක. උත්සාහවත් කරවූ සේක. පහදවා ලූ සේක. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ශික්‍ෂාපද ප්‍රතිසංයුක්ත දහැම් කථායෙන් මහණුන් දක්වත් ම සමාදන් කරවත් ම උත්සාහ කරවත් ම පහදවත් ම "මේ මහණ අත්‍යර්‍ථයෙන් කරුණු බැණ කියත් ම ය"යි ඒ මට අක්‍ෂාන්තියෙක් නො සතුටෙක් වී ම ය. වහන්ස, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පඞ්කධායෙහි කැමැති තාක් වැස රජගහ නුවරට චාරිකායෙහි වැඩි සේක. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නික්ම ඩුත් ම "භාග්‍යවතුන් වහන්සේ ශික්‍ෂාපද ප්‍රතිසංයුක්ත දහැම් කථායෙන් මහණුන් දක්වත් ම සමාදන් කරවත් ම උත්සාහ කරවත් ම පහදවත් ම 'මේ මහණ අත්‍යර්‍ථයෙන් කරුණු බැණ කියයි' යි යම් බඳු මට අක්‍ෂාන්තියෙක් නොසතුටෙක් වී ද, ඒ මට කුකුසෙක් වී ම ය. විප්‍රතිසාරයෙක් වී ම ය. මට ඒකාන්තයෙන් අලාභයෙක, මට ඒකාන්තයෙන් ලාභයෙක් නො වේ. මට ඒකාන්තයෙන් අභාග්‍යයෙක, මට ඒකාන්තයෙන් මනා භාග්‍යයෙක් නො වේ. මම භාග්‍යවතුන් වහන්සේ කරා එළඹෙම් නම්, එළඹ භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි වරද වරද විසින් දෙසන්නෙම් නම් මනා මැ නු!" යි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ශික්‍ෂාපද ප්‍රතිසංයුක්ත දහැම් කථායෙන් මහණුන් දක්වත් ම සමාදන් කරවත් ම උත්සාහවත් කරවත් ම පහදවත් ම "මේ මහණ අත්‍යර්‍ථයෙන් කරුණු බැණ කියති" යි යම්බඳු මට අක්‍ෂාන්තියෙක් නො සතුටෙක් වී ද, ඒ අපරාධය බාල බවට අනුරිවින් මූඪ බවට අනුරිවින් අකුශලයට අනුරිවින් මා අභිභවා ගියේ ය. වහන්ස, ඒ මාගේ වරද භාග්‍යවතුන් වහන්සේ ආයති සංවරය සඳහා වරද විසින් පිළිගන්නා සේක්වා.

කස්බ, මා ශික්‍ෂාපද ප්‍රතිසංයුක්ත දහැම් කථායෙන් සඟුන් දක්වත් ම සමාදන් කරවත් ම උත්සාහ කරවත් ම පහදවත් ම 'මේ මහණ අත්‍යර්‍ථයෙන් කරුණු බැණ සියුම් සියුම් කොට කියත් මැ ය'යි යම්බඳු තට අක්‍ෂාන්තියෙක් නො සතුටෙක් වී ද, ඒකාන්තයෙන් ඒ වරද යම් පරිදි බාල වී නම් යම් පරිදි මූඪ වී නම් යම් පරිදි අකුශල වී නම් එපරිදි ම තා අභිභවා ගියේ ය.

කස්බ, යම් හෙයෙකින් තෝ වරද වරද විසින් දැක ධර්මානුරූප පරිදි ප්‍රතිකර්ම කෙරෙහි ද, තාගේ ඒ වරද අපි පිළිගණ්නම්හ. කස්බ, යමෙක් වරද වරද විසින් දැක ධර්මානුරූප පරිදි ප්‍රතිකර්ම කෙරේ නම්, ආයති සංවරයට පැමිණේ නම්, තෙල ප්‍රතිපත්තිය, ආර්‍ය විනයෙහි අභිවෘද්ධියෙක් ම ය.

කස්බ, ස්ථවිර භික්‍ෂුවෙක් වේ ද, හේ ශික්‍ෂාකාම නො වේ ද, ශික්‍ෂාසමාදානය පිළිබඳ ගුණ කියන්නේ නො වේ ද, ශික්‍ෂාකාම නොවන යම් අන්කිසි සඟහු වෙත් නම්, ඔවුනුදු ශික්‍ෂායෙහි සමාදන් නො කරවා ද, ශික්‍ෂාකාම වූ යම් අන්කිසි සඟහු වෙත් නම්, ඔවුන්ගේ විද්‍යමාන වූ සැබෑ වූ ගුණ නිසි කල්හි නො කියා නම්, කස්බ, මෙබඳු වූ ඒ ස්ථවිර භික්‍ෂුහුගේ ගුණ මම නො කියම්.

තං කිස්ස හෙතු:

සත්ථා හිස්ස වණ්ණං භණතීති අඤ්ඤෙ ච නං භික්ඛූ භජෙය්‍යුං, යෙ නං භජෙය්‍යුං, ත්‍යාස්ස දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං. යාස්ස දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං, තෙසං තං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛායාති. තස්මාහං කස්සප එවරූපස්ස ථෙරස්ස භික්ඛුනො න වණ්ණං භණාමි.

මජ්ඣිමො චෙපි කස්සප භික්ඛු හොති -පෙ- නවො චෙපි කස්සප භික්ඛු හොති න සික්ඛාකාමො සික්ඛාසමාදානස්ස න වණ්ණවාදී, යෙ චඤ්ඤෙ භික්ඛූ න සික්ඛාකාමා තෙ ච පන සික්ඛාය න සමාදපෙති. යෙ චඤ්ඤෙ භික්ඛූ සික්ඛාකාමා, තෙසඤ්ච න වණ්ණං භණති භූතං තච්ඡං කාලෙන. එවරූපස්සාහං කස්සප නවස්ස භික්ඛුනො න වණ්ණං භණාමි

තං කිස්ස හෙතු:

සත්ථා හිස්ස වණ්ණං භණතීති අඤ්ඤෙ ච නං භික්ඛූ භජෙය්‍යුං, යෙ නං භජෙය්‍යුං, ත්‍යාස්ස දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං. යාස්ස දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං, තෙසං තං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛායාති. තස්මාහං කස්සප එවරූපස්ස නවස්ස භික්ඛුනො න වණ්ණං භණාමි.

ථෙරො චෙපි කස්සප භික්ඛු හොති සික්ඛාකාමො සික්ඛාසමාදානස්ස වණ්ණවාදී, යෙ චඤ්ඤෙ භික්ඛූ න සික්ඛාකාමා, තෙ ච සික්ඛාය සමාදපෙති, යෙ චඤ්ඤෙ භික්ඛූ සික්ඛාකාමා තෙසඤ්ච වණ්ණං භණති භූතං තච්ඡං කාලෙන. එවරූපස්සාහං කස්සප ථෙරස්ස භික්ඛුනො වණ්ණං භණාමි.

තං කිස්ස හෙතු:

සත්ථා හිස්ස වණ්ණං භණතීති අඤ්ඤෙ ච නං භික්ඛූ භජෙය්‍යුං, යෙ නං භජෙය්‍යුං, ත්‍යාස්ස දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං. යාස්ස දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං තෙසං තං අස්ස දීඝරත්තං හිතාය සුඛායාති. තස්මාහං කස්සප එවරූපස්ස ථෙරස්ස භික්ඛුනො වණ්ණං භණාමි.

මජ්ඣිමො චෙපි කස්සප භික්ඛු හොති -පෙ- නවො චෙපි කස්සප භික්ඛු හොති සික්ඛාකාමො සික්ඛාසමාදානස්ස වණ්ණවාදී. යෙ චඤ්ඤෙ භික්ඛූ න සික්ඛාකාමා, තෙ ච සික්ඛාය සමාදපෙති, යෙ චඤ්ඤෙ භික්ඛූ සික්ඛාකාමා, තෙසඤ්ච වණ්ණං භණති භූතං තච්ඡං කාලෙන, එවරූපස්සාහං කස්සප නවස්ස භික්ඛුනො වණ්ණං භණාමි.

තං කිස්ස හෙතු:

සත්ථා හිස්ස වණ්ණං භණතීති අඤ්ඤෙ ච නං භික්ඛූ භජෙය්‍යුං. යෙ නං භජෙය්‍යුං, ත්‍යාස්ස දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං. යාස්ස දිට්ඨානුගතිං ආපජ්ජෙය්‍යුං, තෙසං තං අස්ස දීඝරත්තං හිතාය සුඛායාති. තස්මාහං කස්සප එවරූපස්ස නවස්ස භික්ඛුනො වණ්ණං භණාමීති.

**සමණවග්ගො චතුත්ථො.**

---

* තදුද්දානං -:
සමණො ගද්‍රභො ඛෙත්තං - වජ්ජිපුත්තො ච සෙක්ඛතං
තයො ච සික්ඛනා වුත්තා දෙව සික්ඛා සංකවායනාමාති. මජසං.

ඒ කවර හෙයින යත්:

"ශාස්තෘන් වහන්සේ වනාහි ඔහුගේ ගුණ වදරති" යි සෙස්සෝ ඒ මහණ සෙවුනාහුය. යම් මහණ කෙනෙක් ඒ මහණ සෙවුනාහු ද, ඒ මහණහු ඔහු පිළිබඳ දෘෂ්ටානුගතියට පැමිණෙන්නාහුය. යම් මහණ කෙනෙක් ඔහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙන්නාහු ද, ඔවුනට එය දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේ ය. කස්බ, එහෙයින් මම මෙබඳු ස්ථවිර භික්ෂුහුගේ ගුණ නො කියමි.

කස්බ, ඉදින් මධ්‍යම භික්ෂුවෙක් වේ ද .... කස්බ, ඉදින් නවක භික්ෂුවෙක් වේ ද, හේ ශික්ෂාකාම නො වේ ද, ශික්ෂාසමාදානය පිළිබඳ ගුණ කියන්නේ නො වේ ද, ශික්ෂාකාම නොවන යම් අන්කිසි සඟහු ඇත් ද, ඔවුනුදු ශික්ෂා-යෙහි සමාදන නො කරවා ද, ශික්ෂාකාම වන යම් අන්කිසි සඟහු ඇත් ද, ඔවුන්ගේ ත් විද්‍යමාන වූ සැබෑ වූ ගුණ නිසි කල්හි නො කියා ද, කස්බ, මම මෙබඳු නවක භික්ෂුහුගේ ගුණ නො කියමි.

ඒ කවර හෙයින යත්:

"ශාස්තෘන් වහන්සේ වනාහි ඔහුගේ ගුණ වදරති'යි අන් මහණහු ඔහු සෙවුනාහුය. යම් මහණ කෙනෙක් ඔහු සෙවුනාහු ද, ඒ මහණහු ඔහු පිළිබඳ දෘෂ්ටානුගතියට පැමිණෙන්නාහුය. යම් මහණ කෙනෙක් ඔහු පිළිබඳ දෘෂ්ටානුගතියට පැමිණෙන්නාහු ද, ඔවුනට එය දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේය. කස්බ, එහෙයින් මම මෙබඳු නවක භික්ෂුහුගේ ගුණ නො කියමි.

කස්බ, ස්ථවිර භික්ෂුවෙක් වේ ද, හේ ශික්ෂාකාම වේ ද, ශික්ෂාසමාදානය පිළිබඳ ගුණ කියන්නේ වේ ද, ශික්ෂාකාම නොවන යම් අන්කිසි සඟහු ඇත් ද, ඔවුනුත් ශික්ෂායෙහි සමාදන් කරවා ද, ශික්ෂාකාම වන යම් අන්කිසි සඟහු ඇත් ද, ඔවුනුදු ගේ විද්‍යමාන වූ සැබෑ වූ ගුණ නිසි කල්හි බෙණේ ද, කස්බ, මම මෙබඳු ස්ථවිර භික්ෂුහුගේ ගුණ කියමි.

ඒ කවර හෙයින යත්:

"ශාස්තෘන් වහන්සේ වනාහි ඔහුගේ ගුණ වදරති" යි අන් මහණහු ඔහු සෙවුනාහුය. යම් මහණ කෙනෙක් ඔහු සෙවුනාහු ද, ඒ මහණහු ඔහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙන්නාහුය: යම් මහණ කෙනෙක් ඔහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙන්නහු ද, ඔවුනට එය දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුබ පිණිස වන්නේ ය. කස්බ, එහෙයින් මම මෙබඳු ස්ථවිර භික්ෂුහුගේ ගුණ කියමි.

කස්බ, මධ්‍යම භික්ෂුවෙක් වේ ද ... කස්බ, නවක භික්ෂුවෙක් වේ ද, හේ ශික්ෂාකාම වේ ද, ශික්ෂාසමාදානය පිළිබඳ ගුණ කියන්නේ වේ ද, ශික්ෂාකාම නොවන යම් අන්කිසි සඟහු ඇත් ද, ඔවුනුදු ශික්ෂායෙහි සමාදන් කරවා ද, ශික්ෂාකාම වන යම් අන්කිසි සඟහු ඇත් ද, ඔවුනුදු ගේ විද්‍යමාන වූ සැබෑ වූ ගුණ නිසි කල්හි බෙණේ ද, කස්බ, මම මෙබඳු නවක භික්ෂුහුගේ ගුණ කියමි.

ඒ කවර හෙයින යත්:

"ශාස්තෘන් වහන්සේ වනාහි ඔහුගේ ගුණ වදරති" යි අන් මහණහු ඔහු සෙවුනාහුය. යම් මහණ කෙනෙක් ඔහු සෙවුනාහු ද, ඒ මහණහු ඔහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙන්නාහු ය. යම් මහණ කෙනෙක් ඔහුගේ දෘෂ්ටානු-ගතියට පැමිණෙන්නාහු ද, ඔවුනට ඒ දීර්ඝරාත්‍රයෙහි හිත පිණිස සුබ පිණිස වන්නේ ය. කස්බ, එහෙයින් මම මෙබඳු නවක භික්ෂුහුගේ ගුණ කියමි.

**සතරවන ශ්‍රමණ වර්ගය යි.**

# [ 5. ලොණඵල වග්ගො ]

**3. 2. 5. 1.**

**[සාවත්ථිනිදානං:]**

42. තීණිමානි භික්ඛවෙ කස්සකස්ස ගහපතිස්ස අච්චායිකානි කරණීයානි.

කතමානි තීණි:

ඉධ භික්ඛවෙ කස්සකො ගහපති සීඝසීඝං ඛෙත්තං සුකට්ඨං කරොති සුමතිකතං. සීඝසීඝං ඛෙත්තං සුකට්ඨං කරිත්වා සුමතිකතං සීඝසීඝං බීජානි පතිට්ඨාපෙති. සීඝසීඝං බීජානි පතිට්ඨාපෙත්වා සීඝසීඝං උදකං අභිනෙතිපි අපනෙතිපි. ඉමානි ඛො භික්ඛවෙ තීණි කස්සකස්ස ගහපතිස්ස අච්චායිකානි කරණීයානි.

තස්ස ඛො තං භික්ඛවෙ කස්සකස්ස ගහපතිස්ස නත්ථි සා ඉද්ධි වා ආනුභාවො වා, අජ්ජෙව මෙ ධඤ්ඤානි ජායන්තු ස්වෙව ගබ්භීනි හොන්තු උත්තරස්වෙව පච්චන්තූති. අථ ඛො භික්ඛවෙ හොති සො සමයො. යං තස්ස කස්සකස්ස ගහපතිස්ස තානි ධඤ්ඤානි උතුපරිණාමීනි ජායන්තිපි ගබ්භීනිපි හොන්ති පච්චන්තිපි.

එවමෙව ඛො භික්ඛවෙ තීණිමානි භික්ඛුස්ස අච්චායිකානි කරණීයානි.

කතමානි තීණි:

අධිසීලසික්ඛාසමාදානං අධිචිත්තසික්ඛාසමාදානං අධිපඤ්ඤාසික්ඛාසමාදානං. ඉමානි ඛො භික්ඛවෙ තීණි භික්ඛුස්ස අච්චායිකානි කරණීයානි.

තස්ස ඛො තං භික්ඛවෙ භික්ඛුනො නත්ථි සා ඉද්ධි වා ආනුභාවො වා, අජ්ජෙව මෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චතු ස්වෙව වා උත්තරස්වෙව වාති. අථ ඛො භික්ඛවෙ හොති සො සමයො, යං තස්ස භික්ඛුනො අධිසීලම්පි සික්ඛතො අධිචිත්තම්පි සික්ඛතො අධිපඤ්ඤම්පි සික්ඛතො අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං තිබ්බො නො ඡන්දො භවිස්සති අධිසීලසික්ඛාසමාදානෙ. තිබ්බො ඡන්දො භවිස්සති අධිචිත්තසික්ඛාසමාදානෙ. තිබ්බො ඡන්දො භවිස්සති අධිපඤ්ඤාසික්ඛාසමාදානෙති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

# [ 5. ලොණඵලවග්ගය ]

### 3. 2. 5. 1.

**[සැවැත් නිදානයි:]**

42. මහණෙනි, සීසාතා ගෘහැවිහුගේ මේ අතිශ් ආවශ්‍යක කෘත්‍යයෝ තුන් දෙනෙකි.

කවර තුන් දෙනෙක යත්:

මහණෙනි, මෙලොව සීසාතා ගැහැවි වහ වහා කෙත මොනොවට සාතා ලද්දක් පුවරු ගා සම කරණ ලද්දක් කෙරෙයි. වහ වහා කෙත මොනොවට සාට තැනක් මොනොවට පුවරු ගා සම කළ තැනැක් කොට වහ වහා බිජු පිහිටුවයි. වහ වහා බිජු පිහිටුවා වහ වහා දිය එළවීමුදු නෙරීමුදු කෙරෙයි. මහණෙනි, සාතා ගැහැවිහුගේ මේ අතික් ආවශ්‍යක කෘත්‍යයෝ තුන් දෙනහ.

මහණෙනි, ඒ සාතා ගෙහෙවිහුගේ "අද ම මාගේ ධාන්‍යයෝ තැගෙත්වා, සෙට ම ගර්භිත වෙත්වා, අනෙක් (නෙවත) දා ම පැසෙත්වා" යි එබඳු සෘද්ධියෙක් වේ ව යි අනුභාවයෙක් වේව යි නැත. වැලිදු මහණෙනි, යම් හෙයෙකින් ඒ සාතා ගෙහෙවිහුගේ සෘතුපරිණාමයට පත් ඒ ධාන්‍යයෝ තැගෙත් ද, ගර්භිතත් වෙද්ද, පැසෙද්ද, එබඳු කලෙක් වෙයි.

මහණෙනි, එපරිදි ම මහණහුගේ මේ අතික් ආවශ්‍යක කෘත්‍යයෝ තුන් දෙනෙකි.

කවර තුන් දෙනෙක යත්:

අධිශීලශික්ෂා සමාදානය අධිචිත්තශික්ෂා සමාදානය අධිප්‍රඥශික්ෂා සමාදාන යි. මහණෙනි, මොහු තුන් දෙනා මහණහුගේ අතික් ආවශ්‍යක කෘත්‍යයෝ යි.

මහණෙනි, ඒ මහණහුගේ "අද ම මාගේ සිත උපාදා විසින් නො ගෙණ ආස්‍රවයන් කෙරෙත් මිදේව යි හෝ සෙට හෝ අනෙක් දා හෝ මිදේව යි කියා හෝ එබඳු සෘද්ධියෙක් වේව යි අනුභාවයෙක් වේව" යි නැත. වැලිදු මහණෙනි. යම් හෙයෙකින් අධිශීලයෙහි හික්මෙන අධිචිත්තයෙහි හික්මෙන අධිප්‍රඥයෙහි හික්මෙන ඒ මහණහුගේ සිත උපාදා විසින් නො ගෙණ මිදේ නම් එබඳු කලෙක් වෙයි.

මහණෙනි, එහෙයින් මෙසේ හික්මෙත්තේ ය: "අපගේ තීව්‍ර ඡන්දයෙක් අධිශීලශික්ෂා සමාදානයෙහි වෙයි. තීව්‍ර ඡන්දයෙක් අධිචිත්ත ශික්ෂා සමාදාන-යෙහි වෙයි. තීව්‍ර ඡන්දයෙක් අධිප්‍රඥශික්ෂා සමාදානයෙහි වෙයි". මහණෙනි, මෙසේ ම තොප හික්මෙත්තේ ය.

## 3 2 5. 2.

43. තීණිමානි භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා පවිවෙකානි පඤ්ඤපෙන්ති.

කතමානි තීණි:

චීවරපවිවෙකං පිණ්ඩපාතපවිවෙකං සෙනාසනපවිවෙකං.

තත්‍රිදං භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා චීවරපවිවෙකස්මිං පඤ්ඤපෙන්ති: සාණානිපි ධාරෙන්ති, මසාණානිපි ධාරෙන්ති, ඡවදුස්සානිපි ධාරෙන්ති, පංසුකූලානිපි ධාරෙන්ති, තිරීටකානිපි[1] ධාරෙන්ති, අජිනානිපි[2] ධාරෙන්ති, අජිනක්ඛිපම්පි ධාරෙන්ති, කුසචීරම්පි ධාරෙන්ති, වාකචීරම්පි ධාරෙන්ති, ඵලකචීරම්පි ධාරෙන්ති, කෙසකම්බලම්පි ධාරෙන්ති, වාලකම්බලම්පි ධාරෙන්ති, උලූකපක්ඛිකම්පි ධාරෙන්ති. ඉදං ඛො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා චීවරපවිවෙකස්මිං පඤ්ඤපෙන්ති.

තත්‍රිදං භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා පිණ්ඩපාතපවිවෙකස්මිං පඤ්ඤපෙන්ති: සාකභක්ඛාපි හොන්ති, සාමාකභක්ඛාපි හොන්ති, නීවාරභක්ඛාපි හොන්ති, දද්දුලභක්ඛාපි හොන්ති, හටභක්ඛාපි හොන්ති, කණභක්ඛාපි හොන්ති, ආචාමභක්ඛාපි හොන්ති, පිඤ්ඤාකභක්ඛාපි හොන්ති, තිණභක්ඛාපි හොන්ති, ගොමයභක්ඛාපි හොන්ති, වනමූලඵලාහාරා යාපෙන්ති, පවත්තඵලභොජී. ඉදං ඛො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා පිණ්ඩපාතපවිවෙකස්මිං පඤ්ඤපෙන්ති.

තත්‍රිදං භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා සෙනාසනපවිවෙකස්මිං පඤ්ඤපෙන්ති: අරඤ්ඤං, රුක්ඛමූලං, සුසානං, වනපත්ථං, අබ්භොකාසං, පලාලපුඤ්ජං, භුසාගාරං. ඉදං ඛො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා සෙනාසනපවිවෙකස්මිං පඤ්ඤාපෙන්ති.

ඉමානි ඛො භික්ඛවෙ තීණි අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා පවිවෙකානි පඤ්ඤපෙන්ති.

තීණි ඛො පනිමානි භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ භික්ඛුනො පවිවෙකානි.

කතමානි තීණි:

ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා ච හොති. දුස්සීල්‍යඤ්චස්ස පහීනං හොති, තෙන ච විවිත්තො හොති. සම්මාදිට්ඨිකො[3] හොති, මිච්ඡාදිට්ඨි චස්ස පහීනා හොති, තාය ච විවිත්තො හොති. ඛීණාසවො හොති, ආසවා චස්ස පහීනා හොන්ති, තෙහි ච විවිත්තො හොති.

යතො ඛො භික්ඛවෙ භික්ඛු සීලවා හොති, දුස්සීල්‍යඤ්චස්ස පහීනං හොති, තෙන ච විවිත්තො හොති. සම්මාදිට්ඨිකො හොති, මිච්ඡාදිට්ඨි චස්ස පහීනා හොති, තාය ච විවිත්තො හොති. ඛීණාසවො ච හොති, ආසවා චස්ස පහීනා හොන්ති, තෙහි ච විවිත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අග්ගප්පත්තො සාරප්පත්තො සුද්ධො සාරෙ පතිට්ඨිතො.

---

1. තිරීටානිපි - මජසං. 2. අජිනම්පි - මජසං. 3. සම්මාදිට්ඨිකො ච. - මජසං.

### 3. 2. 5. 2.

43. මහණෙනි, අන්තොටු පිරිවැජියෝ මේ ප්‍රවිවෙක තුණ පණවත්

කවර තුණෙක යත්:

චීවර ප්‍රවිවෙකය, පිණ්ඩපාත ප්‍රවිවෙකය, ශයනාසන ප්‍රවිවෙක යි.

මහණෙනි, අන්තොටු පිරිවැජියෝ ඒ චීවර ප්‍රවිවෙකයෙහි ලා මේ පැණවීම කෙරෙත්: සණවැහැරි ද ධරත්. මුසු පිළී ද ධරත්. මිනියෙත් තෙල වත් ද ධරත්. බිම ලූ මහලු පිළී ද ධරත්. රුක්පොතුමුවා පිළී ද ධරත්. අඳුන්මුවසමුදු ධරත්. මැදින් පැළු අඳුන්මුවසමුදු ධරත්. කුසවැහැරි ද ධරත්. වික්කලමුදු ධරත්. පුවරු වැහැරි ද ධරත්. කෙස්මුවා කම්බිලි ද ධරත්. අස්ලොම්මුවා කම්බිලි ද ධරත්. මහමුහුනු පියායෙන් කළ පිළී ද ධරත් මහණෙනි, අන්තොටු පිරිවැජියෝ චීවරප්‍රවිවෙකයෙහි ලා මෙය පණවත්.

මහණෙනි, අන්තොටු පිරිවැජියෝ ඒ පිණ්ඩපාතප්‍රවිවෙකයෙහි ලා මේ පැණවීම කෙරෙත්: පලා වළඳනුවෝ ද වෙත්. බඩහමු වළඳනුවෝ ද වෙත්. හුරුහැල් වළඳනුවෝ ද වෙත්. සම්කසළ වළඳනුවෝ ද වෙති, ලහටු හෝ සෙවෙල් වළඳනුවෝ ද වෙති. කුඩු වළඳනුවෝ ද වෙති. දමුබත් වළඳනුවෝ ද වෙති. පුතකු වළඳනුවෝ ද වෙති. තණ වළඳනුවෝ ද වෙත්. ගොම වළඳනුවෝ ද වෙති. වනමුල් පිලි අහර කොට ඇති ව යපෙත්. හුවටුවෙන් ගුළු පල වළඳන සුලු ද වෙති. මහණෙනි, අන්තොටු පිරිවැජියෝ පිණ්ඩපාතප්‍රවිවෙකයෙහි ලා මේ පණවත්.

මහණෙනි, අන්තොටු පිරිවැජියෝ ඒ ශයනාසනප්‍රවිවෙකයෙහි ලා මේ පැණවීම කෙරෙති: අරණ්‍යය, වෘක්‍ෂමූලය, සමශානය, වනප්‍රස්තය, අභ්‍යවකාශය, පලාලපුඤ්ජය, කලවිටිහල යන මේ ය. මහණෙනි, අන්තොටු පිරිවැජියෝ ශයනාසන ප්‍රවිවෙක විෂයෙහි ලා මෙය පණවත්.

මහණෙනි, අන්තොටු පිරිවැජියෝ මේ ප්‍රවිවෙක තුණ පණවත්.

මහණෙනි, මේ ශාසනයෙහි මහණහට මේ ප්‍රවිවෙකයෝ තුන් දෙනෙක් ඇත.

කවර තුන් දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් ද වෙයි. ඔහුගේ පස්වැදෑරුම් දෞශශීල්‍යය ද ප්‍රහත වෙයි. එයින් විවිකත ද වෙයි. සම්‍යග්දෘෂ්ටික වෙයි. ඔහුගේ මිථ්‍යාදෘෂ්ටිය ප්‍රහත වෙයි එයින් විවිකත ද වෙයි. ක්‍ෂීණාස්‍රව ද වෙයි. ඔහුගේ ආස්‍රවයෝ ද ප්‍රහත වෙත්. එයින් විවිකත ද වෙයි.

මහණෙනි, යම් කලෙක මහණ සියුපිරිසිදු ශීලයෙන් සිල්වත් වේ ද, ඔහුගේ පස්වැදෑරුම් දෞශශීල්‍යය ප්‍රහත වේ ද, එයින් විවිකතත් වේ ද, සම්‍යග්දෘෂ්ටික වේ ද, ඔහුගේ මිථ්‍යාදෘෂ්ටියත් ප්‍රහත වේ ද, එයින් විවිකතත් වේ ද. ක්‍ෂීණාස්‍රවත් වේ ද, ඔහුගේ ආස්‍රවයෝත් ප්‍රහත වෙත් ද, එයින් විවිකතත් වේ ද, මහණෙනි, මේ මහණ ශීලයෙන් අගතැන් පැමිණියේ යයි ශීලසාරය ලද්දේ යයි පිරිසිදු යයි ශීල සමාධි ප්‍රඥා සාරයෙහි පිහිටියේ යයි කියනු ලැබේ.

සෙය්‍යථාපි භික්ඛවෙ කස්සකස්ස ගහපතිස්ස සම්පන්නං සාලික්ඛෙත්තං, තමෙනං කස්සකො ගහපති සීඝසීඝං[1] වපාපෙය්‍ය සීඝසීඝං වපාපෙත්වා සීඝසීඝං සංසරාපෙය්‍ය. සීඝසීඝං සංසරපෙත්වා සීඝසීඝං උබ්බහාපෙය්‍ය. සීඝසීඝං උබ්බහාපෙත්වා සීඝසීඝං පුඤ්ජං කාරාපෙය්‍ය. සීඝසීඝං පුඤ්ජං කාරාපෙත්වා සීඝසීඝං මද්දාපෙය්‍ය. සීඝසීඝං මද්දාපෙත්වා සීඝසීඝං පලාලානි උද්ධරාපෙය්‍ය. සීඝසීඝං පලාලානි උද්ධරාපෙත්වා සීඝසීඝං භුසිකං උද්ධරාපෙය්‍ය. සීඝසීඝං භුසිකං උද්ධරාපෙත්වා සීඝසීඝං ඔපුණාපෙය්‍ය. සීඝසීඝං ඔපුණාපෙත්වා සීඝසීඝං අතිහරාපෙය්‍ය. සීඝසීඝං අතිහරාපෙත්වා සීඝසීඝං කොට්ටාපෙය්‍ය. සීඝසීඝං කොට්ටාපෙත්වා සීඝසීඝං ථුසානි උද්ධරාපෙය්‍ය. එවමස්සු තානි භික්ඛවෙ කස්සකස්ස ගහපතිස්ස තානි ධඤ්ඤානි අග්ගප්පත්තානි සාරප්පත්තානි සුද්ධානි සාරෙ පතිට්ඨිතානි.

එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු සීලවා ච හොති, දුස්සීල්‍යඤ්චස්ස පහීණං හොති, තෙන ච විවිත්තො හොති. සම්මාදිට්ඨිකො ච හොති, මිච්ඡාදිට්ඨි චස්ස පහීණා හොති, තාය ච විවිත්තො හොති. ඛීණාසවො ච හොති, ආසවා චස්ස පහීණා හොන්ති, තෙහි ච විවිත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අග්ගප්පත්තො සාරප්පත්තො සුද්ධො සාරෙ පතිට්ඨිතොති.

### 3. 2. 5. 3.

44. සෙය්‍යථාපි භික්ඛවෙ සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ආදිච්චො නභං අබ්භුස්සක්කමානො[2] සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච භාසතෙ ච තපතෙ ච විරොචති ච.

එවමෙව ඛො භික්ඛවෙ යතො අරියසාවකස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි. සහදස්සනුප්පාදා භික්ඛවෙ අරියසාවකස්ස තීණි සඤ්ඤොජනානි පහීයන්ති, සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො.

අථාපරං ද්වීහි ධම්මෙහි නිය්‍යාති අභිජ්ඣාය ච ව්‍යාපාදෙන ච. සො විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. තස්මිං භික්ඛවෙ සමයෙ අරියසාවකො කාලං කරෙය්‍ය, නත්ථි තං සඤ්ඤොජනං, යෙන සඤ්ඤොජනෙන සඤ්ඤුත්තො අරියසාවකො පුන ඉමං ලොකං ආගච්ඡෙය්‍යාති.

---

1. සීඝංසීඝං - මජසං. 2. අබ්භුස්සුක්කමානො - මජසං.

මහණෙනි, යම් පරිදි කර්ෂකගෘහපතිහුගේ පිරියුනු ශාලික්ෂෙත්‍රයෙක් වේ ද, කර්ෂකගෘහපති ඒ කෙත වහ වහා වපුරවන්නේ වේ ද, වහ වහා වපුරවා වහ වහා ගොයම් හකුළුවන්නේ වේ ද, වහ වහා හකුළුවා වහ වහා කලවිටට එළවා ලවන්නේ වේ ද, වහ වහා එළවා ලවා වහ වහා පිඬු කරවන්නේ වේ ද, වහ වහා පිඬු කරවා වහ වහා මඩවන්නේ වේ ද, වහ වහා මඩවා වහ වහා පිදුරු උදුරවන්නේ වේ ද, වහ වහා පිදුරු උදුරවා වහ වහා බොල් උදුරවන්නේ වේ ද, වහ වහා බොල් උදුරවා වහ වහා හුළඟෙහි පොළවන්නේ වේ ද, වහ වහා හුළඟෙහි පොළවා වහ වහා කොටුවට තංවන්නේ වේ ද, වහ වහා කොටුවට තංවා වහ වහා කොටවන්නේ වේ ද, වහ වහා කොටවා වහ වහා දහසිවි උදුරවන්නේ වේ ද. මහණෙනි, මෙසේ කරත් ම කර්ෂකගෘහපතිහුගේ ඒ ධාන්‍යයෝ සහලින් අගතැන් පැමිණියාහු වෙති. සාරබවට පැමිණියාහු වෙති. ශුද්ධවූවාහු වෙති. සාරයෙහි පිහිටියාහු වෙති.

මහණෙනි, එපරිදි ම මහණ චතුෂ්පරිශුද්ධ ශීලයෙන් සිල්වත් වේ ද, ඔහුගේ පස් වැදෑරුම් දෞඃශීල්‍යය ප්‍රහත වේ ද, එයින් විවික්තත් වේ ද, සම්‍යග්දෘෂ්ටිකත් වේ ද, ඔහුගේ මිථ්‍යාදෘෂ්ටියත් ප්‍රහත වේ ද, එයින් විවික්තත් වේ ද, ක්ෂීණාස්‍රවත් වේ ද, ඔහුගේ ආස්‍රවයෝත් ප්‍රහත වෙත් ද, එයින් විවික්තත් වේ ද, මහණෙනි, මේ මහණ ශීලයෙන් අගතැන් පැමිණියේ යයි ශීලසාරය ලද්දේ යයි ශුද්ධ යයි ශීල සමාධි ප්‍රඥාසාරයෙහි පිහිටියේ යයි කියනු ලැබේ.

### 3. 2. 5. 3.

44. මහණෙනි, යම් සේ සරත් කාලයෙහි අහස පහ වූ වලා ඇති ව පහන් ව සිටි කල හිරු අහසට නැගෙමින් අහස්හි වත් හැම අඳුරු නසා බබලන්නේ වේ ද, රස් පතුරුවන්නේ වේ ද, දිලෙන්නේ වේ ද.

මහණෙනි, එපරිදි ම යම් කලෙක ආර්‍යශ්‍රාවකයාට රාගාදි රජස් නැති රාගාදි මල නැති ධර්මචක්ෂුස පහළ වී ද, මහණෙනි, ආර්‍යශ්‍රාවකයාගේ ශ්‍රෝතාපත්තිමාර්ගෝත්පාදය සමග ත්‍රිවිධ සංයෝජනයෝ පහව යෙත්. සත්කායදෘෂ්ටිය විචිකිත්සාය ශීලව්‍රතපරාමර්ශ යි.

අනතුරුව අභිධ්‍යා හා ව්‍යාපාදයෙන් දූසි දදහමින් නිර්‍යාණය කෙරෙයි. හේ කාමයෙන් වෙන්ව ම ...... ප්‍රථමධ්‍යානයට එළැඹ වෙසෙසි. මහණෙනි, එසමයෙහි ආර්‍යශ්‍රාවක කලුරිය කරන්නේ වේ ද, යම් සංයෝජන-යෙකින් සංයුක්ත ආර්‍යශ්‍රාවකයෙක් නැවත මෙලොවට එන්නේ වේ ද, එබඳු සංයෝජනයෙක් ඔහුට නැත.

3. 2. 5. 4

45. තිසෙසා ඉමා භික්ඛවෙ පරිසා. කතමා තිසෙසා: අග්ගවතී පරිසා, වග්ගා පරිසා, සමග්ගා පරිසා.

කතමා ච භික්ඛවෙ අග්ගවතී පරිසා:

ඉධ භික්ඛවෙ යස්සං පරිසායං ථෙරා භික්ඛු න බාහුලිකා හොන්ති. න සාථලිකා, ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා විරියං ආරභන්ති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. තෙසං පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති. සාපි හොති න බාහුලිකා න සාථලිකා ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. අයං වුච්චති භික්ඛවෙ අග්ගවතී පරිසා.

කතමා ච භික්ඛවෙ වග්ගා පරිසා:

ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛු භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති. අයං වුච්චති භික්ඛවෙ වග්ගා පරිසා.

කතමා ච භික්ඛවෙ සමග්ගා පරිසා :

ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛු සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති. අයං වුච්චති භික්ඛවෙ සමග්ගා පරිසා.

යස්මිං භික්ඛවෙ සමයෙ භික්ඛු සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති. බහුං භික්ඛවෙ භික්ඛු තස්මිං සමයෙ පුඤ්ඤං පසවන්ති බ්‍රහ්මං භික්ඛවෙ විහාරං තස්මිං සමයෙ භික්ඛු විහරන්ති යදිදං මුදිතාය චෙතොවිමුත්තියා. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදියති. සුඛිනො චිත්තං සමාධියති.

සෙය්‍යථාපි භික්ඛවෙ උපරිපබ්බතෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ තං උදකං යථානින්නං පවත්තමානං පබ්බත කන්දරපදරසාඛා පරිපූරෙති, පබ්බතකන්දරපදරසාඛා පරිපූරා කුසුබ්භෙ පරිපූරෙන්ති, කුසුබ්භා පරිපූරා මහාසොබ්භෙ පරිපූරෙන්ති, මහාසොබ්භා පරිපූරා කුන්නදියො පරිපූරෙන්ති, කුන්නදියො පරිපූරා මහානදියො පරිපූරෙන්ති, මහානදියො පරිපූරා සමුද්දං පරිපූරෙන්ති. එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ භික්ඛු සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති. බහුං භික්ඛවෙ භික්ඛු තස්මිං සමයෙ පුඤ්ඤං පසවන්ති. බ්‍රහ්මං භික්ඛවෙ විහාරං තස්මිං සමයෙ භික්ඛු විහරන්ති, යදිදං මුදිතාය චෙතොවිමුත්තියා. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති

ඉමා ඛො භික්ඛවෙ තිස්සො පරිසාති.

**3. 2. 5. 4.**

45. මහණෙනි, මේ පිරිස්හු තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්· අග්‍රවත් පිරිස් ය. වග්ගපිරිස් ය, සමග්‍රපිරිස් යයි.

මහණෙනි, අග්‍රවත් පිරිස් කවර?

මහණෙනි, මෙසස්නෙහි යම් පිරිසෙක ස්ථවිර භික්ෂූහු ප්‍රත්‍යය බාහුල්‍යය නැත්තාහු වෙද් ද, ශික්ෂාශාසනය ලිහිල් කොට නො ගන්නාහු වෙද් ද, පඤ්චනීවරණයෙහි හළ ධුර ඇත්තාහු වෙද් ද, ප්‍රවිවෙකයෙහි පූර්වඞ්ගම වෙත් ද, නො ලත් විශේෂය ලබනු පිණිස, අනධිගත විශේෂය අධිගම් කරණු පිණිස, පසක් නො කළ විශේෂය පසක් කරණු පිණිස වැර අරබත් ද, ඔවුන්ගේ පශ්චිම ජනතා තොමෝ දෘෂ්ටානුගතියට පැමිණේ ද, ඒ ජනතාවත් බාහුලික නො වේ ද, ශික්ෂාශාසනය ලිහිල් කොට නොගණී ද, පඤ්චනීවරණයෙහි හළ ධුර ඇද්ද, ප්‍රවිවෙකයෙහි පූර්වඞ්ගම වේ ද, නොලත් විශේෂය ලබනු පිණිස අනධිගත විශේෂය අධිගම් කරණු පිණිස පසක් නො කළ විශේෂය පසක් කරණු පිණිස වැර අරඹා ද, මහණෙනි, මේ අග්‍රවත් පිරිසැයි කියනු ලැබේ.

මහණෙනි, වග්ගපිරිස් කවර?

මහණෙනි, මේ සස්නෙහි යම් පිරිසෙක මහණහු හටගත් භණ්ඩන ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විවාදයට පැමිණියාහු පුරිස් තෙපුල් සැතින් උනුන් විදුනාහු වෙසෙත් ද, මහණෙනි, මේ වග්ගපිරිසැයි කියනු ලැබේ.

මහණෙනි, සමග්‍ර පිරිස් කවර?

මහණෙනි, මෙ සස්නෙහි යම් පිරිසෙක මහණහු සමග වූවාහු සතුටු වන්නාහු විවාද නො කරන්නාහු ක්ෂීරොදක බඳු වූවාහු උනුන් ප්‍රිය ඇසින් දක්නාහු වෙසෙත් ද, මහණෙනි, මේ සමග්‍රපිරිසැයි කියනු ලැබේ.

මහණෙනි, යම් කලෙක මහණහු සමග වූවාහු සතුටු වන්නාහු විවාද නො කරන්නාහු ක්ෂීරොදක බඳු වූවාහු උනුන් ප්‍රිය ඇසින් දක්නාහු වෙසෙත් ද, මහණෙනි, එකල මහණහු බොහෝ පින් රැස් කෙරෙත්. මහණෙනි, යම් මේ මෘදුතා චෙතොවිමුක්තියෙක් වේ ද, එයින් එකල මහණහු බ්‍රහමවිහාරය කෙරෙති. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදී. ප්‍රීතිමත් සිතැත්තාහට කය සන්හිඳෙයි. සන්හුන් කය ඇතියේ සුව විඳියි. සුව ඇතියහුගේ සිත සමාධිගත වෙයි.

මහණෙනි, යම් පරිදි ගල්මුදුනෙක දළ පොද ඇති මෙසයක් වස්නා කල ඒ දිය නිම්න තුබූ සේ පෙරළෙමින් අවුදු පර්වත කඳුර ප්‍රදර ශාඛාවන් පුරවා ද, ගල්කඳුර පැළී ඇලිහු පිරුනාහු කුඩා හෙජ් පුරවත් ද, කුඩා හෙජ්හු පිරුනාහු මහ හෙජ් පුරවත් ද, මහහෙජ්හු පිරුනාහු කුඩා නදීන් පුරවත් ද, කුඩා නදීහු පිරුනාහු මහා නදීන් පුරවත් ද, මහානදීහු පිරුනාහු මුහුද පුරවත් ද මහණෙනි, එපරිදි යම් කලෙක මහණහු සමග වූවාහු සතුටු වන්නාහු විවාද නො කරන්නාහු ක්ෂීරොදක බඳු වූවාහු ප්‍රිය ඇසින් දක්නාහු වෙසෙත් ද, මහණෙනි, එකල මහණහු බොහෝ පින් රැස් කෙරෙත්. මහණෙනි, යම් ඒ මෘදුතා චෙතොවිමුක්තියෙක් වේ ද, එයින් එකල මහණහු බ්‍රහමවිහාරය කෙරෙත් ප්‍රමුදිතයාහට ප්‍රීතිය හටගණී. ප්‍රීතිමත් සිතැතියහුගේ කය සන්හිඳේ සන්හුන් කය ඇතියේ සුව විඳී, සුව ඇතියහුගේ සිත සමාධිගත වෙයි.

මහණෙනි, මේ ත්‍රිවිධ පිරිස්හු යි.

## 3. 2. 5. 5

46. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

කතමෙහි තීහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො භද්‍රො අස්සාජානීයො වණ්ණසම්පන්නො ච හොති, බලසම්පන්නො ච ජවසම්පන්නො ච. ඉමෙහි බො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව බො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති, පාහුණෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

කතමෙහි තීහි:

ඉධ භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො ච හොති බලසම්පන්නො ච ජවසම්පන්නො ච.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං බො භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු බලසම්පන්නො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහාණාය, කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. එවං බො භික්ඛවෙ භික්ඛු බලසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ජවසම්පන්නො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං බො භික්ඛවෙ භික්ඛු ජවසම්පන්නො හොති.

ඉමෙහි බො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

### 3. 2. 5. 5.

46. මහණෙනි, ගුණාඞ්ග තුනෙකින් සමන්‍වාගත වූ රාජකීය, භද්‍ර ආජානෙය අශ්වයා රජුට නිසි වෙයි. රජුට උපභොග වෙයි. රජුගේ අවයව-යෙක් ම ය යි ගණනට යෙයි.

කවර අඞ්ග තුනෙකින යත්:

මහණෙනි, මෙලොව රජුගේ භද්‍ර ආජානීය අශ්ව වර්‍ණසම්පන්න ද වෙයි. කායබලසම්පන්න ද වෙයි. ජවසම්පන්න ද වෙයි. මහණෙනි, මේ ගුණාඞ්ග තුණින් සමන්‍වාගත රාජකීය භද්‍ර අශ්වාජානෙය රාජාර්හ වෙයි. රාජභොග්‍ය ද වෙයි. රජුගේ අවයවයෙක් ම ය යි ගණනට ද යේ.

මහණෙනි, එපරිද්දෙන් ම ධර්‍ම තුනෙකින් සමන්‍වාගත මහණ ආහුති සඞ්ඛ්‍යාත පිණ්ඩපාතයට නිසි වෙයි. ප්‍රාඝුණ සඞ්ඛ්‍යාත ආගන්තුග භක්තයට නිසි වෙයි, දක්ෂිණාවට නිසි වෙයි. අඤ්ජලිකරණයට නිසි වෙයි. සර්‍වලෝකයට අසදෘශ පුණ්‍යක්‍ෂෙත්‍ර ද වෙයි.

කවර තුනෙකින යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ ගුණවර්‍ණයෙන් යුක්ත වූයේ ද වෙයි. වීර්‍ය්‍යබලයෙන් යුක්ත වූයේ ද වෙයි. ඥානජවයෙන් යුක්තවූයේ ද වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ගුණවර්‍ණයෙන් යුක්ත වූයේ වේ ද:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි. ප්‍රාතිමෝක්‍ෂසංවරයෙන් සංවෘත ව වෙසෙයි. ආචාරගෝචර දෙකින් යුක්ත වෙයි. අණුමාත්‍ර වරදෙහිත් බිය දක්නා සුලු වෙයි. ශික්‍ෂාපද විෂයෙහි සමාදන් කොට ගෙණ හික්මෙයි. මහණෙනි, මෙසේ මහණ වර්‍ණසම්පන්න වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ වීර්‍ය්‍යබලයෙන් යුක්ත වූයේ වේ ද:

මහණෙනි, මෙසස්නෙහි මහණ අකුශලධර්‍මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්‍මයන්ගේ උපසම්පත්තිය පිණිස පටන් ගත් වැර ඇතියේ වෙසෙයි. ඥානස්ථාමයෙන් යුක්ත වූයේ වෙයි. දෘඪපරාක්‍රම ඇත්තේ වෙයි. කුසල් දහම්හි නො තැබූ ධුර ඇත්තේ වෙයි. මහණෙනි, මෙසේ මහණ බලසම්පන්න වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ඥානජවයෙන් යුක්ත වූයේ වේ ද:

මහණෙනි, මෙසස්නෙහි මහණ "මේ දුකැ"යි යථාභූතය දනී. ... "මේ දුඃඛ නිරොධගාමිනී ප්‍රතිපදාය"යි යථාභූතය දනී. මහණෙනි, මෙසේ මහණ ඥජවසම්පන්න වෙයි.

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත මහණ ආහුති සඞ්ඛ්‍යාත පිණ්ඩපාතයට නිසි වෙයි .. සර්‍වලෝකයට අසදෘශ පුණ්‍යක්‍ෂෙත්‍ර වෙයි.

## 3. 2. 5. 6.

47 තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

කතමෙහි තීහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො භද්‍රො අස්සාජානීයො වණ්ණසම්පන්නො ච හොති. බලසම්පන්නො ච ජවසම්පන්නො ච. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

කතමෙහි තීහි:

ඉධ භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො ච හොති බලසම්පන්නො ච ජවසම්පන්නො ච.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු බලසම්පන්නො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො හොති අකුසලානං ධම්මානං පහාණාය, කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු බලසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ජවසම්පන්නො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. එවං ඛො භික්ඛවෙ භික්ඛු ජවසම්පන්නො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 3. 2. 5. 6.

47. මහණෙනි, අඞ්ග තුණෙකින් සමන්නාගත වූ රාජකීය භද්‍ර අශ්වාජානෙය රජාහී වෙයි. රාජභෝග්‍ය වෙයි. රජ්ජුගේ අවයවයෙක් ම ය යි ගණනට ද යේ:

කවර කරුණු තුණෙකින යත්:

මහණෙනි, මෙලොව රජ්ජුගේ භද්‍ර ආජානෙය අශ්ව වර්ණසම්පන්න ද වෙයි. කායබල සම්පන්න ද වෙයි. ජවසම්පන්න ද වෙයි. මහණෙනි, මේ කරුණු තුණින් සමන්නාගත රාජකීය භද්‍ර අශ්වාජානෙය රජාහී වෙයි. රජභොග්‍ය වෙයි. රජ්ජුගේ අවයවයෙක් ම ය යි ගණනට යේ.

මහණෙනි, එපරිද්දම ධර්ම තුණෙකින් සමන්නාගත මහණ ආහුති සඞ්ඛ්‍යාත පිණ්ඩපාතයට නිසි වෙයි. ... සර්වලෝකයට අසදෘශ පුණ්‍යක්ෂෙත්‍ර ද වෙයි.

කවර තුණෙකින යත්.

මහණෙනි, මෙසස්නෙහි මහණ ගුණවර්ණයෙන් යුක්ත වූයේ ද වෙයි. වීර්‍ය්‍යබලයෙන් යුක්ත වූයේ ද වෙයි. ඥානජවයෙන් යුක්ත වූයේ ද වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ගුණවර්ණයෙන් යුක්ත වූයේ වේ ද:

මහණෙනි, මෙසස්නෙහි මහණ සිල්වත් වෙයි. .. ශික්ෂාපද විෂයෙහි සමාදන්ව හික්මෙයි. මහණෙනි, මෙසේ මහණ වර්ණසම්පන්න වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ වීර්‍ය්‍යබලයෙන් යුක්ත වූයේ වේ ද:

මහණෙනි, මෙසස්නෙහි මහණ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ උපසම්පත්තිය පිණිස පටන් ගත් වැර ඇතියේ වෙයි. ඥානසථාමයෙන් යුක්ත වූයේ වෙයි. දෘඪපරාක්‍රම ඇතියේ වෙයි. කුසල් දහම්හි නොතැබූ ධුර ඇත්තේ වෙයි. මහණෙනි, මෙසේ මහණ බලසම්පන්න වෙයි.

මහණෙනි, මහණ කෙසේ නම් ඥානජවයෙන් යුක්ත වූයේ වේ ද:

මහණෙනි, මෙසස්නෙහි මහණ පඤ්චවිධ ඔරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයයෙන් එහි පිරිනිවෙන සුළුවූයේ ඒ සුදවැයි ලොවින් පෙරළා නොඑන සුලු වූයේ ඕපපාතික වෙයි. මහණෙනි, මෙසේ මහණ ඥානජවයෙන් යුක්ත වූයේ වෙයි.

මහණෙනි, මේ ධර්ම තුණෙන් සමන්නාගත මහණ ආහුනෙය්‍ය වෙයි... සර්වලෝකයට අසදෘශ පුණ්‍යක්ෂෙත්‍ර ද වෙයි.

### 3. 2. 5. 7.

48. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජා-නීයො රාජාරහො හොති රාජභොග්‍යො රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

කතමෙහි තීහි:

ඉධ භික්ඛවෙ රඤ්ඤො භද්‍රො අස්සාජානීයො වණ්ණසම්පන්නො ච හොති බලසම්පන්නො ච ජවසම්පන්නො ච. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්‍යො රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

කතමෙහි තීහි:

ඉධ භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො ච හොති බලසම්පන්නො ච ජවසම්පන්නො ච.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු වණ්ණසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු බලසම්පන්නො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො විහරති -පෙ- ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු බලසම්පන්නො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ජවසම්පන්නො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ජවසම්පන්නො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

### 3. 2. 5. 8.

49. නවොපි භික්ඛවෙ පොත්ථකො දුබ්බණ්ණො ච හොති දුක්ඛසම්ඵස්සො ච අප්පග්ඝො ච. මජ්ඣිමොපි භික්ඛවෙ පොත්ථකො දුබ්බණ්ණො ච හොති දුක්ඛසම්ඵස්සො ච අප්පග්ඝො ච. ජිණ්ණොපි භික්ඛවෙ පොත්ථකො දුබ්බ-ණ්ණො ච හොති දුක්ඛසම්ඵස්සො ච අප්පග්ඝො ච.

ජිණ්ණම්පි භික්ඛවෙ පොත්ථකං උක්ඛලිපරිමජ්ජනං වා කරොන්ති සංකාරකූටෙ වා තං ඡඩ්ඩෙන්ති.

### 3. 2. 5. 7.

48. මහණෙනි, අඞ්ග තුණෙකින් සමන්‍වාගත රාජකීය භද්‍ර අශ්වාජානෙය රාජාහී වෙයි.. රජභෝග්‍ය ද වෙයි. රජුගේ අවයවයෙක් ම ය යි ගණනට ද යේ.

කවර තුණෙකින යත්:

මහණෙනි, මෙලොව රජුගේ භද්‍ර ආජානෙය අශ්ව වණ්සම්පන්‍න ද වෙයි. කායබලසම්පන්‍න ද වෙයි. ජවසම්පන්‍න ද වෙයි. මහණෙනි, මේ කරුණු තුණින් සමන්‍වාගත රජකීය භද්‍ර අශ්වාජානෙය රජාහී වෙයි. රජභෝග්‍ය වෙයි. රජුගේ අවයවයෙක් ම ය යි ගණනට යේ.

මහණෙනි, එපරිදි ම ධර්‍ම තුණෙකින් සමන්‍වාගත මහණ ආහුනි සඞ්ඛ්‍යාත පිණ්ඩපාතයට නිසි වෙයි ... සර්‍වලෝකයට අසදෘශ පුණ්‍යක්‍ෂෙත්‍ර ද වෙයි.

කවර තුණෙකින යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ වණ්සම්පන්‍න ද වෙයි. බලසම්පන්‍න ද වෙයි. ජවසම්පන්‍න ද වෙයි.

මහණෙනි, මහණ කෙසේ නම් වණ්සම්පන්‍න වේ ද:

මහණෙනි, මෙසස්නෙහි මහණ සිල්වත් වෙයි ... සික‍පද සමාදන්ව හික්මෙයි. මහණෙනි, මෙසේ මහණ වණ්සම්පන්‍න වෙයි:

මහණෙනි, කෙසේ මහණ බලසම්පන්‍න වේ ද:

මහණෙනි, මෙසස්නෙහි මහණ ඇරඹූ වැර ඇතියේ ... ඥනසථාමයෙන් යුක්ත වූයේ දෘඪපරාක්‍රම ඇත්තේ කුසල්දහම්හි නොබහා තැබූ ධුර ඇතියේ වෙසෙයි. මහණෙනි, මෙසේ මහණ බලසම්පන්‍න වෙයි.

මහණෙනි, මහණ කෙසේ ජවසම්පන්‍න වේ ද:

මහණෙනි, මෙසස්නෙහි මහණ ආස්‍රවයන්ගේ ක්‍ෂයයෙන්.. සාක්‍ෂාත් කොට එයට පැමිණ වෙසෙයි. මහණෙනි, මෙසේ මහණ ජවසම්පන්‍න වෙයි:

මහණෙනි, මේ කරුණු තුණින් සමන්‍වාගත වූ මහණ ආහුනිසඞ්ඛ්‍යාත පිණ්ඩපාතයට නිසි වෙයි .... සර්‍වලෝකයට අසදෘශ පුණ්‍යක්‍ෂේත්‍ර ද වෙයි:

### 3. 2. 5. 8

49. මහණෙනි, නව්‍ය වූත් වාකමය වස්ත්‍රය දුර්‍වණ් ද වේ. දුඃඛස්පර්‍ශ ද වේ. අල්පාර්‍ඝ ද වේ. මහණෙනි, මධ්‍යම වූත් වාකමය වස්ත්‍රය දුර්‍වණ් ද වේ. දුඃඛස්පර්‍ශ ද වේ. අල්පාර්‍ඝ ද වේ. මහණෙනි, ජීර්ණවූත් වාකමය වස්ත්‍රය දුර්‍වණ් ද වේ. දුඃඛස්පර්‍ශ ද වේ. අල්පාර්‍ඝ ද වේ.

මහණෙනි, ජීර්ණ වූත් වාකමය වස්ත්‍රය ඉකිලි පිස්නක් හෝ කෙරෙත්. එය කසළගොඩෙහි හෝ බහත්.

එවමෙව ඛො භික්ඛවෙ නවො චෙපි භික්ඛු හොති දුස්සීලො පාපධම්මො. ඉදමස්ස දුබ්බණ්ණතාය වදාමි. සෙය්‍යථාපි සො භික්ඛවෙ පොත්ථකො දුබ්බණ්ණො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. යෙ ඛො පනස්සු* සෙවන්ති භජන්ති පයිරුපාසන්ති, දිට්ඨානුගතිං ආපජ්ජන්ති, තෙසං තං හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. ඉදමස්ස දුක්ඛසම්ඵස්සතාය වදාමි. සෙය්‍යථාපි සො භික්ඛවෙ පොත්ථකො දුක්ඛසම්ඵස්සො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. යෙසං ඛො පන පතිගණ්හාති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරං, තෙසං තං න මහප්ඵලං හොති. න මහානිසංසං. ඉදමස්ස අප්පග්ඝතාය වදාමි. සෙය්‍යථාපි සො භික්ඛවෙ පොත්ථකො අප්පග්ඝො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

මජ්ඣිමො චෙපි භික්ඛවෙ භික්ඛු හොති -පෙ- ථෙරො චෙපි භික්ඛවෙ භික්ඛු හොති දුස්සීලො පාපධම්මො. ඉදමස්ස දුබ්බණ්ණතාය වදාමි. සෙය්‍යථාපි සො භික්ඛවෙ පොත්ථකො දුබ්බණ්ණො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. යෙ ඛො පනස්සු සෙවන්ති භජන්ති පයිරුපාසන්ති දිට්ඨානුගතිං ආපජ්ජන්ති, තෙසං තං හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. ඉදමස්ස දුක්ඛසම්ඵස්සතාය වදාමි. සෙය්‍යථාපි සො භික්ඛවෙ පොත්ථකො දුක්ඛ-සම්ඵස්සො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. යෙසං ඛො පන පතිගණ්හාති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං, තෙසං තං න මහප්ඵලං හොති න මහානිසංසං. ඉදමස්ස අප්පග්ඝතාය වදාමි. සෙය්‍යථාපි සො භික්ඛවෙ පොත්ථකො අප්පග්ඝො, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

එවරූපො චායං භික්ඛවෙ ථෙරො භික්ඛු සඞ්ඝමජ්ඣෙ භණති, තමෙනං භික්ඛූ එවමාහංසු: කින්නුඛො[1] තුය්හං බාලස්ස අබ්‍යත්තස්ස භණිතෙන, ත්වම්පි නාම භණිතබ්බං මඤ්ඤසීති.[2] සො කුපිතො අනත්තමනො තථාරූපිං වාචං නිච්ඡාරෙති යථාරූපාය වාචාය සඞ්ඝො තං උක්ඛිපති සඞ්කාරකූටෙව තං පොත්ථකං.

නවම්පි භික්ඛවෙ කාසිකං වත්ථං වණ්ණවන්තඤ්චෙව හොති සුඛසම්ඵස්සඤ්ච මහග්ඝඤ්ච, මජ්ඣිමම්පි භික්ඛවෙ කාසිකං වත්ථං -පෙ- ජිණ්ණම්පි භික්ඛවෙ කාසිකං වත්ථං වණ්ණවන්තං චෙව හොති සුඛසම්ඵස්සඤ්ච මහග්ඝඤ්ච. ජිණ්ණම්පි භික්ඛවෙ කාසිකං වත්ථං රතනපලිවෙඨනං වා කරොන්ති[3], ගන්ධකරණ්ඩකෙ වා නං පක්ඛිපන්ති.

* යෙ ඛො - පනස්ස - සබ්බත්ථ.

1. කිංඛො - සත්ථි 2. මඤ්ඤිස්සසීති-සත්ථි

3 කරොන්ති - මජසං.

මහණෙනි, එපරිදි ම නවය වූත් මහණ දුසිල් වේ ද, පාපසවභාව ඇතියේ වේ ද, මෙය ඔහුගේ දුර්වර්ණිතායෙහිලා වදාරමි. මහණෙනි, යම් පරිදි ඒ වාකමය වස්ත්‍රය දුර්වර්ණ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි වදාරමි. යම් කෙනෙක් ඔහු සෙවිත් ද, භජනය කෙරෙත් ද, පයර්‍යුපාසන කෙරෙත් ද, දෘෂ්ටානුගතියට පැමිණෙත් ද, ඔවුනට එය දීර්ඝ රාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වෙයි. මෙය ඔහුගේ දුඃඛස්පර්ශිතායෙහි ලා වදාරමි. මහණෙනි, යම් පරිදි ඒ වාකමය වස්ත්‍රය දුඃඛස්පර්ශී වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි වදාරමි. යම් කෙනකුන්ගේ චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාර පිළිගණී ද, ඔවුනට එය මහත්ඵල නො වේ. මහත් අනුසස් ඇතියේ නො වේ. මෙය ඔහුගේ අල්පාර්ඝිතායෙහි ලා වදාරමි. මහණෙනි, යම් පරිදි ඒ වාකමය වස්ත්‍රය අල්පාර්ඝ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇති යෙකැ යි වදාරමි.

මහණෙනි, මධ්‍යම වූත් මහණ දුසිල් වේ ද ... මහණෙනි, ස්ථවිර වූත් මහණ දුසිල් වේ ද, පවිටු සැහැවි ඇතියේ වේ ද, මෙය ඔහුගේ දුර්වර්ණිතායෙහි ලා වදාරමි. මහණෙනි, යම් පරිදි ඒ වාකමය වස්ත්‍රය දුර්වර්ණ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි වදාරමි. යම් කෙනෙක් ඔහු සෙවිත් ද, භජනය කෙරෙත් ද, පයර්‍යුපාසනය කෙරෙත් ද, ඔහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත් ද, ඔවුනට එය දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වෙයි. මෙය ඔහුගේ දුඃඛස්පර්ශිතායෙහි ලා වදාරමි. මහණෙනි, යම් පරිදි ඒ වාකමය වස්ත්‍රය දුඃඛස්පර්ශී වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි වදාරමි. යම් කෙනකුන්ගේ චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාර පිළිගණී ද, ඔවුනට එය මහත්ඵල නො වේ. මහත් අනුසස් ඇතියේ ද නො වේ. මේ ඔහුගේ අල්පාර්ඝිතායෙහිලා වදාරමි: මහණෙනි, යම් පරිදි ඒ වාකමය වස්ත්‍රය අල්පාර්ඝ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි වදාරමි.

මහණෙනි, මෙබඳු වූ මේ ස්ථවිර මහණ සඞ්ඝමධ්‍යයෙහි බෙණේ නම්, සෙසු භික්ෂූහු ඔහුට මෙසේ කියත්: "බාල වූ අව්‍යක්ත වූ තාගේ භණිත-යෙන් කිම? තොපිත් බිණිය යුත්තකු කොට හඟනෙහිද්ද"යි?. හේ කිපියේ නොසතුටු සිතැතියේ යම්බඳු වචනයක් නිසා සඟහු ඒ මහණ ඒ වාකමය වස්ත්‍රය කසළ ගොඩෙහි ලන්නාක් සෙයින් බැහැර ලත් ද, එබඳු වචන පිහිදුනේ ය.

මහණෙනි, නවක වූත් කසීවත් පැහැ සටහන් ඇතියේත් සුවපහස් ඇතියේත් මාහැඟි වූයේත් වේ. මහණෙනි, මධ්‍යම වූත් කසීවත් ... මහණෙනි, ජීර්ණ වූත් කසීවත් පැහැ සටහන් ඇතියේත් සුවපහස් ඇතියේත් මහැඟි වූයේත් වේ. මහණෙනි, ජීර්ණ වූත් කසීවත් රුවන් හකුලා තබනුවක් හෝ කෙරෙත්. සුවඳ කරඬුවෙක හෝ එය බහත්.

එවමෙව ඛො භික්ඛවෙ නවො චෙපි භික්ඛු හොති සීලවා කල්‍යාණධම්මො, ඉදමස්ස සුවණ්ණතාය වදාමි. සෙය්‍යථාපි භික්ඛවෙ. කාසිකං වත්ථං වණ්ණවන්තං, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. යෙ ඛො පනස්සු සෙවන්ති භජන්ති පයිරුපාසන්ති දිට්ඨානුගතිං ආපජ්ජන්ති, තෙසං තං හොති දීඝරත්තං හිතාය සුඛාය, ඉදමස්ස සුඛසම්ඵස්සතාය වදාමි. සෙය්‍යථාපි තං භික්ඛවෙ කාසිකං වත්ථං සුඛසම්ඵස්සං, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. යෙසං ඛො පන සො පටිග්ගණ්හාති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය-භෙසජ්ජපරික්ඛාරං, තෙසං තං මහප්ඵලං හොති මහානිසංසං, ඉදමස්ස මහග්ඝතාය වදාමි. සෙය්‍යථාපි තං භික්ඛවෙ කාසිකං වත්ථං මහග්ඝං, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

මජ්ඣිමො චෙපි භික්ඛවෙ භික්ඛු හොති -පෙ- ථෙරො චෙපි භික්ඛවෙ භික්ඛු හොති සීලවා කල්‍යාණධම්මො, ඉදමස්ස සුවණ්ණතාය වදාමි. සෙය්‍යථාපි තං භික්ඛවෙ කාසිකං වත්ථං වණ්ණවන්තං, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. යෙ ඛො පනස්සු[1] සෙවන්ති භජන්ති පයිරුපාසන්ති දිට්ඨානුගතිං ආපජ්ජන්ති, තෙසං තං හොති දීඝරත්තං හිතාය සුඛාය. ඉදමස්ස සුඛ-සම්ඵස්සතාය වදාමි. සෙය්‍යථාපි තං භික්ඛවෙ කාසිකං වත්ථං සුඛසම්ඵස්සං, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. යෙසං ඛො පන සො පටිග්ගණ්හාති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, තෙසං තං මහප්ඵලං හොති මහානිසංසං, ඉදමස්ස මහග්ඝතාය වදාමි. සෙය්‍යථාපි තං භික්ඛවෙ කාසිකං වත්ථං මහග්ඝං තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි.

එවරූපො චායං භික්ඛවෙ ථෙරො භික්ඛු සඞ්ඝමජ්ඣෙ භණති, තමෙනං භික්ඛූ එවමාහංසු: අප්පසද්දා ආයස්මන්තො හොථ, ථෙරො භික්ඛු ධම්මඤ්ච විනයඤ්ච භණතීති.

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: ‘කාසිකවත්ථූපමා භවිස්සාම න පොත්ථකූපමා’ති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

## 3. 2. 5. 9.

50. යො භික්ඛවෙ එවං වදෙය්‍ය: යථා යථායං පුරිසො කම්මං කරොති, තථා තථා තං පටිසංවෙදියතීති. එවං සන්තං භික්ඛවෙ බ්‍රහ්මචරියවාසො න හොති. ඔකාසො න පඤ්ඤායති සම්මා දුක්ඛස්ස අන්තකිරියාය.

1. යෙ ඛො පනස්ස - සබ්බත්ථ.

මහණෙනි, එපරිදි ම නවකවූත් මහණ සිල්වත් වේ ද, කලණ සැහැවි ඇතියේ වේ ද, මෙය ඔහුගේ සුවණ්තායෙහි ලා වදරමි. මහණෙනි, යම් පරිදි කසීවත් පැහැ සටහන් ඇතියේ වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි වදරමි. යම් කෙනෙක් ඔහු සෙවිත් ද, භජනය කෙරෙත් ද, පයඬුපාසනය කෙරෙත් ද, දෘෂ්ටානුගතියට පැමිණෙත් ද, ඔවුනට එය දීඝීරාත්‍රයෙහි හිත පිණිස සුඛ පිණිස වෙයි. මෙය ඔහුගේ සුඛසපශීතායෙහි ලා වදරමි මහණෙනි, යම් පරිදි ඒ කසීවත සුඛසපශී වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි වදරමි. යම් කෙනකුන්ගේ චීවර පිණ්ඩපාත ශයනාසන භෛෂජ්‍ය පරිෂ්කාර පිළිගණී ද, ඔවුනට එය මහත්ඵල වෙයි. මහත් අනුසස් ඇතියේ වෙයි. මෙය ඔහුගේ මහැඟි බැව්හි ලා වදරමි. මහණෙනි, යම් පරිදි ඒ කසීවත මහැඟි වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි වදරමි.

මහණෙනි, මධ්‍යම වූත් මහණ සිල්වත් වේ ද ... මහණෙනි, ස්ථවිර වූත් මහණ සිල්වත් වේ ද, කලණ දහම් ඇතියේ වේ ද, මෙය ඔහුගේ සුවණ්තා-යෙහි ලා වදරමි. මහණෙනි, යම් පරිදි ඒ කසීවත වණ්වත් වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැ යි වදරමි. යම් කෙනෙක් ඔහු සෙවිත් ද, භජනය කෙරෙත් ද, පයඬුපාසනය කෙරෙත් ද, ඔහුගේ දෘෂ්ටානු-ගතියට පැමිණෙත් ද, ඔවුනට එය දීඝීරාත්‍රයෙහි හිත පිණිස සුඛ පිණිස වෙයි. මෙය ඔහුගේ සුඛසපශීතායෙහි ලා වදරමි. මහණෙනි, යම් පරිදි ඒ කසීවත සුඛසපශී වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැයි වදරමි. යම් කෙනකුන්ගේ චීවර පිණ්ඩපාත ශයනාසන භෛෂජ්‍ය පරිෂ්කාර පිළිගණී ද, ඔවුනට එය මහත්ඵල වෙයි. මහත් අනුසස් ඇතියේ වෙයි. මෙය ඔහුගේ මහැඟිබව්හි ලා වදරමි. මහණෙනි, යම් පරිදි ඒ කසීවත මහැඟි වේ ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇතියෙකැයි වදරමි.

මහණෙනි, මෙබඳු වූ ස්ථවිර මහණ සඟමැද බෙණේ ද, ඔහු නිසා (එහි සෙසු) භික්ෂූහු භික්ෂූන්ට මෙසේ කියති. "ඇවැත්නි, නිහඬ වව. ස්ථවිර මහණ දහමක් විනයක් බෙණේ"යි කියා යි.

මහණෙනි, එහෙයින් මෙසේ හික්මෙත්තේ ය. "කසීවත් බඳු වම්හ. වාකචය වස්ත්‍ර බන්දමෝ නො වම්හ" යි. මහණෙනි, තොප මෙසේ ම හික්-මෙත්තේ ය.

### 3. 2. 5. 9.

50. මහණෙනි, යමෙක් "යම් යම් ආකාරයෙකින් මේ පුරුෂ කම් කෙරේ ද, ඒ ඒ ආකාරයෙන් ඒ කම්යාගේ විපාක විඳුතේ ම ය" යි, මෙසේ බෙණේ ද, මහණෙනි, එසේවත් ම බ්‍රහමචයඹීවාසය (කම්ක්‍ෂයකර) නො වෙයි. මැතැවින් දුක් කෙළවර කිරීමට අවකාශයෙක් නො පැණේ,

යො ච ඛො භික්ඛවෙ එවං වදෙය්‍ය: යථා යථා වෙදනීයං අයං පුරිසො කම්මං කරොති, තථා තථාස්ස[1] විපාකං පටිසංවෙදියතීති. එවං සන්තං භික්ඛවෙ බ්‍රහ්මචරියවාසො හොති, ඔකාසො පඤ්ඤායති සම්මාදුක්ඛස්ස අන්තකිරියාය.

ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං[2] කම්මං කතං, තමෙනං නිරයං උපනෙති. ඉධ පන භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකං පාපං කම්මං කතං දිට්ඨධම්මවෙදනීයං හොති. නාණුම්පි[3] ඛායති. කිං[4] බහුදෙව.

කථංරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං[2] කම්මං කතං තමෙනං නිරයං උපනෙති?

ඉධ පන භික්ඛවෙ එකච්චො පුග්ගලො අභාවිතකායො හොති අභාවිතසීලො අභාවිතචිත්තො අභාවිතපඤ්ඤො පරිත්තො අප්පාතුමො අප්පදුක්ඛවිහාරී, එවරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං කම්මං කතං තමෙනං නිරයං උපනෙති.

කථංරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකං පාපං[2] කම්මං කතං දිට්ඨධම්මවෙදනීයං හොති, නාණුම්පි[3] ඛායති, කිං[4] බහුදෙව?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො භාවිතකායො හොති භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤො අපරිත්තො මහත්තො[5] අප්පමාණවිහාරී. එවරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකං පාපං කම්මං කතං දිට්ඨධම්මවෙදනීයං හොති නාණුම්පි ඛායති. කිං බහුදෙව.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ලොණඵලං[6] පරිත්තෙ උදකමල්ලකෙ[7] පක්ඛිපෙය්‍ය, තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපි නු තං පරිත්තං උදකමල්ලකෙ උදකං අමුනා ලොණඵලෙන ලොණං අස්ස අපෙය්‍යාති?

එවං භන්තෙ.

තං කිස්ස හෙතු?

අදුං හි භන්තෙ පරිත්තං උදකමල්ලකෙ[7] උදකං අමුනා ලොණඵලෙන ලොණං අස්ස අපෙය්‍යාති.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ලොණඵලං ගඞ්ගාය නදියා පක්ඛිපෙය්‍ය, තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපි නු සා ගඞ්ගා නදී අමුනා ලොණඵලෙන ලොණං අස්ස අපෙය්‍යාති?

නො හෙතං භන්තෙ.

තං කිස්ස හෙතු?

අසු හි භන්තෙ ගඞ්ගාය නදියා මහා උදකක්ඛන්ධො. සො අමුනා ලොණඵලෙන ලොණං නෙවස්ස අපෙය්‍යාති.

---

1. තථා තස්ස - මජ්සං. 2. පාපකම්මං - මජ්සං 3. නාණුපි - මජ්සං
4. 'කිං' නත්ථි - සිමු. PTS. 5. මහත්තො - මජ්සං 6. ලොණකපල්ල - මජ්සං
7. උදකපල්ලකෙ - මජ්සං

මහණෙනි, වැලි යමෙක් "යම් යම් අයුරෙකින් මේ පුරුෂ (විපාකවාර විසින්) වින්ද යුතු වූ කම් කෙරේ ද, ඒ ඒ අයුරින් ඒ කම්යාගේ විපාක විඳුනේය" යි මෙසේ බෙණේ ද, මහණෙනි, මෙසේ වත් ම කම්ක්‍ෂයකර බ්‍රහ්මචය්‍ය්‍යීවාසය වේ මැනැවින් දුක් කෙළවර කිරීමට අවකාශයෙක් පැණේ.

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයක්හු විසින් අල්පමාත්‍ර වූත් පාප-කම්යෙක් කරණ ලද්දේ වේ ද, ඒ කම්ය තෙල පුද්ගලයා නිරයට එලවයි. මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයක්හු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර වූත් පාපකම්යෙක් කරණ ලද්දේ ඒ දෘෂ්ටධම්වේද්‍ය වෙයි. පරලොව අණුමාත්‍රයකුදු විපාක විසින් නො පැණේ. බොහෝ (විපාක දෙයි කියනු) කිම?

මහණෙනි, කෙබඳු අයුරු ඇති පුද්ගලයක්හු විසින් අල්පමාත්‍ර වූත් පාපකම්යෙක් කරණ ලද්දේ ඒ කම්ය තෙල පුද්ගලයා නිරයට එලවා ද?

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් කායභාවනා නැතියේ වෙයි. ශීලභාවනා නැතියේ වෙයි. චිත්තභාවනා නැතියේ වෙයි. ප්‍රඥාභාවනා නැතියේ වෙයි. අල්පගුණ ඇතියේ වෙයි. ගුණ විසින් අල්පාත්ම ඇතියේ වෙයි. අල්පපාපයෙනුත් දුඃඛවිහරණ ඇතියේ වෙයි. මහණෙනි, මෙබඳු පුද්ගලයක්හු විසින් අල්පමාත්‍ර වූත් පාපකම්යෙක් කරණ ලද්දේ තෙල පුද්ගලයා නිරයට එලවයි.

මහණෙනි, කෙබඳු අයුරු ඇති පුද්ගලයක්හු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර පාපකම්යෙක් කරණ ලද්දේ දෘෂ්ටධම්වේද්‍ය වේ ද, පරලොව අණුමාත්‍ර විපාකයකුත් නො පැණේ ද? බොහෝ කොට පැණීමෙක් කිම?

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් වැඩූ කාය ඇතියේ වෙයි. වැඩූ සිල් ඇතියේ වෙයි. වැඩූ සිත් ඇතියේ වෙයි. වැඩූ පැණ ඇතියේ වෙයි. ගුණ විසින් අල්ප නො වෙයි. ගුණ විසින් මහාත්ම වෙයි. (ප්‍රමාණකර රාගාදීන්ගේ අභාවයෙන්) අප්‍රමාණ විහරණ ඇතියේ වෙයි. මහණෙනි, මෙබඳු අයුරු ඇති පුද්ගලයක්හු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර වූත් පාපකම්යෙක් කරණ ලද්දේ දෘෂ්ටධම්වේද්‍ය වෙයි. පරලොව අණුමාත්‍ර විපාකයෙකුත් නො පැණේ. බොහෝ විපාක කියනු කිම?

මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් ලුණුකැටයක් කුඩා දියමලායෙක බහන්නේ වේ ද, මහණෙනි, ඒ කෙසේ සිතවු ද? දියමලායෙහි වූ ඒ දියත්ත මේ ලුණු කැටයෙන් ලුණුරසට යන්නේ වේ ද?

වහන්ස, එසේය.

ඒ කවර හෙයින ?

වහන්ස, දියමලායෙහි වූ තෙල දියත්ත (අල්ප හෙයින්) තෙල ලුණුකැට-යෙන් ලුණුරසට යන්නේ වෙයි.

මහණෙනි, යම් පරිදි පුරුෂයෙක් ලුණුකැටයක් ගඞ්ගානදියෙහි බහන්නේ නම්, ඒ කෙසේ සිතවු ද? මහණෙනි, ඒ ගඞ්ගානදිය තෙල ලුණු කැටයෙන් ලුණුරසට යන්නේ වේ ද?

වහන්ස, තෙල නොවන සුලුය.

ඒ කවර හෙයින ?

වහන්ස, ගඞ්ගානදියෙහි වූ තෙල මහදියකඳෙක් වේ ද, ඒ දියකඳ තෙල ලුණුකැට යෙන්ලුණුරසට නො පැමිණෙන්නේ ම ය.

එවමෙව බො භික්ඛවෙ ඉධෙකච්චස්ස පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං කම්මං කතං තමෙතං නිරයං උපනෙති. ඉධ පන භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකං පාපං කම්මං කතං දිට්ඨධම්මවෙදනීයං හොති. නාණුම්පි ඛායති. කිං බහුදෙව. (1)

කථංරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං කම්මං කතං, තමෙතං නිරයං උපනෙති?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අභාවිතකායො හොති අභාවිතසීලො අභාවිතචිත්තො අභාවිතපඤ්ඤො පරිත්තො අප්පාතුමො අප්පදුක්ඛවිහාරී. එවරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං කම්මං කතං, තමෙතං නිරයං උපනෙති.

කථංරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකම්පි පාපං කම්මං කතං දිට්ඨධම්මවෙදනීයං හොති, නාණුම්පි ඛායති, කිං බහුදෙව?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො භාවිතකායො හොති භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤො අපරිත්තො මහත්තො අප්පමාණවිහාරී. එව-රූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකම්පි පාපං කම්මං කතං දිට්ඨධම්මවෙදනීයං හොති. නාණුම්පි ඛායති. කිං බහුදෙව.

ඉධ භික්ඛවෙ එකච්චො අඩ්ඪකහාපණෙනපි බන්ධනං නිගච්ඡති. කහාපණෙ-නපි බන්ධනං නිගච්ඡති. කහාපණසතෙනපි බන්ධනං නිගච්ඡති. ඉධ පන භික්ඛවෙ එකච්චො අඩ්ඪකහාපණෙනපි න බන්ධනං නිගච්ඡති. කහාපණෙ-නපි න බන්ධනං නිගච්ඡති. කහාපණසතෙනපි න බන්ධනං නිගච්ඡති.

කථංරූපො භික්ඛවෙ අඩ්ඪකහාපණෙනපි බන්ධනං නිගච්ඡති, කහාපණෙ-නපි බන්ධනං නිගච්ඡති, කහාපණසතෙනපි බන්ධනං නිගච්ඡති?

ඉධ භික්ඛවෙ එකච්චො දළිද්දො හොති අප්පස්සකො අප්පභොගො. එවරූපො භික්ඛවෙ අඩ්ඪකහාපණෙනපි බන්ධනං නිගච්ඡති. කහාපණෙනපි බන්ධනං නිගච්ඡති. කහාපණ සතෙනපි බන්ධනං නිගච්ඡති.

මහණෙනි, එ පරිදි ම මෙලොව ඇතැම් පුද්ගලයක්හු විසින් අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ ඒ කර්මය තෙල පුද්ගලයා නිරයට එලවයි. මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයක්හු විසින් එබඳු වූ ම පාපකර්මයෙක් කරණ ලද්දේ දෘෂ්ටධර්මවේද්‍ය වෙයි. පරලොව අණුමාත්‍ර විපාකයකුදු නො පැණේ. බොහෝ කොට ම නො පැණේ ම ය. (1)

මහණෙනි, කෙබඳු පුද්ගලයක්හු විසින් අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ ඒ කර්මය තෙල පුද්ගලයා නිරයට ගෙණ යේ ද?

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් නො වැඩූ කය ඇතියේ වෙයි. නො වැඩූ සිල් ඇතියේ වෙයි. නො වැඩූ සිත් ඇතියේ වෙයි. නො වැඩූ පැණ ඇතියේ වෙයි. ගුණ විසින් අල්ප වෙයි. ගුණ විසින් අල්පාත්ම වෙයි. අල්පපාපයෙනුත් දුඃඛවිහරණ ඇතියේ වෙයි. මහණෙනි, මෙබඳු පුද්ගලයා විසින් අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ ඒ කර්මය තෙල පුද්ගලයා නිරයට ගෙණ යත්තේය.

මහණෙනි, කෙබඳු වූ පුද්ගලයකු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ දෘෂ්ටධර්මවේද්‍ය වේ ද, පරලොව අණුමාත්‍ර විපාකයෙකුත් නො පැණේ ද, බොහෝ කොට නො පැණෙත්තේ ම වේ ද?

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් භාවිතකාය වෙයි. භාවිතශීල වෙයි. භාවිතචිත්ත වෙයි. භාවිතප්‍රඥ වෙයි. ගුණ විසින් අනල්ප වෙයි. ගුණ විසින් මහාත්ම වෙයි. (ප්‍රමාණ කර රාගාදීන්ගේ අභාවයෙන්) අප්‍රමාණ විහරණ ඇත්තේ වෙයි. මහණෙනි, මෙබඳු පුද්ගලයකු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ දෘෂ්ටධර්මවේද්‍ය වෙයි. පරලොව අණුමාත්‍ර වූත් විපාකයෙක් නො පැණේ. බොහෝ කොට නො පැණෙත්තේ ම වෙයි.

මහණෙනි, මෙලොව ඇතැමෙක් අඩ කහවණුයෙනුත් බන්ධනයට යෙයි. කහවණුයෙනුත් බන්ධනයට යෙයි. සියක් කහවණුයෙනුත් බන්ධනයට යෙයි. මහණෙනි, මෙලොව ඇතැමෙක් අඩ කහවණුයෙනුත් බන්ධනයට නො යෙයි කහවණුයෙනුත් බන්ධනයට නො යෙයි. සියක් කහවණුයෙනුත් බන්ධනයට නො යෙයි.

මහණෙනි, කෙබඳු වූයෙක් අඩකහවණුයෙනුත් බන්ධනයට යේ ද, කහවණුයෙනුත් බන්ධනයට යේ ද, සියක් කහවණුයෙනුත් බන්ධනයට යේ ද?

මහණෙනි, මෙලොව ඇතැමෙක් දිළිඳු වෙයි. අල්පධන වෙයි. අල්පභොග වෙයි. මහණෙනි, මෙබඳු පුද්ගලයා අඩකහවණුයෙනුත් බන්ධනයට යෙයි. කහවණුයෙනුත් බන්ධනයට යෙයි. සියක් කහවණුයෙනුත් බන්ධනයට යෙයි.

කථංරූපො භික්ඛවෙ අඩ්ඪකහාපණෙනපි න බන්ධනං නිගච්ඡති, කහාපණෙනපි න බන්ධනං නිගච්ඡති, කහාපණසතෙනපි න බන්ධනං නිගච්ඡති?

ඉධ භික්ඛවෙ එකච්චො අඩ්ඪො හොති මහද්ධනො මහාභොගො. එවරූපො භික්ඛවෙ අඩ්ඪකහාපණෙනපි න බන්ධනං නිගච්ඡති, කහාපණෙනපි න බන්ධනං නිගච්ඡති කහාපණසතෙනපි න බන්ධනං නිගච්ඡති. එවමෙව බො භික්ඛවෙ ඉධෙකච්චස්ස පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකම්පි පාපං කම්මං කතං, තමෙතං නිරයං උපනෙති. ඉධ පන භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකං පාපං කම්මං කතං දිට්ඨධම්මවෙදනීයං හොති. නාණුම්පි බායති. කිං බහුදෙව. (2)

කථංරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං කම්මං කතං තමෙතං නිරයං උපනෙති?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අභාවිතකායො හොති අභාවිතසීලො අභාවිතචිත්තො අභාවිතපඤ්ඤො පරිත්තො අප්පාතුමො අප්පදුක්ඛවිහාරී. එවරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං කම්මං කතං තමෙතං නිරයං උපනෙති.

කථංරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකං පාපං කම්මං[1] කතං දිට්ඨධම්මවෙදනීයං හොති, නාණුම්පි බායති, කිං බහුදෙව?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො භාවිතකායො හොති භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤො අපරිත්තො මහත්තා[3] අප්පමාණවිහාරී. එවරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකං පාපං කම්මං කතං දිට්ඨධම්මවෙදනීයං හොති. නාණුම්පි[2] බායති, කිං බහුදෙව.

සෙය්‍යථාපි භික්ඛවෙ ඔරබ්භිකො වා උරබ්භඝාතකො වා අපෙකච්චං උරබ්භං අදින්නං ආදියමානං පහොති හන්තුං වා බන්ධිතුං වා ජාපෙතුං වා යථාපච්චයං වා කාතුං, අපෙකච්චං උරබ්භං අදින්නං ආදියමානං නප්පහොති හන්තුං වා බන්ධිතුං වා ජාපෙතුං වා යථාපච්චයං වා කාතුං.

කථංරූපො[4] භික්ඛවෙ ඔරබ්භිකො වා උරබ්භඝාතකො වා උරබ්භං අදින්නං ආදියමානං පහොති හන්තුං වා බන්ධිතුං වා ජාපෙතුං වා යථාපච්චයං වා කාතුං?

ඉධ භික්ඛවෙ එකච්චො දලිද්දො හොති අප්පස්සකො අප්පභොගො. එවරූපො[5] භික්ඛවෙ ඔරබ්භිකො වා උරබ්භඝාතකො වා උරබ්භං අදින්නං ආදියමානං පහොති හන්තුං වා බන්ධිතුං වා ජාපෙතුං වා යථාපච්චයං වා කාතුං.

---

1. පාපකම්මං කතං - මජසං 2. නාණුපි - මජසං 3. මහත්තා - මජසං.
4. කථංරූපං - මජසං. 5. එවරූපං - ‍ෙජසං.

මහණෙනි, කෙබඳු පුද්ගලයෙක් අඩකහවණුයෙනුත් බන්ධනයට නො යේ ද, කහවණුයෙනුත් බන්ධනයට නො යේ ද, සියක් කහවණුයෙනුත් බන්ධනයට නො යේ ද?

මහණෙනි, මේ ලොව ඇතැමෙක් ආඪ්‍ය වෙයි. මහත්ධන වෙයි. මහාභෝග වෙයි. මහණෙනි, මෙබඳු පුද්ගල අඩකහවණුයෙනුත් බන්ධනයට නො යෙයි. කහවණුයෙනුත් බන්ධනයට නො යෙයි. සියක් කහවණුයෙනුත් බන්ධනයට නො යෙයි.

මහණෙනි, එ පරිදි ම මෙලොව ඇතැම් පුද්ගලයකු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ තෙල පුද්ගලයා නිරයට ගෙණ යයි. මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයකු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ දෘෂ්ටධර්මවේද්‍ය වෙයි. පරලොව අණුමාත්‍ර විපාකයෙක් ද නො පැණෙයි. බොහෝ විපාක නො පැණෙන්නේ ම ය. (2)

මහණෙනි, කෙබඳු පුද්ගලයකු විසින් අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ තෙල පුද්ගලයා නිරයට එළවන්නේ වේ ද?

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් අභාවිතකාය වෙයි. අභාවිත-ශීල වෙයි අභාවිතචිත්ත වෙයි අභාවිතප්‍රඥ වෙයි. ගුණ විසින් අල්ප වෙයි. ගුණ විසින් අල්පතම වෙයි. අල්පපාපයෙනුත් දුඃඛවිහරණ ඇතියේ වෙයි. මහණෙනි, මෙබඳු පුද්ගලයා විසින් අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ තෙල පුද්ගලයා නිරයට පමුණුවයි.

මහණෙනි, කෙබඳු පුද්ගලයකු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර පාපකර්මයෙක් කරණ ලද්දේ දෘෂ්ටධර්මවේද්‍ය වේ ද, පරලොව අණුමාත්‍ර වූත් විපාකයෙක් නො පැණේ ද, බොහෝ විපාක නො පැණෙන්නේ ම වේ ද?

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් වැඩූ කය ඇතියේ වෙයි. වැඩූ සිල් ඇතියේ වෙයි. වැඩූ සිත් ඇතියේ වෙයි. වැඩූ ප්‍රඥ ඇතියේ වෙයි. ගුණ විසින් අනල්ප වෙයි. ගුණ විසින් මහාතම වෙයි. (ප්‍රමාණ කර රාගාදීන්ගේ අභාවයෙන්) අප්‍රමාණ විහරණ ඇත්තේ වෙයි. මහණෙනි, මෙබඳු පුද්ගලයක්හු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර පාපකර්මයෙක් කරණ ලද්දේ දෘෂ්ටධර්මවේද්‍ය වෙයි. පරලොව අණුමාත්‍රවූත් විපාකයෙක් නො පැණේ. බොහෝ විපාක නො පැණෙන්නේ ම වෙයි.

මහණෙනි, යම් සේ තිරෙළු හිමියෙක් හෝ තිරෙළුවන් නසන්නෙක් හෝ නො දුන් තිරෙළුවකු පැහැරගන්නා කිසිවකු නස්නට හෝ බඳනට හෝ ධනයෙන් තෙරණට හෝ කැමැති සේ කරන්නට හෝ පොහොනේ වෙයි. නුදුන්නා වූ තිරෙළුවකු පැහැරගන්නා වූ කිසිවකු නස්නට හෝ බඳනට හෝ ධනයෙන් තෙරණට හෝ කැමැති සේ කරන්නට හෝ නො පොහොනේ වෙයි.

මහණෙනි, තිරෙළුහිමියෙක් හෝ තිරෙළුවන් නස්නෙක් හෝ නුදුන්නා වූ තිරෙළුවකු පැහැරගන්නා වූ කෙබඳුවකු නස්නට හෝ බඳනට හෝ ධනයෙන් තෙරණට හෝ කැමැති සේ කරන්නට හෝ පොහොනේ වේ ද?

මහණෙනි, මෙලොව ඇතැමෙක් දිළිඳු වේ. අල්පධන වේ. අල්ප භොග වේ. මහණෙනි, තිරෙළු හිමියෙක් හෝ තිරෙළුවන් නස්නෙක් හෝ නුදුන්නා වූ තිරෙළුවකු ගන්නා වූ මෙබඳුවකු නස්නට හෝ බඳනට හෝ ධනයෙන් තෙරණට හෝ කැමැති සේ කරන්නට හෝ පොහොනේ වෙයි.

කථංරූපං භික්ඛවෙ ඔරබ්භිකො වා උරබ්භඝාතකො වා උරබ්භං අදින්නං ආදියමානං නප්පහොති හන්තුං වා බන්ධිතුං වා ජාපෙතුං වා යථාපච්චයං වා කාතුං?

ඉධ භික්ඛවෙ එකච්චො අඩ්ඪො හොති මහද්ධනො මහාභොගො රාජා වා රාජමහාමත්තො වා. එවරූපං භික්ඛවෙ ඔරබ්භිකො වා උරබ්භඝාතකො වා උරබ්භං අදින්නං ආදියමානං නප්පහොති හන්තුං වා බන්ධිතුං වා ජාපෙතුං වා යථාපච්චයං වා කාතුං. අඤ්ඤදත්ථු පඤ්ජලිකො ව[1] තං යාචති: දෙහි මෙ මාරිස උරබ්භං වා උරබ්භධනං වාති.

එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චස්ස පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං කම්මං කතං තමෙනං නිරයං උපනෙති. ඉධ පන භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකං පාපං කම්මං කතං දිට්ඨධම්මවෙදනීයං හොති. නාණුම්පි ඛායති, කිං බහුදෙව.

කථංරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං කම්මං කතං තමෙනං නිරයං උපනෙති?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අභාවිතකායො හොති අභාවිතසීලො අභාවිතචිත්තො අභාවිතපඤ්ඤො පරිත්තො අප්පාතුමො අප්පදුක්ඛවිහාරී. එවරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස අප්පමත්තකම්පි පාපං කම්මං කතං තමෙනං නිරයං උපනෙති.

කථංරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකං පාපං කම්මං කතං දිට්ඨධම්මවෙදනීයං හොති. නාණුම්පි ඛායති, කිං බහුදෙව.

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො භාවිතකායො හොති -පෙ- අපරිත්තො මහත්තා අප්පමාණවිහාරී. එවරූපස්ස භික්ඛවෙ පුග්ගලස්ස තාදිසඤ්ඤෙව අප්පමත්තකං පාපං කම්මං කතං, දිට්ඨධම්මවෙදනීයං හොති. නාණුම්පි ඛායති, කිං බහුදෙව. (3)

යො භික්ඛවෙ එවං වදෙය්‍ය: යථා යථායං පුරිසො කම්මං කරොති, තථා තථා තං පටිසංවෙදියතීති[2]. එවං සන්තං භික්ඛවෙ බ්‍රහ්මචරියවාසො න හොති. ඔකාසො න පඤ්ඤායති සම්මා දුක්ඛස්ස අන්තකිරියාය.

යො ච ඛො භික්ඛවෙ එවං වදෙය්‍ය: යථා යථා වෙදනීයං අයං පුරිසො කම්මං කරොති, තථා තථා අස්ස විපාකං පටිසංවෙදියතීති. එවං සන්තං භික්ඛවෙ බ්‍රහ්මචරියවාසො හොති. ඔකාසො පඤ්ඤායති සම්මා දුක්ඛස්ස අන්තකිරියායාති.

---

1. පඤ්ජලිකො - මජසං  2 වෙදනීයං - මජසං

මහණෙනි, තිරෙළුහිමියෙක් හෝ තිරෙළුවන් තසාන්නෙක් හෝ නුදුන් තිරෙළුවකු ගන්නා කෙබඳුවකු තස්නට හෝ බඳින්නට හෝ ධනයෙන් තෙරනට හෝ කැමැති සේ කරන්නට හෝ නො පොහොනේ වේ ද?

මහණෙනි, මෙලොව ඇතැමෙක් ආඪ්‍ය වෙයි. මහත්ධන වෙයි. මහා භෝග වෙයි. රජ හෝ රජමහාමාත්‍ර හෝ වෙයි. මහණෙනි, තිරෙළු හිමියෙක් හෝ තිරෙළුවන් තසන්නෙක් හෝ මෙබඳු වූ නුදුන් තිරළුවකු ගන්නහු නස්නට හෝ බඳින්නට හෝ ධනයෙන් තෙරනට හෝ කැමැති සේ කරන්නට හෝ නො පොහොනේ වෙයි. ඒකාන්තයෙන් බඳුඳිලිව "නිදුකාණෙනි, මාගේ තිරෙළුවා හෝ තිරෙළු ධනය හෝ දෙව"යි ඔහු අතින් ඉල්ලයි

මහණෙනි, එපරිදි ම මෙලොව ඇතැම් පුද්ගලයකු විසින් අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ, තෙල පුද්ගලයා නිරයට ගෙණ යයි. මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයකු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර පාපකර්මයෙක් කරණ ලද්දේ දෘෂ්ටධර්මවේද්‍ය වෙයි. පරලොව අණුමාත්‍ර වූත් විපාකයෙක් නො පැණේ. බහුවිපාක කිම් දෙන්නේ වේ ද?

මහණෙනි, කෙබඳු වූ පුද්ගලයකු විසින් අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ තෙල පුද්ගලයා නිරයට පමුණුවා ද?

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් අභාවිතකාය වෙයි. අභාවිතශීල වෙයි. අභාවිත චිත්ත වෙයි. අභාවිතප්‍රඥ වෙයි. ගුණ විසින් අල්ප වෙයි. ගුණ විසින් අල්පාතම වෙයි.. අල්පපාපයෙනුත් දුඃඛවිහරණ ඇතියේ වෙයි. මහණෙනි, මෙබඳු පුද්ගලයකු විසින් අල්පමාත්‍ර වූත් පාපකර්මයෙක් කරණ ලද්දේ තෙල පුද්ගලයා නිරයට පමුණුවයි.

මහණෙනි, කෙබඳු පුද්ගලයකු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර පාපකර්මයෙක් කරණ ලද්දේ දෘෂ්ටධර්මවේද්‍ය වේ ද, පරලොව අණුමාත්‍ර වූත් විපාකයෙක් නො පැණේ ද, බොහෝ විපාක නො පැණෙන්නේ ම වේ ද?

මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් වැඩූ කය ඇතියේ වෙයි. ... ගුණ විසින් අල්ප නො වෙයි ගුණ විසින් මහාතම වෙයි. (ප්‍රමාණ කර රාගාදීන්ගේ අභාවයෙන්) අප්‍රමාණ විහරණ ඇතියේ වෙයි. මහණෙනි, මෙ බඳු පුද්ගලයකු විසින් එබඳු වූ ම අල්පමාත්‍ර පාපකර්මයෙක් කරණ ලද්දේ දෘෂ්ටධර්මවේද්‍ය වෙයි. පරලොව අණුමාත්‍ර විපාකයෙක් ද නො පැණේ. බොහෝ විපාක නො පැණෙන්නේ ම වෙයි. (3)

මහණෙනි, "යම් යම් ආකාරයෙකින් මේ පුරුෂ කර්ම කෙරේ ද, ඒ ඒ ආකාරයෙන් එය විපාක විසින් විඳුනේමය"යි යමෙක් මෙසේ බෙණේ ද, මහණෙනි, මෙසේ වත් ම කර්මක්ෂයකරබ්‍රහ්මචර්‍ය්‍යාවාසයෙක් නම් නො වේ. මැනවින් දුක් කෙළවර කරන්නට අවකාශයෙක් නො පැණේ.

මහණෙනි, "යම් යම් ආකාරයෙකින් වෙදනීය කර්මයක් මේ පුරුෂ කෙරේ ද, ඒ ඒ ආකාරයෙන් ඒ කර්මයාගේ විපාක විඳුනේ ය"යි යමෙක් මෙසේ බෙණේ ද, මහණෙනි, මෙසේ වත් ම කර්මක්ෂයකරබ්‍රහ්මචර්‍ය්‍යාවාසය වෙයි. මැනවින් දුක් කෙළවර කරන්නට අවකාශයෙක් පැණේ.

## 3. 2. 5. 10

51 සන්ති භික්ඛවෙ ජාතරූපස්ස ඔළාරිකා උපක්කිලෙසා: පංසුවාලිකා සක්ඛරකඨලා. තමෙනං පංසුධොවකො වා පංසුධොවකන්තෙවාසී වා දොණියං ආකිරිත්වා ධොවති සන්ධොවති නිද්ධොවති. තස්මිං පහීනෙ තස්මිං ව්‍යන්තීකතෙ සන්ති ජාතරූපස්ස මජ්ඣිමසහගතා උපක්කිලෙසා: සුඛුමසක්ඛර ථූලවාලිකා. තමෙනං පංසුධොවකො වා පංසුධොවකන්තෙවාසී වා ධොවති සන්ධොවති නිද්ධොවති. තස්මිං පහීනෙ තස්මිං ව්‍යන්තීකතෙ සන්ති ජාතරූපස්ස සුඛුමසහගතා උපක්කිලෙසා: සුඛුමවාලිකා කාළජල්ලිකා. තමෙනං පංසුධොවකො වා පංසුධොවකන්තෙවාසී වා ධොවති සන්ධොවති නිද්ධොවති. තස්මිං පහීනෙ තස්මිං ව්‍යන්තීකතෙ අථාපරං සුවණ්ණසිකතාවසිස්සන්ති. තමෙනං සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා තං ජාතරූපං[1] මූසාය[2] පක්ඛිපිත්වා ධමති සන්ධමති නිද්ධමති. තං හොති ජාතරූපං ධන්තං[3] සන්ධන්තං නිද්ධන්තං, අනීහිතං අනික්ඛිත්තකසාවං, න චෙව මුදු හොති න ච කම්මනියං න ච පභස්සරං පභඞ්ගු ච, න ච සම්මා උපෙති කම්මාය.

හොති සො භික්ඛවෙ සමයො යං සො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා තං ජාතරූපං ධමති සන්ධමති නිද්ධමති. තං හොති ජාතරූපං ධන්තං සන්ධන්තං නිද්ධන්තං නිහිතං නික්ඛිත්තකසාවං, මුදු ච හොති කම්මඤ්ඤඤ්ච පභස්සරඤ්ච න ච පභඞ්ගු, සම්මා උපෙති කම්මාය. යස්සා යස්සා ච පිළන්ධනවිකතියා ආකඞ්ඛති: යදි පට්ටිකාය යදි කුණ්ඩලාය යදි ගීවෙය්‍යකෙ යදි සුවණ්ණමාලාය තඤ්චස්ස අත්ථං අනුභොති.

එවමෙව ඛො භික්ඛවෙ සන්ති අධිචිත්තමනුයුත්තස්ස භික්ඛුනො ඔළාරිකා උපක්කිලෙසා: කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. තමෙනං සචෙතසො භික්ඛු දබ්බජාතිකො පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. තස්මිං පහීනෙ තස්මිං ව්‍යන්තීකතෙ සන්ති අධිචිත්තමනුයුත්තස්ස භික්ඛුනො මජ්ඣිමසහගතා උපක්කිලෙසා: කාමවිතක්කො ව්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො. තමෙනං සචෙතසො භික්ඛු දබ්බජාතිකො පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. තස්මිං පහීනෙ තස්මිං ව්‍යන්තීකතෙ සන්ති අධිචිත්තමනුයුත්තස්ස භික්ඛුනො සුඛුමසහගතා උපක්කිලෙසා: ඤාතිවිතක්කො ජනපදවිතක්කො අනුවිඤ්ඤත්තිපටිසඤ්ඤුත්තො විතක්කො. තමෙනං සචෙතසො භික්ඛු දබ්බජාතිකො පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. තස්මිං පහීනෙ තස්මිං ව්‍යන්තීකතෙ අථාපරං ධම්මවිතක්කාවසිස්සන්ති. සො හොති සමාධි න චෙව සන්තො න ච පණීතො න පටිප්පස්සද්ධිලද්ධො න එකොදිභාවාධිගතො, සසංඛාරනිග්ගය්හවාරිතවතො.[4]

1. ජාතරූපං - මජසං 2 මූසායං - මජසං. 3. අධන්තං අසන්ධන්තං - සයා. ධන්තං සන්ධන්තං නිද්ධන්තං අනිද්ධන්තකසාවං - මජසං. ධන්තං සන්ධන්තං අනිද්ධන්තං අනිහිතං අනිහතීත කසාවං - සීමු. 4 සසංඛාරනිග්ගය්හවාරිතගතො - මජසං.

## 3. 2. 5. 10.

5. මහණෙනි, ජාතරූපයා(රන්හු)ගේ පස් හා වැලිය, සකුරු හා කැබිලිති යයි ඔළාරික උපක්ලේශයෝ ඇත. ඒ උපක්ලේශ පස්දෝනේ හෝ පස්දෝනහුගේ අතවැසියෙක් හෝ දෙණෙහි විසුරුවා දෝනේය. මොනොවට දෝනේය. නිගෙණ දෝනේය. ඒ උපක්ලේශ ප්‍රහීණ වත් මැ ඒ උපක්ලේශ ව්‍යන්ත කොට ලත්මැ රන්හුගේ සියුම් සකුරුය, දළ වැලිය යි මධ්‍යම සහගතඋපක්ලේශයෝ ඇත. ඒ උපක්ලේශ පාංශුධාවක හෝ පාංශුධාවකයා අතවැසියෙක් හෝ සලයි. මොනොවට සලයි, පෙළාගෙණ සලයි. ඒ උපක්ලේශ ප්‍රහීණ වත් ම ඒ උපක්ලේශ විගත කොට ලත් ම රන්හුගේ සියුම් වැලිය, කළු දූලිය යි සූක්ෂම සහගත උපක්ලේශයෝ ඇත. ඒ උපක්ලේශ පාංශුධාවක හෝ පාංශුධාවකයා අතවැසියෙක් හෝ සෝදයි. මොනවට සෝදයි, පෙළාගෙණ සෝදයි. ඒ උපක්ලේශ ප්‍රහීන වත් ම ඒ උපක්ලේශ බැහැර කොට ලත් ම යලි රන්වැලි ඉතිරි වෙයි. රන්කරු හෝ රන්කරු අතවැසියෙක් හෝ ඒ රත කබලෙහි බහා පිඹියි. මොනොවට පිඹියි. පෙළාගෙණ පිඹියි. පිඹ මල හළ, මොනොවට පිඹ මල හළ, නිගෙණ පිඹ මල හළ, විවාරකොට නොතැබූ, නොහළ කසට ඇති, ඒ රත මෘදුත් නො වෙයි. කර්මණ්‍යත් නො වෙයි. ප්‍රභාස්වරත් නො වෙයි. බිඳෙන සුලුත් වෙයි. කර්මාන්තයට මොනොවට නො වැදෙයි.

මහණෙනි, යම් හෙයෙකින් ඒස්වර්ණකාරයා හෝ ස්වර්ණකාරයා අතවැසියා හෝ ඒ රත පිඹ මල හරනේ ද, මොනොවට පිඹ මල හරනේ ද, නිගෙණ පිඹ මල හරනේ ද, ඒබඳු කලෙක් වෙයි. පිඹ මල හළ, මොනොවට පිඹ මල හළ, නිගෙණ පිඹ කසකැළ මල ඇති, ශුද්ධ කොට බහා තැබූ, හළ කසට ඇති, ඒ රතෙක් වේ ද, ඒ මෘදුත් වෙයි. කර්මණ්‍යත් වෙයි ප්‍රභාස්වරත් වෙයි. බිඳෙන සුලුත් නො වෙයි කර්මාන්තයට ද මොනවට වැදෙයි. රන්පටට වේවයි, කොඬොලට වේවයි, ග්‍රීවාලඞ්කාරයෙහි වේවයි, රන්මලට වේවයි යම් යම් පිළන්ධනවිකෘතියකට කැමිති වේ ද ඒ අර්ථය ද වළඳ කෙරේ

මහණෙනි, එපරිද්දෙ ම අධිචිත්තයෙහි යෙදුනු මහණහුගේ කායදුශ්චරිතය වාග්දුශ්චරිතය මනෝදුශ්චරිතය යි ඔළාරික උපක්ලේශයෝ ඇද්ද, චිත්ත සම්පන්න පණ්ඩිතස්වභාව ඇති මහණ එය දුරු කෙරේ. විනෝදනා කෙරේ. විගතාන්ත කෙරේ. අනභාවයට පමුණුවයි. ඒ උපක්ලේශ ප්‍රහීන වත් ම ඒ උපක්ලේශ විගතාන්ත කරත් ම අධිචිත්තයෙහි යෙදුනු මහණහට කාමවිතර්කය ව්‍යාපාදවිතර්කය විහිංසා විතර්කය යි මධ්‍යම්සහගත උපක්ලේශයෝ ඇද්ද, ඒ උපක්ලේශ චිත්තසම්පන්න වූ පණ්ඩිතස්වභාව ඇති මහණ දුරු කෙරේ. විනෝදනා කෙරේ. විගතාන්ත කෙරේ අනභාවයට පමුණුවයි. ඒ ප්‍රහීන වත් ම ඒ විගතාන්ත කොට ලත් ම අධිචිත්තයෙහි යෙදුනු මහණහට ඥාතිවිතර්කය ජනපදවිතර්කය අනුවිඥප්තිප්‍රතිසංයුක්ත විතර්කය යි සූක්ෂම සහගත උපක්ලේශයෝ ඇද්ද, ඒ උපක්ලේශ චිත්තසම්පන්න පණ්ඩිතස්වභාව ඇති මහණ දුරු කෙරේ. විනෝදනා කෙරේ. විගතාන්ත කෙරේ. අනභාවයට පමුණුවයි. ඒ උපක්ලේශ ප්‍රහීන වත් ම ඒ උපක්ලේශ විගතාන්ත කොට ලත් ම ඉන් මතුයෙහි ධර්මවිතර්කයෝ (දශවිදර්ශනොපක්ලේශවිතර්ක) ඉතිරි වෙති. ඒ (අවශිෂ්ට ධර්මවිතර්ක) විදර්ශනාසමාධිය (නොසන්හුන් කෙලෙස් ඇති බැවින්) අශාන්ත වෙයි. ප්‍රණීත නො ද වෙයි. කෙලෙස් සන්හිඳුවීමෙන් නොලද්දේ වෙයි. එකඟ බවට නො පැමිණියේ වෙයි. සප්‍රයොගයෙන් කෙලෙස් නිගෙණීමෙන් උපන්නේ වෙයි.

හොති සො භික්ඛවෙ සමයො, යං තං චිත්තං අජ්ඣත්තඤ්ඤෙව සන්තිට්ඨති, සන්නිසීදති, එකොදි හොති[1], සමාධියති. සො හොති සමාධි සන්තො පණීතො පටිප්පස්සද්ධිලද්ධො එකොදිභාවාධිගතො, න සසංඛාරනිග්ගය්හවාරිතවතො. යස්ස යස්ස ච අභිඤ්ඤාසච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤාසච්ඡිකිරියාය, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති "අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභවෙය්‍යං: එකොපි හුත්වා බහුධා අස්සං, බහුධාපි හුත්වා එකො අස්සං, ආවීභාවං තිරොභාවං, තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡෙය්‍යං සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරෙය්‍යං සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡෙය්‍යං සෙය්‍යථාපි පඨවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමෙය්‍යං සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසුරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසෙය්‍යං පරිමජ්ජෙය්‍යං, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙය්‍ය"න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති "දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණෙය්‍යං දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ චා"ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති "පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානෙය්‍යං, සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානෙය්‍යං, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානෙය්‍යං, සදොසං වා චිත්තං -පෙ- වීතදොසං වා චිත්තං -පෙ- සමොහං වා චිත්තං -පෙ- වීතමොහං වා චිත්තං -පෙ- සඞ්ඛිත්තං වා චිත්තං -පෙ- වික්ඛිත්තං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං- [සබ්බං විත්ථාරෙතබ්බං] - පෙ - විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානෙය්‍යං, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානෙය්‍ය"න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති "අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍යං, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො -පෙ- ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි 'අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ 'අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං,[2] තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍ය"න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

1 එකොදිභාවං ගච්ඡති - සීමු 2. අමුත්‍ර උදපාදිං - මජ්සං.

මහණෙනි, යම් කලෙක ඒ සිත අධ්‍යාත්මයෙහි ම බැස සිටුනේ ද, බැස හිඳුනේ ද, එකඟ වේ ද, සමාධිගත වේ ද, එබඳු කලෙක් වෙයි. ඒ සමාධිය ශාන්ත වෙයි. ප්‍රණීත වෙයි. කෙලෙස් සන්හිඳුවීමෙන් ලදුයේ වෙයි. එකඟ බවට ගියේ වෙයි. සප්‍රයෝගයෙන් කෙලෙස් නිගෙණීමෙන් ලදුයේ නො වෙයි. විශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කළයුතු යම් යම් දහම්කට සිත නතු කෙරේ ද පූර්වහේතු හා අභිඥාපාදක-ධ්‍යානාදි ආයතන (සාධන) ඇති ඇතිවත් ම ඒ ඒ සිද්ධියෙහි ලා පසක් කිරීමෙහි භව්‍යතාවට පැමිණේ.

ඉදින් හේ "බහුප්‍රකාර ඍද්ධිප්‍රභේද වළඳම්ව යි, පියෙවින් එකක් ව බහු-ප්‍රකාර වෙම්ව යි, බහුප්‍රකාරව ද එකෙකිම් වෙම්ව යි, ආවිර්භාවයට තිරොභා-වයට භිත්තිපාරයට (භිත්තියෙන් ඔබ්බට) ප්‍රාකාරපාරයට පර්වතපාරයට අහසෙහි ගෙන යනුවන් සෙයින් නො සැටෙමින් යෙම්ව යි, දියෙහි සෙයින් පොළොවෙහිත් උන්මජ්ජන නිමජ්ජන කෙරෙම් ව යි, නො බිඳෙන දියෙහිදු පොළොවෙහි සෙයින් යෙම්ව යි, පක්ෂිශකුනීන් සෙයින් අහසෙහිත් පලඟින් යෙම්ව යි, මෙසේ මහත් ඍද්ධි ඇති මෙසේ මහත් අනුභාව ඇති මේ සඳහිරුහුන් අතින් පිරිමදිම්ව යි, බඹලොව දක්වාත් කයින් විසිය පවත්-වම්ව"යි කැමැති වේ නම් ආයතන ඇති ඇතිවත්ම ඒ ඒ සිද්ධියෙහි ලා පසක් කිරීමෙහි භව්‍යතාවට පැමිණෙයි.

ඉදින් හෙ "යම් ශබ්ද කෙනෙක් දුරෙහි ඇද්ද සමීපයෙහි හෝ ඇද්ද දිව්‍ය වූත් මානුෂ්‍ය වූත් ඒ උභය ශබ්දයන් මිනිස්කණ ඉක්ම සිටි විශුද්ධ වූ දිව්‍යශ්‍රෝත්‍රධාතුයෙන් අසම්ව"යි කැමැති වේ නම් ආයතන ඇති ඇතිවත්ම ඒ ඒ සිද්ධියෙහි ලා පසක් කිරීමෙහි භව්‍යතාවට පැමිණෙයි.

ඉදින් හෙ "පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ සිත සිතින් පිරිසිඳ දනිම්ව"යි සරාග වූ හෝ සිත සරාග සිතැ යි දනිම්ව යි, වීතරාග වූ හෝ සිත වීතරාග සිතැ යි දනිම්ව යි, සද්වෙෂ වූ හෝ සිත ... වීතද්වෙෂ වූ හෝ සිත ... සමොහ වූ හෝ සිත ... වීතමොහ වූ හෝ සිත ... සඞ්ක්ෂිප්ත වූ හෝ සිත ... වික්ෂිප්ත වූ හෝ සිත .. මහද්ගත වූ හෝ සිත ... අමහද්ගත වූ හෝ සිත ... සඋත්තර වූ හෝ සිත ... අනුත්තරවූ හෝ සිත ... සමාහිත වූ හෝ සිත ... අසමාහිත වූ හෝ සිත .. විමුක්ත වූ හෝ සිත විමුක්ත සිතැ යි දනිම්ව යි, අවිමුක්ත වූ හෝ සිත අවිමුක්ත සිතැ යි දනිම්ව" යි කැමැති වේ නම් ආයතන ඇති ඇතිවත්ම ඒ ඒ සිද්ධියෙහි ලා පසක් කිරීමෙහි භව්‍යතාවට පැමිණෙයි.

ඉදින් හෙ "අනේකප්‍රකාර පූර්වේනිවාසය සිහි කෙරෙම්ව" යි කැමති වේ ද, ඒ කෙසේයැ යත්: "එක් ජාතියකුදු දෙජාතියකුදු තුන් ජාතියකුදු සිවුජාතියකුදු ... සියක් ජාතියකුදු දහසක් ජාතියකුදු සියක් දහසක් ජාතියකුදු අනෙකසංවර්තකල්පයනුදු අනෙක විවර්තකල්පයනුදු අනේක සංවර්තවිවර්තකල්පයනුදු 'අසෝ තැන මෙබඳු නම් ඇතියෙම් වීමි යි, මෙබඳු ගොත්‍ර ඇතියෙම් වීමි යි, මෙබඳු වර්ණ ඇතියෙම් වීමි යි මෙබඳු අහර ඇතියෙම් වීමි යි, මෙබඳු සුවදුක් විඳියෙමි යි, මෙබඳු ආයු කෙළවර ඇතියෙමි යි, මම එයින් ච්‍යුතව අසෝ තැන උපනිමි යි, එහිදු මෙබඳු නම් ඇතියෙමි යි, මෙබඳු ගොත්‍ර ඇතියෙමියි, මෙබඳු වර්ණ ඇතියෙමි යි, මෙබඳු ආහාර ඇතියෙමි යි, මෙබඳු සුවදුක් විඳියෙමි යි, මෙබඳු ආයු පිරිහිම් කොට ඇතියෙමි යි, මම ඉන් සැව මෙහි උපනිමි' යි මෙසේ ආකාර සහිත වූ උද්දෙශ සහිත වූ අනේකප්‍රකාර වූ පූර්වේනිවාස සිහි කරන්නෙමි" යි කැමති වේ නම් ආයතන ඇති ඇතිවත්ම ඒ ඒ සිද්ධියෙහි ලා පසක් කිරීමෙහි භව්‍යතාවට පැමිණෙයි.

සො සචෙ ආකඞ්ඛති "දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සෙය්‍යං චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍යං: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචී -පෙ- මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. 'ඉමෙ වා පන භොන්තො සත්තා කාය සුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සෙය්‍යං චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍ය"න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති "ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය"න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙති.

## 3. 2. 5. 11.

52 අධිචිත්තමනුයුත්තෙන භික්ඛවෙ භික්ඛුනා තීණි නිමිත්තානි කාලෙන කාලං මනසිකාතබ්බානි: කාලෙන කාලං සමාධිනිමිත්තං මනසිකාතබ්බං. කාලෙන කාලං පග්ගහනිමිත්තං මනසිකාතබ්බං කාලෙන කාලං උපෙක්ඛානිමිත්තං මනසිකාතබ්බං.

සචෙ භික්ඛවෙ අධිචිත්තමනුයුත්තො භික්ඛු එකන්තං සමාධිනිමිත්තඤ්ඤෙව මනසිකරෙය්‍ය, ඨානං තං චිත්තං කොසජ්ජාය සංවත්තෙය්‍ය.

සචෙ භික්ඛවෙ අධිචිත්තමනුයුත්තො භික්ඛු එකන්තං පග්ගහනිමිත්තඤ්ඤෙව මනසිකරෙය්‍ය, ඨානං තං චිත්තං උද්ධච්චාය සංවත්තෙය්‍ය.

සචෙ භික්ඛවෙ අධිචිත්තමනුයුත්තො භික්ඛු එකන්තං උපෙක්ඛානිමිත්තඤ්ඤෙව මනසිකරෙය්‍ය, ඨානං තං චිත්තං න සම්මා සමාධියෙථ ආසවානං ඛයාය.

යතො ච ඛො භික්ඛවෙ අධිචිත්තමනුයුත්තො භික්ඛු කාලෙන කාලං සමාධිනිමිත්තං මනසිකරොති, කාලෙන කාලං පග්ගහනිමිත්තං මනසිකරොති, කාලෙන කාලං උපෙක්ඛානිමිත්තං මනසිකරොති, තං හොති චිත්තං මුදුඤ්ච කම්මඤ්ඤඤ්ච පභස්සරඤ්ච න ච පභඞ්ගු, සම්මා සමාධියති ආසවානං ඛයාය.

සෙය්‍යථාපි භික්ඛවෙ සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා උක්කං බන්ධති, උක්කං බන්ධිත්වා උක්කාමුඛං ආලිම්පෙති, උක්කාමුඛං ආලිම්පෙත්වා සණ්ඩාසෙන ජාතරූපං ගහෙත්වා උක්කාමුඛෙ පක්ඛිපිත්වා කාලෙන කාලං අභිධමති, කාලෙන කාලං උදකෙන පරිප්ඵොසෙති, කාලෙන කාලං අජ්ඣුපෙක්ඛති

සචෙ භික්ඛවෙ සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා තං ජාතරූපං එකන්තං අභිධමෙය්‍ය, ඨානං තං ජාතරූපං ඩහෙය්‍ය.

ඉදින් හේ “මිනිසැස ඉක්ම පැවැති විශුද්ධ වූ දිවැසින්, ච්‍යුත වන්නා වූ ද උපදනා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද සුවර්ණ වූ ද දුර්වර්ණ වූ ද සුගත වූ ද දුර්ගත වූ ද සත්ත්වයන් දක්නෙම් යි ද, ‘මේ භවත් සත්ත්වයෝ ඒකාන්තයෙන් කායදුශ්චරිතයෙන් සමන්‍වාගත වූවාහු වාග්දුශ්චරිතයෙන් ... මනොදුශ්චරිත-යෙන් සමන්‍වාගත වූවාහු ආර්‍ය්‍යොපවාද කරන්නාහු මිථ්‍යාදෘෂ්ටික වූවාහු මිථ්‍යාදෘෂ්ටික කර්ම සමාදන් වූවාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත වූ නිරයට එළඹියාහු වෙතැ’ යි කර්ම වූ පරිදි යන සත්ත්වයන් දනිමැ යි ද, ‘මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් සමන්‍වා-ගත වූවාහු වාක්සුචරිතයෙන් සමන්‍වාගත වූවාහු මනඃසුචරිතයෙන් සමන්‍වාගත වූවාහු ආර්‍ය්‍යොපවාද නොකරන්නාහු සම්‍යක්දෘෂ්ටික වූවාහු සම්‍යක්දෘෂ්ටි-කර්ම සමාදන් වන්නාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට එළඹියාහුය’ යි මෙසේ මිනිසැස ඉක්ම ගිය විශුද්ධ වූ දිවැසින් ච්‍යුත වන්නා වූ ද උපදනා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද සුවර්ණ වූ ද දුර්වර්ණ වූ ද සුගත වූ ද දුර්ගත වූ ද කර්ම වූ පරිදි යන සත්ත්වයන් දකිම් ව” යි මෙසේ කරුණු ඇති ඇතිවන්ම ඒ ඒ කාරියෙහි ලා පසක් කිරීමෙහි භව්‍යතාවට පැමිණෙයි.

ඉදින් හෙ “ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට උපයා වෙසෙම්ව” යි කැමැති වේ නම් කරුණු ඇති ඇතිවන් ම ඒ ඒ කාරියෙහි ලා පසක් කිරීමෙහි භව්‍යතාවට පැමිණේ,

### 3. 2. 5. 11.

52 මහණෙනි, (සමථවිදර්ශනාචිත්ත සඞ්ඛ්‍යාත) අධිචිත්තයෙහි යෙදුනු මහණහු විසින් කාරණයෝ තුන් දෙනෙක් කලින් කල මෙනෙහි කළ යුත්තාහ: කලින් කල සමාධි සඞ්ඛ්‍යාත ඒකාග්‍රතා නිමිත්ත මෙනෙහි කළ යුතුය. කලින්කල වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත ප්‍රග්‍රහ නිමිත්ත මෙනෙහි කළ යුතුය. කලින් කල මධ්‍යස්ථතා සඞ්ඛ්‍යාත උපෙක්ෂානිමිත්ත මෙනෙහි කළ යුතුය.

මහණෙනි, ඉදින් අධිචිත්තයෙහි යෙදුනු මහණ ඒකාන්තකොට සමාධිනිමිත්ත ම මෙනෙහි කරන්නේ වේ නම්, ඒ සිත කුසීතභාවයට වැටෙන්නේ ය යන මේකාරණ වෙයි.

මහණෙනි, ඉදින් අධිචිත්තයෙහි යෙදුනු මහණ ඒකාන්තකොට ප්‍රග්‍රහ-නිමිත්ත ම මෙනෙහි කරන්නේ නම්, ඒ සිත උද්ධතභාවයට වැටෙන්නේය යන මේකාරණ වෙයි.

මහණෙනි, ඉදින් අධිචිත්තයෙහි යෙදුනු මහණ ඒකාන්තකොට උපේක්ෂා-නිමිත්ත ම මෙනෙහි කරන්නේ නම්, ඒ සිත ආස්‍රවක්ෂය පිණිස මැනැවින් සමාධිගත නොවන්නේය යන මේ කාරණ වෙයි.

මහණෙනි, යම් කලෙක අධිචිත්තයෙහි යෙදුනු මහණ කලින් කල සමාධිනිමිත්ත මෙනෙහි කෙළේ ද, කලින් කල ප්‍රග්‍රහනිමිත්ත මෙනෙහි කෙළේ ද, කලින් කල උපෙක්ෂානිමිත්ත මෙනෙහි කෙළේ ද ඒ සිත මෘදුත් වෙයි. කර්මණ්‍යත් වෙයි. ප්‍රභාස්වරත් වෙයි. බිඳෙන සුලුත් නො වෙයි. ආස්‍රවක්ෂය සඞ්ඛ්‍යාත අර්හත්ඵලය පිණිස මැනැවින් සමාධිගත වෙයි.

මහණෙනි, යම් පරිදි තුලාරෙක් හෝ තුලාර අතවැසියෙක් හෝ අඟුරු කබලු බඳී ද, බැඳ කබලුමුව ගිනි ගන්වා ද, කබලුමුව ගිනි අවුලුවා අඬුවෙන් රන් ගෙණ කබලු මුවෙහි බහා කලින් කල අභිමුඛ කොට ගෙන පිඹී ද, කලින් කල දියෙන් ඉස්නේ වේ ද, කලින් කල පැසුනු නො පැසුනු බව සොයා ද,

මහණෙනි, ඉදින් රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ ඒ රන ඒකාන්ත කොට ඉදිරිකොටගෙන පිඹින්නේ නම් ඒ රන දැවෙන්නේය යන මෙ කාරණ වෙයි.

සචෙ භික්ඛවෙ සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා තං ජාතරූපං එකන්තං උදකෙන පරිප්ඵොසෙය්‍ය, ඨානං තං ජාතරූපං නිබ්බාපෙය්‍ය.[1]

සචෙ භික්ඛවෙ සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා තං ජාතරූපං එකන්තං අජ්ඣුපෙක්ඛෙය්‍ය, ඨානං තං ජාතරූපං න සම්මා පරිපාකං ගච්ඡෙය්‍ය.

යතො ච ඛො භික්ඛවෙ සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා තං ජාතරූපං කාලෙන කාලං අභිධමති, කාලෙන කාලං උදකෙන පරිප්ඵොසෙති, කාලෙන කාලං අජ්ඣුපෙක්ඛති, තං හොති ජාතරූපං මුදුඤ්ච කම්මඤ්ඤඤ්ච පභස්සරඤ්ච න ච පභඞ්ගු, සම්මා උපෙති කම්මාය. යස්සා යස්සා ච පිළන්ධනවිකතියා ආකඞ්ඛති: යදි පට්ටිකාය යදි කුණ්ඩලාය යදි ගීවෙය්‍යකෙ යදි සුවණ්ණමාලාය තඤ්චස්ස[2] අත්ථං අනුභොති,

එවමෙව ඛො භික්ඛවෙ අධිචිත්තමනුයුත්තෙන භික්ඛුනා තීණි නිමිත්තානි කාලෙන කාලං මනසිකාතබ්බානි: කාලෙන කාලං සමාධිනිමිත්තං මනසිකාතබ්බං. කාලෙන කාලං පග්ගහනිමිත්තං මනසිකාතබ්බං. කාලෙන කාලං උපෙක්ඛානිමිත්තං මනසිකාතබ්බං.

සචෙ භික්ඛවෙ අධිචිත්තමනුයුත්තො භික්ඛු එකන්තං සමාධිනිමිත්තඤ්ඤෙව මනසිකරෙය්‍ය, ඨානං තං චිත්තං කොසජ්ජාය සංවත්තෙය්‍ය.

සචෙ භික්ඛවෙ අධිචිත්තමනුයුත්තො භික්ඛු එකන්තං පග්ගහනිමිත්තඤ්ඤෙව මනසිකරෙය්‍ය, ඨානං තං චිත්තං උද්ධච්චාය සංවත්තෙය්‍ය

සචෙ භික්ඛවෙ අධිචිත්තමනුයුත්තො භික්ඛු එකන්තං උපෙක්ඛානිමිත්තඤ්ඤෙව මනසිකරෙය්‍ය. ඨානං තං චිත්තං න සම්මා සමාධියෙය්‍ය ආසවානං ඛයාය.

යතො ච ඛො භික්ඛවෙ අධිචිත්තමනුයුත්තො භික්ඛු කාලෙන කාලං සමාධිනිමිත්තං මනසිකරොති, කාලෙන කාලං පග්ගහනිමිත්තං මනසිකරොති, කාලෙන කාලං උපෙක්ඛානිමිත්තං මනසිකරොති, තං හොති චිත්තං මුදුඤ්ච කම්මඤ්ඤඤ්ච පභස්සරඤ්ච න ච පභඞ්ගු, සම්මා සමාධියති ආසවානං ඛයාය. යස්ස යස්ස ච අභිඤ්ඤා සච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති. අභිඤ්ඤා සච්ඡිකිරියාය, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති "අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභවෙය්‍යං"න්ති -පෙ- [ඡාභිඤ්ඤාචිත්තං ඤාතබ්බං[3]]. [සො සචෙ ආකඞ්ඛති]* "ආසවානං ඛයා [අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා]* සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය"න්ති, තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙති.

### ලොණඵලවග්ගො පඤ්චමො.

### මහාපණ්ණාසකො සමත්තො දුතියො.

---

1 නිබ්බාපෙය්‍ය - මජසං. 2 තඤ්චෙස්ස - සබ්බත්ථ 3 ඡ අභිඤ්ඤා විත්ථාරෙතබ්බා මජසං:

* [—] අන්තරිත වාක්‍යපදසා පොත්ථකෙසු පෙය්‍යාලමුඛෙන සඞ්ගහිතා

මහණෙනි, ඉදින් රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ ඒ රත ඒකාන්තකොට දියෙන් ඉස්තේ නම් ඒ රන නිවෙන්නේය යන මෙකරුණ වෙයි.

මහණෙනි, ඉදින් තුලාරෙක් හෝ තුලාර අතවැසියෙක් හෝ ඒ රන ඒකාන්තකොට සොයා බලන්නේ නම් ඒ රන මැනැවින් පරිපාකයට නොයන්නේය යන මෙ කරුණ වෙයි.

මහණෙනි යම් කලෙක රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ ඒ රන කලින් කල ඉදිරි කොට ගෙන පිඹින්නේ ද කලින් කල දියෙන් ඉස්තේ ද කලින් කල සොයා බලන්නේ ද ඒ රන මෘදුත් වෙයි. කර්මණ්‍යත් වෙයි. ප්‍රභාස්වරත් වෙයි. බිඳෙන සුලුත් නොවෙයි. මැනැවින් කර්මාන්තයට වැදෙයි. රන්පටට වේවයි, කොඩොලට වේවයි, ග්‍රීවාලඞ්කාරයෙහි වේවයි, රන්මලට වේවයි යම් යම් පිලඬින විකෘතියකට කැමැති වේ ද, ඒ අර්ථය ද වළඳ කෙරේ.

මහණෙනි, එ පරිදි ම අධිචිත්තයෙහි යෙදුනු මහණහු විසින් කාරණයෝ තුන් දෙනෙක් කලින් කල මෙනෙහි කළ යුත්තාහ: කලින් කල සමාධිනිමිත්ත මෙනෙහි කළ යුතුය. කලින් කල ප්‍රග්‍රහනිමිත්ත මෙනෙහි කළ යුතුය. කලින් කල උපේක්ෂානිමිත්ත මෙනෙහි කළ යුතුය.

මහණෙනි, ඉදින් අධිචිත්තයෙහි යෙදුනු මහණ ඒකාන්තකොට සමාධි-නිමිත්ත ම මෙනෙහි කෙරේ ද, ඒ සිත කුසීත බවට වැටෙන්නේය යන මෙ කරුණ වෙයි.

මහණෙනි, ඉදින් අධිචිත්තයෙහි යෙදුනු මහණ ඒකාන්තකොට ප්‍රග්‍රහ-නිමිත්ත ම මෙනෙහි කෙරේ ද, ඒ සිත උද්ධතභාවයට වැටෙන්නේය යන මෙකරුණ වෙයි.

මහණෙනි, ඉදින් අධිචිත්තයෙහි යෙදුනු මහණ ඒකාන්තකොට උපේක්ෂා-නිමිත්ත ම මෙනෙහි කෙරේ ද, ඒ සිත ආස්‍රවයන්ගේ ක්‍ෂය සඞ්ඛ්‍යාත අර්හත්ඵලය පිණිස මැනැවින් සමාධිගත නො වන්නේය යන මෙ කරුණ වෙයි.

මහණෙනි, යම් කලෙක අධිචිත්තයෙහි යෙදුනු මහණ කලින් කල සමාධිනිමිත්ත මෙනෙහි කෙරේ ද, කලින් කල ප්‍රග්‍රහනිමිත්ත මෙනෙහි කෙරේ ද, කලින් කල උපේක්ෂානිමිත්ත මෙනෙහි කෙරේ ද ඒ සිත මෘදුත් කර්මණ්‍යත් වෙයි. ප්‍රභාස්වරත් වෙයි. බිඳෙන සුලුත් නොවෙයි. ආස්‍රව-යන්ගේ ක්‍ෂය සඞ්ඛ්‍යාත අර්හත්ඵලය පිණිස මැනැවින් සමාධිගත වෙයි. විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කළ යුතු යම් යම් දහමකට සිත නතු කෙරේ ද, කරුණ ඇති ඇති වත්ම ඒ ඒ කාරියෙහි ලා පසක් කිරීමෙහි භව්‍යතාවට පැමිණේ.

ඉදින් ඒ මහණ බහුප්‍රකාර ඍද්ධිප්‍රභේදය වළඳන්නෙම්ව යි ... කැමති වන්නේ නම් [මෙහි පෙය්‍යාල මුඛයෙන් ෂඩභිඥ චිත්තය දතයුතුයි.] ඉදින් ඒ මහණ "ආස්‍රවක්‍ෂයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ඊට එළඹ වෙසෙම්ව" යි කැමැති වන්නේ නම්, කරුණ ඇති ඇති වත්ම ඒ ඒ කාරියෙහි පසක් කිරීමෙහි භව්‍යතාවට පැමිණේ.

**පස්වැනි ලොණඵල වර්ගයයි.**

**දෙවන මහාපණ්ණාසකය සමාප්තයි.**

# 3. තතියො පණ්ණාසකො

## [ 1. සම්බොධිවග්ගො ]

### 3. 3. 1. 1.

[සාවත්ථිනිදානං]

1 පුබ්බෙව මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: කො නු ඛො ලොකෙ අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණන්ති.

තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: යං ඛො ලොකෙ[1] පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං ලොකෙ අස්සාදො. යං ලොකො[2] අනිච්චො දුක්ඛො විපරිණාමධම්මො, අයං ලොකෙ ආදීනවො. යො ලොකෙ ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං ලොකෙ නිස්සරණන්ති.

යාවකීවඤ්චාහං භික්ඛවෙ එවං ලොකස්ස අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤාසිං, නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ-සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො[3] පච්චඤ්ඤාසිං.

යතො ච ඛො අහං[4] භික්ඛවෙ එවං ලොකස්ස අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ-සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො[3] පච්චඤ්ඤාසිං.

ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: "අකුප්පා මෙ චෙතොවිමුත්ති. අයමන්තිමා ජාති. නත්ථි'දානි පුනබ්භවො"ති.

### 3. 3. 1. 2.

2. ලොකස්සාහං භික්ඛවෙ අස්සාදපරියෙසනං අචරිං. යො ලොකෙ අස්සාදො, තදජ්ඣගමං. යාවතකො ලොකෙ අස්සාදො, පඤ්ඤාය මෙ එසො සුදිට්ඨො. ලොකස්සාහං භික්ඛවෙ ආදීනවපරියෙසනං අචරිං. යො ලොකෙ ආදීනවො, තදජ්ඣගමං. යාවතකො ලොකෙ ආදීනවො, පඤ්ඤාය මෙ එසො සුදිට්ඨො. ලොකස්සාහං භික්ඛවෙ නිස්සරණපරියෙසනං අචරිං. යං ලොකෙ නිස්සරණං, තදජ්ඣගමං. යාවතකං ලොකෙ නිස්සරණං, පඤ්ඤාය මෙ එතං සුදිට්ඨං.

යාවකීවඤ්චාහං භික්ඛවෙ ලොකස්ස අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං න අබ්භඤ්ඤාසිං, නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ-සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො[3] පච්චඤ්ඤාසිං.

1 ලොකං-මජසං. 2 ලොකෙ-PTS. 3. අභිසම්බුද්ධොති-මජසං. 4. ඛ්වාහං-මජසං.

# 3. තෙවන පණ්ණාසකය

## [ 1. සම්බෝධි වර්ගය ]

### 3. 3. 1. 1.

[සැවැත්නිදානයි:]

1. මහණෙනි, සම්‍යක් සම්බෝධියෙන් කලින් ම චතුස්සත්‍යාවබෝධ නො කළ බෝසත් වූ ම මට මෙබඳු සිතෙක් විය: ලෝකයෙහි ආස්වාදය කවරේය, ආදීනව කවරේය, නිස්සරණය කවරේය යි.

මහණෙනි, ඒ මට මෙසේ සිත් විය: යම් හේතුයෙකින් ලෝකයෙහි යමක් නිසා සුඛය හා සෞමනස්‍යය උපදනේ ද, මේ ලෝකයෙහි ආස්වාද යි. යම් හේතුයෙකින් ලෝකය අනිත්‍ය වේ ද, දුඃඛ වේ ද, විපරිණාමස්වභාව වේ ද, මේ ලෝකයෙහි ආදීනව යි. යම් හේතුයෙකින් ලෝකයෙහි ඡන්දරාගයාගේ විනයයෙක් වේ ද, ඡන්දරාගයාගේ ප්‍රහාණයෙක් වේ ද, මේ ලෝකයෙහි නිස්සරණය වේ යි.

මහණෙනි, මම යම්තාක් කල් මෙසේ ලෝකයාගේ ආස්වාදයත් ආස්වාද විසින් ආදීනවයත් ආදීනව විසින් නිස්සරණයත් නිස්සරණ විසින් තත් වූ පරිදි නො දනිම් ද, මහණෙනි, ඒ තාක් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි - මහණ බමුණන් සියෝ දෙවිමිනිසුන් සියෝ සත්ත්වාඛ්‍යප්‍රජායෙහි 'අනුත්තරසම්‍යක්සම්බෝධිය අවබෝධ කෙළෙම්'යි ප්‍රතිඥා නොම කෙළෙමි.

මහණෙනි, යම් කලෙක මම මෙසේ ලෝකයාගේ ආස්වාදයත් ආස්වාද විසින් ආදීනවයත් ආදීනව විසින් නිස්සරණයත් නිස්සරණ විසින් තත් වූ පරිදි දනිම් ද, එසඳ මහණෙනි, මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි - මහණ බමුණන් සියෝ දෙවිමිනිසුන් සියෝ සත්ත්වාඛ්‍යප්‍රජායෙහි 'අනුත්තර සම්‍යක්සම්බෝධිය අවබෝධ කෙළෙම්' යි පිළිණ කෙළෙමි.

"මාගේ චෙතොවිමුක්තිය අචිකෘත්‍යී (නිශ්චල) විය. මේ අන්තිමජාති යි. දැන් පුනර්භවයෙක් නැතැ"යි ඥානදර්ශනය (ප්‍රත්‍යවේක්ෂාඥානය) ද මට පහළ විය.

### 3. 3. 1. 2.

2. මහණෙනි, මම ලෝකයාගේ ආස්වාදපර්යේෂණය කෙළෙමි. ලෝකයෙහි යම් ආස්වාදයෙක් ඇද්ද, එය අවබෝධ කෙළෙමි. ලෝකයෙහි යම් පමණ ආස්වාදයෙක් ඇද්ද, මා විසින් මෙසේ ආස්වාදය ප්‍රඥායෙන් දක්නාලදි. මහණෙනි, මම ලෝකයාගේ ආදීනව පර්යේෂණය කෙළෙමි. ලෝකයෙහි යම් ආදීනවයෙක් ඇද්ද, එය අවබෝධ කෙළෙමි. ලෝකයෙහි යම් පමණ ආදීනවයෙක් ඇද්ද, මා විසින් මෙසේ ආදීනවය ප්‍රඥායෙන් දක්නා ලදී. මහණෙනි, මම ලෝකයාගේ නිස්සරණ පර්යේෂණය කෙළෙමි. ලෝකයෙහි යම් නිස්සරණයෙක් ඇද්ද, එය අවබෝධ කෙළෙමි. ලෝකයෙහි යම් පමණ නිස්සරණයෙක් ඇද්ද, මා විසින් මෙසේ නිස්සරණය ප්‍රඥායෙන් දක්නා ලදී.

මහණෙනි, මම යම් තාක් කල් ලෝකයාගේ ආස්වාදයත් ආස්වාද විසින් ආදීනවයත් ආදීනව විසින් නිස්සරණයත් නිස්සරණ විසින් තත් වූ පරිදි නො දනිම් ද, මහණෙනි, ඒ තාක් කල් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි - මහණබමුණන් සියෝ දෙවිමිනිසුන් සියෝ සත්ත්වාඛ්‍යප්‍රජායෙහි 'අනුත්තරසම්‍යක්සම්බෝධිය අවබෝධ කෙළෙම්' යි පිළිණ නොම කෙළෙමි.

යතො ච ඛො අහං භික්ඛවෙ ලොකස්ස අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ - සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං.

ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: "අකුප්පා මෙ චෙතොවිමුත්ති. අයමන්තිමා ජාති. නත්ථි'දානි පුනබ්භවො"ති.

3. 3. 1. 3.

3. නො චෙදං[1] භික්ඛවෙ ලොකෙ අස්සාදො අභවිස්ස, නයිදං සත්තා ලොකෙ සාරජ්ජෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි ලොකෙ අස්සාදො, තස්මා සත්තා ලොකෙ සාරජ්ජන්ති.

නො චෙදං[1] භික්ඛවෙ ලොකෙ ආදීනවො අභවිස්ස, නයිදං සත්තා ලොකෙ නිබ්බින්දෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි ලොකෙ ආදීනවො, තස්මා සත්තා ලොකෙ නිබ්බින්දන්ති

නො චෙදං භික්ඛවෙ ලොකෙ නිස්සරණං අභවිස්ස, නයිදං සත්තා ලොකම්හා නිස්සරෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි ලොකෙ නිස්සරණං, තස්මා සත්තා ලොකම්හා නිස්සරන්ති.

යාවකීවඤ්ච භික්ඛවෙ සත්තා ලොකස්ස අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං න අබ්භඤ්ඤංසු, නෙව තාව භික්ඛවෙ සත්තා සදෙවකා ලොකා සමාරකා සබ්‍රහ්මකා-සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය නිස්සටා විසඤ්ඤුත්තා විප්පමුත්තා විමරියාදීකතෙන චෙතසා විහරිංසු.

යතො ච ඛො භික්ඛවෙ සත්තා ලොකස්ස අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤංසු, අථ භික්ඛවෙ සත්තා සදෙවකා ලොකා සමාරකා සබ්‍රහ්මකා - සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය නිස්සටා විසඤ්ඤුත්තා විප්පමුත්තා විමරියාදීකතෙන චෙතසා විහරන්තීති.

3. 3. 1. 4.

4. යෙ හි කෙචි[2] භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ලොකස්ස අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නප්පජානන්ති, න මෙ තෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා, න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

---

1 චෙතං - සෘ. තං - PTS    2 යෙ කෙචි - මජසං.

මහණෙනි, යම් කලෙක මම ලෝකයාගේ ආස්වාදයත් ආස්වාද විසින් ආදීනවයත් ආදීනව විසින් නිස්සරණයත් නිස්සරණ විසින් තත් වූ පරිදි දනිම් ද, එසඳ මහණෙනි, මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි - මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත සත්ත්වාබ්‍යප්‍රජායෙහි 'අනුත්තර සම්‍යක්සම්බෝධිය අවබෝධ කෙළෙමි' යි පිළිණ කෙළෙමි.

"මාගේ චේතොවිමුක්තිය අකෝප්‍ය විය. මේ අන්තිම ජාති යි. දැන් පුනර්භවයෙක් නැතැ"යි මට ප්‍රත්‍යවෙක්ෂාඥාන සඞ්ඛ්‍යාත ඥානදර්ශනය ද පහළ විය.

### 3. 3. 1. 3.

3. මහණෙනි, ඉදින් ලෝකයෙහි ආස්වාදයෙක් නො වී නම් සත්ත්වයෝ ලෝකයෙහි නො ඇලෙති. මහණෙනි, යම් හෙයෙකින් ලෝකයෙහි ආස්වාදයෙක් ඇද්ද, එහෙයින් ලෝකයෙහි සත්ත්වයෝ ඇලෙති.

මහණෙනි, ඉදින් ලෝකයෙහි ආදීනවයෙක් නො වී නම් සත්ත්වයෝ ලෝකයෙහි නො කලකිරෙති. මහණෙනි, යම් හෙයෙකින් ලෝකයෙහි ආදීනවයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ ලෝකයෙහි කලකිරෙති.

මහණෙනි, ඉදින් ලෝකයෙහි නිස්සරණයෙක් නො වී නම් සත්ත්වයෝ ලෝකයෙන් නිස්සරණ නො කෙරෙති. මහණෙනි, යම් හෙයෙකින් ලෝකයෙහි නිස්සරණයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ ලෝකයෙන් නිස්සරණ කෙරෙති.

මහණෙනි, යම් තාක් කල් සත්ත්වයෝ ලෝකයාගේ ආස්වාදයත් ආස්වාද විසින් ආදීනවයත් ආදීනව විසින් නිස්සරණයත් නිස්සරණ විසින් තත් වූ පරිදි නො දත්හු ද, මහණෙනි, ඒ තාක් සත්ත්වයෝ මරුන් සහිත බඹුන් සහිත දෙවියන් සහිත ලෝකයෙන් - මහණ බමුණන් සහිත දෙවමනුෂ්‍යයන් සහිත ප්‍රජාව කෙරෙන් නිසෘත නො වූ හ. විසංයුක්ත නො වූ හ. විප්‍රමුක්ත නො වූ හ. බුන් මියර ඇති (මිදුනු) සිතින් නො විසූහ.

මහණෙනි, යම් කලෙක සිට සත්ත්වයෝ ලෝකයාගේ ආස්වාදයත් ආස්වාද විසින් ආදීනවයත් ආදීනව විසින් නිස්සරණයත් නිස්සරණ විසින් තත් වූ පරිදි දත්හු ද, මහණෙනි, එකල සිට සත්ත්වයෝ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයා කෙරෙන් - මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාව කෙරෙන් නිසෘත වූවාහු විසංයුක්ත වූවාහු විප්‍රමුක්ත වූවාහු බුන් මියර ඇති සිතින් වෙසෙත්.

### 3. 3. 1. 4.

4. මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ ලෝකයාගේ ආස්වාදයත් ආස්වාද විසින් ආදීනවයත් ආදීනව විසින් නිස්සරණයත් නිස්සරණ විසින් තත් වූ පරිදි නො දනිත් ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මා විසින් ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණයහ යි සම්මත නොවෙති. බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණයහ යි සම්මත නොවෙති. ඒ ආයුෂ්මත්හු ශ්‍රාමණ්‍යාර්ථ බ්‍රාහ්මණ්‍යාර්ථ සඞ්ඛ්‍යාත චතුර්විධ ආර්‍යමාර්ගඵල ඉහාත්මයෙහි ම තුමූ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට උපදාගෙන නො වෙසෙත්.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ලොකස්ස අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං පජානන්ති, තෙ ඛො භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා. බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. තෙ ඛො පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.[1]

### 3. 3. 1. 5.

5. රුණ්ණමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ යදිදං ගීතං. උම්මත්තකමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ යදිදං නච්චං. කොමාරකමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ යදිදං අතිවෙලං දන්තවිදංසකං හසිතං.[2]

තස්මාතිහ භික්ඛවෙ සෙතුඝාතො ගීතෙ. සෙතුඝාතො නච්චෙ. අලං වො ධම්මපමොදිතානං සතං සිතං සිතමත්තායාති.

### 3. 3. 1. 6.

6. තිණ්ණං භික්ඛවෙ පටිසෙවනාය නත්ථි තිත්ති. කතමෙසං තිණ්ණං:

සොප්පස්ස භික්ඛවෙ පටිසෙවනාය නත්ථි තිත්ති. සුරාමෙරයපානස්ස භික්ඛවෙ පටිසෙවනාය නත්ථි තිත්ති, මෙථුනධම්මසමාපත්තියා භික්ඛවෙ පටිසෙවනාය නත්ථි තිත්ති.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං පටිසෙවනාය නත්ථි තිත්තීති.

### 3. 3. 1. 7.

7 අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

චිත්තෙ ගහපති අරක්ඛිතෙ කායකම්මම්පි අරක්ඛිතං හොති. වචී කම්මම්පි අරක්ඛිතං හොති. මනොකම්මම්පි අරක්ඛිතං හොති.

---

1. විහරිස්සන්තීති - සීමු. 2. දන්තවිදංසකහසිතං - මජසං.

මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහමණ කෙනෙක් හෝ ලෝකයාගේ ආස්වාදයත් ආස්වාද විසින් ආදීනවයත් ආදීනව විසින් නිස්සරණයත් නිස්සරණ විසින් තත් වූ පරිදි දනිත් ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහමණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි හෝ ශ්‍රමණයහ යි සම්මතයහ. බ්‍රාහමණයන් කෙරෙහි හෝ බ්‍රාහමණයහ යි සම්මතයහ. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රාමණ්‍යාර්ථ බ්‍රාහමණ්‍යාර්ථ සඞ්ඛ්‍යාත චතුර්විධ ආර්‍ය්‍යමාර්ගඵල ඉහාත්මයෙහි ම තුමූ විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ගෙණ ඊට පැමිණ වෙසෙත්.

### 3. 3. 1. 5.

5. මහණෙනි, ආර්‍ය්‍යවිනයෙහි ගීතය නම් හැඬීමෙකි. මහණෙනි, ආර්‍ය්‍යවිනයෙහි නෘත්‍යය නම් උමතු ක්‍රියායෙකි. මහණෙනි, ආර්‍ය්‍යවිනයෙහි අත්‍යර්ථයෙන් දත් විදහා කරණ සිනාව නම් කුමරුන් කරණ දෑයෙකි (ළමා කමෙකි).

මහණෙනි, එහෙයින් ගීතයෙහි හේතු නැස්ම වේවා නෘත්‍යයෙහි හේතු නැස්ම වේවා. කිසියම් කරුණෙකින් ප්‍රමුදිත වූ තොපට මඳ සිනායෙක් වේ නම් ඒ දත් අගමතු දක්වා කරණ ස්මිතමාත්‍රයට ම යුතු ය.

### 3. 3. 1. 6.

6. මහණෙනි, කරුණු තුන් දෙනකුන්ගේ ප්‍රතිසේවනායෙහි තෘප්තියෙක් නැත. කවර තුන් දෙනකුන්ගේ ද යත්:

මහණෙනි, නිද්‍රාවගේ ප්‍රතිසේවනායෙහි තෘප්තියෙක් නැත. මහණෙනි, සුරාමේරයපානයාගේ ප්‍රතිසේවනායෙහි තෘප්තියෙක් නැත. මහණෙනි, මෛථුනධර්‍මසමාපත්තියගේ ප්‍රතිසෙවනායෙහි තෘප්තියෙක් නැත.

මහණෙනි, මේ තුන්දෙනාගේ ප්‍රතිසේවනායෙයි තෘප්තියෙක් නැත.

### 3. 3. 1. 7.

7. එකල **අනේපිඬු** ගෙහෙවි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හින. එකත්පස්ව හුන් අනේපිඬු ගෙහෙවිහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළහ:

ගෙහෙවිය, සිත නොරක්නා ලද කල්හි කායකර්‍මය ද නොරැකුනේ වෙයි. වාක්කර්‍මය ද නොරැකුනේ වෙයි. මනෝකර්‍මය ද නොරැකුනේ වෙයි.

තස්ස අරක්ඛිතකායකම්මන්තස්ස අරක්ඛිතවචීකම්මන්තස්ස අරක්ඛිතමනොකම්මන්තස්ස කායකම්මම්පි අවස්සුතං හොති. වචීකම්මම්පි අවස්සුතං හොති. මනොකම්මම්පි අවස්සුතං හොති. තස්ස අවස්සුතකායකම්මන්තස්ස අවස්සුතවචීකම්මන්තස්ස අවස්සුතමනොකම්මන්තස්ස කායකම්මම්පි පූතියං හොති. වචීකම්මම්පි පූතියං හොති. මනොකම්මම්පි පූතියං හොති. තස්ස පූතිකායකම්මන්තස්ස පූතිවචීකම්මන්තස්ස පූතිමනොකම්මන්තස්ස න භද්දකං මරණං හොති. න භද්දිකා කාලකිරියා.

සෙය්‍යථාපි ගහපති කූටාගාරෙ දුච්ඡන්නෙ කූටම්පි අරක්ඛිතං හොති. ගොපානසියොපි අරක්ඛිතා හොන්ති. භිත්තිපි අරක්ඛිතා හොති. කූටම්පි අවස්සුතං හොති. ගොපානසියොපි අවස්සුතා හොන්ති. භිත්තිපි අවස්සුතා හොති. කූටම්පි පූතිකං හොති. ගොපානසියොපි පූතිකා හොන්ති. භිත්තිපි පූතිකා හොති.

එවමෙව ඛො ගහපති චිත්තෙ අරක්ඛිතෙ කායකම්මම්පි අරක්ඛිතං හොති. වචීකම්මම්පි අරක්ඛිතං හොති. මනොකම්මම්පි අරක්ඛිතං හොති. තස්ස අරක්ඛිතකායකම්මන්තස්ස අරක්ඛිතවචීකම්මන්තස්ස අරක්ඛිතමනොකම්මන්තස්ස කායකම්මම්පි අවස්සුතං හොති. වචීකම්මම්පි අවස්සුතං හොති. මනොකම්මම්පි අවස්සුතං හොති. තස්ස අවස්සුතකායකම්මන්තස්ස අවස්සුතවචීකම්මන්තස්ස අවස්සුතමනොකම්මන්තස්ස කායකම්මම්පි පූතියං හොති. වචීකම්මම්පි පූතියං හොති. මනොකම්මම්පි පූතියං හොති. තස්ස පූතිකායකම්මන්තස්ස පූතිවචීකම්මන්තස්ස පූතිමනොකම්මන්තස්ස න භද්දකං මරණං හොති. න භද්දිකා කාලකිරියා.

චිත්තෙ ගහපති රක්ඛිතෙ කායකම්මම්පි රක්ඛිතං හොති. වචීකම්මම්පි රක්ඛිතං හොති. මනොකම්මම්පි රක්ඛිතං හොති. තස්ස රක්ඛිතකායකම්මන්තස්ස රක්ඛිතවචීකම්මන්තස්ස රක්ඛිතමනොකම්මන්තස්ස කායකම්මම්පි අනවස්සුතං හොති. වචීකම්මම්පි අනවස්සුතං හොති. මනොකම්මම්පි අනවස්සුතං හොති. තස්ස අනවස්සුතකායකම්මන්තස්ස අනවස්සුතවචීකම්මන්තස්ස අනවස්සුතමනොකම්මන්තස්ස කායකම්මම්පි අපූතියං හොති. වචීකම්මම්පි අපූතියං හොති. මනොකම්මම්පි අපූතියං හොති. තස්ස අපූතිකායකම්මන්තස්ස අපූතිවචීකම්මන්තස්ස අපූතිමනොකම්මන්තස්ස භද්දකං මරණං හොති. භද්දිකා කාලකිරියා.

සෙය්‍යථාපි ගහපති කූටාගාරෙ සුච්ඡන්නෙ කූටම්පි රක්ඛිතං හොති. ගොපානසියොපි රක්ඛිතා හොන්ති. භිත්තිපි රක්ඛිතා හොති. කූටම්පි අනවස්සුතං හොති. ගොපානසියොපි අනවස්සුතා හොන්ති භිත්තිපි අනවස්සුතා හොති. කූටම්පි අපූතිකං හොති. ගොපානසියොපි අපූතිකා හොන්ති. භිත්තිපි අපූතිකා හොති.

නොරැකුනු කායකර්මාන්ත ඇති, නොරැකුනු වාක්කර්මාන්ත ඇති, නොරැකුනු මනඃකර්මාන්ත ඇති ඔහුගේ කායකර්මය ද කෙලෙසින් තෙත් වූයේ වෙයි. වාක්කර්මය ද කෙලෙසින් තෙත් වූයේ වෙයි. මනඃකර්මය ද කෙලෙසින් තෙත් වූයේ වෙයි. තෙත් වූ කායකර්මාන්ත ඇති, තෙත් වූ වාක්කර්මාන්ත ඇති, තෙත් වූ මනඃකර්මාන්ත ඇති ඔහුගේ කායකර්මය ද අපවිත්‍ර වෙයි. වාක්කර්මය ද අපවිත්‍ර වෙයි මනඃකර්මය ද අපවිත්‍ර වෙයි. අපවිත්‍ර වූ කායකර්මාන්ත ඇති, අපවිත්‍ර වූ වාක්කර්මාන්ත ඇති, අපවිත්‍ර වූ මනඃකර්මාන්ත ඇති ඔහුගේ මරණය හද්‍ර නො වේ. කලක්‍රියාව හද්‍රිකා නො වෙයි.

ගෘහපතිය, යම් පරිද්දි කුළුගෙයක් දුසෙවූ කල්හි කූටයත් නොරැකුනේ වේ ද, ගොනැස්හුත් නොරැකුනාහු වෙත් ද, බිතත් නොරැකුනේ වේ ද, කූටයත් තෙත් වූයේ වේ ද, ගොනැස්හුත් තෙත් වූවාහු වෙත් ද, බිතත් තෙත් වූයේ වේ ද, කූටයත් දිරාපත් වූයේ වේ ද, ගොනැස්හුත් දිරාපත් වූවාහු වෙත් ද, බිතත් දිරාපත් වූයේ වේ ද,

ගෘහපතිය, එපරිද්දි ම සිත නොරැකුනු කල්හි කායකර්මය ද නොරැකුනේ වේ. වාක්කර්මය ද නොරැකුනේ වේ. මනඃකර්මය ද නොරැකුනේ වෙයි. නොරැකුනු කායකර්මාන්ත ඇති, නොරැකුනු වාක්කර්මාන්ත ඇති නොරැකුනු මනඃකර්මාන්ත ඇති ඔහුගේ කායකර්මය ද කෙලෙසුන් විසින් තෙත් වූයේ වෙයි. වාක්කර්මය ද කෙලෙසුන් විසින් තෙත් වූයේ වෙයි. මනඃකර්මය ද කෙලෙසුන් විසින් තෙත් වූයේ වෙයි. තෙත් වූ කායකර්මාන්ත ඇති, තෙත් වූ වාක්කර්මාන්ත ඇති, තෙත් වූ මනඃකර්මාන්ත ඇති ඔහුගේ කායකර්මය ද අපවිත්‍ර වේ. වාක්කර්මය ද අපවිත්‍ර වේ. මනඃකර්මය ද අපවිත්‍ර වේ. අපවිත්‍ර කායකර්මාන්ත ඇති, අපවිත්‍ර වාක්කර්මාන්ත ඇති, අපවිත්‍ර මනඃකර්මාන්ත ඇති ඔහුගේ මරණය හද්‍ර නොවෙයි. කාලක්‍රියාව හද්‍රිකා නොවෙයි.

ගෘහපතිය, සිත රැකුනු කල්හි කායකර්මය ද රැකුනේ වෙයි. වාක්කර්මය ද රැකුනේ වෙයි. මනඃකර්මය ද රැකුනේ වෙයි. රැකුනු කායකර්මාන්ත ඇති, රැකුනු වාක්කර්මාන්ත ඇති, රැකුනු මනඃකර්මාන්ත ඇති ඔහුගේ කායකර්මය ද කෙලෙසුන් විසින් තෙත් වූයේ නොවෙයි. වාක්කර්මය ද කෙලෙසුන් විසින් තෙත් වූයේ නොවෙයි. මනඃකර්මය ද කෙලෙසුන් විසින් තෙත් වූයේ නොවෙයි. තෙත් නොවූ කායකර්මාන්ත ඇති, තෙත් නොවූ වාක්කර්මාන්ත ඇති, තෙත් නොවූ මනඃකර්මාන්ත ඇති ඔහුගේ කායකර්මයද පවිත්‍ර වෙයි. වාක්කර්මය ද පවිත්‍ර වෙයි. මනඃකර්මය ද පවිත්‍ර වෙයි. පවිත්‍ර කායකර්මාන්ත ඇති, පවිත්‍ර වාක්කර්මාන්ත ඇති, පවිත්‍ර මනඃකර්මාන්ත ඇති ඔහුගේ මරණය හද්‍ර වෙයි. කාලක්‍රියාව හද්‍රිකා වෙයි.

ගෘහපතිය, යම් පරිද්දි කුළුගෙයක් මොනොවට සෙවෙනි කළ කල්හි කූටයත් රැකුනේ වේ ද, ගොනැස්හුත් රැකුනාහු වෙත් ද, බිතත් රැකුනේ වේ ද, කූටයත් තෙත් වූයේ නොවේ ද, ගොනැස්හුත් තෙත් වූවාහු නොවෙත් ද, බිතත් තෙත් වූයේ නොවේ ද, කූටයත් නොදිරා ගියේ වේ ද, බිතත් නොදිරා ගියේ වේ ද,

එවමෙව ඛො ගහපති චිත්තෙ රක්ඛිතෙ කායකම්මම්පි රක්ඛිතං හොති වචීකම්මම්පි රක්ඛිතං හොති. මනොකම්මම්පි රක්ඛිතං හොති. තස්ස රක්ඛිත-කායකම්මන්තස්ස රක්ඛිතවචීකම්මන්තස්ස රක්ඛිත මනොකම්මන්තස්ස කායකම්මම්පි අනවස්සුතං හොති. වචීකම්මම්පි අනවස්සුතං හොති. මනො-කම්මම්පි අනවස්සුතං හොති. තස්ස අනවස්සුතකායකම්මන්තස්ස අනවස්සුතවචී කම්මන්තස්ස අනවස්සුත මනොකම්මන්තස්ස කායකම්මම්පි අපූතියං හොති. වචීකම්මම්පි අපූතියං හොති. මනොකම්මම්පි අපූතියං හොති. තස්ස අපූතිකාය-කම්මන්තස්ස අපූතිවචීකම්මන්තස්ස අපූති මනොකම්මන්තස්ස භද්දකං මරණං හොති. භද්දිකා කාලකිරියාති.

### 3. 3. 1. 8.

8. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච: චිත්තෙ ගහපති ව්‍යාපන්නෙ කායකම්මම්පි ව්‍යාපන්නං හොති. වචීකම්මම්පි ව්‍යාපන්නං හොති. මනොකම්මම්පි ව්‍යාපන්නං හොති. තස්ස ව්‍යාපන්නකාය-කම්මන්තස්ස ව්‍යාපන්නවචීකම්මන්තස්ස ව්‍යාපන්නමනොකම්මන්තස්ස න භද්දකං මරණං හොති. න භද්දිකා කාලකිරියා.

සෙය්‍යථාපි ගහපති කූටාගාරෙ දුච්ඡන්නෙ කූටම්පි ව්‍යාපන්නං හොති. ගොපනසියොපි ව්‍යාපන්නා හොන්ති. භිත්තීපි ව්‍යාපන්නා හොති. එවමෙව ඛො ගහපති චිත්තෙ ව්‍යාපන්නෙ කායකම්මම්පි ව්‍යාපන්නං හොති. වචීකම්මම්පි ව්‍යාපන්නං හොති. මනොකම්මම්පි ව්‍යාපන්නං හොති. තස්ස ව්‍යාපන්නකායකම්මන්තස්ස ව්‍යාපන්නවචීකම්මන්තස්ස ව්‍යාපන්නමනොක-ම්මන්තස්ස න භද්දකං මරණං හොති. න භද්දිකා කාලකිරියා.

චිත්තෙ ගහපති අව්‍යාපන්නෙ කායකම්මම්පි අව්‍යාපන්නං හොති. වචීකම්මම්පි අව්‍යාපන්නං හොති. මනොකම්මම්පි අව්‍යාපන්නං හොති. තස්ස අව්‍යාපන්නකායකම්මන්තස්ස අව්‍යාපන්නවචීකම්මන්තස්ස අව්‍යාපන්නමනො කම්මන්තස්ස භද්දකං මරණං හොති. භද්දිකා කාලකිරියා.

සෙය්‍යථාපි ගහපති කූටාගාරෙ සුච්ඡන්නෙ කූටම්පි අව්‍යාපන්නං හොති. ගොපානසියොපි අව්‍යාපන්නා හොන්ති. භිත්තීපි අව්‍යාපන්නා හොති. එවමෙව ඛො ගහපති චිත්තෙ අව්‍යාපන්නෙ කායකම්මම්පි අව්‍යාපන්නං හොති, වචීකම්මම්පි අව්‍යාපන්නං හොති. මනොකම්මම්පි අව්‍යාපන්නං හොති. තස්ස අව්‍යාපන්නකාය කම්මන්තස්ස අව්‍යාපන්නවචීකම්මන්තස්ස අව්‍යාපන්න මනොකම්මන්තස්ස භද්දකං මරණං හොති. භද්දිකා කාලකිරියාති.

### 3. 3. 1. 9.

9. තීණිමානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය. කතමානි තීණි: ලොභො නිදානං කම්මානං සමුදයාය. දොසො නිදානං කම්මානං සමුදයාය. මොහො නිදානං කම්මානං සමුදයාය.

යං භික්ඛවෙ ලොභපකතං කම්මං ලොභජං ලොභනිදානං ලොභසමුදයං, තං කම්මං අකුසලං, තං කම්මං සාවජ්ජං, තං කම්මං දුක්ඛවිපාකං, තං කම්මං කම්මසමුදයාය සංවත්තති. න තං කම්මං කම්මනිරොධාය සංවත්තති.

ගෙහෙවිය, එපරිදි ම සිත රැකුනු කල්හි කායකර්මයත් රැකුනේ වේ. වාක්කර්මයත් රැකුනේ වේ. මනඃකර්මයත් රැකුනේ වේ. රැකුනු කායකර්මාන්ත ඇති, රැකුනු වාක්කර්මාන්ත ඇති, රැකුනුමනඃ කර්මාන්ත ඇති ඔහුගේ කායකර්මය ද කෙලෙසුන් විසින් නොතෙත් වූයේ වෙයි. වාක්කර්මය ද නොතෙත් වූයේ වෙයි. මනඃකර්මය ද නොතෙත් වූයේ වෙයි. නොතෙත් වූ කායකර්මාන්ත ඇති, නොතෙත් වූ වාක්කර්මාන්ත ඇති, නොතෙත් වූ මනඃකර්මාන්ත ඇති ඔහුගේ කායකර්මය ද පවිත්‍ර වූයේ වෙයි. වාක්කර්මය ද, පවිත්‍ර වූයේ වෙයි මනඃකර්මය ද පවිත්‍ර වූයේ වෙයි. පවිත්‍ර වූ කායකර්මාන්ත ඇති, පවිත්‍ර වූ වාක්කර්මාන්ත ඇති, පවිත්‍ර වූ මනඃකර්මාන්ත ඇති ඔහුගේ මරණය භද්‍ර වේ. කාලක්‍රියාව භද්‍රිකා වේ.

## 3. 3. 1 8.

8. එකත්පස්ව හුන් අනේපිඬු සිටුහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ හ: ගෙහෙවිය, සිත පෙරළියාව සිටි කල්හි කායකර්මය ද පෙරළියා වෙයි. වාක්කර්මය ද පෙරළියා වෙයි මනඃකර්මය ද පෙරළියා වෙයි පෙරළියා වූ කායකර්මාන්ත ඇති, පෙරළියාවූ වාක්කර්මාන්ත ඇති, පෙරළියා වූ මනඃ-කර්මාන්ත ඇති ඔහුගේ මරණය භද්‍ර නොවෙයි. කාලක්‍රියාව භද්‍රිකා නොවෙයි.

ගෙහෙවිය, යම් පරිදි කුළුගෙය තපුරු කොට සෙවෙනි කල කල කූටයත් විපත්නේ වෙයි. ගොනැස්හුත් විපත්හු වෙති. බිතත් විපත් වෙයි. ගෙහෙවිය, එපරිදි ම සිත පෙරළි කල්හි කායකර්මය ද පෙරළියා වෙයි. වාක්කර්මය ද පෙරළියා වෙයි. මනඃකර්මය ද පෙරළියා වෙයි. පෙරළියා වූ කායකර්මාන්ත ඇති, පෙරළියා වූ වාක්කර්මාන්ත ඇති, පෙරළියා වූ මනඃ-කර්මාන්ත ඇති ඔහුගේ මරණය භද්‍ර නොවේ. කාලක්‍රියාව භද්‍රිකා නොවෙයි.

ගෙහෙවිය, සිත නොපෙරළියා ව සිටි කල කායකර්මය ද නො පෙරළියා වෙයි. වාක්කර්මය ද නො පෙරළියා වෙයි. මනඃකර්මය ද නො පෙරළියා වෙයි. නො පෙරළුනු කායකර්මාන්ත ඇති, නො පෙරළුනු වාක්කර්මාන්ත ඇති නො පෙරළුනු මනඃකර්මාන්ත ඇති ඔහුගේ මරණය භද්‍ර වෙයි. කාලක්‍රියාව භද්‍රිකා වෙයි.

ගෙහෙවිය, යම් පරිදි කුළුගෙය මොනොවට සෙවෙනි කල කල කූටයත් විපත්නේ නො වෙයි. ගොනැස්හුත් විපත්නාහු නො වෙති. බිතත් විපත්නේ නො වෙයි. ගෙහෙවිය, එපරිදි ම සිත නො පෙරළි කල කායකර්මය ද නො පෙරළියා වෙයි. වාක්කර්මය ද නො පෙරළියා වෙයි. මනඃකර්මය ද නො පෙරළියා වෙයි. නො පෙරළුනු කායකර්මාන්ත ඇති, නො පෙරළුනු වාක්කර්මාන්ත ඇති, නො පෙරළුනු මනඃකර්මාන්ත ඇති ඔහුගේ මරණය භද්‍ර වේ. කාලක්‍රියාව භද්‍රිකා වේ.

## 3 3. 1. 9.

9. මහණෙනි, වට්ටගාමිකර්මයන්ගේ පිඬුකිරීම පිණිස මේ කාරණයෝ තුන් දෙනෙක් වෙති. කවර තුන් දෙනෙක යත්: කර්මයන්ගේ රැස් කිරීම පිණිස ලෝභය කාරණයෙකි. කර්මයන්ගේ රැස්කිරීම පිණිස ද්වේෂය කාරණයෙකි. කර්මයන්ගේ රැස් කිරීම පිණිස මෝහය කාරණයෙකි.

මහණෙනි, ලෝභයෙන් කළ, ලෝභයෙන් උපන්, ලෝභය නිදන් කොට ඇති, ලෝභය කරුණු කොට ඇති, යම් කර්මයෙක් ඇද් ද, ඒ කර්මය අකුශලය, ඒ කර්මය සදෝෂය, ඒ කර්මය දුඃඛවිපාකය, ඒ කර්මය අන්‍යකර්මයන් රැස්කිරීම පිණිස ද පවතී. ඒ කර්මය වට්ටගාමිකර්මයන්ගේ නිරෝධය පිණිස නො වැටෙයි.

යං භික්ඛවෙ දොසපකතං කම්මං -පෙ- යං භික්ඛවෙ මොහපකතං කම්මං මොහජං මොහනිදානං මොහසමුදයං, තං කම්මං අකුසලං, තං කම්මං සාවජ්ජං, තං කම්මං දුක්ඛවිපාකං, තං කම්මං කම්මසමුදයාය සංවත්තති. න තං කම්මං කම්මනිරොධාය සංවත්තති. ඉමානි ඛො භික්ඛවෙ තීණි නිදානානි කම්මානං සමුදයාය.

තීණිමානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය. කතමානි තීණි: අලොභො නිදානං කම්මානං සමුදයාය. අදොසො නිදානං කම්මානං සමුදයාය අමොහො නිදානං කම්මානං සමුදයාය.

යං භික්ඛවෙ අලොභපකතං කම්මං අලොභජං අලොභනිදානං අලොභ-සමුදයං, තං කම්මං කුසලං, තං කම්මං අනවජ්ජං, තං කම්මං සුඛවිපාකං, තං කම්මං කම්මනිරොධාය සංවත්තති. න තං කම්මං කම්මසමුදයාය සංවත්තති.

යං භික්ඛවෙ අදොසපකතං කම්මං -පෙ- යං භික්ඛවෙ අමොහපකතං කම්මං අමොහජං අමොහනිදානං අමොහසමුදයං, තං කම්මං කුසලං, තං කම්මං අනවජ්ජං, තං කම්මං සුඛවිපාකං, තං කම්මං කම්මනිරොධාය සංවත්තති. න තං කම්මං කම්මසමුදයාය සංවත්තති. ඉමානි ඛො භික්ඛවෙ තීණි නිදානානි කම්මානං සමුදයායාති.

## 3. 3. 1. 10

10. තීණිමානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය. කතමානි තීණි: අතීතෙ භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො ජායති. අනාගතෙ භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො ජායති. පච්චුප්පන්නෙ භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො ජායති.

කථඤ්ච භික්ඛවෙ අතීතෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො ජායති: අතීතෙ භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ චෙතසා අනු-විතක්කෙති අනුවිචාරෙති. තස්ස අතීතෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ චෙතසා අනුවිතක්කයතො අනුවිචාරයතො ඡන්දො ජායති. ඡන්දජාතො තෙහි ධම්මෙහි සඤ්ඤුත්තො හොති. එතමහං භික්ඛවෙ සඤ්ඤොජනං වදාමි යො චෙතසො සාරාගො. එවං ඛො භික්ඛවෙ අතීතෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො ජායති.

මහණෙනි, ද්වේෂයෙන් කළ ... යම් කර්මයෙක් ඇද් ද ... මහණෙනි, මෝහයෙන් කළ, මෝහයෙන් උපන්, මෝහය නිදන් කොට ඇති, මෝහය හෙතු කොට ඇති යම් කර්මයෙක් ඇද් ද ඒ කර්මය අකුශලය. ඒ කර්මය සදෝෂය. ඒ කර්මය දුඃඛවිපාක ය. ඒ කර්මය අන්‍යකර්මයන්ගේ රැස්කිරීම පිණිස ද වැටේ. ඒ කර්මය වට්ටගාමී කර්මයන්ගේ නිරෝධය පිණිස නො වැටේ. මහණෙනි, වට්ටගාමී කර්මයන්ගේ රැස්කිරීම පිණිස මොහු කාරණයෝ තුන් දෙනයහ.

මහණෙනි, කර්මයන් රැස්කිරීම පිණිස මේ කාරණයෝ තුන් දෙනෙක් වෙති. කවර තුන් දෙනෙක යත්: කර්මයන්ගේ රැස්කිරීම පිණිස අලෝභය කාරණයෙකි. කර්මයන්ගේ රැස්කිරීම පිණිස අද්වේෂය කාරණයෙකි. කර්මයන්ගේ රැස්කිරීම පිණිස අමෝහය කාරණයෙකි

මහණෙනි, අලෝභයෙන් කළ, අලෝභයෙන් උපන්, අලෝභය නිදන් කොට ඇති, අලෝභය කරුණු කොට ඇති යම් කර්මයෙක් ඇද් ද, ඒ කර්මය කුශල ය. ඒ කර්මය අදෝෂ ය. ඒ කර්මය සුඛවිපාක ය. ඒ කර්මය කර්මනිරෝධය පිණිස වැටේ. ඒ කර්මය වට්ටගාමී කර්මයන්ගේ රැස්කිරීම පිණිස නො වැටේ.

මහණෙනි, අද්වේෂයෙන් කළ යම් කර්මයෙක් ඇද් ද ... මහණෙනි, අමෝහයෙන් කළ, අමෝහයෙන් හටගත්, අමෝහය නිදන් කොට ඇති, අමෝහය හෙතු කොට ඇති යම් කර්මයෙක් ඇද් ද ඒ කර්මය කුශලය. ඒ කර්මය අදෝෂය. ඒ කර්මය සුඛවිපාක ය. ඒ කර්මය කර්මයන්ගේ නිරෝධය පිණිස වැටේ. ඒ කර්මය කර්මයන්ගේ රැස්කිරීම පිණිස නො වැටේ. මහණෙනි, වට්ටගාමී කර්මයන්ගේ රැස්කිරීම පිණිස මොහු කාරණයෝ තුන් දෙනයහ.

**3. 3. 1. 10.**

10. මහණෙනි, වට්ටගාමී කර්මයන්ගේ රැස්කිරීම පිණිස මේ නිදානයෝ තුන් දෙනෙකි: කවර තුන් දෙනෙක යත්: මහණෙනි, අතීත වූ ඡන්දරාගයට කරුණු වූ ධර්මයන් අරභයා තෘෂ්ණාච්ඡන්දය උපදී. මහණෙනි, අනාගත වූ ඡන්දරාගයට කරුණු වූ ධර්මයන් අරභයා තෘෂ්ණාච්ඡන්දය උපදී. මහණෙනි, ප්‍රත්‍යුත්පන්න වූ ඡන්දරාගයට කරුණු වූ ධර්මයන් අරභයා තෘෂ්ණාච්ඡන්දය උපදී.

මහණෙනි, කෙසේ අතීත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරභයා තෘෂ්ණාච්ඡන්දය උපදනේ ය යත්: මහණෙනි, අතීත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරභයා සිතින් නුකොට විතර්කණය කෙරෙයි, නුකොට විචාරණය කෙරෙයි. අතීත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරභයා සිතින් නුකොට විතර්කණය කරණ නුකොට විචාරණයකරණ ඔහට තෘෂ්ණාච්ඡන්දය උපදී. හටගත් තෘෂ්ණාච්ඡන්ද ඇතියේ ඒ දහමින් සංයුක්ත වෙයි. මහණෙනි, සිත පිළිබඳ යම් සංරාගයෙක් වේ ද, මම තෙල සංරාගය සංයෝජනය යි කියමි. මහණෙනි, මෙසේ අතීත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරභයා තෘෂ්ණාච්ඡන්දය උපදී.

කථඤ්ච භික්ඛවෙ අනාගතෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො ජායති: අනාගතෙ භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති. තස්ස අනාගතෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ චෙතසා අනුවිතක්කයතො අනුවිචාරයතො ඡන්දො ජායති. ඡන්දජාතො තෙහි ධම්මෙහි සඤ්ඤුත්තො හොති. එතමහං භික්ඛවෙ සඤ්ඤොජනං වදාමි යො චෙතසො සාරාගො. එවං ඛො භික්ඛවෙ අනාගතෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො ජායති.

කථඤ්ච භික්ඛවෙ පච්චුප්පන්නෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො ජායති: පච්චුප්පන්නෙ භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ චෙතසා අනුවිතක්කෙති අනුවිචාරෙති තස්ස පච්චුප්පන්නෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ චෙතසා අනුවිතක්කයතො අනුවිචාරයතො ඡන්දො ජායති. ඡන්දජාතො තෙහි ධම්මෙහි සඤ්ඤුත්තො හොති. එතමහං භික්ඛවෙ සඤ්ඤොජනං වදාමි. යො චෙතසො සාරාගො. එවං ඛො භික්ඛවෙ පච්චුප්පන්නෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො ජායති. ඉමානි ඛො භික්ඛවෙ තීණි නිදානානි කම්මානං සමුදයායාති.

තීණිමානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය. කතමානි තීණි: අතීතෙ භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො න ජායති. අනාගතෙ භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො න ජායති. පච්චුප්පන්නෙ භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො න ජායති.

කථඤ්ච භික්ඛවෙ අතීතෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො න ජායති: අතීතානං භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයානං ධම්මානං ආයතිං විපාකං පජානාති. ආයතිං විපාකං විදිත්වා තදභිනිවජ්ජෙති.[1] තදභිනිවජ්ජෙත්වා[2] චෙතසා අභිවිරාජෙත්වා[3] පඤ්ඤාය අතිවිජ්ඣ පස්සති. එවං ඛො භික්ඛවෙ අතීතෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො න ජායති.

කථඤ්ච භික්ඛවෙ අනාගතෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො න ජායති: අනාගතානං භික්ඛවෙ ඡන්දරාගට්ඨානීයානං ධම්මානං ආයතිං විපාකං පජානාති, ආයතිං විපාකං විදිත්වා තදභිනිවජ්ජෙති. තදභිනිවජ්ජෙත්වා චෙතසා අභිවිරාජෙත්වා පඤ්ඤාය අතිවිජ්ඣ පස්සති. එවං ඛො භික්ඛවෙ අනාගතෙ ඡන්දරාගට්ඨානීයෙ ධම්මෙ ආරබ්භ ඡන්දො න ජායති.

1 තදභිනිවට්ටෙති අට්ඨ - සීමු. තදභිනිවත්තති - මජසං - තදභිනිවෙඩති - PTS.
2. තදභිනිවට්ටෙත්වා. අට්ඨ - සීමු. 3. අභිනිවජ්ජිත්වා - මජසං

මහණෙනි, කෙසේ අනාගත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා තෘෂ්ණාච්ඡන්දය උපදනේය යත්: මහණෙනි, අනාගත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා සිතින් නුකොට විතර්කණය කෙරේ ද, නුකොට විචාරණ කෙරේ ද, අනාගත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා සිතින් නුකොට විතර්කණය කරණ, නුකොට විචාරණ කරණ ඔහට තෘෂ්ණාච්ඡන්දයෙක් උපදී. හටගත් ඡන්ද ඇතියේ ඒ දහම්හි සංයුතක වෙයි. මහණෙනි, සිත පිළිබඳ යම් සංරාගයෙක් වේ ද, මම තෙල සංරාගය සංයොජනය යි කියමි. මහණෙනි, මෙසේ අනාගත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා තෘෂ්ණාච්ඡන්දය උපදී.

මහණෙනි, කෙසේ ප්‍රත්‍යුත්පන්න වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා තෘෂ්ණාච්ඡන්දය උපදනේය යත්: මහණෙනි, ප්‍රත්‍යුත්පන්න වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා සිතින් නුකොට විතර්කණය කෙරෙයි. නුකොට විචාරණ කෙරෙයි. ප්‍රත්‍යුත්පන්න වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා සිතින් නැවත විතර්ක කරණ නුකොට විචාරණ කරණ ඔහට තෘෂ්ණාච්ඡන්දයෙක් උපදී. හටගත් ඡන්ද ඇතියේ ඒ දහම්හි සංයුක්ත වෙයි. මහණෙනි, සිත පිළිබඳ යම් සංරාගයෙක් ඇද් ද, මම තෙල සංරාගය සංයොජනය යි කියමි. මහණෙනි, මෙසේ ප්‍රත්‍යුත්පන්න වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා තෘෂ්ණාච්ඡන්දයෙක් උපදනේය. මහණෙනි, වට්ටගාමී කර්මයන්ගේ රැස් කිරීම් පිණිස මොහු නිදානයෝ තුන් දෙනයහ.

මහණෙනි, විවට්ටගාමී කර්මයන්ගේ රැස් කිරීම පිණිස මේ නිදානයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: මහණෙනි, අතීත වූ ඡන්දරාගයට කරුණු වූ ධර්මයන් අරහයා තෘෂ්ණාච්ඡන්දය නූපදී. මහණෙනි, අනාගත වූ ඡන්දරාගයට කරුණු වූ ධර්මයන් අරහයා තෘෂ්ණාච්ඡන්දය නූපදී. මහණෙනි, ප්‍රත්‍යුත්පන්න වූ ඡන්දරාගයට කරුණු වූ ධර්මයන් අරහයා තෘෂ්ණාච්ඡන්දය නූපදී.

මහණෙනි, කෙසේ අතීත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා තෘෂ්ණාච්ඡන්දය නූපදනේය යත්: මහණෙනි, අතීත වූ ඡන්දරාගයට කරුණු වූ දහමුන්ගේ මතුයෙහි විපාකය දනී. මතුයෙහි විපාක දැන, එය වළහයි. එය වළහා සිතින් පහ කොට නුවණින් විනිවිද දක්නේ ය. මහණෙනි, මෙසේ අතීත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා ඡන්දය නූපදනේ ය.

මහණෙනි, කෙසේ නම් අනාගත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා තෘෂ්ණාච්ඡන්දය නූපදනේය යත්: මහණෙනි, අනාගත වූ ඡන්දරාගයට කරුණු වූ ධර්මයන්ගේ විපාකය මතුයෙහි දන්නේ ය. මතුයෙහි විපාක දැන එය වළහයි. එය වළහා සිතින් පහ කරයි සිතින් පහ කොට නුවණින් විනිවිද දක්නේ ය. මහණෙනි, මෙසේ අනාගත වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරහයා තෘෂ්ණාච්ඡන්දය නූපදී.

කථඤ්ච භික්ඛවෙ පච්චුප්පන්නෙ ඡන්දරාගට්ඨානියෙ ධම්මෙ ආරබ්භ ඡන්දො න ජායති: පච්චුප්පන්නානං භික්ඛවෙ ඡන්දරාගට්ඨානියානං ධම්මානං ආයතිං විපාකං පජානාති. ආයතිං විපාකං විදිත්වා තදභිනිවජ්ජෙති. තදභිනිවජ්ජෙත්වා චෙතසා අභිවිරාජෙත්වා පඤ්ඤාය අතිවිජ්ඣ පස්සති. එවං ඛො භික්ඛවෙ පච්චුප්පන්නෙ ඡන්දරාගට්ඨානියෙ ධම්මෙ ආරබ්භ ඡන්දො න ජායති.

ඉමානි ඛො භික්ඛවෙ තීණි නිදානානි කම්මානං සමුදයායාති.

**සම්බාධවග්ගො පඨමො.***

## [ 2. ආපායික වග්ගො ]

### 3. 3. 2. 1.

**සාවත්ථි නිදානං:**

11. තයොමෙ භික්ඛවෙ ආපායිකා නෙරයිකා ඉදමප්පහාය. කතමෙ තයො:

යො ච අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරී පටිඤ්ඤො. යො ච සුද්ධං බ්‍රහ්මචරියං චරන්තං අමූලකෙන අබ්‍රහ්මචරියෙන අනුද්ධංසෙති. යො චායං එවංවාදී එවං දිට්ඨී නත්ථි කාමෙසු දොසොති, සො කාමෙසු පාතබ්‍යතං ආපජ්ජති.

ඉමෙ ඛො භික්ඛවෙ තයො ආපායිකා නෙරයිකා ඉදමප්පහායාති.

### 3. 3. 2. 2.

12. තිණ්ණං භික්ඛවෙ පාතුභාවො දුල්ලභො ලොකස්මිං. කතමෙසං තිණ්ණං:

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං. තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසෙතා පුග්ගලො දුල්ලභො ලොකස්මිං. කතඤ්ඤූ කතවෙදී පුග්ගලො දුල්ලභො ලොකස්මිං.

ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං පාතුභාවො දුල්ලභො ලොකස්මින්ති.

*තස්සුද්දානං - පුබ්බව දුවෙ අස්සාද- සමණො රාණ පතුවම්.
අභිකති ඡදම ච මුතානි - නිදානානි අපරෙ දු වෙහි

මහණෙනි, කෙසේ නම් ප්‍රත්‍යුත්පන්න වූ ඡන්දරාගයට කරුණු වූ දහම් අරභයා ඡන්දය නො උපදනේ ය යත්: මහණෙනි, ප්‍රත්‍යුත්පන්න වූ ඡන්දරාගයට කරුණු වූ දහමුන්ගේ මතුයෙහි විපාකය දනී. මතුයෙහි විපාක දැන ඒ වළහයි. ඒ වළහා සිතින් පහ කොට නුවණින් විනිවිද දක්නේ ය. මහණෙනි, මෙසේ ප්‍රත්‍යුත්පන්න වූ ඡන්දරාගයට කරුණු වූ දහම් ඇරබ තෘෂ්ණාවච්ඡන්දය නූපදනේ ය.

මහණෙනි, වට්ටගාමි කම්යන්ගේ රැස් කිරීම පිණිස මොහු නිදනයෝ තිදෙනය හ.

**පළමුවන සමොධානි වර්ගයයි.**

## [ 2. අපායික වර්ගය ]

### 3. 3. 2. 1.

**[සැවැත් නිදානයි:]**

11. මහණෙනි, (බ්‍රහ්මචාරීප්‍රතිඥනාවාදී) මේ පාපධර්ම තුණ නො හැර සිටුනා මොහු තුන් දෙන අපායගාමීහු වෙත්. නිරයගාමීහු වෙත්. කවර තුන් දෙනක යත්:

යමෙක් අබ්‍රහ්මචාරී වූයේ බ්‍රහ්මචාරීප්‍රතිඥ ඇතියේ වේ ද, යමෙක් ශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍යය පුරන්නහු අමූලක අබ්‍රහ්මචර්‍ය්‍යවාදයෙන් නිගන්නේ ද, යමෙක් කාමයෙහි දෝෂයෙක් නැතැයි හේ කාමයෙහි පරිභොග කටයුතු බවට පැමිණේ ද, මෙබඳු වාද ඇති' මෙබඳු දෘෂ්ටි ඇති, මෙ තෙමේ ය යන තුන් දෙනයහ

මහණෙනි, මේ පාපධර්ම තුණ නො හැර සිටුනා මොහු තුන් දෙන ආපායික වෙත්. නෙරයික වෙත්.

### 3. 3 2. 2.

12. මහණෙනි, තුන් දෙනකුන්ගේ ප්‍රාදුර්භාවය ලෝකයෙහි දුර්ලභය. කවර තුන් දෙනකුගේය යත්:

මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ ප්‍රාදුර්භාවය ලෝකයෙහි දුර්ලභ ය. තථාගතයන් වහන්සේ වදාළ ධර්මවිනය දෙසන පුද්ගල ලෝකයෙහි දුර්ලභය. කෘතඥ-කෘතවෙදී පුද්ගල ලෝකයෙහි දුර්ලභයි.

මහණෙනි, මේ පුද්ගලයන් තුන් දෙනාගේ ප්‍රාදුර්භාවය ලෝකයෙහි දුර්ලභ වෙයි.

3. 3. 2. 3.

13. තයොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: සුප්පමෙය්‍යො, දුප්පමෙය්‍යො, අප්පමෙය්‍යො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො සුප්පමෙය්‍යො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උද්ධතො හොති උන්නළො චපලො මුඛරො විකිණ්ණවාචො මුට්ඨස්සති අසම්පජානො අසමාහිතො විබ්භන්තචිත්තො පාකතින්ද්‍රියො. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො සුප්පමෙය්‍යො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො දුප්පමෙය්‍යො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අනුද්ධතො හොති අනුන්නළො අචපලො අමුඛරො අවිකිණ්ණවාචො උපට්ඨිතස්සති සම්පජානො සමාහිතො එකග්ගචිත්තො සංවුතින්ද්‍රියො. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො දුප්පමෙය්‍යො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො අප්පමෙය්‍යො?

ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො අප්පමෙය්‍යො.

ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

3. 3. 2. 4

14. තයොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං කතමෙ තයො:

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො තදස්සාදෙති, තන්නිකාමෙති, තෙන ච විත්තිං ආපජ්ජති. තත්‍රට්ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලං කුරුමානො ආකාසානඤ්චායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජති.

3. 3. 2. 3.

13. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් ලෝකයෙහි විද්‍යමානය හ. කවර තුන් දෙනෙක යත්: සුවසේ මිනිය හැකි පුද්ගලය, දුකසේ මිනිය හැකි පුද්ගලය, නොමිනිය හැකි පුද්ගලයි.

මහණෙනි, සුවසේ මිනිය හැකි පුද්ගල කවරේ ය?

මහණෙනි, මෙලෙව ඇතැම් පුද්ගලයෙක් උද්ධත වේ. ඔසොවා ලූ මානනල ඇතියේ වේ. පාත්‍රමණ්ඩනාදි චාපල්‍යය ඇතියේ වෙයි. දෙඩමලු වෙයි. අසංයත වචන ඇතියේ වෙයි. මුළා සිහි ඇතියේ වෙයි. සම්ප්‍රඥත නැත්තේ වෙයි. විපෙතකාග්‍රතා නැතියේ වෙයි. භ්‍රාන්ත සිත් ඇතියේ වෙයි විවෘත ඉඳුරන් ඇතියේ වෙයි. මහණෙනි, මේ පුද්ගල සුප්‍රමෙය (=සුවසේ මිනිය හැකි) ය යි කියනු ලැබේ.

මහණෙනි, දුක සේ මිනිය හැකි පුද්ගල කවරේ ය?

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් අනුද්ධත වෙයි. ඔසොවා ලූ මානනල නැතියේ වෙයි. පාත්‍රමණ්ඩනාදි චාපල්‍යය නැතියේ වෙයි. දෙඩමලු නො වූයේ වෙයි. අසංයත වචන නැතියේ වෙයි. එළඹ සිටි සිහි ඇතියේ වෙයි. සම්ප්‍රඥත ඇතියේ වෙයි සමාධිගත වූයේ වෙයි. එකාග්‍ර සිත් ඇතියේ වෙයි. සංවෘත ඉඳුරන් ඇතියේ වෙයි. මහණෙනි, මේ පුද්ගල දුෂ්ප්‍රමෙය (දුකසේ මිනිය හැකි) ය යි කියනු ලැබේ.

මහණෙනි, අප්‍රමෙය පුද්ගල කවරේ ය?

මහණෙනි, මෙසස්නෙහි අර්හත්ක්ෂීණාස්‍රව මහණෙක් වේ. මහණෙනි, මේ පුද්ගල අප්‍රමෙය (නොමිනිය හැකි)පුද්ගලය යි කියනු ලැබේ.

මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙන ලෝකයෙහි විද්‍යමානය හ.

3. 3. 2. 4.

14. මහණෙනි, මේ පුද්ගලයෝ තුන්දෙනෙක් ලෝකයෙහි විද්‍යමානය හ. කවර තුන්දෙනෙක යත්:

මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් සමතික්‍රමණය කිරීමෙන් ප්‍රතිඝසංඥාවන් අස්තඞ්ගම කිරීමෙන් නානාත්වසංඥාවන් මෙනෙහි නො කිරීමෙන් "ආකාශය අනන්තය" යි ගෙණ ආකාශානන්ත්‍යායතනයට එළඹ වෙසෙයි. හේ ඒ ධ්‍යානය ආස්වාද කෙරෙයි. ඒ ධ්‍යානය පතයි. ඒ ධ්‍යානයෙන් තුෂ්ටියට පැමිණෙයි. ඒ ධ්‍යානයෙහි සිටියේ ඒ ධ්‍යානයෙහි අධිමුක්ත වූයේ ඒ ධ්‍යානයෙන් බහුල විහරණ ඇතියේ ඒ ධ්‍යානයෙන් නො පිරිහුනේ කලුරිය කරමින් ආකාශානන්ත්‍යායතනොපග දෙවියන්ගේ සහභාවයට එළඹෙයි.

ආකාසානඤ්චායතනූපගානං භික්ඛවෙ දෙවානං වීසතිකප්පසහස්සානි ආයුප්පමාණං. තත්‍ර පුථුජ්ජනො යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං, තං සබ්බං ඛෙපෙත්වා නිරයම්පි ගච්ඡති. තිරච්ඡානයොනිම්පි ගච්ඡති, පෙත්තිවිසයම්පි ගච්ඡති.

භගවතො පන සාවකො තත්‍ථ යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං, තං සබ්බං ඛෙපෙත්වා තස්මිංයෙව භවෙ පරිනිබ්බායති.

අයං ඛො භික්ඛවෙ විසෙසො, අයං අධිප්පායො, ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙන යදිදං ගතියා උපපත්තියා සති.

පුනචපරං භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො තදස්සාදෙති, තන්නිකාමෙති, තෙන ච විත්තිං ආපජ්ජති. තත්‍රට්ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලං කුරුමානො විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජති.

විඤ්ඤාණඤ්චායතනූපගානං භික්ඛවෙ දෙවානං චත්තාරීසං කප්පසහස්සානි ආයුප්පමාණං. තත්‍ථ පුථුජ්ජනො යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං, තං සබ්බං ඛෙපෙත්වා නිරයම්පි ගච්ඡති, තිරච්ඡානයොනිම්පි ගච්ඡති, පෙත්තිවිසයම්පි ගච්ඡති.

භගවතො පන සාවකො තත්‍ථ යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං, තං සබ්බං ඛෙපෙත්වා තස්මිඤ්ඤෙව භවෙ පරිනිබ්බායති.

අයං ඛො භික්ඛවෙ විසෙසො, අයං අධිප්පායො, ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙන යදිදං ගතියා උපපත්තියා සති.

පුනචපරං භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්‍ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො තදස්සාදෙති, තන්නිකාමෙති, තෙන ච විත්තිං ආපජ්ජති. තත්‍රට්ඨිතො තදධිමුත්තො තබ්බහුලවිහාරී අපරිහීනො කාලං කුරුමානො ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං සහව්‍යතං උපපජ්ජති.

ආකිඤ්චඤ්ඤායතනූපගානං භික්ඛවෙ දෙවානං සට්ඨිං කප්පසහස්සානි ආයුප්පමාණං. තත්‍ථ පුථුජ්ජනො යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං, තං සබ්බං ඛෙපෙත්වා නිරයම්පි ගච්ඡති, තිරච්ඡානයොනිම්පි ගච්ඡති, පෙත්තිවිසයම්පි ගච්ඡති.

භගවතො පන සාවකො තත්‍ථ යාවතායුකං ඨත්වා යාවතකං තෙසං දෙවානං ආයුප්පමාණං තං සබ්බං ඛෙපෙත්වා තස්මිඤ්ඤෙව භවෙ පරිනිබ්බායති.

මහණෙනි, ආකාශානඤ්චායතනොපග දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කප් විසිදහසෙකි. එහි පෘථග්ජන තෙමේ ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් තාක් වේ ද, ඒ හැම ගෙවා නිරයට ද යෙයි. තිරිසන් යෝනියට ද යෙයි. ප්‍රේතවිෂයට ද යෙයි.

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක එහි ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් තාක් වේ ද, ඒ හැම ගෙවා ඒ භවයෙහි ම පිරිනිවන් පානේ ය.

මහණෙනි, යම් මේ ගතිය හෝ උපපත්තිය හෝ ඇතිවත් ම ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාගේ අශ්‍රුතවත් පෘථග්ජනයා හා සමග මේ විශෙෂ යි. මේ අධිකප්‍රයොග යි. මේ නානාකරණ යි.

තවද මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ආකාශානඤ්චායතනය ඉක්ම ගෙණ "විඥානය අනන්තය" යි කොට විඥානඤ්චායතනයට එළඹ වෙසේ. හේ ඒ ධ්‍යානය ආස්වාද කෙරේ. ඒ ධ්‍යානය පතයි. ඒ ධ්‍යානයෙන් තුෂ්ටියට පැමිණේ. ඒ ධ්‍යානයෙහි සිටියේ ඒ ධ්‍යානයෙහි අධිමුක්ත වූයේ ඒ ධ්‍යානයෙන් බහුල විහරණ ඇතියේ, ඒ ධ්‍යානයෙන් නොපිරිහුනේ කළුරිය කරමින් විඥානඤ්චායතනොපග දෙවියන්ගේ සහභාවයට එළඹෙයි.

මහණෙනි, විඥානඤ්චායතනොපග දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කප් සතළිස්දහසෙකි. පෘථග්ජන එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් තාක් වේ ද, ඒ හැම ගෙවා නිරයට ද යෙයි. තිරිසන් යොනියට ද යෙයි. ප්‍රෙතවිෂයට ද යෙයි.

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වනාහි එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම්තාක් වේ ද, ඒ හැම ගෙවා ඒ භවයෙහි ම පිරිනිවන් පානේය.

මහණෙනි, යම් මේ ගතිය හෝ උපපත්තිය හෝ ඇතිවත් ම ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාගේ මේ විශෙෂ යි. මේ අධිකප්‍රයොග යි. මේ නානාකාරණය යි.

තවද මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් සර්‍වප්‍රකාරයෙන් විඥානඤ්චායතනය ඉක්ම "කිසිත් නැත" යි ගෙණ ආකිඤ්චඤ්ඤායතනයට එළඹ වෙසෙයි. හේ ඒ ධ්‍යානය ආස්වාද කෙරෙයි. ඒ ධ්‍යානය පතයි. ඒ ධ්‍යානයෙන් ම තුෂ්ටියට පැමිණේ. ඒ ධ්‍යානයෙහි සිටියේ ඒ ධ්‍යානයෙහි අධිමුක්ත වූයේ ඒ ධ්‍යානයෙන් බහුල විහරණ ඇතියේ ඒ ධ්‍යානයෙන් නො පිරිහුනේ කළුරිය කරමින් ආකිඤ්චඤ්ඤායතනොපග දෙවියන්ගේ සහභාවයට යෙයි.

මහණෙනි, ආකිඤ්චඤ්ඤායතනොපග දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කප් සැටදහසෙකි. පෘථග්ජන එහි ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃ-ප්‍රමාණය යම් තාක් වේ ද, එ හැම ගෙවා නිරයට ද යෙයි. තිරිසන්යොනට ද යෙයි: ප්‍රෙතවිෂයට ද යෙයි.

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වනාහි එහි ආයු ඇති තාක් සිට ඒ දෙවියන්ගේ ආයුඃප්‍රමාණය යම් තාක් වේ ද, ඒ හැම ගෙවා ඒ භවයෙහි ම පිරිනිවන් පානේ ය.

අයං ඛො භික්ඛවෙ විසෙසො, අයං අධිප්පායො, ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙන යදිදං ගතියා උපපත්තියා සති. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

3. 3. 2. 5.

15. තිස්සො ඉමා භික්ඛවෙ විපත්තියො. කතමා තිස්සො: සීලවිපත්ති, චිත්තවිපත්ති, දිට්ඨිවිපත්ති.

කතමා ච භික්ඛවෙ සීලවිපත්ති?

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුණාවාචො හොති, ඵරුසාවාචො හොති, සම්ඵප්පලාපී හොති. අයං වුච්චති භික්ඛවෙ සීලවිපත්ති.

කතමා ච භික්ඛවෙ චිත්තවිපත්ති?

ඉධ භික්ඛවෙ එකච්චො අභිජ්ඣාලු හොති: ව්‍යාපන්නචිත්තො හොති, අයං වුච්චති භික්ඛවෙ චිත්තවිපත්ති.

කතමා ච භික්ඛවෙ දිට්ඨිවිපත්ති?

ඉධ භික්ඛවෙ එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති. විපරීතදස්සනො නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරොලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. අයං වුච්චති භික්ඛවෙ දිට්ඨිවිපත්ති.

සීලවිපත්තිහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. චිත්තවිපත්තිහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. දිට්ඨිවිපත්තිහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො විපත්තියොති.

තිස්සො ඉමා භික්ඛවෙ සම්පදා. කතමා තිස්සො: සීලසම්පදා චිත්තසම්පදා දිට්ඨිසම්පදා.

1. උපපත්තිස්සාති - P.T.S. සීමු

මහණෙනි, යම් මේ ගතිය හෝ උපපත්තිය ඇතිවත් ම ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාගේ අශ්‍රුතවත් පෘථග්ජනයා හා මේ විශේෂ යි මේ අධිකප්‍රයොග යි. මේ කරණ නානාත්ව යි.

මහණෙනි, මේ පුද්ගලයෝ තුන්දෙනා ලොකයෙහි විද්‍යමානය හ.

## 3. 3. 2. 5.

15. මහණෙනි, මේ විපත්තීහු තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: ශීලවිපත්තිය, චිත්තවිපත්තිය, දෘෂ්ටිවිපත්ති යි.

මහණෙනි, ශීලවිපත්ති කවර?

මහණෙනි, මෙලොව ඇතැමෙක් පණිවා කරන්නේ වෙයි. අසිනාදන් ගන්නේ වෙයි. කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මුසවා බණන්නේ වෙයි. පිසුණුබස් ඇතියේ වෙයි. පරුස්බස් ඇතියේ වෙයි. සම්ඵප්පලප ඇතියේ වෙයි. මහණෙනි, මේ ශීලවිපත්ති යි කියනු ලැබේ.

මහණෙනි, චිත්තවිපත්ති කවර?

මහණෙනි, මේ ලොව ඇතැමෙක් අභිධ්‍යා බහුල වෙයි ව්‍යාපාදයට පත් සිතැත්තේ වෙයි. මහණෙනි, මේ චිත්තවිපත්ති යි කියනු ලැබේ.

මහණෙනි, දෘෂ්ටිවිපත්ති කවර?

මහණෙනි, මේ ලොව ඇතැමෙක් මිථ්‍යාදෘෂ්ටික වෙයි. විපරීතදර්‍ශන ඇතියේ වෙයි. "දානවිපාක නැත, යාගවිපාක නැත, ප්‍රාෂූණසත්කාරවිපාක නැත, සුකෘතදුෂ්කෘතකර්‍මයන්ගේ ඵලවිපාක නැත, මෙලෝ නැත,පරලෝ නැත, මාතෘඋපස්ථාන විපාක නැත, පිතෘඋපස්ථාන විපාක නැත, ඕපපාතික සත්ත්වයෝ නැත. මෙලෝ පරලෝ තමන් දැන ප්‍රත්‍යක්ෂ කොට පවසත් ද එබඳු සම්‍යග්ගත සම්‍යක් ප්‍රතිපන්න ශ්‍රමණබ්‍රාහමණයෝ ලොව නැතැ" යි මිථ්‍යාදෘෂ්ටික වෙයි. මහණෙනි, මේ දෘෂ්ටිවිපත්ති යි කියනු ලැබේ.

මහණෙනි, ශීලවිපත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙත්. මහණෙනි, චිත්තවිපත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙත්. මහණෙනි, දෘෂ්ටිවිපත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙත්.

මහණෙනි, මේ විපත්තීහු තුන් දෙනය හ.

මහණෙනි, මේ සම්පත්තීහු තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: ශීලසම්පත්තිය, චිත්තසම්පත්තිය, දෘෂ්ටිසම්පත්ති යි.

කතමා ච භික්ඛවෙ සීලසම්පදා?

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමේසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, පිසුණාවාචා පටිවිරතො හොති, ඵරුසාවාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති. අයං වුච්චති භික්ඛවෙ සීලසම්පදා.

කතමා ච භික්ඛවෙ චිත්තසම්පදා?

ඉධ භික්ඛවෙ එකච්චො අනභිජ්ඣාලු හොති, අව්‍යාපන්නචිත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ චිත්තසම්පදා.

කතමා ච භික්ඛවෙ දිට්ඨිසම්පදා?

ඉධ භික්ඛවෙ එකච්චො සම්මාදිට්ඨිකො හොති අවිපරීතදස්සනො: අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. අයං වුච්චති භික්ඛවෙ දිට්ඨිසම්පදා.

සීලසම්පදාහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. චිත්තසම්පදාහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. දිට්ඨිසම්පදාහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො සම්පදාති.

## 3. 3. 2. 6.

16. තිස්සො ඉමා භික්ඛවෙ විපත්තියො. කතමා තිස්සො: සීලවිපත්ති, චිත්තවිපත්ති, දිට්ඨිවිපත්ති.

කතමා ච භික්ඛවෙ සීලවිපත්ති?

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති -පෙ- සම්ඵප්පලාපී හොති. අයං වුච්චති භික්ඛවෙ සීලවිපත්ති.

කතමා ච භික්ඛවෙ චිත්තවිපත්ති?

ඉධ භික්ඛවෙ එකච්චො අභිජ්ඣාලු හොති, ව්‍යාපන්නචිත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ චිත්තවිපත්ති.

මහණෙනි, ශීලසම්පත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් ප්‍රාණිවධයෙන් දුරුවූයේ වෙයි. අයිනාදනින් දුරුවූයේ වෙයි. කාමයෙහි මිසහසරින් දුරුවූයේ වෙයි. මුසාවාදයෙන් දුරුවූයේ වෙයි. පිසුණුබසින් දුරුවූයේ වෙයි. පරුස්බසින් දුරුවූයේ වෙයි. සම්ඵප්පලපින් දුරුවූයේ වෙයි. මහණෙනි, මේ ශීලසම්පත්තියි කියනු ලැබේ.

මහණෙනි, චිත්තසම්පත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් අභිධ්‍යාබහුල වූයේ නො වෙයි. ව්‍යාපාදයට පැමිණි සිතැතියේ නො වෙයි. මහණෙනි, මේ චිත්තසම්පත්ති යි කියනු ලැබේ.

මහණෙනි, දෘෂ්ටිසම්පත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් සම්‍යග්දෘෂ්ටික වේ. විපරීතදර්‍ශන නැත්තේ වේ. "දානවිපාක ඇත, යාගවිපාක ඇත, ප්‍රාහුණ සත්කාරවිපාක ඇත, සුකෘතදුෂ්කෘතකර්‍මයන්ගේ ඵලවිපාක ඇත, මෙ ලොව ඇත, පරලොව ඇත, මවුවටතෙහි විපාක ඇත, පියවටතෙහි විපාක ඇත, ච්‍යුත වැ පහළවන සත්ත්වයෝ ඇත, මෙලෝ පරලෝ තමන් දැන පසක් කොට දෙසන සම්‍යග්ගත වූ (මනාගති ඇති) මොනොවට පිළිපන් මහණබමුණෝ ලොව ඇතැ" යි අවිපරීතදර්‍ශන ඇතියේ වෙයි. මහණෙනි, මේ දෘෂ්ටිසම්පත්ති යි කියනු ලැබේ.

මහණෙනි, ශීලසම්පත් හේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි මනා ගති ඇති ස්වර්‍ගලෝකයට එළඹෙත්. මහණෙනි, චිත්තසම්පත්ති හේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි ශොභනගති ඇති ස්වර්‍ගලෝකයට එළඹෙත්. මහණෙනි, දෘෂ්ටිසම්පත්ති හේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි ශෝභනගති ඇති ස්වර්‍ගලෝකයට එළඹෙත්.

මහණෙනි, මොහු සම්පත්හු තුන් දෙනයහ.

### 3. 3. 2. 6.

16. මහණෙනි, මේ විපත්තීහු තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: ශීලවිපත්තිය, චිත්තවිපත්තිය, දෘෂ්ටිවිපත්ති යි.

මහණෙනි, ශීලවිපත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් ප්‍රාණිවධ කරන්නේ වෙයි. ... සම්ඵප්පලාප ඇතියේ වෙයි. මහණෙනි, මේ ශීලවිපත්ති යි කියනු ලැබේ.

මහණෙනි, චිත්තවිපත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් අභිජ්ඣාබහුල වෙයි. ව්‍යාපාදයට පැමිණි සිතැතියේ වෙයි. මහණෙනි, මේ චිත්තවිපත්ති යි කියනු ලැබේ.

කතමා ච භික්ඛවෙ දිට්ඨිවිපත්ති?

ඉධ භික්ඛවෙ එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති විපරීතදස්සනො: නත්ථි දින්නං නත්ථි යිට්ඨං -පෙ- නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති. අයං වුච්චති භික්ඛවෙ දිට්ඨිවිපත්ති.

සීලවිපත්තිහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. චිත්තවිපත්තිහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. දිට්ඨිවිපත්තිහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ අපණ්ණකො මණි උද්ධං ඛිත්තො යෙන යෙනෙව පතිට්ඨාති, සුප්පතිට්ඨිතඤ්ඤෙව පතිට්ඨාති. එවමෙව ඛො භික්ඛවෙ සීලවිපත්තිහෙතු වා සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. චිත්තවිපත්තිහෙතු වා සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. දිට්ඨිවිපත්තිහෙතු වා සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො විපත්තියොති.

තිස්සො ඉමා භික්ඛවෙ සම්පදා. කතමා තිස්සො: සීලසම්පදා, චිත්තසම්පදා, දිට්ඨිසම්පදා.

කතමා ච භික්ඛවෙ සීලසම්පදා?

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සම්ඵප්පලාපා පටිවිරතො හොති. අයං වුච්චති භික්ඛවෙ සීලසම්පදා.

කතමා ච භික්ඛවෙ චිත්තසම්පදා?

ඉධ භික්ඛවෙ එකච්චො අනභිජ්ඣාලු හොති, අව්‍යාපන්නචිත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ චිත්තසම්පදා.

කතමා ච භික්ඛවෙ දිට්ඨිසම්පදා?

ඉධ භික්ඛවෙ එකච්චො සම්මාදිට්ඨිකො හොති අවිපරීතදස්සනො: අත්ථි දින්නං, අත්ථි යිට්ඨං -පෙ- අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති. අයං වුච්චති භික්ඛවෙ දිට්ඨිසම්පදා

මහණෙනි, දෘෂ්ටිවිපත්ති කවරී?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් මිථ්‍යාදෘෂ්ටික වෙයි. විපරීතදර්ශන ඇතියේ වෙයි. "දුන විපාක නැත, යාගවිපාක නැත, .... මෙ ලොවත් පරලොවත් තමත් විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට දෙසන මනාගති ඇති මොනොවට පිළිපන් මහණබමුණෝ ලොව නැත," යන විපරීතදර්ශන ඇතියේ වෙයි. මහණෙනි, මේ දෘෂ්ටිවිපත්තිය යි කියනු ලැබේ.

මහණෙනි, ශීලවිපත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි සැපයෙන් පහව සිටුනා නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙත්. මහණෙනි, චිත්තවිපත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි සැපයෙන් පහව සිටි නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙත්. මහණෙනි, දෘෂ්ටිවිපත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි සැපයෙන් පහව සිටුනා නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙත්.

මහණෙනි, යම් පරිදි ෂඩංශ ඇති පසැට උඩ දූයේ යම් යම් ලෙසෙකින් සිටුනේ ද, මොනොවට සිටුනේ ම සිටී. මහණෙනි, එපරිදි ම ශීලවිපත්ති-හේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මත්තෙහි සැපයෙන් පහව සිටුනා නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙත්. චිත්තවිපත්ති-හේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි සැපයෙන් පහව සිටුනා නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙත්. දෘෂ්ටිවිපත්ති-හේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි සැපයෙන් පහව සිටුනා නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙත්.

මහණෙනි, මේ තුන් විපත්තීහු යි.

මහණෙනි, මේ සම්පත්තීහු තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: ශීලසම්පත්තිය, චිත්තසම්පත්තිය, දෘෂ්ටිසම්පත්ති යි.

මහණෙනි, ශීලසම්පත්ති කවරී?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් පණිවායෙන් දුරුවූයේ වෙයි සම්ඵප්පලපිත් දුරුවූයේ වෙයි. මහණෙනි, මේ ශීලසම්පත්ති යි කියනු ලැබේ.

මහණෙනි, චිත්තසම්පත්ති කවරී?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් අභිධ්‍යාබහුල වූයේ නො වෙයි. ව්‍යාපාදයට පැමිණි සිතැතියේ නො වෙයි. මහණෙනි, මේ චිත්තසම්පත්ති යි කියනු ලැබේ.

මහණෙනි, දෘෂ්ටිසම්පත්ති කවරී?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් සම්‍යග්දෘෂ්ටික වෙයි. විපරීතදර්ශන නැතියේ වෙයි. "දුනවිපාක ඇත, යාගවිපාක ඇත මෙලෝ පරලෝ තමන් විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට ප්‍රකාශ කරණ මනාගති ඇති මොනොවට පිළිපන් මහණබමුණෝ ලොව ඇත" යන අවිපරීතදර්ශන ඇතියේ වෙයි. මහණෙනි, මේ දෘෂ්ටිසම්පත්ති යි කියනු ලැබේ.

සීලසම්පදාහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. චිත්තසම්පදාහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. දිට්ඨිසම්පදාහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ අපණ්ණකො මණි උද්ධං ඛිත්තො යෙන යෙනෙව පතිට්ඨාති, සුප්පතිට්ඨිතඤ්ඤෙව පතිට්ඨාති. එවමෙව ඛො භික්ඛවෙ සීලසම්පදාහෙතු වා සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. චිත්තසම්පදාහෙතු වා -පෙ- දිට්ඨිසම්පදාහෙතු වා සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො සම්පදාති.

### 3. 3. 2. 7.

17. තිස්සො ඉමා භික්ඛවෙ විපත්තියො. කතමා තිස්සො: කම්මන්තවිපත්ති, ආජීවවිපත්ති, දිට්ඨිවිපත්ති.

කතමා ච භික්ඛවෙ කම්මන්තවිපත්ති?

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති -පෙ- සම්ඵප්පලාපී හොති. අයං වුච්චති භික්ඛවෙ කම්මන්තවිපත්ති.

කතමා ච භික්ඛවෙ ආජීවවිපත්ති?

ඉධ භික්ඛවෙ එකච්චො මිච්ඡාආජීවො හොති. මිච්ඡාආජීවෙන ජීවිකං කප්පෙති. අයං වුච්චති භික්ඛවෙ ආජීවවිපත්ති.

කතමා ච භික්ඛවෙ දිට්ඨිවිපත්ති?

ඉධ භික්ඛවෙ එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති විපරීතදස්සනො: නත්ථි දින්නං, නත්ථි යිට්ඨං -පෙ- නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති. අයං වුච්චති භික්ඛවෙ දිට්ඨිවිපත්ති.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො විපත්තියොති.

මහණෙනි, ශීලසම්පත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි ශෝභනගති ඇති ස්වර්ගලොකයට එළඹෙත්. මහණෙනි, චිත්තසම්පත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි ශෝභනගති ඇති ස්වර්ගලෝකයට එළඹෙත්. මහණෙනි, දෘෂ්ටිසම්පත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි ශෝභනගති ඇති ස්වර්ගලෝකයට එළඹෙත්.

මහණෙනි, යම් පරිදි ෂඩංශ ඇති පසැට උඩ දුයේ යම් යම් තෙලෙකින් පිහිටා සිටුනේ ද, සුප්‍රතිෂ්ඨිත කොටම සිටුනේය. මහණෙනි, එපරිදි ම ශීලසම්පත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි ශෝභනගති ඇති ස්වර්ගලෝකයට එළඹෙත්. චිත්තසම්පත්තිහේතුයෙන් හෝ... දෘෂ්ටිසම්පත්තිහේතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතුයෙහි ශෝභනගති ඇති ස්වර්ගලෝකයට එළඹෙත්.

මහණෙනි, මොහු තුන් සම්පත්තීහු යි.

## 3. 3. 2. 7.

17. මහණෙනි, මේ විපත්තීහු තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: කර්මාන්තවිපත්තිය, ආජීවවිපත්තිය, දෘෂ්ටිවිපත්ති යි.

මහණෙනි, කර්මාන්තවිපත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් පණිවා කරන්නේ වෙයි සමඵලාපප- ඇතියේ වෙයි. මහණෙනි, මේ කර්මාන්තවිපත්ති යි කියනු ලැබේ.

මහණෙනි, ආජීවවිපත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් මිථ්‍යාආජීව ඇතියේ වෙයි. මිථ්‍යාආජීවයෙන් ජීවිකා කෙරෙයි. මහණෙනි, මේ ආජීවවිපත්ති යි කියනු ලැබේ.

මහණෙනි, දෘෂ්ටිවිපත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් මිථ්‍යාදෘෂ්ටික වෙයි. විපරීතදර්ශන ඇතියේ වෙයි. "දානවිපාක නැත, (මඞ්ගල විසින් යුතුකළ) ඉෂ්ටදානයෙහි විපාක නැත, ... මෙලොවත් පරලොවත් තමන් විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට දෙසන මනාගති ඇති මොනොවට පිළිපන් මහණබමුණෝ ලොව නැත" යන විපරීතදර්ශන ඇතියේ වෙයි. මහණෙනි, මේ දෘෂ්ටිවිපත්ති යි කියනු ලැබේ.

මහණෙනි, මොහු තුන් විපත්තීහු යි.

තිස්සො ඉමා භික්ඛවෙ සම්පදා. කතමා තිස්සො: කම්මන්තසම්පදා, ආජීවසම්පදා, දිට්ඨිසම්පදා.

කතමා ච භික්ඛවෙ කම්මන්තසම්පදා?

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සම්ඵප්පලාපා පටිවිරතො හොති. අයං වුච්චති භික්ඛවෙ කම්මන්තසම්පදා.

කතමා ච භික්ඛවෙ ආජීවසම්පදා?

ඉධ භික්ඛවෙ එකච්චො සම්මාආජීවො හොති. සම්මාආජීවෙන ජීවිකං කප්පෙති. අයං වුච්චති භික්ඛවෙ ආජීවසම්පදා:

කතමා ච භික්ඛවෙ දිට්ඨිසම්පදා?

ඉධ භික්ඛවෙ එකච්චො සම්මාදිට්ඨිකො හොති අවිපරීතදස්සනො: අත්ථි දින්නං, අත්ථි යිට්ඨං -පෙ- අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති. අයං වුච්චති භික්ඛවෙ දිට්ඨිසම්පදා.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො සම්පදාති.

### 3. 3. 2. 8.

18. තීණිමානි භික්ඛවෙ සොචෙය්‍යානි. කතමානි තීණි: කායසොචෙය්‍යං, වචීසොචෙය්‍යං, මනොසොචෙය්‍යං.

කතමඤ්ච භික්ඛවෙ කායසොචෙය්‍යං?

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ කායසොචෙය්‍යං:

කතමඤ්ච භික්ඛවෙ වචීසොචෙය්‍යං?

ඉධ භික්ඛවෙ එකච්චො මුසාවාදා පටිවිරතො හොති, පිසුණාවාචා පටිවිරතො හොති, ඵරුසාවාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ වචීසොචෙය්‍යං.

කතමඤ්ච භික්ඛවෙ මනොසොචෙය්‍යං?

ඉධ භික්ඛවෙ එකච්චො අනභිජ්ඣාලු හොති, අබ්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨිකො හොති. ඉදං වුච්චති භික්ඛවෙ මනොසොචෙය්‍යං.

ඉමානි ඛො භික්ඛවෙ තීණි සොචෙය්‍යානීති.

මහණෙනි, මේ සම්පත්තිහු තුන් දෙනෙකි කවර තුන් දෙනෙක යත්: කර්මාන්තසම්පත්තිය, ආජීවසම්පත්තිය, දෘෂ්ටිසම්පත්ති යි

මහණෙනි, කර්මාන්තසම්පත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් පණිවායෙන් දුරු වූයේ වෙයි ... සම්ඵප්පලපින් දුරු වූයේ වෙයි. මහණෙනි, මේ කර්මාන්තසම්පත්ති යි කියනු ලැබේ.

මහණෙනි, ආජීවසම්පත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් සම්‍යග් ආජීව ඇතියේ වෙයි. සම්‍යග් ආජීවයෙන් ජීවිකා කෙරෙයි මහණෙනි, මේ ආජීවසම්පත්ති යි කියනු ලැබේ.

මහණෙනි, දෘෂ්ටිසම්පත්ති කවර?

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් සම්‍යග් දෘෂ්ටික වෙයි. විපරීතදර්‍ශන නැතියේ වෙයි "දුනවිපාක ඇත, ඉෂ්ටවිපාක ඇත ... මෙ ලොවත් පර-ලොවත් තමන් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ප්‍රකාශ කරණ මනාගති ඇති මොනොවට පිළිපන් මහණබමුණෝ ලොව ඇත" යන අවිපරීතදර්‍ශන ඇතියේ වෙයි.

මහණෙනි, මේ දෘෂ්ටිසම්පත්ති යි කියනු ලැබේ. මහණෙනි, මේ ත්‍රිවිධ සම්පත්තිහු යි.

### 3. 3. 2 8.

18. මහණෙනි. මේ ශුචිභාවයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: කායද්වාරයෙහි ශුචිභාවය, වාග්ද්වාරයෙහි ශුචිභාවය, මනොද්වාරයෙහි ශුචිභාව යි.

මහණෙනි, කායද්වාරයෙහි ශුචිභාවය කවරේය යත්:

මහණෙනි, මෙ ලොව ඇතැමෙක් පණිවායෙන් දුරුවූයේ වෙයි. අයිනාදනින් දුරුවූයේ වෙයි. කාමයෙහි මිසහසරින් දුරුවූයේ වෙයි. මහණෙනි, මේ කායද්වාරයෙහි ශෞචය යි කියනු ලැබේ.

මහණෙනි, වාග්ද්වාරයෙහි ශුචිභාවය කවරේය යත්:

මහණෙනි, මෙලොව ඇතැමෙක් මුසවායෙන් දුරු වූයේ වෙයි. පිසුණු බසින් දුරුවූයේ වෙයි පරුස්බසින් දුරුවූයේ වෙයි, සම්ඵප්පලපයෙන් දුරු වූයේ වෙයි, මහණෙනි, මේ වාග්ද්වාරයෙහි ශෞචය යි කියනු ලැබේ.

මහණෙනි, මනෝද්වාරයෙහි ශුචිභාවය කවරේ ය යත්:

මහණෙනි, මෙලොව ඇතැමෙක් අභිධ්‍යාබහුල නො වෙයි. ව්‍යාපාදයට පැමිණි සිතැතියේ නොවෙයි. සම්‍යග්දෘෂ්ටික වෙයි. මහණෙනි, මේ මනොද්වාර-යෙහි ශෞචය යි කියනු ලැබේ.

මහණෙනි, මොහු තුන් වැදෑරුම් ශුචිභාවයෝ යි.

3. 3. 2. 9.

19. තීණිමානි භික්ඛවෙ සොචෙය්‍යානි. කතමානි තීණි: කායසොචෙය්‍යං, වචීසොචෙය්‍යං, මනොසොචෙය්‍යං.

කතමඤ්ච භික්ඛවෙ කායසොචෙය්‍යං?

ඉධ භික්ඛවෙ භික්ඛු පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, අබ්‍රහ්මචරියා පටිවිරතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ කායසොචෙය්‍යං.

කතමඤ්ච භික්ඛවෙ වචීසොචෙය්‍යං?

ඉධ භික්ඛවෙ භික්ඛු මුසාවාදා පටිවිරතො හොති, පිසුණාවාචා පටිවිරතො හොති, ඵරුසාවාචා පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ වචීසොචෙය්‍යං.

කතමඤ්ච භික්ඛවෙ මනොසොචෙය්‍යං?

ඉධ භික්ඛවෙ භික්ඛු සන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං අත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති. අසන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං නත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති. යථා ච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහාණං හොති. තඤ්ච පජානාති. යථා ච පහීණස්ස කාම-ච්ඡන්දස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති.

සන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං අත්ථි මෙ අජ්ඣත්තං ව්‍යාපාදොති පජානාති. අසන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං නත්ථි මෙ අජ්ඣත්තං ව්‍යාපා-දොති පජානාති. යථා ච අනුප්පන්නස්ස ව්‍යාපාදස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස ව්‍යාපාදස්ස පහාණං හොති, තඤ්ච පජානාති. යථා ච පහීණස්ස ව්‍යාපාදස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති.

සන්තං වා අජ්ඣත්තං ථිනමිද්ධං අත්ථි මෙ අජ්ඣත්තං ථිනමිද්ධන්ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං ථිනමිද්ධං නත්ථි මෙ අජ්ඣත්තං ථිනමිද්ධන්ති පජානාති. යථා ච අනුප්පන්නස්ස ථිනමිද්ධස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස ථිනමිද්ධස්ස පහාණං හොති, තඤ්ච පජානාති. යථා ච පහීණස්ස ථිනමිද්ධස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති.

සන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චං අත්ථි මෙ අජ්ඣත්තං උද්ධච්ච-කුක්කුච්චන්ති පජානාති. අසන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චං නත්ථි මෙ අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චන්ති පජානාති. යථා ච අනුප්පන්නස්ස උද්ධච්ච-කුක්කුච්චස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නස්ස උද්ධච්චකුක්කුච්චස්ස පහාණං හොති, තඤ්ච පජානාති. යථා ච පහීණස්ස උද්ධච්චකුක්කුච්චස්ස ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති.

සන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡං අත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති. අසන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡං නත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති. යථා ච අනුප්පන්නාය විචිකිච්ඡාය උප්පාදො හොති, තඤ්ච පජානාති. යථා ච උප්පන්නාය විචිකිච්ඡාය පහාණං හොති, තඤ්ච පජානාති. යථා ච පහීණාය විචිකිච්ඡාය ආයතිං අනුප්පාදො හොති, තඤ්ච පජානාති.

ඉදං වුච්චති භික්ඛවෙ මනොසොචෙය්‍යං.

## 3. 3. 2. 9.

19. මහණෙනි, මේ ශුචිභාවයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: කායද්වාරයෙහි ශුචිභාවය, වාග්ද්වාරයෙහි ශුචිභාවය, මනොද්වාරයෙහි ශුචිභාව යි.

මහණෙනි, කායද්වාරයෙහි ශුචිභාවය කවරේ ය යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ, පණිවායෙන් දුරුවූයේ වෙයි. අයිනාදනින් දුරුවූයේ වෙයි අබ්‍රම්සරින් දුරුවූයේ වෙයි. මහණෙනි, මේ කායද්වාරයෙහි ශුචිභාවය යි කියනු ලැබේ.

මහණෙනි, වාග්ද්වාරයෙහි ශුචිභාවය කවරේ ය යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ, මුසාවායෙන් දුරුවූයේ වෙයි. පිසුණුබසින් දුරුවූයේ වෙයි. පරුස්බසින් දුරුවූයේ වෙයි. සම්ඵප්පලපින් දුරුවූයේ වෙයි. මහණෙනි, මේ වාග්ද්වාරයෙහි ශුචිභාවය යි කියනු ලැබේ.

මහණෙනි, මනොද්වාරයෙහි ශුචිභාවය කවරේ ය යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ අධ්‍යාත්මයෙහි විද්‍යමානවූ හෝ කාමච්ඡන්දය 'මාගේ අධ්‍යාත්මයෙහි කාමච්ඡන්දය ඇතැ' යි දනී. අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ කාමච්ඡන්දය 'මාගේ අධ්‍යාත්මයෙහි කාමච්ඡන්දය නැතැ'යි දනී. යම් පරිදි නූපන් කාමච්ඡන්දයාගේ උත්පාදයෙක් වේ ද, එ ද දනී. යම් සෙයෙකින් උපන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණයෙක් වේ ද, එ ද දනී. යම් පරිදි ප්‍රහන කාමච්ඡන්දයාගේ මතුයෙහි නූපැත්මෙක් වේ ද, එ ද දනී.

අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ ව්‍යාපාදය 'මාගේ අධ්‍යාත්මයෙහි ව්‍යාපාදය ඇතැ' යි දනී. අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ ව්‍යාපාදය 'මාගේ අධ්‍යාත්මයෙහි ව්‍යාපාදය නැතැ' යි දනී. යම් පරිදි නූපන් ව්‍යාපාදයාගේ ඉපැත්මෙක් වේ ද, එ ද දනී. යම් පරිදි උපන් ව්‍යාපාදයාගේ ප්‍රහාණයෙක් වේ ද, එ ද දනී. යම් පරිදි ප්‍රහන ව්‍යාපාදයාගේ මතුයෙහි නොඉපැත්මෙක් වේ ද, එ ද දනී.

අධ්‍යාත්මයෙහි විද්‍යමානවූ හෝ ථිනමිද්ධය 'මාගේ අධ්‍යාතමයෙහි ථිනමිද්ධය ඇතැ' යි දනී. අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ ථිනමිද්ධය 'මාගේ අධ්‍යාත්මයෙහි ථිනමිද්ධය නැතැ' යි දනී. යම් පරිදි නූපන් ථිනමිද්ධයාගේ ඉපැත්මෙක් වේ ද, එ ද දනී. යම් පරිදි උපන් ථිනමිද්ධයාගේ ප්‍රහාණයෙක් වේ ද, එ ද දනී. යම් පරිදි ප්‍රහන ථිනමිද්ධයාගේ මතුයෙහි නොඉපැත්මෙක් වේ ද, එ ද දනී.

අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ උද්ධච්චකුක්කුච්චය 'මාගේ අධ්‍යාත්ම යෙහි උද්ධච්චකුක්කුච්චය ඇතැ' යි දනී. අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ උද්ධච්චකුක්කුච්චය 'මාගේ අධ්‍යාත්මයෙහි උද්ධච්චකුක්කුච්චය නැතැ'යි දනී. යම් පරිදි නූපන් උද්ධච්චකුක්කුච්චයාගේ ඉපැත්මෙක් වේ ද, එ ද දනී. යම් පරිදි උපන් උද්ධච්චකුක්කුච්චයාගේ ප්‍රහාණයෙක් වේ ද, එ ද දනී. යම් පරිදි ප්‍රහන උද්ධච්චකුක්කුච්චයාගේ මතුයෙහි නොඉපැත්මෙක් වේ ද, එ ද දනී.

අධ්‍යාත්මයෙහි විද්‍යමාන වූ හෝ විචිකිච්ඡාව 'මාගේ අධ්‍යාත්මයෙහි විචිකිච්ඡාව ඇතැ'යි දනී අධ්‍යාත්මයෙහි අවිද්‍යමාන වූ හෝ විචිකිච්ඡාව 'මාගේ අධ්‍යාත්මයෙහි විචිකිච්ඡාව නැතැ' යි දනී. යම් පරිදි නූපන් විචිකිච්ඡාවගේ ඉපැත්මෙක් වේ ද, එ ද දනී. යම් පරිදි උපන් විචිකිච්ඡාවගේ ප්‍රහාණයෙක් වේ ද, එ ද දනී. යම් පරිදි ප්‍රහන විචිකිච්ඡාවගේ මතුයෙහි නොඉපැත්මෙක් වේ ද, එ ද දනී.

මහණෙනි, මේ මනෝද්වාරයෙහි ශුචිභාවය යි කියනු ලැබේ.

ඉමානි ඛො භික්ඛවෙ තීණි සොචෙය්‍යානීති.

1. කායසුචිං වචීසුචිං චෙතොසුචිමනාසවං,
සුචිං සොචෙය්‍යසම්පන්නං ආහු නින්හාතපාපකන්ති.

### 3. 3. 2. 10.

20. තීණිමානි භික්ඛවෙ මොනෙය්‍යානි. කතමානි තීණි: කායමොනෙය්‍යං, වචීමොනෙය්‍යං, මනොමොනෙය්‍යං.

කතමඤ්ච භික්ඛවෙ කායමොනෙය්‍යං?

ඉධ භික්ඛවෙ භික්ඛු පාණාතිපාතා පටිවිරතො හොති. අදින්නාදානා පටිවිරතො හොති. අබ්‍රහ්මචරියා පටිවිරතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ කායමොනෙය්‍යං.

කතමඤ්ච භික්ඛවෙ වචීමොනෙය්‍යං?

ඉධ භික්ඛවෙ භික්ඛු මුසාවාදා පටිවිරතො හොති. පිසුණාවාචා පටිවිරතො හොති. ඵරුසාවාචා පටිවිරතො හොති. සම්ඵප්පලාපා පටිවිරතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ වචීමොනෙය්‍යං.

කතමඤ්ච භික්ඛවෙ මනොමොනෙය්‍යං?

ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉදං වුච්චති භික්ඛවෙ මනොමොනෙය්‍යං.

ඉමානි ඛො භික්ඛවෙ තීණි මොනෙය්‍යානීති.

2. කායමුනිං වචීමුනිං චෙතොමුනිමනාසවං,
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු සබ්බප්පහායිනන්ති.

**ආපායිකා වග්ගො දුතියො.***

---

* තස්සුද්දානං :- ආපායිකො දුල්ලභො අප්පමෙය්‍යං
ආනෙඤ්ජ විපත්ති සම්පදා
අපණ්ණකො ච කම්මන්තා
ද්වෙ සොචෙය්‍යානි මොනෙය්‍යන්ති - මජසං.

මහණෙනි, මොහු ශුචිභාවයෝ තුන් දෙනැයි.

1. කායද්වාරයෙහි පවිත්‍ර වූ වාග්ද්වාරයෙහි පවිත්‍ර වූ මනෝද්වාරයෙහි පවිත්‍ර වූ එයින් ම අනාස්‍රව වූ මෙසේ ත්‍රිවිධශෞචයෙන් යුක්ත වූ කෙලේශාභාවයෙන් පවිත්‍ර වූ මහණ ධෞතපාපය යි කියත්.

## 3. 3. 2. 10.

20. මහණෙනි, මේ මුනිභාවයෝ තුන් දෙනෙකි. කවර තුන් දෙනෙක යත්: කායද්වාරයෙහි මුනිභාවය, වාග්ද්වාරයෙහි මුනිභාවය, මනෝද්වාරයෙහි මුනිභාව යි.

මහණෙනි, කායද්වාරයෙහි මුනිභාවය කවරේ ය යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ පණිවායෙන් දුරුවූයේ වෙයි, අයිනාදනින් දුරුවූයේ වෙයි. අබ්‍රම්සරින් දුරුවූයේ වෙයි. මහණෙනි, මේ කායද්වාරයෙහි මුනිභාවය යි කියනු ලැබේ.

මහණෙනි, වාග්ද්වාරයෙහි මුනිභාවය කවරේ ය යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ මුසවායෙන් දුරුවූයේ වෙයි, පිසුණුබසින් දුරුවූයේ වෙයි, පරුස්බසින් දුරුවූයේ වෙයි. සම්ඵප්පලපින් දුරුවූයේ වෙයි. මහණෙනි, මේ වාග්ද්වාරයෙහි මුනිභාවය යි කියනු ලැබේ.

මහණෙනි, මනෝද්වාරයෙහි මුනිභාවය කවරේ ය යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ ආස්‍රවයන් ක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට උපයාගෙණ වෙසෙයි. මහණෙනි, මේ මනෝද්වාරයෙහි මුනිභාව යි කියනු ලැබේ.

මහණෙනි, මොහු තුන් මුනිභාවයෝ යි.

2. කායද්වාරයෙන් පවිත්‍ර වූ වාග්ද්වාරයෙන් පවිත්‍ර වූ මනෝද්වාරයෙන් පවිත්‍ර වූ එයින් ම අනාස්‍රව වූ එයින් ම මුනිභාවයෙන් යුක්ත වූ රහත් මුනිහු සියලු පව් පැහුවකු කොට කියත්.

**දෙවන ආපායික වර්‍ගයයි**

# [ 3. භරණ්ඩු වග්ගො ] *

## 3. 3. 3. 1.

**[කුසිනාර නිදානං:]**

21. එකං සමයං භගවා **කුසිනාරායං** විහරති **බලිහරණෙ** වනසණ්ඩෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි -පෙ-

ඉධ භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. තමෙනං ගහපති වා ගහපතිපුත්තො වා උපසඞ්කමිත්වා ස්වාතනාය භත්තෙන නිමන්තෙති. ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු අධිවාසෙති. සො තස්සා රත්තියා අච්චයෙන පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන තස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා නිවෙසනං තෙනුපසඞ්කමති. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදති. තමෙනං සො ගහපති වා ගහපතිපුත්තො වා පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙති සම්පවාරෙති. තස්ස එවං හොති: සාධු වත මායං ගහපති වා ගහපතිපුත්තො වා පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙති සම්පවාරෙතීති. එවම්පිස්ස හොති: අහො වත මායං ගහපති වා ගහපතිපුත්තො වා ආයතිම්පි එවරූපෙන පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙය්‍ය සම්පවාරෙය්‍යාති. සො තං පිණ්ඩපාතං ගථිතො මුච්ඡිතො අජ්ඣොපන්නො අනාදීනවදස්සාවී අනිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. සො තත්ථ කාමවිතක්කම්පි විතක්කෙති. ව්‍යාපාදවිතක්කම්පි විතක්කෙති. විහිංසාවිතක්කම්පි විතක්කෙති. එවරූපස්සාහං භික්ඛවෙ භික්ඛුනො දින්නං න මහප්ඵලන්ති වදාමි. තං කිස්ස හෙතු: පමත්තො භික්ඛවෙ භික්ඛු විහරති.

ඉධ පන භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. තමෙනං ගහපති වා ගහපතිපුත්තො වා උපසඞ්කමිත්වා ස්වාතනාය භත්තෙන නිමන්තෙති, ආකඞ්ඛමානො භික්ඛවෙ භික්ඛු අධිවාසෙති. සො තස්සා රත්තියා අච්චයෙන පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන තස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා නිවෙසනං තෙනුපසඞ්කමති. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදති. තමෙනං සො ගහපති වා ගහපතිපුත්තො වා පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙති සම්පවාරෙති. තස්ස න එවං හොති: සාධු වත මායං[1] ගහපති වා ගහපතිපුත්තො වා පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙති සම්පවාරෙතීති. එවම්පිස්ස න හොති: අහො වත මායං ගහපති වා ගහපතිපුත්තො වා ආයතිම්පි එවරූපෙන පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙය්‍ය සම්පවාරෙය්‍යාති. සො තං පිණ්ඩපාතං අගථිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. සො තත්ථ නෙක්ඛම්මවිතක්කම්පි විතක්කෙති. අව්‍යාපාදවිතක්කම්පි විතක්කෙති. අවිහිංසාවිතක්කම්පි විතක්කෙති. එවරූපස්සාහං භික්ඛවෙ භික්ඛුනො දින්නං මහප්ඵලන්ති වදාමි. තං කිස්ස හෙතු: අප්පමත්තො හි භික්ඛවෙ භික්ඛු විහරතීති.

1 මායං - මජසං. මයං, සීමු. - PTS. * කුසිනාරාවග්ගො - මජසං.

## [ 3. භරණ්ඩු වග්ගය ]

**[කුසිනාරා නිදානයි:]**

**3. 3. 3. 1.**

21. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **කුසිනාරා** නුවර **බලිහරණ** නම් වනලැහැබෙහි වැඩවසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක ...

මහණෙනි, මෙ සස්නෙහි මහණෙක් එක්තරා ගමක් හෝ නියම්ගමක් හෝ ඇසුරු කොට ගෙණ වෙසෙයි. ඔහු කරා ගෘහපතියෙක් හෝ ගෘහපති-පුත්‍රයෙක් හෝ එළඹ සෙටදවස වියයුතු බොජ සඳහා බතින් නිමන්ත්‍රණය කෙරෙයි. මහණෙනි, කැමැති වන මහණ ඉවසයි. හේ එරය ගෙවීයැමෙන් පෙරවරු හැඳපෙරෙව පාසිවුරු ගෙණ ඒ ගෘහපතියාගේ හෝ ගෘහපතිපුත්‍රයාගේ හෝ නිවෙස්න කරා එළඹෙයි. එළඹ පැණ වූ අස්නෙහි හිඳුනේය. ඒ මහණ ඒ ගෘහපතියා හෝ ගෘහපතිපුත්‍රයා හෝ ප්‍රණීත වූ ඛාද්‍යයෙන් භොජ්‍යයෙන් සියතින් සතපයි. මොනොවට පවරවයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "මේ ගෘහපතියා හෝ ගෘහපතිපුත්‍රයා හෝ ප්‍රණීත වූ ඛාද්‍යයෙන් භොජ්‍යයෙන් සියතින් මා මොනොවට සතපනේය. මොනොවට පවරවනේය" කියා යි. මෙසේ ද ඔහුට සිතෙක් වෙයි. "යහහ, මේ ගෘහපතියා හෝ ගෘහපතිපුත්‍රයා හෝ මතුයෙහිදු මෙබඳු ප්‍රණීත වූ ඛාද්‍යයෙන් භොජ්‍යයෙන් සියතින් මා සතපා නම් මොනොවට පවරවා නම් මැනව" කියා යි. ඒ මහණ ඒ පිණ්ඩපාතය තෘෂ්ණායෙන් ග්‍රථිත වූයේ මූර්ජිතවූයේ තෘෂ්ණාවිසින් ගිලගත්තේ ආදීනව නො දක්නා සුල්ලේ නිස්සරණප්‍රඥ නැත්තේ වළඳ කෙරෙයි. ඒ මහණ එහි කාමවිතර්කය ද විතර්කණ කෙරෙයි. ව්‍යාපාදවිතර්කය ද විතර්කණ කෙරෙයි. විහිංසාවිතර්කය ද විතර්කණ කෙරෙයි. මහණෙනි, මම මෙබඳු මහණහට දෙන ලද්ද මහත්ඵලය යි නො කියමි. ඒ කවරහෙයින යත්: මහණෙනි, ඒ මහණ පමාවූයේ වෙයේ. එහෙයිනි.

මහණෙනි, මෙසස්නෙහි මහණෙක් එක්තරා ගමක් හෝ නියම්ගමක් හෝ ඇසිරි කොට වෙසෙයි. ඔහු කරා ගෘහපතියෙක් හෝ ගෘහපති-පුත්‍රයෙක් හෝ එළඹ සෙටදවසට බතින් නිමන්ත්‍රණය කෙරෙයි. මහණෙනි, කැමති වන මහණ ඉවසයි. ඒ මහණ ඒ රය ගෙවීයැමෙන් පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ ඒ ගෘහපතියාගේ හෝ ගෘහපතිපුත්‍රයාගේ හෝ නිවෙස්න කරා එළඹෙයි. එළඹ පැණ වූ අස්නෙහි හිඳුනේය. ඒ මහණ ඒ ගෘහපතියා හෝ ගෘහපතිපුත්‍රයා හෝ ප්‍රණීත වූ ඛාද්‍යයෙන් භොජ්‍යයෙන් සියතින් සතපයි. මොනොවට පවරවයි. ඔහුට මෙබඳු සිතෙක් නොවෙයි. "මේ ගෘහපතියා හෝ ගෘහපතිපුත්‍රයා හෝ ප්‍රණීත වූ ඛාද්‍යයෙන් භොජ්‍යයෙන් සියතින් මා සතපනේය. මොනොවට පවරවනේය" කියා යි. ඔහුට මෙබඳු සිතෙක් ද නොවෙයි. "යහහ, මේ ගෘහපතියා හෝ ගෘහපතිපුත්‍රයා හෝ මතුයෙහිදු මෙබඳු ප්‍රණීත වූ ඛාද්‍යයෙන් භොජ්‍යයෙන් සියතින් මා සතපා නම් මොනොවට පවරවා නම් මැනව" කියා යි. ඒ මහණ ඒ පිණ්ඩපාතය ග්‍රථිත නොවූයේ මූර්ජිත නොවූයේ නොගිලගත්තේ ආදීනව දක්නා සුලු වූයේ නිස්සරණප්‍රඥ ඇත්තේ වළඳ කෙරෙයි. ඒ මහණ එහි නිෂ්කාම-විතර්කය ද විතර්කණ කෙරෙයි. අව්‍යාපාදවිතර්කය ද විතර්කණ කෙරෙයි. අවිහිංසාවිතර්කය ද විතර්කණ කෙරෙයි. මහණෙනි, මම මෙබඳු මහණහට දෙන ලද්ද මහත්ඵල ය යි කියමි. ඒ කවර හෙයින යත්: මහණෙනි, ඒ මහණ අප්‍රමාද විහරණ ඇතියේ වෙසෙයි.

3. 3. 3. 2.

[සාවත්ථි නිදානං:]

22. යස්සං භික්ඛවෙ දිසායං භික්ඛු භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති, මනසිකාතුම්පි මෙ එසා භික්ඛවෙ දිසා න ඵාසු හොති. පගෙව ගන්තුං. නිට්ඨමෙත්ථ ගච්ඡාමි: "අද්ධා තෙ ආයස්මන්තො තයො ධම්මෙ පජහිංසු, තයො ධම්මෙ බහුලමකංසු."

කතමෙ තයො ධම්මෙ පජහිංසු: නෙක්ඛම්මවිතක්කං, අව්‍යාපාදවිතක්කං, අවිහිංසාවිතක්කං. ඉමෙ තයො ධම්මෙ පජහිංසු.

කතමෙ තයො ධම්මෙ බහුලමකංසු:[1] කාමවිතක්කං, ව්‍යාපාදවිතක්කං, විහිංසාවිතක්කං. ඉමෙ තයො ධම්මෙ බහුලමකංසු

යස්සං[2] භික්ඛවෙ දිසායං භික්ඛු භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති, මනසිකාතුම්පි මෙ එසා භික්ඛවෙ දිසා න ඵාසු හොති. පගෙව ගන්තුං. නිට්ඨමෙත්ථ ගච්ඡාමි: "අද්ධා තෙ ආයස්මන්තො ඉමෙ තයො ධම්මෙ පජහිංසු. ඉමෙ තයො ධම්මෙ බහුලමකංසු."

යස්සං භික්ඛවෙ දිසායං භික්ඛු සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති. ගන්තුම්පි මෙ එසා භික්ඛවෙ දිසා ඵාසු හොති. පගෙව මනසිකාතුං. නිට්ඨමෙත්ථ ගච්ඡාමි: "අද්ධා තෙ ආයස්මන්තො තයො ධම්මෙ පජහිංසු, තයො ධම්මෙ බහුලමකංසු."

කතමෙ තයො ධම්මෙ පජහිංසු: කාමවිතක්කං, ව්‍යාපාදවිතක්කං, විහිංසා-විතක්කං. ඉමෙ තයො ධම්මෙ පජහිංසු.

කතමෙ තයො ධම්මෙ බහුලමකංසු: නෙක්ඛම්මවිතක්කං, අව්‍යාපාද-විතක්කං අවිහිංසාවිතක්කං. ඉමෙ තයො ධම්මෙ බහුලමකංසු

යස්සං භික්ඛවෙ දිසායං භික්ඛු සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති, ගන්තුම්පි මෙ එසා භික්ඛවෙ දිසා ඵාසු හොති. පගෙව මනසිකාතුං. නිට්ඨමෙත්ථ ගච්ඡාමි: "අද්ධා තෙ ආයස්මන්තො ඉමෙ තයො ධම්මෙ පජහිංසු, ඉමෙ තයො ධම්මෙ බහුලමකංසු"ති.

---

1. බහුලීමකංසු - සයාකං. - PTS. 2. යස්සං පන - මජ්ඣං.

3. 3. 3. 2.

[සෑවෑත් නිදානයි:]

22. මහණෙනි, යම් දිගෙක මහණහු හටගත් භණ්ඩන ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විවාදයට වැදුනාහු උනුන් මුවසැතින් පෙලන්නාහු වෙසෙත් ද, මහණෙනි, මට තෙල දිග මෙනෙහි කරන්නට ද පහසු නොවේ. යන්නට කැලම ය. "ඒ ආයුෂමත්හු එකාන්තයෙන් කරුණු තුණක් හැරපියති. කරුණු තුණක් බහුල වශයෙන් කෙරෙති" යි මෙසේ මෙහි නිෂ්ඨාවට යෙමි.

කවර කරුණු තුණක් හැරපියත් ද යත්: නිෂ්කාමිතාවිතර්කය, අව්‍යාපාද-විතර්කය, අවිහිංසාවිතර්කය යන මේ තුන් දහම් හැරපියත්.

කවර කරුණු තුණක් බහුල වශයෙන් කෙරෙත් ද යත්: කාමවිතර්කය. ව්‍යාපාදවිතර්කය, විහිංසාවිතර්කය යන තුන් දහම් බහුල වශයෙන් කරත්.

මහණෙනි, යම් දිගෙක මහණහු හටගත් භණ්ඩන ඇත්තාහු, හටගත් කලහ ඇත්තාහු විවාදයට වැදුනාහු උනුන් මුවසැතින් පෙලමින් වෙසෙත් ද, මහණෙනි, මට තෙල දිග මෙනෙහි කරන්නට ද පහසු නොවේ. යන්නට කැලම ය. "ඒ ආයුෂමත්හු එකාන්තයෙන් මේ තුන් දහම් හැරපියත්. මේ තුන් දහම් බහුල වශයෙන් කෙරෙති" යි මෙසේ මෙහි නිෂ්ඨාවට යෙමි.

මහණෙනි, යම් දිගෙක මහණහු සමගි වූවාහු තුස්නාහු විවාද නොක-රන්නාහු ක්ෂීරොදකීභූත වූවාහු උනුන් පිය ඇසින් දක්නාහු වෙසෙත් ද, මහණෙනි, මට තෙල දිග යන්නට ද පහසුය. මෙනෙහි කරනු කැලම ය. "ඒ ආයුෂමත්හු එකාන්තයෙන් කරුණු තුණක් හැරපියති. කරුණු තුණක් බහුල වශයෙන් කරති" යි මෙසේ මෙහි නිෂ්ඨාවට යෙමි.

කවර කරුණු තුණක් හැරපියත් ද යත්: කාමවිතර්කය, ව්‍යාපාදවිතර්කය, විහිංසාවිතර්කය යන මේ කරුණු තුණ හැරපියත්.

කවර කරුණු තුණක් බහුලවශයෙන් කෙරෙත් ද යත්: නිෂ්කාමිතා-විතර්කය, අව්‍යාපාදවිතර්කය, අවිහිංසාවිතර්කය යන මේ තුන් දහම් බහුල වශයෙන් කරත්.

මහණෙනි, යම් දිගෙක මහණහු සමගි වූවාහු තුස්නාහු විවාද නො කරන්නාහු, ක්ෂීරෙදකීභූත වූවාහු උනුන් ප්‍රිය ඇසින් දක්නාහු වෙසෙත් ද, මහණෙනි, මට තෙල දිග යන්නට ද පහසු වේ. මෙනෙහි කරනු කැලම පහසු වේ. "ඒ ආයුෂමත්හු ඒකාන්තයෙන් මේ තුන් දහම් හැරපියත්. මේ තුන් දහම් බහුල වශයෙන් කරති" යි මෙසේ මෙහි නිෂ්ඨාවට යෙමි.

### 3. 3. 3. 3

[වෙසාලි නිදානං:]

23. එකං සමයං භගවා වෙසාලියං විහරති ගොතමකෙ චෙතියෙ. තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි -පෙ-

අභිඤ්ඤායාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි නො අනභිඤ්ඤාය. සනිදානාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි නො අනිදානං. සප්පාටිහාරියාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි නො අප්පාටිහාරියං.

තස්ස මය්හං භික්ඛවෙ අභිඤ්ඤාය ධම්මං දෙසයතො නො අනභිඤ්ඤාය, සනිදානං ධම්මං දෙසයතො නො අනිදානං, සප්පාටිහාරියං ධම්මං දෙසයතො නො අප්පාටිහාරියං, කරණීයො ඔවාදො කරණීයා අනුසාසනී.

අලඤ්ච පන වො භික්ඛවෙ තුට්ඨියා, අලං අත්තමනතාය, අලං සොමනස්සාය "සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො සඞ්ඝො"ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුං. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සහස්සී ලොකධාතු අකම්පිත්ථාති.

### 3. 3. 3. 4.

[කපිලවත්ථු නිදානං.]

24. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො යෙන කපිලවත්ථු තදවසරි. අස්සොසි බො මහානාමො සක්කො භගවා කිර කපිලවත්ථුං අනුප්පත්තොති. අථ බො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං බො මහානාමං සක්කං භගවා එතදවොච:

ගච්ඡ මහානාම, කපිලවත්ථුස්මිං තථාරූපං ආවසථං ජාන යත්ථජ්ජ මයං එකරත්තිං විහරෙය්‍යාමාති. එවං භන්තෙති බො මහානාමො සක්කො භගවතො පටිස්සුත්වා කපිලවත්ථුං පවිසිත්වා කෙවලකප්පං කපිලවත්ථුං අන්වාහිණ්ඩන්තො න අද්දස කපිලවත්ථුස්මිං තථාරූපං ආවසථං යත්ථ භගවා එකරත්තිං විහරෙය්‍ය.

අථ බො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: නත්ථි භන්තෙ කපිලවත්ථුස්මිං තථාරූපො ආවසථො යත්ථජ්ජ භගවා එකරත්තිං විහරෙය්‍ය. අයං භන්තෙ භරණ්ඩු කාලාමො භගවතො පුරාණසබ්‍රහ්මචාරී. තස්සජ්ජ භගවා අස්සමෙ එකරත්තිං විහරතූති.

3. 3. 3. 3.

[**විසාලා නිදානයි:**]

23. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **විසාලා** මහනුවර **ගොතමක චෛත්‍ය**යෙහි වැඩවසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක

මහණෙනි, මම විශිෂ්ටඥානයෙන් අවබෝධ කොට දහම් දෙසමි. අවබෝධ නොකොට නො දෙසමි. මහණෙනි, මම හේතු සහිත කොට දහම් දෙසමි. හේතු රහිත කොට නො දෙසමි. මහණෙනි, මම ප්‍රත්‍යනීකධර්මයන් නෙරලීම් සහිත කොට දහම් දෙසමි. නෙරලීම් රහිත කොට නො දෙසමි.

මහණෙනි, අවබෝධ කොට ගෙණ දහම් දෙසන අවබෝධ නොකොට නො දෙසන, නිදාන සහිත කොට ගෙණ දහම් දෙසන, නිදාන රහිත කොට නො දෙසන, ප්‍රත්‍යනීකධර්මයන් නෙරලීම් සහිත කොට ගෙණ දහම් දෙසන, නෙරලීම් රහිත කොට නො දෙසන ඒ මාගේ අවවාදය කළ යුතුය. අනුශාසනා කළ යුතුය

මහණෙනි, "භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය හ, ධර්මය ස්වාඛ්‍යාතය, සඞ්ඝ සුප්‍රතිපන්නායහ"යි තොපට තුෂ්ටියට නිසිය. සතුටු සිත් ඇති සෙයට නිසිය. සෞමනස්‍යයට නිසිය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. ඒ සියම්නා මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිමුඛ ව පුස්නවූහු. මේ වෙය්‍යාකරණය වදාරණු ලබන් ම සහස්‍රී ලොකධාතුව කම්පිත විය.

3. 3. 3. 4.

[**කිඹුල්වත් නිදානයි:**]

24. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **කොසොල්** දනව්වෙහි සැරිසරණ සේක් **කිඹුල්වත්** නුවර කරා වැඩිසේක. **මහානාම** ශාක්‍ය භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වතට වැඩිසේක් ලැ යි ඇසී ය. එක්බිති මහානාම ශාක්‍ය භාග්‍යවතුන් වහන්සේ කරා එළඹිත. එළඹ භාග්‍යවතුන් වහන්සේ ඇදුරු කොට වැද එකත්පස්ව සිටියේ ය. එකත්පස්ව සිටි මහානාම සැහැරජුට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

මහානාමය, යව, අද එකරැයක් අපි යම් තැනෙක වසමෝ ද කිඹුල්වතෙහි එබඳු ආවසථයක් දත යි. වහන්ස, එසේය යි මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේට පිළිණකොට කිඹුල්වතට වැද මුළු කිඹුල්වත ඔබමොබ ඇවිදුනේ භාග්‍යවතුන් වහන්සේ යම් ආවසථයෙක එක රැයක් වසන සේක් ද එබඳු ආවසථයක් කිඹුල්වතෙහි නො දිට.

එක්බිති මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළකෙළේය: වහන්ස, අද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක එක්රැයක් වසනසේක් ද, එබඳු ආවසථයෙක් කිඹුල්වතෙහි නැත. වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ පැරණි සබ්‍රම්සරයා **භරණ්ඩුකාලාම** තව්සා ඇත. භාග්‍යවතුන් වහන්සේ අද ඔහුගේ අසපුවෙහි එක් රැයක් වසන සේක්වා.

ගච්ඡ මහානාම, සන්ථරං පඤ්ඤපෙහීති. එවං භන්තෙති ඛො මහානාමො සක්කො භගවතො පටිස්සුත්වා යෙන භරණ්ඩුස්ස කාලාමස්ස අස්සමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සන්ථරං පඤ්ඤපෙත්වා උදකං ඨපෙත්වා පාදානං ධොවනාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච:

සන්ථතො භන්තෙ සන්ථාරො, උදකං ඨපිතං පාදානං ධොවනාය, යස්සදානි භන්තෙ භගවා කාලං මඤ්ඤතීති.

අථ ඛො භගවා යෙන භරණ්ඩුස්ස කාලාමස්ස අස්සමො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා පාදෙ පක්ඛාලෙසි.

අථ ඛො මහානාමස්ස සක්කස්ස එතදහොසි: අකාලො ඛො අජ්ජ භගවන්තං පයිරුපාසිතුං, කිලන්තො භගවා, සෙවදානාහං භගවන්තං පයිරුපාසිස්සාමීති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො මහානාමො සක්කො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො මහානාමං සක්කං භගවා එතදවොච:

තයො ඛො මෙ මහානාම සත්ථාරො සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

කතමෙ තයො?

ඉධ මහානාම එකච්චො සත්ථා කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙති, න රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙති, න වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙති. ඉධ පන මහානාම එකච්චො සත්ථා කාමානං චෙව පරිඤ්ඤං පඤ්ඤපෙති, රූපානං ච පරිඤ්ඤං පඤ්ඤපෙති, න වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙති. ඉධ පන මහානාම එකච්චො සත්ථා කාමානං ච පරිඤ්ඤං පඤ්ඤපෙති, රූපානං ච පරිඤ්ඤං පඤ්ඤපෙති, වෙදනානං ච පරිඤ්ඤං පඤ්ඤපෙති. ඉමෙ ඛො මහානාම තයො සත්ථාරො සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

ඉමෙසං මහානාම තිණ්ණං සත්ථාරානං එකා නිට්ඨා, උදාහු පුථු නිට්ඨාති.

එවං වුත්තෙ භරණ්ඩුකාලාමො මහානාමං සක්කං එතදවොච: එකාති මහානාම වදෙහීති.

එවං වුත්තෙ භගවා මහානාමං සක්කං එතදවොච: නානාති මහානාම වදෙහීති.

දුතියම්පි -පෙ- තතියම්පි ඛො භරණ්ඩුකාලාමො මහානාමං සක්කං එතදවොච: එකාති මහානාම වදෙහීති. තතියම්පි ඛො භගවා මහානාමං සක්කං එතදවොච: නානාති මහානාම වදෙහීති.

මහානාමය, යව, පසතරණක් පන්ව සි. "වහන්ස, එසේය"යි මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා භරණ්ඩුකාලාම තව්සාගේ අසපුවට එළඹියේය. එළඹ පසතරණක් පන්වා පා දෝනට දිය එළවා තබා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹින. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකෙළේ ය.

වහන්ස, පසතරණ ඇතිරින. පාදෝනට දිය එළවා තැබින. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දූන් යම් කිසෙක් ඇද්ද, එයට කල් දන්නේ මැනැවැයි.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ භරණ්ඩුකාලාමයාගේ අසපුවට වැඩිසේක. වැඩ පැන්වූ අස්නෙහි හුන් සේක. හිද භාග්‍යවතුන් වහන්සේ පා දෙවූ සේක.

එක්බිති මහානාම ශාක්‍යයාහට මෙසේ සිත් වීය: දූන් භාග්‍යවතුන් වහන්සේ පයසූපාසනයට අකාලය. භාග්‍යවතුන් වහන්සේ කලාන්තයහ. "දූන් මම හෙට භාග්‍යවතුන් වහන්සේ උපාසනය කරමි" යි භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියේ ය.

එක්බිති මහානාම ශාක්‍ය ඒ රය ඉක්මෙන් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හින. එකත්පස්ව හුන් මහානාම ශාක්‍යරජුට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ:

මහානාමය, ලෝකයෙහි මේ ශාස්තෲහු තුන් දෙනෙක් විද්‍යමානයහ.

කවර තුන් දෙනෙක යත්:

මහානාමය, මෙලොව කිසි ශාස්තෘ කෙනෙක් කාමයන්ගේ ප්‍රහාණය පණවත්. රූපයන්ගේ ප්‍රහාණය නො පණවත්. වේදනාවන්ගේ ප්‍රහාණය නො පණවත්, මහානාමය, මෙලොව කිසි ශාස්තෘ කෙනෙක් කාමයන්ගේ ද ප්‍රහාණය පණවත්. රූපයන්ගේ ද ප්‍රහාණය පණවත්. වේදනාවන්ගේ ප්‍රහාණය නො පණවත්. මහානාමය, මෙලොව කිසි ශාස්තෘ කෙනෙක් කාමයන්ගේ ද ප්‍රහාණය පණවත් රූපයන්ගේ ද ප්‍රහාණය පණවත්. වේදනාවන්ගේ ද ප්‍රහාණය පණවත්. මහානාමය, මේ ශාස්තෲහු තුන් දෙනා ලෝකයෙහි විද්‍යමානයහ.

මහානාමය, මේ තුන් ශාස්තෘවරුන්ගේ නිෂ්ඨාව එකෙක් වේ ද? නොහොත් බොහෝ නිෂ්ඨාවෝ ඇත්ද?

මෙසේ වදාළ කල්හි භරණ්ඩුකාලාම තවුස් මහානාම ශාක්‍යයාට මෙසේ කීය: "මහානාමය, එකැයි කියව"යි.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ මහානාම ශාක්‍යයාට මෙසේ වදාළහ: "මහානාමය, නානානිෂ්ඨාය කියව"යි.

දෙවන වටත් ... තුන් වන වටත් භරණ්ඩුකාලාම තව්සා මහානාම ශාක්‍යයාට මෙසේ කීය. "මහානාමය, එකැ යි කියවයි." තුන්වන වටත් භාග්‍යවතුන් වහන්සේ මහානාම ශාක්‍යයාට මෙසේ වදාළහ: "මහානාමය, නානානිෂ්ඨාය කියව"යි.

අථ ඛො භරණ්ඩුස්ස කාලාමස්ස එතදහොසි: 'මහෙසක්ඛස්ස වතම්හි මහානාමස්ස සක්කස්ස සම්මුඛා සමණෙන ගොතමෙන යාවතතියකං අපසාදිතො, යන්නූනාහං කපිලවත්ථුම්හා පක්කමෙය්‍යන්ති'

අථ ඛො භරණ්ඩු කාලාමො කපිලවත්ථුම්හා පක්කාමි. යං කපිලවත්ථුම්හා පක්කාමි, තථා පක්කන්තොව අහොසි. න පුන පච්චාගඤ්ජීති.

### 3. 3. 3. 5.

**[සාවත්ථි නිදානං:]**

25 **එකං** සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො **හත්ථකො** දෙවපුත්තො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො පුරතො ඨස්සාමීති ඔසීදති චෙව සංසීදති ච, න සක්කොති සණ්ඨාතුං. සෙය්‍යථාපි නාම සප්පිං වා තෙලං වා වාලිකාය ආසිත්තං ඔසීදති සංසීදති න සණ්ඨාති. එවමෙව හත්ථකො දෙවපුත්තො භගවතො පුරතො ඨස්සාමීති ඔසීදති චෙව සංසීදති ච, න සක්කොති සණ්ඨාතුං.

අථ ඛො භගවා හත්ථකං දෙවපුත්තං එතදවොච: ඔළාරිකං හත්ථක, අත්තභාවං අභිනිම්මිනාහීති.

එවං භන්තෙති ඛො හත්ථකො දෙවපුත්තො භගවතො පටිස්සුත්වා ඔළාරිකං අත්තභාවං අභිනිම්මිනිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො හත්ථකං දෙවපුත්තං භගවා එතදවොච:

යෙ තෙ හත්ථක ධම්මා පුබ්බෙ මනුස්සභූතස්ස පවත්තිනො අහෙසුං, අපි නු තෙ තෙ ධම්මා එතරහි පවත්තිනොති?

යෙ ච මෙ භන්තෙ ධම්මා පුබ්බෙ මනුස්සභූතස්ස පවත්තිනො අහෙසුං, තෙ ච මෙ ධම්මා එතරහි පවත්තිනො. යෙ ච මෙ භන්තෙ ධම්මා පුබ්බෙ මනුස්සභූතස්ස නප්පවත්තිනො අහෙසුං, තෙ ච මෙ ධම්මා එතරහි පවත්තිනො. සෙය්‍යථාපි භන්තෙ භගවා එතරහි ආකිණ්ණො විහරති භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි, එවමෙව ඛො අහං භන්තෙ ආකිණ්ණො විහරාමි දෙවපුත්තෙහි. දූරතොපි භන්තෙ දෙවපුත්තා ආගච්ඡන්ති හත්ථකස්ස දෙවපුත්තස්ස සන්තිකෙ ධම්මං සොස්සාමාති. තිණ්ණාහං භන්තෙ ධම්මානං අතිත්තො අප්පටිවානො කාලකතො.

එක්බිති භරණ්ඩුකාලාම තව්සාට මෙසිත් විය: "මහේශාඛ්‍ය මහානාම ශාක්‍යරජුගේ හමියෙහි දී මහණ ගොයුම්හු විසින් තුන්වන වට තෙක් ගරහන ලදුයෙමි. මම කිඹුල්වතින් පැනයෙමි නම් මැනැවැ"යි.

එක්බිති භරණ්ඩුකාලාම තව්සා කිඹුල්වතින් නික්මීත. කිඹුල්වතින් යම් සැටියෙකින් පැන ගියේ ද, එසැටියෙන් ගියේ ම විය. වටාලා නො පැමිණියේ ය.

**3. 3. 3. 5.**

**[සැවැත් නිදානයි:]**

25. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් අනේපිඬු සිටුඅරම්හි වැඩවසන සේක. එසද **හත්ථක** දෙව්-පුත් ඉකල් රැය අභිකාන්තවර්ණවිවණි ඇත්තේ සම්පූර්ණ ජේතවනය වටා බබුලුවා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේය. 'එළඹ භාග්‍යවතුන් වහන්සේ පෙරට සිටිම්'යි ගළයි. වැතිරීම් කෙරෙයි. නො සිටියහෙයි. සර්පිස් බිඳු හෝ තෙලබිඳු හෝ සියුම් වැලි මඬෙක ඉස්නා ලදුයේ ගළනේ වතුරැනේ වේ ද, නො සිටුනේ වේ ද, එපරිදි ම හත්ථක දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේ පෙරට සිටිම්'යි ගළනා හා වරැතුනා හා කෙරෙයි. සිටුනට නොහැකි වෙයි.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ හත්ථක දෙව්පුත්හට තෙල වදාළහ: හත්ථකය, ඔලාරික ආත්මභාවයක් මවාලව යි.

වහන්ස, එසේය යි හත්ථක දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ඔලාරික ආත්මභාවයක් මවාගෙණ භාග්‍යවතුන් වහන්සේ සක සා වැඳ එකත්පස්ව සිටියේ ය. එකත්පස්ව සිටි හත්ථක දෙව්පුත්හට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළහ:

හත්ථකය, පෙර මිනුෂ්‍ය වූ තොපට යම් ඒ දහම්හු (හැදෑරීමෙන්) වණ පොත්ව වැටුනාහු ද, ඒ දහම්හු තොපට දැනුත් වණපොත්ව වැටෙත් ද?

වහන්ස, යම් ඒ දහම්හු පෙර මනුෂ්‍ය වූ මට වණපොත්ව වැටුනාහු ද, ඒ දහම්හු දැනුත් මට වණපොත්ව වැටෙති. වහන්ස, යම් ඒ දහම්හු පෙර මනුෂ්‍ය වූ මට වණපොත්ව නොවැටුනාහු ද, ඒ දහම්හුත් දැන් මට වණ-පොත්ව ඇත. වහන්ස, යම් පරිදි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා, රජ රාජමහාමාත්‍ය, තීර්ථක තීර්ථකශ්‍රාවකයන් විසින් ආකීර්ණව වසනසේක් ද, වහන්ස, එපරිදි ම මමත් දේවපුත්‍රයන් විසින් ආකීර්ණව වෙසෙමි. වහන්ස, දුරසිට දු "හත්ථක දෙවපුත්‍රයා වෙත දහම් අසම්හ"යි දෙව්පුත්හු එති. වහන්ස, මම දහම් තුණක් පිළිබඳව අතෘප්ත වූයෙමි උත්කණ්ඨිත නො වූයෙමි කළුරිය කෙළෙමි.

කතමෙසං තිණ්ණං?

භගවතො අහං භන්තෙ දස්සනස්ස අතිත්තො අප්පටිවානො කාලකතො. සද්ධම්මසවණස්සාහං භන්තෙ අතිත්තො අප්පටිවානො කාලකතො. සඞ්ඝස්සාහං භන්තෙ උපට්ඨානස්ස අතිත්තො අප්පටිවානො කාලකතො. ඉමෙසං ඛො අහං භන්තෙ තිණ්ණං ධම්මානං අතිත්තො අප්පටිවානො කාලකතොති.

3. නාහං භගවතො දස්සනස්ස තිත්තිමජ්ඣගා[1] කුදාචනං,
සඞ්ඝස්ස උපට්ඨානස්ස සද්ධම්මසවණස්ස ච.

4. අධිසීලෙ සික්ඛමානො සද්ධම්මසවණෙ රතො
තිණ්ණං ධම්මානමතිත්තො හත්ථකො අවිහං ගතොති.

### 3. 3. 3. 6.

[බාරාණසි නිදානං]

26. එකං සමයං භගවා **බාරාණසියං** විහරති **ඉසිපතනෙ** මිගදායෙ. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය බාරාණසිං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා ගොයොගපිලක්ඛස්මිං[2] පිණ්ඩාය චරමානො අඤ්ඤතරං භික්ඛුං රිත්තාසං බාහිරාසං මුට්ඨස්සතිං අසම්පජානං අසමාහිතං විබ්භන්තචිත්තං පාකතින්ද්‍රියං. දිස්වා තං භික්ඛුං එතදවොච:

භික්ඛු භික්ඛු[3] මා ඛො ත්වං අත්තානං කටුවියමකාසි. තං වත භික්ඛු කටුවියකතං අත්තානං ආමගන්ධෙ[4] අවස්සුතං මක්ඛිකා නානුපතිස්සන්ති, නාන්වාස්සවිස්සන්තී,ති නෙතං ඨානං විජ්ජතීති.

අථ ඛො සො භික්ඛු භගවතා ඉමිනා ඔවාදෙන ඔවදිතො සංවෙගමාපාදි. අථ ඛො භගවා බාරාණසියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාත-පටික්කන්තො භික්ඛූ ආමන්තෙසි:

ඉධාහං[5] භික්ඛවෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය බාරාණසිං පිණ්ඩාය පාවිසිං. අද්දසං ඛො අහං භික්ඛවෙ ගොයොගපිලක්ඛස්මිං පිණ්ඩාය චරමානො අඤ්ඤතරං භික්ඛුං රිත්තාසං බාහිරාසං මුට්ඨස්සතිං අසම්පජානං අසමාහිතං විබ්භන්තචිත්තං පාකතින්ද්‍රියං. දිස්වා තං භික්ඛුං එතදවොචං:

1. තිත්තිමජ්ඣිකුදාචනං - PTS 2. ගොයොග පිලක්ඛෑමිං - සනා. 3 මරම්මගන්ථෙ නදිස්සන්ති. 4. ආමග න්ධෙන - මජසං. 5. ඉධාහං - මජසං.

කවර කරුණු තුනක් පිළිබඳවය යත්:

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ දශීනයට අතෘප්ත වූයෙම් උත්කණ්ඨිත නොවූයෙම් කලුරිය කෙළෙමි. වහන්ස, මම සද්ධර්මශ්‍රවණයට අතෘප්ත වූයෙම් උත්කණ්ඨිත නොවූයෙම් කලුරිය කෙළෙමි. වහන්ස, මම සඞ්ඝොපසථානයට අතෘප්ත වූයෙම් උත්කණ්ඨිත නොවූයෙම් කලුරිය කෙළෙමි. වහන්ස, මම මේ තුන් දහමුන් පිළිබඳව අතෘප්ත වූයෙම් උත්කණ්ඨිත නොවූයෙම් කලුරිය කෙළෙම් යි.

3. මම භාග්‍යවතුන් වහන්සේගේ දශීනය පිළිබඳව කිසිදු කලෙක තෘප්තියට නොගියෙමි. සඟුන් වටතට සද්ධර්මශ්‍රවණයට තෘප්ත නොවීමි.

4. දශශිලයෙහි හික්මෙන්නෙම් සද්ධර්මශ්‍රවණයෙහි ඇළුනෙම් තුන් දහමුන් පිළිබඳව අතෘප්ත වූයෙම් හත්ථක නම් මම අවිහ බඹලොවට ගියෙමි.

## 3. 3 3. 6.

[බරණැස් නිදානයි:]

26. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර මිගදායෙහි වූ **ඉසිපතනාරාමයෙහි** වැඩවසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැද පෙරෙව පාසිවුරු ගෙණ බරණැස පිණ්ඩපාතයට වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ ගෙරින් විකොටගන්නා තැනෙක වූ පුළිල ගසක් සමීපයෙහි පිඩුපිණිස වඩනා සේක් ධ්‍යානසුඛ නැතියෙන් අල්පාශ වූ, කාමගුණ සුඛවශයෙන් බාහිරාශා ඇති, එයින් ම මුෂ්‍ඨා සිහි ඇති, සම්ප්‍රඥන රහිත, සමාහිත නොවූ, විභ්‍රාන්ත සිත් ඇති, නොදැමූනු ඉඳුරන් ඇති මහණෙක්හු දුටුසේක. ඒ මහණහු දැක මෙලෙ වදාළහ:

මහණ, මහණ, තෝ ආත්මය තහමක් ඉඳුල් කරව. මහණ ඉඳුල් කල, ක්‍රොධ සඞ්ඛ්‍යාත ආමිගන්ධයෙහි තෙත් වූ ඒ ආත්මය කෙළෙස් මැස්සෝ නැගී ලුහු නො බඳිති, ලුහුබැඳ නො කති යන මෙලෙ කරුණ ඒකාන්තයෙන් නොවේ.

එක්බිති ඒ මහණ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අවවාදයෙන් අවවාද කරණ ලද්දයේ සංවෙගයට පැමිණියේය.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ බරණැස පිඩු පිණිස හැසිර පස්බත පිණ්ඩපාතයෙන් වැළකුනු සේක් භික්ෂූන් ඇමතූ සේක:

මහණෙනි, මම පෙරවරු හැද පෙරෙව පාසිවුරු ගෙණ බරණැස පිඩු පිණිස පිවිසිනිමි. මහණෙනි, මම ගොයොගපලක්ෂ මූලයෙහි දී පිඩු පිණිස හැසිරෙන්නෙම් ධ්‍යානාභාවයෙන් අල්පාශා ඇති, කාමගුණවශයෙන් බාහිරාශා ඇති, මූළා සිහි ඇති, සම්ප්‍රඥන නැති, සමාධිත නො වූ, විභ්‍රාන්ත සිත් ඇති, ප්‍රාකෘත ඉන්ද්‍රිය ඇති එක්තරා මහණෙක්හු දිටිමි. දැක ඒ මහණහට මෙලෙ බස කීමි:

"භික්ඛු භික්ඛු, මා ඛො ත්වං අත්තානං කටුවියමකාසි. තං වත භික්ඛු කටුවියකතං අත්තානං ආමගන්ධෙ අවස්සුතං මක්ඛිකා නානුපති ස්සන්ති නාන්වාස්සවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති"ති.

අථ ඛො භික්ඛවෙ සො භික්ඛු මයා ඉමිනා ඔවාදෙන ඔවදිතො සංවෙගමාපාදීති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: කිනනු ඛො භන්තෙ කටුවියං? කො ආමගන්ධො? කා මක්ඛිකාති.

අභිජ්ඣා ඛො භික්ඛු කටුවියං. ව්‍යාපාදො ආමගන්ධො. පාපකා අකුසලා විතක්කා මක්ඛිකා. තං වත භික්ඛු කටුවියං කතං අත්තානං ආමගන්ධෙ අවස්සුතං මක්ඛිකා නානුපතිස්සන්ති නාන්වාස්සවිස්සන්තීති නෙතං ඨානං විජ්ජතීති.

5. අගුත්තං චක්ඛුසොතස්මිං ඉන්ද්‍රියෙසු අසංවුතං,
මක්ඛිකා අනුපතිස්සන්ති සංකප්පා රාගනිස්සිතා.

6. කටුවියකතො භික්ඛු ආමගන්ධෙ අවස්සුතො,
ආරකා හොති නිබ්බාණා විඝාතස්සෙව භාගවා.

7. ගාමෙ වා යදි වා, රඤ්ඤෙ අලද්ධා සමමත්තනො,[1]
පරෙති[2] බාලො දුම්මෙධො මක්ඛිකාහි පුරක්ඛතො.

8. යෙ ච සීලෙන සම්පන්නා පඤ්ඤායුපසමෙ රතා,
උපසන්තා සුඛං සෙන්ති නාසයිත්වාන මක්ඛිකාති.

### 3. 3. 3. 7.

**[සාවත්ථි නිදානං:]**

27. අථ ඛො ආයස්මා **අනුරුද්ධො** -පෙ- භගවන්තං එතදවොච: ඉධාහං භන්තෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන යෙභුය්‍යෙන පස්සාමි මාතුගාමං කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජමානං.

කතීහි නු ඛො භන්තෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති?

තීහි ඛො අනුරුද්ධ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

---

1. පත්තකා - මජසං 2. චරෙති - මජසං.

"මහණ, මහණ, තෝ ආත්මය නහමක් ඉදුල් කරව, මහණ, ඉදුල් කළ, ක්‍රෝධ සඞ්ඛ්‍යාත ආමගන්ධයෙහි තෙත් වූ ඒ ආත්මය කෙලෙස්මැස්සෝ නැගී ලුහු නො බඳිති, ලුහු බැඳ නො කති යන තෙල කරුණ ඒකාන්තයෙන් නොවේ" යි කියා යි.

මහණෙනි, එක්බිති ඒ මහණ මා විසින් මේ අවවාදයෙන් අවවාද කරණ ලදුයේ සංවේගයට පැමිණියේ.

මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය: වහන්ස, 'ඉදුල' යනු කිම? 'ආමගන්ධ' යනු කිම? 'මැසි' යනු කිම?

මහණ, අභිධ්‍යාව ඉදුල. ව්‍යාපාදය ආමගන්ධය. පාපක අකුශල විතර්කයෝ මැස්සහ. මහණ, ඉදුල් කළ ක්‍රෝධ සඞ්ඛ්‍යාත ආමගන්ධයෙහි තෙත් වූ ඒ ආත්මය "කෙලෙස්මැස්සන් නැගී ලුහු නො බඳිති යි ලුහු බැඳ නො කති යි" යන තෙල කරුණ ඒකාන්තයෙන් සිදු නොවෙයි.

5. චක්ඛුශ්‍රොත්‍ර දෙක්හි කළ ගොපන නැති, ඉන්ද්‍රියයෙහි අසංවෘත වූ මහණහු රාගනිඃශ්‍රිත සංකල්පාඛ්‍ය මක්ෂිකාවෝ ලුහු බැඳ ගණිත්.

6. කෙලශාඛ්‍ය ආමගන්ධයෙහි තෙත් ව සිටුනා එසින් ම ඉදුල් කළ මහණ නිවණින් විදුර වෙයි. සංසාරදුඃඛයට ම භාගී වෙයි.

7. ගමෙහි වේවයි, නොහොත් වනයෙහි වේවයි, තමහට සමයක්නු නොලැබ දුෂ්ප්‍රාඥ වූ අඳබල් මහණ කෙලෙස්මැස්සන් විසින් පුරස්කෘත ව යෙයි.

8. යම් මහණහු ශීලසම්පන්න වෙත් ද, ප්‍රඥයෙන් කෙලශව්‍යපශමයෙහි නිරත වෙත් ද, උපශාන්ත වූ ඒ මහණහු කෙලෙස්මැස්සන් නසා පියා සුවසේ හොවිත්.

## 3. 3. 3. 7.

### [සැවැත් නිදානයි:]

27. එසඳ ආයුෂ්මත් **අනුරුද්ධ** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළහ: වහන්ස, මම විශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටුනා දිවැසින් කාබුන් මරණින් මතුයෙහි සුවයෙන් පහව සිටි නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹ සිටුනා මාගම් භූයොභාවයෙන් දක්මි.

වහන්ස, කෙතෙක් දහම්න් සමන්වාගත මාගම කාබුන් මරණින් මතුයෙහි සුවයෙන් පහ වූ නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹේ ද?

අනුරුද්ධය, දහම් තුණෙකින් සමන්වාගත වූ මාගම කාබුන් මරණින් මතුයෙහි සුවයෙන් පහව සිටි නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙයි.

කතමෙහිති හි ?

ඉධ අනුරුද්ධ මාතුගාමො පුබ්බණ්හසමයං මච්ඡෙරමලපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති. මජ්ඣන්තිකං සමයං ඉස්සාපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති. සායන්හසමයං කාමරාගපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති.

ඉමෙහි ඛො අනුරුද්ධ තීහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

## 3. 3. 3. 8.

අථ ඛො ආයස්මා අනුරුද්ධො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා අනුරුද්ධො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

ඉධාහං ආවුසො සාරිපුත්ත, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සහස්සං ලොකං ඔලොකෙමි. ආරද්ධං ඛො පන මෙ විරියං අසල්ලීනං. උපට්ඨිතා සති අපම්මුට්ඨා. පස්සද්ධො කායො අසාරද්ධො. සමාහිතං චිත්තං එකග්ගං. අථ ච පන මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චතීති

[සාරිපුත්තො:]

යං ඛො තෙ ආවුසො අනුරුද්ධ එවං හොති: 'එවාහං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සහස්සං ලොකං ඔලොකෙමී'ති ඉදන්තෙ මානස්මිං.

යම්පි තෙ ආවුසො අනුරුද්ධ එවං හොති: 'ආරද්ධං ඛො පන මෙ විරියං අසල්ලීනං. උපට්ඨිතා සති අපම්මුට්ඨා. පස්සද්ධො කායො අසාරද්ධො. සමාහිතං චිත්තං එකග්ගන්ති' ඉදන්තෙ උද්ධච්චස්මිං.

යම්පි තෙ ආවුසො අනුරුද්ධ එවං හොති: 'අථ ච පන මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චතී'ති ඉදන්තෙ කුක්කුච්චස්මිං.

සාධු වතායස්මා අනුරුද්ධො ඉමෙ තයො ධම්මෙ පහාය ඉමෙ තයො ධම්මෙ අමනසිකරිත්වා අමතාය ධාතුයා චිත්තං උපසංහරතූති.

අථ ඛො ආයස්මා අනුරුද්ධො අපරෙන සමයෙන ඉමෙ තයො ධම්මෙ පහාය ඉමෙ තයො ධම්මෙ අමනසි කරිත්වා අමතාය ධාතුයා චිත්තං උපසංහරි. අථ ඛො ආයස්මා අනුරුද්ධො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා"ති අබ්භඤ්ඤාසි අඤ්ඤතරො ච පනායස්මා අනුරුද්ධො අරහතං අහොසීති.

1. සමන්තමිච්ඡනතො - මජසං. 3. අහං - මජසං - PTS

කවර දහම් තුනෙකින යත්:

අනුරුද්ධය, මෙ ලොව මාගම පෙරවරු වේලෙහි මසුරුමලින් මඩනා ලද සිතින් ගෙහි වෙසෙයි. මධ්‍යාහ්න වේලෙහි ඊර්ෂ්‍යායෙන් මැඩුනු සිතින් ගෙහි වෙසෙයි. සවස් වේලෙහි කාමරාගයෙන් මැඩුනු සිතින් ගෙහි වෙසේ.

අනුරුද්ධය, මේ තුන් දහමින් සමන්‍වාගත මාගම කාබුන් මරණින් මතු-යෙහි සුවයෙන් පයාව සිටි නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට එළඹෙයි.

## 3. 3. 3. 8.

28. එකල ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණු-වන් කරා එළඹිය හ. එළඹ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් හා සමග සතුටු වූහ. සතුටට හේතු වූ සිහි කළ යුතු වූ කථාව කොට නිමවා එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙල සැළ කළහ:

කියග ශාරිපුත්‍රයෙනි, මම පිරිසිදු වූ මිනිසැස ඉක්ම සිටුනා දිවැසින් සහස්‍රලෝකය බලමි. මා විසින් වීර්‍ය්‍ය ඇරඹිත. නොසැඟවිත. සම්‍ෘතිය එළඹ සිටුනීය. මුෂිත නොවූවාය. නාමිකය සංහිඳිත. සාරද්ධ රහිතය. සිත සමාහිතය. එකඟය. එහෙත් මාගේ සිත උපාදනවශයෙන් නොගෙණ ආස්‍රවයන් කෙරෙන් නොමිදෙයි.

[සැරියුත්:]

කියග අනුරුද්ධය, යම් හෙයෙකින් තොපට මෙසින් වේ ද: 'මෙසේ මම විශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටුනා දිවැසින් සහස්‍රලෝකය බලමි' යි. මේ තොපගේ මානය යි.

ඇවැත අනුරුද්ධය, යම් හෙයෙකින් තොපට මෙසින් වේ ද: 'මා විසින් වීර්‍ය්‍ය අරඹන ලදී. නොසැඟවිත. සම්‍ෘතිය එළඹ සිටුනීය. ප්‍රමුෂිත නො වූවාය. නාමිකය සංහිඳිත, සාරද්ධ රහිතය, සිත සමාහිතය, එකඟය' යි. මේ තොපගේ උද්ධතභාවය වේ.

ඇවැත අනුරුද්ධය, යම් හෙයෙකින් තොපට මෙබඳු සිතෙක් වේ ද: 'එහෙත් මාගේ සිත උපාදනවශයෙන් නොගෙණ අස්‍රවයන් කෙරෙන් නො මිදෙයි' යි. මේ තොපගේ කුකුසෙකි.

ඇවැත් අනුරුද්ධ තෙරණුවෝ මේ තුන් දහම් හැරපියා මේ තුන් දහම් නො මෙනෙහි කොට නිර්වාණධාතුවට සිත එළවත් නම් මනාම ය

එක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ පසුකලෙක මේ තුන් දහම් හැරපියා, මේ තුන් දහම් නො මෙනෙහි කොට නිර්වාණධාතුවට සිත එළවූහ. එක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ එකලා වූවාහු වෙන්වූවාහු අප්‍රමත්ත වූවාහු කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තාහු කායජීවිත නිරපෙක්‍ෂව වසන්නාහු යම් අර්ථත්ත්වයක් පිණිස කුලපුත්‍රයෝ මොනොවට ගිහිගෙන් නික්ම පැවිද්දට යෙත් ද, ශාසන බ්‍රහ්මචර්‍ය්‍යය අවසන් වූ ඒ අර්ථත්ත්වය මඳ කලෙකින් ම ඉහාත්ම යෙහි ම තුමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ඊට එළඹ විසූහ. "ජාතිය ක්‍ෂය විය. බඹසර වැස නිමවිත. සිවුමඟ කිස කරණ ලදී. මේ අර්ථත්ත්වය පිණිස මින් බැහැර දෑයෙක් නැති" යි දත්හ. ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ රහතුන් අතුරෙන් අන්‍යතර කෙනෙක් ද වූහ.

### 3. 3. 3. 9.

29. තීණිමානි භික්ඛවෙ පටිච්ඡන්නානි වහන්ති නො විවටානි.

කතමානි තීණි:?

මාතුගාමො භික්ඛවෙ පටිච්ඡන්නො වහති නො විවටො. බ්‍රාහ්මණානං භික්ඛවෙ මන්තා පටිච්ඡන්නා වහන්ති නො විවටා. මිච්ඡාදිට්ඨි භික්ඛවෙ පටිච්ඡන්නා වහති නො විවටා.

ඉමානි ඛො භික්ඛවෙ තීණි පටිච්ඡන්නානි වහන්ති නො විවටානි.

තීණිමානි භික්ඛවෙ විවටානි විරොචන්ති. නො පටිච්ඡන්නානි.

කතමානි තීණි.?

චන්දමණ්ඩලං භික්ඛවෙ විවටං විරොචති නො පටිච්ඡන්නං. සූරියමණ්ඩලං භික්ඛවෙ විවටං විරොචති නො පටිච්ඡන්නං. තථාගතප්පවෙදිතො ධම්මවිනයො භික්ඛවෙ[1] විවටො විරොචති නො පටිච්ඡන්නො.

ඉමානි ඛො භික්ඛවෙ තීණි විවටානි විරොචන්ති නො පටිච්ඡන්නානීති

### 3. 3. 3. 10.

30. තයො මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං

කතමෙ තයො: පාසාණලෙඛූපමො පුග්ගලො, පඨවිලෙඛූපමො පුග්ගලො, උදකලෙඛූපමො පුග්ගලො.

කතමො ච භික්ඛවෙ පාසාණලෙඛූපමො පුග්ගලො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති. සො ච ඛ්වස්ස කොධො දීඝරත්තං අනුසෙති. සෙය්‍යථාපි භික්ඛවෙ පාසාණෙ ලෙඛා[2] න ඛිප්පං ලුජ්ජති වාතෙන වා උදකෙන වා, චිරට්ඨිතිකා හොති. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති. සො ච ඛ්වස්ස කොධො දීඝරත්තං අනුසෙති. අයං වුච්චති භික්ඛවෙ පාසාණලෙඛූපමො පුග්ගලො.

කතමො ච භික්ඛවෙ පඨවිලෙඛූපමො පුග්ගලො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති. සො ච ඛ්වස්ස කොධො න දීඝරත්තං අනුසෙති. සෙය්‍යථාපි භික්ඛවෙ පඨවියං ලෙඛා ඛිප්පං ලුජ්ජති වාතෙන වා උදකෙන වා, න චිරට්ඨිතිකා හොති. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති. සො ච ඛ්වස්ස කොධො න දීඝරත්තං අනුසෙති. අයං වුච්චති භික්ඛවෙ පඨවිලෙඛූපමො පුග්ගලො.

1 තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො-මිලින්දපඤ්හ. 2. පාසාණ ලෙඛා - සී. මු.

## 3. 3. 3. 9.

29. මහණෙනි, මේ කාරණයෝ තුන් දෙනෙක් පිළිසන්ව වහත්. විවෘත ව නො වහත්.

කවර තුන්දෙනෙක යත්:

මහණෙනි, මාගම පිළිසන්ව වහයි. විවෘතව නොවහයි. මහණෙනි, බමුණන්ගේ වෙදමන්ත්‍රයෝ පිළිසන්ව වහත්. විවෘතව නො වහත්. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය පිළිසන්ව වහයි. විවෘතව නොවහයි.

මහණෙනි, මේ කාරණයෝ තුන් දෙන පිළිසන්ව වහත්. විවෘතව නො වහත්.

මහණෙනි, මේ කාරණයෝ තිදෙනෙක් විවෘතව බබලත්, පිළිසන්ව නො බබලත්.

කවර තුන් දෙනෙක යත්:

මහණෙනි, සඳමඬල විවෘතව බබලයි. පිළිසන්ව නො බබලයි. මහණෙනි, හිරුමඬල විවෘත ව බබලයි. පිළිසන් ව නො බබලයි. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් වදාළ ධර්මවිනය විවෘත ව බබලයි. පිළිසන් ව නො බබලයි.

මහණෙනි, මේ කාරණයෝ තිදෙන විවෘතව බබලත්. පිළිසන් ව නො බබලත්.

## 3. 3. 3. 10.

30. මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙනෙක් විද්‍යමානය හ.

කවර තුන් දෙනෙක යත්: ශිලාලේඛාවට බඳු පුද්ගලය, පෘථිවිලේඛාවට බඳු පුද්ගලය, ජලලේඛාවට බඳු පුද්ගල යි.

මහණෙනි, ශිලාලේඛාවට බඳු පුද්ගල කවරේය යත්:

මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් නිරතුරු කිපෙයි. ඔහුගේ ඒ කෝපය දීර්ඝරාත්‍රයෙහි ලුහුබැඳ වැටෙයි. මහණෙනි, යම් පරිදි ශිලාලේඛාව වාතයෙන් වේවයි, උදකයෙන් වේවයි වහා නොනස්නී ද, චිරස්ථායිනී වේ ද, මහණෙනි, එපරිදි ම මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් නිරතුරු කිපෙයි. ඔහුගේ ඒ ක්‍රෝධය ද දීර්ඝරාත්‍රයෙහි ලුහුබැඳ වැටෙයි. මහණෙනි, මේ ශිලාලේඛාවට බඳු පුද්ගල යි කියනු ලැබේ.

මහණෙනි, පෘථිවිලේඛාවට බඳු පුද්ගලයා කවරේය යත්:

මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් නිරතුරු කිපෙයි. ඔහුගේ ඒ ක්‍රෝධය නිරතුරු ලුහු බැඳ නො වැටේ. මහණෙනි, යම් පරිදි පොළොවෙහි ඇඳි ලේඛාව වාතයෙන් වේවයි, උදකයෙන් වේවයි වහා නස්නී ද, චිරස්ථායිනී නො වේ ද, මහණෙනි, එ පරිදි ම මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් නිරතුරු කිපෙයි. ඔහුගේ ඒ ක්‍රෝධය දීර්ඝරාත්‍රයෙහි ලුහු බැඳ නො වැටෙයි. මහණෙනි, මේ පෘථිවිලේඛාවට බඳු පුද්ගල යි කියනු ලැබේ.

කතමො ච භික්ඛවෙ උදකලෙඛූපමො පුග්ගලො?

ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො ආගාළ්හෙනපි වුච්චමානො ඵරුසෙනපි වුච්චමානො අමනාපෙනපි වුච්චමානො සන්ධියති චෙව, සංසන්දති චෙව, සම්මොදති චෙව. සෙය්‍යථාපි භික්ඛවෙ උදකෙ ලෙඛා ඛිප්පං යෙව පටිවිගච්ඡති, න චිරට්ඨිතිකා හොති. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො ආගාළ්හෙනපි වුච්චමානො ඵරුසෙනපි වුච්චමානො අමනාපෙනපි වුච්චමානො සන්ධියති චෙව සංසන්දති චෙව සම්මොදති චෙව. අයං වුච්චති භික්ඛවෙ උදකලෙඛූපමො පුග්ගලො.

ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

භරණ්ඩුවග්ගො තතියො.

## [4. යොධාජීවවග්ගො]

### 3. 3. 4. 1.

**[සාවත්ථි නිදානං:]**

31. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො යොධාජීවො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

කතමෙහි තීහි?

ඉධ භික්ඛවෙ යොධාජීවො දූරෙ පාතී ච හොති, අක්ඛණවෙධී ච, මහතො ච කායස්ස පදාලෙතා. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො යොධාජීවො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

කතමෙහි තීහි?

ඉධ භික්ඛවෙ භික්ඛු දූරෙ පාතී ච හොති. අක්ඛණවෙධී ච මහතො ච කායස්ස පදාලෙතා.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු දූරෙ පාතී හොති?

ඉධ භික්ඛවෙ භික්ඛු යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා සබ්බං රූපං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යා කාචි වෙදනා අතීතානාගත පච්චුප්පන්නා අජ්ඣත්තිකා වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ වා සන්තිකෙ වා සබ්බං වෙදනං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යා කාචි සඤ්ඤා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තා වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ සන්තිකෙ වා සබ්බං සඤ්ඤං "නෙතං මම, නෙසොහමස්මි, න මෙ සො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යෙ කෙචි සඞ්ඛාරා අතීතානාගත පච්චුප්පන්නා අජ්ඣත්තිකා වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යෙ දූරෙවා සන්තිකෙ වා සබ්බෙ සඞ්ඛාරෙ "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙවා සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. එවං ඛො භික්ඛවෙ භික්ඛු දූරෙ පාතී හොති.

---

1. සබ්බංසඤ්ඤං - මජසං.

මහණෙනි, උදකලේඛාවට බඳු පුද්ගල කවරේය යත්:

මහණෙනි, මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් කැකුළෙන් කියනු ලබන්නේත් පරුස්බසින් කියනු ලබන්නේත් මන නොගන්නා බසින් කියනු ලබන්නේත් ගැළපෙන්නේ ම වෙයි. සැසඳෙන්නේ ම වෙයි. සතුටු වන්නේ ම වෙයි. මහණෙනි, යම් පරිදි දියෙහි ඇඳි ලේඛාව වහා ම පහව යේ ද, චිරස්ථායිනී නො වේ ද, මහණෙනි, එ පරිදි ම මෙ ලොව ඇතැම් පුද්ගලයෙක් කැකුළෙනුදු කියනු ලබන්නේ පරුස්බසිනුදු කියනු ලබන්නේ මන නොගන්නා බසිනුදු කියනු ලබන්නේ ගැළපේ ම ය. සැසඳේ ම ය. සතුටු වේ ම ය. මහණෙනි, මේ උදලේඛාවට බඳු පුද්ගල යි කියනු ලැබේ.

මහණෙනි, මේ පුද්ගලයෝ තුන් දෙන ලෝකයෙහි විද්‍යමානයහ.

**තුන්වැනි හරණ්ඩු වග්ග යි.**

## [ 4. යොධාජීව වග්ගය ]

**3. 3. 4. 1.**

**[සැවැත් නිදානයි:]**

31. මහණෙනි, අඞ්ග තුණෙකින් සමන්වාගත යොධාජීව රජාර්හ වෙයි. රාජභොග්‍ය වෙයි. රජුගේ අවයවයෙක් ම ය යි ගණනට යෙයි. කවර අඞ්ග තුණෙකින යත්:

මහණෙනි, මෙලොව යොධාජීව දුරෙහි ඊය හෙළන සුළු වෙයි. විදුලි-යෙන් විදින සුළු වෙයි. ලොහොපට ආදි මහත් කය බිඳින සුළු වෙයි. මහණෙනි, මේ තුන් අඟින් සමන්වාගත යොධාජීව රජුට නිසි වෙයි. රජු විසින් උපභෝග කටයුතු වෙයි. රජුගේ අවයවයෙක් ම ය යි ගණනට යෙයි.

මහණෙනි, එපරිදි ම අඞ්ග තුණෙකින් සමන්වාගත මහණ ආහුන සඞ්ඛ්‍යාත පූජාවට නිසි ය ... ලෝකයට අනුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍ර ද වෙයි.

කවර අඞ්ග තුණෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ දූරෙපාතීත් වෙයි, අක්ඛණවෙධීත් වෙයි, මහත් කය බිඳුනේත් වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ දූරෙපාතී වේ ද?

මහණෙනි, මෙ සස්නෙහි මහණ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වේවයි, ආධ්‍යාත්මික වේවයි, බාහ්‍ය වේවයි, ඖළාරික වේවයි, සියුම් වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි, දූරෙහි වේවයි, ළඟෙහි වේවයි යම් කිසි රූපායතන-යෙක් ඇද්ද, එහැම රූප “තෙල මා ගැත්තේ නො වෙයි. මම් හේ නොවෙමි. හේ මා විසිය නො වැටෙ” යි මෙසේ මෙය තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥයෙන් දක්නේ ය. අතීතානාගතප්‍රත්‍යුත්පන්න වේවයි, ආධ්‍යාත්මික වේවයි, බාහ්‍ය වේවයි, ඖළාරික වේවයි, සියුම් වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි, දූරෙහි වේවයි, ළඟෙහි වේවයි යම් කිසි වේදනා ඇද්ද ... අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වේවයි, ආධ්‍යාත්මික වේවයි, බාහ්‍ය වේවයි, ඖළාරික වේවයි, සියුම් වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි, දූරෙහි වේවයි, ළඟෙහි වේවයි යම් කිසි සංඥ ඇද්ද, එනැම සංඥ “තෙල මාගේ නො වෙයි, මම හේ නො වෙමි. හේ මාගේ ආත්ම නොවෙ” යි මෙසේ මෙය තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥයෙන් දක්නේ ය. අතීතානාගතප්‍රත්‍යුත්පන්න වේවයි, ආධ්‍යාත්මික වේවයි, බාහ්‍ය වේවයි, ඖළාරික වේවයි, සියුම් වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි, දූරෙහි වේවයි, ළඟෙහි වේවයි යම් කිසි සංස්කාර ඇද්ද “තෙල මාගේ නොවෙයි. මම හේ නොවෙමි. හේ මාගේ ආත්ම නොවෙ”යි මෙසේ තත්වූ පරිදි සම්‍යක්ප්‍රඥ-යෙන් දක්නේය. අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වේවයි, ආධ්‍යාත්මික වේවයි, බාහ්‍ය වේවයි, ඖළාරික වේවයි, සියුම් වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි, දූරෙහි වේවයි, ළඟෙහි වේවයි යම් කිසි විඥන ඇද්ද, එහැම විඥන “තෙල මාගේ නො වෙයි, මම හේ නො වෙමි. හේ මාගේ විසිය නො වැටෝ”යි මෙසේ මෙය තත් වූ පරිදි සම්‍යක් ප්‍රඥයෙන් දක්නේ ය. මහණෙනි, මෙසේ මහණ දූරෙපාතී වෙයි.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු අක්ඛණවෙධී හොති?

ඉධ භික්ඛවෙ භික්ඛු "ඉදං දුක්ඛ"න්ති යථාභූතං පජානාති. "අයං දුක්ඛසමුදයො"ති යථාභූතං පජානාති. "අයං දුක්ඛනිරොධො"ති යථාභූතං පජානාති. "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු අක්ඛණවෙධී හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු මහතො කායස්ස පදාලෙතා හොති?

ඉධ භික්ඛවෙ භික්ඛු මහන්තං අවිජ්ජාක්ඛන්ධං පදාලෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු මහතො කායස්ස පදාලෙතා හොතීති.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

### 3. 3. 4. 2.

32. තිස්සො ඉමා භික්ඛවෙ පරිසා.

කතමා තිස්සො?

උක්කාචිතවිනීතා පරිසා, පටිපුච්ඡාවිනීතා පරිසා, යාවතාවිනීතා[1] පරිසා.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො පරිසාති.

### 3. 3. 4. 3.

33. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො මිත්තො සෙවිතබ්බො.

කතමෙහි තීහි?

දුද්දදං දදාති, දුක්කරං කරොති, දුක්ඛමං ඛමති.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො මිත්තො සෙවිතබ්බොති.

### 3. 3. 4. 4.

34. උප්පාදා වා භික්ඛවෙ තථාගතානං අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා"ති. තං තථාගතො අභිසම්බුජ්ඣති අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා"ති.

උප්පාදා වා භික්ඛවෙ තථාගතානං අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා"ති. තං තථාගතො අභිසම්බුජ්ඣති අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා"ති.

---

1. යාවතජ්ඣවිනීතා - අට්ඨකථා; යාවතා ච විනීතා, පාඨන්තරං - අට්ඨකථා.

මහණෙනි, කෙසේ මහණ අකඛණවෙඩී වේ ද?

මහණෙනි, මෙසස්නෙහි මහණ "මේ දුකැ" යි තත් වූ පරිදි දනී. "මේ දුක්ඛසමුදය (දුක් උපදවන හේතු)"යි තත් වූ පරිදි දනී. "මේ දුක්ඛ-නිරොධය (දුක් නැතිවීමය)"යි තත් වූ පරිදි දනී. "මේ දුක්ඛනිරොධගාමිනී පටිපදය"යි තත් වූ පරිදි දනී. මහණෙනි, මෙසේ මහණ අකඛණවෙධී වෙයි.

මහණෙනි, කෙසේ මහණ මහත් කය බිඳුනේ වේ ද?

මහණෙනි, මෙ සස්නෙහි මහණ මහත් අවිද්‍යාස්කන්ධය බිඳුනේ වෙයි. මහණෙනි, මෙසේ මහණ මහත් කය බිඳුනේ වෙයි.

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත මහණ ආහුත සඞ්ඛ්‍යාත පූජාවට නිසි වෙයි ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වෙයි.

### 3. 3. 4. 2.

32. මහණෙනි, මේ පසිඳ්හු තුන් දෙනෙකි.

කවර තුන් දෙනෙක යත්:

නො පිළිවිස විනීත හෙයින් දුර්විනීත පසිඳ්ය, පිළිවිස විනීත හෙයින් සුවිනීත පසිඳ්ය, පමණ විසින් විනීත හෙයින් ප්‍රමාණවත් සේ විනීත පසිඳ්ය (අදහස් දත විනීත පසිඳ්ය).

මහණෙනි, මේ තුන් පසිඳ්හු යි.

### 3. 3. 4. 3.

33. මහණෙනි, අඞ්ග තුණෙකින් සමන්‍වාගත මිත්‍රයා සෙවියයුතු යි.

කවර අඞ්ග තුණෙකින යත්:

නොදියහෙත දුය දෙයි. නොකටහැකි දුය කෙරේ. නොසිහියහෙත දුය සෙහේ.

මහණෙනි, මේ අඞ්ග තුණෙන් සමන්‍වාගත මිත්‍රයා සෙවියයුතු ය.

### 3. 3. 4. 4.

34. මහණෙනි, තථාගතයන් වහන්සේගේ උපතින් හෝ තථාගතයන් වහන්සේගේ නූපතින් හෝ "සියලු සංස්කාරයෝ අනිත්‍යයහ" යන ඒ ධම්ධාතුව ස්වභාවසපිතිතාව ස්වභාවනියාමතාව සිටියා ම වෙයි. තථාගතයන් වහන්සේ එය අවබෝධ කෙරෙති, අභිසමය කෙරෙති. අවබෝධ කොට අභිසමය කොට "සියලු සංසකාරයෝ අනිත්‍යයහ" යි වදරත්, දෙසත්, පණවත්, ප්‍රකාරයෙන් පිහිටුවත්, විවරණ කෙරෙත්, විභාග කෙරෙත්, ආවිර්භූත කෙරෙත්.

මහණෙනි, තථාගතයන් වහන්සේගේ උපතින් හෝ තථාගතයන් වහන්සේගේ නූපතින් හෝ "සියලු සංසකාරයෝ දුඃඛයහ" යන ඒ ධම්ධාතුව සවභාවසපිතිතාව, සවභාවනියාමතාව සිටියා ම වෙයි. තථාගතයන් වහන්සේ එය අවබෝධ කෙරෙති, අභිසමය කෙරෙති. අවබෝධ කොට අභිසමය කොට "සියලු සංසකාරයෝ දුඃඛයහ" යි වදරත්, දෙසත්, පණවත්, ප්‍රකාරයෙන් තබත්, විවරණ කෙරෙත්, විභාග කෙරෙත්, ආවිර්භූත කෙරෙත්.

උප්පාදා වා භික්ඛවෙ තථාගතානං අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා "සබ්බෙ ධම්මා අනත්තා"ති. තං තථාගතො අභිසම්බුජ්ඣති අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානී කරොති "සබ්බෙ ධම්මා අනත්තා"ති.

## 3. 3. 4. 5.

35. සෙය්‍යථාපි භික්ඛවෙ යානි කානිචි තන්තාවුතානං වත්ථානං කෙසකම්බලො තෙසං පාවාරානං පතිකිට්ඨො අක්ඛායති. කෙසකම්බලො භික්ඛවෙ සීතෙ සීතො, උණ්හෙ උණ්හො, දුබ්බණ්ණො දුග්ගන්ධො දුක්ඛසම්ඵස්සො. එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි පුථුසමණප්පවාදානං[1] මක්ඛලිවාදො තෙසං පතිකිට්ඨො[2] අක්ඛායති.

මක්ඛලී භික්ඛවෙ මොඝපුරිසො එවංවාදී එවංදිට්ඨී: "නත්ථි කම්මං, නත්ථි කිරියං, නත්ථි විරිය"න්ති.

යෙපි තෙ භික්ඛවෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙපි භගවන්තො කම්මවාදා චෙව අහෙසුං කිරියවාදා ච විරියවාදා ච. තෙපි භික්ඛවෙ මක්ඛලී මොඝපුරිසො පටිබාහති: "නත්ථි කම්මං, නත්ථි කිරියං, නත්ථි විරිය"න්ති.

යෙපි තෙ භික්ඛවෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙපි භගවන්තො කම්මවාදා චෙව භවිස්සන්ති කිරියවාදා ච විරියවාදා ච. තෙපි භික්ඛවෙ මක්ඛලී මොඝපුරිසො පටිබාහති: "නත්ථි කම්මං, නත්ථි කිරියං, නත්ථි විරිය"න්ති.

අහම්පි භික්ඛවෙ එතරහි අරහං සම්මාසම්බුද්ධො කම්මවාදො ච කිරියවාදො ච විරියවාදො ච. මම්පි භික්ඛවෙ මක්ඛලී මොඝපුරිසො පටිබාහති: 'නත්ථි කම්මං, නත්ථි කිරියං, නත්ථි විරිය"න්ති

සෙය්‍යථාපි භික්ඛවෙ නදීමුඛෙ ඛිප්පං ඔඩ්ඩෙය්‍ය[3] බහුන්නං[4] මච්ඡානං අහිතාය දුක්ඛාය අනයාය ව්‍යසනාය. එවමෙව ඛො භික්ඛවෙ මක්ඛලී මොඝපුරිසො මනුස්සඛිප්පං මඤ්ඤෙ ලොකෙ උප්පන්නො බහුන්නං සත්තානං අහිතාය දුක්ඛාය අනයාය ව්‍යසනායාති.

## 3. 3. 4. 6.

36. තිස්සො ඉමා භික්ඛවෙ සම්පදා.

කතමා තිස්සො: සද්ධාසම්පදා සීලසම්පදා පඤ්ඤාසම්පදා.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො සම්පදාති.

---

1 පුථුසමණබ්‍රාහ්මණවාදානං - මජසං 2 පටිකිට්ඨො - මජසං.
3. ඛිප්පං උඩ්ඩෙය්‍ය - මජසං 4. බහූනං - මජසං.

මහණෙනි, තථාගතයන් වහන්සේගේ උපතින් හෝ තථාගතයන් වහන්සේගේ නූපතින් හෝ "සියලු ධර්මයෝ අනාත්මයහ"යි යන ඒ ධර්මධාතුව සවභාවසථිතිතාව සවභාවනියාමතාව සිටියා ම වෙයි. තථාගතයන් වහන්සේ එය අවබෝධ කෙරෙත්. අභිසමය කෙරෙත්. අවබෝධ කොට අභිසමය කොට "සියලු ධර්මයෝ අනාත්මයහ"යි වදාරත්, දෙසත්, පණවත්, ප්‍රකාරයෙන් තබත්, විවරණ කෙරෙත්, විභාග කෙරෙත්, ආවිර්භූත කෙරෙත්.

## 3. 3. 4. 5.

35. මහණෙනි, යම් පරිදි යම් කිසි හුයින් වියූ වස්ත්‍රයෝ ඇද්ද, ඒ පවුරු අතුරෙන් කේසකම්බලය නිකෘෂටය යි කියනු ලැබේ. මහණෙනි, කේසකම්බලය ශීතකාලයෙහි ශීතය, උෂණකාලයෙහි උෂණය, දුර්වර්ණය, දුර්ගන්ධය, දුඃඛස්පර්ශ ඇත්තේ ය. මහණෙනි, එපරිදි ම යම් කිසි මහත් ශ්‍රමණප්‍රවාදයෝ ඇද්ද, ඔවුනතුරෙන් මක්ඛලිවාදය නිකෘෂටය යි කියනු ලැබේ.

මහණෙනි, මක්ඛලී මූඪ පුරුෂ මෙබඳු වාද ඇතියේ වෙයි මෙබඳු දෘෂ්ටි ඇතියේ වෙයි: "කර්මයෙක් නැත, ක්‍රියායෙක් නැත, වීර්යයෙක් නැත" කියා යි.

මහණෙනි, අතීතයෙහි යම් ම අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වූහු ද ඒ භාග්‍යවත්හුදු කර්මවාද ඇතිවූහු ද ක්‍රියාවාද ඇතිවූහු ද වීර්යවාද ඇතිවූහු ද වූහු. මහණෙනි, මක්ඛලී මූඪ පුරුෂ ඒ බුදුවරුනුත් පිළිකෙව් කෙරෙයි: "කර්මයෙක් නැත, ක්‍රියායෙක් නැත, වීර්යයෙක් නැත" කියා යි.

මහණෙනි, අනාගතයෙහි යම් ම අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වෙත් ද ඒ භගවත්හුදු කර්මවාද ඇත්තාහු ද වෙත්. ක්‍රියාවාද ඇත්තාහු ද වෙත්. වීර්යවාද ඇත්තාහු ද වෙත්. මහණෙනි, මක්ඛලී මූඪ පුරුෂ ඒ බුදුවරුනුත් පිළිකෙව් කෙරේ: "කර්මයෙක් නැත, ක්‍රියායෙක් නැත, වීර්යයෙක් නැත" කියා යි.

මහණෙනි, මෙකල අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ මමත් කර්මවාද ඇතියෙම් ද වෙමි. ක්‍රියාවාද ඇතියෙම් ද වෙමි. වීර්යවාද ඇතියෙම් ද වෙමි. මහණෙනි, මක්ඛලී මූඪ පුරුෂ මාත් පිළිකෙව් කෙරෙයි: "කර්මයෙක් නැත, ක්‍රියායෙක් නැත, වීර්යයෙක් නැත" කියා යි.

මහණෙනි, යම් පරිදි නෝමුව කෙමිනක් බොහෝ මසුනට අහිත පිණිස දුක් පිණිස අනය පිණිස ව්‍යසනය පිණිස ගිල්වා තබා ද, මහණෙනි, එපරිදි ම මක්ඛලී මොඝපුරුෂයා බොහෝ සත්ත්වයන්ට අහිත පිණිස දුක් පිණිස අනය පිණිස ව්‍යසනය පිණිස ලෝකයෙහි උපන් මිනිස් කෙමිනක් වැන්න.

## 3. 3. 4. 6.

36. මහණෙනි, මේ සම්පත්හු තුන් දෙනෙකි.

කවර තුන් දෙනෙක යත්: ශ්‍රද්ධාසම්පදාය, ශීලසම්පදාය, ප්‍රඥාසම්පදා යි.

මහණෙනි, මේ තුන් සම්පත්හු යි.

3. 3. 4. 7.

37. තිස්සො ඉමා භික්ඛවෙ වුද්ධියො.

කතමා තිස්සො? සද්ධාවුද්ධි සීලවුද්ධි පඤ්ඤාවුද්ධි.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො වුද්ධියොති

3. 3. 4. 8.

38. තයො ච භික්ඛවෙ අස්සඛළුඞ්කෙ දෙසිස්සාමි තයො ච පුරිසඛළුඞ්කෙ. තං සුණාථ -පෙ-

කතමෙ ච භික්ඛවෙ තයො අස්සඛළුඞ්කා?

ඉධ භික්ඛවෙ එකච්චො අස්සඛළුඞ්කො ජවසම්පන්නො හොති, න වණ්ණසම්පන්නො න ආරොහපරිණාහසම්පන්නො. ඉධ පන භික්ඛවෙ එකච්චො අස්සඛළුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච, න ආරොහපරිණාහසම්පන්නො. ඉධ පන භික්ඛවෙ එකච්චො අස්සඛළුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච. ඉමෙ ඛො භික්ඛවෙ තයො අස්සඛළුඞ්කා.

කතමෙ ච භික්ඛවෙ තයො පුරිසඛළුඞ්කා?

ඉධ භික්ඛවෙ එකච්චො පුරිසඛළුඞ්කො ජවසම්පන්නො හොති, න වණ්ණසම්පන්නො න ආරොහපරිණාහසම්පන්නො. ඉධ පන භික්ඛවෙ එකච්චො පුරිසඛළුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච, න ආරොහපරිණාහසම්පන්නො. ඉධ පන භික්ඛවෙ එකච්චො පුරිසඛළුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච.

කථඤ්ච භික්ඛවෙ පුරිසඛළුඞ්කො ජවසම්පන්නො හොති, න වණ්ණසම්පන්නො න ආරොහපරිණාහසම්පන්නො?

ඉධ භික්ඛවෙ භික්ඛු "ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයො"ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධො"ති යථාභූතං පජානාති. "අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං පජානාති. ඉදමස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො සංසාදෙති නො විස්සජ්ජෙති. ඉදමස්ස න වණ්ණස්මිං වදාමි. න ඛො පන ලාභී හොති චීවරපිණ්ඩපාත සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. ඉදමස්ස න ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ පුරිසඛළුඞ්කො ජවසම්පන්නො හොති, න වණ්ණසම්පන්නො න ච ආරොහපරිණාහසම්පන්නො.

**3. 3. 4. 7.**

37. මහණෙනි, මේ වෘද්ධීහු තුන් දෙනෙකි.

කවර තුන් දෙනෙක යත්: ශ්‍රද්ධාවෘද්ධිය, ශීලවෘද්ධිය, ප්‍රඥාවෘද්ධි යි.

මහණෙනි, මේ තුන් වෘද්ධීහු යි.

**3. 3. 4. 8.**

38. මහණෙනි, තුන් අස්ගුණ්ඩයන් (පොව්වන්) දෙසම්. තුන් පුරිස්-ගුණ්ඩයනුදු (පොව්වනුදු) දෙසම්. ඒ අසව ...

මහණෙනි, තුන් අස්ගුණ්ඩයෝ කවරහ යත්:

මහණෙනි, මෙ ලොව ඇතැම් අස්ගුණ්ඩයෙක් ජවසම්පන්න වෙයි. වර්ණ-සම්පන්න නො වෙයි. ආරෝහපරිණාහ සම්පන්න නො ද වෙයි. මහණෙනි, මෙලොව ඇතැම් අස්ගුණ්ඩයෙක් ජවසම්පන්න ද වෙයි. වර්ණසම්පන්න ද වෙයි. ආරෝහපරිණාහ සම්පන්න නොවෙයි. මහණෙනි, මෙලොව ඇතැම් අස්ගුණ්ඩයෙක් ජවසම්පන්න ද වෙයි. වර්ණසම්පන්න ද වෙයි. ආරෝහ-පරිණාහසම්පන්න ද වෙයි. මහණෙනි, මේ තුන් අස්ගුණ්ඩයෝ යි.

මහණෙනි, තුන් පුරිස්ගුණ්ඩයෝ කවරහ යත්:

මහණෙනි, මෙලොව ඇතැම් පුරිස්ගුණ්ඩයෙක් ජවසම්පන්න වෙයි. වර්ණ-සම්පන්න නො වෙයි. ආරෝහපරිණාහ සම්පන්න නො ද වෙයි. මහණෙනි, මෙලොව ඇතැම් පුරිස්ගුණ්ඩයෙක් ජවසම්පන්න ද වෙයි. වර්ණසම්පන්න ද වෙයි. ආරෝහපරිණාහ සම්පන්න නො වෙයි. මහණෙනි, මෙලොව ඇතැම් පුරිස්ගුණ්ඩයෙක් ජවසම්පන්න ද වෙයි. වර්ණසම්පන්න ද වෙයි ආරෝහ-පරිණාහ සම්පන්න ද වෙයි.

මහණෙනි, කෙසේ නම් පුරිස්ගුණ්ඩයා ජවසම්පන්න වේ ද, වර්ණසම්පන්න නො වේ ද, ආරෝහපරිණාහසම්පන්න නො වේ ද?

මහණෙනි, මෙසස්නෙහි මහණ "මේ දුකැ"යි ඇතිසැටියෙන් දනී. "මේ දුක්ඛසමුදය" යි ඇතිසැටියෙන් දනී. "මේ දුක්ඛනිරෝධය" යි ඇති සැටියෙන් දනී. "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාය"යි ඇතිසැටියෙන් දනී. මේ ඔහුගේ ඥානජවය යි කියමි. අභිධර්මයෙහි අභිවිනයෙහි ප්‍රශ්න විචාරණ ලදුයේ අවසාදනය කෙරෙයි (පසුබසී.) නොවිසඳයි. මේ ඔහුගේ වර්ණය නොවෙති යි කියමි. චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාර නොලබන සුලු වෙයි. මේ ඔහුගේ ආරෝහපරිණාහ සම්පත් නො වෙති යි කියමි. මහණෙනි, මෙසේ පුරිස්ගුණ්ඩයා ජවසම්පන්න වෙයි. වර්ණසම්පන්න නො වෙයි. ආරොහපරිණාහසම්පන්න නො ද වෙයි.

කථඤ්ච භික්ඛවෙ පුරිසඛලුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණ-සම්පන්නො ච, න ආරොහපරිණාහසම්පන්නො?

ඉධ භික්ඛවෙ භික්ඛු "ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං පජානාති, ඉදමස්ස ජවස්මිං වදාමි: අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති නො සංසාදෙති. ඉදමස්ස වණ්ණස්මිං වදාමි. න ඛො පන[1] ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනා-සනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. ඉදමස්ස න ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ පුරිසඛලුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණ-සම්පන්නො ච, න ආරොහපරිණාහසම්පන්නො.

කථඤ්ච භික්ඛවෙ පුරිසඛලුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණ-සම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච?

ඉධ භික්ඛවෙ භික්ඛු "ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා"ති යථාභූතං පජානාති. ඉදමස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති, නො සංසාදෙති. ඉදමස්ස වණ්ණස්මිං වදාමි. ලාභී ඛො පන හොති චීවරපිණ්ඩපාතසෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. ඉදමස්ස ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ පුරිසඛලුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණ-සම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච.

ඉමෙ ඛො භික්ඛවෙ තයො පුරිසඛලුඞ්කාති.

### 3. 3. 4. 9.

39. තයො ච භික්ඛවෙ අස්සසදස්සෙ[2] දෙසිස්සාමි තයො ච පුරිසසදස්සෙ. තං සුණාථ -පෙ-

කතමෙ ච භික්ඛවෙ තයො අස්සසදස්සා?

ඉධ භික්ඛවෙ එකච්චො අස්සසදස්සො ජවසම්පන්නො හොති, න වණ්ණ-සම්පන්නො න ආරොහපරිණාහසම්පන්නො, ඉධ පන භික්ඛවෙ එකච්චො අස්සසදස්සො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච, න ආරොහ-පරිණාහසම්පන්නො. ඉධ පන භික්ඛවෙ එකච්චො අස්සසදස්සො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච. ඉමෙ ඛො භික්ඛවෙ තයො අස්සසදස්සා.

කතමෙ ච භික්ඛවෙ තයො පුරිසසදස්සා?

ඉධ භික්ඛවෙ එකච්චො පුරිසසදස්සො ජවසම්පන්නො හොති, න වණ්ණ-සම්පන්නො න ආරොහපරිණාහසම්පන්නො. ඉධ පන භික්ඛවෙ එකච්චො පුරිසසදස්සො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච, න ආරොහපරි-ණාහසම්පන්නො. ඉධ පන භික්ඛවෙ එකච්චො පුරිසසදස්සො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච.

---

1. න පන ලාභී හොති - මජ්ඣං. 2. අස්සපරස්සෙ - මජ්ඣං.

මහණෙනි, කෙසේ පුරිස්ගුණ්ඩයා ජවසම්පන්නත් වේ ද වර්ණසම්පන්නත් වේ ද, ආරොහපරිණාහසම්පන්න නො වේ ද?

මහණෙනි, මෙ සස්නෙහි මහණ "මේ දුකැ"යි යථාභූතය දනී ... "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය"යි යථාභූතය දනී. මේ ඔහුගේ ඥානජවය වෙති යි කියමි. අභිධර්මයෙහි අභිවිනයෙහි ප්‍රශ්න විචාරණ ලද්දුයේ විසඳයි. අවසාදනය නො කෙරෙයි. මේ ඔහුගේ වර්ණය වෙති යි කියමි. චීවර-පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාර නොලබන සුලු වෙයි. මේ ඔහුගේ ආරොහපරිණාහ සම්පත් නො වෙති යි කියමි. මහණෙනි, මෙසේ පුරිස් ගුණ්ඩයා ජවසම්පන්නත් වෙයි. වර්ණසම්පන්නත් වෙයි. ආරොහපරිණාහසම්පන්න නො වෙයි.

මහණෙනි, කෙසේ පුරිස්ගුණ්ඩයා ජවසම්පන්නත් වේ ද වර්ණ-සම්පන්නත් වේ ද ආරොහපරිණාහසම්පන්නත් වේ ද?

මහණෙනි, මෙ සස්නෙහි මහණ "මේ දුකැ"යි යථාභූතය දනී .. "මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය"යි යථාභූතය දනී. මේ ඔහුගේ ඥානජවය වෙතියි කියමි. අභිධර්මයෙහි අභිවිනයෙහි ප්‍රශ්න විචාරණ ලද්දුයේ විසඳයි. අවසාදනය නො කෙරෙයි. මේ ඔහුගේ වර්ණය වෙතියි කියමි. චීවර-පිණ්ඩපාතශයනාසනග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර ලබන සුලු වෙයි මේ ඔහුගේ ආරොහපරිණාහසම්පත් වෙති යි කියමි. මහණෙනි, මෙසේ පුරිස්-ගුණ්ඩයා ජවසම්පන්නත් වෙයි. වර්ණසම්පන්නත් වෙයි. ආරොහපරිණාහ-සම්පන්නත් වෙයි.

මහණෙනි, මේ පුරිස්ගුණ්ඩයෝ තුන් දෙන වෙති.

## 3. 3. 4: 9

39. මහණෙනි, අශ්වයන් කෙරෙහි සදශ්වයන් තුන් දෙන ද (ජාතිමත් අසුන්) දෙසමි. සදශ්වසදෘශ පුරුෂයන් තුන් දෙන ද දෙසමි. ඒ අසව, ...

මහණෙනි. අශ්වසදශ්වයෝ තුන් දෙන කවරහ?

මහණෙනි, මෙලොව ඇතැම් අශ්වසදශ්වයෙක් ජවසම්පන්න වෙයි. වර්ණ-සම්පන්න නොවෙයි. ආරොහපරිණාහසම්පන්න නොවෙයි. මහණෙනි, මෙ ලොව ඇතැම් අශ්වසදශ්වයෙක් ජවසම්පන්නත් වෙයි. වර්ණසම්පන්නත් වෙයි. ආරොහපරිණාහසම්පන්න නො වෙයි. මහණෙනි, මෙලොව ඇතැම් අශ්වසදශ්වයෙක් ජවසම්පන්නත් වෙයි. වර්ණසම්පන්නත් වෙයි. ආරොහ-පරිණාහසම්පන්නත් වෙයි. මහණෙනි, මොහු තුන් අශ්වසදශ්වයෝ යි

මහණෙනි, සදශ්වසදෘශ තුන් පුරුෂයෝ කවරහ?

මහණෙනි, මෙලොව ඇතැම් පුරුෂසදශ්වයෙක් ජවසම්පන්න වෙයි. වර්ණසම්පන්න නො වෙයි. ආරොහපරිණාහසම්පන්න නො වෙයි. මහණෙනි, මෙලොව ඇතැම් පුරුෂසදශ්වයෙක් ජවසම්පන්නත් වෙයි වර්ණසම්පන්නත් වෙයි. ආරොහපරිණාහසම්පන්න නො වෙයි. මහණෙනි, මෙලොව ඇතැම් පුරුෂසදශ්වයෙක් ජවසම්පන්නත් වෙයි. වර්ණසම්පන්නත් වෙයි. ආරොහ-පරිණාහසම්පන්නත් වෙයි.

කථඤ්ච භික්ඛවෙ පුරිසසදස්සො ජවසම්පන්නො හොති, න වණ්ණ-සම්පන්නො න ආරොහපරිණාහසම්පන්නො?

ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. ඉදමස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො සංසාදෙති, නො විස්සජ්ජෙති. ඉදමස්ස න වණ්ණස්මිං වදාමි. න ඛො පන ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. ඉදමස්ස න ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ පුරිසසදස්සො ජවසම්පන්නො හොති, න වණ්ණසම්පන්නො න ආරොහපරිණාහසම්පන්නො.

කථඤ්ච භික්ඛවෙ පුරිසසදස්සො ජවසම්පන්නො ච හොති වණ්ණ-සම්පන්නො ච, න ආරොහපරිණාහසම්පන්නො?

ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. ඉදමස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති නො සංසාදෙති. ඉදමස්ස වණ්ණස්මිං වදාමි. න ඛො පන ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. ඉදමස්ස න ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ පුරිසසදස්සො ජවසම්පන්නො හොති වණ්ණසම්පන්නො, න ආරොහපරිණාහසම්පන්නො.

කථඤ්ච භික්ඛවෙ පුරිසසදස්සො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච?

ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං -පෙ- අනාවත්තිධම්මො තස්මා ලොකා. ඉදමස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති, නො සංසාදෙති. ඉදමස්ස වණ්ණස්මිං වදාමි. ලාභී ඛො පන හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛා-රානං. ඉදමස්ස ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ පුරිසසදස්සො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච.

ඉමෙ ඛො භික්ඛවෙ තයො පුරිසසදස්සාති.

මහණෙනි, කෙසේ පුරුෂසදශ්‍යව තෙමේ ජවසම්පන්‍න වේ ද, වර්‍ණ-සම්පන්‍න නො වේ ද ආරොහපරිණාහසම්පන්‍න නො වේ ද?

මහණෙනි, මෙ සස්නෙහි මහණ පස් වැදූරුම් ඕරම්භාගිය සංයොජනයන් ක්‍ෂය කිරීමෙන් ඕපපාතික වෙයි. ඒ බඹලොවින් වටාලා නො එන සැහැවි ඇත්තේ ඒ බඹලොව ම පිරිනිවන් පානේ වෙයි. මේ ඔහුගේ ඥානජවය යි කියමි. අභිධර්‍මයෙහි ලා අභිවිනයෙහි ලා ප්‍රශ්න නගන ලද්දුයේ අවසාදනය කෙරෙයි. නො විසඳයි මේ ඔහුගේ වර්‍ණය නො වෙතියි කියමි. චීවරපිණ්ඩ-පාතශයනාසනගලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර නො ලබන සුලු වෙයි. මේ ඔහුගේ ආරොහපරිණාහසම්පත් නො වෙති යි කියමි. මහණෙනි, මෙසේ පුරුෂසදශ්‍යවයා ජවසම්පන්‍න වෙයි. වර්‍ණසම්පන්‍න නො වෙයි. ආරොහ-පරිණාහසම්පන්‍න නො වෙයි.

මහණෙනි, කෙසේ පුරුෂසදශ්‍යවයා ජවසම්පන්‍නත් වේ ද වර්‍ණසම්පන්‍නත් වේ ද, ආරොහපරිණාහසම්පන්‍න නො වේ ද?

මහණෙනි, මෙ සස්නෙහි මහණ පස්වැදූරුම් ඕරම්භාගිය සංයොජනයන් ක්‍ෂය කිරීමෙන් ඕපපාතික වෙයි. ඒ බඹලොවින් වටාලා නො එන සැහැවි ඇතියේ ඒ බඹලොව ම පිරිනිවන් පානේ වෙයි. මේ ඔහුගේ ඥානජවය වෙති යි කියමි. අභිධර්‍මයෙහි ලා අභිවිනයෙහි ලා ප්‍රශ්න නගන ලද්දුයේ විසඳ යි. නො ගළයි. මේ ඔහුගේ වර්‍ණසම්පත් වෙති යි කියමි. චීවරපිණ්ඩ-පාතශයනාසනගලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර නොලබන සුලු වෙයි. මේ ඔහුගේ ආරොහපරිණාහ සම්පත් නො වෙති යි කියමි. මහණෙනි, මෙසේ පුරුෂසදශ්‍යවයා ජවසම්පන්‍න වෙයි. වර්‍ණසම්පන්‍න වෙයි. ආරොහපරිණාහ-සම්පන්‍න නො වෙයි.

මහණෙනි, කෙසේ පුරුෂසදශ්‍යවයා ජවසම්පන්‍නත් වේ ද වර්‍ණසම්පන්‍නත් වේ ද ආරොහපරිණාහසම්පන්‍නත් වේ ද?

මහණෙනි, මෙ සස්නෙහි මහණ පස්වැදූරුම් ඕරම්භාගිය සංයොජනයන් ක්‍ෂය කිරීමෙන් ඕපපාතික වෙයි. ඒ බඹලොවින් වටාලා නො එන සැහැවි ඇතියේ ඒ බඹලොව ම පිරිනිවන් පානේ වෙයි. මේ ඔහුගේ ඥානජවය වෙති යි කියමි. අභිධර්‍මයෙහි ලා අභිවිනයෙහි ලා ප්‍රශ්න නගන ලද්දුයේ විසඳයි. නො ගළයි. මේ ඔහුගේ වර්‍ණසම්පත් වෙති යි කියමි. චීවර-පිණ්ඩපාතශයනාසනගලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර ලබන සුලු වෙයි. මේ ඔහුගේ ආරොහපරිණාහසම්පත් වෙති යි කියමි. මහණෙනි, මෙසේ පුරුෂසදශ්‍යවයා ජවසම්පන්‍නත් වෙයි. වර්‍ණසම්පන්‍නත් වෙයි. ආරොහපරිණාහ-සම්පන්‍නත් වෙයි.

මහණෙනි, මේ තුන් පුරුෂසදශ්‍යවයෝ යි.

### 3. 3. 4. 10.

40. තයො ච භික්ඛවෙ භද්‍රෙ අස්සාජානීයෙ දෙසිස්සාමි තයො ච භද්‍රෙ පුරිසාජානීයෙ. තං සුණාථ -පෙ-

කතමෙ ච භික්ඛවෙ තයො භද්‍රා අස්සාජානීයා?

ඉධ භික්ඛවෙ එකච්චො භද්‍රො අස්සාජානීයො ජවසම්පන්නො ච හොති, [-පෙ-* න ආරොහපරිණාහසම්පන්නො හොති -පෙ-* ඉධභික්ඛවෙ එකච්චො භද්‍රො අස්සාජානියො ජවසම්පන්නො ච හොති.] වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච. ඉමෙ ඛො භික්ඛවෙ තයො භද්‍රා අස්සාජානීයා

කතමෙ ච භික්ඛවෙ තයො භද්‍රා පුරිසාජානීයා [-පෙ-*]

ඉධ භික්ඛවෙ භද්‍රො පුරිසාජානීයො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච. [-පෙ- *]

කථඤ්ච භික්ඛවෙ භද්‍රො පුරිසාජානීයො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච.

ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉදමස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති නො සංසාදෙති. ඉදමස්ස වණ්ණස්මිං වදාමි. ලාභී ඛො පන හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. ඉදමස්ස ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ භද්‍රො පුරිසාජානීයො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච.

ඉමෙ ඛො භික්ඛවෙ තයො භද්‍රා පුරිසාජානීයාති.

### 3. 3. 4. 11.

41. එකං සමයං භගවා රාජගහෙ විහරති මොරනිවාපෙ පරිබ්බාජකාරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි -පෙ-

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානං.

කතමෙහි තීහි?

අසෙඛෙන සීලක්ඛන්ධෙන අසෙඛෙන සමාධික්ඛන්ධෙන අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානන්ති.

---

* පෙය්‍යාලමුඛයි අනන්තරිත සුත්තපදෙසා පුබ්බෙ වුත්ත සුත්තානුසාරෙන වෙදිතබ්බා. "ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා" ආදි පදෙහි යොජෙත්වා පුරිසාජානීය වාරා වෙදිතබ්බා.

## 3. 3. 4. 10.

40. මහණෙනි, භද්‍ර අශ්වාජානීයයන් තුන් දෙනා දෙසමි. භද්‍ර පුරුෂාජානීයයන් තුන් දෙනා ද දෙසමි. එය අසව ....

මහණෙනි, භද්‍ර අශ්වාජානීයයෝ තුන් දෙනා කවරහ යත්:

මහණෙනි, මෙ ලොව ඇතැම් භද්‍ර අශ්වාජානීයයෙක් ජවසම්පන්න වෙයි. ... * ආරොහපරිණාහසම්පන්න නො වෙයි [ ... *] මහණෙනි. මෙලොව ඇතැම් භද්‍ර අශ්වාජානීයයෙක් ජවසම්පන්නත් වෙයි. වර්ණසම්පන්නත් වෙයි. ආරොහපරිණාහසම්පන්නත් වෙයි. මහණෙනි, මේ තුන් වැදෑරුම් භද්‍ර අශ්වාජානීයයෝ යි.

මහණෙනි, භද්‍ර පුරුෂාජානීයයෝ තුන් දෙනා කවරහ යත්: [...*]

මහණෙනි, මෙ ලොව භද්‍ර පුරුෂාජානීයයා ජවසම්පන්නත් වෙයි. වර්ණසම්පන්නත් වෙයි. ආරොහපරිණාහසම්පන්නත් වෙයි. [ .... *]

මහණෙනි, කෙසේ භද්‍ර පුරුෂාජානීයයා ජවසම්පන්නත් වේ ද, වර්ණසම්පන්නත් වේ ද, ආරොහපරිණාහසම්පන්නත් වේ ද?

මහණෙනි, මෙ සස්නෙහි මහණ ආස්‍රවයන් ක්‍ෂය කිරීමෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ඊට එළඹ වෙසෙයි. මේ ඔහුගේ ඥානජවය වෙති යි කියමි. අභිධර්මයෙහි ලා අභිවිනයෙහි ලා පැන පුළුවුස්නා ලද්දේ විසඳයි. නො ගළයි. මේ ඔහුගේ වර්ණය වෙති යි කියමි. චීවර පිණ්ඩපාතශයනාසනග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර ලබන සුලු වෙයි. මේ ඔහුගේ ආරොහපරිණාහය වෙති යි කියමි. මහණෙනි, මෙසේ භද්‍ර පුරුෂාජානීයයා ජවසම්පන්න ද වෙයි. වර්ණසම්පන්න ද වෙයි. ආරොහපරිණාහ සම්පන්න ද වෙයි.

මහණෙනි, මේ තුන් භද්‍ර පුරුෂාජානීයයෝ යි.

## 3. 3. 4. 11.

41. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර මොරනිවාප නම් පරිව්‍රාජකාරාමයෙහි වැඩ වෙසෙති. එකල භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන් ඇමතූ සේක. ...

මහණෙනි, දහම් තුණෙකින් සමන්‍වාගත මහණ අත්‍යන්ත නිෂ්ඨ වෙයි. අත්‍යන්තයෝගක්‍ෂේමී වෙයි. අත්‍යන්තපර්‍යවසාන ඇතියේ දෙව්මිනිස්නට ශ්‍රෙෂ්ඨ වූ අත්‍යන්තබ්‍රහ්මචාරී වෙයි.

කවර තුන් දහම්න යත්:

අශෛක්‍ෂ ශීලස්කන්‍ධයෙන, අශෛක්‍ෂ සමාධිස්කන්‍ධයෙන, අශෛක්‍ෂ ප්‍රඥාස්කන්‍ධයෙන

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත මහණ අත්‍යන්තනිෂ්ඨ වෙයි. අත්‍යන්තයෝගක්‍ෂේමී වෙයි. අත්‍යන්තපර්‍යවසාන ඇති, දෙව්මිනිස්නට ශ්‍රෙෂ්ඨ වූ අත්‍යන්තබ්‍රහ්මචාරී වෙයි.

---

* ... මෙහි පෙය්‍යාලමුඛයෙන් වැසුනු සූත්‍ර ප්‍රදෙශ පෙරකී සූත්‍රඅනුසාරයෙන් දතයුතු.
"මහණෙනි .... ආස්‍රවයන් ක්‍ෂය කිරීමෙන්" ආදිපද යොදා පුරුෂාජානීය වාර දතයුතු.

### 3. 3. 4. 12.

42. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති, අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානං.

කතමෙහි තීහි?

ඉද්ධිපාටිහාරියෙන, ආදෙසනාපාටිහාරියෙන, අනුසාසනීපාටිහාරියෙන.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති -පෙ- සෙට්ඨො දෙවමනුස්සානන්ති.

### 3. 3. 4 13.

43. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති -පෙ- සෙට්ඨො දෙවමනුස්සානං.

කතමෙහි තීහි?

සම්මාදිට්ඨියා සම්මාඤාණෙන සම්මාවිමුත්තියා.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති, අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානන්ති.

**යොධාජීවවග්ගො චතුත්ථො***

## [ 5. මඞ්ගල වග්ගො ]

### 3. 3. 5. 1.

**[සාවත්ථිනිදානං:]**

44. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

කතමෙහි තීහි?

අකුසලෙන කායකම්මෙන, අකුසලෙන වචීකම්මෙන, අකුසලෙන මනොකම්මෙන.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.

කතමෙහි තීහි?

කුසලෙන කායකම්මෙන, කුසලෙන වචීකම්මෙන, කුසලෙන මනොකම්මෙන.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

---

*තස්සුද්දානං: යොධො පරිස මිත්තඤ්ච
උප්පාදා කෙසකම්බලො
සම්පදා වුඩ්ඪි තයො අස්සා
තයො මොරනිවාපිනොති - මජ්ඣං.

**3. 3. 4. 12**

42. මහණෙනි, ධර්ම තුනෙකින් සමන්‍වාගත මහණ අත්‍යන්තනිෂ්ඨ වෙයි, අත්‍යන්තයොගක්‍ෂෙමී වෙයි, අත්‍යන්තපර්‍ය්‍යවසාන ඇතියේ දෙවිමිනිස්නට ශ්‍රෙෂ්ඨ වූ අත්‍යන්තබ්‍රහ්මචාරී වෙයි.

කවර තුන් දහම්හ යත්:

ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යයෙන. ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍යයෙන. අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍යයෙන.

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත මහණ අත්‍යන්තනිෂ්ඨ වෙයි, අත්‍යන්තයොගක්‍ෂෙමී වෙයි ... දෙවිමිනිස්නට ශ්‍රෙෂ්ඨ වූ අත්‍යන්තබ්‍රහ්මචාරී වෙයි.

**3. 4. 4. 13**

43. මහණෙනි, දහම් තුනෙකින් සමන්‍වාගත මහණ අත්‍යන්තනිෂ්ඨ වෙයි ... දෙවිමිනිස්නට ශ්‍රෙෂ්ඨ වූ අත්‍යන්තබ්‍රහ්මචාරී වෙයි.

කවර තුන් දහම්හ යත්:

සම්‍යග්දෘෂ්ටියෙන, සම්‍යග්ඥානයෙන, සම්‍යග්විමුක්තියෙන.

මහණෙනි, මේ තුන් දහමින් යුක්ත වූ මහණ අත්‍යන්තනිෂ්ඨ වෙයි. අත්‍යන්තයෝගක්‍ෂෙමී වෙයි, අත්‍යන්තපර්‍ය්‍යවසාන ඇති, දෙවිමිනිස්නට ශ්‍රෙෂ්ඨ වූ අත්‍යන්තබ්‍රහ්මචාරී වෙයි.

**සතරවන යොධාජීව වර්ග යි.**

## [5. මඞ්ගල වර්ගය]

**3. 3. 5. 1**

**[සැවැත් නිදානයි:]**

44. මහණෙනි, දහම් තුනෙකින් සමන්විත වූයේ ගෙණවුත් තැබුයේ යම්සේ ද එපරිදි නිරයෙහි වෙයි.

කවර දහම් තුනෙකින යත්:

අකුශලකායකර්මයෙන්, අකුශලවාක්කර්මයෙන්, අකුශලමනඃකර්මයෙන්.

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබුයේ යම්සේ ද, එපරිදි නිරයෙහි සිටියේ වේ.

මහණෙනි, දහම් තුනෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබුයේ යම්සේ ද, එපරිදි ස්වර්ගයෙහි සිටියේ වේ.

කවර දහම් තුනෙකින යත්:

කුශලකායකර්මයෙන්, කුශලවාක්කර්මයෙන්, කුශලමනඃකර්මයෙන්.

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබුයේ යම්සේ ද, එපරිදි ස්වර්ගයෙහි සිටියේ වේ.

### 3. 3. 5. 2.

45. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ

කතමෙහි තීහි?

සාවජ්ජේන කායකම්මෙන, සාවජ්ජේන වචීකම්මෙන, සාවජ්ජේන මනොකම්මෙන.

ඉමෙහි බො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.

කතමෙහි තීහි?

අනවජ්ජේන කායකම්මෙන, අනවජ්ජේන වචීකම්මෙන, අනවජ්ජේන මනොකම්මෙන.

ඉමෙහි බො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

### 3. 3. 5. 3.

46. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- එවං නිරයෙ.

කතමෙහි තීහි?

විසමෙන කායකම්මෙන, විසමෙන වචීකම්මෙන, විසමෙන මනොකම්මෙන. ඉමෙහි බො -පෙ- එවං නිරයෙ.

තීහි -පෙ- එවං සග්ගෙ.

කතමෙහි තීහි?

සමෙන කායකම්මෙන, සමෙන වචීකම්මෙන, සමෙන මනොකම්මෙන. ඉමෙහි බො -පෙ- එවං සග්ගෙති.

### 3. 3. 5. 4.

47. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො -පෙ- එවං නිරයෙ.

කතමෙහි තීහි?

අසුචිනා කායකම්මෙන, අසුචිනා වචීකම්මෙම්මන, -පෙ- මනොකම්මෙන. ඉමෙහි බො තීහි -පෙ- එවං නිරයෙ.

තීහි භික්ඛවෙ -පෙ- එවං සග්ගෙ.

කතමෙහි තීහි?

සුචිනා කායකම්මෙන, සුචිනා වචීකම්මෙන -පෙ- මනොකම්මෙන.

ඉමෙහි බො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

### 3. 3. 5. 5.

48. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො අබ්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති. සාවජ්ජො ච හොති සානුවජ්ජො විඤ්ඤූනං. බහුඤ්ච අපුඤ්ඤං පසවති.

කතමෙහි තීහි?

අකුසලෙන කායකම්මෙන, අකුසලෙන වචීකම්මෙන, අකුසලෙන මනොකම්මෙන.

**3. 3. 5. 2**

45. මහණෙනි, ධර්ම තුනෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබූයේ යම්සේ ද, එපරිදි නිරයෙහි සිටියේ වේ.

කවර දහම් තුනෙකින යත්:

සදෙස් කායකම්න, සදෙස් විසිකම්න, සදෙස් මූනිකම්න.

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබූයේ යම් සේ ද, එපරිදි නිරයෙහි වේ.

මහණෙනි, දහම් තුණෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබූයේ යම් සේ ද, එපරිදි සවර්ගයෙහි වේ.

කවර තුණෙකින යත්:

නිර්දෙෂකායකර්මයෙන්, නිර්දෙෂවාක්කර්මයෙන්, නිර්දෙෂමනඃකර්මයෙන්.

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබූයේ යම් සේ ද, එපරිදි සවර්ගයෙහි වේ.

**3. 3. 5. 3**

46. මහණෙනි, දහම් තුණෙකින් සමන්‍වාගත වූයේ ... නිරයෙහි සිටියේ වේ. කවර දහම් තුණෙකින යත්:

විෂම වූ කායකම්න, විෂම වූ විසිකම්න, විෂම වූ මූනිකම්න ...

මහණෙනි, මේ තුන්දහමින් ... නිරයෙහි වේ.

මහණෙනි, දහම් තුණෙකින් .. සවර්ගයෙහි වේ.

කවර දහම් තුණෙකින යත්:

සම වූ කායකර්මයෙන්, සමවූ වාකකර්මයෙන්, සම වූ මනඃකර්මයෙන් ...

මහණෙනි, මේ තුන් දහමින් .. සවර්ගයෙහි වේ.

**3. 3. 5. 4**

47. මහණෙනි, දහම් තුණෙකින් සමන්‍වාගත වූයේ නිරයෙහි සිටියේ වේ. කවර තුණෙකින යත්:

අපවිත්‍ර වූ කායකර්මයෙන්, අපවිත්‍ර වූ වාක්කර්මයෙන්, අපවිත්‍ර වූ මනඃ-කර්මයෙන්.

මහණෙනි, මේ තුන් දහමින් ... එපරිදි නිරයෙහි වේ.

මහණෙනි, දහම් තුණෙකින් ... සවර්ගයෙහි වේ.

කවර තුණෙකින යත්:

පවිත්‍ර වූ කායකර්මයෙන්, පවිත්‍ර වූ වාක්කර්මයෙන් පවිත්‍ර වූ මනඃකර්මයෙන්.

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත වූයේ ගෙණවුත් සිටියේ යම්සේ ද, එපරිද්දෙන් සවර්ගයෙහි වේ.

**3. 3. 5. 5**

48. මහණෙනි, කරුණු තුණෙකින් සමන්‍වාගත අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාලයා ගුණවිසින් සාළ තවූ ආත්මයක් පරිහරණය කරයි. සාවද්‍ය ද වෙයි. නුවණැතියන් විසින් උපවාද කටයුතු ද වෙයි. බොහෝ පව් ද රැස් කෙරෙයි.

කවර තුන් දහමකින යත්:

අකුශලකායකර්මයෙන්, අකුශලවාක්කර්මයෙන්, අකුශලමනඃකර්මයෙන්.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති, සානුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවතීති.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වියත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජො ච හොති, අනනුවජ්ජො විඤ්ඤූනං, බහුඤ්ච පුඤ්ඤං පසවති.

කතමෙහි තීහි:

කුසලෙන කායකම්මෙන, කුසලෙන වචීකම්මෙන, කුසලෙන මනොකම්මෙන.

ඉමෙහි ඛො භික්ඛවෙ -පෙ- බහුඤ්ච පුඤ්ඤං පසවතීති.

**3. 3. 5. 6.**

49. තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-

සාවජ්ජෙන කායකම්මෙන, සාවජ්ජෙන වචීකම්මෙන, සාවජ්ජෙන මනොකම්මෙන. -පෙ-

තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-

අනවජ්ජෙන කායකම්මෙන, අනවජ්ජෙන වචීකම්මෙන, අනවජ්ජෙන මනොකම්මෙන. -පෙ-

**3. 3. 5. 7.**

50. තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-

විසමෙන කායකම්මෙන, විසමෙන වචීකම්මෙන, විසමෙන මනොකම්මෙන. -පෙ-

තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-

සමෙන කායකම්මෙන, සමෙන වචීකම්මෙන, සමෙන මනොකම්මෙන. -පෙ-

**3. 3. 5. 8.**

51. තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-

අසුචිනා කායකම්මෙන, අසුචිනා වචීකම්මෙන, අසුචිනා මනොකම්මෙන -පෙ-

තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-

සුචිනා කායකම්මෙන, සුචිනා වචීකම්මෙන, සුචිනා මනොකම්මෙන. -පෙ-

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වියත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජො ච හොති, අනනුවජ්ජො ච විඤ්ඤූනං, බහුඤ්ච පුඤ්ඤතං පසවතීති.

**3. 3. 5. 9.**

52. තිස්සො ඉමා භික්ඛවෙ වන්දනා.

කතමා තිස්සො?

කායෙන වාචාය මනසා.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො වන්දනාති.

මහණෙනි, මේ තුන් දහමින් සමන්විතවූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාලයා ගුණවිසින් සෑරූ, නටුවා වූ ආත්මයක් පරිහරණය කෙරෙයි. සාවද්‍ය ද වෙයි නුවණැතියන් විසින් උපවාද කට යුතු ද වෙයි. බොහෝ පව් ද රැස් කෙරෙයි.

මහණෙනි, තුන් දහමෙකින් සමන්විත වූ ව්‍යක්ත වූ සත්පුරුෂ වූ පණ්ඩිතයා ගුණවිසින් නොකෑණී නොනට ආත්මයක් පරිහරණය කෙරෙයි. අනවද්‍ය ද වෙයි. නුවණැතියන් විසින් උපවාද නොකට යුතුද වෙයි. බොහෝ පින් ද රැස් කෙරෙයි.

කවර තුන් දහමෙකින යත්:

කුශලකායකර්මයෙන්, කුශලවාක්කර්මයෙන්, කුශලමනඃකර්මයෙන්

මහණෙනි, මේ තුන් දහමින් ... බොහෝ පින් ද රැස් කෙරෙයි.

3. 3. 5. 6.

49. මහණෙනි, තුන් දහමෙකින් ...

සාවද්‍යකායකර්මයෙන්, සාවද්‍යවාක්කර්මයෙන්, සාවද්‍යමනඃකර්මයෙන් ...

මහණෙනි, තුන් දහමෙකින් ...

අනවද්‍යකායකර්මයෙන්, අනවද්‍යවාක්කර්මයෙන්, අනවද්‍යමනඃකර්මයෙන් ...

3. 3. 5. 7.

50. මහණෙනි, තුන් දහමෙකින් ...

විෂමකායකර්මයෙන්, විෂමවාක්කර්මයෙන්, විෂම මනඃකර්මයෙන් ...

මහණෙනි, තුන් දහමෙකින් ...

සම වූ කායකර්මයෙන්, සම වූ වාක්කර්මයෙන්, සම වූ මනඃකර්මයෙන් ...

3. 3. 5. 8.

51. මහණෙනි, තුන් දහමෙකින් ...

අපවිත්‍ර කායකර්මයෙන්, අපවිත්‍ර වාක්කර්මයෙන්, අපවිත්‍ර මනඃකර්මයෙන් ...

මහණෙනි, තුන් දහමෙකින් ...

පවිත්‍ර කායකර්මයෙන්, පවිත්‍ර වාක්කර්මයෙන්, පවිත්‍ර මනඃකර්මයෙන් ...

මහණෙනි, මේ තුන් දහමින් සමන්විත වූ ව්‍යක්ත වූ සත්පුරුෂ වූ පණ්ඩිතයා ගුණවිසින් නොසෑරූ, නොනට ආත්මයක් පරිහරණය කෙරෙයි. අනවද්‍ය ද වෙයි, නුවණැතියන් විසින් උපවාද නොකට යුතු ද වේ, බොහෝ පින් ද රැස් කෙරෙයි.

3. 3. 5. 9.

52. මහණෙනි, මේ වන්දනාවෝ තුන් දෙනෙකි.

කවර තුන් දෙනෙක යත්:

කයින්, විසින්, සිතින්.

මහණෙනි, මේ තුන් වන්දනාවෝ යි.

### 3. 3. 5. 10.

53. යෙ හි භික්ඛවෙ,[1] සත්තා පුබ්බණ්හසමයං කායෙන සුචරිතං චරන්ති, වාචාය සුචරිතං චරන්ති, මනසා සුචරිතං චරන්ති, සුපුබ්බණ්හො භික්ඛවෙ තෙසං සත්තානං.

යෙ හි භික්ඛවෙ සත්තා මජ්ඣන්තිකං සමයං[2] කායෙන සුචරිතං චරන්ති, වාචාය සුචරිතං චරන්ති, මනසා සුචරිතං චරන්ති, සුමජ්ඣන්තිකො භික්ඛවෙ තෙසං සත්තානං.

යෙ හි භික්ඛවෙ සත්තා සායන්හසමයං කායෙන සුචරිතං චරන්ති, වාචාය සුචරිතං චරන්ති, මනසා සුචරිතං චරන්ති, සුසායන්හො භික්ඛවෙ තෙසං සත්තානන්ති.

10. සුනක්ඛත්තං සුමඞ්ගලං සුපභාතං සුහුට්ඨිතං,[3]
සුඛණො සුමුහුත්තො ච සුයිට්ඨං බ්‍රහ්මචාරිසු.

11. පදක්ඛිණං කායකම්මං වාචාකම්මං පදක්ඛිණං,
පදක්ඛිණං මනොකම්මං පණිධියො[4] පදක්ඛිණා,
පදක්ඛිණානි කත්වාන ලභන්තත්ථෙ[5] පදක්ඛිණෙ.

12. තෙ අත්ථලද්ධා සුඛිතා විරූළ්හා බුද්ධසාසනෙ,
අරොගා සුඛිතා හොථ සහ සබ්බෙහි ඤාතිභීති.

**මඞ්ගලවග්ගො පඤ්චමො.***

**ඛුද්දක පණ්ණාසකො සමත්තො තතියො.**

## [6. පටිපදාවග්ගො]

**[සාවත්ථි නිදානං:]**

1. තිස්සො ඉමා භික්ඛවෙ පටිපදා.

කතමා තිස්සො?

ආගාළ්හා පටිපදා, නිජ්ඣාමා පටිපදා, මජ්ඣිමා පටිපදා.

කතමා ච භික්ඛවෙ ආගාළ්හා පටිපදා?

ඉධ භික්ඛවෙ එකච්චො එවංවාදී හොති එවංදිට්ඨි: නත්ථි කාමෙසු දොසොති. සො කාමෙසු පාතබ්‍යතං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ ආගාළ්හා පටිපදා.

---

1. යෙ හි භික්ඛවෙ - මජසං. 2. මජ්ඣන්තිමං සමයං - මජසං. 3. සුහුට්ඨිතං, - මජසං.
4. පණිධී තා - මජසං. 5. ලභන්තත්ථෙ - මජසං.

* තදුද්දානං;-
අකුසලඤ්ච සාවජ්ජං විසමා සුඛිතා සහ
චතුරො ඛතා වන්දනා පුබ්බණ්හො නාම තෙ දසාති - මජසං.

**3. 3. 5. 10**

53. මහණෙනි, යම් කිසි සත්ත්ව කෙනෙක් පෙරවරු වේලෙහි කයින් සුචරිත පුරත් ද, වචනයෙන් සුචරිත පුරත් ද, සිතින් සුචරිත පුරත් ද, මහණෙනි, ඒ සත්ත්වයනට ශුභ පූර්වාහ්නයෙකි.

මහණෙනි, යම් සත්ත්ව කෙනෙක් මධ්‍යාහ්න සමයෙහි කයින් සුචරිත පුරත් ද, වචනයෙන් සුචරිත පුරත් ද, සිතින් සුචරිත පුරත් ද, මහණෙනි, ඒ සත්ත්වයනට ශුභ මධ්‍යාහ්නයෙකි.

මහණෙනි, යම් සත්ත්ව කෙනෙක් සායාහ්නසමයෙහි කයින් සුචරිත පුරත් ද, වචනයෙන් සුචරිත පුරත් ද, සිතින් සුචරිත පුරත් ද, මහණෙනි, ඒ සත්ත්වයනට ශුභ සායාහ්නයෙකි.

10. බ්‍රහ්මසරුන් කෙරෙහි ගුණවදන විසින් පිදීමෙක් වේ ද, ඒ ශුභ නක්ෂත්‍රයෙකි. ශුභ මඞ්ගලයෙකි. ශුභ අලුයමෙකි. ශුභ නැගී සිටුමෙකි. ශුභ ක්ෂණයෙකි. ශුභ මුහුර්තයෙකි

11. එදින කළ කායකර්මය වෘද්ධික්‍රියායෙකි. වාක්කර්මය වෘද්ධික්‍රියා-යෙකි. මනඃකර්මය වෘද්ධික්‍රියායෙකි. ප්‍රණිධිහු වෘද්ධිදායකයෝ යි. වෘද්ධියුක්ත කායකර්මාදීන් කොට වෘද්ධි අර්ථයන් ලබන්නේය.

12. ලබ්ධාර්ථ ඇති, සුඛිත වූ බුද්ධශාසනයෙහි විරූඪ වූ ඒ තෙපි සියලු ඥතීන් හා සමග නීරෝග වව්, සුඛිත වව්.

**පස්වන මඞ්ගල වර්ගයයි.**

**තෙවන බුද්ධපණ්ණාසකය සමාප්තයි.**

## [6. පටිපදාවර්ගය]

**3. 6. 1.**

[**සැවැත් නිදානයි:**]

1. මහණෙනි, මේ පටිපදාවෝ තුන් දෙනෙකි.

කවර තුන් දෙනෙක යත්:
ආගාඪප්‍රතිපත්තිය, පරිතප්පප්‍රතිපත්තිය, මධ්‍යමප්‍රතිපත්ති යි.

මහණෙනි, ආගාඪප්‍රතිපත්ති කවර?

මහණෙනි, මෙලොව ඇතැමෙක් මෙබඳු වාද ඇතියේ වෙයි, මෙබඳු දෘෂ්ටි ඇතියේ වෙයි: කාමයෙහි දෝෂයෙක් නැත කියායි. හේ කාමයෙහි පියයුතු බවට පැමිණෙයි.

මහණෙනි, මේ ආගාඪප්‍රතිපත්තිය යි කියනු ලැබේ.

කතමා ච භික්ඛවෙ නිජ්ඣාමා පටිපදා?

ඉධ භික්ඛවෙ එකච්චො අචෙලකො හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො න එහිභදන්තිකො, න තිට්ඨභදන්තිකො. න අභිහටං, න උද්දිස්සකතං, න නිමන්තණං සාදියති. සො න කුම්භිමුඛා පතිගණ්හාති, න ඛලොපිමුඛා[1] පතිගණ්හාති, න එළකමන්තරං, න දණ්ඩමන්තරං, න මුසලමන්තරං, න ද්වින්නං භුඤ්ජමානානං. න ගබ්භිනියා, න පායමානාය, න පුරිසන්තරගතාය, න සංකිත්තීසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී, න මච්ඡං, න මංසං. න සුරං න මෙරයං න ථුසොදකං පිවති. සො එකාගාරිකො වා හොති එකාලොපිකො වා.[2] ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො වා[2]. සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො වා. එකිස්සාපි දත්තියා යාපෙති. ද්වීහිපි දත්තීහි යාපෙති. තීහිපි දත්තීහි යාපෙති. සත්තහිපි දත්තීහි යාපෙති. එකාහිකම්පි ආහාරං ආහාරෙති. ද්වාහිකම්පි ආහාරං ආහාරෙති. සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති. සො සාකභක්ඛොපි හොති, සාමාකභක්ඛොපි හොති, නීවාරභක්ඛොපි හොති, දද්දුලභක්ඛොපි හොති, හටභක්ඛොපි හොති, කණභක්ඛොපි හොති, ආචාමභක්ඛොපි හොති, පිඤ්ඤාකභක්ඛොපි හොති, තිණභක්ඛොපි හොති, ගොමයභක්ඛොපි හොති. වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී.

සො සාණානිපි ධාරෙති, මසාණානිපි ධාරෙති, ඡවදුස්සානිපි ධාරෙති, පංසුකූලානිපි ධාරෙති, තිරීටානිපි ධාරෙති, අජිනානිපි ධාරෙති, අජිනක්ඛිපම්පි ධාරෙති, කුසචීරම්පි ධාරෙති, වාකචීරම්පි ධාරෙති, ඵලකචීරම්පි ධාරෙති, කෙසකම්බලම්පි ධාරෙති, වාලකම්බලම්පි ධාරෙති, උලූකපක්ඛම්පි ධාරෙති. කෙසමස්සුලොචකොපි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො. උබ්භට්ඨකොපි හොති ආසනපටික්ඛිත්තො. උක්කුටිකොපි හොති උක්කුටිකප්පධානානුයොගමනුයුත්තො. කණ්ටකාපස්සයිකොපි හොති කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙති. සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති.

ඉති එවරූපං අනෙකවිහිතං කායස්ස ආතාපනපරිතාපනානුයොගමනුයුත්තො විහරති. අයං වුච්චති භික්ඛවෙ නිජ්ඣාමා පටිපදා

1. ඛලොපිමුඛා - මජසං. 2 එකාලොපිකො - මජසං. - ද්වාලොපිකො - මජසං

මහණෙනි, පරිතපනප්‍රතිපත්ති කවරී?

මහණෙනි, මෙලොව ඇතැමෙක් සෙලු වෙයි. හළ ආචාර ඇතියේ වෙයි. පිඩු නිමිකල අත ලෝනේ වෙයි. 'එව, වහන්සැ'යි කීකල නො එනු සිල් කොට ඇතියේ වෙයි. 'සිටුව, වහන්සැ'යි කීකල නොසිටිනු සිල් කොට ඇතියේ වෙයි, පළමු එළවූ අහර නොපිළිගන්නේ වෙයි, උදෙසා කළ අහර නොපිළිගන්නේ වෙයි, නිමන්ත්‍රණය නොපිළිගන්නේ වෙයි, හේ කළමුවෙන් උදුරා දුන් අහර නොපිළිගන්නේ වෙයි, සැළමුවින් උදුරා දුන් අහර නො පිළිගන්නේ වෙයි, එළිපත අතර කොට දෙන අහර නොපිළිගන්නේ වෙයි, දඬු අතර කොට දෙන අහර නොපිළිගන්නේ වෙයි, මොහොලා අතර කොට දෙන අහර නොපිළිගන්නේ වෙයි, වළඳන දෙදෙනකුන් අතුරින් එකකු නැඟී දෙන අහර නොපිළිගන්නේ වෙයි, ගැබිලිය දෙන අහර නොපිළිගන්නේ වෙයි, කිරිපොවනිය දෙන අහර නොපිළිගන්නේ වෙයි, පුරුෂාන්තරගත ස්ත්‍රිය දෙන අහර නොපිළිගන්නේ වෙයි, සහල් ඈ සමාදන් කොට පිසූ කල දෙන අහර නොපිළිගන්නේ වෙයි, යම් තැනෙක බලු එළඹ සිටියේ නම් එහි දී දෙන අහර නොපිළිගන්නේ වෙයි, යම් තැනෙක මැසි මුළු ගළගළ ව හැසිරෙත් නම්, එහිදී දෙන අහර නොපිළිගන්නේ වෙයි, මත්‍ස්‍යමාංස නොපිළිගන්නේ වෙයි. රහ නොබොන්නේය, මෙර නොබොන්නේය. සෞවීරක නොබොන්-නේය. හේ එක් ගෙයෙකින් පිඩු ලැබ නවත්නේ හෝ වෙයි, එක් ආලොපයෙ-කින් යැපෙන්නේ හෝ වෙයි, දෙගෙයෙකින් පිඩු ලැබ නවත්නේ හෝ වෙයි, ආලොපදෙකෙකින් යැපෙන්නේ හෝ වෙයි, සත්ගෙයෙකින් පිඩු ලැබ නවත්නේ හෝ වෙයි, ආලොප සතෙකින් යැපෙන්නේ හෝ වෙයි. එක් දත්-තෙකුනුදු (කුඩාතලියෙනුදු) යැපෙයි, දෙදත්තෙකිනිදු යැපෙයි. තුන් දත්තෙකිනුදු යැපෙයි, සත් දත්තෙකිනුදු යැපෙයි. එක් දවසක් අතර කොට ගත්තා අහර ද වළඳයි, දෙදවසක් අතර කොට ගත්තා අහර ද වළඳයි, සත් දවසක් අතර කොට ගත්තා අහර ද වළඳයි. මෙසේ මෙබඳු අඩමසක් අතර කොට ගත්තා අහර ද යි වාරභක්ත භොජනයෙහි යෙදුනේ වෙසෙයි. හේ පලා වළඳන්නේ හෝ වෙයි, බඩහමු වළඳන්නේ හෝ වෙයි, හුරුහැල් වළඳන්නේ හෝ වෙයි, සම්කඩ වළඳන්නේ ද වෙයි, ලහටු වළඳන්නේ හෝ වෙයි, කුඩු වළඳන්නේ හෝ වෙයි, දඹුබත් වළඳන්නේ හෝ වෙයි, පුනකු වළඳන්නේ හෝ වෙයි, ගොම වළඳන්නේ හෝ වෙයි. වැටුනු ඵල වළඳන සුලු වූයේ වනමූලඵල ආහර කොට ඇතියේ ද යැපෙයි.

හේ හණ වැහැරි ද දරයි, මුසුහණ වැහැරි ද දරයි, මිනියෙන් හළ පිළී ද දරයි, පහුල් පිළී ද දරයි, රුක්සුඹුලු ද දරයි, අඳුන්මුවසම් ද දරයි, ඝුර සහිත අඳුන්දිවිසම් ද දරයි, කුසවැහැරි ද දරයි, වාකචීරය ද දරයි, ඵලක-චීරය ද දරයි, කේශකම්බල ද දරයි, වාලකම්බල ද දරයි, මහමුහුණුපියාපතු ද දරයි. හිසකේ රවුලු උදුරා ලීමෙහි යෙදුනේ හිසකේ රවුලු උදුරනුයේ ද වෙයි. අසුන් පිළිකෙව් කෙළේ උඩුහුරුව සිටුනේ ද වෙයි. උලුළුයෙන් තවුස්වැර වැඩීමෙහි යෙදුනේ උලුළුයෙන් සිටුනේ ද වෙයි. කටු ඇතිරියෙහි හෝනේ ද වෙයි, කටුඇතිරියෙහි ශයනය ද කෙරෙයි. සවස තුන්වනු කොට තෙවරක් උදකාවගාහයෙහි යෙදුනේ වෙසෙයි.

මෙසේ මෙබඳු අනේකප්‍රකාර වූ කය පිළිබඳ ආතාපන පරිතාපනානු-යෝගයෙහි යෙදුනේ වෙසෙයි. මහණෙනි, මේ පරිතපන ප්‍රතිපත්තිය යි කියනු ලැබේ.

කතමා ච භික්ඛවෙ මජ්ඣිමා පටිපදා?

ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති: ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අයං වුච්චති භික්ඛවෙ මජ්ඣිමා පටිපදා.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො පටිපදාති.

3. 6. 2.

තිස්සො ඉමා භික්ඛවෙ පටිපදා.

කතමා තිස්සො?

ආගාළ්හා පටිපදා, නිජ්ඣාමා පටිපදා, මජ්ඣිමා පටිපදා.

කතමා ච භික්ඛවෙ ආගාළ්හා පටිපදා? (යථා පුබ්බෙ තථා කාතබ්බං.) -පෙ-අයං වුච්චති භික්ඛවෙ ආගාළ්හා පටිපදා.

කතමා ච භික්ඛවෙ නිජ්ඣාමා පටිපදා? (යථා පුබ්බෙ තථා කාතබ්බං.) -පෙ- අයං වුච්චති භික්ඛවෙ නිජ්ඣාමා පටිපදා.

කතමා ච භික්ඛවෙ මජ්ඣිමා පටිපදා?

ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාපාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති -පෙ-

3. 6. 3.

[තිස්සො ඉමා භික්ඛවෙ, පටිපදා -පෙ-]

ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි-පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. -පෙ-

3. 6. 4.

[තිස්සො ඉමා භික්ඛවෙ, පටිපදා -පෙ-]

සද්ධින්ද්‍රියං භාවෙති, විරියින්ද්‍රියං භාවෙති, සතින්ද්‍රියං භාවෙති, සමාධින්ද්‍රියං භාවෙති, පඤ්ඤින්ද්‍රියං භාවෙති -පෙ-

3. 6. 5

[තිස්සො ඉමා භික්ඛවෙ, පටිපදා -පෙ-]

සද්ධාබලං භාවෙති, විරියබලං භාවෙති, සතිබලං භාවෙති, සමාධිබලං භාවෙති, පඤ්ඤාබලං භාවෙති -පෙ-

මහණෙනි, මධ්‍යම ප්‍රතිපත්ති කවර?

මහණෙනි, මෙසස්නෙහි මහණ කෙලෙස් තවන වැර ඇතියේ නුවණින් දන්නේ, සිහි ඇතියේ, ලෝකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍ය දුරු කොට කයෙහි කය අනුව දක්නේ වෙසෙයි. කෙලෙස් තවන වැර ඇතියේ, නුවණින් දන්නේ, සිහි ඇතියේ, ලෝකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍ය දුරු කොට වෙදනා-යෙහි ... චිත්තයෙහි ... ධර්මයෙහි ... ධර්මය අනුව දක්නා සුලු වූයේ වෙසෙයි. මහණෙනි, මේ මධ්‍යම ප්‍රතිපත්තිය යි කියනු ලැබේ.

මහණෙනි, මේ තුන් ප්‍රතිපත්තීහු යි.

3. 6. 2.

මහණෙනි, මේ ප්‍රතිපත්තීහු තුන් දෙනෙකි.

කවර තුන් දෙනෙක යත්:

ආගාඪප්‍රතිපත්තිය, පරිතප්තප්‍රතිපත්තිය, මධ්‍යම ප්‍රතිපත්ති යි.

මහණෙනි, ආගාඪප්‍රතිපත්ති කවර? ...මහණෙනි, මේ ආගාඪප්‍රතිපත්තිය යි කියනු ලැබේ.

මහණෙනි, පරිතප්ත ප්‍රතිපත්ති කවර? ... මහණෙනි, මේ පරිතප්ත ප්‍රතිපත්තිය යි කියනු ලැබේ.

මහණෙනි, මධ්‍යම ප්‍රතිපත්ති කවර?

මහණෙනි, මෙසස්නෙහි මහණ නූපන් පාපක අකුශලධර්මයන්ගේ නූපදීම පිණිස ඡන්දය උපදවයි. ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍යාරම්භ කෙරෙයි. සිත දැඩි කොට ගණී. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි. උපන් පාපක අකුශල ධර්ම-යන්ගේ ප්‍රහාණය පිණිස .. නූපන් කුශලධර්මයන්ගේ ඉපදීම පිණිස ... උපන් කුශලධර්මයන්ගේ සිථිතිය පිණිස අසම්මෝෂය පිණිස, බොහෝ බව පිණිස, විපුලබව පිණිස, භාවනාවගේ පාරිපූරිය පිණිස, ඡන්දය උපදවයි ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍යාරම්භ කෙරෙයි. සිත දැඩි කොට ගණී. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි. ...

3. 6. 3.

මහණෙනි, මේ ප්‍රතිපත්ති තුනෙකි ...

ඡන්දය නිසා පැවැති සමාධි හා ප්‍රධානසංස්කාර යන මෙයින් සමන්වාගත ඍද්ධිපාදය වඩයි. ... වීර්‍ය්‍යසමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධි හා ප්‍රධාන-සංස්කාර යන මෙයින් සමන්වාගත ඍද්ධිපාදය වඩයි. ...

3. 6. 4.

මහණෙනි, මේ ප්‍රතිපත්ති තුනෙකි ...

ශ්‍රද්ධෙන්ද්‍රියය වඩයි. වීර්‍ය්‍යෙන්ද්‍රියය වඩයි. සමෘතීන්ද්‍රියය වඩයි. සමාධීන්ද්‍රියය වඩයි. ප්‍රඥෙන්ද්‍රියය වඩයි. ...

3. 6. 5.

මහණෙනි, මේ ප්‍රතිපත්ති තුනෙකි.

ශ්‍රද්ධාබලය වඩයි. වීර්‍ය්‍යබලය වඩයි. සමෘතිබලය වඩයි. සමාධිබලය වඩයි. ප්‍රඥාබලය වඩයි. ...

### 3. 6. 6.

[තිස්සො ඉමා භික්ඛවෙ, පටිපදා -පෙ-]

සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති, විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති, පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති, පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගං භාවෙති, සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති, උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගං භාවෙති. -පෙ-

### 3. 6. 7.

[තිස්සො ඉමා භික්ඛවෙ පටිපදා -පෙ-]

සම්මාදිට්ඨිං භාවෙති, සම්මාසඞ්කප්පං භාවෙති, සම්මාවාචං භාවෙති, සම්මා-කම්මන්තං භාවෙති, සම්මාආජීවං භාවෙති, සම්මාවායාමං භාවෙති, සම්මාසතිං භාවෙති, සම්මාසමාධිං භාවෙති. අයං වුච්චති භික්ඛවෙ මජ්ඣිමා පටිපදා.

ඉමා ඛො භික්ඛවෙ තිස්සො පටිපදාති.

[පටිපදා] වග්ගො ඡට්ඨො*

## [7. කම්මපථ පෙය්‍යාලං]

### 3. 7. 1.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

කතමෙහි තීහි?

අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති, පාණාතිපාතෙ ච සමනුඤ්ඤො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

### 3. 7. 2.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.

කතමෙහි තීහි?

අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති, පාණාතිපාතා වෙරමණියා ච සමනුඤ්ඤො හොති -පෙ- එවං සග්ගෙ.

---

* තස්සුද්දානං:- *සතිපට්ඨානං සම්මප්පධානං - ඉද්ධිපාදින්ද්‍රියෙන ච
බලං බොජ්ඣඞ්ගා මග්ගා ච - පටිපදාය යොජයෙති - දසං

**3. 6. 6.**

මහණෙනි, මේ ප්‍රතිපත්ති තුනෙකි ...

සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වඩයි. විරියසම්බොජ්ඣඞ්ගය වඩයි. පීතිසම්බොජ්ඣඞ්ගය වඩයි. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වඩයි. සමාධිසම්බොජ්ඣඞ්ගය වඩයි. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. ...

**3. 6. 7.**

මහණෙනි, මේ ප්‍රතිපත්ති තුනෙකි ...

සම්මාදිට්ඨිය වඩයි. සම්මාසඞ්කප්පය වඩයි. සම්මාවාචා වඩයි. සම්මාකම්මන්තය වඩයි. සම්මාආජීවය වඩයි. සම්මාවායාමය වඩයි. සම්මාසතිය වඩයි. සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ මධ්‍යමප්‍රතිපත්තිය යි කියනු ලැබේ.

මහණෙනි, මේ තුන් ප්‍රතිපත්තීහුයි.

**සවන [ප්‍රතිපදා] වග්ගයි.**

## [7. කම්මපථ පෙය්‍යාලය]

**3. 7. 1.**

මහණෙනි, දහම් තුනෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබුයේ යම්සේ ද, එපරිදි නිරයෙහි සිටියේ වේ.

කවර දහම් තුනෙකින යත්:

තෙමේ ද පණිවා කරන්නේ වෙයි. පණිවායෙහි මෙරමා ද සමාදන් කරවයි. පණිවායෙහි අනුදන්නේ ද වෙයි.

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබුයේ යම් සේ ද, එපරිදි නිරයෙහි සිටියේ වේ.

**3. 7. 2.**

මහණෙනි, දහම් තුනෙකින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබුයේ යම් සේ ද, එපරිදි සවර්ගයෙහි සිටියේ වේ.

කවර දහම් තුනෙකින යත්:

තෙමේ ද පණිවායෙන් දුරු වූයේ වෙයි. මෙරමා ද පණිවායෙන් දුරු වීමෙහි සමාදන් කරවයි. පණිවායෙන් දුරු වීමෙහි අනුදන්නේ ද වෙයි... එසේ සවර්ගයෙහි සිටියේ වේ.

3. 7. 3.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති, අදින්නාදානෙ ච සමනුඤ්ඤො හොති -පෙ- එවං නිරයෙ.

3. 7. 4.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති. පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති. අදින්නාදානා වෙරමණියා ච සමනුඤ්ඤො හොති -පෙ- එවං සග්ගෙ,

3. 7, 5.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති, කාමෙසු මිච්ඡාචාරෙ සමනුඤ්ඤො හොති -පෙ- එවං නිරයෙ.

3. 7. 6.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ච සමනුඤ්ඤො හොති -පෙ- එවං සග්ගෙ.

3. 7. 7.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච මුසාවාදී හොති, පරඤ්ච මුසාවාදෙ සමාදපෙති, මුසාවාදෙ ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං නිරයෙ.

3. 7. 8.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච මුසාවාදා පටිවිරතො හොති, පරඤ්ච මුසාවාදා වෙරමණියා සමාදපෙති. මුසාවාදා වෙරමණියා ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං සග්ගෙ.

3. 7. 9.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච පිසුනාවාචො හොති. පරඤ්ච පිසුනාය වාචාය සමාදපෙති. පිසුනාය වාචාය ච සමනුඤ්ඤො හොති -පෙ- එවං නිරයෙ

3. 7. 10.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ]

අත්තනා ච පිසුනාය වාචාය පටිවිරතො හොති. පරඤ්ච පිසුනාය වාචාය වෙරමණියා සමාදපෙති. පිසුනාය වාචාය වෙරමණියා ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං සග්ගෙ.

3. 7. 3.

මහණෙනි, දහම් තුණෙකින් ...

තෙමේත් අයිනාදන් ගන්නේ වෙයි. මෙරමාත් අයිනාදනෙහි සමාදන් කරවයි. අයිනාදනෙහි අනුදන්නේත් වෙයි ... එසේ නිරයෙහි සිටියේ වේ.

3. 7. 4.

මහණෙනි, දහම් තුණෙකින් ...

තෙමේත් අයිනාදනින් දුරු වූයේ වෙයි. මෙරමා ද අයිනාදනින් දුරු විමෙහි සමාදන් කරවයි. අයිනාදනින් දුරුවිමෙහි අනුදන්නේත් වෙයි ... එසේ සවර්ගයෙහි සිටියේ වේ.

3. 7. 5.

මහණෙනි, දහම් තුණෙකින් ...

තෙමේත් කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මෙරමාත් කාමයෙහි මිසහසරෙහි සමාදන් කරවයි. කාමයෙහි මිසහසරෙහි අනුදන්නේත් වෙයි ... එසේ නිරයෙහි සිටියේ වේ.

3. 7. 6.

මහණෙනි, දහම් තුණෙකින් ...

තෙමේත් කාමයෙහි මිසහසරින් දුරුවූයේ වෙයි. මෙරමාත් කාමයෙහි මිසහසරින් දුරුවිමෙහි සමාදන් කරවයි. කාමයෙහි මිසහසරින් දුරුවිමෙහි අනුදන්නේත් වෙයි ... එසේ සවර්ගයෙහි සිටියේ වේ.

3. 7. 7.

මහණෙනි, දහම් තුණෙකින් ...

තෙමේත් මුසවා බණන්නේ වෙයි. මෙරමාත් මුසවා බිණීමෙහි සමාදන් කරවයි. මුසවායෙහි අනුදන්නේත් වෙයි ... එසේ නිරයෙහි සිටියේ වේ.

3. 7. 8.

මහණෙනි, දහම් තුණෙකින් ...

තෙමේත් මුසවායෙන් දුරු වූයේ වෙයි. මෙරමාත් මුසවායෙන් දුරු-විමෙහි සමාදන් කරවයි. මුසවායෙන් දුරුවිමෙහි අනුදන්නේත් වෙයි ... එසේ සවර්ගයෙහි සිටියේ වේ.

3. 7. 9.

මහණෙනි, දහම් තුණෙකින් ...

තෙමේත් පිසුණුබස් ඇතියේ වෙයි. මෙරමාත් පිසුණුබසෙහි සමාදන් කරවයි. පිසුණුබසෙහි අනුදන්නේත් වෙයි ... එසේ නිරයෙහි සිටියේ වේ.

3. 7. 10.

මහණෙනි, දහම් තුණෙකින් ...

තෙමේත් පිසුණුබසින් දුරුවූයේ වෙයි. මෙරමාත් පිසුණුබසින් දුරු-විමෙහි සමාදන් කරවයි. පිසුණුබසින් දුරුවිමෙහි අනුදන්නේත් වෙයි ... එසේ සවර්ගයෙහි සිටියේ වේ.

3. 7. 11.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච ඵරුසාවාචො හොති, පරඤ්ච ඵරුසාය වාචාය සමාදපෙති, ඵරුසාය වාචාය ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං නිරයෙ.

3. 7. 12.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච ඵරුසාය වාචාය පටිවිරතො හොති. පරඤ්ච ඵරුසාය වාචාය වෙරමණියා සමාදපෙති, ඵරුසාය වාචාය වෙරමණියා ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං සග්ගෙ.

3. 7. 13.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච සම්ඵප්පලාපී හොති, පරඤ්ච සම්ඵප්පලාපෙ සමාදපෙති, සම්ඵප්පලාපෙ ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං නිරයෙ.

3. 7. 14.

[තීහි භික්ඛවෙ, ධම්මෙහි -පෙ-]

අත්තනා ච සම්ඵප්පලාපා පටිවිරතො හොති, පරඤ්ච සම්ඵප්පලාපා වෙරමණියා සමාදපෙති, සම්ඵප්පලාපා වෙරමණියා ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං සග්ගෙ.

3. 7. 15.

[තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-]

අත්තනා ච අභිජ්ඣාලූ හොති, පරඤ්ච අභිජ්ඣාය සමාදපෙති, අභිජ්ඣාය ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං නිරයෙ.

3. 7. 16.

[තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-]

අත්තනා ච අනභිජ්ඣාලූ හොති, පරඤ්ච අනභිජ්ඣාය සමාදපෙති, අනභිජ්ඣාය ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං සග්ගෙ.

3. 7. 17.

[තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-]

අත්තනා ච ව්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච ව්‍යාපාදෙ සමාදපෙති, ව්‍යාපාදෙ ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං නිරයෙ.

3. 7. 18.

[තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-]

අත්තනා ච අව්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච අව්‍යාපාදෙ සමාදපෙති, අව්‍යාපාදෙ ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං සග්ගෙ.

### 3. 7. 11.

මහණෙනි, දහම් තුනෙකින් ...

තෙමේත් පරුෂවචන ඇතියේ වෙයි. මෙරමාත් පරුෂවචනයෙහි සමාදන් කරවයි. පරුෂවචනයෙහි අනුදන්නේත් වෙයි ... එසේ නිරයෙහි සිටියේ වේ.

### 3. 7. 12.

මහණෙනි, දහම් තුනෙකින් ...

තෙමේත් පරුෂවචනයෙන් දුරුවූයේ වෙයි. මෙරමාත් පරුෂවචනයෙන් දුරු-වීමෙහි සමාදන් කරවයි. පරුෂවචනයෙන් දුරුවීමෙහි අනුදන්නේත් වෙයි ... එසේ ස්වර්ගයෙහි සිටියේ වේ.

### 3. 7. 13.

මහණෙනි, දහම් තුනෙකින් ...

තෙමේත් සම්ඵප්පලාප ඇතියේ වෙයි. මෙරමාත් සම්ඵප්පලාපයෙහි සමාදන් කරවයි. සම්ඵප්පලාපයෙහි අනුදන්නේත් වෙයි ... එසේ නිරයෙහි සිටියේ වේ.

### 3. 7. 14.

මහණෙනි, දහම් තුනෙකින් ...

තෙමේත් සම්ඵප්පලාපයෙන් දුරුවූයේ වෙයි. මෙරමාත් සම්ඵප්පලාප-යෙන් දුරුවීමෙහි සමාදන් කරවයි. සම්ඵප්පලාපයෙන් දුරුවීමෙහි අනු-දන්නේත් වෙයි ... එසේ ස්වර්ගයෙහි සිටියේ වේ.

### 3. 7. 15.

මහණෙනි, දහම් තුනෙකින් ...

තෙමේත් අභිධ්‍යාබහුල වෙයි. මෙරමාත් අභිධ්‍යායෙහි සමාදන් කරවයි. අභිධ්‍යායෙහි අනුදන්නේත් වෙයි ... එසේ නිරයෙහි සිටියේ වේ.

### 3. 7. 16.

මහණෙනි, දහම් තුනෙකින් ...

තෙමේත් අභිධ්‍යාබහුල නොවෙයි. මෙරමාත් අනභිධ්‍යාවෙහි සමාදන් කරවයි. අනභිධ්‍යායෙහි අනුදන්නේත් වෙයි ... එසේ ස්වර්ගයෙහි සිටියේ වේ.

### 3. 7. 17.

මහණෙනි, දහම් තුනෙකින් ...

තෙමේත් ව්‍යාපාදයට පත් සිතැතියේ වෙයි. මෙරමාත් ව්‍යාපාදයෙහි සමාදන් කරවයි. ව්‍යාපාදයෙහි අනුදන්නේත් වෙයි ... එසේ නිරයෙහි සිටියේ වේ.

### 3. 7. 18.

මහණෙනි, දහම් තුනෙකින්

තෙමේත් ව්‍යාපාදයට නොපත් සිතැතියේ වෙයි. මෙරමාත් අව්‍යාපාද-යෙහි සමාදන් කරවයි. අව්‍යාපාදයෙහි අනුදන්නේත් වෙයි ... එසේ ස්වර්ගයෙහි සිටියේ වේ.

### 3. 7. 19.

[තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-]

අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති, මිච්ඡාදිට්ඨියා ච සමනුඤ්ඤො හොති. -පෙ- එවං නිරයෙ.

### 3. 7. 20

[තීහි භික්ඛවෙ ධම්මෙහි -පෙ-]

අත්තනා ච සම්මාදිට්ඨිකො හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති, සම්මාදිට්ඨියා ච සමනුඤ්ඤො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

**කම්මපථපෙය්‍යාලං නිට්ඨිතං***

## [8. රාග පෙය්‍යාලං]

### 3. 8 1-170

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බා.

කතමෙ තයො:

සුඤ්ඤතො සමාධි, අනිමිත්තො සමාධි, අප්පණිහිතො සමාධි. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බා.

රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය - පරික්ඛයාය - පහාණාය - ඛයාය - වයාය- විරාගාය-නිරොධාය-චාගාය-පටිනිස්සග්ගාය-ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

දොසස්ස -පෙ- මොහස්ස-කොධස්ස-උපනාහස්ස-මක්ඛස්ස-පළාසස්ස- ඉස්සාය - මච්ඡරියස්ස - මායාය - සාඨෙය්‍යස්ස - ථම්භස්ස-සාරම්භස්ස-මානස්ස- අතිමානස්ස-මදස්ස-පමාදස්ස අභිඤ්ඤාය-පරිඤ්ඤාය-පරික්ඛයාය- පහාණාය- ඛයාය-වයාය-විරාගාය-නිරොධාය-චාගාය-පටිනිස්සග්ගාය ඉමෙ තයො ධම්මා භාවෙතබ්බාති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

**රාගපෙය්‍යාලං නිට්ඨිතං***

**තිකනිපාතො.**

**එකකනිපාතො ච දුකනිපාතො ච තිකනිපාතො ච සමත්තා.**

---

* තදුද්දානං: පාණං අදින්නමිච්ඡා ච මුසාවාදී ච පිසුණා
ඵරුසා සම්ඵප්පලාපො ච අභිජ්ඣාව්‍යාපාද දිට්ඨි ච
කම්මපථෙසු පෙය්‍යාලං තිකකෙන නියොජයෙති - මජ්ඣං.

* (කම්මපථපෙය්‍යාලෙ වීසති කම්මපථසුත්තානි දට්ඨබ්බානි. පොත්ථකෙසු අකුසල-කුසල කම්මපථවසෙන එකතො යොජිතානි දසෙව සුත්තානි පෙය්‍යාලමුඛෙන දිස්සන්ති. රාග පෙය්‍යාලමුඛෙන සත්තත්‍යධිකසතසුත්තානි දට්ඨබ්බානි.)

3. 7. 19.

[මහණෙනි, දහම් තුණෙකින් ...]

තෙමේත් මිථ්‍යාදෘෂ්ටික වෙයි. මෙරමාත් මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයි. මිථ්‍යාදෘෂ්ටියෙහි අනුදන්නේත් වෙයි...එපරිදි නිරයෙහි සිටියේ වේ.

3. 7. 20.

[මහණෙනි, දහම් තුණෙකින් ...]

තෙමේත් සම්‍යග්දෘෂ්ටික වෙයි. මෙරමාත් සම්‍යග්දෘෂ්ටියෙහි සමාදන් කරවයි. සම්‍යග්දෘෂ්ටියෙහි අනුදන්නේත් වෙයි.

මහණෙනි, මේ තුන් දහමින් සමන්‍වාගත වූයේ ගෙණවුත් තැබූයේ යම්සේ ද, එපරිදි ස්‍වර්ගයෙහි සිටියේ වේ.

කම්මපථපෙය්‍යාලය නිමි. *

## [ 8. රාගපෙය්‍යාලය ]

3. 8. 1—170.

මහණෙනි, රාගයාගේ අභිඥතය (වෙසෙසින් දැනීම) පිණිස දහම්හු තුන් දෙනෙක් වැඩිය යුත්තාහ.

කවර තුන් දෙනෙක යත්:

ශූන්‍යතසමාධිය, අනිමිත්තසමාධිය, අප්පණිහිතසමාධි යි.

මහණෙනි, රාගයාගේ වෙසෙසින් දැනීම පිණිස මේ තුන් දහම්හු වැඩිය යුත්තාහ.

මහණෙනි, රාගයාගේ පරිජ්ඤානය පිණිස - පරික්‍ෂය පිණිස - ප්‍රහාණය පිණිස - ක්‍ෂය පිණිස - ව්‍යය පිණිස - විරාගය පිණිස - නිරෝධය පිණිස - ත්‍යාගය පිණිස - දුරලීම පිණිස මේ තුන් දහම්හු වැඩිය යුත්තාහ.

ද්වේෂයාගේ ... මෝහයාගේ ... ක්‍රෝධයාගේ ... උපනාහයාගේ ... මක්‍ෂයාගේ ... පලාසයාගේ ... ඊර්ෂ්‍යාවගේ ... මාත්සර්‍ය්‍යයාගේ ... මායාවගේ ... සාඨෙය්‍යයාගේ ... ථම්භයාගේ ... සාරම්භයාගේ ... මානයාගේ ... අතිමානයාගේ ... මදයාගේ ... ප්‍රමාදයාගේ ... අභිඥානය පිණිස - පරිඥානය පිණිස - පරික්‍ෂය පිණිස - ප්‍රහාණය පිණිස - ක්‍ෂය පිණිස - ව්‍යය පිණිස - විරාගය පිණිස - නිරෝධය පිණිස - ත්‍යාගය පිණිස - පෙරනා පිණිස මේ තුන් දහම්හු වැඩිය යුත්තාහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටුසිත් ඇති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිමුඛ කොට ගෙණ සතුටුවූහු.

රාගපෙය්‍යාලය නිමි. *

තිකනිපාත යි.

ඒකකනිපාත-දුකනිපාත-තිකනිපාතයෝ සමාප්තයහ.

* මෙහි කම්මපථ පෙය්‍යාලයෙහි 'පාණාතිපාතී හොති' ආදි දසඅකුසලකම්මපථ හා, 'පාණාතිපාතා පටිවිරතො හොති' ආදි දසකුසලකම්මපථ වශයෙන් යෙදුනු සූත්‍ර 20 කි. රාගපෙය්‍යාලයෙහි රාගාදි පද 17 වෙන වෙන ම 'අභිඤ්ඤාය' ආදි පද 10 සමග යොදා ඒ එක එක 'සුඤ්ඤතසමාධි' ආදි පද 3 හා ගටා ගැණීමෙන් සූත්‍ර 170 ක් වන බව දතයුතු.

## [ උද්දානගාථා ]

1. අඞ්ගුත්තරනිකායවරෙ සබ්බඤ්ඤුනා පරමවිසුද්ධදස්සිනා,
නිපාතා එකාදසෙයෙව පවත්තිතා උද්දානතො තෙ තිස්සාමෙථ ආදිතො:

## [ එකකනිපාතො ]

2. ඉත්ථිරූපං පුරිසරූපං පඤ්චනීවරණානි ච,
අකම්මනියාදිකං පඤ්ච පඤ්ච චිත්තං අදන්තතො.

3. සූකං පදුට්ඨරහද ඵන්දනො ලහු පභස්සරං,[1]
ආසෙවභාවෙ මනසි[2] භාගීති අපරෙ දුවෙ.

4. උප්පජ්ජන්ති පරිහාණී අනත්ථාය අසම්මුසා,
චතුකොටි මූලා එතෙ චතුරෙ සබ්බවත්තී තා.[3]

5. අධම්මා විනයා ච භාසිතා චිණ්ණපඤ්ඤත්තපඤ්චමං,[4]
ආපත්ති ලහු දුට්ඨුල්ලං සාවසෙසක්කමෙත ච.

6. පුග්ගලො සාරිපුත්තො ච එතදග්ගෙ තථෙව ච,
අට්ඨානඤ්ච තිබ්බිද සම්බුධා[5] අනුප්පන්නං ච කුසලං.

---

1. පභස්සරො – සබ්බත්ථ  2. ආණසවභාවමනසා - සබ්බත්ථ.  3. සබ්බවත්තිතා - සබ්බත්ථ.
4. පණ්ණත්තිපඤ්චමං - සබ්බත්ථ.  5 සම්පද - සබ්බත්ථ.

## [ උද්දානගාථා ]

1. ක්‍ෂණසමනුපස්සනායෙන් දක්නා හෙයින් පරමවිශුද්ධදර්ශී වූ සර්‍වඥයන් වහන්සේ විසින් පවර අඞ්ගුත්තරනිකායෙහි ලා නිපාතයෝ එකොළොස් දෙනෙක් වදාරණ ලදහ. ආදිය පටන් කොට ඒ නිපාතයන් උද්දානගාථා විසින් අසව:

## [ එකකනිපාතය ]

2. ස්ත්‍රීරූපය, පුරුෂරූපය, පඤ්චනීවරණසූත්‍රයෝ ය, අකම්මනියාදි පසය, අදන්තවිශෙෂණය පටන් කොට චිත්තසූත්‍ර පසය. (මෙහි ප්‍රථම වර්ගයෙහි ස්ත්‍රීරූපාදි පසෙක, පුරුෂරූපාදි පසෙකැයි සූත්‍ර දසයෙක, ද්විතීය වර්ගයෙහි පඤ්චනීවරණයන්ගේ උත්පාද අනුත්පාද භේදයෙන් සූත්‍ර දසයෙක, තෘතීයවර්ගයෙහි චිත්තයාගේ අකර්මණ්‍යාදි භේදයෙන් සූත්‍ර දසයෙක, චතුර්ථ වර්ගයෙහි චිත්තයාගේ අදන්තාදි භේදයෙන් සූත්‍ර දසයෙකැයි මේ හැම සමසතළිසෙක.)

3 – 4. සූක, පදුට්ඨ, රහද, එන්දන, ලහු පරිවත්ත, පභස්සර සූත්‍රයෝ ය. ආසෙවති – භාවෙති – මනසිකරොති යී තුන් සූත්‍රයෝ ය. ‘අකුසලභාගියා – කුසලභාගියා’යී ‘භාගී’භාගයෙන් ගත් අන්‍ය සූත්‍රයෝ දෙදෙනෙක. ‘උප්පජ්ජන්ති’ ‘පරිහානි’ ‘අනත්ථාය – අසම්මොසාය’ යන පදභෙදයෙන් ගත් සූත්‍රයෝ ය. පර්‍යවසානසූත්‍රයෙහි එන ‘අනුයොගො අකුසලානං’ යනාදි තෙල සතර මුඛයෝ චතුකොටි නම් වෙති. ඔහු ’නාහං භික්ඛවෙ’ යනාදි හැම සූත්‍රයෙහි නම් විසින් වැටෙති.

(මෙහි දසවන වර්ගයෙහි දෙතිස්වන සූත්‍රය අවසන් කොට හැම සූත්‍ර පැවැසින. ‘පභස්සර’ සූත්‍රයෝ නම්: පස්වන සවන දෙවර්ගයෙහි අග හා මුල හා එන සතර සූත්‍රයෝ යි. ‘උප්පජ්ජන්ති’ යන ක්‍රියායෙන් ගත් සූත්‍රයෝ නම්: සවන වර්ගයෙහි අටවන සූත්‍රය පටන් කොට අටවන වර්ගයෙහි පස්වන සූත්‍රය අවසන් කොට එන සූත්‍රයෝ ය. අටවන වර්ගයෙහි සවන සූත්‍රය පටන් කොට පරිහාණි සූත්‍ර කියත් ම ව්‍යතිරෙක වශයෙන් වුද්ධිසූත්‍රයෝත් සඞ්ගෘහීත වෙත්නු යි ඔහු එහි ම ඇතුළත් වෙති. ‘අනත්ථාය – අසම්මොසාය’ යන පදභෙදයෙන් ගත් සූත්‍ර රාශියෙහිදු ව්‍යතිරෙකපක්‍ෂය ඇතුළත් වේ. “අනුයොගො අකුසලානං, අනනුයොගො කුසලානං, අනුයොගො කුසලානං, අනනුයොගො අකුසලානං.” යන සතර කෙළෙක් පර්‍යවසාන සූත්‍රයෙහි ඇත. එයින් ‘චතුකොටි’ නමි. “නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි” යනාදි මුල කියූ සූත්‍රජාතය හැම ම එනමින් ගත් සේ කිහ. එයින් ම ඒ චතුකොටිය සර්‍වත්‍රී වෙයි.)

5. ‘අධම්ම – අවිනය’ දෙපදයෙන් එන සූත්‍ර ය, ‘භාසිත – ආචිණ්ණ’ දෙපදයෙනුදු පස්වන ‘පඤ්ඤත්ත’ පදයෙනුදු ගත් සූත්‍රය. ‘ආපත්ති – ලහුක-දුට්ඨුල්ල’ යන පදභේදයෙන් ගත් සූත්‍ර ය. ‘සාවසෙස – අනවසෙස’ ආදි ක්‍රමයෙන් වෙන් කොට ගත් සූත්‍ර ය.

6. (තෙළෙස්වන වර්ගයෙහි මුල) ‘පුග්ගල’ පදයෙන් යුත් සූත්‍ර ය. (එහි අග) ‘සාරිපුත්ත’ පදයෙන් ගත් සූත්‍ර ය. එසෙයින් ම ‘එතදග්ග’ පාළියෙහි එන සූත්‍ර ය. අට්ඨානපාළි සූත්‍ර ය, ‘නිබ්බිදාය – සම්බොධාය’ යන පෙදෙන් බිඳි සූත්‍ර ය. ‘අනුප්පන්න – කුසල’ යන පෙදෙන් බිඳි සූත්‍ර ය. (මෙහි ද අනුප්පන්න අකුසල’ ආදි ව්‍යතිරෙක පක්‍ෂය ද ඇතුළති.)

7. මිච්ඡාදිට්ඨී පවඩ්ඪන්ති යෙනෙව සත්තා අසද්ධම්මවුට්ඨානෙන,
පරෙ සාවජ්ජම්පං දූරක්ඛාතෙ ච ඤාණ සං.[1]

8. මනුස්සෙසු මජ්ඣිමෙ පඤ්ඤාචරියෙන[2] චක්ඛුනා,
දස්සනසවණධාරණා උපපරික්ඛණ අත්ථමඤ්ඤාය දස.

9. සංවෙගො සංවිග්ගෙන වවස්සග්ගාරම්මණෙන ච,
අනෙනාත ච යෙ වුත්තා යෙ යෙ අත්ථරසෙන ච.

10. ද්වෙ මනුස්සා ද්වෙ දෙවා නිරයා[3] අපරෙ දුවෙ,
ද්වෙ තිරච්ඡානයොනීයා[4] ද්වෙ පෙත්ති විසයා ජම්බුදීපෙහි යොජයෙ.

11. අරඤ්ඤෙ පිණ්ඩපාතං පංසුකූලං ධම්මකථිකා විනයෙන ච,
බාහුසච්චං ථාවරෙය්‍යං ආකප්පා ද්වෙ ච හොන්ති.

12. පරිවාරජ්ඣානමෙත්තා උට්ඨානං[5] පධාන ඉන්ද්‍රිය බලබොජ්ඣඞ්ගා,[6]
මග්ගො අභිභායතනං විමොක්ඛකසිණෙන ච.

13. ද්වෙ සඤ්ඤා අනුස්සතිට්ඨානා සහගතෙහි යොජයෙ,
අච්ඡරා ච මහාසමුද්දෙ සංවෙගා පස්සද්ධි අකුසලං කුසලෙන ච.

14. අවිජ්ජාපඤ්ඤාපපභෙදෙ ච පටිවෙධො පටිසම්භිදා චතුරෙ,
එලෙන පටිලාභො වුද්ධි වෙපුල්ලතාය ච.

15. මහාපුථුවිපුලඤ්ඤාව[7] ගම්භීරං අසාමන්තභූරි ච,
බාහු සීඝ ලහු හාසු[8] ජවන තික්ඛනිබ්බෙධෙන ච.

16. භුඤ්ජනතිභූතපරිහීනං[9] විරද්ධමපමාදිංසු තෙ,
සෙවනභාවනබහුලා අභිඤ්ඤාපරිඤ්ඤාය ච අථො සච්ඡිකිරියායානි.

**පඨමො නිපාතො.**

---

1. ඤාණවසං - සබ්බත්ථ. 2. විඤ්ඤාචරියෙන - සබ්බත්ථ. 3 නිරයෙ - සබ්බත්ථ. 4 තිරච්ඡානයොනියෙ - සබ්බත්ථ. 5. උපට්ඨානං - සබ්බත්ථ. 6. බොජ්ඣඞ්ගො - සබ්බත්ථ. 7. වෙපුල්ලඤාව - සබ්බත්ථ. 8 ආසු - සබ්බත්ථ. 9. පරිහීනතා - සබ්බත්ථ.

7 'මිච්ඡාදිට්ඨි පච්ඡන්නි' 'යෙනෙවං සත්තා' 'අසද්ධම්මා වුට්ඨාපෙත්වා' යන ආදි පෙදෙන් බිඳි සූත්‍ර ය. 'මහාසාවජ්ජං' යන මෙහිදු 'ඛිප්පං ඔඩ්ඩෙය්‍ය' යන මෙහිදු 'සාවජ්ජං, ඛිප්පං' යන දෙපෙදෙන් බිඳි සූත්‍ර දෙකය. 'දුරක්ඛාතෙ' යන පෙදෙන් බිඳි සූත්‍ර ය. එහිදු 'යඤ්ච සමාදපෙති' යන පෙදෙන් බිඳි සූත්‍ර ය.

8. 'මනුස්සෙසු' යන පෙදෙන් බිඳි සූත්‍ර ය. 'මජ්ඣිමේසු' යන පෙදෙන් බිඳි සූත්‍ර ය. 'පඤ්ඤවන්තො' යන පෙදෙන් බිඳි සූත්‍ර ය 'අරියෙන පඤ්ඤා-චක්ඛුනා' යන පෙදෙන් බිඳි සූත්‍ර ය. (තථාගතං දස්සනාය - ධම්මවිනයං සවණාය - ධම්මං ධාරෙන්ති යන) දශීත ශ්‍රවණධාරණයෙන් වෙන් කළ සූත්‍ර ය. (අත්ථං උපපරික්ඛන්ති - අත්ථමඤ්ඤාය මෙහි) උපපරික්ඛණයෙන් බිඳි සූත්‍රය හා 'අත්ථමඤ්ඤාය' යන පෙදෙන් බිඳි සූත්‍රය.

9. 'සංවිජ්ජන්ති' මෙහි සංවෙගයෙන් බිඳි සූත්‍ර ය. 'යෙ සංවිග්ගා' යන 'සංවිග්ග' පෙදෙන් බිඳි සූත්‍ර ය. 'වවස්සග්ගාරම්මණං' යන පෙදෙන් බිඳි සූත්‍ර ය. 'යෙ අන්නග්ගරසග්ගානං' යන පෙදෙන් බිඳි සූත්‍ර ය 'යෙ අත්ථරසස්ස' යන පෙදෙන් බිඳි සූත්‍ර ය.

10. 'මනුස්සා චුතා' මෙයින් බිඳි දෙසූත්‍ර ය. 'දෙවා චුතා' මෙයින් බිඳි දෙසූත්‍ර ය 'නිරයා චුතා' මේයින් බිඳි දෙසූත්‍ර ය. 'තිරච්ඡානයොනියා චුතා, මෙයින් බිඳි දෙසූත්‍ර ය. 'පෙත්තිවිසයා චුතා' මෙයින් බිඳි දෙසූත්‍ර ය යන මේ සූත්‍ර "සෙය්‍යථාපි....ජම්බුදීපෙ" ආදීන් වදාළ කරුණු හා සසඳ ගත්තේ ය

